සිංහල

විමානවත්ථුප්පකරණය

පේතවත්ථුප්පකරණය

සිංහල

විමානවත්ථුප්‍රකරණය.

සෙඛඤ්ඤසෙලාඛ්‍ය ශ්‍රීමඩිනපුර පුෂ්පාරාම
මහා විහාරයෙහි
වැඩවිසූ
ගම්මුල්ලේරතනපාලාභිධාන
මහාස්ථවිරපාදයන් වහන්සේ විසින්
විරචිතයි.

විද්‍යෝදයපරිවෙණාධිපති
ත්‍රිපිටකවාගීශ්වරවාසී ශ්‍රී සුමඞ්ගලාභිධාන
ප්‍රධාන සඞ්ඝනායක සවාමීන්ද්‍රයානන් වහන්සේගේ
ශිෂ්‍යවූ
පුෂ්පාරාම මහා විහාරවාසී
තෙල්වත්තේ මහානාම සිලානන්ද
ස්ථවිරයන් වහන්සේ විසින්
ශුද්ධකොට සකස්කරණලදී.

ජේ. පී. ගුණවර්ධන නමැති මා විසින්
අවිවුගස්වා ප්‍රසිද්ධකරණලදී.

ජිනාලඞ්කාරයන්ත්‍රාලයෙහි
මුද්‍රණය කරවනලදී.

බු: ව: **2445**.

සිංහල
විමානවත්ථුප්පකරණය.

මෙනම් මාහැගි ධම්ප්‍රකරණයවූකලි මින් අවුරුදු එකසිය නිස් එකකට පමණ පෙර මෙම සෙඛඛණ්ඩසෙලාභිධාන ශ්‍රීවඩ්ඩනපුරය අග නුවර කොට ලඞ්කාරාජ්‍යයෙහි එකච්ඡත්‍ර නංවා රජ පැමිණි කිනිසිරි රාජසිංහ මහරජතුමානන් දවස මෙම නුවර පුෂ්පාරාම මහා විහාර යෙහි වැඩ විසූ ගම්මුල්ලේ **රතනපාලාභිධාන** මහාසථවිර සවාමි පාදයන් වහන්සේ විසින් ගලගෙදර **ඉන්ද්‍රජාති** සථවිර පාදයන් වහන්සේගේ ආරාධනාවෙන් සිංහල භාෂාවෙන් කරණලද්දකි.

යථොක්ත මහාසවාමිපාදයන් වහන්සේ මෙකල ලක්දිව පවත්නා බුඩශාසනය පිහිටවීමෙහි මහොපකාරීවූ බොධිසත්ව චරිතඇති ත්‍රිපිට කධාරී කවිකුල තිලකායමාන වැලිවිට පිණ්ඩපාතික අසරණ සරණ **සරණංකරාභිධාන** සංඝරාජ මාහිමිතුමානන් වහන්සේගේ ශිෂ්‍යවූ උපොසථාරාමයෙහි නායක පදවියට පත්ව වැඩවිසූ ධම්මරක්ඛිත නා යක සවාමිපාදයන් වහන්සේගේ ශිෂ්‍ය කෙණෙකි. මුන්වහන්සේ ත්‍රි පිටක ධම්යෙහි හා තර්ක ව්‍යාකරණාදී නානා ශාස්ත්‍රයන්හිද හසළ බුඩි මත් උතුමෙක් බැව් මෙම ග්‍රන්ථයෙන් සහ මෙහිම අවසන්හි පැණෙන ශාසන සංග්‍රහ වසතුවෙන්ද පෙණේ.

මේ සම්බන්ධි මූල ධම්ප්‍රකරණය තෙවළාදහම් අතුරෙන් සූත්‍රපිටක යෙහි බුද්ඛකනිකායට ඇතුලත්කොට ගාථාඛ්‍යයෙන් **විමානවත්ථු** යයි සංග්‍රහකරණ ලද්දේය. ඊට දිඹුලාගල්විහාරයෙහි වැඩවිසූ තත් කාල ශාසනානුශාසක ත්‍රිපිටකධාරී මහාකවි **ධම්මපාල** මාහිමියා නන් වහන්සේ විසින් අට්ඨකථාවක් කරණලදී.

එසින් සියලුදෙනාට ප්‍රයොජන නොවන බැව් සලකා පූර්වොක්ත ගම්මුල්ලේ **රතනපාල** මහා සවාමිපාදයන් වහන්සේ විසින් යථොක්ත ප්‍රකරණය සිංහල භාෂාවට නගනලදී. මිට සතුටුවූ කිනිසිරි රාජසිංහ මහරජතුමානන් විසින් සතුටු පඬුරු කොට සතරනේ‍රර ළේ අළුත්නුවර විහාරගම සහ නිතුඹල් විහාරගමත් මුන්වහන්සේට පූදකළ බැව් ආදී සියල්ලම මේ පොතේම නිගමනයෙන් පෙණෙන බැවින් මේ සඳහා ප්‍රපඤ්චකථාකිරීමට නොවෙහෙසෙමු. මෙකල ලක් දිව පවත්නා බුඩශාසනය පිහිටුවූ පරිදි දූනගණු කැමැත්තන්ට මෙහි අවසානයෙහි පෙණෙන ශාසනසංග්‍රහවසතුව විපුල ප්‍රයොජන වේමය.

මෙබඳු ධම් ප්‍රකරණයක් ගුඩකොට මුද්‍රණය කරවා ලොකයාට සුලභකරදීම අතිශයින් වැඩදායකයයි සිතා ගුඩකරදෙන්ටයයි ලක් රිවිකිරණ පත්‍රය හා එම ශාලාවත් දෙවෙනිවර පැවැත්වීමෙහි මහත් උත්සාහයක් දරූ සද්ගුණවන්ත **ආම්. එච්. ජේරා මහතා** සහ තවත් කීපදෙනකුන් විසින් අපව ආරාධනා කළ හෙයින් කරුණාපූර්වක

ඒ අයදුම පිළිගෙණ පරීක්ෂා කළවිට මේ ග්‍රන්ථ කතෘ මහාසඵවිර සවා මිපාදයන් වහන්සේ අපගේ ආචාර්‍යයන් වහන්සේගේ ප්‍රාචාර්‍ය යන් නිසා අපෙන්ම මෙය සිඩවුනිනම් යෙහෙකැයි සතුටුවුයෙමු.

මෙම ඉංග්‍රීසි ආණ්ඩුව මුලදී උපොෂිත පුෂ්පාරාම විහාර මහා නායකපදවිය ලැබ වැඩ විසූ ත්‍රිපිටක ධර්මයෙහි හා සංස්කෘතාදී අ න්‍ය භාෂාවන්හිද දක්ෂවූ හම්මුල්ලේ **සුමනාභිධාන** මහා නායක සඵ විර සවාමීන්ද්‍රයන් වහන්සේ මෙම පොත කළ මාහිමිතුමානන් වහන් සේගේ ශිෂ්‍ය කෙණෙකි-

යථොක්ත **සුමනාභිධාන** මහානායක සවාම්පාදයන් වහන්සේගේ ගලගම නායකසඵවිරතුමන් ආදී ශිෂ්‍යයන් වහන්සේලා අතුරෙන් මෙ ම පුෂ්පාරාම විහාරයෙහි වැඩ විසූ තෙල්වත්තේ **සුමඞ්ගලාභිධාන** මහාසඵවිර පාදයන් වහන්සේ අපගේ ආචාර්‍යවරයානෝය-

යථොක්ත **සුමඞ්ගලාභිධාන** මහාසඵවිර සවාම්පාදයන් වහන් සේගේද කොළඹ මාලිනාකන්දේ විද්‍යෝදය පරිවෙණාධිපති විවර්ජ න තිලකායමාන ත්‍රිපිටක වාගීශ්වරාචාර්‍යය් හික්කඩුවේ **ශ්‍රී සුමඞ්ගලා භිධාන** මාහිමිතුමානන් වහන්සේගේද ශිෂ්‍යවූ මහනුවර පුෂ්පාරාම මහා විහාරයෙහි විංශද්වර්නික කාරක මහා සංඝ සභාවේ සාමාජික කාරක ධුරධර තෙල්වත්තේ **මහානාම සිලානන්ද** සඵවිර නමැති මාවිසින් මෙම ධර්ම ප්‍රකරණය ශුද්ධකොට සකස්කරණලදී.

මෙය ශුද්ධකිරීමේදී මූලපිටු කිපයක් අපගේ ගෞරවාචාර්‍යය් විදු දය පිරිවෙන් මාහිමිතුමානන් වහන්සේට පිළිගන්වන ලදින් බලා වදුරා සතුටුවිය. මා මහනුවර නැවතීමට සැමිණි නිසා අවකාශ පහසු මදවූ හෙයින් පොත අවසන් කරදීමට බොහෝ කලක් ගතවූ බව කරුණාවෙන් දනයුතු. ශුද්ධිපත්‍ර බැලීමේදී මට බොහෝ සෙයින් ම අවකාශ නොතිබුන නිසා මාවෙනින්ම තරමක් දුර ධර්මවිනය උග ත් ශිෂ්‍ය කිප නමකට ශුද්ධි පත්‍ර බලා දෙන හැටියට නියම කෙළෙමි. ඒ ඇත්තන්ගේ ප්‍රමාද භ්‍රමාදියෙන් හා වර්ණයොජකයන්ගේ දෝෂ යෙනුත් මෙහි ශාඨාදියෙහි මද වැරදිතැන් පෙණෙන්ට තිබේ-මෙය නැවත අවවුහැස්වීමේදී ඒ සියලුතැන් ශුද්ධකොට ප්‍රසිඛකරවන නිසා සුඛිහු සමාධිය භජනයකරමින් අපේ උත්සාහයෙහි සතුටුවෙත්වා.

177 වෙනි පිටේ මූල පෙළ පටන් 25 වෙනි පෙළ දක්වා ප්‍රමාද පතිත දෝෂස්ථානය බැවි සලකියයුතුයි.

මේවගට,

තෙ-ම-සිලානන්ද සඵවිර නෙමේෂ.

T. M. SILANANDA.

13 TH: SEPT. 1901.

ORIENTAL LIBRARY
KANDY.

විමානවත්ථු ප්‍රකරණය.

ප්‍රා ර ම්භ ය.

නමෝ තස්ස භගවතෝ අරහතෝ
සම්මාසම්බුද්ධස්ස.

මහාකාරුණිකං නාථං ඤෙය්‍යසාගරපාරගූං,
වන්දෙ නිප්‍රණගම්භීරං විචිත්‍රනයදෙසනං.

යනුහෙයින් මේ විමානවත්ථුප්‍රකරණය කරන්නාවූ මහාවිහාරවාසිවූ ත්‍රිපිටකධාරි ධම්මපාලනාම මහාස්ථවිරයන්විසින් ප්‍රකරණාරම්භයට පළමුවන ඉෂ්ටදෙවතා නමස්කාරවශයෙන් භාග්‍යවත් සම්‍යක්සම්බුද්ධයන්වහන්සේගේ ශ්‍රීපාදවන්දනයට නමස්කාර පිණිස,

"ප්‍රඥාරොහ නෂ්ටමුද්දිෂ්ටමෙකච්‍යාදිලඝක්‍රියා,
සඞ්ඛ්‍යානමඛ්‍යවයොගශ්ච ෂඩ්භෙතෙ ප්‍රත්‍යයාඃ සමෘතාඃ"

යනුහෙයින් ප්‍රඥාරය නෂ්ටප්‍රත්‍යය උද්දිෂ්ටය එකච්‍යාදිලඝක්‍රියාවය වෘත්තසඞ්ඛ්‍යාය අඛ්‍යවයොගය යන ෂඩ්විධ ප්‍රත්‍යයකින් ව්‍යාපන්න ජ්ඤෙ ලක්ෂණය සකල ශාස්ත්‍රයෙහි අන්තර්ගතවූහෙයින් මෙහිද විස්තාරාර්ථයෙන් තුන්දුස් අටසිය සතළිස් අඟුලක් පමණ භූමිප්‍රදෙශයෙන්හි ප්‍රඥාර කටයුතුවූ සවිටගුරුවෘත්ත එකකින්හා එකක් ලඝු සත්ක් ගුරුවෘත්ත අටකින්හා දෙකක් ලඝු සයක් ගුරුවෘත්ත විසිඅටකින්හා තුණක් ලඝු පසක් ගුරුවෘත්ත පණස්සයකින්හා සතරක් ලඝු සතරක් ගුරුවෘත්ත සැත්තෑවකින්හා පසක් ලඝු තුණක් ගුරුවෘත්ත පණස්සයකින්හා සයක් ලඝු දෙකක් ගුරුවෘත්ත විසිඅටකින්හා සතක් ලඝු එකක් ගුරුවෘත්ත අටකින්හා ප්‍රඥාර කොට්ප්‍රාප්තතැන් දන්නා සවිටලඝුවෘත්ත එකක් ඇතුළුව දෙසිය පණස්සයක් පමණ වෘත්ත සඞ්ඛ්‍යාවක් ඇත්තාවූ "උක්තාය අත්‍යුක්තාය" යනාදින් දක්වන ලද එකාක්ෂරයෙහි පටන් සවිසිවන අක්ෂරය දක්වා සවිස්සක් පමණ ජාතීස් අතුරෙන් අනුෂ්ටුබ් නම් ජාතියෙහි සවිසිවන තැනින්

පළමුවන විෂම පාදය හා එකුනානූවන තැනින් දෙවන සමපාදය හා එකුන් තිස්වනතැනින් නූන්වන විෂමපාදය හා දෙසානූවනතැනින් සතරවන සමපාදයහා සතරසථානයෙකින් පාද සතර උදාහරණ,

"සමෙසු සිඛුතෝ ජෙන පථ්‍යාවත්තනං පකිත්තිතං" ඉතුගෙයින් සම පාද ශ්‍රගලගෙනි සතර වර්ණනයකින් පරව ජගණයක් කරණකොට ගෙණ පථ්‍යාවක්‍රත්‍රනම් වූ අර්ධසමවෘත්තයට නගා යගණ සගණ මය ගුරුලයකින් පළමුවන පාදයහා ආද්‍යන්තගුරු දෙකක්හා ජගණවයකින් දෙවන පාදයහා නගණ සගණවය ගුරුවයකින් නූන්වන පාදයහා ආද්‍යන්තලඝු ගුරුවයහා භගණජගණවයකින් සතරවන පාදයහා පාද සතර සම්බන්ධවූ ගණඅටකින්ද අක්‍ෂරදෙනිසකින්ද මාත්‍රා එකුන් පණසකින්ද ගුරුසතලොසකින්ද ලඝු පසලොසකින්ද විශ්‍රාම සතරකින්ද වගීනාක්‍ෂර එත්විස්සකින්ද අවගීනාක්‍ෂර එකොලොසකින්ද අසොෂාක්‍ෂර නවයකින්ද සොෂාක්‍ෂර තෙවිස්සකින්ද කණ්ඨජාක්‍ෂර සයකින්ද තාලුජාක්‍ෂර සතරකින්ද මූර්ධජාක්‍ෂර සයකින්ද දන්තජාක්‍ෂර දසයකින්ද ඔෂ්ඨජාක්‍ෂර සතරකින්ද දන්තොෂ්ඨජාක්‍ෂර දෙකකින්දැයි මෙසේ වර්ණවිශෙෂයන් මිශ්‍රවූ විෂම පාද විෂම මාත්‍රා විෂම වෘත්ත විෂම ගුරු විෂම ලඝු විෂම පාද සතරක් සම්බන්ධකොට කියනලද මේ ගාථාවෙහි අභිප්‍රායනම්.

සකල සත්වයන්කෙරෙහි පතළ මහාකරුණා ඇත්තාවූ විනෙය ජනයන් කෙරෙහි කළ කරුණාවෙන් දිවකුරු බුදුන් සමයෙහි අතට පත් නිවන් හැර භවදුඃඛයට වැද සමතිස්පෙරුම් පුරා බුදුව සකල ඥෙය සාගරයාගේ පරතෙරට පැමිණියාවූ නානානයනිපුණ ගම්භීර විචිත්‍රදෙශනා ඇති සර්වලොකෙකනාථවූ භාග්‍යවත් බුදුරජානන්ව හන්සේට නමස්කාර කෙරෙමිහි කියා සර්වජනහෘදයානන්දකර භාග්‍යවත් බුදුරජානන්වහන්සේට කරණලද නමස්කාර ඇතිව සකලවිප වාසින්ට වැඩපිණිස ගම්භීරවූ ගාථාපදත්‍රීයන්ට අටුවාහා ඒ ඒ වැකුන්ට නිදානාදිවශයෙන් විසතරකොට අර්ථවර්ණනා කළසේක, එබැවින් මේ විමානවත්ථුප්පකරණය සිංහලභාෂාවෙන් ප්‍රකාශකරන්නාවූ අප විසින්දු පූර්වාචාරිවරයන්ගේ වචනානුකූලව "නිත්‍යෝත්සාහපුරස්සරා ඒව මධිතපදෙදුහරණමඛ්‍යාහාරඃ" යනුගෙයින් අධ්‍යාහාරවශයෙන්ද ක්‍රියාවචසින් කර්තෘකර්ම දෙක ප්‍රකාශකරණහෙයින්ද මේ ගාථාවෙහි "විචිත්‍රනයදෙසනා" යන පදයෙහි දෙශනාක්‍රියාවට කර්තෘ බැවින් "විචිත්‍රනයඳදෙසනා එතස්‍ය" යන්නෙන් බුඬරත්නයද එම දෙශනාක්‍රියාවට ශුද්ධසු කර්මවශයෙන් ධර්මරත්නයද ඒ ධර්මදෙශනාව මහාකරුණෙන් පිළිගෙණ එහිවූ පරිද්දෙන් පිළිපැදීමට නිසිකෙණෙකුන් නැතිව දෙශනාව නොපවත්නාබැවින් එම දෙශනාක්‍රියාවට නිමිත්තාවූ සංඝර

තනයද යන මේ ත්‍රිවිධරත්නයම මේ පදද්වයෙහි සඞ්ඛෘතීතබැවින් පුරාතනමහොත්තමයන් කි එකාගාථාවෙහි අන්තිමපදද්වයෙන් ත්‍රිවිධරත්නයට නමස්කාරපිණිස.

සකලජනහිතො යො පාණිලෙනං විහාය
සිවමිව භාවත්තා ලොකසන්තාරහෙතු,
අතුලවිභවවාගො පාරමිපූරිතො තං
සුගතමහතිවන්දෙ අග්ගසබ්බොධිපත්තො.

සිංහල සඞ්ඝයන්ට වැඩ කැමැත්තාවූ එම කරුණාවෙන් අනාථ පාණිවන් හැර ලෝවැසියන් සසරසුරෙන් එතරකිරීම හෙතුකොට ගෙණ සංසාරසාගරය නිර්වාණයයේ සිතා සංසාරයට පැමිණ අවශෙෂ සඞ්ඝයන්විසින් නොකොටහැකිබැවින් අසදෘශ මහත් වරධනපරිත්‍යාග ඇතිව යම් විශිෂ්ටපුරුෂොත්තමකෙණෙක් සම්‍යක්සම්බුද්ධත්වයන් පිරූයේක්ද එසින් අග්‍රවූ සම්‍යක්සම්බුද්ධත්වයට පැමිණියේද ඒ සකලක්ලෙශ සාගරපාරගත විසිතුරු දෙශනාඇති සර්වඥරාජොත්තමයානන්වහන්සේගේ ශ්‍රීපාදද්වන්ද්වයට නමස්කාරකෙරෙමි.

සොමන සිතලගුණෙන පහංකරෙන
තෙජෙන දෙසිතමහාමුනිනා පණීතං,
ධම්මඤ්ච තස්ස මුනිනො සුතපුඤ්ඤබෙත්තං
වන්දාම සංඝපවරං අමලං විසුඛං.

සිහිල්ගුණයෙන් චන්ද්‍රයාවැනිවූ තෙජොගුණයෙන් සූර්‍යයාවැනිවූ මහර්ෂිවූ බුදුන්විසින් දෙසනලද උත්තමවූ ධර්මරත්නයටද ඒ බුදුන්හේ ඖරසපුත්‍රවූ මනාපින්කෙත්වූ කෙලඟමලරනිතවූ එසින් පිරිසිදුවූ උතුම්සංඝරත්නයටද නමස්කාරකෙරෙමි.

එවං ගුණගහරතනත්තයමත්තකෙන
වන්දිත්ව තස්ස රතනත්තයතෙජසා මෙ,
හුත්වා ඝනත්තරුපසඟහනාමධෙයොඅහං
වක්ඛාමි සිඟලගතෙහි විමානවත්ථුං.

ගුණයෙන් අග්‍රවූ ත්‍රිවිධරත්නයට මෙසේ නමස්කාරකොට එසින් ජනිතවූ ඉෂ්ටවිපාකයෙන්ද ඒ ත්‍රිවිධරත්නයාගේ තෙජසින්ද නයභාලද සර්වඥතරාදියොපදුව ඇතිව මාගේ උවදුරු නැසුබැවින් සම්පූර්ණාරෝගියෙන් නිරොගිව මේ විමානවත්‍යුත්ප්‍රකරණය හෙළබසින් සාක්ෂෙපයෙන් කියමි.

මේ විමානවත්‍යුදෙශනාව වනාහි මහාසමුද්‍රයයේ ගම්භීරවූ දෙශනා ඇත්තේය, ඒකෙසේවූ දෙශනාවෙක්දයත්? ගංගායමුනාදී නොයෙක්

ගංගාජලප්පවාහය යම්සේ ඒඒ ගඟදියපමණින් අනුක්‍රමයෙන් ගැඹුරු ගැඹුරුව ගොස් මහාසමුද්‍රයට පැමිණ අනිගමනීරව ගොස් කිසිවක්ම වත් අවිසයව සිටිද එමෙන් මේ ධම්මදෙශනාවද ඒ ඒ දෙවතාවන්ගේද නුවනපමණින් ප්‍රකාශකොට කියනලද දෙවභාෂිතහා අග්‍රශ්‍රාවක මහා ශ්‍රාවකභාෂිතහා එක්ව ගැඹුරුගැඹුරුව ගොස් තුන්ලෝවාසි කිසිකෙණකුන්ටත් අවිෂයවූ අනිගමනීරවූ සර්වඥභාෂිතයට පැමිණ අනිගමනීරදෙශනාත්‍වඇත්තේය. එසේහෙයින් අපවැන්නවුන්විසින් පාලිඅර්ථය පෙරළා එළවට නගා අර්ථවර්ණනා කෙරෙමිහි සිතිමනම් සිදුහතුකර ඛුවක් ගෙණ මුහුදුදිය ඉස්නට උත්සාහකරන්නාක්වැන්න, තණදණඩක් ගෙණ පොළොව පෙරළන්නට උත්සාහ කරන්නාක්වැන්න, එතකුදුවුවත් මහත්වූ මැණික් ආකරයක් දැක ඒ මැණික් ආකරය සැමනිමවාගත නොහැකිවූවත් එක මැණිකක් පමණවත් ගත්කෙණකුන්ට සිතුසිතු සමපත් පහළවනහෙයින් වැඩක්ම විනා අවැඩක් නැත්තාසේ මේ ධම්මදෙශනාවද විසතරවශයෙන් ප්‍රකාශකොට ලිය නොහැක්කේවිනමුත් එකගාථාපදයකින්වත් ඛණ කිවන්ටත් ඛණ ඇසුවන්ටත් නිවන්සමපත් අවසන්කොට ඓහලෞකිකපාරලෞකිකාභිවෘඩ්ධිනයට හෙතුවන්පෝය. එසේහෙයින් හෙළුහාෂා පමණක් දන්නා ශ්‍රද්ධාවන්ත සත්පුරුෂයන්ට වැඩපිණිසත් පූර්වාචාරිවරයන් කියමකින් ආත්මාර්ථ. පරාර්ථවශයෙන් සඛගීතමොක්ෂසමපත් සාධාරනකොට වැයි සිතා මේ විමානවත්‍ථුප්පකරණය හෙළුබසට නගා සංක්ෂෙපයෙන් වර්ණනා කෙරෙමි. ලඝුකොට නොසිතා අන්‍යවිහිත නොව එකඟවූ සිතින් ඛණ අසා සඛගීතමොක්ෂසම්පත් ලබන්ට උත්සාහකටයුතු.

එහි පිළිවෙළ කථාව මෙසේ දතයුතු.

විශෙෂයෙන්ම දෙවතාවන්ගේ ක්‍රීඩාවට නිවාසස්ථානවූ ඒ ඒ දෙවභාවන්ගේම සුචරිතකර්මයෙන් උපන්නාවූ ගොදුන් දෙගොදුන් ආදි ප්‍රමාණවිශෙෂයෙන් නානාරත්නයෙන් විරාජමානවූ විසිතුරුවිමාන වර්ණසණ්ඨානාදි ශොභාසිරය සමපත්තියෙන් යුක්තහෙයින් විශෙෂනාමයෙන්ද, "පිඨත්තෙ සොවණ්ණමයං උළාරං" යනාදිවූ අනෙකනයදෙශනාවශයෙන් පවත්වනලද ඒඒ දෙවතාවන්ගේ රූපශොභාපරිවාරාදි සමපත් ඉපදීමට නිසි කුශලකර්මය නිසා මේ දෙශනාවගේ පැවැත්වීමහෙයින්ද කර්මවිපාකයට ප්‍රධානහෙයින්ද විමානවත්‍ථුනාම්වූ මේ දෙශනාව වනාහි පුබ්බාගාථා විස්සජ්ජනාගාථාශයි ත්‍රිප්‍රකාරවත් නොහ. එහි විස්සජ්ජනාගාථා ඒඒ දෙවතාවන්විසින් කියදවස කරණ

ලද කුසල් ප්‍රකාශකොට කියනලදුහ. පුවජාගාථා වනාහි බුදුන්විසින්ද ශක්‍රාදීන්විසින්ද මහාශ්‍රාවකයන්විසින්ද කියනලදුහ. තවද චිනියශ්‍රාවකවූ මුගලන්මහතෙරුන්වහන්සේ දෙවොරිකාවෙන් දෙව්ලොවට වැඩ ඒඒ දෙවතාවන්විසින් යටගියදවස කරණලද කුශලකර්මයන් එසින්ලත් සිරිසැපත් විචාරා නැවත බුදුන්ට දන්වා බොහෝසේම ප්‍රකාශකරවූසේක—හේ කෙසේදයන්?

ජනකුමුදවිකාසනභාස්කරදෙසුසාහිතවූ සර්වඥරාජොහනමයානන්ව හන්සේ මේ මහාභද්‍රකල්පයට විසිඅසඞ්ඛ්‍යකප්ලක්ෂයකින් යට මනොප්‍රණිධානයට පළමුවන නානුනම් අසඞ්ඛ්‍යයෙහි පහළවූ බ්‍රහ්මදෙවනම් බුදුන්සමයෙහි කාරකණ්ටකනම්නුවර අතිදෙවනම් රජව බුදුන් දැක භවගත්තාවූ ප්‍රීතියෙන් මත්ව මතුමහල්තලයෙන් බිමට බැස පැන පෙනිදහසක් ඇතිව රථසකස්සා පියුමක් පැනනැහි පාපියුම් පිළිගත් කල සුවසේ බුදුන්කරා එළඹැ විසිතුරු මහපියුම් තුණක්ගාසමග නොයෙක් රත්නයෙන් පූජාකොට පසඟපිහිටුවා වැඳ ලොවුතුරාබුදුවෙම්වයි සිතින් පතා එතැන්පටන් මනොප්‍රණිධානය පිරිමෙන් සත්‍යාසඞ්ඛ්‍යය ඇතුළත ලොව පහළවූ එක්ලක්ෂපස්විසිදහසක් සර්වඥයන් දැක මනොප්‍රණිධානය මහත්කප්‍රාර්ථනාකළසේක.

එසින් වදුළහ.

"තෙසු සත්තසඞ්ඛ්‍යෙසු ජාතා ලොකෙකනායකා,
පඤ්චවීසසහස්සා ච ලක්ඛමෙකං භවෙකතො.
එත්තකානං මහෙසීනං මනසා පත්ථතෙ තදා,
දුනෙන මෙ සමො නත්ථි එසා මෙ දානපාරමී"ති.

ඉක්බිති මේ කල්පයට තෙළසාසඞ්ඛ්‍යකප්ලක්ෂයකින් යට වාග්ප්‍රණිධානයට පළමුවන සර්වභදුනම් අසඞ්ඛ්‍යයෙහි ධඤ්ඤවතිනම්නුවර සාගරනම් සක්විතිරජව රත්නදුන්හරින් ප්‍රාසාදලක්ෂයක් කරවා පුරාණගොතමනම් බුදුන්ට පිළිගන්වා සවාමීනි නුබවහන්සේමෙන් ශාක්‍යරාජවංශයෙහි ඉපිද ගොතමනම් බුදුව සුවිසිඅසංඛ්‍යයක් සතුන් සසරින් මුදවම්වයි කියා වාග්ප්‍රහෙදප්‍රාර්ථනාව කොට එතැන්පටන් නවාසංඛ්‍යය ඇතුළත පහළවූ තුන්ලක්ෂසතාසූදහසක් බුදුන් දැක මහදන් පවත් වා වාග්ප්‍රහෙදප්‍රාර්ථනාව මහත්කප්‍රාර්ථනාකළසේක.

එසින් වදුළහ.

"තෙසු නවඅසඞ්ඛ්‍යෙසු ජාතා ලොකෙකනායකා,
තිණ්ණිසතසහස්සානි සත්තාසිතිසහස්සෙ ච.
එත්තකානං මහෙසීනං වචසා පත්ථතෙ තදා,
දුනෙන මෙ සමො නත්ථි එසා මෙ දානපාරමී" ති.

මෙසේ මනොවාන්ප්‍රණිධානය පිරීමෙන් සොළසාසංඛ්‍යය ඇතුළත පහළවූ පස්ලක්ෂදෙලොස්දහසක් බුදුවරයන්ට මහදන් පවත්වා පුරණ ලද මනොවාන්පෙරුම්ඇති මහබෝසතාණෝ මේ කල්පයට සාරාස ඛ්‍යකප්ලක්ෂයකින් ඉට සාරමණ්ඩනම් කප දිපඞ්කරබුදුන් සමයෙහි සුමෙධතාපසව නියතව්‍යාකරණලදින් එතැන්පටන් සාරාසඛ්‍යකප් ලක්ෂයක්මුලුල්ලෙහි සම්භාරධර්මයන් පිරීමෙන් සූර්සිබුදුකෙ ණෙකුන් දැක සූරිසිසූජාවක් කොට සූර්සිව්‍යාකරණත් ලදින් කෙළවර වෙ සසන්තරව උපන් ජාතියෙන් තුසිපුර පැමිණ දෙවුබඹුන්ගේ ආරාධනා වෙන් කිඹුල්වත්පුර ඉපිද වැඩිවිය පැමිණ සක්විතිරාජ්‍යය හැර පැවිදිව බොධිපර්‍යඞ්කාරූඪව ලොවුතුරාබුදුව දම්සක් පවත්වා වෙළුවනාදි ග්‍රොධාරාමජෙතවනාදි නොයෙක් විහාර පිළිගෙණ සූර්සිඅසංඛ්‍යයක් සත්වයන් භවකුන්නාරයෙන් එතරකරවනසේක.

එසමයෙහි මුළුදඹදිව එකමගුල්ගෙයක්මෙන් ශාරිපුත්‍රමොග්ගල්‍යාය නාදිඅසීතියසිපුදගලමහාසංඝයාවගත්සේවිසින් අලඞ්කෘතවිය, ඒ සැරි යුත් මුගලන් දෙදෙනාවහන්සේ වනාහි මේ මහාභද්‍රකල්පයට එකාස ඛ්‍යකප්ලක්ෂයකින් ඉට අනොමදස්සිනම් බුදුන්සමයෙහි සැරියුත්සා මින් සරදනම් තාපසව ආශ්‍රමයට වැඩි බුදුන් දැක වනමුල් ඵලාහාරවලද වා සතරගව්වක් උස මලස්නෙක බුදුන් වඩාහිඳුවා තුන්ගවුඋස මලසුන් වල අගසවු දෙදෙනා වඩාහිඳුවා ගවුදෙගවුඋස මලසුන්වල සෙසුලක්ෂ ඝක් රහතන් වඩාහිඳුවා බුදුන් සිරසට මල්කුඩයක්මවා ඒ කුඩය අන්න් අල්වාගෙණ සත්දවසක් නිරාහාරයෙන් බුබාලඹනප්‍රීතින් සිට ධ්‍යාන සුවයෙන් වැඩහුන් බුදුන්ට මෙසේ පූජාකොට බුදුකෙණෙකුන්ට අග්‍රශ්‍රා වකවෙම්වයි ප්‍රාර්ථනා කළසේක.

එසමයෙහි මුනලන්මහතෙරුන්වහන්සේ සරදනාපසයන්ගේ හිහි යහළුවූ සිරිවඩ්ඪනනම් සිටුනු මෙපවත් අසා යහළුවානන් කළ ප්‍රාර්ථ නාව මමත් කෙරෙමියි සිතා නිලුපුල්මණ්ඩපයක් නිමවා බුදුන්ප්‍රධා නවූ එක්ලක්ෂසුසැත්නෑදහසක් රහතන් පවරා සත්දවසක් දන්දී බුදු කෙණෙකුන්ට විතියශ්‍රාවකවෙම්වයි ප්‍රාර්ථනාකළසේක.

මෙසේ දෙදෙනා එක්ව කළ කුසලයෙන් එකාසඛ්‍යකප්ලක්ෂයක් ඔවු නොවුන් මිනිදිමය රඤ්ඤොට අපබුදුන්සමයෙහි බමුණුමහසල්කුල යෙහි ඉපිද දෙවුකුමරුවන්සේ වැඩිවිය පැමිණ නොයෙක් සම්පත් හැර බුදුන්කරා එළඹැ පැවිදිව උපසම්පදා අගතනතුරු ලදින් සැරියුත්මුග ලන්දෙදෙනාවහන්සේයයි හිරුයදුසේ ප්‍රසිඩවූහ.

ඒ අගසවුදෙදෙනාඅතුරෙන් ෂට්අභිඤ්ඤා සිවුපිළිසිඹියාපත් රහත්ඛීණ යෙන්නා සියලුශ්‍රාවකාඥනයාගේ මුඛකප්‍රාපනසඞ්ඛ්‍යාතුන්නෙරෙහි අග

තැන්පත් විතීයශ්‍රාවකවූ මුගලන්මහතෙරුන්වහන්සේ එන්දවසත් සකලසත්ත්වයන්කෙරෙහි පතළකරුණා ඇතිව සිහිනුවනින් සෙදිරහොගතව ඛ්‍යානසුවයෙන් වැඩහුන්සේක. එසේ වැඩහුන්නාවූ ආයුෂ්මත්මුගලන්මහතෙරුන්වහන්සේට මෙබඳු සිතෙක් පහළවිය.

හේ කෙසේදයත්? දෙවුලොව දෙවතාවෝ මිනිස් ලොවදී නමනමන් ගේ ගෞරවනීවූ පරිදෙන් පහන්සිත්ඇතිව දුනාදිකුසල් නොට දිව්‍යලොකයෙහි ඉපිද උදුරවූ මනන්සම්පත් අනුභවකරණපරිදි සියලු මනුෂ්‍යයෝ විශෙෂයෙන්ම දන්නාහුවීනම් බොහෝසේ කුසල් නොට සිහිනොමොක්ෂ සම්පත් සාදාගණිත්මය එසේහෙයින් දෙවචාරිකාවෙන් දෙවුලොවට ගොස් කම්මානුරූපවූපරිද්දෙන් උදුරසම්පත් අනුභවකරණ දෙවතාවන්අතින් කම්මඵලවිචාරා ඔවුනොවුන්ලවා කුසල් ප්‍රකාශකරවා ඒ දෙවතාවන් සාක්ෂිකොටගෙණ බුදුන්ට දැන්වූයේවීමිනම් බුදුහු ආකාශතලයෙහි පූර්ණචන්ද්‍රයා නහා දක්වන්නාසේ මනුෂ්‍යයන්ට කම්මඵල ප්‍රත්‍යක්ෂකොට බණ වදරණසේක, එකල්හි සවලමානවූ කුශලකම්මය පවා ශ්‍රද්ධාසමාධියෙන්හා චිත්තප්‍රසාදසම්පත්තියෙන්ද ක්ෂෙත්‍රශුද්ධියෙන්ද උදුරතරවූ මහත් ඵලමහානිසංසවන පරිදි හඟවා ප්‍රකාශකෙරෙමින් ඒ ඒ විමානවයහු අත්තොතපත්තිකොට මහත්ධම්මදෙශනා පවත්නිය. ඒ ධම්මදෙශනාතොමෝ දිව්‍යමනුෂ්‍යයන්සහිත බොහෝ සත්ත්වයන්ට වැඩ පිණිස වන්නියගි සිතා වදරා මුගලන්මහතෙරහු ශ්‍රීයහන්මයන කයෙන් නැගි සිට සඤ්ඤාවලාවක් අඳුන්කුලවට දිවන්නාසේ දෙපට හඳනා සිවුර වැලඳ ඉඳුනිල්මිණ්කුළක් සවණ්ණකම්බලයකින් වසන්නාසේ උත්තරාසංගය එකාංග කෙරෙමින් මනාකොට හැඳපොරවා හාත්පසින් ජාතිනිඟුල් රසධාරාවිසුරුවන්නාක්මෙන්ද සඤ්ඤාවලාහා විදුලිවැලඳ ගමන්ගන් අඤ්ජනකූටපර්වතයක්සේ බුදුන්ගරා එලඹැ නවයාකාරකොට එකත්පස්ව හිඳ තමන්ගේ අභිප්‍රාය බුදුන්ට දන්වා අවසරගෙණ හුනස්නෙන් නැගි බුදුන් වැඳ ප්‍රදක්ෂිණාකොට ඉන්බිති අභිඥාපාදකචතුර්ථධ්‍යානයට සමවැද සමාපත්තියින්නැගි සෘඞ්බලයෙන් එකෙණෙහිම තවුතිසාභවනයට පැමිණ ඒ ඒ දෙවතාවන් විසින් රැස්කරණලද කුශලකම්මඵලවිචාරා දෙවතාවෝ ඔවුනොවුන් කළ සුචරිතධම්මයන් ප්‍රකාශකොට කිකල මිනිස් ලොවට අවුත් පුවඟා විඤ්ඤාණදෙක එක්කොට සියලුම පවත් බුදුන්ට දන්වනසේක බුදුහු මෙම අත්තොතපත්තිකොටගෙණ භික්ෂූන්වහා සම්ප්‍රාප්තපරිසට විසතර වශයෙන් බණ වදරණසේක. ශක්‍රාදින්විසිනුදු එසේම විවාරා පැන විසඳුන් එක්කොට තෙරිඳුන්ට දැන්වූකල මහතෙරහු සුගත්හට දන්වා ප්‍රකාශකරවනසේක.

මෙබඳු ක්‍රමයෙන් මුනිලන්මහතෙරහු සඟකරුණාවෙන් බොහොසේ විමන්වත් ප්‍රකාශකරවූසේක. බුදුන් පිරිනිවිකල මහාකාශ්‍යපාදි මහාස්ථවිරයන්වහන්සේ විනයසූත්‍රාභිධම්ම සඞ්ඛ්‍යාත ත්‍රිපිටකධර්මය සංගායනාකරණකල්හි ධර්මභාණ්ඩාගාරික ආයුෂ්මත්ආනන්දස්ථවිරයන් වහන්සේ ජේතවනවෙළුවනාදි ඒ ඒ තන්හි ප්‍රකාශවූ නොයෙක්විමානවස්තූන් එක්කෝට විමානවත්‍ථූයයි කියා සඞ්ග්‍රහයට නගා සූත්‍රපිටකයෙහි කුද්දකනිකායට අන්තර්ගතකොට ගාථාඛ්‍යයෙන් සංග්‍රහ නාකර වදාළසේක. ඊට අනතුරුව මේ ලක්දිව මහාවිහාරවාසි ධර්මපාලනම් මහාස්ථවිරයන්වහන්සේ මහාශ්‍රාවකයන්ගේ අභිකථානුසාරයෙන් සකලත්‍රිපිටකාරූඪ වැඩපිණිස ඒ ඒ වස්තූන්ට නිදානාදි විභාග විශේෂවශයෙන් අර්ථවර්ණනාකොට විමානවත්‍ථුප්‍රකරණය කළසේක.

ඒවනාහි වයිනවශයෙන් පීඨවගීනය චිත්තලතාවගීනය පාරිවජ්ඣක්වගීන්ය මාණෙඤ්ඡඨිකවගීනය මහාරථවගීනය පායාසිවගීනය සුනික්ඛිත්තවගීනයයි යනමේ සප්තමහාවගීනයකින් ප්‍රතිමණ්ඩිත විය. එසින් පළමුවන පීඨවගීනයෙහි සතළොසක් වස්තූකථාවෝය, දෙවන චිත්තලතා වයිනයෙහි එකොළොසක් වස්තූකථාවෝය, තුන්වන පාරිවජ්ඣකවයිනයෙහි දසයක් වස්තූකථාවෝය, සතරවන මාණෙඤ්ඡඨිකවගීනයෙහි දෙළසක් වස්තූකථාවෝය, පස්වන මහාරථවගීනයෙහි තුදුසක් වස්තූකථාවෝය, සවන පායාසිවගීනයෙහි දසයක් වස්තූකථාවෝය, සත්වන සුනික්ඛිත්තවගීනයෙහි එකොළොසක් වස්තූකථාවෝය, මේ සප්තමහාවගීනයෙහි සඞ්ගෘහීත අතුරුවිමානවස්තූන්හැර පසාසූවක් වස්තූකථාවෝය, අතුරුවිමන්වත්හාසමග එක්සිය විසිතුණක් වස්තූකථාවෝය. මේ මෙසේ එක්දුස්පන්සියයක් ගාථාවශයෙන් ප්‍රකාශකොට වදාරණලද්දවූ එක්සියවිසිතුණක් පමණ වස්තූකථාවන්අතුරෙන් පීඨවගීනයෙහි පළමුවන යවණිණපීඨවත්‍ථුවනම් කවරයත්?

එහි පිළිවෙළකථාව මෙසේ දතයුතු.

ත්‍රිභුවනෛකනිලකසකලඥෙයසාගරපාරගතාශෙෂනෛකගුණරතනමන්දිරාශමානවූ සම්‍යක්සම්බුඛඝ්වඥරාජෝත්තමයානන්වහන්සේ සැවැත්නුවර ගොදුරුගම් කොට දෙවුරම්වෙහෙර වැඩවසනසමයෙහි පසෙනදි කොසොල්රජ්ජුරුවන්විසින් බුදුපාමොක්මහාසංඝයාවහන්සේට සත්දවසක්මුලුල්ලෙහි අසදෘශමහාදානය දවසින් දවස වඩවඩා පැවැත්වූකල්හි අනේපිඬුමහසිටානන්හා විසාකාමහඋපාසිකාවන්හා නුවරවාසින්විසින් තුන්දවසක් මහදන් පැවැත්වූහ. මෙසේ රජ්ජුරුවන්හා මහජනයාවිසින් අසදෘශමහාදානය දුන්කල්හි ඒ අසදෘශමහාදානයාගේ ප්‍රවෘත්තිය සියලුදඹදිවමුලුල්ලෙහි ප්‍රසිඛවිය. එකල්හි මහජන

යෝ කියන්නාහු කරණලද මහත් උදුරතර දානපරිත්‍යාගයෙන්ම එල මහත් වේද නොහොත් තමාගේ ශක්තිපමණින් කරණලද දාන පරිත්‍යාගයෙනුත් එල මහත් වේදැයි යනවේ කථාව ඉපදවූහ. මේ වවනය ඒ ඒ තැන කියන්නා අසා භික්ෂූන් බුදුරජානන්වහන්සේට දැන්වූහ. එකල දානයෙහි අනුසස් ප්‍රකාශකොට වදාරණ බුදුරජානන් වහන්සේ–

"න භික්ඛවෙ දෙය්‍යධම්මසම්පත්තියා ච දානං මහප්ඵලතරං භවිස්සති අථඛො චිත්තාපසාදසම්පත්තියා ඛෙත්තසම්පත්තියා ච තසමා කුණ්ඩ කමුසිමත්තමපි පිලොතිකමත්තමපි තිණසන්ථාරපණ්ණසන්ථාරමත්ත මපි පූතිමුත්තහරිටකමත්තමපි විපුසඤ්ඤෙන චෙතසා දානබිණෙ යාපුගහලෙ පතිඨාපිතං මහප්ඵලතරං භවිස්සති මහාජුතිකං මහාවි පඵාරන්ති"

යනවේ පාඨයෙන් මහණෙනි දෙය්‍යධම්මසම්පත්තියෙන්ම එල මහත් වන්නේ නොවෙයි, චිත්තප්‍රසාදසම්පත්තියෙන්ද ක්ෂෙත්‍රසම්පත්තියෙන්ද එල මහත්වෙයි, එසේහෙයින් කුඩුම්බරිඹ පමණවත් කල්හිස රෙදිකඩත් පමණවත් තෘණසන්ථාර පර්ණසන්ථාර මාත්‍රයක්වත් හොඳින් අර එවක් පමණවත් යම්කිසිකෙණෙකුන් පිහින් පහන්සිත් ඇතිව දක්ෂිණාගියන්කෙරෙහි පිහිටුවා දෙනලද්දේවිනම් මහත් එල මහානිසංස වෙයි මහාජුතිකවෙයි මහාවිපඵාරවෙයි හෙවත් ආයුබලවර්ණාදිවූ මහත් විසාරදවූ සම්පත්තියෙන් ජෙතිමත්ව බබලන්නේයයි වදාළසේක.

එකල්හි මේ ධර්මකථාප්‍රවෘත්තිය සකලජම්බුවිපය මුලුල්ලෙහි පතළ විය. එසමයෙහි මනුෂ්‍යයෝ යථානුරූපවූ පින් සදහා මහණ බමුණන්ටහා නොයෙක් දුගිමහියාචකයන්ට දන් දෙති; ගෙහාඛහන වල පැන් එලවා නබති; වාරකොෂ්ඨවල අසුන් පණවා නබති. එසමයෙහි එක්තරා පිණ්ඩපාතිකතෙරකෙණෙකුන්වහන්සේ යහපත් සොට හැඳ පෙරව පාත්‍රය අතින් ගෙණ ඉදිරිප්පු නොබලා වියදඬු පමණින් බිමට නතුකරණලද ඇස් ඇතිව ඊර්ෂ්‍යාපථසම්පන්නව සන් සුන් ලීලාවෙන් එක්තරා හෙදෙරකට පැමිණිසේක. ඒ ගෘහයෙහි වසන්නාවූ ශ්‍රද්ධාසම්පන්නවූ එක්තරා කුලදියනියක් තෙරුන්වහන් සේ දැක බලවන්ම හටහත්තාවූ ගෞරව බහුමාන ඇතිව උදුරවූ ප්‍රීති සොම්නස් උපදවා පසඟ පිහිටුවා වැඳ තමන් හිඳිනා පුටුව මත්තෙහි රන්වන් වයනුයක් අතුට ආසනය පණවා දුන්නිය. තෙරුන්වහන්සේ පණවනලද ආසනයෙහි වැඩහුන්කල්හි ඕනොමෝ මට මෙහි උතුම්වූ පින්කෙනක් පහළවියයි පහන්සිත් ඇතිව ශක්තිවූ පරිද්දෙන් අහර පිළියෙළකොට තෙරුන්වහන්සේට පිළිගන්වා විජඨිපනු

යක් අතින් ගෙණ පවන් පූජාකළාය. ඉක්බිති කරණලද අහරකිස ඇති තෙරුන්වහන්සේ ආසනදන භොජනදනාදි ප්‍රතිසංයුක්ත ධම්ම කථාවෙන් බණ වදාරා වැඩසේක.

ඒ සත්තොමෝ ඇගේ දනයද ධම්මකථාවද ප්‍රත්‍යවෙක්ෂාරන්නී ප්‍රීතියෙන් පිරුණාවූ ශරීර ඇතිව ඒ පිඬයද විහාරයටම දුන්නිය. එයින් පසු නොබෝ කලන් ගියකල එක්තරා රොගයකින් පෙළෙන ලද්දී කාලක්‍රියා කොට ඒ කුශලානුභාවයෙන් තවුතිසාභවනයෙහි දෙලොස් යොදුන් රන් විමනෙක උපන්නිය. පරිවාරඤ්ඤු දහසක් පමණවූහ.

නවද පිඬදනානුභාවයෙන් විමානයෙහි සතරඟවු පමණ සවණ්ණ පඤ්ඤකයෙක් පහළවිය. ඒ පඤ්ඤකය වනාහි ආකාශචාරිව ශිඝ්‍රවූ ජව ඇත්තේය මත්තෙහි කූටාගාර සටහන් ඇත්තේය. එසේහෙයින් ඒ විමානයද පිඬවිමානනම් විය. පෙර තමන් පුටුව දෙන දවස පිත වණ්ණ වස්ත්‍රයක් අතුට දුන් හෙයින් කම්මසාදුග්‍ය වශයෙන්ම කුශලය විභාගකොට දක්වන්නාසේ ඒ පඤ්ඤකයද සවණ්ණමය වූයේය. ප්‍රතිග්‍රාහකයන්ගේ ගුණ බලවත් හෙයින් ශිඝ්‍රවූ ජව ඇත්තේය. දැක්ෂිණාගී පුද්ගලයාහට සින් රුචිවශයෙන් දුන්හෙයින් යථාරුචිවූ ගමණින්හා ප්‍රසාදසම්පත්තියෙන්ද උදුරතරව සවිධප්‍රකාරයෙන්ම ඒ දෙවුදුවගේ හා දුටුදුටුවන් සින් සතුටුකරවන්නාවූ ප්‍රසාද වහන්නාවූ ගොහාති ගාඝසම්පත්තියෙන් යුක්තවූයේය. ලොභයෙන් දුරුව ශ්‍රද්ධාසමාධිකුණ යෙන් යෙදී දුන්හෙයින් යවණ්ණවණ්ණ විය. දෙෂයෙන් දුරුව ප්‍රඥා සමාධියෙන් යෙදී දුන්හෙයින් උදුරතර විය. මොහයෙන් දුරුව දන් දෙමියි විසඳී උපදවා සමාධියෙන් දුන්හෙයින් මනොමය ජවඇතිව මනා පඤ්ඤානයකට උපතතවේ. මේයේ ඒ දිව්‍යාඞ්ගනාතොමෝ කම්මානුරූපවූ පරිද්දෙන් ඔහත්වූ ශ්‍රීසෞභාග්‍යයෙන් මහත්වූ දිව්‍යශ්‍රීසම්පත් අනුභවකරන්නිය.

එසමයෙහි දෙවියන්ගේ එක්තරා උත්සවදිනයෙක දෙවතාවන් අතුරෙහි යම් දිව්‍යලීලාවෙක් දිව්‍යාලඞ්කාරයෙක් දිව්‍යානුභාවයෙක් ඇද්ද එබඳුවූ දිව්‍යලීලායෙන් දිව්‍යාලඞ්කාරයෙන් දිව්‍යානුභාවයෙන් දිලිහි දිලිහි උයන්පෙළි පිණිස නන්දනොද්‍යානයට යනකල ඒ දෙව තාදුවද සුන්දරවූ දිවසළුවක් හැඳ එසෙයින්ම දිවසළුවක් එකාංශ කොට දිව්‍යාභරණයෙන් සැරසි දහසක් දිව්‍යඅප්සරාවන් පිරිවරා සවකීය දෙලොස් යොදුන් රන්විමනින් නික්ම පිඬවිමානාරූඪව මහත්වූ දිව්‍යඍද්ධියෙන් මහත්වූ දිව්‍යශෝභාග්‍යයෙන් යුක්තව චන්ද්‍රයාමෙන්ද සහස්‍රකිරණයාමෙන්ද හාත්පසින් එකොහාස කෙරෙමින් උයන්කෙළියට යන්නිය.

එසමයෙහි ආයුෂ්මත්වූ මුගලන්මහතෙරුන්වහන්සේ යටකියන ලද ක්‍රමයෙන් දෙවවාරිකාවෙහි හැසිරෙණසේක් තවුතිසා භවනයට පැමිණ ඒ දෙවතාදුවට නුදුරු තෙනෙක්හි ඉඳුනිල්මිණිරුවණක්සේ පෙණී වදාළසේක.

නැවත ඒ දෙවතාදූතොමෝ තෙරුන්වහන්සේ දැක උපන්නාවූ ප්‍රීතිප්‍රමොදඇතිව බලවත් සංඝගෞරවයෙන් වහාම පසඟිඹාසෙන් බැස තෙරුන්වහන්සේ කරා එළඹැ පසඟ පිහිටුවා වැඳ දසනඛ සමොධානසමුජ්ජලිතවූ අඤ්ජලිපුටඋත්තමාඞ්ගයෙහි තබා වැඳ එකත් පස්ව සිටියාය. තවද ඒ තෙරුන්වහන්සේ වනාහි ඒ දෙවතාදුව තබා සියළු දිව්‍යලොකයෙහි දෙවිසන්හා අනන්තසඞ්ඛ්‍යාවිසින් රැස්කරණලද යම් කුශලකර්මයක් ඇද්ද ඒ සියළුම කුශලකර්මය තමන්වහන්සේගේ යථාකර්මොපගඥානානුභාවයෙන් අතට ගත් සිතුමිණි රුවණක්සේ බලාබලවශයෙන් ප්‍රත්‍යක්ෂ කොට දුන වදාරණසේක. එත කුදුවුවත් දෙවතාවන්ගේ උපපත්තිසභා සමග නොහොත් උපපත්තියට අනතුරුව කොයින් වුහව මෙහි උපන්නෙම්ද කවුරහමු කුශලකර්මයක් හෙතුකොට ගෙණ මෙබඳු සම්පත්ප්‍රතිලාභයෙක් මට වූයේදැයි අභිනවභවයෙහි රැස්කරණලද කුශලකර්මය බැලිව දෙවතාවන්ගේ ධර්මතාවක්ම නෙයින් බොහෝසේම සිඳවන්නේය. එසේ හෙයින් ඒ දෙවතාදුවටද යම් ඤාණයක් පහළවේද ඒ කාරණයෙන් ඒ දෙවුදුව ලබාම කුශලකර්මය ප්‍රකාශකරවා දිව්‍යමනුෂ්‍යයන් සහිත ලොකයාගට කර්මඵල ප්‍රත්‍යක්ෂකරණු කැමතිව මහතෙරුන්වහන්සේ;

> “පිඨතෝ සොවණ්ණමයං උළාරං
> මනොජවං ගච්ඡති යෙන කාමං,
> අලඞ්කතෙ මල්ලධරෙ සුවත්ථෙ
> ඔහාසයි විජ්ජුරිවබ්භකූටන්ති”.

යනුහෙයින් එබඳා දෙවතාදුව තිබේ ඉච්ඡානුරූපවූ පරිද්දෙන් උයන්කෙළි ආදියට යෙමිසි සිතුකෙණෙහිම සිතුලෙස පවත්නාහෙයින් මනොමය ජව ඇත්තාවූ යොදුනක් පමණ මහත් උදුරතර ශ්‍රේෂ්ඨවූ සඞ්ගීතිපර්යායිඛාකාර සටහන් ඇත්තාවූ කාමාවචරවිමානයක්හා තවද අලඞ්කාරභූත වූ දිව්‍යශරීරයෙහි නානාප්‍රකාරවූ රශ්මිජාලාවෙන් බබලන්නාවූ අනෙකවිධරත්නයෙන් විරාජමානවූ හසකුපඟපාදුපඟාදීවූ ප්‍රභෙද වශයෙන් සැටඟැලක් පුරාලන පමණ සර්වාභරණයෙන් සැරහී කල්පවෘක්ෂ පාරිජාතකසන්තානාදි සමභව සුවිශුඛවාමීකර විවිධරත්නමයවූ පත්‍රකිඤ්ජල්කකෙසරසමන්තාවිජෝ

තමානවූ විසඳුරන්න කිරණනිකරරුවිරදිව්‍යකුසුමයෙන් විභූෂිත හෙ
ඝින් මාලාධාරිවූ කලාපලතානිබඛනනානාවණ්ණවිරාගවිශෙෂ සුපරි
ශුඛහාසුරප්‍රභාසම්පත්තාදිව්‍යවෘත්තයන්ගේ වශයෙන් සුන්දරවූ දිවසඵ
වක් හැඳ එහෙයින්ම සුන්දරවූ දිවසඵවක් එකාංශකොට බබලන්නාවූ
නොහොත් අඩසඳක් වැනිවූ යහපත් නලල්තලයෙන්ද දෙවුදුනු
දෙකක් වැනිවූ බැමඅතලින්ද නිලප්‍රභාකාර උස්වූ නාසිකාවෙන්ද
බිම්බඵලාදුගට රන්වූ ඔෂ්ඨයෙන්ද පූර්ණචන්ද්‍රයා වැනිවූ මුහුනින්ද
රන්කලසක කරක් වැනිවූ ග්‍රීවයෙන්ද ඇත් සොඬකට බදුවූ බාහු
යුගලයෙන්ද පියුම්පෙති වැනිවූ අතුල්තලයෙන්ද සවණ්ණඵලක
යෙක්හි ඔබනලද රන් බුබුල් දෙකක් වැනි පයොධර යුගලයෙන්ද රන්
පුවරුවක්වැනිවූ යහපත් පිටකින්ද වස්ත්‍රාභරණයෙන් බබලන සිහිනි
ඟකින්ද රඹ කඳක්සේ දිස්වූ වටවූ මහත් ඌරුයුගලයෙන්ද දුනුකේ
කැකුළු වැනි කොණ්ඩාසඟලින්ද රන් මිරිවැඩි සඟලක් වැනිවූ පතුල්
යුගලයෙන්දසි මෙසේ බබලන්නාවූ රූපශ්‍රියකින්හා සඤ්ඤාකාල
යෙහි සුසංඛිතපයෙන් රැඳිකිය රන් වලාකුලක් යම්සේ සවභාවයෙන්ම
බබලාද එසේ ප්‍රකෘතියෙන්ම ජෙතිමත්ව බබලන්නාවූ සඩ්ඛ්‍යාවලා
පටලය භාත්පසින් විදුලිය වැලඳගත් කල්හි විශෙෂයෙන්ම බබ
ලාද එමෙන් සවභාවයෙන්ම බබලන්නාවූ පිඨවිමානය සව්වාලඞ්කාර
යෙන් විභූෂිතව සවිවාකාරයෙන් දිපතිමත්ව බබලන්නාවූ නිගේහරි
රප්‍රභාවහා වස්ත්‍රාභරණාදියෙන් ප්‍රභාමත් වෙයි. තවද චක්‍රවර්ති රජ්
ජුරුවන්ගේ සත්විනි රුවන යම්සේ චක්‍රවර්තිනිමහරජානෝ "පවත්තතු
භවං චක්කරතනං" යි යිකල සිතුලෙස අභිමුඛව අභිමතස්ථාන
යකට උපගත වේද එමෙන් දෙවතාදුවද යම් තැනකට යෙමියි සිතු
කෙණෙහිම සඳුවිමනක්සේ වායුවෙගයෙන් ආකාශයට පැනනැගි
මනාපස්ථානයකට සම්ප්‍රාපනවේමැයි. මෙසේ පළමුකොට ඈගේ සම්පත්
ප්‍රකාශකොට වදුරා නැවත ගියදවස කළාවූ සුචරිතකර්මය විචාරා
වදුරණ මහතෙරුන්වහන්සේ–

"කෙන තෙ තාදිසො වණ්ණො කෙන තෙ ඉධ මිජ්ඣති,
උපපජ්ජන්ති ච තෙ භොගා යෙ කෙචි මනසො පියා.

පුවජ්ජාමි තා දෙවි මහානුභාවෙ
මනුස්සභූතා කිමකාසි පුඤ්ඤං,
කෙනාසි එවං ජලිතානුභාවා
වණ්ණා ච තෙ සබ්බදිසා පභාසන්ති"

යනුහෙයින් එම්බා දෙවතිනෑව සඳුවිමනක්සේ ප්‍රභාමත්වූ පිඨවිමා
නයක්හා භාත්පසින් ජෙතිමත්ව බබලන්නාවූ ශරීරවණ්ණයක්හා

පරිභොගකටයුතුවූ වස්ත්‍රාභරණාදිවූ මෙබඳු උපකරණයක්හා යම් කිසි ඌනත්වයක් නැත්තාවූ සිතුසිතුවිට ප්‍රියපරිභොග කටයුතුවූ මෙබඳු සම්පත්තියක් පෙර මිනිස්ලොවදී නෙබඳුවූ කුසලයක් කොට ලබන ලද්දිද කවර කාරණයකින් මෙබඳුවූ දිව්‍යානුභාවයෙන් හා පරිවාර සම්පත් වර්ණසම්පත් ආදියෙන් ජොතිමන්ව බබලාද මම විචාරමි මට නොවළහා කියවයි විචාරා වදුළසේක. මෙසේ මුගලන්මහතෙරුන්වහන්සේ විසින් විචාරණලද ප්‍රශ්නය විසඳූ පරිදි දක්වන්නාවූ සඞ්ඝිතිකාරකයන්විසින්;

"සා දෙවතා අත්තමනා මොග්ගල්ලානෙන පුච්ඡිතා,
පඤ්හං පුට්ඨා විය්‍යාකාසි යස්ස කම්මස්සිදං ඵලං"

යනුහෙයින් මුගලන්මහතෙරුන්වහන්සේවිසින් විචාරණලද ඒ දෙවතාදූතොමෝ එක්තරා නෙරකෙණෙකුන්ට දුන්නාවූ සවල දනයෙන් මෙතෙක් සම්පත්තියක් ලදිමි. සුචරිතකර්මඵල සිහිකිරි මෙන්ද බුදුන්ගේ ත්‍රිතීයශ්‍රාවකවූ ඍද්ධිමත් මුගලන්මහතෙරුන්වහන්සේ විසින් මාගේ පුණ්‍යඵලප්‍රතිසංයුක්තවශයෙන් විචාරණලද්දේයයි දෙකාරණයෙන්ම හටගත්තාවූ බලවත් ප්‍රීති සොම්නස් ඇතිව හෙරුන්වහන්සේගේ වචනය මුදුනෙන් පිළිගෙණ කුශලඵල ප්‍රකාශ කොට දක්වන්නාවූ දෙවතාදූතොමෝ;

"අහං මනුස්සෝසු මනුස්සභූතා
අබ්භාගතානාසනකං අදාසිං,
අභිවාදිසිං අඤ්ජලිකං අකාසිං
සථානුභාවඤ්ච අදාසි දානං.

තෙන මෙ තාදිසෝ වණ්ණෝ තෙන මෙ ඉධමිජ්ඣති,
උපජ්ජන්ති ච මෙ භොගා යෙ කෙචි මනසෝ පියා.

අක්ඛාමි තෙ භික්ඛු මහානුභාව
මනුස්සභූතා යමකාසි පුඤ්ඤං,
තෙනම්හි එවං ජලිතානුභාවා
වණ්ණෝ ච මෙ සබ්බදිසා පභාසතී'ති"

යනුහෙයින් මිනිස්ලොව විශෙෂ භගවා විද්‍යමානවශයෙන්ම මනුෂ්‍ය යන්ට අත්‍යන්තගීතව උපන්බව හඟවන පිණිස මනුෂ්‍යභූතයෙමියි කිව. එහි විශෙෂකාවරයත්?–මනුෂ්‍යනාරකික්‍ය මනුෂ්‍යප්‍රෙත්‍ය මනුෂ්‍ය තිරශ්චීගහනය පරමාර්ථවශයෙන් මනුෂ්‍යයෝයයි චතුර්විධ වන්නාහ. යම් මනුෂ්‍යජාතිකෙණෙක් දණ්ඩනිග්‍රහාදියට නිසිවූ ප්‍රාණාතිපාතාදිවූ අකර්ත්තව්‍යකොට ඒ ඒ තන්හි රාජාදින්විසින් පමුණුවනලද හස්ත පාදශිරශ්ඡෙදාදි වධබන්ධනාදියට පැමිණ මහත් දුක් අනුභවකෙරෙද්ද ඔහු මනුෂ්‍යනාරකිකයෝ නම්වෙත්. අනිකුදු යම් මනුෂ්‍යකෙ

ණෙක් පූර්වජාතියෙහි කළ කර්මවශයෙන් ඉදුල් බතකුදු සැපසේ නොලැබ සාපිපාසාදි දුකින් පීඩිතව ගෙයක් දොරක් නැතිව ඇස් පිරුණු කදුළු ඇතිව හිස පිරුණු උකුණන් ඇතිව වෙර පිරුණු කුණු ඇතිව කිසි පිහිටක් නැතිව සොකයෙන් පීඩිතව සුසුම් ලලා ප්‍රේතයන්සේ දුක් බහුලව ඇවිදිද්ද ඔහු මනුෂ්‍යප්‍රේතනම් වෙත්. අනි කුදු යම් මනුෂ්‍යකෙණෙක් දුසකම්මකාරාදි අනුන් අයිනිවූ පැවතුම් ඇතිව අන්‍යාසිප්‍රාය වශයෙන් බර උසුලමින්හෝ භිත්තාමයඝ්‍රාදු ඇතිව අනාචාරයෙහි හැසිර අනුන්විසින් සන්තාජීජිත කාරණලදුව මරණ භයින් තැතිගෙණ ග්‍රහණ නිශ්‍රිතව හෙවත් වල්වැද හිතාහිත නොදුන නිරිසනුන්සේ දුකසේ නිදිමෙන් හා දුකසේ සාපිපාසා විනොදනය කෙරෙද්ද ඔහු මනුෂ්‍යතිරශ්චිගතයෝ නම් වෙත්. යම් මනුෂ්‍ය ජාතිකෙණෙක් වැඩ අවැඩ මෙලෝ පරලෝ දුන කර්මඵල අදහමින් සකලසත්වයන් කෙරෙහි දයානුකම්පා ඇතිව සංවෙග බහුලව අකුශලකර්මපථය හැර කුශලකර්මපථයෙහි හැසිර දශපුණ්‍යක්‍රියාවයතු පුරද්ද ඔහු මනුෂ්‍යධර්මයෙහි පිහිටියාවූ පරමාර්ථවශයෙන් මනුෂ්‍ය යෝ නම්වෙත්. මම වනාහි හියදවස මෙම බුඩොත්පාදකාලයෙහි මේ චතුර්විධ මනුෂ්‍යයන් අතුරෙන් මනුෂ්‍යධර්මයෙහි පිහිටියාවූ විද්‍යමානමනුෂ්‍යයන්ට අත්‍යන්තගතව එක්තරා කුලදිතෘවක්ව මනුෂ්‍යභූතව වසන්නෙමි මාගේ ගෙදොරට වැඩියාවූ නෙරකෙණෙකුන්වහන්සේ දුක පහන්සිතැනිව මා හිඳිනා පුටුව මත්තෙහි පිහටණින වස්ත්‍රයක් අතුට වඩා හිඳුවා දසනඛසමොධානසමුජ්ජලිත ඝනපුටමඤ්ඤකයෙහි තබා නමඃක්කාරකොට ඉක්බිති ශක්තිවූ පරිද්දෙන් අහර පිළියෙළ කොට දන් දිනිමි. පිඬාසනයද පූජාකෙළෙමි. එපමණ කුශලානුභාවයෙහෙතුකොටගෙණ මෙබඳු වර්ණසම්පත්භොගසම්පත්ආදිවූමහානුභාවසම්පන්න උදාරතර දිව්‍යශ්‍රීසම්පත්තියක් ලදින් දසදින් බබුළුවමිසි කියා කුශලත්‍යාමය ප්‍රකාශකොට සවාමිනි සඩ්ඝදානමය කුශලයෙන් මෙයේ වනකල තුනුරුවන්කෙරෙහි පහන්සිත් ඇතිව උදාරතරව යම්කිසි දානයක් දෙනලද්දේවිනම් චිත්තශුද්ධියත් වෙතනාශුද්ධියත් ක්ෂෙත්‍රශුද්ධියත් යහපත් බැවින් මහත්ඵල මහානිසංස වන්නේයයි කිව.

ඒ දිව්‍යාඛ්‍යානාතොමෝ තෙරුන්වහන්සේවිසින් විචාරණලද ප්‍රශ්නා විස්සර්ජනය කළකල්හි මහතෙරහු විඥතරවශයෙන් බණ වදාළසේක. ඒ ධර්මදෙශනාව පරිවාරයහිත දෙවතාදුවට සාර්ථක විය. ඉක්බිති මහතෙරහු මිනිස්ලොවට අවුත් බුදුරජානන්වහන්සේට එපවත් දන්වූසේක. බුදුරජානෝ මෙම අර්ථොපපත්තිකොට ගෙණ එතැන්හි පැමිණි පිරිසට බණ වදාළසේක. ඒ ධර්මදෙශනාව බොහෝ දෙනාට ප්‍රයොජන විය.

මේ විමානවත්ථු ප්‍රකරණයෙහි පීඨවර්ගයෙහි පළමුවන සවණ්ණපීඨවත්ථුව කියා නිමවනලදී.

මේ විමානවත්ථුප්පකරණයෙහි

දෙවන කුඤ්ජර විමානවත්ථුව නම් කවරෙක්ද?

එහි පිළිවෙළ කථාව මෙසේ දතයුතු-තේ කෙසේදයත්?

මාරගජකුම්භවිදාරණකෙසරීභූතවූ බුදුරජානන්වහන්සේ එක්ස මයෙක්හි රජගහනුවර සමීපයෙහිවූ ලෙහෙනුන්ට වැටුප් නඩා අහස දුන්හෙයින් කලන්දකනිවාපනම්වූ වෙළුවනාරාමයෙහි වැඩවසන සේක්. එයමයෙහි එක්දවසක් නැකත් කෙළිපිණිස කාලඝොෂාකොට නගරවාසිහු රැස්ව මුළුනුවර බෙර ඇසක්සේ බිම සමකොට කළු වැලි පියා සුදු වැලි අතුට සියළු විථිවල ඒ ඒ තන්හි නානාවර්ණ ධ්වජපතාකා තංවා දොරක් දොරක් පාසා කෙහෙල් තොරණ් ලවා පුන් කලස් තබා ලදුපස්මල් විසුරුවා මුළුනුවර දෙවුපුරසක්සේ අල ඛ්කෘත කොට සරහා රාජරාජමහාමාත්‍යාදිවූ සියළු නගරවාසිහු ඔවුනොවුන්ගේ බලානුරූපවූ පරිද්දෙන් නානාවර්ණ වස්ත්‍රාභරණාදි යෙන් සැරසී නැකත් කෙළියට පටන්ගත්තාහුය.

තවද මතුමහල්තලයෙන් බිමට නොබස්නා ඉසුරුමත් බිසෝවරු පවා නානාලඞ්කාරයෙන් සැරහී ඔවුනොවුන්ගේ පිරිස්හා සමග නැකත් කෙළියට නික්මෙති. එසමයෙහි මුළුනුවර දෙවුපුරසක්සේ අල ඞ්කෘතවිය. එකල්හි මගධෙශ්වරවූ බිම්බිසාරනම් මහරජානෝ පළමු රජදරුවන්ගේ සිරිත්වශයෙන් මහජනයාගේ චිත්තානුරක්ෂණය පිණිස සර්වාභරණයෙන් සැරහී රජගෙන් නික්ම මහසෙන් පිරිවරා මහත්වූ රාජානුභාවයෙන් උදරවූ ශ්‍රීසෞභාග්‍යයෙන් මහපිරිස් පිරිවරා ශක්‍රදෙවෙන්ද්‍රලීලාවෙන් නුවර ප්‍රදක්ෂිණාකරන්ට වන්හ. එය මයෙහි රජගහනුවර වසන්නාවූ එක්තරා කුලදියනියත් උදරවූ ශ්‍රී සෞභාග්‍යයෙන් මහත් රාජානුභාවයෙන් දිලිනි දිලිහි වඩනා බිම්බිසර රජහුගේ ඓශ්වර්‍යය් සම්පත් දැක බලවන්ට හටගත්තාවූ අද්භූතවූ ප්‍රීති සොම්නස් ඇත්තාවූ ඒ ස්ත්‍රීතොමෝ මේ රාජ්‍යඞ්ඞි වැනිවූ උදරතරවූ ශ්‍රීසම්පත් ලබනු කැමැත්තෙමි කවර කාරණයකින් ලබන්ට හැකිවන් නෙඳැයි නුවනැත්නවුන් කරා හොස් විමාළිය.

එකල්හි කල්‍යාණාධ්‍යාශ්‍රයාවූ මේලෝ පරලෝ වැඩ දන්නා ප්‍රඥාව සහිත මනුෂ්‍යයෝ කියන්නාහු එමබා භද්‍රාව මේ ලොකයෙහි යම් ඓශ්වර්‍යය් සම්පත්තියෙක් ඇද්ද ඒ සියලුම සම්පත් සුවරිතකර්ම්මයෙන්ම සිඛවන්නේය; එසේහෙයින් කුශලකර්ම්මයෙන්ම සිතුසිතු සම්පත් දෙන හෙයින් සිතුම්ණිරුවනක්හා සමානය; සම්කිසි ඌනත්වයක් නැන්තාවූ ඉසුරුසම්පත් දෙනහෙයින් කල්පවෘක්ෂයක්හා සමානය. තවද

ක්ෂේත්‍රශුද්ධියෙන්ද චිත්තශුද්ධියෙන්ද මහත්ඵල මහානිසංස වෙයි; යම් කිසි දුනාදිවූ කුශලකර්මයක් කොට කිසියම් ප්‍රාර්ථනාවක් කළේ වීනම් ඒ ප්‍රාර්ථනාව සිතූ පැතූ පරිද්දෙන්ම සිඛවන්නේය; එතකුදුවත් ආසනදුනයෙන් ක්ෂත්‍රියබ්‍රාහ්මණාදිවූ උතුම් වංශ ඇතිවෙයි; භොජනදුනයෙන් කායබල සම්පත් ඇතිවෙයි; වත්‍රදුනයෙන් වර්ණ සම්පත් ඇතිවෙයි; රථ ගැල් ඊල්ලෙලි කුනම්ආදි යානදුනයෙන් සුවපහස් ඇතිවෙයි; පහන් පූජාවෙන් පසැස් ලැබෙයි; හෙවත් රන් විමනෙක එබූ මැණික්කුලිසෙයින් පස්පෑදිස්නා ඇස් ඇතිවෙයි; ආවාසදුනයෙන් අනෙකප්‍රකාරවූ සියළු සම්පත් ලැබෙයි යනාදි කුසල් ප්‍රකාශකොට කිහ.

එපවත් අසා ඒ සත්‍රිතොමෝ මේ මිනිස්ලොව සම්පත්තියට වඩා දිව්‍ය සම්පත් ඉතා උදාරතරයයි සිතා දිව්‍යසම්පත් අරමුණුකොට කුසල් කිරිමෙහි බලවත් වියයි ඇතිවූවාය. එසමයෙහි ඈගේ මාතෘ පිතෘහු අළුත් පිළිදෙකක්ද අළුත් පුටුවක්ද පියුම් කලඹක්ද හිතෙල් මී සකුරු කිරි සාල් ආදි උපකරණද පරිභොග පිණිස එවූවාහුය. ඒ ස්ත්‍රීවනාහි පරිභොග පිණිස මවුපියන්විසින් එවනලද හිතෙල් මී සකුරුආදි උපකරණ දැක සිතන්නි මමද දන්දෙනු කැමැත්තෙමි දන්දියයුතු දුනොපකරණත් මාවිසින් ලබන ලද්දේයයි සතුටුසින් ඇතිව දෙවන දවස් දන් සරසන්නි අලෙවාදක මී කිරිබත් සපයා අන්‍යවූද දුනා හීවූ ඛාද්‍යභොජ්‍යාවකෘතියත් පිළියෙළකොට දන්ගෙය සුවඳ පිරිබඩ ලවා අළුත් පිඬාසනය විකශිතපදමයෙන් සරහා අළුත් සුදු වස්ත්‍රයක් අතුට ආසනය පණවා ආසනයාගේ සතරපා මත්තෙහි පියුම්රැස් සතරක් තබා උඩ සුදුවස්ත්‍රන් බැඳ අවලම්බනපුෂ්පදමයන් එල්වා ආසනය වට සියළු භූමිය සියඅතින් මල්පෙති අතුට ප්‍රතිග්‍රාහකයන් ආ කල පූජා කෙරෙමිසි මල් කරඬුවත් එනත්පසෙහ තබා මෙසේ සියළු දුනොපකරණ සපයා තබා ඉක්බිති ඉස්සොධා නහා සුදු වස්ත්‍රයක් හැඳ එසේම සුදුවස්ත්‍රයත් එකාංශකොට ගෙණ ඉක්බිති කල් වේලා පරීක්ෂාකොට දසියත් කැඳවා මාගේ දුනයට සුදුසු සිල්වත් කෙණෙකුන් සොයා කැඳවා ගෙණ එවයි කියා ගමන්කරවූවාය.

එසමයෙහි ආයුෂ්මන්වූ දම්සෙනෙවි සැරියුත්මහතෙරුන්වහන්සේ දහසින්බැඳි පියල්ලක් දෙර දෙර එලන්නාසේ රජගහනුවර පිඬුපිණිස හැසිරෙණසේක් ඇතුළු විපියට පැමිණිසේක. එකල්හි ඒ දාසිතොමෝ තෙරුන්වහන්සේ දැක නමස්කාරකොට ස්වාමිනි පාත්‍රය මා අතට දී වදුරා එක්තරා උපාසිකාවක්හට අනුග්‍රහපිණිස මෙසේ වැඩිය මැනවැයි ආරාධනාකළාය. එකල්හි තෙරුන්වහන්සේ පාත්‍රය අතට

දුන්සේක. ඉක්බිති ඒ දැසී පාතුය ගෙණ මහතෙරුන් වඩා නෙට ගියාය. ඒ උපාසිකාවද දුරින් වඩනා තෙරුන්වහන්සේ දැක පෙරග මන් කොට තෙරුන්වහන්සේට ආසනය දක්වා සවාමිනි මෙහි පණ වනලද ආසනයෙහි වැඩහුන මැනවැයි කියා මහතෙරහු ආසනයෙහි වැඩහුන්කල්හි මල්පූජා කරන්නි ආසනයවට සියනින් පියුම්පෙනි විසු රුවා පසඟ පිහිටුවා වැඳ හිතෙල් මී සකුරු මිශ්‍රවූ අලොදක මී කිරි ඛනින් වැලඳවුව එසේ වලඳවන්නි මේ කුශලානුභාවය හෙතුකොට ගෙණ දිව්‍යමය ඇත් වාහනය මත්තෙහි කූටාගාර සටහන් ඇත් තාවූ පයඞ්ඛකයකින් සොභාමත් දිව්‍යසම්පත්තියක් පහළවේවයි කියා ප්‍රාර්ථනා කළාය; නැවත තෙරුන්වහන්සේ වලඳ ඉක්බිති පාතුය සොධා හිතෙල් මී සකුරු පුරා පුටුව මත්තෙහි අතුළාවූ වැසුය පාතුයට සුබුළුවක් කොට තෙරුන්වහන්සේට පිළිගන්වා මහතෙරහු අනුමෙවෙනි බණ වදුරා වඩිනා කල්හි මිනිසුන් දෙන්නෙකු කැදවා තෙරහු අත තුබූ පාතුයහා මේ පයඞ්ඛකයද විහාරයට ගෙණ ගොස්දී එන්වයි කිව. ඒ පුරුෂයෝද කිලෙස පාතුයහා පුටුවද විහාරයට ගෙණ ගොස් දුන්හ ඒ දැනී එයින් අපරභාගයෙහි නොබෝකලකින් කාල ක්‍රියා කොට ඒ කුශලානුභාවයෙන් තවුතිසාදෙව්ලොව සාරසියසත් ගවුපමණ රන්විමනෙක උපන්නිය පරිවාර යහිහුද දහසක් පමණවූහ, ඇගේ ප්‍රාර්ථනාවයයෙන් පදම්මාලාලඞ්කාරයෙන් අලඞ්කෘතවූ පියුම්පෙනි වැනිවූද රෙණුවැනිවූද නියකෙස්හා ලොම් ඇතිහෙයින් හාත්පසින් පියුම්පෙත්තෙන් හා මල්රෙණුයෙන්ම ශොභාමත්වූ ශරීරබැවින් ජලජමාලාලඞ්කෘතවූ මනාදසීනියවූ සියුම් මොලොක් සුවපහස් ඇත් තාවූ අනෙකවණ්ණරඝම්ජාලාවෙන් දිලියෙන්නාවූ සවණ්ණාභරණයෙන් විභූෂිතවූ විසිඟවූ පමණ උතුම් කුඤ්ජරවාහනයෙක් පහළ විය. ඒ ඇතුපිට අනෙකවිධරත්නයෙන් දිලියෙන්නාවූ පදම්මාලාලඞ්කාරයෙන් අලඞ්කෘතවූ කූටාගාරසටහන් ඇත්තාවූ මනාසුවපහස් ඇත් තාවූ සතර ගවුපමණ උතුම් කනකපයඞ්ඛකයෙක් පහළ විය. එසේ හෙයින් ඒ විමානය කුඤ්ජරවිමාන නම් විය. ඒ දෙවිදූතොමෝ දිව්‍ය සම්පත් අනුභවකරන්නී ඒ කුඤ්ජරවිමානයෙහි නොයෙක් රත්නා යෙන් විසිතුරු රත්නපයඞ්කාරූඪව නන්දනොද්‍යානාදියෙහි ක්‍රීඩා කෙරෙමින් මහත්වූ ශ්‍රී සම්පත් අනුභවකරන්නිය.

එසමයෙහි එක්තරා උතුරුදිනයෙක දෙවතාමෝ ඔවුනොවුන්ගේ කර්මානුරූපවූ පරිද්දෙන් අනෙකවිධවූ දිව්‍යශ්‍රීන් දිලිහි දිලිහි උයන් කෙළි පිණිස නන්දනොද්‍යානයට යන කල්හි ඒ දෙවතාදුවද යහපත්වූ දිවසඵවක් හැඳ එසෙයින්ම දිවසලුවක් එකාංශ කොට සැටහැලන් පමණ දිව්‍යාභරණයෙන් සැරහී දිව්‍යපසරාමන් දහසක් පිරිවරා සියයක්

යොදුන් කනකවිමානයෙන් නික්ම කුඤ්ජරවිමානාරූඪව මහත් දිව්‍යඍද්ධියෙන් මහත් ශ්‍රීසෞභාග්‍යයෙන් හිරු සඳුසේ හාත්පසින් එ කොහොඹ කෙරෙමින් දිළිහි දිළිහි නන්දනොද්‍යානයට යන්නිය.

එසමයෙහි ආයුෂ්මත් මුගලන්මහතෙරුන්වහන්සේ යටකියනලද ක්‍රම යෙන් දෙවවාරිකාවෙන් තවුතිසාභවනයට පැමිණ ඒ දෙවතාදුවට හුදු රු තැනෙක්හි කප්රුකක්සේ පෙණී වදාළසේක. එකල ඒ දෙවතාදු තොමෝ තෙරුන්වහන්සේ දැක බලවත්ව හටගත්තාවූ සංඝගෞරව යෙන් වහාම පඤ්ඣකයෙන් බැස තෙරුන්වහන්සේ කරා එලැඹ පසඟ පිහිටුවා වැඳ දසනඛසමොධානසමුජ්ජලිත ඝනප්‍රථමඤ්ඤක යෙහි තබා වැඳ එකත්පස්ව සිටියාය. එකල මහතෙරුන්වහන්සේ ඒ දෙවතාදුවවිසින් පූර්වජාතියෙහි කරණලද කුශලකර්මය ඒ දෙ වතාදුව ලවාම ප්‍රකාශකරවා දෙවියන් සහිත ලෝකයාහට කර්මඵල ප්‍රත්‍යක්ෂ කරවා දෂ්ටානුගතික වශයෙන් ගහවනු කැමතිව;—

"කුඤ්ජරෝ තෙ වරාරොහෝ නානාරතනකප්පනෝ,
රුචිරෝ ථාමවා ජවසම්පන්නෝ ආකාසම්හි සම්ඵති.
පදුමී පදුමපත්තක්ඛී පදුමුප්පලධාරිණී,
පදුමවණ්ණාභිකිණ්ණඞ්ගෝ සොණ්ණපොක්ඛරමාලවා.
පදුමානුසටං මග්ගං පදුමපත්තාවිභූසිතං,
සිතං වග්ගු මනුග්ඝාති මිතං ගච්ඡති වාරණෝ.
තස්ස පඤ්ඤමමානස්ස සොණ්ණකංසාරතිස්සරෝ,
තෙසං සුයති නිග්ඝොසෝ තූරියෙ පඤ්චඞ්ගිකෙ යථා.
තස්ස නාගස්ස ඛන්ධස්මිං සුවිත්ථා අලඞ්කතා,
මහන්තං අච්ඡරාසංඝං වණ්ණෙන අතිරොචසි.
දූතස්ස තෙ ඉදං ඵලං අථෝ සිලස්ස වා පන,
අථෝ අඤ්ජලිකම්මස්ස තෙමෙ අක්ඛාහි පුච්ඡිතා'ති."

ඝනුහෙයින් නිලුපුල් පෙති වැනිවූ නෙත්‍රයුගලයක් ඇත්තාවූ එම්බා දෙවතාදුව නිගේ මේ උත්තම වාහනවූ දැකිනියවූ හයනිලඤ්ඤණ රූපශ්‍රී සොභාවෙන් හා විදුලිය මැලදගත් මහත් රන්පව්තයක්සේ කුම්භා ලඞ්කාරාදි අනෙකප්‍රකාර රත්නාලඞ්කාරයෙන් මනාකොට බබලන්නාවූ ආකාශචාරිවූ ජවබලසම්පන්නවූ පදුමයක්සේ පියුම් පෙත්තෙන් අලඞ්කෘතවූ පෙර කුඹයක් ඇත්තාවූ දිව්‍යමය පදෙමාත්පල මාලාල ඞ්කාර ශරීර ඇතිබැවින් පියුම් රසක්සේ සකල ශරීරය පදෙමාත්පල යෙන්ම ඒ ඒ තන්හි ජෝතිමත්ව බබලන්නාවූ සුවණ්ණමය පියුම් පෙනිහා රෙණුයෙන් ගැවසී ගත් ශරීර ඇතිසෙයින් කිඤ්ජල්කයෙන් හාත්පසින් ආකිණ්ණවූ ජලජමාලාලඞ්කෘත ගාත්‍රයක් ඇත්තාවූ ක්‍රීඩා කාලයෙහි නිර්මිතව පවත්නාවූ උතුම්වූ මේ ඇත් වාහනයෙන් හා,

තාවද මේ ඇතු ගමන් ගත්කල පියත් පියත් පාසා දසවූ පණ්ඩිත කොණ්ඩකුන්විසින් මනාකොට පියුම් සඳ සරහා තබනලද මාගිහ යක්සේ ඇතු තුබූ පතුල් මහත් පියුම් නැහි පාපියුම් ධර ධරා නානා වණ්ණයෙන් විරාජිතවූ ශරීරය හාන්පසින් පෙනිපතරින් හා රෙණු යෙන් තවරමින් රන්සුණු ඉස්නාසේ සොහාමත් වෙයි පිට මත් තෙහි අනඤ්ඤවූ සවණ්ණපඨඩිඛාරූඪව උන්නවුන් නොවෙහෙසා පියුම් පිට පියුම් තබන්නාසේ යහපත් ඇත්ගමනින්ම යන ගමන් ඇත්තේය, මෙසේ යන්නාවූ ඇතුගේ උභය පාඝිවයෙහි එලෙන් නාවූ මහසැලසා මුතුමැණික් ආදියෙන් විසිතුරුවූ නොයෙක් සිය ගණන් රන්මිණි සොඹාව දැසවූ ගන්ධව්වයන්විසින් වයනලද ආත තය විතතය ආතතවිතතය ඝනය සුසිරය -යන පඤ්චාඞ්ගිකතූයඃ නාදය යම්සේ කණ්ණරසායනව ඇසේද එමෙන් පඤ්චාඞ්ගිකතූයඃ නාදයෙන් එකනින් නාදවෙහි, ඒ ඇත්කඳ පිට කනකාසනයෙහි දිව්‍යමය වස්ත්‍රාභරණයෙන් සැරහි කනකරූපය්සේ අලඞ්කෘතවූ උදුරතරවූ රූපශ්‍රීන් ජොනිමත්ව තාරකා මධ්‍යයෙහි දිලියෙන පුණ්ණ චන්ද්‍රයාසේ මහත්වූ දිව්‍යඡත්‍ර සමූහයා මධ්‍යයෙහි ගරිරවණ්ණයෙන් සියල්ලවුන් අභිභවනය කෙරෙමින් දිපනිමත්ව බබලන්නාවූ එමඟා දෙවතාවූව තිවිසින් මෙබඳු සම්පත්තියක් ලැබීමට කාරණා කවරේද? අන්නපානවත්ථාභරණාදි දසවිධ දානවස්තූන් අතුරෙන් කවරදාන යක්හුගේ විපාකයෙක්ද? කායසංවරාදිවශයෙන් කවර ශීලවිපාක යෙක්ද? වන්දන මානාදියද චාරිත්‍ර සිලයෙහිම අන්තර්ගත හෙයින් කවරනම් චාරිත්‍ර සිලයක්හුගේ විපාකයෙක්ද? හෙවත් දානශීලාදි වශයෙන් කවර සුචරිත කර්මයක් කොට රූප භොග පරිවාරාදි මෙ බඳු සම්පත්තියක් ලබන ලද්දීද? හේ මට ප්‍රකාශ කොට කියවයි කියා යටගිය දවස කළාවූ කුශලකර්මය විචාරා වදුළසේක.

"සා දෙවතා අත්තමනා මොග්ගල්ලානෙන පුච්ඡිතා,
පඤ්හං පුට්ඨා වියාකාසි යස්ස කම්මස්සිදං ඵලංනි"

ස්වාමියන් යට කියනලද ක්‍රමයෙන් සතුටුව තෙරුන්වහන්සේගේ වචනය මුදුනෙන් පිළිගෙණ කුශලකර්මය ප්‍රකාශකරන්නාවූ ඒ දෙව කාන්තාවෝ;—

"දිස්වාන ගුණසම්පන්නං ඛීණාසවං ඛීණාරහං සතං,
අද්දසිං පුප්ඵාභිකිණ්ණං ආසනං දුස්සසන්ථතං.
උපඩ්ඪපදුමමාලාහං ආසනස්ස සමන්තතෝ,
අබ්භොකිරියඤ්ච පත්තෝහි පඤ්ඤා සකෙහි පාණිහි.
තස්ස කම්මස්ස කුසලස්ස ඉදං මෙ ඊදිසං ඵලං,
සක්කාරෝ ගරුකාරෝ ච දෙවානං අපචිතා අහං."

යනුහෙයින් බොහෝ කුසල් රැස්කොට ශ්‍රාවකපාරමිතාඥානය මෙහා කළ්‍රාපත කොට අග්‍රශ්‍රාවකඉණයෙන් සමන්විතවූ ආරම්මණූපනිධ්‍යානය ලක්ඛණූපනිධ්‍යානය යන මිප්‍රකාරවූ ධ්‍යානයෙන්හා දූවියයුතුවූ සකලකෙලශයන් නසා අගිත්ඵලයෙහි පිහිටියාවූ එහෙයින්ම ලොකොත්තරධ්‍යානයෙහි ඇළුම් ඇත්තාවූ සත්පුරුෂඉණයෙන් අග්‍රවූ සැරියුත්මහතෙරුන්වහන්සේ දැක පහන්සිත් ඇතිව මලින් සරහා අළුත් වස්ත්‍රයක් අතුට පණවනලද පීඨාසනයෙහි මහතෙරහු වඩා හිඳුවා මම වනාහී උපාර්ධයක් පමණ පියුම්පෙහි හලවා ආසනය වට සියලු භූමිය පියුම්වැසි වස්නාසේ සියනින් මල්පෙහි විසුරුවා අලෙප්‍රදක මී කිරිබතින් වලඳවා පුටුවහා වස්ත්‍රයද පූජාකෙළෙමි. ඒ කුශලකර්මය හෙතුකොට ගෙණ මේ කුඤ්ජරවිමානය ආදිවූ උදාර තරවූ දිව්‍යසම්පත් ලදින් බොහෝ දෙවියන්විසින් කරණලද පූජා සත්කාර ගරුකාර බහුමාන කටයුතුවූ දිව්‍යමය ඓශ්වර්යයෙන්ද දිව්‍යානුභාවයෙන්ද ආයුෂයෙන්ද වර්ණයෙන්ද සැපතින්ද පරිවාරයෙන්ද අධිපතිභාවයෙන්ද දසදිග් බබුළුවමි කියා;-

"යො වෙ සම්මා විමුත්තානං සන්තානං බ්‍රහ්මචාරිනං,
පසන්නො ආසනං දජ්ජා එවං නන්දෙ යථා අහං.
තස්මා හි අත්තකාමෙන මහන්තමභිකඞ්ඛතා,
ආසනං දූතබ්බං හොති සරිරන්තිමධාරිනන්ති."

යනුහෙයින් ස්වාමිනි මම යම්සේ ආසනදානයක් දී මේ කුඤ්ජරවිමානය ඇතුළුවූ දිව්‍යශ්‍රීසම්පත්තියන් ලදිත් සතුටුවෙමිද එමෙන් රත්නත්‍රය ඉණ සලකා කර්මඵල අදහමින් පහන්සිත් ඇතිව යම්කිසිකෙණෙක් දන් දෙනකල බ්‍රහ්මචාරිවූ සත්හුන් කායවාක් මනොචාර ඇතිහෙයින් සන්හුන් ඉඳුරන් ඇත්තාවූ සකලකෙලශයන්කෙරෙන් මිදුනාවූ එහෙයින් ක්ෂීණාශ්‍රවවූ ආර්‍යපුද්ගලයන්ට යම්කිසි දානයක් දුන්නේවිනම් උදාරතරවූ ශ්‍රීසම්පත් ලබමින් මෙසේම සතුටුවන්නේය එසේහෙයින් තමහට වැඩකැමැත්තාවූ මහත් උදාරතරවූ ශ්‍රීසම්පත් කැමැත්තාවූ ශ්‍රද්ධාවන්තයන්විසින් පින්කෙත් සොයා ආනන්ත්‍රිමදෙහබා රිවූ ක්ෂීණාශ්‍රවවූ ආර්‍යපුද්ගලයන්ට අසුන් දියයුතුයයි කියා ක්ෂීණාශ්‍රවයන්ට වඩා පින්කෙත් ලොකයෙහි නැතිබව භගවා විසෙළසෙන්ම ප්‍රශංසා කොට කිව.

මෙසේ මහතෙරුන්වහන්සේ විවාළ පැනය ඒ දෙවතාදුවවිසින් විසඳුකල්හි මහතෙරහු විසතරවගයෙන් බණ වදාළසේක. ඒ ධර්ම දෙශනාව පරිවාර සහිතව ඒ දෙවතාදුවට සාක්ෂාත් විය. ඉක්බිති මහතෙරහු මිනිස්ලොවට අවුත් පුර්‍වාචාර්‍යාජනාවවයෙන් සියලුම පූර්‍ව

තනිය බුදුන්ට දුන්වූසේක. භාග්‍යවත් බුදුරජානන්වහන්සේ මෙම අත්ථොත්පත්තිකොට ගෙණ සම්ප්‍රාප්ත පිරිසට ධම්මදෙශනා කෙට වදුලසේක. ඒ ධම්මදෙශනාව බොහෝදෙනාට ප්‍රයොජන විය.

මේ විමානවත්ථුප්‍රකරණයෙහි පඨවග්ගයෙහි
කුක්කුර විමානවර්ණනාව නිමාවිණි.

නවද මේ විමානවත්ථුප්‍රකරණයෙහි පඨවග්ගයෙහි **නාවුකාවිමාන වත්ථුව** නම් කවරෙක්ද?–එහි පිළිවෙළ කථාව මෙසේ දතයුතු–හේ කෙසේදයත්?

සුරනරහමරඝණාදිසෙවිතපාදපඞ්කජෝපෙතවූ භාග්‍යවත් බුදුරජානන්වහන්සේ සැවැත්නුවර වැඩවසන සමයෙහි අන්‍යතර ග්‍රාමාන්ත සෙනාසනයෙක වසන්නාවූ සඟොළොස්දෙනෙකුන්වහන්සේ බොහෝදවසක් සවිඥයන්වහන්සේගේ රූපශ්‍රී නුදුටුහෙයින් බුදුන් දැකසින් සනහා ගනුමිහයි සිතා ඒ විහාරයෙහි කළමනා ගම්කවත් සපයා තමතමන්ගේ පාසිවුරු ගෙණ විහාරයෙන් නික්ම සවණ්ණහංසපෙළක්සේ සැවැත්නුවර දිසාභිමුඛව දිඹිමාගිහයට පැමිණ වඩනාහු ග්‍රීෂ්ම ඍතුයෙහි පළමුවන මාසයෙහිත් අතුරුමඟ නිරුදක කාන්තාරයෙහි පැන් නොලදින් පිපාසයෙන් පීඩිතව පැන් ලද හැක්කැයි අනික් දිසාවකට ගොස් ලිඳක් දැන ඒ ලිඳට නුදුරු තැනක වැඩසිටියාහ. එකල පැන් ගෙණ එමි සිතා ඒ ලිඳට පැන් පිණිස ගියාවූ නාමගොත්‍රයෙන් අප්‍රසිඛවූ එක්තරා ස්ත්‍රියක් ලිඳ සමීපයෙහි වැඩසිටි භික්ෂූන් දැක මේ ආර්‍යයන්වහන්සේට පැනින් ප්‍රයොජන ඇත්තේය. ඕමන්කලහෙයින් පිපාසිතහයි දැන අනලස්ව අනුකම්පා උපදවා පහන්සිත් ඇතිව පැන් කලයක් ගෙණ ගොස් ස්වාමිනි සැමදෙනාවහන්සේම මා කෙරෙහි අනුකම්පා කොට පැන් පිව මැනවැයි ආරාධනා කළාය. එකල්හි පාත්‍රයථවිකාවෙන් පෙරහන්කඩ ගෙණ පැන් පෙරා සැමදෙනාවහන්සේම අභිප්‍රායවූ පරිද්දෙන් උදකපානය කොට විඩා සන්සිඳුවා හැඟපාදඩොවනයෙන් අත්පා සිහිල් කොට ඕමන් හැර ඉක්බිති ඒ ස්ත්‍රියට උදකදානානුමොදනාවෙන් ධණ වදුරා වැඩියාහ.

ඉක්බිති ඒ පැන් පූජාකළාවූ උපාසිකාතොමෝ ඒ කුශලකර්මය සිතා තබා නැවත නැවත සිහිකරන්නී එහින් අපරභාගයෙහි නොබෝකාලකින් කාලක්‍රියා කොට ඒ කුශලකර්මය හෙතුකොට ගෙණ තවුතිසා දිව්‍යලොකයෙහි දිව්‍යමය කල්පවෘක්ෂයෙන් උපශොභිතවූ මහත් දිව්‍ය විමානයක උපන්නිය; ඒ විමානය පරික්ෂෙප කොට හාත්පසින් මුතු

රූසක්සේ රිදීමය වැල්ලෙන් ගැවසිගත්බැවින් රිදිපටක්සේ සුදුවැලි තලාවෙන්හා රිදිපවුරක්සේ ප්‍රලිනතොපශොභිතව මැණික්කඳන් සේ නිම්මලවූ සිහිල්වූ ජලයෙන් පිරුණාවූ ගඟාවක්ද ඒ ගඟාවගේ උභයතීරයෙහි දිවසුවඳමල් ගසින් ගැවසිගත්තාවූ සත්රුවන්මය පවුරු වාසල් දෙරටු ආදියෙන් හෙබියාවූ උද්‍යානවිමානාදියෙන්ද නොයෙක් රත්නයෙන් ජොනිමන්ව බබලන්නාවූ පවුරින්හා සත්රුවන්මය පිය ගැට පඬිකතියෙන් ශොභාමත්වූ මහතොටඇති පොකුණක්ද ඒ පුෂ්කරණියෙහි රත්නපදමය සෙවනපදමය රතොත්පලය සෙවතොත්පලය නිලොත්පලය ඝනාදි නොයෙක් මල්වනයහා සමග සත්රුවන්මයවූ නැව් විමනෙක්ද පහළ විය එසේහෙයින් ඒ විමානයද නාවුකාවිමාන නම් විය; ඒ දිව්‍යාඟනාතොමෝ එක්දවසක් නොයෙක් දිව්‍යාභරණයෙන් සැරසි විමානයෙන් නික්ම නාවුකාවිමානයෙහි නොයෙක් ලීලාවෙන් දිළිහි දිළිහි ජලක්‍රීඩා කෙරෙමින් මහත් දිව්‍යසම්පත් අනුභව කරන්නිය.

එසමයෙහි ආයුෂ්මත් මුගලන්මහතෙරුන්වහන්සේ යට කියනලද ක්‍රමයෙන් දෙවචාරිකාවෙහි ගැසිරෙණසේක් ඒ නාවුකාවිමානයෙහි ක්‍රීඩා කරන්නාවූ ඒ දෙවතාදුව දැක ඒ දෙවතාදුවවිසින් පූර්වජාතියෙහි කරණලද කුශලකර්මය විචාරා වදාරණ මහතෙරුන්වහන්සේ;—

"සුවණ්ණවජ්ජනං නාවං නාරී ආරුය්හ තිට්ඨසි
ඔගාහසි පොක්ඛරණිං පදුමං ඡින්දසි පාණිනා
කොන තෙ තාදිසො වණ්ණො—පෙ—පභාසති'ති."

යනුහෙයින් රත්නසවණ්ණාදිවූ විචිත්‍රවිත්‍රකර්මාන්තයෙන් හෙබියාවූ භිත්තිහා නානාවිධරත්නයෙන් දිළියෙන්නාවූ සත්රුවන්මයවූ පල සෙවෙනි ඇත්තාවූ සවණ්ණමයවූ නැවකට නැඟි රතොත්පල නිලොත්පලාදිවූ නොයෙක් මලින් ගැවසිගත්හෙයින් දියකෙළියෙහි ඇළුම් ඇතුව මේ පුෂ්කරණියෙහි ජලක්‍රීඩාවට පැමිණ මරකතමණිමය මල්දඬු ඇත්තාවූ පද්මරාගමණිමය පෙති ඇත්තාවූ සවණ්ණමය කණිණිකාහා රෙණුඇත්තාවූ සුවඳ වහනය වන්නාවූ මේ පියුම් අතින් බිඳ ගෙණ ක්‍රීඩාකරන්නාවූ එම්බා දෙවතාදුව මෙබඳු ශරීරවර්ණයක්හා උද්‍යානවිමානාදි පරිභොග කටයුතුවූ මෙබඳු සම්පත්තියක් කවරකුසලයකින් ලබනලද්දිදැයි විචාරා වදළසේක; මෙසේ තෙරුන්වහන්සේවිසින් විචාළ ප්‍රශ්නය ඒ දෙවතාදුව විසඳූ බව දක්වන්නාවූ මහාසඵවිරයන්විසින් සඞ්ගීතිකාලයෙහි;—

"සා දෙවතා අත්තමනා මොග්ගල්ලානෙන පුච්ඡිතා,
පඤ්හං පුට්ඨා විය්‍යාකාසි යස්ස කම්මස්සිදං ඵලං'ති"

යනුහෙයින් යට සඳහන්කරන ලද පරිදි කියෙයින් මහතෙරුන්ට හන්සේගේ වචනය මුදුනෙන් පිළිගෙණ;—

"අහං මනුස්සෙසු මනුස්සභූතා
පුරිමාජාතියා මනුස්සලොකෙ,
දිස්වාන භික්ඛූ තසිතෙ කිලන්තෙ
වුට්ඨාය පාතුං උදකං අදාසිං.
යො වෙ කිලන්තානපිපාසිතානං
වුට්ඨාය පාතුං උදකං දදාති,
සීතොදිකා තස්ස භවන්ති නජ්ජො
පහූතමල්ලා බහුපුණ්ඩරීකා.
තමාපගා අනුපරියන්ති සබ්බදා
සීතොදිකා වාලුකසන්ථතා නදී,
අම්බා ච සාලා නිලකා ච ජම්බුයො
උද්දාලකා පාටලියො ච ඵුල්ලා.
තං භූමිභාගෙහි උපෙතරූපං
විමානසෙට්ඨං භුසසොභමානං,
තස්සිධ කම්මස්ස අයං විපාකො
එතාදියා කතපුඤ්ඤා ලභන්ති.
තෙන මෙ—පෙ—පභාසතී'නි"

යනුහෙයින් සවාමිනි මම මිට පූර්වජාතියෙහි මනුෂ්‍යයන් අතුරෙන් මනුෂ්‍යධර්මයෙහි පිහිටි විද්‍යමාන මිනිසුන්ට අත්‍යන්තහිතව මිනිස්ලොව ඉපද මේ බුඩොත්පාදකාලයෙහි ගමන් විඩාව පිපාසයෙන් කලාන්තවූ භික්ෂූන් දැක අනලස්ව පහන්සිත් ඇතිව පානය පිණිස පැන් පමණක් පූජාකෙළෙමි; ඒ කුසලයෙන් මෙතෙක් සම්පත්තියක් ලදිමි එසේහෙයින් පිපාසයෙන් කලාන්තවූ තෙණෙකුන්ට පහන්සිත් ඇතිව යමෙක් බොන පැන්දි උපකාර කෙළේවිනම් ඔහු මාසේම සිහිල්ජලයෙන් පිරුණාවූ පළවණිණපදමයෙන් ගැවසිගත්තාවූ පුෂ්කරණියෙන්ද වෛජයන්තප්‍රාසාදය වැනිවූ විමානයෙන්ද ඒ විමානයට භාත්පසින් පවුරුවළල්ලන්සේ නිරන්තරයෙන් ජලවහනය වන්නාවූ රිදිපට ක්සේ රජතමය සුදුවැලිතලාවෙන් හෙබියාවූ ගඟාවෝද ඒ ගංතෙර සියලු භූමිභාගයෙහි විමානයට භාත්පසින් මුලපටන් අගදක්වා පිපි වැනිනිය මලින් ගැවසිගත්තාවූ අඹ දඹ සල් පලොල් ඇසල නිලකා දිවූ නානාප්‍රකාර සුවඳමල් වෘක්ෂයෙන් ප්‍රතිමණ්ඩිතවූ උයනින්දැයි මෙසේ මහත් ශ්‍රේෂ්ඨවූ අතිශයින් දිපනිමත්ව බබලන්නාවූ උද්‍යාන විමානප්‍රාකරණාදිවූ දිව්‍යසම්පත් ලබන්හේයැයි කියා සවාමිනි කිසි යම් අගයක් නැත්තාවූ. නිරන්තරයෙන් මුහුදටම යන්නාවූ ඉතා සව ලපවූ පැන් පමණක් පූජාකළාවූ කුශලානුභාවයෙන් මෙබඳුවූ දිව්‍ය සම්පත්තියක් ලදින් දැයදික් බබුලුවමිහි කිව.

එකල්හි මුගලන් මහතෙරහු යටකී ක්‍රමයෙන් බණ වදාරා බුදුරජාණන්වහන්සේට දන්වූසේක. බුදුහු එම අර්ථොත්පත්තිකොට ගෙණ සම්ප්‍රාප්ත පිරිසට බණ වදාළසේක. ඒ ධර්මදෙශනාව බොහෝදෙනාට ප්‍රයොජන විය.

මේ විමානවත්ථුප්පකරණයෙහි පිඨවග්ගයෙහි
නාවුකාවිමානවත්ථුව නිමවනලදී.

තවද මේ විමානවත්ථුප්පකරණයෙහි **නාතිසනාවුකා විමානවත්ථුව** නම් කවරක්ද ?

සර්වලොකෛකනාථකවූ බුදුරජානෝ කොසොල්රට සැරිසරා වඩනාසේක් භික්ෂුසඞ්ඝයා පිරිවරා ථූණනම් බමුණුගමට වැඩිසේක, එගම් වැස්සෝ බුදුන් වඩනාබව අසා මාගිහවල් අවුරා ලින්පොකුණු ආදියත් පිදුරුආදියෙන් වසා දානමානාදිවශයෙන් කිසිඋපකාරයක් නොකට යුතුයයි කියා කතිකා කළබැවින් මනුෂ්‍යයෝ බුදුන්වහා සඞ්ඝයාට කිසිඋපකාරයක් නොකරන්නාහ.

එසමයෙහි බමුණෙකුගේ දාසියක් දියකැලයක් ගෙණ යන්නී ගසක් මුල වැඩහුන් බුදුන් දැක ගම්වැස්සෝ මට කුමක්කරතත් බුදුන්ට පැන්දී මිස නොනවතිමි සිතා නිසතුබු පැන් කලය ගෙණ ගොස් බුදුන්ට පැන් පිළිගන්වා මහාසඞ්ඝයාටත් පැන් පිළිගන්වා අඹුනොව තබෙන පැන් කලය දැක ප්‍රීතියෙන් පින පිනා මාගේ ජීවිතය සඵල වියයි සිතා පැන් කලය ගෙණ ගෙට අභිමුඛව යන්නිය, ඇගේ ස්වාමිවූ බ්‍රාහ්මණයා එපවත් අසා ගම්වැස්සන් කළ කතිකාවත් බිඳ මටත් නිදුකළහයි කියා බිම් හෙලා අහින් පහින් ඇණ මැරිය, ඒ දාසි පැන් පූජාකළ කුසලයෙන් තවුතිසාභවනයෙහි රන්විමනෙක උපන්නිය.

ඉක්බිති බුදුරජානෝ ලිදකින් පැන් ගෙණ එවහි කියා අනදමහතෙරුන්වහන්සේට වදාළසේක. මහතෙරහු පාත්‍රය ගෙණ ලිද සමීපයට වඩනාකල පිදුරුබොල්ආදිය ඉපිල පැන් ඉතිර නැගෙමින් ලින්පැන් පොකුණුආදිය පුරා හිඳේය මනුෂ්‍යයෝ ඒ ආශ්චර්‍යය දැක සතුටුව වැඩඉන්ට සෙනසුන් සලස්වා දෙවන දවස් සියලු ථූණනම් බමුණුගම්වැස්සෝ එක්ව බුදුපාමොක් මහසංඝයාවහන්සේ වලඳවා ඉක්බිති බුදුන් වැඳ එකන්පසව හුන්නාහුය. ඒ දිව්‍යාභනාව පැන් පූජාවෙහි අනුසස්හා තුනුරුවන්ගේ ගුණ ප්‍රකාශකරවනු පිණිස නාවුකාවිමානාරූඪව අවුත් බුදුන් වැඳ දිළිහි දිළිහි සිටියාය බුදුරජානෝ ඇගේ කුශලකර්මය ඒ දිව්‍යාභනාව ලවාම ප්‍රකාශ කරවා චතුර්යාර්‍ය ප්‍රකාශ කොට බණ වදාළසේක, දිව්‍යාභනාව සෝවාන්ඵලයෙහි පිහිටා බුදුන් වැඳ අවසර ගෙණ ගියාය; ඒ ධර්මදෙශනාව බොහෝදෙනාට සාර්‍ථක විය. මෙහි විස්තර දානපරිච්ඡේදයෙන් දතයුතු.

මේ විමානවත්ථුප්පකරණයෙහි පිඨවග්ගයෙහි
නාතිසනාවුකාවිමානවත්ථුව සංක්ෂේපයෙන් නිමවනලදී.

තවද මේ විමානවත්ථුප්‍රකරණයෙහි පිළිවගිනයෙහි **දිපවිමානට ත්ථුව** නම් කවරයත්?-හේ මෙසේ දතයුතු.

විනයජඤ්ඤනලිනවිකාසනාංසුමාලිභවූ භාග්‍යවත් බුදුරජාණන්වහන්සේ සැවැත්නුවර වැඩවසන සමයෙහි එක්තරා පොහෝදිනයෙක බොහෝ උපාසකවරු පෙහෙවස් සමාදන්ව ඔවුනොවුන්ගේ ශක්‍ති පමණින් පෙරවරු දන්දී ඉක්බිති පෙරවරු කාලයෙහිම බත් අනුභව කොට පස්වරු භාගයෙහි සුදුපිලි හැඳ සුදුපිලි එකාංශකොට සඳුන් තුවරලාදී සුවඳබඩුහා ගෙතූ නොගෙතූ නොයෙක් සුවඳමල්ගත් අත්දැතිව විහාරයට ගොස් ඔවුනොවුන්ට අභිප්‍රායවූ භික්ෂූන් කරා ගොස් භජනය සෙවනය කොට වැඳ පුදා ඉක්බිති සවස ධම්මශාලාවෙහි බණ අසන්නාහු විහාරයෙහිම වසනුකැමතිව හියහෙයින් බණ අසමින් සිටියදිම සූර්‍යා ඝසන්ධනව අන්ධකාර විය; එකල්හි නාමගොත්‍රයෙන් අප්‍රසිඩවූ එක්තරා සත්‍වයක් දැන් වනාහි පහන් ආලොක උවමනා කල්වන්නේය. එසේහෙයින් මාවිසින් පහණක් දැල්වුව මැනවැයි සිතා ඈගේ වාසභවනයෙන් පහන්තෙල්ආදි උපකරණ ගෙන්වා පහණක් දල්වා ධම්මාසනය පෙරටුව තබා සතුටුව බණ අසා ඉක්බිති ඒ සත්‍වතොමෝ ඈවිසින් පිදූ ප්‍රදීපදානය සිහිකොට සතුටුව ප්‍රීතිසෞමනස්‍ය උපදවා නමස්කාර කොට ගෙට හියාය; එහින්පසු නොබෝකලක් හිය කල කාලක්‍රියාකොට ඒ කුශලකර්මය හෙතුකොට ගෙණ තවුතිසා භවනයෙහි හිරුවිමනක්සේ නොයෙක් රශ්මිජාලාවෙන් දිදිනිමක්ව බබලන්නාවූ මහත් ජෝතිරසවිමානයෙක උපන්නිය, ඈගේ ශරීරප්‍රභාව වනාහි සෙසු දෙවතාවන් අභිභවනය කෙරෙමින් තාරකාමඩය යෙහි දිළියෙන පූර්ණිණවන්ද්‍රයාසේ ශරීරාලොකයෙන් දසදිග් බබුලුවමින් මහත්වූ දිව්‍යශ්‍රීසම්පත් අනුභවකරන්නිය; එකල්හි ආයුෂ්මත් මුගලන්මහතෙරුන්වහන්සේ තවුතිසාභවනයෙහි දෙවචාරිකාවෙහි හැසිරෙණසේක් හිරුසඳුසේ ශරීරාලොකයෙන් දිළිහි දිළිහි දහසක් දෙවහනන් පිරිවරා දිව්‍යශ්‍රීසම්පත් අනුභවකරන්නාවූ දිව්‍යාඟනාව දැක මේ සම්පත් ලැබීමට ඈවිසින් පූර්වජාතියෙහි කළාවූ සුචරිතකර්මය ප්‍රකාශකරවනු කැමති මහතෙරුන්වහන්සේ;-

"අභික්කන්තෙන වණ්ණෙන යා ත්වං තිට්ඨසි දෙවතෙ
ඔභාසෙන්ති දිසා සබ්බා ඔසධී විය තාරකා
කෙන තෙ තාදිසො වණ්ණා—පෙ—පභාසති'ති"

යනුහෙයින් එම්බා දෙවතාදූව යම්සේ ඔසධිතාරකා අනික් තාරකාවන් අභිභවමින් දසදිගුන් එකාලොක කෙරේද එමෙන් සෙසු දෙවතාවන් අභිභවනය කෙරෙමින් තිගේ මහත්වූ රූපශ්‍රී සොභාවෙන්ද යහ

පත්වූ ජවිවණ්ණයෙන්ද දසදික් එකාලොක කෙරෙමින් ජොතිමත්ව බබලන්නියයි මෙසේ පළමුකොට ඇගේ ඵෙඤ්ඣයහි සම්පත් ප්‍රකාශ කොට ඊට අනතුරුව මෙබඳු විමානයක් හාත්පසින් ජොතිමත්ව බබලන්නාවූ ශරීරවණ්ණයක්හා පරිභොග කටයුතුවූ වස්ත්‍රාභරණාදිමෙබඳු උපකරණයක්හා ප්‍රියපරිභොග කටයුතුවූ මෙබඳු සම්පත්තියක් පෙර මිනිස්ලොවදී කවරකුසලයක් කොට ලබනලද්දීදැයි කවරකාරණයකින් මෙබඳු රූපශ්‍රීන් දසදික් බබුලුවාදැයි විචාරා වදුළසේක; මෙසේ තෙරුන්වහන්සේවිසින් විචාළ ප්‍රශ්නය දෙවතාදුව විසඳු පරිදි ගඟවන පිණිස සඞ්ඝනිකාරකමහාසථවිරයන්වහන්සේ විසින්;—

"සා දෙවතා අත්තමනා මොග්ගල්ලානෙන පුච්ඡිතා,
පඤ්හං පුට්ඨා වියාකාසි යස්ස කම්මස්සිදං ඵලං'ති"

යනුහෙයින් මුගලන්මහතෙරුන්වහන්සේගේ වචනය මුදුනෙන් පිළිගෙණ ප්‍රශ්නය විසඳීජනය කරන්නාවූ දෙවතාදූතොමෝ;—

"අහං මනුස්සෙසු මනුස්සභූතා
පුරිමාය ජාතියා මනුස්සලොකෙ,
ඝනන්ධකාරම්හි තිමිසිකායං
පදීපකාලම්හි අදං පදීපං.
යො අන්ධකාරම්හි තිමිසිකායං
පදීපකාලම්හි දදාති දීපං,
උප්පජ්ජති ජොතිරසං විමානං
පභූතමල්ලං බහුපුණ්ඩරීකං.
තෙන මේ තාදිසො වණ්ණො තෙන මේ ඉධ මිජ්ඣති,
උපපජ්ජන්ති ච මෙ භොගා යෙකෙචි මනසො පියා.
තෙනම්හි එවං ජලිතානුභාවා
වණ්ණා ච මෙ සබ්බදිසා පභාසති,
තෙනාහං විමලොභාසා අතිරොචාමි දෙවතා,
තෙන මේ සබ්බගත්තෙහි සබ්බා ඔභාසතෙ දිසා'ති"

යනුහෙයින් ස්වාමිනි මම මීට පූර්වජාතියෙහි මිනිස්ලොව ඉපද විද්‍යමාන මනුෂ්‍යයන්ට අන්තගීහතව මේලෝ පරලෝ හැඳින වසන්නෙමි එක්තරා පොහෝදිනයෙක ධම්මසාලාවකට ගොස් රාත්‍රිකාලයෙහි පහන්සිත් ඇතිව පහණක් දල්වා ධම්මාසනය පෙරටුව පුදා සතුටුව බණ ඇසීමි. එපමණ කුශලානුභාවයෙන් මෙතෙක් සම්පත්තියක් ලදිමි. එසේහෙයින් මේ ලොකයෙහි සත්පුරුෂාදීන් අතුරෙන් ශ්‍රේෂ්ඨයකු මෙන් මහත්වූ බහලාන්ධකාර ඇතිව ප්‍රදීපාලොකයෙන් ප්‍රයොජන ඇතිකාලයෙහි පහණක් දල්වා වේවයි ප්‍රදීපයට හිතවූ පහන්වැටි පහන්කදු පහන්තෙල් පහන්මාලාදි උපකරණ සපයා වේවයි පහන් සිත්ඇතිව පූජාකෙළේවිනම් මාසේම උත්පත්තිස්ථානයෙහිම මහත් හිනි

කදක්සේ දිලියෙන්නාවූ නොයෙක් රශ්මිමාලාවෙන්හා සෙවනොතපල නීලොත්පලාදිවූ නොයෙක් මලින් සරහනලද ශ්‍රියහනින්ද මාලාකම්ම ලතාකම්මාදි නොයෙක් විචිත්‍රවිත්‍රකම්මාන්තයෙන්ද හෙබියාවූ ජෙනි රසවිමානයෙක ඉපිද ශරීරවණ්ණයෙන්ද සෙසු දෙවතාවන් අභිභව මින් දසදික් බබුළුවන්නේ වේදුයි කියා නැවත සක්‍රාමිනි මමද පහන් පූජාවෙහි ආනිශංසයෙන් මෙබඳු සම්පත්තියෙන්ද ශරීරප්‍රභාවෙන්ද දසදික් බබුලුවමි කිව. මහතෙරුන්වහන්සේ විසින් විචාරණලද ප්‍රශ්නය ඒ දෙවතාදුවවිසින් විසඳුකල්හි මහතෙරුන්වහන්සේ ඒ දෙවතාදුවගේ චරිතය බලා හෙතුසම්පත් ඇතිහෙයින් මාගිඵලාධිගමයට සමර්ථයයි දැන චතුස්සත්‍යය ප්‍රකාශකොට බණ වදළසේක; ඒ ධම්මදෙශනාවසානයෙහි ඒ දිව්‍යාඟනාව සහපිරිවරින් සෝවාන්ඵලයෙහි පිහිටියාය. ඉක්බිති මහතෙරුන්වහන්සේ මිනිස්ලොවට අවුත් ඒ සියළුම ප්‍රවෘත්තිය බුදුරජානන්වහන්සේට දන්වූසේක; බුදුරජානන් වහන්සේ එම අත්ථොත්පත්තිකොට ගෙණ එතැන්හි රැස්වූ පිරිසට බණ වදළසේක; ඒ ධම්මදෙශනාව බොහෝදෙනාට ප්‍රයොජන විය. එතැන්පටන් බොහෝසේ මනුෂ්‍යයෝ පහන්පූජානිශංස විශෙෂයෙන් දැන පහන් පූජා කොට සඟහිපරායණවූහ.

මේ විමානවත්ථුප්පකරණයෙහි පීඨවග්ගයෙහි
දීපවිමානවත්ථුව නිමවනලදි.

නවද මේ විමානවත්ථුප්පකරණයෙහි පීඨවග්ගයෙහි **නිලදක්ඛිණාවිමානවත්ථුව** නම් කවරයන්?—

මුනිභමරගණාඞ්ඝිවුම්බිතපාදපඞ්කජොපෙතවූ භාග්‍යවත් බුදුරජානන්වහන්සේ එක්සමයෙක සැවැත්නුවර දෙවිරම් වෙහෙර වැඩවසනසේක; එසමයෙහි රජගහනුවර වසන්නාවූ දරුගැබඇනි එක්තරා ස්ත්‍රියක් තෙල් සිඳිනා කැමතිව තල සුඟක් යොඩා අව්වෙහිලා වියළන්නිය ඕතොමෝ ගෙවුනාවූ ආයුඇතිහෙයින් එදවස්ම කාලක්‍රියා කොට නරකයෙහි උපදනා අකුසල් ඇත්තිය එසේහෙයින් එදවස්ම ඈගේ අකුශලකම්මයට අවකාශව සිටියේය; එසමයෙහි භාග්‍යවත් බුදුරජානන්වහන්සේ අළුයම් වේලෙහි මහාකරුණාසමාපත්තියෙන් නැඟි මුළුලෝ බලා වදුරණසේක් ඒ ගහිනිය දැක වදුරා ඈකෙරෙහි කරුණා උපදවා සිතා වදුරණසේක් මේ ස්ත්‍රිය මේ දවස්ම කාලක්‍රියා කොට නරකයෙහි උපද්දී දැන් මා එහනට නියකල වියලන්නාවූ තලරැසින් තල දෙහොතක් පූජාකෙරෙයි ඒ කුශලකම්මය ඇට ප්‍රතිඵඨාධාරව සඟහිනාපවඟිහසම්පත්තියට කාරණා වන්නේයයි සවිඥානඥානයෙන්

දුක වදුරා තිලප්‍රතිග්‍රහණයෙන් නරකයට යන ගමන් වළකා සඟුපස්ථූප ගමනය කෙළෙම් වින්නම් ඉතා යෙහෙකැයි කරුණා කොට වදුරා සවී ඇසන්වහන්සේ එකෙණෙහිම සැවැත්නුවරින් රජගහනුවරට ඇසිල්ල කින් වැඩ පූර්වාහ්නකාලයෙහි සිවුරු ගැටවටුගත්වා පාත්‍රාධාතුව ශ්‍රීහස්තයට ගෙණ වදුරා රජගහනුවර ගෙපිළිවෙළින් පිඬුසිඟා වඩනා සේක් ඈගේ ගෙදොරට පැමිණියේක; එකල්හි ඒ සත්‍රීතොමෝ ගිනිකඳක් සේ දිලිහි දිලිහී දෙර සමීපයෙහි වැඩසිටි බුදුන් දැක මහත්වූ බුඩාලඹනප්‍රීතීන් උපදවා බලවත්වූ ප්‍රීතිසොම්නස් ඇතිව වහාම හුන්තැනින් නැගි සිට බුදුන් වැඳ ඉක්බිති දන් දියයුතුවූ කිසිවක් ඇද්දැයි බලා නොදැක අත්පා පිරිසිදු කොට වියලන තල එකතැන් කොට තල දොළොතක් පමණ ගෙණ ගොස් බුදුන්ගේ පාත්‍රයට පිළිගන්වා නමස්කාර කළාය, එකල්හි බුදුරජානන්වහන්සේ ඈකෙරෙහි කරුණාවෙන් සුවපත් වේවයි වදුරා වැඩසේක; ඒ සත්‍රීතොමෝ එම දින රෑය අළුයම් වේලෙහි කාලක්‍රියාකොට ඒ කුශලානුභාවයෙන් නරකයට යන ගමන් වැළකී නිදා පිබිදියක්හුසේ තවුතිසා දිව්‍යලොකයෙහි අට සාළිස් ගවුපමණ රන්විමනෙක උපන්නිය.

එසමයෙහි ආයුෂ්මත්වූ මුගලන්මහතෙරුන්වහන්සේ යට කියන ලද ක්‍රමයෙන් දෙවචාරිකාවෙහි හැසිරෙණසේක් දහසක් දෙවඟනන් පිරිවරා මහත්වූ දිව්‍යඍද්ධියෙන් මහත්වූ ශ්‍රීසෞභාග්‍යයෙන් ශ්‍රීසම්පත් අනුභව කරන්නාවූ ඒ දෙවතාදුව දැක වදුරා ඈවිසින් මේ සම්පත් ලැබීමට පූර්වජාතියෙහි කළාවූ කුසලය ප්‍රකාශකරවනු කැමතිව විචාරා වදාරණ මහතෙරුන්වහන්සේ;—

> “අභික්කන්තෙන වණ්ණෙන යා ත්වං තිඨසි දෙවතෙ
> ඔභාසෙන්ති දිසා සබ්බා ඔසධි විය තාරකා
> කෙන තෙ තාදිසො වණ්ණො—පෙ—පභාසති‘ති”

යනුහෙයින් එම්බා දෙවතාදුව යම්සේ ඔසධිතාරකා අවශෙෂ තාරකාවන් අභිභවමින් දසදිගුන් එකාලොකකෙරේද එමෙන් සෙසුදෙවතාවන් අභිභවනය කෙරෙමින් තිගේ මහත්වූ රූපශ්‍රීසොභාවෙන්ද ජවිවණ්ණයෙන්ද දසදික් එකාලොක කොරෙමින් ජෙනිමත්ව බබලන්නියහි මෙසේ පළමුකොට ඈගේ එශ්වර්‍යයී සම්පත් සංක්‍ෂෙපයෙන් ප්‍රකාශකොට ඊට අනතුරුව මෙබඳු විමානයක්හා ඖත්පත්තික වූ ශරීර වර්ණයක්හා පරිභොග කටයුතුවූ වස්ත්‍රාභරණ උද්‍යානවිමානාදී මෙබඳු සම්පත්තියක් පෙර මිනිස්ලොව දී කවර කුශලකර්මයක් කොට ලබනලද්දිද කවර කාරණයකින් මෙබඳු රූපශ්‍රීන් දසදික් බබුලුවාදැයි විචාරා වදාළසේක.

"සා දෙවතා අත්තමනා මොග්ගල්ලානෙන පුට්ඨා,
පඤ්හං පුඨා ව්‍යාකාසි යස්ස කම්මස්සිදං ඵලං'ති"

යනුහෙයින් මුගලන්මහතෙරුන්වහන්සේවිසින් විචාරණලද්දාවූ ප්‍රශ්නය විසඳීජනය කරණ ඒ දෙවතාදූතොමෝ බුදුගුණ සිහිකොට සවලාදැනයෙන් මෙතෙක් සම්පත්තියක් ලද්දෙමියි සතුටුව මහතෙරුන්වහන්සේගේ වචනය මුදුනෙන් පිළිගෙණ;—

"අහං මනුස්සෙසු මනුස්සභූතා
පුරිමාය ජාතියා මනුස්සලොකෙ.
අද්දසං විරජං බුද්ධං විප්පසන්නමනාවිලං
ආසජ්ජ දානං අදාසිං අකාමා
තිලදක්ඛිණං දක්ඛිණෙය්‍යස්ස බුද්ධස්ස
පසන්නා සකෙහි පාණිහි
තෙන මෙ—පෙ—පභාසති'ති"

යනුහෙයින් ස්වාමිනි මම මිට පූර්වජාතියෙහි මෙම බුඩොත්පාද කාලයෙහි මිනිස්ලොව ඉපිද විසූ මානමිනිසුන්ට අත්‍යන්තහිතව දවස් හරණෙම් එසමයෙහි එක්දවසක් තෙල්පිණිස තල සොඩා අව්වෙහිලා වියලන්නේ එකල්හි දිපදොත්තමවූ බුදුරජානන්වහන්සේ සැඩකරුණාවෙන් පිඬුසිඟා වඩනාසේක් මාගේ ගෙදොරට වැඩිසේක බුදුන් දැක හට ගත්තාවූ බලවත් ප්‍රීතිසොම්නස් ඇතිව දන් දියයුක්තක් නොදැක තල දොහොතක් පූජාකෙළෙම් තල දන්දී දිව්‍යසම්පත් ලබමි කියා පළමු දන් දුන් කැමතිව සදකළ කිසිඋපඝාතය නැතිවම දැකිණාවත් ශ්‍රද්ධාවන් සම්ප්‍රාපනවූහෙයින් බුදුන් දුටුකෙණෙහිම සිත පහදවා අග්‍රදක්ඛිණෙය්‍යවූ සර්වඥන්වහන්සේට දුන්නාවූ සවලාදැනමය කුශලකර්මය හෙතුකොටගෙණ මෙබඳු සම්පත්තියක් ලදිමි සවාමිනියි කිව. එකල්හි මහතෙරහු පිරිවරසහිත දෙවතාදූවට විසඳරවශයෙන් බණ වදාරා මිනිස්ලොවට අවුත් බුදුරජානන්වහන්සේට දැන්වූසේක; බුදුරජානන්වහන්සේ එම අත්ථොත්පත්තිකොට ගෙණ එතැන්හි පැමිණි පිරිසට ධර්මදෙශනා කොට වදාළසේක; ඒ ධර්මදෙශනාව බොහෝ දෙනාට ප්‍රයොජන විය.

මේ විමානවත්ථුප්‍රකරණයෙහි පිඨවග්ගයෙහි තිලදක්ඛිණාවිමානවත්ථුව කියා නිමවනලදි.

තවද මේ විමානවත්ථුප්‍රකරණයෙහි පිඨවග්ගයෙහි **පතිව්‍රතාවිමානවත්ථුව** නම් කවරයත්?-එහි උත්පත්තිකථාව මෙසේ දතයුතු.

සනරාමරලොකගුරුවූ භාග්‍යවත් සර්වඥරාජෝත්තමයානන්වහන්සේ එක්සමයෙක සැවැත්නුවර ජේතවනාරාමයෙහි වැඩවසනසේක; එකල්හි නාමගොත්‍රයෙන් අප්‍රසිද්ධවූ එක්තරා ස්ත්‍රියක් පතිව්‍රතාධර්මය රක්ෂාකරන්නී සවාමිපුත්‍රයාට කීකරුව චිත්තානුකූලවූ පැවතුම් ඇතිව

පුත්තයෙකු රක්නා මැනිකෙණෙකුන්සේ කණ බොන දෙය මිශ්‍රරු කොට දිමෙන්ද වරද ඉවසිමෙන්ද ආචාර සමාචාර කිරිමෙන්ද අත්පා මෙහෙ කිරිමෙන්ද අප්‍රියවචනයෙන් දුරුව ප්‍රියවචන කිමෙන්ද මුසාවා දයෙන් දුරුව සැබෑවචන කිමෙන්ද අඛණ්ඩ කොට පඤ්චසීලය රක්‍ෂාකෙ රෙමින් සවාමියන් හැර අනික් පුරුෂයෙකුගේ මුහුන කාමයෙන් අඬිව රාගසිතින් නොබලා පතිව්‍රතාඛ්‍යධම්මය නොකඩ කොට රක්‍ෂා කෙරෙමින් ශ්‍රද්ධාදිගුණධම්මයෙහි පිහිටා ශක්තිවූ පරිද්දෙන් දන්දෙ මින් නොයෙක් කුසල් කෙරෙමින් වසන්නි එක්තරා රොගයකින් පෙළෙනලද්දි කාලක්‍රියා කොට තවුතිසාභවනයෙහි මහත්වූ රන්විම නෙක උපන්නිය; එසමයෙහි ආයුෂ්මත් මුගලන්මහතෙරුන්වහන්සේ යට කියනලද ක්‍රමයෙන් දෙවවාරිකාවෙන් තවුතිසාභවනයට වැඩ දහසක් දෙවඟනන් පිරිවරා සැටගැළක් පමණ සවිභරණයෙන් සැ රහි මහත්වූ දිව්‍යශ්‍රීසම්පත් අනුභවකරන්නාවූ ඒ දෙවතාදුව දැක ඈගේ විමානය සමීපයට ගොස් වැඩසිටි සේක; එකල්හි ඒ දෙවතාදුව දහසක් දෙවඟනන් පිරිවරා මහතෙරුන්වහන්සේගේ ශ්‍රීපාදයට නම ස්කාර කොට එකත්පස්ව සිටියාය; එකල්හි මහතෙරුන්වහන්සේ ඒ දිව්‍යාඟනාවවිසින් පුර්වජාතියෙහි කළාවූ සුවරිතකර්මය ඒ දෙවතා දුව ලවාම ප්‍රකාශ කරවනු කැමතිව මේ ගාථාවලින් මෙසේ විචාරා වදාළසේක.

“ කොඤ්චා මයූරා දිවියා ච හංසා
වග්ගුස්සරා කොකිලා සම්පතන්ති,
පුප්ඵාභිකිණ්ණං රමණීදං විමානං
අනෙකචිත්තං නරනාරිසෙවිතං.

තඤ්ච ජ්ඣසි දෙවි මහානුභාවෙ
ඉඞ්ඝ විකුබ්බන්ති අනෙකරූපා,
ඉමාව තෙ අච්ඡරාඔ සමන්තතො
නච්චන්ති ගායන්ති පමොදයන්ති.

දෙවිඞ්ඝපත්තාසි මහානුභාවෙ
මනුස්සභූතා කිමකාසි පුඤ්ඤං,
කෙනාසි එවං ජලිතානුභාවා
වණ්ණා ච තෙ සබ්බදිසා පභාසන්ති” ”

යනුහෙයින් එම්බා දෙවතාදුව රන්රිදිමුතුමැණික්ආදි නොයෙක් රත්නයෙන් විසිතුරුවූ භිත්තිසතමහසොපානමාලාකර්මාදි අනෙකප්‍ර කාර විචිත්‍රවිත්‍ර කර්මාන්තයෙන් හෙබියාවූ විමානයෙන්ද එසේම අනෙ

කච්ඩරත්තායෙන් සොභාමත්වූ පවුරුහා වාසලින් අලඞ්කෘතවූ උයන් පොකුණු ගලතලාකලාවෘක්ෂාදියෙන්ද සොභාමත් විය. තවද මේ විමානයෙහි ගෙතු නොගෙතු නොයෙක් මලින් සැරහී විත්තාභිරමණය කරන්නාවූ පරිවාර දිව්‍යපුත්‍රයන්හා දිව්‍යාඟනාවන්විසින් නිරන්තර යෙන් ගැවසිගත්තේය මේ විමානය හාත්පසින් කොස්ලිහිණියෝද මයූරයෝද සවණ්ණහංසාදි හංසයෝද කාලකොකිල ජීවඤ්ජකොකිලාදි කොවුල්ලෝද යන පක්ෂිසමූහයන් ඒ ඒ තැන මනොඥවූ මධුරස්වර යෙන් නාද කෙරෙමින් තිගේ විත්තාභිරමණය පිණිස ලලනාය කෙරෙමින් නටති ලීලා දක්වති මේ සියල්ලට අධිපතිවූ මහානුභාවසම්පන්නවූ යශපත්වූ රූපශ්‍රී ඇත්තාවූ එම්බා දෙවතාදුව හංසමයූරාදි අනෙක ප්‍රකාර රූප මවා නානාවණ්ණයෙන් සැරහී අනෙකවිධවූ ලීලා දක්වා නටනහෙයින් විකුව්ඵණඍඞ්ඝියක් මෙන් තිගේ කාමනැමති විකුව්ඵණ ඉර්ධියෙන් පහළවූ පරිවාරස්ත්‍රීන්හා දිව්‍යපුත්‍රයන් විසින් අනෙකප්‍රකාර ලීලා දක්වමින් හාත්පසින් නටති ගී කියති ගායනා කෙරෙති සතුටු එලවති යනාදින් පළමුකොට ඇගේ සම්පත් ප්‍රකාශකොට ඊට අනතුරුව මහත් දිව්‍යඍඞ්ප්‍රාප්ත මහානුභාවසම්පන්න එම්බා දිව්‍යාඟනාව නී මීට පූර්වජාතියෙහි මනුෂ්‍යභූතව කවර කුසලයක් කොට මෙබඳු දිව්‍යඍඞියක් දිව්‍යානුභාවයක් දිව්‍යසම්පත්තියක් ලබනලද්දිද කවර කාරණයකින් මෙබඳු වස්ත්‍රාභරණාදියෙන්හා ශරීරවණ්ණයෙන්ද දසදික් බබුලුවාද මීට කාරණාවූ සුචරිතකම්මය ප්‍රකාශ කොට කියවයි වදුලසේක.

"සා දෙවතා අත්තමනා මොග්ගල්ලානෙන පුච්ඡිතා,
පඤ්හං පුඨා වියාකාසි යස්ස කම්මස්සිදං ඵලං 'නි"

යනුහෙයින් සතුටුව මහතෙරුන්වහන්සේගේ වචනය මුදුනෙන් පිළිගෙණ;-

"අහං මනුස්සෙසු මනුස්සභූතා
පතිබ්බතා අනක්කොධමනා අහොසිං,
මාතාව පුත්තං අනුරක්ඛමානා
කුඩ්ඩාපගං න ඵරුසං අවොචං.

සවෙව සිතා මොසවජ්ජං පහාය
දූනෙ රතා සඞ්ඝගිහිත්තභාවා,
අන්නාඤ්ච පානඤ්ච පසන්නචිත්තා
සක්කච්චදානං විපුලං අදාසිං.
තෙන මෙ—පෙ—පභාසති'නි"

යනුගෙයින් ස්වාමිනි මම මිට පූර්ව ජාතියෙහි මෙම බුඩොත්පාදකාල යෙහි මිනිස්ලොව ඉපද ශීලාදිගුණධර්මයෙහි පිහිටා පතිව්‍රතාධර්මය රක්ෂාකරන්නෙමි මාගේ ස්වාමිපුත්‍රයන් හැර රාගචෙතනාවෙන් පෙර ලියාවූ සිත්ඇතිව අනික් පුරුෂයෙකුගේ මුහුන කිසිකලෙකත් නොබැලූයෙමි පුත්‍රයෙකු රක්නා මැනියෙකුසේ අවැඩ දුරුකිරීමෙන් වැඩෙහි පිහිටුවනු කැමතිව දයානුකම්පා ඇතිව මාගේ ස්වාමිපුත්‍රයා රක්ෂා කෙළෙමි. අනික් කළ වරදක් නිසාවත් ස්වාමිපුත්‍රයන් කිපි කලද එරුෂ වචනයෙන් බණන කලද එරුෂවචනයක් නොකියෙමි ප්‍රියබස්ම කිමි සතුටින්මුත් කිපිසිනින් කිසිකලෙකත් මාහිමියන් මුහුන නොබැලූ යෙමි; එකාන්තයෙන් මුසාවාදයෙන් දුරුව සැබෑබස්ම කිමි දනයෙහි ඇළුම් ඇතිව දුනප්‍රියවචනඅර්ථවයඤ්ඤාසමානාත්තතායය යන සතරසඞ්ග හවෙන් අනුන්ට සඞ්ගහකෙළෙමි ශ්‍රද්ධාසමාධියෙහි යෙදෙමින් කර්මඵල අදහමින් අන්නපානවස්ත්‍රාභරණාදියෙන් උදුරතරවූ මහත් දන් ස රහා සකස් කොට පූජාකෙළෙමි මෙපමණ කුශලකර්මය හෙතුකොට ගෙණ මෙබඳුවූ දිව්‍යශ්‍රීසම්පත්තියක් ලදින් ශරීරවර්ණයෙන්ද දසදික් බබුලුවමි කිව, මෙසේ මහතෙරුන්වහන්සේවිසින් විවාළාවූ ප්‍රශ්නය ඒ දෙවතාදුවවිසින් විසඳීජනය කළකල්හි මහතෙරුන්වහන්සේ පරිවා ර සහිතව ඒ දෙවතාදුවට වියතරවශයෙන් බණ වදරා ඉක්බිති මිනිස් ලොවට වැඩ ප්‍රඥාපුවජාවිසඳීජනදෙක යුක්තකොට බුදුරජානන්ව හන්සේට දන්වූසේක. බුදුහු එම අර්ථොත්පත්තිකොට ගෙණ සම්ප්‍රා පත පිරිසට බණ වදළසේක. ඒ ධර්මදෙශනාව බොහෝදෙනාට සාර්ථක විය.

මේ විමානවත්ථුප්පකරණයෙහි පඨවග්ගියෙහි
පතිව්‍රතාවිමානවර්ණනාව කියා නිමවනලදී.

නවද මේ විමානවත්ථුප්පකරණයෙහි පඨවග්ගියෙහි **කෙසකාරීවිමා නවත්ථුව** නම් කවරයත්?–

සුරනරවිභගගණාකිර්ණිණඅමෘතඵලභරිතකල්පවෘක්ෂයක් වැනි සව් ඥරාජොත්තමයානන්වහන්සේ කසිරට බරනැස්නුවර ඉසිපතනාරාම යෙහි වැඩවයනසේක, එකල්හි භික්ෂූහු පූර්වාහ්නසමයෙහි මනාකොට හැඳ පෙරව කයින් සිවුරහා අතින් පාත්‍රය ගෙණ පිඬුපිණිස බරනැස් නුවරට වඩනාහු එම නුවර නාමගොත්‍රයෙන් අප්‍රසිඩවූ එක්තරා බ්‍රාහ්ම ණයෙකුගේ දොරකඩ සම්පයෙන් වඩනාහ ඒ ගෙයි වසන්නාවූ බමුණා ගේ කෙසකාරිනම් දියනියක් ඇත්තිය. එක්දවසක් ඒ කෙසකාරිනම්

කුමාරිකාතොමෝ ගෘහචාරයෙහි මැනියන් හිස උකුණන් හරිමින් සිටියාය; එදවස්ද පාසිවුරු ගෙණ දෙරසමීපයෙන් පිඬුපිණිස වඩනා භික්ෂූන් දැක ඒ කුමාරිකාතොමෝ මැනියන් අතින් විචාරන්නී මැනියන්වහන්ස මේ භික්ෂූහු පැවිදිවූ බවක්මුත් ප්‍රථම නවයෞවන වයසින් සුකුතයහ යහපත් දර්‍ශනීයවූ රූපශ්‍රී ඇත්තාහ සුකුමාලවූ ශරීර වර්‍ණ ඇත්තාහ මේ ලොකයෙහි මහණවීමට කාරණාවූ පරිහාණි සතරක් ඇත්තාහ එසින් එක් පරිහාණියකුත් මේ පැවිද්දන් කෙරෙහි නැතැයි සිතමි මොහු කුමක් දැක කුමක් පිණිස ගිහිගෙය හැර පැවිදිවූවාහුදැයි මැනියන් අතින් විචාළිය; එබස් අසා ඒ කෙසකාරි කුමාරිකාවගේ මැනියෝ කියන්නී දියනියෙනි මේ ලොකයෙහි මහාසම්මත රජහු පටන් අසඬකිණ්ණව පැවතආවාවූ ශාක්‍යකුල තිලකයක් වැනිවූ සුඛෝදන මහාරාජතුමයන්ගේ පුත්‍රවූ උදුරතර මහාසම්පත්ඇති හෙයින්ද දිව්‍යසෙනාවක්සේ රූපශ්‍රීන් අග්‍රප්‍රාප්තවූ ශාක්‍ය කොළිය දෙනුවරවාසිවූ නොයෙක් දහස් ගණන් ඤාතිරාජසමූහයක්ඇති හෙයින්ද භොගභව්‍යසන ඤාතිව්‍යසනාදි කිසි පරිහාණියක් නැතිව සද්දවසින් ලබන්ට තුබූ සක්විති රාජ්‍යය හැර මහෙශාක්‍යරාජකුලයෙන් නික්ම පැවිදිව සව්වධම්මයන් සව්වාකාරයෙන් දත්තාවූ ශාස්තෘවූ ගෞතමනම් බුදුකෙණෙක් මේ ලොකයෙහි පහළවිය ඒ සියල්ල දන් බුදුරජානන් වහන්සේ මෙසේ බණ වදරණ සේක. කෙසේදයත්?

පඨමාපත්ති ධම්මයන් සව්වභාගයෙන් සුන්දර බැවින් එක ගාථාවෙක්හි ප්‍රථමපාද වශයෙන්ද එකානුසන්ධික සූත්‍රයෙහි නිදානවශයෙන්ද නානාසන්ධික සූත්‍රයෙහි ප්‍රථමානුසන්ධිවශයෙන්ද තමහට අත්‍යුත්තවූ ශීල යෙන්ද ඝනාදිවූ නොයෙක් අර්‍ථයෙන් ආදියෙහි සොභනවූ හෙයින්ද විතීය තෘතීය පාදයෙන්ද නිදන නිගමනයන්ගේ මධ්‍යයෙහි සමථවිදර්‍ශනා මාර්‍ගඵලයෙන්ද නොහොත් විදර්‍ශනාමාර්‍ගයෙන්ද ධම්ම සුධම්මත්වයෙන්ද ප්‍රත්‍යෙකබොධිඥානයෙන්ද ප්‍රතිපත්තියෙන්ද අත්‍යුශුඩියෙන්ද මධ්‍යයෙහි සොභන හෙයින්ද පශ්චිමපාදයෙන්ද නිගමනයෙන්ද නිර්‍වාණයෙන්ද ඝඨසුප්‍රතිපත්තියෙන්ද ශ්‍රාවකබොධිඥානයෙන්ද ප්‍රතිපත්තිඵලකෘත්‍යශුඩියෙන්ද අවශානයෙහි සොභනවූ හෙයින්ද යන මේ ත්‍රිවිධ කල්‍යාණයෙන් යුක්තවූ මේ ශාසනධම්මය ප්‍රකාශ කරන්නාවූද නෛර්‍යාණිකාත්‍මී රහිත අන්‍නපාන ස්ත්‍රී පුරුෂ වර්‍ණ නාව ගැර සමෘති ප්‍රසථානාදි නිශ්‍රිතදෙශනාව පවත්වනහෙයින්ද මහාශ්‍රාවක කාත්‍යායන මහාස්ථවිරභාෂිතවූ නෛරුක්තනිරුක්තියෙන් සංක්ෂාගන ප්‍රකාශන විවරණ විභජන උත්තානීකරණ ප්‍රඥප්ත්‍යාත්‍මී පදසමායොගයෙන් අත්‍යගම්භීර ප්‍රතිවෙධ ගම්භීරයෙන්ද අත්‍යසන්තිකවූ දුවිඩ කිරාත යවනපාරසිකාදි භාෂාවන්සේ එකවිප්‍රකාර ව්‍යඤ්ජන මාත්‍ර

යක් නොවී ශීලවිපත්ති ධනිතාදිවූ දශවිධ ව්‍යඤ්ජනයෙන් සම්පූර්ණ බැවින්ද අක්ෂරපදව්‍යඤ්ජනයන් නිරුක්ති නිද්දේශයෙන්ද ව්‍යඤ්ජන සම්පන්නවූ ප්‍රක්ෂේපවූ අනුසන්ධිව්‍යවදානීයන් නැතිබැවින්ද ශීලසමාධි ප්‍රඥාදිප්‍රභෙද ධර්මාධිගම සමාගමයෙන්ද භාත්පසින්ම පරිපූර්ණවූ පරිත්‍යජවූ සංක්ලේශ ධර්මයන්හුගේ අභාවයෙන්ද නිර්දූෂ බැවින්ද දෘෂ්ටිමානාද්‍යුපක්ලේශාභාවවෘත්ත දුඃඛනිස්සාරණප්‍රවෘත්ති ලෝකාමිස නිරපේක්ෂතාදි හෙතුයෙන්ද අත්‍යන්ත නිර්මලවූ ශ්‍රේෂ්ඨාර්ථ බ්‍රහ්ම ශබ්දයෙන්ද වාච්‍යවූ බුද්ධප්‍රත්‍යේකබුද්ධශ්‍රාවකයන්ගේ චරියාවයයි කියන ලද ශාසනමාර්ගබ්‍රහ්මචර්‍යාව ප්‍රකාශකරෙමින් විනෙයජනයන් කෙරෙහි පතල කරුණාවෙන් ධර්මදේශනා කොට වදාරණ සේක; ඒ ශාක්‍යකුලතිලකවූ බුදුරජානන්වහන්සේගේ ධර්ම දේශනාව අසා මහත් රාජ්‍යශ්‍රී සම්පත්පවා හැර බොහෝසේම පැවිදිවන් ආහුවේදුයි කිව. එසමයෙහි සෝවාන්මාර්ගඵලයෙහි පිහිටියාවූ මේ සව්වඳහාසනය විශේෂයෙන්ම දන්නාවූ එක්තරා උපාසක කෙණෙක් ඒ විහිවිහාර සමීපයෙන් සිට උන් කියන කථාව අසා ඔවුන් සමීපයට ගියේය එකල්හි ඒ බ්‍රාහ්මණ කුමාරිකා කියන්නී එම්බා උපාසකය ඤාතිව්‍යසනාදි කිසි පරිහානියක් නැතිව ක්ෂේත්‍ර වස්තු ගව මහිෂ ධන ධාන්‍යාදී මහත්වූ උපභොග පරිභොග සම්පත් හැර බොහෝ කුල පුත්‍රයෝ ශාක්‍යපුත්‍රවූ බුදුරජානන්වහන්සේගේ සස්නෙහි පැවිදිවෙති ඊට කාරණා කවරේද? කවර අර්ථයක්පිණිස කවර වැඩක් දැක කවර ප්‍රයෝජනයක් පිණිස පැවිදිවෙද්දැයි විවාළිය. එබස් අසා ඒ උපාසක තෙම පඤ්චකාමයෙහි ආදීනවයා නෛෂ්ක්‍රම්‍යයෙහි ආනිශංසද දක්වන්නේ එම්බා කුමාරිකාව පඤ්චකාම සම්පත්තියනම් බොහෝකල් නොපවත්නාහෙයින් අතට ගත් දියත්තක් වැන්න සිහිනෙන් අනුභවකළ භොජනයක් වැන්න සොක කිරීමය දුඃඛය දෞර්මනස්‍යය උපායාසය යනාදිවූ මහත්ඝොර දරුණුවූ සංසාරදුඃඛයට කාරණාවන හෙයින් මහත් ගිනිඅඟුරු වලක් වැන්න දරුණු විෂඝොර සර්පයෙකු වැන්න ලෙහි ඇණි උලක් වැන්න යනාදින් පඤ්චකාමයෙහි ආදීනවයා පඤ්චකාමසම්භෝග හැර ගිහිගෙයින් නික්ම පැවිදිවීමනම් සසර දුකින්මිදීමට කාරණා වනහෙයින් සිරගෙයින් මිදුනාක් වැන්න අති භයානකවූ අක්මුල් නැති සසරදුකින් මිදීමට කාරණා වනහෙයින් සිංහ ව්‍යාඝ්‍රාදි නොයෙක් උවදුරු සහිතවූ වනාන්තරයකින් නික්ම නිරුපද්‍රවස්ථානයට පැමිණි කෙණෙක් වැන්නැයි යනාදින් පඤ්චකාම සම්පත් හැර නික්ම පැවිදිවීමෙහි ආනිශංසයද ප්‍රකාශ කෙරෙමින් ඔහුගේ නුවණපමණින් විස්තරකොට කියේය; තවද මේ ත්‍රිවිධරත්න යනම් තිරුවට වඩා තෙජෝ ගුණය සඳුට වඩා සෞම්‍ය ගුණය ආකා

යයෙස් අනුත්තර ගුණය මත මුහුදයේ හැඹුරු ගුණය මේ ත්‍රිවිධ රත්නය කෙරෙහි ප්‍රසන්නවූ නිරුක්තාදීන්ට පවා සටහන මොක්ෂ සම්පත් දායකවූ මහත් ගුණ ඇත්තේය, යනාදී රත්නත්‍රයෙහි ගුරුද පඤ්චශීලය රක්ෂාකිරීමෙන් සිඛවන්නාවූ ඓහලෞකික පාරලෞකිකානිසංසද දෘෂ්ටධාම්මික සාම්පරායිකාදි ගුණානිශංස වශයෙන් ප්‍රකාශකොට කියේය. එකල්හී ඒ බ්‍රාහ්මණ කුමාරිකාව එපවත් අසා සතුටු සිත් ඇතිව් එම්බා උපාසකය එසේවීනම් අපවිසිනුදු ඒ සරණ යෙහිද ශීලයෙහිද පිහිටා තා විසින් කියනලද ගුණානිශංසයට පැමිණෙන්ට පිළිවන්දැයි විවාළිය එබස් අසා ඒ උපාසකතෙම කියන්නේ බුදුන් විසින් දෙශනා කරණලද මේ ධර්මයනම් සාධාරණය සියලු සත්වයන්ට ප්‍රතිඝාධාරය එසේහෙයින් කුමකින් නොහැකිවන්නිද එකාන්තයෙන්ම හැකිවන්නීය කියා සරණයද පඤ්චශීලයද දුන්නේය; සමාදන්වූ සරණසිල් ඇති ඒ කුමාරිකාතොමෝ හෙතු සම්පත් ඇතිහෙයින් ආචාරිනි මින්මතු කුමක් කටයුතුදැයි විවාළිය; එතෙම ඈ නුවණ ඇතිබව සලකා උපනිශ්‍රය සම්පත් ඇත්තියයි දැන ශරීර සභාවය දක්වමින් කායගතාසතිවශයෙන් වත්තිංසාකාර කර්මස්ථානයන් කියා කායථිරත්වය උපදවා කායථිරාභයෙන් මත්තෙහි අනිත්‍යතාප්‍රතිසංයුක්ත කථාවෙන් සංවෙග උපදවා විදර්ශනාමාර්ගයට නිසි පිළිවෙත් කියා ගියේය. ඉක්බිති ඕතොමෝ උපාසකයා විසින් කියනලද ඒ සියලුම ප්‍රවෘත්තිය සිත තබා ප්‍රතිකූල මනස්කාරයෙහි එලවනලද සිත්ඇතිව විදර්ශනා වඩා උපනිශ්‍රය සම්පත් ඇතිහෙයින් නොබෝ කලකින්ම සෝවාන්ඵලයෙහි පිහිටියාය; ඉක්බිති ඒ කෙසකාරිතොමෝ එතැන් පසු නොබෝ කලකින් කාලක්‍රියාකොට එම කුශලානුභාවයෙන් තවුතිසාභවනයෙහි ශක්‍රදෙවෙන්ද්‍රයාට පරිවාරිකාව උපන්නීය; පරිවාරසම්පත්තු ලක්ෂණයක් පමණවූහ; ආශ්චර්යමත්වූ රූපශ්‍රීන් දිලිහි දිලිහී සිටි දිව්‍යාඟනාවෝ දැක මහත්වූ ප්‍රීතිසොම්නස් උපදවා සතුටු සිත් ඇතිව ශක්‍රදෙවෙන්ද්‍රයෝ ඒ දෙවතා දුවවිසින් ගිය දවස කලාවූ සුචරිතකර්මය ප්‍රකාශකරවනු කැමතිව "ඉදං විමානං රුචිරං පභස්සරං" යනාදී ගාථා සතරින් විවාළේය.

"ඉදං විමානං රුචිරං පභස්සරං
වෙළුරියත්ථම්භං සතතං සුනිම්මිතං,
සොවණ්ණරුක්ඛෙහි සමන්තමොතතං
ඣානං මම කම්මවිපාකසම්භවං.

තත්‍රූපපන්නා පුරමච්ඡරා ඉමා
සතං සහස්සානි සකෙන කම්මනා,
තුවංසි අජ්ඣුපගතා යසස්සිනී
ඔභාසයං තිට්ඨසි ප්‍රබ්භදෙවතා.

සසී අධිගහ්හ යථා විරොචති
නක්ඛත්තරාජා රිව තාරකාගණං,
තථෙව ත්වං අච්ඡරාසංඝතං ඉමං
දද්දල්ලමානා යසසා විරොචසි.

කුතොනු ආගම්ම අනොමදස්සනා
උපපන්නා ත්වං භවනං මමයිදං,
බ්‍රහමංව දෙවා තිදසා සඉන්දකා
සබ්බ න තපපාමසෙ දස්සනෙ තං.

යනුහෙයින් දසදිග රැස්විහිදෙන්නාවූ රන් කඳින්හා ශාඛාවලින්ද නොයෙක් වර්ණයෙන් බබලන්නාවූ පිපි වැනිඹිය මලින් ගැවසී ගත්තාවූ අනෙකවිධවූ දිව්‍ය වෘක්ෂපඞ්ක්තියෙන් ගැවසී ගත්හෙයින් සවර්ණවෘක්ෂපෙළින් ගැවසී සොභාමත්වූ උයන් පොකුණු කලා වෘක්ෂාදියෙන් අතිරමණීයවූ මේ සථානයෙහි වෛදූර්‍යමණිමයවූ ටැම්ඇත් තාවූ අනෙකවිධවූ දිව්‍යරත්නයෙන් සුනිර්මිතවූ භිත්ති දොර කවුළු සොපාන මාලාකර්ම ලතාකර්මාදියෙන් සොභාමත්වූ නොයෙක් රැසින් දිලිසෙනහෙයින් ප්‍රභාමත්වූ අතිමනොඥවූ මේ විමානය අති ශයින් සොභාමත් විය, මේ විමානාධිගෘහීතව උපන්නාවූ එම්බා භද්‍රාව මාඉග් මේ ශක්‍රපුරයෙහි මාගේම කර්මවිපාකයෙන් පහළවූ පුරාණ දිව්‍යාඟනාවන්හා තිගේ සවකියවූ කර්මවිපාකයෙන් පහළවූ ලක්ෂයක් පමණ දිව්‍යාඟනාවන්හා මේ පුරසත්‍රින් මධ්‍යයෙහි රූපශ්‍රී යෙන්හා ශරීරාලොකයෙන් දසදිතුන් එකාලොක කෙරෙමින් සිටිනීය සස ලක්ෂණයක් ඇත්තාවූ සියලු නක්ෂත්‍රතාරකාවන්ට අධිපතිහෙ ඝින් නක්ෂත්‍රරාජවූ චන්‍ද්‍රතෙම සියළු තාරකා සමූහයා අභිභවනය කොට අධිකවූ කාන්තියෙන් යම්සේ අතිශයින්ම බබලාද එමෙන් යශශ්‍රී ඇති එම්බා භද්‍රාව තී මේ සත්‍රි සමූහයා අභිභවා දිලිසෙමින් අතිශයින්ම දිපතිමත්ව බබලන්නීය සහමපති මහාබ්‍රහ්මයාහෝ මේ තවුතිසා භවනයට පැමිණිකල තවුතිසා වැසිවූ ඉන්‍ද්‍රාදි දිව්‍ය සමූහයා විසින් ඒ බ්‍රහ්මරුව බලා යම්සේ තෘප්තියකට නොපැමිණෙද්ද එමෙන් තිගේ රූසිරු බලා අපි සියල්ලද තෘප්තියකට නොපැමිණෙම්හ මෙබඳු රූපශ්‍රියක් ඇත්තාවූ අලාමකදර්ශනීයවූ එම්බා දිව්‍යාඟනාව තී කොයින් අවුත් මාගේ මේ දිව්‍ය භවනයෙහි උපන්නීද ? කවර කුසලක් කොට මෙබඳු සම්පත්තියක් ලද්දිදැයි විචාළේය; මෙසේ ඒ සක්දෙවු මහරජානන් විසින් විචාළ ප්‍රශ්න ව්‍යාකර්ජනය කරණ දිව්‍යාඟනාතොමෝ මෙසේකිව;

"යමේතං සක්ක අනුප්පවජ්ජසෙ මමං
කුතෝ වුත්තා ත්වං ඉධ ආගතාති,
බාරාණසීනාමපුරත්ථි කාසිනං
තත්ථ අහොසිං පුරකෙසකාරිකා..
බුද්ධෙ ච ධම්මෙ ච පසන්නමානසා
සංඝෙ ච එකන්තිගතා අසංසයා.
අඛණ්ඩසික්ඛාපදෙ ආගතප්පලෙ
සමෙධාධිමෙම නියතා අනාමයා;

ඔතුමෙයින් ශක්‍රදෙවෙන්ද්‍රයානන්වහන්ස මා ගිය දවස සළ කුශ ලයත් කොයින් චුතව මෙහි උපන්නිදැයි කියා පෙර දිසූ තැනුත් කර්මානුරූප වශයෙන් විවාරණසේක්වීනම් අසා වදළ මැනව කසි රට බරනැස්නම් නුවරෙක් ඇත්තේය ඒ නුවර කෙසකාරී නම් බමුණු කුමාරිකාවක් විමි එකල්හි බුද්ධරත්නය ධම්මරත්නය සංඝ රත්නය යන මේ ත්‍රිවිධරත්නය කෙරෙහි ප්‍රසන්නවූ සිත් ඇතිව නොකඩ කොට පවසිලය රක්‍ෂාකෙළෙමි ත්‍රිවිධ සංයොජනයෙන් දුරුව සෝවාන් ඵලයෙහි පිහිටා ශඨකාරහිතව දෘෂ්ටාඝයෙන් එතරව අධිකවූ කෙලශරාගයෙන් මිදී එකාන්තයෙන්ම නිවන්මගට පැමිණ නිරොගි විමි සුවපත්විමි කිව; එබසට සතුටුව ප්‍රශංසා කරන්නවූ සක්දෙවු මහරජතෙනි මේ මතු කියන ගාථාවෙන් මෙසේ කියේය.

"තං තෘාභිනන්දාමසෙ සාගතව පෙ
ධමෙමන සච්චං යසසා විරොවසි,
බුද්ධෙ ච ධම්මෙ ච පසන්නමානසෙ
සංඝෙ ච එකන්තිගතෙ අසංසයෙ
අඛණ්ඩසික්ඛාපදෙ ආගතප්පලෙ
සමෙධාධිමෙමෙට නියතා අනාමසෙ" ති.

ඔතුමෙයින් බුද්ධරත්නය ධම්මරත්නය සංඝරත්නය යන මේ ත්‍රිවිධ රත්නය කෙරෙහි පහන්සිත් ඇත්තාවූ අවලඟ්ඨාවෙන් ග්‍රහණවූ ශික්‍ෂාපදවශයෙන් ශීලසමාධිප්‍රඥාදි ගුණයෙන් සමන්නාගතවූ පැමිණ නලද සෝවාන්ඵල ඇතිමෙයින් එකාන්තයෙන් නිර්වාණමාගීගයට පැමිණියාවූ එමෙයින්ම නිරොගිවූ අලාමක දශනියවූ එම්බා භද්‍රාව ති මේ දිව්‍යභවනයට ආ ගමන ඉතා යහපත නිමේ තම් පරිවාරාදි සමප ත්තියෙක් යසසෙක් ඇත්නම් ඒ සියල්ලම ධම්මයෙන්ම ලොතිමත් වෙයි එසේමෙයින් විශෙෂයෙන්ම සතුටුවම්හයි කියා ප්‍රශංසා කෙළේය.

ඉක්බිති එක්දවසක් ආයුෂ්මත්වූ මුගලන්මහතෙරුන්වහන්සේ යට ක්‍රමයෙන් දෙවවාරිකාවෙන් වඩනා දුක ශක්‍රදෙවෙන්ද්‍රයෝ මහ

තෙරුන්වහන්සේ කරා එළැඹැ නමස්කාරකොට එකත්පස්වසිට මෙහි කියනලද ප්‍රශ්නයත් විසඳීජනයත් එක්කොට ඒ සියලු ප්‍රවෘත්තිය මහතෙරුන්වහන්සේට දන්වීය මහතෙරහු මිනිස්ලොවට වැඩ බුදු රජානන්වහන්සේට දන්වූසේක; බුදුරජානන්වහන්සේ එම අර්ථා තපත්තිකොට ගෙණ එතැන්හි සම්ප්‍රාපත පිරිසට ධර්මදෙශනාකොට වදුළසේක; ඒ ධර්මදෙශනාව දිව්‍යමනුෂ්‍යයන් සහිත ලොකයාහට ප්‍රයොජනවිය.

මේ විමානවත්ථුප්පකරණයෙහි

කොපකාදිවිමානවත්ථුව කියා නිමවනලදී.

මේ විමානවත්ථුදෙශනාවෙහි පිඨවග්ගාදිවණ්ණනාවයි.

තවද මේ විමානවත්ථුප්පකරණයෙහි චිත්‍රලතාවග්ගයෙහි **දුසිවිමාන වත්ථුව** නම් කවරයත්?

දිව්‍යබ්‍රහ්මනමැති හංස සමූහයාවිසින් ඵලවිශ්‍රුතවූ පියුම්විලක්වැනිවූ භාග්‍යවත් බුදුරජානන්වහන්සේ සැවැත්නුවර ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි සැවැත්නුවර වසන්නාවූ එක්තරා උපාසකයෙණක් බොහෝ උපාසකවරුන් සමඟ විහාරයට ගොස් බණ අසා ඉක්බිති සියලු බණ පිරිස නැගි ගියකල ඒ උපාසකයා බුදුන්කරා එළැඹැ නමස්කාර කොට එකත්පස්වනිඳ දක්වනුයේ ස්වාමීනි මම මෙතැන්පටන් සංඝයාට නිරන්තරයෙන් බත්සතරක් දෙමියි කියේය එකල්හි භාග්‍යවත්බුදුරජානන්වහන්සේ ප්‍රසාදානුකූලවශයෙන් බණ වදුරා වදුළ බණෙහි සිත සමාදන්කරවා සමාදන්කළ ප්‍රතිපත්තියෙහි සිත තියුණු කරවා ඒ දානය සංඝයාට දෙවූසේක. ඉක්බිති උපාසකයා බුදුන් වැඳ අවසරගෙණ එයින් නැගි උපාසකවරුන්ගේ ආරාධනා පිළිගෙණ සංඝයා නියමකොට දක්වා දෙන්නාවූ බත්උදෙසන තෙරුන්වහන්සේ කරා ගොස් වැඳ කියන්නේ ස්වාමීනි මාගේ ගෙයි සෙට පටන් නිරන්තරයෙන් බත්සතරක් තබා මාවිසින් සංඝයාට දෙනුලැබෙයි සෙටපටන් සංඝයාවහන්සේ මාගේ ගෙට නිරන්තරයෙන් වඩනාසේක්වයි කියා බත්උදෙසන තෙරුන්වහන්සේට ආරාධනා කොට ඉක්බිති තමන්ගේ ගෙට ගොස් දුසි කැඳවා කියන්නේ මම විහාරයට ගොස් බණ අසා සතුටුසිත් ඇතිව සඟහට නිරන්තරයෙන් බත්සතරක් දෙමිකියා ආරාධනා කෙළෙමි; එසේහෙයින් නිවසින් සැමකලම නොපමා වියයුතුයයි කියේය.

ඒ දුසි වනාහි ශීලසම්පන්න වන්නිය ශ්‍රද්ධා ඇතිහෙයින් විශෙෂයෙන් ම කුසල් කැමැත්තිය; එබැවින් එබසට සතුටුව ඒ වචනය මුදුනෙන් පිළිගෙණ දවසින් දවස කල්බලා නැති ප්‍රණීතවූ අන්නපානභාද්‍ය භොජ්‍යාදි සියලු භොජනවිකෘතිය පිළියෙලකොට ඉක්බිති ගෙයක් හැමද සුවඳ පිරිබඩ ලා අසුන් පණවා භික්ෂූන් වැඩිකල අසුන්වල වඩා හිඳුවා නමස්කාර කොට ගඳදුම්මල් පහන් ආදියෙන් පුදා නිරන්තර යෙන් සතුටු සතුටුව සකස්කොට අහර වලඳවන්නිය; ඉක්බිති එක් දවසක් කරණලද අහරකිසඇති භික්ෂූන්කරාඑලැබැ නමස්කාරකොට විචාරන්නි සවාමිනි ජාතිජරාමරණාදි දුකින් මිදිම කවරහෙයකින් පිළිවන්දැයි විචාළිය; එකල්හි භික්ෂූහු ඒ දුසිඅට සරණසද පඤ්චශීලයද දී ඉක්බිති ශරීරස්වභාව දක්වා කායගතාසති වශයෙන් ප්‍රතිකූලමනසිකාර කම්මස්ථානයන් කියා අනිත්‍යතාප්‍රතිසංයුක්ත ධර්ම්මකථාවෙන් බණ වදාළාහුය. ඉක්බිති ඒයන්‍ත්‍රී එතැන්පටන් සොළොස්අවුරුද්දක් නොකඩකොට සිල්රැකී කරන්නි අතරතුරෙහි සිහිනුවනින් යෙදී කමට හන් මෙනෙහි කරන්නි එක්දවසක් ධර්ම්මශ්‍රවණසත්ප්‍රාය ලැබ ඤනපරිපාකයට ගියබැවින් විදර්ශිනා වඩා සෝවාන්ඵලයෙහි පිහිටියාය; ඒ යන්‍ත්‍රී තොමෝ එයින් පසු නොබෝකලකින් කාලක්‍රියාකොට තවුතිසා දෙවුලොව සක්දෙවුමහරජතන්ට වල්ලභවූ පරිචාරිකාවක්ව උපන්නිය; පමාණික තුර්‍යත්‍රිභාණඝත් සැටදහසක්පමණ නළුන ටකයන් විසින් පිරිවරණ ලදුව ලක්ෂයක් දෙවඟනන්හා සමඟ මහත්වූ දිව්‍යානුභාවයෙන් දිලිහි දිලිහි මහන්දිව්‍යශ්‍රීසම්පත් අනුභවකරන්නි සමහි සතුටුව සහපරිවරින් නන්දනොද්‍යානාදියෙහි ක්‍රීඩා කෙරෙමින් හැසිරෙයි එසමයෙහි ආයුෂ්මත්වූ මුගලන් මහතෙරුන්වහන්සේ ඝට කියනලද ක්‍රමයෙන් දෙවචාරිකාවෙන් වඩනාසේක් ඒ දිව්‍යාඟනාව දැක ඈ විසින් ගිය දවස කළාවූ කුශලකර්ම්මය ලොකඝාහට ප්‍රකාශකරවනුකැමතිව "අපි සක්කොව දෙවිඤ්ඤ" යනාදි ගාථාවලින් විචාළසේක.

"අපි සක්කොව දෙවිඤ්ඤ රමෙම චිත්තලතාවනෙ
සමන්තා අනුපරියාසි නාරිගණපුරක්ඛතා.
ඔභාසෙන්ති දිසා සබ්බා ඔසධි විය තාරකා.

යනුහෙයින් චිත්‍රානම් දිව්‍යාඟනාවගේ කුශලකර්ම්මයෙන් පහළවූ හෙයින්ද බොහෝසේම නොයෙක් එළු පල්ලවයෙන්හා මලින් ගැවසිගත්තාවූ කල්පලතාවනයෙන් ගැවසිගත් හෙයින් චිත්‍රලතා වනඝණී කියනලද අතිරම්‍යවූ උයන්හි දෙවුලොව දෙවියන් පිරිවරා අඛ්‍යුතුන් කෙළක් පුරඝනාවන්හා සමඟ උයන්කෙළියට වන් ශක්‍රයාමෙන් හාත් පසින් ගැවසිගත්තාවූ දිව්‍යස්ත්‍රී සමූහයා මධ්‍යයෙහි ජෙතිමත්ව බබ

ලන්නිය නවද සියලු නාරකාවන් අභිභවා පෙනීමත්ව බබලන්නාවූ ඔසධිතාරකාවක්සේ ශරීරාලොකයෙන් දසදික් එකාලොකකෙරෙමින් බබලන්නිය; එම්බා දෙවතාවූව නි මෙබඳු වණීණ සම්පත් පරිවාරසම්පත් ආදිවූ මේ සියලු සම්පත් ලැබීමට කරණලද කුශල කර්මය කවරේදැයි විවාළසේක; මෙසේ මුගලන් මහතෙරුන්වහන්සේවිසින් විචාරණලද වචනය මුදුනෙන් පිළිගෙණ මේ මතු කියනලද ගාථාවලින් කුශලකර්මය ප්‍රකාශකලාය.

"අහං මනුස්සෙසු මනුස්සභූතා
දූසි අහොසිං පරපෙස්සියා කුලෙ.
උපාසිකා චක්ඛුමතො, ගොතමස්ස යසස්සිනො;
තස්සා මෙ නිකඛමෝ ආසි සාසනෙ තස්ස තාදිනො
කාමං භිජ්ජතිසං කායා, නෙව අපෙතභ සඤ්ඤතං."

යනුහෙයින් සවාමිනි මම මීට පූර්ව ජාතියෙහි මනුෂ්‍යයන් අතුරෙන් අන්‍යන්ගේ ගෙදර දැසියක්ව බැලමෙහෙ කෙරෙමින් ජීවත්වීමි එනකුදුවුවත් ගොතම ගොත්‍රයෙහි උපන්හෙයින් ගෞතම නම්වූ පසැස්ඇති සර්වඥයන්වහන්සේගේ ශාසනයෙහි ශ්‍රද්ධාසම්පන්න උපාසිකාවක්ව සොළොස්හවුරුද්දක් මුලුල්ලෙහි සිල් රක්ෂාකෙරෙමින් කාය ගතාසති ආදි කර්මස්ථාන මෙනෙහි කරන්නාවූ මට මෙබඳු සිතෙක් පහළවිය මෙපමණින්ම මාගේ විඤ්ඤාණනාශය ශීඝ්‍රලවෙහි සිතා විඤ්ඤාණය සිත නිරුද්ධකරන්නෙමි දෙනිස් කුණප කොඨාසයෙන් යුත් මේ කය එකාන්තයෙන්ම පෙනපිඬක්සේ බිඳී යන්නේය. එසේහෙයින් ඒ බුදුන්ගේ සත්තිස් බොධිපාක්ෂික ධර්මසඛ්‍යාත ශාස්ත්‍රාඥා සනයෙහි අප්‍රමාදව විඤ්ඤාණසුතුයයි සිතා බලවත් උත්සාහ ඇතිව චිදහිනා වඩා තෙලෙසුන් කෙරෙන් නික්ම ශාසනඵට ඇතුලන්ව උතුම් ලොකොත්තර ඵලයෙහි පිනිටියෙමි කියා ඉක්බිති ආර්‍ය මාර්ගඵලයෙහි ඵල දක්වන්නි මෙසේ කිව.

"සිකඛාපදානං පඤ්චන්නං මගඵා සොවත්ථිකෝ සිවෝ,
අකණ්ටකෝ අගහණෝ උජු සඛිපවෙදිතෝ,
නිකඛමස්ස ඵලං පස්ස යදිදං පාපුණිත්ථිකා,
ආමන්තනිකා රක්ඛෙ,මකි සක්කායස්ස වසවත්තිනෝ.

යනුහෙයින් යමෙක් නිත්‍ය ශීලවශයෙන් සමාදන්වූ පවසික්ෂාපද කොඨාසයන්ගේ උපනිශ්‍රයභාවයෙන්ද ඒ ශික්ෂාපදයන්ගේ පාරිපූරිකඛයෙන්ද ලද්දාවූ ශික්ෂාපදයන් සම්බන්ධිවූ ඵලයෙන් යම් සිතකා හටගත්තාවූ සන්තානයෙක් ඕහට සර්වප්‍රකාරයෙන් සැප ඵලවාද එබැවින් යහපත්වූ කෙළෙස් සතුරන් කෙරෙන් වන උවදුරු නැති

බැවින් ක්‍ෂෙමවූ රාගනමැති විසකටු නැතිබැවින් පිරිසිදුවූ මිථ්‍යා දෘෂ්ටි නමැති වනගහණයෙන් මිදුනු බැවින් වල් නැත්තාවූ වක්‍ෂා කුවිලහාවයක් නැතිගෙයින් සෘජුවූ බුඩාදි මහොත්තමයන් විසින් ප්‍රතිවෙධ කරණලද්දුවූ යම් ආර්‍යමාගීහයෙක් ඇද්ද ඒ මාගීහයට යම් විර්‍යයකින් යම් උපායකින් යම් ඥානයකින් පැමිණිය්‍යෙම්ද එම එලානිශංසය බලා වදුළ මැනව ඉසුරුමත් සක්දෙවිමහරජානන්ගේ කෙළිකාලයෙහි ඔහුවිසින් අල්ලාප සල්ලාපාදි ක්‍රීඩාවට කැදවිය යුතු විමි කියා හියදවස කළාවූ කුශලයත් එයින් පැමිණි අධිපති භාවයත් ප්‍රකාශකොට ඉක්බිති පිරිවරසමපත් ප්‍රකාශකරන්නි;—

“ සඞ්ඝං තූරියසහස්සානි පටිබොධං කරොන්ති මෙ,
ආලම්බා ගගනමො භිමො සාධුවාදි ච සංසයො.
පොක්ඛරො ච සුඵස්සා ච වීණාමොක්ඛා ච නාරියො,
නන්දෙව සුනන්දා ච සොණදින්නා සුවිම්හිතා.
අලම්බුසා මිස්සකෙසි ච පුණ්ඩරීකාතිවාරුණී,
එනිපඤ්ඤා සුඵස්සා ච සුභද්දා මුදුභාවිනි.
එතා අඤ්ඤූපසෙය්‍යාසෙ අවජරානං පබොධිකා,
තා මං කාලෙනුපාගන්ත්වා අභිහාසන්ති දෙවතා.
හන්ද නච්චාම ගායාම හන්ද නං තං රමාමසෙ,
නසිදං අකතපුඤ්ඤානං කතපුඤ්ඤානමෙවිදං.
අසොකං නන්දනං රම්මං නිදසානං මහාවනං,
සුඛං අකතපුඤ්ඤානං ඉධ නත්ථි පරත්ථ ච,
සුඛඤ්ච කතපුඤ්ඤානං ඉධවෙව පරත්ථ ච.”

යනුහෙයින් හෙරිචිණාදි තූර්‍යභාණ්ඩයන් අතුරෙන් එක් මුහුනින් යුත් සෑලබෙර විදුරුබෙර ආදිවූ ආතතනම් තූර්‍යවිශෙෂයෙන් දෙළසෙක එසේම දෙමුහුනින්යුත් මිහිකුබෙරආදි විතතනම් තූර්‍යවිශෙෂයෙන් දෙළසෙක සවිවහාගයෙන් වෙළා කරණලද පණාබෙර ආදිවූ ආතතවිතතනම් තූර්‍යවිශෙෂයෙන් දෙළසෙක කුලුතාලම් ආදි කොටඇති ඝණනම් තූර්‍යවිශෙෂයෙන් දෙළසෙක වස්ත්‍රුලල් සක් සිත්තම්ආදි සුසිරනම් තූර්‍යවිශෙෂයෙන් දෙළසෙකැයි මෙසේ පඤ්චා ඟිකතූර්‍යභාණ්ඩවිශෙෂයෙන් මදුළස දෙළසත් එකිනෙකට දහස දහ ස බැගින් පරිවාරහා සමඟ සැටදහසක් පමණවූ ආලම්බනම් ගන්ධර්ව දිව්‍යපුත්‍රය එසේම ගගනමය භිමය සාධුවාදිය සංසයය ප්‍රඤ්ඤාරය සුඵ සසය යනාදි නොයෙක් ගන්ධර්වදිව්‍යපුත්‍රයන්ගෙ විණාමොක්ඛය නන්දය සුනන්දය සොණදින්නාය අලම්බුසාය මිස්සකෙසිය පුණ්ඩරීකාය යනාදිවූ

නොයෙක් දිව්‍යාඟනාවන්හා මෙකී නොකී සැටදහසක් පමණ නළුනාටක සෙනාව පච්චාභිකතූර්‍යත්‍රිභාඝණ්ඩ ගෙණ යුක්තප්‍රයුක්තවූ කාලයෙහි මාකරා එලැඹ භාවභාවලීලා දක්වා මෘදු ප්‍රියවචනයෙන් මෙසේ කියති හිමි කුමක්කරමෝද නෘත්‍යකරමෝද ගායනාකරමෝද කවරක්‍රීඩාවක්‍ෂනුබ සිත්ඇලේද යනාදී ප්‍රියබස් කියා පදමයක් ප්‍රබොධ කරන්නාසේ මාගේ සිත සතුටුකරවති මාවිසින් ලද්දාවූ මේ දිවඉසුරු කුසල් කළවුන්ටම නියතවා විනා කුසල් නොකළවුන්ට නොලැබෙන්නේය තවුතිසාවැසි දෙවියන්ගේ සිත් සතුටු කරවන්නාවූ සිත්කළුවූ මේ නැණනම් උයනෙහි ක්‍රීඩාසැප විඳිමහා ඉහලොක පරලොක සම්පත්තියද කුසල් නොකළාවූ උභයලොකවාසින්ටම නොලැබෙයි කියා කුසල් කළවුන්ටම සාධාරණබව දක්වනපිණිස;

"නෙසං සඟව්‍යකාමානං කත්තබ්බං කුසලං බහුං,
කත්තපුඤ්ඤකිමොදන්ති සබ්බභොගසමඞ්ගිනොති."

යනුහෙයින් ඒනවුතිසාවැසි දෙවියන්හා එක්ව දිව්‍යසම්පත් අනුභව කරණු කැමැත්තන්විසින් දානශීලාදි වගයෙන් බොහෝ කුසල් කට යුක්තේයයි කිව; එකල්හි මුගලන්මහතෙරුන්වහන්සේ පිරිවර සහිතවූ ඒ දෙවිදුවට විසතරවශයෙන් බණ වදාරා මිනිස් ලොවට වැඩසියලු ත්‍රවෘත්තිය බුදුරජානන්වහන්සේට සැලකළසේක, බුදුරජානන් වහන්සේ එම අත්ථොත්පත්තිකොට ගෙණ එතැන්හි රැස්වූ පිරිසට ධර්ම්මදෙශනා කොට වදාළසේක, ඒ ධර්ම්මදෙශනාව දිව්‍යමනුෂ්‍යයන් සහිත ලොකයාහට සාර්ත්ථකවිය.

මේ විමානවත්‍ථු ප්‍රකරණයෙහි චිත්‍රලතාවගීනයෙහි
දෘෂ්ටිවිමානවත්‍ථුව කියා නිමවනලදී.

නවද මේ විමානවත්‍ථුප්‍රකරණයෙහි **ආචාමදායිකාවිමානවත්‍ථුව** නම් කවරයත්?

බුදුරජානෝ රජගහනුවර වෙළුවනාරාමයෙහි වැඩවසන සමයෙහි එම නුවර එක්තරා කුලයක් අභිඝාතකරොගයෙන් නැසි එක් සත්‍රියක් ඉතිරිව හිඳිනිය බිඳ ගොස් එක්තරා ගෙයක පිටිපස දුඃඛජීවිකාවෙන් ජීවත්ව වසන්නී ආයුෂ්මත් මහාකාශ්‍යපස්ථවිරයන් වහන්සේට ලුණු නුමුසු පිලිනිකැඳින්තක්දී එදවස් රාත්‍රියෙහි කාලක්‍රියාකොට නිම්මානරති නම් දිව්‍යලොකයෙහි උපන්නීය ශක්‍රදෙවෙන්ද්‍රයෝ ඒ සත්‍රියකාලක්‍රියාකළබව දැන මහාකාශ්‍යපස්ථවිරයන්වහන්සේකරා ගොස් මෙසේ විවාළේය.

" පිණ්ඩාය තෙ චරන්තස්ස තුණ්හීභූතස්ස තිට්ඨතො,
දලිද්දා කපණා නාරී පරාගාරං අවස්සිතා.
යා තෙ අදාසි ආවාමං පස්සන්තා සකෙහි පාණිභි,
සා හිත්වා මානුසං දෙහං කින්නු සාදිසතං ගතා"

යනුහෙයින් සවාමිනි පිඬුපිණිස වැඩ තූෂ්ණීම්භූතව සිටියාවූ නුඹව හන්සේට පිළිනිකැඳිත්ත දුන් දිළිඳු සහි කාලක්‍රියාකොට කොයි උපන්නීදැයි විවාලේය එකල්හි මහතෙරහු මෙසේ වදළසේක.

" පිණ්ඩාය මෙ චරන්තස්ස තුණ්හීභූතස්ස තිට්ඨතො,
දලිද්දා කපණා නාරී පරාගාරං අවස්සිතා.
සා මෙ අදාසි ආවාමං පස්සන්තා සකෙහි පාණිභි,
සා හිත්වා මානුසං දෙහං විප්පමුත්තා ඉතො චුතා.
නිම්මානරතිනො නාම සන්ති දෙවා මහිද්ධිකා,
තත්ථ තා සුඛිතා නාරී මොදතාවාමදාසිකා 'ති "

යනුහෙයින් ශක්‍රදෙවෙන්ද්‍රය මට පිළිනිකැඳිත්ත දුන් දුක්පත් ස්ත්‍රිය ඒ කැඳිත්ත දුන් කුශලයෙන් නිම්මානරතිනම් දිව්‍යලොකයෙහි උපන්නියයි වදළසේක මෙහි විස්තරදෙශනාව පරිවෙජදපොතෙහි හෙළුබසින් ප්‍රකාශවූබැවින් මෙතැන්හි සංක්ෂෙප විය, විස්තරඅසනුකැමැත්තාහු දුනපරිවෙජදයෙන් අසා දතයුක්තේය; ඉක්බිති ආයුෂ්මත් මහාකාශ්‍යපස්ථවිරයන්වහන්සේ ශක්‍රයා විවාළ නියාවත් මහතෙරහු වදළ නියාවත් විස්තරවශයෙන් බුදුන්ට දැන්වූසේක් බුදුරජානෝ එම අර්ථොත්පත්තිකොට ගෙණ එතැන්හි රැස්වූ පිරිසට බණ වදළසේක, ඒ ධර්මදෙශනාව බොහෝ දෙනාට සාර්ථකවිය.

මේ විමානවස්තුප්‍රකරණයෙහි චිත්‍රලතාවග්ගයෙහි ආවාමදාසිකාවිමානවස්තුව සංක්ෂෙපයෙන් නිමවනලදී

නවද මේ විමානවත්‍රප්‍රකරණයෙහි චිත්‍රලතාවග්ගයෙහි **චඩාලී විමානවත්‍රව** නම් කවරයන්?.

මහපොළොවසේ විස්තාරවූ ගුණඇති භාග්‍යවත් බුදුරජානන්ට හන්සේ රජගහනුවර වැඩවසන සමයෙහි බුදුරජානන්වහන්සේ එක් දවසක් අලුයම්වේලෙහි මහාකරුණාසමාපත්තීන් නැඟි විනෙයජනයන්දක්නාපිණිස මුලුලොව බලාවදරණසේක් රජගහනුවර සමීපයෙහි එක්තරා සැඩොල්ගමෙක් ඇත ඒ ගම වසන්නාවූ ගෙවිනාවූ ආත්ම ඇතිව නරකයෙහි උපදනා අකුසල්ඇති වණ්ඩාලමැහැල්ලක් දැන බිදු

රා ඇකෙරෙහි කරුණා උපදවා සිතා වදුරණසේක් සවහිලොකසමප තට කාරණාවූ කුශලයක් ඇලවා කරවා නරකයට යන ගමන් වළ කා දෙව්ලොව උපදවම් සිතා වදුරා මහත්වූ භික්ෂුසංඝයා පිරිවරා රජ ගහනුවරට පිඬුසිහා වැඩිසේක; එසමයෙහි ඒ සැඩොල්මැහැල්ල සැර ඝට දඬුකඩෙක එල්බ ගෙණ නුවරින් නික්ම යන්නී මහසඟපිරිවරා වඩනා බුදුන් දැක ඉදිරියෙහි සිටියාය සව්වඤ්ඤන්වහන්සේද ඇගේ ගමන් වළකන්නාසේ මහසඟ පිරිවරා මාගීහය මැද වැඩසිටිසේක; එකල්හි ආයුෂ්මත් මුගලන් මහතෙරුන්වහන්සේ බුදුන්ගේ අදහස් දැන එදවස්ම ඇගේ ආයුසංස්කාරය ගෙවෙන නියාව දැන ඇකෙරෙහි කරුණා උපදවා බුදුන් සිරිපා වඳවා වැඩෙහි යොදනු පිණිස ඉදිරි යෙහි සිටි සැඩොල් මැහැල්ලට මෙසේ වදාළසේක.

"චණ්ඩාලි වන්ද පාදානි ගොතමස්ස යසස්සිනෝ,
තමෙව අනුකම්පාය අට්ඨාසි ඉසිසත්තමෝ.

අභිප්පසාදෙහි මනං අරහන්තමහි තාදිනෙ,
ඛිප්පං පඤ්ජලිකා වන්ද පරිත්තං තව ජීවිතන්ති".

ඇතුළෙහින් එම්බා සැඩොල්මැහැල්ල මේ එසේ මෙසේ කෙණෙක් නොවෙයි ෂට්විධ මුනින්ට ශ්‍රෙෂ්ඨවූ නොහොත් විපස්සිබුදුන් ආදි කොට සත්වැනිව බුදුවූ සියල්ල දත් බුදුකෙණෙක, තිකෙරෙහි අනුකම්පාවෙන් නුවරට නොවැඩ මහසඟ පිරිවරා අතරමඟ වැඩසිටි සේක. සියලු දිව්‍ය මනුෂ්‍යයන්විසින් කරණලද පූජාවට සුදුසුවූ බුදුන් කෙරෙහි සිත පහදවා ගනුව, තිගේ ජීවිතය බොහෝ කල් නොපවත් නේය දැන්ම බිඳී විනාසයට පැමිණෙන සවභාව ඇත්තේය; එසේහෙ යින් ගෞතම සව්වඤ්ඤන්වහන්සේගේ ශ්‍රීපාදවන්දනාවට නමස්කාර ක රව එපමණ කුශලකර්මය නිට පිටිවහල් වෙයි වදාළසේක; ඒබැව් ප්‍ර කාශනොට දක්වන්නාවූ සඞ්ගීතිකාරක මහාස්ථවිරයන්, විසින්;

"වොදිනා භාවිතත්තෙන සරීරන්තිමධාරිනා,
චණ්ඩාලි වන්දි පාදානි ගොතමස්ස යසස්සිනෝ,

තමෙනං අවධි ගාවී චණ්ඩාලිං පඤ්ජලිං ඨිතං.
නමස්සමානං සම්බුද්ධං අඞ්කාරෙ පහංකරං,

ඛීණාසවං විගතරජං අනෙජං
එකං අරඤ්ඤමහි රහෝ නිසින්නං,
දෙවාධිපත්තා උපසඞ්කමිත්වා
වන්දි නං හිර මහානුභාවන්ති"

යනුහෙයින් බුඩාදිමහොත්තමයන් විසින් භාවිතවූ ආයතිමාගිහය ට පැමිණ එම මාගීහභාවනාවෙන් කෙලෙසුන් තවා සසර සැරිසරන්නාවූ භවොත්පත්ති නැතිහෙයින් කෙළවර ආත්මය ධරන්නාවූ මුගලන් මහතෙරුන්වහන්සේවිසින් පොදනාකරණලද ඒ වණ්ඩාල මැහැල්ල බුඩාලඹනප්‍රිනි උපදවා ඔපදෙන්නමවූ ගොතම සම්‍යක්සම්බු ඩසව්වඥරාජොත්තමයානන්වහන්සේගේ ශ්‍රීපාදවඳයට පසඟ පිහිටුවා වැඳ නැගි සිට දෙගොන් මුදුන්දී බුදුන් වඩනාකල්හිද බල බලා බු ඩාලඹනප්‍රිනියෙන් වැඳ සිටියාය; එකල්හි බුදුරජානන්වහන්සේ මේ පමණෙක්ම මේ මැහැල්ලට වැඩපිණිස වන්නේයයි සිතා වදුරා මග සඟ පිරිවරා ඇතුළු නුවරට පිඬුසිඟා වැඩිසේක; එකල්හි අලුත වැදූ දෙනක් ලබා වස්සෙකු ගෙණ කුලුව දිවන්නී බුදුන් බලබලා වැඳසිටි වණ්ඩාල මැහැල්ලට අහින් ඇණ ඉරා එතැන්හිම ජීවිතක්ෂයට පමු ණුවාපුව; ශරීරයෙහි තලබිජ්ජවටත් පමණ නැනින් නැනි රයිසෙන් අනන්තාපරිමාන සක්වල එකාලොකකරතත් පොහොසත්වූ තවද ස ඞ්ඝයන්ගේ නුවණ නමැති ඇස් වැසි සිටි මොහාන්ධකාර විධ්වංසනය කොට ප්‍රඥනමැති ආලොකයෙන් නිවන්මග එලිය කළාවූ සම්‍යක් සම්බුඩසව්වඥරාජොත්තමයානන්වහන්සේගේ ශ්‍රීපාදවඳයට නමස්කා කාරකළාවූ කුශලයෙන් එම වශඩාල මැහැල්ල තව්තිසා දෙවිලොව මහත්වූ රත්විමනෙක උපන්නිය, එකොණෙනිම දිව්‍යඍඩිප්‍රාප්තවූ ඒ දිව්‍යාඟනාතොමෝ ඈගේ දිවඉසුරු බලා කවරකුශලකර්මයක් හෙ තුකොට ගෙණ මෙබදු සම්පත්තිප්‍රතිලාභයෙන් මට විදැසි යටගිය දවස කළාවූ සුවරිතකර්මය නුවනැසින් බලන්නී මුගලන්මහතෙ රුන්වහන්සේගේ නියොගයෙන් බුදුන්ගේ ශ්‍රීපාදවඳ්වයට නමස්කාර කළාවූ කුශලකර්මයෙන් ලද්දාවූ ඉෂ්ටවිපාකයයි දැක මහත්වූ සන්තෝ ෂයට පැමිණ බුදුගුණහා මහතෙරුන්වහන්සේගේ ගුණ සිහිකොට එදවස් මහතෙරුන්වහන්සේ දක්නට යෙමි සිතා විමානයහා සමග මිනිස්ලොවට අවුත් එක්තරා වනාන්තරයෙක ඡායාසම්පන්නරුකක් මුල එකලාව කායවිවෙකයට පැමිණ දිවාවිහරණයෙන් වැඩහුන් නාවූ මුගලන්මහතෙරුන්වහන්සේ කරා එලැඹ විමානය ආකාශයෙ හි රඳවා විමානයෙන් බැස මහානුභාවසම්පන්න මහාවීරයානන්වහන්ස නුබවහන්සේට නමස්කාර කෙරෙමි කියා නමස්කාරකළාය. එසේ සඟපිරිවරින් අවුන් නමස්කාරකොට ශරීරප්‍රභාවෙන් සියලු වනලැහැ බ එකාලොක කොරමින් දිලිහි දිලිහි සිටි දිව්‍යාඟනාව දැක මෙසේ විවාළසේක,

"සුවණ්ණවණ්ණා ජලිතා මහායසා
විමානමාරුය්හ අනෙකචිත්තා,
පරිවාරිතා අච්ඡරාසංඝණෙන
කා ත්වං සුභෙ දෙවතෙ වන්දසෙ මමන්ති".

යනුහෙයින් අනෙකප්‍රකාරවූ විචිත්‍රවිත්‍රකවිමාන්නයෙන් හෙබියාවූ දිව්‍යවිමානාරූඪව අවුත් මා දැක විමානයෙන් බැස ලක්ෂයක් දෙවඟ නන් පිරිවරා කනක රූපයක්මෙත් දිලිහි දිලිහි මාකරා එලැඹ නම ස්කාරකොට එකත්පව සිටියාවූ නි කවුරුදැයි විචාරා වදාළසේක; මෙසේ මහතෙරුන්වහන්සේ විසින් විචාරණලද ඒ දිව්‍යඟනාතොමෝ ම හත්වූ ආදර බහුමාන ඇතිව මහතෙරුන්වහන්සේගේ වචනය මුදු නෙන් පිළිගෙණ හිය දවස කළාවූ සුචරිතකර්මඵලයෙහා ඒ සියලුම ප්‍රවෘත්තිය මහතෙරුන්වහන්සේට දන්වන්නී මෙසේ කිව.

"අහං භන්තෙ චණ්ඩාලී නාහා වීරෙන පෙසිතා,
වන්දිං අරහතො පාදෙ ගොතමස්ස යසස්සිනො.

සාහං වන්දිත්ව පාදානි වුත්තා චණ්ඩාලයොනියා,
විමානං සබ්බතො භද්දං උපපන්නම්හි නන්දනෙ.

අච්ඡරානං සතසහස්සං පුරක්ඛත්වාන තිට්ඨසි,
තාසාහං පවරා සෙට්ඨා වණ්ණෙන යසසායුකා.

පහූතා කන්තකල්‍යාණා සම්පජානා පතිස්සතා.
මුනිං කාරුණිකං ලොකෙ තං භන්තෙ වන්දිතුමාගතා'නි."

යනුහෙයින් විශිෂ්ඨසම්පන්නවූ සෘද්ධිමත්තන්කෙරෙහි අගතැන්පත් සම්මාසම්බුද්ධයන්වහන්ස නුබවහන්සේවිසින් බුදුගුණ කියා චණ්ඩාලමැහැල්ල බුදුන්ගේ ශ්‍රීපාදවන්දනයට විදුවහි නියොගකරණලදුව ගෞතම බුදුන් ගේ ශ්‍රීපාදයුගලයට නමස්කාරකළාවූ චණ්ඩාල මැහැල්ල නම් මමය එදවස් අළුත වැදූ දෙනක් ලමාවස්සෙකු ගෙණ කුලුව දිවන්නී බුදුන් බලබලා වැඳ සිටි මා එතනම ඇණ මැරුවාය ඒ නමස්කාරමය කුශ ලය බලපෑවී නමුදු පින්කෙත බලවත්හෙයින් ඒ චණ්ඩාලාත්මභාව යෙන් චුතව තවුතිසා දිව්‍යලොකයෙහි රන් රිදී මුතු මැණික් ආදිවූ නොයෙක් රත්නයෙන් නිම්හෙයින් සර්වප්‍රකාරයෙන් යශපත්වූ දුටු දුටුවන් සිත් සතුටු කරවන්නාවූ දිව්‍යවිමානයෙක උපන්මි මේ ලක්ෂයක් පමණ දිව්‍යාඟනාවන්ට වඩා ශරීරවර්ණ යස ශ්‍රීආදියෙන් උතුම්වීමි එසේ නමස්කාරවශයෙන් කරණලද කල්‍යාණකර්මය හෙතුකොටගෙණ උපන්නාවූ ඉෂ්ටවිපාකය සිහිකරන්නාවූ මම තුබුරුවන් කෙරෙහි විශෙෂයෙන්ම සතුටුව සත්ත්වලොකයා කෙරෙහි පතළ

කරුණාඇති බුදුන්ගේ ගුණයද එසේම භාග්‍යවතුන්වහන්සේගේ ගුණයද සිහිකොට භාග්‍යවතුන්සේ වදහාපිණිස ආයෙමි කියාය; ඒ බව ප්‍රකාශ කොට දන්වන්නාවූ සඞ්ගීතිකාරක මහාස්ථවිරයන් විසින්;-

"ඉදං වත්වාන චණ්ඩාලී කතඤ්ඤූ කතවෙදිනී,
වන්දිත්වා අරහතෝ පාදෙ තත්ථෙවන්තරධායථා'ති".

යනුහෙයින් නියතව සිටි අපාය මාර්ගය වළකා සවර්ගලෝකසම්පත්තියට කාරණාවූ වන්දනාමය සුචරිතකර්මය කියා කරණලද උපකාර සැලකීමෙන් කෙළෙහි ගුණ දන්නාවූ ඒ චණ්ඩාල දිව්‍යාඟනා තොමෝ මේ සියලුම ප්‍රවෘත්තිය මහතෙරුන්වහන්සේට කියා ඉන් බිහි මහතෙරුන්වහන්සේගේ ශ්‍රීපාදවන්දයට නමස්කාරකොට එතැන් හිදීම අන්තර්ධානව දෙව්ලොවටම ගියාය.

ඉක්බිති ආයුෂ්මන්වූ මුගලන් මහතෙරුන්වහන්සේ භාග්‍යවත් බුදුරජානන්වහන්සේට එපවත් දන්වූසේක, බුදුරජානන්වහන්සේ එම අර්ථොත්පත්තිකොට ගෙණ එතැන්හි රැස්වූ පිරිසට ධර්මදෙශනා කොට වදළසේක; ඒ ධර්මදෙශනාව බොහෝදෙනාට ප්‍රයොජනවිය.

මේ විමානවත්ථුප්‍රකරණයෙහි චිත්‍රලතා වර්ගයෙහි චණ්ඩාලී විමානවත්ථුව කියා නිමවන්ලදි.

තවද මේ විමානවත්ථු ප්‍රකරණයෙහි චිත්‍රලතාවර්ගයෙහි **භද්‍රාවිමානවත්ථුව** නම් කවරෙක්ද?

සකලජනහෘදයානන්දකරවූ භාග්‍යවත් බුදුරජානන්වහන්සේ එක් සමයෙක සැවැත්නුවර ගොදුරු ගම්කොට දෙවිරම් වෙහෙර වැඩව සිටිසේක, එසමයෙහි කිම්බිල නුවර රොහකනම් සිටුපුත්‍රයෙක් ඇත්තේය හෙතෙම තුනුරුවන් කෙරෙහි ප්‍රසන්නසිත් ඇතිව ශ්‍රද්ධාබුද්ධිසම්පන්නව ශීලාචාරගුණ ඇත්තේය එම නුවර එසේම උපභොගපරිභොග සම්පත් ඇති සමානකුලගෙයක යහපත් රූපශ්‍රී ඇත්තාවූ එක්නරා භද්‍රානම් උපාසිකා කුමාරිකාවක් ඇත්තිය, ඕතොමෝ ශ්‍රද්ධාසම්පන්නවුව ශීලසම්පන්නවුව යහපත් ආචාරසමාචාර ඇතිබැවින් ප්‍රධානිනාමයෙන්ම භද්‍රානම් වූවාය, එසමයෙහි රොහකකුමාරයාගේ මවු පිය දෙදෙන භද්‍රාවගේ මවුපියන්හා කථාකොට ආවාහවිවාහයට සුදුසු අවස්ථාවෙහි ශුභවූ නක්ෂත්‍රදිනයෙක භද්‍රාව රොහකයන්ට සරණපාවා දුන්හ; එතැන් පටන් ඔහු දෙදෙන සමඟි සතුටුව ප්‍රිය සංවාසයෙන් වසන්නාහු ඒ කුමාරිකාතොමෝ සැමියාටද මවුපිය නැදි මිතිල් හිලන් වැඩිමහල්ලන්ටද ආචාර සමාචාර ඇතිබැවින් භද්‍රාවයයි කියා සියලු නුවර මුලුල්ලෙහි ප්‍රසිද්ධවූවාය.

එසමයෙහි අග්‍රශ්‍රාවකවූ සැරියුත් මුගලන් දෙදෙනාවහන්සේ පන්සිය යක් භික්ෂුසංඝයා පිරිවරා දනව් සැරිසරන්නාහු අනුක්‍රමයෙන් කිමිබිලනු වරට පැමිණියාහුය, එකල්හි රොහකනම් සිටුපුත්‍රයා සැරියුත් මුගලන් දෙදෙනාවහන්සේ ඒ නුවරට වැඩිබව අසා දැන මහත්වූ සත්කාරඇතිව මහතෙරුන් කරා ගොස් නමස්කාර කොට ස්වාමීනි සෙට දවස මාකෙරෙහි අනුකම්පාවෙන් මාගේ දානය ඉවසා වදාළ මැනවැයි කියා සැමදෙනාවහන්සේටම දන් පවරා දෙවන දවස් අහර පිළියෙළ කොට ප්‍රණීතවූ ඛාද්‍යභොජ්‍යාදියෙන් සැම දෙනාවහන්සේම වළඳවා ඉක්බිති පුත්‍රදාරාවන්හා සමග මහතෙරුන් වැඳ එකත්පස්ව හිඳ කාලානුරූපවශයෙන් වදාරණලද ධර්මදේශනාව අසා අවවාදයෙහි පිහිටමින් සරණයෙහි පිහිටා පන්සිල් සමාදන්විය ඔහුගේ භාර්‍යාභද්‍රාව වනාහි නිරන්තරයෙන් පඤ්චශීලය රක්ෂාකෙරෙමින් අටවක් දිනය තුදුස්වක් පසළොස්වක් දිනය පාටිපදිකය යන මේ පොහෝ දවස් පෙහෙවස් වෙසෙමින් අතිශයින්ම ශීලාචාරගුණයෙන් යුක්තවූ වාය, එසේහෙයින් දෙවතාවන්විසින්ද කරණලද අනුකම්පා ඇති හෙයින් ඒ භද්‍රාවගේ හිස මත්තෙහි මිථ්‍යාවාදවශයෙන් වැටුනාවූ ලොකාපවාද සන්සිඳුවා ශීලාදි ගුණය ලොවට ප්‍රකාශකරණලදුව අතිශයින්ම ගුණකීර්තිය දසදිග පැතිර ගියේය; ඒ කෙසේවූ මිථ්‍යාවාදයෙක්ද යත්? එසමයෙහි එක්දවසක් ඒ භද්‍රාවගේ ස්වාමීවූ රොහකයෝ වෙලඳුම් පිණිස කිමිබිල නුවරින් නික්ම තක්සලා නුවරට ගියේය, එකල තක්සලා නුවරවාසීන්ගේ නකැත්කෙළිනම්වූ උත්සව දිනය සම්ප්‍රාප්ත විය, එදවස් රොහකයන්ගේ යහලුවෝ රොහකයන් කරා ගොස් යහලු රොහකයෙනි නකැත්කෙළියට යම්හයි කියා කැඳවූහ; එබැවින් රොහකයන්ටද නකැත්කෙළියට යන අභිප්‍රා ඇතිවිය; එකල්හි යට කියනලද ඔහුගේ භාර්‍යාවූ භද්‍රානම් කුමාරිකාව කිමිබිල නුවර වෙසෙසි ඒ උත්සව දිනයෙහි නකැත්කෙළියට යන අභිප්‍රාව රොහකයන් සිත ගටගත්කෙණෙහිම ඒ භද්‍රාවගේ ශීලානුභාවයෙන් ඒ හෙයි අධිගෘහීත දෙවතාවා විසින් ඔහුගේ දිව්‍යානුභාවයෙන් ඈගේ ස්වාමීවූ රොහකයෝ යම්තැනක වෙසෙද්ද ඒ සමාගමයට පමුණුවා රොහකයන්හා නකැත්කෙළියට යොදවනලදුව එදවස් ස්වාමිපුත්‍රයන්හා ප්‍රිය සංවාසයෙන් භද්‍රාව කුස දරු බිජුවටක් ඇතිවිය, නැවත ඒ දෙවතාවාවිසින් ඒ කුමාරිකාව කිමිබිල නුවරට පමුණුවන ලදුව අනුක්‍රමයෙන් දරුගැබ මහත්ව ගර්භාභාවය ප්‍රකාශව ගටගත් කල්හි අනාචාරයේ හැසිර සොර සැමියන්හා වැස දරු ලද්දියයි කියා නැදි මයිල් ආදිහු විසින් සැක ඉපදවූහ, එකල්හි එම දෙවතාවා විසින් ඔහුගේ දිව්‍යානුභාවයෙන් ඒ ශබ්දාර්ථය නැතිකරවන පිණිස මහත්වූ

ගංගාජලප්‍රවාහය සියලු කිමිබිලඟුවර වසා රල නැගි පැතිර එන්නාසේ වාසුවෙගයෙන් ඉතිර නැතුණු කල්හි ඒ හද්දාවතේ පතිව්‍රතා ධර්ම සඛ්‍යාත සත්‍යක්‍රියා බලයෙන් ඒ ජලප්‍රවාහය නැවත වානවෙග යෙන් පෙරසේම ගඟටම බැස ගියේය, එකල්හි නැදිමඟිල් ආදීන්ගේ ශඛ්‍යතාව සුලන් දුටු පරඔලා පතක්සේ දුරුවිය; ඉක්බිති ඈගේ සවාමි පුත්‍රයා විසිනුදු පෙර නැදිමඟිල් ආදිහු සැක කළාසේම අනාචාරයේ දරු ලද්දියගි කියා සැක කරණලද්දිය; එකල්හි තක්සලා නුවරදී ඔහු විසින් දෙනලද පේරස්මුද්ද දක්වා ඔහුගේ සැක දුරුකොට මෙ සේ යශපත් ශීලාචාර ගුණසම්පත් ඇති බැවින් සවාමිපුත්‍රයාහා මවු පිය නැදිමඟිල් ආදි සියලු නෑසත්හේද නුවර වැසියන්හේද සැක දුරු කොට දිව්‍යමනුෂ්‍යයන් සහිතවූ සියල්ලවුන්ගෙන් කිනිතිප්‍රශංසා ලැබ අනිගසින්ම ලොකයෙහි ප්‍රසිඛවූවාය.

ඉක්බිති ඒ හද්දානම් උපාසිකා නොමෝ එයින් පසු නොබෝ දවස කින් කාලක්‍රියාකොට තවුතිසා දිව්‍යලොකයෙහි උපන්නිය; එසම යෙහි භාග්‍යවත් බුදුරජානන්වහන්සේ සැවැත්නුවර ගණඩම්බවෘක්ෂමූ ලයෙහිදී යමකප්‍රාතිහාර්‍යය කොට නිජ්ඣක මඨනය කෙරෙමින් තුන්වැ යවරකින් තවුතිසාභවනයට වැඩිකල්හි සක්දෙව් මහරජානෝ දෙව් පිරිස් පිරිවරා බුදුන්කරා එලැඹ නමස්කාර කොට ඉක්බිති බුදුන්ට වැඩ ඉන්ට නිසි අස්නක් පරීක්ෂාකරන්නේ පාණ්ඩුකම්බලශෛලාසන යට වඩා උතුම් ආසනයක් මේ දිව්‍යලොකයෙහි නැත්තේය මේ ශෛ ලාසනය දිග සැටයොදුන පුලුල පණස්යොදුන උස පසළොස්යොදුන බුදුරජානෝ දෙලොස්රියන් උසඇතිසේක මේ අස්නෙහි වැඩලන් කල මහත් පර්වතයක් මත්තෙහි සිටි වටුකුරුල්ලෙකුසේ ප්‍රකාශව නොපෙ ණෙනසේක්දෝහෝයි සැක සිත සිතා බුදුන් වඩාගෙණ ගොස් පාණ්ඩු කම්බලශෛලාසනය බුදුන්ට පිළිගැන්විය, එකල්හි සර්වඥයන්වහන් සේ ඔවුන්ගේ අදහස් දැන දෙවතාවෝ බුදුබල නොදන්නාහුයයි සිතා වදුරා දිග නවපියත් පුලුල සවියත් සුගත් සිවුර සතර පටක්කොට මහත් රන්පලසකින් කුඩා පුටුවක් වසන්නාසේ බැලූ බැලූ දිග සිවුරම විනා පඬුපුල් අස්න නොපෙණෙනසේ වසා අතුට ආසනය පුරා වැඩහුන්සේක. එකල්හි දෙවතාවෝ සතුටුව අහෝ ආශ්චර්‍යමිත් බුදුබලයක් බලවයි කියා සාධුකාර පැවැත්වූහ. මෙසේ ඒ බුදුරජානන්වහන්සේ තවුතිසාභවනයට වැඩ පරසතු ගසමුල පඬුපුල් අස්නෙහි වැඩහුන් කල්හි දසදහසක් සක්වල දෙවතාවෝ බුදුන්කරා එලැඹ නමස්කාර කොට එකත්පස්ව උන්නාහු ඒ දෙවතාවන් අතුරෙන් ඒ හද්දානම් දිව්‍යාඟනාවද බුදුන්කරා එලැඹ නමස්කාර කොට එකත්පස්ව සිටි යාය; එදවස් දසදහසක් සක්වල දිව්‍යබ්‍රහ්මයන් මධ්‍යයෙහි ඒ හද්දානම්

දිව්‍යාඟනාවගේ ඓශ්වර්‍යසම්පත්තියත් තිය දවස කළාවූ කුශලකර්මයත් ප්‍රකාශකරවනු පිණිස බුදුරජානන්වහන්සේ මෙසේ විචාරා වදාළසේක.

"නීලා පීතා ච කාලා ච මඤ්ජිට්ඨා අථ ලොහිතා
ඵලිකාවවාඝාතං වණ්ණවානං කිඤ්ජක්ඛපරිවාරිතා.
මන්දාරවානං පුප්ඵානං මාලං ධාරෙසි මුද්ධනි
න ඉමෙ අඤ්ඤෙසු කායෙසු රුක්ඛා සන්ති සුමෙධසෙ.
කෙන කායං උපපන්නා තාවතිංසං යසස්සිනි
දෙවතෙ පුච්ඡිතාචික්ඛ කිස්ස කම්මස්සිදං ඵලන්ති."

සතුහෙයින් නීල පීත ලොහිතාවදාත මාඤ්ජිට්ඨප්‍රභාස්වරයයි කිය හැලද අනෙකප්‍රකාර වර්ණසම්පන්න පත්‍රකිඤ්ජල්ක කෙසරපඞ්ක්තියෙන් හෙබියාවූ මදරා මලින් ගොතා කරණලද මුදුන් මල්දාමින්ගෙ අනෙකප්‍රකාර විචිත්‍ර චිත්‍රකර්මාඞ්ගයෙන් හෙබියාවූ මල්වඩම් වලින් සැරහී සෙසු දෙවතාවන් මධ්‍යයෙහි දිප්තිමත්ව බබලන්නිය එම්බා දිව්‍යාඟනාව මේ දෙව්ලොව සෙසු දෙවතාවන් අතුරෙහි මෙබඳු මල් ඔස් නැත්තේය අනික් දෙවතාවන් අතුරෙහි මෙබඳු සැරසිමත් නැත්තේය මහත්වූ යසශ්‍රීඇති එම්බා දෙවතාදුව තිය දවස තිවිසින් කරණලද කවර කුශලකර්මයක් හෙතුකොටගෙණ මේ තවුතිසා භවනයෙහි උපන්නිද මාවිසින් විචාරණලද මේ පැණය මේ දෙව්බඹ පිරිස්මැද ප්‍රකාශකරව යම් කුශලකර්මයකින් මෙබදු දිව්‍යශ්‍රීසම්පත්තියත් ලබනලද්දේවිනම් ඒ කුශලකර්මයාගේ මේ ඵලයයි කියා ප්‍රකාශ කරවයි වදාළසේක. එකල්හි ඒ දිව්‍යාඟනාතොමෝ එසේය ස්වාමීන් වහන්සැයි බුදුන් වදාළ වචනය මුදුනෙන් පිළිගෙණ දෙහොත් මුදුන් දී සිට මෙසේ ප්‍රකාශ කළාය.

"භද්දිත්ථිකානි මං අඤ්ඤිංසු කිමිලායං උපාසිකා
සඛාසිලෙන සම්පන්නා සංවිභාගරතා සදා.
අවජ්ජදානං ච භත්තං ච සෙනාසනපදීපියං
අදාසිං උජුභූතෙසු විප්පසන්නෙන චෙතසා.
චාතුද්දසිං පඤ්චදසිං යාව පක්ඛස්ස අට්ඨමී
පාටිහාරියපක්ඛඤ්ච අට්ඨඞ්ගසුසමාගතං.
උපොසථං උපවසිං සදා සීලෙසු සංවුතා
පාණාතිපාතා විරතා මුසාවාදා ච සඤ්ඤතා.
ථෙය්‍යා ච අනිචාරා ච මජ්ජපානා ච ආරකා
සමසික්ඛාපදෙ රතා අරියසඞ්ඝානකොවිදා.
උපාසිකා චක්ඛුමතා අප්පමාදවිහාරිනි.
කතාවකාසා කතකුසලා තතො චුතා.

සයංපභා අනුවිචරාමි නන්දනං
භික්ඛුවගං පරමනිතාතුකම්පකෙ
අභොජයිං තපයිසුගං මහාමුනිං
කතාවකාසා කතකුසලා තතො චුතා
අඞ්ඛනිතං අපරිමිතං සුඛාවහං
උපොසථං සත්තනුපාවසිං අහං
කතාවකාසා කතකුසලා තතො චුතා
සයංපභා අනුවිචරාමි නන්දනන්ති."

යනාදීන් දක්වනලදහෙයින් ශ්‍රද්ධාසම්පන්නව යහපත් ආචාර සම්‍ය
චාර ඇතිහෙයින්ද නුවර වසා ගලා එන්නාසේ ඉතිර නැංගාවූ හංගා
ජලප්‍රවාහය පනිවුතාධම්මසඛ්‍යාත සත්‍යක්‍රියා බලයෙන් සන්සිඳුවා
නුවරමාසින් විෂමපත් කරවූ අඛණ්ඩාවර්ජිතවූ සිල් ඇතිබැවින්ද යහ
පත් උත්තමඃක්‍රියයි යන අර්ථයෙන් කිඹිලනුවර වාසිනු මට භද්දා
නම් උපාසිකායයි කියා දනිත්මය ආමන්ත්‍රණය කෙරෙන්මය එබැ
වින් සඞ්ඝාමිනි ශ්‍රද්ධාශීලාදි ගුණසම්පන්නව තුනුරුවන්කෙරෙහි පැහැද
දුනසංවිභාගයෙහි ඇලුම් ඇතිව ඉහලොක පරලොකාර්ථ දුන වසන්
නෙම් විවර පිණ්ඩපාත සෙනාසන ගිලානප්‍රත්‍යය යන සිවිපස දුන
යෙන් අෂ්ටාඃශීපුදගල මහාසංඝයාට උපස්ථාන කෙළෙමි. අන්න පාන
වස්ත්‍රාභරණ මාලාගන්ධ විලෙපන සෙය්‍යා ආවාස ප්‍රදීපය යන දසවිධ
දුනවස්තුවෙන්ද පූජා සත්කාර කෙළෙමි. තුදුස්වක් පසළොස්වක්
අටවක් පාටිහාරිය පක්ෂය යන පොහෝදවස් අෂ්ටාඟ සමන්විතව බුදු
සවවන්ගේ ගුණයට අනුකූලව පෙහෙවස් විසිමි නිරන්තරයෙන් පව
ශීලය රක්ෂා කෙළෙමි. එබැවින් විවෙෂයෙන් ප්‍රාණඝාතයෙන් දුරුවිමි
ලේඛින්නෙකුත් නොනැසිමි. විවෙෂයෙන්ම අදත්තාදානයෙන් දුරු
විමි. පරසන්තකබව දුන නූල්රැළක් පමණවත් සොරසිනින් වේවයි
බලාත්කාරයෙන් වේවයි අනුන් අයිති බඩුවක් නොගත්මි. විවෙෂ
යෙන්ම කාමමිථ්‍යාචාරයෙන් දුරුවිමි. කිසිකලෙකත් මා සමානන්
හැර රාගයෙන් පෙරලුනාවූ සිත්ඇතිව පරපුරුෂයන් මුහුන නොබැ
ලිමි. විවෙෂයෙන්ම මුසාවාදයෙන් දුරුවිමි. කෙළිපිණිසවත් බො
රුබසත් නොකිමි. විවෙෂයෙන්ම සුරාපානයෙන් දුරුවිමි. පිනිසි
දක් පමණවත් රාත්‍රිකක් නොපුයෙමි. තවද ශ්‍රද්ධාසම්පත්ති ධනය
ශීලසම්පත්ති ධනය පාපයෙහි ලජ්ජාවගයෙන් පවත්නා හිරිසම්පත්ති
ධනය සසර භයවගයෙන් පවත්නා ඔත්තප්ප නමැති ධනය මහණඹමු
ණන්කරා එලැඹ ඇසූ පිරූ තැන් ඇතිබැවින් ශ්‍රුත නමැති ධනය
දන්දීම් වගයෙන් පවත්නා ත්‍යාගසම්පත්ති ධනය ප්‍රඥාසම්පත්ති ධනය
යන මේ සත්වැදෑරුම්වූ ආර්ය්‍යධනය පෙර සැල පිනින් ලත් බැවින්

බුදුරජානන්වහන්සේගේ ශාසනයෙහි අප්‍රමාද විහාරීවූ උපාසිකාවක් වීම්. එසමයෙහි අග්‍රශ්‍රාවක දෙදෙනාවහන්සේ ලැබ ප්‍රණීතවූ භොජනයෙන් සන්තර්පණය කෙළෙමි. මෙසේ කරණලද කුසල් හෙතු කොටගෙණ මේ දිව්‍යසම්පත් අනුභව කෙරෙමි කිව.

ඉක්බිති බුදුරජානන්වහන්සේ මාතෘදිව්‍යපුත්‍රයා ප්‍රධානකොටඇති දසදහසක් සක්වල දිව්‍යබ්‍රහ්මයන්ට තුන්මාසයක් මුලුල්ලෙහි ජලපොළොවසේ අනිගම්භීරවූ අභිධම්මපිටකය දෙශනාකොට වදාරා ඉක්බිති මිනිස්ලොවට වැඩ භික්ෂුසංඝයාට ආමන්ත්‍රණය කොට භද්‍රාවිමානය ප්‍රකාශකොට බණ වදාළසේක. ඒ ධම්මදෙශනාව එතැන්හි සම්ප්‍රාප්ත පිරිසට ප්‍රයොජනවිය.

මේ විමානවත්ථුප්පකරණයෙහි චිත්‍රලතාවගීයෙහි භද්‍රාවිමානවත්ථුව කියා නිමවනලදි.

තවද මේ විමානවත්ථුප්පකරණයෙහි චිත්‍රලතාවගීයෙහි **ගිරිමානන්ද සිකා විමානවත්ථුව** නම් කවරයත්?

අසරණසරණවූ කරුණානිධානවූ භාග්‍යවත් බුදුරජානන්වහන්සේ සැවැත්නුවර දෙව්රම් වෙහෙර වැඩ වසනසේක, එසමයෙහි උත්තර මධුරානම් නුවර සමීපයෙහි නුවරින් පිටත වසන්නාවූ ගෙවුනාවූ ආයුඇතිව අපායෙහි උපදනා අකුසල් ඇත්තාවූ එක්තරා ස්ත්‍රියක් ඇත්තිය. එසමයෙහි භාග්‍යවත් බුදුරජානන්වහන්සේ එන්දවසක් අලුයම් වේලෙහි මහාකරුණාසමාපත්තීන් නැගි මුලුලෝ බලා වදාරණසේක් ගෙවුනාවූ ආයුඇතිව අපායෙහි උපදින්ට සුදුසුවූ අකුසල් ඇති ඒ ස්ත්‍රිය දැක වදාරා අපායට යන ගමන් වළකා සුගතියෙහි උපදවනු කැමැතිව කරුණාවසින් වොදනාකරණලද බුදුරජානන්වහන්සේ හුදකලාව උත්තර මධුරාවට වැඩ පෙරවරුභාගයෙහි හැඳ පෙරව පාසිවුරු ගෙණ පිටිනුවරට පිඬු සිඟා වැඩිසේක; එසමයෙහි ඒ ස්ත්‍රිනොමෝ අහරපිස එකත්පසෙක තබා පැන්නෝවට ගොස් දිය නහා ඉක්බිති පැන්කලයක් ගෙණ ගෙට යන තැනැත්ති අතර මගදී බුදුන් දැක කිමෙක්ද සවාමිනි නුබවහන්සේවිසින් යම්කිසි භොජනයක් ලබනලදදැයි විචාරා මනු ලබම්හයි බුදුන්විසින් වදළකල්හි අහර නොලත්බව දැන පැන්කලය බිම තබා බුදුන්කරා එලැඹ නමස්කාරකොට සවාමිනි නුබවහන්සේට පිණ්ඩපාතය දෙමි මාගේ දානය ඉවසා වදාළමැනවැයි කියා ආරාධනා කළාය, එකල්හි බුදුරජානන්වහන්සේ මුවෙන් නොබැණ ඉවසා වදාළසේක ඒ සත්‍රි බුදුන් මුවෙන් නොබැණ දානය ඉවසූබව දැන පළමුවෙන්ම ඇගට ගොස් දිය හිස යහපත්කොට හමදනාලද භූමිප්‍රදෙශයෙක්හි ආසනයත් පණවා බුදුන්

වඩනා පෙරමග බලබලා සිටියාය බුදුරජානෝ ගෙට වැඩ පණවනලද ආසනයෙහි වැඩහුන්සේක. ඉක්බිති ඒ උපාසිකාව පිළියෙළ කරණලද භොජනයෙන් වැලඳවූමාය කරණලද අගරකිස ඇති බුදුරජණෝ අන්න් පහකරණලද පාත්‍රය ඇතිසේක් දුනාඅනුමොදනාවෙන් බණ වදුරා වැඩසේක; ඒ ඝනී අප්‍රමාණවූ ප්‍රීතියෙන් පිරුණාවූ සිත් ඇතිව එසේ උපන් ප්‍රීතිය නොගැර වඩනා බුදුහු යම්තාක් ඇසට විෂය වෙණේද ඒතාක්කල් බුබාලම්බනප්‍රීතියෙන් බල බලා වැඳ සිටියාය. ඊට අනතුරුව ඒ උපාසිකාව කිපදවසක් ගියකල කාලක්‍රියා කොට තවුතිසාදිව්‍යලොකයෙහි උතුම්වූ රත්වීමනෙක උපන්නිය පරිවාරඤ්ඤිහුද දහසක් පමණවූය, එසමයෙහි ආයුෂ්මන්වූ මුගලන්මහතෙරුන්වහන්සේ දෙවවාරිකාවෙන් වඩනාසේක් බුදුමුඛයකිනුන් කියා නිමවාලිය නොහැක්කාවූ ශ්‍රීසම්පත් අනුභවකරන්නාවූ ඒ දිව්‍යාඟනාව දැක මෙසේ විචාළසේක.

"අභික්කන්තෙන වණ්ණෙන යා ත්වං තිට්ඨසි දෙවතෙ
ඔභාසෙන්ති දිසා සබ්බා ඔසධී විය තාරකා"

යනුහෙයින් එම්බා දෙවනාදුව නි ඕසධිතාරකාවක්සේ දසදිත් එනා ලොක කෙරෙමින් බබලන්නිය මේ දිව්‍යසම්පත් ලැබීමට කළාවූ කුශලකම්මය කවරේදැයි විචාරා වදුළසේක. එතල ඒ කුශලකම්මය ප්‍රකාශකරන්නාවූ දිව්‍යාඟනාතොමෝ මෙසේ ප්‍රකාශකළාය.

"අහං මනුස්සෙසු මනුස්සභූතා
පුරිමාය ජාතියා මනුස්සලොකෙ
අද්දසං විරජං බුද්ධං විප්පසන්නමනාවිලං
තස්ස අදාසිහං භික්ඛං පසන්නා සකෙහි පාණිහි
තෙන මෙ නාදිසො වණ්ණො—පෙ—පභාසතිනි."

යනුහෙයින් සවාමිනි මම මිනිස්ලොව උපන් සමයෙහි බුදුන් දැක සතුටුව ආහාරදානයෙන් දිනිමි එපමණ කුශලය හෙතුකොට ගෙණ මෙබදු දිව්‍යශ්‍රීසම්පදානියක් ලදිමි කිව; ඉක්බිති මුගලන්මහතෙරුන්වහන්සේ මිනිස්ලොවට වැඩ බුදුන්ට එපවත් දන්වූසේක. බුදුරජානෝ එම අත්ථොතපත්තිකොට ගෙණ එතැන්හි සම්ප්‍රාප්ත පිරිසට ධම්මදෙශනාකොට වදුළසේක. ඒ ධම්මදෙශනාව බොහෝදෙනාට ප්‍රයොජනවිය.

මේ විමානවත්ථුප්‍රකරණයෙහි චිත්‍රලතාවගීනයෙහි ගිරිමානන්දසිකා විමානවත්ථුව කියා නිමවන ලදි.

පරමාත්ථජෝතිකානම් මේ විමානවත්ථුප්‍රකරණයෙහි දෙවන චිත්‍රලතාවගීනයයි.

පීඨවග්ගයෙහි පටන් වීතුලතාවග්ගය ඇතුළුව ප්‍රකාශවූ විමානවස්තූන් මාගේ නුවණ පමණින් විස්තාරවශයෙන් වර්ණනා කොට ඊට අනතුරුව සියලු විමානවස්තූන් සංක්ෂේපවශයෙන් වර්ණනාකරන්නේ ගුරුබොහෝවිමෙන් පොත මගත්වන බවත්පිනා දිව්‍යලෝකයෙහි උපන්ගති කිකල දිව්‍යලොකයෙහි උපන් කෙණෙකුන්ට උද්‍යාන විමානාදි සම්පත්තියෙන් අඩුවක් නැත්තේය එබැවින් සියලු සම්පත් ප්‍රකාශ කළානම් වෙයි, මේහි වෙනසෙක්නම් ඔවුනොවුන්ගේ නම් ගොත්හා ඔවුනොවුන් කළ කුසල්හා ඔවුනොවුන්ට පහළ වන්නාවූ උසන් පොකුණු ගල තල කල්පවෘක්ෂ විමාන සටහන් ඇතුළුව නෘත්‍ය ගීත නලුනාටකාදි පිරිවරහා ශරීරප්‍රභාදි වර්ණසටහන් පමණක්ම වෙනස් බව මුත් සටකි විමානවස්තූන්හා සමාන වන්නේය, එබැවින් ගුරුබොහෝවිමෙන් පොත මගත්වන නිසාත් පොත මගත්වීමෙන් සැමදෙනාටම සැපසේ ලියා කියා මතු පැවැත්වීම දුෂ්කරනිසාත් අති කුදු බොහෝවූ කටයුතු සලකා පූර්වාචාරීන්ගේ වචනයටත් අනුකූලව මතු ප්‍රකාශවත්හාවූ පාරිහාරකයන් වහිහයෙහි පටන් ඒ ඒ දෙව කාවන්විසින් කරණලද කුසල් ප්මණක්ම වර්ණනා කොට උද්‍යාන විමාන වර්ණනාසටහන්ආදිය සංක්ෂේපයෙන් වර්ණනා කෙරෙමි අසමත්තකාමක්නිසා නම් මෙබදු පාලියක් හෙළුබසින් කෙරෙමියි කියා සිතිනුත් නොසිහම් ලඝුභොට නොසිනා ශ්‍රද්ධාවන්ත සත්පුරුෂයන් විසින් බණ අසා සවහිගමොක්ෂසම්පත් ලබන්ට උත්සාහ කටයුතු.

"තෙපිටකා මහාථේරා මහාපඤ්ඤ, බහුස්සුතා
විවාදෙ දිස්සතෙ පුබ්බෙ කාමං නෙසමපි සීමතං.
තාහං හි මාදිසා නාම දුප්පඤ්ඤ, ඉග කා කථා
ඉමාය සකභාසාය විරුඩං වෙ පදිස්සතෙ.
අපටිහෙතාසිය ධිරෙහි පාලිං ලොකිස්සසාධුකං
උහගෙත්වා විසෙසෙන වත්තබ්බං පාළිභාසතො.
මාදිසානං මනුස්සානං හිතාය ච සුඛාය ච
කුසලං ගහනත්ථාය සකභාසාය වුච්චතෙ.

තවද මේ විමානවත්ථුප්පකරණයෙහි පරසතුවගිහයෙහි **උළාරවිමාන** වස්තුව නම් කවරුයත්?

සාධුජනනමැති කෙමදවනප්‍රබොධයට සරාසඳ මඩලක් වැනිවූ බුදුරජනෝ එක්සමයෙක රජගහනුවර වෙළුවනාරාමයෙහි වැඩ වසනසේක, එසමයෙහි ආයුෂමත් මුගලන් මහතෙරුන්වහන්සේට උපස්ථාන කරන්නාවූ රජගහනුවර එක්තරා ශ්‍රද්ධාවන්ත කුලයෙක නිරහංකරයන් දන් දීමෙහි ඇලුම් ඇත්තාවූ දන් දීමෙහි තුටු පහටු සිත්ඇත්තාවූ ශ්‍රද්ධාවන්ත කුමාරිකාවක් ඇත්තිය. ඕතොමෝ පෙරවරු

භාගයෙහී කීසියම් කෘතබොහෝදෙයක් ඒ හෙයි උපදිද එසිත් ඒ කුමාරි කාවටත් කොටසක් ලැබේද ඒ තමන් ලත් කොටසින් භාගයක් දන්දී අනුභව කරන්නිය දන් නොදී අනුභව නොකරන්නිය දන් පිළිගන්නට නිසි සිල්වත් කෙණෙකුන් ඔන්වේලෙහි නුදුටුහොත් භාගයක් සඟවා තබා දුටුකල දන් දෙන්නිය එසේම ශාවකයන් වත් දන් දෙන්නිමය, එකල්හි ඇගේ මෑනියෝ මාගේ දියනියෝ දුනාඛ්‍යාස ඇත්තිය දුනසංවිභාගයෙහි ඇලුම් ඇත්තියයි සතුටුසින් ඇතිව දෙභාගයක් දෙන්නිය එසේ දෙන්නිද පළමු ලත් කොටස දන් දුන්කල අනිත් කොටසක් දෙයි සිල්වතුන් දුටුකල එසිනුදු භාගයන් දන් දෙන්නිමය මෙසේ කල්යවනකල ඇගේ මව්පියදෙදෙනා වැඩිවිය වයසට පැමිණෙනලද ඒ කුමාරිකාව එම නුවර සමානකුලයක කුමාරයෙකුට සරණ කොට දුන්හ ඒ කුලය වනාහී මිථ්‍යාදෘෂ්ටිවන්නාහු තුනුරුවන් කෙරෙහි අප්‍රසාදය ශ්‍රද්ධා නැත්තාහ, එසමයෙහි ආයුෂ්මත් මුගලන්මහතෙරුන්වහන්සේ රජගහනුවර ගෙපිලිවෙළින් පිඬුසිඟා වඩනාසේක් ඒ කුමාරිකාවගේ මසිලනුවන් දෙර සමීපයෙහි වැඩසිටි සේක. කුමාරිකාව ඒ තෙරුන්වහන්සේ දැක සතුටුසිත් ඇතිව නම සකාරනොට මෙසේ වැඩිසමැනවැයි කියා හෙට හොස් නැන්දනියන් විසින් සඟවා තබනලද කබලු පූවත් දැක නැන්දනියන් ආකල මෙපවත් කියා පින්අනුමොදන් කරවමි සිතා විශ්වාසයෙන් හෙණ තෙරුන්වහන්සේට පූජාකළාය මහතෙරුන්වහන්සේ අනුමොදනා කොට වැඩිසේක, ඉක්බිති ඒ කුමාරිකාව නැන්දනියන් ආකල මෙපවත් කියන්නී මැනියනි නුබවිසින් සඟවා තබනලද කබලු පූවත් මුගලන් මහතෙරුන්වහන්සේට පූජාකෙළෙමි පින් අනුමොදන්වවයි කිවාය එබස කිපී කිමෙක්ද මේ කවර බුහුටිකමෙක්ද නපුරු කෙල්ල මාස නානක කබලු පූව මා නොවිචාරා නිස මුඩු ශ්‍රමණයාට දුන්නිදැයි කියා බැන තට තට යන අනුකරණඇතිව ක්‍රොධයෙන් දිලිහී කටයුතු නොකටයුතු සලකා ගන නොහී ඉදිරිපිට තුබූ මෝල්දඬක් ගෙණ අංගකුටයට පහරක් දුන්නිය, ඒ කුමාරිකාව සුකුමාලශරීර ඇතිගෙයින්ද ගෙවිනාවූ ආයුඇතිගෙයින්ද එම පහරින්ම බලවත් දුඃඛවේදනා වෙන් මඩනාලදුව කිපදවසකින් කාලක්‍රියාකොට තවුතිසාදිව්‍යලොකයෙහි උපන්නිය මේ අනිත් කුසලයෙන් නොවෙයි තෙරුන්වහන්සේට දුන්නාවූ කබලුපූවෙහි අනුසස් වන්නේය, එසමයෙහි ආයුෂ්මත්වූ මුගලන්මහතෙරුන්වහන්සේ දෙවවාරිකාවෙන් වඩනාසේක් දහසක් පමණ දෙවගනන් පිරිවරා මහත්වූ දිව්‍යලීලාවෙන් විරාජමානව බබලන්නාවූ දිව්‍යාභරණාව දැක සමීපයට වැඩ ඇවිසින් ඔය දවස කරණලද කුශල කර්මය මෙසේ විමාලසේක.

"උළාරෝ තෙ යසෝ වණ්ණෝ සබ්බා ඔභාසතෙ දිසා
නාරියෝ නච්චන්ති ගායන්ති දෙවපුත්තා අලඞ්කතා.
මොදන්ති පරිවාරෙන්ති තව පූජාය දෙවතෙ
සොවණ්ණානි විමානානි තං විමානං සුදස්සනෙ.
තුවංසි ඉස්සරා තෙසං සබ්බකාමසමිඞ්ගිනී
අභිජානා මහන්තාසි දෙවකායෙ පමොදසි
දෙවනෙ පුච්ඡිතාවික්ඛ කිස්ස කම්මස්සිදං ඵලන්ති"

යනාදින් එබඳා දිව්‍යාභරණාවත් තිබේ රන්කඳක්වැනිවූ ශරීරවර්ණ ඇති යසස් ඉතා උදාරතර වෙයි යනාදින් සම්පත් වර්ණනාකොට මේ දිවඉසුරු ලැබීමට කළාවූ කුශලය කවරේදැයි විචාරා වදාළසේක. එකල මහතෙරුන්වහන්සේගේ වචනය මුදුනෙන් පිළිගෙණ ඒ දිව්‍යාංගනාතොමෝ මෙසේ ප්‍රකාශකළාය.

"අහං මනුස්සෙසු මනුස්සභූතා
පුරිමාය ජාතියා මනුස්සලොකෙ
දුස්සීලෙසු කුලෙ සුනිසා අහොසිං
අස්සාඛෙ සුකදරියෙසු අහං,

සඛාසිලෙන සම්පන්නා සංවිභාගරතා සදා
පිඤ්ඣාය චරමානස්ස අද්දසං භික්ඛුමාගතං.

තදහං සස්සුයාවික්ඛිං සමණෙ ආගතෙ ඉධ
තස්ස අදාසිං භුඤ්ජිස්සං පසන්නා සකෙහි පාණිහි.

ඉතිස්සා සස්සු පරිභාසි අඛීනිතා තුවං වධූ
න මං සම්මුඛතුං ඉච්ඡි සමණස්ස දදමගං.

තතොං මෙ සස්සු කුපිතා පහාසි මුසලෙන මං
කූටඞ්ගවජ්ඣන්ති අවධි මං නාසක්ඛිං ජීවිතුං චිරං.

සාහං කායස්ස භෙදා විප්පමුත්තා තතොං චුතා
දෙවානං තාවතිංසානං උපපන්නා සහව්‍යතං".

සනාදින් දක්වන්නී ස්වාමිනි මම ඕනිස්ලොව වසනකල පිඬුපිණිස වැඩියාවූ භාග්‍යවතුන්වහන්සේ දැක පහන්සිත් ඇතිව මාසතු දෙයක් නැති බැවින් නැන්දනියන් සන්නක කබලුපූවක් දැක විශ්වාසයෙන් ගෙණ පූජාකොට ඉක්බිති නැන්දනියන්ට කබලු පූව දුන් පවත් කිමි එඬයට කිපි මා නොවිචාරා මා සන්නක කබලු පූව ශ්‍රමණයාට දුන්නිදැයි කියා ඉදිරියේ තුබූ මෝල්දණ්ඩක් ගෙණ පහරක්දී අංගකූටය බිඳ පුව එබැවින් බොහෝ දවසක් ජීවත්වය නොහී කාලක්‍රියාකොට ඒ කුශල

සෙන් මේ දිව්‍යශ්‍රීසම්පත්ති ලදිමි කිව, මහතෙරහු දෙවතාදුවට බණ වදාරා මිනිස්ලොවට අවුත් බුදුන්ට එපවත් කියේක. බුදුහු එම අර්ථය කපත්තිකොට ගෙණ එතැන්හි පැමිණි පිරිසට බණ වදාළසේක. ඒ ධම්මදෙශනාව බොහෝදෙනාට ප්‍රයොජනවිය.

මේ විමානවත්ථුප්පකරණයෙහි පාරිජ්ඣත්තක වග්ගයෙහි උළාරවිමානවත්ථුව කියා නිමවන ලදී.

තවද මේ විමානවත්ථුප්පකරණයෙහි පාරිජ්ඣත්තක වග්ගයෙහි **ඉත්තිලවිමානවත්ථුව** නම් කවරයත්?

ජලපොළොවසේ ගැඹුරුවූ විසිතුරුවූ දෙශනා ඇති බුදුරජානන්වහන්සේ එක්සමයෙක රජගහනුවර වෙළුවනාරාමයෙහි වැඩවසනසේක. එසමයෙහි ආයුෂ්මත් මුගලන්මහතෙරුන්වහන්සේ යට කියනලද ක්‍රමයෙන් දෙවොරිකාවෙන් වඩනාසේක් ඒ තවුතිසා දෙවිලොව පිළිවෙළින් එකතැන පිහිටියාවූ සතිසක් පමණ දිව්‍යවිමානවල වෙනවෙනම දසදහසක් දිව්‍යාඟනාවන් පිරිවරා මහත්වූ දිව්‍යසම්පත් අනුභව කරන්නාවූ සතිසක් දිව්‍යාඟනාවන් දැක "අභික්කන්තෙන වණ්ණෙන" යනාදි ගාථාවලින් වෙන වෙනම පූර්වජාතියෙහි කරණලද කුශලකර්මයන් විචාරා ඔවුන් විසින්දු ඒ වචනයට අනතුරුව "විඤ්ඤාත මදම්හිකා අහං" යනාදි ගාථාවලින් වෙන වෙනම කුසල් ප්‍රකාශකොට කිකාල මිනිස්ලොවට වැඩ බුදුන්ට එපවත් දැන්වූසේක. බුදුරජානෝ එබස් අසා මොදගල්‍යායනස්ථවිරය ඒදිව්‍යාඟනාවෝ තොපවිසින් විචාරණලදුව ප්‍රකාශකොට කිවාහුම නොවෙති පෙර මාවිසින්දු විචාරණලදුව මෙසේම ප්‍රකාශකොට කිවාහු වේදැයි වදාරා මහතෙරහු විසින් ඒයාදරදෙශනාවට ආරාධනා කරණලදුව තිමන්ගේම පූර්වචරිතවශයෙන් අතීතවූ ඉත්තිලපණ්ඩිතයන්ගේ උත්පත්තිකථාව ගෙණ හැර දක්වා වදාළසේක.

ඒ කෙසේදයත්? යට ගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්තනාම් රජ්ජුරු කෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි අප මහබෝසතානෝ එක්තරා ගන්ධර්වකුලයෙක ඉපිද ගන්ධර්වශිල්පයෙහි නිෂ්පත්තියට පැමිණ නිමඛරු නාරදාදි ගන්ධර්වදිව්‍යපුත්‍රයන්සේ ඉත්තිලාචාරීන්වහන්සේයයි සියලු දිසාවෙහි ප්‍රසිඛව දඹදිවට එකාචාරිය අඤ්ඤවූ මව්පියන් රකුණා කෙරෙමින් වෙසෙහි, එසමයෙහි උදෙනිනුවර වාසිවූ මූසිලනම් ගන්ධර්වයෙන් එපවත් අසා බෝසතුන් කරා ගොස් වැඳ එකත්පස්ව සිටියේය, කුමක්පිණිස ආයෙහිදැයි විචාළකල නුඹ සම්පයෙහි ශිල්ප උගන්ට ආමි කිය, පණ්ඩිතයෝ එබස් අසා ලක්ඛණ දැන්මෙහි සමර්ථකැවින් ඔහුගේ ලකුණු බලා. අසත්පුරුෂවූ තද එරුෂ කෙළෙහි ගුණ

නොදන්නා විෂමාධ්‍යාස ඇති එකෙක එබැවින් මොහු මාවිසින් සඬ්ඝ නොකට යුතුයයි සිතා ශීල්‍ය උගන්ට අවසර නුදුන්සේක. එකල්හි මූසිලයා අඬවූ මවුපියන්ට මෙහෙ කොට ඔවුන්ලවා යාචඤ්ඤ කරවිය.

එසේ මවුපියන් විසින් යාචඤ්ඤ කරණලද ඉතිකිල පණ්ඩිතයෝ මවුපියන්ගේ වචනය නම් අනික්‍රාන්ත නොකටයුතුයයි සිතා ශීල්‍ය උගන්වනසේක් මසුරු මල නැතිහෙයින්ද මහත් කරුණා ඇතිහෙයින්ද ආචාර්‍යභාගයකුත් නොතබා නිරවශෙෂ කොට ශීල්‍ය ඉගැන්වූසේක ඒ මූසිලයාද නුවණ ඇතිහෙයින්ද පෙර පුරුදුහෙයින්ද කුශීත නොවනහෙයින්ද නිඟාකොට උගන්නාලද ශීල්‍ය ඇතිව සිතන්නේ මේ බරණැස්නුවර නම් මුලු දඹදිව රජුන්ට අග්‍රවූ රජහට නිවාසහෙයින් අධිපති නුවරය එබැවින් මේ නුවර රජුහා පිරිසට ශීල්‍ය දැන්වූයෙම් වින්නම් ඉතා යෙහෙකැයි එසේකල ආචාර්‍යන්මෙන් නුවනින් මුලු දඹදිව ප්‍රසිද්ධවෙමි සිතා ආචාර්‍යන්ට මෙසේ කිය, ආචාර්‍යවහන්ස රජු ඉදිරියේ මම ශීල්‍ය දක්වනු කැමැත්තෙමි රජහට මා දැක්වුව මැනවැයි කිය. එකල බෝසතානෝ සිතනසේක් මොහු මා සමීපයෙහි උගන්නාලද ශීල්‍ය ඇත්තේය එබැවින් මෝහට පිවිසහලක් ලැබේවයි සිතා කරුණාසිත් ඇතිව රජු සමීපයට කැඳවාගෙණ ගොස් රජහට දක්වා දෙවයන්වහන්ස මාගේ මේ අතැවැස්සා උගත් විණාශීල්‍ය බලා වදාළ මැනවැයි කීසේක. රජ යහපතැයි කියා විණාගායනා අසා සතුටුව සියරටව යනු කැමැතිව සිටි ගමන් වළකා මා සමීපයෙහි වසව ආචාරින්ට දුන් සැපතින් භාගයක් දෙමි කිහ, එබසට මූසිලයා මම ආචාරිහුට හය නොවෙමි. ආචාරිහු මට වඩා දන්නා දෙයක් නැත සමකොටසක් දුන මැණවැයි කිය, එසේ නොකියව ආචාරිහුම මහත් වෙයි තට භාගයක් දෙමියි රජුවිසින් කී කල්හි දෙවයන්වහන්ස එසේවිනම් මාගේද ආචාරින්ගේද ශීල්‍යවාද දන්නා සේක්වයි කියා රජහෙන් නික්ම මෙසින් සත්වන දවස් රාජඩගණයෙහිදී මාගේද ඉතිකිලාචාරින්ගේද ශීල්‍යවාදය-දැක්ම වෙයි ඒ වාදය දක්නා කැමැති කෙණෙක් සත්වන දවස් රාජඩගණයෙහි රැස් වෙත්වයි කියා ඒ ඒ තැන ඇවිද උදෙසාඝණය කෙළේය, මහබෝසතානෝ එපවත් අසා සිතනසේක් මේ මූසිලයා තරුණය කායබල ඇත්තේය මම වනාහි ජරාවෙන් ජීර්ණවිමි ඉදින් මට පරාජයෙක් වීනම් නපුර ජීවත්වීමට වඩා මිය යාම උතුම්ය එබැවින් වල්වැද කර වැලලා මියෙමි සිතා වළට ගිය සේක් මරණභයින් තැනිගෙණ නැවත ආසේක් එසේම නැවත නැවතත් යමින් එමින් වෙහෙසෙනසේක් එතැන්හි යනඑන මග වල්මිය තණ පහවිය, එකල්හි සක්දෙවි මහරජානෝ එපවත් දැක බෝසතුන්කරා අවුත් දෘශ්‍යමාන ශක්‍රවිලාසයෙන් ආකාශයෙහි සිට

මෙසේ කියේය. ආචාරිනි කුමක් කරණසේක්දැයි විචාළේය එබස් අසා මහබෝසතානෝ තමන් කළ කී දේ මේ ගාථාවෙන් ප්‍රකාශ කළ සේක.

"සතතතන්තිං සුමධුරං රාමණෙය්‍යං අවාචයිං
සෝ මං රඤ්ඤමති අවෙහති සරණං මෙ හොහි කොසියා 'ති"

කොසිය හොත්‍යෙහි උපන් සක්දෙවිරජතෙනි සත් තතක් ඇත් කාවූ ඒ තනත්‍රින් සත්දෙනාගේ සැදීම් වශයෙන් සප්ත්‍රප්‍රකාරයෙන් පවත්නා සවර සතැකින්ද එම විෂය කොට සුදුසු වශයෙන් පවත්නා දෙවිස්සක් ප්‍රමාණ ශ්‍රැතීන්ගා ඒ ශ්‍රැතිභෙද අපාහණ වශයෙන් පවත් නා සම පණස් මෘර්ජනාවන්ගේ ව්‍යාපාවිමෙන් සවරයාගේද ශරීරයා ගේද වීණාවගේද ඔවුනොවුන්ගේද සංසඳනයෙන් අසන්නවුන් ගේ සිත් අතියෂින් අභිරමණය කරණභෙයින් රාමණෙය්‍යවූ සවර ශනාදි විභානවශයෙන් සදනලද චතුර්විධ ගන්ධර්ව ශිල්පය නොඇර ආචාර්‍ය්‍ය මෘෂ්ටි රහිතව ගන්ධර්ව ශිල්පය නිෂ්ඨා කොට නොසඟවා මූසි ලනම් ඇතැ වැසියාගට කිම්, උගත්නා භික්ම විමි ඒ මූසිලයා දුන් වාද කෙරෙම්යි මාහා සමග රජපිරිස් මැද නෘත්‍යමණ්ඩලයෙහි ශිල්ප දක් වන්ට එවයි කියා මා කැඳවයි එබැවින් දෙදෙව්ලොවට අධිපතිවූ සක් දෙව් රජතෙනි මට පිටිවහල්වුව මැනවැයි මට පිළිසරණ වෙවයි කි සේක, එබස් අසා සක්දෙව්මහරජතෙනෝ නොබව ආචාරිනි සැක නො ටුව මැණව මම නුබ රකිමි පිළිසරණ වෙමියි කියා අස්වසන්නේ:—

"අහං තෙ සරණං හොමි අහමාචරිය පූජකො
න නං ජනිස්සති සිස්සො සිස්සමාචරිය ජෙස්සති"

යනුහෙයින් කියදවස මහබෝසතානෝ ශක්‍රයාට ගුරුවූසේක, එබැ වින් ශක්‍රයා බෝසතුන්ට ආචාර්‍යවාදයෙන් ආමන්ත්‍රණය කොට ආචා රිනි මම ගුරුපූජා කෙරෙම් මූසිලයාසේ සමකොට නොසිනම් මා වැනි අතැවැසියෙකු සිටියදි කවරභෙයකින් නුබට පරාජය වේද මම නුබට පිළිසරණ වෙමි නුබට මුත් ශිෂ්‍යවූ මූසිලයාට ජය නැත්තේය සත් වන දවස මමත් සාකවජා මණ්ඩලයට එමි සැක නොව නෘත්‍යමණ්ඩ ලයට එනසේක්වයි කියා අස්වසා දෙව්ලොවට කියේය. ඉක්බිති සත්ව න දවස් රජු මහපිරිස් පිරිවරා ශිෂ්‍යාචාර්‍යදෙදෙනාගේ ශිල්පවාදය බලමහයි කියා සිංහාසනාරූඪව රාජසභාවෙහි උන්නේය, ගුනනිලා චාරිද මූසිලයාද ශිල්ප දක්වනු පිණිස සැදි පැහැදි රජුගෙරා එළැඹ නමස්කාර කොට තමතමන්ට සුදුසු අසුන්මල හිඳ වීණා ගායනාවට පටන්ගත්තාහුය, එකල්හි ශක්‍රදෙවෙන්ද්‍රයෝද එම නෘත්‍යමණ්ඩලයට අවුත් ආකාශතයෙහි සිටියේය ඒ ශක්‍රයා වනාහි මහබෝසතානෝම

දක්නාසේක්‍ෂා අවශෙෂයෝ නොදක්නාහ රජපිරිස දෙදෙනාගේම ගායනා අසා දෙදෙනාගේම ගායනා සමහෙයින් දෙදෙනා කෙරෙහිම සමසිත්වූහ, ඉක්බිති ශක්‍රයා ඝන්ධිලාචාරිනි එක් තනක් සිදුවයි කිහ පණ්ඩිතයෝ එක් තනක් සිද ගායනා කළසේක එකලද පෙරසේම මධුරස්වර විය එසේම දෙවන තුන්වන සතරවන පස්වන සවන සත්වන තනයයි මෙම ක්‍රමයෙන් සිදුවයි කිහ, එසේ සිද ගායනා කළහ පෙරසේ මධුරනාද විය ඒ බව දැක මූසිලයා පරාජයවිමෙන් දුර්මුඛව බිම බලා ගෙණ එතැන්හි සිවි රජපිරිස තුටුපහටුව ඝන්ධිලපණ්ඩිතයන්ට සාධුකාර දුන්හ, රජු මූසිලයා රාජසභාවෙන් පිටත ලැවූහ මහජනයා කිපී කැට කැබිලිනි දඩු මුගුරු ආදියෙන් තළා එතැන්හිම ජීවිතවිනාසයට පැමිණවූහ. සක්දෙව්මහරජානෝ බෝසතුන්හා සමග ප්‍රියකථා කොට දෙව්ලොවටම ගියේය.

එකල දෙවතාවෝ මහරජ නුබ මදකලක් කොයි ගිය සේක්දැයි විචාරා එපවත් අසා මහරජ අපිද ඝන්ධිලාචාරින් දක්නා කැමැත්තම්හ ඝන්ධිලාචාරින් මෙතැන්හි ගෙන්වා අපට දක්වුව මැණවැයි කිහ, ශක්‍රයා දෙවතාවන් කි බස් අසා මාතලිදෙව්පුත් කැඳවා මාතලිය වෛජයන්ත නම් රථය ගෙණ ගොස් අපගේ ඝන්ධිලාචාරින් කැඳවා ගෙණ එව දෙවතාවෝ ආචාරින් දක්නා කැමැත්තම් හයි කියා යැවූහ එකල මාතලී දෙව්පුත් වෛජයන්ත නම් රථය ගෙණ මිනිස්ලොවට ගොස් ඝන්ධිලපණ්ඩිතයන් රථයට නංවා ගෙණ දෙව්ලොවට ගියේය ශක්‍රදෙවෙන්‍ද්‍රයෝ බෝසතුන් දැක සතුටුව උන්හා ප්‍රියකථාකොට ආචාරිනි දෙවතාවෝ වීණා ගායනා අසන්ට කැමැත්තම් හයි කිහ, එබසට බෝසතානෝ කියනසේක් දෙවයෙනි අපි ශිල්පානිසාම ජීවත්වම්හ වැටුප් වැනුවක් නැතිව ශිල්ප නොපාමි කිසේක, කෙබදු වයනුවක් කැමැත්තේ වේදැයි විමාළකල අනික් වයනුවකින් මට ප්‍රයොජන නැත මේ දෙවතාවන් විසින් පූර්ව්‍වජාතියෙහි කරණලද කුසල් ප්‍රකාශකොට කිම මට වයනුනම් වෙයි කිසේක, දිව්‍යාඟනාවෝද එබසට යහපතැයි කියා ඔවුන් කළ කුසල් ප්‍රකාශ කොට කිහ, ඒ දිව්‍යාඟනාවෝ කාශ්‍යපබුදුන් සමයෙහි මිනිස්ලොව ඉපිද වෙන වෙනම කුසල් කොට එයින් චුතව තවුතිසා දිව්‍යලොකයෙහි වෙන වෙනම දිව්‍ය පෘරාවන් දහස දහස පිරිවරා ශක්‍රයාට පාදපරිචාරිකාව පිළිවෙළින් පිහිටි සතිසක් දිව්‍යවිමානවල ඉපිද බුදුමුඛයකින් මුත් කියා නිමවා ලිය නොහැකි මහත්වූ දිව්‍යශ්‍රීසම්පත් අනුභව කරන්නාහුය මෙසේ එකතැන පිළිවෙළින් පිහිටි සතිස් දිව්‍යාඟනාවන්ගේ විමන් දැක ඔවුන් මෙබඳු සම්පත් ලැබීමට යට ගිය දවස කරණලද කුසල් ප්‍රකාශ කරණු කැමතිව වීණාශිල්ප දැක්වීමට වැටුප් වියදම් වශයෙන් ප්‍රතිඥ ගෙණ විචාරණසේක් මේ ගාථාවලින් විමාළසේක.

" අභික්කන්තෙන වණ්ණෙන යා ත්වං තිට්ඨසි දෙවතෙ
ඔභාසෙත්වා දිසා සබ්බා ඔසධි විය තාරකා "

යනුහෙයින් එම්බා දිව්‍යාඟනාව නි අනෙකවිධ රැසින් දිලිහෙන නොයෙක් දිව්‍යාභරණයෙන් සැරහි මහත්වූ ශරීරවර්ණයෙන් දිලිසෙමින් දෙව්පිරිස් මැද යම් ලීලාවකින් සිටිද එකල්හි තාරකාවන් මැද දිලිහෙන ඔසධි තාරකාවක්සේ දසදික් එකාලොක කෙරෙමින් බබලන්නීය, මෙසේ දිලිහෙන්නාවූ නි කවර කුශලකර්මයක් හෙතුකොට ගෙණ වර්ණසම්පත් භොගසම්පත් පරිවාරසම්පත් ආදියෙන් ජෙතිමත්ව බබලාදැයි විචාළසේක, මෙසේ ඉත්තිල පණ්ඩිතයන් විචාළ පැණය විසඳන්නාවූ දිව්‍යාඟනාතොමෝ මෙසේ ප්‍රකාශකළාය.

" චතුන්නමදුකිකා නාරි පවරා හොති නරෙසු නාරිසු
එවං පියරූපදුකිකා මනාපං දිබ්බං සා ලභතෙ උපෙච්ච ඨානං.
තෙහා මෙ පඤ්ඤ විමානං අච්ඡරාකාමවණ්ණනිභමත්ති
අච්ඡරාසහස්සාහං පවරා පඤ්ඤ ප්‍රාඳඤ්ඤතං විපාකං "

යනුහෙයින් එම්බා ඉත්තිලඟැබ්වය මම යට හිය දවස කාශ්‍යප බුදුන් සමයෙහි මිනිස්ලොව ඉපිද මේලෝ පරලෝ දැන වසන්නෙමි කර්මඵල අදහමින් මිනිස්ලොව විද්‍යමාන වැත්‍රුයිනින් අතුරෙන් අග්‍ර ගිවූ කොටිගණන් අගණා උතුම් පිලි සඟලක් රහත් නමකට පූජා කොළෙමි එපමණ කුශලය හෙතුකොට ගෙණ මේ දෙදෙව්ලොවට අධිපතිවූ ශක්‍රදෙවෙන්ද්‍රයන්ට අග්‍රමහෙසිකාව කවර කෙණෙකුන්විසින්හු කියා නිමවාලිය නොහැකි මෙබඳු දිව්‍යශ්‍රීසම්පත්තියක් ලදිමි එබැවින් මේ ලොකයෙහි සත්‍රීපුරුෂයන් අතුරෙන් යම් සත්‍රියක් උතුම් වස්ත්‍රයක් දුන්නේවිනම් හෝතොමෝ ප්‍රියමනාපවූ වර්ණසම්පත් දුන්නා නම් වෙයි එබැවින් සියලු සත්‍රීපුරුෂයන් අතුරෙන් අග්‍රවූ ප්‍රියමනාපවූ දිව්‍ය සම්පත් ලබති එහි අනුසස් දන්නාපිණිස මාගේ මේ උත්තම වර්ණසම්පත්හා දිව්‍යවිමානාදි සියලු සම්පත් බැලුව මැණව එක වැත්‍රුය දුන්නාවූ කුශලකර්මයම සියලු සැපතට මූලකාරණා වන්නේයැයි කිව. ඉක්බිති පිළිවෙළින් සිටි අනිත් සියල්ලවුන් අනින්ද වෙන වෙනම පෙරසේම විචාළසේක ඔවුන්විසිනුදු වෙන වෙනම කුසල් ප්‍රකාශ කොට කිහ.

හේ කෙසේදයත්? එක් දෙවඟනක් කියන්නි ඔට හිය දවස කාශ්‍යපබුදුන් සමයෙහි මිනිස්ලොවදී තුනුරුවන් කෙරෙහි පැහැද උතුම්වූ සමන්මල් දමක්හා සුවඳ මල්පූජාවක් කෙළෙමි එපමණ කුශලයෙන් මෙබඳු සැපතක් ලදිමි කිව. ඉක්බිති අනිත් දෙවඟනක් කියන්නි එම බුදුන් දවස මිනිස්ලොව උපන් සමයෙහි තුනුරුවන් කෙරෙහි

පැහැද සඳුන් සුවඳ කැත්තුරිකාදි උතුම් සුවඳ ගඳපුජාවක් කොට මේ සම්පත් ලදිමි කිව. ඊට අනතුරුව අනික් සුරසුන්දරියක් කියන්නී මම යට ගිය දවස කාශ්‍යපබුදුන් සමයෙහි මිනිස්ලොවදී අනුභව කටයුතුවූ වැල වරකා අඹ දඹ කදලි නාලිකෙරාදි වශයෙන් එලාඵල දැනයන් දුනිමි එපමණ කුසලින් මේ සියලු සම්පත් ලදිමි කිව. ඉක්බිති අනික් දිව්‍යාඟනාවක් කියන්නී පින්වත් ගඤ්ඡිවය මම මිනිස්ලොව වසන සමයෙහි ගිතෙල් මී සකුරුආදී මිහිරි රසදැනයක් දුනිමි එපමණ පින්න් මෙබදු සම්පත්තියක් ලදිමි කිව. ඊට අනතුරුව අනික් සුරඟනක් කියන්නී පින්වත්නි මම මිනිස්ලොව උපන් සමයෙහි කාශ්‍යපබුදුන්ගේ ධාතු වසා බඳනාලද සත්රුවන් දැහැබට සුවඳ ගඳපහඟුලක් දුනිමි එපමණ පින්න් මෙබදු සැපතක් ලදිමි කිව. ඊට අනතුරුව අනික් දෙවඟනක් කියන්නී යට ගිය දවස මිනිස්ලොව උපන් සමයෙහි කාශ්‍යපබුදුන්ගේ ශාසනයෙහි පැවිදිවූ භික්ෂුසඞ්ඝයාද භික්ෂුණී සඞ්ඝයාද යන දෙපක්ෂයෙහි සඞ්ඝයාම දිඹිමාගිහයට පැමිණ වඩනාහුමා වසන ගම සමීපයට පැමිණියා දැක සතුටුව වැඳ පුදා ඔවුනොවුන් ගෙන් බණ අසා එක පොහෝදිනයෙක අෂ්ටාඞ්ගසමන්විතවූ පෙහෙවස් පමණක් විසිමි එම කුශලයෙන් මේ දිව්‍යසම්පත් ලදිමි කිව. ඉක්බිති අනික් සුරසුන්දරියක් කියන්නී කාශ්‍යපබුදුන්ගේ ශාසනයෙහි පැවිදිවූ භික්ෂුකෙණෙකුත්වහන්සේ කිසි කටයුකතක් නිසා නැවුනැගිවඩනාසේක් වලඳනා කාලය සම්ප්‍රාපනවූ හෙයින් එම නැව පිටම හිඳ වලඳනසේක් මම එසමයෙහි උන්වහන්සේට බොන පැන්හා මුඛධොවන පැන් පමණක් දුනිමි එපමණ කුශලයෙන් මේ දිව ඉසුරු ලදිමි දිසපිටම හිඳ කිසි ආයාශයක් නැතිව අතට ගෙණ දුන් පැන් සිහින් තෙහි අනුභස් බලවයි කිව. ඊට අනතුරුව අනික් දිව්‍යාඟනාවක් කියන්නී යට ගිය දවස කාශ්‍යපබුදුන් සමයෙහි එක්තරා කුලදුවක්ව චණ්ඩවූ විෂමාධ්‍යාස මවුපියන් ඇති පුරුෂයෙකුට සරණ ගොස් ඒ එරුෂවූ නැදිමසිලන් විසින් ක්‍රොධයෙන් දිලිහී නොයෙක් ලෙසින් අප්‍රියවචන කියා පරිභව බණනකල නොකිපී මෛත්‍රිගුණයෙන් යෙදි සසර සිහිකෙරෙමින් සිහිනුවණින් යෙදී වරද ඉවසා නොපමා වීමි එපමණ කුශලයෙන් මේ දිවඉසුරු ලදිමි කිව. ඉක්බිති අනික් සුරසුන්දරියක් කියන්නී යට ගිය දවස මම කාශ්‍යපබුදුන් සමයෙහි එක්තරා කුලගෙයක දුසියක්ව ඉපිද දුඃඛජීවිකාවෙන් දවස් යවන්නෙම් එතකු දුටුවත් දන් දීමෙහි ඇලුම් ඇත්තෙම් එබැවින් කර්මඵල අදහමින් දැනසංවිභාගය සිතින් සලකා මම ලත් කොටසින් භාගයක් දන්දී අනුභව කරණ සුලුවිම් හිමියන් විසින් නොයෙක් ලෙසින් ආක්‍රොෂ පරිභව බණන කල මාවැනි වැඩ පසස්නා දුසියකටත් මෙසේ කියවිදැයි

අභිමාන නොකොට සිහිනුවණින් යෙදී කිසිකලෙකත් ක්‍රොධ නොකොට සන්හුන් කායවාක් සමාචාරඇති බැවින් කිකරුව මෙත්‍රිකුණසම පහළ කෙළෙමි එපමණ කුශලයෙන් මෙබඳු සැපතක් ලදිමි කිව. ඊට අනතුරුව අනික් දෙවඟනක් කියන්නී මම ඇට ගිය දවස කාශ්‍යපබුදුන්ගේ ශාසනයෙහි මහණවූ භික්ෂුකෙණෙකුන් දැක සතුටුසින් ඇතිව කිරිබත් පමණක් පූජා කෙළෙමි එපමණ කුශලයෙන් මෙබඳු සැපතක් ලදිමි කිව. ඊට අනතුරුව අනික් සුරසුන්දරියක් කියන්නී එම්බා ගන්ධර්වය මම ඇට ගිය දවස මිනිස්ලොව උපන් සමයෙහි පිණ්ඩපාතික සඟනමකට සකුරුපිඩක් පූජා කෙළෙමි එපමණ කුශලයෙන් මෙබඳු සැපතක් ලදිමි කිව. ඊට අනතුරුව අනික් සුරසුන්දරියක් කියන්නී මම කාශ්‍යපබුදුන් සමයෙහි මිනිස්ලොවදී පිණ්ඩපාතයෙහි වඩනා සඟනමක්හට උක්දඬු කඩක් පමණ පූජා කෙළෙමි එපමණ කුශලයෙන් මෙබඳු සැපතක් ලදිමි කිව. ඉක්බිති අනික් සුරසුන්දරියක් කියන්නී මම මිනිස්ලොව උපන් සමයෙහි පිණ්ඩපාතික සඟනමක්හට තිඹිරි ගෙඩියක් පමණ පූජා කෙළෙමි එපමණ කුශලයෙන් මෙබඳු සැපතක් ලදිමි කිව. ඉක්බිති අනික් සුරසුන්දරියක් කියන්නී මම ඇට ගිය දවස මිනිස්ලොවදී පිණ්ඩපාතික සඟනමක් දැක කැකිරිගෙඩියක් පූජා කෙළෙමි එපමණ කුශලයෙන් මෙබඳු සැපතක් ලදිමි කිව. නැවත අනික් දෙවඟනක් කියන්නී මම මිනිස්ලොව වසන සමයෙහි පිණ්ඩපාතික සඟනමක් දැක නියඹරා ගෙඩියක් පූජා කෙළෙමි එපමණ කුශලයෙන් මෙබඳු සැපතක් ලදිමි කිව. ඊට අනතුරුව අනික් දෙවඟනක් කියන්නී මම මිනිස්ලොව වසන සමයෙහි පිඬුසිඟා වඩනා සඟනමක්හට වැල ඵලයක් පූජා කෙළෙමි එපමණ කුශලයෙන් මෙබඳු සැපතක් ලදිමි කිව. ඊට අනතුරුව අනික් සුරඟනක් කියන්නී එම්බා ගන්ධර්වය මම මිනිස්ලොව වසන සමයෙහි පිණ්ඩපාතික සඟනමක්හට බොරලු දමුණු ඵලපමණක් පූජා කෙළෙමි එපමණ කුශලයෙන් මෙබඳු සැපතක් ලදිමි කිව. නැවත අනික් සුරඟනක් කියන්නී මම මිනිස්ලොව වසන සමයෙහි භික්ෂුකෙණෙකුන් වහන්සේට සිත නිවාරණය පිණිස භයභ්‍රාපනයක් දුනිමි හෙවත් අඟුරු කඹලක් පූජා කෙළෙමි එපමණ පිනින් මෙබඳු සැපතක් ලදිමි කිව. ඉක්බිති අනික් සුරසුන්දරියක් කියන්නී මම මිනිස්ලොව වසන සමයෙහි භික්ෂුකෙණෙකුන්ට පලා කොලම්ටක් පමණ පූජා කෙළෙමි එපමණ කුසලින් මෙබඳු සැපතක් ලදිමි කිව. ඊට අනතුරුව අනික් දෙවඟනක් කියන්නී මම මිනිස්ලොව වසන සමයෙහි මඟ වඩනා එක්භික්ෂුකෙණෙකුන් දැක පුලුන්මිටක් පමණ පූජා කෙළෙමි එපමණ පිනින් මෙබඳු සැපතක් ලදිමි කිව. නැවත අනික් සුරසුන්දරියක් කියන්නී මම මිනිස්

ලොව වසන සමයෙහි පිඬුසිහා වඩනා සඟනමක් දැක සතුටුසිත් ඇතිව මූලපලා මිටක් පමණ පූජා කෙළෙමි එම පින්හින් මෙබඳු සැපතක් ලදිමි කිව. අනික් දෙවඟනක් කියන්නී මම යට ගිය දවස මිනිස්ලොව වදී පිඬුසිහා වඩනා සඟනමක් දැක සතුටුව කොසඹකොලමිටක් පූජා කෙළෙමි එම කුසලින් මෙබඳු සැපතක් ලදිමි කිව. ඉක්බිති අනික් සුරඟනක් කියන්නී මම මිනිස්ලොව වසන සමයෙහි පිඬුසිහා වඩනා තෙරකෙණෙකුන්ට ඇඹුල් කැඳින්නක් පමණ පූජා කෙළෙමි කිව. අනික් සුරඟනක් කියන්නී මම මිනිස්ලොව වසන සමයෙහි පිඬුසිහා වඩනා සඟනමක්හට තෙල්මුරුවටක් පූජා කෙළෙමි කිව. නැවත අනික් සුරඟනක් කියන්නී මම මිනිස්ලොව වසන සමයෙහි එක් සඟනමක්හට කඟබානත් දුනිමි හෙවත් සිවුරු පටියක් දුනිමි කිව. නැවත අනික් සුරසුන්දරියක් කියන්නී මම මිනිස්ලොව උපන් සමයෙහි එක් සඟනමක්හට කර එල්වා පරිහරණය කටයුතුවූ පටියක් පූජා කෙළෙමි කිව. අනික් දෙවඟනක් කියන්නී මම මිනිස්ලොව වසන සමයෙහි සඟනමක්හට සිව්රැස් විජිනිපතුයක් පූජා කෙළෙමි කිව. ඉක්බිති අනික් සුරඟනක් කියන්නී මම මිනිස්ලොව වසන සමයෙහි සඟනමක්හට නල්වටක් දුනිමි හෙවත් නල්පනින් කළ වටහපතක් දුනිමි කිව. ඊට අනතුරුව අනික් දෙවඟනක් කියන්නී මම යට ගිය දවස මිනිස්ලොව වදී මොණරපිල් කළඹක් හොතා කරණලද හෙයින් මනාවූ මොණර පිල්යා විජිනිපතක් පූජා කෙළෙමි කිව. නැවත අනික් සුරසුන්දරියක් කියන්නී මම මිනිස්ලොව වසන සමයෙහි එක්තරා සඟනමක්හට කුඩයක් පූජා කෙළෙමි කිව ඉක්බිති අනික් දෙවඟනක් කියන්නී මම මිනිස්ලොව වසන සමයෙහි සඟනමක්හට සෙරෙප්පු යුගලයක් පූජා කෙළෙමි කිව. නැවත අනික් සුරසුන්දරියක් කියන්නී මම මිනිස්ලොව වසන සමයෙහි පිඬුසිහා වඩනා සඟනමක්හට කබලු පූවක් පූජා කෙළෙමි කිව. ඊට අනතුරුව අනික් දෙවඟනක් අනින් විවාළ සේක. ඒ දිව්‍යාඟනාව කියන්නී යට ගිය දවස මම මිනිස්ලොව වසන සමයෙහි පිඬුසිහා වඩනා තෙරකෙණෙකුන්ට අඟහලාවක් පූජා කෙළෙමි එම කුශලයෙන් මෙබඳු සැපතක් ලදිමි කිව. ඊට අනතුරුව සනිස් දිව්‍යාඟනාව අනිනුදු පෙරසේම කුශලකර්මය විවාළසේක. ඒ දිව්‍යාඟනාව කියන්නී ඉතාතිලපණීතයෙනි මම මිනිස්ලොව වසන සමයෙහි කාශ්‍යපබුදුන්ගේ ශාසනයෙහි පැවිදිවූ භික්ෂුකෙණෙකුන් වහන්සේ දැක පහන්සිත් ඇතිව සකබලිකනම් කැවිලි විශෙෂයක් පූජා කෙළෙමි එම කුශලකර්මය හෙතුකොට ගෙණ මේ සියලු ඵලාඵල යසසම්පත්තියන් ලදිමි කිව. මෙසේ ඒ දිව්‍යාඟනාව විසින් යට ගිය දවස කරණලද සුවරිතකර්මය ප්‍රකාශකොට කී කල්හි විශෙෂයෙන් සතුටුව ප්‍රශංසා කරන්නාවූ ඔහබෝසථානෝ මෙසේ කීසේක.

"ඨානං වත මෙ අජ්ජ සුපභාතං සුවුට්ඨිතං
යං අද්දසිං දෙවතායො අවජ්ජරා කාමවණ්ණිනියො.
ඉමාසාහං ධම්මං සුත්වාන කාහාමි කුසලං බහුං
දමෙන සමචරියාය සඤ්ඤමෙන දමෙන ච.
සොහං තත්ථ ගවජ්ඣාමි යත්ථ ගන්ත්වා න සොචරෙ'නි"

යනුහෙයින් අද මාවිසින් මේ දිව්‍යලොකයට ආ ගමනත් ඉතා යහපත අද මේ රාත්‍රියත් යහපත් වැඩක ගැසිරීමෙන් අතික්‍රාන්තවිය මේලෝ පරලෝ දන්නා රූපශ්‍රී ඇති දිව්‍යාඟනාවන් දැකීමක් ඇද්ද ඒ දැකීමත් යහපත් වන්නිය කුශලකර්මඵල ප්‍රත්‍යක්ෂකිරීම් වශයෙන්ම සතුටු සින්ඇත්තාවූ මම මිනිස්ලොවට ගොස් අප්‍රමාදව දන් දීමෙන් හා ප්‍රාණඝාතාදිවූ දශවිධ අකුශලයෙන් දුරුව දශවිධ කුශලකර්ම යෙහි පිහිටා කුසල් කෙරෙමි කියා කුශලකර්මඵල ප්‍රත්‍යක්ෂයෙන්ම දැන සිත එකඟවූ බව ප්‍රකාශකොට මේ දිව්‍යභවනයට ආ නමින සාර්ථකවියයි කියේක. ඉන්බිනි ගුත්තිල පණ්ඩිතයෝ මෙසේ ප්‍රශංසා කොට නැවත මිනිස්ලොවට ගොස් කියනලද ක්‍රමයෙන් දිවිහිමියෙන් කුසල්කෝට කම්වූ පරිද්දෙන් මිය පරලොව හියසේක. මෙතකලා යනසථවිරය ගුත්තිලපණ්ඩිතව උපන්නෙමි දැන් මේ ලොවුතුරාබුදුවූ මම්මයයි වදුරා කාශ්‍යප බුදුන්ගේ බුඩොත්පාදය පවත් මාගේ මේ බුඩොත්පාදය දක්වා දෙව්ලොවම සැරිසරන්නාහු කියනලද විමන් වල සැප විඳිනවුන් දැක නොපවසින් විචාරණලදුව ප්‍රකාශකොට කිවාහුය දැන් නොපවසින් විචාරණලදුව ප්‍රකාශකොට කිවාහුම නොවෙයි මාවසිනුදු ගුත්තිලපණ්ඩිතව උපන් සමයෙහිද විචාරණලදුව නොපට කිවාසේම වෙන වෙනම ප්‍රකාශකොට කිවාහුම වේදැයි වදුරා මේ ගුත්තිලවිමානවත්ථුදෙශනාව ගෙණ හැර දක්වා වදළසේක. වත්ථුත්තමදැයිකා විමානය පවත් සකඛලිදැයිකා විමානය දක්වා වෙන වෙනම වර්ණනා කරණලද කුශලකර්මයන් මුගලන් මහතෙරුන් වහන්සේට ප්‍රකාශකොට කිවාසේ පළමුකොට ගුත්තිලාචාර්ය්‍යන්ට කී හෙයින් ගුත්තිලවිමානයයි කියා සඞ්ගීතිකාලයෙහි සඞ්ග්‍රහවට නැගුපමණක් විනා ඒ විමානයන් ඒ ඒ දිව්‍යාඟනාවන් සන්තකමය සඞ්ගීතිකාරක මහාසථවිරයන් විසින් ගුත්තිලවිමානවත්ථු දෙශනාමයයි කියා සඞ්ගායනා කළහෙයින් ගුත්තිලවිමාන නම් විය. ඒ දිව්‍යාඟනාවෝ සතිස්දෙන වනාහි කාශ්‍යපබුදුන්ගේබුඩොත්පාදකාලයෙහි පවත් කුශලකර්මය නැවත නැවත සිහිකිරීම් වශයෙන් උපදනා ප්‍රීතිචිත්තයෙන් කාලක්‍රියා කොට දිව්‍යලොකයෙහිම ඉපිද දෙවන ආත්මභාවයෙහි පවත් එක් බුඩාන්තරයක් මුලුල්ලෙහි දෙව්ලොවම සැරිසරන්නාහු

අපබුදුන් කාලයෙහිද තවුතිසාභවනයෙහි එකතැන පිහිටි සතිසක් දිව්‍යවිමානවල ඉපිද දසදහසක් දෙවඟනන් පිරිවරා දිව්‍යශ්‍රීසම්පත් අනුභවකරන්නාහුය එසමයෙහි ආයුෂ්මත් මුගලන්මහතෙරුන්වහන්සේ දෙවවාරිකාවෙන් වඩනාසේක් ඒ දිව්‍යාඩහනාවන් දැක ඔවුන් පිසින් පූර්වජාතියෙහි කරණලද කුශලකර්මයන් විචාරණු කැමතිව යට ගුත්තිලපණ්ඩිතයෝ විචාළසේම විචාළසේක. ඔවුන් විසිනුදු ගුත්තිලපණ්ඩිතයන් කාලයෙහි ප්‍රකාශකොට කිවාසේම මුගලන් මහතෙරුන්වහන්සේටද වෙන වෙනම ප්‍රකාශ කොට කිවාහුයයි දතයුතු.

මේ විමානවත්ථුප්පකරණයෙහි පාරිචරිත්තකවග්ගයෙහි ගුත්තිල විමානවත්ථුව කියා නිමවනලදී.

තවද මේ විමානවත්ථුප්පකරණයෙහි පාරිචරිත්තකවග්ගයෙහි **දද්දල්ලවිමානවත්ථුව** නම් කවරයත්?

භාග්‍යවන් බුදුරජානෝ ජෙතවනාරාමයෙහි වැඩවසන සමයෙහි නාලනම් ගම එක්තරා කෙළෙඹි පුත්‍රයෙකුගේ භද්‍රාය සුභද්‍රායයි දියනි යෝ දෙදෙනෙක් වූහ උන් දෙදෙන එක පුරුෂයෙකුට සරණගොසින් වසන්නාහුය ඔවුන් අතුරෙන් භද්‍රාවද නිරන්තරයෙන් දන් දෙන්නිය එක් දවසක් තමන් නැඟණිවූ සුභද්‍රාවටත් දන්දෙවයි කියා අවවාද කළාය සුභද්‍රාවද ඔහපතැයි කියා වචනය පිළිගෙණ රෙවත මහතෙරුන්වහන්සේ ඇතුලුව අටදෙනෙකුන්වහන්සේ වඩාහිඳුවා සාංඝික කොට දුනයන් දුන්නිය ඒ කුසලයෙන් නිම්මාණරතිනම් දිව්‍යලොකයෙහි උපන්නිය භද්‍රාව ශක්‍රයාට පරිචාරිකාව තවුතිසා දෙව්ලොව උපන්නිය සුභද්‍රාව තමන්ගේ සම්පත් දැක භද්‍රාව උපන්තැන් බලා ශක්‍රයාට පරිචාරිකාව උපන්බව දැක භද්‍රාවගේ විමානයට ගොස් දිළිහි සිටියාය. භද්‍රාව සුභද්‍රානම් දිව්‍යාඟනාව දැක මේ දෙව්ඟලාව දෙවියන්ට වඩා ශරීර වර්ණයෙන් බබලන්නාවූ හී කවුරුදැයි විචාළාය. එකල් හී සුභද්‍රාව කියන්නී පෙර මිනිස්ලොව උපන් සමයෙහි එක් පුරුෂයෙකුට භාර්‍යාව විසුවාවූ සුභද්‍රානම් නොප නැඟණියෝනම් මමය නිම්මාණරතී නම් දෙව්ලොව උපන්මි කිව. කවර කුසලයකින් නිම්මානරතිදෙව්ලොව උපන්නිදැයි විචාළිය. එබසට සුභද්‍රාව කියන්නී පෙර මම සඟ අටනමකට සාංඝික දුනයක් දුන්නෙමිද ඒ කුසලයෙන් මෙබඳු දිව ඉසුරක් ලදිමි කිව. ඒ භද්‍රාව විචාරන්නා මම බොහෝසේ දන්දී තිනවූ තවුතිසා දෙව්ලොව උපදින්ටත් නෝ එක් දවසක් දන්දී නිම්මානරතිදෙව්ලොව උපදින්ටත් කාරණා

කවරේදැයි විමසූහ. එකල සුභද්‍රාව කියන්නී මම සාංඝිකාව දුන් දෙයින් නිම්මානරතිදෙවිලොව උපන්මි නෝ පුදහලින දෙයාට දුන් දෙයින් තිනවූ තවුතිසා දෙවිලොව උපන්නියයි කියා සාංඝික දානය මහානිසංසබව ප්‍රකාශකොට ගියාය ශක්‍රයා ඒ දිව්‍යාඟනාව කථාකොට ගියා දැක භද්‍රාව අතින් මෙසේ විචාළේය. ශරීර වර්ණයෙන් දිළිහි දිළිහි නි හා සමග කථාකොට ගියාවූ දිව්‍යාඟනාව කවුරුදැයි විචාළේය. භද්‍රාව ඒ සියල්ලම ශක්‍රයාට කිව, ශක්‍රයෝද මුගලන්මහතෙරුන්වහන්සේ දෙවචාරිකාවෙන් වඩනා දැක ඒ සියලුම පවත් තෙරුන්වහන්සේට කිහ. මහතෙරහු මිනිස් ලොවට වැඩ ඒ සියළුම ප්‍රවෘත්තිය බුදුන්ට දන්වූසේක. බුදුරජානන්වහන්සේ එම අනෝත්පත්තිකොට ගෙණ සම්ප්‍රාපත පිරිසට බණ වදාළසේක. ඒ ධර්මදේශනාව බොහෝදෙනාට සාර්ථක විය.

මේ විමානවත්ථුප්පකරණයෙහි පාරිච්ඡත්තක වර්ගයෙහි දුතිය ලඵවිමානවණ්ණනාව දානපරිවේදයෙහි විසතරවශයෙන් මහළු බසට නැඟූ බැවින් මෙතැන්හි ග්‍රන්ථ බොහෝවනානිසා සංක්ෂේපයෙන් කියා නිමුවන ලදී.

තවද මේ විමානවත්ථුප්පකරණයෙහි පාරිච්ඡත්තකවර්ගයෙහි **සෙස වනී විමානවත්ථුව** නම් කවරයන්?

විපදෙත්තමවූ බුදුරජානෝ සැවැත්නුවර ජෙතවනාරාමයෙහී වැඩවසන සමයෙහි මගධරට නාලකනම් ගමෙක් විය ඒ ගම එක් තරා සිටුපුත්‍රයෙක්හුගේ සෙසවතිනම් යෙහෙලියක් ඇත්තිය ඒ කුමාරිකා වනාහි යළි ගිය දවස කරණලද කුසල් ඇතිහෙයින් මහපින් ඇතිවූවාය. ඒ කෙසේදයත්?

යට ගිය දවස කාශ්‍යප බුදුන්ගේ ශ්‍රී ශරීරය ආදහන කළතැන එක ඝණවූ ධාතු වහා රුවන් දැගැබ කරණ කල්හි මේ සෙසවති කුමාරිකා ලදරු කුමාරිකාවක්ව මැනියන්හා සමග ඒ චෛත්‍යස්ථානයට ගිය තැනැත්නි රන්ඵළු කම්මාන්ත කරන්නවුන් දැක මැනියන් අත්හැර විචාරන්නී මැනියෙනි මොහු කුමක් කෙරෙද්දැයි විචාළිය එකල මැනියෝ කියන්නී දියනියෙනි මේ දැගැබ බදනාපිණිස රන්ඵළු වැඩ කරවති කි කල්හි එපවත් අසා ඒ කුමාරිකාව සතුටුසිත් ඇතිව මැනියෙනි මගේ කර පලඳනාලද මේ සවණ්ණමයවූ කුඩා පලඳනාවක් ඇත මේ පලඳනාව දැගැබ පිණිස දෙමි කිවාය මැනියෝ එබසට යහපත දෙවයි කියා පලඳනාව කරින් ගලවා මේ කුමාරිකාව විසින් දෙනලද පලඳනාව මේ රණෙහි බහා උළුකැටක් කරවයි කියා

සාණ්ඩකාරයා අනට දුන්නිය සාණ්ඩකාරයා කිලෙසම කළේය ඒ කුමාරිකාව එයින් අපරභාගයෙහි කාලක්‍රියා කොට ඒ කුසලයෙන් දිව්‍යලොකයෙහි ඉපිද නැවත නැවතත් සුගතියෙහිම සැරිසරන්නී අප බුදුන් සමයෙහි නාලකනම් බමුණුගම උපන්නී අනුක්‍රමයෙන් දෙ, ලොස් හැවිරිදි වයසට පැමිණියාය. එක්දවසක් මෑනියන් විසින් තෙල් ගෙණෙවයි කියා මිළදී ගවනලද්දී මිළ ගෙණ එක්තරා සල් පිලකට ගියාය ඒ සල්පිළ එක්තරා කෙළෙඹි පුත්‍රයෙක් පියානන් විසින් නිධාන්කොට තබනලද රන් රිදී මුතු මැණික් රතනයන් ගොඩ නගමි සිතා ඒ හිරණ්‍යසාවණ්ණාදිය ගන්නාපිණිස ගොඩ නගන්නේය. ඒ ආපණිකයා ඔහුගේ කම්මබලයෙන් කැට කැබිලිනි ගල්බොරළු සේ නැගෙන්නා දැක මහත් සංවේගයට පැමිණ එක්දව සක් පින්වත් කෙණෙකුන් නිසාවත් රිදී ආදියසේ වේදෝ හෝයි සිතා විමසනු පිණිස සල්පිල රැස්කොට තුබුයේය. එසමයෙහි තෙල් පිණිස මිළ ගෙණගියාවූ ඒ සෙසවනි කුමාරිකාව මහත් රුවන්ගොඩ දැක කිමෙක්ද පින්වත රන් රුවන් මෙසේ අනාථයේ දමන්නේ ඇද්ද මනාකොට සඟවා නිඛියතු නොවේදැයි කිව. කෙළඹිපුත්‍රයා එබස් අසා මේ කුමාරිකාව මහ පින් ඇත්තිය මේ කුමාරිකාවගේ කුශල මහිමයෙන් අපගේ මේ සියළු වයතුට රන්රුවන්ව ගියේනම් අපට මහත් අභිවෘඩියක මේ කුමාරිකාව මපුතනුවන්ට සරණ පිණිස කැඳවා ගෙණඑමි සිතා ඈගේ මෑනියන් සමීපයට ගොස් නැගණියෙනි නොප දියනිවූ මේ සෙසවනි මපුතනුවන්ට සරණ පිණිස දෙවයි කියා වලක්වා මෑනියන්ට බොහෝ වයතුදී ආවාහ විවාහ කොට ඒ කුමාරිකාව ඔහුගේ ගෙට කැඳවාගෙණ ගියේය. ඉක්බිති ඒ කුමාරිකාව ශීලාචාරගුණ ඇතිබව දැන භාණ්ඩාගාරයෙහි දෙර හරවා කැට කැබිලිනි ආදියසේ තුබූ වයතුරැස් දක්වා දියනියෙනි කුමක් පෙණේදැයි විචාරා ඒ ගෙයි රැස්කොට තබනලද රන්රුවන් රැස් දකිම් කි කළ මේ සියල්ලම අපගේ කම්මබලයෙන් අත්තභාවවූ වයතුව නිගේ කුශලවිපාකවිශෙෂයෙන් ප්‍රකෘතිමත්ව රන්රුවන් විශෙෂවිය එබැවින් මෙතැන්පටන් මේ ගේ සියල්ලම තී සන්තකය කිම රකුව නි විසින් දෙනලද දෙයක්ම අපි අනුභව කරමහයි කියා ඒ සියලුම සමපත් සෙසවනි සන්තකයයි කියා ව්‍යවහාර කළහ.

එසමයෙහි දම් සෙනෙවි සැරියුත්මහතෙරුන්වහන්සේ මාගේ මවු රූපසාරිනම් බ්‍රාහ්මණදේවීන්ට මා ලත් නිවන් සමපත් පොහා වනික මිළ කියා ඒ පිණිස දී පිරිනිවන්පාම් සිතා බුදුන්කරා එලැඹ උපන් ගෙයිදි පිරිනිවන් පානට අවසර ගෙණ බුදුන්ගේම අනුමැතියෙන් අනෙකවිධ ප්‍රාතිහාර්‍යය දක්වා නොයෙක් සතුතිසහශ්‍රයෙන් බුදුගුණ

කියා සතුනිකොට බුදුන් වැඳ ප්‍රදක්ෂිණා කොට දකිනයට විසයවන තාක් තැන් පටන් බුදුන්ට අභිමුඛව හොස් මුවහවන තැන සිට පසඟ පිහිටුවා වැඳ භික්ෂුසංඝයා පිරිවරා විහාරයෙන් නික්ම භික්ෂුසංඝයාට අවසරදී ආයුෂ්මත් අනඳමහතෙරුන්වහන්සේ අනිත්‍යතා ප්‍රතිසංයුක්ත ධර්මදෙශනාවෙන් අස්වසා සිවුවනක් පිරිස අතුරෙන් නිත්‍ය පරිවාර පන්සියයක් සංඝයා පිරිවරා අනුක්‍රමයෙන් නාලකනම් ගමට පැමිණ මෑනියන් සෝවාන් ඵලයෙහි පිහිටුවා එදවස් අළුයම් වේලෙහි මහන්වූ පවනින් නිවිගිය මහාප්‍රදීපයක්මෙන් උපන්ගෙයිදි පිරිනිවන් පෑ වදුළසේක. එසමයෙහි සැරියුත් සවාමීන් පිරිනිවි පවත් අසා දිව්‍ය බ්‍රහ්මයන්සහ මනුෂ්‍යයෝ රැස්ව ශරීරසත්කාර වශයෙන් සත් දවසක් මුලුල්ලෙහි ගඳදුම්මල් පහන් ආදි නොයෙක් පූජා පෙළහරින් දවස් යැවූහ. ඉක්බිති අගරුවඳුනාදියෙන් සියක් රියන් පමණ දරසෑයක් කළාහුය.

ඒ සෙසවති කුමාරිකාවද මහතෙරහු පිරිනිවන් පෑ බව අසා ඒ සථානයට ගොස් සියතින් ගඳ දුම්මල් පහන් ආදියෙන් පුදමිසි රන් මල් රිදිමල්ද අනිකුදු නොයෙක් මල්හා හරිවඳුනාදි නොයෙක් සුවඳකරඬු ගෙන්වා ගෙණ යනු කැමැතිව මසිලනුවන් විවාරා ඔහු විසින් තෝ බැරුරුම් ඇත්තිය එතැන්හි බොහෝ දෙනාගේ රැස්වීමෙන් ජනසම්බාධ ඇත්තේය. ගඳ දුම්මල් පහන් ආදි පූජා භාණ්ඩ යවා මෙහිම වසවසි කියා වලක්වමින් සිටියදි ශ්‍රද්ධා ඇති බැවින් නොපසුබට වියහී ඇඟිව ජීවිතවිනාසයට සේ නමුදු ගොසින්ම පූජා සත්කාර කෙරෙමි කියා මසිලනුවන් කිබස් නොගිවිස පිරිවරහා සමඟ පූජාභාණ්ඩ ගෙන්වා ගෙණ ගොස් ගන්ධපුෂ්පාදින් පූජාකොට දෙහොත් මුදුන්දී වැඳ සිටියාය. එසමයෙහි තෙරුන්වහන්සේගේ ශරීර පූජාවට ආවාවූ පිරිස් අතුරෙන් මදයෙන් මත්ව ඇතෙක් ඒ සථානයට දිව ආයේය. ඔහු දූක මනුෂ්‍යයෝ මරණ භයින් තැනිගෙණ දිවනකල මහත් ජනසම්මර්දනයෙන් වැටිහුන් සෙසවතී කුමාරිකාවන් ඇඟ පිටට මනුෂ්‍යයෝ පැණ පැහි මිරිකි මැරුනිය. ඒ කුමාරිකාව ශ්‍රද්ධා සම්පන්නව කම්මඵල අදහමින් පූජා සත්කාරකොට තෙරුන්වහන්සේ කෙරෙහි විත්තප්‍රසාද වශයෙන් කරණලද කුශලකම්මය හෙතු කොටගෙණ කාලක්‍රියාකොට තවුතිසාදිව්‍යලොකයෙහි උපන්නිය. පරිවාර සත්හු දහසක් පමණවූහ. උපන් කෙණෙහිම ඒ දිව්‍යාඟනාව ඇගේ දිව්‍යසම්පත් බලා කවර කුශලකම්මයක් හෙතුකොටගෙණ මා විසින් මෙබඳු සම්පත්තියක් ලබන ලදදැයි ඇගේ කුශලකම්මය පරීක්ෂාකරන්නී තෙරුන්වහන්සේට කරණලද පූජා සත්කාරයත් එහින් ජනිතවූ ඉෂ්ටවිපාකයත් දූක රත්නත්‍රය කෙරෙහි අතිශයින් ප්‍රසන්නවූ

සිත් ඇතිව සැටහැලක් පුරාලන පමණ සව්වාහරණයෙන් සැරසී දහ සක් දෙවඟනන් පිරිවරා චන්ද්‍රසූර්‍යයන්සේ මහත් දිව්‍යානුභාවයෙන් දිලිහි දිලිහි දසදික් එකාලොක කෙරෙමින් විමානයහා සමග බුදුන් දක්නා පිණිස මිනිස්ලොවට අවුත් විමානයෙන් බිමට බැස බුදුන්කරා ළඟැඹි නමස්කාරකොට දෙහොත් මුදුන්දී එකත්පස්ව සිටියාය.

එසමයෙහි වඩිනිස මහතෙරුන්වහන්සේ බුදුන් සමීපයෙහි සිටිසේක් බුදුන්ට නමස්කාරකොට සවාමිනි මේ දිව්‍යාඟනාව මෙබඳු සමපත් ලැබීමට කරණලද කුශලකර්මය විචාරන්ට අවසර දෙනසේක්වහි කිසේක. එසඳ බුදුහු වඩිනිසස්ථවිරය පිළිවිසවහි වදාළසේක. ඒ දිව්‍යාඟනාව කරණලද කුශලකර්මය විචාරණු කැමති වඩිනිස මහතෙරහු පළමුකොට ඇගේ සමපත් ප්‍රකාශ කරණසේක.

"එළික රජත හෙමජාල ජාහං
විවිධ විචිත්‍ර එලමදදසං සුරමමං,
වාමහං සුනිම්මිතං තොරණූපපන්නං
රාජකූපකිණ්ණමිදං සුභං විමානං.

භාසති දිසතා නහෙව සූරියෝ
සරදෙ තමනුදෙ සහස්සරංසි,
තථා තපති තව ඉදං විමානං
ජලම්ව ධූමසිඛෝ නිසෙ නභඝෙහ.

මුසතිව නයනං සතෙ රතාව
ආකාසෙ ඨපිතමිදං මනුඤ්ඤං,
වීණාමුරජසම්මතාලසුඨං
ඉඩං ඉන්‍දපුරං යථා තවසිදං".

යනාදීන් ගාථාවලින් විමානවර්ණනා කොට ඛඟලාඞ්කාර විධිවංශනය කොට ආකාශයෙහි බබලන්නාවූ සූර්‍යමණ්ඩලයසේ බබලන්නාවූ මේ විමානය ඇතුලුව මේ දිව්‍යශ්‍රීසම්පත් ලැබීමට හි පූර්ව ජාතියෙහි කළාවූ කුශලකර්මය කවරේදැයි විචාරා වදාළසේක.

මෙසේ වඩිනිස මහතෙරුන්වහන්සේ විසින් විචාරණලද පැනය විසඳන්නාවූ දිව්‍යාඞනා තොමෝ මෙසේ කිව.

"යථා ච මෙ අභිගතමිදං විමානං
කොඤ්චා මයූරා චකොරසංඝචරිතං,
දිඝපිලවහං සරාජමත්තං
විජකාරණ්ඩවකොකිලාභිනාදිතං.

නානාසඞ්ඝානකප්පරුක්ඛවිවිධං
පාටලිජම්බුඅසොකරුක්ඛවණ්ණං,
යථා ච මෙ අධිගතමිදං විමානං
තඤ්ඤෙව පවිදිස්සාමි සුණොහි භඤ්ඤෙ.

මගධවරපුරත්ථිමෙන නාලගාමෝ නාම අත්ථි භඤ්ඤෙ,
තත්ථ අහොසිං පුරෙ සුනිසා සෙසවනිති තත්ථ ජානිංසු මං.
සාහං අපවිං තත්ථ ධම්මං කුසලං දෙවමනුස්සපූජිතං මහන්තං,
උපනිස්සයං පරිනිබ්බුතං අසපමෙය්‍යං මුදිතමනා කුසුමෙහි
අබ්භොකිරිං".

යනාදින් වණ්ණනීයවූ කොඤ්චාමයූරාදි පක්ඛිසමූහයා විසින් ගැවසී ගත්තාවූ පිපී වැනිගිය මලින් ගැවසී ගත්තාවූ සල් පලොල් ආදි නොයෙක් දිව්‍යවෘක්ෂාදියෙන් සොභාමත්වූ මාගේ උයන් විමන් ආදි මේ සියලු සම්පත් ලැබීමට කරණලද කුශලකර්මය ප්‍රකාශකෙරෙමි අසා වදාළමැණව සවාමිනි ජයශ්‍රී මහාබොධිත්වහන්සේට නැගෙණ හිරිදිග මගධරට නාලකනම් ගමෙක් ඇත ඒ ගම එක්තරා කෙළෙඹි පුත්‍රයෙකුට යෙහෙලිව සෙසවති කුමාරිකාවයයි ප්‍රසිද්ධව විසිමි. එසම යෙහි දම්සෙනෙවි සැරියුත් මහතෙරුන්වහන්සේ පිරිනිවන් පෑ නැනට ගොස් මල ශරීරයට සවණ්ණමල්ගා සුවඳමල් ආදියෙන් පූජා කෙළෙමි, එපමණ කුශලය හෙතුකොටගෙණ මෙබදු සම්පත්තියක් ලදිමි කිව.

මෙසේ වඩිනිස මහතෙරුන්වහන්සේ විසින් විචාරණලද වචනය මුදුනෙන් පිළිගෙණ ඒ දිව්‍යාඞ්ගනාව විසින් කියනලද වචනය අත්‍යොත්පත්තිකොටගෙණ එතැන්හි පැමිණි පිරිසට බුදුරජානන් වහන්සේ ධර්මදෙශනාකොට වදාළසේක. ඒ ධර්මදෙශනාව දිව්‍යාඞ්ගනාවටහා බොහෝදෙනාට සාර්ථකවිය.

මේ විමානවත්ථුප්‍රකරණයෙහි පාරිජ්ඣානකවගිහයෙහි සෙසවති විමානවණ්ණනාව කියා නිමවනලදී.

තවද මේ විමානවත්ථුප්‍රකරණයෙහි පාරිජ්ඣානකවගිහයෙහි **පාරිජ්ඣානක විමානවත්ථුව** නම් කවරයත්?

භාග්‍යවත්වූ බුදුරජානන්වහන්සේ එක්සමයෙක්හි සැවැත්නුවර ජෙතවනාරාමයෙහි වැඩ වසනසේක. එසමයෙහි සැවැත්නුවර වාසි එක්තරා උපාසකයෙක් බුදුන් කරා එලැඹ නමස්කාරකොට ස්වාමිනි සෙට දවස මාගේ දුනය ඉවසා වදාළමැණවැයි කියා ආරාධනාකොට

නැවත තමන්ගේ ගෙට ගොස් ගෙදොර සමීපයෙහි මණ්ඩපයක් සදා උඩ විසිතුරු ඔයන් බැඳ මටතිර ඇද පරිභෝගකොට ඛජ්ජපානාන නංවා නානාමණිණ පිළිහා සුවඳ මල්දම් එල්වා නොයෙක් අලංකාරයෙන් මණ්ඩපය සරහා පැන් ඉස ඝනපත්කොට හමදනාලද භූමිප්‍රදෙශයෙහි අසුන් පණවා බුදුන්ට කල්දුන්වූයේය. එකල්හි බුදුරජානෝ පෙරවරු සමයෙහි හඳනා සිවුරු වැලඳ පාසිවුරු ගෙණ විහාරයෙන් නික්ම දිව්‍යවිමානයක්සේ අලංකෘතකොට සරහනලද මණ්ඩපයට වැඩ සූසම්මණ්ඩලයසේ සමුද්‍රකුක්ෂිය එකාලොක කෙරෙමින් බුදුරැසින් දිලිහි දිලිහි පණවනලද ආසනයෙහි වැඩහුන්සේක. එකල්හි ඒ උපාසකයා හඳ දුම්මල් පහන් ආදියෙන් බුදුන්ට පූජා කෙළේය.

එසමයෙහි කාඤ්ඤනාරිනම්වූ එක්තරා ස්ත්‍රියක් දරපිණිස අඹවන නම් අරණ්‍යයට නියතැනැත්ති ඒ වනයෙහි වැඩහුන් බුදුන් දැක පහන්සිත් ඇතිව වැඩහුන් ආසනයට මල් ඇතිරියක්සේ හෝපලු මල් අතුට පූජාකොට පසඟ පිහිටුවා වැඳ ප්‍රදක්ෂිණා කොට නිවාස. ඒ සක්‍රිය එසින්පසු නොබෝකලකින් කාලක්‍රියාකොට තවුතිසා දිව්‍ය ලොකයෙහි උතුම්වූ රන් විමනෙක උපන්නිය පරිවාර සත්හු දහසක් පමණවූහ. ඒ දිව්‍යාඟනාව එක්දවසක් නන්දනනම් උයන්හි දහසක් දෙවඟනන් පිරිවරා නටමින් ගායනා කෙරෙමින් පරසතුමල් ගොතමින් සතුටුව ක්‍රීඩා කෙරෙයි.

එසමයෙහි ආයුෂ්මත් මුගලන් මහ තෙරුන්වහන්සේ ඍධියෙන් දෙවචාරිකාවෙන් වඩනාසේක් තවුතිසාභවනයට වැඩ ඒ දිව්‍යාඞ්ගනාව දැක ඒ දිව්‍යාඞ්ගනාව විසින් කරණලද කුශලකර්මය මේ ගාථාවලින් විවාළසේක.

"පාරිවජ්ඣත්තකොවිලාරෙ රමණීයෙ මනොරමෙ,
දිබ්බං මාලං ගන්ථමානා ගායන්ති සමපමොදසි.

තස්සා තෙ නච්චමානාය අඞ්ගමඞ්ගෙහි සබ්බසො,
දිබ්බා සද්දා නිච්ඡරන්ති සවණීයා මනොරමා.

තස්සා තෙ නච්චමානාය අඞ්ගමඞ්ගෙහි සබ්බසො,
දිබ්බා ගන්ධා පවායන්ති සුචිගන්ධා මනොරමා.

විවත්තමානා කායෙන යා වෙනිසු පිලන්ධනා,
නෙසං සුය්‍යන්ති නිඝෝසෝ තූරියෙ පඤ්චඞ්ගිකෙ යථා.

විවංසකා වානධුනා වානෙන සමපකම්පිතා,
නෙසම්පි සුය්‍යති නිඝෝසෝ තූරියෙ පඤ්චඞ්ගිකෙ යථා

සාපි තෙ සිරසම්හි මාලා සුවිගන්ධා මනොරමා,
වාති ගන්ධො දියා සබ්බා රුක්ඛා මඤ්ඤන්ති සබ්බදා යථා.

සායසෙ තං සුවිගන්ධිං රූපං පස්සසි අමානුසං,
දෙවතෙ පුච්ඡිතාවික්ඛ කිස්ස කම්මස්සිදං ඵලං'නි".

සතුහෙයින් දිව්‍යමය උයනෙහි පරසතු මදරා මල් හොතා පැලඳ නවන්නාවූ තිගේ මුදුන්මල්කඹින්හා දෙපය පටන් හිස දක්වා ඇවසී තිබෙන වන්‍දාභරණ මාලාදිය වාතවෙගයෙන් කම්පිතව පඤ්චාභිඤ්ඤතුඝ්ඝිනාදයක්සේ සියල්ලන් විසින් අසනු ලැබෙයි ගඬ මාදනපර්වතයෙහි නන්දමූලකපබ්භාරයෙහි මැණික්ලෙණ දෙර පිහිටි දියෙහි ගොඩෙහි හැම මල් පිපෙන්නාවූ මඤ්ජූසකනම් වෘක්ෂය යම්සේ නොයෙක් යොදුන් ගණන් හිමාලයප්‍රදෙශය සුවඳපිඬක්සේ එකපැහැර සුවඳ කෙරේද එමෙන් තිගේ ඇග හිස වලඳනාලද වන්‍දාභරණ මාලාදියෙන්හා ශරීරාවයවයෙන් නික්මෙන්නාවූ සුවඳින් දසදිග එකපැහැර සුවඳ පැතිරෙයි යනාදින් දිව්‍යසම්පත් වර්ණනාකොට මෙබඳු සම්පත් ලැබීමට කාරණලද කුශලකර්ම්මය කවරේදැයි වදුලසේක. ඒ පැනය විසඳන්නාවූ දිව්‍යාඞ්ගනාව මේ ගාථා දෙකින් ප්‍රකාශකළාය.

"පභස්සරං අච්චිමන්තං වණ්ණගන්ධෙන සඤ්ඤුතං,
අසොකපුප්ඵමාලාහං බුද්ධස්ස උපනාමයිං.

තාහං කම්මං කරිත්වාන කුසලං බුද්ධවණ්ණිතං,
අපෙතසොකා සුඛිතා සම්පමොදම්හාමයා'නි".

සතුහෙයින් ස්වාමිනි මම මිනිස්ලොව උපන් සමයෙහි ප්‍රවාලමය රේණු පෙළින්හා තිනිරුසක්සේ රත්වූ යහපත් සුවඳ ඇති හොපඵ මල් ගෙණ ගොස් බුදුන්ට පූජාකෙළෙමි එපමණ කුශලයෙන් බුදුන් විසින් වර්ණනා කරයුතුවූ අවෙෂයන්විසින් කියා නිමවිය නොහැකි දිව්‍ය සම්පත්තියක් ලදිමියි කිව. එකල මහතෙරහු විහාරවශයෙන් බණ වදාරා මිනිස්ලොවට වැඩ බුදුන්ට එපවත් දන්වූසේක. බුදුරජානෝ එම අත්තොත්පත්තිකොටගෙණ එතැන්හි සම්ප්‍රාප්ත පිරිසට බණ වදුලසේක. ඒ ධර්ම්මදෙශනාව බොහෝදෙනාට ඖත්සුක්‍යවිය.

මේ විමානවත්ථුප්‍රකරණයෙහි පාරිජ්ඣත්ථක වර්ගයෙහි පරසතුවිමානවර්ණනාව නිමවන ලදී.

පරමාර්ථජ්‍යොතිකානම්වූ ඛුද්දකට්ඨකථාවෙහි තුන්වන පාරිජ්ඣත්ථකවර්ගය නිමියයි.

තවද මේ විමානවත්ථුප්පකරණයෙහි සතරවන මඤ්ඡිට්ඨවග්ගයෙහි පළමුවන **මඤ්ඡිට්ඨවිමානවත්ථුව** නම් කවරයක්ද?

කරුණාවෙන් සිතිල්වූ භාග්‍යවත් බුදුරජානෝ එක්සමයෙක සැවැත්නුවර දෙව්රම්වෙහෙර වැඩවසනසේක. එසමයෙහි සැවැත්නුවර වාසිවූ එක්තරා උපාසකයෙක් බුදුන්කරා එලැඹ නමස්කාර කොට බුදුන්ට ආරාධනාකොට නැවත ගෙට ගොස් ගෙදොර සම්පයෙහි මණ්ඩපයක් සද උඩුවියන් බැඳ වටහිර ඇද පරික්ෂේපකොට ධ්වජපතාක නංවා නානාවණ්ණ පිලි හා ඔලම්බකපුඤ්ඡාදාමයන් එල්වා නොයෙක් අලඞ්කාරයෙන් මණ්ඩපය සරහා පැන් ඉස හමදනාලද භූමිප්‍රදෙශයෙහි අසුන් පණවා බුදුන්ට කල් දන්වූසේක. එකල්හි බුදුරජානෝ පූර්වාහ්නසමයෙහි හැඳ පාසිවුරු ගෙණ දිව්‍යවිමානයක්සේ අලඞ්කෘතකොට සරහා පිළියෙළකරණලද මණ්ඩපයට වැඩ උදයගිරිපර්වතමස්තකයෙහි දිලියෙන බාලාර්කිකමණ්ඩලයසේ දිලියෙමින් පණවනලද ආසනයෙහි වැඩහුන්සේක. එකල්හි ඒ උපාසකයා ගඳදුම්මල් පහන් ආදියෙන් පූජාකෙළේය. එසමයෙහි එක්තරා කුලදුසියක් අඹවනයට ගොස් ඒ වනයෙහි පිපුනාවූ මල්දැනි සල්ගසක් දැක සුපිපි මල් කඩාගෙණ ඉරටවලින් අමුනා මුදුන්මල්කඩ කිපයක් කොට නැවත ගොතා ඉතිරිවූ බොහෝ සල්මල් ගෙණ ඇතුලු නුවරට වත්නී ශුභන්ධිරපර්වතමස්තකයෙහි පර්වතකුක්ෂිය එකොහාඹ කෙරෙමින් දිලියෙන බාලාර්කිකමණ්ඩලයසේ සවණක්ඝන බුඛරශ්මිමාලාවන් විහිදුවා ඒ මණ්ඩපයෙහි දිලිහි දිලිහී බුඛාසනයෙහි වැඩහුන් බුදුන් දැක සිත හටගත්තාවූ බලවත් ප්‍රීති සොම්නස් ඇතිව ඒ ගෙණ ගන මල්වලින් පූජාකරන්නී මුදුන්මල්කඩ කිපය වැඩහුන් ආසනය වට තබා සෙසු මල් ආසනය වට විසුරුවා පූජාකොට බුදුන් වැඳ ප්‍රදක්ෂිණාකොට ගියාය. ඒ දැසී එයින් පසු නොබෝකලකින් කාලක්‍රියාකොට තවුතිසා දිව්‍යලොකයෙහි ගොමුහනක ගොමෙඩ කාදි මැණික් රත්නවශයෙන් හා රන්පබලුමිණිමය දෙව්විමනෙක උපන්නීය. ඒ විමන්දෙර ඉදිරියෙහි රුවන්වැලි අතුරණලද භූමිභාග ඇති මහත් සල්වනයක් පහළවිය. ඒ දිව්‍යාභරණාව ඝම් දවසෙක විමනින් නික්ම ඒ සල්වනයට ප්‍රවෙශ වන්නී වීනම් එකල්හි ඒ සල්අතු නැමි හිසමත්තෙහි මල් වගුරුවනී මෙසේ මහත්වූ දිව්‍යශ්‍රී සම්පත් අනුභවකරන්නී එක්දවසක් විමනින් නික්ම දහසක් දෙවඟනන් පිරිවරා මහත්වූ දිව්‍යඍද්ධියෙන් සල්වනයට ප්‍රවිශව ශරීරප්‍රභාවෙන් දිලිහි දිලිහී සැප විදිමින් ක්‍රීඩා කෙරෙයි.

එසමයෙහි ආයුෂ්මත්වූ මුගලන්මහතෙරුන්වහන්සේ දෙවචාරිකාවෙන් තවුතිසාදෙව්ලොවට වැඩ ඒ දිව්‍යාභරණාව දැක ඈ සමීපයට

වැඩ මේ සම්පත් ලැබීමට හිය දවස කරණලද කුශලකම්මය විචාරණ සේක් මේ ගාථාවලින් විවාලසේක.

"මඤ්ජිට්ඨකං විමානඤ්ච සොවණ්ණවාලුකසන්ථතෙ,
පඤ්චඞ්ගිකෙන තුරියෙන රමසි සුපවාදිතෙ.

තම්හා විමානා ඔරුය්හ නිම්මිතා රතනාමයා,
ඔගාහසි සාලවනං පුප්ඵිතං සබ්බකාලිකං.

යස්ස යස්සෙව සාලස්ස මූලෙ තිට්ඨසි දෙවතෙ,
සිසෙ මුඤ්චති පුප්ඵානි ඔනමිත්වා දුමුත්තමෙ.

වාතෙරිතං සාලවනං ආධුතං දිජසෙවිතං,
වාති ගන්ධො දිසා සබ්බා රුක්ඛෙ මඤ්ජුස්සකෙ යථා.

ඣායසෙ ත්වං සුවිගන්ධිං රූපං පස්සසි අමානුසං,
දෙවතෙ පුච්ඡිතාවික්ඛ කිස්ස කම්මස්සිදං ඵලන්ති."

යනාදීන් ඈගේ එසෙවයසම්පත් වර්ණනාකොට මෙබඳු සම්පත් ලැබීමට කරණලද කුශලකම්මය කවරේදැයි විචාලසේක. මෙසේ තෙරුන්වහන්සේ විසින් විචාරණලද පැණය විසඳන්නාවූ දිව්‍යාඟනාතෝමෝ මේ ගාථාවලින් ප්‍රකාශ කළාය.

"අහං මනුස්සෙසු මනුස්සභූතා දුසි අය්‍යකුලෙ අහුං,
බුද්ධං නිසින්නං දිස්වාන සාලපුප්ඵෙහි ඔකිරිං.

වටංසකඤ්ච සුකතං සාලපුප්ඵමයං අහං,
බුද්ධස්ස උපනාමෙසිං පසන්නා සකෙහි පාණිහි.

නාහං කම්මං කරිත්වාන කුසලං බුද්ධවණ්ණිතං,
අපෙතසොකා සුඛිතා සම්පමොදමනාමයා'නි."

යනුහෙයින් සවාමිනි මම යට හිය දවස එක්තරා කුලදැසියක් විමි. එසමයෙහි භොජනශාලාවෙහි මහසඟ පිරිවරා වැඩහුන් බුදුන් දැක සතුටුසිත් ඇතිව ආසනය වට වැසිවස්නාසේ සල්මල් විසුරුවා සල් මලින් කරණලද මුදුන් මල්කඩ කිපයක් ආසනය වට සඳ බුදුන්ට පූජා කෙළෙමි. එපමණ කුශලය හෙතුකොටහෙණ මෙබඳු දිව්‍යසුරක් ලදිමි කිව. එකල මුගලන් මහතෙරහු මිනිස්ලොවට වැඩ බුදුන්ට එපවත් දන්වූසේක. බුදුරජානෝ එම අත්තෝත්පත්තිකොට හෙණ සම්ප්‍රාප්ත පිරිසට බණ වදාළසේක. ඒ ධම්මදෙශනාව බොහෝ දෙනාට සාර්ථකවිය.

මේ විමානවත්ථුප්‍රකරණයෙහි මඤ්ජිට්ඨවගීනයෙහි
මඤ්ජිට්ඨවිමානවර්ණනාව නිමවනලදී

තවද මේ විමානවැත්ථුප්පකරණයෙහි මජ්ඣිමසඞ්ගීතියෙහි **කාණ්ඩ දායිකාවිමානවත්ථුව** නම් කවරයක්ද?

සර්වලෝකෛකනාථවූ බුදුරජානෝ එක්සමයෙක අඞ්ගවිඳනම් රට එක්තරා රමණීයවූ සථානයෙක වැඩවසනසේක. එසමයෙහි බුදුන්ගේ කුස වාතරොගයෙක් උපන. බුදුහු අනදමහතෙරුන්වහන්සේව ආමන්ත්‍රණය කොට යව ආනන්දය නෝ පිඬුපිණිස ගොස් මාගේ කුස උපන් වාතරොගයට නිසි බෙහෙත් කැඳක් හෙණෙවයි වදළ සේක. එකල අනදමහතෙරුන්වහන්සේ බුදුන්ගේ වචනය අසා මුදුනෙන් පිළිගෙණ සතරවරම් දෙවිරජදරුවන් විසින් දෙනලද ශෛලමය පාත්‍රය ගෙණ නමන්වහන්සේට උපසථාන කරන්නාවූ වෙදුනන්ගේ ගෙදොරට වැඩ දොරසමීපයෙහි වැඩසිටිසේක. එකල වෙදුනන්ගේ භාර්‍යාව මහතෙරුන් දුක සතුටුයිත් ඇතිව පෙරමගට ගොස් පසඟ පිහිටුවා වැඳ පාත්‍රය අතට ගෙණ විචාරන්නී සවාමිනි කෙසේවූ බෙහෙතක් නුබවහන්සේට ප්‍රයොජනඇද්දැයි විචාළිය. මෙසේ උපාසිකාව මහ නුවණ ඇතිගෙයින් මහතෙරහු බෙහෙතින් ප්‍රයොජනයක් ඇතිකල මේ ගෙට වඩනාසේක, භික්ෂා පිණිස වැඩි ගමනක් නොවෙයි කියා සිතින් සලකා දැන විචාල හෙයින් කැඳ කින් ප්‍රයොජන ඇතැයි වදළකල සිතන්නී අප අනදමහස්වාමීන්ට ප්‍රයොජන බෙහෙතක් පිණිස වැඩි බවක් නොවෙයි මේ වනාහි සර්වඥ සන්වහන්සේගේ පාත්‍රය වන්නේය, එබැවින් බුදුන්ට සුදුසුවූ කැඳක් ඉදිකරම් සිතා බලවත්ව හටගත්තාවූ ප්‍රීතිසොම්නස් ඇතිව ඩෙබර ඝුසයෙන් කැඳ පිස පාත්‍රය පුරවා පිළිගන්වා එපමණකින්ම අපවැනි ශ්‍රද්ධාවන්තයන්ට සුදුසු නොවෙයි සිතා අනිකුදු සූපව්‍යඤ්ජන සහිත අහර පිළියෙළ කොට යැවූහ. ඒ බෙහෙත් කැඳ වැලඳූ කෙණෙහිම බුදුන්ගේ කුස හටගත් වාතරොගය සන්සිඳින.

ඒ උපාසිකාව එයින් පසු නොබෝකලකින් කාලක්‍රියා කොට ඒ කුශලමයහෙතුවෙන් තවුතිසා දෙව්ලොව ඉපිද මහත්වූ දිව්‍යශ්‍රී සම්පත් අනුභවකෙරෙයි එසමයෙහි ආයුෂ්මත් මුගලන්මහතෙරුන් වහන්සේ දෙවචාරිකාවෙන් වඩනාසේක් දහසක් දෙවඟනන් පිරිවරා දිවඉසුරු අනුභවකරන්නාවූ ඒ දිව්‍යාඞ්ගනාව දුක ඇවිසින් ගිය දවස කරණලද කුශලකර්මය මේ ගාථාවලින් විවාළසේක.

"අභික්කන්තෙන වණ්ණෙන යා ත්වං තිට්ඨසි දෙවතෙ,
ඔභාසෙන්ති දිසා සබ්බා ඔසධි විය තාරකා-පෙ."

යනාදී ගාථාවලින් දිව්‍යසම්පත් වර්ණනාකොට එම්බා දෙවතාදුව නී මෙබඳු සම්පත් ලැබීමට කළාවූ කුශලය කවරේදැයි විවාළසේක එබස් අසා ඒ ප්‍රශ්නය විසඳන්නාවූ දිව්‍යාඞ්ගනාතොමෝ මේ ගාථාවලින් මදක් ප්‍රකාශ කළාය.

"අහං අඞ්කතිඤ්ඤයිං බුධ්‍යසාදිවබන්ධුනෝ,
අදාසිං කොලසම්පාකං කඤ්ජිකං තෙලඵ්ඵිතං.

පිප්පල්‍යා ලසුණානඤ්ච මිස්සං ලාමඤ්ජකෙන ච,
අදාසිං උත්තුතයිං පිප්පසන්නෙන චෙතසා.

යා මහෙසිත්තං කාරෙත්‍ය චක්කවත්තිස්‍ය රාජිනෝ,
නාරී සබ්බඞ්ගකල්‍යාණී භත්තුවාචනාමදායිකා.

එතස්ස කඤ්ජිදානස්ස ඵලං නාග්ඝන්ති සොළසිං,
සතං නෙක්ඛා සතං අස්සා සතං අස්සතරිරථා.

සතංකඤ්ඤා, සහස්සානි ආමුත්තමණිකුණ්ඩලා,
එතස්ස කඤ්ජිදානස්ස ඵලං නාග්ඝන්ති සොළසිං.

සතංහෙමවතා නාගා ඊසදන්තා උරුළ්හවා,
සුවණ්ණකච්ඡා මාතඞ්ගා හෙමකප්පනිවාසනා.

එතස්ස කඤ්ජිදානස්ස ඵලං නාග්ඝන්ති සොළසිං,
චතුරණ්ණම්පි ච දීපානං ඉස්සරං ගොධ කාරයෙ
එතස්ස කඤ්ජිදානස්ස ඵලං නාග්ඝන්ති සොළසින්ති"

ස්වාමිනි මම මිට පූර්ව ජාතියෙහි මිනිස්ලොව අඞ්ක විඤ්ඤත්‍ය රට වසන සමයෙහි ඩෙබරස්‍ය සතර එකට සිදුවා කැඳ පිස ඉතුරු මිරිස් නිප්පිලි අඹ අසමෝදක පෙරුන්කායන් සුදුලූණු කලුදුරු සුදුදුරු ස්‍ය මේ කාටුකහාණ්ඩයන් එක්කොට බහා බැඳ පෙල්දුවා සුවඳ දුම් කවා මේ බෙහෙත් කැඳ බුදුන්ට ඵාසු පිණිස වේවයි කියා පූජා කෙළෙමි. එපමණ කුසලින් මෙබඳු සම්පත්තියක් ලදිමි කියා කුශල කර්මය ප්‍රකාශකොට ඉක්බිති තුනුරුවන් වඩනා පින්කෙත් ලොක යෙහි නැතිබව භගවන්නි මේ ලොකයෙහි යම් ඒකාන්තයක් සතරමහ දිව සිනට අධිපතිවූ චක්‍රවර්තිරජ්ජුරුවන්ට අග්‍රමහෙසිකාබවට පැමිණ පඤ්චකල්‍යාණයෙන් යුක්තව ස්වාමියාට ප්‍රියකරුව සුවාසූදහසක් බිසෝවරුන්ට නායකව ශ්‍රීසම්පත් අනුභවකරන්නේවිනමුදු ඒ සියලු ඉසුරු සම්පත්තිය බුදුන් උදෙසා දුන් එක කැඳ දානයාගේ සොළොස් වැනි කලාවෙන් කලාවකටත් නොහඟනේය, තවද රත්‍රන් පස් කලදෙක් නිකයෙත්නම් වෙයි, ඒ නිකවශයෙන් රත්‍රන් සියක්දහ සක්ද අශ්වාලඞ්කාරයෙන් සරහනලද අසුන් සියක් දහසක්ද ශෛඛ වයන් යොදූ රථාලංකාරයෙන් සරහනලද රථ සියක් දහසක්ද මුත්තා මාණික්‍යමය කුණ්ඩලාභරණාදි නොයෙක් අලංකාරයෙන් සරහන ලද කන්‍යාඝනාවන් සියක් දහසක්ද යන මේ සියල්ලම යම්කෙ ණෙක් යාචකයන්ට දන් දුන්නේවී නමුදු ඒ සියලුම දානය මේ එක

කඤ්ඡිකා දුනයාගේ සොළොස් වැනි කලාවෙන් කලාවකටත් නොඟහනේය. දත්වල රන්කුප්පි බහා නොයෙක් භාණ්ඩාලංකාරයෙන් සරඟනලද නිමාලයෙහි උපන් අලි ඇතුන් සියක් දහසක් දුන්නේවී නමුදු මම දුන් එක කඤ්ඡිකා දුනයාගේ සොළොස් වැනි කලාවෙන් කලාවටත් නොඟහනේය. යමෙක් සතර මහාද්වීපයට අධිපතිව චක්‍රවර්තිරාජ්‍යය කරන්නේවීනමුදු ඒ ඉසුරු සම්පත්තිය මම දුන් මේ එක කැඳ දුනයාගේ සොළොස්වන කලාවෙන් කලාවකටත් නොඟහනේයයි කියා තුනුරුවන්ට වඩනා පින්කෙතක් ලොකයෙහි අතිශයින් නැතැයි කියා බුදුගුණ ප්‍රකාශකොට කිව.

එකල්හි මුගලන් මහතෙරුන්වහන්සේ ඒ දිව්‍යාඟනාවට විස්තර වශයෙන් බණ වදාරා මිනිස්ලොවට වැඩ බුදුන්ට එපවත් දන්වූසේක. බුදුරජානෝ එම අර්ථොත්පත්තිකොට ගෙණ එතැන්හි රැස්වූ පිරිසට බණ වදාළසේක. ඒ ධර්මදෙශනාව බොහෝදෙනාට සාර්ථකවිය.

මේ විමානවත්ථුප්පකරණයෙහි මඤ්ඡිට්ඨවග්ගියෙහි
කඤ්ඡිකදුසිකා විමානවණ්ණනාව නිමාවන ලදී.

තවද මේ විමානවත්ථුප්පකරණයෙහි මඤ්ඡිට්ඨවග්ගියෙහි **විභාර විමානවත්ථුව** නම් කවරයත්?

සර්වලොකෛකනාථවූ භාග්‍යවත් බුදුරජානෝ ජෙතවනාරාමයෙහි වැඩවසන සමයෙහි නුවරවාසින්ගේ එක්තරා ක්‍රීඩා දවසෙක පිරිවර ජනයාහා යෙහෙලිවරුන් විසින් උයන්කෙළියට යම්හයි කියා යාවඤ්ඤ කරණලද විශාඛා මහාඋපාසිකාව සුවඳපැනින් ඉස සෝධා නහා සුවඳතෙල් ගා යහපත්ව බත් අනුභවකොට නවකෙළක් අඟනා මේල පලඳනාව පැලඳ පන්සියයක් යෙහෙලියන් පිරිවරා මහත්වූ ඓශ්වර්‍යයෙන් දෙවඟනක්සේ ගෙයින් නික්ම උයන්දිග බලා මදතැනක් ගොස් මෙසේ සිතුවාය. බාලකුමාරිකාවන්සේ සිහිමුළාව කෙළ ඇවිදිම අප වැන්නන්ට සුදුසු නොවෙයි විහාරයට ගොස් බුදුරජානන් වහන්සේද ප්‍රියවූ භික්ෂුසංඝයාද දැක බණ ඇසුයෙම් වින්නම් ඉතා යෙහෙකැයි සිතා විහාරයට ගොස් එක්තෙනෙක සිට මේලපලඳනාව ගලවා දුසිය අතට දී බුදුන් කරා එලැඹ නමස්කාරකොට එකත්පස්ව උන්නාය. බුදුරජානෝ සුදුසු ලෙසින් බණ වදාළසේක. ඒ විශාඛාව බණ අසා ඉක්බිති අවසර ගෙණ බුදුන් වැඳ ප්‍රදක්ෂිණාකොට මනොභාවනියවූ භික්ෂුසංඝයාද වැඳ විහාරයෙන් නික්ම මද තැනක් ගොස් ආභරණ පලඳනා කැමැතිව දුසිය කැඳවා පින්වත් දුසිය ආභරණ පලඳිමියි දෙවයි කිව. දුසි වනාහි ආභරණ පොදිබැඳ විහාරයෙහී

තබා ඒ ඒ තැන ඇවිද යන කල සිනිමදව වහා අවුත් කැටුව ගියහෙ යින් ආහරණ දෙවයි කි හෙයින් එකෙණෙහි සිහි මදව සඞ්ඝමිනි විහාර යෙහි සිහිමදව ආයෙමි වහා ගෙණ එමි මදත් සිටිනුමැණවැයි කියා වලක්නා කැමතිවූවාය. එකල විශාඛාවෝ කියන්නි පින්වත් දුසිය ඉදින් විහාරයේ තබා ආවාවිනම් අපි නොගණුමිහ, විහාරය පිණිසම පරිත්‍යාග කරමිහයි කියා විහාරයට හොස් බුදුන් කරා එලැබ නම ස්කාරකොට තමන් අභිප්‍රාය බුදුන්ට දන්වන්නි සඞ්ඝමිනි විහාරයක් කරවනු කැමැත්තෙමි මාකෙරෙහි අනුකම්පා උපදවා විහාරදානය ඉවසා වදුළමැනවැයි කියා ආරාධනා කළාය. බුදුරජනෝ මුවෙන් නොබැන ඉවසා වදුළසේක.

ලක්ෂයක් අධිකකොට නවකෙළක් වයතු දී විශාඛාවෝම මේලපලඳ නාව ගෙණ ඒ සියලුම වයතු වියදම්කොට පූර්වාරාම විහාරය කර වන්නි ආයුෂ්මත් මුගලන් මහතෙරුන්වහන්සේ විහාරකර්මාන්තය නිමවනතෙක් එතැන්නි වැඩසිටුවා උන්වහන්සේගේ නියොගයෙන් භික්ෂූසඞ්ඝයා තලාන් ගොනැස් කැණිමඬුලු දෙරබා වාතපාන සොපා නාදි ගෙහාවයවයන් යහපත්කොට සදනලද දඬුකර්මාන්තයෙන් හා මනොඥවූ සුධාලෙපන කර්මය හා මාලාකර්ම ලතාකර්මාදි විචිත්‍රවිත්‍ර කර්මාන්තයෙන්ද යහපත්කොට ඔප් නඟා නිමවනලද ඉඳුනිල් මැණික් පෝරුවක්සේ විසිතුරු භූමිභාග ඇති යටමාලේ සැතපෙන ගෙවල් පන්සියයක් හා උඩුමාලේ ගෙවල් පන්සියයකැයි ගෙවල් දහස කින් ප්‍රතිමණ්ඩිතවූ ප්‍රාසාදය බුදුන්ගේ හා මහාසංඝයාගේ වසිමට සුදුසු පරිද්දෙන් දිව්‍යවිමානයක්සේ අලඞ්කෘතකොට කරවා ඒ ප්‍රාසාදයට පිරිවර වශයෙන් ප්‍රාසාද දහසක්ද ඒ ප්‍රාසාදයන්ට පරිවාර වශයෙන් සත්මන් මණ්ඩප හොජනශාලාදියද යන මේ සියලු විහාරකර්මාන්තය නවමාසයකින් කරවා නිමවූවාය. විහාරකර්මාන්තය නිමිකල්හි නවකෙළක් පමණ රුවනින් විහාරපූජාව කරවන්නාවූ විශාඛාවෝ පන්සියයක් ශ්‍රේයහෙලියන් හා සමග ප්‍රාසාදයෙහි මතුමහලට නැඟි ඒ ප්‍රාසාදයාගේ ලක්ෂණශ්‍රී සමෘද්ධිය බලා සතුටු සිත්ඇතිව පරිවාර සත්‍රීන්ට ආමන්ත්‍රණයකොට මෙසේ කිය. නවකෙළක් වයතු වියදම් කොට මෙබදු විහාරයක් කරවන්නාවූ මාවිසින් යම් කුශලකර්මයක් රැස්කරණලදද ඒ සියලු පින් තොපට දුනිමි පින් අනුමෝදන්වෙත් වයි කියා පින් දුන්නිය. ඒ සියලුම සත්‍රීහු යහපත යහපතැයි කියා පින් අනුමෝදන්වූවාහුය. එදවස් එතැන්හි සිටි එක්තරා උපාසිකාවක් විශෙෂයෙන්ම තුනුරුවන් කෙරෙහි සතුටුව පින් අනුමෝදන්වූවාය, ඒ උභාසිකාව එහින් පසු නොබෝ කලකින් කාලක්‍රියාකොට ඒ පින් අනුමෝදන්වූ කුශලයෙන් තවුතිසා දෙව්ලොව උපන්නිය.

ඇඟේ කුශලමහිමයෙන් නොයෙක් කූටාගාරයෙන් හා උඩත් පොකුණු ආදියෙන් ප්‍රතිමණ්ඩිතවූ සිව්සැටගවු පමණ දිග පුලුල හා උස ඇති සියක් සොඳුන් තැන් අඬකාර විධ්වංසනයකොට ප්‍රභා විහිදෙන්නාවූ ආකාශයෙන් යන්නාවූ මහත්වූ දිව්‍යවිමානයෙක් පහළවිය. ඒ දිව්‍යාඟනාව උඩත්කෙළි ආදියට යන්නිද දහසක් දෙවඟනන් පිරිවරා විමානය හා සමගම යන්නිය, මෙසේ මහත්වූ දිව්‍යශ්‍රීසම්පත් අනුභවකෙරෙයි. ඒ විශාඛා මහා උපාසිකාව වනාහි උදුරවූ මහත් පරිත්‍යාග ඇති හෙයින්ද තුනුරුවන් කෙරෙහි අචලශ්‍රද්ධාවෙන් යුක්තහෙයින්ද නිම්මාණරතිනම් දිව්‍යලොකයෙහි ඉපිද සුනිම්මිතනම් දිව්‍යරාජයාට අග්‍ර මහෙසිකාභාවයට පැමිණියාය. එසමයෙහි ආයුෂ්මත්වූ අනුරුද්ධ මහතෙරුන්වහන්සේ තවුතිසා භවනයෙහි දෙවචාරිකාවෙන් වඩනාසේක විශාඛාවන්ගේ යෙහෙලිවූ දිව්‍යාඟනාව දැක මෙසේ විචාළසේක.

"අඤ්ඤතෙනත වණ්ණෙන යා ත්වං තිඨසි දෙවතෙ,
ඔභාසෙන්තී දිසා සබ්බා ඔසධි විය තාරකා.

තස්සා තෙ නච්චමානාය අඞ්ගමඞ්ගෙහි සබ්බසො,
දිබ්බා සද්දා නිවජ්ජන්ති සවණීයා මනොරමා.

තස්සා තෙ නච්චමානාය අඞ්ගමඞ්ගෙහි සබ්බසො,
දිබ්බා ගන්ධා පවායන්ති සුවිගන්ධා මනොරමා".

යනාදීන් යට කියනලද ක්‍රමයෙන් පූර්වජාතියෙහි කරණලද කුශලකර්මය විචාරා වදාළසේක. ඒ දිව්‍යාඟනාව මහතෙරුන්වහන්සේගේ වචනය මුදුනෙන් පිළිගෙණ මෙසේ ප්‍රකාශ කළාය.

"සාවත්ථියං මයහං සඛි භදන්තෙ
සංඝස්ස කාරෙසි මහාවිහාරං,
තත්ථූපපන්නා අහමානුමොදිං
දිස්වාන ගාසඞ්ඝ පියං ච මෙතං.

තාය ච මෙ සුඛානුමොදනාය
ලඛ්ධං විමානං අඛුතං දස්සනෙය්‍යං,
සමන්නතො සොළසයොජනානි
වෙහාසයං ගච්ඡති ඉඞ්ඝියා මම.

කූටාගාරා නිවෙසා මෙ විභත්තා භාගසො මිතා,
දද්දල්ලමානා ආභොන්ති සමන්තා සතයොජනා.

සැවැත්නුවර වාසිවූ විශාඛානම් ශ්‍රද්ධාවන්ත උපාසිකාවක් සහරදිනින් වඩනා මහාසඞ්ඝයාට සැපසේ වසනපිණිස නවකෙළක් වැයනු වියදමී කොට පූර්වාරාමනම් මහත් විහාරයක් කරවා ඒ විහාරය බුදුපාමොක් මහාසංඝයාට පූජාකරණකල වාරිසින් රැස්කරණලද මේ සියලුම පින් තොපට දුනිමි පින් අනුමෝදන්වෙත්වයි කියා පින් දුන්නිය ඒ පින් අනුමොදන් වන්නාවූ මම මේ දිව්‍යවිමානයක්සේ ගෙවල් දහස කින් ප්‍රතිමණ්ඩිතවූ උදුරතරවූ ප්‍රාසාදයද ඒ ප්‍රාසාදය නිසා පරිත්‍යාගකරණලද ධනරාසියද දැක මේ ප්‍රාසාදය නිසා මෙතෙක් වැනු දෙන ලදැයි කියා සිතින් සලකා අනිශයින් පහන්සිත් ඇතිව පින් අනුමොදන්වීමි. මෙසේ ශුද්ධසිතින් පින් අනුමොදන්වූ කුශලයෙන් මෙබඳුවූ දිව්‍යසම්පත්තියක් ලදිමි කිව. එකල්හි මහතෙරහු ඒ විහාරය කරවූ විසාඛාවන් උපන්තැන් ඒ දිව්‍යාඟනාව ලවා ප්‍රකාශකරවනු කැමතිව මෙසේ විචාළසේක.

"තායෙව තෙ සුඛානුමොදනාය,
ලඛං විමානං අඛුතං දස්සනෙය්‍යං,
යාවෙව සා දුනමදුසි නාරි,
තස්සා ගතිං බ්‍රූහි කුහිං උපපන්නාසා හි."

යනුහෙයින් යම් සත්‍රියක් බොහෝ වැනු වියදම්කොට විහාරයක් කරවා බුදුපාමොක් මහසඞ්ඝයාට දී නිට පින් දුන්නිද ඒ විසාකාවෝ දැන් කොයි උපන්නිද පින් අනුමොදන්වූ නිට මෙතෙක් සැපතක් ලැබුනුකල ඒ විසාකාවන්ට පහලවූ සම්පත කියනුම කවරේද ඒ විසාකාවන් උපන්තැන් ප්‍රකාශකොට කියවයි විචාළසේක. එකල්හි මහතෙරුන්වහන්සේවිසින් විචාළ පමණක්ම දක්වන්නාවූ ඒ දිව්‍යාඟනා තොමෝ මෙසේ කිව.

"යා සා අහු මයහං සඛි භදන්තෙ
සඞ්ඝස්ස කාරෙසි මහාවිහාරං,
විඤ්ඤුතධම්මා සා අදුසි දානං,
උපපන්නා නිම්මාණරතීසු දෙවෙ.
පජාපතිතස්ස සුනිම්මිතස්ස,
අච්ඡනියා කම්මවිපාක තස්සා,
යමෙතං පුවජි කුහිං උපපන්නා සා'නි
තං ව්‍යාකාසි අනඤ්ඤථා අහන්හි."

යනුහෙයින් සවාමිනි යම් ඒ විසාකානම් උපාසිකාවක් පූර්වාරාම විහාරය කරවා බුදුපාමොක් මහසඞ්ඝයාට පූජාකොට මට පින් දුන්නිද ඒ

සෝවාන් ඵලයෙහි පිහිටා චතුඃඝනාත්‍යධර්මය දන්නා මා යෙහිලිවූ උපාසිකාව නිම්මාණරතිනම් දෙවිලොව සුනිම්මිතනම් දිව්‍යරාජයාට අග්‍ර මහෙසිකාව උපන්නීය ඒ උපාසිකාවගේ කුශලවිපාකයෙන් පහළවූ ඉසුරුසම්පත් අව්‍යෝනය්‍ය අප්‍රමෙය්‍යබැවින් කියා නිමවාලිය නොහැක්කේයැයි කිව. විසාඛාවන්ට පහළවූ දිව්‍ය සම්පත් පාත දෙවිලොව සිටි දිව්‍යාඟනාව කෙසේ දැනගත්තිදැයි යතහොත්? සටකි දදුලල විමාන වයතුවෙහි සුභද්‍රානම් දිව්‍යාඟනාව භද්‍රානම් දිව්‍යාඟනාව සම්පයට අවුත් කථාකොට හිඳියසේ ඒ විසාඛා දිව්‍යාඟනාවද මෙකි දිව්‍යාඟනාව වසන තැනට අවුත් කථාකොට හිඳිය එබැවින් ඒ විසාඛාවන් උපන්නැන්හා දිව්‍යසම්පත් ප්‍රකාශකොට කිව. මෙසේද කියා ඉක්බිති බොහෝදෙනා කුශලයෙහි පිහිටුවනපිණිස බණ කියන්නි මෙසේ කිව.

"තෙනාහඤ්ඤුපි සමාදපෙථ
සඞ්ඝස්ස දානානි දදථ චිත්තා,
ධම්මඤ්ච සුණාථ පසන්නමානසා
සුදුල්ලභෝ ලඛෝ මනුස්සලාභෝ.
සම්මග්ගතං මග්ගාධිපති අදෙසයි
බ්‍රහ්මස්සරෝ කඤ්චනසන්නිභත්තනෝ,
සඞ්ඝස්ස දානානි දදථ චිත්තා,
මහප්ඵලා යත්ථ ලභන්ති දක්ඛිණා.—පෙ—"

ඝනුහෙයින් සඛාමිනි කුශලකම්ම විපාකය මාලවා ප්‍රකාශකරවන ණේක්වීනම් සුචරිතගුණය ප්‍රකාශකොට කියම් නැවත මිනිස්ලොවට වැඩ බොහෝ සත්පුරුෂ ජනයන් කුසල් කිරීමෙහි සමාදන් කරවා මෙසේ බණ වදාළමැනව එඹඳා පින්වත්වූ සත්පුරුෂයෙනි අෂ්ටඋෂ්ටක්ෂණයෙන් මිදි මනුෂ්‍යත්වභාවය ලැබීම දුර්ලභ වන්නේය, තුනුරුවන් ලොව පහළවීමත් එසේම දුර්ලභවන්නේය, එබැවින් දුර්ලභවූ මනුෂ්‍යත්වභාවයත් බුඩොත්පාදයත් ලද්දාවූ තෙපි බණ අසා කුසල් අකුසල් හැඳින දැනශීලාදිවශයෙන් කුසල් රැස්කරව් එසේ දෙනලද දැනසෙක් ඇත්නම් මහත්ඵලමහානිසංස වන්නේය ඝනාදින් තුනුරුවන් ගුණයත් කුසල්කිරීමෙහි අනුසසුත් ප්‍රකාශකොට කිව, එකල් හි අනුරුඛමහතෙරුන්වහන්සේ මිනිස්ලොවට වැඩ බුදුන්ට එපවත් දන්වූසේක, බුදුරජානෝ එම අත්‍යෝත්පත්තිකොට ගෙණ එතැන්හි පැමිණි පිරිසට බණ වදාළසේක. ඒ ධර්මදෙශනාව බොහෝදෙනාට සාර්ථකවිය.

මේ විමානවත්ථුප්පකරණයේහි මඤ්ජිට්ඨවගීහයෙහි විභාරවිමානවත්ථුවර්ණනාව කියා නිමවනලදී.

තවද මේ විමානවත්‍යුප්‍රකරණයෙහි මැදිපියසවගිහයෙහි **පින්විමාන වයනුව** නම් කවරයත්?

ඒපදෙන්නාමවූ බුදුරජානන් වහන්සේ සියලු බුඛකෘත්‍යයන් කොට පිරිනිවන් පෑ වදුළ කල්හි මගධෙශ්වරවූ අජාසත් රජ්ජුරුවන් විසින් තමන් ලත් ධාතුකොෂ්ඨාසය නොයෙක් පුද පෙළහරින් වැඩමවා ගෙණ ගොස් රජගහනුවර මහත්වූ දගැබක් කරවා ජීවමාන බුදුන්ට පූජා කරන්නාසේ මහත්වූ පූජාසත්කාර පවත්වන ලදකල්හි රජගහනුවර වසන්නාවූ එක්තරා සත්‍රියක් අළුයම නැගිසිට සිරුරු පිළිදුකුම් කොට පවිත්‍රශිලීව සකසා හැඳ වැටකොළුමල් සතරක් කඩාගෙණ ශුඛාබලයෙන් නොපසුබට වීර්‍ය්‍ය ඇතිව මාගිහයෙහි වන උවදුරු නොසලකා ඒ දගැබ දිසාවට අභිමුඛව යන්නිය, එකල අලුත වැදූ දෙනෙක් ලමාවස්සෙකු ගෙණ දිවන්නී වහා අවුත් මගබැස ඒ ථූප පූජා පිණිස යන සත්‍රියට අභිමුඛව අහින් ඇණ එතැන්හිම ජීවිත විනාසයට පමුණුවාපුව. ඒ උපාසිකා වනාහි එතැන්හිම කාලක්‍රියා කොට ධාතුපූජා පිණිස ගිය කුශලය හෙතුකොටගෙණ තව්තිසා දෙව්ලොව උපදනා තැනැත්තිය උසස් කෙලියට යන සක්දෙව් මහරජානන්ගේ අභිමුඛයේහි දෙකෙළ පණස්ලක්ෂයක් පමණ දෙවඟනන් මැද ඈගේ ශරීරප්‍රභාවෙන් සියලු දෙවඟනන් අභිභවනය කෙරෙමින් රථ විමානය හා සමග පහළවූවාය, සක්දෙව් රජතෝ ඒ දෙව්දුව දැක විසම පත්ව ආශ්චර්‍ය්‍ය අද්භූතවූ ප්‍රීතිසොම්නස් ඇතිව කවරනම් උදුරතර කුශලයක් හෙතුකොටගෙණ මේ දිව්‍යාඟනාව මෙබඳු මහත් දිව්‍ය සමෘඞ්ධියකට පැමිණියාදැයි විචාරණු කැමතිව මේ ගාථාවලින් විචාළේය.

"පිතවත්තෙ පිතඩජෙ පිතාලඞ්කාරභූසිතෙ,
පිතචන්දනලිත්තඞ්ගෙ පිතුපපලමාලිනි.
පිතපාසාදසයනෙ පිතාසනෙ පිතභොජනෙ,
පිතඡත්තෙන පිතරථෙ පිතඤ්ඤෙ පිතවිජනෙ
කිං කම්මමකරි භද්දෙ පුබ්බෙ මානුසකෙ භවෙ,
දෙවතෙ පුච්ඡිතාවිත්ථ කිස්සකම්මස්සිදං ඵලන්ති."

යනුහෙයින් ශරීරයත් ශරීරයෙහි පලඳනාලද වස්ත්‍රාභරණ සඳුන් මාලාදිය හා කුඩ කොඩි සේසත් විමානාසන පරිවාරාදි සියල්ලම සවණ්ණවණ්ණයෙන්ම බබලන්නාහ, නී මෙබඳු දිවඉසුරක් ලැබීමට මිනිස්ලොවදී කළාවූ කුශලය කවරේදැයි විචාළේය, මෙසේ ශක්‍රදෙවෙන්‍ද්‍රයා විසින් විචාරණලද පැනය විසඳන්නාවූ දිව්‍යාඞ්ගනා තොමෝ මේ ගාථාවලින් ප්‍රකාශකළාය.

"කොසාතකී නාමලතත්ථි භත්තෙන කිත්තිතා අනතිඤ්ඤිතා
තස්සා චත්තාරි පුප්ඵානි ථූපං අභිහරිං අහං.

සත්ථුසරීරං උද්දිස්ස විප්පසන්නෙන චේතසා,
නාස්සා මග්ගං අවෙක්ඛිස්සං තදඟමනසාසති.

තතෝ මං අවධි ගාවී ථූපං අපච්චනමානසං,
තඤාහං අභිසලෙස්සං භියෝ නූන ඉතෝ සියා.

තෙන කම්මෙන දෙවින්ද මඝවා දෙවකුඤ්ජර,
පහාය මානුසං දෙහං තව සහව්‍යතමාගතා'ති."

යනුහෙයින් සවාමිනි දිව්‍යරාජෝත්තමවූ සවාමින්වහන්ස මිනිස් ලොව වැටකොළුනම් වැල්ජාතියක් ඇත්තේය මෙද අවිද්‍යාවෙන් නොමුළාව කුසල්ඵල දන්නාබැවින් බුදුන් සිහිකොට වැටකොලු මල් සතරක් කඩා ශරීරධාතූන්ට පූජා කෙරෙමි සිතා මගට බැස දැහැබ දිසාවට යන්නෙමි එකල අලුතවැදුදෙනක් ලමාවස්සකු ගෙණ දිව එන්නී උවදුරු නොසලකා තුනුරුවන් ගුණ සිතසිනා යන්නාවූ මා දැහැබ සමීපයට යන්ට පළමුවෙන් ඇණ මැරුවාය, ඒ මල්සතර ධාතු උදෙසා යොමුකොට මද්තැනක් ගෙණ හියපමණින් මෙබඳු සැපතක් ලදිමි නුබවහන්සේ සමග සැපවිඳිමට පැමිණියෙමි, ඉදින් ඒ මල්පූජා කළානම් මීටත් වඩා උදාරතරසම්පත් ලදිමි කිව. එබස් අසා සතුටුව ශක්‍රදෙවෙන්ද්‍රයෝ මාතලිදිව්‍යපුත්‍රයා ඇතුලුව තවුතිසාවැසි දෙවියන්ට මෙසේ බණ කියේය.

"පස්ස මාතලි අවෙජ්ජවිපාකං කම්මඵලං ඉදං,
අප්පකම්පි කතං දෙය්‍යං පුඤ්ඤං හොති මහප්ඵලං.

නත්ථි චිත්තෙ පසන්නම්හි අප්පිකා නාම දක්ඛිණා,
තථාගතෙ වා සම්බුද්ධෙ අථවා තස්ස සාවකෙ.

එහි මාතලි අම්හෙහි භියෝ භියෝ මහෙම්හස,
තථාගතස්ස ධාතූං යෝ සුඛෝ පුඤ්ඤානං උච්චයෝ.

නිබ්බුතෙචාපි සම්බුද්ධෙ චිත්තෙ සමං ඵලං,
චෙතොපණිධිහෙතූහි සත්තා ගච්ඡන්ති සුග්ගතිං.

බහූනං වත අත්ථාය උප්පජ්ජන්ති තථාගතා,
යස්ස කාරං කරිත්වාන සඟං ගච්ඡන්ති දක්ඛිණා'ති."

යනුහෙයින් මාතලිදිව්‍යපුත්‍රය බුදුන්ගේ ආශ්චර්‍යවත් ගුණයක් බලව දියහුතු දැනවයනුව සඵල්පවිනමුදු කුශලය මහත් ඵලවන්නේය එබැවින් බුදුන් කෙරෙහිද බුදුසව්වන් කෙරෙහිද පහන්සිත් ඇතිව දුන්කල දැනවයනුට සඵල්පවන්නේ නොවෙයි නුගඛිල්ලවට කුඩාවත්

ගය මහත් වන්නාසේ දැනය සැවල්පවී නමුදු මහත්ඵල වන්නේය. එබැවින් මෙසේ එව මාතලිය උයන්කෙළියට යාමෙන් ප්‍රයොජන නැත බුදුන්ගේ ධාතුපූජාකිරීම කුසල් අතුරෙන් උතුම්වූ කුශලයෙක් නම් වන්නේය. ශරීරධාතුපූජාවට යම්හ බුදුන් කෙරෙහි සමඅදහස් ඇතිව යමක් පිදුයේවිනම් ජීවමාන බුදුන්ට කළාවූ පූජාවන් පිරිනිවන් පෑ කල කරණලද උදෙදසික පූජාවත් සම විපාක වන්නේය සින් ප්‍රසන්නවූ කුශලය හෙතුකොටගෙණ සත්ත්වයෝ සුගතිලොකසම්පත්තියට හා නිර්වාණයට පැමිණෙන්නාහ. එබැවින් බොහෝ දෙනාට වැඩ පිණිස බුදුවරයෝ ලොව පහළවන්නාහ. බුඩොත්පාද කාලයෙහි තමතමන්ගේ ශක්තිපමණින් පූජාසත්කාරකොට දුගතියෝ සුගතියට යන්නාහගි කියා ප්‍රශංසාකොට උයන්කෙළිය නබා තමන් නිරන්තරයෙන් පූජාසත්කාර කරණලද සිලුමිණියෑය සම්පයට ගොස් සත්දවසක් මුලුල්ලෙහි පූජාසත්කාරකෙළේය. එයින් පසු එක්දවසක් ආයුෂ්මත්වූ නාරද මහතෙරුන්වහන්සේ දෙවචාරිකාවෙන් තවුතිසා භවනයට වැඩිසේක, ශක්‍රදෙවෙන්ද්‍රයෝ සියලුම ප්‍රවෘත්තිය උන්වහන්සේට කියේය, නාරද මහතෙරුන්වහන්සේ මිනිස්ලොවට වැඩ සතිනි කාරක මහාසථවිරයන්ට කියේක, උන්වහන්සේලා මේ විමානවණ්ණනාවත් බොහෝදෙනාට වැඩ පිණිස ධම්මසංග්‍රහවට නාහා සහා යනාකළහ.

මේ විමානවත්ථුප්පකරණයෙහි මඤ්ජිට්ඨ වග්ගයෙහි පීතවිමානවණ්ණනාව නිමාවනලදි.

තවද මේ විමානවත්ථුප්පකරණයෙහි මඤ්ජිට්ඨවග්ගයෙහි **රජ්ජුමාලාවිමානවත්ථුව** නම් කවරයත් ?

එක්සමයෙක් ශාක්‍යකෘවූ බුදුරජානන්වහන්සේ සැවැත්නුවර ජේතවනාරාමයෙහි වැඩවසනසේක, එසමයෙහි දඹදිව ශ්‍රාවස්ති බමුණුගමෙක් විය එගම වසන්නාවූ නාමගොත්‍රයෙන් අප්‍රසිඛවූ බමුණෙකුගේ එක්ඛරා දියනියක් ඇත්තිය, ඒ කුමාරිකාව වැඩිවිය පැමිණිකල ඒ ගම අනික් බමුණුකුමාරයෙකුට සරණපිණිස දෙනලදුව පතිකුලයට ගිය තැනැත්තී ඒ ගෙයි ඉසුරුසැපයට හිමිව වසන්නිය. ඒ ගෙයි දැසියක්ගේ දුවක් ඇත්තිය ඒ බමුණු කුමාරිකාව කෙල්ල දුටුතැන් පටන් ක්‍රොධයෙන් දිලිහී තවතවයේ කිපී ක්‍රොධය ඉවසාගතනොහී ආක්‍රොශපරිභව බෙණෙහි යම්කලෙක වැඩිවිය පැමිණ කායබල සාමර්ත්‍යයක් ඇතිවූවාද එකල්හි දැනහිසින් වැලඹිවින් තළා මරා කිසිවරදක්

නැතිව නිකරුණේ හිංසා පිඩා කෙරෙයි ඊට කාරණා කවරේදැයි යත හොත්? පෙර ජාතියෙහි බඳනාලද වෛරයක් නිසා වෙහෙසෙන්නීය– ඒ කෙසේදයත්?

ඝටිකාරවස කාශ්‍යපබුදුන් සමයෙහි මෝ දුසිකුලකුමාරිකාවක් වූවාය, මේ බමුණු කුමාරිකාව ඒ ගෙයි දුසියක්ව උපන්නිය, ඒ කුල කුමාරිකාව නිරන්තරයෙන් දණෙඩන් කැටකැබිලිනි ආදියෙන්හා අතින් පයින් ඒ දුසියට තලා මරා බොහෝසේ වෙහෙසන බැවින් පිඩිතව අභිමාන උපදවා දැනාදී කුසල්කොට මේ කුශලය හෙතුකොට ගෙණ උතුම් කුලයක ඉපිද මේ කුලදරිකාවට සවාමීව මට දුන් වෙහෙසට දියුණුදියුණු වෙහෙසම්වයි කියා ප්‍රාර්ථනාකළාය. ඒ දුසි වනාහි එසේ කරණලද ප්‍රාර්ථනාඇතිව එයින් චුතව කුශලාකුශල කර්මවශයෙන් සැරිසරන්නී මේ බුඩොත්පාදකාලයෙහි කියනලද ගයානම් බමුණුගම ඉපිද පනිකුලයට හිස තැනැත්නී ඒ ගෙයි සියලුම සැපතට හිමිවූවාය, එකල යතුද එයින් චුතව සසර සැරිසරන්නී ඒ ගෙයි දුසිව උපන්නිය, මෙසේම කරණලද ප්‍රාර්ථනාවශයෙන් බඩවෙරිවූ ඒ බමුණු කුමාරිකාව කෙල්ලට වෙහෙසන්නී කිසිවරදක් නැතිව ඉසකේවැටිය අල්වා බිම හෙළා අතින් පයින් ඇණ තලා නිරන්තරයෙන් වෙහෙස කෙරෙයි ඒ දුක් ඉවසාගතනොහී හිසකේවැටිය අල්වා තලනාහෙයින් එක්දවසක් කරනැවෑම් සාලාවට ගොස් හිසකෙස් කප්පවා හිස මුඩුකොට ගෙට ගියාය, බමුණුකුමාරිකාව ඒ බව දැන කිමෙක්ද දුෂ්ට කෙල්ල තී හිස මුඩුකළපමණකින්ම නිදෙස් වන්නිදැයි කියා හිස රැහැණක් බැඳ ඒ රැහැණ අල්වා නමා බැඳ හෙළා අතින් පයින් ඇණ වෙහෙස කෙරෙයි, ඒ රැහැණ හිසින් ගලවා ලියනොදී නිරන්තරයෙන් රැහැණ මාලාවක්සේ තිබෙන හෙයින් රජ්ජුමාලාවයයි කියා අනික් නමකින් ව්‍යවහාරවූවාය.

එසමයෙහි භාග්‍යවත් බුදුරජනෝ මහාකරුණාසමාපත්තියෙන් නැඟී විනෙයජනයන් දක්නාපිණිස මුළුලොව බලාවදුරණසේක් ඒ රජ්ජුමාලාව සෝවාන්ඵලයෙහි පිහිටවීමට උපනිශ්‍රයසම්පත් ඇතිනියා වත් ඒ බමුණු දුව සරණයෙහි පිහිටන නියාවත් සර්වඥතාඥානයෙන් දැන වදුරා පූර්වාහ්ණසමයෙහි හැඳ පෙරව වනාන්තරයට වැඩ එක්තරා ජාසම්පන්නවූ රුකක්මුල සවණක් ඝනබුඩරශ්මී මාලාවන් විහිදුවමින් දිලිහි දිලිහී වැඩහුන්සේක්. එදවස් යටකී රජ්ජුමාලාව දවස දවස ගුටිමුට්කා වෙහෙසෙන්නී මෙසේ සිතුවාය, මාගේ මේ දුඃඛ ජීවිතයෙන් ජීවත්වීමට වඩා මියයාම යහපතැයි සිතා කලකිරුණාවූසිත් ඇතිව පණ නසාගන්නා කැමැතිව කලය ගෙණ පැන්නොටට යන්නියසේ මිනිසුන් වසන්නා කොට ගෙයින් නික්ම කලය මහින් ඉවත

තඹා අනුක්‍රමයෙන් ගොස් වනාන්තරයට වැද බුදුහු වැඩහුන් රුක් මුලට නුදුරුතැනක එන්තරා ගසක් දැක සාර වැල්ලාගන්නා අභිප්‍රාය ඇතිව හිස බැඳතුබූ රැහැණ ගල්වා වනා ඇසිරෙණසේ මදු පාස කොට ඒ ගස අත්හැර බැඳ මන්ද කරලා ගෙණ යමිකිසිකෙණෙක් සිට මරණට අන්තරායක් කෙළේනම් තුප්පුරුසි සිතා ඇතමැත බලන්නී සවණන්ඝන බුඩරයම්මාලාවන් විහිදුවමින් දිලිනිදිලිනි එනැන්හි රුක් මුල වැඩහුන් බුදුන් දැක සතුටුසින් ඇතිව මරණතමැති ප්‍රපාතයෙහි වැටිහිය විත්තය බුඩගෞරවයෙන් සවිඥනමැති සම්බිමට අදනාලදුව කිමෙක්ද සවිඥවරයෝ නම් මාවැන්නන්ටත් කරුණාවෙන් බණවදා රන්නාහ එබැවින් බුදුන් සමීපයට ගොස් බණ අසා මේ දුකින් මිදුනේවිනම් ඉතායෙහෙකැයි සිතුවාය, එකල්හි බුදුරජනෝ දෑගේ සිත බලා රජ්ජුමාලායයි වදුළසේක. ඒ වචනය අසා අමෘතාභිසෙකයක් ලද්දසේ අතුරු නැතිව ප්‍රීතියෙන් පිරුණාවූ සිත්ඇතිව ප්‍රීතියෙන් ඉපිල පැණනැඟි බුදුන් කරා ගොස් වැඳ එකත්පස්ව සිටියාය. බුදු රජානෝ අනුපුඨිකථාවෙන් බණ වදුළසේක. රජ්ජුමාලාව එසෙණෙහිම සෝවාන් ඵලයෙහි පිහිටියාය, බුදුරජානෝ මේ දුසි කිසිසෙණකුන් විසින් සොලවාලිය නොහැක්කාවූ ශ්‍රඛාවෙහි පිහිටා සඛා රහිතව ආයතිඛුණයට පැමිණියාය එබැවින් මේ රජ්ජුමාලාවට මෙපමණ සංග්‍රහවම සෑහේයයි සිතා වදුරා වනයෙන් නික්ම ගමට නුදුරු තැන එන්තරා රුකක්මුල හිරු විමනක්සේ දිලිහි දිලිහි වැඩහුන්සේක. කිසිසෙණෙකුන් විසින් විනිපාතනය නොකොට හැක්කාවූ තමන් කෙරෙහිද සියල්ලවුන් කෙරෙහිද සමව පවත්නා ඤානවති මෙත්‍රී දයානුකම්පා ඇති හෙයින් බැමිණි මා මරා වේවයි වෙහෙසා වේවයි යම් වධයක් කරණු කැමැත්තිනම් ඒ කෙරේවයි සිතා පැන් කලයක් ගෙණ ගෙට ගියාය. එසමයෙහි ගෙහිම් බ්‍රාහ්මණයා ගෙදොර සම්පයෙහි සිටියේ ගෙට එන රජ්ජුමාලාව දැක එම්බා රජ්ජුමාලාව අද නි දිය ගෙණෙනා පිණිස හිය නැනැන්නි බොහෝ කල්යවා අව නිගේ මුහුන වණ්ණයත් අතිප්‍රසන්නය පෙරසේ නොව අනික් ආකාරයකින් උපසථානයත් කෙරෙයි මෙසේ වන්ට කාරණා කවරේ දැයි විවාළේය. රජ්ජුමාලාව ඒ සියළුම ප්‍රවෘත්තිය බමුණාට කිව බ්‍රාහ්මණයා එබසට සතුටුව ගෙට ගොස් දියනියෙනි මෙතැන්පටන් මේ රජ්ජුමාලාව ලවා නිවිසින් කිසිවක් නොකරවිය යුතුයයි යෙහෙළියට අවවාදකොට බුදුන් කරා එලැඹ නමස්කාර කොට ආදරයෙන් කරණලද ගෞරව බහුමාන ඇතිව පිළිසඳර කථාකොට ආරාධනා කොට ගෙට වඩාගොස් වඩා හිඳුවා ප්‍රණීතවූ කෑම බොන දෙයින් වල දවා වලඳ ඉක්බිති ශ්‍රී හස්තයෙන් පහකරණලද පාත්‍රය ඇති බුදුන්

කරා එලැඹ නමස්කාරකොට එකත්පස්ව හුන්නේය. ඔහුගේ සෙ හෙළිද බුදුන් වැඳ එකත්පස්ව හුන්නිය. එපවත් අසා ගයා නම් ගම වසන්නාවූ බමුණන්ගා හොඳිහුද බුදුන්කරා එලැඹ නමස්කාර කොට එකත්පස්ව හුන්නාහුය සමගරු බුදුන් හා සමග පිලිසඳර කථා කොට ඒකාන්තයෙන් හුන්නාහුය එකල්හි බුදුරජානෝ රජ්ජුමාලාවට සටහිය දවස කුලදුවක්ව බමුණුකුමාරිට වෙගෙස දුන් නියාවත් ඔමු ණුදුව රජ්ජුමාලාවට දුසිව උපන් නියාවත් විස්තරවශයෙන් වදාරා ඔවුනොවුන්ගේ චරිතානුකූල වශයෙන් සම්ප්‍රාපනපිරිසට බණ වදාළ සේක. ඒ බණ අසා බ්‍රාහ්මණයා හා ඔහුගේ සෙහෙළිද එතැන්හි රැස්වූ මනුෂ්‍යයෝද සරණසිලයෙහි පිහිටියාහුය.

ඉක්බිති බුදුරජානෝ හුනස්නෙන් නැගි සැවැත්නුවරට වැඩිසේක. බ්‍රාහ්මණයා රජ්ජුමාලාව දූ තනතුරෙහි තුබුයේය. එතැන්පටන් ඔමුණුදුව රජ්ජුමාලාවගේ මුහුණ ප්‍රියනෙත්‍රයෙන් බලමින් සමගි සතුටුව දවස් යැවූහ. රජ්ජුමාලාව එයින් පසු නොබෝ දවසකින් කාලක්‍රියාකොට තවුතිසා දිව්‍යලොකයෙහි උපන්නිය. පරිවාරස්ත්‍රිහු දහසක් පමණවූහ. ඒ දිව්‍යාඟනාව එක්දවසක් සැටගැලක් පුරාලන පමණ සව්වාභරණයෙන් සැරහී දහසක් දෙවඟනන් පිරිවරා නන්ද නොදූනයෙහි කෙළිමින් මහත්වූ දිව්‍යශ්‍රීසම්පත් අනුභවකරන්නිය. ආයුෂ්මත්වූ මුගලන් මහතෙරුන්වහන්සේ එක්දවසක් දෙවචාරි කාවෙන් වඩනාසේක් මහත්වූ දිව්‍යානුභාවයෙන් මහත් දිව්‍යඍ ධියෙන් බබලන්නාවූ ඒ දිව්‍යාඟනාව දූක ඈ විසින් කරණලද කුශල කර්මය මේ ගාථාවලින් විචාළ සේක,

"අභික්කන්තෙන වණ්ණෙන යා ත්වං තිට්ඨසි දෙවතෙ,
ඔභාසෙ පාදෙ ච විගය්හ නච්චසි සුපවාදිතෙ.
තස්සා තෙ භාවමානාය අඩ්ගමඩ්ගෙහි සබ්බසො,
දිබ්බා ගන්ධා පවායන්ති සුවිගන්ධා මනොරමා.
විවත්තමානා කායෙන යා වෙනිස්සු පිලන්ධනා,
තෙසං සූයති නිග්ඝොසො තූරියෙ පඤ්චඞ්ගිකෙ යථා.
යාපි තෙ සිරස්මිං මාලා සුවිගන්ධා මණොරමා,
වාති ගන්ධා දිසා සබ්බා රුක්ඛෙ මඤ්ජූසකො යථා.
භාසතෙ තං සුවිගඞ්ගං රූපං පස්සති අමානුසං,
දෙවතෙ පුච්ඡතාචික්ඛ කිස්ස කම්මස්සිදං ඵලන්ති."

ඝනුහෙගින් එම්බා දිව්‍යාඟනාව නී යම් ලීලාවකින් දිපනිමත්ව සිටින්නි විනම් ඉඤ්ඣනපාදයෙන් අනෙකප්‍රකාර වණ්ණඇති ඔල් මිටි

ගෙණ නටන්නිය යනාදීන් වර්ණනා කොට යට කී ක්‍රමයෙන් කුශල කම්මය විවාළසේක. ඒ පැණය විසඳන්නාවූ දිව්‍යාඟනා තොමෝ මේ ගාථාවලින් ප්‍රකාශ කළාය.

"දුසී අහං පුරෙ ආසිං ගයායං බ්‍රාහ්මණස්සහං,
අපපුඤ්ඤා අලක්ඛිකා රජ්ජුමාලාති මං විදූ.

අඤ්ඤාසානං වධානඤ්ච තජ්ජනායච උක්කතා,
කූවං ගහෙත්වා නික්ඛම්ම ගඤ්ඡිං උදකහාරියං.

විපථෙ කූටං නික්ඛිපිත්වා වනසණ්ඩං උපාගමිං,
ඉධෙවාහං මරිස්සාමි කෝ අත්ථෝ ජීවිතෙන මෙ.

දළ්හං පාසං කරිත්වාන ආලම්බිත්වාන පාදපෙ,
තතෝ දිසා විලොකෙසිං කොඤ්ඤෝ වනමස්සිතෝ.

තත්‍රද්දසාසිං සම්බුද්ධං සබ්බලොකහිතං මුනිං,
නිසින්නං රුක්ඛමූලස්මිං ඣායන්තං අකුතොභයං.

තස්සා මෙ ආහු සංවෙගෝ අබ්භුතෝ ලොමහංසනෝ,
කොනු ඛෝ වනමස්සිතෝ මනුස්සෝවා උදහු දෙවතා.

පාසාදිකං පසාදනීයං වණ්ණා නිබ්බානමාගතං,
දිස්වා මනෝ මෙ පසීදි නාගං යාදිසකිදිසෝ'නි.

ඛත්තියිත්ථියෝ ඛ්‍යානරතෝ අඛ්‍යගඝනමානසෝ,
හිතෝ සබ්බස්ස ලොකස්ස බුද්ධෝ අයං භවිස්සති.

භයභෙරවෝ දුරාසදෝ සිඟෝව ගුහමස්සිතෝ,
දුල්ලභාහං දස්සනාය පුප්ඵං ඔදුම්බර ංසථා."—පෙ—

යනාදීන් ප්‍රකාශ කරන්නී පෙර මම මිනිස් ලොව ගයා නම් බමුණු ගම එක්තරා බමුණෙකුගේ ගෙයි පින්මද කාලකන්නිවූ දාසියක් වීමි ඒගෙයි බැමිණියක් මා හිසකේ වැටිය අල්වා ගෙණ ඇත මැත ඇද අතින් ඇන වෙහෙසන හෙයින් දුක් ඉවසිය නොහී හිස කෙස් කප්පවාලීමි එකල රහැනකින් හිසබැඳ ඒලනුව අල්වාගෙණ වෙහෙස කෙරේයි ඒරහැණ හිසින් ගලවාලිය නොදී නිරන්තරයෙන් මාලයක්සේ නිබෙනහෙයින් මනුෂ්‍යයෝ රජ්ජුමාලායයි කියා ආමන්ත්‍රණය කෙරෙති. ඒ වධ ඉවසිය නොහී මහත් දෙමිනසට පැමිණ මාගේ මේ දුඃඛ ජීවිකාවෙන් කවර අර්ථයෙක්ද මිය යාම උතුමැයි සිතා දියපිණිය පැන්නොවම යන්නියක්සේ ගෙයින් නික්ම මහින් ඉවත්ව ඛැද්දේ කලය තබා වනසණ්ඩයට ගොස් එක්තරා රුක්මුලට පැමිණ මෙතැන්හි කරවැලලා ගියෙමි සිතා ඉස බැඳි ලනුව ගලවා මදු ඇස්ස තනා තරකොට අත්තෙහි බැඳ මන්ද බොටුවට දමා මේ වනාන්තරය ආශ්‍රයකොට යම් කිසිකෙනෙකුන් සිට මරණට අන්තරා වක් කෙළේනම් නපුරැයි සිතා ඇතමැත බලන්නෙමී එහනට නුදුරු

තැන රුකක්මුල වැඩහුන් බුදුන් දැක මට මෙබදු මහත්වූ සංවෙග යෙක් උපන පෙර නුදුටුවිරූ මේ ආශ්චර්යමත් පුරුෂයා මේ වල වසන කවර විර පුරුෂයෙක්ද නොහොත් දෙවතා කෙනෙක්දැයි පරීක්ෂා කරන්නෙම් දෙතිස් මහාපුරුෂ ලක්ෂණයෙන් හා අසූඅනුව්‍යඤ්ජන ලක්ෂණ බ්‍යාමප්‍රභා කෙතුමාලාලංකාරයෙන් දිලියෙන්නාවූ ශ්‍රී විලාසය දැන මේ එසේ මෙසේ ලාමක සත්වයෙක් නොවෙයි සදේවලොකගුරුවූ බුදුරජානන්වහන්සේය මේ බුදුන් දැක්ම නම් රන් ගල්ගුහාවෙක්හි වසන්නාවූ භයජනකවූ කෙඟරසිංහයාගේ දැකිම දුලීහවන්නාක් මෙන්ද දිඹුල්මල් දැකිම දුලීහවන්නාමෙන්ද පින්මද සත්වයන් විසින් නොලැබිය හැක්කාවූ දුලීහවූ දැක්මෙකැයි සතුටුසිත් ඇතිව රැහැණ කරින් ඉලවා බුදුන්කරා හොස් වැඳ පවු ගෙවා ගත්තෙම් වින්නම් ඉතා යෙහෙකැයි සිතිමි. එකල්හි බුදුරජානන්වහන්සේ එම්බා රජ්ජුමාලාව බුදුන් සරණ යවයි වදළසේක. මිහිරිවූ මෘදුවූ කණ්ණරසාය නවූ මධුර වචනය අසා විශෙෂයෙන්ම සතුටුව බුදුන් කරා හොස් වැඳ එකත් පස්ව සිටියෙමි. එකල්හි බුදුරජානෝ මාගිහාධිගමයට සුදුසුවූ කෙලෙසුන් තුණිවූ සිත දැක ජාතිජරාමරණාදි දුඃඛසත්‍යයද ඒ දුක් ඉපදිමට මූල්වූ තෘෂ්ණාසංඛ්‍යාත සමුදයසත්‍යයද ඒ තෘෂ්ණාවගේ නැසීමයැයි කියනලද නිරොධසත්‍යයද ඒ දුක නිරුඛවිමට කරණලද ප්‍රතිපත්තිසංඛ්‍යාත මාගිහසත්‍යයද යන මේ චතුරාර්යසත්‍යයද ප්‍රකාශ කොට බණ වදළසේක. මම ඒ බණ අසා සොවාන්ඵලයෙහි පිහිටා අවලශ්‍රද්ධාවෙන් යුක්තව තුනුරුවන් කෙරෙහි අතිප්‍රසන්නවූ ප්‍රෙමණි යවූ බුදුන්ගේ දියනියක්වීමි. ඔබැවින් සසරදුකින් මිදි දැන් මේ දෙව් ලොවට ආවාවූ මම මාගිහරතියෙහිද එලරතියෙහිද සිත් අලවා කිසි භයක් නැතිව පඤ්චකාම රතියෙන් ක්‍රීඩා කෙරෙමින් මහත්වූ දිව්‍ය සම්පත් අනුභව කෙරෙමියි කියා යට දැසිවිමානවණ්ණනාවෙහි කී පරිද්දෙන් දිව්‍යසම්පත් වණ්ණනා කොට මාගේ මේ දිවඉසුරු බලා වදළ මැණවැයි කිව.

එකල්හි ආයුෂ්මත් මුගලන් මහතෙරුන්වහන්සේ මිනිස්ලොවට වැඩ බුදුන්ට එපවත් දන්වූසේක. බුදුරජානෝ එම අත්ථොතපත්තිකොට ගෙණ එතැන්හි සම්ප්‍රාප්ත පිරිසඳ බණ වදළසේක, ඒ ධම්මදෙසනාව බොහෝදෙනාට සාර්ථකවිය.

මේ විමානවත්ථුප්පකරණයෙහි මඤ්ජිට්ඨ වග්ගයෙහි රජ්ජුමාලා විමානවණ්ණනාව කියා නිමවන ලදී.

සතරවන මඤ්ජිට්ඨවග්ගයයි.

තෙතිස්සක් පමණ සත්‍රිවිමානවණ්ණනා කියා සමාපතයි.

නවද මේ විමානවත්ථුප්‍රකරණයෙහි මහාරථවර්ගයෙහී **මණ්ඩූක දිව්‍යපුත්‍ර විමානවත්ථුව** නම් කවරයත්?

ත්‍රිභුවනෙක තිලකවූ භාග්‍යවත් බුදුරජානන්වහන්සේ එක් සම යෙක චම්පානුවර ගොදුරුගම්කොට ගගිහරාතාම් පොකුණ සමීප යෙහි රමණීයවූ විහාරයෙක වැඩ වසනසේක. එසමයෙහි බුදුරජනෝ අළුයම්වේලෙහි මහාකරුණා සමාපත්තියට සමවැද සමාපත්තින් නැගි ටිනෙය ජනයන් දක්නා පිණිස මුළුලොව බලා වදුරණසේක් එක්තරා මැඩියෙකු දුක අද මා බණ වදුරණකල එක්තරා මැඩියෙක් මාගේ ස්වරයෙහි නිමිත්තග්‍රහණය කෙරෙමින් අසා හෝනේය එකල්හි ගව පාලයෙකුගේ උපක්‍රමයෙන් මිය දෙව්ලොව ඉපද මහත්වූ පිරිස්පිරිවරා මහජනයා බල බලා සිටියදීම මා දක්නා පිණිස එන්නේය. එතැන් හිදී බොහෝදෙනාට ධර්මාභිසමය වෙයි කියා දුක පෙරවරු මනා කොට හැඳ පාසිවුරු ගෙණ මහත්වූ භික්ෂුසංඝයා සමග චම්පානුවරට පිඬු පිණිස වැඩ පිණ්ඩපාත ලාභයෙන් සංඝයාට ආසුකොට කරණ ලද අහරකිස ඇති බුදුරජානෝ නැවත විහාරයට වැඩ භික්ෂුසංඝයා බුදුන් වැඳ වත් දක්වා අවසර ගෙණ තමතමන් දිවාසථානවලට ගිය කල සුගන්ධවූ ගඳකිළියට වැඩ එලසමාපත්තිසැපයෙන් දවස් යවා සවස්වේලෙහි භික්ෂු භික්ෂුනී උපාසක උපාසිකාගණ සිවුවනක් පිරිස් පොකුණුතෙර ධර්මසභාමණ්ඩපයෙහි රැස්වූ කල්හි සුරභිසුගන්ධගන්ධ කුටියෙන් කාලානුරූපවූ ප්‍රාතිහාර්යයෙන් නික්ම පොකුණු තෙර ධර්මසභාමණ්ඩපයට වැඩ අලංකෘතකොට පණවනලද බුද්ධාසන මයනකයෙහි වැඩහිඳ මැණික් ගල්තලා මත්තෙහි සිංහනාද කරණ අභීත කෙශරසිංහරාජයෙකුසේ අචින්තෙය්‍ය අප්‍රමෙය්‍යවූ බුද්ධානුභාව යෙන් අනුපමවූ බුධලීලායෙන් අශීතානුබ්‍යඤ්ජනවූපෙත බ්‍රහ්මස්වර විහිදුවා සර්වසත්ත්ව ස්වකීය භාෂානුරූපවූ මධුරවචනයෙන් ධර්මදෙශනාවට පටන්ගත්සේක. එකණෙහි එක්තරා මැඩියෙක් පොකුණෙන් නික්ම අවුත් මේතෙම ධර්මයක් කියනුලැබෙයි සිතා ධර්මඝෝෂයෙන් ස්වරයෙහි නිමිත්තග්‍රහණය කෙරෙමින් පිරිස්කෙළවර බණ අසා හොත්නේය. එසමයෙහි එක්තරා ගොපළුදරුවෙක් ඒ භූමිප්‍රදෙශයට ආයේ නොයෙක් බුධශ්‍රීන් දිළිහි දිළිහි බණ වදුරණ බුදුරජානන්ද සන්හුන් ඉඳුරන් ඇතිව කාශවාක්සමාචාරයෙන් යෙදී බණ අසන පිරි සද දුක ඒ ධර්මශ්‍රවණයට ඵලවනලද සිත්ඇතිව අත තුබූ කෙවුටුලිය බිම සිටුවා එලි සිටියේ බණ අසා හොත් මැඩියා නොදුක ඉසමත් නෙහි අමුනා ඉස පලවා සිටියේය. ඒ මැඩියා එතැන්හි කාලක්‍රියා කොට බණ ඇසූ කුශලයෙන් තවුතිසා දෙව්ලොව නිදා පිබිදියාක්හු යේ දෙලොස්යොදුන් රන්පිමනෙක උපන්නේය. නොයෙක් දිව්‍ය

භරණයෙන් සැරහී දිව්‍යපුරා සමූහයා පිරිවරා දිපනිමත්ව බබලන් නාවූ තමන්ගේ දිවඉසුරු දැක උපන් කෙණෙහිම පූර්ජාතියෙහි කරණලද කුශලකම්මය බැලීම දෙවතාවන්ගේ ධම්මතාවක් හෙයින් මේ දිව්‍යපුත්‍රයාද කොයින් වුතව අවුත් මෙහි උපනිම්දැයි ආව ජ්ඤා කරන්නේ පූර්ජාතියෙහි ජලගොචරව තිරිසන්යෝනියෙහි සිට ආබව දැක සිතන්නේ තිරිසන්ව සිටි මමත් මෙබදු සම්පත් ලදින් මේ දෙව්ලොව උපන්මි මෙබදු සැපතක් ලැබිමට කවර කුශලකම්මයක් කෙළෙම්දැයි පරීක්ෂා කරන්නේ බුදුන්ගේ සවරයෙහි නිමිත්තග්‍රහණය කොට ශබ්දය ඇති පමණක්විනා අනික් කුශලයක් නොදැක බුදුන් කෙරෙහි ප්‍රසන්නව විමානයහා සමඟ මිනිස්ලොවට අවුත් විමානය ආකාශයෙහි රඳවා බිමට බැස මහජනයා බල බලා සිටියදී මහත්වූ පිරිවරහා සමඟ මහත්වූ දිව්‍යානුභාවයෙන් දිළිහි දිළිහි බුදුන් කරා එලැඹ ශ්‍රීපාදයට නමස්කාරකොට දෙහොත්මුදුන්දී එකත්පස්ව සිටියේය. එකල්හි බුදුරජානෝ බුද්ධානුභාවයත් කුශලකම්මඵලයත් සියලු මහජනයාට ප්‍රත්‍යක්ෂකොට දක්වනු පිණිස දැන දැනම මෙසේ විචාරා වදළසේක.

"කො මෙ වන්දති පාදානි ඉද්ධියා යසසා ජලං,
අභික්කන්තෙන වණ්ණෙන සබ්බා ඔභාසයං දිසා'නි."

යනු වදළහෙයින් විදුලියකැල වැලඳි රන්පර්වතයක්සේ සැටහැලක් පුරාලන පමණ සව්වාභරණයෙන් සැරහී මහත්වූ දෙව්පිරිස් පිරිවරා ජවිවණ්ණයෙන්හා ශරීරාලොකයෙන් දසදික් එකොහාඹ කෙරෙමින් දිළිහි දිළිහී මාගේ ශ්‍රීපාදවයට නමස්කාර කරන්නාවූ තෝ දිව්‍යබ්‍රහ්ම නාගයක්ෂරාක්ෂසමනුෂ්‍යාදීන් අතුරෙන් කවරෙක්හිදැයි විචරා වදළ සේක. මෙසේ භාග්‍යවත්වූ බුදුරජානන්වහන්සේ විසින් විචාරණලද වචනය මුදුනෙන් පිළිගෙණ දිව්‍යපුත්‍රතෙම පූර්ජාතිය ආදිකොට සියලුම ප්‍රවෘත්තිය කියන්නේ මේ ගාථාවලින් ප්‍රකාශකොට කියේය.

"මණ්ඩූකොහං පුරෙ ආසිං උදකෙ වාරිගොචරෝ,
තව ධම්මං සුණන්තස්ස අථකි වච්ඡපාලකෝ.

මුහුත්තං චිත්තපසාදස්ස ඉඩිං පස්ස යසඤ්ච මෙ,
ආනුභාවඤ්ච මෙ පස්ස වණ්ණං පස්ස ජුතිඤ්ච මෙ.

යෙ ච තෙ දිඝමඩ්ධානං ධම්මං අස්සොසුං ගොතම,
පත්තා තෙ අචලං ඨානං යත්ථ ගන්ත්වා න සොචරෙ'නි."

යනුහෙයින් සවාමිනි මම මිට පූර්ජාතියෙහි දිය ගොදුරුකොට උපන් දියම භූමිකොට වසන එක්තරා මැහිගෙක්විමි එසමයෙහි

නුබවහන්සේ විසින්සවිස චිත්තකියභාෂාානුරූපලක්ඛණිය යථාභාෂානු රාගශ්‍රවණිය මධුරවචනයෙන් දෙයනා කරණලද්දවූ ධම්මදෙයනා ශබ්දයෙහි නිමිත්තාග්‍රහණය කොට මේ කියන්නේ ධම්මයෙකැයි සිතා බණ අසා හොත්තාවූ මා එක්තරා හොපළඳුරුවෙක් අතතුබූ කොවුටු දණ්ඩ බිම ඔබා හිස මත්තේ ඇණ හිස පලා මැරුයේයයි කියා නැවත සවාමිනි නුබවහන්සේගේ ධම්මදෙශනාවෙහි පැහැද ශබ්දමාත්‍රයක් පමණ ඇසූ කුශලයෙන් සමෘඩවූ දිව්‍යසම්පත්තියද නළුනාටකාදි පරි වාරසම්පත්තියද මේ දිව්‍ය සම්භවයා අභිභවමින් දෙලොස් යොදනෙක පැතිර පවත්නා අඤ්ඤාර! විඛවංශනය කොට බබලන්නාවූ ශරීරා ලොකයද බලා වදුළමැණවැයිකියා ඔහුගේ දිවඉසුරු සම්පත් ප්‍රකාශ කොටකියා එතැන්හි රැස්වූ පිරිසට හා බොහෝදෙනාට ධම්මශ්‍රවණ මය කුශලය ප්‍රකාශකොට කියන්නේ ස්වාමිනි මද ඇසිල්ලක් බණ ඇසූ පමණකින් මෙතෙක් සැපත් ලැබුනුකල මේ ලොකයෙහි යම් කිසිකෙණෙක් නුබවහන්සේගේ ධම්මදෙශනාව මාසේ නොව බොහෝකලක් ඇසුවාහුවිනම් ඔවුන්ට වන්නාවූ ඉෂ්ටවිපාකය කියා නිම වාලිය නොහැක්කේය, ඒ සත්‍යයෝ සසර වසනතෙක් කල් මුළුල්ලෙහි කිසියම් සංසාරව්‍යසනයට නොපැමිණ දෙව්මිනිස් සැපත් විඳ කෙළවර මේ ලොකවාසිහු යම්තැනකට ගියාහු සොක නොකෙරෙද්ද එබදු අවලසථාණීයවූ ප්‍රණීතවූ අමෘතවූ මහානිර්වාණයට පැමිණෙන්නාහයි කියා දැන එහි අනුසස් දක්නාපිණිස මොහොතක් කල් බණඇසූ මාගේ සම්පත් බලා වදුළමැනවැයි කියේය. එකල්හි බුදුරජානන්ව හන්සේ ඒ දිව්‍යපුත්‍රයාගේද සම්ප්‍රාප්තපරිසගේද චරිතය බලා විසතර වයයෙන් ධම්මදෙශනා කොට වදුළසේක. ඒ ධම්මදෙශනාවගේ කෙළවර ඒ දිව්‍යපුත්‍රයා සොවාන්ඵලයෙහි පිහිටියේය අනිකුදු සවාසූ දහසක් ප්‍රාණීහු සඩ්ඛ්මාමෘතපානයකොට අමාමහ නිවන් දුටුවාහුය. ඉක්බිති ඒ මණ්ඩුකදිව්‍යපුත්‍රයා බුදුන් වැඳ අවසරගෙණ ප්‍රදක්ෂිණා කොට නැවත භික්ෂුසංඝයාවද නමස්කාරකොට සහපරිවාරව දෙව් ලොවටම ගියේය.

මේ විමානවත්ථුප්‍රකරණයෙහි මහාරථවගීහයෙහි මණ්ඩූක දිව්‍යපුත්‍ර විමානවත්ථුව කියා නිමවන ලදී.

නවද මේ විමානවත්ථුප්‍රකරණයෙහි මහාරථවගීහයෙහි **රෙවතී විමානවත්ථුව** නම් කවර යත්?

සනරාමර ලොකගුරුවූ භාග්‍යවත් බුදුරජානන්වහන්සේ බරණැස් නුවරසමීපයෙහිවූ බරණැස්රජහු විසින් නිග්‍රොධ මුවරජහට දෙනලද

වැටුප් හා අහස්දැන ඇතිහෙයින් මිගදාය නම්වූ ඉසිපතනාරාමයෙහි වැඩවාසය කරණසේක. එසමයෙහි බරණැස්නුවර ශ්‍රද්ධාසම්පන්නවූ කුලයෙහ ශ්‍රද්ධාසම්පන්නවූ තුනුරුවන්කෙරෙහි ප්‍රසන්නවූ නන්දිකනාම් වූ උපාසකයෙක් ඇත්තේය. හේතෙම නිරන්තරයෙන් ආසනසාලාව හැමදිමය නහන බොන පැන් එලවා තැබීමය දෑහැටුදඬු එලවීමය තෙමේ ස්වාත්මදේයකින් යැපී මධුරකොට දන්දීමය යනාදින් නොයෙක් ලෙසින් මහාසංඝයාට උපස්ථාන කරන්නේය. දුගිමගි යාචකයන්ටද දුනපතිව දන් දෙන්නේය එසමයෙහි සම්පගෙයක නන්දිකයන්ගේ මයිලනුවන්දුවූ රෙවතිනම්වූ කුමාරිකාවක් ඇත්තිය ඕතොමෝ දන් නොදෙන්නිය සිල් නොරක්නිය බණ නොඅසන්නිය නන්දිකයන්ගේ මව්පියෝ ඒ රෙවති නන්දිකයන්ට සරණ පිණිස ගෙණෙනු කැමතිවූවාහුය හෝ තොමෝ පවිටු අදහස් ඇතිහෙයින් නන්දිකයෝ නොකැමැතිවිය නන්දිකයන්ගේ මෑනියෝ රෙවතියට මෙසේ කිව දියනියෙනි තෝ මේ ගෙට අවුත් සඞ්ඝස්ථවිරයන්සේ වැඩහිඳිනා හොජනශාලාවට අලුත් ගොමයෙන් පිරිබඩහා හිඳිනා අසුන් පණවා භික්ෂූන් වහන්සේ වැඩිකල්හි නමස්කාරකොට පාත්‍රය ගෙණ වඩාහිඳුවා ඛාරාවෙන් පැන් පෙරාදි වැලඳූකල්හි පාත්‍රාසොධා උපස්ථාන කරව මෙසේ කල මප්‍රතිරූපවන් සිත් නත්තිනම් වේදැයි කිහ. එබසට රෙවති තොමෝ සැදැහැ නැතත් ස්වාමිපුත්‍රයා සිත්ගන්නා පිණිස එසේම කළාය ඉක්බිති මෑනියෝ රෙවතී අවවාදයෙහි පිහිටා බව නන්දිකයන්ට කියා නන්දිකයෝ යහපතැයි කියා ඉවසූකල දවස් නියමකොට අවවාද කළහ. එකල්හි නන්දිකයෝ රෙවතියට මෙසේ කිහ, එම්බා සොඳුර භික්ෂුසංඝස්ථවිරයන්සේටද මවුපියන්ටද උපස්ථාන කරන්නී විනම්නි මේගෙයි වස්න්ට ලබන්නිය එසේහෙයින් නොපමාව වන්පිළිවෙත් කරවයි කියේය. රෙවතීතොමෝ නන්දිකයන්ගේ බස්අසා යහපතැයි පිළිනෙණ සවාමියා සිත්ගන්නා පිණිස නොබෝ දවසක් ශ්‍රද්ධා ඇති එකෙක්සේ නන්දිකයන්ට අනුව පවත්නී කල් යාමකින් දරු දෙදෙනෙකු ලද්දිය නොබෝ කලකින් නන්දිකයන්ගේ මවුපියෝ දෙදෙන කාලක්‍රියා කළාහුය. එකල්හි ඒගෙයි සියලුම ඉසුරුසම්පත් රෙවතිට හිමිවිය නන්දිකයෝ දුගිමගි යාචකයන්ට ගෙදර දන්වැට තබා දන් දෙන්නේය මහසංඝස්ථවිරයන්සේටද දුනපතිව මහදන් පැවැත්වූයේය තවද නන්දිකයා ඉසිපතන විහාරස්ථානයෙහි ගබඩා සතරකින් ප්‍රතිමණ්ඩිතවූ චතුශ්ශාලාවක් කරවා එහි ඇදපුටු බිසි බිමෙබාහන කලල් පැදුරු ගිනිකබල් කල කොතලා සැලිවලන් ආදි සෙනාසන භාණ්ඩයන් සපයා ඒ විහාරය පිළිගන්වන දවස බුදුන් ප්‍රධානකොට ඇති මහසංඝස්ථවිරයන්සේට මහත්කොට උදුරහරව දන්දී ඉක්බිති බුදුන්ගේ

ශ්‍රීනඟෙහි පැන්වත්කොට විනාරය පිළිගැන්වීයේය ඒ දක්ෂිණෝ දකය ගා සමන විනාරය පිදිනැන්වූ කෙණහි තවුතිසා දිව්‍යලොකයෙහි දිගින් පුලුලින් සතලිස්අට ගව්ව පමන ඇති සාරසියයක් ගව්ව උසඇති නොයෙක් මහල් ඇති දහස්ගණන් ගබඩා ඇති තිරුරස් කළඔක්සේ බලන්නවුන්ගේ ඇස් බමවන්නාවූ සත්රුවන්මය සවිභරණයෙන් ජෙනිමත්ව බබලන්නාවූ නොයෙක් දහස්ගණන් දෙව භවන් විසින් ගැවසී ගත්තාවූ සහනරත්නමය දිව්‍යප්‍රාසාදයෙක් පහළවිය එසමයෙහි ආයුෂ්මත්වූ මුගලන් මහතෙරුන්වහන්සේ දෙව චාරිකාවෙහි වඩනාසේක් නන්දිකයන්ට ඒ පහළවූ දිව්‍යප්‍රාසාදය දැක තමන්වහන්සේට නමස්කාරපිණිස ආවාවූ දිව්‍යපුත්‍රයන් අතින් මෙසේ විචාළසේක් හිරු විමනක්සේ ජෙනිමත්ව බබලන්නාවූ මේ ප්‍රාසාදය කාගේ විමානයෙක්දැයි විචාරා වදාළසේක. ස්වාමිනි මේ ප්‍රාසාදය හිමිතැනැත්තේ මිනිස්ලොව වසන්නේය බරණැස් නුවර නන්දිකනම් කෙළෙඹිපුත්‍රයෙක් සංඝයාවහන්සේ උදෙසා ඉඩිපතන විහාරාසන්න යෙහි ගබඩා සතරකින් ප්‍රතිමණ්ඩිතවූ චතුශ්ශාලාවක් කරවා පිළිගැන්විය ඕහට මේ ප්‍රාසාදය පහළවියයි කිවාහුය ඒ විමානයෙහි උපන් දිව්‍යාඟනාවෝ තෙරුන්වහන්සේට නමස්කාරකොට කියන්නාහු ස්වාමිනි බරණැස් නුවර නන්දිකනම් උපාසකයාට පරිවාරිකාවන පිණිස අපි මේ දිව්‍ය විමානයෙහි උපනුම්හ. ස්වාමිනි නන්දිකයන්ට මෙසේ වදාළ මැනව නන්දිකයෙනි නොපව පරිවාරිකාවන පිණිස උපන් දිව්‍යාඟනාවෝ නොපි මිනිස්ලොව කල්යවන ගෙයින් කලකිරුනාවූ සිත් ඇත්තාහු දිව්‍යාඟනාලොකසම්පත්තිය නම් මැටි භාජනයක් බිඳ රන්භාජනයක් ගත්තාක් මෙන් සතුටු එලවා මන වඩන්නේයයි කියා මේ දෙව්ලොවට එන්ට වදාළමැණවැයි කිවාහුය. දිව්‍යාඟනාවන් කි බස් අසා ඝනපතැයි කියා මහතෙරහු වහා දෙව්ලොවින් මිනිස්ලොවට අවුත් ධම්මසභාමණ්ඩපයෙහි සිවුවනක් පිරිස්මැද වැඩහුන් බුදුන් කරා එලැඹ මෙසේ විචාළසේක. ස්වාමිනි කරණලද කුසල් ඇතිව අප්‍රමාදව වසන කුලපුත්‍රයන්ට මිනිස්ලොව සිටියදිම දිව්‍යලොකයෙහි සම්පත් පහළ වේදැයි විචාළසේක. මොදහල්‍යායනසථවිර යෙනි නන්දිකයන්ට තවුතිසා දිව්‍යලොකයෙහි පහළවූ දිව්‍යසම්පත්තිය තා විසින් දක්නාලද්දෙහිය දැන් කුමක්පිණිස මා විචාරන්නෙහි දැයි විචාළසේක. එකල්හි මහතෙරහු එසේය ස්වාමිනි නන්දිකයන්ට පහළවූ දිවඉසුරු මාවිසින් දක්නා ලද්දේයයි දන්වූසේක. එකල්හි බුදුරජානන්වහන්සේ ධම්මදෙශනා කරණසේක් යම්සේ දෙශානතරය කට හිය පුරුෂයෙකු එනු අසා නෑයෝ මිතුයෝ පෙරමගට ගොස් මෙසේ එව පුත්‍රයෙනි මිතුයෙනි යනාදින් ආමන්ත්‍රණය කෙරෙද්ද

එමෙන් කරණලද කුසල්ඇති සත්පුරුෂයන් මෙලොවින් පරලොවට යන කල කුසල් නැමති ඥතිමිත්‍රයෝ සමපත්නැමති අතින් පිලිගෙණ ආදර දක්වා සතුටුවන පරිදි දක්වා මේ ගාථාදෙකින් ධම්මදෙශනා කළසේක.

මේ කෙසේද යත්?

"චිරපවාසිං පුරිසං දූරතෝ සොත්ථිමාගතං,
ඤාතිමිත්තා සුහජ්ජා ච අභිනන්දන්ති ආගතං.
තථෙව කතපුඤ්ඤම්පි අස්මා ලොකා පරං ගතං,
පුඤ්ඤානි පතිගණ්හන්ති පියං ඤාතිව ආගතං."

යනුහෙයින් යම්සේ පරදෙශයට හොස් බොහෝකලක් එනි වැස ලබනලද ලාභසත්කාර ඇතිව යම් පුරුෂයෙක් සුවසේ ඒද ඔහු දැක නෑයෝ ඉදිරියට ගොස් වැඳිමෙන්ද සිපගැන්මෙන්ද ආබම යහපත යනාදින් ප්‍රියබස් කියා විශෙෂයෙන්ම සතුටුවෙද්ද එමෙන් දානශීලාදි වියයෙන් කරණලද කුසල් ඇති සත්පුරුෂයෝද පරලොව යන කල කුසල් නැමති නෑයෝ මිතුයෝ ආයුවණිණාදි පඩුරු දක්වා සමපත් නැමති අතින් ඔහු පිලිගන්නාහුයයි වදළසේක. ඒ බණ අසා සතුටුව ස්ත්‍රීන් පිරුණාවූ ශරීර ඇති නාඤිකශෝ පෙර දවසට වඩා බොහෝකොට දන්දෙමින් සිල්රකිමින් බොහෝ කුසල් කරන්නේ වෙලඳුම් පිණිස යනු කැමතිව එක්දවසක් රෙවතිය ලඟට කැඳවා කියන්නේ සොඳුර මාවිසින් සංඝයාටහා දුගිමගි යාචකයන්ට දෙනලද දානය මා සිටිනා සේ අප්‍රමාදව පවත්වා ලවයි කිහ. ඒ රෙවතීද යහපතැයි කිවාය. මෙසේ අවවාද කොට වෙලඳුමට ගියේය. යම්තැනක ලැබුම්ගෙණ සිටිනේවීනම් සංඝයාටහා දුගිමගි යාචකයන්ටද විභවානුරූපව දන්දෙන්නේ රහතන්වහන්සේලාද ඔහුට අනුකම්පා උපදවා දුරිනුදු අවුත් දන් පිළිගන්නාසේක්මය නාඤිකයෝ ගිය කිපදවසක් දානය පවත්වා යාචකයන්ට දෙන දානය නැති කළාය. භික්ෂූන්වහසේලාටද කාඞිහා නිවුඩු සාලේ බත් දෙන්නිය. භික්ෂූන්වහන්සේ වැළඳු කල්හි තමන් අනුභවකොට ඉතිරි බත්සුලුහා දියමස් ගොබඔස් කැවිලිහා ඇටඇට ආදිය විසුරුවා මිනිසුන්ට දක්වා මෙසේ කියති ශ්‍රමණයන්ගේ කටයුතු තැමදෙනම බලව අපි සැදැහැයෙන් දෙනලද දානය මෙසේ වළඳන්ට සුදුසුදැයි කියා සංඝයාගේ නුගුණ කියා මනුෂ්‍යයන්ට දක්වන්නිය. වෙලඳුමින් ලබනලද ලාභසත්කාර ඇතිව එන්නාවූ නාඤිකයෝ එපවත් අසා නොසතුටු සිත්ඇතිව රෙවතී ගෙයින් පිටතුකරවා ගෙට වන්නේය. දෙවනදවස් බුදුපාමොක් මහසංඝයාට දන්දී එතැන්පටන් භික්ෂූන්වහා අනාථ යාචකයන්ට නිතිදන් පැවැත්වූයේය. නැවත තමාගේ යහලුවන් විසින් යාවිසූ කොට ගෙට කැඳවා ගෙණ එනලද

රෙවතියට බන් පිලී පමණක් දී ඉන්ට සැලැස්විය, නඤ්ඤයෝ අප්‍රමාදව කුසල් කොට එයින් නොබෝ දවසකින් කාලක්‍රියා කොට නවුතිසා දෙව්ලොව තමන්ට පහළවූ දිව්‍යවිමානයෙහිම උපන්නේය. රෙවතී වනාහි නඤ්ඤයන් මළපසු සියලු දන්වැට නැතිකොට මේ ශ්‍රමණයන් නිසා මාගේ ලාභසත්කාර නැතිවියයි සංඝයා කෙරෙහි වෛරබැඳ භික්ෂූන්ට ආක්‍රොශ පරිභව බෙණෙමින් ඇවිදිනිය, එකල්හි වෙසමුණු රජ්ජුරුවෝ යක්‍ෂයන් දෙදෙනකු කැඳවා මෙසේ කියේය. ඔව නෙපි ගොස් මෙයින් සත්වනදවස ජීවත්ව සිටියදිම රෙවති නරකයට දමන්නේයයි කියා සියලු බරණැස්නුවරට ඇසෙනසේ අඩඹසත්වයි නියොග කෙළේය, ඒ යක්‍ෂයෝ ගොස් මෙයින් සත්වනදවසේ ජීවත්ව සිටියදිම රේවති නරකයට දමන්නාහු වෙති පාපිෂ්ටවූ අසත්පුරුෂවූ රේවතිට වන්නාවූ අනාර්‍ය නුවරවාසිහු දැනගණ මේ රෙවතිමෙන් පවී නොකොට පින් ඒකරෙත්වයි යන අභිප්‍රායෙන් උද්ඝොෂණය කළාහුය. ඒ ගඩ අසා මනුෂ්‍යයෝ හඬින් නැතිගෙණ කටයුතු නොකටයුතු සලකාගතනොහී තමතමන්ගේ ඉෂ්ටදෙවතා නමස්කාර කෙරෙමින් වෙවුල වෙවුලා ඒ ඒ අත දිවමින් චක්‍රවලව මහත්වූ සාවෙශයට පැමිණියාහ. රෙවති වනාහි ප්‍රාසාදයට නැගි දෙර වසාගෙණ හුන්නාය. ඉක්බිති සත්වනදවස් ඇගේ අකුශලකර්මයා විසින් වොදනාකරණලදුව වෙසමුණු රජහු විසින් ඇණවා එවනලද යක්‍ෂයෝ දෙදෙන අඤ්ජනකූට පර්වතයමෙන් ඉතා නිල්වූ භයානකවූ මහත් ශරීර ඇතිව පර්වතවිවරයක්මෙන් මහත්වූ මුඛයක් ඇත්තාවූ දෙකපොලයෙන් නික්ම නිබෙන්නාවූ මහත් දළ ඇත්තාවූ හිනිගෙණ දිලියෙන ඇවසේ මහත් රහැස් ඇත්තාවූ මැදින් බිඳි අහින් පැනැලිවූ මහත්වූ නාසිකා ඇත්තාවූ සලා දිදි ඇවිලෙන හිනිවැටක්සේ ක්‍රෑරවූ තඹරවුල් ඇත්තාවූ නිල්මේඝකුලක්සේ මහත් උදර ඇත්තාවූ නිග්‍රණු මුවහත් ඇති කඩුපෙලක්සේ දික්ව රුධිරධාරාවෙන් ගැවසිගත්තාවූ රත්වූ නියපතර ඇත්තාවූ රැලිසහිත පලල් නලල්තල ඇත්තාවූ පිටි තොල මස්කඬා මනුෂ්‍ය මාංශ භක්‍ෂණයකොට ලේපානය කරන්නාවූ භයානක චණ්ඩරූප ස්වභාවඇති ඒ යක්‍ෂයෝ දෙදෙන මතුමහල් තලයෙහි උන් රේවතිය කරා අවුත් මෙසේ කිහ.

"උඤ්ඤේහි රෙවතෙ සුපාපධම්මෙ
අපාරුතචාරෙ අදූසකිලෙ,
නෙසාම තං යත්‍ර ඨිතන්ති දුග්ගතා
සමප්පිතා නෙරයිකා දුක්ඛේනා'ති'

ඉච්චෙවං වත්වා යමස්ස දූතා
චෙ යක්ඛා ලොහිතක්ඛා බ්‍රහන්තා,
පච්චෙකබාහාසු ගහෙත්වාන රෙවතිං
පක්කාමිංසු දෙවගණස්ස සන්තිකෙ" ති.

N

යනුහෙයින් එම්බා පව්ටුවූ රේවතිය මේ ප්‍රාසාදය නරකදුකින් ගල වන්ට නොහැකි වන්නේය, හුන්තැනින් වහා නැගි සිටුව යම් හෙයකින් ආයුෂ්මන්වහන්සේට ආක්‍රොශපරිභව බෙණෙමින් තිගේ දොර සමීපයට ආ යාචකයින්ට ආහාරපානාදි වශයෙන් කිසිවක් නොදී දඬු මුගුරු කැට පහන් ආදියෙන් තලා මරා එලවමින් අනුන්ගේ සම්පත් නොඉවසන සුලුවූ තමාගේ සම්පත් සහවා මසුරුවූ සත්ප්‍රයොගයෙන් හෝ කෙරාටිකභූණයෙන් යෙදි තුනුරුවන් ගුණ නොසලකා දුනශීලාදි කිසියම් කුශලකර්මයක් නොකළාද එබදු ලාමකස්වභාව ඇති නී වැනි ඖනසත්වයන්ට නරකවල දොර නොවසන ලද්දේය; නී වැන්නන්ට නරකයම් වාසස්ථාන වන්නේය, මේ සත්ලොකයෙහි. දුනපතිව දන් දෙන්නාවූ සිල්වත්වූ මසුරු නොවන්නාවූ තිගේ සවාමිපුත්‍රයන් වැනි පින් කළවුන්ටම සවර්ගලොකයෙහි වාසස්ථාන වන්නේය, එසේහෙයින් පින්කළවුන්ට සවර්ගයත් පව්කළවුන්ට අපායත් නියතවා විනා මේ ප්‍රාසාදය නිට රක්ෂාස්ථානයෙන් නොවෙයි, මෙහි මොහොතකුදු නොඉඳ පලා එව එසේ නොව මෙතැන්හි හිඳිනට නොදෙම්හ, වහා නැගි සිටුවයි කියා වෙන වෙනම අත්දෙක ගසා අල්වා ගෙණ බරණැස්නුවර මුලුල්ලෙහි පව්කළවුන් ඉදිරි විදිනා දුක් මෙසේයයි කියන්නාසේ විපියෙන් විපියට නුවර මුලුල්ලෙහි ගල්මුල් ආදියෙහි ඇණ බිම්ලා ඇද භ්‍රමණය කොට උකුස්සන් ගන් කුකුළුපැටවියක්සේ අහසට නගා ගෙණ තවුතිසාභවන් යෙහි නන්දිකයන්ගේ විමන්දොර සිටුවූහ, එකල්හි යක්ෂයන් විසින් තවුතිසාදෙව්ලොවට ගෙණ ගොස් නන්දිකයන්ගේ විමන්දොර සිටුවන ලද ඒ රේවතිතොමෝ සූර්‍යමණ්ඩලයසේ ඉතා ප්‍රභාමන්ව බබලන්නාවූ විමානය දැක මෙසේ විචාළීය.

“ආදිච්චවණ්ණං රුචිරං පභස්සරං
වියූහං සුභං කඤ්චනජාලවජ්ජිතං,
කස්සෙතමාකිණ්ණජනං විමානං
සුරියස්ස රංසී විය ජොතමානං.

නාරිගණා චන්දනසානුලිත්තා
උභතෝ විමානං උපසොභයන්ති,
තං දිස්සති සුරියසමානවණ්ණං
කො මොදති සගගපතෙතා විමානෙ‘ති”.

යනුහෙයින් ආකාශයෙහි දහසක් රැසින් දිලියෙන්නාවූ හිරුවිම නක්සේ රන් දුල් වසා නොයෙක් රශ්මිජාලාවෙන්හා සජනවිධරත්නයෙන් ආකීර්ණව ජොතිමත්ව බබලන්නාවූ තෙල පෙණෙන විමානය කාගේ විමානයෙක්ද යෙල යාලක් පමණ ළඳුන් සුවඳවිලවුන් ල්හවනලද ශරීරඇතිව දිවසළු වැලඳ සත්රුවනින් විසිතුරුවූ සවිභාර

ණයෙන් සැරසී මේ විමානය උභයපාර්ශ්වයෙහි සත්රුවනින් විසිතුරු වූ මර ගෙණ දෙපස සලමින් සිටිති සමහරු ගී කියති සමහරු ගායනා කෙරෙති. භාවභාවලීලාවෙන් යුත් නොයෙක් දහස්ගණන් දිව්‍යාංගනාවෝ දෙපස සිට දිව්‍යපුත්‍රයා සතුටු කරවති මෙසේ මේ පරිවාර දිව්‍යසෙනාව මධ්‍යයෙහි සූර්‍යමණ්ඩලයසේ මේ ප්‍රාසාදයෙහි සුව විඳිනාහු කවරෙක්ද කොයි සිට සර්වලොකප්‍රාප්තවූ සෝණක්දැයි කියා යක්ෂයන් අතින් විචාළිය. එසේ විචාරණලද යක්ෂයෝ මෙසේ කිහු.

"බාරාණසියං නන්දිකො නාමාසි උපාසකො
අම්හජරි දූතපති වදඤ්ඤූ,
තස්සෙතං ආකිණ්ණජනං විමානං
සූරියස්ස රංසි විය ජොතමානං.

නාරිගණා චන්දනසානුලිත්තා
උභතො විමානං උපසොභයන්ති,
තං දිස්සති සූරියසමානවණ්ණං
සො මොදති සහපත්තෙහා විමානෙ'ති."

සත්‍යශෛශීන් මිනිස්ලොව බරණැස්නුවර මසුරු නොව දානපතීව දන් දුන්නාවූ බුබාදි රත්නත්‍රයෙහි පහන්සිත් ඇති සිල්වත්වූ නන්දික නම් උපාසකයෙක් විය ඕහට දහසක් රැසින් දිළිඹෙන තිරුමඩලක් මෙන් බබලන්නාවූ අනල්පවූ දිව්‍යවූ චන්දනකුඩිකුමාදි සාරගන්ධයෙන් අඹරාග ගෙණ සිටි දිව්‍යස්ත්‍රීන්ගෙන් ගැවසී ගත් මේ දිව්‍යප්‍රාසාදය පහළවිය එහි බලන්නවුන්ගේ ඇසට රසාඤ්ජනයක් බඳුවූ දිව්‍යමය නිලුපුල්පෙති වැනිවූ දිගුපුලුල් සුනිල්නෙතින් හා සියලු අවයව සම්පත්තීන් සැරහුනාවූ භාග්‍යකරයාසේ ගාවභාව ලීලාවිලාසයෙන් යුත් නොයෙක් දහස්ගණන් දිව්‍යාංගනාවෝ සඳුන් විලවුන් ගෙණ ඔහු පිරිවරා සිටිති මෙසේ දෙපස සැදී සිටි දිවපිරිස් මැද සූර්‍යාසේ බබලන්නාවූ තෙල පෙණෙන්නාවූ දිව්‍යපුත්‍රයානම් නන්දික උපාසකයායයි කිවා ය. එබස් අසා රෙවතිය කියන්නී එසේවිනම් පින්වන්නි මම ඒ නන්දික ස්වාමීන්ගේ ගෙයි එක්ව ඉසුරු විඳි ස්ත්‍රියෙක ඒ නන්දිකයෝ මාගේ සවාමිපුත්‍රයාය, එසේහෙයින් මාගේ සවාමියාගේ විමන්හි සිත් ඇලෙමි දැන් මම නරකය දක්නවද පැසෙන්නටද නොකැමැත්තෙමි කිවාය එසේ කී රේවතියට යක්ෂයෝ කියන්නාහු එම්බල රේවතිය තිගේ ප්‍රාර්ථනාවෙන් කම් නැත නන්දිකදිව්‍යපුත්‍රයාගේ සිත්කළුවූ නිම්මලවූ කිසිකලෙකත් නි කරා නොපැමිණෙන්නාවූ සවභාව ඇති මේ රත්න ප්‍රාසාදය නි කුඹ ස්පිණිස ප්‍රාර්ථනා කෙරේද? එසේ නොපතව නී නරකයට යනු කැමැති වේවයි නොකැමැති වේවයි තිගේ පැතිමෙන් ප්‍රයොජන නැහැයි

කියා සසවකනම් නිරයසමීපයට ගෙණ ගොස් සිටුවා කියන්නාහු රේවතිය නි විසින් මනුෂ්‍යලොකයෙහිදී ස්වල්පමාත්‍රවූද කුශලකර්මයක් නොකරණලද්දේය, එසේ පින් නොකරණ තමාගේ සම්පත් සඟවන සුලුවූ මසුරුමලයෙන් යුක්තවූ අනුන්කෙරෙහි වෙෂ ඉපදවීමෙන්හා තමාගේ සිත හටගත් ලොභාදි පාපධර්මයන්හා ලාමකස්වභාව ඇති නි වැනි සත්ත්වයෝ වනාහි කුසල්කොට දිව්‍යලොකයෙහි මහත් දිව ඉසුරු විඳිනා දෙවියන්හා සමග වාසය කරන්ට නොලැබෙති කියා නැවත නි විසින් බොහෝ කලක් මහදුක් විඳීමට වාසස්ථානවූ මේ සසවකනම් නරකයෙහි පැසිමට නියත වන්නේයයි කියා ඒ යක්ෂයෝ දෙදෙන එතැන්හිම අන්තර්ධානවූවාහුය. එදවස් යමපල්හු දෙදෙනෙක් අවුත් ඒ සංසවකනම් ගූථනරකයෙහි ලන පිණිස අදනා කල්හි ඒ රේවතිය යමපලුන් අතින් මෙසේ විචාළිය.

"කිස්සනු ගූථඤ්ච මුත්තඤ්ච අසුචි පනිදිස්සති,
දුග්ගන්ධං කිමිදං මීළ්හං කිමෙතං උපවායතීති."

යනුහෙයින් ආහාරමලයෙන්හා මූත්‍රාදියෙන්හා ඔරු නැවුසා මහන් පණුවන් විසින් ගැවසි ගත්තාවූ නාසිකාව පැළියන තරම් දුගීන්ධ ඇති මේ මහත් අසුචිවළක් දක්නා ලැබෙයි, මෙසේ දුගීන්ධ හමන්නාවූ අසුචිවළ කිමෙක්දැයි විචාළිය. එසේ විචාළ රේවතියට නරකයේ නමද දිගපුලුලහා ආයුෂයද ප්‍රකාශකොට කියන්නාහු—

"එස සංසවක්ඛෝ නිරයෝ ගම්භීරෝ සතපෝරිසෝ,
යත්ථ වස්සසහස්සානි තුවං පච්චසි රෙවතෙති."

යනුහෙයින් මේ නරකය ගැඹුරෙන් සියක් යොදුනක් පමණ උස වන්නේය, සියයක් යොදුන් වට ඇති සියයක් යොදුන් තැන උන්නාවුන් ඉස් පැළියන පමණ දුගීන්ධඇති කකියනලද ගූථනරකයෙහි හුනු සත්‍යා සුවිමුඛවූ ලොහොතුඩු වැනි තුඩු ඇති ඔරු නැවු පමණ පණුවෝ වටලා ගෙණ හාත්පසින් සිවි සිඳ මස් සිඳ නහර සිඳ ඇට සිඳ මස් ලියලියා කමින් සකල ශරීරය ගුල්ලන් විඳිනා දණ්ඩක් පරිද්දෙන් සිදුරු කොට ඇටමුල් කති මේ නරකයෙහි ආයුෂයද මිනිස් ලොව තුන්කෙළ සැටලක්ෂයක් අවුරුදු සංසවකනම් ගූථනරකයෙහි එක්දවසක් වෙයි ඒ නියා දවසින් තිස්දවස් මස්කොට දෙලොස්මස් හවුරුදු කොට ඒ හවුරුද්දෙන් මේ නරකයෙහි දහසක් අවුරුදු ආයු වන්නේය, එබඳා රේවතිය නි ඒ නරකයෙහි නොයෙක් දහස්

ගණන් අවුරුදු පැසෙන්නීයති කියා යමපලුන් විසින් කියනලද කල්හි රෙවතිතොමෝ තමන් ඒ නරකයෙහි උපදනට හෙතුවූ අකුශලකම්මය විචාරන්නී මෙසේ විචාළිය.

"කින්නු කායෙන වාචාය මනසා දුක්කටං කතං,
කෙන සංසවකො ලඩො ගම්භීරො සතපොරිසොනි."

යනුහෙයින් පින්වත්නි කයින්ද වචසින්ද මනසින්දුයි යන මේ ත්‍රිවිධ දුශ්චරිතයන් අතුරෙන් කවරනම් අකුශලකම්මයක් හෙතුකොට ගෙණ සියක් පුරුෂප්‍රමාණ ගැඹුරුවූ සසවක නම් මේ අසුචි නරකය මාවිසින් ලබනලද්දේද? කවර අකුසලයකින් මේ නරකයෙහි උප දිම් දුයි විචාළිය. එකල්හි යමපල්හු ඒ අකුශලකම්මය ප්‍රකාශ කොට කියන්නාහු–

"සමණෙ බ්‍රාහ්මණෙ වාපි අඤ්ඤෙ වාපි වණිබ්බකෙ,
මුසාවාදෙන වඤ්චෙසි තං පාපං පකතං තයා'නි."

යනුහෙයින් රෙවතිය නී යම් වෙෂ මොහයක් කරණකොට ගෙණ සන්හිදුවනලද පාපයන් ඇතිහෙයින් ශ්‍රමණනම්වූද බාහිතනිරිම්මය යෙන් නාසනලද ලොභාදි ධම්මියන් ඇතිහෙයින් බ්‍රාහ්මණනම්වූද එසේහෙයින් අන්‍යවූ අනාථයන්ද යන මේ හැමදෙනාම බොරුවෙන් රවටා වඤ්චාකෙළේද නී විසින් එබඳු පව්ටුකමක් කරණලද්දේය, එහෙයින් මේ සත්වලොකයෙහි යම් කිසිවෙක් කායාදි වාරත්‍රයෙන් ප්‍රාණඝාතාදි අකුසල් කෙළේවිනම් මෙබඳු මහත් දුකට පැමිණෙන් නේය නිදූ කායාදි වාරත්‍රයෙන් මහත් අකුසල් කළාය එසේහෙයින් මේ නරකයෙහි පැසෙන්නියයි එහි පැසෙන්නට හෙතුවූ අකුශල කම්මය ප්‍රකාශකොට කියා නැවත කියන්නාහු–

"තෙන සංසවකො ලඩො ගම්භීරො සතපොරියො,
තත්ථ වස්සසහස්සානි තුවං පච්චසි රෙවතෙනි."

යම් අකුශලකම්මයකින් ගැඹුරෙන් සියක්පුරුෂයන් උසඇති දහසක් අවුරුද්දට ආයුෂය ඇති නිරන්තරයෙන් ගුථ මූත්‍රාදියෙන් අසුචි වහනය වනහෙයින් සසවකනම්වූ නරකයෙක් ඇද්ද ඒ නරක යෙහි අකුශලකම්මබලයෙන් දේවතිය නී පැසෙන්නියයි කියන්නාහු මේ මතු කියන ගාථාවෙන් මෙසේ කියත්.

"හත්ථෙපි ඡින්දන්නි අථොපි පාදෙ
කණ්ණෙපි ඡින්දන්නි අථොපි නාසං,
අථොපි කාකොළගණා සමෙවද
සංගම්ම ඛාදන්නි විඝසමානන්නි."

යනාදින් කියන්නාහු රෙවතිය නි වනාහි තුන්ගවු උස ඇති ශරීරයෙන් මේ නරකයෙහි නොයෙක් දහස්ගණන් අවුරුදු පැසෙන් නිය නිවිසින් කරණලද අකුශලකර්මය යම්පමණ කලක් නොගෙවේද එපමණ කල් පැසි මහදුක් විඳිනාවූ නිගේ අත්පා කන් නාසා අගපසඟ තිබුණු මුවහන් ඇති සසහි තොමර මුදගරාදි නානාප්‍රකාර ආයුධ ගෙණ කපති පලති ඉරති තළති නැවත කැපු කැපූතන්හි මස් අටගන්නේය තවද නිගේ තුන්ගවුදිග ශරීරයෙහි නොයෙක් දහස් ගණන් කවුඩෝ තල්කඳසා ඝනිගෙණ දිලියෙන අයොමය තුඩින් මස් විද විද ඉරා කති නැවත කර්මබලයෙන් කෑ තැන් මස් පිරෙයි යනාදින් එහි දුක් කර්කටුල් ඒ යමපල්හු දෙදෙනා විසින් කිකල්හි මිනිස්ලොවට කුසල්කරණු පිණිස යෙමියි යාච්ඤාකරන්නී මෙසේ කියා ඇඬුහ.

"සාධු ඛො මං පටිනෙථ කාහාමී කුසලං බහුං,
දමෙන සමචරියාය සඤ්ඤමෙන දමෙන ච.
යං කත්වා සුඛිතා හොන්ති න ච පච්ඡානුතපපරෙති."

යනුහෙයින් සත්‍පුරුෂයෝ යම් කුසලයක් කොට නිවන් දැකීමෙන් සුව පත් වෙද්ද එබදුවූ දාන ශීලාදි කුසල් කෙරෙමි මිනිස්ලොවට ගැරිය මැනවැයි කිහ, එකල්හි නිරයපාලයෝ මෙසේ කිවාහුය.

"පුරෙ තුවං පමජ්ජිත්වා ඉදානි පරිදෙවසි,
සයං කතානං කම්මානං විපාකං අනුභොස්සසිනි."

රෙවතිය යි පෙර කුසල් නොකොට ප්‍රමාදවිහාරීව දැන් කුමක් පිණිස ගඬයිද? නී විසින් කළාවූ අකුශලකර්මය තිම විඳුවයි කියා—

"ඉච්චෙවං විලපන්තිංව එදමානං තතොතතො,
ඛිපිංසු නිරයෙ ඝොරෙ උඩ්ඩපාදං අවංසිරන්ති."

නොයෙක් විලාප කිය කියා ඔබිනොබ වැටෙමින් අඬන්නාවූ රෙවතියගේ දෙකකුල ගසා අල්වා ඌර්ධපාදව අධොශීර්ෂකොට කප්ගින් නක්මෙන් නිරන්තරයෙන් සලා ගුගුරා දගදිග දිවන ඝනිසිලුඇති සසවකනම් ගුථනරකයෙහි හෙලූහ.

ඉක්බිති භික්ෂූන්වහන්සේ රෙවති යක්ෂයන් ගෙණ ගිය බව බුදුරජාණන්වහන්සේට දන්වූසේක බුදුරජාණන්වහන්සේ එමඟා මහණෙනී ඒ රෙවති වෙසමුණුරජහුගෙන් නියෝග ලත් යක්ෂයෝ දෙදෙනෙක් අවුත් අල්වාගෙණ ඒසාමගත් බරණැස්නුවර විටියෙන් විටියෙහි ඇද ගෙණ ගොස් තවුතිසා දෙවුලොව නන්දිකයන්ගේ විමානය දක්වා සසවකනම් ගුථනරකය සමීපයට ගෙණ ගොස් සිටුවා අහනඩීනාවූහ

ඒ නරකයෙහි වසන යමපල්හු දෙදෙනෙක් අවුත් අල්වා ගෙණ ගොස් නරකයට දැමූහ, මෙසේ මේ කථාප්‍රවෘත්තිය විභාවනයෙන් වදුරා මත්තෙහි චතුරාර්යසත්‍යය ප්‍රකාශ කොට බණ වදළසේක ඒ දෙශනාවසානයෙහි බොහෝදෙනා සොවාන් සකෘදාගාමී අනාගාමී අර්හත් යන සතර මග සතර ඵලයට පැමිණියාහුය.

මේ විමානවත්ථුප්‍රකරණයෙහි මහාරථ වර්ගයෙහි රෙවති විමානවත්ථුව කියා නිමවන ලදි.

තවද මේ විමානවත්ථුප්‍රකරණයෙහි මහාරථ වර්ගයෙහි **ජතුමාණවක විමානවත්ථුවත්** කවරහුත්?

භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර වැඩවසන සමයෙහි සෙතව්‍ය නුවර ජතුනම් බමුණුකුමාරයෙක් උක්කඨානුවර පොක්ඛර සාතිනම් බ්‍රාහ්මණයා කරා ගොස් ශිල්ප ඉගෙණ නිමවා නැවත සෙතව්‍ය නුවරට ගොස් මවුපියන්ට එපවත් කියා ගුරුපඩුරු පිණිස කහවණු, දහසක් ගෙණ උක්කඨා නුවර පොක්ඛරසාතිනම් බමුණා කරා යමින් සිටියේය, එසමයෙහි බුදුරජානෝ එදවස් අළුයම්වේලෙහි ජතුමාණවකයා දැක වදුරා ඒ මාගිහයෙහි රුකක්මුල වැඩහුන්සේක. ජතුමාණවකයා මග යමින් සිට බුදුන් දැක සමීපයට ගොස් බුදුන්ගෙන් බණ අසා සරණසිලයෙහි පිහිටා තුනුරුවන් සිහිකෙරෙමින් ඒ මඟට බැස යනකල සොරු දැක විද මැරූහ, ඒ කුමාරයා කාලක්‍රියා කොට තවුතිසා දෙවුලොව තිස්සොළුන් රන්විමනෙක උපන්නේය, ඒ කුමාරයා මළපවත් අසා මවුපියන් හා සෙතව්‍ය නුවර වාසිහුද පොක්ඛරසාති බමුණා හා උක්කඨානුවර වාසිහුද රැස්ව මහත් සමාගමක් විය බුදුරජානෝද ඒ ස්ථානයට වැඩිසේක. එකල්හි ජතුනම් දිව්‍යපුත්‍රයා විමානය හා සමග දෙවුලොවින් අවුත් බුදුන් වැඳ එකත්පස්ව සිටියේය බුදුරජානෝ දිව්‍යපුත්‍රයාට හා සම්ප්‍රාප්තපිරිසට බණ වදළසේක ඒ බණ අසා බොහෝ සත්වයෝ සතර මග සතර ඵලයට පැමිණියාහ, බුදුරජානෝ ජේතවනාරාමයට වැඩ ජතුනම් දිව්‍යපුත්‍රයාගේ විමානය වර්ණනාකොට සම්ප්‍රාප්තපිරිසට බණ වදළසේක. ඒ දෙශනාව බොහෝදෙනාට සාර්ථක විය. මෙහි විභාග ශිලපරිවේදයෙන් අසා දතයුතු.

මේ විමානවත්ථුප්‍රකරණයෙහි මහාරථවර්ගයෙහි ජතුමාණවක විමානවර්ණනාව සංක්ෂේපයෙන් කියා නිමවන ලදි.

තවද මේ විමානවත්ථුප්පකරණයෙහි මහාරථ වර්ගයෙහි **කකිටක රසදූසක විමානවත්ථුව** නම් කවරයක්ද?

සර්වලොකෙකනාථවූ භාග්‍යවත් බුදුරජානන් වහන්සේ එක්සම යෙක්හි රජගහනුවර වේළුවනාරාමයෙහි වැඩවසනසේක. එසම යෙහි ශ්‍රද්ධාවෙන් පැවිදිව නිවන්පිණිස මෙහෙයනලද සිත්ඇති ආරඛ විපස්සකවූ භික්ෂුකෙණෙකුන්වහන්සේ බුදුන් කෙරෙන් කම්මසථාන ගෙණ වියත්කරණසේක් කණ්ණියෙහි පහරණලද රුජාවකින් පෙළෙනලද ශරීර ඇතිව සිත එකඟකොට ගත නොහැක්කාවූ කෙලෙසුන් තුනිකිරිමට සුදුසු නොවන්නාවූ කයක් ඇති බැවින් විදර්‍ශනා භාවනාකිරිමට උත්සාහ කරන්ට නොහැකිවනසේක් වෙදවරුන් විසිනුදු විධිවූ පරිද්දෙන් බෙහෙත් කොටත් ඒ රොගය ඇසු නොවූ සේය එබැවින් ඒ භික්ෂූන්වහන්සේ බුදුන්ට එපවත් කියනසේක්, සථා මිනි මාගේ කණ හටගත් රොගය නිසා කම්මසථානයත් සිහිනොහැර සිත එකඟකොටගත නොහෙම් කිසේක. එකල්හි බුදුරජානන් වහන්සේ උන්වහන්සේගේ හෙතුසම්පත් ඇති නියාවත් රොගය නිසා අධිගමයට අන්තරාය්වන නියාවත් කකිටකරසභොජනයෙන් කණ්ණ රොගය හා කෙලාශරොගය සන්සිඳෙන නියාවත් සර්ව්ඥතාඥානයෙන් දැක වදුරා කකුළුරසභොජනය යැපයයි කියා දැන කැපවශයෙන් මේ භොජනය කෙසේ ලැබේදැයි සිතා එක්තරා කෙත්පාලයෙක් කකුළු රස පිසන්නා දැක ඒ කෙත්පාලයාට වන වැඩත් දැක උන්වහන්සේට වදුරණසේක් මගණ තෝ මගධක්ෂෙත්‍රයට පිඬුපිණිස යවයි වදළසේක බොහෝ කල් දක්නාලද බුදුරජානන්වහන්සේ විසින් මතුවන වැඩ දක්නාලදැයි සිතා යගපතැයි කියා බුදුන් වදළ වචනය මුදුනෙන් පිළි ගෙණ බුදුන් වැඳ අවසර ගෙණ කසීන් සිවුරුහා අතින් පාත්‍රය ගෙණ මගධරට කෙතට වැඩ නාමගොත්‍රයෙන් අප්‍රසිඛවූ එක්තරා කෙත් පාලයෙකුගේ දොරසම්පයෙහි වැඩසිටිසේක, එකල කෙත්පාලයා දැක කකිටක රසයා බත්පිස මදක්කල් යවා බත් අනුභවකෙරෙමි සිතා හුන්නේ ඒ තෙරුන්වහන්සේ දැක සතුටුව පාත්‍රය ගෙණ ඔහුගේ වාස භවනයෙහි ආසනයක් පණවා පැණවූ ආසනයෙහි තෙරුන්වහන්සේ වඩාහිඳුවා කකුළුරස භොජනය පිළිගැන්විය තෙරුන්වහන්සේ ඒ භොජනය මදක් වැලඳූ කෙණෙහි පහරණලද රුජාව සන්හිඳී ග්‍රීෂ්මකාලයෙහි පැන්කල සිසයක් වත්කළාසේ ශරීරය සිහිල්වූසේය. තෙරුන්වහන්සේ කයට සැප ආහාර ලැබීමෙන් චිත්තප්‍රසාදය ලැබ විදර්‍ශනාවශයෙන් සිත නිර්‍වාණයට යොමුකොට නමන්නේ, භොජනය වලඳ නිමවන්ට පළමුවෙන් ආශ්‍රවක්ෂයකරාභිඥතයෙන් නිරවශෙෂ කොට සකලක්ලෙශයන් නසා රහත්ඵලයෙහි පිහිටා කෙත්පාලයාට

මෙසේ වදාළසේක. එම්බා උපාසකය තාගේ පිණ්ඩපාත දානයෙන් මාගේ රොගය සන්හිඳි කයත් සිතත් යහපත් විය, තොපද මේ කුශල කර්මඵලයෙන් හෙවත් මේ කුශලය හෙතුකොටගෙණ පහවූ කාය චිත්ත රොග ඇතිව නිදුක් නිරොගි වේවයි කියා අනුමෙවෙනි බණ වදුරා වැඩිසේක. කෙත රක්නා තැනැත්තේ එයින් පසු නොබෝ කලකින් කාලක්‍රියා කොට හාත්පසින් උස්ව නැංගාවූ උතුම්වූ පද්ම රාග මාණික්‍යමය ටැම් ඇත්තාවූ සඝණිණවණිණමයවූ සත්සියයක් කූටාගාරයෙන් ප්‍රතිමණ්ඩිතවූ වෛදූර්‍යමණිමය ගබඩා ඇති දෙලොස් යොදුන් දිව්‍යවිමානයෙහි මැණික්මය ගෙයක උපන්නේය, ඔහුවිසින් පූර්වජාතියෙහි රැස්කරණලද කුශලකර්මය ප්‍රකාශකරණ පිණිස කුශල කර්මයෙන් නිර්මිතවූ මුතු සාල්ලෙහ රන්වන් කකුළුවෙක් එලි සිටියේය. එසමයෙහි ආයුෂ්මත්වූ මුනලන් මහතෙරුන්වහන්සේ ගට කියනලද ක්‍රමයෙන් දෙවඟරිකාවෙන් වඩනාසේක් තුන්ගවු උස දිව්‍යානුභාවයක් ඇතිව සවිහරණයෙන් සැරහි දහසක් දිව්‍යස්ත්‍රීන් පිරිවරා හිරු සඳුසේ මහත්වූ දිව්‍යඍර්ධියෙන් දිලියෙන්නාවූ දිව්‍යපුත්‍රයා දැක පූර්වජාතියෙහි කළාවූ කුශලකර්මය ප්‍රකාශකරවනු කැමැතිව මේ ගාථාවලින් විමාළසේක.

උච්චමිදං මණිථූනං විමානං
සමන්තතෝ චාදසයොජනානි,
කූටාගාරසහස්සභා උළාරා
වෙලුරියත්ථම්භා රුචිකත්ථතා සුභා.

නත්ථවත්ථි පිවසි ඛාදසි ච
දිබ්බා ච වීණා පවදන්ති වග්ගු,
දිබ්බා රසා කාමගුණේත්ථ පඤ්ච
නාරියෝ නච්චන්ති සුවණ්ණජාලා-පෙ-

යනුහෙයින්, හාත්පසින් උස්ව නැංගාවූ පදුමරාගමණිමය ටැම්ඇත්තාවූ උදුරතර විපුලවූ සත්සියයක් පමණ සඝණිණමයවූ කූටාගාරයන් ප්‍රතිමණ්ඩිතවූ වෛදූර්‍යමණිමය ගබඩාවෙන් උපසොභිතවූ දෙලොස් යොදුන් පමණ මහත්වූ දිව්‍යවිමානයක්හා ඒ විමානයෙහි වෛදූර්‍යමණිමය ගබඩාවෙහි රන් පුවරු මත්තෙහි සදා නිබෙන්නාවූ දිව්‍යරස හොජනයෙන්හා සියුම් මොලොක් සුවපහස් ඇති ආසනරණ අතුට සුවඳමලින් සරහා නිබෙන්නාවූ ශ්‍රීයහනින්හා සඝණිණාභරණාදි නොයෙක් අලඞ්කාරයෙන් සැරහි ශ්‍රවණීයවූ මධුරනාද පවත්නා බෙර වීණා වාදනාදියෙන් හාඝනාකෙරෙමින් නටන්නාවූ නිලුනාටකාදින්හා රූපශබ්දාදිපඤ්චකාමසම්පත්තියෙන් අඩුවක් නැත්තාවූ මෙබඳු

දිව්‍යසම්පත්ති ලැබීමට හේතු සිත් පූර්වජාතියෙහි කරණලද කුශලය කවරේදැයි විචාරා වදාළසේක, මෙසේ මුගලන්මහතෙරුන්වහන්සේ විසින් විචාරණලද පැනය විසඳන්නාවූ දිව්‍යපුත්‍රතෙම මෙසේ කීයේය.

"සතිං සම්පජාදකරෝ චාරේ කඤ්චනථම්භෝ සිතෝ,
නිසිතෝ ජාතරූපස්ස සොභති දසපාදකෝ."

යනුවෙයින් ඔන්රණින් නිමියාවූ රන්කඹක් වැනිවූ කයක් ඇත්තාවූ එකෙකි පාර්ශ්වයෙහි පස්පස් පයක් බැගින් දයපයක් ඇත්තාවූ රන්වන් කඳුළුවෙක් මාගේ විමන්දොර සාල්ලෙහි සොඳාමත්ව එලී සිටිනා ලෙස දැක වදාළසේක්වීනම් ඒ රන්වන් කඳුළුවා පූර්වජාතියෙහි කඳුළුමස්රස දන්දී මේ දිව්‍යසම්පත් ලත්බව සිහිකොට බොහෝ දෙනාට කුශලකර්මය ප්‍රකාශකරවන පිණිස පහළව සිටිනේය, එබැවින් සවාමිනි මම කියන්නේ කිමෙක්ද? මම කියන්නෙම්වීන්නම් මේ කඳුළුවාගෙන් ප්‍රයොජන කවරේද? මේ සලකුණෙන් කඳුළුමස් දුන් කුශලයෙන් මේ දිවඉසුරු ලද්දේයයි කියා දැන වදාළමැනවැයි කියේය, එකල්හි තෙරුන්වහන්සේ පිරිවර සහිතවූ ඒ දිව්‍යපුත්‍රයාට බණ වදාරා මිනිස්ලොවට වැඩ බුදුරජානන්වහන්සේට එපවත් සැලකළසේක, බුදුරජානන්වහන්සේ එම අත්ථාන්පත්ති කොට ගෙණ එතැන්හි පැමිණි පිරිසට බණ වදාළසේක. ඒ දෙශනාව බොහෝදෙනාට ප්‍රයෝජන විය.

මේ විමානවත්ථුප්පකරණයෙහි මහාරථ වර්ගයෙහි කඤ්චනථම්භදායක විමානවර්ණනාව නිමා නිමවනලදී.

තවද මේ විමානවත්ථුප්පකරණයෙහි මහාරථවර්ගයෙහි **නාගවිමාන් වත්ථුව** නම් කවරෙක්ද?

එක්සමයෙක දෙවාතිදෙවවූ භාග්‍යවත් බුදුරජානන්වහන්සේ සැවැත්නුවර ජේතවනාරාමයෙහි වැඩවසනසේක, එසමයෙහි මුගලන් මහතෙරුන්වහන්සේ යට කියනලද ක්‍රමයෙන් දෙවචාරිකාවෙන් වඩනාසේක් කවුනිසාභවනයෙහි ඇල්ඇන්වාහනාරූඪව දිව්‍යසෙනාව පිරිවරා ආකාශයෙන් යන්නාවූ එක්තරා දිව්‍යපුත්‍රයෙකු දැක සම්පයට වැඩ ඉදිරියෙහි වැඩසිටිසේක, ඒ දිව්‍යපුත්‍රයා තෙරුන්වහන්සේ දැක ඇන්කඳ පිටින් බැස තෙරුන්වහන්සේට නමස්කාරකොට දෙහොත් මුදුන් දී සිටියේය, දිව්‍යපුත්‍රයා කවරකුශලයකින් ඒ දිව්‍යසම්පත් ලද්දේදැයි යහළුහාන්–

ඝටිකාරදවස භාග්‍යවතුන් වහන්සේ ගව්රුදු බුබරාජ්‍යශ්‍රී වූ සියලු බුඛකෘත්‍යයන් කොට නිමවා පිරිනිවන් පෑ වදුළකල්හි ශ්‍රීසරීරය ආදාහණකළහැන්හි එකඝනවූ ධාතුවෝ සතරගවු පමණ මහත්වූ සත් රුවන් දගැබක් කොට පූජාසත්කාර කරණ සමයෙහි කිකිනම් මහරජානකෙණෙක් මහඇමතිවරුන්හා ගම් නියම්ගම් වැස්සන්හා ඇතුළු නුවර පිටිනුවර බොහෝදෙනාහා දවසින් දවස වඩවඩා නිරන්තරයෙන් මල්පූජා කෙරෙති, මෙසේ රාජරාජමහාමාත්‍යාදීන්විසින් නිරන්තරයෙන් මල්පූජාකරණ හෙයින් සමන්මල් ආදි මාහැඟි උතුම් මල් දුර්ලභවූයේය, එසමයෙහි එක්තරා උපාසකයෙක් කහවණු අටක් ගෙණ මාලාකාරවීථියට ගොස් මල් නැත්තෙන් කහවණු අටට මල් අටක් දෙවැයි කියා ඇවිද එක මලකුදු නොලැබ මල්වත්තට ගොස් මාලාකාරයාට මෙසේ කියේය, එම්බා මාලාකාරය මේ කහවණු අට නිසා මල් අටක් දෙවැයි කිය. එබසට මාලාකාරයා කියන්නේ හිමී මාවිසින් සඟවා තබනාලද කිසියම් මල්ජාතියක් නැත මල්වත්තේ හිඳ කිසිවක් නොනබා නෙලා දෙනලද්දේය බොහෝ මනුෂ්‍යයෝ මිළ දී මල් ගෙණ ගියහ, දැන් බුබ පසුව ආබැවින් කුමක් කෙරෙම්දැයි කියේය, එබසට උපාසකයා කියන්නේ ආරාමයෙහි කිසියම් ගසෙක සැඟවී තුබූ මල් මම ගොස් බලා සොයා නෙලා ගන්නා කැමැත්තෙමි කියේය එසේවීනම් ආරාමයට ගොස් බලා සොයා ගන්නැයි කිහෙයිත් උපාසකයාද යහපතැයි කියා මල්වත්තට වැද ඒ ඒ තැන බලා සොයන්නේ නටුවෙන් කිලිනි ගසමුල වැටී තුබූ මල් අටක් ලැබ මාලාකාරයාට කියන්නේ පින්වත මාවිසින් මල් අටක් සොයාගන්නාලද්දේය කහවණු අට ගණුවයි කිය, එකල්හි මාලාකාරයා කියන්නේ නුබ පිනින් ලද්දාවූ මලට මම මිළ නොගණිමියි ඒ ගෙණ ගොස් බුඛ පූජා කළමැනවැයි කියේය, උපාසකයානෝ නොමිළයේ මල් ගෙණ ගොස් බුදුන්ට පූජානොකරම් සිතා කහවණු අට මාලාකාරයා ඉදිරියේ තබා මල් ගෙණ චෛත්‍යාඛණයට ගොස් සතුටු සිත් ඇතිව රුවන් දගැබට පූජාකෙළේය, ඒ උපාසකයා එයින් අපරභාගයෙහි කාලක්‍රියා කොට තවුතිසා දෙවුලොව ඉපිද එහි ආයුප්‍රමාණයෙන් දිවඉසුරු විඳිමින් නැවත නැවතත් චුතිප්‍රතිසන්ධිවශයෙන් බුබාන්තරයක් මුලුල්ලෙහි දිවඉසුරු විඳ දෙව්ලොවම සැරිසරන්නේ මේ බුඛොත්පාදකාලයෙහිද තවුතිසා දෙවුලොව ඉපද ඇත්මාහනාරූඪව දෙවඟනන් පිරිවරා අහසින් යමින් සිට මහතෙරුන් දැක ඇතුපිටින් බැස නමස්කාර කොට එකත්පස්ව සිටියේය. මහතෙරහු ඒ දිව්‍යපුත්‍රයාගේ ඓශ්වර්‍යය සඳහන් දැක ඔහුවිසින් ගිහිජාතියෙහි කළාවූ කුශලකර්මය ලොවට ප්‍රකාශකරණු පිණිස මේ ගාථාවලින් මෙසේ විවාළසේක.

"සුසුකකබන්ධා අභිරුයහා නාගා
අකාවිනදන්තා බලං මහාජවං,
අභිරුයහ ගජවරං සුකපපිතං
කවාගමා වෙහාසයමන්තාලිකෙඛ.

නාගස්ස දන්තෙසු දුවෙසු නිම්මිතා
අවෙජාදකා පදුමිණියෝ සුඵුල්ලා,
පදුමෙසු චතුරියගණා පවජ්ජරෙ
ඉමා ච නවවන්ති මනොහරායෝ."

යනුහෙයින් එම්බා දිව්‍යපුත්‍රය තාගේ මේ උත්තම වාහනයවූ හස්තිරාජයාගේ සතර පාදයද වස්තිකොෂයද මුඛප්‍රදේශයද දෙකන් තලවාළයිද යන මේ රත්නවර්ණයෙන් බබලන්නාවූ මෙකී අවයවයන් තබා සියලු සවිවාහය රිදිපළිතයක්සේ ඉතා ධවලවෙයි ආජානීය ලක්ෂණවූ ජවබලසම්පන්නවූ ආකාශචාරිවූ රන්සැත් රන්පොරොදු කුම්භාලඞ්කාරාදි නොයෙක් හස්ත්‍යාලඞ්කාරයෙන් සැරහුනාවූ රන්කුප්පිහා රැස් විහිදෙන්නාවූ දළසඟලින්හා කුශලකර්මයෙන් නිර්මිතව පවත්නාවූ මේ ඇතුගේ දළ දෙකෙහි ප්‍රසන්නවූ සිහිල්ජලයෙන් පිරි නිබෙන්නාවූ පොකුණුවල පිපිවැනිගිය දිවසුවඳ විහිදෙනා පදුම වනයෙන් ගැවසිගත්තේය ඒ පියුම්පෙතිවල දිව්‍යාඟනාවෝ සවිවාභරණයෙන් සැරහී හෙරි වීණාදි තූර්‍යභාණ්ඩ ගෙණ නටමින් ගායනා කෙරෙමින් රූපශබ්දාදි පඤ්චකාමසම්පත්තියෙන් තොප සන්තර්පණය කරන්නාහුය, එම්බා දිව්‍යපුත්‍රය මේ සම්පත් ලැබීමට කළාවූ කුශලකර්මය කවරේදැයි විචාරා වදාළසේක, මෙසේ මුගලන් මහතෙරුන් වහන්සේ විසින් විචාරණලද පැනය විසඳන්නාවූ දිව්‍යපුත්‍රතෙම මේ ගාථාවලින් කුශලකර්මය ප්‍රකාශකොට කියේය.

"අඤ්ඤෙව මුත්තාපුප්ඵානි කාසපස්ස මහෙසිනෝ,
ථූපස්මිං අභිරොපෙසිං පසන්නා සකෙහි පාණිහි.
තෙන මෙ තාදිසෝ වණ්ණෝ තෙන මෙ ඉධ මිජ්ඣති,
උපපජ්ජන්ති ච මෙ භොගා යෙකෙචි මනසෝ පියා."

යනුහෙයින් ස්වාමිනි මම යටගියදවස කාශ්‍යපබුදුන් සමයෙහි මිනිස්ලොව උපන් කල්හි නටුවෙන් ගිලිහි හස මුල හුනු මල් අටක් දැක ගෙණ ගොස් කාශ්‍යපබුදුන්ගේ ධාතු වයා බදනාලද දගැබට පහන් සිත්ඇතිව සියඅතින් පූජාකෙළෙමි, ඒ කුශලකර්මය හෙතුකොටගෙණ මේ දිව්‍යශ්‍රීසම්පත් ලදිමිහි කියේය, එකල්හි ආයුෂ්මත් මුගලන් මහතෙරුන්වහන්සේ ඒ දිව්‍යපුත්‍රයාට විස්තරවශයෙන් බණවදාරා මිනිස්ලොවට වැඩ බුදුන්ට එපවත් දන්වූසේක,

බුදුරජානෝ එම අතෝත්පත්තිකොට ගෙණ එතැන්හි රැස්වූ පිරිසට ධම්මදෙශනා කොට වදළසේක, ඒ ධම්මදෙශනාව බොහෝදෙනාට සාර්ථක විය.

මේ විමානවත්ථුප්පකරණයෙහි මහාරථවගිහයෙහි නාගවිමානවණ්ණනාව නිමවනලදි.

තවද මේ විමානවත්ථුප්පකරණයෙහි මහාරථවගිහයෙහි **තිස්ස නාගවිමානවත්ථුව** නම්කවරයත්?

සකලඥුණනිධානවූ භාග්‍යවත් බුදුරජානන්වහන්සේ එක්සමයෙක් හි රජගහනුවර කලන්දකනිවාපනම්වූ වෙලුවනාරාමයෙහි වැඩවසන සේක, එසමයෙහි රහතුන් තුන්දෙනෙකුත්වහන්සේ ගාමාන්තරයෙ නාසනයෙහ වස්විසූහ, වසනලද වස්ඇති ඒ තෙරුන්වහන්සේලා තුන්නම වස්පවරා අන්තයෙහි බුදුන් වඳින්ට යම්හෑ කිසා ඒ සෙනා සනය තැන්පත් කොට තබා මගට පැමිණ රජගහනුවර උදෙසා ඒ නුවර දිශාවට අභිමුඛව වඩනාහු සවස්වේලෙහි අතුරුමඟ එක්තරා මිථ්‍යාදෘෂ්ටිබ්‍රාහ්මණයෙකුගේ උක්කෙතක් සමීපයට ගොස් උක්කෙහ රක්ෂාකරණ පුරුෂයා අතින් විචාරන්නාහු ඇවැත්නි අද අපට රජ ගහනුවරට යන්ට පිළිවන්දැයි විමාළහ. එකල්හි ඉක්ෂුපාලයා කියන් නේ ස්වාමිනි මෙතැන්පටන් රජගහනුවර අඩයොදුන් පමණ වෙයි දැන් සවස්වූහෙයින් වැඩිය නොහැක්ක අද මෙතැන්හි වැඩසිට සෙට වැඩිය මැනවැයි කිය, ඒ වහන්සේලා වදරන්නාහු ඇවැත්නි මෙහි අප විසිමට සුදුසු කිසියම් ආවාසයක් ඇද්දැයි විමාළහ, නැවත වහන්ස එතකුදුවුවත් නුබවහන්සේලාට ආවාසයක් මම දෙන්නෙම් වේදැයි කිය, තෙරුන්වහන්සේලාද ඉවසා වැඩසිටියාහ, ඒ ඉක්ෂුපාල යා ආවාසයකරන්නේ එසේම නිබ්‍යදි උක්දඬුගස් කිපයක් එක්කොට මණ්ඩපාකාරයෙන් බැඳ මත්තෙහි උක්කොල වසා බිම පිදුරු අතුට ආසනය පනවා එක් තෙරකෙණෙකුන්ට දුන්නේය, නැවත දඹු තුණක් දණ්ඩාකාරයෙන් බැඳ මත්තෙහි තණයෙන් වසා බිම තණ අතුට දෙවෙනි තෙරුන්වහන්සේට දුන්නේය, ඉක්බිති තමන් වසන ගෙයින් දෙතුන්දණ්ඩක්ඛා සාඛාකිපයක් ගෙණ මනාකොට බැඳ පිලියෙන් වසා පිලිකුටියක් කොට අනිත් තෙරුන්වහන්සේට දුන් නේය, ඒ තුන්දෙනාවහන්සේම එදවස් එතැන්හිම විසූහ. ඉක්ෂුපාල යා එදවස් රාත්‍රියගේ ඇවෑමෙන් කල්ඇතිව ආහාර පිළියෙළ කොට අරුණට පළමුවෙන් දුවිටි දඬුහා මුවදෙවුහා පැන් දී උදය උක්

සකුරුණා සමණ ආහාර වලඳවා වලඳ ඉක්බිති අනුමෙවෙනි බණ වදුරා වඩහා උන්වහන්සේලාට මාගේ කොටස වන්නේයයි කියා එක එක උක්දණ්ඩ බැගින් පූජා කොට පසු ගමන් පිණිස උන්වහන්සේලාහා සමග මහට බැස මදතැනක් ගොස් වැලකි සිටින්නේ තමන්ගේ ආගන්තුන උපකාරයත් දැනයත් සිහිකොට ඒ සුචරිතකර්මය අරභයා උදුරතරවූ ප්‍රීතිසොමනස් උපදවා සතුටු සතුටුව කෙතට යමින් සිටියේය, උක්කෙත හිමි මිථ්‍යාදෘෂ්ටික්‍රාහ්මණයා කෙතට එන්නේ උන්වහන්සේලා ඉදිරියට පැමිණ අත තුබූ උක්දඬු දැක මේ උක්දඬු නුබ වහන්සේලා කොසින් ලබනලද්දේදැයි විචාරා ඉක්ෂුපාලයාවිසින් දෙනලදැයි කිහ. එබස් අසා බමුණා තමන් මිථ්‍යාදෘෂ්ටි බැවින් දැණෙඩින් ගැසූ නයෙකුසේ කිපි නොසතුටුව තට තට ඇන අනුකරණ ඇතිව ක්‍රොධයෙන් දිලිහි ඔහුපස්සේ දිව අත තුබූ මුතුරෙන් පහරන්නේ එක පහරින්ම ජීවිතය විනාසකෙළේය. ඉක්ෂුපාලයා තමාවිසින් කරණලද කුශලකර්මය සිහිකොට සුදම්දෙවිසහාවෙහි උපන්නේය, ඔහුගේ කුශලානුභාවයෙන් උතුම්වූ මහත් දිව්‍යමය ඇත්වාහනයෙක් පහළවිය, ඉක්ෂුපාලයා මළපවත් අසා ඔහුගේ මවුපියන්හා අවශෙෂ නැයෝ අඩාවැලප කඳුලු මුසු මුහුනින් යුක්තව එතනට පැමිණියාහ, සියලු ගම්වැසි මනුෂ්‍යයෝද එතැන්හි රැස්වූහ, මවුපිය දෙදෙන ශරීරය ආදාහන කරන්ට ආරම්භවූන, ඒ දිව්‍යපුත්‍රයා ඔහුගේ දිවඉසුරු දැක කොසින් වුතව කවර කුශලයකින් අවුත් මෙහි උපනිම්දැයි පරීක්ෂාකරන්නේ තමන්ගේ පූර්වචරිතය දැක තුන්රුවන් ගුණ ලොවට ප්‍රකාශ කෙරෙමි සිතා රන්පෝදු මිණි කිංකිණිකාදි නොයෙක් ගෘහාලඞ්කාරයෙන් අලඞ්කෘතවූ ඇතු පිටට පැන නැඟි පඤ්චාඟික තූර්‍යභාණ්ඩ ගත් නලුනාටක සමූහයා පිරිවරා එකපැහැර පඤ්චාඟික තූර්‍යඝොෂා කරවමින් මහත්වූ දිව්‍යඍද්ධියෙන් මිනිස්ලොවට අවුත් එතැන්හි රැස්වූ පිරිස් මැද දෘශ්‍යමානරූපයෙන් සියල්ලට පෙණී පෙණී හිරුවිමනක්සේ ආකාශයෙහි සිටියේය, එකල්හි එතැන්හි රැස්වූ මිනිසුන්අතුරෙන් එක්තරා පණ්ඩිතපුරුෂයෙක් ඒ දිව්‍යපුත්‍රයාවිසින් කරණලද කුශලකර්මය මේ ගාථාවලින් විවාළේය.

"කොනු දිබ්බෙන යානෙන සබ්බසෙතෙන හත්ථිනා,
තූරියතාලිතනිග්ඝොසො අන්තලික්ඛෙ මහීයති.

දෙවිතානුසි ගන්ධබ්බා ආදු සක්කො පුරින්දදෙ,
අජානන්තා හං පුච්ඡාම කථං ජානෙමු තං මයන්ති."

යනුවෙතින් එම්බා දිව්‍යපුත්‍රය සච්චාභබවලවූ ඇත්වාහනාරූඪව අවුත් ආකාශයෙහි බබලන්නාවූ තොප සතුටු කරවමින් නලුනාටක සෙනාවෝ හෙරිවිණාදි තූර්‍යභාණ්ඩ ශෙණ පඤ්චාඟිකතූර්‍යඝොෂා

භවත්වමින් නොපව පූජාසත්කාර කෙරෙනි. මෙබඳු පූජාසත්කාර විඳී මින් දිලියෙන්නාවූ නෝ දෙවතාකෙණෙක්ද? නොහොත් ගඤ්ඤව ගේක්ද? ශක්‍රදෙවෙඳුයාද? නොපි කව්රුන් බවත් අපි නොදනුම්හ, අපට ප්‍රකාශකොට කිඹවයි කියේය, එඛස් අසා ඒ පැනය විසඳන්නාවූ දිව්‍යපුත්‍රතෙම මෙසේ කියේය.

"නමහි දෙවෝ න ගඤ්ඤබ්බා නපි සක්කෝ පුරින්දදෙ,
සුධම්මා නාම තෙ දෙවා තෙසං ඇඤ්ඤතරෝ අහන්ති."

යනුහෙයින් එම්බා පින්වත න ම අවශෙෂ දෙවතා යොණෙකුන් නොවෙමි ශක්‍රයාත් නොවෙමි නවුනිසා වැසි දෙවියන් අතුරෙහි සුධ ම්මානම්වූ යම් අනතුරු දිව්‍යනිකායෙක් ඇද්ද ඒ දෙවතාවන්අතු රෙන් එක්තරා මහානුභාවසම්පන්න දිව්‍යරාජයෙක් වීමි කියේය, ඉක් බිනි ඒ පණ්ඩිතපුරුෂයා මෙසේ විචාළේය.

"පුච්ඡාම දෙවං සුධම්මං පුට්ඨා කඞ්ඛාන ඇඤ්ජලිං,
කං කඞ්ඛා මානුසෙ කම්මං සුධම්මං උපපජ්ජති'නි."

යනුහෙයින් එම්බා සුධම්මානම් දිව්‍යපුත්‍රය නුබවහන්සේට නම ස්කාර ඉකොට ඇදිලි බැඳ විචාරම්හ, දානශීලාදි වශයෙන් සඞ්ඝයෝ මිනිස්ලොවදි කවර කුශලයක් කොට සුධම්මානම් දිව්‍යනිකායෙහි උපදින්දැයි විචාළේය, ඒ දිව්‍යපුත්‍රයාගේ කුශලකම්මය අරහයා විචා ළහෙයින් එඛස් අසා අනිකුදු දානශීලාදි වශයෙන් කුසල් කළවුන් එහි උපදනාහු වීනමුදු තමන් කළ කුශලයම ප්‍රකාශ කොට කියන්නේ මේ ගාථාවෙන් ප්‍රකාශකෙළේය.

"උච්චාගාරං නිණාගාරං විත්තාගාරඤ්ච යො දදෙ,
නිණණමඤ්ඤතරං කත්වා සුධම්මං උපපජ්ජති'නි."

යනුහෙයින් එම්බා පින්වත්නි මේ ලොකයෙහි යම් කිසිකෙණෙක් උක්දණෙඩන් ගෙයක් ඉදිකොට උක්කොල වසා කළ උක්පැලක් වේවයි තණ වසා කළ වල්පැලක් වේවයි පිලි වසා කළ පිලිකුටියක් වේවයි මේ ත්‍රිවිධකුටින්අතුරෙන් එක්තරා ගෙයක් කොට භික්ෂුසඞ්ඝ යාට පිළිගන්වා එහි වඩාහිඳුවා උපකාර කෙළේවිනම් ඒ සැබෑතෙම තවුතිසාදෙව්ලොව සුධම්මානම් දිව්‍යනිකායෙහි උපදනේයයි කියා තමන් උක්කෙත රකුණාකළ නියාවන් සකස්කොට තෙරුන්වහන්සේ ලාට කළ ආගන්තුක උපකාරයත් ඒ කුශලයෙන් දෙවිලොව උපන් නියාවත් කියා තමන්ගේ මෘතශරීරයත් දක්වා ඉක්බිනි ත්‍රිවිධරත්න යෙහි ගුණ කියා මවුපියන්ගා සම්බන්ධ ප්‍රියකථා කොට අප ලත් දිවඉසුරු ලබනපිණිස අප්‍රමාදව කුසල් කළමැනවැයි කියා අවවාද කොට දෙව්ලොවටම නියේය. මනුෂ්‍යයෝ ඒ දිව්‍යපුත්‍රයාගේ වචනය අසා

බුදුන්කෙරෙහිද සඞ්ඝයාකෙරෙහිද පැහැද ආදර බහුමාන ඇතිව බොහෝසේ දානොපකරණ සපයා ගැල්වල පුරා වෙළුවනාරාමයට ගොස් බුදුපාමොක් මහසඟනට දන් දී ඉක්බිති සියලුම ප්‍රවෘත්තිය බුදුන්ට සැලකළෝය. බුදුරජානෝ ප්‍රඥාවිසජ්ජනා දෙක එසේම වදාරා එම අනෝතත්තාදී කොට ගෙණ ඔවුන්ට විස්තරවශයෙන් බණ වදාරා ඔවුන් සරණසිලයෙහි පිහිටුවා වදාළසේක, ඒ බණ අසා ශ්‍රද්ධාවෙන් පිනිටියාවූ උපාසකවරු බුදුන් වැඳ අවසර ගෙණ තමන් ගමට ගොස් ඉක්ෂුපාලයා මළතන්හි විහාරයක් කැරවූහ.

මේ විමානවත්ථුප්පකරණයෙහි මහාරථවගීනයෙහි තතියනාග විමානවණ්ණනාව කියා නිමවනලදී.

නවද මේ විමානවත්ථුප්පකරණයෙහි මහාරථවගීනයෙහි **චූලරථවිමානවත්ථුව** නම් කවරයත්?

සකලඥුණනිධානවූ භාග්‍යවත් බුදුරජානන්වහන්සේ සියලු බුඩකෘත්‍යයන් කොට නිමවා පිරිනිවන්පෑ වදාළකල්හි ධාතු බෙදා ගෙණ ඒ ඒ තැන්හි ධාතු පිහිටුවා දගැප් බඳනට පටන්ගත්තාහුය, එසමයෙහි ධාතුබෙදන තැනට රැස්වූ මහාශ්‍රාවක්යන්අතුරෙන් ආයුෂ්මත් මහා කාශ්‍යපස්ථවිරයන්වහන්සේ ප්‍රධානකොටඇති පන්සියයක් පමණ ක්ෂීණාශ්‍රව මහාසඞ්ඝයාවසින් ධර්මසඞ්ගායනා කිරීම රජගහනුවරදී වන්නේයයි කියා නියමකොට ගෙණ ශ්‍රාවකසන්නිපාතයට නියමවූ ඇසළපුර පසළොස්වක් දිනය සම්ප්‍රාප්තවනතෙක් විනෙයජනයන් දක්නා පිණිස තමතමන්ගේ පිරිස්හා සමග ඒ ඒ තැන්හි වසනකල ඒ මහාශ්‍රාවකයන්අතුරෙන් ආයුෂ්මත්වූ කාත්‍යායනමහතෙරුන්වහන්සේ එක්තරා ප්‍රත්‍යන්තදෙශයෙක එක්තරා වනඛණ්ඩයක් නිසා වෙත්‍යසථානයෙක වැඩවසනසේක, එසමයෙහි අස්සක රට පෝතලිනුවර අස්සකනම් රජ්ජුරුකෙණෙක් රාජ්‍යයකෙරෙයි ඒ රජහුගේ අග්‍රමහෙසි කාදේවින් කුස ඒ රජුනිසා උපන් සුජාතනම්වූ සොළොස් හැවිරිදි කුමාරයෙක් පියරජහුවිසින් අනික් කුඩා බිසවක් කෙරෙහි බැඳී රටින් නගනලදුව වල්වැද වනචරකයන් නිසා වනයෙහි වෙසෙයි.

ඒ කුමාරයාගේ උත්පත්තිකථාව කෙසේදයත්?–ඒ සුජාතකුමාරයා වනාහි ඉටහිසදවස කාශ්‍යපබුදුන් සමයෙහි බුදුසස්නෙහි පැවිදිව අධිගමඥතට පැමිණ ගතනොහි ශීලයෙහි පමණක් පිහිටියේ පෘථග්ජනව කාලක්‍රියාකොට තවුතිසා දෙවුලොව ඉපද එහි ආයුප්‍රමාණින් දිවඉසුරු විඳ නැවත නැවතත් සුගතියෙහිම සැරිසරන්නේ මේ බුඩොත්පාද

කාලයෙහි අපමහා ගෞතමබුදුරජානෝ ශ්‍රීමහාබොධිමූලයෙහිදී ළොව්තුරා බුදුවූ දවස්පටන් නිස්වනවසීයෙනි අසඝකනම් රට පොතලිනුවර අසඝකරජහුගේ අග්‍රමහෙසිකාදෙවින් කුස උපන්නේය, ඕහට සුජාත කුමාරයෝයයි නම් විය. ඒ සුජාතකුමාරයා මහපිරිවරින් දෙවුකුමරු වකුසේ වැඩෙයි. එසමයෙහි මැනියෝ කාලක්‍රියාකළාය, එකල්හි රජ්ජුරුවෝ අනික් බිසවක් අග්‍රමහෙසිකාස්ථානයෙහි තුබුයේය. එයින් පසු නොබෝකලකින් ඒ බිසවද රජුනිසා කුමාරයෙකු වැදිය. රජ්ජුරුවෝ ඈගේ පුතුයා දැක සතුටුව එබිබා සොඳුර මෙබඳු පුත්රුවනක් වදා දුන් නිවසින් කැමැත්තක් ගණුවයි කියා වර දුන්නේය, ඒ බිසවද දෙවයෙනි මාවසින් වර ගන්නාලද්දේය එනකුදුවුවත් මට ප්‍රයොජනයක් ඇතිවිට ගණිමි කියා වර නොගෙණබා යම්කෙලෙක සුජාතකුමාරයා සොළොස්හැවිරිදි වයසට පැමිණියේද එකල්හි බිසව සිතන්නී මේ සුජාතකුමාරයාට රාජ්‍යය දුනහොත් නපුර රට පළමු වෙන් වර ගතමැනවැයි සිතා රජ්ජුරුවන්ට මෙසේ කිය. දෙව ඝන්වහන්ස පෙර දවසෙක මප්‍රුතනුවන් දැක සතුටුව නුබවහන්සේ විසින් වරයක් දෙනලද්දේය. ඒ වරය මට දුන් දුනමැනවැයි කිව, වර ගණුවයි දෙවිනි කිහ. එසේවිනම් මප්‍රුතනුවන්ට රාජ්‍යය දෙවයි කිව. රජු එබසට කිපී වඤ්ඣාලිය නි කුමක් කියයිද දිව්‍ය කුමාරයෙකුසේ මාගේ ජ්‍යෙෂ්ඨපුතුවූ සොළොස්හැවිරිදි සුජාතකුමාරයන් සිටියදී කවරහෙයකින් මෙසේ කිහයිද කුමක්පිණිස නිගේ පුතුට රාජ්‍යය දෙවයි කියාදැයි ප්‍රතික්ෂේපකෙළේය. බිසව නැවත නැවතත් යාච්ඤාකරන්නී සිත්හතනොහී එක්දවසක් මෙසේ කිව. දෙවයෙනි නුබ සත්‍යයෙහි පිහිටිසේක්වීනම් මප්‍රුතුහට රාජ්‍යය දෙවයි කිව, එබසට රජ්ජුරුවෝ සිතන්නේ මාවසින් නොසලකා මෑහට වර දෙනලද්දේය. මේ බිසවද හැමවේලෙහිම වේ වචනයම කියයි සිතා විපිළිසරවූ සිත්ඇතිව සුජාතකුමාරයා ලහට කැඳවා එපවත් කියා ශොකකෙරෙමින් දැසින් කඳුලු ඉහලුහ. සුජාතකුමාරයෝ ශොකයෙන් හඬන පියානන් දැක බලවත්වූ දෙම්නයට පැමිණ දැසින් කඳුළු පවත්වා කියන්නේ දෙවයෙනි නුබවහන්සේ මට අවසර දෙන සේක්වීනම් අනික් නැහැකට යෙමි කියේය. එබස් අසා අනික්නුවරක් නිමවා දෙමි එනි වසටයි කියා රජවසින් කියනලදකල්හි කුමාරයා නොකැමැතිවිය. මාගේ යහලුවූ රජදරුවන් සම්පයට යවා පොෂ්‍යය කරමි කිහ. එකල්හි එසිදු කුමාරයා නොකැමැතිව දෙවයෙනි හුද කළාව වලට යෙමි කිහ. එකල්හි රජ්ජුරුවෝ පුතනුවන් දැනින් වැලඳ ඉස සිඹ සනහා මාසිටිනානෙක් තොප මලනුවෝ රාජ්‍යය කෙරේවයි මානැතිහාල මේ නුවරට අවුත් තොපයනු රාජ්‍යයෙහි පිහිට

රාජ්‍යය කාරවතී කියා අවවාදකොට යවූහ. ඒ කුමාරයාද රජ්ජුරුවන් වැඳ අවසර ගෙණ මැනියන් නැති අඩුව සිතසිතා මහදුක් උසුලමින් වල් වැද වල්මැද්දන් නිසා වසන්නේ එක්දවසක් මෘගඝාතකරාදීන් සොයා ඒ වළ දඩයමට ගියේය. සුජාතකුමාරයෝ පෙර කාශ්‍යපබුදුන් සමයෙහි පැවිදිව වසනකල්හි යහලුව මහණදම් පුරා ගැසුරුණාවූ එක් තරා දිව්‍යපුත්‍රයෙක් ඔහුකෙරෙහි කරුණාවෙන් සසරදුකින් මුදවම් සිතා මුවමවසක් මවා කුමාරයාට පෙණී පලොභනය තෙරෙමින් දිව ගොස් කාත්‍යායනගොත්‍රතෙරුන්වහන්සේගේ පන්සල සමීපයට පැමිණ අන්තර්ධාන විය. ඒ කුමාරයාද මුවා දුන්ම ගණිමි දුන්ම ගණිමියි පසු පස්සෙහි දිවන්නේ තෙරුන්වහන්සේ වසන තැනට පැමිණ මුවා නොදුක පන්සලින් පිටත වැඩහුන් තෙරුන්වහන්සේ දුක උන් වහන්සේ සමීපයෙහි දුනුකෙළවර බිම ඔබා දුන්නේ එලි සිටියේය. තෙරුන්වහන්සේ ඔහු දිගාව බලා කුමාරයා සිටිනාලෙස දුක ආදි යෙහි පවත් ඔහුගේ සියලුම ප්‍රවෘත්තිය දිව්‍යඥානයෙන් දැන ඔහුකෙරෙහි කරුණාවෙන් කථාකිරීමට අවකාස දෙමි සිතා ඕහට සඞ්ග්‍රහ කරණසේක් නොදන්නාසේ මෙසේ විචාළසේක.

දළ්හධම්මා නියාරයස්‍ස ධනුං ඔලුබ්භ තිට්ඨසි,
ඛත්තියොනුසි රාජඤ්ඤ, ආදු ලුද්දෝ වනෙචරෝ'ති.

සත්‍වඥයින් දුන්න නගා දුනුදිය මැද ලොහෝ රියම් ආදි යම්කිසි බරක් බැඳ දුනුදණ්ඩමැදින් අල්වා ගෙණ කරපමණතැන් දක්වා උඩනගා ගත්කාල ලෝහාදි බර බිමින් ඉහිල එසවිහිසේනම් දෙදහසක් නගනලද දළහධනුනම් වෙයි, එබදු දෙදහසක් බල දරන්නාවූ විශිෂ්ටවූ හරඇනි වාක්‍යයෙන් මනාකොට සඳ නගනලද දුන්නක් ගෙණ එක් කෙළවරක් බිම ඔබා අනික්කෙළවර එලිසිටිනාවූ තෝ ශාක්‍යරාජකුමාරයෙක්ද? නොගොස් මේ වළ වසන වල්මැද්දෙක්හිද? මේ දෙපක්‍ෂයෙන් පිටත් අනික් රජදරුකෙණෙක්හිදැයි විචාරා වදාළසේක. එකල්හි ඔහු තමන් රාජකුමාරබව ප්‍රකාශකොට කියන්නේ–

අස්සකාධිපතිස්සාහං භත්තෙන පුත්තෙනා වනෙචරෝ,
නාමං මෙ භික්ඛු තෙ බ්‍රූමි සුජාතෝ ඉති මං විදූ.

සත්‍වඥයින් ස්වාමිනි අස්සක රට වැස්සන්ට අධිපතිවූ අස්සකරජහු ගේ පුත්‍රවූ සුජාතකුමාරයෝනම් මමය මාගේ නම නුබවහන්සේට කියමි මම සුජාතකුමාරයෝයැයි කියා දැන වදාළමැනව භූරන් මුවන් සොයා මේ වළ හැසිරෙන්නාවූ සුජාතකුමාරයෝයැයි කියා රටවැස්සෝ දනිති කිහ. එබස් අසා මහතෙරහු ඔහුහා සමඟ පිළිසඳරකථා කොට ඍගන්තුකඝතකාර පිණිස මෙසේ වදාළසේක.

යාවාගතං තෙ මහාපුඤ්ඤ අථෝ තෙ අදූරාන ධා,
එතෙනා උදකමාදාය පාදපක්ඛාලයන්තු තෙ.
ඉදං හි පානීයං සීතං ආගතං ගිරිගබ්භරා,
රාජපුත්ත තතෝ පිබා සඤ්ඤතයිං උපාවිසා'හී.

යනුහෙයින් එම්බා රාජකුමාරය, දුරන් මුවන් සොයා යනගමනක් සේ නරකාදි දුකට පැමිණියයුතුවූ ගමනෙක් නොවෙයි දැන් මෙත නට ආගමන ප්‍රීති සොම්නස් ඉපදිම්වශයෙන් සියලු බැඩට කාරණාවූ යහපත් ගමනෙක මේ පැන් ගෙණ පාදධොවනය කරව මේ ගිරිලෙණ පැන් නිම්මලවූ සිහිල් පැන් වන්නේය. එයින් පැන් ගෙණ බී පිඩා සන්සිඳුවා මෙතන ඇතිරියේ හිඳ ශරීරය සනපාගණුවැනි වදළසේක. එබසට රාජකුමාරතෙම තෙරුන්වහන්සේගේ වචනය මුදුනෙන් පිළි ගෙණ ඒ ආගන්තුකඝත්තකාර ඉවසමින් මෙසේ කිහ.

කල්‍යාණී වත තෙ වාචා සවණීයා මහාමුනි,
නෙලා අත්‍ථවති වහකු මන්ත්‍රා අත්‍ථඤ්ච භාසසෙ.
කා තෙ රති විහරතෝ ඉසිනිසභ වනෙ නති පුත්‍රෝ,
නව වචනපථං නිසාමයං අත්‍ථං ධම්මපදං සමාචරෙමසෙ'නි.

යනුහෙයින් සවාමිවූ උත්තමඍෂීන්වහන්ස නුබවහන්සේගේ වච නය කණට මිහිරිව ඇසියයුතුහෙයින්ද අර්‍ථසහිතව ඉතා යහපත් වන්නිය. මෙලෝ පරලෝ වැඩ අවැඩ ප්‍රභුවෙන් පිරිසිඳ දැන ධර්‍මාන්විතව කියනසේක. සියලු සෘෂීන් අතුරෙන් ශ්‍රෙෂ්ඨර්ෂිවූ උතුමානන්වහන්ස, මේ ජනශූන්‍යවූ වනයෙහි වසන්නාවූ නුබවහන් සේට කවර ඇල්මක්ද? නුබ සිනින් කවරක් අරමුණුකොටගෙණ කමපානොව වසනසේක්ද? උභය ලොකාර්‍ථාධිගමයට උපායසහිතව කියන වචනමාර්‍ගය අසා ඉහලොක පරලොක දෙක්හිම අර්‍ථාවහ හිතාවහ වන්නාවූ ශීලාදිධර්‍මකොඨාසයෙහිම පිළිපදුම්හයි කියා තෙ රුන්වහන්සේගේ ගුණ කියා ඒ ගුණයෙහි හැසිරෙණපිණිස පිළිවෙත් විවාළේය. එකල්හි මහතෙරහු දැන් ඔහට සුදුසුපරිද්දෙන් තමන් වහන්සේගේ පිළිවෙත් කියන්ට වටනේයයි සිතා මෙසේ කිසේක.

අහිංසා සබ්බපාණානං කුමාර අම්හාකං රුච්චති,
අථෝ‍ය්‍යා ච අහිචාරා ච මජ්ජපානා ච ආරති.
ආරති සමචරියා ච බාහුසච්චං කතඤ්ඤුතා,
දිඨධම්මපරත්‍ථං ච ධම්මා එතෙ පසංසියා'නි.

යනුහෙයින් එම්බා පින්වත් රාජකුමාරය සියලු සත්වයන්ට හිංසා පිඩා නොකිරීමද සොරකම්නොකිරීමද සත්‍රීසෙවනය නොකිරීමද

බොරු නොකිමද රහමෙරින් වැළකිමද මෙකී දේ අපට රිසිවන්නේය ත්‍රිවිධ දුසිරිතෙහින් දුරුව ත්‍රිවිධ සුචරිතයෙහි හැසිරිමද බහුශ්‍රැතව සපයෑපනික නවලෝකොත්තරසද්ධම්මයෙන් යුක්ත කථාකිරිමද උප කාරසැලකිම්වශයෙන් කෙමෙලහිගුණ දන්නාබවද ඉහලොක පර ලොක දෙක්හිම සත්ත්වයන්ට හිත සැප ඵලවනහෙයින් මෙකී ධම්මයෝ ප්‍රශංසා කටයුතුවන්නාහුය, එසේ බුදුපසේබුදුමහසවුවන්විසින් ප්‍රශං සාකටයුතුවූ ප්‍රතිපත්තිධම්මයෙහි පිහිටියම්හයි කියා ඔහට අනුරූප පරිද්දෙන් සම්‍යක්පිළිවෙත් වදුරා ඉස්බිනි අනාගතඤනයෙන් ඔහු ගේ ආයුසංඛාරය බලන්නේ පස්මසක්පමණ ආයු වන්නේයයි දැක ඔහට සංවෙගඵලපදවා දැඩිකොට ප්‍රතිපත්තියෙහි පිහිටුවනුපිණිස මේ ගාථාව වදළසේක.

සන්තිකෙ මරණං තුය්හං ඔරං මාසෙහි පඤ්චහි,
රාජපුත්ත විජානාහි අත්තානං පරිමොචයා'ති.

යනුහෙයින් එම්බා රාජකුමාරය පස්මසකින් මෙපිට නෝ මරණට පැමිණෙන්නෙහිය, එබැවින් මරහු තට සමීපවියහි කියා දැනගණුව මරහු ලංවියහි සිතා අපායාදිදුකින් මිදෙන්ට උනසාහකරවයි වදළ සේක, රාජකුමාරයා එබස් අසා තමන් ඒ දුකින් මිදිමට උපාය විචා රන්නේ මෙසේ කිහ.

කතමං ඤාහං ජනපදං ගන්ත්වා කිං කම්මං කිව පොරිසං,
කාය වා පන විජ්ජාය භවෙය්‍යං අජරාමරෝ'ති.

යනුහෙයින් ස්වාමිනි කවරදනව්වකට කවරදෙශයකට ගොස් කවර පුරුෂබලපරාක්‍රමයකින් කවරවිද්‍යාවත් කවරශාස්ත්‍රයක් කවරමන්ත්‍ර යක් ඉගෙණ කවරඋපායකින් අජරාමරවෙම්දැයි විචාළේය, එබසට මහතෙරහු ඔහට බණ වදාරණපිණිස මේ ගාථාවෙන් වදළසේක.

න විජ්ජතෙ සො පදෙසෝ කම්මා විජ්ජාව පොරිසං,
යත්ථ ගන්ත්වා භවෙ මවෙවා රාජපුත්තාජරාමරා.

මහධනා මහාභොගා රඤ්ඤෙනාපි ඛත්තියා,
පහූතධනධඤ්ඤයෝ න තෙපි අජරාමරා.

ඛත්තියා බ්‍රාහ්මණා වෙස්සා සුද්දා ච ණ්ඩාලපුක්කුසා,
එතෙ චඤ්ඤෙ ච ජාතියා තෙපි න අජරාමරා.

යනුහෙයින් එම්බා රාජකුමාරය මේ ලොකයෙහි අජරාමරදෙශ යෙක් වේවයි දිපයක් වේවයි ජනපදයක් වේවයි.යම්කිසි පුරුෂපරාක්‍රම යක් බලපරාක්‍රමයක් වේවයි විද්‍යාවක් වේවයි මන්ත්‍රයක් වේවයි එකා නත්‍රයන්ම අජරාමරවීමට නිසිඋපායෙක් නැත්තේමය නිවන්පුරය

හැර මනුෂ්‍යත්වය අනික් යම්කිසි තැනකට ගොස් අජරාමර වෙයි යන සිතක් ඇද්ද එබඳුවූ කම්මවිපාකයෙන් මිදීමට නිසිතැනක් එකාන්තයෙන්ම නැත්තේයයි කියා ජාතිජරාමරණාදියෙන් මිදීමට නිසිතැනක් නැතිබව හඟවා සියල්ලම ශාස්වතවශයෙන් නියතනොවනබව ප්‍රකාශකොට වදාරණසේක්, එම්බා රාජකුමාරය දවසකට සියක්කෙළක් ධන නිධානගතවන්නාවූ පිසිඅමුණක් වියදම්වන්නාවූ ක්ෂත්‍රියමහාසාරකුලයෙහි උපන්නාහුද අසූකෙළක් ධන නිධානගතවන්නාවූ දසාමුණක් වියදම්වන්නාවූ බ්‍රාහ්මණමහාසාරකුලයෙහි උපන්නාහුද සතළිස්කෙළක් ධන නිධානගතවන්නාවූ ගෘහපති මහාසාරකුලයෙහි උපන්නාහුද තමන්පිරිස හා බොහෝදෙනාට සත් අට වෂීයක් සෑහෙන පරිද්දෙන් රැස්කොට තබනලද මහත් උපභොග පරිභොග සම්පත් ඇත්තාහුද කාශිකොශලාදිජනපදාධිපතිවූ ප්‍රසිද්ධවූ පින්වත්ජනයෝද හිරණ්‍යසුවණ්ණමුත්තාමාණික්‍යාදි බොහෝ ධන සම්පත් ඇත්තාවූ වෙළඳගොවිආදිහුද චණ්ඩාලපුක්කුසාදි අවශෙෂහීන මඩ්‍යම උත්තෘෂ්ටජාති ඇත්තාහුද අඞ්ගමගධාදිප්‍රත්‍යන්තජනපදයෙහි යන නමින් ප්‍රසිද්ධවූ ශෞරවීරබලපරාක්‍රමයෙන් සම්පන්නවූ සතුරුබලමැඩ ජයගෙණ වසන්නාවූ කුලපරම්පරාව ශාස්වතයක් හා සමව හිර සඳ සේ අවිනෂ්ටව පවත්නාවූ ජාතියෙන් විශිෂ්ටවූවාහුද යනමේ සියල්ලම තමතමන් හිස මත්තෙහි වැටෙනලද ජරාමරණ වළකාගතනොහෙත්මය මරණට පැමිණෙන්නාහ තවද සන්හුන් ඉදුරන් ඇත්තාවූ කායවාක්සමාචාරයෙන් යුත් ශීලාදිගුණඇති අටකය වාමකය යනාදි සෘෂිවරයන් විසින් තමන්ගේ ප්‍රඥානැමති ඇසින් බලා ලොවට පහළකරණලද කප්පය ව්‍යාකරණය යනාදිවූ යම් මන්ත්‍රජාතියෙක් ඇද්ද ඒ මන්ත්‍රවිද්‍යාවෙන්හා අවශෙෂශාස්ත්‍රජාතියකින්වත් ජරාමරණ වළකාගතනොහැක්කේයයි කියා බණ වදාළසේක; එබස් අසා රාජකුමාරතෙම තමන්විසින් කලමනා කටයුතු කියන්නේ මෙසේ කියේය.

"සුභාසිතා අත්‍ථවති ගාථායො ඉත මහාමුනි,
නිරූඩතෙනාමනි සුභං යෙන ඛිමෙව සරණමහවං'නි".

යනුහෙයින් මහර්ෂිවූ ස්වාමින්වහන්ස නුඹවහන්සේවිසින් මෙලෝ පරලෝ හඟවා ධර්මයවූපරිද්දෙන් මාගේ සිත හෙළා වදාරණලද ශාස්තෘඅභිප්‍රායන් දැන සිතට නහා ගනිමි නුඹවහන්සේගේ ධර්මදෙශනාව ඉතා ශෘඝනත්වයට නුවනැත්තවුන් විසින් සිත්හිලා දැරියයුතුහෙයින් අප්‍රමාදසහිතවන්නේය වැඩ අවැඩ මෙලෝ පරලෝ නුඹවහන්සේම දන්නාසේක, එබැවින් නුඹවහන්සේගේම සරණ යෙමි, මට පිටි

වගල්වුවමැනවැයි කිහ, එබස් අසා ඔහු සමඟක් පිළිවෙත්හි පිහිටුවනු පිණිස අනුශාසනාකරණ මහතෙරුන්වහන්සේ මේ ගාථාව වදාළ සේක.

"මා මං තුවං සරණං ගඤ්ඡි තුවමෙව සරණං වජ,
සක්‍යපුත්තං මහාවීරං යමහං සරණංගතෝ'නි".

යනුහෙයින් එම්බා රාජකුමාරය තෝ මා සරණ නොයව ශාක්‍ය පුත්‍රවූ ගෞතමනම් බුදුකෙණෙකුන්ගේ යම් සරණක් මම ගියෙම්ද හෝ ඒ මහාවීරවූ බුදුන් සරණ යවයි වදාළසේක, එබසට රාජකුමාර තෙම මෙසේ කියේය.

"කතරඤ්ච සෝ ජනපදෙ සත්ථා තුම්හාකමාරිස,
අහම්පි දට්ඨුං ගවජිස්සං ජිනං අප්පටිපුග්ගලන්ති".

යනුහෙයින් සාමිනි නුඹවහන්සේගේ ගුරුවූ ශාස්තෘන්වහන්සේ කවර දිගක කවර රටක දැන් වැඩවසනසේක්ද? ඒ අප්‍රතිපුද්ගලවූ පස්මරුන් දිනූ බුදුරජානන්වහන්සේ දකින්ට යෙමි කියේය, එකල මහ තෙරුන් මෙසේ වදාළසේක.

"පුරත්ථිමයඤ්ච ජනපදෙ ඔක්කාකකුලසම්භවෝ,
කපිලවත්ථුපුරෙ සක්‍යකුලෙ ජාතෝසි පුරිසාජඤ්ඤ, සෝ ච ඛෝ පරිනිබ්බුතෝ'නි".

යනුහෙයින් එම්බා රාජකුමාරය මේ සථානයට නැගෙනහිර දිග් භාගයේ ජනපදයෙහි කපිලවස්තුපුරයෙහි ම්හාසම්මතරජහු පටන් පිරිසිදුව පැවත ආවාවූ ඔක්කාකකුලයයි කියනලද යම් සූර්‍යවංශයක්ද ඒ සූර්‍යවංශොද්භූතව ශ්‍රී මහාබොධිවෘක්ෂමූලයෙහිදී සවාසනා සම්පත්ති ලොවුතුරා බුදුවූ පුරුෂොත්තමකෙණෙක් සත්ත්වයන් භවකාන්තාරයෙන් එතර කළසේක්ද ඒ ශාස්තෘවූ බුදුරජානෝ පන්සාළිස් හවුරුද්දක් මුලුල්ලෙහි බුදුව වැඩහිඳ සියලු බුද්ධකෘත්‍යයන් කොට නිමවා පිරිනිවන්පෑ වදාළසේකැයි කියා බුදුගුණ වදාළසේක, මෙසේ තෙරුන්වහන්සේවිසින් වදාරණලද ධර්මදේශනාව අසා සතුටුසිත්ඇති රාජකුමාරතෙම සරණයෙහිද ශීලයෙහිද පිහිටියේය. එයින් කිහ.

"සචෙ හි බුද්ධෝ නිජ්ඣෙය්‍ය සත්ථා තුම්හාකමාරිස,
යොජනානි සතසහස්සානි ගච්ඡෙය්‍යහං පයිරුපාසිතුං.
යතෝ ච ඛෝ පරිනිබ්බුතෝ සත්ථා තුම්හාකමාරිස,
නිබ්බුතම්හි මහාවීරෙ ගවජාමි සරණං අහං.
උපෙමි සරණං බුද්ධං ධම්මඤ්චාපි අනුත්තරං,
සංඝඤ්ච නරදෙවස්ස ගවජාමි සරණං අහං.

පාණාතිපාතා විරමාමි ඛිප්පං
ලොකෙ අදින්නං පරිවජ්ජයාමි,
අමජ්ජපෝ නෝ ච මුසා භණාමි
යකෙන දුරෙන ච හොමි තුසෝ'හි.

යනුහෙයින් ඨවාමින්වහන්ස නුබවහන්සේගේ ශාසනයන්වහන්සේ දහසක් සොඳුනින් මත්තෙහි වැඩසිටිනාසේක්වීනම් දැන් ඒ දහස් ගණන් සොදුන් දුරු මග ගෙවා වඳින්ට භජනය සෙවනය කරන්ට යෙමි, දැන් ඒ බුදුරජානන්වහන්සේ යම්හෙයකින් නිවන්පුර වැඩි සේක්ද? ඒ බුදුන් සරණයෙමි කියා තෙරුන්වහන්සේට පසඟපිහිටුවා වැඳ සිල්ගන්නේ බුදුන් සරණ යෙමි අනුත්තරවූ දහම් සරණයෙමි බුඩ පුතුවූ සඟ සරණයෙමි කියා තුන්සරණයෙහි පිහිටා ඉක්බිති ප්‍රාණඝාත යෙන් වැළැක්මි සඞ්ඝයන්කෙරෙහි මෛත්‍රීකරමි අදින්නාදානයෙන් වැ ළැක්මි දුන්දෙයාම ගණිමි කාමමිථ්‍යාචාරයන් වැළැක්මි සිසලු අඹු වන්නිසාම සතුටුවෙමි නිරවද්‍යපානයම කෙරෙමි කියා සරණයෙහිත් ශීලයෙහිත් පිහිටියේය, මෙසේ සරණයෙහිද ශීලයෙහිද පිහිටනලද කුමාරයාහට මහතෙරහු මෙසේ වදාළසේක.

එම්බා රාජකුමාරය මේ වළ විසිමෙන් තට කම් නැත්තේය තාගේ ජීවිතය බොහෝකල් නොපවත්නේය පස්මසක් ඇතුළත නෝ නස් නේය එබැවින් තොපගේ පියරජහු සම්පයට ගොස් දානශීලාදි කුසල් කොට සවගිහපරායණ වෙවයි කියා තමන්වහන්සේ සම්පයෙහි තුබූ ශරිරධාතු දී අවවාද කොට පියානන්වහන්සේ සම්පයට යවයි සමුදි යැවූසේක; රාජකුමාරයා තෙරුන්වහන්සේගේ වචනය මුදුනෙන් පිළිගෙණ යමින් සිට තෙරුන්වහන්සේට නමස්කාරකොට මෙසේ කියේය, ඨවාමින්වහන්ස මම මපියානන් සම්පයට යෙමි මට අනුක මපාවෙන් එහි මාවසනතැනව වැඩියමැනවැයි කියා ආරාධනාකොට තෙරුන්වහන්සේවියින් ඉවසුබව දැන මහතෙරුන් වැඳ අවසර ගෙණ ප්‍රදක්ෂිණාකොට පියරජහුගේ නුවරට ගොස් උයනට වැද තමන් ආ බව රජ්ජුරුවන්ට දන්විය. රජ්ජුරුවෝ එබස් අසා සඟපිරිවරින් උය නට ගොස් කුමාරයා වැලඳ සිඹ සනහා ඇතුළුනුවරට කැඳවා ගෙණ ගොස් අභිෂෙකකොට රාජ්‍යය පමුණුවනු කැමැතිවිය, එකල ඒ කුමා රතෙම කියන්නේ දෙවයන්වහන්ස මාගේ ආයුෂය ඛවලපවත්නේය මෙයින් මතු සාරමයක් හිඳකල මට මරණ පැමිණෙයි එයින් මට රාජ්‍යයෙන් ප්‍රයොජන නැත නුබවහන්සේ පිටිවහල්කොට ගෙණ කුසල්කොට ගණිමි කියා තෙරුන්වහන්සේගේ ඛුණයන් බුඩාදිරත්නා නුසෙයි ආනුභාවන් රජ්ජුරුවන්ට කිහ, රජ්ජුරුවෝ එපවත් අස

ඔහුත්වූ සංවේගයට පැමිණ තෙරුන්වහන්සේ කෙරෙහිද තුනුරුවන් කෙරෙහිද ප්‍රසන්නවූ සිත්ඇතිව මහත්වූ විහාරයක් කරවා කාත්‍යායනමහතෙරුන්වහන්සේ සමීපයට දූතයෙකු යැවූහ, තෙරුන්වහන්සේ රජ්ජුරුවන්ටහා මහජනයාට අනුග්‍රහකෙරෙමින් වැඩිසේක, එකල දුරින් වඩනා තෙරුන්වහන්සේ දැක රජ්ජුරුවෝ සහපිරිවරින් පෙරගමන් කොට මහතෙරහු වඩා ගෙණ ගොස් විහාරය තෙරුන්වහන්සේට පිළිගන්වා සකස්කොට සිවුපසයෙන් උපස්ථානකෙරෙමින් සරණශිලයෙහි පිහිටිසේය, රාජකුමාරයාද සිල්සමාදන්ව තෙරුන්වහන්සේටහා භික්ෂුසංඝයාට සකස්කොට උපස්ථානකෙරෙමින් දන් දෙමින් බණඅසමින් බොහෝසේ කුසල් රැස්කෙරෙමින් සාරමසක් ඇවැමෙන් කාලක්‍රියාකොට තවුතිසාදෙවුලොව උපන්නේය, ඔහුගේ කුශලානුභාවයෙන් සත්රුවනින් ප්‍රතිමණ්ඩිතවූ සියක් යොදුන් පමණ රථවිමානයක් පහළවිය, පරිවාරසම්පත්හු නොයෙක් දහස් ගණන් වූහ, රජ්ජුරුවෝ කුමාරයාගේ ශරීරය ආදාහනකරවා භික්ෂුසංඝයාට මහදන් පවත්වා බුදුන් උදෙසා ධාතුචෛත්‍යයට පූජාසත්කාරකළේය, එකල්හි රජ්ජුරුවන් ඇතුළුව බොහෝ මනුෂ්‍යයෝ ඒ විහාරස්ථානයට රැස්වූහ. තෙරුන්වහන්සේ භික්ෂුසංඝයා පිරිවරා ඒ ස්ථානයට වැඩිසේක, මෙසේ හිනිපැවිදි දෙපක්ෂයෙන්ම එනි මහත් සමාගමන් විය, ඉක්බිති ඒ දිව්‍යපුත්‍රතෙම තමන් පූර්වජාතියෙහි කරණලද කුශල කර්මයත් තෙරුන්වහන්සේ කළ උපකාරයත් දැක කෙළෙනි ගුණ දන්නා බැවින් තෙරුන්වහන්සේ කරා ගොස් වදිමි තෙරුන්වහන්සේගේ ගුණයත් සර්ව්ඥශාසනයෙහි ගුණයත් බොහෝදෙනාට ප්‍රකාශ කෙරෙමි සිතා දිව්‍යරථයට නැගි මහත්වූ දෙවුපිරිස් හා සමග දෘශ්‍යමානරූපයෙන් මිනිස්ලොවට අවුත් රථය ආකාශයෙහි රඳවා බිමට බැස තෙරුන්වහන්සේගේ ශ්‍රීපාදවන්දනයට නමස්කාරකොට පියරජ්ජුරුවන්හා පිළිසඳරකථාකොට නැවත තෙරුන්වහන්සේ කරා ගොස් දෙගොන් මුදුන්දී එකත්පස්ව සිටියේය, මහතෙරහු ඒ දිව්‍යපුත්‍රයාගේ ශ්‍රීසමෘඞ්ධිය දැක ඔහුවිසින් කරණලද කුශලකර්මය ප්‍රකාශකරවනු පිණිස මේ ගාථාවලින් විමාළසේක.

"සහස්සරංසි යථා මහප්පභෝ
දිසං යථා භාති නභෙඅනුත්තරං,
තථූපකාරෝ තවායං මහාරථෝ
සමන්නතෝ යොජනසත්තමායතෝ.

සුවණ්ණපට්ටෙහි සමන්නතෝමනෝ
උරස්ස මුත්තානි මණීහි චිත්තිතෝ,
ලෙඛා සුවණ්ණස්ස ච රූපියස්ස ච
සොභන්ති වේලුරියමයා සුනිම්මිතා.

සියමිදං වෙළුරියස්ස නිම්මිතං
යුගඤ්ඣිදං ලොහිතකාය චිත්තිතං,
යොත්තා සුවණ්ණස්ස ච රූපියස්ස ච
සොභන්ති අස්සාවපි මේ මනොජවා.

සො තිඨති සිඛරට්ඨේ අධිට්ඨිතෝ
දෙවානමිඤ්ඤේව සහස්සවාහනෝ,
පුච්ඡාමි තං යසවන්ත කොවිදං
කථං තයා ලඛෝ අයං උළාරෝ'ති".

යනුහෙයින් දහසක් රැසින් දිලියෙන්නාවූ මහත් ප්‍රභාමන්වූ සූර්‍ය්‍ය මණ්ඩලය හාත්පසින් අන්ධකාර විධ්වංශනය කොට යම්සේ ආකාශ යෙහි බබලාද එමෙන් තාගේ මේ මහාරථ විමානය හාත්පසින් ජොති මත්ව බබලන්නේය, එතකුදුවුවත් මේ ලොකයෙහි සත්ත්වයන් ඇසට පෙණෙන්නාවූ ආලොකයන් අතුරෙන් සූර්‍ය්‍යමණ්ඩලයට වඩා මහත් ආලොකයක් නැතිහෙයින්ද අනික් උපමාවක් ප්‍රකාශව නොපෙණෙන බැවින්ද ආලොකය නිසා සූර්‍ය්‍යමණ්ඩලයට උපමාකළ පමණක්වීනා හිරුමඬල පණස්යොදුන් පමණ වෙයි මේ රථවිමානය අයමින් විතරින් උසින් සියක්යොදුන් පමණ වෙයි මිනිස්ලොවට පැමිණි යොණෙහිම තුන්දිවසිනක පැහිර පවත්නාවූ අඳුරු දුරුකොට දිලියෙමින් මේ විමානය හිරුවිමනටත් වඩා අතිශයින්ම ප්‍රභාමත් වෙයි, මේ රථය හාත්පසින් රත්පටින් වසනලද්දේය, ඒ රත්පටෙහි බබලන්නාවූ මාලාකර්ම්ම ලතාකර්ම්මාදීනය වෛදූර්‍ය්‍යමාණික්‍යයෙන් නිමියේය රථඋරය මුතුමැණික්මය විසිතුරු කම්මාදීනයෙන් නිමියේය සියලුම රථකම්මාදීනය රන්රිදිමුතුමැණික්මය වන්නේය මේ රථයෙහි කිඹුල් මුඛ දෙකද ලොහිතඞ්ගමණිහා වෛදූර්‍ය්‍යමණියෙන් නිමියේය වියලනු රණින් රිදියෙන් නිමියේය මේ රථයෙහි යොදනලද ශෛඛව අශ්වයෝද දිව්‍යපුත්‍රයා යම්තැනකට යෙමි සිතුතෙණෙහිම සිතුතැනකට රථය අදනාහෙයින් මනොමය ජව ඇත්තාහ, දහසක් ශෛඛවශ්වයන් යොදනලද වෛජයන්තනම් රථයෙහි හුන්නාවූ ශක්‍ර දෙවෙන්ද්‍රයාසේ තෝද මේ රථවිමානාරූඪව මේ දිව්‍යසමූහයා අභිභවමින් බබලන්නෙහිය තාවතිසින් පූර්ව්වජාතියෙහි කරණලද කවර කුශලයක් හෙතුකොටගෙණ මේ දිව්‍යඉසුරු ලද්දේදැයි විචාළසේක, එසේ ඒ මහතෙරුන්වහන්සේ විසින් විචාරණලද ප්‍රශ්නය විසඳන්නාවූ දිව්‍ය පුත්‍රතෙම මේ ගාථාවලින් ප්‍රකාශකෙළේය.

"සුජාතොනාමහං භන්තෙ රාජපුත්තස්සා පුරෙ අහු,
කිඤ්චු ඊං අනුකම්පාය සඤ්ඤමඤ්ඤං නිවෙසයී.

ඛිණාසුකඤ්ච මං ඤත්වා සරීරං පාදසි සත්ථුනෝ,
ඉමං සුජාත පූජෙහි තං තෙ අත්ථාය මහාහිනි.

නානාගන්ධෙහි මාලෙහි පූජයිත්වා සුමුත්තතෝ,
පහාය මානුසං දෙහං උපපන්නොමහි නන්දනෙ.

නන්දනේ පවනෙ රම්මෙ නානාදිජගණායුතෙ,
රමාමි නච්චගීතෙහි අච්ඡරාහි පුරක්ඛතෝ"ති

යනුගෙයින් සවාමිනි මෙම නුවර රජහුගේ පුත්‍රවූ කාලක්‍රියාකළ සුජාත කුමාරයෝනම් මමය එසමයෙහි නුඹවහන්සේ මට සුජාත කුමාරය මේ ධාතු පූජාකරව මතු සවහිතමොක්ෂ සම්පත් දෙයකවන් ගෙයින් මහත් වැඩ පිණිස වන්නේයයි කියා බුදුන්ගේ ශාරීරිකධාතු දුන්සේක. මමද ඒ ධාතු ගෙණ ගොස් ගඳදුම්මල්පහන් ආදියෙන් පූජා කොට මේ දිව්‍යලොකයෙහි උපන්මි යනාදින් ප්‍රකාශකොට කියා තෙරුන්වහන්සේ වැඳ අවසර ගෙණ ප්‍රදක්ෂිණාකොට මවුපියන් විමාන රථයට නැඟි දෙව් පිරිස් පිරිවරා දෙවිලොවටම ගියේය, මහතෙරුන් වහන්සේ එම අතීතාත්පත්තිකොට ගෙණ එතැන්හි රැස්වූ පිරිසට බණ වදාළසේක, ඒ ධම්මදෙසනාව බොහෝදෙනාට ප්‍රයොජනවිය.

ඉක්බිති මහතෙරුන්වහන්සේ තමන් විවාළ නියාවත් දිව්‍යපුත්‍රයා කී නියාවත් ඒ සියලුම ප්‍රවෘත්තිය තත්වූපරිද්දෙන් ධම්මසඞ්ගායනා කරණකාලයෙහි ධම්මසඞ්ගායනාකරණ මහාසථවිරයන්ට කිහ, ඒ මහාසථවිරවරයෝ මේ විමානවත්ථුද සඞ්ග්‍රහවට නගා විමානවත්ථු දෙසනාවට අන්තර්ගතකොට සඞ්ගායනාකළහ.

මේ විමානවත්ථුප්පකරණයෙහි මහාරථවගියෙහි සුලරථ විමානවර්ණනාව කියා නිමවනලදී.

තවද මේ විමානවත්ථුප්පකරණයෙහි මහාරථවගියෙහි **මහාරථ විමානවත්ථුව** නම් කවරයත්?

සනරාමරලොකගුරුවූ බුදුරජානන්වහන්සේ එක්සමයෙක සැවැත් නුවර ජෙතවනාරාමයෙහි වැඩවසනසේක, එසමයෙහි මුගලන්මහ තෙරුන්වහන්සේ දෙවවාරිකාවෙන් වඩනාසේක් තවුතිසාභවන යෙහි තමන්ගේ විමනින් නික්ම දහසක් අසුන් යොදනලද මහත්වූ දිව්‍යරථයකට නැඟි මහත්වූ දෙව්පිරිස් පිරිවරා මහත්වූ දිව්‍යසෘඞ්ධියෙන් දිලිහිදිලිහි උයන්කෙළියට යන්නාවූ එක්තරා ගොපාලනම් දිව්‍යපුත්‍රයෙකුගේ දිවුසුරු දැක බුදුන්ට දන්වා ප්‍රකාශකරවූසේක, ඔහුනේ කුශලකර්මය මේ මතුපහළවන්නේය, කෙසේදයත්?–

මහාරථවිමානවත්ථුව.

මේ මහාභද්‍රකල්පයට එකානූවන කල්පයෙහි බුදුවූ මහාවිපස්සිනම් බුදුන්සමයෙහි දෙතිස්මහාපුරුෂලක්ෂණයෙන් හා අසූඅනුව්‍යඤ්ජනලක්ෂණයෙන් දිලිහෙන්නාවූ බුබඳ්‍රි දුක සතුටුසිත්ඇතිව රන්මාලාවක් පූජා කොට මේ කුශලය හෙතුකොටගෙණ මේ ජාතියෙහි පටන් නිවන් දක්නා ජාතිදක්වා උරවජ්දමාලාවන් පහළවේවයි කියා කරණලද ප්‍රාර්ථනාඇතිව එකානූකපක් මුලුල්ලෙහි සුගතියෙහිම සැරිසරන්නේ මේ මහාභද්‍රකල්පයෙහිම තුන්වැනිව බුදුවූ කාශ්‍යපනම් බුදුන් සමයෙහි බ්‍රාහ්මණකුලයෙහි ඉපිද වෙදතුයෙහි පරතෙරට පැමිණ ගොපාල බ්‍රාහ්මණයයි ප්‍රසිද්ධව මේලෝ පරලෝ කුසල් අකුසල් හැඳින සත්පුරුෂ ගුණයෙහි පිහිටියේය, රාජ්‍යශ්‍රීසම්පත් අනුභවකෙරෙයි, ඔහු යටගියදවස මහාවිපස්සිනම් බුදුන් සම්යෙහි කළ ප්‍රාර්ථනාවශයෙන්ම කසිරට කිකිනම් කසිරජහුගේ අග්‍රමහෙසිකා දෙවින් කුස උපන් දිව්‍යාඟනාවක් වැනිවූ උතුම් රූපශ්‍රියෙන්හා සියුම් මොළොක් ශරීරසුවපහස් ඇත්තාවූ සියලු ලය මඩල වසා වලඳනාලද සවණ්ණමය උරවජ්දමාලාවක් ලැබුහෙයින් උරවජ්දමාලානම් රාජකුමාරිකාවක් පහළවූවාය, ඒ රාජකුමාරිකාව ගොපාලබ්‍රාහ්මණයා කළු ප්‍රාර්ථනා බලයෙන් පියරජහු විසින් පාවාදෙනලදුව දෙවඟනක් වැනිවූ රාජකුමාරිකාව විසින් කරණලද උපකාර විදිමින් ශ්‍රීසම්පත් අනුභවකෙරෙමින් බුදුන්කෙරෙහි පැහැද බුදුපාමොක් මහසඟනට අශදුශදුනාදී මහදන් පවත්වා ඒ බ්‍රාහ්මණයා හා රාජකුමාරිකාව උදෙසා බුදුන්විසින් වදරණලද බණ අසාද ශ්‍රද්ධා සති ප්‍රඥා සම්පත් ඇති පසුවසැඩි නුමුහුකළ බැවින් මාගිඵලයක් උපදවා ගත නොහී පෘථග්ජන කාලක්‍රියාවෙන්ම කාලක්‍රියාකොට ඒ ජාතියෙහි කරණලද කුශලකර්ම හෙතුකොටගෙණ තවුතිසාභවනයෙහි සාරසියයක් ගව්‍යූතමණ රන්විමනෙහි උපන්නේය, පිරිවර දිව්‍යාඟනාවෝ නොයෙක් කෙළගණන් පහළවූහ, නොයෙක් විචිත්‍ර චිත්‍ර කර්මාභරණයෙන් ශොභාමත්වූ හිසනි හා රථාලඞ්කාරයෙන් හෙබියාවූ ඕහිරිනාද පවත්නාවූ රථචක්‍රහා දහසක් අසුන් යොදනලද්දවූ රථාලොකයෙන් සූර්යමණ්ඩලයට නිහැකරන්නාක් වැනිවූ ප්‍රභාසම්පන්නවූ දිව්‍යරථයක් පහළවිය, ඒ දිව්‍යපුත්‍රතෙම එහි ආයුප්‍රමාණින් දිව්‍යසම්පත් අනුභවකොට නැවත නැවතත් දිව්‍යලොකයෙහිම සැරිසරන්නේ මේබුඩොන්පාදකාලයෙහිද යෙහෙව තුබූ එම කුශලකර්ම විපාකයෙන් කියනලද රථවිමානය ඇතුලුවූ දිව්‍යසම්පත්තියෙන් සමෘඩවූ ගොපාල දිව්‍යපුත්‍රයායි යන මේ නමින් ප්‍රසිද්ධව එම තවුතිසාභවනයෙහිම දිව්‍යසම්පත් අනුභවකරන්නේ එක්දවසක් තමන් රන්විමනින් නික්ම රථයට නැඟි මහත්වූ දෙවුපිරිස් පිරිවරා මහත්වූ දිව්‍යසෘඩියෙන් දිලිහි දිලිහි

උයන්කෙළි පිණිස යන්නාවූ දිව්‍යපුත්‍රයාගේ අභිමුඛයෙහි මුඟ ලන්මහතෙරුන්වහන්සේ පෙණී වදාළසේක, එකල්හි ඒ දිව්‍යපුත්‍ර තෙම තෙරුන්වහන්සේ දැක වහා රථයෙන් බැස තෙරුන්වහන්සේට නමස්කාර කොට දෙගොන් මුදුන්දී එකත්පස්ව සිටියේය. එකල්හි ඒ දිව්‍යපුත්‍රයාගේ ඉසුරුසම්පත් දැන ඔහුවිසින් පුවිජාතියෙහි කරණලද කුසලකර්මය ඔහුලවාම ලොකයාට ප්‍රකාශකරවනු කැමතිව මේ ගාථා වලින් විචාළසේක.

"සහස්සයුත්තං හයවාහනං සුභං
ආරුය්හිමං සඳනං නෙකචිත්තං,
උය්‍යානභූමිං අභිතෝ අනුක්කමං
පුරින්දදු කතපුඤ්ඤ වාසවෝ.

සොවණ්ණමයා තෙ රථකුඛරා උභෝ
ඵලෙහි අංසෙහි අතීව සඛතා,
සුජාතඝුම්බා නරවීර නිම්මිතා,
විරොචති පණ්ණරසෙව චන්දිමා.

සුවණ්ණජාලා විතතෝ රථෝ අයං
බහූහි නානාරතනෙහි චිත්තිතෝ,
සුනාභිඝොසෝ ච සුභාසරෝ ච
විරොචති වාමරහත්ථබාහූහි"

යනාදීන් දක්වනලද හෙයින් අනෙකප්‍රකාර විචිත්‍ර චිත්‍ර කර්මාන්ත යෙන් ශෝභිතවූ දහසක් අසුන් යොදනලද වෛජයන්තනම් රථයට නැගි දෙදෙව්ලොව දෙවියන් පිරිවරා උයන්කෙළියට යන ශක්‍රදෙවෙන්ද්‍රයාසේ දිව්‍යසෙනාව පිරිවරා නානාවිධරත්නයෙන් විසිතුරුවූ දහසක් ශෛඛ්‍යවයන් යොදනලද රථවිමානාරූඪව උයන් බිමට යන්නාවූ එම්බා මහානුභාව සම්පන්නවූ දිව්‍යපුත්‍රය චන්ද්‍රමණ්ඩලයසේ නොයෙක් රැස්වන් දිලිහෙන්නාවූ තාගේ මේ රථවිමානය මත්තෙහි කූටාගාර සටහන් ඇති පලසෙවෙනි සත්රුවනින් නිම්මේය, සතරදිග නගනලද ටැම් සමූහය දක්‍ෂවූ ලියන වඩුවන් විසින් ඔවුන්ගේ සොරවියඳ බලදක්වා පදමකුමුදුකාර සුවිකා හිදුවා ගකනිවූපරිද්දෙන් ලියා නැඟුවාසේ සත්රුවනින් නිම්මේය, රථයෙහි සිටිනාවුන් රක්‍ෂාකරණ පිණිසහා අතින් අල්වාගතහැකිවූ පරිද්දෙන් දෙපස ආවරණකොට සදනලද කිඹුල් මුව දෙක සත්රුවනින් නිම්මේය, දෙපස වෙදිකාකාරයන් සදනලද ගහරන් සත්රුවනින් නිම්මේය, මණ්ඩපමධ්‍යයෙහි

දිලියෙන්නාවූ පයෝධකාය අනෙකවිධරත්නයෙන් නිමියේය, බිම ඉදුනිල් මිණියෙන් නිමියේය, දහස්ගණන් දැවිහා රන්පුවරුකඩ චක්‍රාකාරයෙන් විදුලිය වැලඳ දිලියෙන්නාසේ ශොභාමත්වූ සියදහස් ගණන් රෙඛා සමූහය ගහනරනින් නිමියේය, අනෙකවිධ රත්නයෙන් නිමියාවූ නානි නිමිවළලු සහිත රථ සත්පෙළින් ශොභාමත්වේයි ඊමත් තෙහි සත්රුවන් ධජ හඟා නිබෙයි නානාවිධ රත්නයෙන් නිමියාවූ චාමර ගත් අත් ඇතිව පවත් සලමින් පිරිවරා සිටි දිව්‍යපුත්‍රයන් හා නානාවිධ රත්නයෙන් සැරහී නටමින් ගායනා කරමින් පවත්වනලද නළුනාටකයන් විසින් කරණලද නෘත්‍ය ගීත ලීලා දැක සතුටුව පවත් වනලද සාධුකාර නාදයෙන්හා ආශිර්වාද වචයෙන් පවත්වනලද ජයනී මඞ්ගල්‍ය ශොෂාවෙන් එකනින් නාද වෙයි, මේ රථය පදනාකල මිණි කිංකිණිකනාදයහා රථචක්‍රනාදය දෙකවූ ගැබිවියන් විසින් වයනලද පඤ්චාඞ්ගිකතූර්‍යනාදයක්සේ කණිණරසායනව මධුරනාද පවත්නේය, රථයෙහි ශොදනලද දහසක් ශෛඛ්‍යවයෝ ඔවුනොවුන්ට නො පසුබැස රථ අදනා දහසක් චාමර එකවිට සැලෙන්නාසේ එකවිට වල්පත් සැලීමෙන්ද රථාලඞ්කාරය පිණිස අසුන්ගේ කුරසංඝට්ට නයෙන්ද අලඞ්කාර වන්නේය, සිවු සැටක් පමණ සඞ්ගීතඥයෙන් සමඞ්ගීතවූ නොයෙක් කෙළඟණන් දෙවඟනන් පිරිවරා රථවිමානා රූඪව තෝ ශක්‍රදෙවෙන්ද්‍රලීලාවෙන් ඛබලන්නෙහිය, එම්බා දිව්‍යපුත්‍රය මෙබදු සැපතක් ලැබීමට කාවිසින් ඖෂධියෙහි කරණලද කුශල කර්මය කවරේදැයි විචාරා වදුළසේක, මෙසේ මුගලන් මහතෙරුන් වහන්සේ විසින් විචාරණලද පැනය විසඳන්නාවූ දිව්‍යපුත්‍රතෙම මෙසේ ප්‍රකාශකොළේය.

"ජිනිඤ්ඤං බුඛං අනොමනික්කමං
නරුත්තමං කස්සපං අගඝප්පහලං,
අවාපුරන්තා අමතස්ස වාරං
ඉදවාතිඉදවං සතපුඤ්ඤලක්ඛණං.

තමන්නපානෙන ච චීවරෙන ච
ඛජ්ජෙන හොජ්ජෙන ච සායනෙන ච,
සන්තප්පයිත්වා දිපදුත්තමං
සොසග්ගසො දෙවපුරෙ රමාමහං."

යහුගෙයින් ඩවාමිනි මම කාශ්‍යපබුදුන් සමයෙහි ගොපාලකම් බ්‍රාහ්මණව බුදුන් දුටුකෙණෙහිම මේ එසේ මෙසේ සතිකෙණෙක් නොවෙයි, සකලකෙලශයන් නසා සිඟල්ල දත් ලොවුතුරා බුදුකෙණකැයි සතුටු සින් ඇතිව බණ අසා දුනයට ආරාධනාකොට මාගේ

වාසභවනයෙහි ගෙයක් ව්‍යත් බැඳ වටහිර ඇද ඔලම්බක පුෂ්පදාම යත් එල්වා යහපත් ඇතිරි අතුට මධ්‍යයෙහි බුදුන් වඩාහිඳුවා දෙපාර්ශ්වයෙහි අග්‍රශ්‍රාවක දෙදෙනා ප්‍රධානකොට ශ්‍රාවක සංඝයා වඩාහිඳුවා ඛාද්‍ය භොජ්‍යාදී ආහාර වහිහ්‍යන් වලඳවා සිවුරු පූජාකෙළෙමි, මෙසේ අශදාශ දානාදි වශයෙන් ත්‍රිවිධ චෙතනාව පිරිසිදුකොට මහත් වර බන පරිත්‍යාග කොට පිරිසිදු ගුණගණාඩඹසඩහත උදුරතර මනා පින්කෙත්වූ බුදුන් ප්‍රධානකොට මහාසඩඝයාට මහ දන් පවත්වා ඒ කුශලකර්මය හෙතුකොටගෙණ මනුෂ්‍යකුණපය හැර මේ දෙව් ලොව ශක්‍රයා වැනිවූ උදුරතර සම්පත් ලදිමි කියා කුශලකර්මය ප්‍රකාශකොට බුදුන්ගේ උත්තම ගුණ මහන්තත්වය ප්‍රකාශකරණු පිණිසත් බොහෝදෙනා කුශලක්‍රියාවෙහි යොදවා ශ්‍රද්ධාවෙහි පිහිටුවනු කැමැතිව මෙසේ කියේය.

" ආයුඤ්ච වණ්ණඤ්ච සුඛං බලඤ්ච
පණීතරූපං අභිකඩ්ඛතා මුනි,
අන්නඤ්ච පානඤ්ච බහුං සුසංඛතං
පතිඨපෙතබ්බං අසඩ්ඛමානසෝ."

ඝනුහෙයින් අග්‍රවූ ආයුෂය අග්‍රවූ බලය අග්‍රවූ වර්ණය අග්‍රවූ සැපය ඥානාදිවූ සියලුම උතුම් සම්පත් කැමති ශ්‍රද්ධාවන්තයන් විසින් අන්න පානාදි යම්කිසි දානයක් ඇත්නම් බුද්ධාදි රත්නත්‍රයෙහිම පිහිටවිය යුත්තේය, මෙලොවත් පරලොවත් බුදුන්ම විනා ලෝවැස්සන් විසින් කරණලද පූජා සත්කාර විඳීමට සුදුසු නොමැණෙන් කිසි තැනකත් නැත්තේයයි කියා බුදුගුණ ප්‍රකාශකෙළේය, එකල්හි මහතෙරුන් වහන්සේ ඒ දිව්‍යපුත්‍රයාගේ සිත් බලා කෙලෙසුන් තුනිවූ සහපත්වූ මෘදුවූ කෙලෙසුන් කෙරෙන් විනිවරණවූ ප්‍රසන්නවූ මාගිහාඛිගමයට සුදුසුවූ සිත දැන චතුස්සත්‍යය ප්‍රකාශකොට බණ වදාළසේක, එකල්හි ඒ දිව්‍යපුත්‍රතෙම සොවාන් ඵලයෙහි පිහිටියේය, ඉක්බිති මුගලන්මහ තෙරුන්වහන්සේ මිනිස්ලොවට වැඩ බුදුන්ට එපවත් දන්වූසේක, බුදු රජානන්වහන්සේ එම අත්ථාත්පත්තිකොටගෙණ එහැන්හි රැස්වූ පිරිසට ධම්මදෙශනාකොට වදාළසේක, ඒ ධම්මදෙශනාව බොහෝදෙනාට ඝාතීකරිය.

මේ විමානවත්ථුප්පකරණයෙහි මහාරථවගියෙහි මහාරථ විමානවණ්ණනාව කියා නිමවනලදී.

මේ විමානවත්ථුප්පකරණයෙහි මහාරථවගි.යි.

තවද මේ විමානවත්‍යුත්‍පත්‍රකරණයෙහි පාඨාසිවගිහයෙහි **සච්ඡිණ්ණ විමානවත්‍යුත්‍ව** නම් කවරයක්ද?-

සම්‍යක්සම්බුදුරජානන්වහන්සේ අඞ්ගතවිඤ්ඤ නම් රට වැඩවසනසේක, එසමයෙහි අඞ්ගතවිඤ්ඤනම් රට නාමගොත්‍ර යෙන් අප්‍රසිද්ධවූ එක්තරා ශ්‍රද්ධාසම්පන්නවූ උපාසකයෙක් ඔහුගේ ගමට නුදුරු නැන එක්තරා මුඩුගල්තම් පර්වතයක් මුදුනෙහි සක්මන් මණ්ඩප ජන්නාගෘහ භොජනශාලාදි සියල්ලෙන්ම සම්පූර්ණ කොට නිරන්තරයෙන් බුදුන්ගේ වාසයට සුදුසු පරිද්දෙන් ගඳකිළියක් කරවා විහාරය බුදුන්ට පිළිගන්වා පිරිවරසහිත බුදුන් විහාරයෙහි වඩවා නිරන්තරයෙන් යහපත්කොට උපස්ථාන කෙළේය, තමාද නිරන්තර යෙන් පන්සිල් රකිමින් පොහෝ පෙහෙවස් වෙසෙමින් නිරන්තරයෙන් පිරිසිදු ශීලයෙහි පිහිටා යහපත් ශීලසංවර ඇතිව කාලක්‍රියාකොට ඒ කුශලානුභාවයෙන් තවුතිසාදෙවුලොව උපන්නේය, ඔහුගේ කුශලා නුභාවය ප්‍රකාශකොට දක්වනුපිණිස පුෂ්පාරාම එලාරාමාදියෙන් සමෘ ඩවූ රමණීයවූ සිත්කළු භූමිභාග ඇති රන් පර්වතයක් මුදුනෙහි නා නාරත්නයෙන් විසිතුරුවූ රශ්මිජාලා සමුජ්ජ්වලිත විචිත්‍ර වේදිකාවෙන් පරික්ෂිප්ත කරණලද අනෙකප්‍රකාර විචිත්‍රචිත්‍ර කම්මාන්තයෙන් නිමි යාවූ කිහිනි දොරකවුළු සොපානමාලාදි වශයෙන් අනෙකප්‍රකාරයෙන් අලඞ්කෘතවූ රන්විමනෙක් පහළවිය. එසමයෙහි ආයුෂ්මත්වූ මුගලන් මහතෙරුන්වහන්සේ දෙවචාරිකාවෙන් දෙවුලොවට වැඩ ඒ දිව්‍යපුත්‍ර යා දැක ඔහු විසින් නියජානියෙහි කරණලද කුශලකම්මය ප්‍රකාශකර වනු පිණිස මේ ගාථාවලින් විචාළසේක.

සොවණ්ණමයෙ පබ්බතස්මිං විමානං සබ්බසො පභං,
හෙමජාලකපටිච්ඡන්නං කිංකිණිජාලකපරික්ඛිතං.

අසංසු සුකතා එමහා සබ්බෙ වෙළුරියාමයා,
එකමෙකාය අංසියා රතනාසතන්තනිම්මිතා.

වේළුරියසුවණ්ණස්ස එලිකා රූපියස්ස ච,
මසාරගල්ලමුත්තානි ලොහිතඞ්කමණීහි ච,

විචිත්තමතොරමා භූමි න කත්තුඛංසති රජෝ,
ගොපානසි ගණා පිතා කූටං ධාරෙන්ති නිම්මිතා.

සොපානානි ච චත්තාරි නිම්මිතා චතුරෝ දිසා,
නානාරතනගඛෙහි ආදිච්චොව විරොචති.

යනුහෙයින් එම්බා දිව්‍යපුත්‍රය මේ රන්පර්වතය මුදුනෙහි දිලිසෙන් නාවූ තාගේ මේ විමානය අනිශයින්ම ශොභාමත් වෙයි, මත්තෙහි රන්දැල් වසා රන් රශ්මිදුලින් සැරසි නිබෙයි; ඕම ඉන්‍ද්‍රනීලමණිස්ය

මය බැවින් රජස් ධූලි නොනැගෙයි සියලු වැම් වෛරඵම්ණිමය වෙයි එනකුදුවුවත් ඒ වැම් සියල්ලම අෂ්ටාංග වෙයි එහින් එක් අංගයෙක් වෙරඵම්ණිමය එක් අංගයෙක් සුවණ්ණමය එක් අංගයෙක් එලිකමය එක් අංගයෙක් රිදිමය එක් අංගයෙක් මැසිරිගල්මය එක් අංගයෙක් මුතුමය එක් අංගයෙක් ලොහිතඞ්ක මිණිමය එක් අංගයෙක් සව්ව රත්නාමය වෙයි හොනැස් සුවණ්ණවණ්ණවූ පුෂ්පරාගමිණිමය වෙයි හොනැස් දරා සිටි කර්ණිකාව සත්රුවනින් නිමියේය, සතරදිග සත්රුවනින් නිමියාවූ හිනිමං සතරකින් හා නානාවිධරත්නා යෙන් නිර්මිතවූ නොයෙක් ගඛඩාවෙන් ප්‍රතිමණ්ඩිතවූ මේ රත්න පර්වතය මුදුනෙහි දිලියෙන්නාවූ විමානය යුගදුරු මුදුනෙහි දිලි යෙන හිරු විමනක්සේ දශදික් එකාලොක කෙරෙමින් බබලන්නේය කවද මේ විමානයෙහි නොයෙක් දිව්‍යාභරණයෙන් සැරහී බබලන් නාවූ තෝ සම්පණ්ඩ යෙදුන් හිරු විමනෙහි දිලියෙන ශූරයාදිව්‍යපුත්‍රයා මෙන් ශොභාමත්ව බබලන්නෙහිය, එම්බා දිව්‍යපුත්‍රය මෙබඳු දිව්‍ය සම්පත් ලැබීමට තාවිසින් කරණලද කුශලකර්මය කවරේදැයි විවා රා වදාළසේක, ඒ තෙරුන්වහන්සේ විසින් විවාරණලද පැනය විස දන්නාවූ දිව්‍යපුත්‍රතෙම මෙසේ කියේය.

අහං අඞ්කවිඳෑහිං බුඛඝ්‍යාදිවඛඛුනෝ,
විහාරං සත්ථුනෝ කාරෙසිං පඝණ්හෝ ඝරෙනි පාණිනි.

තත්ථ ගන්ධඤ්ච මාලඤ්ච පඤ්චඞ්ගඤ්ච විලෙපනං,
විහාරං සත්ථුනෝ'දාසි විපඝඝණ්හෙන චෙතසා.

ස්වාමිනි මෙපමණ කුශලකර්මය හෙතුකොට්ගෙණ මෙබඳු දිව්‍යසම්පත්තියක් ලදිමි කියේය, මෙසේ ඒ දිව්‍යපුත්‍රයා කුශලකර්මය ප්‍රකාශකොට කිසාල පිරිවර සහිත දිව්‍යපුත්‍රයාට විස්තාරවශයෙන් බණ වදාරා මිනිස්ලොවට වැඩ බුදුන්ට එපවත් දැන්වූසේක, එම අපේක්ෂිත සත්තිකොටගෙණ සම්ප්‍රාපත පිරිසට බණ වදාළසේක, ඒ ධර්මදේශනාව බොහෝදෙනාට සාර්ථකවිය.

මේ විමානවත්ථුප්පකරණයෙහි පායාසිවගීයෙහි සුවණ්ණවණ්ණ විමානවණ්ණනාව නිමවනලදී.

තවද මේ විමානවත්ථුප්‍රකරණයෙහි පායාසිවග්ගයෙහි **අනෙකවණ්ණ විමානවත්ථුව නම්** කවරයක්?

සකල ගුණ නිධානවූ භාග්‍යවත් බුදුරජානන් වහන්සේ සැවැත්නුවර දෙවිරම්වෙහෙර වැඩවසනසමයෙහි එක්දවසක් ආයුෂ්මත් වූ මුගලන්මහතෙරුන්වහන්සේ යටකියනලද ක්‍රමයෙන් දෙවවාරිකාවෙන් තවුතිසාභවනයට වැඩිසේක; එකල්හි අනෙකවණ්ණ නම් වූ එක්තරා දිව්‍යපුත්‍රයෙක් තෙරුන්වහන්සේ දැක සතුටුව බලවත්ව ගරුගත්තාවූ ගෞරව බහුමාන ඇතිව තෙරුන්වහන්සේ කරා එළැඹ නමස්කාර කොට එකත්පස්ව සිටියේය, එකල්හි මහතෙරහු ඒ දිව්‍ය පුත්‍රයා දැක ඔහු විසින් පූර්ව්‍වජාතියෙහි කරණලද කුශලකර්මය විචාරණුකැමතිව ඒ දිව්‍යපුත්‍රයා අතින් මෙසේ විචාළසේක.

අනෙකවණ්ණං දරසොකනාසනං
විමානමාරුය්හ අනෙකචිත්තං,
පරිවාරිතෝ අච්ඡරාසංගණෙන
සුනිම්මිතෝ භූතපතීව මොදසී.
සමා සමෝ නැපි කුතෝ අනුත්තරෝ
යසෙන පුඤ්ඤෙන ච ඉඩ්ඨියා ච,
සබ්බෙව දෙවා නිදසගණා සමෙච්ච
තං තං නමස්සන්ති සසිංව දෙව.

යනුහෙයින් එම්බා දිව්‍යපුත්‍රය නීලපීතාදිවශයෙන් නොයෙක්වණ්ණයෙන් බබලන්නාවූ තාගේ රූපශ්‍රී දුටුකෙණෙහිම සිත්ශොකපරිලාහය ග්‍රීෂ්මකාලයෙහි පැන්පූවාසේ ශරීරය සිහිල්වනතරම් යහපත් රූපශොභාවක් ඇත්තෙහිය අනෙකප්‍රකාර විසිතුරු කර්ම්මාන්තයෙන් නිර්ම්මිතවූ විමානාරූඪව දිව්‍යසමූහයාවිසින් පිරිවරණලදුව සුනිර්ම්මිත දිව්‍යරාජලීලාවෙන් දීපතිමත්ව බබලන්නෙහිය පරිවාරසම්පත්තියෙන්ද ආනුභාවයෙන්ද ඓශ්වර්‍යසම්පත්තියෙන්ද යන සියල්ලෙන්ම තෝ අග්‍රවන්නෙහිය යම්සේ පුරපැළවිය දිනයෙහි පෙනෙන්නාවූ චන්ද්‍රයාට සියලු මනුෂ්‍යයෝ මුලු මුලුව වඳිද්ද එමෙන් තවුතිසාවැසි දෙවතාවෝ තට වඳිති පූජාසත්කාර කෙරෙති මෙසේ අග්‍රවන්ට කරණලද කුශලකර්මය කවරේදැයි විචාළසේක, මෙසේ තෙරුන්වහන්සේ විසින් විචාරණලද පැනය විසඳන්නාවූ දිව්‍යපුත්‍රතෙම මෙසේකීයේය

අහං භදන්තෙ අහුවාසි පුබ්බෙ
සුමෙධනාමස්ස ජිනස්ස සාවකො,
පුථුජ්ජනෝ අනවබොධෝ හමස්මි
යෝ සත්තවස්සානි පරිබ්බජිස්සං.

සත්ථාහං සුමේධස්ස ජිනස්ස සත්ථුනෝ
පරිනිබ්බුතසෙසාකතිණ්ණස්ස තාදිනෝ,
රතනුච්චයං හෙමජාලෙන ඡාදනං
වත්ථිත්ව ථූපසම්මිං මනං පසාදයිං.

යනුහෙයින් මේ මහා භද්‍රකල්පයට නිස්දහසක් වන කපින්යට බුදු වූ සුමේධනම් බුදුරජානෝ ලොකයෙහි පැනිර පවත්නා මොහාන්ධකාරවිධ්වංශනයකොට ලොව එකාලොකකෙරෙමින් ජනයජනයන් සසරසයුරෙන් එතරකොට සියලු බුඩකෘත්‍යයන්කොට නිමවා පිරිනිවන් පැවදුළකල්හි මනුෂ්‍යයෝ බුදුන්ගේ ධාතු පිහිටුවා දැගැබක්කොට පූජාසත්කාර කෙරෙනි එසමයෙහි එක්තරා පුරුෂයෙක් ශාසනයෙහි පැවිදිව සත්හවුරුද්දක් මුලුල්ලෙහි බ්‍රහ්මචර්‍යාව රක්ෂා කොට මාඝිඟඵලවශයෙන් නිශ්චලව සිත නොපිහිටිබැවින් මේ ජාතියෙහි අධිගමයකට පැමිණිය නොහැක්කේයයි කුකුස් ඇතිව සිවුරු හැරගිහිවිය එතකුදුවුවත් ශ්‍රද්ධාප්‍රඥා ඇතිහෙයින් සංවෙග බහුලව කර්ම්ඵලඅදහමින් දැගැබ්මලුව හමදිමින් සුවද ගඳ පිරිබඩ ලම්න් නිත්‍ය පඤ්චශීලය රකිමින් පොහොය පෙහෙවස්වෙසෙමින් බණඅසමින් අනිකුදු බොහෝකුසල්කෙරෙමින් සුචරිතකර්ම්යෙහි හැසුරුනේය ඒ කුශලකර්ම්ය හෙතුකොටගෙණ ආයුකෙළවර එසින් ගොස් තවුතිසා දෙව්ලොව ඉපිද උදරතරවූ කුසල්ඇතිව මහානුභාව ඇතිහෙයින් ශක්‍රයා ප්‍රධානකොට ඇති දෙවතාවන් විසින් කරණලද පූජාසත්කාරඇතිව එහි ආයුපමණින්සිට දිවඉසුරු විඳ එසින් චුතව නැවත නැවතත් දිව්‍ය සම්පත් විඳිමින් චුතිඋපපත්තිවශයෙන් සසර සැරිසරන්නෝ නිස්දහසක් කප්මුලුල්ලෙහි දිව්‍යමනුෂ්‍යසම්පත් අනුභවකොට ශෙෂවතුබ් එමකුශලකර්ම්විපාකයෙන් මේ බුඩොත්පාදකාලයෙහි අනෙකවර්ණදිව්‍යපුත්‍රයයි ප්‍රසිඩව මහත්වූ දිව්‍යසම්පත් අනුභවකරන්නාවූ දිව්‍යදෘත්‍රයාදූක මහතෙරහු විචාළපැණය විසඳන්නේ සවාමිනි මම සුමේධනම් බුදුන්ගේ ශාසනයෙහි පැවිදිව සත්හවුරුද්දක් බ්‍රහ්මචර්‍යාව රක්ෂාකොට උතුම ආර්‍යමාඝිඟයෙන් ගොස් පැමිණිය යුතුවූ අධිගමවශයෙන් මාඝිඟඵලයක් උපදවාගතනොහෙම්සි කුකුස් උපදවා කලකිරුණාවූසිත් ඇතිව සිවුරුහැර උපාසකධර්ම්යෙහි පිහිටා බුදුන්ගේ ධාතුපිහිටුවා මන්තෙහි රන්දැල්වසා බදනාලද සත්රුවන් දැගැබට ගඳදුම්මල් පහන් ආදියෙන් පූජාසත්කාරකොට දැගැබ්මලුව හැමද අනිකුදු බොහෝ කුසල්කෙරෙමින් අනුක්‍රමයෙන් බණ කියා අවවාදකොට මේ ධාතු පූජාකරව දන්දෙව සිල්රක්ෂාකරව යනාදින් කුසල් අකුසල් හඟවා බොහෝසේ උන්ලවාත් කුසල්කරවා ආතමාර්ථපරාර්ථ වශයෙන්

බොහෝ කුසල් රැස්කොට මේ දෙවියාලාව ඉපිද මේ දිව්‍යසම්පත්තියා වැද ශරීරාලෝකයෙන් දිදහිමත්ම බබලමි කියා කුශලකර්‍මය ප්‍රකාශ කොට කීයේය.

එකල්හි මහතෙරුන් වහන්සේ පිරිවරසහිත දිව්‍යපුත්‍රයාට විස්තර වශයෙන් බණවදාරා මිනිස්ලොවට වැඩ බුදුන්ට එපවත් කීසේක. බුදුරජානෝ එම අර්ථාන්පත්තිකොටගෙණ එතැන්හි සම්ප්‍රාප්තපිරිසට විස්තරවශයෙන් බණවදාළසේක; ඒ ධර්‍මදේශනාව බොහෝදෙනාට සාර්ථකවිය.

මේවිමානවත්ථුප්පකරණයෙහි පායාසිවග්ගයෙහි
අනෙකවණ්ණවිමානවත්ථුව ඨපිතා
නිමිමනලදි.

තවද මේ විමානවත්ථුප්පකරණයෙහි පායාසිවග්ගයෙහි **හියෝදසක විමානවත්ථුව** නම් කවරයත්?

සම්බුද්ධත්වයන් සම්භාරයෙන් දත්තාවූ බුදුරජානන්වහන්සේ රජ්ජ ගහනුවර වෙළුවනාරාමයෙහි වැඩවසනසේක; එසමයෙහි භික්ෂූහු ඡෙඤ්ඤුන්වහන්සේ දිසා මාගියට පැමිණ වඩනාසේක් අතරමග එක් තරා ගමකට පැමිණ ගෙපිළිවෙළින් පිඬුසිහා වඩනාසේක් ඒ ගම නාමගොත්‍රයෙන් අප්‍රසිද්ධවූ එක්තරා පුරුෂයෙකුගේ දොරසමීපයෙහි වැඩ සිටිසේක එකල්හි ඒ ගෙය හිමි පුරුෂයා අන්පා සෝදා පිරිසිදුකොට බත් අනුභවකෙරෙමින් හුන්නේය, ඔහුගේ භාර්‍යාව තලියෙහි බත් ලා ඉදිරියේ තුබුවාය එකල්හි භික්ෂූන්වහන්සේ දැක ප්‍රසන්නවූ සිත්ඇතිව තමන්ට අනුභවකිරීමට ළඟවනලද බත්පාත්‍රය ගෙණගොස් තෙරුන්වහන්සේගේ පාත්‍රයෙහි බහන්නේ තෙරුන්වහන්සේ විසින් එක්කොටසක් දෙවැනි වදාරණලද කල්හිද ඒ වචනය නැසුනුකන්ව ඒ බත් සියල්ලම නිමවා පිළිගැන්වීය එකල්හි තෙරුන්වහන්සේ ඔහට අනුමෙවෙනි බණවදාරා වැඩසේක, ඉක්බිති ඒ පුරුෂයා වනාහි මට අනුභවකිරීමට ළඟවනලද ආහාරය අනුභව නොකොට බුද්ධසාවසිට පිණ්ඩපාතයෙන් කලාහනවූ තෙරුන්වහන්සේට මා විසින් දෙනලද්දේ යයි නැවත නැවතත් සිහිකෙරෙමින් උදාරතරවූ ප්‍රීතිසොම්නස්ඇතිව එයින් මැතභාගයෙහි කාලක්‍රියාකොට පහළ ආහාරය අනුභවනොකොට දන්දුන් කුශලානුභාවයෙන් තව්තිසාදෙව්ලොව දෙළොස්යොදුන් රන්විමනෙක උපන්නේය එකල්හි ආයුෂම්වූ මුගලන්මහතෙරුන්වහන්සේ දෙවචාරිකාවෙන් වඩනාසේක් ඒ

හත්වූ දිව්‍යඍඞ්ධියෙන් දිළිලියෙන්නාවූ දිව්‍යපුත්‍රයා දැක මෙසේ විචාළ සේක.

"උච්චමිදං මණිථූනං විමානං
සමන්තතෝ ච්‍රාදසයොජනානි,
කූටාගාරා සත්තසතා උළාරා
වෙළුරියත්ථම්භා රුචකත්ථතා සුභා.

යනුහෙයින් එම්බා දිව්‍යපුත්‍රය මෙසේ වෛදූර්‍යමණිමය වැම් ඇත්තාවූ සතළිස්අටගවුපමණවූ සත්සියයක් කූටාගාරයෙන් ප්‍රතිමණ්ඩිතවූ නොයෙක් රත්නයෙන් විසිතුරුවූ භිත්තිදෙරකවුළු ආදියෙන් සැදුම්ලද්දවූ තාගේ මේ උදාරතරවූ විමානය ඉතා සොභාමත්ව දිළියෙයි තාගේ ශරීරවර්ණයද චන්ද්‍රමණ්ඩලය සේ දශදික්හි ඒකාලොකකෙරෙමින් දිළියෙයි මෙබදු සම්පත්ලැබීමට තාවිසින් පූර්ව්‍වජාතියෙහි කරණලද කුශලකර්මය කවරේදැයි විචාරා වදාළසේක; ඒ තෙරුන්වහන්සේ විසින් විචාරණලද පැනය විසඳන්නාවූ දිව්‍යපුත්‍රතෙම මෙසේ කීයේය.

"අහං මනුස්සෙසු මනුස්සභූතෝ
දිස්වාන භික්ඛුං තසිතං කිලන්තං,
එකාහං භික්ඛං පටිපාදයිස්සං
සම්බ්‍රාහතෙනාන තදා අකාසිං.

යනුහෙයින් සවාමිනි මම මීට පූර්ව්‍වජාතියෙහි මේ බුද්ධොත්පාදකාලයෙහි එක්තරා ශ්‍රද්ධාවන්තපුරුෂයෙක්වීමි එසමයෙහි එක්දවසක් ආහාරයෙන් කලාන්තවූ පිඬුපිණිස මාගේ ගෙදොරට පැමිණි තෙරකෙණකුන්දැක මට අනුභවකිරීමට සාදාගත් ආහාරපමණක් පූජාකෙළෙමි එපමණ කුශලකර්මය හෙතුකොටගෙණ මෙබදු දිවඉසුරක් ලදිමිහිකියේයඑකල්හි ආයුෂ්මත්වූ මුගලන් මහතෙරුන්වහන්සේ ඒ දිව්‍යපුත්‍රයාට විස්තරවශයෙන් බණ වදාරා මිනිස්ලොවට වැඩ බුදුන්ට එපවත් දැන්වූසේක බුදුරජානෝ එම අර්ථොත්පත්තිකොටගෙණ එතැන්හි රැස්වූ පිරිසට බණවදාළසේක ඒ ධර්මදේශනාව බොහෝදෙනාට සාර්ථකවිය.

මේ විමානවත්ථුප්පකරණපාළියෙහි පායාසිවගීයෙහි
ඡත්තිංසදායකවිමානවත්ථුව නිට්ඨිතා
නිමවනලදී.

තවද මේ විමානවත්ථුප්පකරණයෙහි පායාසිවග්ගයෙහි **සුනිසණ්ණ තත්ත විමානවත්ථුව** නම් කවරයත්?

ජලපොළොවසේ ගැඹුරුවූ ගුණඇති භාග්‍යවත් බුදුරජානන්ව හන්සේ එක්සමයෙක සැවැත්නුවර ජේතවනාරාමයෙහි වැඩවස නසේක එසමයෙහි ආයුෂ්මත්වූ මුගලන් මහතෙරුන්වහන්සේ එ ක්දවසක් යටකියනලද ක්‍රමයෙන් දෙවඇපිකාවෙන් වඩනාසේක් ත වුතිසාදෙව්ලොවට වැඩිසේක එකෙණෙහි එක්තරා දිව්‍යපුත්‍රයෙක් ත මාගේ විමානයෙහි සිටියේ මුගලන්මහතෙ රුන්වහන්සේ දැක හටග ත්තාවූ ගෞරව බහුමාන ඇතිව තෙරුන්වහන්සේ කරා එලැඹ නම ස්කාරකොට දෙහොත් මුදුන්දී එඇත්පස්ව සිටියේය.

ඒ දිව්‍යපුත්‍රයාගේ උත්පත්තිකථාවනම් කවරයත්?

යටගියදවස මේ මහාභද්‍රකල්පයෙහි පහුන්වැනිව බුදුවූ කාශ්‍යප නම් බුදුරජානන්වහන්සේ සියලු බුඩකෘත්‍යයන්කොට නිමවා පිරිනි වන් පෑවදාළ කල්හි ශරීරධාතුවසා ලෝවැසියන් විසින් දැහැබක් ක ළාහ; එසමයෙහි භික්ෂුභික්ෂුණී උපාසකඋපාසිකාදි බොහෝදෙනා රැස්ව ගඳදුම් මල්පහන් ආදියෙන් පූජාසත්කාරකෙරෙති, එසේ උ පාසකවරු මල්පූජාකොට ගියකල්හි ඒ ආසනවල පිදූමල් ඒ ඒ තැන තිබෙන්නා දැක එක්තරා උපාසකයෙක් ඒ මල්ගෙණ මලසුන්වල දැහැනියාකොට විසිතුරු රූපාලඞ්කාරයෙන් මල්සඳ පූජාකෙළේය, එසේ පුදා බුදුගුණසිහිකොට බුදුන්කෙරෙහි ප්‍රසන්නව උත්තමවූ බු දුන් උදෙසා මා විසින් මල්සඳ පූජාකරණලද්දේයයි කියා ඒ කුසල් අරමුණුකොට ඒ කුශලකර්මය සිත තබාගත්තේය ඒ උපාසකතෙම එ ඔන් අපරභාගයෙහි කාලක්‍රියාකොට ඒ කුශලානුභාවයෙන් තවුති සා දෙව්ලොව දෙළොස්යොදුන් රන්විමනෙක උපන්නේය, ඒ දිව්‍ය පුත්‍රතෙම මහත් ආනුභාව හා මහත් ඓශ්වර්‍යසම්පත්තිය හා පිරිවර සම්පත්ඇතිවිය එතැන්පටන් සුගතියෙහිම සැරිසරන්නේ මේ බු ඩොත්පාදකාලයෙහිද එසේම මහත් දිව්‍යසම්පත් අනුභවකෙරෙමින් සිට තෙරුන්වහන්සේ දැක වැඳ එකත්පස්ව සිටියේය එකල මහතෙ රුන්වහන්සේ ඒ දිව්‍යපුත්‍රයා දැක ඔහු විසින් ගියදවස කරණලද කු ශලකර්මය මේ ගාථාවලින් විචාළසේක.

"උච්චමිදං මණිථූනං විමානං
සමන්තතෝ මාදසයොජනානි,
කූටාගාරා සත්තසතා උළාරා
වෙළුරියත්ථම්භා රුචකත්ථකා සුභා.

ඝනාදීන් දක්වනලද හෙයින් එම්බා දිව්‍යපුත්‍රය වෛදූර්‍යමණිමය වැම් ඇත්තාවූ හාත්පසින් සතළිස්අටගවු පමණ මහත්වූ උදුරත රවූ සත්සියයක් කූටාගාරයෙන් ප්‍රතිමණ්ඩිතවූ නොයෙක් රතනයෙන් විසිතුරුවූ භිතත්දෙරකවුළු ආදියෙන් සැදුම්ලද්දුවූ තාගේ මේ විමානය ඉතා සොභාමත්ව දිළිසෙයි තාගේ විමානයෙහි පරිචාර දෙවතාවෝ දිව්‍යරසයෙන් යුක්තවූ අනනපානාදිය සදු කවර ඖජනයක් කවර රසයක් කවර පානවර්‍ගයක් අනුභවකරන්ට කැමතිසේක් දැයි යනාදීන් ප්‍රියබසින් ආරාධනාකොට උපකාරස්වීකාර කෙරෙති පවාහික තූර්‍යභාණ්ඩගත් දෙවතාවෝ නොයෙක් අලඞ්කාරයෙන් සැරහී නාට්‍යගීතවාද්‍යාදි පඤ්චකාමසම්පත්තියෙන් තොප සතුටුකරවති තාගේ ශරීරවර්ණයද චන්ද්‍රමණ්ඩලය සේ දශදික් එකාලොකකෙරෙමින් දිළිසෙයි මෙබදු මහානුභාවසම්පත් ලැබීමට තා විසින් පූර්ව ජාතියෙහි කරණලද කුශලකර්මය කවරේදැයි විචාරා වදාළසේක, ඒ තෙරුන්වහන්සේ විසින් විචාරණලද පැනය විසඳන්නාවූ දිව්‍යපුත්‍රතෙම මෙසේ කීයේය.

"දුන්නිකඛිත්තං මාලං සුනික්ඛිපිත්වා
පතිඨාපෙත්වා සුගතස්ස ථූපෙ,
මහිඞ්කොවමහි මහානුභාවෝ
දිබ්බෙහි කාමෙහි සමඞ්ගිභූතෝ.

ඝනුතෙසින් සවාමිනි මම යටගියදවස මිනිස්ලොව උපන්සමයෙහි එක්දවසක් කාශ්‍යපබුදුන්ගේ ධාතුවසා බදනාලද දැහැබ සම්පයට ගොස් මල්ආසනවල මල් පූජාකොට පැහැරීමෙන් ඒ ඒ තැන විසිරවැටී තිබෙන්නා දැක ඒ මල්ගෙණ මලසුන්වල විසිතුරුකොට සදුබුදුගුණ සිහිකිරීමෙන් සතුටුවීමි එපමණ කුශලකර්මය හෙතුකොට ගෙණ මහත්වූ දිව්‍ය සෘද්ධියෙන්ද ආනුභාවයෙන්ද පිරිවරින්ද ශරීරවර්ණයෙන්ද සියලු පඤ්චකාමසම්පත්තියෙන්ද අග්‍රවීමි කියේය මෙසේ ඒ දිව්‍යපුත්‍රයා තමාවිසින් කරණලද කුශලකර්මය ප්‍රකාශකොට කිකල ඕහට විස්තාරවශයෙන් බණවදාරා මිනිස්ලොවට වැඩ එපවත් බුදුන්ට දැන්වූසේක. බුදුරජානෝ එම අර්‍ථාපත්තිකොටගෙණ එතැන්හි සම්ප්‍රාප්තපිරිසට විස්තාරවශයෙන් බණවදාළසේක ඒ ධර්මදේශනාව බොහෝදෙනාට සාර්‍ථකවිය.

මේ විමානවත්ථුප්පකරණයෙහි සාමාවිමානයෙහි
සුනික්ඛිත්තවිමානවත්ථුව නිමවන ලදි.

තවද මේ විමානවත්ථුප්‍රකරණයෙහි පායාසිවගීයෙහි **උත්තරාවිමානවත්ථුවනම්** කවරයත්?

සකලගුණනිධානවූ භාග්‍යවත් බුදුරජානන්වහන්සේ රජගහ නුවර වෙළුවනාරාමයෙහි වැඩවසන සමයෙහි රජගහනුවර සුමන සිටානන්නිසා බැලමෙහෙකොට වසන්නාවූ පුණ්ණනම් දුගියෙක් බැල මෙහෙ පිණිස සී සාන්ට සන්නේ අඹුවට බත්ගෙණ එවයි කියා කෙත ට ගියේය. එකල්හි සැරියුත්මහතෙරුන්වහන්සේ නිරොධසමාපත්‍ති යෙන් නැගී ඔහු කෙරෙහි කරුණාවෙන් කෙතට වැඩිසේක. දුගීතෙ ම තෙරුන්වහන්සේ දැක දැහැටි පැන් පමණක් පිළිගැන්වීය. ඉක් බිති ඔහුගේ භාර්‍යාව බත්ගෙණ මගට ආබව දැන ඇතුළුනුවර බලා වැඩිසේක. ඒ උපාසිකාව තෙරුන්වහන්සේ දැක ගෙණයන ආහාර පිළිගන්වා නැවත ගෙට ගොස් ආහාරපිසගණ එසී. පූර්ණනම් දුගී යාද බිජුවට දැමුණක සා පියා විඩාව බඩගිනි ඉවසාගතනොහී ගොන් උනා සෙවනක පෙරමග බලබලා හුන්නේය උපාසිකාව පෙරමග බ ල බලාහුන් දුගියා දැක කෙවිටිලියෙන් තලාපුවහොත් නපුරැයි සිතා සවාමිනි අද එකදවසකට සිතපහදවා ගතමැනව සැරියුත් සවාමින් දැක නුඹට ගෙණ එන්නාවූ බතපිළිගන්වා නැවත ගෙට ගොස් බත් පි සගෙණ ආයෙමි සිත පහදවා පින්ගන්නැයි කිව ඉතා යහපත මාවිසි නුදු දැහැටි පැන් දෙනලද්දේයයි කියා පින්අනුමොදන්ව බත් අනු භවකොට මදක් නිදා නැගිසිට බිජු දැමුණක සාපු සීනාට රත්රන්ව ගියා දැක රජ්ජුරුවන්ට කීහ, රජ්ජුරුවෝ ඒ රත්රන්ගෙන්වා රජ ගෙයි මලුවේ ගොඩගසා නුවරවැස්සන් ගෙන්වා වඩුවෙන් අසූරියන් පමණ රත්රන්ගොඩ දක්වා මෙබදු රත්රන්රැසක් ඇත්තන්ට කුම ක් දෙන්ට වටනේදැයි විචාරා සිටුතනතුරු දෙන්ට වටනේයයි කිකල සිටුසේසන්දී බහුධනසිටානෝ යයි නමුත් දුන්හ; බහුධනසිටානෝ ගෙබිමක් ඉල්වා ගෙවල් කරන්නේ බොහෝ වසතුලැබ ගෙවල්කොට නිමවා බුදුපාමොක් මහසඟනට සත්දවසක් දන්දී බණ අසා භා ග්‍යවහා උතුතරානම් දියනියන් හා තුන්දෙනාම සෝවාන්වූහ සුමන සිටානන්ගේ පුතනුවන්ට උත්තරානම් දියනියන් සරණපිණිස දුන්හ ඒකුලය මිථ්‍යාදෘෂ්ටිහෙයින් දන්දෙන්වත් බණ අසන්වත් නොලැබ උත්තරාවෙ මව්පියන්ට එපවත්කියා යවූහ එබස්අසා බහුධන සිටා නෝ දියනියන් දුක්පත්ව ගියහයි නොසතුටු සිත්ඇතිව පසළොස් ද හසක් කහවණුදී යවන්නේ මේනුවරසිරිමානම් වෙශ්‍යාවක් ඇත දවස දවස දහස දහස බැගින් නියමකොට සිරිමානම් වෙශ්‍යාවට මේ කහවණු පසළොස්දහසදී සවාමියාට පාවාදී පසළොස් දවසකට අ

වසරගෙණ දන්දී බණ අසවයි කියා යැවූහ උත්තරාවෝද එසේම සිරිමාවෝගෙන්වා සවාමියාට පාවාදී අවසරගෙණ බුදුපාමොක් මහසඟනට දන්දෙන්නීය එක් දවසක් සිටුපුත්‍රයා සිව්මැදුරු කවුළුවෙන්මුලුනැන් ගෙය දිසාවබලා මෙසේ කැඳබත් පිසව මෙසේ පූපිසව යනාදීන් විධානකොට ඇවිදිනා උත්තරාවන් දැක අනේ මේපින්මද නුවණ නැති තැනැත්තී මෙබඳු ශ්‍රීසැපත් අනුභව නොකොට හිසමුඩු මහණුන්ට බන්දීමත් වැඩෙකැයි සිතා සැලිවල දැළිගැවී ඇවිදිනීයයි සිතා සිනාසී ගෙණ ඉවත්වීය සිරිමාව එපවත් දැක මේ සිටුපුත්‍රයා මේ සත්‍රියහා පුරුදුකමක් ඇතැයි සිතා උත්තරාවන් කෙරෙහි වෛරබැඳ පිටත් සත්‍රියෙකැයි සිතා ගින්නෙන් කකියන තෙල්සැන්දක් ගෙණගොස් උත්තරාවන්ගේ හිස මත්තෙහි වත් කළාය, උත්තරාවන්ගේ මෛත්‍රී ආනුභාවයෙන් තෙල් සිහිල්ව ගියේය සිරිමාවෝ ඒ තෙල් සිහිල්වනැයි සිතා නැවතත් කකියන තෙල් සැන්දක්ගෙණ උත්තරාවන්කරා නික්මුනාය එකල්හි උත්තරාවන්ගේ දැසියෝ දැක අවුත් අතින් පයින් තලා බිමහෙලා ගත්හ උත්තරාවෝ කෙල්ලන් නවතා සිරිමාව නහා සිටුවා අවවාදකොට සතපාක සහස්‍රපාකතෙල් ගල්වා උපකාරකළහ එකල්හි සිරිමාව පිටතින් අවුත් ඒගෙයි විසූබවත් උත්තරාවෝ ගෙහිමිබවත් දැන උත්තරාවන්ගේ පාමූල වැදහෙව මට ක්‍ෂමාකළමැණවැයි කිව්ය එකල උත්තරාවෝ බුදුන් ක්‍ෂමාකරණසේක් වී නම් මම ක්‍ෂමාකරවම්කියා බුදුන්කරාගොස් එපවත්කිහ එකල්හි බුදුරජාණෝ ධර්මදෙශනාකොට වදාළසේක ඒ බණ අසා උත්තරාව ශකෘදාගාමිවූවාය උත්තරාවන්ගේ සවාමිපුත්‍රයාහා නැදිමසිලෝද පන්සියයක් පරිවාර සත්‍රින්හා සිරිමාවද සොවාන්වූහ. උත්තරාව එයින්පසු නොබෝකලකින් කාලක්‍රියාකොට තවුතිසා දෙව්ලොව උපන්නීය එකල්හි ආයුෂ්මත්වූ මුගලන් මහතෙරුන්වහන්සේ දෙවවාරිකාවෙන් තවුතිසා දෙව්ලොවට වැඩ ඒ දිව්‍යාඟනාවදැක මෙසේ විචාළසේක.

"අභික්කන්තෙන වණ්ණෙන යා ත්වං තිට්ඨසි දෙවතෙ
ඔභාසෙන්තී දිසා සබ්බා ඔසධී විය තාරකා.

යනුහෙයින් එම්බා දිව්‍යාඟනාව නී ඔෂධී තාරකාවක්සේ ශරීරවර්ණයෙන් බබලන්නෙහීය මෙබඳු සම්පත් ලැබීමට පූර්ජාතියෙහි කරණලද කුශලය කවරේදැයි විචාළසේක, එකල්හි කුශලකර්මය ප්‍රකාශකොට දක්වන්නාවූ දිව්‍යාඟනාව මෙසේ කීවාය.

"ඉසඤ්ච මවෙජ්ඣරමථො පලාසො
නාහොසි මය්හං සරමාවසන්තියා,
අක්කොධනා භත්තුවසානුවත්තිනී
අපපමත්තා උපොසථා.

යනාදී සවාමිනි මම මිනිස්ලොව වසන සමයෙහි ඊශ්‍යාවහා මේ සුරුමලද ස්‍රුනග්‍රාහවශයෙන් උපදනා අභිමානයද ක්‍රොධයද දුරුකොට මෛත්‍රිසිත්ඇතිව සවාම්පුත්‍රයාට කීකරුව හිටියෙයි වෙසෙමින් පොහෝ පෙහෙවස් දිසීම් නිත්‍යපඤ්ශීලය රක්‍ෂාකෙළෙම්, මෙසේ නොයෙක් කුශලක්‍රියාවෙහි පිහිටමින් ශාක්‍යදුහිතා උත්තරානම උපාසිකාවක්වීමියි කීසා ලොභවෙශාදී අකුශලිත් දුරුව මෛත්‍රිකළ කුශලයෙන් මෙබදු සිරිසැපතක් ලදිමියි කියා ඉක්බිති සවාමිනි උත්තරානම උපාසිකාවක් නුබවහශේගේ ශ්‍රීපාදවඳින තමස්කාර කළායයි කියා බුදුන්ට දැන් වුව මැනවැයි කිව ඉක්බිති මුගලන්මහතෙරුන්වහන්සේ මිනිස්ලොවට වැඩ බුදුන්ව එපවත් දැන්වූසේක බුදුරජානෝ එමඅර්ථාත්පත්ති කොටගෙණ සම්ප්‍රාප්තපිරිසට බණ වදාළසේක ඒ ධර්මදෙශනාව බොහෝ දෙනාට සාර්ථකවිය.

මේ විමානවත්ථුප්‍රකරණයෙහි පායසිවගීහයෙහි උත්තරාවිමාන වත්ථුව රතනාවලියෙහි විස්තාරවශයෙන් එළුවූහෙයින් මෙතැන්හිසංක්‍ෂෙපයෙන් කියානිමවනලදි.

තඵද මේවිමානවත්ථු ප්‍රකරණයෙහි පායසිවගීහයෙහි **සිරිමා විමානවත්ථුවනම්** කවරයන්?

බුදුරජානන්වහන්සේ රජගහනුවර වේළුවනාරාමයෙහි වැඩවස න සමයෙහිසිරිමානම් වෙශ්‍යාව සෝවාන් ඵලයෙහි පිහිටි තැන්පටන් නිරන්තරයෙන් සංඝයාට ලහබත්දෙන්නිය එසමයෙහි භික්‍ෂූන්වහන්සේකෙණෙක් සිරිමාවගේ රූපශ්‍රිය අසා සිරිමාව දක්නාපිණිසම ලහබත් පමුණුවාගෙණ ගියසේක එකල්හි සිරිමාව ගිලන් වූහෙයින් ආහරණ ගලවා සංඝයා දක්නාපිණිස ගෙණාවාහුය; සිරිමාව දක්නාපිණිස ගිය උන්වහන්සේ සිරිමාවන්කෙරෙහිඇලි බත්පාත්‍රය ගෙණගොස් විහාරයේ එකත්පසෙක තබා නිරාහාරව වැදහොත්සේක සිරිමාව එදවස්ම කාලක්‍රියාකොට නිම්නා රතිනම්දෙවුලොව උපන්නීය බුදුරජානෝ සිරිමාව මලපවත් අසා මලශරීරය සඟයන් නොකනලෙස අමුසොහොන් හි රැකවල්ලවසිකියා රජ්ජුරුවන්ට අසුන්යැවූසේක රජු එසේකරවිය සතරවෙනිදවස රජ්ජුරුවෝ නුවරවැසියන් අමුසොහොන් හි රැස්කරවිය බුදුරජානෝ මහසඟපිරිවරාවැඩසේක එකල සිරිමාවගේ ශරීරය කුණුව නවදෙරින්වැහෙන පනුවන් විසින් සුදුව ඇල්සාලේබන් සැලියක්බිඳපුවාසේවිය, බුදුහු බිම්බිසාරරජ්ජුරුවන් කැඳවා මේ කවරෙක්දැයි විචාළසේක මේ නුවරවසිඟාවූ රූඇති සි

රිමාවෝයයි දැන්වූහ පෙරමේ ශිරිමාවකරා එන්නාහු දහසක්දී එක දවසක් වැසයෙනි දැනුදු එසේම කහවණු දහසක්දී ශිරිමාව කරා එන්ට කියවයි වදාළසේක එකල්හි රජ්ජුරුවෝදහසක්දී සිරිමාව ගෙණ යෙත්වයි කියා විධානකළෝය මනුෂ්‍යයෝ එබස් අසන්ටත් අප්‍රිය වූහ රජ්ජුරුවෝ සවාමිනි එබස් අසන්ටත්නොකමැත්තේයයි දැන්විය මහරජ එසේවීනම් අහයඅඩ්ඩකරවයි වදාළසේක රජ්ජුරුවො අඩු කරන්නාහු පන්සියයක් දෙවදෙසියපණසක්දෙව යනාදීන් අනුක්‍රමයෙන් අඩුකොට නොමිලයේගණිත්වයි විධානකළේය එකල තුෂ්ණීම්භූතවම සිටි මිනිසුන් දැක සවාමිනි නොමිලයෙ ගෙණයන කෙණෙක්වත් එබස්අසන්නෙක්වත්නැතැයි දැන්විය එකල්හි බුදුරජාණෝ සිරිමාවදැක නිරාහාරව සිටි භික්ෂූන් වහන්සේ කැඳවා මහණෙනි මේගණිකාව පෙර ඇවිදිසැටියට දැන්කෙසේ තිබේද මුව පියුමෙහි රූපනැමැති රේනුවට ආ බඹර සමූහයක් වැනියයි කවිජනයාවිසින් වර්ණනීයවූ හිසකේ දැන්කොයිලෙස තිබේද යනාදීන් කරුණපයදක්වා බණ වදාළකසේක දෙශනාකෙළවර සවාසූදහසක් ප්‍රාණීහු අමාමහනිවන් දුටුවාහුය සතර දවසක් නිරාහාරයෙන් සිටි භික්ෂූන්වහන්සේ එකෙණෙහිම සෝවාන්ඵලයෙහි පිහිටා නැවත එමඅරමුනුකොට සකලක්ලෙශයන්නසා රහන්වූසේක බෙහි විසතර රතනාවලියෙන්දැත්‍යුතු එකල්හි සිරිමානම් දිව්‍යාඟනාව ඇගේ දිව්‍යඵෙශ්‍යයෂ්‍ය බලා පූර්ජානිය බලන්නී තමාගේ ශරීරය සම්පයෙහි රැස්වසිටිනා මහජනයා සමඟ මහසඟ පිරිවරාසිටි බුදුන්දැක පන්සියයක් දිව්‍යාඟනාවන්හා පන්සියයක් රථපිරිවර කොට ඇති මහත් රථවිමානයකට ආරුඪව අවුත් රථයෙන් බැස පන්සියයක් දෙවඟනන්පිරිවරා බුදුන්කරා එලැඹ නමස්කාරකොට දෙහොත්මුදුන්දී එකත්පස්ව සිටියාය; එකල්හි ආයුෂ්මත්වූ වඟීස මහතෙරුන් වහන්සේ බුදුන්සම්පයෙහි සිටිසේක් බුදුන්ගෙන් අවසරගෙණ මෙසේ විචාළසේක.

සුභනාව තෙ පරමං අලංකතා හයා
අධොමුඛා අසසිගමා බලිජවා;
අභිනිම්මිතාපචරථා සතා චතෙ
අනෙති නං සාරථිචොදිතා හයා.
සා නිඪසී රථවරෙ අලඞ්කතා
ඔභාසයං ජලම්වජොතිපාවකො,
පුචඡාමි තං වරතනුනොමදස්සනෙ
කසමා කායා අනධිවරං උපාගමී'නි.

යනුහෙයින් නොයෙක් අලංකාරයෙන් නිර්මිත ජවබල සම්පන්නවූ අසුන්යොදනලද රථපන්සියයක්පිරිවරා මිනිස් ලොව බලා ආකාශයෙන් එන්නාවූ රථවිමානාරූඪව අවුත් රථයෙන් බැස බුදුන්දක්නාපිණිස බුදුන්කරා එලඹියාවූ තීකවර දිව්‍යනිකායක සිටඅාවාද තීකවරියක්දැයි විචාරා වදළසේක; එබස්අසා ඒදිව්‍යඟනා වමෙසේකිව;

"කාමග්ගපත්තානං ය මාහූනන්තරා
නිම්මාය නිම්මායචරන්තදෙවතා;
තසමා කායා අච්ඡරා කාමවණ්ණිනි
ඉධාගතං අනඛිවරංනමස්සිතු"නති.

යනුඉයින් සාමිනි නිම්මාණරතීනම් දිව්‍යනිකායෙහි සිට බුදුන්දක්නට ආයෙම් කිව; එකල්හි ඒදිව්‍යලොකයෙහි උපදින්ට කළාවූ කුශලකර්මය විචාරණුකැමතිව මෙසේ විචාළසේක.

"කිං නිං පුරෙ සුචරිතමාචරී ඉධ
කෙනාසි නිං අම්තයසා සුඛෙ සිතා;
ඉඛ්ච තෙ අනඛිවරා විහඝමා
වණ්ණාව තෙ දසදිසතා විරොචති.

යනුහෙයින් නී කවරකුශලයක්කොට මෙබඳු සම්පත්තියක් ලද්දීදැයි විචාළසේක; ඒදිව්‍යඟනාවද මෙසේප්‍රකාශ කළාය.

"නගරන්තරෙ නගරවරෙ සුමාපිතෙ
පරිවාරිකා රාජස්ස සිරිමතො;
නවෙවසු ගීතෙසු පරමෙසු සික්ඛිතා
අහුං සිරිමානි මං රාජගහෙ අවෙදිසු.

යනාදීන් සාමිනි රජගහනුවර සිරිමානම් වෙශ්‍යාදුවක්ව බුදුන්ගෙන්බණඅසා සොවාන්ඵලයෙනි පිහිටා දානසීලාදි කුශල්කොට මෙබඳු දිවඉසුරු ලැබසතුටුව මම බුදුන්හා භික්ෂුසංඝයා වදනා පිණිස අායෙමිකියා කුශලකර්මය ප්‍රකාශකොට බුදුන්ටද භික්ෂුසංඝයාටද වැඳඅවශරගෙණ දෙවුලොවටම ගියාය බුදුරජානන් වහන්සේ එමඅජ්ඣාත්පත්තිකොටගෙණ සම්ප්‍රාපනපිරිසට බණ වදළසේක ඒධම්මදෙශනාවසා උකටලි භික්ෂූන්වහන්සේ රහත්වූසේක, සම්ප්‍රාපනපිරිසට ද ඒධම්මදෙශනාවසාඛ්‍යිකාවිය.

මේ විමානවත්ථුප්‍රකරණයෙහි පාඨාසිවගීයෙහි සිරිමාවිමාන වත්ථුවණ්ණනාවසානයෙන් නිඝණ්ඨිමවග්ගය නිමියේදි.

තවදමම් විමානවත්ථුප්පකරණයෙහි පායාසිවග්ගයෙහි **ලඛුමාවි මානවත්ථුවතම්** කවරයත් ?

මහාකාරුණිකවූ භාග්‍යවත් බුදුරජානන්වහන්සේ බරණැස් නුවර වැඩවසනසමයෙහි බරනැස්නුවරසම්පයෙහි කෙවුල්නම් ගමෙක්ඇත ඒගමදෙරට හා නුවරදෙරට අතුරෙහි නිවාසවූ ගමටද කෙවුල්දෙරනම්විය ඒගම ලඛුමානම්වූ ශ්‍රද්ධාබුද්ධිසම්පන්න එක්තරා සත්‍රියක් පිවුපිණිස දෙරකඩින් වඩනා භික්ෂූන්දැක නමස්කාරකොට ගෙට වඩාගෙණ ගොස් බත්සැන්දක්දෙන්නීය මෙසේ පුරුදු කිරීමෙන් ශ්‍රද්ධාවවඩා භොජන සාලාවක්කරවා ඒ භොජන ශාලාවට වඩනා සංඝයාට අසුන්පණවාදී බොනපැන්හා පරිභෝගපැන් ඵලවා උපකාර කෙරෙයි තමන්ගේ ගෙයි අහරකොමුආදී යම්කිසිකන බොන දෙයක් ඇත්නම් එසිනිදු සංඝයාට දන්දෙයි පසුව භික්ෂූන්ගේ සම්පයෙහිදී බණ අසාසරණශීලයෙහි පිහිටා කම්මඃඨාන ඉගෙණ උත්සාහ කරන්නී හෙතුසම්පත්ඇතිහෙයින් නොබෝ කලකින් සෝවාන් ඵලයෙහි පිහිටියාය.

ඒ සත්‍රී කාලක්‍රියාකොට තවුතිස දෙවුලොව මහත්වූ දිව්‍යවිමානයෙක ඉපිද දහසක් පරිවාරස්ත්‍රීන් පිරිවරා දිව්‍යසම්පත්අනුභව කෙරෙයි එසමයෙහි ආයුෂ්මත්වූ මුගලන්මහතෙරුන්වහන්සේ දේව චාරිකාවෙන් වඩනාසේක් ඒදිව්‍යාංගනාව දැක මෙසේ විචාළසේක.

"අභික්කන්තෙන වණ්ණෙන යා ත්වං තිට්ඨසි දෙවතෙ
ඔභාසෙන්තී දිසා සබ්බා ඔසධිව්‍ය තාරකා.

යනාදීන් සම්පත් වර්ණනාකොට පෙර ජාතියෙහි කරණලද කුශලකර්මය විචාරා වදාළසේක, ඒදිව්‍යාංගනාවද මෙසේ ප්‍රකාශකළාය

"කෙවට්ටවාරා නික්ඛම්ම අහු මයහං නිවෙසනං
තත්ථ සංවරමානානං සාවකානං මහෙසිනං,
ඔදනං කුම්මාසං සාකං ලොණ සොවිරකඤ්ජිකං.
අදාසිංඋජුභූතෙසු විපපසන්නෙනන චෙතසා,

යනුහෙයින් සාමිනි කෙවුල්ගම් දෙරමාගේ වාසභවනය ඒදෙරකඩින් නික්ම වඩනා සංඝයාට කුරපලාආදී ව්‍යඤ්ජන සහිත බත්හා කොමුද බත්රසහා බොහෝදෙය එක්කොට ලුණුම්ශ්‍රවූ ඇඹුල් කැඳ ද පහන්සිත්ඇතිව පූජාකෙළෙමි පසසීලයහා පොහෝපෙහෙවස් වෙසෙමින් ශීලාදිගුණධර්මයෙහි පිහිටිලඛුමානම්වූ සොවාන් උපාසිකාවක්වීමි එමකුශලය හේතුකොටගෙණ මේදිව්‍යසම්පත් ලදිමි කියා ඉක්බිති සාමිනි ලඛුමානම් උපාසිකාවක් බුදුන්ගේ ශ්‍රීපාදවන්දනයටනමස්කාර කෙරෙති කියා බුදුන්ව දන්වා වදාළමැණවැ සික්ව, එකල්හි තෙ

රුන්වහන්සේ මරිතබලා බණ වදාළසේක. ඒ බණඅසා ශකාදාහාමිවූ වාස මහතෙරහු මිනිස්ලොවට වැඩ බුදුන්ට එපවත්දන්වූසේක බුදුරජාණෙ සමිදාප්තපිරිසටද බණවදාළසේක ඒධම්මදෙශනාව බොහොදෙනාට සාර්ථකවිය,

මේ විමාන වත්ථුප්‍රකරණයෙහි පායාසි වග්ගයෙහි ලඹුමා විමාන්වත්ථුවර්ණනා නිමවනලදි.

තවද මේවිමාන වත්ථුප්‍රකරණයෙහි පායාසි වග්ගයෙහි **උච්චුදසි කා විමානවත්ථුව** නම් කවරයන් ?

කරුණාවෙන් සිහිල්වූ භාග්‍යවත් බුදුරජානන්වහන්සේ එක්සම යෙක රජගහනුවර වේලුවනාරාමයෙහි වැඩවසනසේක, එසමයෙහි ආයුෂ්මත්වූ මුගලන්මහතෙරුන්වහසේට උපස්ථාන කරන්නාවූ රජ ගහනුවර එක්තරා ශ්‍රද්ධාවන්ත කුලයෙක නිරන්තරයෙන් දන්දී මෙහි ඇලුම් ඇත්තාවූ ශ්‍රද්ධාවත්තකුමාරිකාවක් ඇත්තිය පෙරවරු භාගයෙහි කිසියම් කනබොන දෙයක් ලද්දිනම් තමන්ලත් කොටසින් භාගයක් දන්දී අනුභවකරන්නිය දන්නොදී අනුභවනොකරන් නිය දන් පිළිගන්ට නිසි සිල්වත් කෙනෙකුන් බත්වේලේ නුදුටුව හොත් භාගයක් සඟවා තබා දුටුකල දන්දෙන්නිය යාචකයන්ටත් එසේම දන්දෙන්නිය එකල්හි ඇගේ මැනියෝ මාගේදුව දැනාව්‍යාශ ඇත්තියයි ක්‍රියා සතුටුසිත්ඇතිව පළමුත් කොටස දන්දුන්කල අනික් කොටසක්දෙයි සිල්වතුන් දුටුකල එසිතුදු කොටසක් දන්දෙන්නිය මෙසේ කල්යවනකල ඇගේ වවුපිය දෙදෙන වැඩිවිය පැමිණෙනලද ඒ කුමාරිකාව එම නුවර සමාන කුලයෙක කුමාරයෙකුට සරණ කොට දුන්හ; ඒ කුලය මිථ්‍යාදෘෂ්ටිවන්නාහ, කුනුරුවන් කෙරෙහි අප්‍ර සන්නය ශ්‍රද්ධානැත්තාහ, එසමයෙහි ආයුෂ්මත්වූ මුගලන් මහතෙරු න්වහන්සේ රජගහනුවර පෙපිළිවෙළින් පිඬුසිඟා වඩනාසේක් ඒ කුමාරිකාවගේ මයිලනුවන් දෙර වැඩසිටිසේක, ඒ කුමාරිකාව තෙ රුන්වහන්සේ දැක සතුටුසිත්ඇතිව නමස්කාරයොට මෙසේ වැඩිය මැනවයි කියා ගෙටගොස් නැන්දනියන් විසින් සඟවා තබනලද උක් දඬු කඩක් දැක නැන්දනියන් ආකල මෙපවත් කියා පින්අනුමොද න්කරවම් සිතා විශ්වාසයෙන්ගෙණ තෙරුන්වහන්සේට පූජාකළාය, මහතෙරුන්වහන්සේ අනුමෝදනාකොට වැඩිසේක ඉක්බිති ඒ කු මාරිකාව නැන්දනියන් ආකල කියන්නී මැනියෙනි නුබවිසින් සඟ වා තබනලද උක්දඬුකඩ මුගලන් මහතෙරුන්වහන්සේට පූජා කෙ ළෙමි. පින්අනුමෝදන්වෙවයි කීවාය, එබසට කිපී කිමෙක්ද නපුරු

කෙල්ල මාසහතක උක්දඩු කඩ මා නොවිචාරා හිසමුඩු ශ්‍රමණයාට දුන් නිදසි කියා බැණ තට තටයන අනුකරණ ඇතිව ක්‍රොධයෙන් දිලිහි කටයුතු නොකටයුතු සලකාගත නොහී ඉදිරිපිට තුබූ පුටුවක් ගෙණ පහරක්දුන්නිය ඒ කුමාරිකාව සුකුමාලවූ ශරීරඇතිහෙයින්ද ගෙවූ නාවූ ආයුඇතිහෙයින්ද, එම පහරින්ම කාලක්‍රියාකොට තවුතිසා දිව්‍යලොකයෙහි උපන්නිය උපන්කෙනෙහිම මේ දිව්‍යසම්පත් ලැබීමට කළාවූ කුශලය කවරේදැයි පරීක්ෂාකොට උක්දඩුකඩ දුන්නාවූ කුශලය හේතුකොටගෙණ පහළවූ බවදැක තෙරුන්වහන්සේ කෙරෙහි පැහැද උපස්ථාන කරන්ට යෙම් සිතා එදවස් රාත්‍රියෙහි මිනිස්ලොවට අවුත් හිජුකුළු පව්ව හාන්පසින් හිරු සඳු එකවිට උදාවූවාසේ ශරීරාලොකයෙන් එලිකොට තෙරුන්වහන්සේට පසඟ පිහිටුවා නමස්කාරකොට දෙඉහොත් මුදුන්දී එකන්පස්ව සිටියාය. එකල්හි මුගලන්මහ තෙරුන්වහන්සේ ඒ දිව්‍යාඟනාව විසින් පූජාකිරීමෙහි කරණලද කුශලකර්මය විචාරණ්හු කැමතිව මෙසේවිචාළසේක;

ඔභාසයි තුවං පඨවිං සදෙවකං
අතිරොචසි චන්දිමසූරියා විය
සිරියා ච වණ්ණෙන යසෙන තෙජසා
බ්‍රහ්මාච දෙවෙ නිදසෙ සඉන්දකෙ
පුච්ඡාමි තං උපපලමාලධාරිනි
ආවෙලිනි කඤනසන්නිභත්තනෙ,
අලඞ්කතෙ උත්තමවත්ථධාරිනි
කා තුවං සුභෙ දෙවතෙ වන්දසෙ මමං,

යනුහෙයින් චන්ද්‍රසූර්‍යයන්ගේ ශරීරවර්ණයෙන් සියලු පෘථිවිය ඒ කොභාසකොට බබලන්නාවූ නී කවරෙක්ද? මෙබඳු දිව්‍යඑශ්වර්‍යය ක්ලැබීමට කළාවූ කුශලය කවරේදැයි විචාරා වදළසේක, එකල්හි ඒ කුශලය ප්‍රකාශකොට දක්වන්නාවූ දිව්‍යාඟනාතොමෝ මෙසේකිවාය.

ඉදානි භන්තෙ ඉමමෙව ගාමෙ
පිණ්ඩාය අම්හාක ඝරං උපාගමි
තතො තෙ උච්ඡුස්ස අදාසි ඛණ්ඩිකං
පසන්නචිත්තා අතුලාය පීතියා;
සසඤ්ච පච්ඡා අනුග්ගණ්හතෙ මමං
කහන්නු උච්ඡුං මධුකෙ අවාකිරි
නච්ඡඩ්ඩිතං නව පන ඛාදිතං මයා
සන්තස්ස භික්ඛුස්ස සයං අදාසහං,

තුය්හම්දං ඉස්සරියං අථො මමං
ඉතිස්ස සස්සු පරිභාසතෙ මමං
පීථං ගහෙත්වා පහරං අදාසි මෙ
තතො චු තා කාලකතම්හි දෙවතා;

ඇතැම්හු කියන්නී සැමියනි යටගියදවස මේ රජගහනුවර එක් තරා කුලයෙක යෙහෙළියක්විමි එසමයෙහි පිඬුපිණිස වැඩියාවූ නුබ වහන්සේට නැන්දනියන් සතුනක උක්දඬුකඩක් පූජාකෙළෙමි ඉක්බිති නැන්දනියන්ට කියන්නෙමි මැනියෙනි නුබ සතුනකවූ උක්දඬුකඩ සන්සුන් කෙළෙසුන්ඇති යහපත් තෙරකෙණෙකුන්ට පූජා කෙළෙමි, පින්ගැහුවයිකිම් එකල්හි නැන්දනියෝ දණෙඬන්හැසූ නයෙකු සේ ක්පී කායඃී කායඃී සලකාගත නොහී ඉදිරියේතුබූ පුටුවක්ගෙණ පහරක්දුන්නීය මම එකණෙනිම කාලක්‍රියාකොට ඒ උක්දඬුකඩ දුන්නාවූ කුශලයෙන් තවුතිසා දිව්‍යලොකයෙහි ඉපිද උදරතරවූ පඤ්ච කාමසම්පත් අනුභව කරමින් සක්දෙව් මහරජානන්හා තවුතිසාවැසි දෙවියන්විසින් රක්ෂාකරණලදුව දෙවියන් පිරිවරා නන්දනවනයෙහි බබලන්නාවූ ශක්‍රයාමෙන් මහත් දිවඉපුරක් ලදිමිදි කියා ඉක්බිති නුබවහන්සේගේ ගුණසලකාඅවුත් නමස්කාරකෙළෙමි කියා ප්‍රශංසා කොට ඔැඳ අවසරගෙණ, දෙව්ලොවට ගියාය මහතෙරුන්වහන්සේ ඒ සියලුම ප්‍රවෘත්තිය බුදුන්ට දැන්වූනේක බුදුරජානන්වහන්සේ එම අර්ථොත්පත්තිකොටගෙණ, සම්ප්‍රාප්ත පිරිසට බණ වදාළසේක; ඒ ධර්මදෙශනාව බොහෝදෙනාට සාර්ථකවිය

මේ විමාන වස්තුප්‍රකරණයෙහි පාඨාසි වශියෙහි උච්චුදුම්බරිකා විමානවර්ණනාව කියා නිමවනලදී

නවද මේ විමානවස්තු ප්‍රකරණයෙහි පාඨාසිවර්ගයෙහි **පළල ඔකවිමානවත්ථුව** නම් කවරයත්?

සකල ගුණනිධානවූ භාග්‍යවත් බුදුරජානන්වහන්සේ එක්සමයෙක සැවැත් නුවර ජෙතවනාරාමයෙහි වැඩවසනසේක එසමයෙහි සැවැත්නුවර එක්තරා කුලපුත්‍රයෙකුගේ දියනියක් ඇත්තිය ඒ කුමාරිකාව එනුවර සමාන කුලඇති එක්තරා කුලපුත්‍රයෙකුට සරණ පිණිස මවුපියන් විසින් දෙනලද්දී ක්‍රොධනොකරණ සවාභාවඇතිව සවාමිපුත්‍රයා දෙවතාකොට උපකාරසත්කාර කෙරෙමින් නිති පන්සිල් රකිමින් පොහෝ පෙහෙවස් වෙසෙමින් යහපත්කොට ගිහිධර්මය රක්ෂාකළාය; ඒ උපාසිකාව එසින්පසු නොබෝකලකින් කාලක්‍රියා කොට ඒ කුශලකර්මය හේතුකොටගෙණ තවිතිසා දෙව්ලොව උතුම්

වූ රත්විමනෙහි උපන්නිය;

එසමයෙහි ආයුෂ්මත්වූ මුගලන් මහතෙරුන්වහන්සේ දෙවවාරිකාවෙන් වඩනාසේක් ඒ දිව්‍යාඟනා දැක මෙසේ විචාළසේක:

පල්ලඞ්කසෙඨේ මණිසොණ්ණ චිත්තෙ
පුපඵාතිකිණ්ණෙ සයනෙ උළාරෙ
තත්‍රච්ඡසි දෙවි මහානුභාවෙ
උච්චාවචා ඉඞ්ඛිතකුබ්බමානා

ඉමාච තෙ අච්ඡරායෝ සමන්තතෝ
නච්චන්ති ගායන්ති පමොදයන්ති
දෙවිඞ්ඛිපත්තාසි මහානුභාවෙ
මනුස්සභූතා කිමකාසි පුඤ්ඤං

කෙනාසි එවං ජලිතානුභාවා
වණ්ණොච තෙ සබ්බදිසා පභාසතීති.

යනුහෙයින් එම්බා දිව්‍යාඟනාව නිගේ මේ නොයෙක් විචිත්‍ර චිත්‍ර කර්ම්මාන්තයෙන් හා නොයෙක් රැස්විහිදෙන්නාවූ උදුරතරවූ පයිඞ්ඛය මාණික්‍යරත්නයෙන්හා ඝණරණින් නිමියේය යනාදීන් සම්පත් වණ්ණනා කොට මෙබඳු සම්පත් ලැබීමට කරණලද කුශලකර්ම්මය කවරේදැයි විචාළසේක ඒ කුශලකර්ම්මය ප්‍රකාශකරන්නාවූ දිව්‍යාඟනාව මෙසේ ප්‍රකාශකළාය.

අහං මනුස්සෙසු මනුස්සභූතා
අඤ්ඤෙ කුලෙ සුනිසා අහොසිං,
අක්කොධනා භත්තුවසානුවත්තිනී
අහොසිං අපපමත්තා උපොසථෙ,

මනුස්සභූතා දහරාය පාපිකා
පසන්නචිත්තා පතිමාභිවාදයිං
දිවාච රත්තොච පචාරිනී අහං
පුරෙ සද්ධා සීලවතී අහොසිං,

පාණාතිපාතා විරතා අචොරිකා
සංසුද්ධකායා සුචිබ්‍රහ්මචාරිනී,
අමජ්ජපානාච මුසාඅභාසිනී
සික්ඛාපදෙසු පරිපූරකාරිනී

යනුහෙයින් සඞ්ඝමිනි මම මිනිස්ලොව වසන සමයෙහි ගව ධනරත්නාදියෙන් ආඪ්‍යවූ කුලයෙක ක්‍රොධනැත්තාවූ සවාමියාට අනුකූල පැවතුම් ඇත්තාවූ අප්‍රමාද සභාගව ඇත්තාවූ යෙහෙළියක්විම් එසමයෙහි නිත්‍යපඤ්චසීලය රකිමින් පොහෝපෙහෙවස් වෙසෙම්න් පුරුෂයාට රුදුවල් දෙක්ගිම අප්‍රමාදව වැඳිම් පිදිම් ආදී ආචාරසිලයෙන් යුක්තවිම් තුනුරුවන් කෙරෙහි පහන්සිත් ඇත්තාවූ ශ්‍රද්ධාවන්තාවූ බුදුන්ගේ ශාසනයෙහි ශීලාචාරවූ උපාසිකාවක්ව ප්‍රාණඝාතාදි දශවිධඅකුසලින් දුරුව දශවිධවූ කුසල්කොට මේ දිව්‍යස්ත්‍රී සම්පත්තියක් ලදිම් කීවාය එකල්හි මුගලන්මහතෙරුන්වහන්සේ විස්තරවශයෙන් බණවදාරා මිනිස්ලොවට වැඩ බුදුන්ට එපවත් දැන්වූසේක බුදුරජානෝ එම අඤ්ඤාත්පත්‍රති කොටගෙණ සම්ප්‍රාප්ත පිරිසට විස්තරවශයෙන් බණවදාළසේක, ඒධම්මදේශනාව බොහොදෙනාට සාර්ථකවිය.

මේ විමානවත්ථුප්‍රකරණයෙහි පාඨාඛිවඟ්ගයෙහි පල්ලඞ්ක විමානවත්ථුවකියා නිමවනලදි.

තවද මේ විමානවත්ථු ප්‍රකරණයෙහි පාඨාසිවඟ්ගයෙහි **ලතාවි මානඛත්ථුව** නම් කවරයත්?

භාග්‍යවත් බුදුරජානන්වහන්සේ එක්සමයෙක සැවැත්නුවර ජෙතවනාරාමයෙහි වැඩවසනසේක, එසමයෙහි සැවැත්නුවර වසන්නාවූ එක්තරා උපාසකයෙකුගේ නුවනැත්තාවූ කාය්‍යාකාය්‍යයෙහි දක්ෂවූ සථානොචිත ප්‍රඥාවෙන් යුක්තවූ ලතානම් දුවක් ඇත්තිය; ඒ කුමාරිකාව එක්තරා පුරුෂයෙකුට සරණපිණිස පනිකුලයට ගිය නැනැත්තී සවාමියාටහා නැදිමයිලන්ට ප්‍රියමනාපවන්නිය, ඒ ගෙයි සිය ලුබර උසුලන්ටද වසතුරස් කිරීමටද පිරිවර ජනයාට සංග්‍රහකරන්ටද සමර්ථව ක්‍රොධනොකිරීම සවභාවකොට ඇත්තිය; තුනුරුවන්කෙරෙහි පැහැද නොකඩකොට නිරන්තරයෙන් පන්සිල් රකිමින් පොහෝ පෙහෙවස් වෙසෙම්න් දන්දීමෙහි ඇලුම්ඇතිව නොපමාව දන ශීලාදිවශයෙන් බොහෝ කුශල්රැස්කළාය ඒ උපාසිකාව එයින් පසු නොබෝකලකින් කාළක්‍රියාකොට චාතුම්මහා රාජික දිව්‍යලොකයෙහි වෙසමුනිරජ්ජුරුවන්ට දුව උපන්නී ලතාදිව්‍යාඟනාවයයි ප්‍රසිඩවූවාය ඒ ලතාවගේ නැගනිවූ සැරියාය පවරාය අඩවිමුඛිය සුනාසයි නාමා අනිකුදු දිව්‍යාඟනාවෝ සතරදෙනෙක් ඇත්තානුය ශක්‍රදෙවෙන්ද්‍රයා විසින් ඒ දෙවඟනන්පස්දෙනාගෙන්වා තමන්ට නැටුම් ගිකිම් ආදිය පිණිස නාටකඉත්ථි භාවයෙන් පරිචාරිකාඨානයෙහි තබනලද්දාවූ ඔවුන් පස්

දෙනා අතුරෙන් ලතාදිව්‍යාඟනාව නැටුම් ගීකීම් ආදියෙහි දක්ෂ බැවින් අනික් සතරදෙනාට වඩා දෙවියන්ට ප්‍රියවන්නිය ඒ පස්දෙනම සමනිව සැපවිහරණයෙන් හුන්නාහුය නෘත්‍යගීත කිරීමෙහි මම සම ජීයෙමි මම සමඤ්ඤයෙමි කියා උන්ගේ නෘත්‍යගීත පිණිස විවාදයෙක් උපන එසේ විවාදකොට වෙසමුනි රජ්ජුරුවන්කරාගොස් පියානන් වහන්ස අප පස්දෙනා අතුරෙන් නෘත්‍යගීත ක්‍රීමෙහි කවරක් සමඤ්ඤී දැයි විචාළාහුය එකල වෙසමුනිරජ්ජු කියන්නේ දූවරිනි නොපිගොස් හි මවත අනවතප්ත විලසම්පයෙහි දෙවසමාගමයෙහි නටව එකල්හි තොපගේ සඤ්ඤාව ප්‍රකාශවන්නේ යැයි කීයේය, ඒ දිව්‍යාඟනාවෝද යහපතැයි කියා අනවතප්ත විල දෙවසමාගමයෙහි නටන්නාහු ලතානම් දෙවුදුව නටනකල දෙවතාවොා තමතමන් සවභාල්ලාවෙන් හිඳගත නොහී සිතහටගත් සන්තෝෂයෙන් ආශ්චර්‍යීය අද්භූතයයි ප්‍රීතිවාක්‍ය පවත්වා සාධුකාර දෙමින් ඔල්වර හඬගසමින් පිළිනිස සිසාරමින් සියලු හිමාලවනය කම්පාකරන්නාසේ එක කෝලාහල කළාහුය අනික් සතරදෙනා නටනකල සිතකාලයෙහි හැකිලසිටිනා කොවුලන්සේ තූෂ්ණීම්භූතව හුන්නාහුය එකල ලතාවගේ සමඤ්ඤකම විශෙෂයෙන් ප්‍රකාශවිය, ඒ දිව්‍යාඟනාවන් සතරදෙනාට මෙබඳු සිතෙක් පහළ විය මේ ලතාව කවරකුශල කම්යක්කොට අපසියල්ලම අභිභවනය කොට බබලාද? මෙබඳු ඓශ්වර්‍යීයක් ලැබීමටකළාවූ කුශලය කව රේදැයි කියා සුතානම් දිව්‍යාඟනාව විචාළාය ඒ දිව්‍යාඟනාවද කුශලය ප්‍රකාශකොටකිව එසමඟයෙහි දෙවචාරිකාවෙන් දෙවුලොවට වැඩියාවූ මුගලන් මහතෙරුන්වහන්සේට වෙසමුනිරජ්ජුරුවෝ ඒසියලුම ප්‍රවෘත්තිය කියේය මුගලන් මහ තෙරුන්වහන්සේ මිනිස්ලොවට වැඩ කුශලකර්මය විචාරීමට කාරණා සහිතව මුලපටන් සියලුම ප්‍රවෘත්තිය බුදුන්ට දන්වනසේක්;

ලතාව සජ්ජා පවරා ච දෙවතා
අච්චිමුඛී රාජවරස්ස සිරීමතො,
සුතාව රඤ්ඤෝ වෙස්සවණස්ස ධීතා
රාජෝති ධම්මං ගුණේහි සොභථ.

පඤ්ඩවඤ්ඤා නාරී අගමුං නහාසිතුං
සීතොදකං උපපල්වනං සිවං නදිං,
නහාසිත්වතා තඤ්ච රමිත්ව දෙවතා
නච්චිත්ව සුතා ලතාබ්‍රැවී,

පුච්ඡාමි තං උපපලමාලධාරිනී
ආවෙලිනී කඤ්චනසන්නිභත්තචේ,
තිම්රතම්බක්ඛි නහෙවසොභතෙ
දීඝායුකී කෙන කතෙ යසො තව,

යනුහෙයින් සවාමිනි ලතාය සජ්ජාය පවරාය අච්චිමුඛිය සුතායසි කියා වෙශමුනිමහ රජහුගේ දූවරු පස්දෙනෙක් ඇත්තාහ ඒ පස් දෙන අනවතප්තවිලට නහන්ට ගියාහුය නිම්මලවූ සිහිල් පැන් නහා ඉක්බිති නෘත්‍යගීත කොට ලතානම් දිව්‍යාඟනාවගේ නැටුම් බලා දෙවිතාමෝ විශෙෂයෙන් සතුටුවූහෙයින් ලතා දිව්‍යාඟනාව යට ගිය දවස කළාවූකුසල කර්‍මය විචාරණු කැමතිව සුතානම් දිව්‍යාඟනාව මෙසේ විචාළේය එම්බා ලතාවෙනි බොහෝ දේවතාවන් විසින් ලතා වගේ නෘත්‍යගීතය යහපතය යනාදින් ප්‍රශංසා කටයුතුවූ නෘත්‍යගීත හා රූපශ්‍රී ශරීරවර්ණනාදි මේ දිව්‍ය ඓශ්වර්‍යයක් ලබන්ට පූර්ව ජාතියෙහි කළාවූ කුශලකර්‍මය කවරේදැයි විචාළාය මෙසේ සුතානම්දි ව්‍යාඟනාව විසින් විචාරණලද පැනය විසඳන්නාවූ ලතානම් දිව්‍යාඟනාව මෙසේ ප්‍රකාශ කළාය.

උදුරභොගෙ කුලෙ සුනිසා අහොසිං,
අහං මනුස්සෙසු මනුස්සභූතා
අඑකාධනා භත්තු වසානුවත්තිනී
අපපච්චතා උපොසථෙ.

මනුස්සභූතා දහරා සහපතිකා
පසන්නචිත්තා පනිමාභිරාධයිං,
සදෙවරං සසුරං සදාසකං
අභිරාධයිං තමහි කතෙ යසෙ මම්.

සාහංතෙන කුසලෙන කම්මුනා
චතුහියානෙසු විසෙසමජ්ඣගා
ආයුඤ්ච වණ්ණංච සුඛං බලංච
ඛිඩ්ඩං රතිං පච්චනුභොමනපපකං.

යනුහෙයින් යටගිය දවස මිනිස්ලොව වසන සමයෙහි එක්ත රා උදුරභොගඇති කුලයෙක යෙහෙලියක් වීමි සවාමියාට අනු කූලවූ පැවතුම්ඇතිව, ක්‍රොධයෙන් දුරුව අප්‍රමාදව නිරන්තර යෙන් පන්සිල් රකිමින් ඔපොහෝපෙහෙවස් වෙසෙමින් සතුටු සි

ත්ඇතිව ස්ත්‍රියගේද පුරුෂයාගේ මල්බැයන්ටද නැදිමසිලන්ටද සි
ත්වලස උපකාරකෙළෙම් දැයි දසුන්ටද සිත්වූ පරිද්දෙන් සඞ්ග්‍රහ කෙ
ළෙම් අප්‍රමාදව ගිහිධම්සඞ්ඛ්‍යාත පතිවූතාධම්මය රක්‍ෂාකොට ඒ කු
ශලානුභාවයෙන් මේදෙවුලොව ඉපිද සෙස්සන්ටවඩා ආයුෂයෙන්ද
වණ්ණයෙන්ද සැපයෙන්ද බලයෙන්ද විශෙෂ බවට පැමිනියෙම් ස්ත්‍රී
ඩාරතියෙන් අනල්පවූ මහත් දිව්‍ය ශ්‍රීසම්පත් අනුභව කෙරෙම් කිව එ
බස්අසා පතිවූතා ධම්සඞ්ඛ්‍යාත කුසලධම්යට ප්‍රශංසා කරන්නාවූ
සුනානම් දිව්‍යාඟනාව අනිකුත්දෙනාට මෙසේ කිව.

සුනා නුනං භාසති යං අයං ලතා
යතො අපුච්ඡිම්හ අකිත්තයිතො
පතිනො කිරමහාකං විසිඨනාරිනං
භතිච තාසං පවරාව දෙවතා.

පතිසු ධම්මං පවරාව සබ්බා
පතිබ්බතා යත්ථ භවන්ති ඉත්ථියො
පතිසුධම්මං විචරිත්ව සබ්බං
ලච්ඡාමසෙ භාසති යං අයං ලතා.

යනුහෙයින් යම්හෙයකින් අපජ්‍යෙෂ්ඨ බුහුනනියන් අතින් වි
චාළමොනම් ඒ පැනය අපට ප්‍රකාශකොට කීවාය මෙහේ මේලතාව
යම් පතිවූතාධම්යක් ප්‍රකාශකොට කියාද ඒ ධම්ය අපවිසින් අසන
ලද්දේය එබැවින් විශෙෂයෙන් ප්‍රශංසාකටයුත්තේය, සවාම්පුරුෂ
යෝනම් සත්‍රීභාවයට පැමිණියාවූ විසිෂ්ටවූ අපට පොෂ්‍ය කරණහෙයි
න්ද රක්‍ෂාකරණහෙයින්ද උතුම් වන්නාහ දෙවතාවන්හා මෙලොවත්
උන්හේම පිහිට ප්‍රතිසරණය පරලොවත් හිත සැප ඵලවන හෙයින්
උන්හේම පිහිටය සත්‍රීහුනම් තැනක උපන්නාහු පතිවූතාධම්ය ර
ක්‍ෂාකෙරෙද්ද අපිද ඒ මිනිස්ලොව ඉපිද පතිවූතාධම්ය රක්‍ෂාකොට
මේලතාව යම් ඓශ්වර්‍යසම්පත්තියක් ප්‍රකාශකොට කීවාද ඒ දිවඉ
සුරු ලබම්වයි කියා නැවත මේ උපමාවෙන් ප්‍රකාශකරන්නී යම්සේ
සිංහයා නමාට නිවාසවූ පළිත ආශ්‍රයකොට ගල්ගුහායෙහි වැස අවශෙ
ෂ ක්‍ෂුද්‍රානුක්‍ෂුද්‍ර සත්වයන් මැඩපවත්වා ඇතුන් මරා මස්අනුභව කෙරේද
එමෙන් ආර්‍යශ්‍රාවිකාවූ ධම්මචාරීවූ උපාසිකාතොම බත්පිළි පමණක්දී
පොෂ්‍යකරණහෙයින් සවාම්පුරුෂයා ආශ්‍රයකොට වසන්නී පිළිගත් ව
සතුවෙනි(හෙවත්)තමන් සන්තක වසතු ආදියෙහි උපදනා මසුරුමලාදී
අකුසල් මැඩපවත්වා ක්‍රොධය නසා සවඟ්හයෙහි ඉපිද සතුටු වන්නී

සයි කියා සුභානම් දිව්‍යාඟනාව ප්‍රශංසා කළායයි යනමේ කථා ප්‍රබන්ධය බුදුන්ට දැන්වූසේක; බුදුරජානෝ එම අර්ථොත්පත්තිකොට ගෙණ සම්ප්‍රාප්ත පිරිසට බණවදාළසේක ඒ ධර්මදේශනාව බොහෝදෙනාට සාර්ථකවිය.

මේ විමානවත්ථු ප්‍රකරණයෙහි පාඨාභිවගීයෙහි ලත්තා විමානවත්ථුව කියා නිමවනලදි.

තවද මේ විමාන වත්ථුප්‍රකරණයෙහි පායාසිවර්ගයෙහි **මල්ලිකා විමානවත්ථුව** නම් කවරයත්?

සර්ව්ලෝකෙශ්වර නායකවූ බුදුරජානන්වහන්සේ දම්සක් පැවතුම් සූත්‍රදේශනාවෙහි පටන් පරිනිර්වාණ මංචකයෙහිදි සුභද්‍රාණම් පරිව්‍රාජකයා විනයනය කොට වදාළ ධර්මදේශනාව දක්වා සියලු බුද්ධකෘත්‍යයන්කොට නිමවා කුසිනාරානුවර මල්ලරාජයන්ගේ උපවර්තනම් සල්උයනෙහිදී වෙසක්මස පුරපසළොස්වක්දත් අහසරුවාදැවිසානැකතින් අඑයම් වේලෙහි සිරිනිවන්පෑ වදාළකල්හි දිව්‍යමනුෂ්‍යයෝ බුදුන්ගේ ශ්‍රීශරීරයට පූජාකරන්ට පටන්ගත්තාහුය එසමයෙහි බැඹුල සෙනාධිපතින්ගේ භාර්‍යාවූ මල්ලරජ්ජුරුවන් දූවූ මල්ලිකානම් ශ්‍රද්ධාවන්ත උපාසිකාවක් කුසිනාරානුවර වසන්නී විශාඛා මහ උපාසිකාවගේ මේල පලඳනාව වැනිවූ තමන්ගේ මේලපලඳනාව සුවඳදියෙන් සෝධා දුහුල්සුඹුළුවකින් බැඳ අනිකුදු පූජා කටයුතුවූ බොහෝවූ ගඳදුම්මල් පහන්ආදියත් ගෙණගොස් බුදුන්ගේ ශරීරයට පූජාකළාය. මේ මෙහි සංක්ෂේපවන්නේය විස්තාරකථාව රතනාවලිනම් දම්පිසා අටුවාවෙහි උකාශවූයේය ඒ බැඹුල මල්ලිකාව එසින්පසු නොබෝදවසකින් කාලක්‍රියාකොට ඒ කුශලය හෙතුකොටගෙණ තවුතිසා දිව්‍යලොකයෙහි ඔගත්වූ රත්විමනෙක උපන්නිය, ඒ රත්නාභරණ පූජානුභාවයෙන් සත්රුවනින් නිර්මිතවූ වස්ත්‍රාභරණයෙන්හා එසේම සත්රුවනින් නිර්මිතවූ උදාරවූ විමානාදියෙන්හා විශෙෂයෙන්ම සිගිසමණිණයෙන් නිර්මිතවූ උද්‍යාන විමානවස්ත්‍රාභරණ මාලාදියෙන් නික්මෙන්නාවූ රන්වන් රැසින් රන්රසධාරා ඉසින්නාසේ එකො භාෂ කරමින් දිලෙයන්නාවූ සෙස්සන් විසින් සාදාගත නොහැක්කාවූ අසාධාරණවූ උදාරතරවූ දිව්‍යසම්පත්තියක් පහළවිය; එකල්හි ආයුෂ්මත්වූ නාරද මහතෙරුන්වහන්සේ දෙවචාරිකාවෙන් වඩනාසේක් ඒ විමානය සමීපයට වැඩිසේක ඒ දිව්‍යාඞ්ගනාවද තෙරුන්වහන්සේ දැක උ

න්වහන්සේකරා එලැඹ නමස්කාරකොට දෙහොත්මුදුන්දී වැඳ එක් ත්පස්ව සිටියාය එකල්හි තෙරුන්වහන්සේ ඒ දිව්‍යාඟනාවගෙන් පූර්ව්‍යජාතියෙහි කරණලද කුශලකර්මය මෙසේ විචාළසේක.

පිතවත්තේ පිතධජේ පිතාලඞ්කාරභූසිතෙ
පිතන්තරෙහි වගූහි අපිළන්ධිතාව සොභති

කාකම්බුකායූරධරා කඤ්චන වෙලභූසිතෙ
ඉමමජාලක පවිඤ්ඤෙන නානාරතන මාලිනී.

සොවණ්ණමයා ලොහිතංකමයා ච
මුත්තාමයා වෙළුරියාමයාච,
මසාරගල්ලා ස ලොහිතංකා
පාදරවටංකිනි මණිහි චිත්තා,

කොවෙකා එත්ථ මයුරසුස්සරෝ
හංසස්සරයොඤ්ඤ කරවීකසුස්සරෝ
තෙසං සරෝ සුයති වග්ගුරූපෝ
පඤ්චඞ්ගිකං තුරියමිවප්පවාදිතං.

රථොච තෙ සුභෝ වග්ගු නානාරතනචිත්තිතෝ,
නානාවණ්ණෙහි ධාතූහි සුවිභත්තෝතාව සොභති.

තස්මිං රථෙ කඤ්චනබිම්බවණ්ණා
යත්ථ්හි තා භාසසිමං පදෙසං
දෙවතෙ පුච්ඡිතාවික්ඛ කිස්ස කම්මස්සිදං ඵලංති.

යනුහෙයින් ඒබඹා දිව්‍යාඟනාව නී කවර දිව්‍යනිකායක උපනීද? නීගේ රූපශ්‍රීසම්පත්තිය කිසියම් පලඳනාවක් නැත්තේ නමුදු ශරීර ශොභාවෙන් දිප්තිමත්වෙයි එබදුවූ ශ්‍රීශරීරයෙහි රන්වන් වස්ත්‍රයක් හැඳ රන්වන් වස්ත්‍රයක් එකාංශකොට සවණ්ණමයවූ නොයෙක් ආභරණයෙන් සැරහී විශෙෂයෙන් බබලන්නිය මුතුමැණික් ආදී නොයෙක් රත්නයෙන් නිර්මිතවූ කණ්ණාභරණ ග්‍රීවාභරණ හස්තපාදාභරණාදී නොයෙක් ආභරණයන් අතුරෙන් සමහරක් හංසස්වර නාද වැනිනාද ඇසෙයි සමහරක් මයූරස්වර කුරවීකනාදමෙන්ද පඤ්චාඟික තූර්‍ය්‍යනාදමෙන්ද යහපත්වූ මනහර මිහිරිනාද ඇසෙනුලැබෙයි; මෙසේ අනෙක ප්‍රකාර දිව්‍යාභරණයෙන් සැරසී මුදුනෙන් රන්ධජ නඟා සත්රුවනින් නිර්මිතවූ රථවිමානාරූඪව රන්රුවනක්සේ බබලන්නාවූ ඒබඹා දිව්‍යාඟනාව නී මෙබදු දිවඉසුරක් ලැබීමට පූර්ව්‍යජාතිමය

නිකරණලද කුශලකර්මය කවරේදැයි විචාළසේක; එකල්හි ඒ පැනයවී සඳන්නාවූ දිව්‍යාඟනාව මෙසේ කීව.

සොවණ්ණජාලං මණිසොණ්ණවිත්තං
මුඤ්ඡාවිතං හෙමජාලෙනඡ්ඡනං,
පරිනිබ්බුතෙගොතමෙ අප්පමෙය්‍යෙ
පසන්නචිත්තාඅහමාභිරොපයිං.

නාහං කම්මං කරිත්වාන
කුසලං බුද්ධවණ්ණිතං
අපෙතසොකා සුඛිතා
සම්පමොදා මි අනා මයා'ති

යනුහෙයින් හිසපටන් පාදන්තය දක්වා සියලුශරීරය රන් දැලින් වසනලදුව ග්‍රීවාභරණ හස්තාභරණ පාදාභරණාදී වශයෙන් ඒ ඒ තන්හි අලඞ්කාර පිණිස මුතුමැණික් ආදී නොයෙක් රත්නයෙන් විසිතුරු කරණලද මේලපලඳනානම් ආභරණ විශෙෂයක් ගෙණ ගොස් පහන්සින් ඇතිව පිරිණිවන්පෑවදුළ ගෞතමබුදුන්ගේ ශරීරයට පූජා කළෙමි. ඒ කුශලකර්මය හේතුකොටගෙණ මේදිව්‍යශ්‍රීසම්පත් ලදිමි කිව එකල්හි ආයුෂ්මත්වූ නාරද මහතෙරුන්වහන්සේ ඒ දිව්‍යාඟනාවට බණ වදාරා මිනිස්ලොවට වැඩ ධර්මසංගායනා කරන්නාවූ මහා කාශ්‍යපස්ථවිරයන්වහන්සේ ප්‍රධානකොට ඇති මහසඞ්ඝයාට කී සේක එකල්හි මේ විමානවර්ණනාවද විමානවත්ථුදෙශනාවට අන්ත ගීතකොට සංගායනාකළාහුය.

මේ විමානවත්ථු ප්‍රකරණයෙහි පායාසිවග්ගයෙහි මල්ලිකා විමානවර්ණනාව නිමාවනලදී.

තවද මේ විමානවත්ථු ප්‍රකරණයෙහි පායාසිවග්ගයෙහි **විශාලා** ඇති **විමානවත්ථුවනම්** කවරයත්?

සකලගුණ නිධානවූ භාග්‍යවන් බුදුරජානන්වහන්සේ පිරිණිවන් පෑවදුළකල්හි අජාසත් රජ්ජුරුවෝ තමන්විසින් ලබනලද බුදුන්ගේ ශරීරධාතු මහත් පූජා පෙළහරින් නුවරට වඩාගෙණගොස් රජගහනුවර දාගැබක් කරවා පූජාසත්කාර කරණසමයෙහි රජගහනුවර වසන්නාවූ එක් තරා මාලාකාරයෙකුගේ දූවූ සොවාන්ඵලයෙහි පිහි

පියාවූ ආයුෂ්මත් ශ්‍රාවිකාවූ සුනන්දනම් උපාසිකාවක් ඇත්තිය ඒ උපාසිකාව තමන්ගේ පියානන්ගේ ගෙයින් පලඳනාපිණිස එවනලද සුවඳ මල්හා සඳුන් සුවඳ කස්තුරිකාදි සුවඳ බුදුන් දවස්පතා ගමන්කරවාද, ගැබට පූජාකරෙව්වාය, පොහෝදිනයෙහි තොමෝම ගොස් සඟහඟනා යෙන් පූජාකළාය; ඒ උපාසිකාව එයින් පසු එක්තරා රොගයකින් පෙළෙනලදුව කාලක්‍රියාකොට ශක්‍රදෙවෙන්ද්‍රයාට පරිචාරිකාව උපන්නිය. එකල්හි එක්දවසක් ශක්‍රදෙවෙන්ද්‍රයන්හා සමග උයන්කෙළි පිණිණිස චිත්‍රලතා වනයට් උයනට ගියාය ඒ උයනෙහි අනික් දේවතාවන්ගේ ශරීරප්‍රභාවෝ! මල්ආදියෙහි රැස්වැද ගැන්මෙන් විසිතුරු වණ්ණයෙන් බබලන්නාහුය මේ සුනන්දනම් දිව්‍යාඟනාවගේ ශරීරප්‍රභාව වනාහි අවශෙෂ වස්ත්‍රාභරණමාලාදියෙහි රැස් වැදීමෙන් අනික් වණ්ණයකට නොපැමිණ ඇගේම ශරීරප්‍රභාවෙන් දශදික් බබ්බුලුව මින් සිටියාය ශක්‍රදෙවෙන්ද්‍රයෝ ඒ දිව්‍යාඟනාව දැක සතුටුව ඒ දිව්‍යාඟනාව විසින් පූර්ව ජාතියෙහි කරණලද කුශලකර්මය දැනගන්නා කැමතිව මේගාථාවලින් විචාළේය.

කා නාම ත්වං විශාලක්ෂි රමෙම චිත්තලතාවනෙ
සමන්තා අනුපරියාසි නාරීගණ පුරක්ඛතා.
සදෙවා තාවතිංසා පවිසන්ති ඉමං වනං
සයොග්ගා සරථා සබ්බෙ චිත්තා හොන්ති ඉඛාගතා.
තුය්හංච ඉධ පත්තාය උය්‍යානෙ විචරන්තියා
කායෙන දිස්සති චිත්තා නෙකරූපං තවෙදිසං
දෙවතෙ සුචිත්තාවිත්ත කිස්ස කම්මස්සිදං ඵලං'ති

යනුහෙයින් විපුලවූ නෙත්‍ර යුගලයක් ඇත්තාවූ එම්බා භද්‍රාවති මිට පූර්වජාතියෙහි කවරෙක් වන්නිද? කවරකුශලයක්කොට මේ දෙවුලොව උපන්නීද? සැමකල්හිම දෙවතාවෝ උයන්කෙළිපිණිස මේ චිත්‍රලතාවනම් උයනට ප්‍රවෙශ වන්නාහුය මේචිත්‍ර ලතාවන නම් උයනට පැමිණියාවූ දෙවතාවන්ගේ ශරීරප්‍රභාවහා වස්ත්‍රාභරණ මාලාවන්හා රථාශ්වාදී සියල්ලම මේ උයන්හි අනෙප්‍රකාර මල්වලරැස්වැදීමෙන් නොයෙක් විසිතුරු වණ්ණවෙති මේ උයනට පැමිණියාවූ තීගේ ශරීරප්‍රභාවෝ විකාරවණ්ණයකට නොපැමිනෙණ සඟහාලීලාවෙන් ජොති මත්ව බබලන්නීය තී පූර්වජාතියෙහි කළාවූ කුශලය ප්‍රකාශකොට කියවයි කියේය.

මෙසේ ඒ ශක්‍රදෙවෙන්ද්‍රයා විසින් විචාරණලද පැනය විසඳන්නා වූ දිව්‍යාඩ්ඛනා තොමෝ මේ ගාථාවලින් ප්‍රකාශකළාය.

"අහං රාජගහෙ රමේම සුනඤ්ඤානාමුපාසිකා,
සඩ්ඪාසීලෙන සම්පන්නා සංවිභාගරතා සදා.
අච්ඡාදනඤ්ච භත්තඤ්ච සෙනාසනපදීපියං,
අදාසිං උජුභූතෙසු විප්පසන්නෙනන වෙතසා."

යනාදීන් දක්වනලද හෙයින් දෙදෙව්ලොවට අධිපතිවූ සක්දෙව් මහරජානන්වහන්ස සිත්කලුවූ රජගහනුවර මාලාකාරදුවූ සුනඤ්ඤ නම් උපාසිකාවක් වීමි එසමයෙහි මම දන්දීමෙහි ඇලුම්ඇතිව ශ්‍රද්ධාසම්පන්න හෙයින් ප්‍රසන්නවූ සිත්ඇතිව අෂ්ටාඞ්ගසමන්විත උත්තමපුද්ගල සංඝයාට දන්දුන්මි නිරන්තරයෙන් පන්සිල් රකිමින් පොහෝ පෙහෙවස් විසිමි මාගේ ඥාතිකුලය මාලාකාරකුලයවූයේය එබැවින් පලඳනාපිණිස පියානන්ගේ ගෙදරින් එවනලද සුවඳ මල්හා සඳුන් සුවඳ කස්තුරුකා පුරු ආදිකොට ඇති සුවඳවිලවුන් ආදිය ගමන්කරවා බුදුන්ගේ ධාතු පිහිටුවා බඳනාලද දාගැබට දවස්පතා පූජාකරමි පොහෝදිනයෙහි පහන්සිත් ඇතිව සිසතින්ම පූජාකෙළෙමි ඒ කුශල කර්මය නෙතු කොටගෙණ මේදිව්‍යසම්පත්හා මෙබඳු දිව්‍යඝණ්ඩියක් ලදිමි කියා මල්ගඳ විලවුන් ආදීපූජාවෙන්හා සිල්රැකීමෙන් සිඳවන්නාවූ කුශලයද බලවත් හෙයින් දැන් ඒ කුශලය විපාකදීමට පටන්ගන්නාලද්දේ නොවෙයි අනිත් ආත්මභාවයෙහි විපාක දෙන්නේය කවර ප්‍රකාරයකින් ශාක්‍යදාගාමි චෙමිදූසිකියා ආර්‍යධර්මවිෂයෙහි මාගේ ප්‍රාර්ථනාව වන්නේයයිකිව ශක්‍රදෙවෙන්ද්‍රයෝ තමන් විචාල නියාවත් දිව්‍යාඩ්ඛනාව ප්‍රකාශකොට කීනියාවත් දෙවචාරිකාවෙන් වැඩියාවූ වඩ්ඪීස මහතෙරුන් වහන්සේට කියේය වඩ්ඪීස මහතෙරුන්වහන්සේ සංගීතිකාරක මහාසථවිරයන්ට කියේක උන්වහන්සේලා මේ කථාවද විමානවත්ථුදෙශනාවට අනන්තර්ගතකොට සංග්‍රහයට නගාසංගායනා කළහ.

මේ විමානවත්ථු ප්‍රකරණයෙහි පාසාණිවග්ගයෙහි
සිඟාලාඤ්ඤ විමානවර්ණනාව නිමාවිය.

තවද මේ විමානවත්ථු ප්‍රකරණයෙහි **පාසාණිවග්ගයෙහි ප්‍රභාස්වර විමානවත්ථුව** නම් කවරයත්?

කරුණාවෙන් සිහිල්වූ භාග්‍යවත් බුදුරජානන්වහන්සේ එක්ස මයෙක රජගහනුවර වැඩවසනසේක එසමයෙහි රජගහනුවර ශ්‍රද්ධා සම්පන්න එක්තරා උපාසකයෙක් ඇත්තේය ඒ උපාසකතෙම ආයුෂ්මත් මුගලන් මහතෙරුන්වහන්සේ කෙරෙහි විශෙෂයෙන්ම ප්‍රස නනවූ සිත්ඇත්තේය ඔහුගේ ශ්‍රද්ධාසම්පන්නවූ දුවක් ඇත්තීය එසම යෙහි ආයුෂ්මත්වූ මුගලන් මහතෙරුන්වහන්සේ රජගහනුවර ගෙපි ළිවෙළින් පිඬු සිහා වඩනාසේක් ඒ කුලගෙටත් වැඩිසේක. ඒ කුමාරි කාව තෙරුන්වහන්සේ දැක සතුටුයිත් ඇතිව ආසනයක් පනවා තෙරුන්වහන්සේ ආසනයෙහි වැඩහුන්කල්හි සමන්මල් පූජාකොට මිහිරිවූ උක්සකුරුපිඬත් තෙරුන්වහන්සේගේ පාත්‍රයට පිළිගැන්වූ වාය. තෙරුන්වහන්සේ ඒ කුමාරිකාවට අනුමෙවෙනි බණ වදාරණ කැමතිව වැඩහුන්සේක ඒ කුමාරිකාව ගිහිගෙයි බොහෝකටයුතු ඇතිබැවින් අවකාශ නැතිබව දන්වා අනික් දවසක බණ අසමි කියා තෙරුන්වහන්සේට නමස්කාරකොට වඩනට කල් දැන්වූවාය. ඒ කුමාරිකාව එදවස්ම කාලක්‍රියාකොට තවුතිසා දිව්‍යලොකයෙහි උතු මිවූ රන්විමනෙක උපන්නීය. එසමයෙහි ආයුෂ්මත්වූ මුගලන් මහ තෙරුන්වහන්සේ දෙවවාරිකාවෙන් වඩනාසේක් ඒ ද්වාරබාහාව දැක සම්පයට වැඩ මේ ගාථාවලින් විචාළසේක.

"පභාසරවණ්ණනිභෙසු රත්තා
වත්ථවසනෙමගිඞ්ගිකෙ
චන්දනරුවිරගත්තෙ
කා ත්වං සුභෙ දෙවතෙ වන්දසෙ මමං."

පල්ලංකොව තෙ මහග්ඝා නානාරතනවිත්තිතෝ,
රුච්චිරෙයඤ්ච තෙ භවං නිසින්නා
විරොචසි දෙවරාජාව නන්දනෙවනෙ.

යනුහෙයින් ප්‍රභාස්වරවූ වණ්ණසම්පන්නවූ සුරතවූ දිවසලුවක් හැඳ එසේම දිවසලුවක් එකාංසකොට සඳුන් තවරණලද මනොඥවූ ශරීරයක් ඇතිව මට වඳනා නී කවරෙක්හිද නන්දනවනයෙහි ශක්‍රදෙ වෙන්ද්‍රයාසේ යම් ආසනයක හුන්නෙහිද ඒ පර්‍යඞ්කය මහාඝර්‍ඝවූ නා නාවිධ රත්නයෙන් විසිතුරුවිය යනාදින් වර්ණනාකොට මෙබඳු ස මපත් ලැබීමට කරණලද කුශලය කවරේදැයි විචාළසේක එකල්හි ඒ දිව්‍යාඞ්ගනාව මෙසේ කිව.

"හොතිව මෙ අනුතාපො අපරඩං දුක්කතඤමෙ,
සාහං ධම්මං නාසෙසාසිං සුදෙසිතං ධම්මරාජෙන.
තං තං වදාමි භද්දන්තෙ යස්ස මෙ අනුකම්පියො,
ඤාත්‍විධමෙවසු තං සමාදපෙථ සුදෙසිතං ධම්මරාජෙන.

යනුමහයිත් මම මිනිස්ලොව වසන සමයෙහි පිඬුපිණිස වැඩියා වූ නුබවහන්සේට සමන්මල් පූජාකොට උක්සකුරු පිඩක් පාත්‍රයට පිළිගැන්වූයෙමි. එකල්හි නුබවහන්සේ බණ වදාරණ පිණිස වැඩහුන්සේක මම අවකාශනැතිහෙයින් බණ නැසුණයම් බුදුන්වීසින් වදාරණලද ධම්මය නැසුහෙයින් මාවිසින් නොකටයුත්තක් වරදක් කරණලද්දේය. එබැවින් විපිළිසරවීමක් ඇත්තේය. සවාමිනි මේකාරණය නුබවහන්සේට කියමි යම් අනුකම්පා කටයුත්තක් ඇත්නම් බුදුන්වීසින් වදාරණලද ශීලාදි කිසියම් ගුණධම්මයක සමාදන් කරවනසේක්වා එසේවීනම් මාගේ ඉසුරුසම්පත් කියා නිමවිය නොහැක්කේය කි කිව එකල්හි මහතෙරහු විඥානවශයෙන් බණ වදාරා මිනිස්ලොවට වැඩ බුදුන්ට එපවත් දැන්වූසේක බුදුරජානන්වහන්සේ එම අසෝත්පත්තිකොට සම්ප්‍රාප්ත පිරිසට බණ වදාළසේක ඒ ධම්මදේශනාව බොහෝදෙනාට සාර්ථකවිය.

මේ විමානවත්ථුප්‍රකරණයෙහි පායාසිවගියෙහි
ප්‍රභාඤ්ඣර විමානවත්ථුව කියා නිමවනලදී.

තවද මේ විමානවත්ථු ප්‍රකරණයෙහි **නාගවිමානවත්ථුව** නම් කවරයන්?

භාග්‍යවත් බුදුරජානන්වහන්සේ එක්සමයෙක බරණැස්නුවර ඉසිපතනා රාමයෙහි වැඩවසනාසේක එසමයෙහි බරණැස්නුවර වසන්නාවූ ශ්‍රද්ධාවන්තවූ ශීලාචාර සම්පන්නවූ එක්තරා උපාසිකාවක් බුදුන් උදෙසා වස්ත්‍රදෙකක් වියවා සහපත් කොට මැසුම් පිරියම් කරවා බුදුන්කරා එලැඹ බුදුන්ගේ ශ්‍රීපාද මූලයෙහි පිළිසඟලතබා මෙසේ කිව සවාමිනි යම් කුශලකම්මයක් බොහෝකලක් මුලුල්ලෙහි මට හිත සැපපිණිස මෙයින් පැමිණේද ඒ කුශලකම්මය මට අත්පත්කරුණ පිණිස බුදුරජානන්වහන්සේ. මාකෙරෙහි අනුකම්පාවෙන් මේපිළිදෙක පිළිගන්නාසේක්වයි කිව බුදුරජානෝ ඒ පිළිසඟල පිළිගත්සේක නැවත ඒ උපාසිකාව උපනිශ්‍රය සම්පත් ඇතිබව දැක චතුස්සත්‍යය ප්‍රකාශකොට බණ වදාළසේක. ඒ උපාසිකාව දෙශනාකෙළවර සෝවාන්ඵලයෙහි පිහිටාබුදුන් වැඳ අවසරගෙණ ප්‍රදක්ෂිණාකොට ගොටගියාය එයින් පසුනොබෝද වසකින් කාලක්‍රියාකොට තවුතිසා දෙවුලොව ශක්‍රදෙවෙන්ද්‍රයන්ට වල්ලභවූ යසුත්තරානම් අග්‍රමහේසිකාවක්ව උපන්නිය.

ඇතේ කුශලානුභාවයෙන් හස්ත්‍යාලංකාරයෙන් හෙබියාවූ රන්දැලින් වසනලද ඇත්වාහනයක් පහළවිය ඒ ඇතුපිට නිම්මිතවූ මැණික්මය මණ්ඩප මධ්‍යයෙහි සමිරත්නමය පර්‍යඞ්කයෙක් පහළවිය දළ දෙකෙහි කමල කුවලයාදී නොයෙක් මලින් ගැවසී ගත්තාවූ සිහිල් ජලයෙන් පිරුණාවූ රමණීය පොකුණු පහළවිය එහි මල්කෙම්වල පඤ්චාඞ්ගික තූර්‍යභාණ්ඩගත් දිව්‍යාඞ්ගනාවෝ නටති ගායනාකෙරෙති මෙසේ මහත් දිව්‍යශ්‍රීසම්පත්තියක් ලද්දිය.

ඉක්බිති බුදුරජානන්වහන්සේ බරණැස්නුවර කැමති කලක් වැඩ වාසය කොට සැවැත්නුවරට යම් දිශාවකින් යායුතුවේද ඒ දිශාවෙන් මගට පැමිණ ගම් නියම්ගම් රාජධානි පිළිවෙලින් වඩනා සේක් සැවැත්නුවරට පැමිණ ජෙතවනාරාමයෙහි වැඩවසනසේක. එසමයෙහි ඒ දිව්‍යාඞ්ගනාව තමාවිසින් අනුභව කරණලද දිව්‍යසම්පත් බලා ඒ දිව්‍යසම්පත් ලැබීමට කාරණා කවරේදැයි පරීක්ෂා කරන්නී බුදුන්ට පිළිසඟල දුන්බව දැන බුදුන්කෙරෙහි පැහැද ආදරබහුමාන සතුටු සොම්නස් ඇතිව බුදුන් වඳනා කැමතිව පෙරයම ඉකුත් මධ්‍යම රාත්‍රියෙහි ඇත්වාහනාරූඪව ආකාශයෙන් අවුත් ඇතුපිටින් බැස බුදුන්වැඳ දෙහොත් මුදුන්දී එකත්පස්ව සිටියාය එකල්හි වඞ්ගීස මහතෙරුන්වහන්සේ බුදුන්විසින් අනුදන්නා ලදුව මෙගාථාවලින් විචාළසේක.

"අලංකතා මණිකඤ්චනාචිතං
සුවණ්ණජාලා විතතං මහනතං,
අභිරුහ ගජවරං සුකපපිතං
ඉධාගතා වෙහාසයනතලිකෙක.

නාගස්ස දනතෙසු දුවෙ සුනිම්මිතා
අචෙඡාදිකා පදුමිනියො සුඵුල්ලා,
පදුමෙසුච තුරියගණා පවජ්ජරෙ
ඉමාච නවවනති මනොහරායො.

දෙවිඩිපතතාසි මහානුභාවෙ
මනුස්සභූතා කිමකාසි පුඤ්ඤං
යෙනාසි එවං ජලිතානුභාවා
වණ්ණාච තෙ සබබදිසා පභාසතීති."

යනුහෙයින් යටකියනලද ක්‍රමයෙන් දිවඉසුරු වර්ණනාකොට මෙබඳු සම්පත් ලැබීමට කරණලද කුශලකර්මය කවරේදැයි විචාළසේක එකල්හි ඒ කුශලය ප්‍රකාශකොට දක්වන්නී මෙසේ කිව.

"බාරාණසියං උපසංකම්ම්වා
බ්‍රහ්මසහං වන්දුගං අදසිං,
පාදානි වන්දිත්ව ඨිතා නිසීදිං
විත්තාවහං අඤ්ජලිකං අකාසිං.

බුද්ධොව මෙ කඤ්ඤනසන්නිභත්තතෙ
අදෙසයී සමුදය දුක්ඛනිච්චතං,
අසංඛතං දුක්ඛනිරොධසස්සතං
මග්ගං අදෙසෙසි යතො විජානියං.

අපායුකා කීලකතා තතො චුතා
උපපන්නා තිදසගණා යසස්සිනි,
සක්කස්සහං අග්ගමනුස්සතරා පජාපතී
යස්සත්තරානාම දිසාසු විස්සුතා'නි.

යනුහෙයින් සවාමිනි යටගිය දවස බරණැස්නුවර එක්තරා ශ්‍රද්ධාවන්ත උපාසිකාවක් වීම් එසමයෙහි පිළිසඟලක් වියවාගෙණ බුදුන් කරාගොස් බුදුන්ට පිළිගන්වා වැඳ බිම එකත් පසෙක හුන්නෙම් එකල්හි බුදුරජානන්වහන්සේ චතුස්සත්‍යය ප්‍රකාශකොට බණවදා ළසේක්. මම ඒබණඅසා සෝවාන්වීම් ආයුමද හෙයින් නොබෝ දවසකින් කාලක්‍රියාකොට ඒ කුශලයෙන් සක්දෙව් මහරජාණන්ට අග්‍රමහෙසිකාවූ සොළොස් දහසක් වල්ලභ දිව්‍යාඞ්ගනාවන් අතුරෙන් දශදිශාවෙහි ප්‍රසිද්ධවූ යසුත්තරානම් එක්තරා අගමෙහෙසියක් වීම් කිව. එකල්හි බුදුරජාණන්වහන්සේ එම අග්ගොත්පත්තිකොට ගෙණ බණ වදාළසේක. ඒ ධම්මදෙශනාව දිව්‍යාඞ්ගනාවටතා බොහෝ දෙනාට ඕඝඩිකවිය. ඒ දිව්‍යාඞ්ගනාව බුදුන්වැඳ අවසරගෙණ දෙව්ලොවටම ගියාය.

මේ විමානවත්ථුප්‍රකරණයෙහි පායාසිවගීයෙහි
නාගවිමානවත්ථුව නිමාවනලදී.

තවද මේ විමානවත්ථු ප්‍රකරණයෙහි **අලොමා විමානවත්ථුවනම්** කවරයත්?

භාග්‍යවන්වූ සම්‍යක් සම්බුද්ධ සර්ව්ඥ රාජොත්තමයාහාන් වහන්සේ එක්සමයෙක බරණැස්නුවර නිසා ඉසිපතනා රාමයෙහි වැඩවසනා සේක. එසමයෙහි බුදුරජානන්වහන්සේ එක්දවසක් පූර්ව්ඣනසමයෙහි මහාකොට හැඳ පාසිවුරුගෙණ බරණැස්නුවරට පිඬුසිහා වැඩි

සේක. එකල්හි අලොමානම්වූ එක්තරා දුප්පත් ස්ත්‍රියක් බුදුන් දැක හටගත් බලවත් ප්‍රීති සොම්නස් ඇතිව දියයුතුවූ දානවස්තුවක් නොදැක යවසාලින් කරණලද වියලි කොමුවක් දැක දානය සවලපවීනමුදු බුදුන්ට දෙනලද්දේ මහත්ඵල මහානිසංසවෙයි සිතා දුර්භික්ෂවූ ලුනු නැත්තාවූ වියලිගියාවූ කොමුපිඬු ගෙණගොස් පිළිගැන්වූවාය. බුදු රජානෝ පිළිගත්සේක ඒ ස්ත්‍රිද ඒ දානය අරමුණුකොටගෙණ විශෙෂයෙන්ම සතුටුවූවාය ඒ ස්ත්‍රී එසින් මෑතභාගයෙහි කාලක්‍රියාකොට එම කුශලකර්මය හෙතුකොටගෙණ තවුතිසා දෙවිලොව මහත්වූ රන් විමනෙක උපන්නිය.

එසමයෙහි ආයුෂ්මත්වූ මුගලන්මහ තෙරුන්වහන්සේ දෙවචාරි කාවෙන් වඩනාසේක් ඒ දිව්‍යාඞ්ගනාව දැක මෙසේ විචාලසේක.

"අභික්කන්තෙන වණ්ණෙන යා ත්වං තිට්ඨසි දෙවතෙ,
ඔභාසෙන්තී දිසා සබ්බා ඔසධී විය තාරකා.

යනුහෙයින් එඹා දිව්‍යාඞ්ගනාව නී ඔසධී තාරකාවක්සේ ශරීරාලොකයෙන් දසදික් එකාලොක කෙරෙමින් බබලන්නිය මෙබදු දිවඉසුරක් ලැබීමට පූර්ජාතියෙහි කරණලද කුශලය කවරේදැයි විචාළසේක. ඒ වචනය මුදුනෙන් පිළිගෙණ කුශලකර්මය ප්‍රකාශකොට දක්වන්නාවූ දිව්‍යාඞ්ගනා තොමෝ–

"අහංහි බාරාණසියං බුධස්සාදිච්චබන්ධුනො,
අද්දසිං සුක්කකුම්මාසං පසන්නා සකෙහි පාණිහි.
සුක්කායව අලොනිකාය පසන්න චිත්තා උළාරා කුම්මාසමදාසියා,
අලොමං සුඛිතා දිස්වා කො පුඤ්ඤං න කරිස්සති."

යනුහෙයින් ස්වාමිනි මම යටගිය දවස බරණැස්නුවර එක්තරා දිළිඳු ස්ත්‍රියක්වීමි. එසමයෙහි පහන්සිත් ඇතිව සුයම්වංශොත්භූතවූ බුදුරජානන්වහන්සේට වියලුනාවූ යවකොමුවක් පමණ පූජාකෙළෙමි. ඒකුශලයෙන් සියලුම සම්පත් ලදිමි කිව එබැවින් ලොකයෙහි යම්කෙනෙක් සකස්කොට දන්දුන්නාහු වීනම් ඔවුන් ලබන සම්පත් කියනුම කවරේද ලුනුනැත්තාවූ වියලුනාවූ යවකොමුවෙහි අනුසස් බලව මේ අලෝමානම් දුප්පත් ස්ත්‍රී සුවපත්වූ බව දැක කවරෙක්නම් කුසල්නොකෙරේද එක බත්පිඬකුදු ඇත එසින් භාගය ක්දන්දී චිනා අනුභව නොකරන්නේමය ඉන්බිති තෙරුන්වහන්සේ මිනිස්ලොවට වැඩ බුදුන්ට එපවත් දැන්වූසේක, බුදුරජානෝ

එම අරෝචාන්පත්තිකොටගෙණ සම්ප්‍රාප්ත පිරිසට බණ වදාළසේක, ඒ ධර්මදේශනාව බොහෝදෙනාට සාර්ථකවිය.

මේවිමානවත්ථු ප්‍රකරණයෙහි පායාසි වග්ගයෙහි
අලොමාවිමාන වර්ණනාව නිමා නිමවනලදී.

පායාසිවග්ග වර්ණනාවයි.

තවද මේ විමානවත්ථු ප්‍රකරනයෙහි සුනික්ඛිත්ත වග්ගයෙහි අම්බ විමානවත්ථුවනම් කවරයත්?

එක් සමයෙක්හි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර වැඩවනසේක එසමයෙහි සැවැත්නුවර වසන්නාවූ එක්තරා ශ්‍රද්ධාවන්ත උපාසිකාවක් ආවාසදානය මහත්ඵල මහානිසංස ඇතිබව අසා ආවාසයක් කරවන අදහස් ඇතිව බුදුන්වැඳ කියන්නේ සඞ්ඝයා වහන්ස මම ආවාසයක් කරවනුකැමැත්තෙමි ඒ ආවාසය කරන්ට සුදුසු ස්ථානයක් ලබනුකැමැත්තෙමියි කිවාය. එකල්හි බුදුරජානන්වහන්සේ භික්ෂූන්වහන්සේට වදාළසේක, භික්ෂූහු ආවාසයට සුදුසු ස්ථානයක් දක්වා කිවාහුය. ඒ උපාසිකාව එතැන්හි රමණීයවූ විහාරයක් කරවා ඒ විහාරය අවට අඹගස් රොපණය කරවූහ. එබැවින් ඒ විහාරය අඹනසින් පරිෂ්කෘතකරණලද්දාවූ ශාස්ත්‍රදකසම්පන්නවූ මුතු රැසක්සේ සුදුවැල්ලෙන් ගැවසිගත්තාවූ රිදීපටක්සේ සිත්කලුවූ භූමිභාගඇතිවිය. ඒ උපාසිකාතොමෝ ඒ විහාරකර්මාන්තය නිමවා නානාවර්ණවස්ත්‍රයෙන් වියන්බැඳ මල්දම් එල්වා විහාරය දිව්‍යවිමානයක්සේ අලංකෘතකොට සරහා සුවඳතෙලින් පහන්නඟා අඹගස් අළුත් වස්ත්‍රයෙන් වෙලා සංඝයාට පූජාකළාය, ඒ උපාසිකාව එයින් අපරභාගයෙහි කාලක්‍රියාකොට තව්තිසා දිව්‍යලොකයෙහි උපන්නීය. ඇගේ කුශලානුභාවයෙන් පූර්ව්වජාතියෙහි කරණලද කුශල කර්මය ප්‍රකාශකොට දක්වන්නාසේ දිව්‍යමය අඹවනයෙන් පරිෂ්කෘත කරණලද උතුම්වූ දිව්‍යප්‍රාසාදයෙක් පහළවිය. ඒ දිව්‍යාඞ්ගනාව තරු පිරිවැරූ පූර්ණචන්ද්‍රයාසේ දිව්‍යස්ත්‍රී සමූහයා පිරිවරා මහත්වූ දිව්‍යසම්පත් අනුභව කරන්නීය එකල්හි ආයුෂ්මත්වූ මුගලන් මහතෙරුන්වහන්සේ දෙවචාරිකාවෙන් වඩනාසේක් ඒ දිව්‍යාඞ්ගනාව දැක මෙසේ විචාළසේක.

"දිබ්බඤ්ච අම්බවනං රම්මං පසාදෙත්ථ මහල්ලකො,
නානාතුරියසංඝුට්ඨෝ අච්ඡරාගණසෝභිතෝ.
පදීපෝ තත්ථ ජලති නිච්චං සොවණ්ණයෝ මහා,
දුස්සථලෙහි රුක්ඛෙහි සමන්තා පරිවාරිතෝ.
කෙන තෙ අම්බවනං රම්මං පසාදෙත්ථ මහල්ලකො,
නානාතුරියසංඝුට්ඨෝ අච්ඡරාගණසෝභිතෝ.

•යනුහෙයින් එම්බා දිව්‍යාඞ්ගනාවතීගේ මේ රමණීයවූ දිව්‍යමය අඹවනයෙහි නානා ප්‍රකාර තූර්‍යනාදයෙන්හා පරිවාරදිව්‍යාඞ්ගනාවන්ගේ ගායනාවෙන් ඝොෂාකරණලද යම් මේ මහත්වූ විමානයෙක් ඇත්ද ඒ විමානයෙහි රැස්කලඹක්සේ බබලන්නාවූ වියනින්හා නානාවිධරත්නයෙන් නිර්මිතවූ පහනින් එකාලොකව බබලන්නේය. දිව සලුනැමති ඵලයෙන්හා එයින්ම නැගෙණලද දිව්‍යපත්‍රයෙන් ගැවසී ගත්තාවූ අඹවනයෙන් පිරිවරණලද මේ සවණ්ණිමය දිව්‍ය ප්‍රාසාදය හිරු විමනක්සේ ජොතිමත්ව බබලන්නේයයි කියා දිව්‍යසම්පත් වර්ණනා කොට මෙබඳු සම්පත් ලැබීමට කරණලද කුශලය කවරේදැයි විචාළ සේක මුගලන් මහතෙරුන්වහන්සේගේ වචනය මුදුනෙන් පිළිගෙණ කුශලය ප්‍රකාශකොට දක්වන්නාවූ ඒ දිව්‍යාඞ්ගනාතොමෝ මෙසේ කීවාය.

"අහං මනුස්සෙසු මනුස්සභූතා
පුරිමාය ජාතියා මනුස්සලොකෙ,
විහාරං සංඝස්ස කාරෙසිං අම්බෙහි පරිවාරිතං."

යනුහෙයින් සවාමිනි යටගිය දවස සැවැත්නුවර ඒක්තරා උපාසිකාවක්වීමි. එසමයෙහි විහාරයක් කරවා ඒ විහාරය අවට අඹගස් රොපනයකොට විහාරය නොයෙක් අලංකාරයෙන් සරහා අඹගස්ද වස්ත්‍රයෙන් ඵලගන්වා සරහා බුඩපුත්‍රවූ මහසංඝයාට පූජාකෙළෙමි. ඒකුශලයෙන් මේ සියලු සම්පත් ලදිමි කීවාය. එකල්හි මහතෙරුන්වහන්සේ විස්තරවශයෙන් බණවදාරා මිනිස් ලොවට වැඩ බුදුන්ට එපවත් දන්වූසේක. බුදුරජානන්වහන්සේ එම අර්ථොත්පත්තිකොට

ගෙණ සම්ප්‍රාප්ත පිරිසට බණ වදාළහෙයක ඒ ධර්මදේශනාව බොහෝ දෙනාට සාධිකවිය.

මේ විමානවත්ථු ප්‍රකරණයෙහි සුනික්ඛිත්තවගි යෙහි අම්බවිමාන වත්ථුව නිමිවනලදි.

තවද මේ විමානවත්ථු ප්‍රකරණයෙහි සුනික්ඛිත්ත වග්ගයෙහි **චාරපාලවිමානවත්ථුව** නම් කවරයත්?

සම්බුද්ධත්වයන් සාක්ෂාත්කාරයෙන් දන්නාවූ සර්ව්ඥයන්වහන්සේ එක් සමයෙක්හි රජගහනුවර වැඩවසනසේක එසමයෙහි රජගහනුවර එක්තරා උපාසකයෙක් නිරන්තරයෙන් සංඝයාට බත්සන්‌දක් දෙන්නේය ඒ උපාසකයාගේ ගෙය කෙළවර පිහිටි මහදෙර ඇතුළටසොරු වදනාහෙයින් උන් වලක්වන පිණිස බොහෝසෙයින්ම ඒදෙරවස නලද්දේවෙයි භික්ෂූහු ඔහුගේදානයපිණිස දෙර සම්පයට වැඩදෙර වසනලද හෙයින් සමහර දවසක බත්නොලැබ ආපසු වඩනාහුය උපාසකයා අවුත් භාග්‍යවතට කියන්නේ කිමෙක්ද භද්‍රාව නිදිසින් අපගේ ස්වාමින්වහන්සේලාට සකස්කොට බත්දෙනලදදැයි විචාළේය. එබසට ඒ සත්‍රී කියන්නී ස්වාමිනි එදවස්වල සංඝයාවහන්සේ වැඩියේ නැතැයි කීවාය. එකල්හි නොවඩින්ට කාරණ කවරේදැයි විචාළේය. එබසට ඒසත්‍රී කියන්නී ගෙය කෙළවර දෙර වසනලද හෙයිනැයි සිතම් කීවාය. උපාසකයා එබස් අසා මහත් සංවේගයට පැමිණ චාරපාලයෙකු මාවිසින් සැදුවමැණවැයි සිතා එක්තරා පුරුෂයෙකු කැඳවා අදපටන් තෝ මේදෙර රක්ෂාකරමින් හිඳ යම් වේලෙක සංඝයාවහන්සේ වැඩිසේක්වීනම් උන්වහන්සේලා ඇතුළුගෙට වඩා පාත්‍රාගෙණ ආසනයෙහි වඩා හිඳුවා කළමනා කටයුතු සියල්ලම තෝම කරවයි කියා එක්තරා පුරුෂයෙකු දෙර රක්ෂාවට තුබූසේය. ඒ චාරපාලයාද යහපතැයිකියා එතැන්පටන් එසේම කෙරෙමින් භික්ෂූන් සම්පයෙහිදී බණඅසා උපදනාලද ශ්‍රද්ධාව ඇතිව කර්මඵල අදහා සරණයෙහිද සීලයෙහිද පිහිටියේය. භික්ෂුසංඝයාවද සකස්කොට උපස්ථානකළේය. ඉක්බිති නිරන්තරයෙන් බත්සන්‌දක්දී සංඝයාට උපස්ථානකලාවූ උපාසකයා මැනහාගයෙහි කාලක්‍රියාකොට යාමනම් දිව්‍යලොකයෙහි උපන්නේය. චාරපාලයා වනාහි කාලක්‍රියාකොට අනුන්ගේ දානයෙහි සකසා වතාවත් කිරීම්වසයෙන් කරණලද කුශලයෙන්හා අනුන්කරණ කුශලය අනුමෝදන්වූ කුශලයෙන්ද තව්තිසා දිව්‍ය

ලොකයෙහි දෙලොස්යොදුන් රන්විමනෙක උපන්නේය. එසමයෙහි ආයුෂ්මත්වූ මුගලන් මහතෙරුන්වහන්සේ දෙවචාරිකාවෙන් වඩිනාසේක් ඒ දිව්‍යපුත්‍රයාදැක මෙසේ විචාළසේක.

"උච්චම්දං මණිථූනං විමානං
සමන්තතෝ චාදස යොජනානි,
කූටාගාරා සතතසතා ඵලාරා
වෙලුරියත්ථම්භා රුචකත්ථකා සුභා.
තත්ථච්ඡසි පිවසි ඛාදසිතිච්ච,
විනාච තසච්ං පවදනති වඤ්ඣූ
දිබ්බා රසා කාමගුණෙත්ථ පඤ්ච
නාරියෝ නච්චන්ති සුවණ්ණ ජනනා.

යනුහෙයින් යට සවණ්ණකකිටක විමානයෙහි කියනලද ක්‍රමයෙන් එම්බා දිව්‍යපුත්‍රය නුඹ මේදෙලොස්යොදුන් රන්විමානය ඇතුලුවූ දිව්‍යසම්පත් ලැබීමට කරණලද කුශලය කවරේදැයි විචාළසේක. එකල්හි කුශලකර්මය ප්‍රකාශකොට දක්වන්නාවූ දිව්‍යපුත්‍රතෝම මෙසේකීයේය.

"දිබ්බං මමං වස්සසහස්සමායු
වාචාහි ගීතං මනසා පවත්තිතං,
එත්තාවතා ඨස්සනිපුඤ්ඤ කම්මං
දිබ්බෙහි කාමෙහි සමඞ්ගිභූතෝ."

යනුහෙයින් සවාමිනි යටගිය දවස එක්තරා චාරපාලයෙක්විමි එසමයෙහි දෙරසම්පයට වැඩියාවූ මහසංඝයා දැක මේ බුඩපුත්‍රවූ මහසංඝයාවහන්සේ අතිපවිත්‍රවූ ශීලාචාර ගුණඇත්තාහ යනාදීන් ගුණ සිහිකොට ප්‍රසන්නවූ සිත්ඇතිව නමස්කාරකොට සවාමිනි මෙසේ වැඩිය මැණවයි කියා එක්තරා උපාසකයෙකුගේ ඇතුළුගෙට වඩා මෙහි ආසන පනවනලද්දේය වැඩහුන මැනවයි කියා වඩාහිඳුවා සවාමිනි ශරීරයෙහි එාසු අඵාසු කවරේද. වෙහෙර සුවසේ විසුසේක්ද. යනාදීන් ආචාර සමාචාර වශයෙන් පිළිසඳර කථාමාත්‍රයක් පමණ කෙළෙම් මෙපමණක්ම කුශලයක් කෙළෙම් මෙපමණෙක් විනා මා සතු දෙයින් යම්කිසි දානවස්තුවක් දෙනලද්දේත් නොවෙයි ආචාර සමාචාර කුශලමාත්‍රයක් පමණ හෙතුකොටගෙණ මේ දිව ඉසුරු ලැබ මිනිස්ලොව සියක්අවුරුද්දෙක් තවුතිසා දෙවුලොවට එක්දවසක්වෙයි එදවසින් තිස්දවසෙක් මසෙක්වෙයි එමසින් දෙලොස්

මසෙක් හවුරුද්දක්වෙයි ඒ හවුරුද්දෙන් දහසක් හවුරුද්දට ආයු ඇතිව මහත්වූ දිව්‍යසම්පත් අනුභව කෙරෙමි කීයේය. එකල්හි මහ තෙරහු ඕහට බණවදාරා මිනිස්ලොවට වැඩ බුදුන්ට එපවත්දන්වූ සේක. බුදුරජානන්වහන්සේ එම අග්‍රොත්පත්තිකොටගෙණ සම්ප්‍රාප්ත පිරිසට බණ වදාළසේක. ඒ ධම්මදෙශනාව බොහෝදෙනාට සාර්ථකවිය.

මේ විමානවත්ථු ප්‍රකරණයෙහි සුනික්ඛිත්ත වග්ගයෙහි චාරපාල විමානවත්ථුව නිමා විය.

තවද මේවිමානවත්ථුප්‍රකරණයෙහි සුනික්ඛිත්ත වග්ගයෙහි **කරණීය විමානවත්ථුවනම්** කවරයක්?

මිපදෙත්තමවූ බුදුරජානන්වහන්සේ එක්සමයෙක්හි රජගහනුවර වැඩවසනසේක. එසමයෙහි රජගහනුවර එක්තරා උපාසකයෙක්තෙම බුදුන්ට ආරාධනාකොට දන්දෙන්නේය. එසමයෙහි ආරණ්‍ය සෙනාසනයෙක වසන්නාවූ එක්තරා තෙරකෙනෙකුන් වහන්සේ පිඬුසිඟා වැඩිසේක. එකල්හි එක්තරා පුරුෂයෙක් තෙරුන්වහන්සේ දැක නමස්කාරකොට උපාසකයාගේ ඇතුළු ගෙට වඩා ආසනයෙහි වඩාහිඳුවා යටකී චාරපාලයාමෙන් සත්කාරකෙළේය. ඉක්බිති උපාසකයා එයින් අපරභාගයෙහි කාලක්‍රියාකොට තවුතිස දිව්‍යලොකයෙහි සත්සියයක් කූටාගාරයෙන් ප්‍රතිමණ්ඩිතවූ දෙලොස් යොදුන් දිව්‍යප්‍රාසාදයෙක උපන්නේය. එසමයෙහි ආයුෂ්මත්වූ මුගලන් මහතෙරුන්වහන්සේ දෙවුලොවට වැඩ ඒ දිව්‍යපුත්‍රයා දැක විචාළසේක.

"උදවමිදං මණිථූනං විමානං
සමන්නතෝ චාදසයොජනානි
කූටාගාරා සඨානසතා උළාරා
-පෙ- සුවණ්ණඡන්නා"

යනුවෙයින් යට කියනලද ක්‍රමයෙන් ඔහුගේ දිව්‍යසම්පත් වර්ණනාකොට මෙබදු සම්පත් ලැබීමට කරණලද කුශලකර්මය කවරේදැයි විචාරා වදාළසේක. එබැවසා ඒ දිව්‍යපුත්‍රතෙම මෙසේ ප්‍රකාශකළේය.

"කරණීයානි පුඤ්ඤානි පණ්ඩිතෙන විජානතා
සම්මග්ගතෙසු තාදීසු යත්ථ දින්නං මහප්ඵලං
අඤ්ඤාය වත මෙ සික්ඛිං අරහන්තෙ ගාමමාගතෙ
තත්ථ චිත්තං පසාදෙත්වා තාවතිංසූපගා අහූ.

යනුහෙයින් ස්වාමිනි මම මිනිස්ලොව වශන සමයෙහි. ආරණ්‍ය සෙනාසනයක වසන්නාවූ තෙරකෙනෙකුන්වහන්සේ පිඬුපිණිස වැඩිසේක උන්වහන්සේ දැක සතුටු සිත්ඇතිව දියයුතතක් නැත්තේ වීනමුදු. සතුටු සිත්ඇතිව නමස්කාරකොට දන්දෙන්නාවූ එක්තරා උපාසකයෙකුගේ ගෙට වැඩමවා ආසනයෙහි වඩාහිඳුවා සුවදූක් විචාරා ආචාර සමාචාර දක්වා අනුන්දෙන දානයෙහි පින්අනුමෝදන් වීමි. එපමණ කුශලය හෙතුකොටගෙණ මේ තවුතිසා දිව්‍යලොකයට පැමිණියෙමි. මට වැඩ පිණිසම ඒතෙරුන්වහන්සේ වනයෙන් නික්ම ගමට පැමිණිසේකැයි සිතම් එබැවින් තමහට වැඩකැමති ශ්‍රද්ධාව නතයන් විසින් දානශීලාදී වශයෙන් කුශල් කටයුතතානුහුමය එතකුදුවුවත් සම්‍යක් මාර්ගඵලයට පැමිණියාවූ ආර්‍යශ්‍රාවකයන් අතුරෙන් යම්කෙනෙක් කෙරෙහි පහන්සිත්ඇතිව කිසි යම්දෙයක් දෙනලද් දේවීනම් ඒ දානය මහත්ඵල මහානිසංස වන්නේයයි කියේය. එකල්හි තෙරුන්වහන්සේ ඒ දිව්‍යපුත්‍රයාට බණවදාරා මිනිස්ලොවට වැඩබුදුන්ට එපවත් දන්වුසේක. බුදුරජානන්වහන්සේ එම අර්ථොත්පත්තිකොටගෙණ එතැන්හි සම්ප්‍රාපත පිරිසට විස්තරවශයෙන් බණවදාරණසේක ඒ ධර්මදෙශනාව බොහෝදෙනාට සාර්ථකවිය.

මේවිමානවත්ථු ප්‍රකරණයෙහි සුනික්ඛිත්තවග්ගයෙහි චතිය කරණීය විමාන වණ්ණනාව කියා නිමවනලදී.

තවද මේවිමානවත්ථුප්‍රකරණයෙහි සුනික්ඛිත්තවග්ගයෙහි. **එල දායකවිමානවත්ථුව** නම් කවරයත්?

සකලලොක සිවන්කරවූ භාග්‍යවත් බුදුරජානන්වහන්සේ එක් සමයෙක රජගහනුවර වේලුවනාරාමයෙහි වැඩවසනසේක එසමයෙහි බිම්බිසාරරජ්ජුරුවන්ට අකාලයෙහි අඹ අනුභව කරණු කැමතිවිය. එකල්හි රජ්ජුරුවෝ ආරාමපාලයා ගෙන්වා කියන්නේ එම්බා ආරාමපාලය මට අඹඵලයෙහි ලාභ උපන එබැවින් මට අඹගෙණවිත් දෙවයි කිහ එකල්හි ආරාමපාලතෙම කියන්නේ දේවයන්වහන්ස අඹගස්වල අඹනැත්තේද නොවෙයි. එතකුදුවුවත් වහාදී පිය නොහැක්කේය දේවයන්වහන්ස මදකලක් ඉවසා වදාරණසේක්නම් යම් ආකාරයකින් නොබෝදවසකින් අඹඵලගණිද එලෙස කරවිසිකිය රජු එබස්අසා යහපත ආරාමපාලය එසේකරවයි කිහ නැවත ආරාමපාලයා අඹඋයනටගොස් අඹගස්මුල පස්හැරදමා යම්ලෙසකින් ගස්වල පත්නැතිවේද (හෙවත්) කොලවැටේද එබඳු රුක්ෂවූ බො

රලුකැට මිශ්‍රවූ පස්දමා එබඳුදිය වත්කෙළේය නැවත පන්හිලි හෙන්ට වන්කළ රලුබොරලුපස් ඉවත දමා සහපත්වූ ප්‍රකෘතිපස්දමා මනාකොට දියවත්කෙළේය. අඹගස් නොබෝදවසකින් දළු කොලහා මල් කැකුලු හටගෙණ මුකුළුතව මල්පිපී මැලකි හටගෙණ අඹඵලගන්නේය ඒ ඵයනෙහි එක් අඹගසක පළමුකොට වනාසිලාසුණු රැඳසේ වණිණසම්පන්නවූ අඹඵල සතරක් පැසුනේය ඵයන්පාලයා ඒ අඹඵලසතර නෙලාගෙණ රජ්ජුරුවන්ට දක්වම්සි කියා ගෙණයන්නේ අතරමගදී පිඬුපිණිස වඩනා මුගලන්මහතෙරුන්වහන්සේ දැක මෙසේ සිතුයේය මේ අග්‍රවූ අඹඵල අග්‍රදක්ෂිණෙය්‍යවූ මේ මහතෙරුන්වහන්සේට දුන්නේවීනම් එකාන්තයෙන්ම මට බොහෝකාලයක් මුලුල්ලෙහි හිත සැපපිණිස වන්නේය රජ්ජුරුවන්ට ගෙණයන්නාවූ අඹ දුන් වරදට රජ්ජුරුවෝ මරණසේක්හෝ රටින් නගණසේක්හෝ වේවයි ඒදුක් මේජාතියට පමණ වන්නේය රජ්ජුරුවන්ට දුන්කල රජ්ජුසතුටුව ඉහලොක සම්පත් පමණක් දෙනසේක එසිනුදු සවලප මාත්‍රයෙක්වෙයි මේ සඞ්ඝරත්නයාණන්වහන්සේට දුන්කල්හි එසේනොවෙයි ඉහලොක පරලොක ඉදක්හිම මහත්ඵල මහානිසංස වන්නේයයි සිතා ඒ අඹඵල තෙරුන්වහන්සේට පූජාකොට රජ්ජුරුවන්කිරා ගොස් රජ්ජුරුවන්ට එපවත් කිහ රජ්ජු එබස්අසා රාජපුරුෂයන් කැඳවා මොහු මටගෙණා අඹ තෙරුන්වහන්සේට දුන්නෙම් කියා යමක් කියානම් ඒ සැබෑදැයි විමසා එන්වයි කිහ.

එකල්හි තෙරුන්වහන්සේ ඒ අඹ ගෙණගොස් බුදුන්ට පිළිගැන්වූසේක බුදුරජානන්වහන්සේ එයින් එකක් සැරියුත් මහතෙරුන්වහන්සේටද එකක්මුගලන් මහතෙරුන්වහන්සේටද එකක් මහාකාශ්‍යප සථවිරයන් වහන්සේටද දෙවා වදුරා එකක් තමන්වහන්සේ වැළඳූසේක. රාජපුරුෂයෝ එපවත්දුක රජ්ජුරුවන්ට කිවාහුය රජ්ජුරුවෝ එපවත්අසා මොහු එකාන්තයෙන්ම ප්‍රඥවන්ත වීරපුරුෂයෙක තමුාගේ ජීවිතය පරිත්‍යාගකොට කුසල්කෙළේය තමන් උදෙසා ගෙණආවාවූ අඹඵලයක් සවලපනොකොට යහපත්වූ සමනැනවම පැමිණෙනලෙස කෙළේයසිකියා සතුටුසිත් ඇතිව ඕහට එක් ගම්වරක්හා වස්ත්‍රාභරණාලංකාරාදී උපකරණසියල්ලදී එම්බා ආරාමපාලය අම්බඵලදානය හෙතුකොටගෙණ තාවිසින් යම්කුශලයක් රැස්කරණලදද එයින් මට පින්දෙවයි කිහ. දෙවයන්වහන්ස සුවසේ පින්අනුමෝදන්වනු මැණවැයිකියා පින්දුන්නේය. ඵයන්පාලයා එසින් අපරභාගයෙහි කාලක්‍රියාකොට තවුතිසා භවනයෙහි උපන්

නේය. ඕහට සත්සියයක් කූටාගාරයෙන් ප්‍රතිමණ්ඩිතවූ සුසැට ගවු පමණවූ රන්විමනෙක් පහලවිය. එසමයෙහි ආයුෂ්මත්වූ මුගලන් ම හතෙරුන්වහන්සේ දෙව්ලොවට වැඩ ඒ දිව්‍යපුත්‍රයා දැක මෙසේ විචාළසේක.

"උච්චම්දං මණිථූනං විමානං
සමන්නතෝ සොළස යොජනානි,
කූටාගාරා සත්තාසතා උළාරා
වෙලුරියත්ථම්භා රුචකත්ථතා සුභා.

තත්ථච්ඡසී පිවසී ඛාදසිව
දිබ්බාව විණා පවදන්ති වග්ගු,
අට්ඨට්ඨකා සික්ඛිතා සාධු රූපා
දිබ්බාච කඤ්ඤ නිදසවරා උළාරා
නච්චන්ති ගායන්ති මනොහරායෝ.

යනුහෙයින් යටකියනලද ක්‍රමයෙන් දිව්‍යසම්පත් වර්ණනා කොට මේසත්සියයක් කූටාගාරයෙන් ප්‍රතිමණ්ඩිතවූ දිව්‍යප්‍රාසාදය ඇතුලුව දිවඉසුරු ලැබීමට කරණලද කුශලය කවරේදැයි විචාරා ව දළසේක. එකල්හි යටගිය දවස කරණලද කුශලය ප්‍රකාශකොට දක්වන්නාවූ දිව්‍යපුත්‍රතෙම මෙසේ කීයේය.

එලදැයි එලං විපුලං
ලභති ධම්මජ්ජුගතෙ සුපසන්නා

සොහි මොදති සහත්ථගතෝ නිදිවෙ
අනුභොතිව පුඤ්ඤඵලං විපුලං.

යනුහෙයින් සවාමිනි මේලොකයෙහි යම්කිසි කෙනෙක් සෘජුමාර්ගඵලයට පැමිණියාවූ අෂ්ටාර්යපුද්ගල මහසංඝයාකෙරෙහි පහන්සිත්ඇතිව අඹඵලාදි වෘක්ෂයන් යම්කිසි ඵලදෑනයක් දුන්නේවිනම් ඒඵල යතෙම දිව්‍යලොකයට ගියේ උදාරතරවූ මහත්ඵල ලබම්න් සතුටුව දිව්‍යසම්පත් අනුභවකෙරෙයි ඒ මහත්ඵල මහානිසංස ඇතිබව මාගේ මේ දිවඉසුරු බලා දනයුත්තේමය මම යටගිය දවස මිනිස්ලොව වසන සමයෙහි එක්තරා ආරාම පාලයෙක්වීම් එසමයෙහි අලුත් අඹඵල සතරක් පූජාකෙලෙමි. ඒ කුශලකර්මය හෙතුකොටගෙණ මේසියලුම දිවඉසුරු ලැබීම් එබැවින් දිව්‍යමනුෂ්‍යසම්පත් කැමැත්තාවූ නුවණැති මනුෂ්‍යයන් විසින් නිරන්තරයෙන් දන්දෙන්ට සුදුසු වන්නේ යයි කීයේය.

එකල්හි ආයුෂ්මත් මුගලන් මහතෙරුන්වහන්සේ ඒ දිව්‍යපුත්‍රයාට විශතරවශයෙන් බණ වදාරා මිනිස්ලොවට වැඩ බුදුන්ට එපවත් දැන්වූසේක බුදුරජානන්වහන්සේ එම අවේච්චප්පසාදිකොටගෙණ සම්ප්‍රාප්ත පිරිසට බණ වදාළසේක. ඒ ධර්ම දෙශනාව බොහෝ දෙනාට සාර්ථකවිය.

මේවිමාන වත්ථුප්පකරණයෙහි සුනික්ඛිත්ත වග්ගයෙහි එලදායක විමානවණ්ණනාව නිමවන්ලදි.

තවද මේ විමානවත්ථු ප්‍රකරණයෙහි සුනික්ඛිත්ත වග්ගයෙහි **කුණ්ඩල විමානවත්ථුව** නම් කවරයත්?

දෙවනි දෙවවූ භාග්‍යවත් බුදුරජානන්වහන්සේ එක්සමයෙක සැවැත්නුවර ජෙතවනාරාමයෙහි වැඩවසනසේක. එසමයෙහි අග්‍ර ශ්‍රාවකවූ සැරියුත් මුගලන් දෙදෙනාවහන්සේ නිත්‍යපරිවාරවූ පන්සිය පන්සිය සංඝයා පිරිවරා කසීරට දනවී සැරිසරා එඩෙණ්ඩ්‍රු සවස සූර්‍යාස්තංගතවන වේලෙහි එක්තරා විහාරයකට පැමිණියාහ එපවත්අසා ඒ විහාරයට ගොචරවූ නුදුරු ගමකවසන්නාවූ එක්තරා උපාසකයෙක් තෙරුන්වහන්සේලා කරා එළැඹ නමස්කාරකොට සිරිපතුල් සොඹා තෙල්ගල්වා ඇඳපුටු කලාල් පැදුරුඑලවා සඳ ඇතිරි අතුට මනාකොට අසුන් පණවා වඩාහිඳුවා දානාරාධනාකොට දෙවෙනි දවස් ආහාර පිළිගෙයලකොට මහත්කොට දානය පැවැත්වූසේක.

තෙරුන්වහන්සේලාද වළඳ ඉක්බිති දානානුමොදනාවෙන් ඕහට අනුමෙවෙනි බණවදාරා වැඩියාහුය. එයින් අපරභාගයෙහි උපාසකයා කාලක්‍රියාකොට තවුතිසා දිව්‍යලොකයෙහි දෙලොස්යොදුන්රන්විමානෙක උපන්නේය එසමයෙහි ආයුෂ්මත්වූ මුගලන් මහතෙරුන්වන්සේ දෙවවාරිකාවෙන් තවුතිසා භවනයට වැඩ ඒ දිව්‍යපුත්‍රයාද්‍ය කෙසේ විවාළසේක.

අලංකතෙ මල්ලධරෙ සුවත්ථෙ
සාකුණ්ඩලී කපිතකෙසමස්සු,
ආමුත්තහත්ථා හරණේ යසස්සී
දිබ්බේ විමානම්හි යථාපි වන්දිමා.
දිබ්බාච භික්ඛා පවදන්ති වග්ගු
අට්ඨට්ඨකා සික්ඛිතසාධුරූපා,
දිබ්බාච කඤ්ඤූ නිදසවරා උළාරා
නච්චන්ති ගායන්ති පමොදයන්හි.

යනුහෙයින් එම්බා දිව්‍යපුත්‍රය යහපත්කොට අන්දන් තබනලද කෙසමශ්‍රැන්හා පළඳනාලද කුණ්ඩලාභරණ ඇතිව දිව්‍යමය වස්ත්‍රාභරණමාලාදියෙන් ද අනෙකවිධ රත්නයෙන් විසිතුරුවූ හස්තාභරණ පාදාභරණාදි නොයෙක් අලංකාරයෙන් සැරහී තෝ මේදිව්‍යප්‍රාසාදයෙහි චන්ද්‍රයාසේ ජෝතිමත්ව බබලන්නෙහිය සිව්සැටක් පමණ සත්‍රී අලංකාරයෙන් සැරහුනාවූ දිව්‍යාඞ්ගනාවෝ වීණාගායනා කෙරෙමින් නාට්‍යගීත කෙරෙමින් තොප සතුටුකරවන්නාහුවෙති එම්බා දිව්‍යපුත්‍රය තෝ මෙබඳු සැපතක් ලැබීමට කලාවූ කුශලය කවරේදැයි විචාරා වදාළසේක. එබස් අසා කුශලය ප්‍රකාශකොට දක්වන්නාවූ ඒ දිව්‍යපුත්‍රතෙම මෙසේ කීයේය.

අහං මනුස්සෙසු මනුස්සභූතෝ
දිසවාන තෙ සමණෙ සීලවන්තෙ,
සම්පන්නවිජ්ජාචරණෙ යසස්සී
බහුස්සුතෙ තණ්හක්ඛයූපපන්නෙ.
අන්නඤ්ච පානඤ්ච පසන්නචිත්තෝ
සක්කච්ච දානං විපුලං අදාසිං.

යනුහෙයින් සවාමිනි යටගිය දවස මම මිනිස්ලොව වසන සමයෙහි ශීලසම්පන්නවූ බහුශ්‍රැතවූ තෘෂ්ණාක්ෂයකළාවූ මහාසංඝයා දැක සතුටුවූ සිත්ඇතිව අන්නපානාදියෙන් උදාරතරව දන්දී උපකාර කෙළෙමි. ඒ කුශලයෙන් මෙසියලුම දිවඉසුරු ලදිමි කීයේය. එකල්හි මහතෙරුන්වහන්සේ ඕහට විශ්තරවශයෙන් බණවදාරා මිනිස්ලොවට වැඩ බුදුන්ට එපවත් දැන්වූසේක. බුදුරජානන්වහන්සේ එම අර්ථොත්පත්තිකොටගෙණ සම්ප්‍රාප්ත පිරිසට බණ වදාළසේක. ඒ ධර්මදෙශනාව බොහෝදෙනාට සාර්ථකවිය.

මේවිමානවත්ථු ප්‍රකරණයෙහි සුනික්ඛිත්ත වග්ගයෙහි
කුණ්ඩල විමානවණ්ණනාව කියා නිමවනලදී

තවද මේ විමානවත්ථු ප්‍රකරණයෙහි සුනික්ඛිත්තවග්ගයෙහි **ඒ තතරවිමානවත්ථුව** නම් කවරයත්?

සකලසත්වානුකම්පාඇති භාග්‍යවත් බුදුරජානන්වහන්සේ සියලුබුඩකෘත්‍යයන්කොට නිමවා පිරිණිවන්පෑකල්හි ධාතුභෙදගණ ඒ. ඒ තන්හි දැහැබ්බඳිනට පටන්ගත්තාහුය එසමයෙහි ධාතුබෙදනාතානටරැස්වූ මහාකාශ්‍රාවකයන් අතුරෙන් ආයුෂ්මත්වූ මහාකාශ්‍යප ස්ථවි

රියන්වහන්සේ ප්‍රධානකොටඇති මහසංඝයා වහන්සේලාසින් ධම්මසංගායනා කිරීම රජගහනුවරදී වන්නේයයි නියමකොට ගෙණ ශ්‍රාවක සන්නිපාතයටහා වස්විසීමට නියමවූ ඇසලවස පූරපස ළොස්වක් දිනය සම්ප්‍රාප්තවනතෙක් තමතමන්ගේ පිරිස්හා සමග මහාස්ථවිරහැන් ඒ ඒ තැන්හි වසනකල ඒමහාශ්‍රාවකයන් අතුරෙන් ආයුෂ්මත්වූ කුමාරකාශ්‍යපස්ථවිරයන්වහන්සේ පන්සියයක් භික්ෂූසංඝයාපිරිවරා සෙතව්‍යනුවරට පැමිණ සිංසපා වනයෙහි වැඩවසනසේක. එසමයෙහි පායාසිරාජඤ්ඤනම් බ්‍රාහ්මණයෙක් බොහෝ දෙනාවසින් පිරිවරණලදුව තෙරුන්වහන්සේ කරා එළැඹ පිළිසඳර කථාකොට එකත්පස්ව හිඳ මෙසේ කීයේය.

කාශ්‍යපස්ථවිරයන්වහන්ස මෙලොවසිටියන්ට පරලොවන් නැත මලස්කියන්ට නැවත ඉපදීමකුත්නැත කුසල්කිරීමෙන් ලබන ඵලවිපාකයකුත් නැත අකුසල්කිරීමෙන් වන අපාදුකකුත්නැතැයි කියා මම මෙබඳුවාදයක් දෘෂ්ටියක් ඇත්තෙමියි කිවෙය. එකල්හි තෙරුන්වහන්සේ වදාරණසේක් එම්බා රාජඤ්ඤය මට එසේ නොකියම් පරලොව නැතකුසල් අකුසල් නැතකියා දූකවත් අසාවත් නැත්නේය එසේවිනම්තා අතින් මමකාරණයක් විචාරම්යි මේවඤ්ඣසූයම් දෙදෙනාද මේලොවද පරලොවද දෙවියෝද මනුෂ්‍යයෝද දන්නෙහිවිනම් කියවයි වදළසේක එකල්හි බ්‍රාහ්මණයා සිතන්නේ මේතෙරුන්වහන්සේ චන්ද්‍රසූර්‍යයන් උදාහරණය පලමුකොට වදළසේක එබැවින් චන්ද්‍රසූර්‍යයින්මෙන් කිසිවක්හු විසින් මැඩපැවැත්විය නොහැක්කේය මේවන්ද්‍රසූර්‍යයන් දෙදෙන මෙලොව කින්නම් චන්ද්‍රසූර්‍යයන් දෙදෙන කෙපමණ උසමහත ඇත්තාහුද යනාදීන් වාදාරොපණයකරණසේක එකල්හි මට උත්තරය කියා ලිය නොහැක්ක පරලොවකින්නම් පරලොවනැතැයිකියාගත් මාගේවාදය බිඳෙයි එතකුදුවුවත් ඔන්වහන්සේ වම එක්විය යුතුයයි සිතා පරලොව දෙවියෝය මෙලොවත් නොවෙයි මනුෂ්‍යයෝත් නොවෙයි කිය එකල්හි පරලොවත් කුසල් අකුසල් ඇතැයි කියා මේකාරණයෙන් දූනගණුවයි වදළසේක.

එකල්හි බ්‍රාහ්මණයා කියන්නේ එතකුදුවුවත් කාරණාඇතිහෙයින් මම අදහා නොගණිමි සතුන් නැසිව සොරකම්කිරීම ආදීවූ දසවිධ අකුසල් කළාවූ මාගේ නැයන් මිත්‍රයන් මරණාසන්නකාලයෙහි උන්කරාගොස් මෙසේ කීම් පින්වත්නි ප්‍රාණඝාතාදී අකුසල් කළ සත්වයෝ අපායේ උපදනාහයිකියා සමහර ශ්‍රමණ බ්‍රාහ්මණයොණෙක්කියන්නාහුවෙති. උන්කියන්නාවූ බස්සැබෑවිනම් නොපි පව් කළබැවින් අපායේ උපදනාහුවෙත් එසේ උපනහොත් අපි අපායේ උප

නම්හයි කියා මට අවුත්කියවයි කීම් ඔව්හුද යහපතැයි කියා කාල ක්‍රියාකළාහුය ඔවුන් අතුරෙන් අවුත් මට කිකෙනෙක්වත් දූනයෙකු එව්කෙනෙක්වත් නැත එබැවින් පරලොව නැතැයි කීම් කියය.

එකල්හි මහතෙරහු වදාරණසේක් රාජඤ්ඤය මම තට උපමාවක් කියම් උපමාවෙනුත් සමහර නුවණැත්තාහු වචනාර්ථය දන්නාහුයයි වදාරා රාජඤ්ඤය තොපගේ චිත්තයෙහි රාජ අපරාධකළාවූ සොරෙකු ගෙණවුත් තොපට දක්වා මේසොරාහට වධ යෙදුවමැනවැයි කී කල තොපි චොරඝාතකයන් කැඳවා මොහු පිටිතල හයාබැඳ වීථියෙන් වීථිය සඞ්ගියෙන් සඞ්ගිය කසයෙන් තලා ක්ෂාරඝවරවූ පණාබෙරින් වධබෙරගස්වා හිස්සිඳුවයි කියන්නේ වේද එකල්හි වධකරුවෝ ඔහුඅල්ලා කීලෙස වධබෙරගසා බැඳ වීථියෙහි දකුණු වහසල් දෙරින් පිටත්කරවා සොරුන් මරණතැන නිදුවා ඉස්සිඳින්ට ආරම්භවූකල අසවල්ගම මාගේ නෑයන් මිත්‍රයන් බලා එනතෙක් මාහිස නොකපන්වයි කියා චොරඝාතකයන් කෙරෙන් ගැලවියන්ට සොරා අවසරක්ලබාද නොහොත් හඬ හඬා සිටියදීම නිස කපත්දැයි විචාලසේක එසේ නොලැබයි හඬහඬා සිටියදී හිස කපන්නාහුයයි කීය. එසේවී නම් රාජඤ්ඤය සොරාත් මනුෂ්‍යයෙක වධකරුවෝත් මනුෂ්‍යයෝය මනුෂ්‍යයෙක් මනුෂ්‍යයන්ගෙන් ගැලවී නැයන් දකින්නට යාම නොලබානම් පවුකොට අපායේ උපන් තොපගේ ඥාතිමිත්‍රයෝ අමනුෂ්‍යවූ යම පළුන්ගෙන් ගැලවී කෙසේ තොපකරා එද්ද මේකාරණයෙන් පරලොව ඇතිබව දූනගණුවයි වදාළසේක එකල්හි බ්‍රාහ්මණයා කියන්නේ එතකුදුවුවත් මම අදහා නොගණිමි ඊට කාරණා ඇත ඒ කවරේදයත් ප්‍රාණඝාතාදී දසවිධ අකුසලින් දුරුවී දානශීලාදි වශයෙන් කරණලද කුසල් ඇත්තාවූ මාගේ නෑයන් මිත්‍රයන් මරණාසන්නකාලයෙහි උන්කරාගොස් මම මෙසේ කීම් පින්වත්නි මේලොකයෙහි කුසල් කළසත්වයෝ දිව්‍යලොකයෙහි උපදනාහයි කියා සමහර ශ්‍රවණබ්‍රාහ්මණකෙනෙක් කියන්නාහුවෙහි උන්කියන බස්සැබෑවීනම් නොපිකුසල්කළබැවින් දෙව්ලොවඋපදනාහුවෙති එසේ උපනහොත් අපි දෙව්ලොව උපනුම්හයිකියා මට අවුත්කියවයි කීම් බව්හුද යහපතැයි කියා කාලක්‍රියාකළෝය ඔවුන් අතුරෙන් මට කීකෙනෙක්වත්කියා එව්කෙනෙක්වත්නැත එබැවින් පරලොව නැත කීමයි කීය.

එකල්හි තෙරුන්වහන්සේ වදාරණසේක් එම්බා රාජඤ්ඤය උපමාවක් කියම් ඉසපටන් අසුවිවලක ගැලී සිටි පුරුෂයෙකු දක තොපි තොපගේ පුරුෂයන්ට මෙසේකියන්නෙනිය මොහු අසුවිවල්වන් ගොඩනගා උනපත්තෙන් පිස සෝදා පඬුමැටියෙන් උලවා තෙල්ගල්වා

සුවඳ සුණු ගල්වා සෝදවයිකියා සෝදවා සම්භරණයෙන් සරසවා ප්‍රාසාදයකට නංවා පඤ්චකාමගුණසම්පත්තියෙන් උපකාර කරන්නේවේද ඒ ප්‍රාසාදාභිරුඨව පඤ්චකාම සම්පත් අනුභව කරන්නාවූ පුරුෂයා නැවතත් එමඅසුචිවලෙහි ගැලෙනුකැමතිදැයි විවාළසේක එසේනැත අසුචිදුර්ගන්ධබැවින් ඉතා පිළිකුල්කෙරෙයි කීය එසේවීනම් සුවඳ විලවුන්ගා සම්භරණයෙන් සැරසී සිවි චක්‍රවර්ති රජ්ජුරුවන්වැනිය වුන්පවා සාරසියයක් ගව්දුරසිවි දෙව්යන්ට කරබැඳි ගැරඬිකුනක් සේවැටහෙයි එබැවින් කුසල්කොට දෙව්ලොව උපන් තොපගේ ඥාති මිත්‍රයෝ පරලොව ඇතිබව ක්‍යන්ට තොපකරා කෙසේ එද්ද මේකාරණයෙන් පරලොව ඇතිබව දැනගණුවයි වදාළසේක.

එකල්හි බ්‍රාහ්මණයා කියන්නේ තවත් කාරණාඇත අදහා නොගණිමි කවරේදයත්? දසවිධඅකුසලින් දුරුව දසවිධකුසලයෙහි පිහිටියාවූ මාගේනැයන් මිත්‍රයන් මරණාසන්නකාලයෙහි උන්කරාගොස් මම මෙසේකිම් පින්වත්නි කුසල්කළ සත්වයෝ තව්තිසාදෙව්ලොව උපදනාහයිකියා සමාහර ශ්‍රමණ බ්‍රාහ්මණයෝ කියන්නාහුවෙති උන් කියනබස් සැබෑවිනම් තොපින් තව්තිසා දෙව්ලොව උපදනාහුවෙති එසේ උපනහොත් මට අවුත්කියවයි කීමි උන්අතුරෙන් අවුත් කිකෙනෙක්වත් එවිකෙනෙක්වත් නැත එබැවින් පරලොවනැත කියමියි කීය. එකල්හි තෙරුන්වහන්සේ වදාරණසේක් එම්බා රාජකුමාර මිනිස්ලොව සියක් අවුරුද්දක් තව්තිසාවැසි දෙවියන්ට එක්දවසෙක් වෙයි ඒදවසින් නිස්දවසෙක් මසෙක්වෙයි ඒමසින් දෙළොස් මසෙක් අවුරුද්දෙක්වෙයි ඒ අවුරුද්දෙන් දහසක් අවුරුද්දට ආයුවෙයි තවුතිසා දෙව්ලොව උපන් තොපගේ ඥාතිමිත්‍රයෝ දෙතුන්දවසක් පව කාමගුණසම්පත් අනුභවකොට නැවත ගොස් පායාසිරාජකුමාරයාට බ්‍රාහ්මණයාට කුසල් අකුසල් පරලොවඇතිබව කියන්ට යමිහයි කියා දෙතුන්දවසක් සැපවිඳ අවුත් කියන්නාහුනම් එසේලැබේදැයි විවාළසේක කාස්‍යපසම්බුරයන්වහන්ස නොලැබෙයි උන්එහකල මම කාලක්‍රියාකොටත් බොහොකල්ඉක්මෙයි කිය එසේකියා නැවත කියන්නේ තව්තිසා දෙව්ලොව දෙවියන් ඇතිබවද බොහෝආයුඇති බවද නුබවහන්සේට කීවෝකවුරුද දුටුවෝ කවුරුද මම අදහානොගණිමියි කියේය. එකල්නි තෙරුන්වහන්සේ වදාරණසේක් එම්බා රාජකුමාර මමඋපමාවක් කියම් යම්සේ ජාත්‍යන්ධ පුරුෂයෙක් හිරසඳ නොදකිද තාරකාවන් නොදකිද නීලපීතාදී රූපයන් නොදකිද එසේ නොදැකීමනිසා ඔහු මෙසේකියන්නේය හිර සඳනැත තාරකාවන්නැත නීලපීතාදී රූපයකුත්නැත හිරසඳ දුටුකෙනෙකුන්නැත

නීලපීතාදී රූපයන් දුටුකෙනෙකුත්නැත මම නොදනිමි මම නොදක්නෙමි එබැවින් නැතැයිකියන්නේවේද ඒ කියන වචනය ඇත් තක්ද යහපත් වචනයක්ද නොහොත් නොදක්නාබැවින් කියාදැයි විචාළසේක. පින්වත් කාශ්‍යපසවිරයන්වහන්ස ඔහු නොදක්නා හෙයින් කියන බවක්වීනා යහපත් බසෙක් නොවෙයි කිය.

එම්බා රාජකුඤ්ඤය තව්තිසාවැසි දෙවියෝත් ඇද්ද එබදු දීඝායු ෂයකුත් ඇද්ද ඒ දුටුවෝ කවුරුද නුබවහන්සේට කිවෝ කවුරුදැයි කියනහෙයින් තෝද ඒ ජාත්‍යන්ධයාට උපමාකොට සිතමි ජාත්‍යන්ධ යාට චන්ද්‍රසූර්‍යාදි රූපයන් නොපෙනෙන්නාසේ තෘෂ්ණාවේ මේ ප්‍රයෝජ නයෙන් පරලොව දැනගත නොහැක්ක දිවස්ඇති ශ්‍රමණ බ්‍රාහ්මණ යෝ විශෙෂයෙන් දක්නාහුයයි වදළසේක. එකල්හි බ්‍රාහ්මණයා කි යන්නේ එසේදවුවත් මම අදහානොගණිමි ඊට කාරණාඇත කවරේ දයත් සිල්වත්වූ ශ්‍රමණබ්‍රාහ්මණයෝ මරණට පැමිණියහු අපට පරලොවසැප ඇතැයි කියා දනිත්නම් විෂකාහෝ මියෙත්මය ශ ස්ත්‍රයෙන්හෝ කරවැල ලාහෝ මියෙත්මය දුකට පිළිකුල්වූ මරණ නොකැමැත්තාවූ සැපකැමැත්තාවූ ජීවත්වනු කැමැත්තාවූ ශ්‍රමණ බ්‍රාහ්මණයන් දක්නෙමි කුශලවිපාකයක් නැතිසෙයින් මරණ නොකැමැත්තාහ ජීවත්වනු කැමැත්තාහ. එබැවින් පරලොව නැතැයි කියමියි කිය. එකල්හි තෙරුන්වහන්සේ වදාරණසේක් එම්බා රාජකුඤ්ඤය මම පෙරවූ දෙයක් කියමි එක්තරා බ්‍රාහ්මණයෙකුගේ අඹුවෝ දෙදෙනෙක් වූවාහුය. එක් ස්ත්‍රියෙකුගේ දසදොළොස්වය ස්වූ පුතෙක් ඇත්තේය. එක්ස්ත්‍රියක් ගර්භිනිවූවාය එකල්හි බ්‍රාහ්ම ණයා කාලක්‍රියාකෙළේය. ඒ ගෙයි සියලුම ඉසුරු සම්පත් ඒගැබිනි යම සන්තකවිය එකල්හි බ්‍රාහ්මණකුමාරයා ගර්භිනියට කියන්නේ මැනියනි පියානන් සන්තක ධනධාන්‍යාදි සියලු සම්පත් නුබම සන්ත කවිය මටත් දායාදයොටසක් දෙවයි කිය එකල්හි බැමිණි කියන්නී මා වදනතෙක් බලව පුතෙකුවිනම් නොපටත් භාගයක් දෙමි දුවක් විනම් නොපටම පරිවාරිකාකොට සියලුම සම්පත් දෙමිකිව. කුමාර යා දෙවෙනිවත් තුන්වැනිවත් එසේම දායාද දෙවයිකීය. එකල්හි අ ඥාන බාලනුවණැති බැමිණි කුමාරයෙක්ද කුමාරිකාවක්දැයි කියා බලමි සිතා ගෙටවැද බඩඉරා අනයව්‍යසනයට පැමිණියාය. එමෙන් රාජකුඤ්ඤය තෝත් පරලොවයයා අනයව්‍යසනයට පැමිණියෙහිය සිල්වත්වූ යහපත් ගුණඇති ශ්‍රමණ බ්‍රාහ්මණයෝ එසේ අනයව්‍යසන යට නොපැමිණෙන්නාහුය යම්තාක් ආයුපරිපාකයටයේද ඒතාක්ක ල් බොහෝ කුසල් රැස්කරෙමින් බොහෝ දෙනාටනිත සැපපිණිස

පිළිපදිමින් ආත්මාර්ථපරාර්ථසාධම්න් බොහෝකල්සිටිනාහුයයි වදළ සේක. එසේදවුවත් මම අදහා නොගණිමි ඊට කාරණාඇත. කවරේ දයත්? ජීවිතය සොයම්සිතා මරන්ට සුදුසු වරදඇති සොරෙකු අල්වා සැලියෙකලා තෙත්සමින් මුව වසාබැඳ ඝණකොට මැටිබැඳ ලිප තබා ගිනිකොට නිවුනුකල බිමටබා මැටිබිඳ වැසුම්හැර වහා බැලීම් එකල ජීවිතය නික්මෙනවාහුදුටුයෙමි එබැවින්පරලොවනැතයි කියමිකිය. එම්බා රාජඝාතය දවල් සැතපෙන්නාවූ තෝ උයන් පොකුණු ආදිවූ රමණීයවූ භූමිභාග සිහිනෙන් දුටුයේ ඇද්දැයි විචාළසේක. දුවිමි කිය ඒසිහින දකිනාකල කොරුන්ඛුදුන්හා බාලතරුණ සත්‍රිහු තා රක්ෂා කොට උන්නාහුදැයි විචාළසේක රැක උන්නාහුයයි කිය ඔවුන් අතු රෙන් තාගේ ජීවිතය ශරීරයෙන් පිටත්වන බවක්හෝ ඇතුලත්වන බවක්හෝ දුටුවෝඇද්දැයි විචාළසේක. නැතැයිකිය. එසේවිනම් ජීව න්වූ සත්‍රිහු ජීවත්වූ තාගේ ජීවිතය නික්මෙන්නා නොදකින්නම් ම ල සත්‍යාගේ ජීවිතය නික්මෙන්නා කෙසේ දකිද මේකාරණයෙන් පරලොව ඇතිබව දැනගණුවයි වදළසේක. එකල්හි බ්‍රාහ්මණයා කි යන්නේ මරන්ට නිසි සොරෙකු අල්වා තරාදියේ තබා කිරා එහිම සිටියදී දුනුදියෙන් බොටුවවෙලා මරා නැවතත් කිරුව ජීවත්ව හුන් කල බර්යැනැල්ලුවිය මලකල බරබොහෝවිය තදවිය එබැවින් පර ලොව නැතැයි සිතමිකිය. එකල්හි තෙරුන්වහන්සේ වදුරණසේක් දවසක්මුලුල්ලෙහි යවටක් ගිනිකොට ගිනිගෙණ දිලියෙන යවටය ත රාදියේතබා කිරා නැවත නිවුනුකල කිරන්නේවිනම් කවර වේලෙ ක බරබොහෝවේද කවරවිට සැහැල්ලුව මෘදුවේදැයි විචාළසේක ගිනි ගත්යවටගිනිහා වායු එක්වූබැවින් සැහැල්ලුන්වෙයි මෘදුන්වෙයි නිවු නුකල බරත්වෙයි තදත්වෙයි කිය. එමෙන් රාජඝාතය ජීවත්වූ සත්ව යාඋෂ්ණත් සහගතව වායු සහගතව විඤ්ඤාණසහගතව සිටිනාහෙයි න් සැහැල්ලුවෙයි මෘදුවෙයි මලශරීර උෂ්ණයද වාතයද විඤ්ඤාණයද නැතිහෙයින් බරවෙයි තදත්වෙයි මේකාරණයෙන් පරලොව ඇතැ යිකියා දැනගණුවයි වදළසේක.

එකල්හි බ්‍රාහ්මණයා කියන්නේ ජීවිතය නික්මෙන්නා බලම්හයි සිතා මරන්නට නිසිවරදඇති සොරෙකුගෙණා පුරුෂයන්ට මෙසේ කිම් සිවි සම් මස් නහර ඇට ඇටමිදුලු විනාසනොකොට ජීවිතයෙ න් තොරකෙරෙත්වයි හෙවත් මරවයිකිම් උන්එසේමකළෝය. ඔහු මියන්ට ආසන්නවූකල්හි මෙසේකිම් උඩුකුරුකොටහොවා ජීවිතය නික්මෙන්නා බලවයි කිම් එසේම කළෝය නැවත මුනින්හොවා බ

ලව දකුණැලයෙන් හොවා බලව වමනැලයෙන් හොවා බලව නහා සිටුවා බලව ඉස බිම සිටුවා බලව අනික් අතින් අනුව පසින් අනුව කැවින් පහරව දන්ඩෙන් පහරව ශස්ත්‍රයෙන් පහරව එහාට මෙහාට බිම ඇන සොලවා බලවසි කිම් එසේකොටත් දිවිනික්මෙන්නා නුදුටුමිහ එබැවින් පරලොව නැතැයි සිතම්කිය. එකල්හි තෙරුන්වහන්සේ වදුරණසේක් එම්බා රාජකුඤ්ඤය ඊට උපමාවශයෙන් පෙර වූදෙයක් කියම් සක්පිඹිනා පුරුෂයෙක් එක්තරා ප්‍රත්‍යන්ත ගමක් මැදට ගොස් තුන්වරක් සක්පිඹ සකබිමතබා හුන්නේය මනුෂ්‍යයෝ ඒ ශබ්දයඅසා සතර්දිගින් අවුත් මේමිහිරිවූ කණිණරසායනවූ ඇලුම් කටයුතුවූ ශබ්දය කවරනාදයෙක්දැයි විචාළාහුය. ඒ පුරුෂයා මේසං ඛනාදයයිකිය එක්ල්හි අඤ්ඤවූ බාලවූ මනුෂ්‍යයෝ ඒසක උඩුකුරු කොට හොවා සංඛනාද කරවයිකිව්ය නාදනැත මුහුනින්හොවා දකුණැලයෙන් හොවාවමනැලයෙන් හොවා නගාසිටුවා සංඛනාදකරවයි කිය. අතින් පැහැර කැවින් පැහැර සැනින් පැහැර එහාට මෙහාට බිමඇන සොලවා සංඛනාදකරවයි කිව්ය. එකල්හි සක්පිඹිනා පුරුෂයා සිතන්නේ මේ ප්‍රත්‍යන්ත ජනපදවාසී බාලජනයෝ නුදුටුව නින්යෙදී කෙසේ සංඛනාද සොයද්දැයිකියා සසකපිඹ කර චතුරුවා ගෙණ හියේය. එකල්හි මනුෂ්‍යයෝ පුරුෂයාගේ ව්‍යායාමයෙන්හා වායුසහගතව නාද පවත්වන්නේයයි කියා දැනගත්නාහුය. එමෙන් රාජකුඤ්ඤය මේකයද වායු සහගතව උෂ්ණසහගතව විඤ්ඤාණසහගතව යාම් ඊම් ඉදිම් සිටිම් ආදී ඉරියව් පවත්වමින් රූපශබ්දාදි පඤ්ච කාමසම්පත් අනුභවකෙරෙති එබැවින් පරලොවඇතැයිකියා දැනගණුවසි වදාළසේක.

එකල්හි බ්‍රාහ්මණයා කියන්නේ ජීවිතය සොයම්සිතා මරණට සුදුසු වරද ඇති සොරෙකු ගෙණාකල පුරුෂයන්ට මෙසේ කිම් මොහු ගේ සිවිසිඳ ජීවිතය බලවසි කිම් එසේකොටත් ජීවිතය නුදුටුම්හ නැවත සිවිසිඳ බලව මස්සිඳ බලව නහරසිඳ බලව ඇටසිඳ බලව ඇටමුල්සිඳ බලවසි කිම් එසේ බලාත් ජීවිතය නුදුටුමින එබැවින් පරලොව නැතැයි සිතම්කිය. එකල්හි තෙරුන්වහන්සේ වදුරණසේක් මිට උපමාපිණිස පෙරවූ දෙයක් කියම් වනයෙහි වසන්නාවූ අහිකනම් ජටිලයෙක් කිසිකටයුත්තක් පිණිස මනුෂ්‍යපථයට යනුකැමතිව ලද රැකාලයෙහි වලඳමා නිබ්බුමාරයෙකුවඩා ගෙණවුත් පොෂ්‍යය කිරීමෙන්වල වැඩුනාවූදස දෙළොස් වයස් පිරුණාවූ කුමාරයාකැඳවා පුත්‍රය මා එනතෙක් ගිනිපූජාකරව ගින්නිවුනේවීනම් මෙයින් ගිනිඋපදවා ගණුවසියා දරකොටනකැත්තහා ගිනිගාණා දඬුකඩ දෙක ද

ක්වා ගියේය. එකලකෙලඇදිමෙන් ගිනි නිවුනේය ඒකුවාරයා නි නි නිවුනුබවදැක ගිනිඋපදවමිසිනා ගිනි ගානා දඹුකඩඉගණ කැන් ඉතන් සැස්සේය එසේන් ගිනිනොදැක දෙකට පැලිය එසේන් නො දැක තුනට සතරට පහට දසයට පලා එසේන් නොදැක කඩ කඩ කොට කපා වනලා කොටා සුණුවිසුණු කොට සූලඉඟ් ගැරන් ගිනි උපදවා ගත නොහැකිවිය. නැවත අහසික ජටිලයා අවුත් පුත නිනි පූජා කෙලෙනිදැසිවිචාළේය. එකලතමන්කළ කවයුතු සියල්ලම කිය මේලදරුවා නොදන්නා නිසායසි සිතාබලා සිටියදි ගිනිගා මෙසේ ගිනි ඉපදවිය යුතුයසි කියේය. බාලවූ ලදරුවා ගිනිසොයන්ට උත් සාහ කළාසේ නෝත් පරලොව සොයන්ට උත්සාහ කෙළෙහිය නා නේ මේවිපරීත් දෘෂ්ටිය හරු ව මේවිපරීත දෘෂ්ටිය නොහළසේවිනම් නට බොහෝ කලක් මුලුල්ලෙහි අහිතයට දුඃඛයට කාරණාවෙයි ව දැළසේක.

එකල්හි බ්‍රාහමණයා කියන්නේ කාශ්‍යපඅඑවිරයන්වහන්ස පර ලොවනැත කුසල්නැත අකුසල්නැතැයි කියා මම මේ ලාමක දෘෂ්ටි ගත්බව කෙසොල්රජ්ජුරුවන් ඇතුලුවබොහෝ පණ්ඩිතවරු දනිනි මමදැන් මේ දෘෂ්ටිය හැරිසෙම්විනම් පායාසිරාජඤ්ඤයා බාලයාය අ ඥානයෘය අව්‍යක්තයාය මෙතෙක් දවස් වරදවා හැසුරුණේයයි නි ඤ්ඤකෙරෙති ඒනිසාත් නොහරිම් කුබවහන්සේගේ වචනය නාසන නිසාත් කුබවහන්සේහා සමකොට සිතන්නාවූ යුගග්‍රාහය නිසාත් නොහරිමිකිය. එම්බා රාජඤ්ඤය ඊට උපමාවශයෙන් පෙරවූ දෙයක් කියම්.ශාස්තෘවාහකයෝදෙදෙනෙක්ගැල්දහසක්ගෙණ බො හෝවෙලදුන්හා එක්ව වෙළදුම්කොට ඇවිදිනාහු යම් ප්‍රදෙශය කට ගියකල ඒ ප්‍රදෙශයෙහි දරපැන්හා තණකොල ආදිය වහා ම විනාසවන්නේය එබැවින් ගැල් දහසක්ගෙණ එකමග යාම දුශ්කරයසිකියා ගැල් පන්සිය පන්සිය දෙකට බෙදාගෙණ ඔවූ න් අතුරෙන් අඥාන වෙලදනායකතෙම පළමුවෙන් මම යෙමිකියා ගොස් යක්ෂාකිගෘහිතවූ අලපභක්ෂ නිරුදක කන්තාරය ලඟට පැමිණ දිය දර පටවාගෙණ යන්නේය එකල්හි යක්ෂයෙක් මඩවැකුණු රථ චක්‍රඇනි කොටලුවන් යෙදූ රථයා තෙන්හිසකේහා තෙත්පිළිඇනි වේදවෙසක් මවාගෙණ නෙලුඹුදැලි කකා ඉදිරියට අවුත් මාගීයායෙහි වැසිවැස ඇලකදුරු පිරීමඩගෝරු බොහෝ බවකියා දිය දරදම්මවා අන්තර්ධානවිය එබසට දියදර දමා වාලුකාකන්තාරයට පැමිණ පළමු වෙනි ශාස්තෘවාහයෙහි දියදර නොදැක දියදර ඇතිතැනට යම්හයිකි යා වහවහා ගොස් දෙවන තුන්වන සතරවනපස්වන සවන සත්වන

ශාස්තෘවාහනයට පැමිණ දියදර නොදූක ඒ ඒතැන වැටී හුන්නාහුය. එකල්හි යක්ෂයෝ අවුත් ගොන්හා මිනිසුන්ගේ ශරීරමාංස භක්ෂණය කොට ඇටපමණක් දමාගියාහුය. ඉක්බිති අනිත්වෙළඳුනෝද එසේ ම වාලුකාකන්තාරය ඍජුමාර්ගයට පැමිණි කල යක්ෂයා පෙරසේම අවුත් දියදර දමන්ටකිය එකල්හි නුවනැති වෙළඳ නායකයා ඔහුගේ ලක්ෂණයෙන්ම යක්ෂයාබවදැන සියලු මිනිසුන් රැස්කොට පෙර මේ කන්තාරයෙහි දියදරඇතැයිකියා ඇසුවෝ ඇද්දැයි විචාරා නැතැයි කී කල එසේවිනම් දියදුටු කලමුන් එකදියබිඳුවක්වත් නොදමන්වයි කියා අවවාදකොට පළමුනිය වෙළඳුන් මලනැන් සොයන්ට යම්හයි කියා වහවහාමගොස් ඇටකටුහා බඩුපිරූ ගැල්පමණක් දූක විශේෂ පන්ව පරණගැල්හා අගය අඩුවසතුදමා අලුත්ගැල්හා මාරුකිවසතුගෙණ සුවසේ වෙළඳම්කොට කම්වූපරිද්දෙන් පරලොව ගියේය. එම්බා රාජඍෂිය තෝ දරදිය දමා ගිය වාලුකාකන්තාරයට පැමිණි වෙළඳුන්හා විනාසයට පැමිණි වෙළඳනායකයාට උපමාකොට සිතම් මේ සංසාර නැමති කන්තාරයට පැමිණ කුසල්නැමති මාණික්‍යාපකරණ දමා තවත් තාගේ පිරිවරජනයාටත් අහිතයට දුඃඛයට කාරණවෙයි තාගේ විපරීතදෘෂ්ටිය හරුවයි වදළසේක.

එබසටත් පෙරසේම නොහරිමිසිකිය. එකල්හි ඊට උපමාපිණිස මහතෙරුන්වහන්සේ වදාරණසේක් එම්බා රාජඍෂිය මම පෙරවූ දෙයක් කියමි. රන් පොෂ්‍යය කරණපුරුෂයෙක් කිසිකටයුකත්ත් පිණිස දුරතැනකට ගොස් යන්නේ අතරමග වියලිතුබූ අසුචි ගොඩක් දූක ඌරන්ට දෙන්ට ගෙණයෙමි සිතා උතුරුසලුවේ පොදි බැඳ ඉසතබාගෙණ යනකල මහත් වැස්සකින් තෙම් ඉසපටන් දෙපය කෙලවරකොට අසුචි වැහෙන්ට වන ඒ දූක මනුෂ්‍යයෝ කිමෙක්ද තෝ උතුයෙහිද අසුචිපොදිය දමවයි කීවාහුය එබස්අසා තොපි උතුවන්නාහුවෙති මම ඌරන්ටගෙණයෙමිකියා ඉස තබාගෙණ ගියේය. එම්බා රාජඍෂිය තෝත් සූකරපොෂකයාට උපමාකොට සිතම් අසුචිපොදියවැනිවූ තාගේ විපරීතදෘෂ්ටිය හරුවයි වදළසේක.

එකල්හි බ්‍රාහ්මණයා කියන්නේ වහන්ස මම මේ දෘෂ්ටියගත්බව කොසොල් රජ්ජුරුවන් ඇතුළුවූ බොහෝ දෙනාදන්නා හෙයින්ද නුබවහන්සේගේ වචනය නාසනනිසාද නුබහාසමකොට සිතන්නාවූ යුගග්‍රාහය නිසාද මේලාමකවූ විපරීත දෘෂ්ටිය නොහරිමිකිය. එකල්හි තෙරුන්වහන්සේ වදාරණසේක් එම්බාරාජඍෂිය මම උපමාවක් කියම් පෙර අඤ්ඤතීර්ථයෝ දෙදෙනෙක් බොහෝසේම දූකෙලනාහුය. ඔවුන් අතුරෙන් එකෙක් පරාජයවනබව දූන පසඇටගිලිනේය ඒ

දුතීයාමෙන් අනය ව්‍යසනයට පැමිණ සසරදුකින් ගැලවිය නොහැක්ක තාවිසින් ගන්නාලද ලාමක දෘෂ්ටිය හරුවයි වදාළසේක. එබසට ත් පෙරසේම නොහරිමිසිකිය. එකල්හි තෙරුන්වහන්සේ වදාරණසේක් එම්බාරාජසුඳුය මම උපමාවක් කියම් උපමාවෙහුත් නුවනැත්නාහු කියනලද වචනයාගේ අර්ථය දන්නාහුයයි වදාරා රාජසුඳුය මම පෙරවූදෙයක් කියම් මනුෂ්‍යයෝ එක්තරා දනව්වක් හැරගියාහුය එසමයෙහි යහලුවෝ දෙදෙනෙක් මිනිසුන් හැරගිය ජනපදයෙහි කිසියම් වස්තුවක් දමාතුබුසේවීනම් එයගෙණඑන්ටයම්හසි-කියාගොස් එක්තරා ගමෙක්හි දමනලද හනවැහැරි ගොඩක්දැක හන්මිටිදෙකක් බරට බැඳගෙණ එන්නාහු අනික්ගමකට පැමිණ එතැන්හි දමනලද හනනූල් දැක ඔවුන් අතුරෙන් නුවනැති යහලුවා කියන්නේ මේහනවැහැරිගෙණගොස් නූල්කරන්ට වුවමැණව එබැවින් මේහන අසුඹුනීයාමෙන් අනය ව්‍යසනයට පැමිණ සසරදුකින් ගැලවියනොහැක්ක තාවිසින් ගන්නාලද ලාමක දෘෂ්ටියහරුවයි වදාළසේක. එබසටත්පෙරසේම නොහරිමිසිකිය. එකල්හිතෙරුන්වහන්සේ වදාරණසේක් එම්බා රාජසුඳුය මම උපමාවක්කියම් උපමාවෙහුත් නුවනැත්නාහුකියනලද වචනයාගේ අර්ථය දන්නාහුයයි වදාරා රාජසුඳුය මම පෙරවූදෙයක් කියම් මනුෂ්‍යයෝ එක්තරා දනව්වක්හැර ගියාහුය එසමයෙහි යහලුවෝ දෙදෙනෙක් මිනිසුන් හැරගිය ජනපදයෙහි කිසියම් වස්තුවක් දමාතුබුසේවීනම් ඒ ගෙණඑන්ට සමිහසිකියා ගොස් එක්තරා ගමෙක්හි දමනලද හනවැහැරි ගොඩක් දැක හනමිටි දෙකක් බරට බැඳගෙණ එන්නාහු අනික් ගමකට පැමිණ එතැන්හි දමනලද හනනූල්දැක ඔවුන් අතුරෙන් නුවනැති යහලුවා කියන්නේ මේහනවැහැරි නෙණගොස් නූල්කරන්ට වුවමැණව එබැවින් මේහනබව දැක අනික් අසුඹුනීයා පසඇට නොගලුවයි කිය ඔහුදෙවෙනිවත් එපාකියාදීම පසඇටගිලිනේය: එකල්හි අනික්පුරුෂයා එක්දවසක් විෂයොදා පසඇට දැමිය එදවස්හිද පෙරසේම පරාජයවනබවදැන එසටැගිල කාලක්‍රියාකළේය. එම්බාරාජසුඳුය තෝද තාගේමේවිපරීත දෘෂ්ටිය නොහැරිසේවීනම් පසඇටගිල නැසුනු අසුඹුනීයාමෙන්අනයව්‍යසනයට පැමිණ සසරදුකින් ගැලවියනොහැක්ක තාවිසින් ගන්නාලද ලාමක දෘෂ්ටිය හරුවයයි වදාළසේක. එබසටත් පෙරසේම නොහරිමිසිකිය. එකල්හි තෙරුන්වහන්සේ වදාරණසේක් එම්බාරාජසුඳුය මම උපමාවක්කියම් උපමාවෙනුත්නුවනැත්නාහු කියනලද වචනයාගේ අර්ථයදන්නාහුයයි වදාරා රාජසුඳුය මම පෙරවූදෙයක් කියම් මනුෂ්‍යයෝ එක්තරා දනව්වක්හැරගියාහුය එසමයෙහි යහලුවෝ දෙදෙනෙක් මිනිසුන්හැර

පය ජනපදයෙහි කිසියම් වැතුවක් දවාතුබුයේවිනම් ඒ ගෙණ එන්
ට සමහයිකියා නෙස් එක්තරා ගමෙක්හි දමනලද හනවැහැරිගො
ඩක්දූක හනම්පි දෙක්ක් බරට බැඳගෙණ එන්නාහු අනික්ගමකට
පැමිණ එතැන්හි දමනලද හනනුල්දූක ඔවුන් අතුරෙන් නුවනැති
යහලුවා කියන්නේ මේහනවැහැරිනෙණගොස් නුල්කරන්ට වුවමැ
ණව එබැවින් මේහනම්පි දමා හනනුල් ගෙනයම්හයිකීය. එකල්හි
අනික්යහලුවා කියන්නේ මේ හනම්පියම මෙනාකොටබැඳ දුරසිට
ගෙණ එනලද්දේය එබැවින් මම නොදමන්නෙමි නොගණුවයි කීය.
එකල්හි ඒනුවනැති යහලුවා හනවැහැරි මිටිය දමා හනනුල් බරක්
බැඳගත්තේය. ඔහුදෙදෙනම එක්වයන්නාහු අනික්ගමකට පැමිණ
දමනලද හනපිළිගොඩක් දූක ඒ නුවනැති යහලුවා කියන්නේ ය
හලුන් හනබරදමව මම හනනුල් දමමි අපිදෙදෙන හනපිළිගෙණ
යම්හයිකීය එකල්නිද අහුන යහලුවා මම මේහනම්පිය මනාකොට
බැඳගෙණ දුරසිටනෙණෙන ලද්දේය එබැවින් නොදමමිකීයනුව
නැතියහලුවා නුල්දමා හනපිළිබරක්බැඳගත්තේය මෙමක්‍රමයෙන්
ඔහුදෙදෙන එක්වයන්නාහු අනිත් ගමකට පැමිණ එතැන්හි දමන
ලද ඤෝමවැහැරිදූක නුවනැති යහලුවා පෙරසේමකියා හනපිළිද
මා ඤෝමවැහැරිනත්තේය මෙම ක්‍රමයෙන් ඤෝමවැහැරිදමා ඤෝ
ම නුල් ගත්තේය ඤෝමනුල්දමා ඤෝමපිළිගත්තේය. ඤෝමපිළි
දමා කපුඤ්ඤත්තේය කපුදමා කපුනුල්ද එමනුල්දමා කපු පිළිගත්තේ
ය කපුපිළිදමා කලුලොහෝගත්තේය කලුලොහෝදමා තඹලොහෝ
ද තඹලොහෝදමා කලුඊයන්ද කලුඊයන්දමා සුදුඊයන්ද සුදුඊයන්
දමා සුදුරිදිගත්තේය. අනික් පුරුෂයා හනම්පියම හෙණයන්නේය.
මෙසේ දෙදෙන එක්වයන්නාහුද මසුරන් ගොඩක්දූක නුවනැති ය
හලුවා කියන්නේ යහලුව තෝහනම්පියදමව මමසුරුරිදිබරදමමි අපි
දෙදෙන මසුරන් ඉදබරක් ගෙණයම්හයි කීය. එබසටත් නුවණනැ
ති යහලුකියන්නේ මම මේහන බර මනාකොටබැඳ දුරසිටනෙණෙන
ලද්දේය නොදමමි නොගණුවයිකීය. එකල්හි නුවනැති පුරුෂයා රි
දිබරදමා මසුරන් බරක් බැඳගෙණ ගමටගියේය. ඔහුගේ මවුපියන්
හා අඹුදරුවෝද විශෙෂයෙන්ම සතුටුවුවාහුය බොහෝවසතුවන් ල
ද්දේය. මසුරන් නොගෙණ හනම්පිය පමණක් ගෙණගිය පුරුෂයා
ගේ මවුපියන්හා අඹුදරුවෝද නොසතුටුව දොම්නස්වුවාහුවසතුවෙ
නුත් පිරිහුනාහුය–

එම්බා රාජසූදය නෝද බ්‍රහ්මරතනය ධම්මරතනය සංඝරත්නය
යන ත්‍රිවිධරත්නයෙන් උපසොහිතවූ මේ මගුල්සක්වල ඉපිද දැනගී
ලාදිවෘත්‍තයන් කුසලකම්යක් නොකොට පරලොවනැත කුසල්නැත

වුනිවිත්තායෙන් මත්තෙනිඋපදනාසංඛයන් නැත්තේයසිකියා ලාවක වූ විපරීතදෘෂ්ටියගෙණ තාගේ සුහිමිත්‍රයන්හා පිරිවරජනයන්ද අඹුදරුවන් ඇතුලුවතාආශ්‍රයකළාවූ බොහෝදෙනාත් සතරඅපායාදියට පමුණුවා බොහෝකාලයක් මුලුල්ලෙහි සසර දුක්විඳුවා තෝත්තරකාදි සතරඅපායට පැමිණ අනය ව්‍යසනයට පැමිණෙන්නෙහිය එබැවින් එම්බාරාජසුඳුය තෝත් හණගෙණගිය පුරුෂයාට උපමාකොට සිතමි තාගේ මේලාවහාවූ විපරීත දෘෂ්ටිය හරුව තට දීඝීකාලය ක්මුලුල්ලෙහි අහිතයට දුඃඛයට කාරණවෙයි වදාළසේක.

එකල්හිබ්‍රාහ්මණයා කියන්නේ ස්වාමිනි භුබවහන්සේ පළමුකොට වදාළඋපමාවෙන්ම පරලෝව ඇතිබව දැනගනිමි එතකුදුවුවත් භුබවහන්සේගෙන් විසිතුරු ප්‍රශ්නයක් අසනුකැමතිව මෙතෙක්කාරණාකිමි සමසක් මන්මූලා එකක්හු අතඅල්වාගෙණ මේමඝසවයිකියා මගපැවැත්වෙන් භුබවහන්සේගේ ධර්මදෙශනාව ඉතාසහපත්වන්නේයැයි කියා ප්‍රසංසාකොට අදපටන් තුණුරුවන් සරණයෙමිකියා සරණගොස් කියන්නේ සාමිනි අදපටන් මහදන් පවත්වනු කැමැත්තෙමි මට අනුශාසනාකරවදාළමැණවැයිකිය එකල්හි තෙරුන්වහන්සේ එම්බා රාජසුඳුය යම්ලෙසකින් ප්‍රාණඝාතාදී පවුෂනා ෂ්‍රේනම් එලෙසින් දන්දෙවයි වදාළසේක. එතැන්පටන් ශ්‍රාවණබ්‍රාහ්මණයන්වහා දුර්මිගීයාවිඝයන් දන්දෙන්නේ පෙරදන්දී පුරුදුවත් නැතිඉහයින් කැදහා කාඩිඇඹුලදෙවනිකොට න්වුඩුසාලේ බන්දෙයි දළපිළිහා මහත් දහඇහි පිළිදෙයි මෙසේසකස්නොකොට දන්දී වාතුම්හාරාජික දිව්‍යලොකයෙහි හිනවූදිව්‍යනිකායෙක උපන්නේය.

ඒ දැන විධානය කරන්නාවූ උත්තරනම් මානවකයෙක් ඇන්තේය. ඒ උත්තරනම් මාණවකයා එක්දවසක් දන්දී මේපායාසි රාජසුඳුයන්හා මේජාතියෙහි එක්වූ පමණක්නිනා මතු එක්නොවම් ගසි කියා පැතුයේය. බ්‍රාහ්මණයා එපවත් අසා ඔහුගෙන්වා සැබෑදැයි කියා විමාළේය. එකල්හි භුබවහන්සේ සකස්නොකොට දමාපිය න දෙයක්සේ සවල්පදෙය දන්දී මතුත් සවල්පදේම ලබනසේක එකල්හි භුබඵක්ව උපනඉහත් අපටත් සවල්පදෙයක්ම ලැබෙයි එබැඟින් භුබහා එක්නොවම්ගසිකියා ප්‍රාර්ථනාකෙළෙමිකිය. එකල්හි බ්‍රාහ්මණයා කියන්නේ අපිපරිභොගකරණ පරිද්දෙන් දන්දෙවයිකිය. එතැන්පටන් ඒ උත්තරමාණවකයා දැනය පැවැත්වීමෙහි ව්‍යාවෘතව සකස්කොට දන්දී නවීසියා දිව්‍යලොකයෙහි දෙලොස්යොදුන් රන්විමනෙක උපන්නේය. ඉක්බිති ඒදිව්‍යපුත්‍රතෙම දිව්‍යසම්පත් ලැබීමට කාරණ,නවරේදැයි පරීක්ෂාකොට කුමාරකාශ්‍යපස්ථවිරය

නිමහන්සේගෙන් බණඅසා දානශීලාදි වසයෙන් කුසල්කොට අවුත් උපන්බවදැන කළඋපකාරය සලකමින් විමානයහාසඑග තෙරුන්වහන්සේකරා එලැඹ විමානයෙන් බැස පාහපිහිටුවාවැඳ දෙහොත්මු දුන්දි එකත්පස්ව සිටියේය. එකල්හි තෙරුන්වහන්සේ ඒ දිව්‍යපුත්‍රයාදැක මෙසේවිචාළසේක.

"සා දෙවරාජස්ස සභා සුධම්මා
යත්ථච්ඡසි දෙවසංඝෝ සමාගතා,
තත්‍රූපමං තුයහමිදං විමානං
ඔභාසයං තිට්ඨති අනඝාලිකෙබ."

යනුහෙයින් එම්බා දිව්‍යපුත්‍රය තව්තිසාවැසි දෙවියන් රැස්වහිඳි නාවූ සක්දෙව් මහරජහුගේ සුධම්මානම් දිව්‍යසභාවමෙන් තාගේ මේදිව්‍යප්‍රාසාදයආකාශයෙහි දිපතිමත්ව බබලන්නේය තෝද දෙදෙවිලොව දෙවියන් පිරිවරා බබලන්නාවූ ශක්‍රයාමෙනැයි සිතම් මේ බදුසැපතක් ලැබිමට කළාවූ කුශලය කවරේදැයි විමාරාවදුළසේක. එකල්හි ඒ කුශලකර්මය ප්‍රකාශකොට දක්වන්නාවූ දිව්‍යපුත්‍රතෙම් මෙසේකීයේය.

"අහං මනුස්සෙසු මනුස්සභූතෝ
පායාසිරාජඤ්ඤසුදස්ස අහොසිං මාණවෝ,
ලබ්භා ධනං සංවිභාගං අකාසිං
පියාව මෙ සීලවතෙහා අහෙසුං.
අනන්නපානම්හි පසන්නචිත්තෝ
සක්කච්චං දානං අදාසිං අදාසිං."

යනුහෙයින් යටගිය දවස මිනිස්ලොව වසනසමයෙහි පායාසි රාජඤ්ඤනම් බ්‍රාහ්මණයාගේ කාසඤ්ඤාසියෙහි දසඅවු උත්තරනම් මානවකයෙන්විමි. එසමයෙහි දන්දීමෙහි සතුටුසින් ඇතිව කර්මඵල අදහමින් මාලන්දෙය මම අනුභවනොකොට සම්‍යදෘෂ්ටියෙන් සැපිසහ ස්කොට දන්දුනිමි යහපත්කොට ශීලයද රක්ෂාකළෙමි ඒ පායාසිරා ජඤ්ඤයාගේ දානයද අනුන්ගේ දානයයි නොසිතා මාගේ දානයක් මෙන් සතුටුසින් ඇතිව සකස්කොට දන්දුනිමි ඒ කුශල කර්මයහෙතු කොටගෙණ මේදිවඉපුරු ලද්‍රිද්ධියා ප්‍රසංසාකොට මහතෙරුන්වහන්සේවැඳ අවසරගෙණ දෙව්ලොවටම ගියේය.

මේවිමානවත්ථු ඝ්‍රඝාරණෙහි සුනිකිත්තනවර්ණනයෙහි
දානඵලවිමානවත්ථුව නිමිවණලදි.

නවද මෙම්හි විමානවත්ථු ප්‍රකරණයයි සුනියමිච්ඡාවගීහයෙහි ඒනි ඝඅම්බඛිමිාතවත්ථුවහම කවරහත්?

අපරණ සරණ්‍ය භාග්‍යවත් බුදුරජාණන්වහන්සේ එක්සමයෙ ක රජගහනුවර වෙලුවනාරාමයෙහි වැඩවසනසේක. එසමයෙහි ර ජගහනුවර එක් දරා දුප්පත් පුරුෂයෙක් බැලමෙහෙ පිණිස අනුන් ගෙන් බත් වැටුප්ගෙණ උන්සාත්තයා අඹඵයනක් රක්‍ෂාකෙරෙයි. එක්දවසක් ග්‍රීෂ්මඍතුයෙහි තදඅව්වෙන් උණුවූ සුදුවැල්ලෙන් ගැව සිගත්නාවූ ඒ ඒ අත විශතීක්ෂ්ණවූ ඕරිතුජලයෙන්යුත් භූමිභාගඇති දුරමගට පැමිණ සෙදයෙන්යුත් ශරීරඇතිව ග්‍රීෂ්මයෙන් කලාන්තව අඹඵයන සවම්පයෙන් වඩනා සැරියුත් මහතෙරුන්වහන්සේ දැක උන්වහන්සේ කරාඵලැබ නමස්කාරකොට සවාමිනි ග්‍රීෂ්මකාලය ඉ තා දුඛිටෙයි සවාමීන්වහන්සේගේ ශරීරයත් බලවත්වූ උෂ්ණයෙන් කලාහතවූයේ දක්නාලැබෙයි සවාමීනි මාකෙරෙහි අනුකම්පාවෙන් මේ අඹඵයනට ටැඩ මදකලක් මේසෙවනේ වැඩහිඳ මාගිහිඩා සන් සිඳුවා වැඩියමැණවැයි ආරාධනා කෙළේය. එකල මහතෙරුන්වහ න්සේ ඔහු තිගෙෂයෙන් ප්‍රසන්නා වූ බවදැක ඔහුගේ සිතටහත් ප්‍රස නනතාව මතුමත්තෙහි වඩාවැඩෙහි සොදනුකැමතිව අඹවනයට වැ ඩ එක්තරා අඹගහක්මුල වැඩහුන්සේක. එකල්හි ඒ පුරුෂතෙම කියන්නේ සවාමිනි පැන්නහනුකැමැතිසේක් වීනම් මේලිදෙන් පැ න්ගෙණපිළිගන්වා නහවම්හිය තෙරුන්වහන්සේ මුවෙන්නොබැ ණ ඉවසුසේක. ඒ පුරුෂතෙම ලිදෙන් පැන්ගෙණ පෙරා තෙරුන්ව හන්සේ නැහැවූයේය, පැන්නහවා ඉක්බිති හැකපෑද ඩොවනකොට වැඩහුන් තෙරුන්වහන්සේට බොනපැන්පිළිගැන්වීය. පන්වළඳ ඉක්බිති සන් සිඳුනලද කායපරිළාහඇති මහතෙරුන්වහන්සේපැ න්නහවාවූ කුසලයන් පැන්වළඳවාපුකුශලයත් දක්වා උදානදනානු මොදනාවෙන් බණවදාරා ඔහු සතුටුකරවා වැඩසන්න. එකල්හි ඒපු රුෂතෙම ශ්‍රීෂ්මන්නේ එකාන්තයෙන්ම ග්‍රීෂ්මයෙන් විඩාවූ තෙරුන් වහන්සේගේ ග්‍රීෂ්මවිනාසිදවා උපකාරකෙළෙමියි සතුටුව එකාන්ත යෙන් මාවිසින් බොහෝකුසල් රැස්කරණලද්දේයයි කියා උදාරවූ ප්‍රී තිසොම්නස් උපදවා කුසලය සිතතබාගත්තේය. ඒ පුරුෂතෙම එයි න් අපරභාගයෙහි කාලක්‍රියාකොට තාවතිසා දිව්‍යලෝකයෙහි උපන් න්නේය. එසමයෙහි ආයුෂ්මත් මුගලන් මහතෙරුන්වහන්සේ ඉදි වවාරිකාවෙන් වඩනාසේක් ඒ දිව්‍යපුත්‍රයාදැක ඔහුවිසින් කරණලද කුශලඊය විචාරණු කැමතිව මෙසේ විවාලසේක.

"උච්චම්දං මණිථූනං විමානං
සමන්තතෝ ද්වාදසයොජනානි,

කූටාගාරා සන්තාසනා උළාරා
වෙලුරියත්ථම්භා රුචකත්ථතා සුභා.

තත්ථච්ඡසි පිවසි ඛාදසි ච
දිබ්බාව විණා පවදන්ති වග්ගු,

දිබ්බා රසා කාමගුණේත්ථ පඤ්ච
නාරියෝ නච්චන්ති සුවණ්ණවජ්ජත්තා."

යනාදීන් යටකියනලද ක්‍රමයෙන් ඔහුගේ දිව්‍යසම්පත් වර්ණනා කොට මෙබඳු සම්පත් ලැබීමට කළාවූ කුශලය කවරේදැයි විචාරා වදාළසේක. එකල්හි ඒ කුශලකර්මය ප්‍රකාශකොට දක්වන්නාවූ දිව්‍ය පුත්‍රයෙම මෙසේ කියේය.

"හිමහානං පච්ඡිමේ මාසෙ පතපන්තෙ දිවාකරෙ,
පරෙසං භතකෝ පොසෝ අම්බරාමම්හි සිඤ්චති.

අථ තෙන අගමා භික්ඛු සාරිපුත්තොති විස්සුතෝ,
කිලන්තරූපා කායෙන අකිලතෙනා ච චෙතසා.

තඤ්ච දිස්වාන ආයන්තං අවොමාහං අබ්භසිඤ්චකෝ,
සාධුතං භන්තෙ නහාපෙය්‍ය ධම්මස්ස සුඛාවහං.

තස්ස මෙ අනුකම්පාය නික්කිපි පත්තඤ්චරං,
නිසීදි රුක්ඛමූලස්මිං ඣායාය එකචිවරෝ."

යනුවෙනසින් යටනියදවස බැලමෙහෙකොට රැකෙන්නාවූ එක්නරා දුක්පතෙක්මේ එසමයෙහි ග්‍රීෂ්මඍතුයෙහි පසළුවූ ඇස ළමසඉරැරැස් බලවත්හෙයින් බත්වැටුප්ගෙණ අනුන්ගේ අඹ උයනක් රකිමින් අඹගස්මුල පැන්වත්කෙරෙමින් ඒ ආරාමයෙහි සිටියෙම්-එසමයෙහි ආයුෂ්මාන්හු ඇණයෙන් කෙළෙසුන් නැසුහෙයින් කලාහනනොවන්නාවූ සිත්ඇති සැරියුත් මහ තෙරුන්වහන්සේ ශරීරයපමණක් ග්‍රීෂ්මඍතුයෙන් කලාහනාට ඒ ආරාමය සම්පයට වැඩිසේක එකල්මම උන්වහන්සේදැක නමස්කාරකොට අඹගස්මුලවඩාහිඳුවා පැන්නාවදාළවැණවයිකියා ආරාධනාකෙළෙම් එකල්හි මහතෙරුන්වහන්සේ මාකෙරෙහි අනුකම්පාවෙන් පාසිවුරුතබා එකසිවුරකින් යුත්තාව වැඩසිටිසේක. එකල්හි ලිදෙන් පැන්ගෙණ නහවාපැන්වළදවා සතුටුසිත්ඇතිව උපකාර කෙළෙම්. කියා ඉක්බිති මෙප

ණක්විනා අනික් කුසලයක් ඒ ජාතියෙහි නොකළබව පැහැදිනපියෝ සමෙස්නිමියේය.

"අමෙඛාවසිතෙනා භූමණ්ඩනහාසෝ
මයාවපුඤ්ඤං පසුතං අනපපකං.

ඉතිසොපීතිවාකාය සබබං අපරිවත්තතෙනා,
තදෙවඑත්තකං කම්මං අකාසිංතායජාතියා.

පහාය මානුසං දෙහං උපපෙනාමහිනන්දනං,
නන්දනෙපවනෙරම්මෙ නානාදිජගණායුතෙ.
රමාමිනච්චගීතෙහි අච්ඡරානිපුරක්ඛතොති."

යනුගෙයින් සවාමිනි ඒජාතියෙහි මාවිසින් අඹහස්මුල පැන්වීත්කරණලද්දේය. තෙරුන්වහන්සේ පැන්නහවන ලද්දේය. මහත් කුසලයකුත් රැස්කරණලද්දේය. එබැවින් ඒ තෙරුන්වහන්සේට කල උපකාරය පමණක් විනා ඒ ජාතියෙහි අනික්කුසලයක් මාවිසින් නොකරණලද්දේය. එපවණ කුසලය හෙතුකොටගෙන මෙදිව්‍යලෝකයෙහි ඉපිද නන්දනෝද්‍යානයෙහි නානාතූර්‍යාදිවශයෙන් ක්‍රීඩාකෙරෙමින් උදුරවූදිව ඉසුරුලැබ පඤ්චකාමසම්පත් අනුභවකෙරම්කියේය. එකල්හි මහතෙරුන්වහන්සේ ඕනට විසාරවශයෙන් බණවදාරා මිණිස්ලොවට වැඩ බුදුන්ට එපවත් දැන්වූසේක. බුදුරජානන්වහන්සේඑම අර්හත්ඵලනිකොටගෙණ සම්ප්‍රාප්තපිරිසට බණවදාළසේක ඒ ධම්දෙශනාව බොහෝදෙනාට සාර්ථකවිය-

මේ විමානවත්ථුප්පකරණයෙහි සුනික්ඛිත්තවග්ගයෙහි
තිතීය අඹබවිමානවණ්ණනාවකිසා නිමවනලදී.

තවද මේවිමානවත්ථුප්පකරණයෙහි සුනික්ඛිත්තවග්ගයෙහි **ගෝපාලවිමානවෘත්තුවනම්** කවරයත්?

සකලගුණනිධානවූ භාග්‍යවත් බුදුරජානන්වහන්සේ එක්සමයෙක රජගහනුවර වැඩවසන්සේක එසමයෙහි රජගහනුවර වසන්නාවූ එක්තරා ගවපාළයෙක් ගවයන් රක්නාපිණිස යන්නේ උදෑසන්ම පිණ්ඩ යවසාලින් කරණලද කොමුආහාරයක් ජේණිණවූ කිළුටුවස්ත්‍රයකබැඳගෙණ කල්යමා අනුභවකෙරෙමිනිතා නුවරින් නික්ම ගවයන් හැසිරන්නාවූ ගොදුරු බිමට පැමිණියේය. එසමයෙහි ආයුෂ්මන්වූ මුගලන්මහතෙරුන්වහන්සේ ඒ ගවපාළයාදැක් සිතාවදාරණසේක් මේගවපාලයාදැන් කාලක්‍රියාකෙරෙයි එතැනදුවුවත් මට

සකොමුආහරයක් දැන්දී හව්නිසා දෙව්ලොව උපදනානයිකියා දැන ඕ
හුසව්සට වැඩිසේක. එකල්හි ඒ ගවපාලතෙම කල්වේලාබලා තෙරු
න්වහන්සේට සකොමුආහාරයක් දන්දෙනුකැමතිවිය එසමයෙහි ගව
යෝ අනුන්ගේ උදුකෙතකට වදනානුය. ඒබව දැක ගොපලුතෙම
සිතන්නේ කිමෙක්ද පළමුකොට මේතෙරුන්වහන්සේට කොමුද
න්දෙමිද නොහොත් ගවයන් උදුකෙතෙන් පිටත්කෙරෙමිදැයිසිතූ
සේය එකල්හි ඕනට මෙබදුසිතෝක් පහළවිය උදුකෙතෙහි මියෝ ම
වයමක්කරණු කැමැත්නානුනම් ඒඋන්ට මනාපදෙසක් කෙරෙන්ව
සි තෙරුන්වහන්සේ වැඩියසේක්වීනම් මාගේ මේකොමුදුනයට අ
නුතරාවෙයි පළමුකොට මේතෙරුන්වහන්සේටකොමුපූජාකෙළෙම්
නම් ඉතායහෙකැයිසිතා තෙරුන්වහන්සේට කොමුආහාර පිළිගැ
න්විය උන්වහන්සේද ඔහුතෙරෙහි අනුකම්පායෙන් පිළිගන්සේක.
ඉක්බිති ගවයන් නවතනපිණිස උවදුරුනොබලා දිවන්නාවූ ගවපා
ලයා පයවැදීමෙන් කිපෙනලද නාගයෙක් දෂ්ටකෙළේය. තෙරුන්
වහන්සේ ඔහුකෙරෙහි අනුකම්පායෙන් කොමුවළඳන්ට පටන්ගත්
සක ගවපාලතෙම ගවයන් නවතා කෙතින් පිටතුකොට ආයේ
කොමුවළඳන තෙරුන්වහන්සේදැක උදුරවූ ප්‍රීතිසොම්නස් පිළිලබ
මින් හුන්නේය. එකෙණෙහිම ඔහුගේ සකලශරීරයට විෂව්‍යාප්තව
මොහොතකින් නිසමුදුනට පැමිණිකල්හි කාලක්‍රියාකොට නවුතිනා
දෙව්ලොව දෙලොස්යොදුන් රන්විමනෙහි උපන්නේය. එසමයෙහි
ආයුෂමත් මුගලන් මහතෙරුන්වහන්සේ සටකියනලදඍද්ධිබලයෙන්ද
චාරිකාවෙන් වඩනාසේක් ඒදිව්‍යපුත්‍රයා දැක මේගාථාවලින් විමාන
වදුළසේක.

"අලංකතෙ බාලාහාරී සුවත්ථේ,
සාකුණ්ඩලී කඤ්චිතකෙසමස්සු,
ආමුත්තහත්ථා හරණේයසඤ්ඤී
දිබ්බෙ විමානම්හි යථාපි චන්දිමා.

දිබ්බාචවීණාපවදන්තිවග්ගු
අට්ඨට්ඨකාසිකිතාසාධුරූපා,
දිබ්බාචකඤ්ඤා නිදසවරා උළාරා
නච්චන්ති ගායන්ති පමොදයන්ති."

යනුවෙසින් එම්බා දිව්‍යපුත්‍රය අන්දන් තබනලද දැළිරිවුලු ඇ
තිව වස්ත්‍රාභරණ මාලාදියෙන්ගා හස්තාභරණාදියෙන්ද අනෙකප්‍ර
කාර දිව්‍යාලඞ්කාරයෙන් සැරසි මේ දිව්‍යවිමානයෙහි බබලන්නාවූ
තෝ යම්සේ චන්ද්‍රයා තාරකාවන් පිරිවරා ශරීරාලෝකයෙන් අසදිශ්

එකාලෝක කෙරේද එමෙන් මේ දෙවිපිරිස් පිරිවරා ශරීරාලෝකයෙන් දසදිග් එකාලෝක කෙරෙමින් දීප්තිමත්ව බබලන්නෙහිය. තවද සිව්සැටක් පමණ සත්‍රීඅලංකාරයෙන් සැරසුනාවූ නොයෙක් දහස්ගණන් දිව්‍යාඞ්ගනාවෝ නටමින් ගායනා කෙරෙමින් හොපසතුටු කරවන්නාහුය. එම්බා දිව්‍යපුත්‍රය නෝ මෙබඳු දිව්‍යසුරක් ලැබිටට කළාවූ කුශලය කවරේදැයි විචාරාවදාළසේක. එකල්හි එප්‍රශ්නය විසඳන්නාවූ දිව්‍යපුත්‍රතෙම මෙසේ කියේය.

අහං මනුස්සෙසු මනුස්සභූතෝ
සංගම්මරඤ්ඤං පරෙසං ධෙනුයෝ,
තතෝ ච ආගා සමණෝ මමන්තිකේ
ගාවෝ ච මාසෙ අගමංසු ඛාදිතුං.

මයඤ්ඤකිච්චං උභයඤ්ඤ කාරියං
ඉධෙවහං හනෙන තදා විචින්තයිං
තතොව සඤ්ඤං පරිලබ්භ යොනිසෝ
තදුපි හනෙන ඛිපිං අනන්තකං.

සෝ මාසකෙඛ්‍යනං තුරිතං අවිංසරිං
පුරා සයං භුඤ්ජති යඤ්ඤිදං ධිනං
තතොව කණ්හා උරගෝ මහාවිසා
අඩංසි පාදෙ තුරිතස්ස මෙස තෝ.

සොහං අට්ටොමහි දුඛෙන පීළිතෝ
භික්ඛුව මායං භුඤ්ජිත්වා අනන්තකං;
අදාසි කුටමාසං මමානුකම්පයා
තතෝ චුතෝ කාලකතොම්හි දෙවතා.

තදෙවකම්මං කුසලං කතං මයා
සුඛඤ්ච කම්මං අනුභොමි අත්තනා
තයාහි භනෙන අනුකම්පිතෝ භුසං
කතඤ්ඤුතාය අභිවාදයාමි තං."

යනුහෙයින් සවාමිනි යටගියදවස මිනිස්ලොව වසන සවයෙහි අනුන්ගේ ගවයන් රක්‍ෂාකරණ ගවපාලයෙක්වීමි එසමයෙහි කොමු ආහාරයක් කිඵටුවස්තුයෙක බැඳගෙණ ගවයන් රක්නා පිණිස මහා දුරුවීමට ගොස් ගවයන් එක්කොට රක්‍ෂාකෙළෙමි. එසමයෙහි සවාමිවූ නුබවහන්සේ එතැනට වැඩිසේක. එකල්හි මම කොමුදන් දෙන්ට සිතීමි. එකෙණෙහිම ගවයෝ උදුකෙන කන්ට යන්නාහුය. මෙසේ මා විසින් වඩා කරන්ට සුදුසු කටයුතු දෙකක් එකවිටම සම්ප්‍රා

පනවිය මේ දෙකෙන් පළමුකොට කුමක් කෙරෙම්දැයි සිතන්නාවූ මම් සිහිනුවනින් යෙදී මෙසේ සිතීමි. තෙත්හිමියෝ මට කුමක්කරතත් පළමුකොට කොමු පිළිගන්වමි සිතා ජීර්ණවූ කිළිටුවස්ත්‍රයෙහි බැඳ තුබූ කොමු පළමුකොට පිළිගැන්වූයෙම් නැවත මේ උදුකෙත මැඩ කාපුනම් නපුර ඊටපළමුවෙන් ගවයන් කෙතෙන් පිටතු කෙරෙම් සිතා වහාදිවස්නෙම් එසමයෙහි ඝොරවිෂඇති කලුනාගයෙක් උවදුරු නොබලා දිවන්නාවූ මාගේ පය දෂ්ටකෙළේය. සඞ්ඝමිත්වහන්සේ මා කෙරෙහි අනුකම්පාවෙන් කොමු වැලදුසේක. නාගයාවිසින් කනලදුව දුඃඛවේදනාවෙන් පීඩිතව කාලක්‍රියාකොට මේ දිව්‍යලොකයෙහි උපන් මා විසින් මෙපවණ සුවිශාලකුශලයක් කරණලද්දේය. එතකුදුවුවත් පින්කෙත බලවත්හෙයින් මහත්වූ දිව්‍යසම්පත්තියක් අනුභවකෙරම් කියා නැවත තෙරුන්වහන්සේගේ ගුණයට ප්‍රසංසා කරන්නේ-

සදෙවකේ ලොකස්මාරකේ ච
අඤ්ඤෙසු මුනි නත්ථි තයානුකම්පකෝ,
තඤ හි භන්තෙ අනුකම්පිතෝ භුසං
කතඤ්ඤුතායා අභිවාදයාමි තං.

යනු හෙයින් සඞ්ඝමිත්‍රි නුබවහන්සේහා සමානවූ සකලසත්ත්වයන් කෙරෙහි දයානුකම්පා ඇති සෘෂීන්වහන්සේ කෙනෙක් දෙවියන්ම රුන්සහිතවූ මේලොකයෙහි එකාන්තයෙන්ම නැත්තේය නුබවහන්සේ විසින් අනුකම්පාකරණලද්දාවූ මම මෙබඳු දිවඉසුරක් ලදිමි එබැවින් කෘතොපකාරපණ්ඩිත නුබවහන්සේට නමස්කාර කෙරෙමි කියා ප්‍රසංසාකොට නමස්කාර කෙළේය. එකල් ආයුෂ්මත් මුගලන්මහතෙරුන්වහන්සේ පිරිවරසහිතවූ ඒ දිව්‍යපුත්‍රයාට විස්තාරවශයෙන් බණවදාරා මිනිස්ලොවට වැඩ බුදුරජානන්වහන්සේට ඒ සියළුම ප්‍රවෘත්තිය දැන්වූසේක.

එම අනේකාන්පත්තිකොටගෙණ සම්ප්‍රාප්ත පිරිසට බණවදාරන්නාවූ භාග්‍යවත් බුදුරජානන්වහන්සේ ශ්‍රීමුඛයෙන් නිකුත් සුවිඳින් සියලු දම්සභාමණ්ඩපය සුවඳකාරඛුවක්සේ කෙරෙම්න් මෙසේ වදාළසේක.

දිසවාන දෙවං පවිපුච්ඡි භික්ඛූ
උදාචව විමානමහි විරජ්ජිතීකෙ
ආමුත්තහත්ථාභරණං යසස්සිං
දිබ්බෙ විමානමහි යථාපි වන්දිමා.

යහුං භාගියෙන් යම්සේ චන්දිව්‍යපුත්‍රයා තමන්ගේ දිව්‍යවිමානයෙහි ධවලවූ සිසිර කිරණයෙන් ජොතිමත්ව බබලාද එමෙන් තුන්කෙළ සැටලක්ෂයක් නවුරුදු මුලුල්ලෙහි සැපවිඳිනා පිණිස විරසඨාසීව පිහිටිය වූ තමන්ගේ උතුම්වූ දිව්‍යවිමානයෙහි භාසනාභරණ පාදුභරණාදි නොයෙක් දිව්‍යාලංකාරයෙන්-සැරසී මහත්වූ යශයෙන්හා ශරීරාලෝකයෙන් දශදිග් එකාලොකකෙරෙමින් බබලන්නාවූ මනාපාල නම් දිව්‍යපුත්‍රයා දැක මුගලන් මහතෙරහු එම්බා, දිව්‍යපුත්‍රය නෝ මේ දිවඉපුරු ලැබීමට හිසජාතිශයෙහි කළාවූ කුසල්‍ය කවරේදැයි විවාළේය. ඒ දිව්‍යපුත්‍රයාද කුශලකර්මය ප්‍රකාශකොට කියේය යනාදින් සියලුම කථා ප්‍රවෘත්තිය වදුරා චතුරස්සත්‍යය ප්‍රකාශකොට බණවදාළසේක. ඒ ධර්මදේශනාව බොහෝදෙනාට සාර්ථක විය.

මේ විමාන වත්ථු ප්‍රකරණයෙහි සුනික්ඛිත්ත වර්ගයෙහි
මනාපාල විමානවර්ණනාව නිමවනලදි.

නවද මේ විමානවත්ථුප්‍රකරණයෙහි සුනික්ඛිත්ත වර්ගයෙහි
මච්චකුණ්ඩලී විමානවත්ථුවනම් කවරයත්?

ලොකාග්‍රවූ භාග්‍යවත් බුදුරජානන්වහන්සේ සැවැත්නුවර ජෙතවනාරාමයෙහි වැඩවසන සමයෙහි සැවැත්නුවර වසන්නාවූ ගවධන රත්නාදියෙන් ආඪ්‍යවූ ලොභයින් ඇත්තාවූ එක්තරා මිථ්‍යාදෘෂ්ටි බ්‍රාහ්මණයෙකුගේ මච්චකුණ්ඩලීනම්වූ කුමාරයෙක් ඇත්තේය ඒ කුමාරයාට බලවත්වූ ලෙඩක් හටනත්තේය ඒ බමුණා වැකුව්‍යදම් වෙසිසිනා වැකුලොහයෙන් වෙදකම් නොකරවා ලෙඩ තදවූබවදැන ඇතුළුගෙයි මලකල්හි නිකුත්නිරීම්ආදියෙහි දුසකරය සිනා ගෙයින් පිටතු කරවා වාරකොෂ්ඨයෙහි සයන කරවිය එකල්හි බුදුරජානන්වහන්සේ අළුයම්වේලෙහි ලොව බලා වදාරණසේක් ඒකුමාරයා කාලක්‍රියාකොට නරකයෙහිඋපදනා අකුසල්ඇතිබව දැක අදමා එතැන්හි ගියෙමි විනිමි ඒ කුමාරයා මාදැක පැහැද ඒ කුසලයෙන්ම දිව්‍යලොකයෙහි ඉපිද සොඑතැනින් හඬන්නාවූ පියබමුණා කරාඅවුත් කුසල් අකුසල් දක්වා සංවේග උපදවන්නේය එකල්හි ඔහු මාකරා එන්නේය එතැන්හි මහත් සමාගමක්වෙයි-ඒ සමාගමෙහි මාවිසින් ධර්මදේශනාකළ කල්හි බොහෝ සත්ත්වයෝ නිවන්දකිනාහුයසි සිතා වදාරා මහසඟ පිරිවරා සැවැත්නුවරට පිඬුසිහාවැඩ මච්චකුණ්ඩලියාගේ පියබමුණාගේ ගෙදොර සමීපයෙහි වැඩසිට සවණක් බුදුරැස් හැර වදාළසේක. ඒ දැක ඒ කුමාරතෙම එසේ මෙසේ බලන්නේ දෙතිස්මහා පුරුෂලක්ෂණයෙන්හා අසූඅනුව්‍යඤ්ජන ලක්ෂණ බ්‍යාමප්‍රභාකෙතු

ාලාලඞ්කාරයෙන් බබලමින් වැඩසිටි බුදුන් දැක සතුටුසිත්. ඇතිව බුඩාලම්බනප්‍රීති උපදවා අත්දෙක එක්යොට වැඳගෙණ නැගිසිටීමට අසමර්ථයෙසින් එතැන්හිම සයනය කෙළේය. බුදුරජානන්වහන්සේ මෝහට මෙපමණෙක්ම සැහෙයි සිතා වැඩසේක.

ඒ කුමාරයා කාලක්‍රියාකොට තව්තිසා දිව්‍යලොකයෙහි දෙළොස් යොදුන් රන්විමනෙක ඉපද මේ දිවඉසුරු ලැබීමට කාරණ කව රේදැයි පරීක්ෂාකරන්නේ ඒ සියලුම පවන් දැක නැවත ඔහුගේ පිය වූ අදිනනපුඩ්ඩකනාම් බමුණා සොහොනේ හඬන්නාදැක කුසල්දක්වා මොහු වැඩෙහි පිහිටුවහොත් ඉතා යෙහෙකැයි සිතා මිනිස්ලොවට අවුත් සොහොනෙහි හඬන්නාවූ බමුණා ඉදිරියෙහි මටවකුණ්ඩලී වේසයෙන් හඬමින් සිටියේය. බ්‍රාහ්මණයා ඔහුදැක කුමක්නිසා හඬාදැයි විචාළේය. එකල්හි මානවකයා කියන්නේ ප්‍රභාසම්පන්නවූ සුවණ්ණමය රථපඤ්ජරයෙක් මට උපන්නේය ඒ රථයට චක්‍රදෙකක් නොලැබ ඒ දුකින් හඬමි ජීවිතයෙනුත් කම්නැතයි කිය. සුවණ්ණමයහෝ මාණික්‍යමයවූහෝ රථචක්‍රදෙකක් මම සපයාදෙමි නොහඬවයි කීය. එකල්හි මානවකයා කියන්නේ එසේවීනම් මේ පෙනෙන්නාවූ චන්ද්‍රසූර්‍යයීදෙදෙන රථචක්‍රපිණිස දෙවයි කිය. එකල්හි බ්‍රාහ්මණයා කියන්නේ එම්බා බාලවූ මානවකය නොලැබියහුදු දෙය පැතීමෙන් ප්‍රයොජනනැතැයි කීය. එකල්හි මාණවකයා කියන්නේ මේ පෙනෙන්නාවූ හිරුසඳ දෙදෙනා නොලැබේනම් නාගේ හැඬීමෙන් මියපරලොව ගිය කුමාරයා නෙසේ ලැබේදැයි කියා යොක සන්සිදුවා දිව්‍යලොකයෙහි සිට ආබවත් තමන් ඔහුගේ පුත්‍රයා බවත් බුදුන් දැක පැහැද දිව්‍යලොකයෙහි උපන්බවත් කියා අවවාදකෙමි ට සරණසිලයෙහි පිහිටුවා බුදුන් සමීපයට සැවූහ. එදවස් බුදුන්කරා යන්නාවූ අදිනනපුඩ්ඩකනාම් බමුණා දැක අද පුතුමල සොකයෙන් බුදුන්කරායන්නේය මේ බමුණානිසා අද මහත් ධර්මදේශනාවක් නේයයි කියා බොහෝදෙනා රැස්ව මහත්සමාගමවෙක්විය. ඒමටවකුණ්ඩලී දිව්‍යපුත්‍රයාද විමානයහා සමග බුදුන් දකින්ට ආයේය. එකල්හි බුදුරජානන්වහන්සේ ඔහුගේ අදහස් බලා චතුස්සත්‍යය ප්‍රකාශකොට බණ වදාළසේක. ඒ දෙසනාකෙළවර ඒදිව්‍යපුත්‍රයාහා බ්‍රාහ්මණයා ඇතුළුවූ සඟසුදහසක් ප්‍රාණීහු අර්හත්වඵලයෙන් දුටුවාහුය. මේ කථාප්‍රවෘත්තිය රතනාවලියෙහි විශ්තරවශයෙන් ප්‍රකාශවිය එබැවින් මෙතැන්හි සංක්ෂේපවිය.

මේ විමානවස්තු ප්‍රකරණයෙහි සුනිකඛිත්ත වණ්ණනාවෙහි මච්චකුණ්ඩලී විමානවණ්ණනාව සංක්ෂේපයෙන් නිමා නිම්වනලදී.

තවද මේ විමානවත්ථුප්පකරණයෙහි සුනික්ඛිත්ත වග්ගයෙහි **සේරිස්සක** විමානවත්ථුවනම් කවරයන්?

සම්බුද්ධත්වයන් සත්කාරයෙන් දත්තාවූ භාග්‍යවත් බුදුරජානන්වහන්සේ සියළු බුද්ධකෘත්‍යයන් කොට නිවමා පිරිනිවන්පෑ වදළකල්හි ආයුෂ්මත්වූ කුමාරකාශ්‍යපස්ථවිරයන්වහන්සේ පන්සියයක් සඞ්ඝයා පිරිවරා සේතව්‍ය නුවරට පැමිණ සිංසපාවනයෙහි වැඩවසනසේක.

එසමයෙහි තමන් වහන්සේගේ සමීපයට පැමිණියාවූ පායාසි රාජඤ්ඤනම් බ්‍රාහ්මණයා පරලොවනැත කුසල්නැත අකුසල්නැතැයි කියා ගන්නාලද විපරීත දෘෂ්ටියෙන් මුදා සම්‍යක්දෘෂ්ටියෙහි පිහිටුවූසේක. ඒ බ්‍රාහ්මණතෙම එතැන්පටන් කුසල් රැස්කිරීමෙහි ව්‍යාවෘතව දන්දෙන්නේ දන්දීමෙහි පුරුදුකමක් නැතිහෙයින් දමාපියන දයක් සකස්නොකොට දන්දී එයින් චුතව චාතුම්මහාරාජික දිව්‍යලෝකයෙහි සූන්‍යවූ සේරිස්සකනම් විමානයක හුදනලාව උපන්නේය. ඒ සේරිස්සක විමානයනම් කාශ්‍යපබුදුන්ගේ සමයෙහි කොලමුඩුවක්කොට පූජාකළාවූ පුරුෂයෙකුට පහළවිය. හේකෙසේදයත් යටගියදවස කාශ්‍යපබුදුන් සමයෙහි එක්තරා රහත් තෙනෙකුන්වහන්සේ එක්රා ගමක පිඬුපිණිවහෙණ ගමින් පිටත එක්තරා භූමිප්‍රදේශයෙක වැඩහිඳ දවස්පතා ආහර වළඳනසේක. ඒතෙරුන්වහන්සේ දැක එක්තරා ගවපාලයෙක් සිතන්නේ මේ සඞ්ඝීන්වහන්සේ සූර්‍යතාපයෙන් කලාන්තාවනසේක මොහුන්හි මරුඩපයක් කෙළෙම්නම් ඉතා යහපතැයි සිතා සතුටුසිත් ඇතිව මහරිදඬු සතරක් සිටුවා ශාඛාමණ්ඩපයක්කොට දුන්නේය. ඒ මණ්ඩපය සම්පයෙහි සෙවනපිණිස මහරිගසකුදු රෝපණය කෙළේය. ඒ පුරුෂතෙම එයින් අපරභාගයෙහි කාලක්‍රියාකොට ඒ කුසලකර්මය හේතුකොටගෙණ චාතුම්මහාරාජික දිව්‍යලෝකයෙහි උපන්නේය. ඔහුගේ විමන්දොරපුළුයෙහි කරුණලද කුසලකර්මය ප්‍රකාශකරණපිණිස කර්මසාදෘශ්‍යවශයෙන් වර්ණගන්ධ සම්පන්නවූ මලින් අලඞ්කෘතවූ මහරිවනයෙක් පහළවිය එබැවින් ඒ විමානය සේරිස්සකනම්විය. ඒ දිව්‍යපුත්‍රතෙම එතැන්පටන් බුද්ධානන්තරයක් මුළුල්ලෙහි සුගතියෙහිම සැරිසරන්නේ මෙබුදුඋත්පාදයෙහි දෙවිලොවින් චුතව මිනිස්ලොව ඉපිද ආයුෂ්මත්වූ යසමහතෙරුන්වහන්සේගේ විමලාදී ගිහියහළුවන් සිව්පන්සිදෙනා අතුරෙන් ගවම්පතීනම් යහළුව බුදුන්හෙන් බන අසා රහත්ඵලයෙහි පිහිටිසේක පූර්වාසනාවශයෙන් ජනසුන්‍යවූ ඒ සේරිස්සකනම් විමානය දැක නිරන්තරයෙන් දිවාවිහරණය පිණිස වඩ

නාසේන අපරභාගයෙහි ඒ විමානයෙහි පායාසි දිව්‍යපුත්‍රයා දැක ඇ
සැන්නී තෝකවරෙක්දැයි විචාරා ඔහුවිසින් සඟමිනි සේතව්‍යනුවර
පායාසි රාජඤ්ඤ බ්‍රාහ්මණයානම් මමය මේ විමානයෙහි උපන්මි කීක
ළ කිමෙක්ද තෝ මිථ්‍යාදෘෂ්ටිගෙණ වරදවා හැසිරෙණ ලදැහි වේද
කවරහෙයකින් මෙහි උපන්නෙහිදැයි විචාළසේක එකල්හි ඒ දි
ව්‍යපුත්‍රතෙම කියන්නේ සඟමිනී කුමාරකාශ්‍යපස්ථවිරයන් වහන්
සේ විසින් මිථ්‍යාදෘෂ්ටියෙන් මුදනලද්දාවූ මම සකස්නොකොට කුසල්
කළබැවින් සූනහවූ මේ දිව්‍යවිමානයෙහි හුදකලාව උපන්මි සඟමිනි
මිනිස්ලොවට වැඩියකළ මාගේ පිරිවර ජනයාට මෙසේ වදාළමැනව
පායාසිරාජඤ්ඤ බ්‍රාහ්මණයා සකස්කොට ප්‍රණීතදේ දන්නොදී සඟල්
පදෙය දන්දී හිස්වූ සේරිස්සක විමානයෙහි උපන්නේය තොපි සක
ස්නොට කුසල්කෙරෙමින් ඔහුසම්පයෙනි උපදනා පිණිස ප්‍රාර්ථනාක
රවසි කියා වදාළමැනවැ යිකිය. පෙරුන්වහන්සේ ඔහට අනුකම්පා
වෙත් එසේ වදාළසේක. ඒ පිරිවර ජනයෝද තෙරුන්වහන්සේ
ගේ වචනය අසා එසේම ප්‍රාර්ථනාකෙරෙමින් කුසල්කොට ඒ සේරි
ස්සකවිමානයෙහි උපනන හුස-නැවත යම්තිසි රුක්සෙවනක්හෝ
චතුරබ්භද්‍රවක්ෂෙත්‍ර නැත්තාවූ චාඒකාකාන්තාර භූමියෙහි මාඟිය
ට පැමිණියාවූ මිනිසුන්ට යක්ෂයන්නිසා වන උවදුරු නසනැපිණිස
වෙසමුනිරජහු රැවෝ සේරිස්සකනම් දිව්‍යපුත්‍රයා මාඟිගාරක්ෂාවට සි
ටුවූහ. ඉක්බිති එයින් අපරභාගයෙහි අහුම්ගඩ දෙරට වාසිවූ වෙල
දගනනක් ගැල්වල බඩුපුරාගෙණ සිඟිසෝවිරදේශයට යන්නාහු වා
ඒකාකානතාරයටපැමිණ උෂ්ණහයින් දුවල් නොගොස් රාත්‍රියෙ
හි නාගත්තරුබලා මහට පැමිණ යන්නාහු මංමුලාව අනින්දිගට හි
සාහුය ඔවුන් අතුරෙන් ශ්‍රද්ධාසිල සම්පන්නවූ එමජාතියෙහි රහත්වී
මට හේතුසම්පත් ඇතනාවූ උපාසකයෙක් ඇත්තේය ඔහු මවුපි
යන් රක්නාපිණිස ධනසොයා වෙළඳුන්හා සමග සියේය එකල්හි
ඒ සේරිස්සකනම් දිව්‍යපුත්‍රතෙම ඒ උපාසකයාට අනුග්‍රහකෙරෙමි
න් විමානයහා සමග තමා දැක්විය එසේ දක්වා පැනක් සෙවනක්
නැත්තාවූ මේකාන්තාරයට නොප කුමක් පිණිස ආවුදැයි කියා දිව්‍ය
පුත්‍රයාවිසින් විචාරණලද ඒ වෙළඳහු තමන් ආපවත් කීවාහුය ඒ දි
ව්‍යපුත්‍රයාගේහා වෙළඳුන්ගේ කථා ප්‍රවෘත්තිය දක්වන්නාවූ සංගීති
කාරක මහායථවිරයන් විසින්.

"සුණාථ යකඛස්සච වාණිජානච
සමාගමෝ යඤ්ච තදා අහහා යථා
කථං ඉතරීතරෙණවාපි
සුභාසිතං තංච සුණාථ සබ්බෙ

යොසෝ අසුරාජා පායාසිනාම්
භුම්මානං සහව්‍යගතා යසස්සී
සෝ මොදමානොසතෙ විමානෙ
අමානුසෝ මානුසෙ අජ්ඣභාසිති"

යනුහෙයින් වෙසමුනි රජ්ජුරුවන්ගේ පරිවාරිකවූ සේරිස්සක නම් දිව්‍යපුත්‍රයාගේද වෙළඳුන්ගේද යම් වාළුකාකාන්තාරභූමියකදී එක් වීමෙක්විද එතැන්හිදී ඔවුනොවුන් විසින් කරණලද යම් කථා ප්‍රවෘත්තියෙක් ඇද්ද ඒ සියලුම ප්‍රකාශකොට දක්වමිහ එබඳු ශ්‍රේෂ්ඨ වන්න සත්පුරුෂයෙනි තොපි සියල්ලෝම එපවත් කන්නමා අසව් සේතව්‍යනුවර පායාසි රාජඤ්ඤන්ම් යම් බ්‍රාහ්මණයෙක් ඇද්ද ඒ බ්‍රාහ්මනතෙම බ්‍රම්ටු දෙවියන්හා සමගිව උපන්නේය ඒ සේරිස්සකන්ම් දිව්‍යපුත්‍රතෙම පිරිවර දෙවතාවන්හා සමග සතුටුව පැළඳිකාම සම්පත් අනුභව කෙරෙමින් තමාගේ විමානයෙනිම සිට වෙළඳුන්දක් මෙසේ කීයේය.

"සවංකෙ අරඤ්ඤෙ අමනුස්සපථාසණෙ
කන්තාරෙ අපෙපාදසෙ අපපහසෙඛ
සුදුගහමෙ වණිඤ්ඣුපථස්ස මජ්ඣෙ
වංකහයා නාධ්මානා මහුඃසා

නාසිධඵලමූලං මයාව සන්නි
උපාදනං නාපි කුතො ඉධහිකඛා
අඤ්ඤත්‍ර පංසූහිව වාළුකා හිව
තත්තානි උණ්හානිව වාළුකාහිව

උජ්ජංගලං තත්තාවිඛිං කපාලං
අනාසසං පරලොකෙන තුල්‍යං
රුද්දනමා වාසමිදං පුරාණං
භූම්පපදෙසෝ අහි සන්තරූපෝ

අථ තුහෙම කෙන වණ්ණෙන
කිමාසඛාන කිමපපදෙසම්හි
අනුපවිධා සහසා සමෙවව
ලොහහයා අඛ්ඛා සම්පමුළ්හානි"

යනුහෙයින් එබඳ පින්වත් මනුෂ්‍යයෙනි මේකාන්තාරයට පැමිණි මිනිසුන්ට අපගේ ජීවිතය ඇතිවේද නැතිවේද අපට මරණ පැමිණේද දිවිරැකගෙන යන්ට හැකිවේදැයි කියා සැකඋපදවන්නාවූ නිරන්තරයෙන් යක්ෂ පිසාචාදී අමනුෂ්‍යයන් හැසිරෙන්නාවූ සුවසේ

යාතොහැකි හෙයින්ද කතබොනෘදයක් නැතිහෙයින්ද පැන්නෙණ යායුතුහෙයින්ද මිනිසුන්ට ගෝචරනොවන්නාවූ මේ කාන්තාරයට වැදීමට පළමුවෙන්ම මිනිසුන්ට භය උපදවන්නාවූ මේ වාළකානන රයමැද අඹ දඹ කෙහෙල් පොල් ආදී කෑයුතු ඵලජාතියකුත් නැත්තේය කෘෘරවූ උනුවැලිත් පසුත් හැර යටත්පිරිසෙසින් ගිනිඵලවන දර පමනකුත්නැත්තේය එබැවින් කෑයුතු ආහාරයෙක් නම් කෙසේඇතිවේද ඒකාන්තයෙන්ම නැත්තේය මදක් පඬුවන් රුක්ෂවූ තදපස් ඇතනාවූ රත්වූ කබලක්වැනිවූ සඤ්ඤයන්ට භයඵලවන හෙයින්ද අමනුෂ්‍ය සතුරන්හෙත් ගැවසීගත්හෙයින්ද කිසියෑපතක් පිණිටක් නැතිහෙයින්ද පරලොවක් වැනිවූ හෙවත් නරකයක් වැනිවූ පුරානැනපටන් බොහෝකාලයක් මුළුල්ලෙහි යකුන්ටම වාසස්ථානවූ මේ හැමි ප්‍රදේශයට තෙපි කවර කාරණයක්නිසා ආවාහුද කවරවෘත්තුවක් පතා ආවාහුද නොපගේ සතුරුකෙණෙකුන් විසින් අනර්ථයක් කරණ්‍රුකැමතිවරවින් නානා හරණ ලදහුද නොහොත් මූලාව ආවාහුදැයි විවාළේය-එබස්අසා වෙළඳහු මෙසේ කීවාහුය.

මගඩේසු අඛේඝසුව සඤ්ඤ වාහා
ආරොපියං පානියං පහුතං
තෙයාමසෙ සිඤ්ඤ සොවිරභූමිං
ධනත්ථිකා උදයං පත්ථයානා

දිවාපි තාසං නධිවාසයන්නා
යොගහානුකූපංච සමෙක්ඛමානා
එතෙන මග්ගෙන ආයාම සබ්බ
ඉතෙ රත්තිමඛණං පටිපන්නනාවිකාලෙ

තෙ දුප්පයාතා අපිරඤ්ඤමග්ගා
අඤ්ඤාකුලා විප්පනට්ඨා අරඤ්ඤේ
සුදුග්ගමෙවනභූපථඤ්ඤමපේඤ්ඤ
දිසං නජානාම පමුළ්හචිත්තා

ඉදං අදිස්වාන අදිට්ඨ පුබ්බං
විමානසෙට්ඨඤ්ඤව වතයඤ්ව යක්ඛි
තට්ඨතරිං ජීවිතමනසාන
දිස්වාපණ්හං සුමනා උදග්ගාහි"

යකුහෙයින් එබඳු දිව්‍යපුත්‍රය අනුමගධ දෙරට වැඩුනාවූ සාර්ථවාහකයෝ වමා ගැල්වල බොහෝ බඩුපුරාගෙණ වැඩිලාභ උපදවමහයි සිතා වසතු ලෝභයෙන් සිඤ්ඤසෝවිර දෙශයට වෙළඳවිපිණිස

සම්‍ය නුබවහන්සේ දක්නට පළමුවෙන් උපන්බලවත් සෙසින් ශ්‍රී ෂම ඉවසියනොහී ගොන්ටහා මිනිසුන්ම ඵාසුපිණිස අනුකම්පාවෙන් දහවල් එක්තෙනක ලැගුම්ගෙණ සිට අපිසියල්ලම රාත්‍රියෙහි මාගීහයට පැමිණියම්හ අවේලාවේ ගවන යහපත් ගමනක් නොවෙහි එබැවින් ඒ වරද අපටම පැමිණියේය යක්ෂාධිෂ්ඨිතවාළුකාකාන් තාරයමැද මහදැන්නනනොහි මන්මුලාව නුවනැස් අඹිව ඇස් නැතන්සේ සින්ධුසොවීර දෙශය අසවල් දිගයයි කියා දැනගතනොහි විනාසමුඛයට පැමිණියම්හ මෙයින් මතු අපට අපගේ දිවිනැති වෙයිකියා සිතට සැක උපන්නේය එබඳු දිව්‍යපුත්‍රය අපවියින් පෙරනොදක්නාලද මේ දිව්‍ය ප්‍රාසාදයහා නුබවහන්සේගේ යම්මේ දැකීමෙක් ඇඳද ඒ දැනීම හේතුකොටගෙණ ප්‍රීතියෙන් උද්ගතවූ සිත්ඇතමහා මෙතැන්පටන් දිවිලබමහයි සිතා නුබවහන්සේ දැක සතුටුව මහයි කීවාහුය. මෙසේ සියළුප්‍රවෘත්තිය ප්‍රකාශකොට කිකලුනි නැවත දිව්‍යපුත්‍රතෙම මේගාථාදෙකින් මෙසේ වීවාළේය.

"පාරං සමුද්දස්ස ඉදඤ්ච වණ්ණං
වෙත්තාවාරං සංකුපථඤ්ච මිඝං
නදියා පන පබ්බතානඤ්ච දුග්ගා
පුට්ඨදිසා ගවජථ හොගහේතු

පක්ඛින්දියානං විජිතං පරෙසං
වෙරඤ්ජකෙ ගවජථ පෙක්ඛමානා
සං වා සුතං වා අථවාපි දිට්ඨං
අථෙජරකංතං වො සුණොම තාතා"

ඉනුහෙයින් ඒ දිව්‍යපුත්‍රතෙව නුමාගේ ඓශ්වර්‍ය්‍ය සම්පත් ඒ වෙළඳුන්ලවා ප්‍රකාශකරනු කැමතිව කියන්නේ එබඳු පින්වත්නි මේ වෙළඳුම්කරණ මිනිසුන් බලා වසනුයොයා යන්නාවූ තොපි මහාසමුද්‍රයෙන් එතරීද මෙවෙනි වාළුකා කාන්තාරවලද වේවැල්බැඳ අල්වා ඇයුතු මාගීහවලද කණුසිටුවා යායුතුවූ සංකුපථයයි කියනලදද මාගී වලද ගංගාපර්වතාදී විෂම භූමිවලද වසනු නිසා නොයෙක් දිග ඇති දිනාහුය පැනගන යායුතුවූ භූමිභාග ඇති නොයෙක් රජුන්ගේ රාජ්‍යවල නානාදේශවාසිවූ වෙළඳුන් දක්නාවූ තොපි වසනුනිසා ඇති දිනාහුය එසේ යන්නාවූ තොප විසින් දක්නාලදහෝ අසනලදහෝ ආශ්චර්‍ය්‍ය අද්භූතවූ යමක් ඇත්නම් ඒ සියල්ලම මට නොවල්හාම කියවයි කියේය. මෙසේ ඒ දිව්‍යපුත්‍රයා විසින් විචාරණලද ඒ වෙළඳහු මෙසේ කීවාහුය.

X

"ඉතොපි අවෙජ්‍රතරං කුමාර
න නො සුතංවා අථවාපි දිට්ඨං
අත්‍ථත මානුසසකමෙව සබ්බං
දිසවා න තපපාම අනොම වණණං
වෙහාසයං මං පොක්ඛරඤ්ඤු සවන්ති
පහූතමල්‍යා බහු පුණ්ඩරීකා
ද්‍රුමාචිමෙ නිච්ච ඵලූපපන්නා
අතීව ගන්ධා සුරභි පවායති
වෙළුරියත්ථම්භා සතමුසසිතාසෙ
සිලාපවාලසසච ආයතංසා
මසාරගල්ලා සහ ලොහිතංකා
එමහා ඉමා ජොතිරසා මයාසෙ
සහසසත්ථම්භං අතුලානුභාවං
තෙසූපරී සාධු මිදං විමානං
රතනන්තරං කඤ්චන වෙදි මිසසං
තපනීය පට්ටෙහිව සාධු ඡන්නං
දෙවොනු ආසී උදවාසි යක්ඛා
උදහු දෙවිඤ්ඤු මනුසසභූතා
පුච්ඡන්ති තං වානිජා සත්ථවාහා
ආචික්ඛ කොනාම තුවංසි යක්ඛානි"

යනුහෙයින් ප්‍රථම නව යෞවනයෙහි පිහිටියාවූ එම්බා දිව්‍යකුමාරය මානුසිකවූ ඉසුරු සම්පත් ඉක්මගියාවූ නුබවහන්සේගේ මේ ඓසවර්‍යය සම්පත්තියට වඩා අප විසින් අසනලදහෝ දක්නාලදහෝ ආශ්චර්‍යය අද්භූත දෙයක් නැත්තේය. නුබවහන්සේගේ අලාමකවූ උත්තම වර්ණ සම්පත්තියහා විමාන සම්පත්තිය බලා තෘප්තියකට නොපැමිණෙමිහ බොහෝවූ සෙවත්පද්ම රකතපද්මාදී නොයෙක් මලින් ගැවසීගත්තාවූ නිර්මලවූ සිහිල් ජලයෙන් පිරුනාවූ පොකුණු ආකාශයෙහි සන්දනය වන්නේය මේ පොකුණු හා විමානය වට පිහිටියාවූ නිරන්තරයෙන් නොයෙක් පළුපලුවයෙන් සැදුම් ලද්දාවූ දිව්‍ය වෘක්ෂ පඞ්කතියෙන් යහපත්වූ සුරභි සුවඳ හමන්නේය වෛඩූර්‍යමසාරගල්ල ලොහිතඞ්කශිල ප්‍රවාළාදියෙන් නිර්මිතවූ අෂ්ටාංශ සෙඛණ්ඩාංශ චතුරස්‍රාංශවූ රශ්මිදෙන්නාවූ දික්වූටැම් මත්තෙහි සොභාමත්වූ මේ ප්‍රාසාදය පිහිටියේය. සත්රුවනින් නිර්මාවූ අසදෘශවූ දහසක් පමණ ටැම්හා භිත්තිසථම්භ සොපාන මාලාවෙන් යුක්තවූ සුවර්ණමය වේදිකාවෙන් යුක්තවූ මත්තෙහි රත්පටින් වසනලද්

දුවූ බොහෝසේම ජාම්බුනද සවණ්ණයෙන් යහපත්කොට ඔප නගනලද විමානාවයවයන් ඇත්තාවූ තොපගේ මේ විමානය දවසක් මුලුල්ලෙනි බලාත් සිත් නොපිරෙන්නේය මේ රන් මාලිගාව ඇතුලෙනි ඛාද්‍යභොජ්‍යාදී නොයෙක් දිව්‍ය භෝජන සදහිබෙන්නේ ය දසවූ ගඩිමියන් වියින් මිහිතුබෙර පනාබෙර ආදී පවඩනික තූ යෂ්කොෂාවෙන් එකනින් නාද වෙයි නොයෙක් දිව්‍ය පූජාවයන් විසින් සතුති හී කියා නමස්කාර කරණ ලද්දෙහිය. යම්සේ වෙසවුණු රජ්ජුරුවෝ නොයෙක් මලින් සැදුනාවූ නලිනී නම් පුෂ්කරණියෙහි නොයෙක් දෙවතාවන් විසින් පිරිවරණලදුව සතුටුව ක්‍රීඩා කෙරේද එමෙන් නුබවහන්සේද නොයෙක් දිව්‍යාඞ්ගනාවන් පිරිවරා මේ දිව්‍යප්‍රාසාදයෙහි ක්‍රීඩා වශයෙන් අවිත්තෙහාය්‍යඅප්‍රමෙය්‍යවූ සම්පත් අනුභව කරණසේක. ස්මෙක්ද නුබ දේවතාකෙනෙක්ද නොහොත් මේ කාතාරයෙහි වසන චණ්ඩවූ යක්ෂයෙක්ද නොහොත් දෙදෙවු ලොවට අධිපතිවූ ශක්‍රදේවේන්ද්‍රයාද මිනිස්ජාති ඇති කෙනෙක්දැයි කියා සැක ඇතිව මේ සාඤ්ඨිවාහක වෙලෙන්දු විචාරන්නාහුය එම්බා දිව්‍යපුත්‍රය නුබවහන්සේ කවරෙක්හිදැයි විචාළහ. එකල්හි ඒ වෙළඳුන් විසින් විචාරණ ලද දිව්‍ය පුත්‍රතෙම තමන්ගේ සවභාව දක්වන්නේ.

"සෙරිසසකෝ නාම අහංහි යක්ඛෝ
කාතාරිකෝ වණ්ණුපථයම්හි ගුත්තෝ
ඉමං පදෙසං අභිපාලයාමි
කරොමි වාචං වෙස්සවණ්ණස්ස රඤ්ඤෝති"

යනු හෙයින් එම්බා පින්වත්වූ වෙළඳුනෙනි මම මේ වාඨකාකාන්තාර භූමි ප්‍රදෙශයෙහි නියුක්තවූ සේරිස්සක නමිවූ වෙසවුණු රජ්ජුරුවන්ගේ පරිචාරිකවූ දිව්‍යපුත්‍රයෙක් වීමි වෙසවුණු රජ්ජුරුවන්ගේ වචනයෙන් මේ භූමි ප්‍රදෙශය රක්‍ෂා කෙරෙමි කියේය එබස් අසා මේ සම්පත් ලැබීමට කාරණා විචාරන්නාවූ සාර්ථවාහකයෝ මෙසේ විචාළාහුය

"අධිච්චලද්ධං පරිනාමිතං තෙ
සයං කතං උදාහු දෙවෙහි දින්නං
පුච්ඡන්ති තං වාණිජා සත්ථවාහා
කථං තයා ලද්ධමිදං විමානන්ති"

යනු හෙයින් එම්බා දිව්‍යපුත්‍රය නුබවහන්සේගේ මේ ඉසුරු සම්පත්තිය කිසි කාරණයක් නැතිව කැමැති පරිද්දෙන් ලත් සැපතෙක්ද නොහොත් කිසිකෙනෙකුන්ගිසින් කාලවශයෙන් පිරිනමනලද්

ඉද්ද නොහොත් නුබගේ සෘධිමහිමයෙන් නුබ විසින් උපදවන ලද් ඉද්ද නොහෙ.ත් නුබවිසින් ආරාධිතවූ දෙවිකෙනෙකුන් විසින් ප්‍රභා දවශයෙන් දෙනලද්දේදූයිකියා මේ වෙලඳ සාථී වාහකයෝ විචාර න්නාහුය. නුබවහන්සේ විසින් මේ විමාන සම්පත්තිය කෙසේ ලබන ලද්දේදූයි විචාළාහ, එකල්හි ඒ දිව්‍යපුත්‍රතෙම මේ සතර කාරණ ගර්භ ප්‍රතිසේඛප කොට කුශලකර්මයම ප්‍රකාශකොට දක්වන්නේ,

"නාධිච්චලද්ධං නපරිනාම්නතමෙම
න සයංකතං නහි දෙවෙහි දිනනං
සකෙහි කම්මෙහි අපාපකෙහි
එවම්ඉයා ලධම්දං විමානන්ති"

යනු හෙයින් මාගේ මේ ඉසුරු සම්පත්තිය නිකරුනේ ලද්දේන් නොවෙයි යම් කෙනෙකුන් විසින් පිරිනමන ලද්දේන් නොවෙයි මා විසින් උපදවන ලද්දේන් නොවෙයි මහෙශාක්‍ය දෙවියෙකු විසින් ඉදනලදෙත් නොවෙයි පූර්ජාතියෙහි කරණලද කුශලකර්මයෙන් ලද්දේයයි කීහ. එකල්හි වේළෙන්දු කුශලකර්මය විචාරන්නාහු එබඳු දිව්‍යපුත්‍රය නුබ විසින් පුරුදු කරණලද කවර ශ්‍රෙෂ්ඨවයක්‍රීවයක් කව ර වත්තසමාදානයක් හෙතුකොටගෙණ මේ විමානය ලද්දේදූයි කියා විචාළාහුය, නැවත ඒ දිව්‍යපුත්‍ර තෙම තමා විසින් රැස්කරණලද කු ශලකර්මය ප්‍රකාශකොට දක්වන්නේ,

"සුඹණාවඛෝ ආසි කුමාරකසසපෝ
බහුසසුතෝ විත්තකථී උළාරෝ
සෝ මෙ තදා ධම්මකථං අභාසි
දිටඨිවිසුකානි විනොදයී මෙ

තාහං ධම්මකථං සුණිත්වා
උපාසකත්තනං පටිවෙදයිසසං
පාණාතිපාතා විරතෝ අහොසිං
ලොකෙ අදිනනං පරිවජ්ජයිසසං

අමජ්ජපෝ නොව මුසා අහාසිං
සකෙන දාරෙනවහොසි තුටඨෝ
තමෙම චතං තමපන බ්‍රහමචරියං
තසස සුචිණණසස අයං විපාකෝ

ඉතෝහව කම්මෙහි අපාපකෙහි
පූකෙඤඤහි මෙ ලධම්දං විමානන්ති"

ඇනු හෙයින් මම යටගිය දවස කොසොල් ජනපද වාසීන්ගේ සෙ කවය නම් නුවර පරලොව නැත කුසල් නැත අකුසල් නැතැයි කියා ගණ්නාලද උපදිශද දෘෂ්ටි ඇත්තාවූ මසුරුවූ ලාමක යහාව ඇත්

නාවූ පායාසිරාජඤ්ඤ නම් බ්‍රාහ්මණයෙක් විය. එසමයෙහි බුදුන්ගේ ශ්‍රාවකවූ චිත්‍රකථිකවූ බහුශ්‍රුතවූ උදාරවූ ප්‍රඥාඇති කුමාරකාශ්‍යපනම් මහතෙරුන් වහන්සේ ඒ දෘෂ්ටිය විනොදනයකොට බණ වදාළසේක. මම ඒ බණ අසා ප්‍රාණඝාතය අදත්තාදානය කාමමිථ්‍යාචාරය මෘෂාවාදය සුරාපානය යන පස් පවින් දුරුව දානශීලාදී වශයෙන් කුසල් පමණක් කෙළෙමි. එසේ පුරුදු කරණලද වතසඹා දානය හා එම ශ්‍රේෂ්ඨවයසින්ව හෙතුකොටගෙණ මාවිසින් මේ විභවය හා මේ විපාකානිසංස ලබන ලද්දේයයි කීය. එකල්හි ඒ සාධුවාහකයෝ ඒ දිව්‍ය පුත්‍රයාද විමානයද ප්‍රත්‍යක්ෂයෙන්ම දැක කම්ඵල අදහාගෙණ තමන්ගේ කම් ඵල ඇදහීම දක්වත්නාහු.-

"සච්චං කිරාහං පුන තා සපඤ්ඤ
අනඤ්ඤථා වචනං පණ්ඩිතානං
යතිං යතිං ගච්ඡති පුඤ්ඤකම්මෝ
තතිං තතිං මොදති කාමකාමී

යතිං යතිං සොකපරිද්දවොව
වධොච බන්ධොච පරිකිලෙසෝ
තතිං තතිං ගච්ඡති පාපකම්මෝ
නමුච්චති දුග්ගතියා කදාචිති"

යනු හෙයින් නුවනැත්තාවූ යම් කෙනෙක් යමක් කිවාහුනම් ඒ නුවනැති පණ්ඩිතයන්ගේ වචනය නම් වෙනසක් අන්‍ය ථාභවයක් නැත්තේය කරණලද කුසල් ඇති සත්පුරුෂතෙම යම් තැනකට ගියේද හෙවත් දිව්‍යලොක මනුෂ්‍යලෝකාදි වශයෙන් යම් යම් තැනක උපදීද ඒ ඒ තැන්හි පවකාමසම්පත් විඳිමින් සතුටු වන්නේය කරණලද අකුසල් ඇති සත්වතෙම යම් යම් තැනකටයේද ඒ ඒ තැන්හි සොකකිරීමය විලාපකීමය වධබන්ධනාදියට පැමිණීමය යනාදි නොයෙක් අනර්ථයට පැමිණ කිසිකලෙකත් සසරදුකින් නොමිදෙන්නේමයයි කියා කුශලයට ප්‍රශංසාකොට අකුසල් කලවුන්ට නිගුකොට ඒ දිව්‍යපුත්‍රයා හා සමග ප්‍රියකථාකොට ඉක්බිති මනුෂ්‍යපථයට ගොස් දිවිනිමියෙන් කුසල්කොට කම්වූ පරිද්දෙන් පරලොකප්‍රාප්තවුවාහුය. ඒ උපාසකයාද ස්‍රවසේ ගමට ගොස් මව් පියන්ට උපස්ථානඋකොට ඉක්බිති සකලකෙලශයන් නසා රහත්ව සසර දුකින් මිදුනේය.

මේ විමානවත්ථු ප්‍රකරණයෙහි සුණිකඛිත්තන වශියෙහි සෙට්ඨ සහක විමානවණ්ණනාව නිමාවිනිමවනලදී.

පරමප්පසාදජනිකා නම්වූ බුදුගුණ කථාවෙහි සන්වන සුණිකඛිත්තන වශිය නිමි.

සුභං භවතු.

තවද මේ විමානවස්තු ප්‍රකරණයෙහි සිංහලභාෂා කතිෘන් විසින් සඞ්ග්‍රහකරණලද ශාසනොපකාර සඞ්ග්‍රහ වස්තුවනම් කවරයත් ? පුරාතන පටන් මූලභාෂායෙහි කියනලද පාලි අර්ථවශයෙන් පැවත ආවාවූ මේ විමානවස්තු ප්‍රකරණයෙහි සප්තමහා වගීයට අන්තර්ගතවූ කථාවස්තූන් පාලියහැර වචනාර්ථ පමණක් ගෙණ එළවට නගා ප්‍රකාශකොට දක්වා ඊට අනතුරුව මැත භාගයෙහි පසුබටවූ ලක්දිව ශාසනය නැවත නිම්ලව දීප්තිමත්වූ බවද ධර්මයවූ පරිද්දෙන් පිළිප දනා මහොත්තමයන්ගේ ගුණ කීර්ති කිරසඳසේ දශදිග ප්‍රසිද්ධවීමෙ න් හා ඓහලෞකික පාරලෞකිකාභිවෘද්ධි වර්ණයට කාරණාවන බවද ප්‍රකාශකොට දක්වන පිණිස මේ විමානවස්තු ප්‍රකරණයෙහි මු ලම් දැක්වියයුතුවූ ''සංඤ්ඤනිම්මතං කත්තාරං පරිමාණං ප්‍රයොජනං'' යන පස් අර්ථයන් මෙහිම සඞ්ඛෘතිතවන බැවින් මේ විමානවස්තු ප්‍රකරණයටම අන්තර්ගතකොට ශාසනොපකාර සඞ්ග්‍රහ නම්වූ වස්තු සඞ්ග්‍රහවක් අප විසින් සංග්‍රහ කරණලදුව ප්‍රකාශකොට දක්වම්හ ලඝුකොට නොසිතා මනාකොට අසා පූර්වාපරවිරයන් කළ කී කටයු තු හැඳින එනදවසත් යම්කිසි කාරණයකින් ශාසනය පිරිහෙන්ට එන්නේවිනම් ශාසනාභිවෘද්ධි වර්ධනය කැමති ශ්‍රද්ධාවන්තයන් විසි න් සැකනැතිව වීර්‍ය්‍ය වඩා පස්වාදහසක් පවත්නා සම්බුද්ධශාසනයට ආධාරව සැබෑ මොක්ෂ සම්පත් ලබන්ට උත්සාහ කටයුතු.

උස්සාහං වඩ්ඪනත්ථාය පවක්ඛාමි ඉතෝ පරං,
සාසනොදය කාමිනං සුත්වා සක්කච්චසිකං ඵලං.
විනාසමුඛ සම්පත්තං ලඞ්කායං ජිනසාසනං,
ජොතනත්ථාය උස්සාහ කතස්ස සඞ්ඝරාජිනො.

ගුණච වුඩ්ඪිපත්තස්ස සාසනස්සව දීපනං,
කිත්තිසසිරී රාජසීහ භූමිපාලස්ස වණ්ණනං.
තං සුත්වා චෙව මුස්සාහං වඩ්ඪනතු මුනිසුණවෝ,
භූමිපාලාදි සබ්බපි කරොන්තු සත්ථුසඞ්ගහනන්ති''

සම්ලොකෙකනාථවූ අප බුදු රජාණන්වහන්සේ යඩ්ඡීමෘත වර්ෂා කෙරෙමින් පන්සාළිස් හවුරුදක් මුළුල්ලෙහි ජීවත්ව වැඩහිඳ සියළු බුද්ධකෘත්‍යයන්කොට නිමවා පිරිනිවිතැන් පටන් දෙසියසතළිස් වෙ නි වර්ෂයෙහි මේ ශ්‍රී ලඞ්කාද්වීපයෙහි දෙවෙනි පැනිස්ස මහරජාණන් දව ස මිහිඳුමහ තෙරුන්වහන්සේ ප්‍රධානකොට ඇති මහාසංඝයා දඹදිව් න්වැඩ විශුද්ධ බුද්ධශාසනය පිහිටෙවිතැන් පටන් ඒ ඒ කල රජ පැමි ණි ශ්‍රද්ධාබුද්ධි සම්පන්න රාජරාජමහාමාත්‍යාදීන් විසින් ධර්මධර විනය ධර ලජ්ජිපෙසල ශික්ෂාකාමී මහසංඝයා වහන්සේගේ සහායෙන් ඒ

ඒ කලට සම්ප්‍රාප්තවූ ශාසනාර්බුද තෙරුරු දුරුකොට නිම්ලව පවත්වා ආවාවූ බුඩ ශාසනය මැතභාගයෙහි එවෙනි පින්වත් රාජ රාජමහාමාත්‍යාදීන් නොපැලඹීමෙන් හා පරඛනිදම්ළාදී මිථ්‍යාදෘෂ්ටින්ගේ උවදුරුනිසා ලජ්ජීපෙසල සික්ෂාකාමී තැන්වලට සිවුපසය නොලැබීමෙන් ශ්‍රඛාවෙන් පැවිදිවූ කුලදරුවන්ට සූත්‍රාභිධම්ම විනයසඛ්‍යා තත්‍රිපිටක ධර්මය සුවසේ ඉගෙණ ධර්මවිනයානුකූලවූ පරිද්දෙන් පිලිපැදීමට අසමර්ථව කුලදූෂණාදී මිථ්‍යාජීවයෙන් ජීවත්වන දුශ්ශීල තැන්වලට බලවැඩී අනුක්‍රමයෙන් ශාසනය පිරිහී බුදුන් විසින් විනය ධරයන් කෙරෙහි අග්‍රස්ථානයෙහි තබනලද උපාලිස්ථවිරයන් වහන්සේ පටන් පිළිවෙළින් පැවත ආවාවූ

"උපාලි දාසකෝ චෙව සොණකෝ සිඟාලවෝ තථා
මොඝාලී පුතෙතන පචවිං එතෙ ජම්බුසිරිවහයා.

තතෝ මහිඤ්ඡූඉටඨියෝ උතතියෝ සම්බලෝ භදදසාලොව
පණ්ඩිතා තෙ මහාපඤ්ඤ ජම්බුදිපා ඉධාගතා.

තතෝ අරිටෝඨා මෙඩාව තිස්සදතෙතා ච පණ්ඩිතෝ
වියාරදෙ කාලසුමනෝ ථෙරෝ ච දීඝනාගෝ"

යනාදීන් දක්වනලද උපාලිදාසකය සොණකය සිඟාලවය මොඝාලිපුත්තය මිහිදුය යනාදී ක්‍රමයෙන් ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවශයෙන් කවර කුලයකින්වත් ශ්‍රඛාවෙන් පැවිදිව ධර්මවිනය ලෙසින් ගුරු පරම්පරාව නොකඩකොට පැවත ආවාවූ ශාසන පරම්පරාව හැරත මතමන්ගේ කුලපරම්පරාව ශාසන පරම්පරාවයයි වරදවාගෙණ ශ්‍රඛාවන්න කුලදරුවන්ගේ මහණවීමට අවසරනොදී ශ්‍රඛාවන්න රාජ රාජමහාමාත්‍යාදීන් විසින් සඞ්ඝයාට සිවුපසය පිණිස සාංඝිකකොට කැපවශයෙන් දෙනලද ගම්බිම් කෙත්වත් ආදියත් තම තමන්ගේ ඥාතිකුල පරම්පරාවටම හිමිකොට පදවියලත් කෙනෙකුන්ට රාජකාරිය දෙමින් ගම නිසා තම තමන්ගේ දරුමුනුබුරු කෙනෙකුන් පැවිදිකොට සිවුරු පිළි පොත්පත් විහාර ගම් ආදියත් ඥාති කුල පරම්පරාවටම අයිති කෙරෙමින් ශාසන පරම්පරාවයයි ව්‍යවහාර කොට දුශ්ශීලතැන් හිහිවීමෙනුත් ශ්‍රඛාවන්න කුලදරුවන් මහණවීමෙනුත් නිම්ලව පවත්නා සඞ්ඝ ශාසන පරම්පරාව නසා සමහර ලජ්ජීපෙසල ශික්ෂාකාමී කීප නමක් හැර අවශෙෂතැන් මැණික් නිබි යදී හිනිඅඟුරු උකාගන්නාසේ උගතමනා ධර්මවිනය නිබියදී නෑකැන් වෙදකම් යඤ්ඤප්‍රලයාදී නින්දිත ශාස්ත්‍ර ඉගෙණ ඇතුළු නුවර පිටිනුවර නෑකැන් වෙදකම් යඤ්ඤප්‍රලයාදී ගර්හිත විද්‍යා දක්වා රාජ

ඒජ මහාමාත්‍යාදීන්ගේ සිත්ගෙණ ගම් කුඹුරු ස්ථානාන්තර ලබා
නෙණ ඉනායෙක් අනාචාරයෙහි හැසිර ශාසන පිළිවෙත් පිරිහුලා
ඉගාවිතැන් වෙළඳුම්කොට වලලු මුදු පිළිපත් ආදිය සපයා මල්බෑ බු
හුනනි ආදීන් රක්ෂාකිරීම ශිලයක්කොට වසන අලජ්ජිතැන් බහුල
බැවින්ද පරඛතිදව්ලාදී මිථ්‍යාදෘෂ්ටීන්ගේ පැලඹීමෙන්ද ශාසනය න
සින්ට වන්කල මහානුභාව සම්පන්න තෙජොබල පරාක්‍රම සම්පන්ව
තවූ * රාජසිංහ නම් මහාරාජෝත්තමයාන කෙනෙක් ලඞ්කාරාජ්‍ය
යට පැමිණ මහත් උත්සාහයෙන් ශ්‍රී බුඩ වර්ෂයෙන් දෙදාස්එක්සිය න
වානූවෙනි වර්ෂයෙහිදී කොලඹ බලකොටුව හරවා පරඞ්ගි උවදුරු දු
රුකොට ඕලන්දවාසීන් ගෙන්වා මින්මතු රාජපරම්පරාවට හා ලඞ්කා
වාසීන්ට මිථ්‍යාදෘෂ්ටි සතුරන් නිසා කිසි උවදුරක් නොවේවයි
සන කරුණාඛ්‍යාසයෙන් ලඞ්කා ව්පයට සමුද්‍ර තීරයෙහි රැක්
වල් ලවමින් මෙසේ සතුරු උවදුරු දුරු කිරීමෙහි ව්‍යාවෘත
වීම නිසා ශාසනොපකාර කටයුත්නාක් කොට ගතනොහී ප
රලොකප්‍රාප්තවූ සේක. එම රාජසිංහ මහ රජානන්ගේ ඇවැ
මෙන් රාජ්‍යශ්‍රී පදප්‍රාප්තවූ ශ්‍රද්ධාබුඩි සම්පන්න ශාසනොදයක්කා
රීවූ ‡ විමලධම්සූරියී මහරජානෙ අප වැනි ශ්‍රද්ධාවන්ත මහොත්තම
ඇන් විසින් සව්ඥශාසනයට උපකාර කටයුතුඇයි යන් කරුණාඛ්‍යාස
ඇතිව යථත්පිරිසෙයින් ලක්දිව උපසම්පදා සඞ්ඝයා පස්නමක් පමණ
වත් සුසීලතැන් නැතිසෙයින් රඤ්ඤහුදෙශයෙන් අතිරෙක දශවර්ෂ
සඞ්ඝයා ඉන්වා එකල ශාසන පිළිවෙත් දන්නා සඟනමක් නැතිනි
සාලෙ සිව්බිඹුන්ගේ වශයෙන් ශාසනය විරසථාපීවන කටයුත්තක්
නොකොට ධර්මධර විනයධරකමක් වේවයි සුශීල දුශ්ශීලකමක් වේ
වයි ශාසන ප්‍රතිපත්තිපරීක්ෂාවක් නැතිව ලක්දිව මැතභාගයෙහි පැ
මත ආවාවූ අපිළිවෙත්ම පිළිවෙතැයි සිතා ශ්‍රද්ධාවන්තයන්ගේ පැවි
දිවීමට අවසර නොදී ශාසන පරම්පරාවයයි කියා වරදවා විභාවර්ගම්
භා වැඩිගම් කුඹුරුඇතිතැන් තෙතිස්නමක්පමණ තෝරාගෙණ මහ
වැලිගඟෙහි උදක සීමාවේදී උපසම්පදා කරවා පිණ්ඩපාත භෝජනය
පාංශුකූලචීවරය වෘක්ෂමූල සෙනාසනය අරණ්‍ය ගොමූත්‍රය යන සිව්පස
ය ආශ්‍රයකොට ශ්‍රද්ධාවන්තයන් විසින් නිවන් පිණිස පැවිදිවන් ල්දී
සව්ඥශාසනයෙහි ගම් කුඹුරු නිසා එක්සිය විසිනමක් පමණ සාම
ණේර පැවිදිකරවා රටින් වැඩිය සඞ්ඝයා දෙශාන්තරයවා ඒ විමල්
ධම්සූරියී මහරජානෙ දුනශීලාදී වශයෙන් කුසල් කෙරෙමින් සා
සීඥශාසනයටත් ආධාරව දෙවිසි අවුරුද්දක් දහැමෙන් රාජ්‍යය
කොට පරලෝකප්‍රාප්තවූසේක. ඒ මහරජානන්ගේ ඇවැමෙන්
රජ පැමිණි නරෙන්ද්‍රසිංහ මහරජානන් දවසත් සමහර ශ්‍රද්ධාවන්ත

---

* මේ දෙවෙනි රාජසිංහ රජතුමානෙය.

‡ මේ දෙවෙනි විමලධම්සූරියී රජතුමානෙය.

කීපනමක් හැර අවශේෂතැන් යටකී පරිද්දෙන්ම කුලදූෂණාදී නොයෙක් අනාචාරයෙහි හැසිරෙමින් ගෙපිළිවෙලින් සිඟා වැළඳීම තබා පාත්‍රයෙන් වැළඳීමත් නිත්‍යනකොට හැර ගිහිඇමතියන්සේ බත් පිස්සා පිඟන් ආදියෙන් අනුභවකොට තෙරුන්වහන්සේයයි යන නාම මාත්‍රයක්පමණ පවත්වමින් නොයෙක් නින්දිත කටයුතු කරමින් වසන කල සුවිශුද්ධ ශීලාලඞ්කෘත සරණඞ්කරාභිධාන සඞ්ඝ රාජ ස්ථවිරයන් වහන්සේ පමණක් පූජාවාසනා බලයෙන් ගුරුන් හැර ලක්දිව අන්කිසි කෙනෙක්හි නැතිව පිරිහීනිය නිඝණ්ටු ශබ්දස් ව්‍යාකරණාදී ඵලතයුතු ශාස්ත්‍ර ඉගෙණ ශ්‍රද්ධාවත්ත කීපනමක් සමග සිඟා වළඳමින් පාංශුකූල සිවුරු වලඳිමින් අරණ්‍ය සෙනාසනවල වසමින් සාමණේර භූමියෙහි සිටත් පයත්තිපත්ති ප්‍රතිපත්ති දෙක්හි අප්‍රමාදව වසනසේක් කල්යාමෙන් ලක්දිව එක උපසම්පදා නමකුත් නැතිව හිස්විය ඒ නරෙන්ද්‍රසිංහ මහරජානෝද දළදාමැදිරය ඇතුළුව සමහර සිඛස්ථානවල පුදපවත්වා ප්‍රසාදාවාකුකූල වශයෙන් සම්භරතැන් ගණනක් සාමණේර පැවිදිකරවා සිව්පසයෙන් උපකාරකොට සාවද්‍ය අනවද්‍ය වශයෙන් තෙනිස් ගවුරුදුක් රාජ්‍යය කොට පරලෝකප්‍රාප්තවූ සේක. ඒ රජ්ජුරුවන්ගේ ඇවැමෙන් රාජ්‍යශ්‍රියට පැමිණියාවූ රත්නත්‍රය සරණපරායණවූ සර්ගුණගණාභරණ විභූෂිතවූ සූර්යවංශකුල ප්‍රසූතවූ විජය රාජසිංහ මහරජානෝ අපවැනි ශ්‍රද්ධාවන්ත මහෝත්තමයන් විසින් ලොකශාසනාභිවෘද්ධි වර්ධනය කිරීමෙහි උත්සාහකටයුතුයයි යන කරුණාඛ්‍යාස ඇතිව සඞ්ඝයා පිණිස බොහෝ පඬුරු පාක්කුඩම්හා මහ ඇමතියන් යැවූහ.

එපඬුරුහා මහ ඇමතියන් නැවහා සමග දියෙහි ගැලි මිනිසුන් දෙනෙනාකුහා එක් අමාත්‍යයෙක් පමණක් ගැලවී පසිඟෝදෙශයට ගොස් සඞ්ඝයා දැක තමන් ආපවත් කියා අරණ්‍යවාසී මහාසථවිර කෙණකුන් විසින් දෙනලද කර්මවාක්‍යපොතක් ලබාගෙණ ජීවිතය පමණක් රක්ෂාකොටගෙණ ආශ්චර්ය. ඒ මහරජානෝ නැවතන් නොපසුබටවියහී ඇතිව පඬුරුපාක්කුඩම්හා මහ ඇමතියන් දෙශාන්තර යැවූහ. ඒ අමාත්‍යයෝ බතාවියටගොස් ගෙණගිය පඬුරුපාක්කුඩම් එනිතබා සඞ්ඝයා ඇති නැතිබව පරීක්ෂාකරණු පිණිස සියම් දේශයට ගොස් සඞ්ඝයාදැක සතුටුව නැවත ශ්‍රී සන්හස් හා පඬුරුපාක්කුඩම් ගෙණයන පිණිස බතාවියට ආකල විජයරාජසිංහ මහරජානෝ අට අවුරුදුක් දෙහැමින් රාජ්‍යයකොට පරලෝකප්‍රාප්තවූ සේක. එපවත් අසා මෙකල රජපැමිණි උතුමානන්ට නොදන්වා සඞ්ඝයා වඩා ගෙණයාම සුදුසුනොවෙහි කියා ඕලන්දවාසීහු කී බැවින් කලකිරුනාවූ සිත්ඇතිව ගෙණගිය පඬුරු එහිම තිබියදී නැව් නැගී ලක්දිවඹලා

එන්නාහු බොහෝදෙන චිරාසයට පැමිණ කීපදෙනෙක් පමණක් ඉතිරිවී ආවාහුය.....එසමයෙහි.....

"නාගවම්පක පුණ්ණාග තිණසාලාදි භූසිතෙ
සීතලාදක සම්පූණ්ණ වාපි පල්ලලමාපගෙ
නානාවිහාර ආරාම මෙනියාදිහි මණ්ඩිතෙ
භක්ඛ්‍යසුරථ පත්තාදි නානාජන සමාකුලෙ
සබ්බිස්සරිය සම්පූණ්ණ සෙඩ්ඨණ්ඩ සෙලනාමකෙ
නානාතූරිය සංඝුට්ඨ රමණීයෙ පුරුත්තමෙ
ලඞ්කම්බරමහි විත්ථිණ්ණං නාමසෙනානා අභිතං තමං
උග්ගතෝච්චය ආදිමෙවා මතාමසෙනානා සුජනම්බුජෙ
කිත්තිස්සිරි රාජසීහ භූපාලා ගුණභූසනෙ
රජ්ජං පතෙත්තාසි ලඞ්කායං සකෙකාව තිදසාධිපොති"

බහලාන්ධකාර විධ්වංසනයකොට සියළු පද්මවන්ඩයන් ප්‍රබෝධ කරවමින් නැංගාවූ සූර්‍යමණ්ඩලයසේ ලඞ්කාවිප නැමති ආකාශයෙහි පැතිර පවත්නා පරශතෘ නැමති අන්ධකාර විධ්වංසනය කෙරෙමින් සත්පුරුෂජන නැමති පද්මයන් සතුටුකරවමින් සූර්‍යවංශ නැමති උදයගිරි පර්වතයෙන් උදාවෙමින් ශ්‍රී බුද්ධ වර්ෂයෙන් දෙදාස් දෙසිය අනුවෙනි වර්ෂයහි ලඞ්කාරාජ්‍යශ්‍රී පදප්‍රාප්තවූ පරරාජකිරීට භ්‍රමරනිසේවිත පාදපඞ්කජෝපේතවූ අපගේ කීර්තිශ්‍රී රාජසිංහ රාජෝත්තම නැමති සූර්‍ය්‍ය දිව්‍යරාජතෙම පූර්‍වෝපචිත කුශලානුභාවයෙන් එකවේත්‍ර නංවා අසදෘශ ආඥාගුණ තේජෝබල පරාක්‍රම සමන්විතව විහාරාරාම චෛත්‍යාදී නොයෙක් අලඞ්කාරයෙන් ප්‍රතිමණ්ඩිතවූ සෙන්කඩගල් නම් පුරප්‍රවරයෙහි ශක්‍රදෙවේන්ද්‍ර ලීලාවෙන් රාජ්‍යශ්‍රීවිඳ වසමින් ජිනවර ශ්‍රී දන්තධාතූන් වහන්සේ දිව්‍යරාජයාගේ ඔටුනනාක් වැනිවූ මුකුතාමාණික්‍යාදී නොයෙක් රත්නාකම්මාන්තයෙන් බබලන්නාවූ නොයෙක් දහස්ගණන් අඟනා රන්කරඬුවල වඩා රත්නාභරණ ග්‍රාම ක්ෂෙත්‍ර ගව මහිස ඇත් අශ්ව දාසි දාස දී සවිඤ්ඤාණක අවිඤ්ඤාණක වස්තු පරිත්‍යාග කිරීමෙන්ද ධර්ම්මාශෝක දෙවෙනි පැතිස්සාදී පින්වත් නරේන්ද්‍රයෝ සවා ප්‍රතිපත්තිසාර භික්ෂූන්ගේ සහායයන් ශාසනය පවත්වා ආහෙයින් අපවිසිනුදු සිල්වත් සඟනමක් සහායකොටගණ ශාසනෝපකාර කටයුතුයයි යන පූර්‍වනරවීර වංශානුගත උදාරව්‍යාසඇතිව ධර්ම්මාන්විත ප්‍රතිපත්තී පුරන්දාවූ ඝටකී සරණඞ්කර සාමණේරයන් වහන්සේවූ පුෂ්පාරාම විහාරය කරවා පිළිගන්වා සිවුපසයෙන් උපකාර කෙරෙමින් බණඅසා පොහෝපහවස් වශයෙමින් නිත්‍ය පව් සිලය රකිමින් පූරාතන පටන් මුළුතැන්හට දෙන මෘග සූකරා

දි අමුමාංසත් එපාකොට සියළු සත්වයන්ට අභය දී දසරාජ ධර්මයෙන් රාජ්‍යය කෙරෙමින් විහුමකදළදුම්පිදිරය හා ගඩහාරාම විහාරය කර වා එහි සඞ්ඝයාට සිවුපසය පිණිස ගම් කුඹුරු ආදිය පූජාකිරීමෙන්ද එසේම මහියඞ්ගණ අනුරාධපුරාදී නොයෙක් සිඛාස්ථානවල උදර තරවු පූජා පැවැත්වීමෙන්ද සමන්තකූට පර්වතයෙහි පූජා සත්කාර පිණිස බොහෝදෙනා රැස්වන කාලයෙහි ලාභ සත්කාර පිණිස මි ප්‍රත්‍යාදූනී යාචකයෝ ගොස් සිට ශ්‍රීපාදලඤ්ඡනය හල්ගා සුණුගණ බොහෝ අවැඩ පුරවාගන්නා බව කණිණයුගලයෙහි වැටුනු සෑම යෙහිම කම්පිතවූ චිත්තසන්තාන ඇතිව සපරගමුවබද කුටවාපිටිය ඇතුළුව ගම් කුඹුරු පූජාකෙරෙමින් ශ්‍රීපාදලඤ්ඡනය රුවන්පටකින් වසා ලක්දිව උපසම්පදා කටයුතු සිඛිලීමෙන් සඞ්ඝයා බහුලවූ කල සඞ්ඝරාජ සබාමින්වහන්සේට දන්වා එහි සඞ්ඝයා සිටිනාලෙස සලස්වා සිවුපසයෙන් පූජාසත්කාර පැවැත්වීමෙන් බොහෝ කුසල සම්භාරයන් රැස්කරණසේක් පූජෝපචිත කුසලමහිමයෙන් බෝධි සත්ව භූමියෙහි පිහිටි අප කීර්නිශ්‍රීරාජසිංහ මහරාජෝත්තමයාහෙත් එ ක්තරා පොහෝදිනයෙක උභය විහාරවාසී සාමණේරතැන් ගෙන් වා ඇතුළු රජගෙයිදී වළඳවන්ට ආරම්භව අටපිරිකර කවරදැයි විචාරා පත්තං පරිස්සාවනකායබන්ධනං යන ගාථාවෙන් බණ කී කල අටපිරිකර පමණවත් නැති තමුන්වහන්සේලා කෙරෙහි කවර ගුණයෙක් ඇඳද අටපරිකරමුලටම වදුල පාත්‍රය දැන් කොයිදැයි කියා මතැන්පටන් පාත්‍රයෙන් වළඳන බවක් විනා පිගන් තැටි ආදියෙන් වැළඳු නමක් ඇත්නම් රාජආඥා කෙරෙමි කියා ඉපර නිදහකොට හැරියාවූ පාත්‍රාදෙමින් අද පටන් සඞ්ඝයා විසින් නොනටයුතු නැකත් වෙදකම් යඤ්ඤප්‍රලයාදී නිෂිද්ධ කටයුතු අපවැනි ශ්‍රද්ධාවන්තා මනෝත්තමයන් විසින් සඞ්ඝසාලවා නොකරවියයුතුයයි සඞ්ඝයා විසින් උගතමනා ධර්මය උගතමැනවැයි කියා ආඥාකොට ශාසනාධාර උපසම්පදා සඞ්ඝයා නැතිතෙසින් බුද්ධශාසනයාගේ නොපවැත්ම හේතුකොටගෙණ අපායභාජනවන ලඞ්කාවිපවාසී පශ්චිම ජනතාව කෙරෙහි පැවැති මහත් කරුණාඛ්‍යාස ඇතිව පූර්වනරේශ්වරයන් රාජෝත්තමයන් විසින් පවත්වා ආවාවූ පසාදහසක් පවත්නා සර්ද්ධශාසන යට මාවැනි නරශ්‍රේෂ්ඨයන් විසිනුදු උපකාර කටයුතුයයි කියා පුරාතන මහෝත්තමයන්ගේ පරම්පරානුගත රාජාඥාන උපදවා මා ගේ පුණ්‍යමහත්මතයන් හා ශාසනාභිවෘද්ධිඥානය කිරීමෙහි යම් බලවත් අභිප්‍රායක් ඇත්නම් ඒ චිත්තාභ්‍යාහතරෝත්පන්න කටයුතු වහාම සුවසේ සිඛවේවයි යන කරුණා පූර්ණහෘදයවූ උදරාඛ්‍යාසයෙන් නොපසුබට වීර්‍ය ඇතිව ඇඹැලල්පොල විජයසුන්දර වික්‍රමසිංහ

චන්ද්‍රශේඛර සෙනානායක ජයතිලක පණ්ඩිත මුදලි සේනාපති මහ ඇමතියානන් සහායකොටගෙණ ශ්‍රී සන්හස් හා සමග මාහැඟි පඬු රුපාක්කුඩම් ස්‍යාම්දෙශ සඞ්ඛ්‍යාත සියාම්දෙශයට යවා දෙශයෙන් සඞ්ඝයා වඩිනාතෙක් අපවිසින් අප්‍රමාදවිය යුතුයයි කියා සුවිසුද්ධ ශීලාචාර ගුණඇති සරණඞ්කර සාමණේරයන් වහන්සේ හා යටකී සෙනාපති මහඇමතියන් හා ආමන්ත්‍රණයකොට බුදුසසුන් බබුළුවන බව්ට පූජනීනිමිත්ත පානාසේ රජසිරි ලත් වශියෙනිම වෙළඳුන කෙනෙකුන් හා සමග පසිගෝ දෙශයෙන් සිරිලකට පැමිණි මහතෙරුන් වහන්සේ ලවා බොහෝ කුලදරුවන් සාමණේර පැවිදිකරවා පළමුයි වි දුසිලතැන් ගණනක් ශාසනයෙන් පිටතුකරවා ශ්‍රද්ධාවන්තතැන් වලට සිල්දෙවා සාසනය පිරිසිදු කරමින් නිසණ්ටු ඡන්දස් ව්‍යාකරණ හා ධම්විනය පුරුදුකරවා සාමණේරතැන් ඇතිකරවූහ. එකල දෙශාන්තරගිය ඇමතියෝ බතාවියේ තුබුනු පඬුරු හා ගෙණගිය මාහැඟි වසතු හා ශ්‍රී සන්හස් සමගින් සියාම දෙශය බද අයෝධ්‍යපුරයෙහි රජකරණ රජතුමානන්ට දක්වා ඒ අදිෂ්ටමිත්‍රවූ ධාර්මික මහරජතුමානන් විසින් එවනලද උත්තම ගුණ නුවන ඇති උපාලිසථවිරයන් හා එසේම ගුණගණාඛ්‍යසඞ්ඛත ආර්‍යවංශමුනි මහතෙරුන් වහන්සේ ප්‍රධානකොටඇති අනිරෙකදසවගීය භික්ෂු සඞ්ඝයා වඳින්සේ හා අයෝධ්‍යපුර මහඇමතියෝ ලඞ්කාවිපයෙහි නැති ධම්විනය ශබ්දශාස්ත්‍රාදී පොත්පත් හා නොයෙක් පඬුරු පාක්කුඩම් නෙන්වාගෙණ සිංහල ඇමතියන් හා සමග නැව් නැගී නිරිකුණාමලයට පැමිණි බව අසා දෙලා කුඩ කොඩි සිවුරු පිරිකර ගඳදුම් මල්පහන් ආදී පූජාභාණ්ඩයන්හා මගුලැතු සරහා පඤ්චඞ්ගික තූර්‍ය භාණ්ඩ ගත් නාට්‍ය ගීත වාද්‍යාදියෙහි නියුක්තවූ තූර්‍ය සෙනාවහා ඇහැලේ පොල විජයසුන්දර වික්‍රමසිංහ චන්ද්‍රශේඛර සෙනානායක ජයතිලක පණ්ඩිත මුදලි සෙනාපති මහ ඇමතියන් යවා සමුද්‍රතීරයෙහි පටන් නොයෙක් පූජා පෙළහරින් ධාතු පිළිම පොත්හා මහසඞ්ඝයා වඩාගෙණ අනුක්‍රමයෙන් මහාවාලුක ගංගාසන්නයට පැමිණි කල්හි ශ්‍රී ලඞ්කාධිපති අපගේ කීර්නිශ්‍රීරාජසිංහ මහ රාජෝත්තමයානෝ සර්‍වාභරණයෙන් සැරසී තුරඞ්ගවාහනාරූඪව ශක්‍රදෙවෙන්ද්‍ර ලීලාවෙන් සිවුරඟ සෙනඟ පිරිවරා මහත්වූ රාජානුභාවයෙන් දිලිහි දිලිහී පෙරගමන්කොට අසුපිටින් බැස සඞ්ඝදර්‍ශන සාදුසාම්චි රසාස්වාදයෙන් දෙවෙනි රාජ්‍යයක් ලැබුයේ ඉතා සන්තුෂ්ටව ත්‍රිවිධ රත්නය පෙරදැරිකොට සඞ්කීර්‍යපුර ප්‍රවෙසව අභිනව කරවන ලද පුෂ්පාරාම විහාරය පිළිගන්වා එනි වසන සඞ්ඝයා වහන්සේට සිවිපසයෙන් උපස්ථාන කෙරෙමින් ශ්‍රී බුධ වර්ෂයන් දෙදාස් දෙසිය සඨාතුවෙනි වර්ෂයෙහි

ඇසළමස පුරපසළොස්වක් දිනයෙහි මෙම විහාරමධ්‍යයෙහිවූ පොහෝගෙයිදී පළමුවෙනි උපසම්පදා මඟනල්‍යය සිඳකරවා වස් වැසවූහ. එසේ උපසම්පදා කරවන්නේ ශාසනෝපකාර කිරීමට සහායව සිටි සරණඞ්කර සාමණේරයන් වහන්සේ ලඞ්කාවාසී සියළු සඞ්ඝයා වහන්සේලාට ගුරු ස්ථානයෙහි පිහිටුවා ප්‍රථම දිනයෙහිම උපසම්පදා කරවා දෙශතයන් වැඩිය සඞ්ඝයා හා ලක්දිව් උහය විහාරවාසිවූ මහසඞ්ඝයා මධ්‍යයෙහි රජතුමානෝ ශක්‍රදෙවෙන්ද්‍ර ලීලාවෙන් හිඳ සඞ්ඝයාට ආදර දක්වා සියළු සඞ්ඝයාට වඩා පිණ්ඩපාත ධූතවූතාදී වශයෙන් ශාසනෝපකාර හෙයින් සරණඞ්කර සථවිරයන් වහන්සේ සඞ්ඝරාජ ධුරන්ධරයෙහි පිහිටුවා මුන්වහන්සේගේ අවවාදයෙහි නොපිහිටි කෙනෙක් ඇත්නම් රාජාඥා කෙරෙමිසි කියා සථවිරපදවියෙහි තබා බොහෝදෙනා මහණ මහළු පැවිදි කරවූහ.

"ලඞ්කිස්දං දෙසනත්ථාය අයුජ්ඣපුර රාජිනා
දිනනං පඤ්ඤකංවෙව භික්ඛූ සඞ්ඝඤ්ච ගාහිය
ආගතානං අවිච්චානං කත්වාන බහු සංගහං
තස්ස රාජස්ස දත්වාන මහගඝඤ්ච පඤ්හකං
දත්වා සීහලිකා මූලෙව තථෙව පුඤ්ඤසාසනං
ලඞ්කිස්දු පුන පෙසෙසි අයුජ්ඣපුර මුත්තමනති"

ඉක්බිති සියාම්දෙශ සඞ්ඛ්‍යාත අපෝද්ධ්‍ය සඞ්ඝයා සතර අවුරුදුදක් වැඩසිටුවාගෙණ ග්‍රන්ථවිදර්ශනාධුරචය ඇතුළුව ශාසනපිළිවෙත් මතු බොහෝකලක් පවත්නා පරිද්දෙන් සත්අවුරුද්දක් ගුරුන්ලඟ හික්මවා එකම උපසම්පදා නවකුත් නැතිව තුබූ ලක්දිව දහසක් පමණ භික්ෂුසඞ්ඝයා ඇතිකරවා ශාසනාභිවෘද්ධිය කිරීමෙන් පස්වා දහසක් පවත්නා ශාසනයට ආධාරව සිව්පසයෙන් උපකාර කෙරෙමින් පළමුවෙන් දෙශාගත මහා සඞ්ඝයා මැද සඞ්ඝරාජ ධුරන්ධරයෙහි තබාලූ තමන්ට මෙවෙනි ශාසනෝපකාර කිරීමට සහායව සිටි සංඝරාජ ස්වාමිපාදයන් වහන්සේම මාහිමියකොට පළමුවෙනි උපසම්පදාවෙහි පටන් දෙළොස්වෙනි වෂ්ෂයෙහිවූ ඉල්මස අවදියවකලත් සදුදා ලඞ්කා භික්ෂුසඞ්ඝයා කෙරෙහි පළමුවෙනි උපසම්පදා මංගල්‍යය මහත් උදාරතර පූජාපෙළහර පැවැත්වීමෙන් සිඳකරවා එදවස් පටන් පිළිමවහන්සේ නවක් නෙත් පිහිටවීමත් පොතක් ලියවා නිමවා කිරීමත් උපසම්පදා මංගල්‍යය සිඳකිරීමත් මේ ත්‍රිවිධ කටයුත්තම එකදවසම සිඳකිරීම්වශයෙන් බොහෝ දවසක් නොකඩකොට පවත්වා මව රාජ්‍යය ගිබෙනතෙක් සියලු සඞ්ඝයාම සිව්පසයනිසා වෙහෙසක් නැතිව සුවසේ ධර්ම්වනය සූහුණුකරණ සේක්වයි යන කරුණාව්‍යාසයෙන් සතරමංසඤ්ඤයෙහි පියුම්විලක්සේ සතර දිසින් වඩනා

මහා සංඝයාට රාජභවනයෙහී දන්වැට තබා ගිලන් භික්ෂූන්ට බෙහෙත් පිණිස වැටුප් විගදම් හා බෙහෙත්බඩුදී එක්කෙනෙකුන්ට මිනී සුන් දසදෙනා බැගින් කැපකරුවන් විස්සක් හා වෛද්‍යාචාරීන් දෙ දෙනෙකු සලස්වා සංඝරාජෝත්තමයන්ට උපකාර පිණිස කැපකරු වන් දසදෙනෙකු සලස්වා අනිකුදු කියා නීමවිය නොහැකිපරිද්දෙන් බොහෝ කුශල සම්භාරයන් රැස්කෙරෙමින් මතුමත්තෙහිත් මා විසින් ඇතිකරගත් භික්ෂූන් වහන්සේලා අප්‍රතිපත්ති දුෂ්ප්‍රතිපත්තීන් දුරුව සම්‍යක් ප්‍රතිපත්තියෙහී පිහිටා ශාසනය නිර්මලව පැවැත්වීම විනය පඤ්ඤාපනී මුල්කොටම වන්නේය; එසේ හෙයින් සැමදෙනා ම හන්සේම සමනිසතුටුව විනය පොත් බලා භික්මියයුතුය යි කියා කර ණුලද ආරාධනාවෙන් සංඝරාජ සවාමීන්වහන්සේ ප්‍රධානකොට ඇති උභය විහාරවාසී මහාසංඝයා පුෂ්පාරාම විහාරයට රැස්ව අප්‍රමාද ව දිවා රෑ දෙක්හි අර්ථකථා සහිත විනය පාලිපොත් බලා නිමවා බුද්ධ ශාසනය නිර්මලව පවත්නා සමයෙහි–

සංඝරාජස්ස සිස්සෝ යෝ ථේරෝ සූරෝව පාකටෝ,
සීලාදිගුණසම්පන්නෝ ධම්මරක්ඛිතනාමකෝ.

තස්ස සිස්සේන සඞ්ඝසුණුහුතෙන සාධුනා,
රතනපාලෙන ථේරෙන සද්ධසද්ධාදි මිත්තයෙනා.

ඉන්දජෝතිස්ස ථේරස්ස සඩ්ඪමතිති කාමිතෝ,
ආරාධනං පටිඤ්ඤාය විසුද්ධතථෝදෝව ආදිතෝ,

ආනෙත්වා මූලභාසාය විමානවත්ථු දෙසනා,
විභාස මූල භාසඤ්ච සඛාභාසාය වණ්ණිතා.

තං සුත්වා දානසීලාදි පුඤ්ඤ කම්මං විජානිය,
රතනත්තයගුණෙසුච්ච කත්තබ්බං කුසලං බහූ'නති"

සංඝරාජ සවාමි පාදයන්ගේ ශිෂ්‍යවූ පණ්ඩිත ජනහෘදයානන්ද කරවූ උපොසථාරාම විහාරවාසිවූ නායක ධුරන්ධරයෙහි පිහිටා හිරු මඬලසේ දශදිග පතල කීර්තිශ්‍රී ඇති ධර්මරක්ෂිත සථවිරයන් වහන්සේගේ ශිෂ්‍යවූ මාතුල නම් දනවීවෙහි අස්ගිරි කෝරළය බද වඟුලී ලෙන සම්පයෙහිවූ ගම්මුල්ල නම් පියස ගෘහපති වංශෝද්භූතවූ ජ හඳස් ව්‍යාකරණ නිඝණ්ටු ගණිතාදී නොයෙක් ශාස්ත්‍රයෙහි නිපුණවූ රතනපාල සථවිරයන් වහන්සේ විසින් මහරජතුමන් දෙනලද සිව් පස්ය වළඳමින් පුෂ්පාරාම විහාරයෙහි වසමින් ශ්‍රද්ධාබුද්ධි සම්පන්න ශාසනොදය කාමිවූ ගලඟගදර ඉන්දජෝති තෙරුන් වහන්සේගේ ආ රාධනාව පිළිගෙණ මතු එනදවස පාලිඅර්ථ පෙරළා බණ කීමෙහි අ සමර්ථවූ ශ්‍රද්ධාවන්ත සත්පුරුෂයන්ට වැඩ පිණිස ග්‍රන්ථ එක්සිය පන්

සැත්තැවක් අධිකකොටඇති අටලොස් බණවරකින් හා සැරදුස් අට සිය පන්සැත්ගැවක් ග්‍රන්ථයෙන් හා එක්ලක්ෂ සතළිස් නවදුස් සසිය යක් පමණ අක්ෂර සංඛ්‍යාවක් ඇති මේ එලු විමානවත්ථු ප්‍රකරණය ශ්‍රී ශුභ ශකරාජ වර්ෂයෙන් එක්වාදහස් සසියදයානුවෙනි වර්ෂයෙහි දී ලකාව නිමවනලදී.

දෙවෝ වස්සතු කාලේන සස්සසම්පත්තී හෙතුව,
පීතෝ භවතු ලෝකෝච රාජා භවතු ධම්මිකෝ.

ඉච්ඡිතා පුණ්ණකමෙව යාව බුද්ධා භවාමිහං,
මහාසඩ්ඪෝව ඝනේන ජෝතිසෙට්ඨිව හොගිනා;
වෙස්සන්තරෝව දානෙන හොතු මයම්පි භවාභවේ.

සත්තාසංඛෙය්‍ය කප්පානි මනෝපණිධි පූරිය,
නවාසංඛෙය්‍ය කප්පානි වචීපණිධි පූරිය.

අට්ඨධම්මසමොධානා ලභිත්වා විවරම්පිච,
චතුරාසංඛෙය්‍ය කප්පානි පූරෙත්වා දසපාරමී.

සබ්බඤ්ඤුතරෙ ධම්ම පූරෙත්වා පඨමාභිසම්බුධෝ,
මහාබෝධිමූලෙ නිසිදිත්වා බුද්ධා හෙසුං අනාගතෙ.

කිත්තිනිස්සිරි රාජසීහ රාජාධිරාජ කුලඩ්ඪජෝ,
පසන්නෝ විමානවත්ථුම්හි ධම්මං සුත්වා අනෙකධා.

සඵලා ජීවිතං මය්හං සුලද්ධං වත ජීවිතං,
පිතිපාමොජ්ජවචනං නිච්ඡාරෙන්තා සගාරවෝ.

රජ්ජං වා ධනධඤ්ඤංවා දාතුං නහි පහොනකං,
යමහං සබ්බ දදෙය්‍යාම් කෝ අඤ්ඤෝ තව තෙනසී.

රජ්ජං පත්තෝ යෙව මයා කතපුඤ්ඤං දදම්මත,
එවං වක්ඛාථ විඤ්ඤූසි සාසනස්සිති කාරණං.

වුසිත්වා ජනපදෙ යසළිං විහාරෙ ඒදිසෝ යති,
භික්ඛූනං සාමණෙරානං සම්මාසම්බුද්ධ දෙසිතං.

සික්ඛාමපය්‍ය ධුවං ධම්මං චිරං තිට්ඨති සාසනං,
චතුසංගාරලද්ධම්හි භූතන නාතරවාහයෙ.

විහාරං සහ ගඛත්තනි පඤ්චදසම්බණෙහිව,
අපරම්පි තනිං රම්ම ගාමෙ සිංහල නාමකෙ.

සත්තමම්මණෙහි ගඛත්තනි විහාරඤ්ච අදාසි මෙ,
කප්පිය පච්චයඤ්ඤාය උභෝ ලොකෙ පරිග්ගහි'ති.

සිරි සඞ්ඝ බෝ.

ප්‍රථම සතු ප්‍රකරණය.

නමොතස්ස භගවතො අරහතො
සම්මා සම්බුද්ධස්ස.

වන්දෙ ලොකුත්තමං වීරං බුද්ධං සද්ධම්ම නිම්මිතං,
භවාභව කරං ධම්මං සංඝං චාපි නිරඟනං.

ශ්‍රීමත් පාදපද්මතෝල්ලසිතවූ සොතාපුල්ල විසාලසාල වෘක්ෂරාජ යක්ෂේ ප්‍රතිඝ්‍යත පාදලක්ෂණාදි මහා පුරුෂලක්ෂණාභූ රඤ්ජිත දෙහශ්‍රියෙන්හා භුවනත්‍රය වාසි සකල සත්ත්වගීයාගේ අභිමතාර්ථ සිද්ධිකර චින්තාමාණික්‍ය රත්නායක්ෂේද සප්තික මාණික්‍ය බුත්වු ලයක්ෂේද, ලලාටඅස්ථලයෙහි විරාජමාන ඌර්ණරොම මණ්ඩල යෙන් හා හතමප්‍රභාකේතු මාලාලඞ්කාරොතතුහ තරඟාවලින් විභූෂිතොත්තම උත්තමාඟයෙන් සශ්‍රීකවූ, සම්භාවර මන්තාවාර ණකුම්භ ව්දූරණ කේසරිතු භූත ජිතේන්ද්‍රවූ බුදුරජානන්වහන්සේ ඇතුළුව රත්නත්‍රය විසයෙහි පවත්වනලද ප්‍රකරණාරම්භයෙහි විශිෂ්ටවූ ඉෂ්ටදෙවතා නමස්කාරයෙන් ජනිතවූ ප්‍රණම පුණ්‍ය සමභාරොපඝාත සකලොපද්‍රව සකලානතරා ඇතිව ඓහලෞකික පාරලෞකිකාභි වෘද්ධඝක ප්‍රකරණයක් කරණු කැමති මා විසින්

අනතරාය විඝා තඤ්ඤං මඞ්ගලාදි නිමිත්තය
තෙසං ගතිනා මාරම්භෙ ප නාමාදිනි වුච්චරෙ, යි.

යන මෙහි ප්‍රණමානිසංස නිදහසින්

ප්‍රඥාරය, තණ්ඩය, උද්දීඝය, ලඝුක්‍රියාය, වෘත්තසංඛ්‍යය, අධියෝගය, යන ෂට්විධ ප්‍රකාරයෙනින් සමලංකෘතවූ, ජිනෙන්ද්‍රලක්ෂණ ණිවානනගීහන්වූ, ඒ කාණ්ඩරයෙහි පවත් සවිසිවන අක්ෂරය දක්වා නාම ප්‍රභෙදයෙන් දක්නලද උක්තාය අති උක්තාය, මධ්‍යය, ප්‍රතිට්ඨාය, සුප්‍රතිට්ඨාය, ගායත්‍රිය, උෂ්ණිය, අනුෂ්ටුභය, බෘහතිය, පගතිය, අතිජගතිය, සක්වරිය, අතිසක්වරිය, අෂ්ටි, අත්‍යෂ්ටිය, ධෘතිය, අතිධෘතිය, ක්‍රෘතිය, ප්‍රක්‍රෘතිය, ආක්‍රෘතියයි යනාදී ඡන්දස් අතුරෙන් ප්‍රඥාරයට ආයාම විත්තරයෙන් තුන්දහස් අටසිය සතළිස් අඟුලක්ප්‍රමාණ භූමිප්‍රදේශයක් ඇති, සවිගුරුවෘත්තා එකකින් හා එකක්ලඝු සතක්ගුරුවෘත්ත අටකින් හා, දෙකක් ලඝු සයක් ගුරුවෘත්තා විසිඅටකින්ද තුණක්ලඝු පසක් ගුරුවෘත්ත පනස්

සඤ්ඤින් හා, සතරක් ලඝු සතරක් ගුරුවෘත්ති සැත්තැවකින් හා, පසක් ලඝු තුණක් ගුරුවෘත්ත පණස්සයකිහු, සයක් ලඝු දෙනක් ගුරුවෘත්ත විසිඅටකින් හා, සතක් ලඝු එකක් ගුරුවෘත්ත අවයින් හා, සවිලඝු වෘත්ත එකනින්දෑයි මෙසේ දෙසිය පණහ් සූයක් වෘත්තසංඛ්‍යාවකින් උපලක්ෂිතවූ අක්ඛොභ්‍යාක්ෂර ප්‍රතිමණ්ඩිත් අනුෂ්ටුභ් ඡන්දසින් සතොළොස්වනතැනින් පළමුවනපදය ද අසූ එක්වෙනි තැනින් දෙවන පදයහා, තිස්වෙනි තැනින් තුන්වන පදයහා, අසූනවවන තැනින් සතරවන පදයහා, මෙසේ සතර තැනකින් පදසතර උගුළුවාගෙණ සිවුපණසක් මාත්‍රාවලින් හා ගුරුදෙවිස්සකින් හා, ලඝුදසයකින් හා, අවගීතාක්ෂර දසයකින් හා, වඤ්ඣාක්ෂර දෙවිසකින් හා, අක්ඛොභ්‍යාක්ෂර සතකින් හා, ඛොභ්‍යාක්ෂර පස්විසකින් හා, කණ්ඨජාක්ෂර සතරකින් හා, තාළුජාක්ෂර එකතිහ ඕෂ්ඨ්‍යාක්ෂර අටකින්හා මූර්ධජාක්ෂර සතරතිහ, දන්ත්‍යාක්ෂර දසයකින් හා දන්ත්‍යෝෂ්ඨ්‍ය ජාක්ෂර සතරකින්දෑයි මෙසේ දෙතිස් අක්ෂරයකින් මිශ්‍රවූ මෙගාථාවෙන්—

බුද්ධො සබ්බඤ්ඤුතඤාණං ධම්මෝ ලොකුත්තරොනච
සංඝෝ මඟ්ග ඵලවෙඨා ච ඉච්චෙතං රතනත්තයං, යි·

යන මේ ගාථාවෙහි දක්වනලද රතනත්‍රය අතුරෙන්ද,

සොසාගරෙ ජලධිකං රුධිරං අදාසි
භූමින් පරාජි යසමං සමදාසි දානං,
මෙරූපමාන මධිකංච සමොලි සිසං
ඛෙත්තාරකාධික තරං නයනං අදාසී—

මෙසේ යම් විරපුරුෂොත්තමයෙක් තෙම මෙයට සාරාසංඛ්‍ය කප්ලක්ෂයනින් මත්තෙහි දසදහසත් ගොදුන්වූ ජම්බුද්වීප තලයෙහි අසම්විතරින් දෙලොස් ගොදුනක් පමණවූ භාත්පස්හි නිස් ගොදුනක්වූ සියලු පුණ්‍යභිලාෂීන්ට වාසස්ථානවූ ඉතාම අධික සම්පත්තියෙන් හරිත හෙයින් ඒ සම්පත් උසුලන්ට නොහැකිව දිව්‍යලොකයෙන් ගිලිහි පෘථිවියෙහි පිහිටියාක් මෙන් විශෙෂයෙන් සියලු සම්පත්තියෙන් සමෘද්ධවූ ප්‍රචරවූ අමරනම් නුවර රාජ්‍යකරණණාවූ රජහට පොරොහිත තනතුරට පැමිණියාවූ මාතෘ පිතෘ සංඛ්‍යාත උභයපක්ෂයෙන් පිරිසිදුවූ ජාතයෑනි විශෙෂයෙන් පරිශුද්ධවූ ප්‍රතිසන්ධිග්‍රහණයෑනි, සත්කුලපරම්පරාව දක්ව නිසිවෙකු විසින් පිළිකුල් කොට හැරනොදමන ලදැවූ සියලු සම්පත්තියෙන් ආඪ්‍යවූ මහත් ධනහා මහත් හොගයන් ඇත්තා

බොහෝ ධනධාන්‍යයන් ඇතිතාවූ නොයෙක් දහස්ගණන් බ්‍රාහ්ම
ණයින්ට ප්‍රධාණවූ සියලු තැන්හි ප්‍රසිද්ධවූ රත්න් විසින් පූදනලදුවූ
පොරොහිත බ්‍රාහ්මණ යාහට පුත්‍රව ඉපිද සුමේධ කුමාරයෝ යයි
යන නාමය ඇතිව විශිෂ්ටවූ රූපසම්පත්තියෙන් හා උතුම්වූ,
වර්ණ සෞඳුර්‍යයෙන් යුක්තව අමර නම් නුවර නගණලද රණ්
තොරණක්සේ දිලිහෙමින් සිට ත්‍රිවේදයෙහි පරතෙරට පැමිණ
වැඩිවයට ප්‍රාප්තවාල්හි ඒව් පියන්ගේ අවැමෙන්ලත් අප්‍රමාණ
ධනරාශිය දුගී මගී යාචකාදීන්ට කැමතිසේ ගන්නට රත්න ග
බඩාවල දෙරවල් හැරදමා, ඉපදීම් රහිතවූ, වෘධ්‍රරහිතවූ, මරණ
රහිතවූ, අසඞ්ඛතවූ, සුඛවූ, සීතලවූ, ක්ෂේමවූ, නිත්‍යවූ, ධ්‍රැවවූ,
ශාස්වතාවූ, සාරවූ, පරමවූ, ශුභවූ, මදනම්මදනයකරන්නාවූ, කෙ
ලෙස් ප්‍රපාසනසන්නාවූ, විවිධූපචේදකවූ, සංඛාර විගතවූ, තෘ
ෂ්ණාක්ෂයවූ, විභවවූ, විරාගවූ, නිරොධවූ, අනිමිත්තවූ, ශාන්තවූ,
අතෘතවූ, අසඛ්‍යයකරවූ, අමෘතමහා නිර්වාණය සොයම් යන
සිතින් ගෘහවාසය හැර ගොස් ඍෂී ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිද්ව පවා
භිඤු අෂ්ටසමාපත්ති උපදවා ධ්‍යානසුවයෙන් වාසයකරණ කල්
හි, එවකුට ලොවපහළවී වදුළ ලොවට ක්ෂේමකරවූ, දීපඞ්කර
සම්බුදුරජාණන්වහන්සේ කෙරෙන් ලබන්ට හැකිවූ අතිශ්‍රේෂ්ඨ සංසාර
ගත සත්ත්වයන්කෙරෙහි මහාකරුණාවෙන් හැරදමා බුඩඞ්ගයට
පැමිණීම පිණිස දීපඞ්කර බුදුරජාණන්වහන්සේ විසින් දෙනලද
නියත විවරණය ඇතිව එහිම සිට සම්‍යක්සම්බොධිඥානය සිඛ
කරදෙන බුඩකාරක ධර්මයන් බලාවදුරණසේක්, දානපාරමිතාව
පටන් පිළිවෙලින් දසපාරමිතා ධර්මයන් දැකවදුරා ද්‍රඪඞ්කර නම්
බුදුරජාණන්වහන්සේට ඉක්බිත්තෙන් ලොවපහළවී වදුළ කොඞ
ඤ්ඤබුදුරජාණන් වහන්සේ සම්පත්තියෙන්ද නියත විවරණලැබ,
ඉන්පසු ලොවපහළවූ සුමඞ්ගලඍ, සුමනඍ, රේවතඍ, සොභිතඍ,
අනොමදස්සීඍ, පදුමඍ, නාරදඍ, පදුමුත්තරඍ, සුමේධඍ, සුජාතා
ඍ, ප්‍රියදස්සීඍ, අත්‍රදස්සීඍ, ධම්මදස්සීඍ, සිද්ධත්ථඍ, තිස්සඍ,
පුස්සඍ, විපස්සීඍ, සිඛීඍ, වෙස්සභුඍ, කකුසන්ධඍ, කොනාගමඍ, කාස්‍ය
පඍ, යන මේ සුවිසි බුදුවරයන් ලහින් නියතවිවරණලබා ප්‍රථම
කොට දානපාරමිතාව මස්තකප්‍රාප්තකරණසේක්, අකිත්ති බ්‍රාහ්ම
ණ කාලයෙහිද සංඛබ්‍රාහ්මණ කාලයෙහිද, ධනඤ්ඤ රජකාලයෙ
හිද, නම්මාජ්ජකාලයෙහිද, චන්දකුමාර කාලයෙහිද, විස්සාසිද්ධූ
කාලයෙහිද, සිවිරාජ කාලයෙහිද, මහාසුදස්සන කාලයෙහිද, මහා
ගොවිඤ්ඤ කාලයෙහිද, වේලාම බ්‍රාහ්මණ කාලයෙහිද, වෙස්සන්තර
රාජ කාලයෙහිද, බාහිරවස්තු දන්දීමෙන් දානපාරමිතාව හා

කන් නාසා අත පය ආදි අඟ ප්‍රත්‍යඟයන් දන්දීමෙන් දැන උප පාරමිතාව හා සසඳුතකයෙහිදී ජීවිතය දන්දීමෙන් දැනපර මාණ්ඩ පාරමිතාවද මස්තකප්‍රාප්ත කෙරීමෙන් හා නැවත භූරි දත්ත නාගරාජ කාලයෙහිද, සිලවරාජ කාලයෙහිද, චම්පෙය්‍ය නාගරාජ කාලයෙහිද, ඡද්දන්ත හස්තිරාජ කාලයෙහිද, ජයද්දිසරාජ කාලයෙහිද, අලීනසත්තු කුමාර කාලයෙහිද, බාහිර වස්තු නිසා සීලභේද කරනොගනිමින් සීලපාරමිතාව හා අඟ ප්‍රත්‍යඟයන් නිසා සීලභේදයට නොපැමිණීමෙන් සීල උප පාරමිතාව හා ජීවිතය නිසා සීලභේදකර නොගැණීමෙන් සීල සංරක්ෂණය කෙරීමෙන් සඬඛපාල ජාතකයෙහිදී සීලපරමාර්ථ පාරමිතාවද මස්තකප්‍රාප්තකෙරීමෙන් හා සොමනස්ස කුමාර කාලයෙහිද, හත්ථිපාල ජාතකයෙහිද, ඡෝතිපාලජාතකයෙහිද, අයෝඝර ජාතකයෙහිද, රාජ්‍ය ආදි බාහිර වස්තු හැරදමා මහණවීමෙන් නෛෂ්ක්‍රම්‍ය පාරමිතාව හා, අඟ ප්‍රත්‍යඟයන් නොසලකා මහණවීමෙන් නෛෂ්ක්‍රම්‍ය උපපාරමිතාව හා චූල සුතසෝම ජාතකයෙහිදී ජීවිතයත් නොසලකා මහණවීමෙන් නෛෂ්ක්‍රම්‍ය පරමාර්ථ පාරමිතාවද, මස්තකප්‍රාප්තකෙරීමෙන් හා නැවත විධුර පණ්ඩිත කාලයෙහිද, මහා ගෝවිඳ පණ්ඩිත කාලයෙහිද, කුඤ්ඣල පණ්ඩිත කාලයෙහිද, අරක පණ්ඩිත කාලයෙහිද, බෝධි පරිබ්‍රාජක කාලයෙහිද, මහොසධ පණ්ඩිත කාලයෙහිද, සත්තුභස්ත කාලයෙහිද, ප්‍රඥාවන්තයින්ව බාහිරවස්තු පූජාකරමින් ප්‍රඥාප්‍රතිපදාව පිරීමෙන් ප්‍රඥාපාරමිතාවහා, කන් නාසාදී අඟ ප්‍රත්‍යඟයන් පූජාකෙරීමෙන් ප්‍රඥා ප්‍රතිපදාව පුරමින් ප්‍රඥා උපපාරමිතාව හා, සේනක පණ්ඩිත කාලයෙහි හා දඹ්සොඬ කාලයෙහිද ජීවිතය පූජා කෙරීමෙන් ප්‍රඥා ප්‍රතිපදාව පුරමින් ප්‍රඥා පරමාර්ථ පාරමිතාවද, මස්තකප්‍රාප්තකෙරීමෙන් හා අප්‍රමාණ ආත්මභාව වල්හි වීර්‍ය්‍ය පාරමිතාව පුරන්නේ බාහිරවස්තු නිසා ප්‍රධාන්වීර්‍ය්‍ය නොහරිමින් වීර්‍ය්‍ය කෙරීමෙන් වීර්‍ය්‍ය පාරමිතාව හා, ශරීරයෙහි අඟ ප්‍රත්‍යඟයන් නිසා ප්‍රධාන් වීර්‍ය්‍ය අත්නොහැර වීර්‍ය්‍ය කෙරීමෙන් වීර්‍ය්‍ය උප පාරමිතාවහා මහාජනක ජාතකයෙහිදී ජීවිතය නිසා ප්‍රධාන් වීර්‍ය්‍ය අත්නොහැර වීර්‍ය්‍ය කෙරීමෙන් වීර්‍ය්‍ය පරමාර්ථ පාරමිතාවද මස්තකප්‍රාප්ත කෙරීමෙන් හා, මෙසේම අප්‍රමාණ ජාතිවල බාහිර වස්තු නිසා ක්ෂාන්තිය අත්නොහැර රැකීමෙන් ක්ෂාන්ති පාරමිතාව හා, ශරීරයෙහි අඟ ප්‍රත්‍යඟයන් නිසා ක්ෂාන්තිය අත්නොහැර රැකීමෙන් ක්ෂාන්ති උපපාරමිතාවහා ක්ෂාන්තිවාදී ජාතකයෙහිදී ජීවිතයනොසලකා ක්ෂාන්තිය රැකීමෙන් ක්ෂාන්ති පරමාර්ථ පාරමිතාවද මස්තකප්‍රාප්තකෙරීමෙන් හා නැවත අනන්ත

ජාතිවල බාහිර වසතු නිසා බොරුනොකියා සත්‍යවචනයම් කී මෙන් සත්‍යපාරමිතාව හා, අභ ප්‍රත්‍යහයන් නිසා බොරුනොකියා සත්‍ය වචනයම කිමෙන් සත්‍ය උපපාරමිතාව හා, ජීවිතය රැක ගැන්ම පිණිස බොරුනොකියා සත්‍යවචනයම් කී මෙන් ඉහා සු තසොම ජාතකයෙහිදී සත්‍යපරමැති පාරමිතාවද මසතකප්‍රාප්ත කෙරීමෙන් හා තවද අනන්නජාතිවල තමන් අධිෂ්ඨානකර ගත් වෘතසමාදුනය බාහිරවසතු නිසා අත්නොහැර පැවැත්වී මෙන් අධිෂ්ඨාන පාරමිතාව හා, තමන් අධිෂ්ඨාන කරගත් වුත සමාදුනය අභප්‍රත්‍යහයන් රැකගැණීම පිණිස අත්නොහැර පැවැත්වි මෙන් අධිෂ්ඨාන උපපාරමිතාව හා, මුගපකඛජාතක යෙහිදී අධිෂ්ඨාන වෘතසමාදුනය ජීවිතය රැකගැනීම පිණිස අත් නොහැර පැවැත්විමෙන් අධිෂ්ඨාන පරමැති පාරමිතාවද මසතකප්‍රාප්ත කෙරීමෙන් හා එසේම අනන්න ජාතිවල තමන් පවතවන්නාවූ මෛත්‍රිචිත්තය බාහිර වසතු නිසා අත්නොහැර පැවැත්විමෙන් මෛත්‍රි පාරමිතාව හා, මෛත්‍රි චිත්තය අභප්‍රත්‍යහ යන් රැකගැනීම පිණිස අත්නොහැර පැවැත්විමෙන් මෛත්‍රි උපපාරමිතාව හා, ඒක රාජ ජාතකයෙහිදී තමන් පවත්වන මෛත්‍රි චිත්තය ජීවිතය නිසා අත්නොහැර පැවැත්විමෙන් මෛ ත්‍රි පරමැති පාරමිතාවද මසතකප්‍රාප්ත කෙරීමෙන්හා එසේම අනන්න ජාතිවල ඉෂ්ටානිෂ්ටයෙහි සිතමඩ්‍යසතකරගැණීම් සඩ්ඛත උපෙක්ෂා පාරමිතාව පුරන්නේ බාහිර වසතු නිසා උපෙක්ෂාව කඩනොකර පැවැත්විමෙන් උපෙක්ෂා පාරමිතාවහා, අභ ප්‍රත්‍යහ යන් රැකගැනීම පිණිස උපෙක්ෂාව අත්නොහැර පැවත්විමෙන් උපෙක්ෂා උපපාරමිතාව හා, ජීවිතයත් නොසලකා උපෙක්ෂාව පිරීමෙන් ලොමහංස ජාතකයෙහිදී උපෙක්ෂා පරමැතිපාරමිතාවද මසතකප්‍රාප්ත කෙරීමෙන් හා මේහි සංක්ෂෙපයෙන් පාරමිතා වන් දැක්වූයේවි නමුත් චරියා පිටකයෙහි විස්තර වසයෙන් විභාග කොට ඇත්තේය

මෙසේ සමන්ත්‍රින් සත්පාරමී ධම්මයන් පුරමින් සුවාසූදහසක් යොදුන් ගැඹුරැති සිරෙමහා සාගරයෙහි ජලඝටන් වඩා සඩ්කිය ශරීරයෙහි ලේ දන්දීමෙන් හා දෙලක්ෂ සතළිස් දහසක් යොදුන් සනවූ ඉහා පෘථිවියෙහි පස් පරඝන තරමෙන් ශරීර මාංශ දන් දීමෙන් හා කපාදුන්නාවූ ඔටුතුපලන් හිස් එකතු කොට ගොඩ කළේවී නම් එක්ලක්ෂ අටසැට දහසක් යොදුන් උස ඇති මහ මෙර පර්වතයටත් වඩා අධිකතර මෙන් ඔටුතු පලන් හිස්දන්දී

මෙන් සා, අහසේ තාරකාවලටත් වැඩිව ඇස් උපුවා දන්දීමෙතු සමන්ත්‍රීන් යත් පාරමිතාවන් පුරා වෙස්සන්තරාත්මයෙහි ඉපිද සත්වරක් පොළොවවෙවුල්වා සපත්සතික මහදන්දී එසින් චුතව ගොස් තුසිපුර පැමිණ දිව්‍යසම්පත් අනුභවකරමින් වැඩසිටින කලහි, දසදහසක් සතවලෙහි දෙවිබඹුන් රැස්ව

කාලෝ ඛංතෙ මහාවීර උපපජ්ජාතු කුච්ඡි ඛං,
සදෙවකන්තාර ඛනෙතා බුජ්ඣිඛසු අමතං පදං ඛී

යනාදීන් දෙවිබඹුන් විසින් කරණලද ආරාධනාව පිළිගෙණ නැවත කාලදීප දේසකුල ජනෙත්‍රී ආයු පරිවේජදය යන පව මහා විලොකනය කොට තුසිපුරෙන් අවුත් මනුෂ්‍ය ලෝකයෙහි, ඔක්කාක රාජවංසයෙන් අඛණ්ඩව ආගෙයින් උහතෝ සුජි ආති විසුඛවූ ප්‍රසිඛ රාජවංසයෙහි උපන් සුඛොදන මහරජහු නිසා මහමායාදේවියගේ කුස පිළිසිඳගෙණ දසඑකඛමස් ඇවැමෙන් වලාකුලකින් නික්මෙන සෝඛසකලා පරිපූර්ණවූ සතළිස් නාව යොදුන් චන්ද බිම්බයසේ මුළුලොව ඒකාලෝක කරමින් මාතෘ කුක්ෂියෙන් ඛහිනිෂ්ක්‍රමනය්ව, සුසැටකලා ශිල්පයෙහි පරතෙරට පැමිණ වැඩිවිය පැමුණුනු කල්හි, හෙමන්ත ගිම්හාන, වස්සානයා යන සෘතුත්‍රයට යොග්‍යවූ, රම්මය, සුරම්මය, සුභයයි යන උතුම් ප්‍රාසාදත්‍රයෙහි යසෝදරාදේවීන් ප්‍රධානවූ, සුරගනන් බදු සතළිස් දහසක් වරඟනන් විසින් පිරිවරණ ලදුව දිව්‍යසම්පතක් සා එකාකාරවූ රාජ්‍යසම්පත් අනුභවකරණ කල්හි ජරාවක්ඛි මෘතසඛ්ඛ නවූ තුන් පුවතිමිති දර්ශනය කොට, සසරෙහි ආදීනව සැලති සට ගත් සංවේග ඇතිව නැවත සන්සුත් ඉරියවු ඇතිව පෙරමගට පැමිණි ප්‍රවෘජිත රූපයදැක තුටුපහටු සිත් ඇතිව උදුනක්‍රීඩා කොට නුවරට අවුත් ඡන්නනම් අමාත්‍යයාලවා ශ්‍රීවයෙහි පවත් අවලොස් රියනක් සා රට සැහෙන උසද ඇත්තාවූ සුඛොතසංඛ යක්සේ සවිහ ධවලවූ කවුඛ්ඛිසවැනි සිසැති කන්ථක නම් අශ්ව රාජයා සරසා ගෙන්වා, සුරගනන්වැනි සුරගනන් සා දිව්‍යරාජ්‍යය සා සදෘස රාජ්‍යසම්පත්ද අඵයමක්ඛිපා කෙලපිඬක් පමණවත් නොසලකා හැරදම්මින්, කණ්ඨකනම් අශ්වයා පිටට පැනනැඟි, ඡන්නයා ලවා වාලදියගන්වා අඩ රාත්‍රියෙහි අභිනිෂ්ක්‍රමණයට දෙවියන් විසින් සර්ණලද තුවරදොරින් පිටත්ව යනකල්හි, නොයවයි සිඛාඡිකුමාරය මෙසින් සත්වෙනි දිනයෙහි, නොපට චක්‍ර වර්ත්තිරාජ්‍යය ලැබෙයි නොයව නොයවයි කියා වලක්වනලද

වසවත්තී මාරයාගේ වචනයත් නොගෙණ හැරදමා ඇසලමස පෞර්ණමියහා උත්‍රාසලේ නැකතලත් සිතුරාදුදවස අර්ධරාත්‍රියේ ලෙහි "අභිනිස්ක්‍රමණය" ප්‍රණිස පිටත්ව යමින් නිස්යොදුන් මග ගෙවා ගොස් අනොමානම් ගංතෙරට පැමිණ ඇටිකාරතම් මහා බ්‍රහ්මයා විසින් දෙනලද අෂ්ටපරිස්කාරය හැරගෙණ, දුවැජ්ජිත භාවයට පැමිණ එතැන් පටන් සා අවුරුද්දක් මුළුල්ලෙහි දුස්කර ක්‍රියා කොට සත්වෙනි වරුෂයෙහිදී, සෙනානි නම් නියඹගම බොහෝ පාරොහයෙන් හා සාඛාවිට පාදයෙන්ද සම්ලඛිතවූ න්‍යග්‍රෝධ මූලයෙහිදී, රන්වැලියෙන් හොණවිත් සුජාතාව එසින් දෙනලද කිරිබත පළිගෙණ වලඳා, ඉක්බිති රන්වැලිය උඩුගව් බලා යන පිණිස ගඟටලා විසාඛ පෞර්ණමියලත බුදු දින සවස් වේලෙහි, සොත්තිය නම් බ්‍රාහ්මණයා විසින් දෙනලද කුසතෘණ අටමිට හැරගෙණ බොධිදුම මුලයට වැඩ එහි දක්ෂිණ පශ්චිම මොත්තාර දිසාවන් විමසා බලමින් ඒ තුන්දිසාවෙහි පෘථිව්‍යය කම්පාවී සිටිකල්හි, නැවත පුර්වදිසාවට වැඩ එහි නිශ්චලව සිටිහුම්පුදෙශයෙන්, දෙලොස්රියන් ශරීරයෙන් යුක්තවූ උත්වහන්ශ්‍රේෂ්ඨ කෙලෙස්නැසීමට යෝග්‍යව පැනනැගාවූ තුදුස්රියන් විප්‍රාසනා රුචිව චතුර්විධවිත්‍රාබිඥානයෙන් දුමෙනුයාහට පටදී වැඩහුන් කල්හී, සාරාසඛ්‍යකප්ලක්ෂයක් මුළුල්ලෙහි අස් දස් මස් ලේ දන්දිමෙන් බුඩත්වය ප්‍රාර්ථනාකරම්න් සමත්තිංසත් පාරමී ධර්මයන් පුරා මහාකප්‍රාපතාකොට බුඩත්වලාබීම පිණිස විප්‍රාසනා රුචිව වැඩහුන් කෙතෙහි, ර්ව අන්තරා කරණ ප්‍රණිස, දසඛ්විධ රක් මාරසෙනඟ පිරිවරා, ගෙලසියගක්ගවූ උසැති ගිරිමෙඛලා නම් හස්තියා පිටට පැනනැගි අවුත් විප්‍රාසනාය ප්‍රණිස තමන් වහන්සේ හා සමඟ යුඩකරමින් ගිනිගෙණ දිලිහෙන ඉතා භයන්කරවූ ගල්වර්ෂාවය, එසේම ගිනිගෙණ දිලිහෙන බොරළු වර්ෂාවය, එසේම ගිනි බුර බුරා දැල්වෙන්නාවූ ඉතා තීක්ෂණවූ මුවහත් ධාරා ඇති සත්ති තෝමරාදි ආයුධ වර්ෂාවය, දුම්පමණවත් නැතිව ගින්නෙන්ම දිලිහෙන්නාවූ ඉතා භයඩකරවූ ගිනිඅහුරු වර්ෂාවය, ඉතා රත්වූ ගිනිමෙන් තෙජස් ඇත්තාවූ අතිභයංකාරවූ අඵවර්ෂාවය, එසේම දුම්නගිමින් ගිනිගෙණ දිලිහෙමින් පවත්නා ඉතා කක්ෂයවූ වැලිවර්ෂාවය, එසේම රත්වූ කැල් වර්ෂාවයයි, යනාදී නව විධ වර්ෂාවක් වස්වමින් තමන් නැසීමට උත්සාහකළ වසවර්ත්ති මාරයා හා සමඟ මාරපරිසත් පරාජයට පමුණුවමින් එලවා සූයස්තමන්ගතව, දසපැයක් යන අතර පුර්වනිවාසානුසතිඥාණය හා, විසිපැයක් යන අතර නොහොත් මධ්‍යමයාමයෙහි දිව්‍යඥ

එක් සමයෙක්හි සමස්ත ජගධාර පරමාණු සාරභූත ගුණ ගණ කම්මනිම්මිත නිම්මල ලලිත කුසුම්භාංඝ්‍රි භ්‍රාජිත ධම්මකාය ඇති භගවත් අර්හත් සම්‍යක් සම්බුද්ධ යම්හෑ රාජෝත්තමයාන් වහන්සේ ඉසිගිලි වෙහෙර වේ පුලුලපාණ්ඩව ගිජ්ඣකූටය යන පර්වත පසුතින් සමලඬ්කෘතවූ මහාගොව්හැදී නරෙන්ද්‍රයන්ට වාසස්ථානවූ හෙයින් රාජගෘහනම්ලද මෙම රජගහනුවර සම්ප යෙහිවූ නිල්මේඝ වලාවක්සේ ඉතා නිලොහාසවූ ඝනවනයෙන් පරික්ෂිප්ත හෙයින් වේළුවන නාම්ලද ලෙහෙනුන්ට බත් වැට්ප්‍ර දුන් හෙයින් කලන්දක නිවාප නම්වූ වේළුවනාරාමයෙහි වැඩ වාසයකර වදාරණසේක්-එකල්හි රජගහනුවර සියලු සම්ප තින් ආඪ්‍යවූ මහ ධන ඇති මහභොගයන් හා බොහෝ වස්තුහා උපකරණහා රැස්කරණලද නොයෙක් කෙලගණන් ධන ඇති එක්තරා සිටානත්කෙනෙක්වූහ මහා ධන සම්පන්න බැවින් ඕ හට මහ ධන සිටානෝයයි නම්විය, එකල ඕහට එකම පුත්‍රයෙක් වූහ ප්‍රියය, මනාපය, උත්තුවණැති බවට පැමිණිකල්හි මව්පිය දෙදෙන මෙසේ සිතුවාහ අපගේ පුත්‍රයාහට දවස්පතා දහස දහස වියදම්කරණ කල්හි හවුරුදු සියයකින් නමුදු මේධනරාසිය නොගෙවෙයි සිලප්‍රගෙණීම මෝහට මිරිකිමය, එහෙයින් කළාන්තනොව කායචිත්තායඇතිව සුවසේ වසතුපරිභොග කෙරෙ වයි සිතා සිලපනොසිඟැන්වූහ. වයස්පැමිණියාහට වනාහි කුල යෙන්හා රූපයෞවන විලාසයෙන් සමන්විතවූ පවකාමයට යොමුවූ ධම්මසංඥාව විමුකවූ සිත් ඇති ස්ත්‍රියක් ගෙනාවාහුය: ඒ සිටුපුත්‍ර ඇ හා සමග අභිරමනයවෙමින් දහම්හි සිත් පමණ වත් නුපදවා ශ්‍රමණ බ්‍රාහ්මණයන් හා ගුරු දෙමව්පියන් කෙරෙ හිත් ආදරනැතිව ඥාතිජනයන් විසින් පිරිවරණලදුව පවකාම යෙහි ඇලි ගිජ්ඣව මොහයෙන් අන්ධව කල්යවා මව්පියන් කාලක්‍රි යා කළකල්හි නාන්‍යකාරයින් හා නයකාරාදීන්ට කැමතිපරිද් දෙන් දෙමින් වස්තු විනාස කොට නොබෝකලකින්ම පිරිහීමට පැමිණ, පසුව නයගෙණ ජීවිකාකරන්නේ දෙවතු නයන්නොලැබ නය හිමිකාරයන් විසින් නය ඉල්වනලදුව ඔවුන්ට නොමාගේ කෙත් වත් ගෙවල් දෙරවල් ආදිය දී කබල්ගත් අත් ඇතිව සිහ මනෙහි හැසිරිආහර අත්‍රභවකරමින් එම නුවර අනාථ ශාලාවෙක වෙසෙන්නේය. එකල්හි එක් දවසක් සොරහූ ඔහුට මෙසේ කි වාහුය, එබා පුරුෂය තට මේ දුකසේ ජීවත්වීමෙන් ප්‍රයෝජන ක වරේද. තොපි තරුණවයස් ඇත්තේම ශක්තියෙන් හා බලයෙන් සම්පන්නය, කුමක් හෙයින් හස්තපාදාදීන් විකලකෙනෙකුමෙන්

ඉන්නෙඟිද එව අපඟා සමග සොරකමින් අන්සතුදෙය ගෙණ යෑපසේ ජීවිකාව කරවයිකීඟ, ඟෙතෙම මම සොරකම් කරන්ට නොදනිමියි කීය එවිට සොරු කියන්නාහු අපි ඒ උගන්වන්නෙ මුව නොපි අපගේ වචනය පමණක්කරවයි නිවාහුය, ඟෙතෙම යඟපතැයි පිළිගෙණ ඔවුන්ඟා සමග සොරකමට ගියේය.... එකල ඒ සොරහු ඔහු අතටමඟත් මුගුරක්ද ගෘඟසන්ධිය සිද ගෙ වවඳන්නාහු ඔහු යන්නිදෙර සිටුවා ඉදින් මෙඟි අන් කිසිවත් එන්නේ වීනම් ඔහු මේ මුගුරෙන් ගසා එකපඟරින්ම මරවය කි වාහුය....ඒ අඞ්ඛාලතෙමේ ඟිතාඟිතය නොදැනීමින් අතුන්ගේ ඒමම බලමින් එඟි සිටියේය. සොරු ගෙටවැදී ගතයුතු ඟිරණ්‍ය සුවණ්ණාදිය ගන්නාකල්ඟි ගේ වැසි මිනිසුන් විසින් දූනගත්නා ලද්දාහුම ඔබ්මොබ දුවගියාඟ....ඒ ගෙයි මනුෂ්‍යයෝ නැගිට වඟ වඟා ඳවන්නාහු ඔබ්මොබ බලමින් ඒ පුරුෂයා ගෘඟසන්ධියලඟදී සිටියවුන් දූකබොල දුඟසොරායයි කියා ඟැරගෙණ මුගුරු ඟදියෙන් අත්පා තලා, දේවඟෙනි මේ සොරා ගෘඟසන්ධිය ලඟදී අල් වාගන්නා ලදුයි කියා රජඟට දූන්වූඟ, රජතෙමේ මොහුගේ ඟිස කප්පවයි නඟර ගුත්තිකයාඟට ආඥාකළේය. යඟපත දේවයෙ නියි කියා නඟරගොපකතෙම ඔහු ඟැරගන්වා පිටිතලඟයා දූඩි කොට බන්දවා රත්මල්වඩම් බොටුවේ බැඳ ඉඤ්චිකාසුණු තවර ණලද ඟිස් ඇතිව වඩ පිණිස ගයනලද ඟෙරීශබ්දයෙන් දඤ්ඣන ලද මාගීය ඇතිකොට විටියෙන් විටියට සතරමන් සන්ධියෙන් ස තරමන් සන්ධියට පමුණුවා කසවලින් තලවමින් වධඟුමියට අති මුඛව ගෙණයන්නාහුය, එකල මෙහුවර පැඟැරඟන්නා සොරහු අලවාඟන්නා ලදුයි කියා හුවර කොලාඟලවිය,එසමයෙඟි වනාඟි ඒ හුවර සූලසානම් වෛශ්‍යසත්‍රියක් තොමෝ ප්‍රාසාදයෙඟි සිට පතෙල් කවුළුව අතරෙඟි බලාසිටින්නී ඔහු එසේ ගෙණයන්න වුන්දැක පෙර ඔහු සමග කරණලද පුරුදුඇති හෙයින් සිතන්නේ මේ පුරුෂතෙම මෙහුවර මඟත් සම්පත් අනුභවකොට සිට දූන් මෙබදුවූ අනර්ථයකට ඟා ව්‍යසනයකට පැමුණුනේයයි සිතා ඕඟට කරුණ උපදවාඅඟලා සතරෙක්ඟා පැන්ද ඟැරියේය, නඟර ගොපකයාඟටද ඔබ්නාන් මේ පුරුෂතෙමේ මේ අඟලාකා පැන් බොන්නේවේද ඒ තාක් ආයුෂ්තෙමෙ නැවතුනම්නැවයි කියා යවීය....එකල එ අතරෙඟි ආයුෂ්මත් මහාමෞද්ගලඟයන ස්ථවිර තෙම ඳිවසින් බලාවපුරණසේක් ඔහුගේ ව්‍යසනු ප්‍රාප්තිය දූක කරුණාවෙන් චොදනාකරණලද සිරා ඇතිසේක් මේ පුරුෂතෙම නොකරණලද කුසල් ඇත්තේය, කරණලද් අකුසල් ඇත්තේය එහෙයින් මෙතෙම මැරිගොස් නරඟයේ උපදනේඟ මම ඟිය

කල වනාහි අඟුලා හා පැන්ද මවදී භූමාවු දෙවියන් කෙරේ උපදනේය. යෙහෙක මම මෝඟට පිහිට වෙමියි සිතා පැන්හා අඳහලාත් ඔහුට එලවනකල්හි ඒ වධප්‍රාප්ත පුරුෂයාගේ ඉදිරියෙහි පහලවූයේය——හෙතෙම තෙරුන් දැක පහන් සිත් ඇතිව මෙසේ සිතන්නේ, දැන් මොවුන් විසින් මරන්ට ගෙණියනු ලබන්නාවූ මට අඟුලා කැමෙන් කවර ප්‍රයෝජනයෙක්ද පරලොව යන්නාවූ මට මේ මඟ වියදමෙක් වන්නේයයි සිතා අඳහලා හා පැන්ද තෙරුන්වහන්සේට දෙවෙවූයේය සථවිරයන්වහන්සේ ඔහුගේ පැහැදිල්ල වඩනා පිණිස ඔහුබලමින් සිටියදීම එබඳු නැනෙක්හි වැඩහිඳ අඳහලාවලඳ පැන්බී හුන්නැනින් නැගිට වැඩිසේක, ඒ පුරුෂයා වනාහි චෝරඝාතකයන් විසින් වධභූමියට ගෙණගොස් හිසකැපීමට පමුණුවන ලදුව තරුතාර පින්කෙත් වූ තෙරුන්වහන්සේ කෙරෙහි කරණලද උදාරවූ පුණ්‍ය හේතු කොට ගෙණ දෙවුලෙවු ඉපදීමට සුදුසුවූයේ නමුදු,යම් හෙයකින් සුලසාවකරා පැමිණ මාවිසින් මේ දුනවඅතුව් ලද්දේයයි සුලසාව කෙරෙහි හටගත් සෙනහයෙන් මරණ සමයෙහි සිතකෙලසෙන ලද විද එහෙයින් හීනාත්මයෙහි උපදින්නේ ප්‍රසිඩ ගුහණවූ ඝනවූ ඡායා ඇති මහනුග ගසෙක්හි දේවතාවෙක්ව උපත්නේය—— හෙතෙම වනාහි ඉදින් ප්‍රථම වයස්හි වෙළඳම් ආදිය කරමින් කුල වංශ තැබීමෙහි උත්සාහ කළේවීනම් වඅතුව වැඩිවීමෙන් එකුවර සිටානවරුන්ට ප්‍රධාන පළමුවෙනි සිටානොහුය මඛ්‍යම වයසෙහි කුලවංශය තැබීමෙහි උත්සාහ කළේවීනම් ඒ හුවරට මඛ්‍යම සිටානොහුය, පශ්චිම වයසෙහි කුලවංශය තැබීමෙහි උත්සාහ කළේනම් පශ්චිම සිටානොහුය,ඉදින් වනාහි ප්‍රථම්වයසෙහි වඅතුවහැර අවුත් පැවිජිවූයේ වීනම් රහත්වන්නාහුය, මඛ්‍යම වයසෙහි පැවිදිවූයේනම් අනාගාමි හෝ සකෘදාගාම් වන්නාහ, පශ්චිම වයස්හි පැවිජිවූයේ වීනම් සොවාන් වන්නාහුය පාපමිත්‍ර සංසර්ගයෙන් සත්ත්වයන්ට සුරාධූර්ත්ත දුශ්චරිතයෙහි ඇලී ශ්‍රමණ බ්‍රාහ්මණයන් කෙරෙහි ආදරනැතිව අත්තක්‍රමයෙන් සියලු සම්පතින් පිරිහී මහත් ව්‍යසනයට පැමිණියේය——ඉක්බිති ඒ දිව්‍යරාජතෙම මැනකාලයෙහි සුලසාව උපනට ආවවුන් දැක හටගත් කාමරාගය ඇතිව අහිකාරයෙක් මවා ඇ එහි තමන්ගේ විමානයට ගෙණගොස් සතියක් මුළුල්ලෙහි ඇ හා සමග සංවාසඅකලේය ඇව තමන් එපවත්ද නිහ, ඇගේ මැනියන් නොදන්නි හඬමින් විලාපකියමින් ඔබ්මොබ කරකැවී ඇවිදින්නිය. ඒ දැක මහජනතෙ මේ නියන්නේ එඛා සත්‍රියෙනි ආයාවූ මහාමෞද්ගල්‍යායණ සථවිරමේ මඟත් සෘද්ධි හා මඟත් ආනුභාව ඇතිසේක ඇගේ ගතිය

දන්නේය උන්වහන්සේ කරාගොස් විචාරවයි නිහ, ඕතොමෝ ය හපත ආශ්‍රයෙනියි කියා තෙරුන්වහන්සේකරා එළඹ එපවත් විචාළිය. තෙරුන් වහන්සේ ඇගේ මැනියන්ට කියන්නේ මේයින් සත්වෙනි දවසෙහි වේළුවනාරාමයෙහි භාග්‍යවතුන්වහන්සේ ධම්මදේශනාකරණ කල්හි ජරිස් කෙළවරදී නිගේ දියනියන් බල වයි කියේක. ඉක්බිති සුලසාතොමෝ ඒ දිව්‍යපුත්‍රයාට කියන්නී නුඹ වහන්සේගේ විමානයෙහි වසන්නාවූ මට සත්දවසක් වූයේ ය. මාගේ මැනියෝ මා නොදැක්නී විලාපයට හා සොකයට පැමිණේයේ වෙයි දේවයෙනි මා එහිම හැරගෙණයෙව මැනවයිකිය. ඒ දිව්‍යපුත්‍රතෙම ඇගෙණගොස් වේළුවනාරාමයෙහි භාග්‍යවතුන් වහන්සේ ධම්මදේශනාකරණ කල්හි ජරිස් කෙළවර සිටුවා අදශ්‍යමාන රූපව සිටියේය. එහෙයින් මහජනතෙම සුලසාවන් දුක මෙසේ නිහ. මැනිය සුලසාවෙනි තොප මෙතෙක් දවස් කොයි ගියේද නිගේ මැනියෝ නී නොදන්නී විලාපයට හා සොකයට පැමිණ උමතු එනියක් මෙන් වියයි නිහ. ඕතොමෝ ඒ සියලු ප වත් මහජනයාහට නිහ. මහජනයා විසින්ද මෙසේ විචාරණ ලද්දාහුය. ඒ පාපපුරුෂතෙම එසේපාපයෙහි වහවානවූයේ නොක රණලද කුසල් ඇත්තේ දිවෙකනපත්තිය කෙසේ ජළිලද්දේ දැයි විමාළ කල්හි සුලසාව කියන්නී මා විසින් දෙවනලද අඳහලා හා පැතුන් ආශ්‍රයවූ මුගලන් මහතෙරුන්වහන්සේට දී ඒ කුසලය හේතුකොටගෙණ දිවෙකනපත්තිය ජළිලද්දයි කිය එ අසා මහජන තෙමේ ආඤ්ඤාත්තුතයින් ඇතිවූහ. අශ්‍රීන්ත්‍ර නම් ලෝකයා ඔට නිරුත්තරවූ පින් කෙනක්වන්නේය යම් කෙනෙක් කෙරේහි කරණලද සවලාවූද සංග්‍රහව සඤයන්ට දිවෙකනපත්තිය ඵලවන් නේයයි කියා මහජනතෙමේ උලාරප්‍රිති සොම්නස පිළිදුන්විය. භික්ෂූන්වහන්සේලා එපවත් භාග්‍යවතුන් වහන්සේට සැලකළෝ ය ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ ඒ අසෝත්පත්ති කොටගෙණ මේ ගාථාවන් වදාළසේක.

(1) ඛෙත්තූපමා අරහන්තෝ දායකා කස්ස කූපමා,
බීජූපමං දෙය්‍යධම්මං ඔඝෝ නිබ්බත්තතෙ ඵලං.

(2) ඔඝ බීජං කසීඛෙත්තං පෙතානං දායකස්ස ච,
තං පෙතා පරිභුඤ්ජන්ති දූතා සුඤ්ඤෙන චඛ්ඛුනි.

(3) ඉවේවං කුසලං කත්වා පෙතෙ ච පටි පූජයං,
සග්ගං ච කාම නිට්ඨානං කම්මං කත්වා න හඤ්ඤති.

(1) යහු හෙයින් අර්හන්ත්‍ර ක්ෂේත්‍ර වැන්නාහ දායකයෝ හොව් යෝ වැන්නාහ, දානවඤුව බීජූවවැන්නේය, තපස් නැමැති වඤුව වි ා ක නැමැති ඵල උපදවන්නේය.

(2) ප්‍රෙතයින්ට හා දුගතියින්වද, තපස් වෂීාවය දුනවසතු බිඳුවටය, දුගතියො ගොවිය, රහත්හු ක්ෂෙසන්හය, ප්‍රෙතයො මෙයින් උපදනා විපාක ඵලය අනුභවකෙරෙති, දන්දුන් තැනැත්තේ පිණින් වැඩෙයි.

(3) මේ ශාසනයෙහිම දුනපරිත්‍යාගකොට ප්‍රෙතයන් උදෙසා දන් දෙනු ලබන්නේ පින් අනුමොදන්ව ප්‍රෙතයො අග්‍රවූ පඬිකාමාදිය ඇති සඞ්ගීගයට යන්නාහුයයි කියා ධම්මදෙශනාකොට වදාලේය.(දෙශනා කෙළවර දිව්‍යපුත්‍රයා හා සුලසාවන් ආදිකොට සවා සූදහසක් ප්‍රාණීන්ව ධම්මාභිසමයවූයේය.එසේහෙයින් ශ්‍රද්ධාවන්ත සත්පුරුෂ වරුණි මෙසේ කුසලා කුසලයෙහි විපාක විශෙෂය දැන අකුසල් දුරුකොට කුසලයෙහි හැසිර සඞ්ගීගාපවඞ්ගීග සම්පත් සාදුගන්ව උතුසාහ කටයුතුයි)මේ ප්‍රෙතවසතු ප්‍රකරණයෙහි පළමුවෙනි උරග වඞ්ගයෙහි පළමුවන ඛෙතූපමා ප්‍රෙතවස්තුව කියා නිමවනලදි.

1 ඛෙතූපමා ප්‍රෙතවසතුව නිමි.

—00—

නවද මේ ප්‍රෙතවසතු ප්‍රකරණයෙහි පළමුවන සඟිව උරගවඞ්ගයෙහි දෙවෙනි **සූකරමුඛ ප්‍රෙත වසතුව** නම් කවරහයත්?එක් සමයෙක්හි ප්‍රඥවිෂයාතික්‍රාන්තවූ ධම්මකායයෙන් සුත්ශාක්‍යකුල ප්‍රදීපාගමාණවූ ශාසකෘවූ බුදුරජානන්වහන්සේ රජගහනුවර සවිමිපයෙහිවූ කලන්දක නිවාපනම් වේළුවනාරාමයෙහි වැඩවාසය කර වදාරණ කල්හි මේ ප්‍රෙතවසතුව එක්තරා සූකරමුඛ ප්‍රෙතයෙකු අරහයා වදාරණ ලද්දේය.හේ මෙසේ දනයුතු.අතීතයෙහි වනාහී කාස්‍යප බුදුරජානන් වහන්සේගේ ශාසනයෙහි එක් භික්ෂුවක්තෙම කයින් කෙරෙණප්‍රාණඝාතාදි අකුසල් වලකා කායසංයමය ඇතිවිය, වචනයෙන් කෙරෙණ එරුෂවචනාදිය නොවැලැක්වූ හෙයින් වාක්සංයමය නැත්තේ භික්ෂූන්ට අක්‍රොෂ පරිභව බෙණෙයි, එ මහණතෙම මැත කාලයෙහි කාලක්‍රියාකොට නරකයෙහි ඉපිද එක් බුඩානාරයක් මුලුල්ලෙහිපෑයී එයින් චුතව අවුත් මේ බුඩොත්පාද කාලයෙහි රජගහනුවර සවිමිපයෙහිවූ ගිජ්ඣකූට පර්වතය අසල එම අකුසල කම්මයාගේ විපාක වශයෙන් සාප්පමාසයෙන් මඩිනලද ශරීරඇති ප්‍රෙතයෙක්ව උපන්නේය ඔහුගේ ශරීරය රන්වන්විය, මුඛය සූකරමුඛය වැනිවිය, එකල ආයුෂඅන්වූ තාරද සඞ්චරයන්වහන්සේ ගිජ්ඣකූට පර්වතයෙහි වාසයකරමින් උදැසනම ශරීර පිළිදැගුම්කොට පාසිවුරු

ගෙණ රජගහනුවරට පිඬු පිණිස වඩිනාසේක් අතරමගදී ඒ ප්‍රේතයා දැක ඔහුවිසින් කරණලද අකුසල කම්මය විචාරණසක් මේ ගාථාව කීහ—

(4) කායොතෝ සබ්බ සොවණ්ණා සබ්බා ඔභාසතා දිසා,
මුඛං තෙ සූකරසෙසව කිං කම්ම මකරී පුරෙති—

(4) එම්බා නාගේ ශරීරය රන්වන්විය සියලු දික් බබලයි නාගේ මුඛය සූකරමුඛය වැනිවෙයි, මෙසේ වන්ට නාවිසින් පූර්වයෙහි කුමන අකුසල කම්මයක්කරණලද්දේ දැයි විචාලේය—මෙසේ තෙරුන්වහන්සේ විසින් විචාරණලදුව ඒ ප්‍රේතතෙම ගාථාව කින් මෙසේ කියන්නේ—

(5) කායෙන සංයතෝ ආසිං වාචා යාසිං අසංයතෝ,
තෙන මෙතා දිසොවණ්ණා යථාපස්සසි නාරදා—ආහ.

(5) යනුහෙයින් ස්වාමීනි පෙර මම කායසංයමයෙන් යුක්තවිමි වාක්සංයමයෙන් යුක්ත නුවූයෙමි නාරද ස්ථවිරයෙනි නුඹවහන්සේ මාගේ ශරීරය දක්නෙහිවේද කායසංයමය ඇතිවූ කුසල කම්මයෙන්, එබඳු ශරීරවර්ණය ඇතිවූයෙමි, වාක්සංයමය නැතිවූ හෙයින් සූකරමුඛය ඇතිවූයෙමි කීහ—(මෙසේ ඒ ප්‍රෙතතෙම තෙරුන්වහන්සේ විසින් විචාරණලදුව ඒ ප්‍රවෘත්තිය කියා එම කාරණ කොට තෙරුන්වහන්සේට අවවාද දෙන්නේ මේ ගාථාවකිහ.

(6) තතොහං නාරද බ්‍රූමි සාමං දිට්ඨ මිදං තයා,
මාකාසිමුඛ සා පාපං මාඛෝ සූකරමුඛෝ අහූති—

(6) තවද නාරද ස්ථවිරයෙනි මම නුඹවහන්සේට කියමි මාගේ මේ ගලවළුයෙහි පටන් යව මනුෂ්‍ය සටහණ ඇතිබව හා ගලවළු යෙන් මත්තෙහි සූකර සටහන් ඇති බවත් නුඹවහන්සේ විසින් තෙමේම දක්නාලද්දේවත එ හෙයින් මුඛයෙන් එරූඪවචනකිම් ආදී පවුකම් නොකර මැණව එසේ කොට මාසේම සූකරමුඛය ඇතිනොවෙයි කීහ—(ඉක්බිත්තෙන් ආයුෂ්මත් නාරද තෙරුන් වහන්සේ රජගහනුවර පිඬු සිඟා ඇවිද දන්වලඳ පෙරලා වැඩි සේක් සිවුවනක් ප්‍රත්‍යෙෂ වැඩහුන් ශාස්තෘන්වහන්සේට එප වත් සැලකෙළේය. ශාස්තෘන්වහන්සේ නාරද මා විසින් ඒ ප්‍රෙත තෙම පළමුවෙන්ම දක්නාලදැයි වදාරා අනේකා කාරයෙන් ලා මකවූවාක් දුස්චරිත නිශ්‍රිතවූ ආදීනවයද වාක්සුචරිත ප්‍රතියං යුක්ත ආනිසංසයද ප්‍රකාශකරමින් ධම්මදේශනා කළසේක—ඒ ධම්මදෙශනා තොමෝ සම්ප්‍රාප්ත පරිසට සාක්ෂීකවූයේය—එඛා ශ්‍රද්ධා බුද්ධි සම්පන්න සත්පුරුෂවරුනි කාය සංයමයෙහි ආනි

සංසඳ වාක් අසංයම යෙහි ආදීනවද මෙයින් දැන, වාක්සංයම යෙනුත් යුක්තවසිට ආත්මාර්ථ පරාර්ථ සාදාගන්ට උත්සාහකට සුනු)—මේ ප්‍රෙතවස්තු ප්‍රකරණයෙහි පළමුවන උරගවග්ගයෙහි දෙවෙනි සූකරමුඛ ප්‍රෙතවස්තුව කියා නිමවනලදි—

2 සූකරමුඛ ප්‍රෙත වස්තුව නිමි,

—※—

තවද මේ ප්‍රෙතවස්තු ප්‍රකරණයෙහි පළමුවෙනි උරගවග්ගයෙහිවූ තුන්වෙනි පූතිමුඛ ප්‍රෙතවස්තුව කවරහයත්?—එක් සමයෙක්හි සුරාසුර වන්දාවරු වූඩා මණිමරිවි සවය පරිවුඩිත චරණනඛ මයුඛ ඇති ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ කලඳුකනිවාප නම්වූ වේළුවනා රාමයෙහි වැඩවාසයකර වදාරණකල්හි එක්තරා පූතිමුඛ ප්‍රෙතයෙකු අරභයා මේ ප්‍රෙතවස්තුව වදාරණ ලද්දේය—ඒ කෙසේදයත්—

යටගිය දවස කසුප් සම්මාසම්බුදුන් කල තුලපුත්‍රයෝ දෙදෙනෙක් ඒ බුදුන්ගේ ශාසනයෙහි පැවිද්ව සීලාචාර සම්පන්නව සැහැල්ලුවූ පැවතුම් ඇතිව එක්තරා ග්‍රාමාවාසයෙක සමගිව වෙසෙති ඉක්බිති එක්තරා පවිටු අදහස් ඇති කේලාම්කීමෙහි ඇලී වසන පවිටු භික්ෂූවක්තෙම හැල්කෙතට සොර මීවෙක් වැදුනා සේ ඒ දෙදෙනා වහන්සේ වසන තෙනට ඇවිත් සිටියේක—ඒ තෙරහු දෙදෙන ඒ භික්ෂූව සමඟ පිළිසඳර කථාකොට වසන තැනකදී දෙවෙනි දවසෙහි ඒ ආගන්තුක භික්ෂුව හැරගෙණ ප්‍රඥප්තිණිස ගම්වැදුනාහ, ඒ දැක මනුෂ්‍යයෝ ඒ තෙරුන්වහන්සේලා කෙරේ ඉතාම ඝටත් ආකාර දක්වා කෑද බත් ආදියෙන් වැළඳෙවුවාහුය, එ ආගන්තුක භික්ෂුතෙම වෙහෙරට ඇවිත් මෙසේ සිතුය, මේ ගොදුරුගම යහපත මනුෂ්‍යයෝද ශ්‍රද්ධාසම්පන්නව ප්‍රණීත පිඬපාතය දෙන්නාහුය මේ වෙහෙර ධන්‍යදුක සම්පන්නය මෙහිම වසන්ට හැක්කේය, මේ භික්ෂූන් මෙහිම වසන්කල මට ඒසුවිහරණයෙක් නොවෙයි අතවැසියෙකුගේ විසීමක් මෙන් වෙයි එබැවින් මම ඔවුනොවුන් බිඳුවා යම්සේ කළඇල්හි නැවත මෙහි නොවෙසෙන්ද, එසේ හෙදකෙරෙම්යි සිතිය—ඉක්බිති එක් දවසක් වැඩමහළු තෙරුන්වහන්සේ ඉතිරි දෙදෙනාහටම අවවාද කොට තමන්වහන්සේ වසන තැනටවන්කල්හි කේලාම් කියන මහණතෙමේ මදක් කල්යවා මහතෙරුන්කරා ගොස් තෙරුන්වහන්සේ විසින් ඇවත්නී නොකල්හි කුමක් ප්‍රණීස ආයෙහි දැසි වදාළකල්හි එසේය වහන්ස කියයුතු නිසිවන් ඇතැයි

කියා කියා ඇවැත්නියි තෙරුන්වහන්සේ විසින් අනුදන්නාලද්දේ මෙසේ කියන්නේ, වහන්ස ඔබගේ මේ මිත්‍ර තෙරුන්වහන්සේ සම්මුඛයෙහි තමන් මිත්‍රයෙකු මෙන් පෙනී පර මුහුණයෙහි සතු රෙකුමෙන් නුගුණ කියන්නේවේදැයි කියා, කුමක කියන්නේද ඇවැත්නියි විමාළකල්හි ඒ භික්ෂුතෙම මෙසේ කිහ, වහන්ස ඇසුව මැනව මේ මහතෙරුන්වහන්සේ කෙරෙහිකිවූ කළවරද සහවා නිවරද දක්වන්නාවූ මායා ඇත්තෙක කුහකය මිථ්‍යාජීව යෙන් ජීවිකාව කෙරේයයි කියා, ඔබගේ නුගුණ කියනියි කියා ඒ කල්හි තෙරුන්වහන්සේ කියන්නේ ඇවැත්නි මෙසේ නොනියව ඒ මහණ මට මෙසේ නොකියති ගිහිකළ පටන් මාගේ ප්‍රකෘතිය දන්නේය, හෙතෙම ප්‍රියසීලිකෙණෙක් වන්නේය යහපත් සුභාව ඇත්තෙකැයි කියා ඒ ආගන්තුක නවගේ නිම නොගිවිසේක. එකල කේලාම් මහණතෙම කියන්නේ, වහන්ස ඉදින් ඔබව හන්සේගේ සිත් සුබබැවින් මෙසේ සිත්වූනම්, ඒ මහණ ඔබටම සුදුසුය, ඔහු හා සමඟ මාගේ වෛරයෙක් නැත්තේය කුමක් හෙයින් මම උන්වහන්සේ විසින් නොකිවක් කීදේයයි කියාද එසේවේවා, කාලාන්තරයකින් තමහටම දැනෙයි කියා මහතෙරුන් වහන්සේද සුහුදුන් බැවින් වෙළහක සිත් ඇතිසේක් මෙසේත් වෙයි. නියා සැක ඇතිව මදක් ලිහිල්වූ විසවාස භාවය ඇතිවිය. ඒ අසුණ මහණ පළමුකොට මහතෙරුන් බිඳුවා ඉතිරි තෙරුන් වහන්සේද ඉහනනී ආකාරයෙන්ම බින්දේය ඉක්බිති එදෙදෙනා වහන්සේ දෙවෙනි දවසහි ඔවුන් කථානොකොට පාසිවුරු හෙණ ගමෙහි පිඬුසිඟාගෙනවුත් තමතමන්ගේ වාසස්ථානවලදීම වළඳා වැඳුම්පිදුම් පමණවත් නොකොට එදවස එහිම වැස අළුයම්වූ කල්හි ඔවුනොවුන්ට බැනනොගෙනම එහා එහා තැන්වලට ගියාහුය. කේලාම් කියමනෙහි ඇළුනු සිත්ඇති මහණ සම්පූර්ණවූ මනොරථය ඇතිව පිඬුපිණිස ගම්වවන්න වුන්දැක මනුෂ්‍යයෝ විචාරන්නාහු වහන්ස තෙරුන්වහන්සේලා කොයිගියාහුදැයි විචාළාහුය එවිට කේලාම් මහණ කියන්නේ ඊයේ රාත්‍රිය මුළුල්ලෙහි ඔවුනොවුන් කලහකොට මා විසින් කලහනොකරවිය සමගිවුව මැනව කලහව නම් අනර්ථ දුඃඛය අනාගතයෙහි දුක් ඵලවන්නාවූ අකුසලොත් පාදදෙයෙක පුරාතනයෝද කලහව නිසා මහත් වැඩෙන් පිරිහුනොවේදැයි, යනාදීන් අවවාද කරණු ලබන්නාහුද මාගේ වචනය නොගෙණ පිටත ගියොයයි කිය, එකල්හි මනුෂ්‍යයෝ කියන්නාහු ඒ දෙදෙනාවහන්සේ කැමති තැනක යෙඳා නුබවහන්සේ අපට අනුකම්පාවෙන්

කනඤ්ඤඑනොව මෙහිම වැඩසිටිය මැණවැයි ආරාධනා කළාහ යහපනැයි කියා ඒ මහණ එහිම වසමින් කිපදිනක් ඉක්මුත්තු කල්හි සිතනජේක් සිල්වත් ගුණවත් යයපත් ආධ්‍යාසය ඇති තෙරුන් දෙදෙනා ආවාස ලොභයෙන් මා විසින් බිදුවන ලද්දහ' එහෙයින් මා විසින් බොහෝ අකුසල් රැස්කරණ ලද්දෙමියි, කැඩපතින් මුහුණේ හිඛෙන කැලැල් දුටුවාජේ සිහියෙන් තමන්කල චරද පෙනි බලවත්ජේ චිපිළිසරව සොකවේගයෙන් ශිලනඹ හිඳ නොබෝදවසකින් මැරිගොස් අවිචිමහනරකයෙහි උපන් නේය-----තේවාසික තෙර දෙදෙනා වහන්ජේ දනවූ සැරිසරා වඩනාහු එක්තරාවිහාරයකදී ඔවුනොවුන් සමඟව සතුටුවී කේලාම් මහණ විසින් කියනලද වචනයන් ඔවුනොවුන්ට කියා, ඒ කිය මන් එජේ නොවුබව දැන සමගි සතුටුව ක්‍රමයෙන් අවුත් එම ආවාසයට පැමිණි යාහුය-----මනුෂ්‍යයෝ ඒ දෙදෙනා වහන්ජේ දැක තුටුපහටු සිත්ඇතිව සොමිනස් වූවාහු සිවුපසයෙන් උපස්ථානක ළොය-----තෙර දෙදෙනා වහන්ජේ එහිමවසමින් සැපආහර අනුභවයෙන් එනහවූ සිත් ඇතිව විදර්ශිනාවඩමින් නොබෝකලකින් ම අහ්‍රඬයට පැමිණියාහුය-----කේලාම්කී මහණතෙම එක් බුඩාන්තරයක් මුළුල්ලෙහි නරකයෙහි පැසී එයින්ගොඩනැඟී අවුත් මේ බුඩොත්පාදයෙහි රජහඟුවරට නුදුරු තැනෙක "පුනී මුඛ ප්‍රෙත ජෙකව" උපන්නේය ඔහුගේ ශරීරය රණ්වණ් වෙයි, කටින් පහුවෝ පිටන්ව මුඛය සිසාරා කන්නාහුය, ඔහුගේ මුඛයෙන් ආකාසය පැතිර දුගඳක් වැහෙයි-----එකල්හි ආයුෂ්මත්වූ නාරදඅඨවිරතෙම ගිජ්ඣකූට පර්වතයෙන් බස්නේ ඒ ප්‍රෙතයා දැක මෙසේ වදුරණ සේක-----

(7) දිඛ්ඛං සුඛං ධාරෙසි වණ්ණ ධාතුං
වෙහාසයං තිට්ඨති අන්තලික්ඛෙ,
මුඛංවතෙ කිම්මයෝ පූති ගන්ධං
ඛාදන්ති කිං කම්ම මකාසි පුබ්බෙති-----

(7) යහු හෙයින් එඛා ප්‍රෙතය තොප දිව්‍ය ශරීරයක් හා සමානවූ යහපත් ශරීරයක් දරමින් ආකාසයෙහි සිටින්නෙව එතකුදුවුව තගේ මුඛය පහුවෝ වවලා කති මුඛයෙන් දුගඳක් හමන්නේය පූර්වජෙහි කුමන අකුසලකම්මයක් කොට මෙසේ වී දැයි මේ ගාථාවෙන් විවාලේය)-----මෙසේ තෙරුන්වහන්ජේ විසින් තමන් පූර්වජෙහි කරණලද අකුසල කම්මය විචාරණලදුව එපවත් දක්වන්නාවූ ප්‍රෙතතෙමේ-----

(8) සම්මතෝ අහං පාපෝ දුක්ඛ වාවෝ
තපස්සිරූපෝ මුඛසා අසඤ්ඤතෝ,
ලබා චමෙතප සාවණ්ණ ධාතු
මුඛංචමෙපෙසුනියෙනපූතීති.

(8) යතුහෙයින් නාරදඍව්රයන්වහන්ස මම පූර්යෙහි කේලාම් කියා ඔවුනොවුන් බිඳුවන පවටු ලාමක මහණෙක් වූයෙම් අනුන් ගේ ගුනය නසා කථාකරණ සභාවයෙන් හා එරූඹ වචනයෙන් යුක්තව කේලාම් කීම් ආදි වාක්දුශ්චරිතයෙහි ඇඵෙවම් තපස්ද ඇතිවූයෙම් මාගේ තපස් ගුණයෙන් මේ ශරීරවර්ණය හා කේලාම් කීහෙයින් කුත්සිත මුඛයඇතිවූයෙම් මාගේ මුඛය සියාරා පතුවෝ සිදුරුබිදුරුකොට මුඛය කන්නාහුයයි කිව මෙසේ ඒ ප්‍රේතතෙම තමන් පූර්යෙහි කණලද කුසලාකුසල කම්මය ප්‍රකාශකොට ඉන් පසු තෙරුන්වහන්සේට අවවාද දෙමින් අවසාන ගාථාවකිහ

(9) තයිදංනයා නාරදසාමං දිට්ඨං
අත්තකම්ප කායෙ කුසලා වදෙයසුං,
මාපෙසුණං මාච්චුසා ප්සුණ අහානි
යකෙඛා හං හොමි සිකාමකාමිනි.

(9) නාරදඍව්රයන්වහන්ස මාගේ මේ රූපය තුබවහන්සේ විසින්ම දක්නාලද්දේය බුඩාඳි මහොත්තම්මයො තොපටඅනුකම්පා වෙන් යම්සේ කියන්නාහුවෙද්ද එසේ මම කියම් කේලාම් නොනිව මැනව බොරු නොකිය මැනව කේලත්නොකීමෙන් වාකසංයමයෙන් සුක්තවූයේ විනම් තුබවහන්සේ පවකම්යෙන් සමන් විනව ප්‍රසිඩ දෙවියෙක්හෝ වෙයි දෙවියන් අතුරෙන් එක්නරා දෙවියෙකු හෝ වෙයිඋදුර දිව්‍යසම්පත් ලබා අභිරමණය වන්නෙහියයි කිව එයසා තෙරුන්වහන්සේ එයින් රජගහනුවරට ගොස් පිඬුසිහා දන්වලදු පෙරලා වැඩහිඳ ශාසනාවූ බුදුරජනාන් වහන්සේට එපවත් සැලකළේය බුදුරජනන් වහන්සේ ඒ අඤ්ඤාතපත්තිකොට ගෙණ සම්ප්‍රාප්ත පර්සට ධම්මදේශණාකළේය. ඒ ධම්මදේශනාව බොහෝදෙනහට සාර්ථකවිය එහෙයින් සඩ්ඛ්‍යාවන්න සත්පුරුෂ ජනයෙන් කේලාම් කීමට ශ්‍රමණභාවයත් මැඩපවතා මෙබඳු කෘරතර විපාක දී නිබෙන බව දැනඑයින් දුරුව සුචරිතපූරිසම්පත් සාදාගන්ට උත්සාහනවසුතු මේ ප්‍රේතවස්තු ප්‍රකරණයෙහි පළමුවන උරගවර්ගයෙහි තුන්වෙනි පූතිමුඛ ප්‍රේතවස්තුව නියානිම්වනලදි.

3 පූතිමුඛ ප්‍රේත වස්තුව නිමි,

—*—

තවද මේ ප්‍රේතවස්තුප්‍රකරණයෙහි පළමුවන උරගවග්ගයෙහි සතරවෙනි "පිට්ඨඛ්ඛලිකවත්ථුව නම්" කවරහයත්—එක් සමයෙක්හි ත්‍රෛලෝක ප්‍රදීපයමානවූ ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ සැවැත්නුවර සවිමිපයෙහිවූ ජේතවන මහාවිහාරයෙහි විඩවාසයකර වදුරණසේක් අනේපිඬු මහසිටුහුගේ දනක්අරබයා මේ ප්‍රේතවස්තුව වදුරණ ලද්දේය—ඒ කෙසේදයත්—

අනේපිඬු මහ සිටුහුගේ මිනිබිරියගේ කිර්මිව් නොමෝ පිට්ඨඛ්ඛලිකයයි නම්ලද පිටිරූපයක් තනා මේ නිගේ ධිතෘවිය මේ හැරගෙණ කෙලිවයි කියා ඇවදුන්නේය, ඕනොමෝත එහි ඒ ධිතෘසංඥ උපදවා ක්‍රීඩා කරණකල්හි එක් දවසෙක ඇගේ ඒ පිටිරූපය බිඳිගියේය, එකල්හි ඕනොමෝ මාගේ දුවමලහයි කියා හැඬියා හඬන්නාවූ ඒලෑදරිය නිසිවෙකුට බනවනට නොහැකිවිය, එවේලෙහි ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ සිටානන්ගේ ගෙයි පනවන ලද ආසනයෙහි වැඩහිඳිනාසේක මහාසිටානෝද භාග්‍යවතුන් සවිමිපයෙහි හුන්නේවෙයි කිර්මිව්නොමෝ ඒ දරුවා හැරගෙණ සිටානන් සවිමිපයට ගියේය, සිටානො ඒ දුක කුමක් පිණිස දරුවා හඬන්නේදැයි විවාලේය, කිර්මිවුනොමෝ එපවත් සිටානන්ට කියා සිටානෝ ඒ දරුවා ඇකයෙහි හිඳුවා මෙසේ කියන්නේ නිගේ දුවනියගේ නමට දනක්දෙමියි කියා භගවා ශාස්තෘන් වහන්සේට සැළකරන්නේ සවාමීනි මාගේ මිනිබිරියගේ දියනිවූ පිට්ඨඛ්ඛලිකාව උදෙසා දනක්දෙනු කැමැත්තෙමි මගේ ඒ දන පන්සියයක් භික්ෂූන්වහන්සේලා සමඟසෙටදවසට ඉවසාවදාළ මැණවයි ආරාධනාකලේය—භාග්‍යවතුන්වහන්සේ තුස්නිම්භාවයෙන් ඉවසාවදාලේය, ඉක්බිති බුදුරජානන්වහන්සේ දෙවෙනිදවස පන්සියයක් භික්ෂූන්හා සමඟ සිටුගෙදරට වැඩ දන්වළඳ ඉක්බිති අනුමෙවෙනි බනවදුරණසේක් මේ ගාථාවන් වදාළසේක—

(10) යං කිඤ්චාර්මමනං සඬා දජ්ජාදුනං අමච්ඡරී,
පුබ්බපෙතෙ ච ආරබ්භ අථවාවත්තු දෙවතා—

(11) චත්තාරොව මහාරාජෙ ලොකපාලෙ යසස්සිනො
කුවෙරං ධතරට්ඨං ච විරූපක්ඛං ච විරුළ්හකං
තමෙව පූජිතො හොති දායකා ච අනිප්ඵලා—

(12) නඛිරුණ්ණංව සොකොවා යාචඤ්ඤු පරිදෙවනා,
න තං පෙතානමත්ථාය එවං තිට්ඨන්ති ඤාතයො—

(13) අථචඛො දක්ඛිණා දින්නා සංඝමහි සුප්පතිට්ඨිතා,
දිඝරත්තං හිතාය‍ස්ස ඨානසො උපකප්පතීති—

(10) යනුහෙයින් මහසිටානෙනි මහල්‍ය අතුරෙන් යම්කිසි කට යුක්තක් අරඹනු කොට ගෙණ නොමසුරු නැනැත්තේ දන්දිපර ලොවහිය මාතෘ පිතෘ ආදිපුවී ප්‍රෙතයන්හු උදෙසවත් නොහොත් ගුහවසතු අධිගෘහිත දේවතාවක් උදෙසාවත්.

(11) ධ්‍රතරාෂ්ට්‍ර විරූඪ විරූපාක්ෂ වෛශ්‍රවණය යන සතරවරන් රජුන් උදෙසාවත් පින්දෙන්නාහු වෙද්ද ඒ දායකයෝ අතුන්ට ත මන්කළ ප්‍රාර්ථිතමන් නිස්ඵල නොවන්නාහුවෙති ඔහුහුදු ඒ දාන විපාකයට සමාම වන්නාහුමය.

(12) යමෙක් මියපරලොව ගිය නැයින් ගැන හඬන්නාහු වැල පෙන්නාහු විනම් ඔවුන්ගේ ඒ හැඬීම් ආදිය නිරාර්ථකවාමිස ප්‍රෙත යන්හට එසින්නිසිත් ප්‍රයොජනයෙක් නොවෙයි.

(13) ඤාතීන් විසින් සංඝගත දක්ෂිණාවදී ප්‍රෙතයන් උදෙසා පින් පෙත් දියයුතුය, එසේ කළේවිනම් ප්‍රෙතයන්ට ඒ පුණ්‍යය කෙළ නොයවා එකතොසි සුවඵලවත්නේයයි භාග්‍යවත් බුදුරජනෙම මෙසේ ධර්මදේශණා කොට ප්‍රෙතයන් උදෙසා පින්දීමෙහි මහජන යාගේ සිත් අලවා ඝනස්තෙන්නාගිසිට වෙහෙරට වැඩසේක).

දෙවෙනි දවස සිටුහාණන්ට හා ඉතිරි නැගෝද එලෙස ප්‍රෙතයන් උදෙසා දන්දී පින්දෙමින් සිටානන්ට ඉතුව පැවතුනාහුය, මේ ප්‍ර කාරයෙන්ම මසක් මුළුල්ලෙහි මහදන් දුන්නාහුය ඉක්බිති පසේ නාදී කොහොල් මහරජතෙම භාග්‍යවතුන්කරා එලඟ සමීපි කු ම්ක් හෙයින් භික්ෂූන්වහන්සේලා මාසයක් පමණ මාගේ ගෙදරට නොවැඩියාහුදැයි විචාළේය, ශාස්තෘන්වහන්සේ ඒ කාරණය වදාළ කල්හි කොහොල් මහරජතෙමේද සිටානන්ට අතුවපවත්නේ බු දුන්ප්‍රමුඛ භික්ෂුසංඝයාහට මහදන්දුන්නේය,ඒ දාන තුවර වැස්සෝ රජහට අතුව පවත්නාහු මාසයක් පමණ මහාදන් දුන්නාහ, මේ සේ දෙමසක් මුළුල්ලෙහි, පිටඨිතලිකාව මුල්කොට මහදන්දුන් නාහු වෙති)මේප්‍රෙතවස්තුප්‍රකරණයෙහි පළමුවෙනි උරගවර්ගයෙහි සත්වෙනි පිටඨිතලික ප්‍රෙතවස්තුව නිමා නිමවන ලදී.

4 පිටඨිතලික ප්‍රෙත වස්තුව නිමි,

——xx——

තවද මේ ප්‍රේතවස්තු ප්‍රකරණයෙහි පළමුවන උරගවර්ගයෙහි පස්වෙනි "නිරොකුඩ්ඩ ප්‍රෙතවස්තුව" කවරහයත්එක්සම යෙක්හි සර්ව්වාලසයන් පරෝපදේශ රහිතව සර්වාකාරයෙන් නැ සුවාවු මාර භයඛකරවූ බුදුරජනන්වහන්සේ රජගහනුවර වැඩ වාසයකරවදාරණකල්හි බොහෝ ප්‍රෙතයන් අරබයා මේ ප්‍රෙත කථාව වදාළ සේකඒ කෙසේදයත්එහි විස්තර කථාව මෙ සේ දතයුතු

මේ මහාබද්‍රකල්පයෙන් මතෙනුත් දෙයාතුවන කල්පයෙහි කාසි පුරනුවර තුවරෙක්හුයේය, එහි ජයසේනනම් රජෙක්හුයේය, ඔහු ගේ අග්‍රමහෙසිකාවූ සිරිමහ නම් දේවියගේ කුස පුෂ්සනම් බොධි සත්වයන්වහන්සේ පිළිසිඳගත බහිනිස් ක්‍රමණුව අනුක්‍රමයෙන් සම්මක් සම්බෝධිය අවබෝධ කළසේක...ඉක්බිති ජයසේන රජතෙම මාගේ පුත්‍රතෙම මහණුව බුදුවූයේය. මාගේම ධර්මය මාගේම සංඝයායයි නියා මම්බවය උපදවා හැමදවස බුදුන් දහම් සංඝයාට තෙමේම උපස්ථානකෙරෙයි අනික් තොතෙනුට අවකාශ නොදෙන්නාහ...එකල බුදුන්ගේ මලතුවෝ තුන්දෙන මෙසේ සිතන්නාහු බුදුවරුනම් සියළු ලොකයාහට වැඩ පණිස උපදින්නාහුය...එකකුටම වැඩ පිණිස නොවෙයි අපගේ පියානන්ට හන්සේද බුදුන්ට උපස්ථාන කරණ්ට අන්‍යයන්ට අවකාස නොදෙන්නාහ කෙසෙ අපි භාග්‍යවතුන්වහා සංඝයාහටත් උපස්ථාන කරන්ට ලබමොදුයි සිතන්නාවූ ඔවුන්ට මෙසේ සිතෙක් පහල විය යම් කිසි උපායක් කරමුයයි නියා ඒ සහෝදරයෝ තුන්දෙන ප්‍රත්‍යන්තජනපද වැසියන් කුපිතවූ වාක්හුමෙන් කෙරෙවූවා හුය...එහෙයින් රජතෙමු ප්‍රත්‍යන්ත ජනපදවාසීහු කුපිතවූයේයයි අසා පුත්‍රයෝ තුන්දෙනම ප්‍රත්‍යන්ත ජනපද වැසියන් සන්සිඳවන්ට යවූවාහ. ඔහුගොස් සන්සිඳවා ආවාහුය, පියරජතෙම සතුටුව කැමතිවූ වරයක් ගනුනියා වරදුන්නේය ඔවුන් නියන්නාහු අපි භාග්‍යවතුන්ට උපස්ථානකරන්ට කැමැත්තෙමුයයි නිවාහ එකල රජතෙම ඒ හැර අනිකක් ගනිවූයයි නියේය. අපට අනික් දෙයකින් ප්‍රයෝජන නැතැයි නිහ. එසේවිනම් කලක් නියම කොට ගනිවූයයි නි කල්හි සත්හවුරුද්දක් මුළුල්ලෙහි උපස්ථාන කෙරීමට යාඥුකළාහුය, රජතෙම ඒ නොපිළිවිනැසිනිය, මෙසේ සාවුරුද්දක්ද පස් හවුරුද්දක්ද හාර හවුරුද්දක්ද තුන්හවුරුද්දක්ද අවුරුද්දක්ද අවුරුද්දක් සත්මසක්ද සමසක්ද පස්මසක්ද සාරමසක්ද දුනම්නැවයි ඉල්වාත නොලැබුනුහෙයින් තුන්මසක් මුළුල්ලෙහි උපස්ථානකරන්ට අවකාශ ඉල්ලුකල්හි හැර ගනුවයි අවකාශ දුන්හ. එකල ඔවුහු භාග්‍යවතුන් කරා ගොස් මෙසේ සැලකළේය, සවාමිනි අපි භාග්‍යවතුන්ට තුන්මසක් මුළුල්ලෙහි උපස්ථානකරන්ට කැමැත්තෙමුව, සවාමිනි භාග්‍යවතුන්වහන්ස ඉව තුන්මස අපහේ ආරාධනාවෙන් වස් විසීම බුදුරජනෙ ඉවසා වදුළ මැණවයි කී කල්හි භාග්‍යවත් තෙම තූෂ්ණීන් භාවයෙන් ඉවසාවදුළසේක...ඒ තුන්දෙන තමන්ගේ ජනපද නියුක්ත පුරුෂයාහට කියා යවන්නාවූ මේ තුන්මස මුළුල්ලෙහි අපි විසින් භාග්‍ය

එතුන්ට උපස්ථානකරන්ට හාරගනිමුව එහෙයින් වස්වැසීමට ලැ
ගුම්ගෙවල් ආදී බුදුරජාණන්ට උපස්ථානයට සුදුසු සියල්ල සම්පාද
නයකොටයි කියා ලියායුවූ කල්හි ඒ පුරුෂතෙමේ ඒ සියලල සම්පා
දනයකොට දෙවෙනිව රාජපුත්‍රයන්හට දන්වායවීය එකල ඒ රාජ
පුත්‍රයෝ තුන්දෙන කසාවසහුණු දෙදහස්පන්සියයක් මෙහෙණ
රුවන් සමඟ බුදුන්ප්‍රමුඛ භික්ෂුසංඝයාට මනාව උපස්ථාන කෙරෙ
මින් ජනපදයට වැඩමවා ගොස් විහාරය පාවාදී වස්වැසෙවුවාහු
ය ඔවුන්ගේ එක් භාණ්ඩාගාරික ගෘහපති පුත්‍රයෙක් ඇත්තෙය,,
සඩ්ඪ භා ප්‍රශන්නයත් ඇත්තෙන් හෙතෙම බුදුන්ප්‍රමුඛවූ සංඝ
යාහට සකස්කොට දුනවසකුව දුන්නේය. ජනපද නියුක්තක
පුරුෂතෙම ඒ හෙණ දනවූවැසි එකොළොස් දහසක් පුරුෂයන්
හා සමඟ සකස්කොටම දුනවසකුවයවීය,ඔවුන් අතුරෙන් සමඟර
දෙනෙක් නටුවාවූ යඩ්ඩියින් ඇනී හෙයින් දුශ්‍යවූ සිත් ඇත්තාහු
ඔවුහු දනට අනන්තරාකොට දුනවසකුව තමුම්ම කැවාහුය දුන
සාලාවද ගිනිලැවූහ පිරිවර සමඟ ඒ රාජපුත්‍රවරහු භාග්‍යව
තුන්ට සත්කාරකොට භාග්‍යවතුන් පිරිවරා පියානන්ලඟට ගියා
හ, බුදුරජනෝ එහි වැඩමවා පිරිනිවන්පාවදුලසේක,, රාජපුත්‍ර
යෝ තුන්දෙන හා ජනපද නියුක්තකයාද භාණ්ඩාගරිකයාද
පිළිවෙලින් මැරිගොස් පිරිස් සමඟ දෙවුලොව උපන්නාහ
නටුවාවූ සඩ්ඪඇතිව දන්කැ මනුෂ්‍යයෝ මැරිගොස් නරකයෙහි
උපන්නාහුය, මෙසේ ඒකුසල් කලාවුන් හා දන්කැමෙන් අකුසල්
කලාහුන් සවර්ගයෙන් සවර්ගයට හා නරකයට යන්නවුන්ට දෙ
සානුකල්පයක් ඉක්මී ගොස්නැවත මේ කල්පයෙහි **කාශ්‍යප** බුදුන්
කලද ඒ මනුෂ්‍යයෝ නැවතත් ප්‍රෙත අපායෙහිම උපන්නාහුය,,ඒ
කල මනුෂ්‍යයෝ තමතමන්ගේ ඤාතිප්‍රෙතයන් පිණිස දන්දී මේ
පින් අපගේ ඤාති ප්‍රෙතයින්ට වේවයි කියා පින් දෙන්නාහ, ඒ ඒ
ප්‍රෙතයෝ පින් අනුමෝදන්ව දිව්‍යසම්පත් ලබන්නාහුවෙති,,එකල්
හි මේකී ප්‍රෙතයෝ ඒදැක කාශ්‍යප බුදුන්කරා ගොස් කිමේකද
ස්වාමීනි අප්ත් මෙබඳු සම්පත් ලබමෝදැයි විමාළාහ, එකල බුදු
රජනෝ වදුරණසේක් තෙපි දන්සම්පත් නොලබන්නාහ, අන
ාගතයෙහි වනාහි ගෞතම නම් සර්ඥකෙනෙක් ලොවපහළ
වෙයි ඒ භාග්‍යවතුන්ගේ කාලයෙහි බිම්සර නම් රජෙක්වෙයි,
හෙතෙම මෙයින්මතු දෙයානුවන කල්පයෙහි තොපගේ නෑ
යෙක්වූහ, ඒ බිම්සර රජතෙම බුදුන් ප්‍රමුඛ සංඝයාවද දන්දී තො
පට පින්දෙනි, එකල සම්පත් ලබන්නෝවේදැයි වදුළසේක මෙ
සේ වදුළකල්හි වනාහි ඒ ප්‍රෙතයන්ට තෙපි සෙව දවසෙහි දිව්‍ය
සම්පත් ලබන්නාහුයයි වදුළාමෙන් සතුටුවූහ. එනැන් පටන් එක්

බුඩානනාරයක් ඉක්මුතු කල්හි අප භාග්‍යවත් තෙම මෙලොව පහ
ලව් වදාළේය—එකල්හි ඒ රාජ පුත්‍රයෝ තුන්දෙන පිරිවර ස
මග දෙව්ලොවින් චුතව අවුත් මගධරට බ්‍රාහ්මණ කුලයෙහි ඉපිද
වැඩිවිය පැමිණ ඉෂි ප්‍රවෘජ්‍යාවෙන් මහණව ගයාසීසීයෙහි "තුන්
බැජට්ලයෝ" වූහ, ජනපද නියුක්ත පුරුෂතෙමේ බිම්බිසාර මහ
රජ වූයේය, භාණ්ඩාගාරික ගෘහපති පුත්‍රතෙම විසාඛ නම් සිටා
නොවූහ, ඔහුගේ භාර්‍යාව ධම්මදින්නා නම් සිටුදුවනියෝ වූයේ
ය. ඉනිර් පිරිස රජහට පිරිවරව උපන්තාහුය අප බුදුරජනෝද
බෝමැඩ චප්‍රාසනාරූඪව මාරපරාජයකොට ලොවුතුරා බුඩභයට
පැමිණ සත්සතියවා ක්‍රමයෙන් බරනැසට වැඩ ඉසිපතනාරාමයෙ
හි දී දම්සක් පවතා පස්වග මහණුන් ආදීකොට දහස දහස
පිරිවරවූ තුන්බැජට්ලයන්ට මාගීහළිලදි වදුරා රජගහනුවරට
වැඩිසේක—එහිද තමන්වහන්සේකරා පැමිණ බිම්බිසාර රජතු
අහුමගධ දෙරටවාසී එකලොස් නහුතයක් බ්‍රාහ්මණ ගෘහපතීන්
හා සමග සෝවාන් ඵලයෙහි පිහිටවා වදාළසේක—ඉක්බිත්
තෙන් රජතුවිසින් පසුව දවසට බතින් ආරාධනා කරණලදුව ඉව
සා වදාරමින් දෙවෙනි දවස මානවක ශරීරයෙන් සුක්තාව පෙර
ටුව යන්නාවූ ශක්‍රදේවේන්ද්‍රයා හා සමග රජගහනුවරට වඩිනා
කල්හි දමනලද ඉඳුරන් ඇති බුදුරජනෝ දමනලද ඉන්ද්‍රියන්
ඇතිවූද කෙලසයන් කෙරෙන් මිදුනාවූ බුදුරජනො කෙලසයන්
කෙරෙන් මිදුනාවූද පුරාණජටිලයන් සමග ශ්‍රීගනික සුවණී වණී
ශරීර ඇතිව භාග්‍යවත්තෙව රජගහනුවරට වැඩිසේකැයි යනාදී
වසයෙන් නුවර වැස්සන් විසින් කරණලදඝතුති ඝෝෂා ඇතිව
රජගහනුවරට වැඩමවා බිම්බිසාර රජතුගේ මාලිගාවෙහිදී මහදන්
පිළිගෙණ වදාළේය—ඉහතකී ප්‍රෙතයමුහයද රජතෙම දැන් අපි
උදෙසා පින් දනියි සිතා රජගේ පිරිවරා සිටියහ. දන්දී බිම්බිසාර
මහරජ තෙම සිතනුයේ බුදුරජනෝ අද කොතැන්හි වැඩසිටින්
නේදැයි යනාදීන් භාග්‍යවතුන්ගේ විහාරස්ථානය සිතුහ, ඒ දනෙ
හි ජන් නිසි කෙනෙකුට නුදුන්හ ඒ හෙයින් දන්නොලැබ ප්‍රෙත
යෝ සුන්නාලයට රාත්‍රිදිනයෙහි රජගෙයි භයානකලෙසින් මුර
හැසුවහුය, රජතෙම භයවහා කලකිරීමට පැමිණ හිඳ අඑයම්
කල්හි ගොස් බුදුරජනාත්ට එපවත් සැලකලෝය, මෙබඳු භයා
නක ශබ්දයක් ඇසුයෙම් ස්වාමිනි මට කිමේක්ද දැයි විවාළේය.
එවිට බුදුරජනෝ වදාරණසේක් මහරජ භයනොවේව, නොපව
නිසින් අනිෂ්ට විපාකයක් නොවෙයි එහින් නොපව වෑසීවන්නේය,
එකුදුවුව නොපගේ පුරාණ කුනිගු ප්‍රෙතාත්මයෙහි උපන්නෝ
ඇත, ඔවුන් එක් බුඩානනාරයක් මුළුල්ලෙහි නොපම ප්‍රාණීනා

කරන්නාහු බුදුන්ට දන්දී අපි උදෙසා පින්දෙනිසි සිතා ඇවිදින් නාහුය, නොපි ඔවුන්ට රජේ දවස දන්දී පින් නුදුන්නේයයි, එ හෙයින් සිදුනාවූ සම්පත් ඇලය ඇතිව එසේ භයානක ලෙසින් ශබ්දකලාහුයසි වදාළේය-නිමෙක්ද සඩාමිනි දුන් නමුත් දුන් කල්හි ඔවුන් සම්පත් ලබන්නාහු දැයි විචාළේය, එසේය මහරජ ලබනැයි වදාළේය, එසේ වීනම් සඩාමිනි නුබවහන්සේ සංඝයා හා සමග සෙට දවසෙහි මාගේ දන ඉවසා වදාළමැණව ඔවුන්ට පින් දෙමියි කියා ආරාධනා කළේය, බුදුරජානෝ තූෂ්ණීන්භාවයෙන් ඉවසා වදාළසේක-රජතෙම රාජනිවෙසනයට ගොස් මහදන් පිළියෙලකරවා භාග්‍යවත්හට කල්දන්නෙවූයේය, බුදුරජනෝ රාජමාලිගාවට වැඩමවා භික්ෂුසංඝයාහා සමග පනවනලද අසුන් වල වැඩහුන්සේක, ඒ ප්‍රෙතයෝද අද අපි සම්පත් ලබන්නෙමුයයි කියා ගොස් භික්තිප්‍රාකාරාදියෙන් පිටත සිටියාහුය, සම්සේ ඒ ප්‍රෙතයෝ සියල්ල රජහුගේ ඇස් ඉදිරියට පැමිණියාහු වෙද්ද භාග්‍ය වතුන්වහන්සේ එසේ අධිෂ්ඨානකොට වදාළේය, රජතෙම දකුණු නෝදකය දෙමින් මේ පින් මාගේ ඤාතිප්‍රෙතයින්ට වේවයිකියා දක්ෂිණෝදකය දුන්නේය, එකනෙහි ප්‍රෙතයින්ට කම්ලොත්පල යෙන් ගැවසීගත් පොකුනු පහලවූහ, ඔවුන් එහි නහා සත්සිදවා ගත්දිය විලිහා ශරීර කලාන්ත පිපාසයන් ඇතිව රණ්වණ්වූ ශරීර ඇතිවූවාහුය-නැවත රජතෙම කෑදකැවිලි හා හොඳුයන්දී පින්දුන්හ, ඒ ක්ෂණයෙහි ඔවුන්ට දිව්‍යමයවූ කෑද අවුළු හා ආහර ද පහලවූවාහ, ඒ ප්‍රෙතයෝ ඒ දෙය අනුභවකොට ප්‍රනීතවූ ශරී රය ඇතිවූවාහුය, නැවත රජතෙම වස්ත්‍ර හා සෙනාසනදී පින් දුන්නාහ, එකල ඔවුන්ට දිව්‍යවස්ත්‍රා හා දිව්‍යප්‍රාසාද සෙනසුන් පසතුරුනු අලඞ්කාරවිධින් පහලවූවාහ, ඔවුන්ගේ ඒ සියළු සම්පත් රජහුට පෙනෙනසේ භාග්‍යවතුන්වහන්සේ අධිෂ්ඨාන කළසේක, එවිට රජතෙම ඒ සම්පත් දැක ඉතාම සතුටු සිත් ඇතිවූය, ඉක්බිති බුදුරජනන්වහන්සේ දන් වලඳ පවරණලදුව, බිම්බිසාර මහරජහට අනුමෝදනා පිණිස තිරොකුඩ්ඩ සුත්‍රය වදාළසේක-

14 තිරොකුඩ්ඩසු තිට්ඨන්ති,, සන්ධි සිංඝාට කෙපුව
මාරබාහා සුතිට්ඨන්ති,, ආගන්ත්වාන සකං සරං-

15 පහූතෙ අන්නපානම්හි,, බජ්ජොජෙප්ප උපට්ඨිතෙ
න තෙසං කොචි සරති,, සත්තානං කම්මපච්චයා-පෙ-

16 සෝ සුති ධම්මෝ ච අයං නිදස්සිතෝ
පෙතානං පූජාව කතා උළාරා,
බලව භික්ඛු මනුපප දිනානං
තුමෙහි පුඤ්ඤං පසුතං අනප්පකන්ති

14 යනු හෙයින් මහරජ සුතිප්‍රෙතයෝ තමන් පෙරව්සූ ගෙදරට හෝ පෙර නැයින්ගේ ගෙදරට හෝ අවුත් භික්ෂුනියෙන් පිටත හා ග්‍රහසන්ති ආදියෙහිද සතරමංසන්ධියෙහිද දොරබා සම්පයෙහිදසිටියාහුය

15 ඒ ඒ කුලවල්වල බොහෝ බාද්‍යභෝජ්‍යාදි ආහර පිළියෙල කළ කල්හි මිය පරලොවහිය අසවල්නු උදෙසා පින්දියයුතුයයි කියා ඒ ප්‍රෙතයන්ගේ බලවත් අකුසල කම්මය හේතුකොට ගෙණ නිසි ප්‍රෙතයන්හු සිහිනොවෙයි ඒ නැසමූහයාගෙන්යමෙක් සුතිප්‍රෙතයින්ට අනුකම්පා ඇතත්නාහු වීනම්, මහරජ නොපි විසින් මේ දන් දුන් ප්‍රකාරයෙන් පවිත්‍රව ප්‍රණීතකොට නිසිවූ කාලයෙහි කැපවූ ආහාර පානාදින් පිළියෙලකර මේ දෙය අපගේ සුතිප්‍රෙතයින්ට ලැබේවා, සුතිප්‍රෙතයෝ සුවපත්වෙත්වයි කියා දෙන්නාහුය. එසේකල්හි ඔවුන් එහි රැස්ව බොහෝවූ ආහාර පානාදීන් මනාකොට අනුමෝදන් වෙන්නාහ. එසේ පින් අනුමෝදන්ව සුවපත් වී, මේ ප්‍රකාර නියති යම් නැකෙනෙක් විසින් අපි උදෙසා පින් දීමෙන් අපට මේ දිව්‍යසම්පත් ආදිය ලැබුනේද අපගේ ඒ නැයෝ බොහෝකල් ජීවත්වෙත්වා මේ පින් අපගේ සුතිප්‍රෙතයින්ට ලැබේවයි කියා අපට ඔවුන් විසින් පින්දීමෙන් අපිත පූජාකරණ ලදැමුව, දන්දුන් දායකයින්ටද නිසඵල නොව සඵලදවත්නේ යයි නියා මෙසේ සුතිප්‍රෙතයෝ නැයින්ට සතුතිකරන්නාහ

මහරජප්‍රෙතඅපායෙහි උපන්නවුන්ට ප්‍රෙත අපායෙහි ජීවත්වන්ට සැහෙන්නාවූ සීසැම් ගවපාලනාදියකුත් නැත්තේය, යම්සේ මනුෂ්‍යයෝ වෙළඳුමෙන් ජීවිකාකෙරෙද්ද එබඳු භිරන්ඤ සුවණ්ණ දියතුදෙනු ආදි වෙළඳුමකුත් නැත්තේය, ප්‍රෙත අපායෙහි උපන් ප්‍රෙතයෝ තම තමන්ගේ සුති ආදීන් විසින් දෙනලද සම්පතින් යාපනවෙති, පව්තයක් මුදුනෙහි වසිනලද ජලය පාතාලයට යම්සේ බස්නේද එමෙන් මේ සුතීන් විසින් දෙනලද දක්ෂිනාව ඒ සුතිප්‍රෙතයින්ට නෙවරදි එකනෙහි ලැබෙයි, යම්සේ කඳුරැලිවූ වැවු පොකුනු හොඳ ආදිය පිරීමෙන් ජලයගඟාවලට බස්නේවේද ගඟා පරිමෙන් මහාසමුද්‍රයට බස්නේවේද මෙපරිද්දෙන්ම සුති ආදීන් විසින් දෙනලද දක්ෂිණාව සුතිප්‍රෙතයින්ට ලැබෙන්නේ වෙයි ඔවුහු මනුෂ්‍යයෝව සිටිනාකල්හි මට මෙබඳු වස්තුවක් දුන්

නේය මව් මෙබඳු උපකාරයක් කළේ නම් මාගේ නැයාය මාගේ මිතු යාසි පෙර තමන්ට කළඋපකාරාදියසිහිකොට නැයන් විසින් ප්‍රේ තයන්ට දක්ෂිණාවදියයුතුවන්නේය මේහැර මියපරලොව්ගිය නැ යන් උදෙසා හැඬීමහා සොකකිරීමද විලාපකිරීමද ප්‍රේතයින්ට ප්‍රයෝජනනොවන්නේය ඤාතීන් විසින් මෙසේ පැවත්විය යුක්තේ ය කෙසේද මේදක්ෂිණාවදෙන ලද්දේය සංඝයා කෙරෙහි මනාව දක්ෂිණාව පිහිටවනලද්දේය,බොහෝකාලයක් මුළුල්ලෙහි අපගේ ඤාතිප්‍රේතයන්ට වැඩපිණිස ලැබේවයි කියා සම්පත් දියයුත්තේය.

16 ඤාතීන් විසින් ප්‍රේතයන්ට පැවැත්විය යුතු ධර්මනාවද මේ ප්‍රකරණයෙන් දක්වන ලද්දේය ප්‍රේතයන්ට මහත් පුණ්‍යවක්ද ක රණ ලද්දෙය, භික්ෂූන්ව ශරීරබලද දෙනලද්දේය මහරජ නොපි විසිනුත් බොහෝ පින්රැස්කරණ ලද්දේයයි වදාළසේක.

ජානුස්සොණී නම් බ්‍රාහ්මණතෙම බුදුරජානන්වහන්සේගෙන් විචා රන්නේය, භවත් ගෞතමයානන්වහන්ස අපි බ්‍රාහ්මණයෝ වන් නොමුව, ඒ අපි මේදානය අපගේ ඤාතිප්‍රේතයින්ට ලැබේවා මේදා නය ඤාතිප්‍රේතයෝ අනුභව කෙරෙත්වයි කියා ඤාතිප්‍රේතයන් උ දෙසා දානාදි පින් කරමහ කිමෙක්ද භවත් ගෞතමයානෙනි ඒ දන් ඤාතිප්‍රේතයින්ට ලැබෙන්නේවේද, කිමෙක්ද ඤාතිප්‍රේතයෝ ඒ දන් අනුභවකෙරෙද්දැයි සිවාලේය, එකල බුදුරජානෝ වදාරණ සේක් බ්‍රාහ්මණය ඉඤ්ඨානයෙහි ලැබෙන්නේය, අඤ්ඨානයෙහි නොලබන්නේයයි වදාළේය, භවත්ගෞතමයානෙනි ඤ්ඨානයකව රෙද අඤ්ඨානය කවරෙද්දැයි විචාළේය, බ්‍රාහ්මණය මේලෝකයෙහි සමහර පුද්ගලයෙක් තෙම ප්‍රාණඝාතාදි අකුසල් කෙරෙද මිථ්‍ය දෘෂ්ටික වේදයෙතෙම්මරනින්මත්තෙහි නරකයෙහි උපදින්නේය නේරයිකසත්ත්වයින්ට එහි යම් ආහාරයෙක් ඇද්ද, ඔහු එයින් යාපය වෙයිඔහු එහි ඒආහරය කරණකොටගෙණ සිටිනේය, බ්‍රාහ්මණය මේ අඤ්ඨානයෙක්වෙයි, එහිසිටියාහට ඒ දානය නොලැබෙන්නේ යතව්ද මේලෝකයෙහි සමහර පුද්ගලයෙක්තෙම ප්‍රාණඝා තාදිය කෙරේද මිථ්‍යාදෘෂ්ටිකවේද ඔහු මරණින්මත්තෙහි තිරිසන් අපායෙහි උපදනේය, තිරිසන් අපායෙහි යම් ආහරයෙක් ඇද්ද එයින් ඔහු එහි යාපෘවෙයි ආහරය කරණකොටගෙණ ඔහු එහි සිටිනේය, බ්‍රාහ්මණය මේන් අඤ්ඨානයෙක්වෙයි යම් තැනක සිටි යාහට ඒ දනනොලැබේද(ඔව්ද බ්‍රාහ්මණය,මේලෝකයෙහි යමෙක් ප්‍රාණඝාතාදියෙන් වැලැක්කේවේද, සම්‍යක් දෘෂ්ටිකවේද හෙතෙම මරණින් මත්තෙහි දිව්‍යලෝකයෙහි උපදින්නේය, ඒද චියන්ගේ යම් ආහරයෙක්වේද එයින් ඔහු එහි යාපෘවන්නේය. ඔහු එයින් එහි සිටිනේය, බ්‍රාහ්මණයයි යම් තැනෙක සිටියාහට

ඒ දැනයනොලබේද මේත් එක ආඛ්‍යානයෙක්වෙයි—බ්‍රාහ්මණය තවද මේ ලෝකයෙහි යමෙක් තෙම ප්‍රාණඝාතාදිය කෙරේද මිථ්‍යාදෘෂ්ටිකවේද ඔහු මරණින්මත්තෙහි ප්‍රෙත අපායෙහි උපදින්නේය, ප්‍රෙතලෝකයෙහි උපපත්තිකාලවුන්ට යම් ආහරයක්වේද එයින් ඔහු එහි යාපනවෙයි ඔහු එයින් එහි සිටින්නේය, යම් මිත්‍රාමාත්‍යයෙක් හෝ නැයෙක් හෝ ඤාතිප්‍රෙතයින්ට යම් සම්පතක් පමුනුවද්ද එයින් ඔහු එහි යාපනවෙයි එයින් ඔහු එහි සිටින්නේවෙයි බ්‍රාහ්මණය යම් තැනෙක සිටියාහට ඒ දැනය ලැබෙන්නේවේද මේ ඒ ඨානයවන්නේයයි වදාළේය)—එවිට බ්‍රාහ්මණතෙම කියන්නේ ඉදින් භවත් ගෞතමයානෙනි ඒ ඤාතිප්‍රෙතතෙම ඒ දන්දෙන තැනට නොපැමිණියේ වීනම් කවරෙක් ඒ දැනය අනුබවකෙරේදැයිවිචාළේය, බ්‍රාහ්මණය අනන්‍යඤාති ප්‍රෙතයෙක්ඒ ඨානයට පැමිණියේවේද ඔහු ඒ දැනය අනුභව කරන්නේය, භවත් ගෞතමයානෙනි ඒ ඤාතිප්‍රෙතද ඒ ඨානයට නොපැමිණියේවෙයි අන්‍යඤාතිප්‍රෙතයෙක්ද ඒ ඨානයට නොපැමිණියේය එකල ඒ දැනය කවරෙක් අනුභවකෙරේදැයි විචාළේය, බ්‍රාහ්මණය යම් හෙයකින් බොහෝ දිඝීකාලයක් ඇවිදිනාවූ සඛයෝ අතුරෙහි ඤාති ප්‍රෙතයින්ගෙන් ඒ දන්දෙනතැන සිස්වේද, ඒකාරණය නොඑත්තේය, එසේවිනම්දු බ්‍රාහ්මණය දැයකයෝ දැනඵල සහිත වන්නාහුයයි වදාළසේක—(මේ තිරොකුඩ්ඩ සූත්‍රාන්තදෙශණාවකෙල වරදී ප්‍රෙත අපායෝත්පත්තියෙහි ආදීනව සලකා සිහිනුවනින් යෙදුනාවුන් ගෙන් සවාසූදඟසක් ප්‍රාණිහු සෝවාන් සකෘදාගාමී අනාගාමී අර්හත් යන සතර මග සතර ඵලයට පැමිණියාහුය—දෙවෙනි දවසද දිව්‍යමනුෂ්‍යයින්ට මෙම තිරොකුඩ්ඩසූත්‍ර දෙශනාකොට වදාළේය, මේ ක්‍රමයෙන් සත්දවසක්ම දේශනාකාලසේක. ඒ සත්දවස්හිම සවාසූදඟස සවාසූදඟස දිව්‍යමනුෂ්‍යාදීහු මාර්ගඵල ලාභිවූවාහුය—සඩ්ඛබුඩ්ධසම්පන්නවූ සත්පුරුෂවරුනි දන්වැව ගසාකෑමෙහි ආදීනව මෙසේන් තේරුන්ගෙන එබඳු අකුසල කර්ම යන් කෙරෙන් දුරුව කුසලයෙහි හැසිර සර්වඥමෝක්ෂ සම්පත් සිද්ධකරන්ට උත්සාහකටයුතු)—මේ ප්‍රෙතවස්තු ප්‍රකරණයෙහි පළමුවන උරගවර්ගයෙහි පස්වෙනි තිරොකුඩ්ඩ ප්‍රෙතවස්තුව කියා නිමවනලදී—

5 තිරොකුඩ්ඩ ප්‍රෙත වස්තුව නිමි,

—✕—

තවද මේ ප්‍රෙතවස්තු ප්‍රකරණයෙහි පළමුවෙනි උරගවර්ගයෙහි හවෙනි සව් පුන්න වාදක ප්‍රෙත වස්තුව' නම් කවරහයහැ?

තවද එක් සමයෙක්හි මාරාරිහංකාර මථනයකලාවූ බුදුරජාණන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ ජේතවන මහාවිහාරයෙහි වැඩවාසයකර වදුරණ කල්හි පුත්‍රයන් පස්දෙනෙක් කෑ ප්‍රේතියක් අරබයා මේ ප්‍රේතවස්තුව දේසනාකරණලද්දේය.

සැවැත් නුවරට නුදුරු ගමෙක එක්තරා කෙලෙඹි පුත්‍රයක්හුගේ භාර්‍යාව වදවූයේය, එකල ඒ කෙලඹිපුත්‍රයාහට නැයෝ කියන්නාහු තාගේ භාර්‍යාව වදවූයේ වන තොපට අනිත්සත්‍රියාවක් ගෙනෙවියයි කිවාහ හෙතෙම භාර්‍යාවකෙරේ සෙනහයෙන් නොකම්පිතවූහ, ඉක්බිති ඔහුගේ භාර්‍යාව එපවත් අසා සවාමියාහට මෙසේ කියන්නිය, සවාමීනි මම වදවූයෙමි කුලවංසය නොනස්නා පිණිස අනික් සත්‍රියාවක් ගෙනායුතුයයි කිය, හෙතෙම ඇවිසින් එක්වන්වෙලාසම්න් පීඩාකරණුලබන්නේ අනික්සත්‍රියාවක් ගෙනායේය, ඕතොමෝ මැතකාලයෙහි බඩදරිවිය, වදසත්‍රි සිතන්නී මෝතොමෝ පුත්‍රයෙකුවපු මේ කුලයට ප්‍රධාන වන්නියයි සිතා ඊර්ෂ්‍යාවෙන් මඩිනලද සිත් ඇතති ඇගේ ගැබ හෙලන උපායක් සොයන්නි එක්තරා පරිබ්‍රාජකකු ආහාරපානාදියෙන් සතපපා ඒ පරිබ්‍රාජකයා ලවා ගැබවැටෙනබෙහෙත් ඇට දෙවෙවූයේය, ඕතොමෝ දරුවාවැටුතුකල්හි තමාගේ මැනියන්ට කිය. මැනියෝ තමුන්ගේ දෙපාශ්වයෙ නැයෝ එකතුකොට ඒ ප්‍රවෘත්තිය දන්විය,ඒ නැයෝ වදසත්‍රිට මෙසේ කියන්නාහු නි විසින් මැගේ දරුගර්භය හෙලනලද්දේ වනැයිකිහ, එවිට ඕතොමෝ කියන්නි මම නොහෙළුයෙමියි කිව ඉඳින් නි විසින් නොහෙළුයේ විනම් දිවුරවයි කිවාහුය,ඉඳින් මා විසින් මැගේ දරුගර්භය එලනලද්දේ විනම් දුගතියෙහි ඉපිද ක්ෂා පිපාසයෙන් මැඩෙනලදුව උදය සවස දෙකහි දරුවන් පස්පස් දෙන වදුකාන් නෑහනියකට නොපැමිණෙම්වයි නිරන්තරයෙන් දුර්ගන්ධය වහනය වන්නාවූ මැස්සන්ගෙන් ගැවයිගත් ශරීර ඇතිවෙම්වයි කියා බොරුවෙන් දිවුලේය, ඕතොමෝ නොබෝ කලකින් මැරී ගොස් එම ගමට නුදුරුතෙන්හ දුර්ණ ශරීර ඇතිප්‍රේතියක්ව උපන්නියෙකල අනවුදේහි වස්ත්‍රාවූ නෙරහු අට නමක් ශාස්තෘන්දක්නා පිණිස සැවැත්පුරට එන්නාහු ඒ ගමට නුදුරුතැන සෙවනඟ ජලයෙන් යුක්තවූ අරණ්‍යක වාසයට එලඹුනාහුය.එකල්හි ඒ ප්‍රේතිය තොමෝ තෙරුන් වහන්සේලාට තමාහේ ශරීරය පෙනා සිටියේය, ඒ තෙරුන්වහන්සේලා අතුරෙන් වැඩිමහළු ප්‍රධාන සඟ චිරයන් වහන්සේ මෙසේ වදුරණසේක.

(17) නගයා දුබ්බණ්ණ රූපාසි දුග්ගන්ධා පූතිවායසි,
මක්ඛිකාකපරි කිණ්ණාව කාතු ත්වං ඉධ තිට්ඨසිති.

(17) යතුහෙයින් එඛා නී විලිවැසිල්ලක් නැතිව ඉතා භයානඛ වන විරූපවත් ශරීරයක් ඇත්තේව දුර්ගන්ධය හමන්නේය හාත් පස්හි නිලමැස්සන්ගෙන් ගැවසීහන්තේව මෙහි සිටින්නාවූ නී කවරකෙනෙක් දැයි කියා මේ ගාථාවෙන් විචාළේය.

එකල්හිඒ ප්‍රෙනි තොමෝ තෙරුන්වහන්සේ විසින් විචාරණ ලදුව තමාගේ ප්‍රවෘත්තිය ප්‍රකාසකරමින් සඞ්ඝයන්ට සන්වේග උපදවන්නී මෙසේ කිව.

(18) අහංභදන්තෙ පෙතිමහි,, දුග්ගන්ධා යමලොනිකා
පාප කම්මං කරිත්වාන,, පෙතලොකං ඉතොගතා.

(19) කාලෙන පච්ච තිත්තානි,, සායං පච්ච පුනාපරෙ
විජායිත්වා නඛාදුම්,, තෙනනාහොසි මෙ අලං.

(20) පරිදය්හති ඡුපායති, ඡුදය හදයං මම
පානියං නලභෙ පාතුං,, පඤ්ඤං බ්‍යසනං ගතනති.

(18) සවාමිනි මම පෙර අකුසල්කොට මනුෂ්‍ය ලෝකයෙන් අවුත් යමලෝකයයි කියනලද මේ ප්‍රෙත අපායෙහි ප්‍රෙතව උපන්නෙම්.

(19) එසේවූ මම උදයකාලයෙහි දරුවන් පස්දෙනෙක් වදුකන් නෙම්, සවස් වේලෙහි දරුවන් පස්දෙනෙක් වදු කන්නෙමි, එයි තුත් මට තෘප්තියක් නැත්තේය.

(20 මාගේ හෘදය ක්ෂුධාවෙන් දත්තේය, දුම්නගන්නේයඛොන් නව පැනක්නොලැබ පිපාසයෙන් පෙළෙමි ව්‍යසනප්‍රාප්තවූ මා ඛැළුවමැනැවැසි කීයේය.

ඒ අසා තෙරුන්වහන්සේ ඇ විසින් පූර්වයෙහි කරණලද අකුස ලකර්මය විචාරන්නේ මෙසේ කීහ.

(21) කින්නු කායෙන වාචාය මනසා දුක්කටං කතං
කිස්සකම්ම විපාකෙන; පුත්තමංසානිඛාදසි.

(21) යතුහෙයින් එඛා ප්‍රේතිය නී පෙර කයින් වචසින් මනසින් කුමන අකුසල කර්මයක් කරණලද්දේද කුමන අකුසල කර්මයක් හේතුකොට ගෙණ දරුවන් මස් කන්නෙහි දැයි විචාළේය.

එකල්හි ප්‍රෙතදුව තමන් පූර්වයෙහිකළ අකුසලකර්මය ප්‍රකාශ කරන්නී මෙසේකීය.

(22) සපතිමෙ ගබ්භිනී ආසි,, තස්සා පාපං අචෙතයි
සාහං පදුට්ඨ මනසා,, අකරං ගබ්භ පාතනං.

(23) තස්සා වෙමාසි යො ගබ්භො ලොහිතක්ඛුසුව පග්ඝරි
තදස්සා මාතා කුපිතා,, මයහං ඤාති සමානයි.

(24) සපථංච මං කාරෙසි,, පරිසා පාප සීවම්මං
සාහං ඤාරව සපථං මුසාවාදං අභාසිඤ්ඤං.

(25) පුත්තමං සානි ඛාදුම්,, සපථං ච කතං මයා
තස්ස කම්ම විපාකෙන මුසාවාදස්ස චූභයං
පුත්තමං සානි ඛාදුම්,, පුබ්බලොහිත මක්ඛිකාති

(22) සවාමිනි මම පූර්වයෙහි සමානවූ සවාමියෙක් ඇති සත්‍රියෙක් වූ යෙමි මාගේ සැතිරවූ අනාක්සනි ගර්භිනිවූයේය,ඇට මම දරුකුවූ අකුසල කම්මයක් කෙළෙමි ගර්භිනිවූ ඒ සත්‍රියාව කෙරෙහි ඊර්ෂ්‍යා වෙන් දුශ්‍ය සින් ඇතිහෙයින් ඇගේ ගර්භිහෙළිම කෙළෙමි
(23) එකල ඇගේ දෙමස් ගැබ ලේ‍ඇවැගිරෙන්ට පටන්ගත්තේ ය, එකල්හි ඇගේමැනියෝ මට කෝපිව නැයෝ එකතුකරවා
(24) ඔවුන් වසින් මා දිවුරවන කල්හි දෙස්කියවන කල්හි බොරු කියා දිවුරන්නාවූ මම මෙසේ කිමි

25 ඉදින් මම මැගේ ගර්භපාතය කෙරෙවූයේවී නම් උදය සවස දරුවන් පස් පස්දෙන වදා කන්නට ලැබෙම්වා දුගිකිව මැස්සන් ගෙන් ගැවසුනාවූ ශරීර ඇතිවෙමහයි කියා දිවුරෙම් ගර්භපාතන අකුසලය හා බොරුවෙන් දිවුල අකුසලයද හේතුකොට ගෙණ උදය සවස දරුවන් පස් පස්දෙන වදා කෑමහා දුගිකිව නිල මැස්සන්ගෙන් ගැවසිගෙණ සැරව වැහෙන්නාවූ ශරීර ඇත්තෙ මි කිය)මෙසේ ඒ ප්‍රෙති නොමෝ තමාගේ අකුසලකම් විපාක ය දක්නා නැවත තෙරුන්වහන්සේට කියන්නී, සවාමිනි මම මේ ගමෙහි අසවල් නම් කෙළෙඹි දූනුයාහට භාර්‍යාව සිට ඊර්ෂ්‍යාවෙන් මධ්‍යනලද සින් ඇතිව අකුසල් කොට මෙසේ ප්‍රෙත අපායේ උපන් නෙම් එහෙයින් මැණව සවාමිනි ඒ කෙළෙඹිපුත්‍රයාගේ ගෙදරට වැඩිය මනාය, එකල හෙතෙම නුබවහන්සේලාට දන්දෙන්නෝ වෙයි ඒ දක්ෂිණාව ඔහු ලවා මට දෙවාපුව මැණව මෙසේ ඇති කල්හි මම මේ ප්‍රෙත අපායෙන් මිදෙමි කිව ඒ අසා තෙරුන්ව හන්සේලා ඇට අනුකම්පාකෙරෙමින් ඇ ප්‍රෙත ආත්මයෙන් චුත කරවන කල්පනා ඇතිව ඒ කෙළෙඹි පුත්‍රයාගේ ගෙදරට පිඬුපිණි ස වැඩියාහුය එකල්හි කෙළෙඹි පුත්‍රතෙම තෙරුන්වහන්සේලා දැක හටගත් ප්‍රශන්නය ඇත්තේ පෙරගමන් ගොස් පාත්‍රාගෙණ තෙරහු ආසනවල වැඩහිඳුවා ප්‍රනීතාහාර වලඳවන්ට පටන්ගත් තේය, එකල තෙරුන්වහන්සේලා ඒ ප්‍රවෘත්තිය කෙළෙඹි පුත්‍රයා හට කියා ඒ දන ඒ ප්‍රෙතියට දෙවෙවුවාහුය ඒ ක්ෂනයෙහිම ඒ ප්‍රෙතිනොමෝ ඒ දුකින් මිදී උදුරවූ දිව්‍යසම්පත්ලබා රාත්‍රියෙහි අවුත් කෙළෙඹි පුත්‍රයාහට තමන් දක්නා සිටියේය ඉක්බිත්තෙන් තෙරහු ක්‍රමයෙන් සැවැත් නුවරට ගොස් භාග්‍යවත් හට ඒ ප්‍ර වෘත්තිය සැලකලාහුය භාග්‍යවත් බුදුරජානන්වහන්සේ ඒ ප්‍ර වෘත්තියම අපෝහාත්‍යත්‍ති කොට ගෙණ සම්ප්‍රාප්ත පිරිසට ධර්ම

දේශනාකොට වදාළේය)—එකල්හි මහජනතෙම ලද්දවූ සංවේග ඇතිවූහ, ඊශ්‍යාමාත්සර්‍යයෙන් වැලකුනාවූ මහජනයාහට ඒ ධම්මදේශනාව සාර්‍ථකවූයේය)—මේ ප්‍රෙතවස්තු ප්‍රකරණයෙහි පළමුවන උරගවර්ගයෙහි හවෙනි පව පුත්තඛාදක ප්‍රෙතවස්තුව කියා නිමවන ලදී—

6 පව පුත්තඛාදක ප්‍රෙත වස්තුවර්ණනාව.

—*—

තවද මේ ප්‍රෙතවස්තු ප්‍රකරණයෙහි පළමුවන උරගවර්ගයෙහි සත්වෙනි සත්තාපුත්තඛාදක ප්‍රෙතවස්තුව කවරහයත්—එක් සමයෙක්හි අසණ සරණවූ ලොවට ස්‍රෙෂ්ඨ කරවූ ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ සැවැත්නුවර වැඩවාසයකර වදාරණ කල්හි පුත්‍රයන් සත් සත්දෙන කන ප්‍රෙතියක් අරභයා මේ කථාව වදාළසේක—

ශ්‍රාවැත්නුවරට නුදුරු එක්තරා ගමෙක එක්තරා උපාසකයක් හට පුත්‍රයෝ දෙදෙනෙක්වූහ. ප්‍රථම වයසෙහි සිටියාවූ ඒ පුත්‍රයෝ දෙදෙන රූප ලක්ෂණයෙන් හා සීලාචාර ගුණයෙන් යුක්තවූවාහ, ඔවුන්ගේ මැනියෝ පුත්‍රයන් නිසා උඩහුසිත් ඇති ඉඹියන් සැමියා නොසලකන්නිය ඒ පුරුෂතෙම භාර්‍යාව විසින් වහලෙකු තරම්වත් නොසලකා නින්දාකරණ ලදුව කලකිරුණාවූ සිත් ඇතිව අනික්ස්ත්‍රියාවක්ගෙනායේය, ඕතොමෝ නොබෝකලකින් ම ගර්භිණිවූය, ප්‍රථම භාර්‍යාව තොමෝ ඊශ්‍යාවෙන් මඩිනලද සිත් ඇතිව ගැබ වැටෙන එක්තරා බෙහෙතක් ආහාරසමග දුන්නේය, එයින් ඇගේ තෙමස් ගැබ වැටුනේය, ඉක්බිත්තෙන් ඇගේ නැයන් විසින්ද සැමියා විසින්ද ඇට මෙසේ කියන්නාහු නි විසින් මැරගේ ගැබ හෙලනලද්දැයි විචාරණලද්දී මම ගැබ නොහෙළුයෙමියි බොරු කියා ඔවුන් අදහානොගෙණ දිවුරවයි කියනලදුව ඉදින් මම මැරගේ ගැබ හෙළුයේවිනම් ඥාතිඥාතිවල උදය සවස දරුවන් සත් සත්දෙනාවද දරුවන්ගේ මස් කන්ට ලබමි වා නිලමැස්සන් ගෙන් ගැවසුනාවූ දුර්ගන්ධවූ සැරව වැහෙන සැරිර ඇතිවෙම්වයි කියා දිවුලේය, ඕතොමෝ මැතකාලයෙනි මැරී ගොස් ඇගේ ගැබ හෙළු අකුසලයෙන් හා බොරුදිවුල අකුසලයෙනුත් ප්‍රෙතියෙක්ව උපන්නිය—ඉඟත කී ප්‍රෙතියමෙන් උදය සවස දරුවෝ සත් සත්දෙනාගේ මස්කමින් එම ගමට නුදුරුව ඇවිදින්නේය—එසමයෙහි වනාහි බොහෝ භික්ෂූන් ග්‍රාමාන්ත සේනාසනයෙහි වස්වැසපවරා භාග්‍යවතුන් දක්නා පිණිස සැ

වැත් තුවරට එන්නාහු ඒ ගමට නුදුරුව එක් ප්‍රදෙශයෙක්හී වාස යකළෝය, එකළ ඒ ප්‍රේතියොදෙන ඒ තෙරුනුවහන්සේලාට ත මුන්දැක්වා සිටියේය,, එකල්හි ඇවැ මහතෙරුන්වහන්සේ මෙසේ කියනසේක්—

(26) නගහා දුබ්බණ්ණ රූපාසි දුග්ගන්ධා පූතිවායසි,
මක්ඛිකාහි පරිකිණ්ණා කාතුඛං ඉධනිට්ඨසි නි—

(26) යතුහෙයින් විලිවැසිලලක්නැනිව දුර්ණීවූ දුර්ගන්ධසැර ව වැගිරෙන්නාවූ නිලමැසඝන්ගෙන් ගැවසිනත් ශරීරයක් ඇති ව මෙතැන්හී සිටින්නාවූ නී කවරෙක් දැයි විවාළේය—එකල් හි ඒප්‍රෙති මෙසේ කියන්නී—

(27) අහං භදන්තෙ පෙතිම්හි, දුග්ගතා යම ලොකිකා
පාපකම්මං කරිත්වාන,, පෙතලොකං ඉධාගතා—

(28) කාලෙන සත්ත පූතානි,, සායං සත්ත පූනාපරෙ
විභාවිතාන ඛාදුම්,, තෙනාහොති මෙ අලං—

(29) පරිදය්හති ඣුපායති,, ඛුදය භදය මම
නිබ්බුතිං නාධි ගච්ඡාමි,, අග්ගිදඩ්ඪාව ආතපෙති—

(27) ඉති ගාථාවලින් මෙසේ කිය, ස්වාමිනි මම අකුසලනම් යක් කොට මනුෂ්‍යලොකයෙන් චුතව යමලෝකයයි කියනලද ප්‍රෙතලෝකයට පැමිණියෙම්—

(28) එසේවූ මම උදය සවස දරුවන් සත් සත් දෙනාගේ මස්කන්නෙමි ඒත් මට තෘප්තියක් නොවන්නේය—

(29) තවද ක්ෂුදා ගින්නෙන්මාගේහෘදය නිතර ඇවිලි දවන්නේය නිතර දුම්නගන්නේය,, ඉතා අධිකව තිබෙන අවුවෙහිදී එසේම බලවත්ගින්නෙන් දවන්නාක් මෙන් මේ ක්ෂාප්පාස දුකඛ යාගේ ව්‍යපසමන නොලබන්නෙමි කියේය—

එසා මහතෙරුන්වහන්සේ ඇ විසින් පුර්වයෙහි ක රණලද කර්මය විචාරණසේක්—

(30) නිනතු කායෙන වාචාය,, මනසා දුක්කටං කතං
කිස්ස කම්මවිපාකෙන,, ඒතාදිසං ඛාදසිනි—

(30) යතුහෙයින් එඛා ප්‍රෙතදුව තෙපි මනුෂ්‍යලෝකයෙහි උපන් කල්හි කයින් වචසින් මනසින් කුමන අකුසලකර්මයක් කෙළේද, කුමන අකුසලකර්මයක් හේතුකොට තොගේ දරුවන්

මස් කන්නෙහිදැයි විචාළේය, එකල්හි ප්‍රේතිනොමෝ තමන් ප්‍රේත අපායෙහි උපපත්තිකෙරීමට හේතුවූ අකුශලකර්මයහා දරුවන් මස් කෑමට හේතුවූ කාරණයද ප්‍රකාශකොට නියන්නී මෙසේ කිව—

(31) ආහුමයහං දුවේ පුත්තා,, උභො සම්පත්තායොබ්බණේ
සාඝං පුත්තබලූපෙතා,, සාමිකං අති මඤ්ඤිසං—

(32) තතො මේ සාමිකෝ කුඩ්ඩෝ,, සපත්තිං ආඤ්ඤමානයි
සාචගබ්භං අලභිත්ථ,, තස්සා පාපං අචෙතයිං—

(33) සාඝංපදුට්ඨ මනසා,, අකරිං ගබ්භ පාතනං
තස්සාතෙ මාසිකෝ ගබ්භෝ,, පූතිලෝහිත කොපති—

(34) තදස්සා මාතා කුපිතා,, මයහං ඤාතිසමානයි
සපථංවමං කාරෙසි,, පරිසපාප යී චමං—

(35) සාඝං ඝෝරං ච සපථං,, මුසාවාදං අභාසිඤං
පුත්තමං සානි ඛාදුම්,, සචෙතං පකතං මයා—

(36) තස්සකම්ම විපාකෙන,, මුසාවාදස්ස චූභයං
පුත්තමං සානි ඛාදුම්,, පුබ්බලොහිත මක්ඛිකාති—

(31) යහතු හෙයින් ස්වාමීනි මම මිනිස්ලොව උපන්කල්හී මාගේ යෞවන වයසට පැමිනියාවූ පුත්‍රයෝ දෙදෙනෙක් ඇතහාත පුත්‍රබලයෙන් යුක්තවූ මම ස්වාමිපුරුෂයාහට අනාදර කෙරෙම්—

(32) එකල්හි ස්වාමිපුරුෂතෙම මට කෝපිව අනික්ස්ත්‍රියාවක් ගෙනායේය, ඈ ගර්භිනිවූකල්හි ඈ කෙරේ ඊර්ෂ්‍යාවෙන් ඉඩකළඳ සිත් ඇත්තෙම් ඇට මම නපුරක සිතුයෙම්—

(33) ඊර්ෂ්‍යාප්‍රකෘති සිත් ඇති මම ඇගේ ගැබ් හෙළුයෙම් ඇගේ තෙමස්ගැබ කුනුලේ වැටින—

(34) එකල්හි ඇගේ මැනියෝ මට කෝපිව නැයෝ එකතු කොට මා දිවුරවූහ,මාලවා දෙස් කියවූහ—

(35) දිවුරන්නාවූ මම බොරුකියා දිවුලෙමි, ඉදින් මා විසින් ඇගේ දරුගැබ්වා හෙළුයේ වීනම් ජාති ජාතිවල දරුවන්මස්කන්ට ලබම්වයි කීයෙම්—

(36) ඒගර්භපාතන අකුසලකර්මය හා බොරුදිවුල අකුසලකර්ම හෙතුත් ප්‍රේතව ඉපිද ලේ සැරව වැකුනාවූ ශරීරඇතිව සිටි මම උදය සවස දරුවන් සත්සත්දෙනා වයූ දරුවන්ගේ මස්කත්නෙමි කියා—

මෙසේ ඒ ප්‍රේතිනොමෝ තමන් පෙරකරණලද අකුශලකම්මය ප්‍රකාශකොට නැවත මහතෙරුන්වහන්සේට කියන්නේ—

සාධුමනි මම මෙම ගම් අසවල් කොළඹ පුත්‍රයාහට භායඤ්ච සිව රූපීතයෙන් මඩිනලදු සින් ඇත්තෙන් අකුශල්කොට මේසේ ප්‍රේතාත්මේ උපත්නෙමි, යහපත සවාමිනි ඒ කෙලෙඹි පුත්‍රයාගේ ගෙදරට වැඩිය මනාය හෙතෙම ඔබවහන්සේලාට දන්දෙන්නේ ය, එකල ඔහුලවා මට දක්ෂිනාව දෙවාපුව මැණව මේසේ ඇති කල්හි ප්‍රේතලෝකයෙන් මාගේ මිදීම වන්නේයයි කියා—ඒ අසා තෙරුන්වහන්සේලා අටනම ඒ ප්‍රේතියකෙරේ අකුතභිපා සින් ඇත්තාහු ඇ ප්‍රේත ආත්මෙන් චුතකරවන සභාවෙහි පිහිටා ඒ කෙළඹියාගේ ගෙදරට පිඬුපිණිස වැඩියාහ, කෙලෙඹි පුත්‍රතෙමේ තෙරුන්වහන්සේලා අටනම දැක හටගත් ප්‍රසාද ඇතිව පෙරම ගට ගොස් පාත්‍රාගෙණ තෙරුන් අවදෙනාවහන්සේ ආසනවල වැඩහිඳුවා ප්‍රණීතාහාරවලදවන්ට ඇරඹිකල්හි තෙරුන්වහන්සේලා ප්‍රේතියගේ ප්‍රවෘත්තිය කියා ඒ දැනය ඒ ප්‍රේතියට උදෙසෙවු වාහ, එකෙනෙහිම ඒ ප්‍රේති තොමෝ ප්‍රේත දුකින්මිදී උදර දිව්‍ය සම්පත් ලබා රාත්‍රියෙහි අවුත් කෙලෙඹි පුත්‍රයාහට තමන් දක්නා සිටියේය—ඉක්බිති තෙරුන්වහන්සේලා ක්‍රමයෙන් සැවැත්නුවර වැඩ භාග්‍යවත්හට එපවත් සැලකළෝය, භාග්‍යවත් බුදුරජාණන්වහන්සේ ඒ අර්ථොත්පත්තිකොට ගෙණ සම්ප්‍රාප්ත පිරිසට ධර්මදේශනාකළෝය ඒ දේශනාව මහාජනයාහට සාර්ථක වූයේයි.

එන් මාර්ගඵලාම්වූ සද්ධාවන්ත සත්පුරුෂවරුන් බොරුකියා දිවිරී මෙහි ආදීනව මෙයින් දැන ගැබහෙලිමට බෙහෙත් යෙදීමෙන් හා බොරුදිවිරීමෙන් දුරුව කුසලයෙහි හැසිරී අනාගතයෙහි සව ශීලාමොක්ෂසම්පත් සිඛරගැනීමට උත්සාහ කටයුතු)—මේ ප්‍රේතවස්තු ප්‍රකරණයෙහි පළමුවන උරගවර්ගයෙහි සත්වෙනි සත්ත පූතභාදක ප්‍රේතවස්තුව කියා නිමවනලදි—

ෙ සත්තපූතභාදකප්‍රේතවස්තුව නිමි.

—*—

එවද මේ ප්‍රේතවස්තු ප්‍රකරණයෙහි පළමුවෙනි උරගවර්ගයෙහි අටවෙනි "ගොණප්‍රේතවස්තුව" නම් කවරහයත්—එහිපිළිවෙල කථාව මෙසේ දතයුතුයි—

එක්සමයෙක්හි ශාක්‍යසිංහවූ මාරාරීහ කේසරීක්‍රාන්තවූ ශාස්තෘත්වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවාසයකර වදුරණසේක්-

එකල සැවැත්නුවර එක්තරා කෙලෙඹි පුත්‍රයක්ගුගේ පියානෝ කාලක්‍රියාකලේය,ඒ කෙලෙඹි පුත්‍රතෙම පියා මැරුණු සෝකාග්නි යෙන්තැවුනාවූ සිත්ඇත්තේ විලාප කියමින් උමතුඋනු එකතු මෙන් ඇවිදිමින් යම් යම් කෙනෙක් දකින්ට ලැබුනේවි නම් ඔහු ගෙන් නිමෙක්ද තොපි පියානන්දුටුවේදැයි විචාරන්නේය එසේ විචාරන්නේ නමුදු කිසිවෙක් ඔහුගේ සෝක දුරුකරන්ට නොහැකිවූහ,ඔහුගේහෘදයෙහි වනාහි කලයතුල දිලෙනපහණක් මෙන් සෝතාපත්ති මාර්ගයට උපනිශ්‍රය සම්පත් දිලෙයි, ශාස්තෘවූ බුදුරජානෝ එක් දවසක් පෙරවරු වේලෙහි ලොව බලා වදුරණසේක් ඔහුගේ සෝතාපත්තිඵල ප්‍රාප්තියට හේතු සම්පත් දැක මෝහට අතීත කාරණය ගෙණහැරදක්වා සෝක සන්සිඳුවා සෝතාපත්ති ඵලය දෙන්ට වටනේයයි සිතා පසුව දවසෙහි පසුබත්වේලෙහි පිඬපාතයෙන් පෙරලා වැඩසේක් පසුම්හණක් හැරගෙණ ඔහු ගේ ගෙදරට වැඩසේක හේතෙම ශාස්තෘන්වහන්සේ ගෙට වැඩම්මවාගණ අවුත් බුදුරජානෝ පනවනලද ආසනයෙහි වැඩ හුන් කල්හි තෙමේත් භාග්‍යවතුන්වැඳ එකත්පසව හිඳ නිමෙක්ද සඞ්ඝාමින් මාගේ පියානෝ ගියතැනක් නුබවහන්සේ දන්නෙහිදැයි විවාලේය, එකල්හි ඕහට බුදුරජානෝ වදාරණසේක් උපාසකය නිමෙක්ද මේ ආත්මයෙහි පියානන් කැමැත්තෙහිද නොහොත් අතීතකාලයෙහි පියානන් කැමැත්තෙහිදැයි අසා වදාළසේක භෞතම එය අසා මාගේ පියානවොරු බොහෝයයි සිතා තුනිවූ සෝක ඇතිව මදක් සිත මඩ්‍යන්තකබවට පැමිණියේ එකල්හි ඕහට බුදුරජානන්වහන්සේ සෝකසන්සිඳෙන්ට නිසිවූ ධර්මදේශ නාක්‍රමයට පැහැවූ සෝක් ඇතිව සිත් මෘදුවූබව දැන චතුස්සත්‍ය දෙ ශනාක්‍රමයට යොදාන් ඵලයෙහි පිහිටවා වෙහෙරට වැඩසේක ඉක්බිත්තෙන් භික්ෂූන්වහන්සේලා දම්සභාවෙහි කථා ඉපදවූවා හුය ඇවැත්නි බුඩානුභාවයක් බැලුවම්‍රණව මහත් සෝකාග්නිය ඇති උපාසකතෙම භාග්‍යවත්හු විසින් සෝවාන් පෙලෙහි පිහිට වනලද්දේ වනැසි නියා කථානලෝය ශාස්තෘන්වහන්සේ එහි වැ ඩමවා පනවනලද ප්‍රවර බුඩාසන මාර්ගයෙහි වැඩහිඳ මහතෙ නි මෙහි දැන් තෙපි කිනම් කථාවකින් යුක්තව හුන්නාහුදැයි අසා වදාළෙය, භික්ෂූහු එපවත් භාග්‍යවත්හට සැලකළාහ

ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ වදාරණසේක් මහණෙනි මා විසින් දැන් පමණක් මොහුගේ සෝක දුරුකරණ ලද්දේ නොවෙයි පෙරත් මා විසින් මොහුගේ සෝක දුරුකරණ ලද්දේමයයි වදාරා ඒ භික්ෂූන් විසින් ආරාධිතවූ බුදුරජානන්වහන්සේ අතීත කථාව ගෙණහැරදක්වා වදාළසේක ඒ කෙසේදයත්

යටගිය දවස බරනැස්නුවර එක්තරා ගෘහපතියෙකුගේ පියානෝ කාලක්‍රියාකළාහ, හෙතෙම පියානන්ගේ මරණයකරණ කොට ගෙණ සෝකයට හා විලාපයට පැමිණ කඳුළුවැකුනු මුහුණු ඇතිව ලෙහි අතගසා හඬමින් ඔහුගේ ඇටතාබාපු සැයවටේ ඇවිද්නේය,, ඔහුගේ පුත්‍රවූ සුජාත නම් කුමාරයෙක් ඇත්තේය, . හෙතොම පඬිතය ව්‍යක්තය නුවනැත්තේය පියානන්ගේ සෝකය සංසිඳවන උපායක් සොයන්නේ එක් දවසක් පිටිනුවර එක් ගොනෙක් මැරුණ දැක තෘණහා පැන්ද ගෙණ ඔහුගේ ඉදිරියේ තබා කබඵකොට දෙමින් ජීවත්වහිඳින කල්හිමෙන් අනවමින් කාපිය ව බිපියව හියමින් සිටිනේය, ආ ආ මනුෂ්‍යයෝ ඒ දැක හිමෙන්ද සුජාතය තොපි මැරුණවූ ගොනාව තණකෑ පියව පැන්බිපියවයි කියන්නේ උමතුදැයි කියති හෙතෙම නිසිවක් නොකියන්නේය මනුෂ්‍යයෝ ඔහුගේ පියානන් ලහට ගොස් කියන්නාහු තොපගේ පුත්‍ර සුජාත කුමාරතෙම මැරුණු ගොනුට තානකවන්ට පැන් පොවන්ට තන්නේ උමතුවයයි කීවාහුය, ඒ අසා කෙලඹියාගේ පියානන් අරබයා පැවති සෝකය සන්සිඳි මං මාගේ පුත්‍රතෙම උමතුවූයේ වනැයි සිතා හෙතෙම සන්සිඳුනු පිතෘසෝකය ඇතිව ගොස් සුජාතය තොපි පඬිතයෙක් නොවේද ව්‍යක්තයෙක් නොවේද නුවනැත්තෙක් නොවේද කුමක් හෙයින් මැරුණවූ ගොනුට තන කවන්ට හා පැන්පොවන්ටත් උත්සාහ කරන්නෙහිදැයි විචාරමින් මේ ගාථාව්‍ය කියේය.

(37) කිනනු උම්මත්ත රූපොව,, ලාසිඤා හරිතං තිණං
ඛාදඛාදුති ලපසි,, මතං සන්තං ජරගාවං.

(38) නහි අන්නෙන පාණේන,, මතෝ ගොතොසම්බුඩ්ඪෙ
ඛාසි බාලොව දුම්මෙධෝ,, යථා තඤ්ඤව දුම්මතිති.

(37) යිනුහෙයින් සුජාතය නෙපි උමතු එනක්මෙන් වෙයි ව් ක්ෂිප්තායතුමෙන් වෙයි මැරුනු ගොනුට තනකඩා ගෙණවුත් දෙමින්තනකා පියව පැන්බිපියවයි කියන්නේය.

(38) මැරුණු ගොන්තොමේ ආහරපානයන් දීමෙන් නැගුට්ටන්ට නොහැකිවෙයි යම්සේ අන්‍යවූ නුවනැතිඅය කථාකෙරේද නෙපින් එබඳු අඥානයෙක් වෙයි බාලයෙක් වන්නේ යයි කීසේය.

එසේ අසා සුජාත කුමාරතෙම පියානන්ට තේරුම්කරමින් තමන්ගේ අභිප්‍රාව ප්‍රකාශකරන්නේ මෙසේ කිහ.

(39) ඉමෙපාදූ ඉමං සීසං,, අයං කායෝ ස වාලධි
නෙතා තථෙව හිටඨන්ති අයං ගොතෝ සම්බුඩ්ඪෙ

(40) අය්‍ය කස්සප හත්ථපාදා,, කායෝ සීසං පදිස්සති
රූදං මත්තික ථූපස්මිං,, නත්තුච්ඡං ඥෙව දුම්මතීති

(39) පියානෙනි මේ ගොත්තුගේ අත්පා ආදී අවයවයන් ඇත්තේය ජීවමාන කාලයෙහි මෙන් නේත්‍රයන් බබලයි වාලධියද නිබෙයි එහෙයින් තෘතෝදකය අනුභවකොට ගොත්තු දුන් නැගිටින්නේයයි සිතමි

(40) මාගේ මුත්තාත්තුවන්ගේ හස්තපාදයන්ද ශිසද නේත්‍රයන්ද යන තිසිවෙක් නොපනෙයි එසේවූ මුත්තාත්තුවන්ගේ ඇට තබා බඳිනලද මැටිසොහොන වැටී හඬමින් ඇවිදිනාවූ නොපි මටත් වඩා අශුණයෙක් නොවේදැයි කීහ

එ්ම අසා බෝධිසත්වයන්වහන්සේගේ පියානෝ සිතන්නේ මාගේ පුත්‍රතෙම පණ්ඩිතය ව්‍යක්තය නුවනැත්තේය මට තේරුම් දෙන පිණිස මේ ක්‍රියාව කෙළේවනැයි සිතා පුත්‍රවූ සුජාතය සියලු සත්ත්වයන්රෙණ සවහාව ඇත්තාක්‍රය ඒ බව මම දැනගනිමි මෙතැන් පටන්යොකනොකරන්නෙමි සොකහරණට සමර්ථයෝනම් නාසේ වන්නාක්‍රයයි කියා පුත්‍රයාහට ප්‍රසංශාකෙරෙමින් මේ ගාථා සතරෙකියේය

(41) ආදිත්තං වත මංසනතං,, සහා සිත්තංව පාවකං
චාරිනා වියඔසිචං,, සබ්බං නිබ්බාපයෙදරං

(42) අබ්බුලහං වත මෙ සල්ලං,, සොකං හදය නිස්සිතං
යොමෙ සොක පරෙතස්ස,, පිතු සොකං අපානුදි

(43) සචාහං අබ්බුලහ සල්ලොහම්,, සීතිභූතොස්මි නිබ්බුතො
න සොචා මිනරොදම්,, තවසුභාන මානව

(44) එවං කරොන්ති සප්පඤ්ඤ යෙහොන්ති අනුකම්පකා
විනිවත්තයන්තිසො කමහා,, සුජාතො පිතරං යථාති

(41) යම්නුහෙයින් පිතෘ සෝකාග්නියෙන් ඇවිලෙන්නාවූ මට ගිතෙල් ගැල්ළුවාක් මෙන්ද ගින්නට ජලය වත්කළාක් මෙන්ද මාගේ සියලු හෘදය ගිනන්නනිවූය

(42) මාගේ හෘදයෙහි පැවති සෝක නැමති හුල ඉදුරුයේය සෝකයෙන් පෙලෙන්නාවූ මාගේ පිතෘසෝකය දුරුකෙළේය

(43) දැනට මම ඉදිරිගියාවූ සොකඵල් ඇත්තෙමි, නිවුනාවූ සෝකාග්නි ඇත්තෙමි මෙතැන්පටන් මම් සෝක නොකරම් රෝදනය නොකරම් මානවකය නාගේ අවවාද අසා සෝකාදිය හැරියෙමි

44 ථිුජත කුමාරතෙම යම්සේ මාගේ සෝක සන්සිඳෙවූයේද වෙනත් සෝකසන්සිඳවන්නාවූ සුව නැත්තෝ මේ ප්‍රකාරයෙන් සෝක සන්සිඳවනිසි කියේය—

ඒ ගෘහපතිතෙම තමාගේ පුත්‍රවූ මානවකයාගේ අවවාදය අසා සෝක සංසිඳුවා ඉස්නානයකොට ආහර අනුභවකොට කම්මාන්ත කරමින් සිට මැරිගොස් දෙවුලොව උපන්නේය—ශාස්තෘවූ බුදු රජානන්වහන්සේ මේ ධම්මදෙශනාව ගෙණහැරදක්වා ඒ භික්ෂුව රුන්ට චතුස්සත්‍යය ප්‍රකාශකොට වදාළසේක චතුස්සත්‍යදේශනා වගේ කෙළවර බොහොදෙන සෝවාන් ඵලාදියට පැමිණි යේය.

එකල්හි සුජාත කුමාරයො නම් දැන් ලෝක සාම්වූ බුදුරජානෙ වූසේක)—මේ ප්‍රෙතවස්තු ප්‍රකරණයෙහි පළමුවෙනි උරග වග්ගයෙහි අටවෙනි ගෝනප්‍රෙතවස්තුව කියා නිමවනලද්දේ—

8 ගෝන ප්‍රෙත වස්තුව නිමි,

—*—

තවද මෙ ප්‍රෙතවස්තු ප්‍රකරණයෙහි පළමුවෙනි උරගවග්ගයේ නමවෙනි මහාපේසකාර ප්‍රෙතවස්තුව නම් කවරහයත්—එක් සමයෙක්හී දේවානි දේවවූ බුදුරජානන්වහන්සේ සැවැත්නුවර ජේතවනාරාමයෙහි වැඩවාසයකර වදාරණ කල්හි එක්තරා පේසකාර ප්‍රෙතියක් අරබයා මේ ප්‍රෙතවස්තුව වදාරණලද්දේය—ඒ කෙසේදයත්—

එක්භික්ෂුවු දෙළොස් නමක් පමණ ශාස්තෘන් වහන්සේගෙන් කම්මස්ථානයෙණ වාසස්ථාන සොයමින් ඇවිදිනාවූ වස්එළඹෙන දවස ලන්වූ කල්හි එක්තරා සෙවන හා ජලයෙන් යුක්තවූ රම්‍ය ආරණ්‍යයක් ඇත්තේය, ඒ ආරණ්‍යයට නුදුරුව ගොදුරුගම් නිබෙන්නා දැක ඒ වනාන්තරයෙහි එක් රැයක් වැස දෙවෙනි දවස ගමට පිඬුපිණිස වැඩියාහුය, ඒ ගමෙහිද පේසකාරකුල එකොළොසක් වෙයි ඒගම වැසි පේසකාරයෝ ඒ භික්ෂූන් දැක ගවගත් සොම්නස් ඇතියාහු තම තමන්ගේ ගෙවලට වැඩමවා හොස් ප්‍රණීත ආහර වලදවා ඉක්බිති මෙසේ කියන්නාහු සාමිනි තුවහන්සේලා කොයිවඩනාහු දැයි විචාළේය, අපට යම් තැනක් පහසුවේද එබඳු තැනයට යයි කීහ,, ඉදින් සාමිනි එසේවිනම් මෙහි වැඩසිටිය මැනව වස් එළඹිවසි කියා යාඥා කළෝය, භික්ෂුවු ඒ ආරාධනාව පිළිගත්හ,, උපාසකවරුද ඒ භික්ෂූන්ට ඒ ආරණ්‍යයෙහි ගෙවල් තනා දුන්නාහුය,, භික්ෂූන්වහන්සේලා අත්තැනට හොඟොස්

එහිම වස්ඵලඛුනාහ, එහී ප්‍රධාන පේසකාරතෙම භික්ෂූන්දෙනම කට සිව්පසයෙන් සකසාවි උපස්ථානකලාහ, අන්‍යයෝ එක එක භික්ෂූන්ගෙකට උපස්ථානකලාහුය, ප්‍රධාන පේසකාරයාගේ භාග්‍යා නොමෝ අසඳ්ධාවනතිය, රත්නත්‍රයෙහි ප්‍රසන්න නැත්තිය, මිත්‍යා දෘෂ්ටික වන්නිය, කොසඹරුකට ගිය කරිවලවැලමෙන් මසුරු සිත් ඇත්තිය, එහෙයින් භික්ෂූන්ට මනාව උපස්ථානනොකරන්නිය, ඒ පේසකාර තෙම ඒ දුක ඇගේම නැගනියන් ගෙනැවිත් තමාගේ ගෙයි ප්‍රධානත්වය දුන්නේය, ඔතොමෝ සඩ්ඩාව හා ප්‍රඥායත් ඇතව භික්ෂූන්ව මනාකොට උපස්ථානකලෙය, ඒ සියලු පේසකාරයෝ වස්ඵලඛ පැවරුවාවූ ඒ භික්ෂූන්ට එක එක නම් කට එක එක වසත්‍රය බැගින් පූජාකළාහුය—මසුරුවූ පේසකාර භාග්‍යාව එහි දූෂ්‍යවූ සිත් ඇතිව තමාගේ සවාමියාගෙට පරිභවකෙරෙමින් මෙසේ කියන්නිය, තාවසින් ශ්‍රමණ ශාක්‍යපුත්‍රයින්ට ගම් ආහර පානයන් දෙනලද්දේද, ඒ දෙය නිට පරලොවදී අසූචි මූත්‍ර හා සැරව්ව් පහලවේවා දෙනලද යම් වස්ත්‍රයෙක් ඇද්ද, ඒ වස්ත්‍ර ගිනිගෙණ දිලිහෙන ගපටවේවයි කීය—ඉන්පසු පේෂ්‍යාපේසකාරතෙම මැරිගොස් මහවනාන්තරයෙහි මහත් ආනුභාව ඇති වෘක්ෂ දෙවතාවෙකි උපන්නේය—ඔහුගේ වනාහි මසුරු සිත් ඇතිව සිටි භාග්‍යාව මැරිගොස් ඒ දේවතාවාගේ වාසස්ථානයට නුදුරුතැන්හි ප්‍රේතියෙක්ව උපන්නිය, ඔතොමෝ විලිවැසිල්ලක් නැතිව දුර්ණීවූ ශරීර ඇතිව ක්ෂුධාපිපාසයෙන් මැඩෙන ලදුව ඒ භූම්භාග දෙවතාවා සමීපයට ගොස් මෙසේ කියන්නී—සවාමිනි මට ඔදනට වසත්‍රයක් නැතිතෙයින් කනසැඵව ආහරයන්ද නැතිතෙයින් බලවත් ක්ෂුධා පිපාසයෙන් මැඩෙන ලදුව ඇවිදිමි,, මට වස්ත්‍ර හා ආහාර පානයත් දෙවයි කීය—

එකල දිව්‍යපුත්‍රතෙම ඇව දිව්‍යවූ උදුර ආහර පානයත් ගෙනැවිත් දුන්නේය, ඒ දෙය ඇ විසින් ගත් කෙනෙහිම අසූචි මූත්‍ර හා සැරවවන්නේය, දෙනලද ද්‍රව්‍යසඵද ඇ විසින් ගත්කල්හි ගිණි ගෙණ දිලිහෙන ගපටුවෙයි, ඔතොමෝ මෙසේ මහදුක් අනුභව කරමින් ඒ දෙය හැරදමා විලාපනියා හඬමින් ඇවිදින්නේය—එකල්හි එක්තරා භික්ෂූන්වහන්සේ නමක් වස්වැස පවරා බුදුන් වඳින්නට යන්නේ, මහත් ගැල් සාත්තුවාහයක් සමග මහවනාන්තරයට පැමිණියේය, සාත්තුවාහකයෝ රාත්‍රිදවසෙහි ගොස් දහවල් සෙවණහා ජලයෙන් යුක්ත ප්‍රදේසයක් බලා විසමුදු මදක්කළ් නැවතුනාහ—භික්ෂුගෙම විවේක කැමති බැවින් මදක් ඉවත්ව් ගොස් එක්තරා ඝනවූ අතුපතරින් යුත් බොහෝ සෙවන

ඇති රුකක්මුල සඟලසිවුර අස්නන්කොට පනවා නිදන්ව වන රාත්‍රි දවසෙහි මාගීයෙහි මිරිකිල්ලෙන් කලාතන ශරීර ඇත්තෙන් නිද්‍රාවට පැමිනියේය සාත්තුවාහකයෝ මදක්ප්‍රමාදව සිට යන්නව මත්වැදුනාහ එකල ඒ භික්ෂුතෙම නොපිබිදුනේය,, ඉක්බිති සවස්වේලෙහි නැගිට සාත්තුවාහකයන් නොදැක එක්තරා නොමාගීයකට බැස යන්නේ ක්‍රමයෙන් ගොස් ඒ දේවතාවා වසන තැනට පැමිණියේය.

ඒ කල්හී ඒ දිව්‍යපුත්‍රතෙම ඒ භික්ෂුව දැක මනුෂ්‍ය ශරීරයෙන් යුක්තව ලඟට අවුත් පිළිසඳර කථාකොට තමාගේ විමානයට වැඩම්වාගෙණ ගොස් පාදුබ්භාහා ඇයදී ගෞරවකරමින් සුන්නේය, එසමයෙහි වනාහි ඒ ප්‍රේතිනොමෝ අවුත් දේවතාවා හට කියන්නී ස්වාමිනි මට ආහාරපානයන්හා වසන්නාදෙවයි කී යේය.ඒ දිව්‍යපුත්‍රතෙම ඇට ඒ දෙය දුන්නේය, එකී දෙය ඇ විසින් ගත්කල්හිම ආහර පානයන් මලමුත්‍රහා සැරව වූයේය, විසඳුගිනිගෙණ දිලියෙන යපට වූයේය.ඒ භික්ෂුතෙම ඒ දැක හට ගත් කලකිරිලිඇතිව දිව්‍යපුත්‍රයාගෙන් මෙසේ විචාරණසේක්.

(45) ගූථං ච මුත්තං රුධිරංච පුබ්බං
පරිභුඤ්ජති භිසඤ අයං විපාකෝ
අයනත්තකිං කම්ම මකාසි නාරී
සබ්බඤ ලෝහිත පුබ්බ භක්ඛා.

(46) නවානි චක්ඛූනි සුභානි චෙව
මුදූනි සණ්හානිව ලෝම සානි
දිඝානි මිඤ්ඤ නිතකා භවන්ති
අයනත්ත කිං කම්ම මකාසි නාරීති.

(45) යුතුහෙයින් එබා දිව්‍යපුත්‍රය, මේ සත්‍ය නොමෝ අසුචිමුත්‍රහා ලේ සැරව අනුභවකරන්නීය මේ කුමන අකුසලයක් නුගේ විපාකයෙක්ද යම් හෙයකින් අසුචිහා මුත්‍රද ලේසැරවද හැම කල්හි අනුභවකරන්නීවද එසේවූයේ නොතොමෝ කුමන අකුසල කර්මයක් කරහෙයින්ද.

(46) මෘදුවූ සෞම්‍ය ඇති අභිනව දිව්‍යවස්ත්‍ර මැ විසින් ගත්තෙනෙහි ගිනිඇවිලි යපට වන්නේය ඒ කුමන අකුසල කර්මයකින් දැයි විචාලේය.

එසේ තෙරුන්වහන්සේ විසින් විචාරණලද දිව්‍යපුත්‍රතෙම ඇ විසින් පුර්වජාතියෙහි කරණලද අකුශලකර්මය ප්‍රකාශකරන්නේ.

(47) හරියාම මෙසා අහුහදනෙනා
අදුඹ කාමවශරි නික දරියා
සාමං දදනතා සමනබ්‍රාහමණානං
අක්කොසති පරිභාසතිච

(48) ගුථංච මුතතං රුහිරංච පුබබං
පරිභුජහා අසුචිං සබබකාලං
එතනෙන පරලොකසමිං හොතු
වතතාඑතෙ නිටකා භවනතු
එතාදිසං දුච්චරිතං චරිතා
ඉධාගතා චිර රතතාය ඛාදතීති

(47) සවාමිනි මොතොමෝ පෙර මිනුෂ්‍ය ලොකයෙහිදී මා ගේ භාර්‍යාවූහ හිසිවෙකුට කිසිවක් නොදෙනසුළුවිය මසුරු සිත් ඇත්තිය දැඩි මසුරුසිත් ඇත්තෙන් ශ්‍රමණ බ්‍රාහ්මණයින්ට දන් දෙන්නාවූ මට අක්‍රොෂ පරිභව බෙනෙන්නේය

(48) ශ්‍රමණයින්ට නොපදෙන ආහර පානයෙන් පරලොව්දී නොපව මලමුත්‍රහා සැරවවේවා නොපි විසින් දෙන වසනු නොපට ගිනිගෙණ දිලියෙන ගපට වේවයි කීයේය,, මෙවාක් දුශ්චරිතය කොට මිනිස්ලොවින් චුතව මේ ප්‍රේත ආත්මයෙහි ඉපිද හැම්කල මලමුත්‍රයහා සැරව අනුභවකරන්නියයි මෙසේ ඒ දිව්‍යපුත්‍රතෙම ඈ විසින් කරණලද අකුසලකම්මය ප්‍රකාශකොට නැවත ඒ භික්ෂූන්වහන්සේගෙන් විචාරන්නේ ස්වාමීනි මෑ මේ ප්‍රෙතලෝක යෙන් මුදවන්ට හැකිවූ උපායෙක් ඇද්දැයි විචාලේය

එකල තෙරුන්වහන්සේ කියන්නේ දිව්‍යපුත්‍රය ඉදින් භාග්‍යවතුන් සමඟ භික්ෂුසංඝයාට හෝ එකභික්ෂූවක් හට හෝ දන් ද මැට උදෙසන්නෙහි චිනාවි ප්‍රේතොමෝත් අනුමෝදන් වන්නේ චිනාවි මෙසේ ඇති කල්හි මෑ මේ දුනින් මිදී සුවයත් වන්නේ යයි කීසේකි ඒ අසා දිව්‍යපුත්‍ර තෙම ඒ භික්ෂූන්වහන්සේට ප්‍රතිහ ආහර පානයන්දී ඒ දක්ෂිනාව ප්‍රේතියට දුන්නේය එකතෙහි ඒ ප්‍රේතිතොමෝ සුඛිතව පිනාන සව්ඉන්ද්‍රියන් ඇතිව දිව්‍යභෝ ජනයෙන් තෘප්තිසහිත වූවාය නැවත එම භික්ෂූන්වහන්සේගේ අතට බුදුරජනන්වහන්සේට පූජාකරණ පිණිස දිව්‍යසළු යුගල යක්දී ඒ දක්ෂිනාවත් ප්‍රෙතියට දුන්නේය, එතනොහිම ඕතොමෝ දිව්‍යසළු හැඳ දිව්‍යාලඞ්කාරයෙන් සැරසි සියළු කාමයෙන් සමර්ඩව දිව්‍යස්ත්‍රීන්වක්සේ බබලමින් සිටියාය ඒ භික්ෂුතොමෙද ඒ දිව්‍ය

පුත්‍රයාගේ ආනුභාවයෙන් එදවස්හිම සැවැත් නුවරට ගොස් ජේතවනාරාමයට පැමිණි භාග්‍යවතුන් සවිමිපයට එළඹ නමස්කාර කොට ඒ විසඳාසුගලයත් පූජාකොට ඒ ප්‍රවෘත්තිය සැලකළේය. භාග්‍යවත් බුදුරජාණන්වහන්සේද එම අනේකාතපාතිකොට ගෙණ සම්ප්‍රාප්ත පිරිසට ධර්මදේශනාකොට වදාලසේක.

ඒ ධර්මදේශනාව මහජනයාහට සාර්ථකවූවාය.

ආනන්ද මාණ්ඩ පරාණිකාමි ශ්‍රද්ධාවන්න සත්පුරුෂවරුනි අනුන් වසින් කරණලද කුසලක්‍රියාවන් ගැණ අක්‍රොෂ පරිහව බිනීමෙහි ආදීනව මෙයින් දැන හැදිනා එබදු අක්‍රොෂ පරිහවාදි යෙන් මිදී කුසලයෙහි හැසිර සර්ව සම්පත් අත්පත්කර ගන්ව උත්සාහ කටයුතු) මේ ප්‍රේතවස්තු ප්‍රකරණයෙහි පළමු වන උරගවර්ගයෙහි නවවෙනි මහාපේසකාර ප්‍රේතවස්තුව නියා නිම්වනලදී.

9 මහාපේසකාර ප්‍රේත වස්තුව නිම්,

—:❀:—

නුවද මේ ප්‍රේතවස්තු ප්‍රකරණයෙහි පළමුවෙනි උරග වර්ගයෙහි දසවෙනි බලාතිය ප්‍රේතවස්තුව කවරහයත් තුන් ලෝවාසින්ට පහන්රුකක් වැනිවූ බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර ගොදුරුගම් කොට ජේතවනාරාමයෙහි වැඩවාසයකර ඒ සමයක්හී එක්තරා බලාතිය ප්‍රේතියක් අරභයා මේ කථාව වදාරණ ලද්දේය. හේකෙසේදයත්

යම්යම දවස බරණැස්නුවර එක්තරා වෛශ්‍ය ස්ත්‍රියක් නොමෝ ඇත්තේය ඕතොමෝ විසිඅවුරුදු ඇත්තිය, දර්ශනාර්හවන්නිය, ප්‍රසාදජනකවන්නිය, උතුම්වර්ණසෞන්දර්යයෙන් යුක්තවන්නිය, ඉතාමනොඉවූ කේශකලාපයක් ඇතත්විය එකල්හි ඇගේ ඒ කේශකලාප සෝභාව ඉවසන්ට නොහැකිව ඊර්ෂ්‍යාවෙන් මඩිනලද සිත්ඇත්තාසේනිසා කිපදෙනෙක් එකතුව කථාකොට ඒවෛශ්‍යාවගේ මෙහෙවරකාර දාසියක් ආමිසයෙන් සිත්පොලඹවා ඒ දාසියලවා ඇගේ හිසකේවැටෙන විෂඔසුදෙවාපූහ ඒ දාසියතොමෝ ඒ විෂ බෙහෙත නහන සුනුසමග යොදා ඒ වෛශ්‍යතොමෝ ගහා නම් ගහ නහනකාලයෙහි ඇට ඒ බෙහෙත් දුන්නීය, වෛශ්‍යතොමොද හිසකේමුල් තෙම තෙමා ජලයෙහි ගැළුනීය, දිය ගැළුනු ගැළුනු කෙනෙහිම කේශයෝ මුලින් ඉදිරිවැටුනාහ ඇගේ හිස

මලබටු ගෙඩියක්සේ වූයේය, එකල්හි ඕතොමෝ සවිප්‍රකාරයෙන් සිඳුනාවූ හිසකේ ඇතිව සිඳුනාවූ මුදුන ඇති පරවියකුමෙන් අව ලක්‍ෂණවූ ශරීරඇත්තෙන් ලජ්ජාවෙන් ඇතුළු තුවරට එදිනෙට ඉතාඇතිව කඩහිසගසා ගෙණ තුවරින් පිටත එක්තරා ප්‍රදේශ යක වාසයකෙළෙය, නිපදවයනියන් පඬුවූ ලජ්ජාඇත්ති තලම්රි කා තෙල් විකුනමින් සුරාව විකුනමින් ජීවිකාකෙරෙයි ගින්නෙන් දැවවුන් අවුවට පෙරළුවාසේ ඕතොමෝ එක් දවසක් මනුෂ්‍යයෝ දෙතුන්දෙනෙක් සුරාවෙන් මඬව මහත් නිද්‍රාවට පැමිනිකල්හි ලිහිල්ව නිබ්ගිය ඇඳිවසනු වන්වාවෙන් ගතියෙන්ඉක්බිත් තෙන් එක්දවසක් ඕතොමෝ එක් රහත් තෙරකෙනෙකුන් පිඬු පිණිස හැසිරෙනාදුන් දැක ප්‍රසන්න සිත්ඇත්තේ තමාගේ හෙට වැඩඹවාගෙණ අවුත් පනවනලද ආසනයෙහි වැඩහිඳුවා තෙල් මිශ්‍රවූරුවට පිඬක් දුන්නීය, ඒ ස්ථවිරතෙම ඇට අනුකම්පාවෙන් එය පිළිගෙණවැළඳුවේය. එකල ඕතොමෝ ප්‍රසන්න සිත්ඇතිව ඒ තොරන්වහන්සේගේ හිසට කුඩයක් අල්ලමින් සිටියාය ඒ ස්ථවිරතෙමේද ඇගේ සිත සතුටුකෙරෙමින් අනුමෝදනාකොට වැඩි සේක ඕතොමෝද අනුමෝදනා කරණ කල්හිම මෙසේ ප්‍රාර්ථනා කරන්නී, මාගේ හිසකේ දික්ව තුනිව මෘදු මොලොක්ව අක්බඹු රු වෙත්වයි ප්‍රාර්ථනාකලාය, ඕතොමෝ මැනකාලයෙහි මැරී ගොස් කුසලාකුසල කර්මය මිශ්‍ර ආනිසංසය හේතුකොටගෙණ මුහුදමැද රත්වීමනක හුදකලාව උපන, ඇගේ හිසකේ ප්‍රාර්ථනා කළ පරිද්දෙන්ම සම්පාදනයවූහ. මිනිසුන්ගේ වසනු සොරා ගත් අකුසලයෙන් නගනව උපන ඕතොමෝ ඒ රත්වීමනෙහි නැවත නැවත ඉපදීමෙන් එක් බුඩානතරයක් මුළුල්ලෙහි නගන ව කල්යවිය. ඉක්බිත්තෙන් අපභාග්‍යවත් බුදුරජනො ලොව පහළවී පවත්වනලද දම්සක් ඇතිව ක්‍රමයෙන් සැවැත් නුවරට වැඩමවා වැඩවාසයකර වප්‍රරණකල්හි සැවැත්නුවරවාසී සිටුයන් පමණ වෙලෙන්දෝ සුවඳ භූමිය උදෙසා යන්නාවූ නැවකින් ගොස් මුහුදට පැමිණියාහුය. එකල්හි ඔවුන් නැගි නැව විස මවූ සැඩසුලඟින් හරණලදුව ඔබ්මොබ කරකැවෙමින් ගොස් ඒ විමාන ප්‍රේතියගේ විමාන ප්‍රදේශයට ගියේය, එකල්හි ඒ විමාන ප්‍රේතිතොමෝ විමාන සමග අවුත් වෙළඳුන්ට තමන් දක්වා සිටියාය.

ඒ දැක දෙටු වෙළඳතෙමෙ මෙසේ විචාරන්නේ.

(49) කාතු අනෙතා විමානම්හි, තිට්ඨන්ති න උපනික්ඛමි
උපනික්ඛමයසු හදෙතු, පසෙසමතං මහිඩ්ඨිකන්ති.

(49) ඒඹා විමානබහ්‍යනන්තරයෙන් පිටතට නොනික්ම විමානය ඇතුලෙහි සිටින්නාවූ නී කවර කෙණෙක්ද මනුෂ්‍ය ස්ත්‍රියක් හෝ වේද නොහොත් අමනුෂ්‍ය ස්ත්‍රියක් හෝ වේද යොදුර තොපි පිටතට නික්මෙව මහත් සෑඩිඇතිව සිටින්නාවූ නී දක්නට කැමැත්තාමුයයි කීහ.

එකල්හි තමන් පිටතට නික්මෙන්ට නොහැකිබව ඕහට ප්‍රකාශකොට කියන්නී.

(50) අට්ටියා මිහරායාමී නගරානිකඛ මිතුං බහි
කෙසෙහමහි පටිවජ්ජනනා පුඤ්ඤමේම අපපකංකතංති.

(50) ඒඹා පුරුෂය මම නගරයවසිටිනෙමී පිටතට නික්මෙන්ට පිළිනුල්වෙමි ලජ්ජා ඇතෙතමී හිසකේවලින් පිළිසන්ව සිටිමි මා විසින් මදවූ පිනක් කරණලද්දේයයි කීය.

එකල වෙලඳතෙම උතුරුසඵව දෙනුකැමතිව මෙසේ කියනුයේ.

(51) හඤ්ඤතාරියං දදාමිතෙ ඉමංදුසඤං නිවාසයං.....පෙ.....

(51) යිනුහෙයින් එඹා ස්ත්‍රිය තොපි නගරයෙයින් පිටතට නික්මෙන්ට නොහැක්කෙහි නම් මාගේ මේ උතුරුසඵව දෙමි මේ හැඳගෙණ එවයි කීය එවිට අතින් අතට දුන් දෙයක් තමන්ට නෙලබෙන බව හඟවන්නී.....මෙසේ කිව.....

(52) හත්ථෙනහත්ථෙද්දනං නමයඤං උපකපපති
එසොසතපුථු පාසකොසඩෙ සම්මාසම්බුඩ සාවකොං.....

(53) එතං අවජ්ඣද සිඛාන මම දක්ඛින මාදිස
තදහං සුඛිතා හෙසඤං සඛකාම සම්ඩිනීති.....

(52) යිනුහෙයින් එඹාපුරුෂය අතින් අතට දුන් දෙයක් මට නෙලබෙන්නේය එසෙයින් සම්‍යක්සම්බුද්ධශ්‍රාවකයන්වහන්සේගේ මේ ශ්‍රද්ධාවන්තවූ උපාසකයෙක් තොපගේ නැවෙහි හිඳින්නේය.....

(53) මේ වසන්තයුගලය ඔහු අන්දවා මට දක්ෂිණාව දෙව එකල්හි මම සියලුකාමයෙන් සමෘර්ධව සුවපත් වන්නෙමි කිය.....

ඒ අසා වෙලෙන්දෙ ඒ උපාසකයා පැන්නාවා සුවඳගල්වා ඒ වසන්තයුගලය ඇන්දෙවුවාහුය.....ඒ අර්ථය ප්‍රකාශකරන්නාවූ සංගීතිකාරකයෝ මේ ප්‍රකාර කියන්නාහුය.....

(54) තංවතෙනහා පයිඛාන විලිමපිඛාන වානිජ
වණ්ණ ඛිවජ්ජාද සිඛාන තඤඤා දක්ඛින මාදිසුං.....

(55) සමනන්තරාතු දිවෙඩ විපාකො උපපජ්ජථ
හොජනවජ්ජනි පානියං දක්ඛිනාය ඉදං ඵලං

(56) තතො සුඛා සුචිවසනා කාසිකුත්තම ධාරිණී
හසන්ති ව්මාණ නිකඛාමී දක්ඛිනාය ඉදං ඵලංති

(51) යිතුඛෙයින් වෙලෙන්දෙ උපාසකයා පැනනාවා සුවඳ ගල්වා ඒ වසත්‍රයුගල අතුවා ප්‍රේතියට දක්ෂිණාව දුන්නාහුය,

(55) ඒ දක්ෂිණාව දුන් කෙනෙහිම එහි විපාකය උපන්නේය දිව්‍යභොජනය හා දිව්‍යපැන්ද

(56) පවිත්‍රවූ උතුම් කසීරටිද පහලව දිවබොජුන් අනුභව කොට දිව්‍යපැන් බී දිව්‍යවස්ත්‍ර හැඳගෙණ සිනහසෙමින් විමාන යෙන් පිටතඅවුත් සිටියාය

මේ දක්ෂිණාවගේවිපාකයයි කීවාහුය

ඉක්බිති ඒ දිවඟනාතොමෝ තමන්ට පහලවූ සම්පත් දක්වන්නාක්මෙන් සිනහසෙමින් අවුත් සිටියකල්හි, ඉක්බිති වෙලෙන්දෙ මෙසේ ප්‍රත්‍යක්ෂවසයෙන් පුණ්‍යවිපාකය දැක ආශ්චර්‍යප්‍රාප්ත සිත් ඇතිවූවාහු ඒ උපාසකයාකෙරෙහි ගෞරව බහුමානය සටගෙණ ඇදිලිබැඳ සිට උපස්ථාන කළාහුය හෙතෙමෙද ධර්ම කථාවෙන් අනයන් පහදවා සරණයෙහිද සීලයෙහිද පිහිට වූයේය ඒවෙලෙහුද විමාණ ප්‍රේතිය විසින් කරණලද කර්මය විචාරන්නාහු මෙසේ කීහ

(57) සුවිත්තරූපං සුචිරං විමානං තෙව භාසති
දෙවතෙවූචසී තා චිකඛ කිසඤකම්මසසිදංඵලන්ති

(57) ඕඛා දිවඟනාවෙනි තොපගේ මේ විමානය ඇත් අස් සත්‍රුරූපාදින්ගේ වසයෙන්ද මාලාකර්ම ලතාකර්මාදින් ගේ වසයෙන්ද ඉතාවිසිතුරුවන්නේය, කිමෙක්ද දානමය කුසලකර්මයක්හුගේ විපාකයෙක්ද නොහොත් සීලමය කර්මයක්හු ගේ විපාකයෙක්දැයි විචාළේය

එසේ ඒ වෙළඳුන් විසින් විචාරණලදුව ඒ විමාන ප්‍රේතියොමෝ මාවිසින් කරණලද සවිලා අකුසලකර්මයාගේ මෙ පමණ විපාකවන්නේය, අකුසලකර්මයට අනාගතයෙහි මේ ප්‍ර කාර වන්නේයයි කියා ඒ දෙකොටසයම ප්‍රකාශකොට කිය න්නී

(58) භික්ඛුනොවර මානස්ස දෙනිනිම්මජ්ජනං අහං
අදාසිං උත්තු භූතස්ස විප්පසන්නෙන චෙතසා

(59) තස්සකම්මස්ස කුසලස්ස විපාකං දිඤ්ඤමාරං
අනුභොමි විමානම්හි තවදූනි පරිත්තකං

(60) උඩ්ඪංචතුහි මාසෙහි කාලනිරියා භවිස්සති
එකන්තං කටුකං ඝොරං නිරයුපපත්තිසඤ්ඤිතං

(61) චතුක්කණ්ණං චතුවාරං විභත්තං භාග සොමිතං
අයොපාකාර පරියන්තං අයසාපටි කුජ්ජිතං ඉපි
එලංච පාපකම්මස්ස තස්මාසෝ චාම්දං භූසන්ති

(58) ඒඛා පුරුෂවරුනි මම පූජාත්‍රියෙහිදී පිඬුපිණිස වඩ නාවූ සෘජුපටිපන්නවූ නිකෙල්සිවූ කායවංකාදිය නැතතාවූ ඉ ඤ්‍ඤවක්හට විශෙෂයෙන්ම ප්‍රසන්න සිතින් තෙල්මිශ්‍රවූ තලමුරු පිඬක්දුන්නෙම්

(59) ඒ කුසලකම්මයාගේ විපාකයෙන් මේවිමානයෙහි වස මින් බොහෝ කාලයක් මුළුල්ලෙහි සුවඅනුභවකෙළෙම් ඒ කුස ලවිපාකයත් මෙතැන්පටත් ස්වල්පකාලයක්වින්දයුතුවෙයි

(60) මෙයින් සාරමාසයක් ගියතැනදී කාලක්‍රියාකොට ඒකා නතයෙන් කටුකවූ ඝොරවූ නරකයෙහි උපදින්නෙම්

(61) ඒ නරකය නම් සතරකොන්ඇත්තේය, ඝනාදි වසයෙන් නරකය විභාරකොට තියාඑහි බොහෝ දුඃඛකාලයක් මුළුල්ලෙහි දුක්විඳින්ව යන්නෙම් ඒකාරණය සිහිවෙන්නාවූ මාගේසිතට බල වත් සෝක උපදතේගයිකියා

ඉමසේ දිව්‍යඝනාතොමො තමාගේ අකුසලකම්ම ප ලය හා අනාගතයෙහි නරකයෙහි උත්පත්තිකරණ බවද ප්‍රකා ශකොට නිකල්හි, ඒ උපාසකතෙම කරුණාවෙන් චොදනා කර ණුලද සිත් ඇත්තේ එබඳුසින් මේ දේවතාදුවට මම පිහිටවත් නෙමි සිතා මෙසේ නියන්තේ දේවතා දුවනි එක්කෙනෙක්වූ මව දුන්පුතාය හේතුකොට ඉෂ්ඨ ගියලු කාමයෙන් සම්පූර්ඛව උදුර සම්පත්තියෙන් යුක්තාවිය, දැන් එනාහි මේ උපාසකවරුන්ට දන්දී ශාස්තෘන්වහන්සේගේ ගුණානුස්මරණය කොට නරකොතපත්ති යෙන් මිදෙන්නෙහි වේදුයි කීය, එකල ඒ දිව්‍යඝනාතොමෝ තු ටුපහටුයින් ඇතිව දිව්‍යවූ ආභරණාවලින් ඒ උපාසකවරුන් සත්‍යාඛ්‍යානයකොට දිව්‍යවස්ත්‍රහා නානාප්‍රකාර රත්නයන්ද දුන්නේ ය, භාග්‍යවතුන්වහන්සේ උදෙසාද දිව්‍යවස්ත්‍රයුගලයක් ඒ උපා

සකවරු අතවදී මෙසේ කියන්නිය, සවාමිනි එක්තරා විමාන ප්‍රේතියෙක් තොමෝ භාග්‍යවත්නුගේ ශ්‍රීපතුල් වඳින්නේයයි කියා සැවැත්නුවරට ගොස් ශාස්තෘන්වහන්සේට මාගේ වචනයෙන් වැඳ මැනවයි කියා යවුවේය...ඒ වෙළඳුන් යන්නාවූ නැවද තමාගේ ශක්‍ති ආනුභාවයෙන් ඒ වෙළඳුන් විසින් කැමතිවනලද පටුනට එදවසේම පැමිනවූයේය...ඉක්බිත්තෙන් ඒ වෙලෙන්දෝ ඒ පටුනෙන් පිටත්ව ක්‍රමයෙන් ගොස් සැවැත්නුවරට පැමිණ පේතවනාරාමයට ගොස් බුදුරජානන්වහන්සේට ඒ වසත්‍රයුගලය පූජා කොට ඒ විමාන ප්‍රේතියගේ වැඳීමෙන් නමස්කාරකොට මුල පටන් ඒ සියලු ප්‍රවෘත්තිය බුදුන්ට කීවාහුය...ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ ඒ අත්‍යොත්පත්තිකොට ගෙණ සම්ප්‍රාපාපිරිසට ධර්මදේශනාකොට වදාළේය...

ඒ ධර්මදේශනාව මහජනයාහට සාධිකවූවාය...

ඒ උපාසකවොරුද දෙවෙනිදවස බුදුන් ප්‍රමුඛසංඝයාට මහදන් දී ඒ විමාන ප්‍රේතියට දක්ෂිණාව දුන්නාහ...එහෙයින් විමාන ප්‍රේතියොමෝ ප්‍රේතලොකයෙන් චුතව නානාවිධ රත්නයෙන් ජෙනිමන්වූ තවුතිසා දෙවලොව රත්‍රන් විමානයක දිව්‍යාප්සරාවන් දහසක් පිරිවරා උපන්නීය)...මේ ප්‍රේත වස්තු ප්‍රකරණයෙහි පළමුවන උරගවර්ගයෙහි දසවෙනි බලාතිය ප්‍රේතවස්තුව කියා නිමවනලදි...

10 බලාතිය ප්‍රේත වස්තුව නිමි.

එවද මේ ප්‍රේතවස්තු ප්‍රකරණයෙහි පළමුවන උරගවර්ගයෙහි එකොලොස්වෙනි නාගප්‍රේතවස්තුව කවරහයත්...එක් සමයෙක්හි සකල ජනශ්‍රිත විධායකවූ ඒසුබ බුඩිඅනි කරුණනිධානවූ ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ සැවත්නුවර පේතවනාරාමයෙහි වැඩවාසයකරවදාරණකල්හි බ්‍රාහ්මණප්‍රේතයන්දෙදෙනෙක් අරභයා මේ ප්‍රේතකථාව වදාරණලද්දේය...ඒ කෙසේදයත්...

ආයුෂ්මත්වූ සංකිච්ච සාමණේරයන්වහන්සේ වනාහි සත්වයන් ඇත්තේ කරගෙයිදීම අහිත්වයට පැමිණ සාමණේර භූමියෙහි සිටින්නේ භික්ෂූහු නිස්නමක් සමග ආරණ්‍යයෙහි වාසයකරණසේක් ඒ භික්ෂූන්වහන්සේලාට පන්සියයක් සොරුන්කෙරෙන් පැමිණි මරණයන් වලක්වා ඒසොරුනුත් දමනයකොට මහණකරවා ශාස්තෘන්වහන්සේ ලඟටවැඩසේක, ශාස්තෘන්වහන්සේ

ලඟට වැඩිසේක, ශාස්තෘන්වහන්සේ ඒ භික්ෂූන්ට ධර්මදේශනා කොට වදාළේය, දේශනාකෙලවර ඒ භික්ෂූහු අතීත්වයට පැමිණියාහුය—ඉක්බිත්තෙන් ආයුෂ්මත් සංකිච්චතෙම පිරුණුවූ විසිවයස් ඇත්තේ උපසන්පදාවේ ඒ භික්ෂූන්වහන්සේලා පන්සියය සමඟ බරණැසට ගොස් ඉසිපතනාරාමයෙ වැඩවාසය කරණසේක—මනුෂ්‍යයෝ සංකිච්චතෙරුන්වහන්සේ ලඟට ගොස් බණඅසා ප්‍රසන්න සිත් ඇතිව විටි පිළිවෙලින් වඩිගෙ වඩිගෙව ආහාන්තුක දන් දුන්නාහුය, ඔවුන් අතුරෙන් එක්තරා උපාසකයෙක් විසින් මනුෂ්‍යයන් නිත්‍ය බත්දිමෙහි සමාදන්කරවූසේය—ඒ මනුෂ්‍යයෝද පොහොසත් පරිද්දෙන් නිත්‍ය බත් තැබුවාහුය, එසමයෙහි බරණැස්නුවර එක්තරා මිථ්‍යාදෘෂ්ටික බ්‍රාහ්මණයෙකුගේ පුත්‍රයොදෙදෙනෙක් හා ධිතෘකෙනෙක්ද ඇත්තාහ ඔවුන් අතුරෙන් වැඩිමහළු පුත්‍රතෙම ඒ උපාසකයාහට මිත්‍රවූයේය—උපාසකතෙම ඔහු හැරගෙණ ආයුෂ්මත් සංකිච්චතෙරුන්වහන්සේ ලඟට ගියාහ, ආයුෂ්මත් සංකිච්චතෙරුන්වහන්සේ මිථ්‍යාදෘෂ්ටිකයාහට ධර්මදේශනාකළේය, ඒ මිථ්‍යාදෘෂ්ටිකතෙම මෘදුවූ සිත් ඇතිවූයේය, එකල ඔහට උපාසකතෙම කියතුයේ තොපි එක්බික්ෂුවක්හට නිත්‍ය බතක් දෙවයි කියේය, ඔහු කියන්නේ ශ්‍රමණ ශාක්‍යපුත්‍රයින්ට නිත්‍ය බත්දිම අපට පුරුදුනැත්තේය, එහෙයින් නොදෙමියි කියේය, උපාසක කියන්නේ මටද බතක් දෙන්නෙහිද නොදෙන්නෙහිදැයි නිහ බ්‍රාහ්මණකුමරුතෙම කියතුයේ ඒ කෙසේ නොදෙම්දැයි නිහ ඉදින් මටදෙන්නෙහි චිනම් ඒබත එක් භික්ෂූනාමකට දෙවයි කියේය, හෙතෙම යහපතැයි කියා දෙවෙනි දවසෙහි උදැසනම වෙහෙරට ගොස් එක් භික්ෂුවක් කැඳවා අවුත් වැලඳවූයේය, මෙසේ කල්‍යාණකින් භික්ෂූන්ගේ ප්‍රතිපත්ති දකත් බණඅසාත් ඔහුගේ මලනුවෝ සමඟ නැගනියොද ශාසනයෙහි අතිප්‍රසන්නව කුසල ක්‍රියාවෙහි ඇළුනේය—

මෙසේ ඒ තුන්දෙන වසතුඇති පරිද්දෙන් දන්දෙමින් ශ්‍රමණබ්‍රාහ්මණයන්ට සත්කාර කළාහුය ගෞරවකළාහුය පූජා කළාහු ඔවුන්ගේ මවුප්‍රයෝ දෙදෙන අශ්‍රද්ධාචාරයෝය අප්‍රසන්නයෝය, ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට ගෞරව නොකරන්නාහ,කුසල ක්‍රියාවෙහි ඇලීමක් නැත්තාහ, ඒ මාතෘ බැමිණියගේ සොහොයුරු බමුණගේ පුතුට දුවනියන් මහල්‍යකොට නැයෝ එකතුව නියමකළාහ,මයිලතුවූ තුතෙමද ආයුෂ්මත් සංකිච්චයන් ලඟින් බණඅසා සසර ආදීනවෙහි කලකිරුණු සිත් ඇතිව මහනවූයේය එතෙම නිතර තමුත් මැනියන්ගේ ගෙදරට වලඳන්ට යන්නේය

මැනියෝද ඒ කුමාරිකාව කෙරෙහි තමන්පුත් සාමනේරයන්ගේ සිත පලෝභනය කරවන්නේය, එහෙයින් ඔහු කලහිරී උපාධ්‍යයන් ලඟට ගොස් ස්වාමීනි මම සිවුරු හරිමි මට අවසරදෙවයි කියේය, උපාධ්‍යතෙම ඔහුගේ උපනිශ්‍රය සම්පත්දැක සාමනේරයෙනි මාසයක් පමණ නැවතෙවයි කියේය-සාමනේරද යහපතැයි නැවතියා .නැවතී මාසය ඉක්මුනුකල නැවතත් එසේම කියේය, උපාධ්‍යතෙම කියතුයේ සාමනේරයෙනි අඩමසක් නැවතෙවයි කිහ, යහපතැයි කියා නැවතුන, අඩමස ඉක්මුනුකල්හි නැවතත් සිවුරුහරිමියි කිවුය සාමනේරය, සතියක් නැවතෙවයිකිහ, එතෙම යහපතැයි කියා නැවතුනේය එකල ඒ සතියඇතුලත සාමනේරතමගේ මාතුලානී වන බැමිණියගේ ගෙය, පලේ දිරා යෙවීම නැතිහෙයින් භික්ෂුතෙමේමෙන් දුවිලව සුලඟට වැටිගියේය, එකල්හි දෙමහල්ලෝ සමග පුත්‍රයෝ දෙන්නාද දුවනියෝද ගෙට යටවී මැරුණහ, ඔවුන් අතුරෙන් බැමිණියහා, බමුණද ප්‍රේතඅපායෙ උපන්නාහුය, පුත්‍රයෝ දෙන්නාහා,දියනියෝ හුමාටු දෙවියන් අතුරෙහි උපන්නාහා, ඔවුන් අතුරෙන් ජේෂ්ඨපුත්‍රයාඟට ඉසතියානාවක් පහළවූයේය, මලතුවන්ට අඹලෙඹියන්යෙදූ රථයක් පහලවූයේය, දුවනියන්ට රන්සිවි ගෙයක් පහලවූයේය-

ඉදිනුව උපන්නාවූ බ්‍රාහ්මණයා හා බැමිණිද දෙදෙන මහත් යමගුරුගෙණ ඔවුනොවුන් කොටාගන්නාහු වෙති යමගුරු වැදුනු වැදුනු තැන්වල මහත් කල පමණ ගඩහවගැණී මොහොතනින්ම පැසීගොස් බිඳිමෙන් සැරව වැගිරෙන්නේය .ඔවුහුද ඔවුනොවුන්ගේ ඒ ගඩ පලාගන්න ක්‍රෝධයෙන් මැඩ මැඩිනිසි කරුණවක් නැතිව එරූෂ වචනවලින් තර්ජනයකර ගනිමින් ලේ සැරව බොනී එයිනුත් තෘප්තියකට නොපැමිණෙනි-ඉක්බිත්තෙන් සාමනේරතෙම කලකිරීමෙන් මඬිනලද සිත් ඇත්තේ උපාධ්‍යයන් ලඟට ගොස් වහන්ස මා විසින් අනුදන්නාලද ඒ ඒ දවස් ඉක්මුයෙම් මම ගෙදරයම් මට අවසර දෙවයි කියේය-එකල්හි උපාධ්‍යතෙම කාලපක්ෂ තුදුස්වක්දින සූයස්ා අස්තංගතවූ කල්හි මෙහි එවයි කියා සාමනේරයන් කැඳවා ගොස් ඉසිපතන මහවිහාරයාගේ පිටිපස්සෙන් මදක්දුර ගොස් සිටියේය, එවේලෙහි වනාහි දිව්‍යපුත්‍රයෝ දෙදෙන නැගනිය සමග එම මාඝීයෙන් යක්ෂ සමාගමට උපස්ථාන පිණිස යන්නාහුය-ඔවුන්ගේ මවුපියෝ දෙදෙන යමගුරුගත් අත් ඇතිව අතිසයින් කෘෘරවූ කාලවණ්ණ ශරීරවලින් යුක්තව අවුල්ව මුහුන සිසාරා වැටුනාවූ හිසකේ ඇතිව සෙනවැදී දුගියාවූ තල්ගස්මෙණ් වැගිරෙන්නාවූ ලේ

සැරව ඇතිව රැලිවැකුනු ශරීර ඇතිව ඉතා පිළිකුල් වන්නාවූ භයානකවූ දර්ශනය ඇත්තාවූ ඔවුන් දෙදෙන ඒ දිව්‍යරාජදෙදෙනාගේ පස්සෙන් එහුබැඳ යන්නාහුය—එකල්හි ආයුෂ්මත් සංකිච්චතෙම යම්සේ ඒ සාමනේරනමට ඒ යන්නාවූ ප්‍රේතයන් හා දිව්‍යපුත්‍රයන් පෙනීමවේද යාඩියෙන් එසේ පෙණෙනසේ සලස්වා සාමනේර නමට කියන්නේ කිමෙක්ද හෙරණ තොපි මේ යන්නවුන් දක්නෙහිදැයි විචාළේය එසේය සවාමීනි කීහ, එසේ විනාවී උන් විසින් පූර්වයෙහි කරණලද කර්මය විචාරවයි කියේය, හෙතෙම හසනීයාදියෙන් යන්නවුන්ගෙන් පළමුව විචාළේය, ඔවුන් කියන්නාහු, පස්සෙන් එන්නාවූ ප්‍රේතයන්ගෙන් විචාළමැනවයි කීවාහුය සාමනේරතෙම ඒ ප්‍රේතයන්ගෙන් කර්මය විචාරමින්, මේ ගාථාවන් කියේය—

(62) පුරතොව සෙතෙත එලෙති භක්ඛිනා
මජෙඩ්ඩ පත අසස තරි රථෙන
පවජාව කඤ්ඤ සිවිකාඅ නියති
ඔ භාසයන්ති දස සබ්බ තොදිසා—

(63) තුමෙහපන මුගහර භත්ථ පානිනො
රුදම්මුඛා භිනන සරීර ගත්තා
මනුසස භූතා කිම කාසි පාපං
යෙනඤ්ඤ මඤ්ඤස්ස පිබාථ ලොහිතන්ති—

(62) යම්තු හෙයින් එඛා ප්‍රේතවරුනි ඉදිරියෙහි ධවල හස්තාභරණඑක් දිව්‍යරාජයෙක් යෙයි, මධ්‍යයෙහි අශ්වලෙඩ්ඩන් යොදනලද රථයකින් එක් දිව්‍යරාජයෙක් යන්නේය, පස්සෙහි සියලු දිසාවන් බබලවමින් එක් දිව්‍යඟනාවක් රන්සිවි ගෙයකින් යන්නීය—

(63) නෙපි වනාහි දඩු මුගුරු ගත් අත්ඇතිව ඔවුනොවුන්ට තලාගණිමින් කඳුලුවැකුනු මුහුනුඇතිව හඬමින් බිදුනාවූ ශරීර ඇත්තාහු ඔවුනොවුන්ගේ රුධිර පානයකරන්නාහුය එසේවන්ට මනුෂ්‍යව සිටිනකල්හි නෙපි කුමන අකුසලයක් කළේදැයි විචාළේය—

මසේ සාමනේරයන්වහන්සේ විසින් විචාරණ ලද්දාවූ ඒප්‍රේතයෝ කියන්නාහු—

(64) පුරතොව යො ගච්ඡති කුඤ්ජරේණ
සෙතෙන නාගෙන චතුඤ්ඤමේන
අමහාකං පුත්තෙහා අඤ්ඤපේටඨ කොසො
දුනානි දඬාන සුඛි පමොදති

(65) යොසොමපේඬ අඤ්ඤතරී රථෙන
චතුබ්භි යුත්තෙන සුවගෙහි තෙන
අමහාකං පුත්තෙහා අඤ්ඤමජ්ඣිමොසො
අමච්ඡරි දුන ජති විරොචති

(66) යසාව පච්ඡාසි චිකාය නියති
දරිසපඤ්ඤ මිගමඤ්ඤ ලොචනා
අමහාකං ධිතා අඤ්ඤසාක නිවඨා
භගඩ භාගෙණ සුඛි පමොදති

(67) එතෙව දුනානි අදංසු පුබ්බෙ
පසනා චිත්තා සමණබ්‍රාහමණානං
මයං පන මච්ඡරිනො අඤ්ඤමහා
පරිභාසකා සමණ බ්‍රාහමණානං
එතෙ පදඬා පරිචාර යන්ති
මයංව සුඤ්ඤා මනලොව ඛිනෙනාති

(64) සිරිමතේරයන්වහන්ස මේ යන්නාවූ සැමදෙනාගෙන් ඉදිරියෙහි ධවල හස්තාභරණය ඇති තැනැත්තේ අපගේ වැඩිමහළු පුත්‍රයානෝවෙයි එතෙම දැඩි සුවපහසු ප්‍රමුදිතවන්නේය.

(65) මධ්‍යයෙහි අශ්වලෙඛ්‍යත් සතරදෙනෙක්යෙදූ රථයෙන් යහපත්ගමනින් යුක්තව යන තැනැත්තේ අපගේ මධ්‍යම පුතානුවෝවෙයි එතෙම නොමසුරුව දානපතිව දැඩි දැන් බබලන්නේය.

(66) මෘගාගනාවගේ ඇස්වැනි ඇස් ඇතිව පස්සෙහි රන්සිවිගෙසින් යන්නී අපගේ දියනියෝ වෙයි ඕතොමෝ තමාගේ ආහාර කොටසෙන් දැඩි ප්‍රමුදිත විමෙන් යුක්තවීය.

(67) මෙසේ ඒ හැමදෙන දානාදි කුසල් කොට දෙවියන්ට එකතුව ඉපිද සම්පතින් සමුඩිව සැප අනුභව කරන්නාහුවෙති, අපි දෙදෙනා මසුරු සිත් ඇත්තෙත් දන්නොදී ශ්‍රමණබ්‍රාහමණවරුන්ට අක්‍රොෂ පරිභව බිහුයෙමුව ඒ අපි දැන් අවුවෙහි දමනලද ගුනබටමෙන් කෂාපිපාස දෙකින් වියලෙන්නෙමුයයි කීහ.

එසේ තමන්ගේ අකුසලය තමා විසින්ම කියා නැවත කියනුයේ, අපි බුඩවහන්සේගේ මාතුල මාතුලානී දෙදෙනයයි

කීයේය, එය අසා සාමනේරයන්වහන්සේ ගටගත් කලකිරිලි ඇත්තේ මෙවැනි දරුණු ක්‍රියා කළවුන්ට ආහර කෙසේ සම්පාදනය වේදැයි විචාරන්නේ "කිං භුම්මකං භොජනං" පෙ "දුක්ඛජ්ජපත්තාහි"

එබඳ ප්‍රේතවරුණි තොපගේ ආහරය කෙබඳු. දෙයක්ද කෙබඳු යහනාවෙක්හි නිදගන්නාහුද ඉතා පවිටු සිහාව ඇත්තාවූ තොපි කෙසේ යාපනවන්නාහුද බොහෝ වසතුන් ඇතිව නිබෙද්දී සැප ලැබීමට හේතුවූ කුසල් නොකිරීම හේතුකොට ගෙණ සැප ලැබීම වැරදිමෙන් දැන් තෙපි දුකට පැමිණියාහුයයි කියා මෙසේ සාමනේරයන්වහන්සේ විසින් විචාරණ ලද්දාවූ,

ප්‍රේතයෝ ඒ ප්‍රශ්නයට මෙසේ ප්‍රකාශකෙරෙත්

(68) අඤ්ඤං මඤ්ඤං ච ඛිඩ්ඩාන පිවාම පුබ්බ ලොහිතං,
බහ්වං පිඩාන දුතා හෝ මනච්ඡා දිඝ සෙමයං

(69) ඉච්චෙව මච්චා පරිදෙව යන්ති
අදායකා පෙච්චය මස්සඩාඝිනෝ
යෙතෙ විවිධං අධිගම්ම හොගෙ
නභුජ්ජරෙ නාපි කරොන්ති පුඤ්ඤං

(70) තෙ ඛ්‍යජ්ජ පා සුපගතා පරත්ථ
පෙතා චිරං සා ඝිරෙ දඝ මානා
කම්මානි කඩාන දුක්කිඤ්ඡ්‍රියානි
අනුභොන්ති දුක්ඛානි කටුකඵලානි

(71) ඉත්තරං ඡිඩනඩඤ්ඤං ඉත්තරං ඉධ ජීවිතං,
ඉත්තරං ඉත්තර තොඤ්ඤා දීපං කයිරාථ පණ්ඩිතෝ

(72) යෙතෙ එවං පජානන්ති නරාධම්මස්ස කොවිදූ,
තෙ දූනෙනප මජ්ජන්ති සුඛා අරහතංවචොනි

(68) යනුහෙයින් සාමනේරයන්වහන්ස අපි ඔවුනොවුන් තලා මරාගෙණ ඔවුනොවුන්ගේ ලේසැරව බොන්නෙමුව අපි අපගේ බොහෝ ලේ සැරව අනුභවකොවත් තෘප්තියකට නොපැමිනෙන්නෙමුව රුචියක් නූපදවන්නෙමුව ඒ දෙය අප කැමැත්තෙන් පාණය කරන්නෝ නොවෙමුව

(69) වෙනත් දන්නොදෙන මසුරුසින් ඇත්තාහු ප්‍රේතලෝකයෙහි ඉපිද මෙසේම විලාප කියමින් හඬන්නාහුය, යම් ඒ කෙනෙක් අනේක ප්‍රකාර හිරණ්‍ය සුවර්ණාදි භොගයන් ලබා මසුරුසින් ඇත්තෙන් තෙමේත් අනුභව නොකරෙද්ද දානාදි පිනකුත් නොකරෙද්ද

(70) දුක්විපාක ඵලවන අකුසලකර්මයන් කොට ඔවුන් පර ලොවදී ප්‍රේතව ඉපිද ක්ෂුත්පිපාස ගින්නෙන් දන්නාහු බොහෝ කලක් සුසුන්ලන්නාහු වෙති, කෘරවූ අපායදුක් අනුභව කරන්නාහු වෙති.

(71) සවාමිනි ධනධාන්‍යයන් අනිත්‍යවූ දෙයෙක මේ මනුෂ්‍යලොකයෙහි ජීවිතය සවලාකාලයක් ජීවත්වෙති, එසේහෙයින් නුවනැති තැනැත්තේ සවලාවූදෙය සවලාවසයෙන් තේරුම්ගෙණ පරලොවදී සුව විපාකය බොහෝකල් පවත්නාවූ දුනාදී කුසල් කෙරීමෙන් තමන් පිහිටකර ගන්නේය.

(72) යම් මනුෂ්‍යකෙනෙක් මනුෂ්‍ය භොගයන්ගේ හා ජීවිතයාගේද සවලාබව තත්වූ පරිද්දෙන් දන්නාහු වෙද්ද ඔවුහු ආර්‍යයන්ගේවචනය අසා හැමකල්හි දැහැමෙහි පමානොවෙති කියෙය.

මසේ ඒ ප්‍රේතයෝ සාමනේරයන්වහන්සේ විසින් අසනලදුව ඒ අර්‍ථයකියා නැවත අපි නුඹවහන්සේගේ මාතුල මාතුලානිවරුයහි කීහ. එය අසා සාමනේරතෙම හවහත් කල කිරිල්ල ඇත්තේ ශාසනයෙහි උකටලීය දුරුකොට උපාධ්‍යයන්ගේ දෙපතුලලහවැටී මෙසේ කියන්නේ සවාමීනි නුඹවහන්සේ විසින් මට යම් අනුකම්පාවක් කටයුතුවිද, ඒ අනුකම්පාව කරණලද්දේය, මාව අනාර්‍යයෙන් පහකලේය දුකින් නිදහස්කලේය, මට දැන් ගෘහවාසයෙන් ප්‍රයොජනයෙක්නැත, බ්‍රහ්මචර්‍යාවාසයෙහි ඇලෙමි කියේය. ඉක්බිත්තෙන් ආයුෂ්මත් සංකිච්චතෙම ඔහුගේ අධ්‍යාසය බලා ඊට සුදුසු කර්මස්ථානයක් ඉගැන්වීය, හෙතෙම කර්මස්ථාන භාවනාවෙහි යෙදෙමින් නොබොකලනින්ම අර්හත්වයට පැමිනිසේක. ආයුෂ්මත් සංකිච්ච තෙරුන්වහන්සේ ඒ ප්‍රවෘත්තිය භාග්‍යවත්හට සැලකලේය. ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ ඒ අර්‍ථොත්පත්තිකොට ගෙණ සම්ප්‍රාප්ත පිරිසට විසතර වසයෙන් ධර්‍මදෙශනාකොට වදාලේය.

ඒ ධර්‍මදේශනා තොමෝ මහාජනයාහට සාර්‍ථක වූවාය.

මේ ප්‍රේතවස්තු ප්‍රකරණයෙහි පළමුවෙනි උරගවර්‍ගයේ එකොලොස්වෙනි නාගප්‍රේතවස්තුව කියා නිමවනලදි.

11 නාග ප්‍රේත වස්තුව නිමි.



තවද මේ ප්‍රේතවස්තු ප්‍රකරණයෙහි පළමුවෙනි උරගවර්‍ගයෙහි දෙලොස්වෙනි උරගවස්තුව කවරහයත්—එක් සම

යෙක්හි ත්‍රිභුවන වසුනෙයාවූ බුදුරජානන්වහන්සේ සැවැත්නුවර ගොදුරුගම්කොට පේතවනාරමයෙහි වැඩවාසයකර වදුරණ කල්හි එක්තරා උපාසකයක් අරභයා මේ උරගවත්‍ථුව වදුරණ ලද්දේය—ඒ කෙසේදයත්—

සැවැත්නුවර වැසි එක්තරා උපාසකයකුගේ පුත්‍රයෙක් කාලක්‍රියාකලේය, ඔහුගේ පියතෙම පුත්‍රයා මැරුණු සෝකය හේතුකොට ගෙණ විලාප කීමට හා සෝකයෙ පැමිණියේ පිටතට ගොස් නිසිකර්මාන්තයක් කරන්ට නොහැකිව ගෙයිම සිටියේය, එකල්හි ශාස්තෘන්වහන්සේ අළුයම්වේලෙහි මහකරුණා සමාපත්තියෙන් නැගිට දිවසින් ලොවබලා වදුරණසේක් ඒ උපාසකයා දැකවදුරමින් පෙරවරු වේලෙහි හැඳ පෙරව පාසිවුරු හැර ගෙණ වැඩමවා ඔහුගේ ගෘහචාරයෙහි වැඩසිටියේය, උපාසකතෙම ශාස්තෘන්වහන්සේ වැඩිබැව් අසා වහා නැගිට ගොස් පෙරහමන් කොට අතින් පාත්‍රය ගෙණ ගෙට වැඩමවා අස්නක් පනවා දුන්නේය—භාග්‍යවත්තෙම පනවනලද ආසනයෙහි වැඩහුන්සේක, උපාසකතෙමේද භාග්‍යවතුන් වැඳ එකත්පස්ව හිඳගත්තේය, භාග්‍යවතුන්වහන්සේ ඔහට කිමෙක්ද උපාසකය සෝකයෙන් පෙළෙන්නාහුමෙන් දක්නේයයි වදුළසේක—එසේය භාග්‍යවත්නි මාගේ ප්‍රියපුත්‍රතෙමේ කාලක්‍රියාකලේය, එහෙයින් මම සෝකයෙන් පෙළෙම්හියේය, එකල්හි බුදුරජානන්වහන්සේ ඔහුගේසෝක දුරුකර වදුරම්න් උරගජාතකය වදුළසේක—කෙසේදයත්—

යටගිය දවස කසීරට බරණැස් නුවර ධම්මපාලනම් බමුණු කුලයක්වූයේය. එහි බ්‍රාහ්මණයාය බැමිණිය පුත්‍රයාය ධිතෘය යෙහෙලිය දැසියයි කියා පස්දෙනෙක් ඇත්තාහ, මෙහි සියල්ලෝ මරණානුස්මෘති භාවනාවෙහිඇලී වසන්නාහුය, ඔවුන් අතුරෙන්, යමෙක් ගෙයින් පිටතවයේද හෙතෙම අන්‍යයන්ට අවවාදකොට නිරාලයව නික්මෙයි ඉක්බිත්තෙන් එක් දවසක් බ්‍රාහ්මණතෙම පුත්‍රයා හා සමග ගෙයින් පිටත්ව කෙතට ගොස් සීසාතේය පුත්‍රතෙම වියලිගියාවූ තෘණහා කාෂ්ඨයන් එකතුකරමින් ගිණි දල්වමින් සිටියේය, එහි එක් නාගයෙක් දැහැයින් ගස් සිදුරෙන් නික්ම අවුත් බ්‍රාහ්මණ පුත්‍රයා දෂ්ටකලේය, හෙතෙම විෂ වේගයෙන් මුර්ජාව එහිමවැටී කාලක්‍රියා කොට ශක්‍රදිව්‍යරාජයාව උපන්නේය—බ්‍රාහ්මණතෙම පුත්‍රයා මැරුණවුන් දැක කර්මාන්තභූමිය සවමිපයෙන් යන්නාවූ එක් පුරුෂයෙකු දැක මේ සේ කීහ, යහළුව මාගේ ගෙදරට ගොස් බැමිණියට මෙසේ කියව

නහාගෙණ පවිත්‍ර වස්ත්‍ර හැඳ මට බත්හා මල්ගඳ ආදිය ගෙණ එවයි කියා නොපි විසින් කියවයි කීයේය, හෙතෙම එහි ගොස් එසේ දැන්විය, ගෘහජනතෙමේද එසේලෙස කළේය---බ්‍රාහ්මණ තෙමේත් පැන්නහා ආහාර අනුභවකොට සුවඳ ගල්වා පිරිවර ජනයන් විසින් පරිවෘතව පුත්‍රයාගේ ශරීරය සැයට නගා ගිණි දල්වා දරකදක් දවන්නාක්මෙන් සිතමින් සොක රහිතව තැවිල්ලක් නැතිව අනිත්‍ය සහිඤුව මෙනෙහි කරමින් සිටියේය--- බ්‍රාහ්මණයාගට පුත්‍රව සිටි ශක්‍රව උපන්නේත් අප මහාබොධිසත්ව තෙම වූයේය, හෙතෙම තමා විසින් පූර්ජාතියෙහි කරණලද කුසලකර්මය ප්‍රත්‍යවේක්ෂාකොට මවුපියන්ට හා නැයින්වද අනුකම්පා කෙරෙමින් බ්‍රාහ්මණ වේසයෙන් එහි ගොස් නැයින් සොක නොක රන්නාවුන් දැක එනනට අවුත් මෙසේ කියන්නේ නෙපි මූවෙක් දවන්නෙවුය අපවත් මාංසදෙවු බඩසායෙම් කිව---එවිට ඔවුන් කියන්නාහු මෙහි දවන්නේ මෘගයෙක් නොවෙයි මනුෂ්‍යයෙක බ්‍රාහ්මණයැයිනිහ කිමෙක්ද මෙතෙම තොපගේ සතුරෙක්දැයි කිහ, සතුරෙක් නොවෙයි මහ ගුණවත් තරුණ ඖරස පුත්‍රයෙ කැයි කිහ කුමක්පිණිස නෙපි ඔබඳු ගුණවත් තරුණ පුත්‍රතෙම මැරුණුකල්හි සෝක නොකරේදැයි විචාළේය,

ඒ අසා බමුණු සෝක නොකරණ කරුණු කියන්නේ---

(73) උරගොවහ චංජිනනං ඡිඩා ගච්ඡති සන්තනුං
එවං සරීරෙ නිඛෙහාගෙ පෙතෙ කාලක තෙසති---

(74) දයහමානො නජානාති ඤුතීනං පරිදෙවිතං
තස්මා එවං නසොචාමි ගතො සොතස්ස යාගතිනි---

(73) යිතුතෙමයින් බ්‍රාහ්මණය යම්සේ නාගතෙමේ ගස්දෙබ ලයනින් ඇදී හෝ දඬුඅතරෙන් ඇදීමෙන් හෝ මුල්අතරෙන් ඇදියාමෙන් හෝ දිරාගිය සියසැචය ගලවාගැර කැමති නැනකට යේද, එමෙන් නිස්ප්‍රයෝජනවූ මේ ශරීරය හැරදමා මැරුණුකල්හි.

(74) දවනුලබන්නාවූ හෙතෙම ඤුතීන්ගේ සෝකයහා විලාපය නොදන්නේය, ඒකාරණයෙන් මම සෝක නොකරමි නාගතෙමේ සියසැචය හැරදමා යන්නාක්මෙන්, මාගේ පුත්‍රයාගට යාසුතුවූ ගමන, ශරීරය හැර ගියේවනැයි කීයේය---

ලෙස බ්‍රාහ්මණයා විසින් තමන්ගේ යොනිසොමනස්කාර දක්ෂභාවය ප්‍රකාශකළකල්හි බ්‍රාහ්මණ සවරූපවූ ශක්‍රතෙම බැමිනියට කියතුයේ මැනියනි මේ මැරුණු තැනැත්තේ තොපට කවරෙක්වේදැයි කීයේය---

සුවාමිනි දසමසක් මුළුල්ලෙහි කුසයෙන් උසුලා පරිහරණයකොට කිරිපොවා අත්පා මනාව පිහිටුවා වඩනයකළ මාගේ පුත්‍රයාගයි කියා ඉඳින් එසේවිනම් පියාතො පුරුෂයා හෙයින් නොහඬන්නේය, මැනිවරුන්ගේ හෘදය මෘදුවෙයි නි කුමක්හෙයින් මැනියෝත්වී නොහඬනේ වේදයිකියේය, ඒ අසා මැනියෝ නොහඬන කාරණය කියන්නී—මෙසේ කියා—

(75) අනමතග්ගතො තනොඅහා නාතුඤ්ඤතො ඉතොගතො යථාගතො තථාගතො තණ්හාපරි දෙවනා—

(76) දයහමානො නජානාති—පෙ—තසසයාගතිති—

(75) යම්තුහෙයින් මෙහිඑව මට පුත්‍රබවට පැමිනේවයිනියා නොකැදවනලදුව ඒ මැරුණූ තැනැත්තේ ප්‍රථමයෙහුත් පූර්ජනියෙන් මෙහි ආයේය, නැපි මෙයින් පරලොව යවයි කියා අනුදැනීමක් නැතිව මෙයින් පරලොව ගියේය, ගියජනියේයිට කැදවීමක් නැතිව යම්සේ මෙහි ආයෙවේද එසේම මෙයින් නොප පරලොව යෙවයි කියා අපගේ අනුදැනීමක් නැතිව පරලොව ගියේය තමාගේ වසඟයෙහි නොපවත්නා සංසාර ප්‍රවෘත්තියෙහි මරණය නිසා කවරනම් විලාපයෙක්ද,

(76) දවතුලබන්නාවූ හෙතෙම ඤාතීන්ගේ විලාපයහා සෝක නොදනිය, ඔහුට යායුතුවූ යම් ගමනෙක් ඇද්ද ඒ ගමන ගියේ වනැසි නියේය—

ඉමසේ ඒ බැමිණිය විසින් කියනලද වචනය අසා ඔහුගේ නැගනියගෙන් විචාරන්නේ මැනියනි මේ මැරුණූ තැනැත්තේ තිට කවරෙක් වේදැයි විචාළේය, සවාමිනි මාගේ සොහොවුරුයයි කීයේය, මැනියනි සහෝදරියොනම් සහෝදරයිනට සෙනහ ඇත්තාහුය, තොපි කුමක්හෙයින් නොහඬනොහිදැයි කියේය, ඕතොමෝ නොහඬන කාරණ කියන්නී—මෙසේ කියා—

(77) සචෙ රොදෙ නිසාඅසසං තණ්හමෙනිං එලංසියා ඤාතිමිත්තා සුහජ්ජානං භියෙඤ්ඤතො අරතිසියා—

(78) දයහමානො නජානාති—පෙ—තසසයාගති, නි—

(77) ඉඳින් මම හඬන්නෙවිනම් කුසව වියළුනාවූ ශරීර ඇතිවෙමි ඒ හැඬීමෙන් මට කවර ප්‍රයෝජනයෙක්වේද ඒ හැඬීම හේතුකොට මාගේ සහෝදරතෙම නොඑන්නේය, ඔහු එයින්

සුගතියටද නොයන්නේය, ඇති මිත්‍ර සුහෘදයින්ට මාගේ සෝක කිරීම හේතුකොටගෙණ බොහෝසෙයින් දුක්ම වැඩෙයි කියේය.

(78) මෙසේ ඇගේ වචනය අසා ඔහුගේ භාර්‍යාවන්ගෙන් විචාරන්නේ නිට ඔහු කවරෙක් වේදැයි විචාලකල්හි මාගේ සවාමියායයි කීවාය, සොඳුර සත්‍රීහු නම් සවාමියා කෙරෙහි සෙනහ ඇත්තාහු වෙති, ඔහු මැරුණුකල්හි භාර්‍යාවරු වැඳුඹුව අසරණ වෙති, කුමක් හෙයින් ති නොහඬන්නිදැයි කීයේය, ඕතොමොද තමා නොහඬන කාරණ කියන්නී—

(79) යථාපි දූරකෝ චඤ්ඤං ගච්ඡන්ත මනුරෝදති
එවං සම්පද මෙවේතං යෝ පෙත මනුසොචති—

(80) දයාමානෙ—පෙ—තස්සයාගතීති—

(79) යහුතුහෙයින් යම්සේ ලදරුවෙක් ආකාශයෙහි ගමන් කරන්නාවූ චන්ද්‍රයා ඉල්වා හඬන්නේවේද යමෙක් කාලක්‍රියා කොට පරලොව ගියාහට සෝකකෙරේද ඔහුගේ ඒ සෝකකෙරීම් ආදිය මට රථවක්‍රය ගෙණදෙවයි කියා ලදරුතෙම චන්ද්‍රයා ඉල්වා හඬනනාක් මෙන් වන්නේය,

(80) දවතුලබන්නාවූ ඔහු ඇතින්ගේවිලාපයහා සෝකනොදන්නේය, එහෙයින් මම නොහඬම් හෙතෙම ඔහුට යායුතු ගම නගියේයයි කීය—

මෙසේ ඔහුගේ භාර්‍යාවගේ වචනය අසා දුසියගෙන් විචාරන්නේ මැනියනි ති ඔහුට කවරෙක් වේදැයි විචාළේය, සවාමීනි මාගේ ආර්‍යාවෝයයිකීහ, ඉදින් තොපි මෙසේ නම් ඔහු විසින් නිට නලා මරා තොපි ලවා වෙශ්‍යාවටිකයන් කරවනලදවෙයි එහෙයින් තොපි නොහඬන්නියයි සිතම් කීහ, මෙසේ නොනිය මැනව මාගේ ආර්‍යාතෙම ඉතාම කෘතඥී මෛත්‍රිහා කරුණාවෙන් සම්පන්නවූ අසුභාකාරයෙකැයි කීය, එකල කුමක්හෙයින් සෝක නොකරේදැයිකීයේය,

ඕතොමෝද තමන් නොහඬන කාරණයකියන්නී—

(81) යථාපි බ්‍රහ්ම උදකුමෙහා භිණ්ණා අපපවි සන්ධියො.
එවං සම්පද මෙවේතං යොපෙත මනුසොචති—

(82) දයාමානො නජානාති—පෙ—තස්සයාගතීති—

(81) යහුතුහෙයින් බ්‍රාහ්මණය පැන්කලය මුගුරු ආදියකින් බිඳිනලද්දේ යම්සේ නැවත ප්‍රකෘතිවත් කරන්ට නොහැකිවේද,

කාලක්‍රියාකොට පරලොව ගියාහට සෝකකිරීම බිදුනකලය දූතෘ තිකරන්ට උත්සාහකෙරීම මෙන් වන්නේය,

(82) දවතුලබන්නාවූ හෙතෙම ඤාතීන්ගේ සෝකාදිය නොදන්නේය, ඔහුගේ යාගුතු ගමන ගිහිස්යයි කියා—

ශ්‍රුතතෙමේද දුසියගේ කථාවත්අසා පහන්සිත්ඇත්තේ මැනියෙනි තෙපි විසින් මරණානුස්මෘතිය වඩනලද්දේය, මෙතැන් පටන් තෙපි ඉසින් ක්‍රුසිවනික් ආදිය කෙරීමට කරුණු නැතැයිකියා ඔවුන්ගේ ගෘහය සත්රුවනින් පුරවා තෙපි අප්‍රමාදව දන්දෙවූය සිල්රකිවූය පෙහෙවසමාදන්වෙවූයයි කියා අවවාදදී තම්න් ශක්‍රයා බැව් දන්වා ශක්‍රභවනට ගියාහා—ඒ බ්‍රාහ්මණද් පස්දෙනද දූනාද්පින්කොට ඇයු ඇති තෙක් කල්සිට මැරිගොස් දෙවුලොව උපන්නාහුය—ශාස්තෘවූ බුදුරජාන්වහන්සේ මේ ජාතකය ගෙණහැරදක්වා ඒ උපාසකයාහට ශ්‍රොතාපත්ති ඵලය උදුරා දෙමින් මහතෙහි චතුරාර්‍යසත්‍යයන් ප්‍රකාශකොට චතුසත්‍යාවසානයෙහි උපාසකතෙම ශ්‍රොතාපත්ති ඵලයට පැමිණි සේකි)—මේ ප්‍රේතවස්තු ප්‍රකරණයෙහි පළමුවන උරගවගීයෙහි දෙවෙනි උරග ජාතක ප්‍රේත වස්තුව කියා නිමවනලදි—

12 උරගජාතක ප්‍රේත වස්තුව නිමි.

—oo—

මෙතෙකින් පරමාර්‍ථජෝතිකානම්වූ ඛුද්දකනිකායාර්‍ථ කථාවට අන්තර්ගත ප්‍රේතවස්තු වර්ණනාවෙහි කථාවස්තු දෙලසනින් ප්‍රතිමණ්ඩිතවූ පළමුවෙනි උරගවගීය කියා නිමවනලදි)—

එවද මේ ප්‍රේතවස්තු ප්‍රකරණයෙහි දෙවෙනි උබ්බරී වගීයෙහි පළමුවන සංසාර මෝචක ප්‍රේතවස්තුව—කවරහයත්.

එක් සමයෙක්හි මෛත්‍රී නැමති ජලයෙන් නිර්වාපනය කරණලද ක්‍රෝපාග්නි ඇති ත්‍රිභුවනෙක තිලක සකලඥෙය්‍ය සාගර පාරප්‍රාප්ත අනන්ත ගුණගනාධාර සකලසත්ව හිතෛසී ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ රජගහා නුවර වේළුවනාරාමයෙහි වැඩවාසයකර වදුරණ කල්හි මගධරට ඉඩිකාවතී නම් ගමෙහි එක්තරා ප්‍රේතියක් අරභයා මේ කථාව වදුරණලද්දේය—කෙසේදයත්—

මගදරට වනාහී ඉඩිකාවතිය දිසරාජියයි කියා ගම් දෙකෙක්වූවාහුය—එහි බොහෝ මිථ්‍යාදෘෂ්ටිකයෝ වාසයකෙරෙති, අතීතකාලයෙහිද පන්සියක් හවුරුද්දකට ඉහත එක් තරු

සත්‍රියක් නොමෝ එම ඉටඩකාවති නම් ගම එක්තරා සංසාර මොවක කුලයෙක ඉපිද මිථ්‍යාදෘෂ්ටිවසයෙන් කිට පටන් ගකියන සතුන් මරා නොහොත් පතුවන් හා පොලඟැටියන් මරා ඒ අකු සලයෙන් ප්‍රේතඅපායෙහි උපන්නේය, ඕනොමෝ පන්සියයක් ඔවුනුදු මුළුල්ලෙහි ක්ෂාපිපාස දුක්අනුභවකොටයිට අප භාග්‍යව තුන්වහන්සේ ලොව පහලව සවතවනලද දම්සක් ඇති චක්‍රම යෙන් රජගහනුවරට වැඩ වේළුවනාරාමයෙහි වැඩවාසයකර වදුරණකල්හි නැවතත් ඉටඩකාවති නම් ගමෙහි එක්තරා සංසා රමොවක කුලයෙක්හිම ඉපිද යම් කලෙක්හි ඕනොමෝ සත් අට වයස් ඇතිව අනික් සත්‍රීන්හා සමඟ විටිවල ක්‍රීඩාවට සමර්ථ විද එකල ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරතෙම එම ගම සවම්පයෙහිවූ අරුණවතීනම් විහාරයෙහි වැඩවාසයකර වදුරණසේක්, එක් දවසක් භික්ෂූන් දෙලොස්නමක් සමඟ ඒ ගම්දොර සවම්පව මාගී යෙන් වැඩමවනසේක්—එකෙනෙහි බොහෝ ගම්දෘර්වරු ගමින් පිටත ගම්දොර සවම්පයෙහි කෙලිනනාහු මවුපියන්ගේ පිලිවෙත් දක්වමින් හොස් සැරියුත් තෙරුන්වහන්සේට හා අනික් භික්ෂූ න්වහන්සේලාටද පවප්‍රතිඡීතයෙන් නමස්කාරකළාහුය, ඒ අශු ඛීවනත කුලවැසි සත්‍රී තොමෝ බොහෝකාලයක් මුළුල්ලෙහි අනාචිණ්වූ කුසල් ඇත්තෙන් කිසි ආදරයක් නැතිව නොහික් මුනු එකියකමෙන් සිටියාය—

සැරියුත්ස්ථවිරයන්වහන්සේද ඇගේ පුර්වචරිතය හා මේ කාල යෙහි සංසාරමොවක කුලයෙහි උපත් බවද අනාගතයෙහි නර කයෙහි උපදිනබවද දැක ඉඳින් මෝතොමෝ මාවදී නම් නරක යෙහි නුපදිනේය, ප්‍රේතව ඉපිදත් මානිසා සම්පත් ලබන්නේ යයි දැන කරුණෙන් චෝදනාකරණලද සින් ඇතිව ඒ ලදුරුව රුන්ට වදුරණසේක් නෙපි භික්ෂූ වදින්නෙවුය මේ ලදුරිනොමෝ නොහික්මුනු එකියකමෙන් සිටිනේයයි වදුලසේක—ඉක්බිත් තෙන් සෙසු ලදුරිවරු ඇගේ අත් අල්වා ඇද අවුත් බලාත්කාර යෙන් තෙරුන්වහන්සේගේ දෙපතුල් වැන්දෙවුවාහුය, ඕනොමෝ මැතකාලයෙහි වයස් පැමිණියවුත් දිඝරාජී නම් ගම සංසාර මොවක කුලයෙක එක්තරා කුමාරයකුට දෙනලද්දේ පිරුණවූ දරු ගැබ් ඇතිව කාලක්‍රියාකළ නැනැත්නි ප්‍රේතඅපායෙහි ඉපිද විලි වැසිල්ලක් නැතිව දුර්වර්ණවූ ශරීරඇතිව ක්ෂාපිපාස දෙකින් මැඩෙ නලදුව ඉතාම භයානක දර්ශනය ඇතිව ඇවිදින්නී, රාත්‍රියෙහි ආයුෂ්මත් සාරිපුත්‍ර ස්ථවිරයන්ට තුදුරුව එකතපස්ව සිටියේය, ඒ දැක ස්ථවිරතෙම,

ගාථාවකින් මෙසේ විචාරණසේක්—

(83) නග්ගා දුබ්බණ්ණ රූපාසි කිසාධමනි සංථිතා
උපඵා සුලිකෙ කිසිකෙ කාතුඤ්ඣං ඉධතිට්ඨසීති—පෙ—

(83) යතුහෙයින් විලිවැසිල්ලක් නැතිව කුසව නහර ඉලි පුනු ශරීරඅැතිව මතුවී පෙනෙන ඒසුවත් ඇතිව ඇට නහර සම් පමණක්වූ හෙයින් ඉතාම කුසවූ ශරීර ඇතිව මේහි සිටින් නාවූ තී කවරෙක්දැයි අසා වදාළේය—

ඒ අසා ප්‍රේතියොමෝ තමන්ගේ පවත් හඟවන්නී මෙසේ කීවාය—ස්වාමිනි මම යමලෝකයයි කියනලද ප්‍රේත අපායෙහි ඉපිද මෙසේ දුක්ඛිතවූයෙමි අකුසල්කොට මනුෂ්‍යලෝකයෙන් චුතව ප්‍රේතලෝකයට පැමිණියෙමි කියා—නැවත තෙරුන්වහන්සේ විසින් එවාරණසේක් එඛාප්‍රේතිය නෙපි විසින් කයින් වචසින් මනසින් කුමන දුසඤ්ඤාතයක් කරණලද්ද කුමන කර්මයක්හුගේ විපාකයක් හේතුකොට ගෙණ මිනිස්ලොවින් මේ ප්‍රේතලෝකයෙහි උපන්නිදුයි කියා කරණලද කර්මය විවාරණ ලද්දී ඇසුරුසින් ඇත්තෙන් දන්නොදෙන සුළුව ප්‍රේතලෝකයෙහි ඉපිද මෙසේ මහදුක් අනුභවකොරෙමි කියා දක්වන්නී—

(84) අත්‍ථකාමපකා මය්හංනාහෙසුං හතෙත්‍ථ
පිතාව මාතා අථවාපි සුතකා
යෙමං නියොජෙය්‍යුං දදන්‍ති දානං
පසන්න චිත්තා සමණ බ්‍රාහ්මනානං—පෙ—

(84) සුවාමීනි පෙර මවඅනුකම්පාඇති කෙනෙක්නුවූහ මාගේ පියකෙනෙක් හෝ මැනිකෙනෙක් හෝ නොහොත් නැකෙනෙක් හෝ තොපි ප්‍රසන්න සිත්ඇතිව ශ්‍රමණ බ්‍රාහ්මණ වරුන්ට දන්දෙවයි කියා මා දන්දීමෙහි නොයෙදුවාහ, මම මෙතැන් පටන්නුත් පන්සියයක් භවුරුදු මුළුල්ලෙහි නග්නව ක්ෂුධා පිපාස ඉදිකින් පෙලෙමින් ඇවිදින්නෙම් ඒ මාගේ අකුසලකර්ම යාගේ විපාකයවෙයි ආය්‍යයන් වහන්ස මම නුඹවහන්සේට ප්‍රසන්න සිත්ඇතිව නමස්කාර කරම් මහත් ආනුභාව ඇති ධෙය්‍යයන්වහන්ස මට අනුකම්පා කළමැනව කිසි දැනවසතුවක් ශ්‍රමණ බ්‍රාහ්මණයින්ටදී ඒ දක්ෂිනාව මට දුනමැනව ඒ කරණකොට ගෙණ මම මේ ප්‍රේත ආත්මයෙන් නිදහස්වෙයි සිතම් ඒ හෙයින් ස්වාමීනි මා මේ දුගතියෙන් නිදහස්කළ මැනවැයි කීවාය—

එසේ ප්‍රේතිය විසින් කීකල්හි ඒ ස්ථවිරතෙම එසේම පැවතුන,එබව දක්වන්ට සංගීතිකාරකයන් විසින්-මෙසේ කීහ.

(85) සාධුතීතිසඝා පටිසඤ්ඤනිඛා සාරිපුත්තෙත්‍රා අනුකම්පකෝ
භික්ඛූනං ආලෝපං දත්වාන පානිමත්තංච වොලඛං

(86) ථාලකඝඤ්ච පානියං තඤ්ඤාදඤ්ඤින මාදිසි
සම්මත්තාරා අනුදිවෙඛ විපාකෝ උපපජ්ජථ

(87) භොජනච්ඡාදන පානියං දඤ්ඤිනාය ඉදං ඵලං
තතෝ සූඛා සුච්චයනා කාසිකුත්‍රාම ධාරිනී
විචිත්තාවළු භරණ සාරිපුත්තං උපසංකමී ති

(85) යුතුවෙයින් යහපතැයි කියා ඇගේ වචනය අසා සාරිපුත්‍ර ස්ථවිරතෙම ඇව අනුකම්පා ඇතිව භික්ෂූකෙනෙකුට බත්පිඩක් හා රියණක්පමණ වස්ත්‍රයක්ද,

(86) එක්තළුතැටියක් පූරවා පැතුදී ඇව දක්ෂිනාව දුන්නේය, දක්ෂිනා දුනයට අනතුරුවම විපාක පහල වූයේය,

(87) දිවබොජුන්හා දිවසළුදා දිවපැන්ද පහලවූයේය, මේ දක්ෂිනාවගේ විපාකය වන්නේය, ඉක්බිත්තෙන් ඒ ප්‍රේතිතොමෝ පවිත්‍රව යහපත් දිවසළු හැඳ උතුම් කසීසළුදරා විසිතුරු වස්ත්‍රාභරණ ඇතිව සැරියුත් තෙරුන්වහන්සේ ලඟට ගියහයි කීහ ඉක්බිත්තෙන් ශාරිපුත්‍ර ස්ථවිරතෙම ඒ ප්‍රේතිය ප්‍රනීත ඉන්ද්‍රියයන් ඇතිව පිරිසිදුවූ ශරීරවර්ණයෙන්හා දිව්‍යමයවූ වස්ත්‍රාලංකාරාදීයෙන් යුක්තව තමාගේ ශරීරා ලෝකයෙන් සියලු දිසාවන් බබුළුවමින් තමන් ලඟ සිටියවුන් දැක, මෙසේ විචාරණසේක්, දේවතාදුව නිට මෙහි සියලු කැමති කැමති සම්පත් පහලවෙයි, ඒ කවර හේතුවකින් වේද මහත් ආනුභාවඇති දේවතාදුව නිගෙන් මම විචාරම් මනුෂ්‍යව උපන්නාවූ තෙපි කුමන පිනක් කලේද කවර පනක් හේතුකොටගෙණ මෙසේ දිලිහෙන ආනුභාවක ඇතිවිද, ඖෂධී තාරකාවක් මෙන් තිගේ ශරීරවර්ණය සියලු දිසාවන් බබුළුවන්නේ කවර හේතුවකින්දැයි කීයේය මෙසේ තෙරුන්වහන්සේ විසින් විචාරණලද්දාවූ ඒ ප්‍රේතිතොමෝ ඇගේ සම්පත් ප්‍රතිලාභ කාරණය ප්‍රකාශකර කියන්නී මෙසේ කීය ඉලිපුතු ගියල් ඇතිව ක්ෂුධාවෙන් හා පිපාසයෙන් පෙලෙමින් නග්නව දිරුවාවූ ජඩිය ඇතිව දුකට පැමිනසිටි මා ලෝකයෙහි කරුණාවන්තවූ නුබවහන්සේ දුටුයේය, දැක වදුරා හිස්සූ නමකට බත්සරළුවක්දී මට දක්ෂිනාව දුන්නේය, රියනක් පමණ වස්ත්‍රයක් හා තළුතැටිය පූරාපැතුදී මට දක්ෂිනාව දුන්නේය, සවිමත් බත්සරළුවගේ විපාකය බැළුව මැනව දිව්‍යභෝජන පහලවූයේය. හවුරුදු දහසක් මුළුල්ලෙහි කාමයෙන් සම්පන්නවනොයෙක් රසවත් ව්‍යංජනයන් යුක්තවූ දිව්‍යආහාර අනුභවකා

ගන්නෙමි, රියනක් පමණ වසුනුදුනයාගේ යම්බඳුවූ චීපාකයෙක් වේද ඒ බැළුවමැනව යම් පමණක් නැඳිය රජහුගේ රටෙහි වසුන යෝ ඇද්ද, සවාමිනි මට කෝසෙය්‍ය වසුනුද කැඹිලිහා කොමුපිළිද කපුපිළිද ඊට බොහෝවන්නාහුය—

එහි මේ නැඳිය රජනම් කවරේද—එහි පිළිවෙල කථාව මෙසේ දතයුතුයි—

අතීත කාලයෙහි වනාහි දසදහසක් හවුරුදු ආයුෂැති මනුෂ්‍යයන් ඇතිකල්හි බරණැස්වැසි එක් කෙලඹි පුත්‍රයෙක් තෙම ආරන්‍යයෙහි ජංඝා විහාරයෙහි ඇවිදිනේ ආරණ්‍යස්ථාන යෙහි එක්තරා පසේබුදු කෙනෙකුන් දුටුයේය, ඒ පසේබුදුරජ තෙම වනාහි එහි සිවුරුකම්මාන්ත කරමින් සිවුරට තුවාවක් නොසැහුනු කල්හි සිවුර හකුලා තබන්ට පටන් ගත්සේක, කෙලෙඹි පුත්‍රතෙමේ ඒ දැක වහන්ස කුමක් කරවුදැයි කියා ඒ පසේබුදුරජහුන්වහන්සේ විසින් අල්පේච්ඡ බැවින් නොනිසිවූ කිසිවක් නොවදුලකල්හිද සිවුරු වසුන අඩුයයි දැන තමාගේ උතුරුසළුව පසේබුදුරජහුගේ පාමුල්හි තබා හියේය—පසේබුදු රජතෙම ඒ ගෙණ අනුවාතඝතඝා සිවුරකොට පෙරවිසේක ඒ කෙලඹි පුත්‍රතෙම ජීවිතයාගේ කෙලවර කාලක්‍රියාකොට තවු තිසා භවනයෙහි ඉපිද එහි ආයුෂැතිතෙක්කල් දිව්‍යසම්පත් අනු භවකොට එයින් චුතව බරණැසින් ගොදුනක් පමණ තැන්හි එක්තරා ගමෙක අමාත්‍යකුලයෙක්හි උපන්නේය, ඔහු වැඩිවිය පැමිණිකල්හි එක් දවසක් ඒ ගමෙහි නැකැත්කෙලි පණිස ඝෝෂාකරණලද්දේවේ, හෙතෙම මැනියන්ට මෙසේ කියන්නේ මැනියනි මට වසුනුයක් දුනමැනව නැකැත්කෙළිම් කියේය, ඕතොමෝ පුංචිනාලද වසුනුයක් හැරගෙණ දුන්නිය, මැනියනි මේ දලයකි කිහ, අනික් වසුනුයක් හැරගෙණ දුන්නිය, ඒ වස්තු යද දලයකි කියා ප්‍රතික්ෂේප කළේය, එකල්හි ඕහට මැනියෝ නියතුයේ, දරුව යම්බඳු වස්තුයක් තෙපි කැමැත්තෙහිද එබඳු වස්තු හෙයි අපි උපදවා නැත මිටවඩා සියුම් වස්තු ලැබීමට අපට පින් නැතැයිනිහ, මැනියනි ලැබෙනතැනකට යෙමි කීයේය, පුත්‍රය තොපට අදම බරණැස් රාජ්‍යය ලැබේනම් මම කැමැත්තෙමි කිහ—යහපත මැනියනි කියා මැනියන්වැඳ පැදකුනු කොට මැනියෙනි මම යෙමි කීයේය, යව පුත්‍රයයිකිහ—ඇවැ මෙබඳු සිතෙක් උපන මොහු කොයියේද මේහි හෝ එහි හෝ හින්නේයයි සිතුන, හෙතෙම පුත්‍ය නියමයෙන් වොදනාකරණ ලදුව ගම්න් පිටත්ව බරණැස්නුවරට ගොස් බරණැස් රජහුගෙ

මිගුල් ගල් පෝරුව් පිට හිසසිට පෙරව නිදාගත්වන, එදවසද බරණැස්රජ කාලක්‍රියාකළ සත්වෙනි දවසවෙයි, අමාත්‍යයෝද පොරොහිතතෙමේද රජහුගේ ශරීර කෘත්‍යකොට රාජාගණයෙහි රැස්වූහිද මෙසේ කථාකළාහුය, රජහුගේ එක් ධීතෘවක්ඇත පුත්‍ර යෙක්නැත, රජෙක්නැතිව රාජ්‍ය නොපවත්නේය, එහෙයින් මිගුල්රථය සරයා හරිමුයයි කථාකොට, ඔවුහු කුමුද පත්‍රවර්ණසවි ඛවයත් සතරදෙනෙක් යොදූ සෙතවජ්ත්‍ර ප්‍රමුඛ පඬරාජ කකුධ භාණ්ඩයන් රථයෙහි මත බාරථය පිටත්කොට රථය පස්සෙන් තුයිත් නාද පැවැත්වූවාහුය, රථය නැගෙණහිර දෙරටුවෙන් නික්ම උය නට අභිමුඛවගියේය, පෙරසුරුද්දෙන් උයනට අභිමුඛව යන්නේ ය නවත්වමුයයි සිතහරෙක් නිවාහුය—පොරෝහිතතෙම නොන වත්වයි කියේය, රථය උයනට ගොස් කුමරුවා පැදකුතුකොට නැගීමට සැරසී සිටියේය—

පුරෝහිතතෙම් ඒ කුමරුවාගේ පොරෝණකොන ඉවත්කොට පතුල්බලමින්, නියතුයේ මේ දස දහසක් යොදුන් පෘථිවිපය තබා දෙදහසක් කොදෙව් පිරිවරකොට ඇති සතරමහ විපයෙහි රාජ්‍යකරන්ට යුක්තෙකැයි කියා තුන්යලක් පවතුය් නාද පැවැත්තෙවුවාහ—එකල්හි කුමරුතෙම මුහුන විවෘත කොට බලා දරුවෙනි කුමක්ද්‍යණිස ආවෝදැයි කීහ, දේවයන්වහ න්ස තුබවහන්සේට රාජ්‍ය පැමිණෙයි කියේය, නොපගේ රජ කොයිදැයි විචාළේය, සවගිහසථවූයේය, සවාමිනිකිහ, කීදවසෙක් ඉක්මියාහුදැයි විචාළේය, අද සත්වෙනි දිනයයි කීහ, පුත්‍රයෙක් හෝ ධීතෘවක් හෝ නැද්දැයි විචාළේය, ධීතෘවක් ඇත දේවයන්ව හන්ස පුත්‍රයෙක්නැතැයි කීයේය, එසේ වීනම් රාජ්‍ය කරම් කී කල්හී එකනෙතිම එහි අභිසේක, මණ්ඩපයක් කරවා රාජධීතෘව සවිලංකාරයෙන් සරසා උයනට ගෙනැවිත් කුමාරයාට අභිසේක කළාහ—

ඉක්බිත්තෙන් කරණලද අභිසේනය ඇති බිහට ලක්ෂ යක් අහනා සඵවක් හඳින්නට එලවූහ, හෙතෙම දරුවන් මේ කිමෙක්දැයි විචාළේය, හඳින වසත්‍රයයි දේවයෙනි කීයේය, දරු වෙනි මේ දල නොවේදැයි කීයේය, මනුෂ්‍යයන් පරිභෝගකරණ වස්ත්‍ර අතුරෙන් මීටවඩා සියුම් වස්ත්‍ර නැත දේවයෙනි කීවාහුය, නොපගේ රජතෙම මෙබඳු වස්ත්‍ර හැන්දේදැයි විචාලකල්හි එසේය දේවයෙනි කීයේය, නොපගේ රජතෙම අපුන්‍යවන්තයෙකැයි සිතමි, එසේනම් සවණී භිඩකාරය ගෙනෙවුය වස්ත්‍රලබම් කීකල්හී

ඔවුහු සවණ්ඩිහිංකාරය ගෙනැවිත් දුන්හ, එතෙම හුනස්නෙන් නැ
ගිට දැත් හෝදාගෙණ මුහුන ධෝවනය කොට දකුණතින් පැන්
ගෙණ පූර්වදිසාවට පැන්ඉස්සේය, එකල ඝනපෘථිවිය පලාගෙණ
කප්රුක් අවෙක් පැනනැන්ගාහුය, නැවත පැන්ගෙණ දකුණු
දිසාවටහා පශ්චිමෝත්තර දිසාවට දැසියන සතර දිසාවට පැන්
ඉස්සේය සියලු දිසාවලින් අට අට බැගින් කප්රුක් නිස්දෙකක් පැ
නනැගාහුය එක් එක් දිගින් සොළසබැගින් හැටහතරෙකැයිසම
හරෙක් නියති-හෙතෙම් එක් දවසළුවන් හැඳ එක් දවසළුවක්
පොරවා නියනුයේ, නඳිය රජහුගේ රටෙහි කපුකටිනාඇතිහු
නොකවිත්වයි නියමින් බෙර හසුරුවවුයයි නියා ජාහයනන්වා රා
ජහරණයෙන් සැරසෙනලදුව උතුම් හස්තිරාජයා පිටට නැගි හු
වරට ප්රවේසව ප්රාසාදයට නැගි මහාසම්පත් අනුභව කරන්නේය
මෙසේ කල්යන කල්හි එක්දවසක් දේවි තොමෝ රජහුගේ සවි
පත් දැක අනේ තාපසවරුණි නියා කරුණා කාරයක් දක්වූයේය,
එකල රජහු විසින් මේ කිමෙක්ද දේවිනියි විචාරණලදුව දේව
යන්වහන්ස අපි අතීත කාලයෙහි කුසල්කළ බැවින් ඉතා මහත්
සම්පතක් ලද්දෙමුව දුන් අනාගතයෙහි සම්පත් ලැබීමට පින්
නොකරේදැයි විචාළේය, කවරෙකුට දෙමුද දේවිනි සිල්වන්හු
නැනැහි නිහ, දේවයන්වහන්ස ජම්බුවීපය රහතන්ගෙන් සිස්නො
වෙයි නුඹවහන්සේ දන්ම සරසාපුව මැනව මම රහතන් ලබමි
කීයේය, පසුව දවසෙහි රජතෙම මහදන් සැරසුයේය-දේවී
තොමෝ ඉදින් මෙදිසාවෙහි අහිත්හු ඇත්තේ විනම් මෙහි වැඩ
මවා අපගේ භික්ෂාව ගනිත්වයි නියා මල් අහසව දමා උතුරු දි
සාභිමුඛව මුහුනින් නිදුගත්තේය, දේවිතොමෝ මුහුනින් හොත්
කෙනෙහිම හිමාලවෙනෙහි පන්මාවනියගේ පුත්වූ පසේබුදුවරු
පන්සියයගෙන් වැඩිමහළු පදුම පසේබුදුරජතෙම බැණහුවරුන්ට
කථාකොට කියනසේක් නිදුකාහ වරුනි නඳිය රජතෙම තොප
ට ආරාධනා කෙරෙයි ඔහුගේ ආරාධනාව ඉවසවූයේනි වදාළේය,
ඒ පසේ බුදුවරු ඒ ආරාධනාව ඉවසා එකතෙහි අහසින්ගොස්.
උතුරුදිසා දෙරටුවට බැස්සාහුය, මනුෂ්යයෝ ගොස් දේවයන්ව
හන්ස පන්සියයක් පසේබුදුවරු වැඩියාහුයයි රජහුට දුන්නුවාහුය

රජතෙම දේවිය සමග ගොස් වැඳ පාත්රා ගෙණ පසේ
බුදුවරුන් ප්රාසාදයටනන්වා එහිදී දන්දී දන්වලඳ අවසානයෙහි
රජතෙම සංඝස්ථවිරයන් වහන්සේගේද දේවිතොමෝ සංඝනවක
තෙරුන්වහන්සේගේද පාමුල්හි හෙව ආර්යවරු ප්රත්යයෙන් නො
මිරිකෙති අපි පිනෙන් නොපිරී හෙන්නෙමුව මෙහි විසිවට අ

පඬිපුතිඤ දෙවා මිදුළමැනවැයි ප්‍රතිඤ ගෙන උයනේ වාසස්ථාන කරවා එහි වස්වා ජීවිතාන්තය දක්වා පසේ බුදුවරුන්ට උපස්ථා නකොට උන්දිහන්සේලා පිරිනිවිකල්හි සාධුක්‍රීඩාකරවා සඳුන්අ ඟිල්දර ආදියෙන් ආදාහන කෘත්‍යය කරවා ධාතූන් ගෙණවෙත්‍ය සන්පිහිටුවා මේවැනි මහඅනුභාව සම්පන්නවූ මහාර්ෂිවරුන්වප වා මරණවෙයි අපවැන්නවුන්ට නියතුම කවරේදැයි හටගත් ක ලකිරිලි ඇතිව වාඩිවහළු පුත්‍රදාරාජ්‍යයෙහි පිහිටුවා තෙමේ ශ්‍රම ණ ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිවූහ——දේවිතොමෝද රජතුමාවූ ක ල්හි මම කුමන් කෙරෙම්දැයි සිතා පැවිදිවිය, දෙදෙනම, උයනෙ හි වෙසමින් ධ්‍යානඋපදවා ධ්‍යාන සැපයෙන් කල්ගවා ආයුක්ෂ ය්වර බ්‍රහ්මලොකයෙහි උපන්නාහුය——

එනඳියරජතෙම වනාහි අප භාග්‍යවත් බුදුරජුනන් වහන්සේගේ ශ්‍රාවකවූ මහාකාශ්‍යපස්ථවිරයානෝ වූහ; ඒ නන්දිය රජතුගේ අග්‍ර මහෙසිකා තොමෝ භද්‍ර කප්ලානියවූයේය නන්දිය රජතෙම වනාහි දසදහසක් හවුරුදු මුළුල්ලෙහි තමුන් දිව්‍ය වස්ත්‍ර හඳිමින් තමාගේ සියලුරට උතුරුකුරු දිවයිනසේ කෙරෙ මින් ආදා මනුෂ්‍යයින්ට දිව්‍යසම්පත් දුන්නාහ, ඒමේ දිව්‍යවස්ත්‍ර යන් ගේ සමෘද්ධිභාවය සඳහා මේ ප්‍රේතිතොමෝ නියතුයේ යම්පමණ නන්දිය රජතුගේ රටෙහි වස්ත්‍රාදාදද්ද ඊටත්වඩා මට පහලවී නිබෙ න දිව්‍ය වස්ත්‍රහා දිව්‍යඵලස්ද කොමුපිලිද කප්පපිලිද හඳිනා පෙ රෝණදිව්‍යවස්ත්‍ර බොහෝ වන්නාහ ඒ වස්ත්‍රයොදිගින් පුරුලින් මහත්වන්නාහුය මහඞ්ගවන්නාහුය ආකාසයෙහි එල්වී සිටිනිසියින් යම් යම් වස්ත්‍රයන් හඳින්ට මමකැමතිනම් ඒ වස්ත්‍රගෙණ හඳිම්පොරවම් තවද නුඹවහන්සේ තළතැටියපුරා යම්පැනක් දුන්නේද ම ම විසින් යම්පැනක් අනුමෝදන් වනාලද්දේද ඒ පානීය දානයා ගේ විපාකය, යම්පමණ මහත්ද ඒ බැළුවමැනව ගම්භීරවූ සත රුස්සපාකුණු ඒ දානය කම්මත්තු භාවයෙන්පහලවූවාහුම ඒපොකුණු පිරුණුවූ සිහිල්ජලය ආත්මාහුය යහපත් තොටුපල ආත්මාහුය ජලිකුල් නොවන සුවඳවත් ජලයඇත්තාහ කමලෝත් එලාදින් ගේ මකරකුයෙන් ගැවසීනත් ජලයෙන්පිරුනාහ, එහිමම ක්‍රීඩාක රණින් දිව්‍යසම්පතින් ප්‍රමුදිතව නිසිසයක්නැතිව කැමතිසේ හැ සිරෙමින් ඒ මම මවුපකාරවූ නුබවහන්සේ වඳින්ට ආයෙම්නී වාය——

මෙසේ ඒ ප්‍රේතිය විසින් නිකල්හි එතනින් වැඩ ඉක්බිත්තෙන් ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරතෙම ඉට්ඨකාවතී නම් ගමය දිසරා

ඒනම් හමය යන දෙගම් වැස්සෝ නමුත් වහන්සේ ලඟටඅ
කල්හි මේ වස්තුව විස්තාරවසයෙන් නියමින් මනුෂ්‍යයින්ට සංවේ
ගඋපදවා සංසාරමොචනක අකු සලකම්මයෙන් මුදවා උපාසක
භාවයෙහි පිහිටවූසේක—ඒප්‍රවෘත්තියහිඤූන්වහන්සේලා අකුරේ
ඔප්‍රකටවිය භික්ෂූන් එපවත්භාගෘවත් බුදුරජනන්වහනසේව සැල
කළාහුය—

භාගෘවතුන් වහන්සේ ඒ අන්‍යොත්පත්තිකොට ගෙණ සම්ප්‍රාප්ත
පිරිසට ධම්මදේශනාකොට වදාළසේක ඒ දේසනා තොමෝ මහ
ජනයා හට සාක්ෂිකවූවාය—ශ්‍රද්ධාවන්නවූ උපාසක උපාසිකාවරු
නි සවිලපවූ කුසලා කුසලයන්ගේ විපාකය මෙසින්දුන අශ්‍රද්ධාව
දුරුකොට ශ්‍රද්ධාවඋපදවා බුද්ධාදි රත්නත්‍රය ඇතුළුව ගෞරව කළ
යුත්තන්ට ගෞරව කෙරිමෙන් කුසල්පුරා එහ ලෞකික පාර
ලෞකික සම්පත් සිඩකොට කෙලවර අමා මහ නිවන් දකින්න
ව උත්සාහ කළමැනවි—මේ ප්‍රේතවස්තුප්‍රකරණයෙහි දෙවෙනි
උඛරිවගීහාන්නගීහතවූ පළමුවන සංසාර මොචක ප්‍රේතවස්තුව
කියා නිම්වනලදි—

13. සංසාරමොචක ප්‍රෙතවස්තුවනිම්.

—xx—

නවද මේ ප්‍රේත වස්තු ප්‍රකරණයෙහි දෙවෙනි උඛරිවගීහාන්න
ගීහත දෙවෙනි ශාරිපුත්‍ර මාතෘප්‍රේත වස්තුවකවරහ ඇත්—

එක්සමයෙක්හි ලෝකයාහටදිව්‍යනේත්‍රයක් බඳුවූබුදුරජ
නන්වහන්සේ රජගහනුවර වේළුවනා රාමයෙහි විඩවාසයකර
වදුරණකල්හි එක්දවසක් ආයුස්මත් ශාරිපුත්‍රස්ථවිරයන්වහන්
සේද, ආයුස්මත් මෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේද, ආයුස්මත්
අනුරුඬ ස්ථවිරයන් වහන්සේද, ආයුස්මත් කප්පින ස්ථවිරයන්වහ
න්සේද, යන සතරදෙනා වහන්සේරජගහනුවරට භුදුරුඑක්නරා
වනාන්ත්‍රයෙක්හි විඩවාසයකර වදුරනාහුය—

එසමයෙහි බරණැස්නුවර සියලුසම්පතින් ආඩ්ඪ්‍යවූ මහ
දනඇති මහත්භෝගයන්ඇති බ්‍රාහ්මණයෙක් ඇත්තේය, හෙතෙම
ශ්‍රවණ බ්‍රාහ්මණ යින්ටහා කුපනව නිඛඛක යාචකාදීන්ට පැන්
පොකුනාක්සේ සවීසාධාරණව ආහාර පානවස්ත්‍ර යාන වාහනාදී
න් දෙන්නාහ, දන් දෙන්නේද ආ ආවූන්ට කාලයවූ පර්ද්දෙන්
සුදුසු පර්ද්දෙන් පාදෝදක පාදබ්‍යභාදී ඍතුපිළිවෙලවූ සිය ඉදි
මෙහි ප්‍රතිපන්නේවෙයි—පෙරබත්වේලෙහි භික්ෂූන් ආහාරපානා
දියෙන් සන්තර්පණාව වලදවන්නේය හෙතෙම දේසාන්තරයව ස

නුකැමනිව භාග්‍යවතහට මෙසේනිහ, පින්වතිය පැනවූ පරිද්දෙ න් මේ දානවිධිය නොපිරී හෙලමින් සකස්කොට අනුවපවතිමින් දෙවයිනියේය, ඕතොමො යහපතැයි පිළිගෙණ ඔහුපිටත්ව ගිය කල්හිම පළමුකොට භික්ෂූන්වහන්සේලාට නියමකරණ ලද දන් විධිය කඩකළේය. වාසයපිණිස එලඹියාවූ මහිජනයින්ට ගේපිටිප සෙහි හැරදමනලද දිරාගිය සාලාවක් දැකා මෙහි නිදුගනිවූය යි කියන්නිය ආහාර පානවස්ත්‍ර සයනාදින් ඉල්වා ආවුන්ට අසූචි කාපිය, මුත්‍රබිපියව, ලේබිපියව, නොපගේ මැනිවරුන්ගේ ගිස මොල කාපියවූයයි යනාදි අසූචි මෙන් පිළිකුල් කටයුතුවූ යම්යම් වචන යෙක් ඇද්ද ඒ ඒ වචනකියානින්දුකරන්නිය....ඕ තොමෝ මැතකාලයෙහි මැරිහොස් අකුසලකම්මානුභාවයෙන් දමන ලදුව ප්‍රේත අපායෙ ඉපිද තමාගේ වාග් දුස්චරිතයට සුදුසුපරිද්දෙන් දුක්අනුභවකරන්නිය....ඕතොමෝ ප්‍රේතදුක් අනුභවකරමින් සිට එක්දවසක් පූර්ජාතියෙහි මැනියෝවූ එකතුභාවය සිහිකොට ආයුස්මත් ශාරිපුත්‍රස්ථවිරයන් වහන්සේ කරා එතුකැමතිව ඒ ස්ථවිරයන් වහන්සේගේ විහාරයටපැමුනුනේය ඒවෙහෙර අධිගෘහීත දේවතාවො ඇට විහාර තුලටවදින්ට අවකාශනුදුන්නාහුය ඒ ප්‍රේතිතොමෝ වනාහි මෙයින් පස්වෙනි ජාතියෙහි ශාරිපුත්‍ර ස්ථවිරයන්වහන්සේගේ මැනියොවූහ එහෙයින් ඕතොමෝ ඔවුන්ට කියන්නී මම්අය්‍යවූ ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේට මෙසින් පස්වෙනි ජාතියෙහි මැනියෝවූයෙම් තෙරුන් වහන්සේ දකින්ට විහාරතුලට යන්නට මටදොරටුව අවකාශ දෙවූයයි කියා ඒ අයා දේවතාවො ඇට විහාර තුලට වදින්ට අවසරදුන්හ, ඕතොමෝ විහාරතුලටවැද සක්මන් තෙලවර සිට තෙරුන් වහන්සේට තමන්දැකා සිටි සේය....

සථවිරතෙම ඇදුකා කරුණාවෙන් චෝදනාකරණලද සින්ඇතිව මෙසේ අසාවදාරණසේක්....

(88) නග්ගාදුබ්බණ්ණරූපාසි කිසා ධමණිසන්ථතා
උපඨාසුලිකෙ නිසිකෙ කාතුම්හං ඉධ තිට්ඨසිති....

(88) යනුහෙයින් වැලිවැසිල්ලක්නැතිහෙයින් නග්නව දුර්ණීවූ ශරීර ඇතිව ඇවසැකිලි පමනක්ව කෘසවූ ශරීරඇතිව ඉලිපිපෙනෙන්නාවූ නහරවැලින් යුක්තව ච්වරවූ පාසුකාවන් ඇති වමෙහිසිටින්නාවූ නී කවරකෙනෙක්දැයි විචාළේය, එවිටඕතොමෝ නියතුයේ

(89) අහංනන්නසනියා මාතා පුබ්බෙඅඤ්ඤාසු ජාතිසු
උපපන්නාපෙතුත්තිවිසයං ඛුප්පිපාසා සමප්පිතා....එප.

(90) දෙඝිපුත්තා ඉමෙදානං අම්හාකඤ්ඤසඤ්ඤිමෙ
අපපව නාමම්හාකඤ්ඤං සුඛලොහිත හොජනානි

(89) යහුගෙයින් සවාමීනි මම තුඹ වහන්සෙගේ සඩකිය මැනියො වෙමි මේ ජාතියෙහි මැනියොනොවෙමි මීටපුවේයෙහි පස්වෙනිජාතියෙහි මැනියෝවූයෙමි ඒ මම ප්‍රේතඅපායෙහි ප්‍රතිසන්ධිවස යෙන්ඉපිද ආහාරපැන් නොලැබ ක්ෂුාපිපාස දෙනින් මැඩෙනලද් දෙමි මනුෂ්‍යයන් එසින් දමනලද කෙලහා කිඹිසිකල්හි වැගිරෙ නලද කෙලද සෙම් සොටුද දවන්නාවූ මිනිසුන්ගේ ව්‍රනතෙල්ද දරුවැදූ ස්ත්‍රීන්ගේනැබමලද අනුභවකෙරෙමි තවද ව්‍රනවලින් වැගිරෙණ ලේ සැරවහා ගිස් නාසා සිඳින ලද්දාවූන්ගෙන් වැ හෙන ලේද, මෙසේ සත්ත්වයන් සම්බන්ධවූ ලේසැරව ආදි අප විසනු දෙය අනුභව කෙරෙමි තවද එඑබැවළු ගව මහිෂාදි න්ගේහා මිනිසුන්ගේ ලේසැරව අනුභවකරමින් තිසිපිළිසරණක් නැතිව වාසයකරන්ට ගෙයක් දොරක් නැතිව මිනිදවනලද හඵ වලින්හා අහුරුවලින් ගැවසී ගත් සොහොන්බිම සයනයකොට ඇත්තෙමි

9ඊ ප්‍රේතයානි මානමව දන්දී දක්ෂිනාව මටදුනමැනවලේ සැරව අනුභව නිරිමෙන්මම නිදහස්වූයේනම් යෙහෙකැයිනිවාය,

එවිට අසා ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන්වහන්සේදෙවෙනි දවසේමොග්ගල්ලානයන ස්ථවිරයන්ආදී තුන්දෙනාවහන්සේත් කැඳ වාළු තෙරුන්හා සමගරජගහනුවරට පිඬුපිණිස වඩනාසේක් බිම්සාර මහරජතුගේ රජගෙට වැඩිසේක රජතෙමේ තෙරුන්වැඳ සවාමීනි කුමක්පිණිස වැඩියෝදැයිකියා වැඩමෙවූකරුණු විවාලකල්හි, ආයුෂ්මත් මොග්ගල්ලානයන ස්ථවිරයන්වහන්සේ ඒ ප්‍රේතිය ගේ ප්‍රවුර්තිය රජහටවදාළෙය රජතෙමේද දනිමි සවාමිනි කියා තෙරුන්යවා සියලුකම්මානන්ත කරණ අමාත්‍යයන්තු කැඳවා යාතුකරන්නේ තොපි නුවරට නුදුරුවූ සෙවනහා ජලයෙන්යුක්තවූ ආරණ්‍යයෙක්හි සතරනිලියක් කරවයි කීයේය ඔවුනු එසේ කලාහ, නැවත ඇතුල්නුවරද සිවුනිලියක් කොරෙවූයේය, තමනුත් එහිගොස් කටයුතු කෘත්‍යය කෙලේය නුවරින් පිටහා නුවර තුලෙහි නිලිනු නිමිකල්හි බිලිදීමට සැහෙන කරුණුසලසවාආහාරපාණ වස්ත්‍ර ආදීන් බුදුන්ප්‍රමුඛ සංඝයාට සුදුසුවූ පරිස්කාරයන්ද එලවා තබා ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන්ට ඒ සියලල භාරකළේය ඉක්බිති ස්ථවිරතෙම ඒ මහාප්‍රේතිය උදෙසා බුදුන්ප්‍රමුඛවස

තරදිගින් වඩිනසංඝයාට ඒ ආහාර පානාදිත් දුන්සේක. ඒ ප්‍රේතිනොමෝ ඒ දක්ෂිනාව අනුමෝදන්ව දෙවුලොව ඉපිද සිය එකාමයෙන් සම්පූර්ණව දෙවනදා ආයුස්මත්මෞද්ගල්‍යන ස්ථවිරයන් ලඟට ගොස්වැඳසිටියාය, ඇගෙන් ස්ථවිරයන් වහන්සේ ප්‍රවෘත්තිවිචාල කල්හි තමන්ප්‍රේතව උපන්බවහා එයින්නිදහස්ව දෙවුලොව උපන්බවද විස්තරවසයෙන්කීවාය.

ඒ බව ප්‍රකාශ කරන්නාවූ සංගීති කාරකයන් විසින්මෙ සේකියනලදී.

(91) මාතුයාවචනං සුත්වා උපතිස්සොත්ථ කමපකෝ
අමන්තයි මොග්ගල්ලානං අත්තරුඩංච කප්පිනං.

(92) චතස්සෝ කුට්යෝ කත්වා සංඝේ චතුද්දිසෙ අදා
කුට්යෝ අන්නපානංච මාතු දක්ඛිණමාදිසි.

(93) සමනන්තරාත්ථ දිවෙඩ්ඪ විපාකොඋපපජ්ජථ
භොජනං පානියං වත්ථංදක්ඛිනාය ඉදංඵලං.

(94) තතෝ සුධා සුවිවසනා කාසි කුත්තම ධාරිනි
විචිත්තා වත්ථා හරණා කොලිතං උපසංකමිත්ථි.

(91) යනුගෙයින් මාතාවූ ප්‍රේතියගේ වචනය අසා උපතිස්ස නම් ශාරිපුත්‍ර ස්ථවිරතෙම අනුකම්පා සිත්ඇතිව මෞද්ගල්‍යයන ස්ථවිරයන්ට හා අනුරුධ ස්ථවිරයන්වද කප්පින ස්ථවිරයන්වද ආරාධනයකොට රජගහනුවරට වැඩ බිම්බිසාර රජතුමා දන්වාබිම්බිසාර රජතුමිසින්

92 ගොවල්සතරක් තනවා එහිආහාර පානාදියසම්පාදනයකොට තෙරුන්වහන්සේට භාරකළ කල්හි ඒ දෙය බුදුන්ප්‍රමුඛව සතරදිගින් වඩිනසංඝයාට පූජාකොට ඒ දක්ෂිනාව මාතාවූ ප්‍රේතියට දුන්සේක.

93 දක්ෂිනාව දුන්කෙනෙහිම එහිවිපාකය පහළවූ සේය, වැ වස්ත්‍රාභරණ වස්ත්‍රාදිය පහළවූහ, මේදක්ෂිනාව දුන්විපාකයවේයී

94 ඉක්බිත්තෙන් ඒ ප්‍රේතිනොමෝ සුඛපවිත්‍රව දිව්‍යසම්පත්හැඳ උතුම් කසීවස්ත්‍රාභරණව විචිත්‍රවූ දිව්‍යකභරණ පැළඳ කෝලිතනම්වූ මෞද්ගල්‍යයන ස්ථවිරයන් වහන්සේ කරා එළඹිටියාය,

ඒ කල්හි ආයුස්මත් මොද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේ
ඒදිව්‍යගනාවිගෙන් මෙසේවිචාරුවදුලසේක— එබාදිව්‍යගනා
වෙනි ඉතාවිසිතුරුවූ ශරීරවර්ණයනින් යුත්තව සිටින්නාවූ තෙ
පි ඔබාසඩි නාරකාවක්සේ නිගේ ශරීරවර්ණයෙන් සියලුදිසාවබල
ල වන්නේය නිගේ කවරහෙතුවකින් එබඳු ශරීරවර්ණයක්ද නි
ගේ කවර කුසලකර්මයකින්මෙහි සියලල සම්‍පත්ද නොපගේ
සිතට ප්‍රියමනාපවූ සියළු සම්පත් පහලවෙති මහත්ආනුභාවඇති
දෙවතා දුව මමතිගෙන් විචාරම් මනුෂ්‍යව උපන්කල්හි නොඑවි
සින් කවර කුසලකර්මයක්කරණ ලද්දද කවරකුසල කර්මයක්හේතු
කොට ගෙණ මෙසේ දිලිහෙන ආනුභාවඇතිවිද කුමක්හේතුකොට
ගෙණ නිගේශරීරවර්ණය සියළුදිසාවන් බබුළුවාදැයි විචාලේය—
එකල්හි ඕතොමෝ නියතුයේ සවාමීනි මම ශාරිපුත්‍ර ස්ථවිරයන්ව
හන්සේගේ මැනියොවුයෙම්යි යනාදි ඉහතකී සියල්ල ප්‍රකාසකො
ට තමන්දිව්‍යත්මය ලාබුකාරණයද නියායයි සහිති කාරකයෝ
කීවාහුය— ඉක්බිත්තෙන් ආයුස්මත් මොද්ගල්‍යායන ස්ථවිරතෙ
ම එපවත් භාග්‍යවත් බුදුරජුන්ට වහන්සේසැළකලේය— භාග්‍ය
වතුන්වහන්සේ ඒ අත්‍යොත් පනිකොටගෙණ සම්‍ප්‍රාප්ත පිරිසට
ධර්මදේශනාකොට වදාළසේක—
ඒධර්මදෙශනා තොමෝ මහජනයාහට සාර්‍ථක වූයේයි—

ඒබාපිත්වත් සත්පුරුෂවරුනි අනුත්විසින් දෙනලද දානා
දියෙහි ඊර්ෂ්‍යාකොට මෙසේ ප්‍රේතආත්මයේ නොයිපද අනුත්විසි
න් ද කරණලද දානාදි සුචරිතයෙහි තම තමනුත් අනුමෝදන්
ව ඒකුසලය ගේතුකොට ගෙණ මනුදිව්‍ය මනුෂ්‍ය සම්‍පත් ලබාඅව
සානයෙහි ජරාමරණ රහිතව නිර්‍වාණ සම්‍පත් ලබන්ට උත්සාහ ක
රයුතු— මේප්‍රේතවස්තු ප්‍රකරණයෙ අදවෙන් උබබරී වර්ගයාන්ත
ගීතවූ දෙවෙනි ශාරිපුත්‍ර මාතා ප්‍රේතවස්තුව කියා නිමවනලදී—

14 ශාරිපුත්‍ර මාතෘ ප්‍රේත වස්තුව නිමි

—*—

තවද මේ ප්‍රේතවස්තුප්‍රකරණයෙහි දෙවෙනි උබබරි වර්ගයාන්තගීත
වූ තුන්වෙනි මත්තානන් ප්‍රේතියගේ කථාවස්තුව කවරහයත්—
හෙ මෙසේ දතයුතු—

ඒක්‍ෂණයෙක්ඛිවන්‍ත්‍රමඛලඇත්තෙහියන්නාවූසූර්‍යරශ්මිය
පරිද්දෙන් ඕසඑලෝකයඇඹගෙණපවත්නාගුණප්‍රබාසය ඇති ශා

සහාවූ බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවා සය කරණකල්හි සැවැත් නුවර වනාහි එක්තරා කෙලෙඹිපුත්‍රයෙක් ඇත්තේය හෙතෙම රත්නත්‍රයකෙරෙහි අශ්‍රද්ධාඇත්තේය ප්‍රසන්නඇත්තේය ඔහුගේභාර්‍යා තොමෝ අශ්‍රද්ධාවතියය රත්නත්‍රයකෙරෙහි ප්‍රසන්න නැත්තියය ක්‍රොධඇත්තියය කදුරුගෙඩියෙහි පතුවෝ වැසුවාක්මෙන් දරුවන්නැතිව වදවූද යේය නමින් මත්තානම්විය— ඉක්බිත්තෙන් ඒකෙලෙඹි පුත්‍රතෙම කුලවත්ශය සිඳෙන හයින් සමාන කුලයකින් තිසරානන් කනාවක් ගෙනායේය ඕතොමෝ ශ්‍රද්ධාව හා ප්‍රසන්න ඇත්තිය සවාමියාට ප්‍රියදවූවාය, ඕතොමෝ නොබෝකලකින්ම ගර්භිනිව දසමස් ඇවැමෙන් පුත්‍රයකුවැදුවාය ඒ පුත්හට භූතයයි නියානම් නිබුයේය— ඕතොමෝ ගෙවසාමිව හිඤුන් සතරණමකට මනාව උපස්ථානකෙරෙයි වද සන්තොමෝ වනාහි ඇ ඊර්ෂ්‍යා කරන්නිය ඒසන්නූ දෙදෙනම එක්දවසක් දියනා තෙත්වූ හිසකේ ඇතිව සිටියාහුය, ඔවුන් දෙදෙනාගේ සවාමීවූ කෙලඹිපුත්‍රතෙම ගුණවසයෙන් තිසරානම් සන්‍රිය කෙරෙහි බැඳුනාවූ සෙනහඇත්තෙන් ඇහාසමග මිහිරිව කථාකෙරෙමින් සිටියේය— ඒ කථා සල්ලාප ඉවසන්නට නොහැකිවූ මත්තා නම් සන්තොමෝ ඊර්ෂ්‍යාවෙන්පෙලෙන ලද්දී ගේපිස එකතුකොට තිබ්ගිය කසල ගෙනැවිත් කථාකෙරෙමින් සිටි තිසරානම් සන්‍රියගේ හිසවදිය— ඒ වදසන්තොමෝ මැනකාලයෙහි මැරීගොස් ප්‍රේතඅපායෙහි ඉපිද තමාගේ අකුසල කම්බලයෙන් පවප්‍රකාරදුක් අනුභවකරන්නිය ඒ දුක් පෙලින්ම ප්‍රකාශවෙයි— ඉක්බිත්තෙන් එක්දවසක් ඒ ප්‍රේතිනොමෝ නැරිගිය සගිඤුඇතිව ඉරබැසගන වේලේහි ගේපලිකන්තේ දියනහමින්සිටි තිසරානම් සන්‍රියවතමන් දැකසිටියාය එකල ඇදුක තිසරානම්සන්තොමෝ මෙසේකීය—

95 නගහා දුබ්බණ්ණා රූපාසි කිසා ඛමණි සණ්ඨිතා
උප්පා සුලිඛෙ කිසිකෙ කාතුබං ඉධ තිට්ඨසිති—

95 යනුහෙයින් විලිවැසිල්ලක් නැතිව දුර්වර්ණවූ ඇවසැනිලි පමණක් හෙයින් කුසව ඉලිපුනාවූ නහරවලින් සුක්ත ශරීර ඇතිව විවරවූ ඉලඇට ඇතිව මෙහිසිටින්නාවූ ති කවරෙක්දැයි විචාලිය එවිටප්‍රේතිතොමෝ කියතුයේ—

96 අහංමත්තා තුවං තිසසා සපතිනෙ පුරෙ අහු
පාපකම්මං කරිත්වාන පෙතලොක මිතො ගතාති—

96 යනුහෙයින් පූර්ජාතියෙහි අපි දෙදෙන එකම සවාමියාට භාර්‍යාවූවාහු මම මත්තානම් සන්‍රියවූයෙම් තොපිතිසසානම් සන්‍රියවූ

ඡේය, එසේවූ මම තොපටයැතිරිව අකුසල්කොට මනුෂ්‍යත්වයෙන්චුතව ප්‍රේතඅපායෙහි උපත්නෙමිනිවාය—

නැවත තිස්සානම්ස්ත්‍රීතොමෝ මෙසේ විචාරන්නී එඛා ප්‍රේතියතොපි මිනිස්ලොව උපන්කල්හි කයින් වචසින් මනසින් කුමණ අකුසලකම්මයක් කොට එයින්චුතව ප්‍රේතඅත්මයෙහි උපන්නිදැයි විවාළේය එවිට ප්‍රේතීතොමෝ කියනුයේ මමපුර්ව්ජාතියෙහි ක්‍රෝධයෙන් එරුෂවචන කියමින් ඊර්ෂ්‍යාසිත්ඇතිවූ යෙම් මසුරුවූයෙම් තෙසීරාවික සිත්ඇතිවූයෙම් ඒ මම නිව දුර්භාසිතවූ නිරාඥික වචනාතියෙම් ඒ අකුසලයෙන් මිනිස්ලොවින් චුතවමේ ප්‍රේතලොකයෙහි උපන්නෙම් කියා තමාගේ අකුසල කම්මය ප්‍රකාශකොට කිවාය—එකල තිස්සානම් ස්ත්‍රීතොමෝ කියනුයේ— එඛාප්‍රේතවූව තෙපි පුර්ව්ජාතියෙහි ක්‍රෝධයෙන් එරුෂවචන කියමින් වහඩඑරුෂව හැසුරුණුබව මමත් දනිමි අනිකුදු කාරණයක් විචාරම් කුමන අකුසලකම්මයක් හේතුකොටගෙණ කසල පස්වලින් ගැවසී සකල ශරීරය ඇතිවිදැයි විවාලිය එකල ප්‍රේතීතොමෝ මෙසේ කියනුයේ—එඛා තිස්සාවෙනි අපදෙදෙන එක සවාමියාට භාර්‍යාවූවිහ එකලතෙපි ඉසානානයකොට වස්ත්‍රාභරණයෙන් මණ්ඩිත අලංකෘතව සිටියාය මමද ඉසානානය කොට මනාව සැරසී සිටියෙමි තෙපි මාබලමින් සිටියදී සවාමි පුරුෂයාහා සමග ප්‍රියකථා කෙරෙමින් සිටියෙව, එහෙයින් මාගේක්‍රෝධය හා ඊර්ෂ්‍යාමාන්නය බහුලව කසල පස් හැරගෙණවුත් නිගේ ඝිසසිට සකල ශරීරයෙහි උසුරුවාදැමුයෙම් ඒ අකුසලය හේතුකොටගෙණ කසල පස්වලින් ගැවසීගත් සකලශරීරය ඇතිවූයෙමි කිව— එකල්හි තිස්සා තොමෝ කියනුයේ ඒ සිසලල මමත දනිමි මිනිස්ලොව උපන්ගමනෙහි තෙපිමාගේ ශරීරයෙහි කසල පස්ඉසුරුයේය, නිගෙන් අනිකුදුකාරණයක් විචාරම් කුමන අකුසලකම්මයක් හේතුකොටගෙණ තෙපි කැඩුවි රෝගයෙන්යුක්තව කසන්නේදැයි විචාලිය, එකල්හි ප්‍රේතීතොමෝ කියන්නී—

ඒඛාතිස්සාවෙනි තෙපිහා මාහා අපිදෙදෙනා බෙහෙත් ද්‍රව්‍යය ගෙණෙනපිණිස වලවගොස් තොපි වෙදුන්විසින් කියන ලද තමන්ට උපකාරවූ බෙහෙත් හැරගෙණ ආයේය මමතොපි කෙරෙහි ඊර්ෂ්‍යා ක්‍රෝධ සිත්ඇති හෙයින් නිවනෙපෙන්වා කසඹිලියාගෙඩිහැරගෙණවුත් තොපවසගවා තොපගේ හැඳෙහි කසඹිලියා පොඩිකොට ඇයෙමි ඒ අකුසලකම්මවිපාකයෙන් කැඩුවිරෝගයෙන් යුක්ත ශරීර ඇතිව කසමින් ඇවිදිමි නිව, එවිටතිස්සා

තොමෝ මෙසේනියන්නී—එඛා ප්‍රේතදුව ඒසියලල මමත් දනිමි නොපි මාගේ සැතෙහි මවසඟවා කැයඹිලියා ඉසුරුව මින්අකුසල්කරණලද්දේවන, අනකුදු කාරණයක් නිගෙන් විචාරම් කවරඅකුසලයකින් උපන්වනම සිටිශරීර ඇතිවිදැයි විචාලිය එවිට ඒ ප්‍රේනි තොමෝ මෙසේ කියන්නිය—

ඒඛාතිසසාවෙනි මිනිස්ලොවදී එක්කලෙක මිත්‍රයන්ගේ සමාගමක්වූ සේය. නැයිනුන්ගේද රැස්වීම් වූසේය, ඒ මංගල්‍යයට යාමට සැරසීසිටින් නොපි කැදවාලද්දේය මම්නොකැදවා ලද්දෙමි, එහෙයින් නොපි හඳින්ට නිබුපිලියක් නොපට නොදන්නවා මම සොරාගතිමි ඒ අකුසල විපාකයෙන් මෙසේ හඳිනාපිලියක්නැතිව නග්නව උපන්වනම සිටිමිකිය, එවිට නිසසාතම සනියකියන්නී ඒ සියලල මමදනිමි මාගේසැතුය නොපි සඟවා ගත්තෙව අනිකුදු කාරණයක් මමනිගෙන්විචාරම් කවර අකුසල කර්මයක් හේතුකොට ගෙණ නිගේ ශරීරයෙන් අසුචිදුගඳ නික හමනේදැයි විචාළේය—එවිට ඒ ප්‍රේනි ඔනියන්නී,

ඒඛා තිසසාවෙනි නිගේ මාහැඟි මල්වඩමක්හා සුවඳ විලවුන් දහා රැගෙණ මමඅසුචි විලක ලැයෙමි ඒ අකුසල කර්ම ඔද මාවසින් කරණලද්දේය, ඒ අකුසලකර්මවිපාකය හේතුකොට ගෙණ අසුචි දුගඳය හමන්නාවූ ශරීර ඇතිවූයෙමි නිව, එකල නිසසාතොමෝ ඒ සියල්ලත් මමදනිමි ඒ අකුසලයන් නිවසින් කරණලද්දේය, අනකුදු කාරණයක් නිගෙන් විචාරම් කවර අකුසල කර්මයක් හේතු කොටගෙණ තෙපි දුප්පත්වූයේදැයි විචාළිය, ප්‍රේනිතොමෝ කියතුයේ—

ඒඛා තිසසාවෙනි මම මිනිස්ලොව සිටිනකල්හි සැමියාගේවසතුව අප්දෙදෙනාට සමසමවූයේය, ගෘහයෙහි ධන විද්‍යමානව නිබෙද්දී මාවසින් මවපරලොව. වසයෙන් පිඬුවක් කර නොගත්තෙමි ඒ අකුසලකර්ම හේතුකොටගෙණ දුප්පත්උපතිම්, නියා නැවතකියතුයේ. තිසසාවෙනි මම්මනුෂ්‍යත්වයේ සිටිනකාලයෙහි නොපිවසින් මවමෙසේ කිය, මතුවෙනි නොපිඅකුසල්නොකරව අකුසලකර්මයෙන් සුගතියක් නොලැබෙයි එනකුදු උත්අකුසලකර්මයෙන් දුගතිය සුලභයයි කියනොපි විසින් මව සැමසේ අවවාද කළේද ඒ කියමන එසේමය නොපගේ අවවාදය නොකලාවූ මවදුක්විපාක ලැබුනේයයි කිය—එවිට නිසසාතම් සනිතොමෝ මෙසේකියන්නිය, එඛා ප්‍රේතිය නොපි මා විරුඬකාරී යකෙක්සිතන්නිද නැවතමවනොපි රක්ෂාකෙරේද අකුසල කර්

විපාකය යම්සේ ඝෝරතරවේදනීය ඵල ප්‍රත්‍යනුභවයෙන් බලාපොරොත්තු වූ තොපගේ අභිලාෂයෙන් ඇත්තාවූ ඔවුන්නිගේ වස්ත්‍රාභරණාදිය පරිභෝග කෙරෙති ඒ නිගේ වැඩකාරවූ අයදුන් නි නැති අන්‍යයන් පිරිවරා ගනිති වසුන්ධරාව සපිරුවුදෙයක් නොවෙයි භූතයාගේ ප්‍රයානෝ වත නිගේ පෙර සැමියෙම කඩපිලේ සිට දුන් ගෙට එයි හෙතෙම නිට යම්කිසිවක් දෙන්නේවිනම් යහපත එතෙක්කල් නොපි මෙතනින් බැහැර නොයවයි කීහ, එවිටදේවතාවොමෝ නියතුයේ—

එඛා තිස්සාවෙනි මම දැනට විලිවැසිල්ලක් නැතිහෙයින් නග්නයෙමි දුර්ගන්ධවූ ශරීර ඇත්තෙමි කැසව නහර ඉලිපුනාවූ ශරීර දැත්තෙමි, සත්‍ත්වයි ඒ කාරණය ලජ්ජාවෙක විකාරවත් ශරීරඇති මාභූතයාගේ පියානෝ නොදනිවා ඔහුට මම පෙනෙන්ට ලජ්ජායෙමි කීය, එවිට තිස්සාදෙවොමෝ මෙසේකියන්නී—

එඛා ප්‍රේතිය යමක්හේතුකොට ගෙණ නොපි සියඵනා මයෙන් සම්බන්ධව සුවපත්වේද, එසේවීමට මම කුමක්දෙවිද මේ වේලෙහි නිට මම කුමක්කෙරෙම්දැයි කීය,—

එකන්හිප්‍රේත් තොමෝ නියතුයේ—

(97) චත්තාරෝ භික්ඛූ සංඝතෝ චත්තාරෝ පන දුග්ගතා.
අථඤ්ඤේ භික්ඛූ හොජයිත්වා මම දක්ඛිණමාදිසි
තදාහං සුඛිතා හෙස්සං සබ්බකාම සමිද්ධිනී—

(98) සාධුනිසා පටිපූජිතා හොජයිත්වා අථඤ්ඤේ භික්ඛවෝ,
වත්ථේහි ඡාදයිත්වාන තස්සාදක්ඛිණමාදිසි—

(99) සමනන්තරා භුං දිවෙඩ විපාකෝ උපපජ්ජථ,
හොජනච්ඡාදනං දක්ඛිණාය ඉදං ඵලං—

(100) තතෝ සුඛා සුචිවසනා කාසිකුත්ත මධාරිණී,
විචිත්‍ර වත්ථාභරණ සපතිං උපසඞ්කමි—

(101) අභික්කන්තෙනා වණ්ණේන යාඛං නිට්ඨතිදෙවතෙ,
ඔභාසෙත්‍ති දිසා සබ්බා ඔසධිව තාරකා—

(102) කෙනතෝතාදි සොවණ්ණා කෙතතෙ ඉධමිජ්ඣති,
උපඤ්ඤන්ති වතෙ හොගා යෙකෙචි මනසොපයා—

(103) පුච්ඡාමි තං දෙව මහානුභාවෙ
මනුස්සභූතා කිමකාසි පුඤ්ඤං,
කෙනාසි එවං ජලිතානුභාවා
වණ්ණෝ ච තෙ සබ්බදිසා පභා සති.

(97) දුටුහෙයින් එඛා තිස්සාවෙනි සඞ්ඝයාගෙන් ඉල්වා සි

භික්ෂූන්සතරණමකට සාංඝික වශයෙන්ද භික්ෂූන් සතරනමකට පු
ද්ගලිකවශයෙනු දෙමිමට ඒ දක්ෂිනාව දෙව එසේ ඇතිකල්හිම
සියළුකාමයෙන් සමුඩ්ව සුවපත්වෙමි කීයේය.

(98) ඒතිස්සා තොමෝද යහපතැයි කියාපිළිගෙණ එපවත්
සවාමියාට කියා භික්ෂූන් අවනම වලඳවා වස්ත්‍රපූජා කොට ඒ ප්‍රේති
යට දක්ෂිණාවදුන්නේය.

(99) ඒදක්ෂිණාව දුන්කෙනෙහිම ඌනවිපාකයපහලවූයේයදිව්‍ය
ආහර දිව්‍යසළු දිව්‍යපැහැ පහලවූයේය මේදක්ෂිණාවගේ විපාකනම්
වන්නේය.

(100) ඉක්බිතෙත්ත් ප්‍රේතිතොමෝඒප්‍රේතඅත්මෙන්මිදී සුඛව
මනාවදිව්‍යසළුහැඳ උතුම් කසීවස්ත්‍රාධාරීව නානාවණී විචිත්‍රව
ස්ත්‍රාභරණයෙන් සැරසි නැවත තිස්සානම් සත්‍රියළඟට අවුත්
තමන්දක්වා සිටියාය.

(101) එකල්හි තිස්සාතොමෝ මෙසේවිචාරන්නිය,ඉතාවිසිඟ
වූ ශරීරවණීයකින් යුක්තවසිටි නොවූ තී කවරෙක්ද ඖසධිතාර
කාවක්සේ තිගේශරීරවණීය සියළුදිසාවන් බබුළුවන්නේය.

(102) කවරකුශලයක් හේතුකොටගෙණ තොපට මෙබඳුශ
රීරවණීයක් ඇතිවූයේද කවරකුසලයක් හේතුකොට ගෙණතො
පට ප්‍රියමනාපවූ සියළුසම්පත් පහලවීද.

(103) මහත් ආනුභාව ඇතිදිව්‍යඅඟනාවෙනි මම තිගෙන් විචා
රම් මනුෂ්‍යව උපන්කල්හි තෙපි කුමන පිනක්කෙලේද කුමන
පුන්‍යයක් හේතුකොට ගෙණමෙසේ දිලිහෙන ආනුභාව ඇතිවී දැ
යි විචාලේය,

එවිටදිව්‍යඅඟනාවො මෙසේකියන්නී.

තිස්සාවෙනි එඛාපෙර මිනිස්ලොවදී මම මත්තානම් සත්‍රියවූයෙම්
තෙපි තිස්සානම් සත්‍රීවූවාය මම අකුසල් කොට ප්‍රේතඅපායෙ උප
නිම් තිවිසිත් දෙනලද දක්ෂිණාව හේතුකොට ගෙණ සියළුකාම
යෙන් සමුඩ්ව සතුටුවෙමි කොයිතුත් මටදුන් භයක් නැත්තේය
නැගනියනි සියළුනැයින් හා සමග තොපි බොහෝ කල් ජීවත්
වෙව එසේමඤුනිත්හා සමග තෙපි සෝකනැත්තාවූ යෙව්ද ජ
ලලිකාදින්නැත්තාවූ දිව්‍යමයවූ ආධිපත්‍යයෙන් තමත මන්ගේව
සහයෙහි පවත්වන්නාවූ වාසස්ථානවූ අග්‍රවූ රූපාදී පඤ්චකාමය
න්ඇත්තාවූ දෙව්ලොවට යාමට භාග්‍යවෙනි මනුෂ්‍ය ලෝකයෙහි
දී මුල්සහිත මසුරුමල දුරුකොට දානාදී කුශලධර්මයෙහි හැ
සිරනිදා නොලබා ප්‍රසංසාලැබීම් ඇතිව දිව්‍ය ලොකෝත් පත්ති
කර වයි කීවාය.ඉක්බිති තිස්සානම් ස්ත්‍රීතොමෝ එපවත් කෙ

ලඹිසුත්‍රයාඟව කීහ, කෙලඹිසුත්‍රතෙමෙ භික්ෂූන්ට කියේය, භික්ෂූන්වහන්සේලා භාග්‍ය වතුන්ට සැලකලාහුය, භාග්‍යවතුන් වහන්සේ ඒ අර්ථෝත්පත්තිකොට ගෙණ එතැනට සම්ප්‍රාප්තවූරියට ධම්මදේසනාකොට වදාලසේක.

ඒ ධම්දේශනාව අසාම්හජනතෙම භවඟත් සංවේග ඇතිව මසුරු මලඅදි අකුසලයන් දුරුකොට දානසීලාදී සුචරිතධර්මයන් රැස්කොට භවඟීචරාගතවූවාහුය. මේ ප්‍රේත වස්තුප්‍රකරණයෙහී උඛ්බරි වඟීාගතඟීතතුන්වෙනි මතානම් ප්‍රේත වස්තුව කියාතමවහලදී.

15 මතතානම් ප්‍රේතවස්තුව නිම්

—×—

තවද මේ ප්‍රේත වස්තුප්‍රකරණයෙහි දෙවෙනි උඛ්බරි වඟීහා නතඟීගත සතරවෙනි නන්දානම්ප්‍රේතවස්තුවකවරහයත්. හේ මෙසේ දතයුතු.

සිරිඇති පදනීයන් හෙනාමලකයක්සේ සර්වඥභාෂිතයෙන් දැනවදලාවූ ශාස්තෘවූ බුදුරජනත්වහන්සේ සැවැත්නුවර වැඩවාසය කරවදුරණකල්හි, එම්නුවරට නුදුරුවූ එස්තරාගමෙකනාඥේන නම් ශ්‍රද්ධාවන්තවූ රත්නත්‍රයකෙරෙහි ප්‍රසන්නසිත්ඇතිව එක් උපාසක යෙක්වූයේය, ඕහට නන්දානම් භාර්යාවක් ඇත්තේය, ඕතොමෝශ්‍රද්ධානැත්තිය, රත්නත්‍රයෙහි පැහැදිලි නැත්තිය, මසුරුමලින් යුත්තිය, චණ්ඩිය ඵරුෂවචනඇතිය, සවාමියාකෙරෙහි ආදරනැතිව්යවහත් භාවය නැතිව පවත්නිය, නැතුනිසවද සවත්නොවූ සෙරිය සොරාය යනාදිඵරුෂවචන කියාබන්නිය. ඕතොමෝ මැතකාලයෙහි මැරිගොස් ප්‍රේතයෝනියෙහි ඉපිද එමගමට නුදුරුතැනක දුක්විඳ ඇවිදින්නිය, එක්දවසක් ගෙයින්පිටත්ව යන්නාවූ නඥේනනම් උපාසකයාහට නුදුරුතැනක සිටතමන්දක්ඛා සිව්යාය. ඒ උපාසකතෙම ඇදුනමෙසේ කීහ.

(104) කාලි දුබ්බන්න රූපාසි ඵරුසා භිරු දස්සනා.
පිහලක්කි කලාරාසි නතං මනුස්සෙසු මානුසිති.

(104) යතුහෙයින්දැගියඅඟුරකට බඳුවූකළුවන්ශරීර ඇතිකෙරවූ දුටුකල හය උපදින ශරීරයකින් යුක්තවූ පිඟුවන්ඇස් ඇති පිටවනික්මුනාවූ දළඇතිමනුෂ්‍ය ස්ත්‍රියෙකැයි නොසිතමි, ප්‍රේතියකැ

සී සිතමිනියේය, ඒ අසා ප්‍රේතිතොමෝ තමන්පවත් ප්‍රකාශකරණු යෙ මෙසේකීය,

(105) අහන් නනු නතුසෙන භරියාතෙපුරෙ අහු,
පාපකම්මං කරිඛාන පෙතලොකං ඉතො ගතෙති

(105) යතුහෙයින් යම්බිවූ නතුඝේනයෙනි මම පෙර ඔබගේන නුනුවී භායර්‍යාවූයෙම්, අකුසල්කොට මම මිනිස්ලෙවින් චුතව අවුත් ප්‍රේතලෝකයෙහි උපනිම් කීවාය

ඒකල්හි නතුසේන උපාසකතෙම කියන්නේ,එඛාප්‍රේතදුවතොපි විසින් කයින් වචසින් මනසින් කුමන අකුසලකම්යක් කරණලද්දිද, කවරනම් අකුශල කම්මවිපාකයක් හේතුකොටගෙණ මිනිස්ලොවින් චුතව ප්‍රේතිව උපනිදැයි විචාළේය එකල්හි ඔහුව ප්‍රේතිතොමෝ කියතුයෙ, මම පුවිජාතියෙහි එන්ඛ එරුඝ හෙයින් ඔබඇදි ආදරකටයුත්තාන්ට එරුඝවචන කියා බ්‍රාහ්මණයෙම් ඔබකෙරෙහි ආදර නැතිව දුර්භාෂිත වචනයියා මිනිස්ලොවින් චුතව ප්‍රේතයෝනියෙහි උපන්නෙම්කීය එකල උපාසකතෙම එසේවිනම් නිවටතුරුසළුව දෙම් මේහැරගෙණ ඇඳගණිමින් තිගේ සැමියවූගෙට එව එහිදී දරුවෝසහ යෙහෙලිවරුන්ද නිට ආහාරපානයන් දෙති කිහ, එවිටප්‍රේතියතොම කියතුයේ සැමියනි අනින්අනට දුන්දෙයක් මට නොලැබෙයි සිල්වතුවූ විතරාගි බහුශ්‍රුත භික්ෂූන්ට ආහරපානයන් වලදවා මට දක්ෂිණාව දුනමැනව එකල්හි මම සියඑකාමයෙන් සමෘර්ධව සුවපත්වෙමි කීහ ඉක්බිතෙතින් ඒ නතුඝේන උපාසකතෙම ප්‍රේතිනිවචනය ඇසපනැයි පිළිගෙණ මහදන්සරසා ආහර පානයන්හා ඛාද්‍යභෝද්‍යයනු වසනුසේනාසන ඡත්‍රපහන් සුවඳමල් ආදි අනේකප්‍රකාර දනෝපකරණයන් සිල්වත් විතරාගි බහුශ්‍රුත භික්ෂූන්වහි ඒ ප්‍රේතියට දක්ෂිණාව දුන්නේය ඒ දක්ෂිණාව දුන්කෙතෙහිම දානවිපාකය උපන්නේය, දිව්‍යආහරහා වසනුද පානවර්‍යයනු ඒ ප්‍රේතියට පහළවූයේය, මේදක්ෂිණාවගේ විපාකයනම්වේ ඉක්බිතෙතින් ඛිතොමෝ සුඛ පවිත්‍රව මනාව දිවසළුහැඳ උතුන්කසිසළුඩරව පවිත්‍රවූ විචිත්‍රවස්ත්‍රාභරණයන්පැලඳ සැරසී සැමියා කරා එළැඹියේය එකල්හි සැමියතෙම විචාරණුයෙ එඛාදේවතාදුව ඉතාවිසිඛටවූශරීරවර්ණයකින්යුක්තව සිටිනනාවූ තොපි ඖෂධිතාරකාවසේ සියඳිසාවන් බබුළුවන්නිය කවරකුසලයක් හේතුකොටගෙණ ඉතාපිමෙබඳු ශරීරවර්ණයනින් යුක්තවීද කවරකුසලයක් හේතුකොටගෙණ මෙහි තොපට කැමති කැමති සම්පත්පහළවන්නේවේද මහත්ඍද්ධිමත් ඇති දේවතා දුව තිගෙන් විචාරම් තෙපි මනුෂ්‍යව උපන්කල්හී කුමණ කුසලකර්මයක් කළේද කුමණකුසලකර්මයනි

න් මෙසේ දිලිහෙන ආනුභාව ඇතිවිද තිගේශරීරවණ්ණය සියළුදිසාවන් ඒකාලෝක කෙරේදැයි කීයේය—

චිකල ප්‍රේතතොමෝ තියත්නී නතු සේනයනි මම පූජනීයයෙන් භුබවහන්සේගේ භායෂාවු නානුවය මෙමම අනුසල්කොට ප්‍රේතඅපායෙහි ඉපිද දුක්විත්දෙමි දුන්තුබවහන්සේවිසින් දුන්නාවූ දක්ෂිණාවෙන් සියළුකාමයෙන් සමෘර්ධව සුවපත්වූයෙමි මවිදුනට කොයිතුත් හයෙන්නැත්තෙය, එහෙයින් ගෘහපතියසියළුනැසින්හා සමගතොපි බොහෝකල් ජීවත්වේව මුල්සහිතවූ මසුරුමලදුරුකොට මිනිස්ලොවදී දානාදි කුසලධම්මයෙහි හැසිර සෝකාදියනැත්තාවූ සිතලවසහකොට පවත්නාවූ දිව්‍යලෝකයෙහි උත්පත්තිකරවයි නියාඅවවාද කලේය—මෙසේ ඒ දිව්‍යපුත්‍රතොමෝ තාමාගේ දිව්‍යසම්පත් ප්‍රකාශකොට තමාගේවෘත්තාන්තයටමේගියාහ—උපාසකතෙම එපවත් භික්ෂූන්වහන්සේලාට කිහ, භික්ෂූන්වහන්සේලා ගොස් බුදුරජානන් වහන්සේට සැලකලාහුය—බුදුරජානො ඒ අර්ථොත් පත්තිකොට ගෙණඑන්නේහි සම්ප්‍රාප්තවූ ප්‍රථමධම්මදේශනාකලසේක—

ඒධම්මී දේශනා තොමෝ මහජනයාහට සාධීකවූවාය—

එඹා ශ්‍රද්ධාදිගුණයෙන් යුක්තසත්පුරුෂවොරුනි ආදර ගොරවකට යුත්තාන්කෙරෙහි අනාදර අගොරවකොට මේසේ ප්‍රේතඅපායෙහි නොසිපද දෙමවුපිය ශ්‍රමණබ්‍රාහ්මණ සභාම්පුරුෂාදින් කෙරෙහි ආදරගොරව කොට දිව්‍යමනුෂ්‍යසම්පත් විඳ කෙලවරනිවන්සම්පත් අත්පත් කරගන්ට උත්සාහ කටයුතු—මේ ප්‍රේත වස්තුප්‍රකරණයෙහිදෙවෙනි උබ්බරිවග්ගාන්නාගීන සතරවෙනිනානුනම් ප්‍රේත වස්තුවකියා නිම්වනලදී—

16 නානු ප්‍රේත වස්තුව නිමි,

—x—

නවද මේ ප්‍රේතවස්තුප්‍රකරණයෙහි දෙවෙනි උබ්බරිවග්ගාන්නාගීගත පස්වෙනි මට්ටකුණ්ඩලිවස්තුවකවිරහයත්—මෙනිවිස්තර කථාව පරමාර්ථ ජෝතිකානම්වූ ඛුද්දක නිකායෙහිවූ විමානවස්තු වණ්ණනාවෙ මට්ටකුණ්ඩලි විමානවණ්ණනාවෙහි නියතලද්දේය එන්නියතලද ක්‍රමයෙන් විස්තරදත සුතු—මෙහිද මට්ටකුණ්ඩලිදිව්‍යපුත්‍රතෙමේවිමානදේවතාවෙක් බැවින්ඔහුගේ කථාවස්තුවදැක්වීම්විමානවස්තු පාළියටනැගුසේනමුදු යම්හෙයකින්

වනාහි ඒ මට්ටකුණ්ඩලී දිව්‍යපුත්‍රතෙම පුත්‍රශෝකයෙන් සොඵොනව ගොස් දරුසැය වවේ කරකැවෙමින් ඔඛන්නාවූ තම්තාගේ පියානොවන අඳිනනාපුබ්බක බ්‍රාහ්මණයාගේ සෝක දුරුකෙරීම පිණිස සොඵොනට අවුත්තමාගේ දිව්‍යසැරීරය හකුළුවාගෙණ සිව මට චන්ද්‍රයා හැරගෙණ දෙව සූර්‍යයාහැරගෙණ දෙව්යසීකියා ඔඛම්ත් දුකෙන් පෙළුනලද ප්‍රේතයකුසේ අඳිනනාපුබ්බක බ්‍රාහ්මණයාහට ආත්මය දැක්වූයේය, ඒනිසාද ඇරත්මතුඅත්තම භාවයෙන් ම්දුතු ඔෙසින් දෙවියන්ටද ප්‍රේතනාමය ලැබෙයිඒඔෙසින් ප්‍රේතවත්තුපාලියෙහි සංග්‍රහකරණලදැයි දතයුතුයි මේප්‍රේතවස්තුප්‍රකරණයෙහි දෙවෙනි උඛඛරීවග්ගොඅනතග්ගිහත පස්වෙනි මට්ටකුණ්ඩලී ප්‍රේතවස්තුව නිගමනිමවනලදි.

17 මට්ටකුණ්ඩලී ප්‍රේතවස්තුවනිම්.

තවද මේ ප්‍රේත වස්තුප්‍රකරණයෙහි දෙවෙනි උඛඛරීවග්ගොඅනතග්ගිහ පස්වෙනි කණ්හප්‍රේතවස්තුවකවරහයත්.

තවද එක්සමයෙක්හි තුන්ලෝවාසින්ට අසහායතේනුයක්වැනිවූ ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ ජේතවනා රාමයෙහි වැඩවාසය කරවදුරණසේක් පුත්‍රඛාමල උපාසකයෙක් අරහයා මේප්‍රේතවස්තුව වදුළසේක. ඒ කෙසේදයත්. සැවැත්නුවර වනාහි එක්තරා උපාසකයක්හුගේ පුත්‍රයෙක්මැරුණහ ඒඋපාසක තෙම ඒපුත්‍රශෝකයෙන් පෙලුනලදුවසතානාගය නොකරණ්ණේය ආහරඅනුභවනොකරණ්ණේය කම්මානාන්ඨානනොකරණ්ණේය, බුඩොපඨාන පිණිස නොයන්නේය, හැමවේලෙහි මාගේප්‍රියපුත්‍රතෙම කොයිගියේද නොප්කෙසේ මාහැර පළමුකොට ගියේදැයි යනාදී සෝකාතුර වචනකියන්නේය, එකල්හිඑතදවසක්ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ පෙරවරුවේලෙහි ලොවබලා වදුරණසේක් ඔහුගේ ස්‍රෝතාපත්ති ඵලයටහේතුදකවදුරාදෙවනදවසභික්ෂුසංඝයාවසින් පරිවාරණලදුව සැවැත්නුවරට පිඬුපිණිස වැඩමවා කරණලද බතකිස ඇතිව භික්ෂූන්වහාරයට යවා ආනන්ද ස්ථවිරයන්වහන්සේ පසුමහනක්කොට ඒ උපාසකයාගේ ගෙදොරට වැඩසේනී. එකල්ශාස්තෘන්වහන්සේ වැඩබැව් පරිවාර ජනයොඋපාසකයාහට කීවාහුය. ඉක්බිති ඔහුගේ පරිවාරජනතෙම අස්නක්පනවා බුදුන්වඩාහිඳුවා, උපාසකයා හැරගෙණ ශාස්තෘන්වහන්සේ සම්මපයටආයේය, එකතපසෙක හුනනාවූ ඔහුදැක වදුරානී මෙක්ද උපාසකය සෝකකෙරේ දැයි අසාවදුරා එසේය ස්වාමීනී

කීකල්හි උපාසකයා පූරාණ පඬිතයින්ගේකථා ඇසුවෝම ලදරුව න්ට සෝකනොකරනි වදුරා උපාසකයා විසින් යාඥාකරණ ලදුව අතීත කථාව ගෙණහැර දැක්වූසේක—කෙසේදයත්—

යවගිය දවස බාරවතිනුවර දසබැ රජකෙණෙක්වූහ, වාසුදේවය, බලදේවය, චන්දදේවය, සුරියදේවය, අග්ගිදේවය, වරුණදේවය, අජ්ජුනය, පජ්ජුනය, ඝතපඬිතය, අන්කුරයයි යනා මොවුන්අතුරෙන් වාසුදේව මහරජහුගේ ප්‍රියවූපුත්‍රතෙම මැරුණ හ. එසින්රජතෙම සෝකාග්නියෙන් පෙලෙනලද්දේ සියළුකම්වා නහැර ඇඳට ඇදිලිගෙණ විලාපකියමින් හොත්තේය, එකල්හි ඝතපඬිතතෙම මෙසේසිතතුයේ මාහැර අන්කිසිවෙක් මාගේබැ නන්ගේ පුත්‍රසෝකය හරවන්නට සමර්ථයෙක්නැත යම්කිසි උපා යකින් මොහුගේ සෝකහරිම් සිතුහ, මෙසේ සිතා ඒඝතපඬිතතෙ ම උමතුවේසයක් ගෙණ සාවාමවදෙවුය, සාවාමවදෙවුයයි කියා උ ඩබලමින් තුවරමුළුලෙලඟි ඇවිදිත්තේය, එකල ඝතපඬිතතෙම උම තුවූයේවනැයි සියඳම නුවරවාසිහු සෙලවිගියාහ—එකල්හිරෝ හිණෙය්‍යනම් ඇමතිතෙම වාසුදේව රජහුලඟටගොස් ඔහුසමඟ කථා කරමින් මෙසේ කීහ—

(106) උට්ඨේහි කණ්හ කිංසෙසිකෝ අත්ථොසුප්පනෙනතෙ,
යොවතුය්‍යහං සකෝ භාතා හදයං චක්ඛුං වදක්ඛිනං,
තය්‍යවාතා බලියන්ති සසොජ්පති කෙසවාති—

(106) යිතුහෙයින් ක්‍රිෂ්ණගෝත්‍රඇති වාසුදේවයන් වහන්ස නැගිටුව මැනව කුමක්පිණිස නිදන්නෙහිවේද නුඹවහන්ස්ථෙ නිදුගැනිමෙන් කවර අභිවෘඩියෙක්වේද නුඹවහන්ස්ගේ හෘ දයවැනි වූ දකුනුඇසවැනිවූ ඝතපඬිතනම් සහෝදරකෙණෙ ක්වේද ඔහුගේ උමතුවාතයෝ බලවත්වෙති ඔහුම්ර්කති කෝස වය, ඒඝතපඬිතතෙම සාවාමව දෙවුය සාවාමවදෙවුයයි කියා වි ලාප කියන්නේයයි කීහ—

ඔහුගේවචනය අසා යහනාවෙන් නැගිට්බවදක්වන් නාවූ ශාස්තෘන්වහන්සේ බුදුවවැඩසිට මෙසේ වදාරණසේක්—

(107) තසසතංවචනං සුත්වා රොහිනෙය්‍යසසකෙසවො,
තරමාණ රූපො උට්ඨා සිහාතුසොකෙන පඬිතොති—

(107) ඒඛාඋපාසකය, ඒ රෝහිනෙය්‍යනම්අමාත්‍යයාගේවච නයඅසා සහෝදරවූ ඝතපඬිතතෙම උමතුවීයයි යන සෝකයෙන්

සුක්නව සෝසවත්වූ වාසුදේව රජතෙම වහායානාවෙන්නැගිටී
යේය.....

වාසුදේව රජතෙම යානාවෙන්නැගිට ප්‍රාසාදයෙන් බැස ඝතපණ්ඩිතයන්ලඟටගොස්දැන් දැඩිකොට අල්වාගෙණ ඔහු හා සමඟ කථාකෙරෙමින් මෙසේ කියන්නේ ඝතපණ්ඩිතයනෙපි උමතුළුකෙක මෙන් මේසියළුවාරවනිතාවර ඇවිදිමින් සාවාමටදෙවුය සාවාමවදෙවූයයි කියන්නේ කිමෙක්ද තෙපිකෙබදු සාවෙකුකැමැත්තෙහිද සවන්මයවූ සාවෙක්කැමැත්තෙහිද නොහොත් මානිකෘමයවූහෝ තඹලොහෝමයවූහෝ නොහොත්රිදීමයවූහෝසඬඛමයවූ හෝසිලාප්‍රවාලමයවූහෝ සාවෙකුකැමැත්තෙහිද එයින් කැමතිසාවෙකු කරවාදෙමි, ආරන්‍යයෙහි ගොදුරුකාඇවිදින්නාවූ සාවෝද ඇතුන්හ ඔවුහු තොපටගෙණ එම් කෙබදු සාවෙකු කැමැත්තෙහිදැයි විචාලේය.....

එඊ අසා පණ්ඩිතතෙම කියනුයේ, ප්‍රථිවිය ආශ්‍රයකොටඇවිදිනුනාවූ සාවන් නොකමැත්තෙම් චන්ද්‍රමඩලයෙහි සාවාකැමැත්තෙම් ඒ ගෙණවයිකියේය, ඒ අසා රජතෙම සිතන්නේ ඒකාන්තයෙන් මාගේ බැනනුතෙම උමතුවූයේමයයි දැමිනසට පැමිණ මාගේ යම්මලනුකෙනෙක් තෙම නොලැබෙනදෙය ලබම් ප්‍රාර්ථනාකෙරේද. මාගේ ඒ ප්‍රියමලනුවෝ ඉතාම්ඛිරිවූ තමාගේ ජීවිතයහරින්නේයයි සිතම් කිහ, ඝතපණ්ඩිතතෙම රජහුගේ කථාව අසා නිස්වලවසිට කියනුයෙ සහෝදරය තෙපි, චන්ද්‍රමඩලයෙන් සාවාලඛන්ට පතන්නාහුගේ ජීවිතය ඒ නොලැබ නැසෙන්නේයයි කියම්න්මැරුනාවූ පුත්‍රයාට සෝකකෙරේ දැයි කියා මෙසේකීහ.....
ඉදින් එසේවීනම් ක්‍රිෂ්ණය දැනහුව යම්සේතෙපි අනුන්ටඅවවාද කරන්නේවේද තොපිත් එසේ දනිද කුමක්හෙයින් තෙපි මෙයින් සාරමසකට මතෙහි මැරුණාවූ පුත්‍රයාහට අදදක්වා සෝකකරනෙනහිදැයි විචාලේය.....

නැවත ඒ ඝතපණ්ඩිතතෙම අනතරවීථියෙහි සිටගණ මෙසේ කියන්නේ වාසුදේවයන්වහන්ස මම ඇසටපෙනෙන්නාවූ මේසාවා ඉල්වම් නොපිවනාහි ඇසටනෙපනෙනදෙය පිණිස කුමකට සෝකකෙරේදැයි කියා ඔහට ධම්දේශනාකරණෙණ, සහොදරයානනි උපන්නාවූ මාගේ පුත්‍රතෙම නෙමරේවයි කියා යමෙකුගේ යම්කැමැත්තක්වේද මනුෂ්‍යයකුවිසින්හෝ අමනුෂ්‍යයක්විසින්හෝ ඒ කැමැත්ත ලබන්නට නොහැක්කේය කොයින්ලැබේද

නෙලඹිය හැකි දෙයක් ක්‍රිෂ්ණවු වාසුදේවයෙනි නෙපි මැරුණවු යම්පුත්‍රයක් නිසා සෝකාතුරව විලාප නියන්නේ වේද පරලොව ගිය ඔහු මන්ත්‍ර ඖෂධාදි කිසිදෙයකින් මෙහි ගෙන්වන්නට නොහැක්කේයයි නියා නැවත පණ්ඩිතතෙම මෙසේ කියන්නේ සහෝදරයානනි මේමරණයනම් කෙලහණින් ධනයන්ගේ හේතුකොටගෙණ වත්ක්ෂත්‍රිය බ්‍රාහ්මණාදි ජාතියක්හේතු කොටගෙණ වත් විද්‍යාවක් හේතුකොටගෙණවත් සීලයක් හේතු කොට ගෙණවත් භාවනාවක් හේතුකොටගෙණවත් වලක්වන්ට නොහැක්කේයයිනියා නවත්විස්තරකොටකියනු යේ සහෝදරයානනි නිධන්ගතවූ කල ගනන්ධන ඇත්තාවූ මහදනවන්තයෝ, දිව්‍යභෝගයන් සදිස මහාභෝගයන් ඇත්තාවූ මහභෝගවන්තයෝද, සියඵරවඇතෙත්ද, තුන්සතරඅවුරුදුකින් නිමකරන්ට නොහැකිව රැස්කරණලද බොහෝධනධාන්‍යයන් ඇත්තාහුද, ඒමහමන්ධාතු මහසුදශීනාදි ක්ෂත්‍රියයෝද ජරාමරණයෙන් නිදහස් නුවූ වාහුය, ඒකාන්තයෙන් මරුමුඛයට පැමිනියාහු වෙත්මය.

තවද ක්ෂත්‍රිය බ්‍රාහ්මණ වෛශ්‍ය ශූද්‍රචණ්ඩාල පුක්කුසාදි

හුදු ජාතියනිමිත්තකොට ගෙණ ජරාමරණයෙන් මුක්තනොව මරුමුඛයටපැමිනියෝ වෙත්මය. තවද සික්ෂාකාව්‍ය නිරුත්තිබන්ධකරණ ජෙතිශාස්ත්‍රඡන්දඃසඞ්ඛ්‍යාත සඞ්ගයෙන් යුක්තව මහබ්‍රහ්මයාවිසින් නියනලද වේදය හදාරණණාවූ යමෙක්ඇද්ද ඔහුදජරා මරණ යෙන් මුක්තනොව මරුමුඛයටමවණණාහු වෙති. තවදඅධිසීල අධිචිත්ත අධිප්‍රඥාත්‍රිවිධසික්ෂාවන් ඒ සත්‍යකරන්නාවූ ආර්ය ප්‍රතිපක්ෂවූ අකුසලයන් ව්‍යුපසමණය කරණණාවූ සංඝම්වූ සිත්ඇති රාගාදි කෙලසයන් තවන්නාවූ නපස්වොරුද මරණකාල යෙහි ශ්‍රාවකභෑරදමා යෙත්මය. කර්මස්ථාන භාවනාවෙහි යෙදුනාවුසිත්ඇතිව වාසයකරණණාවූ අගින් එළැයපිණිස නිමකරාවූ කෘත්‍යඇති රහතන්වහන්සේලා පවා කුසල් අකුසල් ක්ෂයකලාහුමේ ශ්‍රාවකභෑරදමනනාහු වෙතියි කියා ධර්ම්දේශනාකලේය.

එලෙසේ ඝනපණ්ඩිතතෙම ධර්ම්දේශනාකලකල්හි ඒ අසා

දුරුවූ සෝක සල්ලයන් ඇතිව ප්‍රසන්න සිත්ඇත්තාවූ රජතෙමඝනපණ්ඩිතයා හට ප්‍රසංසාකරණුයේ.

(108) ආදිත්තං වත මං සන්තං ඝතසිත්තං වපාවකං,
වාරිනා විය ඔසිඤ්ච සබ්බං නිබ්බාපයෙදරං. පෙ.

(109) යඤ්ඤ එතා දිසාහොන්ති අනන්තජපරිවාරිකා,
සුභාසිතෙන අනෙන්ති සතෝ පෙච්චා වහාතරන්ති.

(108) යිතුහෙයින් පුත්‍රසෝකාග්නියෙන් දිලිහිදිලිහි හුනහාවූ මාගිතෙල් ගැල්එවාක්මෙන්ද දිලිහෙනගිනෙනහි ජලය වක්කලාත්මෙන්ද මාගේ හෘදයනිවී ගියේය, ඒ කාන්තයෙන් මාගේහෘදයෙහි ඔටගෙණ නිබිගිය සෝකහුල ඉදිරිගියේය, සෝකාග්නියෙන් පෙලෙන්නාවූ මාගේ ඒ පුත්‍රසෝකය දුරුවූයේය, සෝකාතුරවූ මම දැන්උදුරණලද සෝක උළුඇතෙත්මී සිහිල්වගියාවූ හෘදයඅ ත්තෙමී නිවුනාවුසි ත්ඇතෙමී නොපගේ ඔහපත් වචනයඅසා මෙතැන් පටන්මම සෝකනොකරමි නොහඬමි"

(109) වෙනත් අතුනඉපාකාරිවූ සප්‍රාඥිවරයෝ ඇඳඔවුහු සෝකාතුරවූ මට ඔහපණ්ඩිතතෙම අවවාදකොට ඒසෝකයෙන්මා යම්සේ දුරුකලේවේද එසේ ඒ ප්‍රාඥිවරයෝ අතුන්ගේ සෝකයන් සිදවන්නාහුය, යම්සේ ඔහ පණ්ඩිතතෙම තමාගේ උපාය කෞසල්‍යවූ ධම්කථායෙන් පුත්‍රසෝකයෙන් ආතුරවූ තමාගේ වැඩිමහ එසහෝදරයාගේ සෝක සන්සිඳවිද වෙනත් සප්‍රාඥවරයෝ අතුන සඳහා ඇතන්නාහුනම් මෙපරිද්දෙන් නැසීන්ට උපකාර වෙන්නාහුය සී කියා, සතුනිකළහසී" ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ මේධම්දේශනාව ගෙනහැරදක්වාවදාරා උපාසකය මෙසේපුරාතනයෝ පණ්ඩිතවරුන්ගේ අවවාදකථාව අසා පුත්‍රසෝකය හැරියෙවේදැයි වදාරා ජාතකය නිමවා වදාලසේක——ජාතකයදේශනාඅවසානයෙහි චතුඃසත්‍ය දේශනාකොට වදාලකල්හි උපාසකතෙම දහසක් නාසීන්ප්‍රතිමඬිතවූ සෝවාන්ඵලයෙහිපිහිටියේය——මේප්‍රේත වස්තු ප්‍රකරණයෙහි දෙවෙනි උඛඛරිවග්ගයෙහි සවෙනි කණ්ඩප්‍රේතවස්තුවර්ණනා නිමවන ලද්දේය——

18 කණ්ඩ ප්‍රේත වස්තුවර්ණනා

——※——

තවද මේප්‍රේත වස්තුප්‍රකරණයෙහි දෙවෙනිඋඛඛරිවග්ගයෙහි සත්වෙනි ධනපාල ප්‍රේතවස්තුව කවරහයත්——හේ මේසේ දතයුතු——එක්සමයෙක්හි ආත්මාර්ථ පරාර්ථ සාධනයෙන් ලොකෝත්තමවූ ගෞතම සෝත්තරාත්තත සම්බුරාජෝත්තමයානන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩවාසය කරවදාරණකල්හි ධනපාලනම් ප්‍රේතයා අරභයා මේකථාව දේශනාකරණලද්දේය——කෙසේදයත්——

බුදුන්ලොව පහළවන්ට ප්‍රථම යෙත්දසනා කනම් රට ඒරකච්ඡකනම් නුවරධනපාලකනම් සිටානකෙනෙක්වූහ,හෙතෙම අශ්‍රද්ධාවන්තයා, රත්නත්‍රය, කෙරෙහි ප්‍රසන්නනැත්තේය, තවද ම

සුරුසින් ඇත්තේය, කොසඹහසවගිය කරිවිලවැලමෙන් කළකුස ලාකුසලයන්ගේ විපාකද නැතැයි නියා නාස්තික දෘෂ්ටිඇත්තේය ඔහුගේ දරුතුන්නම්මය පෙළින්ම ප්‍රකාසවෙයි ගෙතෙම මැරී ගොස් වාඨකාකාන්‍යාරයෙහි ප්‍රේතයෙක්ව උපන්තේය, ඔහුගේතල්කඳක් පමණශරීරය වූයේය, මුහුනවසා වැටුනාවූ හිසයේඇත්තේය, ඉතාඅවලක්ෂණව දනින්ට භයානකවූ ශරීරඇත්තේය, හෙතෙම පස්පනස් අවුරුද්දක් මුළුලෙලහි බත්හුලක් හෝ උදකබින්දුවක් හෝ නොලද්දෙත් වියළුනාවූ කටතොල ඇතිව ක්ෂුත්පිපාස දෙනින් මැඩෙනලදුව ඔබ් මොබකරකෑවී ඇවිදින්තේය ඉක්බිත්තෙන් අපභාග්‍යවත් බුදුරජනන්වහන්සේ ලොවපහලවී චිදුරා පවත්වනලද දම්සක් ඇතිව ක්‍රමයෙන්වැඩ සැවැත්නුවර ජේතවනාමහවිහාරයෙහි වැඩවාසය කරවදුරණකල්හි සැවැත්නුවර වැසි වෙලෙන්දෙ පන්සියයක් හැල්වලබඩුපිරවාගෙන උතුරුදිසාවට ගොස් බඩුවිකුනගෙන ලැබුනුබඩු හැල්වලට නන්වා අපසුළුනානාහු සවස්වේලෙහි එක්තරාජලය සිදිගිය ගහාවක්ලහට පැමිණ එහිදිවියමුදු රාත්‍රියෙහි වසන්නාහුය එකල්හි ඒ ප්‍රේතතෙම පිපාසයෙන් මැඩෙනලදුව පැන්සොයාඅවුත් ඒ ගහාවෙහි බිඳුවක්පමණවත් පැන්නොලැබ පැන්ආලය නැසී මුලින්සිදුනුතල්ගසක්සේ ප්‍රේතතෙම එහිවැටුන, ඒ දැකවෙලදහු මෙසේකිහ.

(110) නගොහා දුබ්බන්න රූපොසි කිසෝ ධම්නිසණ්ඨිතෝ
උපට්ඨාසු ලිකෝ කිසිකෝ කාතුඤමසි මාරිසාති

(110) යහුගෙයින් නිදුකානෙනි විලිවැසිල්ලක් නැතිහෙයින් නග්නව දුවිණිව නහරඉලිපුනාවූ ශරීරඇතිව විරලවූ ඉලඇට ඇතිව දැගිය කතුවක්සේ මෙහිහිඳිනාවූ තෙපි කවරෙක්දැයිවිචාලාහුය

එකලප්‍රේතතෙම කියන්නේ, සවාමිවරුණි මම දුඃඛප්‍රාප්තවූ ප්‍රේතයෙක්මි අකුසල්කොට මිනිස්ලොවින් මේප්‍රේතඅපායෙහිඋපන්නෙමි කියා තමන්ගේ පවත්කිකල්හි තොපි කයින් වචයින් මනසින් කුමණ අකුසලයක් කෙළේද කුමණ අකුසල කම්මයක්හුගේ විපාකයකින් මේප්‍රේතලෝකයෙහි උපන්නේදැයි විචාලහ එකල්හි ප්‍රේතතෙම පෙරවාසයකල නැන්පවත් අතීතකාලයෙහි පැවති ප්‍රවෘත්තිහා වර්තමානකාලයෙහි පැවති ප්‍රවෘත්තියත් දැකමින් ඒ වෙලඳුන්ටද අවවාදකරමින් මෙසේ කිහ

(111) නගරං අම්හිදසනන්නානං එර කච්ඡන්ති විස්සුතං
තත්තසෙථ්ති සුරෙඤසිං ධනපාලොති මංවිදු පෙ

(112) මෙ ත්‍රිත්‍රිත්‍රි

බොහෝ කාලයක්මුළුල්ලෙහි අකුසලකම්විපාක දුකඩවේදනාව විඳින්නෙමි, එබැවින් මම බලවත් ලෙසින් තැවෙමි, එසේහෙයින් තොපට මම කියමි, මෙහිරැස්වූ තොප හැමට අභිවෘඩියක්වේවා තොපි ප්‍රකටවහෝ රහසට හෝ පවුනොකරවූය, ඉදින්තොපි දැන් පවුකරවුනම් හෝ අනාගතයෙහි පවුකරන්නාහු විනම්හෝ නරක තිරශ්චී ප්‍රේතඅසුරකාය යන සතරඅපායෙහිද මනුෂ්‍යයන්අතුරෙහිද උපදවා බොහෝ දුක් අනුභවකිරීමෙන් මිදෙන්නට නොලැබෙන්නේය, අහසටනැගියන්නාවුන්ටද මිදීමෙක් නැත්තේය ඔබ්මොබදුවන්නා වුන්ටද අකුසලකම් විපාකයෙන් මිදීමේක්නැත්තේය, කොතැන්හී සිටියේවිනුමුත් අකුසලකම්ය තමාකරා පැමිණ විපාකදෙන්නේය, ඒබවමෙයින්දැනයුත්තේය.....

* න් අන්තලික්ඛෙන සමුද්දමජ්ඣේ
න පබ්බතානං විවරං පවිසඤ
න විජ්ජති සෝ ජගතිප්පදෙසෝ
යත්ථට්ඨිතොමුච්චෙය්‍ය පාපකම්මාති.....

(112) ශ්‍රී පිමැනියන්ට උපස්ථානකරවූය පියානන්වඋපස්ථානකරවූය කුලදෙටුවන්ට උපස්ථානකරවූය ශ්‍රමණබ්‍රාහ්මණවරුන්ට ආදරගෞරවකරවූය එසේකොට තොපි හැමදෙනම සවිගිහලොකොත්පත්තිකරවූයයි කීයේය.....

එවෙලඳහු ඒ ප්‍රේතයාගේ කථාවඅසා කලකිරුණුසිත් ඇතිව ඔහුඅනුකම්පා කරමින් භාජනවලින් පැන්ගෙණවුත් ඔහුනිදුගන්වා මුඛයෙහිවත්කළාහුය, එකල්හි ඔහුජනයාවිසින් බොහෝවෙලා මුඛයෙහි වත්කරණලද ජලය ඒ ප්‍රේතයාගේ අකුසලකම්බලයෙන් උගුරවනෙවටුනේය, පිපාසකෙසේ සංසිඳේද, ඒ වෙලෙන්දෙ ප්‍රේතයාගෙන් විචාරන්නාහු කිමෙක්ද තට කිසිආස්වාදයක්, ලැබුනේදැයි විචාලාහුය.....එතෙම කියනුයේ ඉදින් මෙපමණදෙනෙක් විසින්මෙපමණවේලා මාගේමුඛයෙහි වත්කරණලදජලයෙන්බිඳුවක්පමණවත් මාගේ උගුරතුලට ප්‍රවේශ උනේවිනම් මම ප්‍රේතාත්මෙන් කිසිකලකවත් නොමිදේවයි කීයේය.

එකල්හි ඒ වෙලෙන්දෙ ඒ අසා ඉතාම කලකිරුණුවූසිත්ඇතිව තොපගේ පිපාසසන්සිඳවන්ට සුළුවත්වූ කිසිඋපායෙක් ඇද්දැයි විචාලේය.....එතෙම කියනුයේ, තථාගත යානන්වහන්

---

* අකුසල...කම්මය,,නොයික්ම්වාවිපාකදීමමේගාථාවෙන්දතයුතුයි,,

සේවහෝ එම්ග්‍රාවකයින්වහන්සේ කෙනෙකුවහෝ දන්දීම්ව දක්ෂිණාව දෙන්නේවී නම් මම මේප්‍රේතආත්මෙන් මිදෙම් කියේය— ඒ අසා වෙලෙන්දෙ සැවැත්නුවරට ගොස්භාග්‍යවතුන්කරා එලඟ එපවත්කියා රත්නත්‍රයේසරණහා පංසිල්ද හැරගෙන බුදුන්ප්‍රමුඛ භික්ෂුසංඝයාට සත්දවසක් මහදන්දී ඒප්‍රේතයාට දක්ෂිණාවදුන්නාහුය—භාග්‍යවත් බුදුරජානන් වහන්සේ ඒ අනෝත්පත්තිකොට ගෙනහික්ෂුභික්ෂුණී උපාසක උපාසිකාගන සිවුවනාක්පිරිසට ධම්දේශනා කොටවදාලේය—මහජනතෙදේද ඒ ධම්දේශනාව අසා ලෝභචෙෂමෝහාදී කෙලෙස්මල දුරුකොට දැනාදිකුසලක්‍රියාවෙහි ඇළුනේවෙයි)—මේප්‍රේත වස්තුප්‍රකරණයෙහි දෙවනුළඹබරි වග්ගයෙහි සත්වෙනි ධනපාල ප්‍රේතවස්තුව කියානිමවනලදී—

19 ධනපාල ප්‍රේත වස්තුව නිමි.

—×—

තවද මේ ප්‍රේත වස්තුප්‍රකරණයෙහි දෙවෙනිළඹබරිව ගිහයෙහි අටවෙනි චූලලසෙටයි ප්‍රේත වස්තුවනම් කවරහයත්— සුරාසුරවර මණිමකුට මරිච්චි "නිර" නිරජයමානවූ ශ්‍රීපාද පත්මඇති ශාස්තෘවූ බුදුරජානන් වූහන්සේ රජගහනුවර වේළුවනාරාමයෙහි වැඩවාසය කරවදාණකල්හි—

බරණැස්නුවර වනාහි එක් ගෘහපතියෙක් වූයේය හෙතෙම අශ්‍රද්ධාවන්නය රත්නත්‍රය කෙරෙහි ප්‍රසන්නනැත්තේය, නදමසුරුසිත්ඇත්තේය, කුසලක්‍රියාවෙහි ආදරනැත්තේය, නම්න් චූලලසිටානෝනම්වූය ඒතෙම මැරිගොස්ප්‍රේතව උපන්නේය— ඔහුගේශරීරයලේමස්නැතිව ඇටනහර සම්පමණනින් යුක්තවූශරීරඇතිවූයේය, හිසමුඩුවූයේය, වස්ත්‍රනැත්තේය—ඔහුගේ බිහෑනොමෙ අඹකවින්දරවෙහි එක්තරා පුරුෂයෙකුට සරණපාවාදුන්හෙයින් එහිසවාමියාගේ ගෙදරවෙසෙමින් පියානන්උදෙසා බ්‍රාහ්මණයන්අනුභවකරවනුකැමතිව සහල්ආදිඋපකරණ සැරසූයේය—එබවදැන ප්‍රේතතෙම ආහාරඅසාවෙන් ආකාශයෙන් එතනට යන්නේ රජගහනුවරට පැමිණුනේය—එසමයෙහි අජාතශත්‍රු රජතෙම දෙව්දත්තෙරහුවිසින් යවනලදුව පියානන්මරා ඒ චිපිලිසරයෙන් දුස්චප්නයෙන් නිද්‍රෝපගතනොවී ප්‍රාසාදයාගේ මතුමහලව නැගි සක්මන්කරමින් සිටින්නේ ඒ ප්‍රේතයා අහසින් යන්නවුන්දැක මෙසේකීයේය—

(113) නගෙහාතියො පබ්බජිතොසි භන්තෙ
රත්තිං කුහිං ගවේසති කිස්සහෙතු
ආවිඤ්ඡමෙතං අපිසඤ්ඤාරොම්
සඛෙඛන චිත්තං පටිපාදයෙතුවන්ති

(113) යතුහෙයින් සවාමිනි තුබවහන්සේනග් නවූයේව කුශ වූ ශරීරඇත්තේව ප්‍රවෘජිතයානෙනි මේ රාත්‍රියෙහි කොයියේද කුමක්නිසා යන්නේවේද මටනි යමැනව තුබවහන්සේගේ චිත්තා තු කුල දෙයක් සියල්ලම සඳහාදනය කෙරෙමි තුබවහන්සේ වඩි න කරුණ මට නියවයි කීයේය මෙසේ රජතුවිසින් විචාරණ ලද්දාවූ ඒ ප්‍රේතතෙම තමාගේ ප්‍රවෘත්තිය නියත්තේ මෙසේ කිව

ඒමහා මහරජ බොහෝතැන ප්‍රසිඩවූ බරණැස් නුව රෙක්ඇත එහි මම පෙරමහවසුඇත්තෙක එසේද වුවත් ඝින සින්ඇතිවූයෙමි දන්නොදෙනසුළුවූයෙමි මම දන්නොදි කාමාමිස යෙහි ගැළුනෙමි, ඒ දුස්සිලකමීමය හේතුකොවගෙන මමප්‍රේත ලෝකයෙහි උපන්නෙමි හෙ මම ක්ෂුාපිපාස නැමති කටුවලින් වි දිනලදුව මිරිතෙමි, ඒසාපිපාසදෙක හේතුකොටගෙණ කිසිඅහා රයඬ ප්‍රාඥිනාකරමින් නැයින්සම්පයට යමි, අනාවූද යමෙක් ක මීමළුල් අදහ නොදෙන සුළුවූවාහු වීනම් ඔවුතුත් මාසේම ප්‍රේත ලෝකයෙහි ඉපිද ක්ෂුාපිපාසදුක් අනුභවකරණණාහුය මාගේ ඛීනෘතොමෝ මවුපියන්ගේ හා කුඩපපා මහපපාගේ නමවද මුත්ත තු මුත්තනිවරුන්ගේ නමවද දන්දෙමි කියා දන්පිළියෙල කරණ ලද්දේය ඒ සපයනලද දෙය බ්‍රාහ්මණයන් වලඳවති කිසිදෙයක් කනුකැමතිව මමත් ඒ අඹකවිඳ තුවරට යම්සි කියේය එ සේනියාසිටිය ප්‍රේතයාහට අජාත ශත්‍රූරජතෙමකියතුයෙ.

එතාගේ ඛීනෘවව්සින් සරසනලද දනය අනුභවකොට නැවතමේහි වහා එව මම හොපව කුමක්කරන්නෙමද ඉදින් නොපට දන්ලැබෙන්නාවූ ආකාරයක් ඇතිනම් අසවල්තැනදී අසවල්ප්‍රකාරෙට දුන්කල්හි මට ආහාර ලැබෙයයි නියා අදහන යුතු වචනයක්කියව ඒ යම අසන්නෙමුයයි කීහ එසේ ය මහරජනනි කියා ප්‍රේතතෙමඅඹ කව්ද තුවරට ගියේය,එහිබ්‍රා හමණයො රැස්ව ආහර අනුභවකලාහුය, ඒ හිදක්ෂිණාඥිසිල්වත් කෙණෙක් නැතිවූයේය, එහෙයින් ආහාරනොලැබ ප්‍රේතතෙම නැවත රජගහනුවරට අවුත් අජාසත්‍රූ රජතුගේ ඉදිරියෙහි සිටි යේය, රජතෙම නැවතපෙරලා ආවාවූ ප්‍රේතයා දැක කියතුයෙ

මමතොපවතුම්කදෙම්ද යම්කාරණයකින් තෙපි බොහෝකලක්
මුළුල්ලෙහි සම්පතින් සතුටුවේද එබඳුකාරණයක් ඇතිනම් ඒම
ව කියවයි කීයේය—එකල්හි රජතෙම කියතුයේ මහරජ බු
දුන්සහිත සංඝයා ආහරපාණයෙන් වලඳවා ඒ දක්ෂිණාව මවදෙව
එසේඇතිකල්හි මමබොහෝකල් සම්පතින්සතුටුවෙමි කීයේය—
එකල්හි රජතෙම එකෙනෙහි ප්‍රාසාදයෙන්බැස බුදුන්සහිත සංඝ
යාව සියඅතින් අනඹිවූ දැහැ සිවාමින් මම එක්ප්‍රේතයෙක් උදෙ
සා මේ දැනය සම්පාදනය කළේයයි එපවත්බුදුන්වකියා නැවත
ඒ ප්‍රේතයාට දක්ෂිණාව දුන්නේය—

එකල්හි ඒ ප්‍රේතතෙම සම්පත්ලබා සතුටුව බබලමින්
අවුත් රජහුගේ ඉදිරියෙහි පහලව සිට කියතුයෙ මහරජනෙ
නි මම ප්‍රේතාත්මෙන් මිදී දිව්‍යාත්මය ලද්දෙමි මහරජ ලක්‍ෂණස
ම්පත් ආදියෙන් මාහාසදෘස මනුෂ්‍යයොනෑත්තේය මාගේ මේ අප්‍ර
මාන සම්පත්හා ආනුභාව බැළුවමැනව මහරජ තෙපි බුදුන්ප්‍රමුඛ
සංඝයාව අනඹිවූ දැහැ ඒ දක්ෂිණාව මවදුන්නේය නොපිවිසින්
බොහෝ ආහාරපානාදියෙන් සංඝයාව සන්තර්පනයකොට නැව
න නොපිවිසින් ජීවිතාන්තයදක්වා මම සිඟළුසම්පත්තියෙන් සන්තා
ර්පනයකරණුලද්දෙන් මම සුවපත්වූයෙමි එහෙයින් මනුෂ්‍යදිව්‍ය
රාජ්‍යානෙනි කැමති පරිද්දෙන් නියමස්ථානයට යන්නෙම්කියා
රජහුගෙන් විචාරාගියේය මෙසේ විචාරි දිව්‍යරාජයා ගියකල්හි
අතුතශාසනා රජතෙම ඒ ප්‍රවෘත්තිය භික්ෂූන්වහන්සේලාට ශලක
ළෙය භික්ෂුන්ද භාග්‍යවතුන්සමීපයට ගොස් ඒ ප්‍රවෘත්තිය බුදුන්ව
සැලකිලාහුය—භාග්‍ය වතුන්වහන්සේ එම අර්ථොත්පත්ති
කොටගෙණ එතැන්හි පැමිණිපිරිසට ධර්මදේශනාකොට වදාලසේ
ක—ඒ ධර්ම දේශනාව අසාමහජනතෙම මසුරුමලදුරුකොට
දැනාදී පින්කම්හි ඇළුනේය—ද්‍රඩාවන්න සත්පුරුෂ වරුණි මේ
අසා මසුරුමලදුරුකොට දැනසිලාදී පින්කොට සඛර්මෝඝ්‍ය ස
ම්පත් සිඛකරගන්ඛ උත්සාහ කවතුසි—මේ ප්‍රේතවත්‍රකරණ
යෙහි දෙවන උඛබර්වගීයෙහි අටවෙනි චුල්ලසෙටසිප්‍රේතවත්‍රය
කියා නිමවනලදි—

20 චුල්ල සෙටඨි ප්‍රේතවත්‍රය නිමි

තවදමේ ප්‍රේතවත්‍රප්‍ර කරණයෙහි දෙවන උඛබර්වගී
යේ නමවෙනි අඛිකුරප්‍රේතවත්‍රය කවරහයත්—දෙව්බඛ නා
සුර නරගරුඛ ගුරුඵම්නිරුස්දියෙන් දෙව්සිරි පාපියුම්ඇති සව්ඥ

යන්වහන්සේ සැවැත්නුවර ජේතවනාරාමයෙහි වැඩවාසයකර වදාරණකල්හි, මේ ප්‍රේතවස්තුව අඛකුරදෙවිපින් අරභයා වදාළ සේක, මෙහිඅඛකුරතෙම ප්‍රේතයෙක්නොවෙයි ඔහුගේ චරිතය යම්හෙයකින් ප්‍රේතයන්සම්බන්ධවේද එහෙයින් අඛකුරප්‍රේතව ස්තුව නම්විය. එහි මේ සංක්ෂෙපකථාවය.

උත්තරමධුරාණම් නුවරට අධිපතිවූ මහාසාගර රජහු ගේ පුත්‍රවූ උපාසාගර කුමරුවා නිසා උත්තරාපථයෙහි කංසභෝ ගයෙ සිහිවූ අසිතජිනිතම් ගමෙහි මහාකඤ්චනම් රජහුගෙධිතෘ වූදේවගර්භාවගේ කුසෙහි උපන් යම් ඒ අජනදේවිය වාසුදේවය බලදේවය චන්දදේවය සුරියදේවය අග්ගිදේවය වරුණදේවය අර්ජු ණය පජ්ජුණය ඝතපණ්ඩිතය අඛකුරයයි කියා වාසුදේවයාආදිකොට ඇතිපිරිමිදසදෙනෙක්හා අජනදේවිසමග එකොලොස් ඉත්ත්‍රි යකෙනෙක්වෙද්ද ඔවුන්අතුරෙන් වාසුදේවයාආදිකොට ඒ බැණ නුවරු අසිතජන නුවරආදිකොට බාරවතී නුවරකෙළවර කොට සියළුජම්බුවීපයෙහි හැටතුන්දහසක් නුවරවල්වල රජුන්මරා රාජ්‍යයගෙණබාරවතීනම් නුවරවාසයකරණුයහු රාජ්‍යදසකොට්ඨාසයකට බෙදුවාහුය, එකල්හි සහෝදරිවූ අජනදේවිය සිහිකොට ඇවකොටසක් නෙබදුවාහුය. නැවතසිහිව එකොලොස් කොට්ඨාසකරමුයයි කීකල්හි ඔවුන්හැමට බාලඅඛකුරතෙම කිය නුයෙ මාගේකොටස අජන දේවියට දෙවූය මම වෙලඳුමෙන් ජීවත්වෙමි තෙපි තම තමංගේ ජනපදවලින් මට සුන්ඟත් එවූ යයි කීයේය. ඔවුහු යහපතැයිකියා පිළිගෙණ අඛකුරරජහු ගේ කොට්ඨාසය සහෝදරියටදී රජහු නවදෙන බාරවතීනම් නුවර වාසයකලාහුය.

අඛකුරතෙම වෙළඳුන්කෙරෙමින් නිතරමහදන් දෙන්නේය, ඔහුගේ එක්භාණ්ඩාගාරික දූසයෙක් ඇත්තේය, අඛකුරතෙම ඒ භාණ්ඩාගාරිකයාහට ප්‍රසන්නසිත් ඇත්තේ ඕහට එක්කුලධීතෘවක් හැරගෙණවුත් දුන්නේය. ඒ භාණ්ඩාගාරිකතෙමේද තමන්ව ජනකපුත්‍රයාමවූ කුසහිදිනකල්හිම මැරුණේය, පුත්‍රයාමවුකුසින්බිහිඋනුකල්හි අඛකුරතෙම ඒ භාණ්ඩාගාරිකයාහට දෙමින් තිබුනු චැටුප්වියදන් ඔහුගේපුත්‍රයාට දුන්නේය ඉක්බිති එහිදරුවාවැඩිවිය පැමිනිකල මෙතෙම දූසයෙක්වේද නොඔහොත් දූසයෙක්නොවේදැයි කියා රජකුලයෙහි විභාගයෙක් වූයේය ඒ අසා අජනදේවිතොමෝ කියනුයෙ මොහුගේ මැනියො වාලියෙක්දැයි වාලියෙක්නොවෙයි ඒ හෙයින් ඇගේ පුත්‍රද

වාලෙක්නොවෙයිකියා දුසභාවයෙන්නිදහස්බවට කාරණකීහ— ඒ දරුතෙම ලජ්ජාවෙන් එහිවසන්ටනොහැකිව හේරුව තුවරට ගොස් එහි එක්තරා බෙරවායක්හුගේ ධීතෘවක් හැරගෙණ හේරිවාද්‍ය සිල්පයෙන් ජීවිකාවකෙරෙසි—එසමයෙහි හේරුව තුවර අසයහසිටුතෙම ශ්‍රමණබ්‍රාහ්මණ ක්‍රපන ව නිබ්බක යාචකාදින්ට මහාදන් දෙති— ඒ හේරිවාද්‍යතෙම සිවානන්ගේ ගෙදරට යන්නටනොදන්නාවූ යාචකාදින්ට ප්‍රීතිසෞමනස්‍ය ඇතිව දකුනත දිහුකොට සිවානන්ගේ ගෙදරදනා එහිගොස් ලැබෙන දෙයක් ලබාගනිවුයවු කියන්නේය, ඔහුගේ ඒ කුසලකර්මය පාලියෙහිමහුයේය—ඒ හේරිවාද්‍යතෙම මැතකාලයෙහි මැරිගොස් වාළිකා කාන්තාරයෙහි එක්තරාරුකෙක්හි භූමාට්ඨදේවතාවෙක්ව උපන්නේය—ඔහුගේ දකුනුහස්තයෙන්කැමති කැමතිසම්පත්පහලවන්නේය, එමහේරුවතුවර එක්තරා පුරුෂයෙක් තෙම අසඤ්ඤ සිටුහුගේ දූනයෙහි වකවානුවූයේය හෙතෙම ශ්‍රද්ධානැත්තේය, රත්නත්‍රයෙහි ප්‍රසන්නනැත්තේය මිථ්‍යාදෘෂ්ටිකය පුන්‍යක්‍රියාවෙහිද ආදරනැතිව සිටකාලක්‍රියා කොට ඒ දිව්‍ය පුත්‍රයා ගෙවාසස්ථානයට නුදුරුතැනකප්‍රේතයෙක්වඋපන්නේය, ඔහුවිසින් කරණලද කර්ම්‍යපාලියෙහිම ආර්‍යඅසයහ මහසිටුතෙම කාලක්‍රියාකොට තවුතිසා භවනයෙහි ශක්‍රදිව්‍යරාජයා හටඑකතුව උපන්නේය—

ඉක්බිත්තෙන් මැතකාලයෙහි අඹකුරතෙම හාතවන්ත්‍රාහ්මණයෙක්හානැල් පන්සියය පන්සියයෙන් බඹුහැරගෙණ දෙදෙනාගැල්දහසකින් යුක්තව වාළිකා කාන්තාරයට පැමිනයන්නාහු මන්ත්‍රාලාවී බොහෝ දවස් එහිමඇවිදින්නාහු ඤ්‍යවගියාවූ දියදරඇතිවූවාහුය—අඹකුරතෙම කැටුව ගියම්නිසුන්ලවා සතරදිසාවෙහි ජලය පරීක්ෂාකරවු යේය—එකල්හි ඒ කැමතිකැමති සම්පත් පහලකොටදෙන දිව්‍යරාජතෙම ඔවුන්ගේ ඒ වෘසනප්‍රාප්තියදැක අඹකුරයාවිසින් පුර්වයෙහි තමන්ටකල උපකාරයසිහිකොට දැන්මොහුට මාවිසින් පිහිටවිය යුතුයයිසිතා තමන්වාසය කරණ නුගගසදක්වාළුයේය—ඒ නුගගසවනාහි සාඛාවිටපයෙන් සම්පන්නවිය ඝනවූපත්‍රයන් ඇත්තේය, ඡායා සම්පන්නය නොයෙක් දහස්ගනන් පාරෝහයන් ඇත්තේය, දිගින්ද පුළුලින්ද යොදුනක්පමනවූයේය, ඒ දැක අඹකුරතෙම තුටුපහටුසින්ඇතිව ඒ නුගගසට නදයුරුබැන්දෙවූයේය—දේවතාතෙම තමාදකුනුඅත දිහුකොට පැන්පහලකොට දීමෙන් සියඑදෙන සන්තර්පණයකළේය ඉක්බිත්තෙන් යම්යම්කෙනෙක් යමක් යමක්කැමනිද ඒ ඒ

ඇත්තන්ට ඒ ඒ දෙය පහළකරදුන්නේය—මේසේ දිව්‍යරාජ යාවිසින් මහජනයන් නානාප්‍රකාරවූ දිව්‍යමය ආහාරපානාදියෙන් කැමතිපරිද්දෙන් සන්තර්පනයකොට මාගීඝ්‍රාන්‍යාය ව්‍යපසමණ යවූ කල්හී බ්‍රාහ්මණ වෙලඳ තෙම තුනුවනින් උමතුවෙමින් මේසේ සිතතුයේය, වස්තුලැබීමට මෙතනින්ඔබ කාඩොජයටගොස් කුමක්කරන්නෙමුද මෙමයක්‍ෂයා යම්නිසිඋපායකින් හැරගෙණයානාවටනන්වා අපගේනුවරටම යන්නෙමුයයි සිතුහ, මේසේ සිතා වනාහී එපවත්අඩකුරයාහටමේප්‍රකාරයෙන්කියේය—

(114) යඤඤඅත්ථාය ගච්ඡාම කඩොජං ධනහාරකා,
අයංකාමද දෙයතෙඛා ඉමංයක්‍ඛංතයාමසෙ—

(115) ඉමංයක්‍ඛං ගහෙත්වාන සාධුකෙන පසය්හවා,
යානං අරොපයිත්වාන ඛිප්පංගච්ඡාම වාරනන්ති—

(114) යිතුහෙයින් අපිහැමදෙනම යම් ධනයක් හැරගෙණ එතුපිණ්ඩය කාඩෝජ රටවයන්නෙමුද මේ යක්‍ෂතෙම සියළුකැමති සම්පත් පහළකරදෙන්නේය මේ යක්‍ෂයා හැරගෙන යමුව

(115) යිතුකොට කැමතිකරගෙන හෝ බලාත්කාරයෙන්හොයානාවට නන්වාගෙන යානාව පස්සෙ බැඳගනහෝ වාරවතිතුව රට හැරගෙණ යමුයයිකීයේය—

මෙසේ බ්‍රාහ්මණයා විසින් කීකල්හි අඩකුරතෙම සත්පුරුෂධම්මයෙහි ප්‍රගිටුවා ඔහුගේවචනය ප්‍රතික්‍ෂෙපකරමින් මෙසෙකීයේය—

(116 යසඤරුක්ඛඤඤඡ්‍යාය නිසීදෙය්‍ය සයෙය්‍යවා,
නතඤඤ සාඛං භිත්දෙය්‍ය මිත්තද්‍රුඛෙහාහි පාපකොති—

(116) යිතුහෙයින් එබා බ්‍රාහ්මණය යම්කෙක් යම්ගසක්යට සෙවනෙහි හිඳිනෙහි හෝවේද නිදන්නේ හෝවේද ඒ ගසෙන් සාඛාවක්නොසිඳිය යුතුය ඒ තෙමේ ගසෙන් සාඛාවක් සිඳිනම් හෙතෙම මිත්‍රද්‍රෝහියෙක් වන්නේය පාපයෙක්වන්නේය, එසේ හෙයින් ඒ ගසට නපුරක්නොසිතිය යුතුය සඛයාකෙරෙහි නපුරක් නොසිතිය යුතුබව කියතුම කවරේද මේදිව්‍යපුත්‍රතෙම සත්පුරුෂයෙක ප්‍රථම කාරිකෙනෙක අපටබොහෝ උපකාරිකෙනෙක අපගේ දුක් දුරුකල කෙනෙක ඔහට කිසිඅනාර්‍යයක් නොසිතියයුතුය ඒකානායෙන්ම ඔහුඅපිවිසින් පූජාසත්කාර කවයුතොකැයි කීයේය ඒ අසාබ්‍රාහ්මණතෙම අඩකුරයාගේ නිමට ප්‍රතිපක්‍ෂවසිටිනියතුයේ

(117) යඤඤ රුක්ඛඤඤ ඡ්‍යාය නිසීදෙය්‍ය සයෙය්‍යවා,
ඛණ්ඩම්පි තඤඤ ජිඝඤය්‍ය අත්ථා පෙතාදි සොසියාති—

(117) එඛාඅඛ්කුරය ඝම්වෘක්ෂයක් හුගේ සෙවනෙහි හිඳිනේ හෝ වේද නිදන්නෙහෝවේද ඝම්කිසිකනුයවලි ආදිවූදෙයකවප්‍ර යෝජනවිනම් ඒ වෘක්ෂයාගේ අතුසිඳිමතබා කඳත්සිදගන්නේ වේ දැයිකීයේය—බ්‍රාහ්මණයාවිසින් මෙසේකීකල්හි අඛ්කුරතෙම සත් පුරුෂධම්මයම ගන්වමින් කියනුයේ—

(118) ඝස්ස රුක්ඛස්ස ඡායාය නිසීදෙය්‍ය සයෙය්‍යවා,
නතස්ස පත්තං භිඳෙය්‍ය මිත්තා දුබ්භාහි පාපකොති

(118) එඛාබ්‍රාහ්මණය ඝම්රුක්ඛ්හුගේ සෙමනෙහි හිඳිනේ හෝ වේද නිදන්නේ හෝ වේද ඒවෘක්ෂයාගේ සාඛාවක් තබා පත්‍ර යකුදු නොසිඳිය යුතුය එසේකලේවිනම් පව්ටුමිත්‍රද්‍රොහියෙක් වන් නේඝසිකීහ—නැවතත් බ්‍රාහ්මණතෙම තමාගේ වාදය ගන්වම් න්මෙසේ කියේය,

(119) ඝස්ස රුක්ඛස්ස ඡායාය නිසීදෙය්‍ය සයෙය්‍යවා,
සමූලම්පිතං අබ්බූහෙය්‍ය ? අත්ථොපෙතා දිසෝ සියාති

(119) යනුහෙයින් එඛා අඛ්කුරය ඝම් රුක්ඛ්හුගේ සෙවනෙ හි හිඳින්නේ හෝ වේද නිදන්නේ හෝ වේද කනුයවලි ආදියක ව ප්‍රයෝජනවිනම් ඒ වෘක්ෂයාගේ සාඛාපත්‍රාදිය සිඳිමතබා ඒ ගස මූලින්ම උදුරාගන්නේඝයි කීයෙය බ්‍රාහ්මණයා විසින් මෙසේකීක ල්හි නැවත අඛ්කුරතෙම ඒ කියමන නිස්ප්‍රයෝජන කරම්න්මෙ සෙකීයේය—

බ්‍රාහ්මණය ඝම් පුරුෂයකුගේ ගෙදර ඝම්පුරුෂයෙක් එක්රැයක් පමණ නමුදු වාසයකොට එන්දි ආහාර පාණදිය ලබා ඒ උපකාරී පුරුෂයා ඔට සිතින්පමණවත් නපුරක් නොසිතිය යුතුය, කයින් වචසින් නපුරක්නොකොට යුතුබැව් කියනුම කිම කෙලෙහි ගුණ සැලකීම බුධාදි මහෝත්තම ඔෝ විසින් ප්‍රශස්තකරණ ලද්දේය—නවද ඝම්පුරුෂයක්හුගේ ගෙයිවාසය කර ණෙණාවේද ගේ සාමියාවිසින් මේදේ ගනුව මේදේඅනුභව කරවයි යනාදිවසයෙන් ආහරපාණදියෙන් සංග්‍රහකරණලදුව ප සුවයිතින් පමනවත් ඔහව නපුරක්නොසිතිය යුතුය කයින් ව චසින් නපුරක්නොකොට යුතු බවනියනුම කිම එසේකලේවී නම් අහිංසක හස්නතෙමේ ඒ මිත්‍රද්‍රෝහිපුද්ගලයා විනාසකරණෙණා වෙයි නවද ඝම්පුරුෂයෙක් තෙම ප්‍රථමකොට ඝමෙකුට උපකාර කෙරේද ඒ උපකාරලබා පසු ඔහුව ඒ පව්ටුපුද්ගලයා විසින් හිං සාකරණෙණවේද එකල ඒ අල්පාති පුරුෂඝාවිසින් නසනලදි

මිත්‍රද්‍රොහිතෙම මෙලෝ පරලෝ දෙක්හිම අභිවෘද්ධියකට නොපැමිනෙන්නේයයි කිහ මෙසේ සත්පුරුෂ ධර්මය ප්‍රකාශකෙරෙමින් අඛකුරයාවිසින් මැඩපවත්වන ලද්දාවූ බ්‍රාහ්මණතෙම උත්තර නැතිව තූෂ්ණීම්භූත වූයේය

දිව්‍යරාජතෙම ඔවුත්දෙදෙනාගෙ කථාවඅසා බ්‍රාහ්මණයාහට කුපිතව මේ දුෂ්ටබ්‍රාහ්මණයා හට කටයුතු පසුව කෙරෙමි සිතා තමන්නිසිවෙකු විසින් මැඩපවත්වන්නට නොහැකි බව පලමුකොට ප්‍රකාශකෙරෙමින් මෙසේ කියන්නේ එඛා මම යම්කිසිදෙව්යකුවිසින් හෝ යම්කිසිමනුෂ්‍යයකුවිසින් හෝ චාතුම්මහාරාජික ශක්‍රසුයාමාදි දිව්‍ය ඓශ්වර්‍යයිකින් හෝ චක්‍රවර්ති සම්පත්ආදි මනුෂ්‍ය ඓශ්වර්‍යයිකින්හෝ මැඩපවත්වන්නට පහසුනොවෙයි මම නම් දිව්‍යඉර්ඛියට පැමිනි දිව්‍යරාජයෙක්වෙමි එසේදවුවත් එසේ මෙසේ දිව්‍යරාජයෙක් නොවෙමි උතුම්දිව්‍ය ඉර්ඛියෙන්ශාසණයකින් බොහෝනැන්හන්නට හැකිවූආනුභාවයකින්ද ශරීරවර්ණයෙන්ද සැක්තිබලයෙන්ද සමන්විත යෙමි එහෙයින් කිසිවෙකුවිසින් මැඩපවඩා ලිය නොහැක්කෙමි කිහ

ඒකල්හි අඛකුරතෙම කියන්නේ එඛා දිව්‍යරාජයානෙනි තොපගේ දකුනු හස්තය සුවණ්ණවර්ණය ඇඟිලිපසින් කැමති කැමතිසම්පත් ධාරාවහනයවෙයි, මිහිරිවූ පැනිරය කට්ටක රසලවනරසාදි ප්‍රභේද ඇති නනාවිධ රසයන්වැගිරෙයි මිහිරිරසාදියෙන් සම්පන්න ඛාද්‍යභෝජ්‍යාදි ආහරයන් පහලකර දෙන හස්තයඇත්තේය එබැවින් මම නෙපි ශක්‍රයෙකැයි සිතම්කියේය

ඒවිට දිව්‍යපුත්‍රකියන්නේ. අඛකුරය මම වෙසමුනිදිව්‍යරාජයා ආදිකොට ඇති ප්‍රසිඛදිව්‍යරාජයෙක්ද නොවන්නෙමි ශාඛ්‍රී කායික දිව්‍යරාජයෙක්ද නොවන්නෙමි පුරින්දද යයි කියන ලද ශක්‍රයාද නොවන්නෙමි මමකවරෙක්වෙමිදයන් මහත්ඉර්ඛි ඇති එක්තරා ප්‍රේතයෙක්මි හේරුව * නුවරින් චූතවඅවුත් මේවා එකාකානන්තාරයෙහිවූ මෙතැන්හි උත්පන්නිවසයෙන් මේනුගඟසවපැමිනියෙමි අඛකුරයතොපි එසේදැනගනුමැයිකිහ එවිටඅඛකුරතෙමවිචාරනුයෙ, එඛා දිව්‍යරාජයානෙනි නෙපි පෙර හේරුවනුවරසිටිනකල්හි පුඒආත්මභාවයෙහිදි අකුසලයෙන්වැලකීම ලක්ෂණකොටඇතිකවරසීලයක්ඇතිවූයේද නැවතනැවතපුනාක්‍රියාවන් කෙරීම ලක්ෂණකොට ඇතිකවර සමාචාරයක් ඇතිවූයේදනොහොත් දැනාදි පුනාක්‍රියාවන් අතුරෙන් කෙබඳු කුශලසමාචාර

* ඇතැම්පොතක "රොරුව"

ඔක් ඇතිවූයේවේද තොපගේ කවරනමිශ්‍රේෂ්ඨබ්‍රහ්මචර්‍යාවක්හේතුකොටගෙණ හෝ්යෙහි සම්පත්පහලවේද ඒ නියවසි නියේය.

ඒකල්හි දිව්‍ය පුත්‍රතෙම අඛ්කුරය මම පුළුයෙහි හේරූවිතුවර සත්නාලියෙක්වූයෙම්, ඉතාදුකසේ ජීවත්වීම් ඇත්තෙම් සිහන්නෙක් වූයෙමි. මගිජනයින්වහා ශ්‍රමණ බ්‍රාහ්මණදින්ට දී යයුතුවූ කිසිත් දානවස්තුවක් මට නැතිවූයේය, මාගේ ගෙයනම් ශ්‍රද්ධා චන්තවූ දානපතිව දන් දෙන්නාවූ පෙරකරණලද කුසල්දැතී අකුසලයට ලජ්ජාවන සභාවඇත්තාවූ'අසයහ, සිටානන්ගේ ගෙදර සමීපයෙහි වූය, දානපතිවදන් දෙනහෙයින් කුපණ අවිකා වනිබ්බක යාචකාදිනොයෙක් හෝත්‍රදැත්තේ ඒ අසයහසිටානන්ගේ ගෙදරටයන්නාහුය, එසේයන්නාවූ යාචකාදිහු ඒ දුප්පත් තුන්නකාරයා වන මාගෙන් මෙසේ විචාරණණාහුවෙති, තොපව වැඩෙක්වේවා දන්දෙනතැන තොසිබඳුයි කියා අසයහ සිටානන්ගේ ගෙදරට මන්විචාරණණාවූ ඔවුන්ට තොපට වැඩක්වේවා තෙල දන්දෙන තැනය එහියවසි කියා දකුනත දිහුකොට මම අසයහසිටුගෙදර පෙන්නුයෙමි, ඒ අතුන්ගේ දානය ප්‍රකාශකෙරීමෙන් දන්දෙනතැන මම මෙසේ සිතාපෙන්නුයෙමි, මම පෙරකුසල්නොකළබැවින් දුන් මෙබඳු ඇත්තන්ට කිසිත් දෙයක් දෙන්නට අසමර්ථවූයේය එහෙයින් දානාග්‍රය මොවුන්ට පෙන්වමින් දන්ලැබීමවළපාය කීමෙන් ප්‍රීතිඋපදවන්නාවූ මම මෙපමණකින්ම බොහෝ ප්‍රීතිරුස්කරම්සිතා පිළියෙළකරණලද දානයය කස්ව සමාදන්වීම හේතුකොට ගෙණද දුන්මාගේ හස්තය කප්රුකක්මෙන්ද කල්පලතාවක් මෙන්ද කැමති කැමති සම්පත් පහලකොට දෙන්නේවෙයි ඒ කුසලය හේතුකොටගෙණ මාගේ හස්තයෙන් නානා විධරශයන් වැහෙන්නේය මාගේඒ කුසලය නැමති බ්‍රහ්මචර්‍යාවහේතුකොට ගෙණ මාගේ හස්තයෙහි සම්පත් පහලවෙයිකියේය.....

ඒකල අඛ්කුරතෙම කියනුයෙ තොපිවනාහි සියතින් තමා සත්තක දෙයක් ශ්‍රමණ-බ්‍රාහ්මණදි නිසිකෙනෙකුට දනක් නුදුන්නේව අනේ මහදනක් දෙන්නේය ඉතාගහපතැයි සිතා අතුන්ගේ දන අතුමෝදන්වෙමින් වාසයකළේය.....ඒ කුසලය හේතුකොට ගෙණ තොපගේ හස්තය කැමති කැමති සම්පත් පහලකරන්නේය, එමකුසලහේතුකොටගෙණ තොපගේ හස්තයෙන්නානා විධ මිහිරිරසයන්වහින්නේය, අතුන්ගේ දානානුමෝදනාවීමෙන් යාචකාදින්ට දන්සැලදක්වා එ කුසලය නැමිබ්

හමුවයහිංව හේතුකොටගෙණ නුබවහන්සේට එබඳුවිපාකයක්ලැ බුනේය, මෙවැනිආනුභාවයක් වූයේය, යම් ඒඅයයහසිටානතෙනෙ ක් ප්‍රසන්නසිත් ඇතිව සවඟස්තයෙන් තමාසන්තකවසතුව මහ දන්දුන්නේවේද හෙතෙම මේලෝකයෙන්මනුෂ්‍යත්මයහැරකෝ යිදිසාවට ගියේවේදැයි කියා අසයහ සිටානන්ගේ පරලෝකෝ ත්පත්තිය විචාළේය. දිව්‍යරාජතෙම කියනුයෙ එම්බා අඩකුරය මසුරුසිත්ඇති ලෝභාධික අනාගතන්විසින් මැඩපැවැත්විය නොහැකිවූ දුනපරිතත්තග සංඛ්‍යත සත්පුරුෂ ධර්මය උසුලන්නාවූ යාචකාදීන් එන්නවුන්දැක උසුරවූ ප්‍රීතිසෞම්මනස්‍ය ඇතිව විශේෂයෙන් පැහැදුනාවූ මුහුනඇතිව සිටිහෙයින් ශරීරයෙන් නික්මෙන රැස්මඇත්තාවූ දුනපතිවදන් දුන් අසයහ සිටානෙ අස වල්නැන උපන්නේයයි කියා ඔහුගේ ගතිය හෝ අසවල්කාලයෙ හි මෙහි එන්නේයයි කියා ආගතිය හෝ මම නොදනිමි, වැලිත් එකෙක් ඇත මම වෙසමුණි රජහට උපස්ථානයටගියකල්හි අස යහ සිටුතෙම ශක්‍රදිව්‍යරාජයාහට එකතුව තවුතිසාදිව්‍යලෝකයෙ හි උපන්නෙවුයයි වෙසමුණි රජහු සමීප යෙහිදි අසනලද්දේ යයිකීහ.

ඒකල්හි අඩකුරතෙම මෙසේ කියන්නේ, එම්බා යක්ෂ ය සම්පත් ඇතිපරිද්දෙන් දන්දෙන්නට යුතුමය පුණ්‍යක්‍රියාවන් කරන්ට යුතුමය අනුන්ගේ දුනය අනුමෝදන්වෙවීන් යාචකාදී න්ට දන්දෙනස්ථානය දක්වාණ පුණ්‍යහේතුකොට හොණ කැමති කැමතිසම්පත් පහලවන්නාවූ හස්තයක් ඇත්තාවූ චේපාන්කා ම දද නම් දිව්‍යරාජයා දැක කවරකෙනෙක් පින්නොකෙරේද මම මෙයින්ගොස් චාරවති නුවරට පැමිණ යාචකුසලයක් මවපරලොව දී කායචිත්තයට සැපඵලවන්නේද එබඳුදුනය දෙන්නෙමි ආහර පානයන් හා වස්ත්‍රසේනාසන දෙමි පැන්සාලාවන්ද තනවමි දු ගී්‍යස්ථානවල ඒදඬුපාලුවිද තනාවමිකියේය. මෙසේ අඩකුරයා විසින් දන්දෙම්යි කියා ප්‍රතිඥාකලකල්හි දිව්‍යරාජතෙම සතුටුසි න්ඇතිව කියනුයේ නිදුකානෙනි තෙපි සැකනැතිව දන්දෙව මම තොපට සහයවෙමි යම්හෙයකින් තාගේ දුනවසතුව ක්ෂය නොවේද එසේකෙරෙමි කියා ඔහුදන්දීමෙහි සතුටුකොට නැ වත දිව්‍යපුත්‍රතෙම බ්‍රාහ්මණ වෙලෙන්දට කියනුයේ, එම්බල තො මාවැනි කෙනෙකු බලාත්කාරයෙන් ගැලවනන්වා නුවර ට හැරගෙණ යන්නට කැමතිවූයේවේද තමාගේ පමන නොදන්නෙ හිදැයි කියා ඔහුගේගැල්වල බඩුඅන්නඩාන කොට ඔහු ට යක්ෂ විහිංසනයෙන් හිංසා කෙරෙමින් හඬගැන්වූ යේය.

එකල්හි අඛකුරතෙම් නානාප්‍රකාරයෙන් ඒ දිව්‍යරාජයාට යාඥාකොව කියා බ්‍රාහ්මණයා ලවා ක්ෂමාව ඉල්වා පහදවා ඒ සියළුබඹු නිබුතු අන්දමින් තිබෙන්ට සලස්වා අළුයම්වූ කල්හි වෙලෙන්දෙ දිව්‍යරාජයා හැර යන්නේ ඔහුට තුදුරු තැනක සිටි එක්තරා ඉතාම භයානක ප්‍රේතයෙකුදැක ඒප්‍රේතයාවිසින් පුළුයෙහිදී කරණලද අකුසල කම්මය විචාරමින් මෙසේ කීයේය.

(120) කෙනතෙ අහුලි කුණ්ඩා මුඛව කුණ්ඩලිකතං,
අක්ඛිහිව පගළරනති නිංපාපංප කතංතයාති.

(120) යිතුහෙයින් තොපගේ ඇඟිලි වකුටුව කුතුවූවාහ, මුහුනද හැකිලිවිකාරවත් වූයේය, ඇස්වලින්ද අසූචිනැමති කබවැගිරෙයි මෙසේවන්නට පුළුයෙහි තාවිසින් කුමණ අකුසලයක් කරණලදදැයි විචාලේය එකල්හි ඒ වෙලඳ හට ප්‍රේතතෙමනියහුයේ.

(121) අසය්හස්ස ගහපතිනො සඛස්සඝර මෙසිනො,
තස්සාහං දුනවිස්සගෙහ? දුනෙ අධි කතො අහු.
(122) තස්ස යාචන කෙදිසවා ආගතෙ හොජනත්ථිකෙ:
එකම න්තං අපක්කම්ම අකාසිං කණ්ඩකී මුඛං.
(123) තෙනමෙ අහුලිකුණ්ඩා මුඛව කුණ්ඩලිකතං,
අක්ඛිහිප් පගළරනති තං පාපංපකතංමයාති.

(121) යිතුහෙයින් පුළුජාතියෙහි ශ්‍රද්ධාවන්තව ග්‍රහයෙහි වසන්නාවූ අසය්හසිටානන්ගේ දුනාග්‍රයෙහි දුගි මගි යාචකාදින්ට දන්දීමපිණිස මම ප්‍රධානියෙක්කොට තැබුයේය දන්දීමෙහි විඝාත වූවාහු විසින් දන්දෙනතැනින් බැහැරනොගොස් එහිමසිට ප්‍රීති සෞමනස්‍ය උපදවාප්‍රසන්නවූ මුහුනින් යුක්තව සවහස්තයෙන් දන්දියයුතුය, අනුන්ලවා හෝ සුදුසුඅන්දමින් දෙවියයුතුය.

(122) මම්ම එසේනොකොට ආහරපානාදීන් ඉල්වා එන යාචකාදින්දුරදීම දැක ඔවුන්ට නමන්නෙපෙනී එකත්පසකට ඉවත්වසිවමුහුනකුණ්ඩිලාකාරව හකුළුවා ගත්තෙම්.

(123) ඒකාරණයද යම්හෙයකින් එකල මම සවාමියාවිසින් දුනපරිත්‍යාගයෙහි යොදනලද්දෙන් දෙනකාලය එලඹසිටිනකල්හි මසුරුසිතින් මැඩෙනලදුව දුනාග්‍රයෙන් ඉවත්වෙමින් පයහකුළුවා ගතෙනම්ද සවහස්තයෙන්දියයුතු දුනයළුයේනොකටඅතහකුළුවාගත්තෙම්ද දන්දිමප්‍රසන්න මුහුනින් යුත්තවදියයුතුය,

එසේනොකොට මුඛුන හකුළුවා ගත්තෝද දන්හා යාචකාදීන් ප්‍රියඅැසින් බැලිය යුතුය එසේ නොකොට ඇස්කළුවන්කරගත්තෝද ඒ අකුසලය හේතුකොටගෙන මාගේ අත්අැඟිලිහා පා ඇඟිලිහුද කුතුවූවාහුය මුඛුනහැකිලි කුණ්ඩලාකාරව ඉතාඅවලක්ෂණ වූ යේය ඇස්වලින්ද අසූචිමෙන් දුගඳකිවූ පිලිකුල්කටයුතුවූ කඹද වැගිරෙන්නාහ.....

ඉන්නමේ අහුලි කුණ්ඩාමුඛංචකුණ්ඩලි කතං, යනාදි ගා ථාවන්කීයේය.....

එඒ අසා අඹකුරතෙම ප්‍රේතයාහට නින්දුකෙරෙමින් මෙසේ කීහ, එම්බා ලාමක පුරුෂය තොපි යම්හෙයකින් අතුත්විසින් දෙනලද දුනයෙහිත් මසුරුව මුඛුනහකුළුවා ගත්තේවේද එහෙයින් නිසිවූකාරණයකින්ම තමාගේ මුඛුන විරූපවත්වූයේයයි කියා නැවත අඹකුරතෙම දුනපතිවූ සිටානන්ට නින්දුකරමින් මේප්‍රකාර කීහ, දන් දෙනදුයකතෙම ආහරපාන වස්ත්‍රසෙනසුන් ආදිය කෙසේ අතුත්ලවා දෙවියයුතුවේද තමාම සවහස්තයෙන් දියයුතුවන්නේය, තමන් එහි වතවෘත වියයුතුය, තමන් සවහස්තයෙන් නොදෙන්නේවිනම් තමන්එහි වතවෘත නුවූයේවිනම් නිස්කාරණයේ දුනවසතුව විනාසවන්නේය, දක්ඛිණාහීවරුන් සැපයෙන් පිරිහෙති කියා මෙසේ ඒසිටානන්ට ගහිකොට දුන්තමාගේ පිළිපැදීමෙහි විබිදක්වනු පිණිස මෙයාකාරයෙන් කීහ, හේ මම මෙයින් ගොස් වාරවතීනුවරට පැමිණ දම්පවත්වම් යම්දෙයක් පරලොවදීමටසුව එලවාද එබදුවූ ආහර පාණයන් හා වස්ත්‍ර සේනාසනයන්ද දෙන්නෙම් පැන් ශාලාවන් හා පැන් පොකුනුද තනවම්න් දුගීඨානවල ඒ දුඛපාලම්ද තනවම් කීහ.....ඒ අඹකුරතෙම මෙසේ කියා වාළුකාන්තාරය හෙවා වාරවතී නුවරට ගොස් මහදන් පැවැත්වූයේය, අඹකුරතෙම තමන්ට මෙලොවපරලොව දෙකින්යමක් සැපඑළුවා දෙන්නේද දුගිමගි යාචකාදීන් රැස්කොට එබඳු ආහරපානයන් හා වස්ත්‍ර සේනාසන දුන්නේය පැන් ශාලාවන්ද තැනෙවූයේය, පැන්පොකුනුද තැනෙවූයේය, දුගීඨානවල ඒ දුඛපාලම් තැනෙවූයේය.....ඔහුගේ දුනඋහයෙහි මෙසේඝෝෂා කෙරෙති ක්ෂුධායෙන් යුක්තවූයේ කවරෙක්ද පැන් පිපාසයෙන් යුක්තවූයේ කවරෙක්ද වස්ත්‍රහීනවූයේ කවරෙකුවද මාගිය්‍යලාභනවූයේ කවරෙක්ද ඒ හැමදෙනමඅවුත්ආහර අනුභවකරවූ නානාවිධ පානභෝජනීන් බොවූය නානාවර්ණවස්ත්‍ර හැරගෙන ඇඳගනිවූය, යම් රථ කරත්තසමූහයෙන් කැමති කැමති යානවාහන

හැරගෙණ යෙහෙයි ජනුකැමැත්තෝ කැමති කැමති ජනුගනිහ යි සඳුන් තුවරලා ජබාදුකස්තුරිකපුරුඟාදී සුවඳකැමැත්තෝ කැම තිසේ සුගඹජාතිගනිහයි ගෙතුනොගෙතුමල් කැමතිකෙනෙ ක් ඒ හැර ගනිහයි වහන්කැමති කෙනෙක් කැමතිසේ වහ න් සහල්ගනිහයි මේ ප්‍රකාර නියමින් ඒ අඛ්කුරයාගේ දුනගෑහ යෙහි වස්තුදිමටලැස්තිවූ කපුවෝද ආහරදිමට නියමවූහක්ත කාරයෝද සුවඳජාති දිමට නියමවූ ගන්ධිකයෝද මෙකී හැමදෙ න දවස්පතා උදය සවස උත්ඝෝසා කෙරෙති මෙසේ මහදූ න්පවත්වමින් කල්යනකල්හි යාචකාදිහු ආහරපානාදියෙන්තෘපති ඝට පැමින දුනගෑහයට නොයිමෙන් දන්හල් යාචකාදින්ගෙන් සිස්වුවාහ——

දන්හල් සියවතිබෙන්නා දුක අඛ්කුරතෙම උදුරවූ දුනාධ්‍යාසය ඇ තිබැවින් නොසතුටුව තමාගේ දුනපරිත්‍යාගයෙහි නියුක්තසිහි ක * නම් මානවකයා කැඳවාකියනුයේ සිහිකය මහජනයෙමට මෙසේ සිතන්නාහුවෙති අඛ්කුරරජතෙම කීර්තියෙන් හා භෝග සම්පතින්හා දුනසම්ප තින්ද යුක්තවූයෙන් සැපසෙ නිදෝපගත වෙයි සැපසෙ පුබුදිත්යයි නියත්නාහු වෙති සිහිකය ඔබ්හෙයකි න්මාගේසාලාදියෙහි මාගේ ආධ්‍යාසයානුරූපව දුනවඤ්ඤු පිළිගන් නා යාචකයෝ බොහෝව නැත්තේ වේද එහෙයින් මම දුකසේ නිදම් දුකසේපුබුදිම්, එසේමමාගේ දුනශාලාදියෙහි මාගේ ආධ්‍යාස යානුරූපව දන් පිලිගන්නා වන්ඛ්කාදිහු බොහෝනැත්තේ වේද එහෙයින් මමදුකසේ නිදම් දුකසේ පුබුදිම් කියේය——

ඒ අසා සිහිකය තෙම ඒ අඛ්කුරයාගේ උදුරවූ දුනාධ්‍යාස ය ප්‍රකට කරණුකැමතිව මෙසේ කියන්නේ එම්බා අඛ්කුරය දෙදෙ වූලොව දෙවියන්ට අධිපතිවූ ශක්‍රදිව්‍ය රාජතෙම කැමති කැමතිව රයක්ගනුවසිනියා නොපව වරයක් දෙන්නේවිනම් නොපිකවර ණම්වරයක් ගන්නෙහිදැයි. විචාළේය——

ඒකල අඛ්කුරතෙම තමාගේ ආධ්‍යාසය තත්වූ පරිද්දෙ න් හඟවමින් කියනුයේ, ඉදින්දෙදෙවූ ලොව දෙවියන්ට අධි පතිවූ ශක්‍රතෙම මට වරදෙන්නේවිනම් මාගේ වරගැණීම මෙසේ වෙයි, අළුයම්වේලෙහි නැගිසිටියාවූ මට දිව්‍ය භෝජන පහළවී මද මාගේ දන්පිළි ගැණීමට සිල්වතුන්ලැබීමද දන් දෙන්නාවූ මාගේ දුන වසඟුව ක්ෂයනොවන සේද. දන්දී මාගේ සිත නො

* "ඉතුකූ"

නැවෙන සේද දැකි සිත නැවත නැවත ප්‍රසන්නවනසේද මම වරගන්නේ චිනම් මෙකී දෙය්‍ය ධම්ම සම්පත් තියද දැකිනෙ ය්‍යසම්පත්තියද දුයකසම්පත්තියද ඝනමේත්‍රිවිධ සම්පත් ලැබෙ නසේ වරගනිමි කීයේය, මෙහි අළුයම්වේලෙහි නැගි සිටිකල්හි ඝන මෙයින් ආරෝග්‍ය සම්පත් හා දිව්‍යභෝජන පහළවේවයි ය න මෙයින් දෙය්‍ය ධම්සම්පත්තියද සිල්වත්හු ලැබේවයි ඝනමෙ සින් දැකිණෙය්‍ය සම්පත්තියද දන් දෙන්නාවූමාගේ දුනවැකුව ක්‍ෂයනොවේයයි ඝන මෙයින් අප්‍රමානවූ දුනවසතු පරිත්‍යාගයද දන් දිසිත පසුතැවිලි නොවේවා. නැවත දන්දී සිත ප්‍රසන්නවේ වයි ඝනමෙයින් දුයක සම්පත්තිදැයි ඝන මේ පස තමන්ට අභිවෘ ඛි දුයක හෙයින් කැමතිවන ලද්දහ, මෙසේ අඛ්කුරතෙම තමා ගේ ආධ්‍යාසය ප්‍රකාශකල කල්හි ශාස්තෘයෙහි කරණලද පුරුදුඳෑ නි සේනකනම් එක්පුරුෂයෙක් තෙම බොහෝ කොට දන්දීමෙ න් අඛ්කුරයා නිදහස්කරනුකැමතිව මෙසේ කියන්නේ—

එම්බා අඛ්කුරය සවිඤ්ඤාණක විඤ්ඤාණකසියළු සම්ප න්ද ඉතිරිනොකොට දැකිණහියන් උසස්කොට සිතා සියල්ලම නොය දිය යුත්තේය, එතකුදුවුව තමන්ට වසනුම උපදින ආකා රයන් දැනගන වියදන් වෙන ආකාරයන් දැනගන දන්දිය යුතුය එසේඇතිකල්හි ධනයන් රුකෙන්නේ වෙයි, නොලත්දෙය ලැ බෙන ආකාරය ලත් දෙය වියදන්වෙන ආකාරද වසනුරැකෙන ක්‍රමයද දැනගතයුතුය—

* එකෙන හොගෙහුජෙය්‍ය විහිකම්මං පයොජයෙ,
චතුත්‍ථං ච නිධාපෙය්‍ය ආපදාසු භවිස්සති—

මෙහි කියනවිධියෙන් ධෝධනයරුනියයුතුය, වසනුන් ආනිබව දන්දීමට මූලකාරණයක්වෙයි, එහෙයින් දන්දීමට වඩා වසතුවම ශ්‍රේෂ්ඨවෙයි වසතුවේ ප්‍රමාණ නොදැනා දීමනිසා අධිකව දන්දීමෙන් කුලය විනාසවන්නේය පරම්පරා ප්‍රවේනිය බොහෝ කල් නොපවතින්නේවෙයි කියා නැවත නුවණැත්තන් විසින් ප්‍රශංසාකරණලද ක්‍රමයක් දක්වන්නේ, එම්බා අඛ්කුරය දන්නොදී මටද අධිකව දන්දීමටද නුවණැත්තෝ ප්‍රශංසා නොකරණහෝ ප්‍රමාණ දැන දන්දීමට ප්‍රශංසාකරන්නාහුය එහෙයින් දන්දීමට වැ ඩියෙන් වසතුව ඇති බව උතුම්වන්නේය සම්ප්‍රකාරයෙන් නොදී ම භේතුකොට ගෙණ පරලොව අභිවෘඩියෙන් පිරී හෙන්නේ ය, අධිකව දන්දීමෙන් දෘඩධාර්මික කුලපරම්පරාව නොපව

*වස්තුවේ ප්‍රමාණ දැන දන්දීම මේගාථාවෙන් දත යුතුයි.

ත්නේය එහෙයින්ලෝක චාලිත්‍රයව සදුසකොට මධ්‍යස්ථව දන්දිය සුතුවන්නේය, මෙනී ප්‍රකාරයෙන් දන්දීම තුවනැත්තාවූ ධෛර්‍ය්‍ය වන්තාවූ කාරණ දුතුම්ඇති පඬිතයන්ගේමාර්ගඵකැයි සේනකතෙ මනීහ...ඒ අසා අඛකුරතෙම ඒ සේනකයාගේ අභිප්‍රාවපෙරලම්න් මෙසේ නියතුයේ...

(124) අහො වතරෙ අහමෙව දජ්ජං
සත්තොහිමං සපපුරිසා භපෙයයුං
මෙඝොව නිනනා නහිපුර යන්තෝ
සන්තාපයෙ සබබ වනිබබකානං...පෙ...

(124) යිතුකීහෙයින් යහපත කොල මම දන්දෙන්නේ මය දන්දෙන්නාවූ මාශානාවූ සත්පුරුෂයෝ භජනයකරණණාහුය නිම්නස්ථාන පුරවම්න් වසින්නාවූ වර්ෂාවමෙන් මම දුනවර්ෂාවෙන් යාචකාදීන් නැමති නිම්නස්ථාන පුරවා සන්තර්පණය කරන්නෙම් ම ය,

ගෘහවාසයෙහි වසන්නාවූ යම් පුත්ගලයෙකුට යාචකාදීන් දුක ප්‍රථමකොට මාගේ පුණ්‍යක්ෂෙත්‍රය ලන්වූයේයයි සිතා ශ්‍රද්ධාව උපන්නාහු ප්‍රසන්න සිත්ඇතිව මුහුනබලාද වසතුව ඇතිපරිද්දෙන් යාචකාදීන්ට දන්දී ප්‍රීති සෞම්මනස්‍ය හටගත් සිත්ඇතිවේද මේ කුසලයාගේ සම්පත් පිරිමය පින්කරණණාහුගේ කුසලසම්පත් පරිපූර්ණ නම් මේත්‍රීසොම්නසමවෙයි එබ වදක්වන්නේ...

(125) පුබෙබව දුනා සුමනො දදං චිත්තංපසාදයං,
දත්වා අත්තමනෝ හොති එසාසඤ්ඤ සස සම්පදා...

(125) යිතුහෙයින් එම්බා සේනකය දන්දෙනතැනැත්තේ මෙසේ සිතන්නේය, මම සම්පත් නිධානයක් නිධන්කරමි නොහොත් අනුනාමික නිධානයක් නිධන්කරම්සිතා දන්දීමටපුදුයෙහි වසතුසම්පාදනයෙනි පටන් දුනපරිත්‍යාගය කරණතුරු සොම්නස් සහිතවේද දුනවසතුව දක්ෂිණාර්හයන්ගේ අතෙහි පිහිටන්නෙම් අසාරවූ වසතුවෙන් සාරවූ දන්දෙන්නෙම් සිතා දන්දෙන කල්හි තමාගේ සිත ප්‍රසන්නකෙරේද, මම දක්ෂිණාර්හයන්ට දුන වසතුපරිත්‍යාග කෙළෙම් තුවනැති පන්ඩිතයන්විසින් පනවනලද දුනය මාවිසින් දෙනලද්දේය අහෝ යහපතැයි කියා දන්දීඅවසානයෙහි ප්‍රීතිසෞම්මනස්‍ය ඇත්තේවේද මෙසේයම් මේපූර්වචේතනාවය මුචනචේතනාවය අපර චේතනාවය ඝන ත්‍රිවිධ චේතනා

ක්ෂණද්ද මේ ත්‍රිවිධ චේතනාවන්ගේ සම්පූර්ණය කුසලයාගේ සම්පත්ති සිද්ධියවේයි මෙයින් අන්‍යයක් නැතැයිකීහ.

මෙසේ අඹකුරතෙම තමාගේ පිළිපැදිලි විධිය ප්‍රකාශ කොට බොහෝ සෙයින් වැඩිදිවුකුවෙන දුනාඛ්‍යසය ඇතිව නැවතත් දවසක් දවසක් පාසා මහදන් පැවැත්වූයේය. ඔහු විසින් ඒ කාලයෙහි සියළු රාජ්‍යවෙල නගුල් උඩනන්වා මහදන් දෙනු ලබන කල්හි පිළිලද්දවූ සියළුම උපකරණයන් ඇතිමනුෂ්‍යයෝ තම තමන්ගේ කුසිවනිග් ආදි කම්මාන්ත හැර සැපවූ පරිද්දෙන් හැසුරුණහුය, මනුෂ්‍යයෝ අයලපදින කම්මාන්ත නොකිරීමෙන් රජුන්ගේ කොටුගෙවල් වල වී සාල් ආදි ධාන්‍ය ජාති නැතිවීමෙන් කොටුගෙවල්ඇද්ද සිස්වූ වාහුය. එහෙයින් රජවරු අඹකුරයා ලඟට යවන්නාහූ මෙසේ නියාගවුහ' පින්වතුන්ගේ දන්දීමනිසා අපගේ අයවිනාසවූයේ වන කොටුගෙවල් සිස්වූවාහ ඒ හැන යුතුඅන්දමක් දුනකරවයි නියා යවූවාහුය. ඒ අසා අඹකුරතෙම තමන්සිටි තුවර හැර දකුණාපථයට ගොස් දෙමළ රටෙහි මුහුදු අසල මහත්දුනසාලාවන් කරවා මහදන්දෙමින් ආයු ඇතිතෙක් කල්සිට මරණින්මත්තෙහි ගොස් තවුතිසා භවනයෙහි උපන්නේය, ඔහුගේ දුන විභූතියද සවිගීලෝකෝත්පත්තියද දක්වන්නාවූ සංගිනිකාරකයෝ මෙසේකීවාහුය.

(126) සටසීංවහ සහස්සානි අඹකුරස්ස නිවෙසනෙ,
හොජනං දියතෙනිච්චං පුඤ්ඤූ පෙක්ඛ සස ජන්තුනො.

(127) ජනාති සහස්සාසුදූ ආමුත්තාමනිකුණ්ඩලා,
අඹකුරං උපජීවන්ති දුනෙඅඤ්ඤූ සස වත්තවා.

(128) සටසීං පුරිස සහස්සානි ආමුත්ත මනිකුණ්ඩලා,
අඹකුරස්ස මහාදුනේ කටඨං ඵාලෙන්ති මානවා.

(129) සොලසිත්ථි සහස්සානි සබ්බාලංකාර භූසිතා,
අඹකුර සසමහා දුනෙ විධා පිණ්ඩන්ති නාරියෝ.

(130) සොලසිත්ථි සහස්සානි සබ්බාලංකාර භූසිතා
අඹකුරස්ස මහාදුනේ දබ්බිහාහාඋපට්ඨිතා.

(131) බහුබහුනං පාදූසි චිරංපාදූසි ඛත්තියෝ,
සක්කාවවං ච සහත්ථාච පිතිකඛාපුනාපපුනං.

(132) ඛත්තුමාසෙව පඤ්ඤව උතු සංවච්ඡරානිච,
මහාදුනං පවත්තෙසි අඹකුරෝ දීඝමන්තරං,

(133) එවං දත්වා යජිත්වා ච අඹකුරෝ දීඝ මන්තරං,
සොභිත්වා මානුසං දෙහං තාවතිංසූ පගෝ අහූති.

(126) යනුහෙයින් පුණ්‍යඵලයය ඇතිව දන්දීමෙහි ඇළෙනාවූ ඒ අඹකුර රජහුගේ දුනාග්‍රයෙහි දවසකට සුවඳ හැල්වලින් සැට දහසක් සාලාවල් වියදන්කොට සඟසමූහයාහට නිතරආහරදෙන්නේය.

(127) ඒඅඹකුරරජහුගේ දුනග්‍රයෙහි ආහරදීමට වකවෘතවමානික්‍ය කුණ්ඩලාභරණාදි ආභරණ පැලඳි ප්‍රධාන මනුෂ්‍යයෝ තුන්දහසක්වෙති.

(128) ඒසේමහඝත්‍යඤ්ජනාදිය ඉවීමට දරමාන්කිරීම පිනිස වකවෘතව මානික්‍ය කුණ්ඩලාදියෙන්ශරසීසිවින නරුන පුරුෂයෝ සැවදහසක්වෙති.

(129) තවද අඹකුරරජහුගේ දුනාග්‍රයෙහි දුරුම්රිස් ආදියඅ ඹරාපඬු කොවදිමිපිණිස නියම්ව සියළු සත්‍රිආභරණයෙන් ශරසී සිටි සත්වරු සොළොස්දහසෙක්වෙති.

(130) තවද අඹකුර රජහුගේ දුනාග්‍රයෙහි භක්ත ව්‍යඤ්ජනාදිය බේදනපිණිස සවිලඛ්කාරයෙන් සැරසී සැදිහැරගෙණ සිටි සත්වරු සොළොස්දහසෙක්වෙති.

(131) ඒඅඹකුරරජතෙම බොහෝ ආහර පානාදිය නොයෙක්දහස්ගනන් ලක්ෂගනන් කෝටිගන්න් මනුෂ්‍යයින්ට බොහෝ කාලයක් මුළුල්ලෙහි දුන්නේය, හෙද ආදරසහිතව කම්මඵල අදහා නිධං ගත කොට තබනදෙයක්මෙන් සිතා ඍහස්තයෙන් නැවත නැවත ගෞරවයෙරෙමින් බොහෝවාරයෙහි දන්දුන්නේය.

(132) විසිදහසකට ආයුඳැති මනුස්‍යයින් ඇතිකල්හි ඉපිදි ඛක්මාසය ආදි කොට බොහෝමාසවලද කෘෂ්ණ පක්ෂ සුක්ල පක්ෂයයි නියනලද බොහෝ පක්ෂවලද වසන්ත ග්‍රීෂ්මාදිය බොහෝසෘතුවලද චිත්‍රසංවත්සරය ආදි බොහොසංවත්සර වල්හි බොහෝ දීඝ්කාලයක් මුළුල්ලෙහි ඉහතකී ලක්ෂණයෙන් මහා දන්පැවැත්වූසේය.

(133) ලමසේ අඹකුරතෙම බොහෝ දීඝ්කාලයක් මුළුල්ලේ ගියාවකාදින්ට මහාදන්නැමති යාගකොට ඉහතෙම මනුෂ්‍යත්ව භාවය හැර තවුතිසාදිව්‍යලෝකයෙහි උපන්නේයයි කිහ.

(134) මේසේඅඹකුරතෙම තවුතිසා දිව්‍යලෝකයෙහි ඉපිද දිව්‍ය සම්පත් අනුභවකරණකල්හි, අපබුදුන් "කල ඉන්දක" නම් මානවකතෙම ආයුෂ්මත් අනුරුඬඝථවිරයන්වහන්සේ පිණ්ඩපාතයෙහි වැඩියකල්හි ප්‍රසන්නසිත් ඇතිව බත්සැන්දක් දෙවේවයේය.

(135) මේතෙම මැතකාලයෙහි මැරිගොස් සෞඝනුගතවූ පුන්‍යයාගේ ආනුභාවයෙන් තවුතිසා දිව්‍යලොකයෙහි මහත්ඉසි ඇති මහත්ආනුභාව ඇති දිව්‍යපුත්‍රයෙක්ව උපන්නේය එතෙම දිව්‍යමයරූපාදී දසකාරණයකින් අඹකුරදිව්‍ය රාජයා ඉක්මවා බබලන්නේය එහෙයින් මෙසේ කියනලද්දේය—

(134) කථවජ්ජුභිකඛං දත්වාන අනුරුඬස්ස ඉතුකෝ,
සොහිත්වා මානුසං දෙහං තාවතිංසූ පගොඅහූ—පෙ—

(135) ආයුනායසසා වෙවවණ්ණෙ නව සුඛෙතව,
අධිපච්චෙන අඹකුරං ඉතුකෝ අති රොචතිති—

යනුහෙයින් මෙසේ අඹකුරදිව්‍යරාජ තෙමේද ඉතුකදිව්‍යරාජතෙමේද තවුතිසා දිව්‍යලෝකයෙහි ඉපිද දිව්‍යසම්පත් අනුභවඋරණකල්හි අපබුදුරජනො බුඬත්වයට පැමිනි සත්වෙනි භවුරුද්දෙහි ඇසලමස පෞණ්මී දිනයෙහි සැවැත්නුවර දෙරටුවස්ව ඕපයෙහිවූ ගන්ඩම්බරුක්මුල යමාපෙළහරකොට අවසානයෙහි තවුතිසා භවනයවැඩ පරසතුගසමුල පාන්ඩු කම්බල ශෙලාසනයෙහි යුගදුරු මුදුනෙහි දිලිහෙන බාලාකී මණ්ඩලයසෙ බබලමින් දසදහසක් සක්වලින්රැස්වූ දිව්‍යබ්‍රහ්ම පිරිසගේ ආලෝකය තමන්වහන්සේගේ ශරීරාලෝකයෙන් මැඩපවත්වමින් අභිධර්මදේශනාවට වැඩහිඳවදුරමින් සම්මිපයෙහි හුනාගාවූ ඉතුකනම් දිව්‍යරාජයාද දෙලොස් යොදුනකින් ඇත හුන් අඹකුරදිව්‍යරාජයාද දැක දක්ෂිණහී සම්පත් ප්‍රකාශකර වදුරමින් මෙසේවදුළසේක.

135) මහාදු නං තයාදිනනං අඹකුරං දිසමනතරෙ,
සුවිදූරෙ නිසිනෙනාසි ආගචඡ මම සනතිකනති—

(136) යනුහෙයින් එබාඅඹකුරය තොපිවිසින් බොහෝදික්කාලයක් මුළුලෙලහි මහදන්දුන්නේව දුරස්තරවඟිදිනේ කිමෙක්ද මා සම්මිපයට එවයි වදුලේය—

එඅයා අඹකුරතෙම කියතුයේ සාමිනි භාග්‍යවතුන්වූ

හන්ස බොහෝදීඝිකාලයක් මුළුලොලඟී දැන වඤ්චුපරිත්‍යාගකලේ වී නුවූත් දක්ෂිණාභියන්ගේ ලැබීමෙන් අකේෂත්‍රයෙහි වපුලබිජුවට මෙයින් උදුරුලු විපාක නුවූයේය මේ ඉන්දකතෙමේ බත්සැන් දක් පමනදුන්දැනය දක්ෂිණාහි සම්පත් ලත්හෙයින් යහපත්කෙ නොහි වපුට බිජුවසේ උදුරවූඵලවිපාක වූයේයයි සැලකලේය, ඒ බවදක්වන්නාවූ සංගීතිකාරකයෝ මෙසේකීවාහුත-

(137) නාවතිංසෙ යදා බුඩ්ඩෝ සිලායං පඬුකම්බලෙ,
පාරිච්ඡත්තකඤ මූලම්හි විහාසිපුරි සුත්තමෝ-

(138) දසසු ලොකධාතුසු සන්ති පතිට්ඨාන දෙවතා,
පසිරූපා සන්ති සම්බුධං වඤතං නඟමුඛති-

(139) නකොචිදෙවෝ වණ්ණන සම්බුධං අතිරොචති
සබ්බෙදෙවෙ අධිභයහ සම්බුඩ්ඩොච විරොචති-

140) යොජනානි දසාවෙව අඩ්කුරොයං තදා අහූ,
අවිදූරෙව බුඩ්ඩස්ස ඉඤකෝ අතිරොචති-

(141) ඔලොකෙත්වාන සම්බුඩ්ඩෝ අඩ්කුරං චාපි ඉඤකං,
දක්ඛිණෙය්‍යපුප්ඵභාවෙන්නෝ ඉදං වචනංබ්‍රැවි-පෙ-

(142) තථෙව සිලවන්නෝසු ගුණවන්නෝසු තාදිසු,
අපාකම්පකතං කාරං පුඤඤං හොති මහඵලන්ති-

(137) යතුහෙයින් ඝම්කලෙක්හි සර්ඤතෙම තවුතිසාදෙවු ලොව පරසතු ගසමුල දීඝසැවයොදුන් පුළුල පනස්යොදුන් උස පසලොස් යොදුන් ඇති පාඬුකඹල ශෛලාසනයෙහි පූර්ණෝත්තා මවූ බුදුරජතෙම වාසඅකලේද-

(138) එකල්හී දස දහසක් සක්වල දිව්‍ය බ්‍රහ්මයෝ තවුතිසා දෙවුලොවට රැස්ව මහමෙරමුදුනෙහි වාසඅකරණාවූ සර්ඤ ඝාහට උපස්ථානකරණාහුය-

(139) එහි නිසි දිව්‍ය බ්‍රහ්මාදී කෙණෙකුගේ ශරීරවර්ණයකින්බුදු න්ගේ ශරීරවර්ණය නොඹික්මෙන්නේය, බුදුරජනන්ගේ ශරීරව ර්ණයෙන් සියළු දිව්‍ය බ්‍රහ්මාදින්ගේ ශරීරවර්ණය ඉක්මවා සර්ඤ තෙමේම බබලන්නේස-

(140) තවද බුදුන්ට දෙලොස්යොදුනකින් ඇත අඩ්කුරදිව්‍ය රාජවූයේය බුදුන්සමීපයෙහි ඉඤක දිව්‍ය රාජතෙම හුන්සේක්ය එයින් අඩ්කුරදිව්‍යරාජයාගේ ශරීරවර්ණාදිය ඉක්මවා ඉඤකදිව්‍යරා ජතෙමේම බැබළුයේය-

(141) එකල සර්ඤතෙම දෙලොස්යොත්නකින් ඇතහුන් අඩ්කුර

දිව්‍යරාජයාද සමීපයෙහි හුන් ඉන්දක දිව්‍යරාජයාද සන දෙදෙනා දැක දක්ෂිණාහී යන්ට ගොරව වඩවනු පිණිස අඩකුරදිව්‍යරාජයාහට මෙසේ වදාලේය—

අඩකුරය නාවිසින් බොහෝදීර්ඝකාලයක් මුළුල්ලෙහි මහත්දන්දුන්නෙය නොපි දුරසථරවහිදිනේ නිමෙක්ද සමීපයටළඟ සිටි වදාලේය—භාවිතාකරණලද දසපාරමිතාවන්හා වඩනාලද ආශ්‍රය මාගිඇති සවිඥාණ විසින් මේසේනියනලදුව අඩකුරතෙම නියතුයේ, සවාමීනි දක්ෂිණාහීයන්නැතිව දුන්නාවූ මාගේ ඒ දානයෙන් ප්‍රයොජන කවරේද, මේ ඉක්‍ෂුකදිව්‍යරජතෙමේ ඉතාසවල්පවූද නක්දී තාරකා සමූහයා ඉක්මබබලන චන්‍රදිව්‍යරාජයාසේ අපටවඩා රූපලක්‍ෂණාදියෙන් බබලන්නේය, කතුකථූ කැටකැබිලිති ආදියෙන් තදවූ භූමිප්‍රදේසඇති අයහපත්ක්‍ෂෙත්‍රයෙහි වපුල බිජුවට මහත්වීපුලවූ සස්‍යඵලයන් නොදෙන්නේය ගොවියන්ගේසිත් ඒසින් සතුටුනොකරන්නේය එමෙන් දුස්සීලයන්කෙරෙහි දෙනලද දානය විපුලවූ මහත්ඵලනොවන්නේය, දායකයන් එසින්සතුටු නොකරෙයි, යම්සේ යහපත් ක්‍ෂෙත්‍රයෙහි වපුරණලද, සවිල්පබීජයා අඹුසින් දස දවසින් පස්දවසින් වර්‍ෂාධාරා මනාවවස්නා කල්හි සස්‍ය ඵලයෙන් ගොවියන් සතුටුකෙරේද—

(142) එමෙන් ධ්‍යානාදි ගුණයෙන් යුත් ඉඤ්ඣානිඤ්ඣයෙහි අකම්පාවන සභාව ඇති සිල්වතුන්කෙරෙහි කරණලද සවිල්පපුන්‍ය උපකාරය මහත්ඵල මහානිසංස වනපිනෙක් වන්නේයයි කීහ—

(143) විචෙය්‍ය දානං දානඤ්ඤං යඤ්ඤිනානං මහඵලං,
විචෙය්‍ය දානං දත්වාන සග්ගා ගච්ඡන්ති දායකා—

(144) විචෙය්‍යදානං සුගතප්පසත්ථං
යෙදක්ඛිණෙය්‍යෙ ඉධජීවලෝකේ
එතෙසු දින්නානි මහඵලානි
බීජානි වුත්තානි යථා සුඛෙත්තේති—

(143) යුතුසෙයින් යම්කෙනෙක්කෙරෙහි දෙනලද්දේ මහත්ඵලවේද එබදු දක්ෂිණාහීසිල්වතුන් සොයා දන්දියයුතුය, සිල්වතුන්සොයා දන්දෙන දායකයෝ සුගතිලෝකොත් පතන්කෙරෙති—

(144) තාවද මේ ලෝකයෙහි සිල්වතුන් සොයා දන්දීම සර්ව්ඥ යන්වහන්සේ විසින් ප්‍රශංසා කරණලද්දේය සිල්වතුන් කෙරෙහි දෙනලද දානය යහපත් කෙතෙහි වපුල බිජුවටමෙන් මහත් ඵල වන්නේයයි කියා සඟිනිකාරකයෝ කීහ.

මේ අඩකුර ප්‍රේතවස්තුවද. ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ නවුතියා දෙව්ලොවදී දස දහසක් සක්වල දේවතාවන් ඉදිරියෙ දක්ෂිණෝපසම්පත් ප්‍රකාශකරණ පිණිස, තා විසින්මහදනක් දෙන ලද්දේයයි යනාදී වශයෙන් තම්මන්වහන්සේ විසින්ම, උපදවනලද්දේය, එහි බුදුරජානෝ තුන්මාසයක් මුළුලොළුහි විජම්දෙසා මහ පවුරුණු දින දිව්‍යසමූහයා විසින් පිරිවරණලදුව දේවාතිදේවවූ සර්ව්ඥෝතම දෙවුලොවින් සකස්පුරතුවරට බැස අනුක්‍රමයෙන් සැවැත්නුවරට පැමිණ ජෙතවන මහා විහාරයෙහි වැඩවාසයකර වසුරුණකල්හි දක්ෂිණාහි සම්පත් ප්‍රකාශ කරණ පිණිස යාඥඅත්‍රාය ගවජාම යනාදිවසයෙන් විස්තාරකොට දේශනා කරමින් චතුරාර්ය්‍ය සත්‍ය ප්‍රකාශකොට වදාළේය. (දේශනා කෙලවර නොයෙක් කෙල දහස්ගනන් ප්‍රාණීන්ට ධර්ම්මාභිසමය වූයේය.) මේ ප්‍රේතවස්තු ප්‍රකරණයෙහි දෙවෙනි උඛ්ඛරී වර්ගයෙ නවවේනි අඩකුර ප්‍රේතවස්තුව කියා නිමවනලදී.

21 අඩකුර ප්‍රේතවස්තුව නිමි.

—*—

තාවද මේ ප්‍රේතවස්තු ප්‍රකරණයෙහි දෙවෙනි උඛ්ඛරී වර්ගයෙ දසවෙනි උත්තර මාතු ප්‍රේතවස්තුව නම් කවරහයත්.

එහි පිළිවෙල කථාව මෙසෙ දතයුතු. සමස්ත ලෝකෙක නායකවූ විසුඩ ගුණගණධාර ප්‍රසිඩ සඩම්මවර චක්‍රවර්ත්තිවූ බුදුරජානන්වහන්සේ කුසිනාරා නුවර මල්ලව රජුන්ගේ සල් උයනෙහි යමක සාලයන් අතර පිරිනිවන් මඤ්චයෙහිදී තුන්ලොවට නැගූ පහන්රුකක් නිවියාමෙන් ලෝකය අන්ධකාරවූ වාක්මෙන් තුන්ලෝකය අන්ධකාර කෙරෙමින් පිරිණිවන්පාවදුල කල්හි ප්‍රථම සංගායනාවෙත් පසු ආයුෂ්මත් කච්චායනස්ථවිරයන් වහන්සේ භික්ෂුසංඝයාලොස්නමක් සමග කොසඹැතුවර සමීපයෙහිවූ එක්තරා ආරණ්‍යයෙක වාසය කලෙය. එසමයෙහි වනාහි උදේනි රජහුගේ එක්තරා අමාත්‍යයෙක් කාලක්‍රියාකලේය. ඔහු විසින්ද පෙර තුවර කර්ම්මාන්තයක් විධානකරණලද්දහ

ඔහු මැරුණු ඉක්බිති රජතෙම ඔහුගේ පුතුවු උත්තරනම් මාන වකයා කැඳවා තොපි පියානන් විසින් අධිෂ්ඨානකරණලද කර්මා න්ත විධානකරවයි කියා පියානන්ගේ ඨානාන්තරය ඔහුට භාර කලේය---හෙතෙම එක් දවසක් නුවරකැඩුම් බිඳුම්ආදී දඩුවලින් කරවියයුතු කර්මාන්තයකට දඩුගෙනෙන පිණිස වඩුවන් හැර ගෙණ වලගියේ එහි ආයුෂ්මත් මහා කාත්‍යඛන ස්ථවිරයන් වස න තැනට එලඹ තෙරහු එහි පාන්සුකූල සිවුරු හැඳ පෙරව විවෙ කව හිඳිනවුන් දැක ඉරියවුවෙහි පැහැද පිළිසඳර කථාකොට වැඳ එකත්පස්ව හුන්නේය, එකල්හි ඕහට තෙරුන් වහන්සේ ධර්මදේ ශනාකලේය---හෙතෙම බණ අසා රත්නත්‍රය කෙරෙහි භටගත් පැහැදිලිඇතිව සරණයෙහි පිහිටා ස්වාමිනි හෙටදවසට භික්ෂූන් සමඟ මාගේ දන කරුණාකොට ඉවසා වදාලමැනවැයි කියා දනට ආරාධනා කලේය, තෙරුන්වහන්සේ තූෂ්ණීම්භාවයෙන් ඉවසු සේක---

ඒ පුරුෂතෙම එයින් පිටත්ව නුවරට ගොස් අනිත් උපා සකවරුන්ට කියන්නේ, උපාසකවරුණි කව්වායන ස්ථවිරතෙම මාවිසින් සෙටදවස දනට ආරාධනාකරණලද්දේවන එහෙයින් තෙපි මාගේ දුනාග්‍රයව ආයුතුයයි කීහ, හෙතෙම දෙවෙනි දව ස උදැසනම ඛාද්‍ය භෝද්‍යයන් පිළියෙලකරවා කල්දන්වා භි ක්ෂූන් හා සමඟ වැඩිය තෙරුන්වහන්සේට පෙර ගම්න්ගොස් න මස්කාරකොට පිරිවරාගෙන අවුත් ගෙට වැඩම්වූයේය---ඉක් බිතෙතින් මහඬිවු කැප පසුතුරුණු අතුරණලද, අසුන්වල ස්ථවිර භික්ෂූහු වැඩහුන් කල්හි සුවඳ මල් සුවඳදුම් පහන් ආදියෙන් පුජා කොට ප්‍රණීත ආහරපානාදියෙන් සන්තර්පණයකරවා භටගත් පැ හැදිලිඇතිව ඇදිලි ගෙණහිඳ අනුමෝදනාඅසා කරණලද භුක්තා නුමෝදනා ඇතිව ස්ථවිරයන්වහන්සේ වඩිනකල්හි පාත්‍රයගෙණ පසු ගම්න්ගොස් නුවරින් පිටතවූකල්හි නැවතෙමින් මේසේ කි යන්නේ ස්වාමිනි නුඹවහන්සේලා නිතර මාගේ ගෙදරට වැඩම විඅයුතුයයි යාඥාකොට ස්ථවිරයන්වහන්සේ ඉවසුබැවු දැන පෙරලා නුවරට ආයේය---මෙසේ ඔහු තෙරුන්වහන්සේට උපස්ථානක රණ කල්හි තෙරුන්වහන්සේගේ අවවාදයෙහි පිහිටා සෝවාන් ඵලයට පැමිණ විභාරයක්ද කෙරෙවූයේය---තමාගේ සියළු නැ යන්ද ශාසනය කෙරෙහි පැහැදෙවූයේය---ඔහුගේ මැනියෝ වනාහී මසුරු මලින් මඩිනලද සිත් ඇතිව මේසේ එරුඹවවන කියා නින්දා කරන්නිය තොපි මා නොකැමති කල්හි මෙසේ ශ්‍රමණයින්ට ආහරපානයන් දෙන්නේව ඒ දෙයතොපට පරලෝ

කයෙහිදී ලේවී පලවේවයි කියන්නීය, ඉක්බිති විහාරපූජා දව සෙනි ඇගේ කැමැත්තෙන් මොනරජළු මිටියත් පූජාකළාය ඕතොමෝ මැරීගොස් ප්‍රේත අපායේ උපන්නීය මොණරපිල් කලාපදෑනාය අනුමෝදන්වූ හෙයින් ඒ ප්‍රේතියාගේ කේසයෝ නිල වණ්ව සිනිදුව අක්බඹුරුව එල්වී භූමිසඨිකරණ තරමින් දික්ව මොලොක්ව හටගත්තාහ. ඒ ප්‍රේතිතොමෝ පපාස ඉවසාගත නොහි යම් වේලක පැන්බොම් සිතා ගහා නම් ගඟට බසින්නිද එකල ගඟාතොමෝ ලේ ගඟාවෙයි ඕතොමෝ මෙසේ පනස් පස් අවුරුද්දක් ක්ෂාපිපාස දුක්විඳිමින් ඇවිද එක්දවසක් කංඛා රේවතස්ථවිරයන් ගඟ ඉවුරෙ දිවාවිහරණයෙහි වැඩහිඳිනවුන් දැක තමාගේ ශරීරයහිසකෙවලින් වසාගෙනගොස් සිට තෙරහුගෙන් පැන් ඉල්වා යාඤ්ඤාකරණෑවූ ඒ ප්‍රේතදුව මෙසේ කීය.

(145) පවපන්නා සවයසානි යතොකාල කතෝ අහං,
නාභිජානාම් භුත්තං වා පීතං වා අථ පානියං,
දෙහිඛං පානියං භන්තෙ තසිතාපානියා යමෙනි.

(145) යනුගෙයින් සවාමිවූ රේවතස්ථවිරයන්වහන්ස මම මේ ප්‍රේතාත්මෙ ඉපිද පනස්පස් හවුරුද්දක් ඉක්මුනාහ එපමණකල් මම ආහරයක් අනුභවනොකළෙමි පිපාසයට පැන්ක් නොපීයෙමි සවාමිනි නුඹවහන්සේ මව පැන් දුනමැනව පිපාසිතහෙයින් පැන් බොන්නට කැමැතිව ආයෙමි කීහ, එකල්හි ස්ථවිරයන්වහන්සේ වදාරණසේක්.

(146) අයංසිතොදකා ගහා හිමවන්තස්ස පස්සතෝ,
සන්දතිපිව * ගඟෙඛාන කිංමං යාච සිපානියන්නි.

(146) යනුගෙයින් එඛා ප්‍රේතදුව හිමාල පර්වතයෙන් වැටුනාවූ ඉතා සිහිල් ජලයඇති මේ ගඟා නම් ගඟ බැසයන්නීය මෙයින් පැන් ගෙණ බිජඹව මගෙන් කුමක්ප්‍රණිස පැන් ඉල්වාදුයි වදාලේය.

එවිට ප්‍රේතදුව කියනුයෙ. සවාමිනි ඉදින් මම ගඟ පැන් ගන්නෙම්වීනම් ඒගත්ගත්පැන් ලේවෙයි ගඟාව ලේගඟ වන්නේය එහෙයින් මම නුඹවහන්සේගෙන් පැන් ඉල්වමි කියේ ය, එකල තෙරුන්වහන්සේ මෙසේ විචාරණ්ණේ, එඛා ප්‍රේතිය පෙර තී විසින් කයින් වචසින් මනසින් කුමනදුශ්චරිතයක් කරණලදද, කවර අකුසලකම්මයක් හේතුකොටගෙන ගඟානම්ගඟ තිට ලේගඟාව වේදුයි විචාළේය. ප්‍රේතදුව කියනුයෙ සවාමිනි පෙර

* එතෙනා.

මිනිස්ලොවදී මාගේ උත්තර නම් පුත්‍රයෙක් ඇත්තේය, හෙතෙම ශ්‍රද්ධාවන්ත උපාසකයෙක්වූයේය ඔහු මා නොකමැති කල්හි ශ්‍රමණයින්ට චීවර පිඬුපාත සේනාසනාදිය දෙන්නේය, එනිල මම ම සුරුමලින් මැඩෙනලද සිත්ඇතිහෙයින් ඔහුට එරුෂ වචනයකියා නින්දාකෙළෙමි නොපි මා නොකමැතිකලැහි ශ්‍රමණයින්ට යම් සිවුරු පිඬුපාතසේනාසන ගිලානප්‍රත්‍යයනසිඛාපසයෙක්දෙන්නේවේද ඒ දෙය උත්තරය නොපව ලේ වේවයි කියෙමි ඒ අකුසල් කම්මය හේතුකොට ගෙණ ගහාව මට ලේ ගහවෙයි කිවාය—ඉක්බිති ඒවතසථවිරතෙම ඒ ප්‍රේතිය උදෙසා භික්ෂුසඞ්ඝයාහට පැන් දුන්නේය—එකල ඈට දිව්‍යපැන් පහලව සුවිපත්විය, ආයුස්මත් රේවතසථවිරතෙම ඒ ප්‍රවෘත්තිය තමාලඟට ආවාවූ සිවුවනක් පිරිසට ප්‍රකාශකොට ධම්මදේශනාකළසේක, එසින් මහජනතෙම හවගත් සංවේග ඇතිව මසුරුමල දුරුකොට දානසීලාදි කුසලධම්මයෙහි ඇඳුනේය—

ඒඛා ශ්‍රද්ධාවන්ත සත්පුරුෂවරුනි අනුන් විසින් කරණලද කුසලකම්මවලට නින්දාකොට මෙසේ ප්‍රේතඅපායේ නොසිපද අඹුදරු ආදීන් විසින් තමුන්කරණලද කුසලකම්වලට ඊර්ෂ්‍යානොකොට එයට සතුටුව අනුමෝදන්වී සඞ්ගීමොක්ෂ සම්පත් සාදාගැනීමට උත්සාහ කටයුතු)—මේ ප්‍රේතවස්තුප්‍රකරණයෙහි දෙවන උඛඛරිවග්ගයෙ දසවෙනි උත්තරමාතු ප්‍රේතවස්තුව කියා නිමවන ලදී—

22 උත්තර මාතුප්‍රේතවස්තුව නිමි.

—×—

එවද මේ ප්‍රේතවස්තු ප්‍රකරණයෙහි දෙවනඋඛඛරිවග්ගයේ එකොළොස්වෙනි සුත්ත ප්‍රේතවස්තුව කවරහයත්—හේ මෙසේ දත්යුතු—

සැවැත්නුවරට නුදුරුවූ එක්තරා ගමෙක අප බුදුන් ලොව පහලවන්ට පළමුවෙන් හවුරුදු සත්සියයකට මත්තෙහි එක්තරා ගම් දරුවෙක් පසේබුදුකෙනෙකුට උපස්ථානකලේය ඔහුගේ මෑනියෝ ඔහු වැඩිවිය පැමිනිකල්හි සමාන කුලයකින් ඕහට එක්තරා කුලධීතුවක් ගෙනැවිත් සරණපාවා දුන්නීය, විවාහ දවස්හිම ඒ කුමරුතෙම යහළුවන්සමඟ නහන්ට ගියේ, නාගයෙකු විසින් දෂ්ටකොට. කාලක්‍රියාකලේය, යක්ෂයෙක් විසින් අල්වාගත් හෙයින් මැරුනේයයි කියාත් සමහරෙක් කියති—හෙතෙම

පසේබුදුරජනන්වහන්සේට උපස්ථානකෙරීමෙන් බොහෝ කුසල් රැස්කොට තිබුනේවිනමුත් ඒ සත්‍රිය කෙරෙහි ඔටගත් ආලයෙන් විමාන ප්‍රේතයෙක්ව උපන්නේය—ඒ විමානප්‍රේතතෙම මහත් ඉඩී හා මහත් ආනුභාව ඇතිවූයේය, ඉක්බිති ඒ කුමාරිකාවන් තමන්ගේ විමානයට ගෙණ එනුකැමැත්තේ කවර උපායකින් ඇ ලවා දීඝටඩම්මවෙද්‍ය කුසලකම්මයක් කරවා මාහාසමග මෙහි අභි රමනයකරණ්ට හා ඇවිසින් දිව්‍යසම්පත් අනුභවකරන්ටද හැකි වූ හේතුවක් විමසමින් පසේබුදුන් සිවුරු කම්මාන්හා කරණගුවන් දුක මනුෂ්‍යවේසයක් ගෙණ පසේබුදුන්ලඟට ගොස් නමස්කාර කොට සිට කිමෙක්ද සාමිනි නුඹ්වලින් ප්‍රයෝජන ඇද්දැයි විචා ළේය, උපාසකය සිවුරුකම්මාන්හා කරන්නෙමුයයි කීසේක, එසේවි නම් සාමිනි අසවල්තැනට නුඹ් සිහමතේ වැඩියමැනවැයි කියා ඒ කුමාරිකාවගේ ගෙදර දක්වාළුයේය—ඉක්බිති පසේබුදුරජ තෙම එහිවැඩ ගුහචාරයෙහි වැඩසිටියේය—

එකල්හි ඒ සත්‍රිතොමෝ පසේබුදුන් එහි වැඩසිටින්න වුන්දැක ප්‍රසන්නසිත් ඇතිව මාගේ ආර්‍යයන්වහන්සේ නුල්පිතිස වැඩසේකැයි දැන එක් තුල්ගුලියක් දුන්නීය—ඉක්බිති ඒවිමානප්‍රේ තතෙම මනුෂ්‍යරූපයෙන් යුක්තව ඒ කුමාරිකාවගේ ගෙටගොස් ඇගේ මවට යාඥුකොට ඇහාසමග කීප දවසක් එකතුවසිට ඇ ගේ මවට අනුග්‍රහ පිනිස ඒ ගෙයි සියළු භාජනයන් හිරන්‍යසුවණි යෙන් පුරවා හැම භාජනාවල මතුයෙහි මේ ධන දේවදූතියගේ ධ නය කිසිවෙකු විසින් මේ නොගතයුත්තේයයි කියා නමලියා තිබුයේය—ඉන්පසු ඒ කුමාරිකාවන් හැරගෙණ තමාගේ විමාන යට ගියේය—ඇගේ මැනියෝ බොහෝ වසතුවලැබ තමාගේ නැයිනට හා ක්‍රපනව නිබඳක යාචකාදීන්ටද බෙදාදී කාලක්‍රියා කරණකල්හි මාගේ ධිතෘව ආ වේලාවක මේ ධන දෙව්‍යයි නෑ සින්ට කියා කාලක්‍රියාකළාය—ඉක්බිති සත්සියයක් හවුරුදු පසු උතු කල්හි අප බුදුරජනො ලොවපහලව පවත්වනලද දම්සක් ඇතිව ක්‍රමයෙන් සැවත්නුවරට වැඩ එහි වැඩසිටින කල්හි ඒ සත්‍රි යාවට ඒ අමනුසයහා සමග එකතුව සිටිනකල්හි කලනිර්ම වූයේ ය, ඕතොමෝ ඒ දිව්‍යපුත්‍රයාට කියන්නී මෑනව ආර්‍යපුත්‍රය මා අපගේ ගෙදරට ගෙනයෙවයි කියා මෙසේකීහ—

(117) අහංපුරෙ පබ්බජිතස්ස භික්ඛුනො
සුත්වාං අදුසිං උපගම්ම යාචිතො,
තස්ස විපාකො විපුලං එලුපලබ්භති
බහුං ච මෙ උපපජ්ජ රෙවණ කොට්ඨො—

(148) පූජාහි කිණ්ණං රමිතං විමානං
අනෙක චිත්තං තරණාරි සෙවිතං,
සාහං භුජාමි ච පාරුපාමි ච
පඤ්ච චිත්තා නවතාව ඛියති

(149) තඤෙව කම්මඤ්ඤ විපාක මන්වායා
සුඛඤ සාතඤ ඉධූප ලබ්භති,
සාහංඉතෝචා පුනදෙව මානුසං
කාහාමි පුඤ්ඤානි නයඤ්ඤු පුත්තමන්ති

(147) යතුහෙයින් මම පූර්‍වයෙහි කාමාදි කෙලෙස්මල දුරුකළාවූ නසතලද සෝලඝයන්ඇතිව මාගේගෙදරට නුල්සිඟමනෙහි වැඩි පසේබුදුරජාණන්හට කපුවෙන් තනතලද නුල්ගුලියක් දුන්නෙම් ඒ කුසලය හේතුකොට ගෙණ විපුලවූ සුවවිපාක ලැබුනේය බොහොවූ නොයෙක් සිරිගතන් දහස්ගණන් ලක්ෂගනන් වසා ගෝ උපදින්නාහුය

(148) නානාප්‍රකාර චිත්‍රකම්මාන්ත ඇති නොයෙක් මලින් ගැවසීගත් දිව්‍යස්ත්‍රීන් විසින් සේවනයකරණලද විමානයක් පහළවූයේ එහි මම දිව්‍ය වසා හඳිම් පොරවම් බොහෝ දිව්‍යසම්පත් අනුභවකෙරෙමි ඒ මාගේ දිව්‍යසම්පත් නොගෙවෙන්නේය

(149) එම කුසලකම්මයාගේ විපාකයෙන් මෙහි සුවවිඳිමි හේ මම මිනිස්ලොවට ගොසින් නැවතසැපවිඳිමින් කුසල්කරම් ආයූ සුභයෙනි මා මනුෂ්‍යලෝකයට හැරගෙන ගවයි කීවාය

එම මනුෂ්‍යතෙම ඇකෙරෙහි හටගත් ප්‍රේම ඇති හෙයින්ද ඇට අනුකම්පාවෙන්ද මනුෂ්‍යලෝකයට යන්ට නොකමැතිව කියනුයේ, එඛා සත්‍රීයාවෙනි තොපි මෙහි අවුත් සත්සියයක් හවුරුදු ඉක්මූනාහ මනුෂ්‍යලෝකයෙහි ඉක්මනින් ජරාවකාධි වෙයි මෙහි දිව්‍යඍතු ආහරආදියෙන් උපස්තම්භිතවූ ආතමභාවය ඇති බැවින් ලදරුවයසින් යුක්තවම සිටින්නිව මෙයින් ගියකල්හි කර්මයන් ක්ෂයවූබැවින් මනුෂ්‍යයින්ගේ ඍතු ආහර වයයෙන් ජරාජීර්ණ වයොවුඩියද මනුෂ්‍යලෝකයෙහිදි පැමිනෙයි බොහොදීඝිකාලයක් ඉක්මගියහෙයින් නිගේ සිරුර නැයොද මැරුණාහුය ඒහෙයින් මේ දෙව්ලොවින් මනුෂ්‍යලෝකයට ගොස් කුමක් කරන්නෙහිද ඉතිරි ආයුසයද මෙහිදීකෙලවරවනතෙක් ඉඳීම වෙසේවයි නිගා මේසේ ඒ දිව්‍යපුත්‍රයා විසින් නියනලද්දී ඒ නොඅදහාඹිණි

නියන්ගේ ආර්‍යපුත්‍රයානනි මෙහි මම උත්පත්ති කොට සත්සියයක් භවුරුදු ඉක්මුනාහුය එපමනකල් මම දිව්‍යශපයෙන් සම්පූර්ණව විසුයෙමි බොහෝකල් පසුවුනේයයි නියා නොසලකමින් කිව මෙසේ ඇ විසින් කීකල්හි ඒ විමාන ප්‍රේතතෙම නානාප්‍රකාරයෙන් ඇව අවවාදකොට නොපි මෙසින් සත්දවසකින් මැරෙයි මැනියන් විසින් තිට තබනලද්දේ මා විසින් දෙනලද ධනයවෙයි ඒ ධනය හැරගෙණ ශ්‍රමණ බ්‍රාහ්මණයින්ට දැන්මෙහි උපදින්නට ප්‍රාර්ථනාකරවයි කියා ඇ අතලඟින් අල්වාගෙණ ගෙණවුත් ගම්මැදතබා මෙහි පැමිණි අන්‍යයන්ටද පොහොසත් පරිද්දෙන් පින්කරවූයයි කියා අවවාදකරවයි කියා ගියාහ—එහෙයින් කියනලදී.

(150) සොතං ගහෙඛාන පගබ්භයහ බාහායං
පඛ්ඛානයිඛාන පුනරෙව ථෙරී
සුදුබබලං වජ්ජයි අංසුංපිජනං ඉධාගතං
කරොථ පුඤ්ඤානි සුඛුප ලබ්භනීති—

(150) යිතුහෙයින් ඒ විමාන ප්‍රේතතෙම ඒ සත්‍රියගේ අත අල්වාගෙණ ඇ උපන්නාවූ ඇ වඩිනයට පැමිණියාවූ ගම්ව ගෙණැවිත් සිටවිය ඒ සත්‍රීතොමෝ විමානයෙන් අහක්වගිය කෙනෙගිම ජින්න හින්නව ඉතා දුර්වලවූ ශරීරයෙන් යුක්තව ජරාවව හා වෘඩවයසට පැමිණ මැහැල්ලව වයප්‍රාප්ත සත්‍රියක්වූවාය, ඇ ගෙණැවිත් ගමෙහි සිටුවා සොදුර නොපිත් දැනසිලාදී පින් කරව නිලඟව පැමිණි අන්‍යයන්ටත් පින්කරණසේ නොපි විසින් අවවාදකරව පින්කළ කල්හි ඒ කාන්තයෙන්ම ඒ කුසලයෙන් ශපවිපාක ලැබෙයි එහි සැක නොකරවූයයි කියා විශෙෂයෙන්ම අවවාදකරවයි කියා ගියේය—

විමාන ප්‍රේතතෙම ඇ සිටුවා මෙසේ නියාගිය කල්හි ඒ සත්‍රීතොමෝ තමාගේ නැයින්ගේ වාසස්ථානවලටගොස් තමන්ගේ ප්‍රවෘත්තිය කියා ඔහු විසින් දුන් ඉහතකී ධනය හැරගෙණ ශ්‍රමණ බ්‍රාහ්මණයින්ට දන්දෙමින් තමන් සවිමපයට ආ ආවුත්ට මෙසේ කියන්නිය—

(151) දිට්ඨාමයං අකතෙන සාධුනා
පෙතා විහඤ්ඤනති තථෙව මානුසා
කම්මඤ්ච කත්වා සුඛවෙදං නියං
දෙවා මනුස්සා ච සුඛෙසිතා පජා—

(151) යිතුහෙයින් නොකරණලද කුසල්ඇති කරණලද අඹු

සල් ඇති ප්‍රේතයෝ සහ මනුෂ්‍යයෝද ක්ෂුත්පිපාසාදියෙන් මිරිකිමට පැමිණෙමින් මහදුක් අනුභවකරනනාවුන් මා විසින් දක්නාලද්දු හ---තවද ශපථපාක ලැබෙන දානසීලාදි පින්කොට නොකරණලද අකුසලයෙන් හා කරණලදකුසලයෙන් යුක්තව දිව්‍ය මනුෂ්‍ය දී සඬයෝ ශපයෙහි පිහිටා ශප විඳින්නවුන්ද මා විසින් ප්‍රත්‍යක්ෂවසයෙන්ම දක්නාලද්දුහ, එහෙයින් කුසලයෙහි ප්‍රමාදනොව අකුසල් දුරුකොට පුන්‍යක්‍රියායෙහි යෙදෙවුයයි කීවාය---

මනුෂ්‍යයින්ට මෙසේ අවවාද කෙරෙමින් ශ්‍රමණ බ්‍රාහ්මණදීන්ට සත්දවසක් මුළුල්ලෙහි මහාදන්දී සත්වෙනි දවසෙහි මැරිගොස් තව්ත්සා දෙවුලොව උපන්නිය---භික්ෂුව එපවත් භාග්‍යවත් බුදුරජානන්වහන්සේට ශලාකළාගුය, බුදුරජතෙම ඒ ප්‍රවෘත්තිය අනෝවාප්‍යත්තිකොට ගෙණ සම්ප්‍රාප්ත පිරිසට ධම්ම දේශනාක්‍රමයේක---පසේ බුදුන් කෙරෙහි දෙනලද තුල්පුජාවගේ මහත් ඵලහා මහානිසංසද, විශෙෂයෙන් ප්‍රකාශකළේය---ඒ අසා මහජනතෙම මසුරුමල දුරුකොට දානාදි පුන්‍යක්‍රියාවෙහි ඇළෙන්වේ---එබා ශ්‍රද්ධාවන්න පුන්‍යාභිලාසිවූ ජනිජනයෙනි සිත් ප්‍රසන්නකරගෙණ කරණලද ඉතා සවල්ප කුසලකම්මය ප්‍රඥධාමීක වීමෙන් මනුෂ්‍ය ශරීරයෙන් යුක්තාවම දිව්‍ය සම්පත් විඳුබව මෙයින් අසා දානාදි සුවරිතයෙහි සිත් ඇලවිය යුතුයි)---මේ ප්‍රේතවස්තු ප්‍රකරණයෙහි දෙවන උබ්බරිවග්ගයේ එකොළොස්වෙනි සුත්ත ප්‍රේතවස්තුව කියා නිමවනලදී---

23 සුත්ත ප්‍රේතවස්තුව නිමි.

—×—

තවද මේ ප්‍රේතවස්තු ප්‍රකරණයෙහි දෙවන උබ්බරිවග්ගයේ දොළොස්වෙනි කණ්මුඬ ප්‍රේතවස්තුව කවරහයත්---හේ මෙසේ දනයුතු---එක් සමයෙක්හි ත්‍රිභුවන නෙකතිලක සකලඥෙය්‍ය සාගර පාරප්‍රාප්ත අනන්ත ගුණගනාධාර භුවනත්‍රයගත සකලසත්ව ඍතෝපදේසකවූ බුදුරජානන්වහන්සේ සැවැත්නුවර ගොදුරු ගම්කොට ජේතවනාරාමයෙහි වැඩවාසයකරවදාරණ කල්හි කණ්මුඬ ප්‍රේතයා අරහයා මේ කථාවස්තුව දේශනාකරණලද්දේය---හේ කෙසේදයත්---

යටගිය දවස කාශ්‍යපබුදුන් සමයෙහි කිඹිල නම් නුවර එක්තරා උපාසකයෙක් ඇත්තේය හෙතෙම සෝවාන්ඵලයට පැ

මිණ වසනුයේ පන්සියයක් උපාසකවරුන් හා සමග සමානවූ ඥ
ඩාව ඇතිව ආරාම රොපන සේතුබන්ධන චංක්‍රමනාදිය කෙරීම්
කෙරවීම් ආදී පුන්‍යක්‍රියාවල එකවෘතව වාසයකරමින් සංඝයාහට
විහාරයක්ද තනවාදී ඒ උපාසකවරුන් හා සමග කලින්කල ඒ
විහාරයට යන්නේය—ඒ උපාසකවරුන්ගේ භාර්‍යාවරුද රත්
නත්‍රය කෙරෙහි අතිප්‍රසන්නව සරණ සමාදන්වීමෙන් හා උපෝ
සථාදී සීලයන් සමාදන්වීමෙන් උපාසිකාවරුවී ඔවුනොවුන් සමගි
සතුටුව මල්ගඳවිලවුන් ගත් අත් ඇතිව කලින්කල විහාරයට
යන්නාහු අතරමග ආරාමවලට හා විශ්‍රාම ශාලාදියට ප්‍රවේසව ප්‍ර
මාදවසිට යන්නාහුය—

ඉක්බිත්තෙන් එක් දවසක් ඛුත්තයෝ කීපදෙනෙක්
එක් සභාවෙක රැස්වහුන්නාහු ඒ උපාසිකාවරු එහි නැවත සිව
ගියකල්හි ඔවුන්ගේ රූපසම්පත් දැක පිළිබඳ සිත් ඇතිව ඔවුන්
ගේ සීලාචාර ගුණසම්පන්න බව දැන මෙසේ කථා ඉපදෙවුවාහුය
මේ උපාසිකාවරුන් අතුරෙන් එනියකුගේවත් සීලභේදකරන්ට ස
මර්ථකවුදැයිකියා ඒ ඛුත්තයෝ කථාකළෝය ඔවුන් අතුරෙහි එ
කෙක් මම සමර්ථයෙමි කීයේය, එකල්හි අනික් ඛුත්තයෝ ඔහුහා
සමග මසුරණ් දහසක් ඔට්ටුකරන්නාහුය, ඉදින් තොපට සීලභේ
දකරන්ට හැනිවුයේ විනම් අපි මසුරණ් දහසක් දෙන්නෙමුව
තොපට ඔවුන්ගේ සීලභේදකරන්ට නොහැකිවූයේ විනම් මසු
රණ් දහසක් අපට දෙවයි කීවාහුය—හෙතෙම වසතුලෝභයෙන්
හා මසුරණ් දහස ගෙවන්නට වේය යන භයිනුත් ඒ ඛුත්තතෙම
විනාවක් ගෙණ නොයෙක් උපාවලින් ගායනාකරමින් සිට ඔවුන්
සභාවට ආකල්හි මනාව තනතලද සත් තනකින් යුක්තවූ මධු
රස්වර ඇති විනාවක් ගෙණ ගායනාකරමින් මිහිරි සවරයෙන්
පවකාම නිශ්‍රිතවූ ගීතිකා නියමින් එසිත් එක්තරා සත්‍රියක් ගීති
කා ශබ්දයෙන් පොලඹවා සීලභේදකොට ඇහා සමග අසඩ්ඛ්‍යෙය
කි යෙදීමෙන් අනික් ඛුත්තියන්ගෙන් මසුරණ් දහසක් දිනාගත්තේ
ය—ඒ ඛුත්තියෝ මසුරණ් දහසෙන් පරදිනලදුව ගොස් එපවත්
ඇගේ සවාමියාට කීවාහුය—

සවාමිපුරුෂතෙම ඒකීම නොඅදහා ඇගෙන් විචාරන්
නේ නි අනාචාරයෙහි හැසුරුනේ යයි මේ ඛුත්තියෝ නියන්නාහුය
ඒ සැබෑදැයි විචාලකල්හි ඕතොමෝ කියනුයේ මම එබන්දක්
නොකළෙමි කීය, එසේ කියත් නොඅදහන කල්හි ලඟසිටිසුනඛ
යෙක් පෙන්වා ඉදින් මාවිසින් එබදු අකුසලයක් කරණලද්දේ

වීනම් මේ කන්සිඳපු කළු බළුතෙමේ මා උපන් උපන් තැනදී කන්වයි කියා බොරු දිවුලාය—අනික් සත්ත්ව පන්සියයදෙ අනාචාරයෙහි හැසුරුණුබව දනිති එසේදවුවත් මෑ එබදු පවක් කෙළේවේද නොහොත් නොකළේවේදැයි කියා සවාම්පුරුෂාදීන් විසින් විචාරණලද්දාහු අපි එබන්දක් නොදනිමුය ඉදින් අපි එබන්දක් දන්නෙමුනම් ජාති ජාතිවල මෑවම අපි වහල්ව උපදින්නෙමුයයි කියා බොරුදිවුලාහුය—

ඉක්බිත්තෙන් ඒ අනාචාරයෙහි හැසිරී බොරුදිවුල සත්ත්වයෝ එම කතාසල්ලින්ද වන්නාවූ හෘදය ඇතිව විසලි හිද නොබෝකලකින් මැරිගොස් හිමාල පර්වතය අසල ෂත්වැදෑරුම් විල් අතුරෙන් කණ්මුඩවිල සවිමිපයෙහි විමානප්‍රේතිව උපන්නියෑ—ඇගේ විමානය හාත්පස්හි කම්මවිපාකය අනුභවකෙරීමට යෝගයවූ එක්පොකුනෙක් පහළවූයේය ඉතිරීසත්ත්ව පන්සියයදෙ මැරිගොස් බොරුදිවුල අකුසලකම්මවසයෙන් ඇවිටමදුසියෝව උපන්නාහුය, ඒ විමානප්‍රේතියොමෝ පුර්වයෙහි කරණලද කුසලකම්ම විපාකයෙන් දහවල් සමපත් අනුභවකොට අර්ධරාත්‍රියෙහි අකුසලකම්ම බලයෙන් චෝදනාකරණලදුව් යහනාවෙන් නැගිට පොකුනුතෙරට යන්නීය එතනට හොස් සිටි ඇ ඇත්පැටවෙක් පමණවූ එක් කළුබල්ලෙක් භයානකවූ රූපඇතිව සිදුනාවූ කන් ඇතිව නියුනුවූ මුවහත් ඇති දික් දත්වලින් යුක්තව මනාව දිලිහෙන කහිර අහුරුවැනි ඇස් ඇතිව නිතරදිගුකරණලද මහත් ජිහ්වාවකින් යුක්තව නියුනුවූ නියපොතු ඇතිව කෘරවූ දික් ලොම් ඇතිව ඒ විලෙන් පිටත්ව අවුත් ඒ සත්ත්ව බිමහෙලා ඉතා අධික බඩගිනි ඇත්තාහු සෙසින් බලාත්කාරයෙන් අල්වාගෙණ කමින් ඇටසැකිල්ල පමණක් ඉතිරිකොට දත්වලින් හැරගෙණ අවුත් පොකුනට දමා අන්තර්ධානවෙයි—

ඒතොමෝ ඒ පොකුනට දැමූ කෙනෙහිම ප්‍රකෘති ශරීරය පහළව විමානයට නැගි යහනාවෙහි නිදන්නීය, අනික් සත්ත්ව ඇට වහල්ව ඉපිද දුක්විඳින්නාහුය, මේ ප්‍රකාරයෙන් එහි වසන්නාවූ ඔවුන්ට පන්සියපනස්හවුරුද්දක් ඉක්මූනාහුය—ඉක්බිත් තෙන්සවාම්පුරුෂයන් නැතිව දිව්‍යසමපත් අනුභවකරන්නාවූ ඔවුන්ට රාගයෙන් සිත්කලඹිරීම වූයේය එහිද කණ්මුඩ විලෙන් නික්ම පවින සිදුරුනින් පිටත්ව හොස් ගඟා නම් ගඟට වැටුනු එක් ගඟාවක් ඇත්තේය,ඔවුන් වාසයකරණ තැනට සමීපව දිව්‍යමය රසවත් ඵලයන් ඇති අඹගසින් හා එසේම මිහිරිඵලවලින් යුක්ත

කොස් දෙල් ආදී වෘක්ෂවලින් සැරසුනාවූ ආරාමයක් සදෘසවූ ආරණ්‍ය ප්‍රදේශයක් ඇත්තෙය—ඒ සත්වරු මේසේ කථාකළාහුය, අපි මේ අඹඵලයන් මේ ගහාවෙහි දමමුව එසේ ඇතිකල්හි වතුරට ගසාගියය මේ අඹඵල දැක අඹවලට ලෝභයෙන් යම්තිසි පුරුෂයෙක් මෙහි ආයේ විනම් යහපත. ඔහු හා සමග අසධර්මයෙහි හැසිරෙමුයයි කථාකොට ඔවුන් එසේ කළාහුය—ඒ සත්ත්‍ව විසින් ගහට දමනලද අඹඵලයන් ජලයෙන් බැස යන කල්හි සමහරක් තාපසවරු ගන්නාහුය, සමහරක් වනචරකයෝ ගන්නාහුය, සමහරක් කවුඩුවෝ හෝ හැරගෙණ යන්නාහුය, සමහරක් ගත්ඉවු රෙහි රැඳෙන්නාහුය—එක් අඹගෙඩියක් ගඟෙහි වතුර බස්නාවට අසුවී බරණැස් නුවරට පැමිනියේය—එසමයෙහි වනාහි බරණැස් රජතෙම ලොහොදුල් අද්දවා ගඟෙ සනානය කෙරෙයි එකල්හි ඒ අඹගෙඩිය වතුරපහරට අවුත් දුලේ බැඳුනේය—

එවණ්ණඛයෙන් සමන්විතවූ මහත් අඹගෙඩිය දැක රාජපුරුෂයෝ රජහට එලෙවුවාහුය එකල රජතෙම ඒ අඹගෙඩියෙන් සුවිල්පමාණයක් කපාගෙණ විමසනු ප්‍රණීත සිරගෙයි වසන්නාවූ වධප්‍රාප්ත එක් සොරෙකුට කන්ට දුන්නේ—හෙතෙම ඒ සුවිල්පය අනුභවකොට දේවයන්වහන්ස මා විසින් මීට පූර්වයෙහි මෙවැනි අඹ නොකනලද්දේය මේ දිව්‍යමය අඹගෙඩියකැයි සිතමිසි කියේය, රජතෙම නැවතත් ඕහට අඹ කැබැලලක් දුන්නේය එතෙම ඒ කැබැලලකා ශරීරයෙහි රැලිවැරලි හා හිංසහි නරකෙශයන්ද නැතිව ඉතා මනොහර ශරීර ඇතිව යවුවන වයස්හි සිටියෙකුමෙන් දෘශ්‍යමානවිය—ඒ දැක රජතෙම ආශ්චර්‍යාත්භූත සිත් ඇතිව ඒ අඹගෙඩිය අනුභවකොට ශරීරයට පහලවූ අමුතු විශෙෂ දැක මනුෂ්‍යයන්ගෙන් විචාරන්නේ, කොතැන්හි මෙවැනි අඹ ඇද්දැයි විචාළේය—මනුෂ්‍යයෝ මෙසේ කීවාහුය, දේවයෙනි හිමාලවනයෙහි පර්වත අසල ඇතැයි කීවාහ—ඒ ගෙණෙන්ට හැක්කේ දැයි විචාරණලද්දාහු දේවයන්වහන්ස වනචරකයෝ දනිති කීහ—රජතෙම වැද්දන් කැඳවවා ඔවුන්ට එපවත් නියා ඔවුන් සියල්ල එකතුව කථාකොට නියමකර භාරදෙන ලද වැද්දුහට කහවණු දහසක්දී තොපි වහා ගොස් මට මෙවැනි අඹ ගෙණවයි නියොගකොට ඔහු හැරියේය—

ඉතිතෙම ඒ කහවනු දහස අඹුදරුවන්ටදී මාගෝපකරණ ගෙණ ගඟ ඉහල කණිමුණඩ විලට අභිමුඛව යනුයේ මනුෂ්‍ය පථය ඉක්මවා ගොස් කණිමුණඩ විලෙන් මොබ සැටයොදුන් පම්

ණ භූම්ප්‍රදේශයෙහි එක් තාපසයෙක් දැක ඒ තාපසයා සමඟ කථාකොට ඔහු විසින් නියතලද මාර්ගය සලකුණෙන් යන්නේ දෙවනුව තිස්යොදුනකින් ඇත එක් ප්‍රදේශයකදී එක් තාපසයෙක් දැක ඔහු හා සමඟ කථාකොට ඔහු විසින් නියතලද මාර්ග සලකුණෙන් ගොස් නැවත පනස් යොදුනකින් පමණ ඇත එක් ප්‍රදේශයක තවත් තාපසයෙක් දැක ඒ තාපසයාහට තමා ආ කරුණු කියේය.

තාපසතෙම ඕහට අවවාද කරනුයේ. මේ මහාමාර්ගය හැර මේ කුඩා ගංගාව අද්දරින් උඩුගඟබලා යන කල්හි යම් වේලාවක පර්වත සිදුරක් දුටුයේවිනම් එකල්හි රාත්‍රියෙහි පහන් දල්වා ගෙණ ප්‍රවේශවෙව මේ ගංගාවද රාත්‍රියෙහි නොපවත්නේය ඒ හෙයින් තොපෙ ගමනට යොග්‍යවෙයි මෙසේ ගොස් කීපයොදුනක් ඉක්මුතුකල්හි ඒ ආඹ වෘක්ෂයන් පෙනෙයි කියේය. හෙතෙම එසේ කොව යන කල්හි සූර්‍යයා උදාවෙන වේලාවෙහි නානාවිධ රත්නරශ්මි ජලයෙන් විජෘම්භිතමාන භූම්ප්‍රදේශඇති ඵලභාරයෙන් නැමිසිටිනාවූ ශාඛා නැමති විසින් ඇති වෘක්ෂ සමූහයෙන් ගැළපී සිටිනාවූ අනේකවිධ පක්ෂිසමූහයා විසින් පවත්වනලද රාවයඇති ඉතා මනොඥවූ අඹ උයනට පැමිණේය. එකල්හි ඒ මනුෂ්‍ය ස්ත්‍රීවරු දුරින්ම ඔහු එන්නවුන් දැක මෙතෙම මට අයිතිය මට අයිතියයි කියා ඒ ස්ත්‍රීහු දුව ආහුය. හෙතෙම වනාහි ඔවුන් හා සමඟ එහි දිවාවසථාන් අනුභවකරන්ට යෝග්‍යවූ පුනාපකර්මයක් නොකළ බැවින් ඔවුන්දැක භයපත්ව මුරගසමින් දුවගොස් බරණැස පැමිණ එපවත් රජහට කීහ. ඒ අසා රජතෙම ඒ ස්ත්‍රීන්ට හා අඹ අනුභවකරන්ටත් ලෝභව රාජ්‍ය අමාත්‍යයන්ට භාරදී මුව දඩයමට ගතනාමෙන් දුනුගිතලවලින් සන්නඬව කඩුව උරෙහි එල්වාගෙණ මනුෂ්‍යයෝ කීපදෙනෙක් විසීන් පිරිවරණලදුව එම වෑද්දු විසින් දක්වනලද මාර්ගයෙන් ගොස් යොදුන් කීපයකට එපිට මිනිසුන් නවතා වෑද්දු පමණක්ම හැරගෙණ ක්‍රමයෙන් ගොස් ඔව්හුත් එපිටනවතා සූර්‍යයා උදාවෙන වේලෙහි අඹ උයනට පැමිණියේය.

එකල්හි ඒ ස්ත්‍රීවරු අර්ථ උපන් දිව්‍යපුත්‍රයෙකුසේ දිලිහෙන්නාවූ ඒ රජහු දැක පෙරගමන් ගොස් රජහුයයි දැන සෙනහ හා බුහුමන් ඇතිව සකස්කොට ඉස්නානය කරවා දිව්‍යමයවූ වස්ත්‍රාලඞ්කාර මල් ගඳ විලවුන් වලින් මනාව සරසා විමානයට ගෙණ ගොස් නානාරස ඇති දිවඛොජ්ජන්අනුභවකරවා ඒ රජහට කැමති පරිද්දෙන් හැසුරුණහුය. ඉක්බිත්තෙන් බොහෝ කාලයක් ඉක්මුතුකල්හි රජතෙම අඩරාත්‍රි වේලෙහි නැගිට යහනා

වේ උන්නැහැත්තේ අනාචාරයෙහි හැසිරී ප්‍රේතිව උපන් ඒ සත්‍රී ය පොකුනුතෙරට යන්නවුන් දැක කුමක් පිණිස මෝතොමෝ මේ වේලෙහි යේදූයි විමසනු කැමතිව පස්සෙන් එහුබැඳ ගියේය. එකල ඒ සත්‍රීතොමෝ පොකුනු තෙරට ගියකල්හි කළු බළුතෙම ඇ වැදී වැදී කන්නවුන් දැක මේ නිමෙක් දුයි නියා නොදනිමින් තුන් දවසත් යොයා බලා මෙතෙම මැගේ සතුරෙක් වන්නේයයි සිතා එස පොවනලද ගියක් ගෙණ සැරයෙන් විද බල්ලා මරා ඒ සත්‍රිය පොකුනට බස්වා නැවත පිළිදල පූර්වරූපය ඇත්තාවූ ඒ සත්‍රිය දැක ශාස්තා දසබලයන්ත් ඇගේ ප්‍රවෘත්තිය මෙසේ විචාරන්නේය.

(152) සොවණ්ණ සොපාණ එලකා. සොවණ්ණ වාළක සණ්ඨිතා,
තත්‍රසා ගන්ධියොව*ගෙහතු, සුචිගන්ධා මනොරමා—පෙ-
(153) කදලි මිග සංඡන්නා, සඤ්ඡාතෝ ගොනක සණ්ඨිතා,
යත්‍රත්‍රංවාසු පගතා, සබ්බකාම සමිද්ධිනී.
(154) සම්පත්තාය † අඞ්ඝරත්තා, තතෝ වුට්ඨාය ගච්ඡසි,
උය්‍යාන භූමිං ගන්ත්වාන, පොක්ඛරඤ්ඤ සමන්තතෝ.
(155) තස්සාතීරෙ ඨිතං ඨාසි, හරිතෙසද්දලෙ සුභෙ,
තතොතෙ කණ්ණමූණෙඩා ‡ අගමංගාන් ඛාදති.
(156) යදුව ඛාසිතා ආසි, අට්ඨිසඞ්ඛලි කාකතා,
ඔගාහසි පොක්ඛරණිං, ඉතිකායෝ යථාපුරෙ.
(157) තතෝ ඨිතං උග්ගාච්ඡන්ති, සුචාරු පියදස්සනා,
වණ්ණෙන පාරු පච්ඡාන, ආයසිමම සන්තිකං.
(158) කිණ්ණුකායෙන වාචාය, මනසා දුක්කටං කතං,
කිස්සකම්ම විපාකෙන, කණ්ණමූණෙඩාව සුනඛා,
අඟ මඟානි ඛාදනීති.

(152) යුතුයෙයින් එඬා දිව්‍යඟනාවෙනි මේ පොකුනුතොමෝ සඛණ්ඩමයවූ ඉතිපෙති හා පවුරු ඇත්තිය, සඛණ්ඩමයවූ වැලිවලින් ගැවසීගත්තිය, ඒ පොකුනෙහි සෞගන්ධිකයෝද ඇත්තාහ, සුන්දරවූ මනොඥවූ සුවඳැති මල් හා ඵලවලින් යුත් නානාවිධ වෘක්ෂවලින් ගැවසීගත්තිය, නොයෙක් සුවඳින් යුක්තවන්තිය, නොයෙක් රත් පියුමෙන් ගැවසිතිබෙයි, නොයෙක් සෙවත පත්මවලින් ගැවසී තිබෙයි, ඒ වෘක්ෂාදිය සුලඟින් කම්පාවූ කල්හි නො

---

* "වගහු.

† "අඞ්ඝරත්තාය" ඇතම් පිටවත්වල.

‡ "සුනඛා" කියාත් පාඨයි.

යෙක් දිවසුවද හමන්නේය හන්සයන් විසින් හා කොස්වග ලිහිනියන් විසින් පවත්වනලද මනොඥ ශබ්ද ඇත්තේය, චක්‍රවාක පක්ෂීන් විසින් නාද පවත්වන ලද්දේය, නොයෙක් පක්ෂීන්ගෙන් ආකීර්ණවූයේය, නොයෙක් රත්නජාති ඇත්තේය, අඹ, දඹ ඇටඹ කරඹ. පතඹ. මී අඹ. ලබුජාති නොයෙක් ඵලධර වෘක්ෂයන් ඇත්තේය, නොයෙක් ඵලධරන්නාවූ වෘක්ෂයන්ගෙන් යුක්ත වනාන්තර ඇත්තේය, මේ තුවර යම්සේ බබලන්නේ වේද බෙබදු අගය ඇති තුවරක් මනුෂ්‍යපථයෙහි නැත්තේය, තිට රම්‍යවාවූ. රිදීවූවා වූ නොයෙක් ගල්තලාද ඇත්තාහ, ඒ ගල්තලා සතරද්ශාවන් බබුළුවනි තිගේ මේ පරිවාරිකා ස්ත්‍රීවරු පන්සියයද සක්වලඑකායු රාදියෙන් සැරසෙන ලද්දාහ. සවණි වණි වසන්න හදිනා පොරොණ ලද්දාහුය යම් තැනෙක්හි තොපි සියලු කාමයෙන් සම්පුණීව වාසයකරන්ට ඵලඹෙන්නේවේද

(153) ඒහි කෙහෙල් මුවසම් අතුරණලද්දාවූ සවණ්මයවූ රිදිමයවූ බොහෝ පර්‍යංකයෝ වෙති

(154) එසේදවුවත් අඩ රාත්‍රිය පැමිණිකල්හි තොපි ඒ පර්‍යංකයෙන් නැගිසිට හාත්පස්හි උයන්වලින් ගැවසිගත් පොකුණ සමීපයට යන්නිය

(155) එහි ගොස් පොකුනු ඉවුරෙහි සිටින්නිය එකල්හි කණ්මුඩ වීලෙන් සුනඛයෙක් අවුත් තී සල්ව සල්වා මුස්කා ඇට පමණක් ඉතිරිකෙරෙයි

(156) එකල්හි තොපි පොකුණට බැස පුළුයෙහි මෙන් ශරීර ඇතිව විලෙන් ගොඩනැගෙයි

(157) එකල්හි තී මනොඥව ප්‍රිය දර්‍ශනය ඇතිව වසන්න හැඳ පෙරව මාගේ සමීපයට එන්නිය

(158) මෙසේ වන්නට තෙපි විසින් පෙර කයින් වචසින් මනසින් කුමන අකුසලකර්මයක් කෙළේද, කුමන අකුසල කර්මයක්හු ගේ විපාකයනින් කණ්මුඩ සුනඛතෙම තිගෙ අඟප්‍රත්‍යඟයන් කන්නේවේදැයි විචාළේය

මෙසේ ඒ රජහු විසින් විචාරණලද ඒ ප්‍රේති තොමෝ මෙසේ කියන්නිය

(159) කිඹිලායං ගහපති සඩ්ඩො ආසි උපාසකෝ,
කාසභාහං භරියා ආසිං දුස්සීලා අති චාරිණී
එවං අතිවරමානාය සාමිකෝ එතදබ්‍රවී පෙ

(160) සත්තවස්ස සතානි ච අනුභූතං යතොපි මේ
කණ්ණමුඛො ච සුනඛො අඟමඟානි ඛාදතීති.

(159) යම්තු හෙයින් එබා මහරජ පෙර කිඹිලානම් නුවර එක් තරුණ ගෘහපතියෙක් වූයේය හෙතෙම ශ්‍රද්ධාවන්තා උපාසකයෙක් වූහ, මම ඔහුගේ භාර්‍යාවවීමි; එකල්හි මම දුස්සීලවූයෙමි, සැමියා ඉක්මවා හැසිරෙණ සුළුවූයෙමි, අනාචාරයෙහි හැසුරුණු මට සැමියාපුරුෂතෙම මෙසේ කියනුයේ තොපි මා ඉක්මවා අනාචාරයෙනි හැසුරුණේවේද තිගේ ඒ ක්‍රියාව තිට සුදුසු නොවෙයි නුසුදුසුයයි කී කල්හි හේ මම බොරුකියමින් දරුණුලෙසින්දී චූරනනේ මෙසේ කියෙමි, මම කයින් වචසින් මනසින් අනාචාරයක් නොකලෙමි ඉදින් මම එසේ අනාචාරයෙහි හැසුරුණේ වීනම් මේ කණ්මුඩ බඵතෙම මාගේ අඟ ප්‍රත්‍යඟයන් මා සල්ව සල්වා කත්වයි කියෙමි.

(160) එම් අනාචාර අකුසලයාගේ හා මුසාවාද කියා දිවුල අකුසල කර්මයාගේ විපාකයෙන් සත්සියයක් භවුරුදු එහි විපාක දුක් අනුභව කෙළෙමි, මේ කණ්මුඩ සුනඛතෙම මාගේ අඟප්‍රත්‍යඟයන් වැදි වැදී කන්නේයයි කීහ.තවද මහරජ නුඹවහන්සේ මට බොහෝ උපකාරවූ සේව මට වැඩ පිණිස මෙහි ආයේය, දැන් මම කණ්මුඩ නම් සුනඛයාගෙන් ලැබෙන දුකින් නිදහස්වූයෙමි. මට දැන් කිසිත් සෝකයෙක් නැත්තේය කොහිනුත් භයෙක් නැත් තේය, නුඹවහන්සේට මම නමස්කාරකරම්, ඇදිලිගෙණ යාඤ්ඤා රන්නෙමි, අමනුෂ්‍ය පඤ්චකාමයන් අනුභවකර මැන්ව මාහා සමඟ රමනය වේවයි කීවාය, එකල්හි රජතෙම එහි විසීමට කලනිරුණුසින් ඇතිව බරණැස් නුවරට යනු කැමති බව කියේය.ඒ අසා ප්‍රේති තොමෝ රජහු කෙරෙහි පිළිබඳ සිත් ඇතති එහිම විසීමට යාඤ්ඤා කලාය; නැවතත් රජතෙම ඒකාන්තයෙන්ම යනු කැමතිව තමාගේ ආධ්‍යාසය ප්‍රකාශ කරමින් මෙසේ කීහ.

(161) භුඤ්ජා අමානුසා කාමා රම්මොමහිතයා සහ
නාහං සුභ ගෙයාවාමි ඛිප්පං පටිනයාහි මනති.

(161) යම්තු හෙයින් සුතුරාඟිය මම තොපි හා සමඟ අමනුෂ්‍ය කාම් සම්පත් විත්දෙමි තිට මම යාඤ්ඤාකරම් වහා මා බරණැස් නුවරට හැරලවයි කීහ.

එකල්හි විමාන ප්‍රේති තොමෝ රජහුගේ වචනය අසා

විියොග දුඃඛය ඉවසන්නට නොහැකිව සෝකාතුර බැවින් කැල ඹුනාවූ සිත් ඇතිව කම්පාවන්නාවූ ශරීර ඇතිව නානාප්‍රකාරවූ උපාවලින් යාඥාකොටද ඔහු එහි වස්වාගන්නට නොහැකිව බොහෝ මහානර්ඝ රත්නයන් හා සමග රජහු නුවරට හැරගෙණ ගොස් ප්‍රාසාදයට නන්වා හඬා විලාපකියා තමාගේ වාසස්ථානය වම ශියාහ—රජතෙම ඇ විදිනාවූදුක් දැක හටගත් සංවේග ඇතිව දැනාදී පින්කම්කොට සඟහිගපරායනවූයේය—ඉක්බිති අප භාග්‍යවත් තෙම ලොව පහලව් වදුරා පවත්වනලද දම්සක් ඇතිව ක්‍රමයෙන් අවුත් සැවැත්නුවර වැඩවාසයකර වදුරණ කල් හිඑක් දවසක් ආයුෂ්මත් මහාමොග්ගල්ලානයන ස්ථවිරතෙම සැරිසරා වඩිනාසේක් පිරිවර සහිතවූ ඒ සත්‍රියදැක ඇ විසින් පුවයෙහි කරණලද කම්මය විවාළකල්හි, ඕ තොමෝ මූලපටන් සියල්ල තෙරුන්වහන්සේට කීවාය, තෙරුන්වහන්සේ ඔවුන්ට ධම්මදේශනා කෙළේය—නැවත පෙරලා අවුත් එපවත් බුදුරජුන්වහන්සේට දන්වූසේක—භාග්‍යවත් බුදුරජුනන්වහන්සේ එම අත්ථුප්පත්තිකොට ගෙණ එනැන්හි පැමිණි පිරිසට ධම්මදේශනා කළසේක—ඒ ධම්දේශනාව අසා මහජනතෙම හටහත් සංවේග ඇතිව අකුසලයෙන් වැලක දැනාදී පින් කම්කොට කුසලධම්යෙහි ඇළුනේසි—(එඩා ශ්‍රද්ධාවන්ත සත්පුරුෂවරුණි බොරු දිවිරිමෙහි ආදීනව මෙයින් දැන ප්‍රේතාන්මෙන් නිදහස්ව සඟහිගමෝක්ෂ සම්පත් ලබන්ට උත්සාහකට සුතු)—මේ ප්‍රේතවස්තු ප්‍රකරණයෙහි දෙවෙනි උබබරිවගීයේ දෙළොස්වෙනි කණ්මුඩ ප්‍රේතවස්තුව නියා නිමවනලද්දේය—

24 කණ්මුඩ ප්‍රේත වස්තුව නිමි.

—:*:—

නුවද මේ ප්‍රේතවස්තු ප්‍රකරණයෙහි දෙවන උබබරි වගීයේ තෙළෙස්වෙනි ප්‍රේතවස්තුවනාම කවරහයත්—

හේ මෙසේ දතයුතු—

එක් සමයෙක්හි භත්තිහාරා වනත සුරාසුර නිකර මනිකුට කිරණ සිසිරණීර පාරිඩෙන පාදපත්ම ඇති ශාස්තෘවූ බුදුරජුනන්වහන්සේ සැවැත්නුවර ජේතවනාරාමයෙහි වැඩවාසයකර වදුරණ කල්හි එම සැවැත් නුවර එක්තරා උපාසිකාවක් ඇත්තිය, ඇගේ සවාමිපුරුෂතෙම මැරුණේය, එකල ඕතොමෝ ප්‍රිය විප්‍රයොග දුකින් ආතුරව සෝකාකාරම්න් ඔහුගේ සොහොනට ගොස්

හඬන්නිය, ස්වාමීනි භාග්‍යවත් බුදුරජානන්වහන්සේ ඇගේ ශ්‍රොතාපත්ති ඵලයට පැමිණීමට උපනිශ්‍රය සම්පත් දැක වදුරා කරුණෙන් සංවොදිනවූ සිත් ඇතිව ඒ උපාසිකාවගේ ගෙදරට වැඩමවා පනවනලද ආසනයෙහි වැඩහුන්සේක, උපාසිකානොමේ‍ා ශාස්තෘන් වහන්සේ කරා එලඹ නමස්කාර කොට එකත්පස්ව හුන්නිය. එකල්හි බුදුරජනෝ ඇගෙන් කිමෙක්ද උපාසිකාවෙනි සෝක කෙරේදැයි අසා වදුරා එසේය ස්වාමිනි ප්‍රිය විප්‍රයෝගයෙන් සෝක කෙරෙමි කී කල්හි ඇගේ සෝක දුරුකරණු කැමතිව අතීත කථාවක් ගෙණ හැර දක්වූසේක. කෙසේදයත්? යටගිය දවස පවා ලරට කපිලනම්නුවර චූලනී බ්‍රහ්මදත්ත නම් රජෙක්වූයේය. හෙතෙම ජන්දෘදී අගතියට නොගොස් තමන්ගේ රටවැසියන්ට අභිවෘඩි කෙරිමෙහි ඇලි දසරාජ ධර්මයෙන් කෝප්‍ය නොකරමින් රාජ්‍යතන්ත්‍රශාසනා කරණෙණය, ඒ රජතෙම සමහර කලෙක තමත්ගේ කුමන වරදක් රටවැසෙ‍ා් කියත්දැයි ඒ අසනු කැමැතිව සන්නාලි වේසයක් ගෙණ හුදකලාව නුවරින් පිටත්ව ගම්න් ගම ව ජනපදයෙන් ජනපදයට ඇවිදින්නේය. එකල සියලු රාජ්‍ය වාසිහු සොරු නැමති කට්ට නැතිව සොරුන්ගෙන් පීඩා නැතිව සියලු මනුෂ්‍යයෝ නොවයනලද ඉරට්ටු ඇතිව සතුටුව වසන්නාවුන් දැක රජතෙම හටගත් සන්තෝෂයෙන් යුක්තව නැවතී නවත් බැහැර නොගොස් නුවරට එන්නේ එක්තරා ගමෙක එක් දුක්පත් කනවැන්දුම් ස්ත්‍රියකගේ ගෙටපැමුණුනේය, ඕතොමෝ මොහු දැක කියන්නී ආර්‍යයෙනි තොපි කොතනසිට ආයේදැයි විචාලිය. භද්‍රාවෙනි මම සන්නාලියෙක්මි සන්නාලි කම්මාන්තයෙකෙරෙමින් ඇවිදිමි, ඉදින් තොපගේ සම්මැසිලි කම්මාන්තයක් ඇත්තේ වීනම් ආහාර හා කුලිදෙව නොපටද සන්නාලිකම් කරදෙමි කීහ.

එකල්හි ඕතොමෝ කියනුයේ අපට ඔත් වැටුප්දනැත කරවන්ට සන්නාලිකම්මාන්තාන් නැත වෙත අයට සන්නාලි කම් කොට කුලිගනුවසි කීයේය, හෙතෙම එහි කීපදවසක් වාසයකරමින් ධර්‍ම්මසූ පුණ්‍යසූ ලක්ෂණයෙන් සම්පන්නවූ ඇගේ ධීනාව දැක මැනියන්ට කියන්නේ, මේ කුමාරිකානොමේ‍ා ස්වාමියෙක් ඇතියෙක්වේද නොහොත් ස්වාමියෙක් නැතියෙක්වේද ඉදින් පුරුෂයකු විසින් පරිග්‍රහනය නොකරණලද්දේවිනම් මට දෙව මම තොපට සැපසේ ජීවත්වෙන උපායක් කරන්ට සමර්‍ථයෙමි කීහ. එකල මැනියෝ යහපත ආර්‍යයෙනි කියා කුමාරිකාවත් ඕහට භාරදුන්නේය, එතෙම ඇහාසමග කීපදවසක් වැස ඇව ක්‍රමවණ්

දහසක්දී මම කීපදවසකින් එන්නෙමි හද්‍රාව නොපි කනගාටු නොවේවයි කියා තමන්ගේ නුවරට ගොස් නුවරම හා එගමටද අතර මාගීහය සමකරවා මාගීය සරසා මහත් රාජානුභාවයෙන් යුක්තව ඒ ගෙදරට ගොස් කුමාරිකාවන් කහවනු රැස මතුයෙහි සිටුවා රිදී රත්‍රං කලවලින් පැන් නහවා උබ්බරියයි කියා නව් කරවා අග්‍රමහෙසිකා තනතුරෙහි තබා ඒ ගමද ඇගේ නැයින්වදී ඇ මහත් රාජානුභාවයෙන් ඒ නුවරට ගෙණවිත් ඇහා සමග පච කාම සම්පත් අනුභව කරමින් ජීවිතාන්තය දක්වා රාජ්‍යසැප අනුභව කොට ආයුසයාගේ කෙලවරදී කුසලා කුසල කම්ය පරිද්දෙන් මියපරලොව ගියේය.

ඒ රජහු කාලක්‍රියාකළ කල්හි ශරීරය ආදහන කොට උබ්බරීදේවිතොමෝ සවාමියානැති වියොහයෙන් සෝක නැමති හුලින් පෙලෙන ලදුව සොහොනට ගොස් බොහෝ දවස් හඳමල් ආදියෙන් පුජාකොට රජහුගේ ගුණ කියමින් උමතුලනාසේ හඬමින් විලාප කියමින් සොහොන වටේ කරකැවි ඇවිදින්නිය. එසමයෙහි වනාහි අප මහබෝසත් තෙම යෑසි ප්‍රවෘජ්‍යාවෙන් පැවිදුව ධ්‍යානලාභී පවාභිඥ උපදවාගෙණ හිමාලවන සමීපයෙහි එක්තරා ආරණ්‍යයක වාසයකරණ කල්හි සෝක හුල හැනි පෙලෙන්නාවූ උබ්බරීදේවිය දැවසින් දැක ඒ තාපස තෙම ආකාශයෙන් අවුත් දෘශ්‍යමාන රූපව අහසෙහි සිට ඒ ඒ තැන්හි සිටි මනුෂ්‍යයින්ගෙන් විචාරනුයේ, මේ සොහොන කවරෙකුගේ සොහොනෙක්ද මේ ස්ත්‍රීතොමෝ කවරෙක් උදෙසා බ්‍රහ්මදත්තයයි කියා හඬමින් විලාපනියන්නී දැයි විචාළේය. ඒ අසා මනුෂ්‍යයෝ කියන්නාහු සවාමිනි මේ උබ්බරීතොමෝ බ්‍රහ්මදත්ත රජහුගේ භාය්‍යාවෝය ඕතොමෝ බ්‍රහ්මදත්ත රජහු කාලක්‍රියාකළ තැන් පටන් සොහොනට ගොස් "බ්‍රහ්මදත්තය බ්‍රහ්මදත්තයයි" ඔහුගේ නම කියමින් හඬා විලාපකියන්නියයි කීවාහුය, එබව දක්වන්නාවූ සංගීති කාරකයෝ මෙසේ කීවාහුය.

(162) අහූරාජ බ්‍රහ්මදත්තා පවාලානං රථෙසභෝ
අහොරත්තාන මච්චයෙ රාජ කාලං කරීතදූ.

(163) තඤ්ඤ ආළාහණං ගන්ත්වා භරියා කඳති උබ්බරි
බ්‍රහ්මදත්තං අපස්සන්ති බ්‍රහ්මදත්තාති කඳති.

(164) ඉසි ච තත්‍ථ ආගංජි සමුපන්න චරණෙමුනි
යොචතත්‍ථ අපුච්ඡීත්‍ථ කෙනත්‍ථ සුසමාගතා.

(165) කස්සචිදං ආළාහණං නානා ගන්ධ සමෙරිතං
කස්සායං කඤ්ඤති භරියා ඉතොදුර ගතංපති
බ්‍රහ්මදත්තං අපස්සන්ති බ්‍රහ්මදත්තාති කඤ්ඤති

(166) නෙව තන්ති වඤ්කසුං යෙතන්ති සුඝමාගතා
බ්‍රහ්මදත්තස්ස භද්දන්තෙ බ්‍රහ්මදත්තස්ස මාරිස

(167) තස්ස ඉදං ආළාහණං නානා ගන්ධ සමෙරිතං
තස්ස සාකඤ්ඤති භරියා ඉතොදුර ගතංපති
බ්‍රහ්මදත්තං අපස්සන්ති බ්‍රහ්මදත්තාති කඤ්ඤතීති

(162) යි නුහෙයින් පූර්වයෙහි පඨාලරට වාසින්ගේ රථ ශ්‍රේෂ්ඨවූ බ්‍රහ්මදත්ත රජෙක්වූහ, හෙතෙම කාලක්‍රියාකළ කල්හි

(163) ඔහුගේ භාර්‍යාවූ උබ්බරී තොමෝ ඒ රජහුගේ ශරීරය දවනලද සොහොනට ගොස් බ්‍රහ්මදත්ත රජ නොදක්නී "බ්‍රහ්මදත්තය බ්‍රහ්මදත්තය" යි කියා හඬන්නිය

(164) එකල්හි ධ්‍යානාදි ගුණයන් එසනය කරනනාවූ ශීලය ඉන්ද්‍රියසංවරය භෝජනයෙහි පමණ දැනීමය ජාගරියානුයෝගය සත්වැදෑරුම් සද්ධර්මය * චතුර්විධ අරූපාවචර ධ්‍යානය යන මේ ප සළොස්චරණ ධර්මයන් ඇත්තාවූ ආත්මාර්ථ පරාර්ථයන් දන්නාවූ පවාභිඥ අෂ්ටසමාපත්ති ලාභිතාපසයෙක් අහසින් ඒ සොහොන ට අවුත් සිට

(165) එ ඒ තැන්වල සිටි මිනිසුන්ගෙන් විචාරත්තුයේ නානාවිධගන්ධය හමන්නාවූ මේ සොහොන කවරෙකුගේවේද? මේ කව රෙකුගේ භාර්‍යාවෝද? මෝතොමෝ කවරෙකු උදෙසා හඬන්නී ද? මේ මිනිස් ලොවින් දුරස්ථයට ගියාවූ බ්‍රහ්මදත්තයන් නොදැක "බ්‍රහ්මදත්තය බ්‍රහ්මදත්තය" යි කියා කැඳවමින් කාට හඬන්නිදැයි විචාලේය

(166) එකල්හි යමෙක් ඒ සොහොනෙහි රැස්ව සිටියාහුද ඔහු සවාමිනි පෙර බ්‍රහ්මදත්ත නම් රජෙක්වූයේ නිදුකානන්වහන්ස ඒ බ්‍රහ්මදත්තාරජ්ජුගේ මේ සොහොනය

(167) පරලොව ගියාවූ ඒබ්‍රහ්මදත්තාරජ්ජුරුවන්වහන්සේට කා යච්චිත්ත සැපයන්වේවා, මේ ස්ත්‍රී තොමෝ ඔහුගේ භාර්‍යාවෝය, මෝතොමෝ බ්‍රහ්මදත්තයා නොදැක මේ මිනිස්ලොවින් දුරට ගිය

---

* "සද්ධාහිරොත්තප්පබහුසුතත්තං
පරක්කමෝ චෙව සතිමති ච" යන සත්ත.

බ්‍රහ්මදත්තයාට "බ්‍රහ්මදත්තය බ්‍රහ්මදත්තාය" යි නියනියා කෑදව මින් හඬන්නීයයි නිවාහුයයි කියා මෙසේ සඤ්ඤිකාරකයෝද කිහ.

ඉක්බිත්තෙන් ඒ තාපසතෙමේ ඔවුන්ගේ වචන අසා අනුකම්පා පණිස උබ්බරිය ලඟට ගොස් ඇගේ සෝක දුරුකරනු පිණිස.

(168) ජලාසිනි සහස්සානි බ්‍රහ්මදත්තාස්ස නාමකා
ඉමස්මිං ආලාහනෙ දඩ්ඪා තෙසං කං අනුසොචසිනි.

(168) යනුහෙයින් උබ්බරිය බ්‍රහ්මදත්තයයි යන නම් ඇත්තෝ ම අසූහදහසක් මේ සොහොනෙහිම දවනලද්දහුය, ඔවුන්ගෙන් කවරෙකු නිසා සෝකකෙරේදැයි විචාළේය.

එසේ තාපසයා විසින් විචාරණලද උබ්බරි තොමෝ තමා අභිප්‍රායකොට සෝකකරණබ්‍රහ්මදත්තයා මෙයයි දක්වන්නී.

(169) යො රාජ චූලණී පුත්තෙනා පචාලානං රථෙසභො
නං භනෙන අනුසොචාමි භත්තාරං සබ්බකාමදනති.

(169) යනුහෙයින් සවාමිනි චූලණී බ්‍රහ්මදත්ත රජහුගේ පුත්‍ර වූ පචාල රට වැසඝන්ගේ ශ්‍රෙෂ්ඨවූ පචාල බ්‍රහ්මදත්ත රජෙක්වූයේ ය, සවාමිනි මට සියලු කැමති කැමති දෙය සිඛකර දුනනාවූ මාගේ ඒ සවාම්පුරුෂවූ පචාල බ්‍රහ්මදත්ත රජහට මම සෝක කෙරෙමි කිය.

උබ්බරි තොමෝ මෙසේ කී කල්හි නැවත තාපසතෙම කියනුයේ, එඛා උබ්බරි දෙව්ය ඒ අසූහදහසම චූලණී පුත්‍රවූ බ්‍රහ්මදත්ත රජහුනම් වෙති, පචාලරට වැසියන්ගෙන් ශ්‍රෙෂ්ඨයෝම වෙති, තෙපිත් ඒ හැමටම පළිවෙලින් අග්‍ර මහෙසිකාවවූය, ගුණ වශයෙන් හා සවාම් වශයෙනුත් විශිෂ්ටවූ මෙපමණපුවු සවාම්යන් හැර එකක්හටම කුමක්හෙයින් සොක කෙරේදැයි විචාළේය. ඒ අසා උබ්බරිතොමෝ හටගත් සංවේග ඇතිව තාපසයාහට මෙසේ කිය. සවාමිනි යමෙක් තමන් සත්වූයේ විනම් සංසාරයෙහි බොහෝ දීඝ කාලයක් සත්‍රම වේද, අසූහදහසක් රජුන්ට මම අග්‍ර මහෙසිකා වූයේයයි නුඹවහන්සේ කියන්නේය, එසේ ඇති කල්හි සත්‍රමවූ කෙණෙක් සත්‍රම වෙනබැව් පෙණෙයි, ඒ රජ අසූහදහසට මම අග්‍ර මහෙසිකාවූ ජාතිවල නුඹවහන්සේ තාපසයෙක්ම වූයේ වේදැයි විචාළේය. ඒ අසා තාපසතෙම සත්‍රිවූ තැනැත්ති සත්‍රම වෙයි, පුරුෂ තැනැත්ත පුරුෂම වෙයි යන නියමයක් සංසාරයෙහි

නැතිබව දක්වන්ට මේසේ කිහ...එඛා උඛඛරිය සත්‍රිවූ තැනැත්
තී සත්‍රීම වෙයි. පුරුෂවූ තැනැත්තේ පුරුෂම වෙයි යන මෙබදු
නිමයෙක් සංසාරයෙහි නැත තොපි සංසාරයෙහි සමහර කාල
යෙක ස්‍රීපුරුෂදවූවෝය, සමහර කාලයෙක සත්‍රිදවූවාය, සත්‍රි පුරුෂ
වීම පමණකුත් නොවෙයි, තවත් සමහර කාලයක සිවූපා ජාතියට
ඇතුලත්ව උපන්නේය, සමහර කාලයක තිරිසන් යෝනියෙහි
අණ්ඩජාදී සතුතුන්වී උපන්නේය, මේ ප්‍රකාරයට අතීතකාලික
සත්‍රීන්ගේ කෙළවරක් නොපෙණෙයි, තවද සමහර කලෙක
සත්‍රීවීමටද සමහර කලෙක පුරුෂවීමටද සමහරකලෙක තිරිසන්
ආදි භාවයටද පැමිණියාවූ ආත්මභාව ඇත්තවුන්ගේ කෙළවර
දිවසින් බලන්නවුන්ට මහත් උත්සාහයෙන් බලන්නේවීනමුදු
නොපෙණෙයි, එහෙයින් සංසාරයෙහි කැරකැවී ඇවිදින සියලු
සත්ත්වයන්ගේ ආත්මභාවයෙහි කෙළවර නොපෙණෙයි, ඒ බව බුදු
රජානොත් මෙසේ ප්‍රකාශකරණලද්දේයයි කියා අට්ඨවාචාය්‍යතෙම
මෙතැන්හි කියනලදී...

"අනමතග්ගොයං භික්ඛවේ සංසාරෝ පුබ්බාකොටිත
පඤ්ඤායති අවිජ්ජා නිවරණානං සත්තානං තණ්හා සංයොජනා න
න්ති" වදුලේයයි කීහ...

මෙසේ නාපසයා විසින් සංසාරයාගේ කෙළවරක් නැති
බව හා කම්ය සත්ත්වයන්ට ඇති බවද ප්‍රකාශකොට ධර්මදේශනා
කළ කල්හි ඒ අසා සංසාරයෙහී කලකිරුණුසිත් ඇත්තී ධර්මයෙ
හි ප්‍රසන්නව පහව ගිය සෝකතුල් ඇති බව තමන්ගේ පැහැ
දිල්ල සෝක සංසිදුනු බවත් ප්‍රකාශකරන්නී මෙසේ කිව...

(170) ආදිත්තං වතමංසන්තං ඝනසිත්තං ව පාවකං,
චාරේනාවිය ඕසිවං සබ්බං නිබ්බාපයෙදරං...පෙ...
නසොවාමි නරොදාමි තව සුභාන මහාමුනිනි...

මෙහි භාවය ඉහතකියනලද්දේ වෙයි...දැන් කලකිරු
ණු සිත් ඇතිව උඛඛරීතොමෝ පිරූ ප්‍රතිපත්තිය දක්වන්නාවූ බුදු
රජානෝ මෙසේ වදුලේය...

(171) තස්ස තං වචනං සුත්වා සමානස්ස සුභාසිතං,
පත්තචීවරමාදාය පබ්බජී අනගාරියං...

(172) සාපබ්බජ්ජූපගතාසන්තා අගාරස්මා අනගාරියං?
මෙත්තා චිත්තා විහාවෙසි බ්‍රහ්මලොකූපපත්තියා...

(173) ගාමා ගාමං විචරන්ති නිගමේ රාජධානියො,
උරුවෙලං නාම්සො ගාමො ඔත්ථකාලමකුබ්බථ...

(174) මෙත්තඤ්චිත්තං විභාවෙඬා බ්‍රහ්මලොකූප පත්තියා,
ඉඤ්චිත්තං විරාජෙඬා බ්‍රහ්මලොකූපගා අහූති—

(171) යතුහෙයින් ශ්‍රමණවූ ඒ තාපසයානන්ගේ ධර්මකථාව අසා සතුටුව ඒ උඛ්ඛරී තොමෝ පා සිවුරු හැරගෙණ ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවූයේ—

(172) බ්‍රහ්මලෝකොත්පත්තිය පිණිස මෛත්‍රිභාවනා වඩමින්.

(173) ගමින් ගමට නියං ගමෙන් නියංගමට රාජධානියෙන් රාජධානියට ඇවිදිමින් අවුත් උරුවෙල් දනවුවෙහි වාසයකළේය.

(174) එහිදී මෛත්‍රිභාවනාකොට සිත් ආත්මයෙහි ආලය හැර බ්‍රහ්මලෝකයෙහි උපන්නේයයි වදාළේය—

ශාස්තෘවූ බුදුරජනෝ මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා උපාසිකාවගේ සෝකසංසිඳුවා මතෙහි චතුසත්‍යය දේශනාකොට වදාළේය—චතුසත්‍යය දේශනා කෙළවර ඒ උපාසිකාතොමෝ ශ්‍රොතාපත්ති ඵලයෙහි පිහිටියාය—සම්ප්‍රාප්ත පිරිස වද මේ ධර්මදේශනාව සාකච්ඡාකවූයේයි—මේ ප්‍රේතවස්තු ප්‍රකරණයෙහි දෙවන උඛ්ඛරී වර්ගයෙහි තෙළෙස්වෙනි උඛ්ඛරී ප්‍රේතවස්තුව කියානිමවනලදී—

25 උඛ්ඛරී ප්‍රේත වස්තුව නිමි.

මේතෙකින් මේ පරමාර්ථ ජෝතිකා නම් ඛුද්දක නිකායාර්ථ කථාවට අනාගත ප්‍රේතවස්තු වර්ණනාවෙහි කථාවස්තු තෙළෙසකින් ප්‍රතිමණ්ඩිත දෙවෙනි උඛ්ඛරී වර්ගය නිමවනලදී—

කවද මේ ප්‍රේතවස්තු ප්‍රකරණයෙහි තුන්වෙනි චූල වර්ගයෙහි පලමුවෙනි ඛුද්ද ප්‍රේතවස්තුව නම් කවරහයත්?—හේ මෙසේ දතයුතුයි—තවද එක් සමයෙක්හි සකලලෝක සත්ත්වාස නෛකසුරාසුරචක්‍රමස්තකෝත්තුඟ පදමයමානතීය ශ්‍රීපාද පද්ම ඇතිසර්ව්වඥරාජෝත්තමයානන්වහන්සේ රජගහනුවර වේළුවනාරාමයෙහි වැඩවාසයකර වදාරණ කල්හි ඛුද්ද ප්‍රේතයා අරභයා මේ ප්‍රේත කථාව වදාළසේක—ඛරනැස් නුවරට බස්නාහිර දිසාවෙහි බරණැස් ගිහි න් ඵගොඩ සියලු ගම් ඉක්මවූ "චුඤ්ඡකා" නම් ගමෙහි එක් වැදි ස්ත්‍රියෙක් වූයේය—හේතොම වනානන්ත

යෙහි මුවත් මරා යහපත් යහපත් මාංස අහුරුවල බහා පැසවා කා ඉනිරී මස් කොල ගොටුවල දමා බැඳ කඳින්හැර ගෙණ ගමට යන්නේ.....

ඔන්න එසේ යනනාවුත් ගම්දරුවෝ ගම්දෙරදී දැක මට මාංසදෙව මටමාංසදෙවයි කියා එකින් එකා අත් දික්කර ඉල්වා ලහවදීවගියා හුඟ.....ඒ වැදි පුත්‍රයා ඔවුන්ට මාංස මදක් මදක් දෙමින්යන්නේය.....

ඉක්බිති එක් දවසක් මාංස නොලැබ උදල මලක් පැලඳ ගෙණ තවත් බොහෝමල් අතින් ගෙණ ගමට යන්නේය, එසේ යන්නාවූ ඔහු ගම්දරුවෝ ගම්දෙරදී දැක මාංස මටදෙව මාංස මට දෙවයි කියා පෙර පරිද්දෙන් ඉල්වමින් ලඟට දුව ගියාහුය, හෙතෙම ඔවුන්ට එක එක මල් පොකුර බැගින් දුන්නේය; ඉක්බිති මෑත කාලයෙහි ඒ වැදිතෙම මැරී ගොස් ප්‍රේතව උපන්නේය, විලිවැසිලිනැතිව ඉතාම අවලක්ෂණ ශරීර ඇතිව බලන්ට භයානකවූ ශරීරයෙහින් යුක්තව සිහිනෙන් පමණවත් ආහරපානයන් නොදක්නේ හිසෙහි හා ශරීරයෙහිත් උදුල මල් කලාපයන් ඇතිව චුන්ඳිකා නම් ගමේහි නැයින් ලඟින් කිසි ආහරයක් ලබම්සි සිතා ගඟා ජලය මදනතෙහි පයින්ම යන්නේය, එසමයෙහි වනාහි බිම්බිසාර මහරජතුමාගේ කොල්ලය නම් මහ ඇමතියෙක් ඇත්තේය හෙතොම කුපිතවූ ප්‍රත්‍යන්ත ජනපද වැසියන් සන්සිඳුවා නුවරට එනුයේ, භක්‍ෂ්‍යභෝජ්‍ය පිරිවර බලසෙනඟ ගොඩින් යවා තමන් ගඟා නම් ගඟෙහි නැවකට නැඟ එන්නේ, ඒ ප්‍රේතයා එසේ යන්නාවුන් දැක අමාත්‍යතෙම මෙසේ විචාළේය.....

(175) අභිජ්ජමාණෙ වාරිම්හි ගඟාය ඉධ තිට්ඨසි
නගෙහා පුබ්බඩ පෙතොව මාලධාරී අලඞ්කතෝ,
කුහිං ගම්මසසි පෙත කත්‍ථ වාසෝ භවිස්සතීති.....

(175) යනුගෙයින් එඩා ප්‍රේතය පාදනික්ඛේපයෙන් නොබිඳෙන ගඟා ජලයෙහි පුවඩිය නැති දිව්‍යසූත්‍රයෙකු සෙයින් මල්වලින් යුක්ත ශරීර ඇතිව නගනව මෙහි යනනාවූ තොප කොයිදේද ප්‍රේතය, තොපගේ වාසය කොයි ගමේවේද කොයි ප්‍රදේශයේවේද ඒ මට කියවයි කීයේය).....

එකල ප්‍රේතතෙම කියනුයේ පින්වත්නි මම බරණැස් නුවරටත් වාසඟ ගමටත් අතර තිබෙන චුන්ඳිකා නම් ගමට යමියි කිහ.....එකල අමාත්‍යයා විසින් ඒ ප්‍රේතතෙමේ පූර්ව්‍වජන්මයෙහි කළ අකුසල් විචාරා නැවත කෝලිය යයි ප්‍රසිද්ධ නම් ඇති ඒ අමාත්‍ය තෙම අඹුනු හා ආහරද රංවත් වසනු සුගලයක්ද ගෙණ ඒ ප්‍රේත

සාමූලැබෙන පිණිස නැව නවතා ඒ නැවෙහි සිටි එක් උපාස
ක කපුවෙකුට දෙවා ප්‍රේතයාට දක්ෂිණාව දුන්නේය. එතනෙකි
ප්‍රේතයාගෙට දිව්‍යභෝජන හා දිව්‍ය වස්ත්‍රාදිය පහළව දිව්‍ය වස්ත්‍ර
හැඳ පෙරවා ගෙණ දිව්‍යභරණ පැලඳ දිව්‍යභෝජන අනුභවකොට
ව ප්‍රේත ආත්මයෙන් මිදුනේය. දක්ෂිණාඝියන් කෙරෙහි පිහිටුවන
ලද දක්ෂිණාව ප්‍රේතයාගෙට එකතොහිම ලැබුනේය. එහෙයින් ප්‍රේත
යින්ට අනුකම්පා ඇත්නාවුන් විසින් ප්‍රේතයින් උදෙසා නැවත
නැවත දක්ෂිණාව දියයුත්තේයයි සංගීතිකාරකයෝ කීහ.

ඉක්බිතෙතින් ඒ කෝලිය නම් මහා අමාත්‍යතෙම ඒ ප්‍රේ
තයාගෙට අනුකම්පා කෙරෙමින් දක්ෂිණාව සම්පාදනයකොට ප්‍රේත
යා සුවපත්කරවා ගඟ පහලට අවුත් සූර්‍යෝදයවෙන වේලෙහි බ
රණැසට පැමිණියේය. භාග්‍යවත් බුදුරජතෙම ඔවුන්ට අනුග්‍ර
හ පිණිස අඟසින් වැඩමවා ගඟාඉවුරෙහි වැඩසිටියේක. කෝ
ලිය මහ අමාත්‍යතෙම නැවින් බැස තුටු පහටු සිත් ඇතිව භාග්‍ය
වතුන්වහන්සේට ආරාධනාකළේය. භාග්‍යවන්හි. අදදවස මට
අනුකම්පාවෙන් මාගේ දත් ඉවසා වදාළමැණවැයි සැලකළේය.
භාග්‍යවත්තෙමේද නුමුණින් මිහාවයෙන් ඉවසාවදාළසේක. ඒ අමා
ත්‍යතෙම භාග්‍යවතුන්වහන්සේගේ ඉවසීම දැන එකතොහිම රමණීය
භූමිප්‍රදේශයෙක මහත් ශාඛා මණ්ඩපයක් මැතෙනි තුන්දහාවෙන්
නානාවර්ණ වස්ත්‍රවලින් විසිතුරුසේ සරයා එහි බුදුන්ට අස්නක්
පනවා පිළිගැන්වූසේක. බුදුරජානෝ ඒ පනවනලද ආසන
යෙහි වැඩහුන්සේක. ඉක්බිතෙතින් මහා අමාත්‍යතෙම භාග්‍යව
තුන් කරා එළඹ ගද දුමේල් ආදියෙන් පූජාකොට වැඳ එකත්පසව
හිද ප්‍රේතයාට තමන් නී වචන හා ප්‍රේතයා නී වචනද බුදුන්ට
සැලකෙළේය. එකල භාග්‍යවත්තෙමේ මෙහි භික්ෂු සඞ්ඝයා
එත්වයි අධිෂ්ඨාන කෙළේය. සිතාවදාළ කෙණෙහිම බුඩානුභා
වයෙන් යංචෝදිතව භික්ෂූහු වැඩ සවණ්හංස සමූහයා විසින් පිර
චරණලද ධ්‍රතරාෂ්ට හංසරාජයාසේ භික්ෂු සඞ්ඝතෙම ධම්මරාජන්වූ
බුදුන් පිරිවැරූසේක. එකල්හි දුන් උදරවූ ධම්මදේශනාවක්
වන්නේයයි සිතා එකතොහිම මහජනයෝද රැස්වූහ. ඒ දැක ප්‍ර
සන්න සිත් ඇතිව මහා අමාත්‍යතෙම බුදුන් ප්‍රමුඛ භික්ෂු සංඝයා
ප්‍රණීතවූ ඛාද්‍යභෝජ්‍යාදියෙන් සන්තර්පණය කෙළේය. භාග්‍යවතුන්
වහන්සේ කරණලද භක්තාකෘත්‍ය ඇතිව මහජනයාහට අනුක
ම්පාවෙන් බරණැස්හුවරවාසී මනුෂ්‍යයෝ රැස්වෙන්වයි අධිෂ්ඨාන
කළසේක. ඒ සියළු මහජනයෝ බුදුන්ගේ ඉර්ධානුභාවය හේ
තුකොට ගෙණ වහාම රැස්වූවාහ.

බොහෝ ප්‍රේතයෝ තමතමන්ගේ සුකීය ශරීරවලින් යුක්තව මහජනයාහට පෙනෙන්නටද අධිෂ්ඨානකෙළේය—එ කල්හි සමහර ප්‍රේතයෝ සුන්බුන් කුතුරෙදිකැබලිහැඳ ගෙන සමහරකෙනෙක් තමතමන්ගේ හිසකේවලින් වසාගත් ශරීර ඇතිවද සමහරෙක් නගනව ක්ෂාපිපාස දෙකින් මැඩෙනලදුව ඇට සම් පමනක්වූ ශරීර ඇතිවද ඔබිමොබ කරකැවෙමින් මහජ නයාහට ප්‍රත්‍යක්ෂ වශයෙන් පෙනුනාහ—එකල්හි භාග්‍යවතුන් වහන්සේ යම්සේ ඒ ප්‍රේතයෝ සියල්ලෝම එක තැනට රැසව ත මතමන් පුර්වයෙහි කරණලද අකුසල කම්මයන් ප්‍රකාශකොට කි යද්ද එසේ අධිෂ්ඨානකොට වදාලේය, ඒ බව දක්වන්නාවූ සංගිති කාරකයෝ මෙසේ කීවාහුය)—

(176) සාහුනනාවාසිනෝ එකෙ අඤ්ඤෙ කෙසනිවාසිනෝ
පෙතාහත්ථාය ගච්ඡන්ති පක්කමන්ති දිසොදිසං—

(177) දූරෙ එකෙ පධාවිත්වා අලඛාව නිවත්තරෙ
ඡාතාපමුච්ඡිතා භත්තා භූමියං පටිසත්ථමිහිතා—පෙ—

(178) යානි යානි හිනානි කුලානි කපනානි ච
තෙසු තෙසෙව වජ්ඣන්ති එසාමච්ඡරිනොගතීති—

(176) යම්තුසෙයින් සමහර ප්‍රේතයෝ කුතුවසඳ කැබලි හැඳ ගනද සමහර ප්‍රේතයෝ හිසකේවලින් ශරීරයන් වසාගෙණද මෙහි ගොස් නිසි ඉදුලක් හෝ වමනකල තැන්හි වැටි බතක් හෝ ගැබ්මල සෙම්සොට්ට ආදියක් හෝ යම් කිසි අහරක් ලබන්නෙමු නම් යෙහෙකැයි සිතා කිසි තෙනකට නොගොස් එතනව ඇහර පිණිස ඒ ඒ දිසාවෙන් ඒ ඒ දිසාවට බොහෝ දුරසැවූයේ නමුත් දුවති එලෙස ඒ අමාත්‍යතෙම දන්දුන් තෙනටද ආවාහුයය—

(177) එසේ දුවද සමහරෙක් කිසි ඇහරයක් හෝ පැනක්හෝ නොලැබ නැවතී ක්ෂාපිපාස දෙකින් පෙලෙනලදුව මුර්ඡාවී භ්‍රම ණයවී ගියගිය තැන මැවිපිඩ බිම හෙළුවා මෙන් වැටී නියම්කාල යෙහි ගින්නෙන් දවන්නාසේ පුර්වයෙහි කරණලද ඊර්ෂ්‍යාමාත්සර්‍යා දී අකුශල කර්මයන් හේතුකොට ගෙණ ක්ෂාපිපාසදුක් අනුභවකෙ රෙමින් මෙසේ කියන්නාහුය. අපි පුර්වයෙහි ග්‍රහස්ථාමීව සිටියෙමුව, කුලමානුව සිටියෙමුව, ධන වසකුව විද්‍යමානව නිබෙද්දී අපි අපට කුශල නැමති පිහිටක් නොකළෙමුව, බොහෝ ආහරපානයන්හි නිෂ්ප්‍රයෝජනේ උසුරුවාදෑමෙම්මුව, ප්‍රව්‍රජිතයන් පැමිණි කල්හි කිසිත් දෙයක් නුදුම්හ, අසත්පුරුෂයන් විසින් නොකටයුතු අකු

ශලයට කැමතිවූයෙමුව, සත්පුරුෂයන් විසින් කටයුතුවූ කුශල යෙහි අලසවූම්හ, බොහෝ මධුරාහාර කා අැවිද්දෙමුව, බත් පඩක් පමණවත් පිනට අනුන්ට නුදුම්හ, ප්‍රතිග්‍රාහකයන් පැමිණි කල්හි නින්දු පර්හව කෙලෙමුව, පුවීයෙහි අපි විසින් මමත්ව පවත්වා සිටි ගේදෙර වස්ත්‍රාභරණ දුසිදුසයො ආදිය දූනට අන්‍යයො පරිභෝග කෙරෙති, අපට එයින් කිසිත් දෙයක් නොලබෙයි, අපි පුවීයෙහි ක්‍රීඩාවෙහි ඇලි ඒ ගැණ චිත්‍රවත්ව සිට අපට පරලොවදි වැඩදුයක අනුත්තාමික කුසලයක් කරගන්ට නොදුන අකුසල් කරමින් සිට වසකුවත් හැරදම්ම අවුත් මේ ක්ෂුත්පිපාසාදි දුක් අනුභව කෙරීමට භාජනව සිටින්නෙමුව, මෙයින් චුතව මනුෂ්‍යලෝකයට ගියකල්හිද ඒත් අපට යහපත් උත්පත්තියක් නොලැබී එම අකුශලකර්මී විපාකාවසේසයෙන් නින්දු කටයුතු පිළිකුල් කටයුතුවූ කුඵ පොතු කුලයෙහි හෝ රථකාරකුලයෙහි හෝ චණ්ඩාල කුලයෙහි හෝ කප්පකුලයෙහි හෝ මිනුදොහිව ක්‍රපනව දුප්පත්ව ඉතාම බැහැපත්ව නැවත නැවත උපදින්නෙමුව.

(178) වෙනත් යම් යම් නිඤ්ඡිතවූ ගර්හිතවූ දුප්පත්වූ නේසාදෑනිව කුලයක් ඇද්ද මේ ක්ෂුත්පිපාස දුක් අනුභවකරමින් ප්‍රේත අපායෙහි සිට මෙයින් චුතවුත්තු කල්හි එබදු කුලයෙක උපදින්නෙමුව, මසුරු සිත් ඇතිභෙයින් කුසල් නොකොට අකුශල්කෙරෙමින් සිටියා, මසුරන්ගේ උත්පත්තිය මේ ප්‍රකාරවෙයි.

තවද පුවීජාතියෙහි මසුරුමල දුරුකොට දානාදී කුසල් කළ දැයකයෝ දිව්‍යලෝක පුරවති, එපමණකුත් නොවෙයි, කල්පවැකෂාදින්ගේ ආලෝකයෙන් බබලන්නාවූ නඳන වනාදියෙහි ආලෝකය තමතමන්ගේ වස්ත්‍රාභර්ණාදී ආලෝකයෙන් හා ශරීරාලෝකයෙනුත් මැඩපවත්වා තමතමන් බබලති, කැමති කැමති ලෙස කාමයන් ඇතිව දිව්‍ය විමානවල රමණයකොට එයින් චුතව මිනිස් ලොව භෝගසම්පත් ඇති ක්ෂත්‍රිය බ්‍රාහ්මණාදි උසස් කුලවල උපදින්නාහුය. තවද මිනිස්ලොව උපන් කල්හි කුටාගාරවලද ප්‍රාසාදවලද නොයෙක් අනඤ්ඤ පලස් අතුරණලද පය්‍යඞ්කවල දිලිහෙන්නාවූ ශරීර ඇතිව උසස් කුලවල උපන්නාවූ ඔවුන්ගේ යසපිරිවර ඇතිව මසුරපිජයන්ගෙන් ප්‍රතිමණ්ඩිත විජිනිගත් අත් ඇති මනුෂ්‍යයන් විසින් පිරිවරණලදුව නොයෙක් වස්ත්‍රාභරණ හා මල්වඛම්වලින් සරහණලදුව භූමියට නොබැස ඇකයෙන් ඇකයට යෙති, උදය සවස බාහිවරු උපස්ථානකෙරෙති, තවුතිසා දෙවුලොව තිබෙන සෝකරහිතවූ රම්‍යවූ නඳන වනො

දානය ආදී උතුන් උදෙසා නොකළ අයට නොවෙයි ඒ දෙය කුසල් කළ අයටමවෙයි. කුසල් නොකළ අයට මේලොව හෝ පරලොව හෝ නසිත් සැපයෙක් නැත කුසල්කළවුන්ට මෙලොව පරලොව දෙකහිම සැපවෙයි එහෙයින් ඔවුන්ට එකතුව උපදිනු කැමැත්තන් විසින් කුසල් කටයුතුය කරණලද කුසල් ඇත්තෝ දිව්‍ය භෝජනයන් ආනිව සඟහයෙන් සතුටුවෙන්නාහුය යි කියා ප්‍රේතයෝ කිවාහුය)

මෙසේ ඒ මේ ප්‍රේතයන් විසින් කරණලද අකුශල කම් වලව ලැබී නිබෙන දුක්ද කුසල් කළවුන්ට ලැබෙන දිව්‍ය ගතිය හා මනුෂ්‍ය ගතියද දිව්‍ය මනුෂ්‍ය සැපද ප්‍රකාශකරණ කල්හි කල තිරුණු සිත් ඇති කෝලිය අමාත්‍යයා ප්‍රධානව එහි රැස්වූ මහජනයාගේ ආධ්‍යාසයට අනුරූප පරිද්දෙන් බුදුරජානන්වහන්සේ විසතර වශයෙන් ධර්මදේශනා කළසේක—දේශනා කොළවර සවාසූදහසක් ප්‍රාණීන්ට ධර්මාභිසමය වූයේයි—මේ ප්‍රේතවස්තු ප්‍රකරණයෙහි තුන්වෙනි චූ වර්ගයේ පළමුවෙනි "අභිජ්ජමාන" ප්‍රේතවස්තුව කියා නිමවනලදි—

26 අභිජ්ජමාන ප්‍රේතවස්තුව දැක්වීම

——:x:x:——

තවද මේ ප්‍රේතවස්තු ප්‍රකරණයෙහි තුන්වෙන චූලවර්ගයේ දෙවෙනි "සානුවාසි" ප්‍රේතවස්තුව කෙසේදයත්? —ත්‍රෛලෝක්‍ය නිලතවූ සකල ජනානුකරවූ එහිකායමාන යසොවිසාලවූ ජගදේක මිතුවූ මාගේ සර්වඥරුවන්වහන්සේ රජගහනුවර ගොදුරුගම්කොට වේළුවනාරාමයෙහි වැඩවාසයකරවදාරණ කල්හි මේ ප්‍රේතවස්තුව දේශනාකළසේක—හේකෙසේද—

යටගිය දවස බරණැස් නුවර නිතව නම් රජතුමාගේ පුත්‍රතෙම උදෙන ක්‍රීඩාකොට නුවරට එන්නේ සුනෙත්ත නම් පසේබුදුන් පිඬු පිණිස හැසිර නුවරින් නික්ම වඩිනා දැක ඉසුරුමදයෙන් මත්ව සිතනුයේ මේ මුණ්ඩක තෙම මට ඇදිරිගෙන නමස්කාර නොකොට කෙසේ යේ දැයි සිතා දුශ්‍යවූ සිත් ඇතිව ඇතු පිටින් බැස තිමෙක්ද තෙපි පිණ්ඩපාතය ලද්දේදැයි කියා කථාකොරෙමින් පසෙබුදුන් අතින් පාත්‍රය ගෙණ පොළවේ හෙලා බින්දේය—එකල්හි පසෙබුදු රජතෙම හැමතැන්හි කම්පානොවන ප්‍රවෘත්ති ඇතිබැවින් නිසි විකාරයක් නැතිව කරුණාවෙන් විස්මිත්තව

සොමනස් තේත්‍රයහෙලා ඔහුදිසාවබලා වැඩසිටියේනමුදු නිස්කා
රණයෙන් උපන් ක්‍රොධයෙන් දුශ්‍ය සිත් ඇතිව කිමෙක්ද මා නි
තිව රජහුගේ පත් බැවු නොදන්නෙහිද තාගෙබැලිම මට කුමක්
කෙරේ දැයි කියා වරෙන් වරෙන් කියා කැඳවමින් ගියේය. ඔහු
එතනින් පටත්වූ මාත්‍රයෙහිම නරකාග්නි ඇති සැඟසවූ බලවත් ශ
රීර දුකයෙක් ඔහට උපන්නේය. හෙතෙම ඒ මහත් සන්තාප
යෙන් මැඩෙනලද ශරීර ඇතිව ඉතා බලවත් දුක්ඛවේදනාවෙන්
පෙලෙනලද්දේ මැරී ගොස් අවීචිමහනරකයෙහි උපන්නේය.

ඉතිතෙම එහි දකුණු පාශ්‍යයෙන්ද වම් පාශ්‍යයෙන්ද උඩු
කුරුවද යටිකුරුවදැයි බොහෝ ප්‍රකාරයෙන් පෙරලි පෙරලි සවා
සූ දහසක් හවුරුදු මුලුල්ලෙහි එහි පැසි එසින් චුතව ප්‍රේතලෝක
යෙහි අප්‍රමාන කාලයක මුලුල්ලෙහි ක්ෂුත්පිපාසාදි දුක් අනුභව
කොට එයින් චුතව මේ බුඩොත්පාද කාලයෙහි කුණ්ඩි නුවර ස
මීපයෙහිවූ කෙවුල් ගමෙක උපන්නේය. ඕහට ජාතිස්මරණඥා
නය පහලවූයේය. ඒ ජාතිස්මරණඥානයෙන් තමාගේ අනුසලයට
සුදුසුව අනුභවකළාවූ දුක් අනුස්මරණය කරමින් වයප්‍රාප්තවූයේද
අකුශලයට භයින් නොඇයන් හා සමග මස්බැඳිමටත් නොයන්නේ
ය. නැයෝ මස්බඳින්ට යන කල්හි මනුෂ්‍යයන් මරන්ව නොක
මැතියෙයින් සැඟවෙන්නේය, මස්අල්ලන දැල් ඉරාදමන්නේය,
දැල්වලට අසුව උන් ප්‍රාණිය ඇති මනුෂ්‍යයන් හැරගෙණ දියේ හ
රින්නේය. ඔහුගේ ක්‍රියාව තුරුස්නාවූ නැයෝ ඔහු ගෙයින් පව
කළාහුය, ඔහුගේ එක සහෝදර කෙනෙක් සෙනඟයෙන් ඔහුකෙ
රේ බැදුනාවූ සිත් ඇතිව වෙසෙයි, එසමයෙහි වනාහි ආයුෂ්මත්
ආනන්දස්ථවිරයන්වහන්සේ කුණ්ඩි නුවර ගොදුරුගම්කොට සාත්ත
වාසී පව්තයෙහි වාසයකරන්නේය.

ඉක්බිති ඒ කෙවුල් පිත්තෙම නැයන් විසින් හැර දමන
ලදුව ඔබ්මාබ කරකැවී ඇවිදිමින් ඒ ආයුෂ්මත් ආනන්දස්ථවිරයන්
හිඳිනා ප්‍රදේශයට පැමිණියේ, වලඳන වේලෙහි තෙරුන් ලඟට
ගියහ. ස්ථවිරතෙම ඔහුගෙන් විචාරා ආහර ඕනැබව දැන ඔහුට
බත් දී කරණලද භක්තකෘත්‍යය ඇති තෙරුන්වහන්සේගේ ධම්ම
කතාවෙන් ඔහු ප්‍රසන්නවූ සිත් ඇත්තේයයි දැන ඇවත නෙපි මහ
ණවවුදැයි විචාළසේක. එසේය ස්වාමීනි ඔහණවේදැයි කියේය.
අනඳ තෙරුන්වහන්සේ ඔහු ඔහණකරවා ඔහු හා සමග බුදුන්
ලඟට වැඩිසේක. එකල්හි බුදුරජානන්වහන්සේ ඔහු නිසා ආන
න්ද ස්ථවිරයන්ට වදුරණුයේ ආනන්ද මේ සාමණේරයාව අනුකම්පා

කරවයි වදුලෙ—ඒ සාමණේර නමද පෙරකුශල් නොකළබැවින් සිවුපසය නොලබන්නේවේ, එකල බුදුරජනෝ ඔහට අනුග්‍රහ කරම්න්ද භික්ෂූන්ට පරිභෝගය පණිසද කලවල පැන් පුරවන්ට නියමකළසේක—ඒ දක උපාසකයෝ ඒ නමට බොහෝ නිත්‍ය බත් නැබූවාහුය—ඒ සාමණේරනම මැනකාලයෙහි උපසම්පදාව අහිත්වයට පැමිණ තෙරුන්වහන්සේව භික්ෂූහු දෙලොස්නමක් හා සමග සානුවාසී පව්තයෙහි වැඩසිටින්නේය—ඒ භික්ෂූහුගේ මවුපියන් ආදී නැයෝ පන්සියයක් දෙනා රැස්නොකල කුශල් ඇතනාහු රැස්කරණලද අකුශල් ඇතනාහු මැරී හොස් ප්‍රේතව උපන්නාහුය—ප්‍රේතව උපන් මවුපියෝ මෙසේ සිතන්නාහු මෙනෙම අප විසින් ගෙදරින් නෙරපාදමනලද්දේ වනැයි සිතා ලජ්ජාවම්න් උන්වහන්සේ කරා නො එලඹ ගිහි කාලයෙහි ඔහුකෙරෙහි පළිබද සෙනහ ඇති සහොදරයන් යවුවාහුය, හෙතම තෙරුන්වහන්සේ ගමට පිඬු පිණිස වැඩකල්හි දකුණු දනමඩල පොලොවෙ තබා කරණලද ඇදිලි ඇතිව තමන් දක්වා "මාතාපිතා ච භතෙතා" යි යනාදිය කියේයයි—"කුණ්ඩිනාගරියොථෙරෝ" යනාදී ගාථාපස ධම් සංගාහකයන් විසින් නියනලද්දහ—

(179) කුණ්ඩිනාගරියො ථෙරෝ සානුවාසි නිවාසිකෝ,
පොඨපාදෙති නාමෙන සමනෝ භාවිතින්ද්‍රියෝ—

(180) තස්ස මාතා පිතා භාතා දුගතා යමලොකිකා,
පාපකම්මං කරිත්වාන පෙතලොකං ඉතෝ ගතා—

(181) තෙ දුගතා සුචිකථා කිලන්තා නගතිනෝ කිසා,
උත්තාසන්නා මහාතාසා න දසෙසන්ති කුරුරිනෝ—

(182) තස්ස භාතා විතරිත්වා නගෙහා එකපථෙකකෝ,
චතුකුණ්ඩිකෝ භවිත්වාන ථෙරස්ස දස්සයී තුමා—

(183) ථෙරෝ සා මනසී කත්වා තුණ්හිභූතෝ අපක්කමී,
සෝ ච විඤ්ඤුපයී ථෙර භාතා පෙතා ගතෝ අහං—පෙ—

(184) තව ඒණෙණන දුනෙන යාපෙසසන්ති කුරුරිනෝති—

(179) යිතුමෙයින් කුණ්ඩී නුවර උපන් පොඨපාදයයි යන නම් ඇති සානුවාසී පව්ත වැසි ශ්‍රමණයින්වහන්සේ ආයුෂ් මාගීය යෙන් වඩනලද සියලු ශ්‍රද්ධාදී ඉන්ද්‍රියන් ඇතිව අහිත්වූයේය—

(180) ඒ තෙරුන්වහන්සේගේ මව්පියෝද සහෝදරයෝද හැම දෙන අකුශල් කොට මිනිස් ලොවින් චුතව යමලෝක සඞ්ඛ්‍යාත ප්‍රේත අපායෙහි උපන්නාහුය. ඔහු කුණුවූ වසනුකැබලි හැඳ ඇඹිපිපාස දෙනින් පීඩිතව නගනව කෘශවූ ශරීර ඇතිව හිඳුකවුමල්

ප්‍රමාණ උගුරු ඇත්තාවූ කලානත්තවූ කාය චිත්තයෙන් යුක්තවූවාහු මෙසේ සිතන්නාහුය.

(181) මේ ශ්‍රමණතෙම අපගේ පුත්‍රයාය' එසේදවුවත් අප විසින් ගෙයින් නෙරපනලද්දේ නොවේදැයි යන සන්තාපයෙන් උත්‍රාසයට පැමිණ තමන් පුර්යෙහි කරණලද අකුශල කම්මයෙන් ඝටගත් මහා භය ඇත්තාවූ තමතමන්ගේ ශරීරයන් තෙරුන්වහන්සේට නොදක්වනි, ලඟට නොයෙති, දරුණු අකුශල කම්මඇති ඔහු තෙරහුගේ සම්මුඛයට නොඑලඹෙනි.

(182) ඒ සාතුවාසි තෙරහුගේ භාතෘතෙම නගනව එකපදික මාර්ගයෙහි ක්‍ෂුදකලාව සිටි නගනහෙයින් ලජ්ජාව සතරගානය බිම තබා අවුත් තමන් තෙරුන්වහන්සේට පෙනී සිටියේය.

(183) සාධ්වරතෙම ඔහු නොසලකා තුෂ්ණීම්භූතව ඉඳිකඟි යේය, එකල ඒ ප්‍රේතතෙම තෙරුන්වහන්සේගේ සොහොවුරු බව මෙසේ දැක්වූහ.

(184) සාධුමනි ක්‍ෂුඛවහන්සේගේ මැනියෝද මිනිස්ලොවදි අකුශල්කොට එයින් චුතව මේ ප්‍රේත අපායෙහි උපන්නේය. ඔවුන් දුකඩප්‍රාප්තව කුණුවූ වසඳ කැබලි හැඳ කලානත්තවූ ශරීර ඇතිව මනාවූ විලිවැසිලි නැතිහෙයින් නගනව ඇටසැකිලි පමණින් යුක්තහෙයින් කෘශවූ ශරීර ඇතිව මේ ශ්‍රමණතෙම අපගේ පුත්‍රයාය, එසේදවුවත් අපි ගෙයින් නෙරපණලද්දෙ නොවේදැයි යන උත්‍රාසයට පැමිණ තමන් පුර්යෙහි කළ අකුශල් අනුස්මරණයකරමින් ඝටගත් මහත්භය ඇත්තාවූ ඒ කෘර කම්මාන්ත ඇත්තාවූ ඔවුන් ක්‍ෂුඛවහන්සේට නොපෙණෙති. එහෙයින් සාධුමනි ක්‍ෂුඛවහන්සේ අපට අනුකම්පාකළමැණව, දන්දී අපට දක්ෂිණාව දුනමැණව, මේසේ මහත් දුක් අනුභවකරන්නාවූ ක්‍ෂුඛවහන්සේ විසින් දෙනලද ආහාරාදියෙන් යාපෘවන්නෙමු යයි නියේය.

ඒ අසාතෙරුන්වහන්සේ පිඬු පිණිස හැසිර පිඬපාතය ගෙනැවිත් අනික් භික්‍ෂූන් වූ ද්‍රෙලොස්නමක් දන් වැලඳීමට එකතු කොට භික්‍ෂූන්වහන්සේලාගේ පිඬපාතයත් ඉල්වාගෙණ මම නැසින් උදෙසා සඞ්ඝ ඛතක් දෙමියි කියා ඒ පිඬපාතයත් සංඝනා කොට දී මේ දක්ෂිනාව මාගේ මවුපියන්ට හා සොහොවුරු ආදී නැසින්ට ලැබේවා, මාගේ නැයෝ මෙයින් සුවපත්වෙත්වයි කියා දක්ෂිණාව දුන්නේය. තෙරුන්වහන්සේ විසින් දක්ෂිණාව දුන් කෙනෙහිම ඒ ප්‍රේතයින්ට පවිත්‍රවූ ප්‍රනීතවූ නොයෙක් රසවත් සූප

ව්‍යඤ්ජන සහිතවූ දිව්‍යභෝජන පහළවූයේය. එකල්හි සොහොවූරු නෙම කියනුයේ සවාමීනි අපි නුඹවහන්සේ විසින් දෙනලද දක්ෂිණාව හේතුකොට ගෙණ ශරීර වර්ණයා ශරීර ශක්තිය ඇතිව සුව පහ බොහෝ දිව්‍ය ආහර පැන් ලද්දෙමුව, එසේදවුව විලිවැසිලි නැතිහෙයින් නගනාව සිටින්නෙමුව, අපට වස්ත්‍ර ලැබෙන ආකාරයක් කළමැණවයි කිහ.

එකල්හි තෙරුන්වහන්සේ කසලගොඩවලින් වස්ත්‍රකැබලි එකතුකොට එසින් සිවුරුකොට සතරදිගින් වැඩි සංඝයාට සාංඝිකකොට දී මේ වස්ත්‍ර මාගේ නැයින්ට වේවා, මෙයින් මාගේ නැයෝ සුව පහයි කියා තෙරුන්වහන්සේගේ මවුපියන්ට හා සහෝදරාදී නැයින්ටද වස්ත්‍ර දක්ෂිණාව දුන්නේය, ඒ වස්ත්‍ර දක්ෂිණාව දුන් කෙණෙහිම දිව්‍යවස්ත්‍රපහළවූවාහ, එහෙයින් දිව්‍යවස්ත්‍ර හැඳ පෙරවා නැවත තෙරුන්වහන්සේට තමන් දක්වාසිට මෙසේ කියන්නේ.

සවාමීනි අපි දැන් ශරීරවර්ණ ඇතිව ශරීර ශක්ති ඇතිව "නන්දියර ජාතා" පහළවූ වස්ත්‍රවලටත් වැඩියෙන් අපට කෝසෙය්‍ය වස්ත්‍ර හා කඹලි කපුප්ළිද කොමුප්ළිද යන මේ වස්ත්‍ර ජාති විසාලවූ මහඟිව පහළවූවාහ. සවාමීනි අපට හින්නට ගෙයක් නැති බැවින් ඒ වස්ත්‍රාදිය අවකාශයෙහි එල්වමින් තිබෙයි, එහෙයින් යම් ආකාරයකින් අපට ගෙයක් ලැබේද එලෙස උත්සාහ ගතමැණවැයි කීයේය.

එකල තෙරුන්වහන්සේ කොල ගෙයක් තනා සතරදිගින් වැඩි සඞ්ඝයාට සාංඝිකකොට ඒ ගෙය දී මාගේ මවුපියන්ට හා සහෝදරාදී නැයින්වද මේ ගේ ලැබේවා, මාගේ නැයෝ මෙයින් සුවපත්වෙත්වයි කියා දක්ෂිණාව දුන්නේය, ඒ ක්ෂණයෙහි ඔවුන්ට දිව්‍යමයවූ කූටාගාර හා ප්‍රාසාදද කොට්ඨාස කොට්ඨාස වසයෙන් විභාග ඇතිව ප්‍රමාණ ඇතිව පහළවූයේය. එකල භාතෘතෙම කියනුයේ සවාමීනි මෙහි අපට ලැබී තිබෙන්නාවූ ප්‍රාසාදාදිය වැනි ප්‍රාසාදකූටාගාරාදියක් මනුෂ්‍යලෝකයෙහි නැත්තේය, දිව්‍යලෝකයෙහි කූටාගාර ප්‍රාසාදාදිය මෙන් මෙහි මේ ග්‍රහයනුත් හත් පසින් සතර දිසාවන් බබුලුවමින් තිබෙයි, එසේවීනමුත් සවාමීනි අපට පැන් නැත්තේය, අපට පැන් ලැබෙනසේ උත්සාහ ගතමැණවයි කීහ. ඒකල තෙරුන්වහන්සේ ඩබරාව පූරා පැන්ගෙණ සතරදිග සංඝයාවදී පින්දුන්නේය, එකතෙහි ඔවුන්ට දිව්‍යපැන් පහළවූයේය, ගාම්භීරවූ සතරැස්වූ සිහිල් ජලයෙන් පිරුණුවූ යහපත් තොටුපල ඇති පතෙව්නසලයෙන් ගැවසීගත් ජලය මතුයෙහි පිරුණුවූ මකුරඳුයන් ඇති පොකුණු පහළවූවාහුය, එනි නහා

පැන්බී තෙරුන්වහන්සේට පෙනීසිට කියන්නේ සවිඤ්ඤාණක අපවදිව්‍ය පැන් පහළවූයේය. අපි ඇවිදිනකල්හි ගල්බොරලු ආදිය ඇති තැ මිප්‍රදේශවල යන එන කල අපගේ පා බිඳෙයි පාදයන් රිදෙයි. ඒ හෙයින් අපට යානාවක් ලැබෙනසේ උත්සාහකළමැණවයි කියේ ය. එකල තෙරුන්වහන්සේ එක් සම්පවලයක් ඇතිව යහනක් සඤ්ඤාතකොටදී ඔවුන්ට දැක්ෂිණාව දුන්නේය, එකතෙණි රථයා නාදිය පහළව දව්‍යරථයෙන් අවුත් සිට කියනුයේ අප කෙරේ අනු කම්පාකොට බුඩවහන්සේ එයින් දෙතැදෙ ආහරයෙන්ද වසන්‍ත්‍ර ලින්ද ගඳවලින්ද දැනයෙන්ද යානවාහනදැනයෙන්ද සුක්‍රාවූ අපි සවාමිනි ලෝකයෙහි කරුණාවන්තයෙක්වූ බුඩවහන්සේට හා මස්කාර කරන්ට ආයෙමුයයි කීහ.

ඉක්බිති තෙරුන්වහන්සේ එපවත් බුදුරජානන්වහන්සේට සැළ කළසේක, භාග්‍යවත් බුදුරජානෝ ඒ කාරණය අනෝත්පත්ති කොට ගෙණ සාතුවාසි තෙරුන්වහන්සේට මෙසේ වදාරණසේක් මොවුන් යම්සේ දුක් අනුභවකළාහුවෙද්ද තොපිත් ප්‍රේතව ඉපිද එසේම දුක් අනුභවකෙළේවනැයි වදාරා තෙරුන්වහන්සේ විසින් ආරාධනාකරණලදුව "පුත්‍තප්‍රේතවසතුව" වදාරා සම්ප්‍රාජාපරිසට ධම්මදේශනාකොට වදාළේය. ඒ ධම්මදේශනාව අසා මහජන තෙම සංවේගජාතව දැනශීලාදි පුණ්‍යකම්යෙහි ඇළෙනයි. එබා ශ්‍රද්ධාවන්තවරුනි එකදෙයකින් සියල්ලම් පහලවීම බොහෝසේ තු පුළුවන් බව මෙයින් තේරුන්ගෙණ ඤාතිප්‍රේතයින්ට අනුකම්පාක රන්නවුන් විසින් මෙසේ අනුකම්පා කටයුතුයයි දතයුතු. මේ ප්‍රේතවසතු ප්‍රකරණයෙහි තුන්වන වූල වගීයේ දෙවෙනි සාතුවාසි ප්‍රේතවසතුව නියා නිමවන ලදී.

27 සාතුවාසි ප්‍රේත වසතුව නිමි.

——oo——

මේ ප්‍රේතවසතුප්‍රකරණයෙහි තුන්වන වූලවගීයේ තුන්වෙනි රථකාර ප්‍රේතවස්තුව අතෝත්තර සතමගල්‍ය ලක්ෂණ යෙන් විරාජමාන ශ්‍රීපාදපතම ඇති බුදුරජානන්වහන්සේ සැවත් නුවර ජේතවනාරාමයෙහි වැඩවාසයකර වදාරණකල්හි දේශනා කරණ ලද්දේය. කෙසේදයත්? යටගිය දවස කාශ්‍යප බුදුන්ගේ කාලයෙහි එක්තරා සහ්‍යක් තොමෝ ශීලාචාර සම්පන්නව කලත ණ මිත්‍රයන් ආශ්‍රයකෙරෙමින් සාසනයෙහි අතිප්‍රසන්නවූ එසහ්‍යිකා මෝ මනාව කොටඳාශ්‍රවසඉයන් බෙදනලදුව විසිතුරු භාෂිත සෝ

පාන භූමිතල ඇති ඉතාම දර්ශනීයවූ එක් ආවාසයක් තනා එහි භික්ෂූන් වැඩහිඳුවා ප්‍රනීතාහාර වළඳවා ඒ ආවාසය භික්ෂු සංඝයාට පූජාකෙළේය. ඕතොමෝ මැතකාලයෙහි මැරී චෙනින් අකුශල කර්මයක්නුගෙවශයෙන් හිමාල පර්වතයෙහිවූ රථකාර විල ඇසු මීපයෙහි විමාණප්‍රේතියෙකු උපන්නිය.

ඒ සංඝයාට දුන් ආවාසයාගේ පුණ්‍යානුභාවයෙන් ඇට සවිරතනමයවූ උදුරවූ භාන්පසින් ඉතාම පැහැදිලි ඇති මණිඟ රවූ රම්‍යපොකුනුවලින් යුක්ත නානුනොඳුනය සදුසව සෝභාමා ණවූ උයන්වලින් පරිවාරිතවූ විමානයක් පහළවූයේය. ඇඳ සු වණ්ණවණ්ණ චිසිඟට රුඇතිව ප්‍රසාද එලවිම් ඇතිවූයේය එහිසුඛියන් නැතිව දිව්‍යසම්පත් අනුභව කරමින් වාසය කරන්නිය බොහෝ කාලයක් මුළුල්ලෙහි දුඃඛියක්නැතිව වාසයකරනනාවූ ඇගේ සිත කලකිරුනේය. මෙසේ ඇ කලකිරිලල ඇතිව පුඃඛියෙක් හෙන්වා ගන්ට උපායක් ඇතැයි සිතා අඹ එල හැර ගෙණ ගඟට දමන්නි. නොකී සියලල කණිමුඩ ප්‍රේතවසුවෙහි ආනුම්යෙන් දතයුතුය. මෙහි බරණැස්වැසි එක් පුඃඛියෙක් එක් අඹගෙඩියක් දැක ඒ ගෙණ පරීක්ෂාකොට බලා මධුර රසයෙසින් ක්‍රමයෙන් හිමා ලවනයට ඒ ගඟා අනුසාරයෙන් ගොස් ඇ වාසයකර්ණ තැනට ගියේය. ඒ විමාණ ප්‍රේතිතොමෝ ඔහු දැක තමාගේ වාසස්ථානයට ගෙණ ගොස් පිලිසඳර කථාකරමින් හුන්නේය. ඒ මාණවක තෙම ඇගේ වාසස්ථානාදි සම්පත් දැක මෙසේ විචාරන්නේය.

(185) වෙළුරියථමහං රුචිරං පහසසරං
විමාණමාරුයහ මනෙකචිත්තා
කඤචිජසිදෙව මහානුභාවෙ
පථදනි පණණා රසොවචනෙතු.

(186) වණණා ච තෙ කනකසස සන්නිභො
උගගතතරුපො භුසදසසනීයො
පලලඞකසෙටඨ අතුලෙ නිසිනනා
එකා තුවං නන්දී ව තුයහසාමිකො. පෙ.

(187) ඉදං විමාණං විරජං සමෙයිතං
උයහණවනනං රතිනන්දි වඩඪනං
ඉචඡාම තෙ නාරි අනොමදසසනෙ
තයා සහ නන්දනෙ ඉධමොදිතුන්ති.

(185) යුතුහෙයින් දිව්‍යාභරණාවෙනි වෛඩූර්‍යමණිමයවූ කනු ඇති පවිත්‍රවූ ප්‍රභාඹරවූ නොයෙක් ලෙසින් විසිතුරුවූ විනා

රැඳුව ආකාසයෙහි බබලන පුණ්‍යවතු දිව්‍යරාජයාසේ ජෙතවනාව මේ විමාණයෙහි හිදිනාවූ ඇත් ආනුභාව ඇති දිව්‍යඝනාවෙනි.

(186) ඕ ගේ ශරීර වර්ණයද සවණ් වර්ණවෙයි උගහනයයි කියනලදඉතිසවණ්‍යක්සේදවෙයි විශෙෂයෙන් දැකිණහිවෙයි අතුලාවූ උතුම් පය්‍යඞ්කයෙහි තොප හුදකලාව ඉනෙනාව නිව සවාමියෙක් නැත්තේය තවද මේ විමාණ ගාත්පස්හි තිබෙනනාවූ පුෂ්කරණී හුද බොහොවූ කමල පුවල පුණ්ඩරීකයෝද ඇත්නාහ සවණ්වණ් වැල්වලිඳු හැවසීගත්නාහ එනි පංචිකඛලලාදිඳු නැත්තේය පොකුණුවල හැසිරෙණ මේ හංසයෝද දැකීනාහිය මනොරම්‍යවනනාහ නිතග පුෂකරණීවලේ හැසිරෙණ හංසයින්ගේ දිව්‍ය හෙරිණද සෙය්‍යපිඛ්නාවූ මධුරනාද ඇත්තේය ඉතාම බබලනනාවූ ශරීරවණ් අතිව එසේම ජෙනිඃත්වූ සවණ්නාවුකාවෙක මහසී පය්‍යඞ්කයන්හි හිඳ ජලක්‍රීඩා කරන්නිය එල්බි සිටින්නාවූ දිකුවූ අක් බඹරුවු ඇසකෝ ඇතැනිය සිනහාවෙන්සුත් මුහුනු ඇතැනිය ප්‍රියවචන කියන්නිය සුඳුරඅග ප්‍රත්‍යඟයක් ඇතිව විශෙෂයෙන් බබලන්නිය

(187) මේ තිගේ විමාණය නිදෙසි සමවූ භූම් ප්‍රදේශයෙහි පිහිටියේය නන්දනවනයෙන් යුකතවෙයි සැපහා ප්‍රිතිවඩනෙනය සම්පුණ්වූ අහප්‍රත්‍යඟයන්ගේ මනාවූ දැකීන ඇති සත්‍යාවෙනි තිහාස මග ඒ මේ විමාණයෙහි ඇලිවාසයකරන්ට කැමැත්තොම් තියේය එකල්හි විමාණ ප්‍රේතිය කියන්නී මෙනි උත්පත්ති කෙරීමට සැහෙත්නාවූ කුශලකම්මයක්කරව නොපගේ චිත්තයද මෙහි උත්පත්තියට යොමුකරව මෙසේ ඇතිකල්හි සියළු කාමයෙන් සම්පුණ්වූ මා ළඟනාඇයි කියා ඒ මානවකතෙම විමාන ප්‍රේතියගේ වචය අසා එයින් මනුෂ්‍යපථයට අවුත් එහි උත්පත්තිය පිණිස සිත පිහිටුවා උත්සාහ ඇතිව පින්කම් කොට නොබෝ කලකින්ම මැරීගොස් එහි උපත්තේය මෙසේ පින්කොට ඒ විමාණ ප්‍රේතියගේ විමාණයෙහි ඇවඑකතුව ඉපිද ඒ දෙදෙනා බොහෝ කාලයක් මුලුල්ලෙහි දිව්‍යසම්පත් අනුභවකරණ කල්හි ඒ දිව්‍යපුත්‍ර තෙම කුශලකම්මය ක්ෂයවීමෙන් කාලක්‍රියා කළසේක සත්‍රී නොමෝ තමන් කළ කුශලකම්මය නිසි පුන්‍යක්ෂෙසත්‍රනිහි කළ බැවින් එක් බුඩානන්තරයක් මුලුල්ලෙහි එහි සම්පත් විඳදේය

ඉක් බිත්තෙන් අප බුදුරාජනෝ ලොවපහළුව පවතින ලද උතුම් දම්සක් ඇතිව කුමයෙන් වැඩ ජෙතවනාරාමයෙහි වැඩවාසයකර වදාරණකල්හි ආයුෂ්මත් මොග්ගලානයනාඃ ථිරයන්

වහන්සේ එක් දවසක් පවිතචාරිකාවෙහි වඩනාසේක්,ඒ විමාණ ය හා විමාණ ප්‍රේතියද දැක-"වෙළුරියථමහං රුච්රං පහසසරං" . ය නාදී ගාථාවලින් විචාලේය,ඕතොමෝදමොදහලත්‍යඝනසාවිරයින්ව මුල පටන් තමාගේ සියලු ප්‍රවෘත්තිය කීයේය. ඒ අසා තොරුන්ව හන්සේ සැවැත්තුවරට වැඩ එපවත් බුදුරජනන්වහන්සේට සැල කලේය, බුදුරජනෝ එම අත්‍යෝත්පත්තිකොට ගෙණ සම්ප්‍රාපත පිරිසට ධම්මදේශනාකළසේක)-----එම ධම්මදේශනාව අසා මහජ නතෙම දානාදි පුණ්‍යකම්මයන් කොට ධම්යෙහි ඇළුනේවේ----- මේ ප්‍රේතවස්තු ප්‍රකරණයෙහි තුන්වන වූල වග්ගයේ (තුන්වන) රථ කාර ප්‍රේතාවස්තුව කියා නිමවනලදී-----

28 රථකාර ප්‍රේත වස්තුව නිමි-----

—:*:—

කිවද මේ ප්‍රේතවස්තු ප්‍රකරණයෙහි තුන්වන වූල වග්ගයේ සතරවෙනි භූතප්‍රේත වස්තුව කවරහයත්?-----එක් සමයෙක්හි නම්මලවූ පස්පැදිස්නා ඇස්ඇති දිපදෙත්තාමවූ සච්ඡුරාජෝත්තාම යානන්වහන්සේ සැවැත්තුවර ජෙතවනාරාමයෙහි වැඩවසන කල්හි-----සැවැත් තුවරට තුදුරුවූ එක් ගාරා ගමෙක්හි එක් සොර වෙලෙන්දෙක් සොරමනා ආදයෙන් වෙලඳුම්කරමින් ජීවිකාවකෙ රෙයි-----හෙතෙම හැල්වී බොල්හැරගෙණ තඹමැටි තවරා බර කොට රත්හැල් සමඟ විකුනන්නේය-----ඔහුගේ පුත්‍රතෙම ගෙදි රට ආවාවූ මාගේ මිත්‍රයින් හා සුහෘදයින්ට ගරුකාර නොකරන් නේයයි කියා කුපිතව එසරුහැම් සම්පට හැරගෙණ මවගෙ ඔසට ගැසුය, ඒ වෙලෙන්දුගේ යෙහෙලිතොමෝ හැම පිසතුබූ මාංසකා නාවත ඔවුන් විසින් විචාරණලදුව ඉදින් මා විසින් ඒ මාංස කන ලද්දේ නම් ඥතිජනිවල තමාගේ පිට මාංස කඩකඩා කනනාට ල බවයි කියා දිවුලේය-----ඔහුගේ භාය්‍යාතොම යම් කිසි උපකර ණයක් ඉල්වා ආවුන්ට එදෙය අප ගෙයි නැත කියා නැවත නැව ත ඉල්වනකල්හි ඉදින් නිබාගණ නැතැයි කියන්නේවිනම් උපන් උපන් තැන්වල අසූචි කන්ට ලබම්වයි කියා බොරුවෙන් දිවුලේය, මෙසේ ඒ සතරදෙන මැතකාලයෙහි මැව් ගොස් මහා වනානතු යෙහි ප්‍රේතයෝව උපන්නාහුය, ඔවුන් අතුරෙන් සොර වෙළඳ තෙම තමන් කළ අකුශලකම්මවිපාකයෙන් ගිනිගෙණ දිලිහෙන රත්හැල් බොල් දැනින්ගෙණ හිස්මුදුනේ උපුරුවාහ නිමිත් මහත් දුක් අනුභවකෙරෙයි-----

ඔහුගේ පුත්‍රතෙම මැනියන්ට රැහැනින් ගැසූ අකුශල කර්මය හේතුකොට ගෙණ මුගුරු හැරගෙණ තමන්ගේ ඖසබ්දග ණ්මින් මහත් දුක් අනුභවකරෙයි. ඔහුගේ යෙහෙළිතොමෝ හොර මාංස කා නැතැයි කියා බොරු දිවුළ අකුශලකර්ම විපාක යෙන්. ඉතා තීක්ෂණවූ මුවහත් ඇති මඟඩ දික්වූ නියවලින් ත මාගේ පිට මස් කඩ කඩා කමින් අප්‍රමාන දුක් අනුභවකරන්නිය.

ඔහුගේ භාර්‍යාතොමෝ පූර්වයෙහිදී කරණලද අකුශල කර්ම විපාකය හේතුකොට ගෙණ ඇට සුවඳවඩ පවිත්‍රවූ පඟවූ කළයහල් ඇති පළිඟෙලවූ හැල්සාලේ බත එලවනලද මාත්‍රයෙ හිම නානාප්‍රකාර පණුවන්ගෙන් ගැවසියත් පරමදුර්ගන්ධවූ පළි කුල්වූ අසූචිහාවයට පැමිණෙයි. ඕතොමෝ ඒ අසූචි දැතින්ගෙණ අනුභව කරන්නිය. මෙසේ ඒ සංසාරදෙන ප්‍රේත අපායේ ඉපිද මහත් දුක් අනුභවකෙරෙමින් සිටිනකල්හි ආයුෂ්මත් මහාමොඟ ලානයනස්ථවිරතෙම පවිතාචාරිකාවෙහි වඩනාසේක් එක් දවසක් ඒ ස්ථානයට ගියසේක, එහිදී ඒ ප්‍රේතයන් දැක මෙසේ විචාරන් නේය.

(188) භුසානිඑකෝ සාලි පුනාපරෝ
අඤ්ඤානාරිසකමංස ලොහිතං
තුවවගූථං අසුචිං අකන්තිනං
පර්හුජ්සිකිස්ස අයං විපාකොති.

(188) යම්තුහෙයින් තොපි අනුරෙන් එකෙක් ගිනිගෙණ දිලි හෙන හැල්වීබොල් හිසෙහි උසුරුවාගණ්මින් දුක්විඳින්නේය, එකෙකනෙක් සම්මුගුරුවලින් තමාගේ හිසට ගසා හිස බිඳහණ් මින් දුක් විඳින්නේය, අනික් ස්ත්‍රියක් තොමෝ තමාගේ පිටමාං ස කඩ කඩා කන්නිය, තොපි අපවිත්‍රවූ අමනාපවන්නාවූ අසූචි අනුභව කරන්නිය, තෙපි සතරදෙනා මෙසේ දුක් අනුභවකරන් නේ කුමණ අකුශල කර්මයක්හුගේ විපාකයෙක්දැයි විචාළේය.

මෙසේ තෙරුන්වහන්සේ විසින් ඔවුන් පූර්වයෙහි කරණ ලද අකුශල කර්මයන් විචාළ කල්හි සොරවෙලද භාර්‍යාතොමෝ ඒ හැමදෙන විසින් කරණලද අකුශලකර්මයන් ප්‍රකාශකොට කියන්නී.

(189) අයං පුරෙ මාතරං හිංසති අයං පන කුට වානිජෝ
අයං මංඡානි ඛාදිඛා මුසාවාදෙන වවෙසි.

(190) අහං මනුස්සෙසු මනුස්සභූතා අගාරිනිසබ්බකුලසඞ්ඝසරා
සන්‍යාසු පරගුයෙහම් මාකාව් ඉතො අදං

(191) මුසාවාදෙන ජාදෙම් නහී එතං මමගොහෙ,
සචෙසන්‍යතං නිගුයෙහම් ගුථොමෙ හොතු හොජනං

(192) තස්සකම්ම විපාකෙන මුසාවාදස්ස චූභයං,
සුගන්‍ධං සාලිනොභන්‍යතං ගුථං මෙ පරිවත්තති

(193) අවඤ්ඤානිව කම්මානි නහිකම්මං විනස්සති,
දුගන්‍ධං කිමිනං මිළ්හං භුඤ්ජාම් ච පිවාමිවාති

(189) යනුහෙයින් සවාමිනි මෙතෙම පුවිජනියෙහි රැහැණ කන් මැනියන්ට ගැසුයේය, මෙතෙම වචාවෙන් රවටා වෙළඳුම් කල කෙනෙක, මොතොමෝ සොරමාංස අනුභවකොට බොරු ඒවූ ගැහැණියක

(190) මම මනුෂ්‍යලෝකයෙහි මනුෂ්‍යඝන්‍යයක්ව ඉපද ගෙට සවාමිව ප්‍රධානව සිටිනකල මාසන්‍යතක දෙසින් කිසිවක් අනුන්ට නුදුන්නෙමි

(191) යමෙක් යම් දෙයක් මාගෙන් ඉල්වූ කල්හි ඒ දෙය මා තේගෙයි නැතායි කියා බොරුවෙන් වැසුයෙමි, නැවතනැවත ඉල්වන කල්හි ඉදින් තොපි ඉල්වූ දෙය තබාගෙණ සහවන්නෙම් නම් මට අසූචි අනුභවකරන්ට වෙයි නියෙමි

(192) ඒ අකුශල කම්මයාගේද බොරු කී අකුශල කම්යාගේද විපාකයෙන් සුවඳ හැල්සාලේ බත් මට අසූචි බවට පැමිනෙයි

(193) සවාමි ඒ හේතුව මුල්ව රැස්කරණලද කම්ම විපාක නොදී නිස්ඵල්වන්නේ නොවෙයි විනාසනොවෙයි, මා විසින් පුවීයෙහි කරණලද අකුශල කම්මයෙන් දුගීහිවූ පණුවන්ගෙන් ගැවසීගත් අසූචි අනුභවකෙරෙම්, අසූචි භක්ෂනොම් කියේය

මෙස් තෙරුන්වහන්සේ ඒ ප්‍රේතියගේ වචනය අසා එපවත් භාග්‍යවතුන්වහන්සේට සැලකළේය භාග්‍යවත් බුදුරජනෝ ඒ අපෝත්පත්තිකොට ගෙණ සම්ප්‍රාපන පිරිසට ධම්දේශනා කළසේක ඒ ධම්දේශනාතොමෝ මහාජනයාහට සාර්ථක වූවාය මේ ප්‍රේතවත්‍ථු ප්‍රකරණයෙහි තුන්වෙනි චූල මිගීහයේ සතරවෙනි භූස ප්‍රේතවත්‍ථුව නිගමනිමවන ලද්දේය

29 භූස ප්‍රේත වස්තුව නිමි.

—×—

තුවද මේ ප්‍රේතවස්තු ප්‍රකරණයෙහි තුන්වෙනිවූ චූල වග්ගයේ පස්වෙනි කුමාර ප්‍රේතවස්තුව කවරහයත්? සතරාමර නගර රසාගත කවනියකනනත ශරීර කාන්තියෙන් මුලුලොව බබුළුවන්නාවූ සව්ඥරාජෝත්තමයානන්වහන්සේ සැවැත් නුවර පෙත වනාරාමයෙහි වැඩවාසයකර වදුරණසේක්ම එකල්හි සැවැත් නුවර වනාහි බොහෝ උපාසකවරු එකතුව නුවර මහත් මණ්ඩපයක් කරවා ඒ මණ්ඩපය නානාවර්ණ වස්ත්‍රවලින් අලංකාර කොට කලින්ම බුදුන් සහිත සඞ්ඝයාට ආරාධනාකොට වැඩමවා ගෙණවුත් මහාඝ පසතුරුණු අතුරණලද ආසනවල බුදුන් ප්‍රමුඛ භික්ෂුසඞ්ඝයා වැඩහිඳුවා ගඳ මල් ආදියෙන් පූජාකොට මහදන් දුන්නාහුය.

ඒ දැක මසුරුමලින් වැලඳගත් සිත් ඇති එක්තරා පුරුෂයෙක් තෙම ඒ සත්කාර ඉවසන්ට නොහැකිව මෙසේ කීහ. මේ සියල්ල කසලගොඩෙහි දමනලද්දේනම් උතුම් වෙයි, මේ මුණිඋකාසින්ට දෙනලද්දේ උතුම්නොවෙයි කීහ. ඒ අසා උපාසකවරු කලකිරුණු සිත්ඇත්නාහු මේ පුරුෂයා විසින් ඒකාන්තයෙන් දරුණු අකුශලයක් රැස්කරණලද්දේය, බුදුන් සහිත භික්ෂු සඞ්ඝයා කෙරෙහි අපරාධ කළේයයි නොයා නැවතා ඒ ප්‍රවෘත්තය උපාසකවරු ඔහුගේ මැනියන්ට කියන්නාහු තිගේ පුතා ලවා ඤාති ඉල්වා ශ්‍රාවක සඞ්ඝයා සහිතවූ බුදුන් ක්ෂමාකරවයි කීවාහුය. ඕතොමෝ යහපතැයි ප්‍රතිවචනදී පුත්‍රයා භයගන්වමින් තේරුන්දී භාග්‍යවතුන් හා භික්ෂු සඞ්ඝයා කරා එලඹ පුත්‍රයා විසින් කරණලද වරදකියමින් ක්ෂමාකරවා භාග්‍යවත්හට හා භික්ෂු සඞ්ඝයාහට සත් දවසක් මුලුල්ලෙහි යාගුදානයෙන් පූජා කළේය. ඇගේ පුත්‍රතෙම නොබෝ කලකින් මැරී ගොස් කිළිටු කම්මාන්තකොට ජීවිකා කරන්නාවූ වෙශ්‍යාවකගේ කුස උපන්නේය. ඕතොමෝද ඔහු උපන් කෙණෙහිම දරුවෙක්බව දැනම් කසලගොඩෙහි දැමූවාය. එතෙම තමාගේ පුණ්‍ය බලයෙන්ම ගන්නාලද ආරක්ෂා ඇතිව නිසිවෙකු විසින් උපද්‍රව නොවනලදුව මැණියන්ගේ ඇකයෙහි මෙන් සුවසේ නිදාගත්තේය. දෙවියෝ ඔහුට ආරක්ෂා ගත්තාහුයයි කියති.

ඉක්බිති භාග්‍යවත්තෙම එදවස පෙරවරු වේලෙහි මහා කරුණා සමවතින් නැගිට බුඩඤාණයෙන් ලොව බලා වදුරණසේක්ම ඒ දරුවා සොහොනෙහි දමනලද්දවුත් දැක සුගතීන්

උදෑවෙන වේලෙහි සොහොනට වැඩිසේක—ශාස්තෘන්වහන්සේ මෙහි වැඩිසේක, මෙහි කාරණයක් ඇත්තේයයි සිතා මහජනතෙ මේද රුස්වූයේය—භාග්‍යවත්තෙම පිරිස රුස්වූකල්හි මෙසේ වදාරණසේක් මේ දරුවා දුන් සොහොනෙහි දමා ලදුව අසරණ වූයේවිනමුත් මේ දරුතෙම නිහතුකවයුත්තෙක් නොවෙයි, මහු ඉහාත්මහාවයෙහි සහ පරලොවදීද උදාරවූ සම්පත් ලබන්නෙ කැයි වදාළ කල්හි ඒ මිනිසුන් විසින් සැමියිනි මොහු විසින් පුවි ජාතියෙහි කුමණ කර්මයක් කරණලදදැයි විචාළහ—එවිට බුදු රජානෝ වදාරණසේක් ජනසමූහයා එකතුව බුදුන් ප්‍රමුඛ භික්ෂු සඞ්ඝයාහට උදාරවූ පූජාකෙළේය—එකල්හි ඒ පූජාවෙහි මොහුගේ සිතට මාත්සර්‍ය්‍ය ඉපදී පරුෂ වචන කීයේයයි මේ ආදී වශයෙන් ඒ දරුවා විසින් කරණලද කර්මයද මහු සම්පත් ලබන බවද ප්‍රකාශකොට රුස්වූ පිරිසගේ ආධ්‍යාසයානුරූපවූ පරිද්දෙන් ධර්ම දේශනාකොට මත්තෙහි චතුස්සත්‍ය ප්‍රකාශකොට වදාළසේක—චතුරාර්‍ය්‍යසත්‍ය දේශනාකෙළවර සවාසූදහසක් ප්‍රාණීන්ට ධර්මාභි සමයවූයේය—

ඉක්බිති අසූකෝටියක් නිධානගතවූ සම්පත් ඇති කෙළෙඹි පුත්‍රයෙක්තෙම බුදුන් ලඟදීම මාගේ පුත්‍රයායයි නියා ඒ ලද රුවා හැරගත්තේය, භාග්‍යවත් තෙමේද මෙපමණකින් මේ ලද රුතෙම ආරක්ෂාවන ලද්දේය, මහජනයාටද අනුග්‍රහකරණ ලද් දේයයි සිතාවදාරා විහාරයට වැඩිසේක—ඒ කුමරුතෙම වැඩිවියට පැමිණ සිටින අතර ඒ කෙළෙඹි පුත්‍රයා කාලක්‍රියා කළකල්හි ඔහු විසින් දෙනලද ධනය පිළිපැද කුටුඹ සණ්ඨාපනයක් කොට එම නුවර මහසම්පත් ඇති ගෘහපතියෙක්ව දැනාදී කුශලයෙහි ඇලුනේවේ—ඉක්බිත්තෙන් භික්ෂුන් දම්සභාවෙහි රැස්ව හිඳ කථාවක් ඉපදෙවූවාහුය. ඒකාන්තයෙන් විස්මයෙක, ශාස්තෘන්වහන්සේ සර්‍වඥයන් කෙරෙහි අනුකම්පා ඇත්තෙක, ඒ ලදරු තෙමේද ඒ කාලයෙහි අසරණව සිටියේය, බුදුන් නිසා දැන් මහත් සම්පත් අනුභවකරන්නේය, උදාරවූ කුශල් දකරන්නේයයිකථාකළාහුය—ඒ අසා ශාස්තෘන්වහන්සේ වදාරණසේක් මහණෙනි මොහුට සම්පත් මෙපමණෙක් නොවෙයි, අනිකෙකුදු ඇත ආයු කෙළවර මැරී ගොස් තව්තිසා දෙවුලොව ශක්‍රවිව්‍යරාජයාහට පුත්‍රයාව ඉපිද මහත් දිව්‍යසම්පත්ද ලබන්නේයයි වදාළේය—

එ‍ම් අසා, භික්ෂුහුද මහජනයෝද මෙසේ නියත්නාහු ශාස්තෘන්වහන්සේ ඒ ලදරුවාට සිඩවන මේ අභිවෘඩිය දුක දිඹිදර

මීවූ බුදුරජනෝ උපන් විටම අඹුසොහොනෙහි දමනලද ඔහු ලඟට වැඩ ඔහුව සංග්‍රහකෙළේයයි, ශාස්තෘන්වහන්සේගේ ගුණ විශෙෂයට සතුතිකොට ඒ ආත්මේ ඔහුගේ ප්‍රවෘත්ති කථාකළාහු ය—ඒ බව දක්වන්නාවූ සංගීතිකාරකයෝ මෙසේ කීවාහුය—

(194) අථෙරරූපං සුගතස්ස ගුණං
සුත්වා යථා පුග්ගලං චක්ඛාසි
උස්සන්නපුඤ්ඤූපි භවන්තිහෙකෙ
පරිත්තපුඤ්ඤූපි භවන්තිහෙකෙ,
අයං කුමාරෝ සිවථිකායජ්ඣිතෝ
අහුවඪ්ඪෙනහෙන ඨාපෙතිරත්තිං—

(195) න ගන්ධහුතා න සිරිසපාවා
විහෙඨයෙය්‍යුං කතපුඤ්ඤකුමාරං
සුනඛාපියෙ ඉමස්සපලභිංසුපාදෙ
ධංකාසිගාලා පරිවත්තයන්ති—

(196) ගණ්හාසයං පක්ඛිගණාහරන්ති
කාකා පන අක්ඛිමලං හරන්ති
න ඉමස්සරක්ඛං විදහිංසු කෙචි
න*ලාසථංසාසප ධූපනංවා—

(197) නක්ඛත්තයොගංපන උග්ගහෙසුං
නසබ්බඤ්ඤූනිපි ආනිර්ංසු,
එතාදිසංඑතම්මනිච්ඡපත්තං
රත්තාභතංසිවථිකායජ්ඣිතං—

(198) නොඋතපිණ්ඩං වියචෙඩමානං
සයංසයං ජීවිත සාවසෙසං
තමද්දස දෙවමනුස්සපූජිතෝ
දිසාවනං චක්ඛරි භූරිපඤ්ඤූ—

(199) අයං කුමාරෝ නගරස්සිමස්ස
අග්ගාකුලේ භවිස්සති භොගතොච
කිසස්සවතං කිංපන බ්‍රහ්මචරියං
කිසස්සුචිනාස්ස අයං විපාකො
එතාදිසං ව්‍යසනං පාපුනිත්වා
තංතාදිසං පච්චතු හොස්සතීති—

---

* "නසනං" කියාත් ඇතැම් පොත්වල.

(194) යම්තුහෙයින් උපන් කේණෙහි සොහොනෙහි දමනලදුව අසරණවනාව හුන් කුමාරයාහට මතුවනනාවූ අභිවෘඩිය ප්‍රකාශකොට වදාළේද එහෙයින් බුදුරජනන්වහන්සේගේ ඝුණය ආශ්චර්‍ය්‍ය අද්භූතවූ අන්‍යයන් හා සාධාරණනොවූ අතුල්‍යවූ විශාල ඝුණයක් වන්නේයයි මේ ලෝකයෙහි සමහර පුද්ගලයෝ උසස් නනාවූ කුශලකර්මයන් ඇත්තාහ, සමහරෙක් ඍෂිසත්‍රසමපත් ආදියෙන් පූර්ණයය, මහත් ආනුභාව ඇති බැවින් උදුර කුශල් ඇත්තාහ, සමහර පුද්ගලයෝ සුවල්ප කුශල ධර්මයන් ඇත්තාහ, සොහොනෙහි දමනලද මේ කුමරුතෙම දේවතාවන් විසින් ඇඟිල්ලෙන් වගුරුවනලද ක්ෂීරපාණයෙන් රාත්‍රි ජීවත්වූයේය.

(195) පූර්ව කරණලද කුශල් ඇති මේ කුමාරයාහට යක්ෂයින් හා පිසාචයන්ද නාගාදී සර්පයෝද සුනඛයෝද හිංසානොකළාහුය, කවුඩුවෝ සහ ගිවල්ලුද නිරෝගිභාවය දැනගනනා පිණිස එපිට මෙපිට පෙරළති,

(196) පක්ෂීහු ගැබමුල හැරගණිති, කවුඩුවෝ කඹ ඇරගෙණ කති, නිසි මනුෂ්‍යයෙනෙක් මොහුට ආරක්ෂා නොකළාහුය, උපන්නාවූ දරුවන්ට යම් සංස්කාරනාදියන් කෙරෙද්ද මොහුට එබඳුක් කළකෙනෙක් නැත්තාහ,

(197) වේන දරුවන් උපන්කළ නැකැත් සොයද්ද අසවල් නැකතේ අසවල් පාදෙ අසවල් රාශියේ අසවල් හොරාවේ අසවල් කරණෙ අසවල් මුහුතේ උපන්නේයයි කියා මොහු ගැණ එසේ නැකැත් සෙවූ කෙනෙක් නැත, අනික් දරුවෝ උපන්කළ මංගල්‍ය කරන්නාවූ බෙහෙත් වශයෙන් සියලු තෙල්ම්ශ්‍රකොට හැල් ආදී යම් ධාන්‍යයක් උසුරුවද්ද මොහු ගැණ ඒ දෙය කළ කෙනෙකුත් නැත. වෛශ්‍රවණගේ කුස ඉපද රාත්‍රියෙහි ගෙනැවිත් සොහොනෙහි දමනලදුව,

(198) රාත්‍රියෙහි ඇඟිල්ලෙන් වැගුරුණු නිරෙන් යාපයවූ වෙඛරූපිඩක් මාංශ වැදුල්ල පමණක්වූ ජීවත්වේද නැද්ද නියා සකස්නිතවූ ප්‍රාණය පමණක් ඉතිරිව තිබුනාවූ මෙබඳු කුමරුවා දිව්‍ය මනුෂ්‍යාදීන් විසින් පුදනලද්දාවූ මහා ප්‍රභාව ඇති සර්ව්ඥයන්වහන්සේදැක මොහු මේ තුවර භව භෝග සම්පත් ආදියෙන් ශ්‍රේෂ්ඨකුල වැසියෙක් වන්නේය, නැවත ශක්‍රයාහට පුත්‍රව ඉපිද මහත් දිව්‍ය ඓශ්වර්‍ය්‍ය ලබන්නේයයි වදාළසේක.

(199) කුමණ ත්‍රිතයක්හුගේ කුමණ බ්‍රහ්මචර්‍යා වක්හුගේ විපාකයක් හෙතුකොටගෙණ මෙසේ දුකට හා ව්‍යසනයකට පැමිණ සිටිය තැනැත්තේ නැවත මෙබඳු ඓශ්වර්‍යයකට පැමිණේදයි සිතා උපාසකවරු සවිඤ්ඤාණකභාවයෙන් විචාළාහුය.

එකල්හි සවිඤ්ඤාණකභාවයේ වදාරණසේක්. එඛා උපාසකවරුණි පසුගිය කල සැවැත් නුවර උපාසක සමූහයා එකතුව බුදුන් ප්‍රමුඛ සඞ්ඝයාහට උදැරවූ පූජාවක්කළේය, එකල්හි පූජාව කෙරෙහි මොහුගේ සිත දූෂ්‍යව සත්ත්වරුෂභාවෙහි නොතියුනුවූ එරූෂ වචනයක් කීයේය, එකල මොහුගේ මැනියන් විසින් එහි ආදීනව හැඟවූ කල්හි එතෙම චිතකීය දුරුකොට ප්‍රීතිසොම්නස් ලැබ පසුව ජේතවනයෙහි වසන්නාවූ තථාගතයන්ට සත් දවසක් මුලුල්ලෙහි යාගුයෙන් උපස්ථාන කෙළේය, ඔහුගේ ඒ ත්‍රිතයාගේ ඒ බ්‍රහ්මචර්‍යා වගේ විපාකය හෙතුකොටගෙණ ඉහතකී ලක්ෂණ ව්‍යසනයකට හා දුකකටත් පැමිණ සිට මතු එබඳු ඓශ්වර්‍යකට පැමිණෙනි, එතෙම මේ මනුෂ්‍යලොකයෙහිම හවුරුදු සියයක් මුලුල්ලෙහි පවකාමයෙන් සම්පූර්ණව ජීවත්ව සිට මැරිගොස් ශක්‍ර දිව්‍යරාජයාහට පුත්‍රව ඉපිද දිව්‍යඓශ්වර්‍ය ලබන්නේයයි වදාළසේක)මේ දේශනාව කෙළවරදී බොහෝ දෙනෙක් සෝවාන් ආදී මාර්ගඵලවලට පැමිණියේසි. මේ ප්‍රේතවස්තු ප්‍රකරණයෙහි තුන්වන චූලවර්ගයෙහි පස්වෙනි කුමාර ප්‍රේතවස්තුව නියාතිම වනලදී.

30 කුමාර ප්‍රේත වස්තුව නිමි.

—:*:—

තවද මේ ප්‍රේතවස්තු ප්‍රකරණයෙහි තුන්වන චූලවර්ගයෙහි සත්වෙනි සෙරිණී ප්‍රේතවස්තුව කවරහයත්? එක් සමයෙක්හි චක්‍රලක්ෂණතුරංගීතශ්‍රීපාද යුගළයක් ඇති සවිඤ්ඤාණෝත්තම්‍යත්වභන්සේ සැවැත් නුවර ජේතවනාරාමයෙහි විඩම්භාශය කරණසේක් සෙරිණී නම් ප්‍රේතියක් අරභයා මේ ප්‍රේතවස්තුව වදාරණලද්දේය. කෙසේදයත්? කුරුරට වනාහි සහජනී නම නුවර සෙරිණී නම් එක් වෛශ්‍ය සත්‍රියක් වූවාය. එසමයෙහි පොහොකරණ පිණිස එනුවරට ඒ ඒ දිගින් බොහෝ භික්ෂූහු රැස්වූහ, නැවත නැවත රැස්වීමෙන් මහත් සංඝ සන්නිපාතයක්වූය. ඒ දැක එනුවර වැසි මනුෂ්‍යයෝ තල සහල් ගිතෙල් වෙඩරු මී ආදිවූ බොහෝ

හෝ දුනෝපකරණ සපයා ඒ සංඝයාට මහ දන් දුන්නාහුය, එ කල්හි වනාහි ඒ දන්දෙන මිනිසුන් විසින් මේකී එව තොපිත් මේ පින් අනුමෝදන්වේවයි කියා ඒ වෙශ්‍යාවට කී කල්හි අශ්‍රද්ධාවන්ත වූ රතනාත්‍රය කෙරෙහි ප්‍රසන්න නොවන්නාවූ ඒ වේශ්‍යාතොමෝත් මසුරුමලින් මඩිනලද සිත් ඇතිව මෙසේ කියන්නී, මේ හිස මුඩු ශ්‍රමණයින්ට දන්දීමෙන් කවර වැඩෙක්දෝයි කීය, තමන් එහි අප්‍රසන්න බවම හැඟවීය.....කුශලයෙහි ප්‍රමාදවූවාහුගේ දන්දී මක්නම් කොසින්ද ඒ වෙශ්‍යාතොම මැත කාලයෙහි මැරී හොස් එක්තරා ප්‍රත්‍යන්ත නුවරෙක්හි අඟල් නියර පිට ප්‍රේතියක්ව උපන්නීය.....

ඉක්බිත්තෙන් හස්තිනිපුර වැසි එක්තරා උපාසකයෙක් තෙම වෙලඳුම් පිණිස ඒ ප්‍රත්‍යන්ත නුවරට හොස් එදවස අලුයම් වේලෙහි යම් කිසි කරුණක් පිණිස අඟල් ඉවුර පිටට ගියේය. ඒ ප්‍රේතිතොමෝ එතැන්හි දිව උපාසකයා දැක හැඳිනගෙණ ඕතොමෝ ඇට හා සම් පමණක්වූ ඉතා භයානකවූ දර්‍ශනය ඇති ශරීර යෙන් යුක්තව උපාසකයාහට නුදුරුව සිට තමන්ට දක්වා සිටින්නීය, එකල්හි උපාසක තෙමේ දැක මෙසේ විචාරන්නේය.....

(200) නගඟාදුබ්බණ්ණ රූපාසි කිසාධමණි සණ්ඨිතා
උප්පාසුලිකෙ කිසිකෙ කාඛංඉධ නිට්ඨසීති.....

(200) යහුගෙයින් එඛා විලිවැසිල්ලක් නැතිගෙයින් දුර්‍වර්ණවූ කෘසවූ ඉලිපුනාවූ නහරවැල්වලින් යුක්තව විවරවූ ඵාසුකාවන් ඇතිව මෙහි සිටින්නාවූ නී කවරෙක්දෝයි විචාළේය, එකල ප්‍රේති තොම කියන්නී.....

(201) අහං භදන්තෙ පෙතිම්හි දුග්ගතා යමලොකිකා.
පාපකම්මං කරිත්වාන පෙතලොක මිතොගතා නි.....

(201) යහුගෙයින් ස්වාමීනි මම පෙර මිනිස්ලොවදී අකුසල් කොට මිනිස්ලොවින් චුතව යමලෝකයයි කියනලද මේ ප්‍රේත ලෝකයෙහි ඉපිද දුක් විඳිමි නිව?.

එසේ කීකල්හිම නැවත උපාසකතෙම විචාරන්නේ එඛා ප්‍රේතදුව තෙපි මිනිස්ලොව උපන් කල්හි කයින් වචසින් මනසින් කුමණ අකුශල කර්‍මයක් කෙළේද කුමණ අකුශල කර්‍මයක් හුගේ විපාකයෙන් මිනිස් ලොවින් චුතව මේ ප්‍රේත අපායේ උපන් නිදැයි විචාළේය.....එකල්හි ප්‍රේතිතොමෝ කියතුයේ ස්වාමීනි පෙර මිනිස්ලොවදී මට දැනවසතුව විද්‍යමානව තිබෙද්දී මසුරු

මලින් යුක්ත හෙයින් එසින් කිසි දෙයක් ශ්‍රමණ බ්‍රාහ්මණාදි කෙණෙකුට භුදුන්නොමි. ඒ අකුශල කර්මය හේතුකොටගෙණ මම ප්‍රේත අපායේ උපන්නෙමි, හේමම මනුෂ්‍යයෝ රැස්වී සභාභවනය කරණ ජලක්‍රීඩාකරණ තොට්ටපලවල් ආදියෙහි ඔවුන්ගෙන් සිහිනැතිව වැටුනාවූ සිහිනැතිව ගියාවූ යම්කිසි ආහරාදියක් ලබාගන්නා පිණිස ඒ ඒ තැන්වලට ගොස් අඩමසක් යොදා ඇවිදත් කිසි ආහරයක් නොලැබුනේය, පැන්පිපාසයෙන් පෙළෙනලදුව පැන් බොන්නට සිතා ගඟාවට ගියේවිනම් කවුඩුවන් විසින් ගොඩගිද බොන්නට හැකිතරම්වත් පිරී බස්නාවූ ගඟාවෝවූයේනමුදු මාගේ අකුශල කර්මය හේතුකොටගෙණ ජලය සිඳී වැලිතලාව පමණක් ඉතිරිවෙයි, උෂ්ණ වේලාවල්හි මම සෙවන ඇති තැනකට පැමිණිකල්හි එහි සෙවන හැරී ගොස් මාගේ අකුශලකර්ම විපාකයෙන් ඒ ස්ථානය අව්වෙන් ගැවසීගන්නේය ඉතා සිහිල්ව හමන්නාවූ සුලඟ මාගේ ශරීරයට ගිනිසේ හමා ශරීරය දවන්නේය, ස්වාමීනි මෙ ක්ෂුත්පිපාසා දුක හා මීටත් වඩා කෲරවූ තවත් දුක්විඳිමට මම සුදුස්සියෙක් වෙමි, එසේහෙයින් ස්වාමීනි භුඬවහන්සේ හෂ්නිපුරයට ගොස් මාගේ මැනියන්ට මෙසේ කිවමැනව, එබා සත්‍යයාවෙන් තිගේ දුවනියෝ අකුශල්කොට මේ මිනිස්ලොවින් චුතව ගොස් ප්‍රේතලෝකයෙහි ඉපිද දුක් විඳින්නාවූන් මා විසින් දක්නාලද්දේයයි කියව. තවද මින්ස්ලොවදී මා නිදහන් පත්‍රිකයට භාරලක්ෂයක් මාගේ ධන ඇත්තේය, ඒ ධනය තිබෙනබව මම විසින් නැසීන්ට නොකියනලද්දේය, ඒ ධනය හැරගණ යවල් පයකින් දන්දී මටද දක්ෂිණාව දෙවයි කියා මාගේ මැනියන්ට කිය යුතුයයි කිය, මෙසේ කීකල්හි ඒ උපාසකතෙම ඇගේ ඒ කිම පිළිගෙණ එහි තමාගේ කෘත්‍යය තීන්දුකොට හෂ්නිපුරයට ගොස් ඇගේ මැනියන්ට එපවත් කීවාය.

ඒකල්හි ඇගේ මැනියෝ ඒ ධනය හැරගෙණ එසින් වියදන්කොට දන්දී ඒ ප්‍රේතියටද දක්ෂිණාව දුන්නිය, එකල්හි ඒ ප්‍රේතිතොමෝ ප්‍රේත ආත්මෙන් මිදී යහපත්වූ ශරීර ඇතිව සියලු කාමසම්පත්තියෙන් සම්පූර්ණවූවාය. ඉක්බිති ඕතොමෝ ලද්දාවූ දිව්‍ය සම්පත් ඇතිව අවුත් මැනියන්ට පෙනීසිට සියලු ප්‍රවෘත්තිය මැනියන්ට කීවාය.

මැනියෝ එපවත් භික්ෂූන්වහන්සේලාට කිය, භික්ෂූන් වහන්සේලා ගොස් එපවත් භාග්‍යවතුන්වහන්සේට සැලකළාහ, ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ එම අත්ථුප්පත්ති කොටගෙණ සම්ප්‍රාප්ත පිරිසට ධම්මදේශනා කළසේක. ඒ ධම්මදේශනාව

මහජනයාව සාකච්ඡාකවූයේය—මේ ප්‍රේතවස්තුප්‍රකරණයෙහි තුන් වෙනි චූලවග්ගයෙහි සවෙනි සෙරිණී ප්‍රේතවස්තුව නියා නිමවන ලද්දේය—

31 සෙරිණී ප්‍රේත වස්තුව නිමී.

—00—

නවද මේ ප්‍රේතවස්තුප්‍රකරණයෙහි තුන්වන චූලවග්ගයෙහි සත්වෙනි මිගලුද්දක ප්‍රේතවස්තුව කවරහයත?—එක් සමයෙක්හි ඓහලෞකික පාරලෞකිකාර්ථයෙන් අනුශාසනා කොට සඳහිනව සව්හි මෝක්ෂ සම්පත් ගෙණහැර දෙන්නාවූ ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ රජගහනුවර වේළුවනාරාමයෙහි වැඩවා සයතර වසුරණකල්හි මුවවැද්දෙකු අරභයා මේ ප්‍රේතවස්තුව වදාරණලද්දේය—ඒ කෙසේදයත?

රජගහනුවර වනාහි එක්තරා මුවවැද්දෙක්තෙම රුදහවල් මුවන් වධ මරාගණ එයින් ජීවිකාව කෙරෙයි, ඕහට එක් උපාසකයෙක් තෙම මිත්‍රවූයේය, ඒ උපාසකයා විසින් ඒ වැද්දාට සියලු ආකාරයෙන් අකුසලින් වලක්වන්ට අවවාදකොට අකුසල් අත්හරවන්ටනොහැකිව නැවත මෙසේ කියන්නේය, එඛා පුරුෂය නොපි රාත්‍රි ප්‍රාණඝාතාදී අකුසල් නොකරවයි නියා රාත්‍රි අකුසලින් වලක්වා. කුසලයෙහි යෙදෙවුයේය—එහෙයින් ඒ වැදි තෙම රාත්‍රියෙහි අකුසලින් වැලකීසිට දහවල් ප්‍රාණඝාත කරන්නේය, හෙතෙම මැතකාලයෙහි මැරිගොස් රජගහනුවර සමීපයෙහි විමාණ ප්‍රේතයෙක්ව උපන්නේය, ඒ ප්‍රේතතෙම දහවල් මහත් ප්‍රේත දුක් අනුභවකරන්නේය, රාත්‍රියෙහි පඤ්චකාමයෙන් සමෘඩ්ධව සැපවිඳින්නේය, ඒ දැක ආයුෂ්මත් නාරදස්ථවිරයන්වහන්සේ ඒ ප්‍රේතයාගෙන් මෙසේ විචාරණසේක්—

(202) නරණරි පුරක්ඛතො ද්‍රුවා
රජ්ජියෙහි කාමගුණෙහි සොභසි,
දිවසං අනුභොසි කාරණං.
කිමකාසි පුරිමාය ජාතියාති—

(202) යනුහෙයින් එඛා ප්‍රේතයා නොපි පරිචාරිකා දිව්‍යස්ත්‍රියන් විසින් හා දිව්‍යමහනාවරු විසිතුන් පිරිවරණලද්දුව මනාවූ තරුණවයසෙහි පිහිටා කාමරාගය ඉපදීමට හේතුවූ රූපාදී පඤ්චකාම

සෙන් සම්පුණ්ව රාත්‍රි දිව්‍යසම්පත් අනුභවකෙරෙමින් බබලන්නේව දහවල් කෘරවූ රෞද්‍රවූ ප්‍රේතදුක් අනුභවකරන්නේව මෙසේ වන්නට තොපි පුවිජාතියෙහි කුමක් කෙළේදැයි විචාළේය—

එ[ඒ]අසා ප්‍රේතතෙම තමන් පුවිසෙහි කරණලද අකුසල කම්මය තෙරුන්වහන්සේට ප්‍රකාශකොට කියමින් මෙසේ කිව—සවාමීනි පුවිසෙහි මම රජගහනුවර වැසිවූ සඞ්ඝානනයෙන් නිතර ලේවැකුනාවූ අත්ඇති දරුණු වැද්දෙක්වූයෙමි, කිසිකෙනෙකු කෙරෙහි විරොධයක් නොකරන්නාවූ සා මුවන් ආදී සතුන් කෙරෙහි දූශ්‍යවූ සිත්ඇතිව අනුන්ට හිංසාදිමෙහි ඇලී දුශ්ශීලව හැසුරුණෙමි, එසේ ප්‍රාණවධාදියෙහි වතවූතවූ මට මිත්‍රවූ ශ්‍රද්ධාවන්තවූ ශීලාදී ගුණධම්මයෙහි ඇළුනු සිත්ඇති උපාසකයෙක් ඇත්තේය, හෙතෙම මට අවවාදකෙරෙමින් මෙසේ කිහ, ඉදින් තොපි පරලොව සුවකැමැතෙහි චිනම් ප්‍රාණඝාතාදී අකුසල් හැර අකුසලයෙන් වැලකී සුචරිතයෙහි හැසිරෙවයි කියා නැවත නැවත මට අවවාද අනුශාසනා කෙළේසි, සුවකැමතිවූ හිතකාමිවූ ඔහුගේ අවවාදය අසා අඟුනවූ මම අකුසලයෙන් නොවැලැනී සිටිනකල්හි ඒ උපාසකතෙම නැවත මට මෙසේ කීයේය, එඛල තට සර්ප්‍රකාරයෙන් ප්‍රානඝාතාදී අකුසල් අත්හැරදමන්ට නොහැකිනම් දිවා රාත්‍රි දෙක්හි අකුසල් කරන්නාවූ තොපි රාත්‍රියෙහි පමණවත් ප්‍රාණඝාතාදිය නොකරවයි කියා අවවාද කෙළේය, එකල්හි මම දහවල් ප්‍රාණඝාතකොට රාත්‍රියෙහි ප්‍රාණඝාතයෙන් වැලකී සංයමයෙන් යුක්තවූයෙමි, මම සර්ප්‍රකාරයෙන් අකුසලයෙන් නොවැලකා දහවල් අකුසල් කොට විසූහෙයින් දහවල් සුනඛයන් විසින් කනලද ශරීර ඇතිව දුක්විඳිමි, රාත්‍රි ප්‍රානඝාත නොකලහෙයින් රාත්‍රියෙහි දිවසපත් අනුභවකෙරෙමි, දහවල් ප්‍රාණඝාතයෙහි හැසුරුණු අකුශලකම්මය හේතුකොට ගෙණ දහවල් සුනඛයෝ දුව අවුත් මාගේ ශරීරය සල්ව සල්වා කා ඇටසැකිල්ල පමණක් කෙරෙති සවාමිනි මම මෙසේ හෙයින් යම් ඒ පුරුෂකෙණෙක් සර්ඥ ශාසනයෙහි අධිසීල සික්ෂා ආදියෙහි නිතර යෙදුනාහුවේද ඒ සප්‍රාඥවරයෝ ලෝකික සුවයෙන් අසම්මිශ්‍රවූ අමෘතමහා නිර්වාණ සැම පැමිනෙන්නාහුයයි සිතම් කියේය—

ඉ[ඊ]සේ ඒ ප්‍රේතයා විසින් කියන්නා නැවත ස්ථවිරතෙම ගොස් එපවත් බුදුරජනන්වහන්සේට සැලකෙළේය—ශාස්තෘවූ බුදුරජනෝ එම අර්ථොත්පත්තිකොට ගෙණ සම්ප්‍රාප්ත පිරිසට ධර්ම දේශනා කොට වදාළසේක—ඒ ධර්මදේශනාතොමෝ එහි පැමිණි බොහෝදෙනෙකුට සාර්ථකවූවාය—මේ ප්‍රේතවස්තු ප්‍රකරණ

යෙහි තුන්වන චූලවග්ගයෙහි සත්වෙනි මිගළුද්දකප්‍රේතවස්තුව කියා නිමවනලදි.

32 මිගළුද්දක ප්‍රේත වස්තුව නිමි.

——00——

තාවද මේ ප්‍රේතවස්තු ප්‍රකරණයෙහි තුන්වන චූලවග්ගයෙහි අටවෙනි චූළමිගළුද්දක ප්‍රේතවස්තුව කවරහයත්?.

දීපඞ්කර පාදමූලයෙහි අතට පත් නිවන්හැර සඟකරුණාවෙන් භවදුඃඛයට වැද දශපාරමිතාචන්පුරමින් නිවන්සෙව්වාවූ බුදුරජානන්වහන්සේ රජගහනුවර වෙළුවනාරාමයෙහි වැඩවාසඃකර වදාරණකල්හි එක්තරා මුවවැද්දෙක්හු අරභයා මේ කථාවස්තුව වදාරණලද්දේය. කෙසේදයත්?

රජගහනුවර වනාහි මුවන් මරන්නාවූ එක්තරා මාණවකයෙක් ඇත්තේය හෙතෙම වස්තු ඇන්තේවී නමුදු වස්තුවඟැර දිවාරාත්‍රිදෙක්හි මුවන් මරමින් ඇවිදින්නේය. ඔහුට යහළුවූ එක් උපාසකයෙක් ඇත්තේ හෙතෙම ඒ වැද්දාට කරුණාවෙන් මෙසේ කියන්නේය, යහළුව ප්‍රාණඝාතකෝලෙවීනම් බොහෝ දීඝී කාලයක් මුළුල්ලෙහි ඇවැඩ පිණිස දුක්වන්නේය, එහෙයින් තොපට දුක් නොලැබෙන පිණිස සතුන්මැරීම හැරදම්වයි කියා අවවාද කෙළේය, හෙතෙම ඒ අවවාදය නොගන්නේය.

ඉක්බිත්තෙන් ඒ උපාසකතෙම තමන්ට ප්‍රියවූ කුලූපගරහතන් වහන්සේ නමකට යාඥාකරණසේ, ස්වාමිනි අසවල් පුරුෂයාහට ප්‍රාණඝාතනොකරණසේ අවවාද අනුශාසනාකළමැනවැයි කියා යාඥාකළේය, ඉන් එක්දවසක් ඒ ස්ථවිරයන්වහන්සේ රජගහනුවරට පිඬුපිණිස වඩිමින් ඔහුගේ ගෘහද්වාරයෙහි වැඩසිටියේය, එසේ වැඩසිටි ක්ෂීණාශ්‍රවයන් දැක හටගත් බුහුමන් ඇතිව වැඳිතෙම පෙරගමන් ගොස් ඒ තෙරුන් ගෙට වැඩමවා වැඩහිඳිනට ආසනයක් පනවා දුන්නේය, එකල පනවනලද ආසනයෙහි ඒ තෙරුන්වහන්සේ වැඩහුන්කල්හි ඒ මුවවැදිතෙමේද තෙරුන් ලඟට අවුත් හිඳගත්තේය, එකල්හි ස්ථවිරයන්වහන්සේ ඔහුට ප්‍රාණඝාතනිවීමෙහි ආදීනවය හා ප්‍රාණඝාතයෙන් වැලකීමෙහි ආනිසංසත් වදාළේය, ඔහු ඒ අසාත් ප්‍රාණඝාතය හැරදමන්නට කැමතිකුවූහ, එකල්හි ඔහුට ස්ථවිරයන්වහන්සේ මෙසේ කියන්නේය, ඉදින් තොපි ප්‍රාණඝාතය සම්පූර්ණාරෙන් හැරනොදමන්නෙහි

මිනම් රාත්‍රියෙහි පමණවත් සතුන් නොමරවයි කිහ, හෙතෙම යහපත සඟමිනි රාත්‍රි ප්‍රාණඝාත නිරීම හරිනෙම් නියා රාත්‍රි සඟඝාතනය හැරදමා දහවල් සඟඝාතනය කෙරෙයි—නොකී සියල්ල ඉහතනී මුවවැද්දාගේ කථාවශදෘසය—ඔහු මිනිස්ලොවින් චුතව ගොස් ප්‍රේතඅපායෙහි ඉපද රාත්‍රි සම්පත් අනුභවකරන්නේය, කරණලද අකුශලකම්මානුකූලව දහවල් ප්‍රේතදුක් අනුභවකරන්නේය, ඉක්බිති මෙසේ රාත්‍රි සම්පත්හා දහවල් දුක් අනුභවකරමින් සිටින ඒ ප්‍රේතයා නාරද ඝට්වරඝන්වහන්සේ දැක මෙසේ විචාරණසේක්—

(203) කූටාගාරෙ ච පාසාදෙ පල්ලඞ්කෙ ගොණකත්ථතෙ
පභාසෙනත තුරියෙන රමසි සුපපවාදිතෙ—පෙ—

(204) කිසස කම්ම විපාකෙන ඉදං දුක්ඛං නිගච්ඡසීති—

(203) යහතුගෙයින් එඹා ප්‍රේතය දිව්‍යමයවූ කූටාගාරහා ප්‍රාසාදවල මහාඝ්‍ය පලස් අතුරණලද පර්‍යඞ්කවල්හි මනා පවත්නලද පභාගික තූර්‍යනාදයෙන් යුක්තව තොපි රාත්‍රි දිව්‍යසම්පත් අනුභවකරන්නෙහිය—

(204) එසේයයි උදුවූකල්හි සොහොනෙහි දමනලද ශරීරඇතිව බොහෝ දුක් අනුභවකරනෙව මෙසේ වන්නට තොපි පූර්වයෙහි කුමනඅකුශලකම්මයක්කෙළේද කයින් වචසින් මනසින් කරණලද කුමන අකුශලකම්මයක්හුගේ විපාකයෙන් මෙබඳු දුකකට පැමිණියේදැයි විචාළේය—

එකල්හි ඒ ප්‍රේතතෙම භියතුයේ සඟමිනි පෙර මම රමණවූ රජගහනුවර ප්‍රාණඝාත නිරීමෙහි ඇලුනාවූ දුශ්ශීල වැද්දෙක්වූයෙමි. ඒ මාගේ යහළුවූ යහපත් ආඪ්‍යසඇති ශ්‍රද්ධාවන්ත උපාසකයෙක් ඇත්තේය, ඔහුවද කුලූපගවූ නාරද රහතන්වහන්සේ කෙනෙක්වූහ, උන්වහන්සේ මට මෙසේ අවවාදකරණ්‍යේ, එඹල පුරුෂය තෙපි පරලොවදී සුවකැමැත්තාහු විනම් දුශ්ශීල්‍ය ක්‍රියාවක් වන්නාවූ ප්‍රාණඝාතය නොකොටයුතුවේයි, එහෙයින් දුගතියට පමුනුවා බොහෝ දුක් හැරගෙණ දෙන්නාවූ ප්‍රාණඝාතාදී අකුසල් තොපි නොකරවසිනියා උන්වහන්සේ මාකෙරෙහි අනුකම්පාවෙන් මට නැවත නැවත අවවාද අනුශාසනා කෙළේය හිතේයිවූ අනුකම්පාඇත්තාවූ උන්වහන්සේගේ අවවාදය අසා ඒ අවවාදයවූ පරිද්දෙන් අකුසලයෙන් නොවැලක අඟුනවූ මම බොහෝකල් අකුසල් නිරීමෙහි ඇලි විසූයෙමි, එකල්හි පණිතවූ

ඒ භික්ෂූන්වහන්සේ මාකෙරෙහි අනුකම්පාවෙන් නැවතත් මව මේ ප්‍රකාරඅවවාදකරණුයේ, එඛා පුරුෂය තොපට සර්ප්‍රකාරයෙන් අනුසලයෙන් වලකින්ට නොහැකිනම් රාත්‍රියෙහි පමණවත් ප්‍රාණඝාත නොකොට සංයතව වාසයකරවයි කියා මාව සංඝමයෙහි පිහිටවූයේය.

ඉහ මම දහවල් ප්‍රාණඝාතකොට රාත්‍රි ප්‍රාණඝාතයෙන් වැලක ණත්‍රියෙහි සංයමයඇතිව විසුවෙමි, රාත්‍රි ප්‍රාණඝාත නොකොට සංයමව විසූ කුසලය හේතුකොටගෙණ දැන් රාත්‍රි දිව්‍යසම්පත් අනුභවකරමි. දහවල් ප්‍රාණඝාතකල අකුශලකර්මය හේතුකොටගෙණ දහවල් බලෙලා එලවාගෙණ අවුත් මාහැරගෙණ සල්ව සල්වා කා ඇටපමණක් ඉතිරිකොට යෙති, මේ ප්‍රකාරයෙන් මම දහවල් ප්‍රේතදුක් විඳිමි සවාමිනි රාත්‍රි පමණක් අකුශලයෙන් වැලකිසිවිය මට මෙබදු දිව්‍යසම්පතක් රාත්‍රි දවසෙහි ලැබෙන්නේවෙයි මෙසේ ඇතිකල්හි යම් නුවණැත්තෙක් සර්ඥ අවවාදයෙහි නිතර යෙදුනාහුවෙද්ද, ඒ යොගාවචරයෝ අමෘතමහානිර්ණඥවම පැමිණෙන්නාහුයයි සිතන්නෙමියි ප්‍රේතතෙම කීයේය. මෙසේ ඒ ප්‍රේතයා විසින් නියනලද ප්‍රවෘත්තිය නාරදඝර්වරයන්වහන්සේ ගොස් ශාස්තෘවූ බුදුරජනන්වහන්සේට සැලකෙළේය. ශාස්තෘවූ බුදුරජනන්වහන්සේ එම අර්ථොත්පත්තිකොටගෙණ සම්ප්‍රාප්ත පිරිසට ධර්මදේශනාකොට වදාළසේක. ඒ ධර්මදේශනාව බොහෝ දෙනාහට සාර්ථකවූයේය-මේ ප්‍රේතවස්තුප්‍රකරණයෙහි තුන්වනවූ චූලවර්ගයෙහි අවවෙනි විනිය මිගඳ්දක ප්‍රේතවස්තුව කියා නිමවනලදී.

33 දුතියමිගඨ්දකප්‍රේතවස්තුවර්ණනා

කවද මේ ප්‍රේතවස්තුප්‍රකරණයෙහි තුන්වන චූලවර්ගයෙහි නවවෙනි කුවව්නිඝඩික ප්‍රේතවස්තුව කවරහයත්?

එක්සමයෙක්හි කරුණානිධානවූ සියලුසත්වයන්ජාතිකාන් නාරාදියෙන් එතරකොට නිවන්පුර පමුඛවන්නාවූ බුදුරජනන් වහන්සේ සැවැත්නුවර ජේතවනාරාමයෙහි වැඩවාසයකර වදාරණසේක. එකල්හි බිම්බිසාර මහරජතෙම මාසයකට සදවසන් පෙහෙවස් සමාදන්වෙති, ඒරජහුට අනුව පවත්නාහු බොහෝ මනුෂ්‍යයෝද පෙහෙවස් සමාදන්ව වෙසෙන්නාහුය, එකල්හි බිම්බිසාරරජතෙම තමන් ලඟට ආ ආ මනුෂ්‍යයන්ගෙන් මෙසේ විචාරණ

සේක්, තෙපි පෙහෙවස් සමාදන්ඵනාහුද (නොහොත්) සමාදන් නුනාහුදැයි විචාරත්තේය. ඒ මනුෂ්‍යයෝ අතරෙහි කේලාම් කියමින් ඔවුනොවුන් භේදකරන්නාවූ වචාවිත්වූ අත්ලස්ගත්නාවූ දරුණු ක්‍රියායෙහි ඇළුනාවූ එක්අධිකරණ නියුක්තක පුරුෂයෙක් සිටියේ හෙතෙම පෙහෙවස් සමාදන්නොවූයෙම්යි කියන්ට හයින් එසේ නොකියා දේවයන්වහන්ස මම පෙහෙවස් සමාදන්වූ යෙම්යි බොරුනිව, ඉක්බිති රජහු සමීපයෙහි සිටි පුරුෂයෙක්තෙම අවුත් ඒ අධිකරණ නියුක්තක පුරුෂයාගෙන් විචාරණුයේ, යහළුව තෙපි පෙහෙවස් සමාදන්වනුලදදැයි විචාළේය.

ඒ විට ඔහු කියන්තේ යහළුව මම හයින් රජහු සමීපයෙහිදී පෙහෙවස් සමාදන්වීම් කීයෙමි, මම පෙහෙවස් සමාදන්නොවූයෙම්යි කීහ, එකල්හි ඔහුට පුරුෂතෙම කියනුයේ යහළුව මෙහි පවන් තොපට අර්ධපොසථයවෙයි. එහෙයින් උපොසථාඟයන් සමාදන්වේවයි කීයේය, හෙතෙම යහපතැයි කියා ඔහුගේ වචනය පිළිගෙණ ගෙටගොස් ආහර අනුභව නොකොට මුහුනසෝදා පවිත්‍රව උපොසථ සීලය අධිෂ්ඨානකොට වාසයකරන්නේ එදා රාත්‍රි දවස නිදන්ට පැමිණි කල්හි ආහර නැතිව සිස්වූ කුක්ෂිය ඇතිහෙයින් වාතය බලවත්වි රුජාතැනි පෙලෙමින් ආයුසංස්කාරය ක්ෂයවි මැරිගොස් පච්චතගුහාවෙක විමාණප්‍රේතයෙක්ව උපන්නේය. හෙතෙම පූර්වයෙහි එක්රැයක් අර්ධපොසථය රක්ෂාකලාවූ කුශලය හේතුකොටගෙණ ඔහුට දිව්‍ය විමාණයක් පහළවිය, හෙතෙම එහි දිව්‍යප්සරාවන් දසදහසක් පරිවරා මහත් දිව්‍යසම්පත් අනුභවකොට නැවත කුවචිනිඝවය කළ අකුසලින් හා ඔවුනොවුන් භේදකරන්නාවූ ප්‍රෙශුන්‍යයන් කීහෙයින්ද තමාගේ පිට මස් තමුන්ම කඩකඩා කමින් දුක්විඳින්නේය, ඒ ප්‍රේතතෙම මෙසේ දුක්විඳින කල්හි එක්දවසක් ආයුෂ්මත් නාරදස්ථවිරයන්වහන්සේ ගිජ්ඣකූට පර්වතයෙන් බස්නා කල්හි ඒ ප්‍රේතයා දැක ඔහුට මෙසේ වදාරණසේක්.

(205) මාලාහාරිති කාසූරිඝත්තා තෙවත්ථ කුඤ්ඣදා,
පසන්නාමුඛ වන්නෙනාසි සුරියවණ්ණීව සොභසි.

(206) තයිදංතයා නාරද සාමදිට්ඨං,
අනුකම්පකායෙ කුසලාවදෙය්‍යුං,

(207) මාපෙසුනමාචමුසාභණී,
මාඛොසි පටිසීමංසි කො තුවහනි.

(205) යනුහෙයින් එඛා දිව්‍යපුත්‍රයා තොපි දිව්‍යමයවූ මල්වඩින් වලින් සැරසෙනලදුව එසේම දිව්‍යමයවූ සිඹිවෙඩනයෙන් යුක්තව කෙසුරවලයාදී දිව්‍යමයවූ හස්තාභරණයෙන් යුක්තවූ ශරීරයෙහි ගල්වනලද දිව්‍යමයවූ චතුනකල්කයන් ඇතිව ප්‍රසන්නවූ මුඛවර්ණියක් ඇත්තාවූ තොපි බාලාකීමණ්ඩලයසේ බබලන්නේව.

(206) නුවද තොපට දිව්‍යපුත්‍රයෝ පිරිවරවෙති, දිව්‍යමයවූ ග්‍රීවාභරණ හස්තාභරණ පාදාභරණවලින් සැරසුනාවූ දසදහසක් දිවඟනාව රූපාදපරිචාරිකාව සිටින්නාහුය. එහෙයින් දුටුදුටු වන්ට භයඉපදී රොමෝද්ගමනය වනසේ මහත් ආනුභාවඇත්තේව එතකුදුවුව තොපගේ පිට මාංශ තොපිම සිද සිඳ කන්නෙහිය මෙසේ වන්නට තොපි පූර්වයෙහි කයින් වචසින් මනසින් කුම්නඅකුශලයෙක් කරණලදද කුමන අකුශල කම්ඣක්ඛගේ විපාකයක් හේතුකොටගෙණ තොපගේ පිටමස් තොපිම සිද සිඳ කන්නෙහිදැයි විචාරා වදාළසේක. එකල්හි ඒ දිව්‍යපුත්‍රතෙම මෙසේ කියන්නේය.

(207) සාමිනි නාරදඤ්ච විරයන්වහන්ස මම පෙර මනුෂ්‍යලෝකයෙහිදී තමන්ට මෙලොව පරලොව දෙක්හි අවැඩදායක වනසේ හැසුරුනෙමි, අනුන් හේදවන්නාවූ පෛශුන්‍යකීයෙමි, මුසාවාදකීයෙමි, නැතිදෙය ඇති කොට ඇතිදෙයනැතිකොට පෙන්වන්නාවූ වචාවෙන් අනුන් වචාකෙරෙමි බොරුකීයෙමි ද්‍රෂ්ට ධාර්මිකාදී අර්ථවත් ධර්මය හැරදමා අධර්මවිනිශ්චයකෙළෙමි, ඒ කාරණයෙන් මම දැන් මාගේ පිටමාංශම මම කන්නෙමිද වෙනත් මෙසේ පැවතුනාවූ යමෙක් ඇත්නම් ඔහු පරලොවදී මෙසේම තමාගේ පිට මාංශ තෙමේම කන්නේය.

නාරද ඝට්වරයන්වහන්ස නුඹවහන්සේ විසින්ම මේ කාරණය දක්නාලද්දේවන, අනුකම්පා ඇත්තාවූ බුඩාදී මහොත්තමයෝ නුඹවහන්සේලාට ධර්මසේ අවවාද අනුශාසනා කෙරෙද්ද එපරිද්දෙන් මමත් නුඹවහන්සේට කියම්, මේ දැක අනුන් බිදෙන්නාවූ සභාවඇති කේලාම් නොකියමැණව, ඇත්ත නැති කොට නැත්ත ඇතිකොට හඟවන සභාවවූ අසත්‍ය වචන නොකිව මැණව, කේලාම්කියා අසත්‍ය වචන කියා පරලොවදී මෙසේ පිට මස් සිඳසිඳ නොකවයි කීසේය.

ඉක්බිති නාරද තෙරුන්වහන්සේ ශාන්තෘන්වහන්සේ

ළඟට ගොස් මෙපවත් සැලකෙළේය, එකල්හි බුදුරජනෝ එම අස්සොත්පත්තිකොට ගෙණ සම්ප්‍රාප්ත පිරිසට ධම්මදේශනා කෙළේය. ඒ ධම්මදේශනාව බොහෝදෙනාහට සාර්ථක වූයේය. මේ ප්‍රේතවස්තුප්‍රකරණයෙහි තුන්වන චූලවර්ගයෙහි නවවෙනි කූටවිනිශ්චයික ප්‍රේතවස්තුව නියා නම්වන ලද්දේය.

34 කූටවිනිශ්චයිකප්‍රේතවස්තුවනිම්.

——oo——

තවද මේ ප්‍රේතවස්තු ප්‍රකරණයෙහි තුන්වන චූලවර්ගයෙහි දසවෙනි ධාතුවිවන්න ප්‍රේතවස්තුව නම් කවරහ්යත්? මේ මෙසේ දතයුතු.

සුමේරාමර ලෝකදිවාකරවූ භගවත් අර්හත් සම්‍යක් සම්බුද්ධ සර්ව්වඥාඥෙත්තමඥානත්වහන්සේ කුසිනාරානුවර මල්ලව රජුන්ගේ උපවර්ත්තනම් සල් උයනෙහි යමකසාලයන්අතරෙහිවූ පරිනිවන් මඤ්චකයෙහිදී අනුපාදිශෙෂවූ පරිනිර්ව්වාණ ධාතුවෙන් පරිනිවන්පැවැදුළ ඉක්බිති ධාතුවිභාගයද කළකල්හි අජාතශත්‍රූ රජතෙම තමන්ලත් ධාතුකොටස ගෙණ සත්ඝවුරුදු සත්මස් සත්දවසක් මූළුල්ලෙහි බුදුගුණ සිහිකරමින් උදාරවූ මහත් පූජා පැවැත්වූයේය, ඒ අජාතශත්‍රූ රජතු විසින් ධාතුන්වහන්සේලාට පවත්වන්නාවූ උදාර මහත්වූ පූජාදෑක එහි සිත්ප්‍රසන්නකොට අසංඛ්‍යඅප්‍රමාණ ගතන් මනුෂ්‍යයෝ දිව්‍යලොකොත්පත්තිය කළාහුය, අසූදහසක්පමණ පුරුෂයෝ බොහෝකලක් මූළුල්ලෙහි පුරුදු අශුභාවෙන්හා මිථ්‍යාදෘෂ්ටියෙනුත් යුක්තවෙයින් ඒ පූජාවගැණ අනාදර වචන කියා පැහැදියතු දෙයෙහි සිත් දූෂ්‍යකොට ඒ අසූදහසක් මනුෂ්‍යයෝ මැරීගොස් ප්‍රේත අපායෙහි උපන්නාහුය, එම රජගහනුවර බොහෝ ධනසම්පත් ඇති එක්තරා කෙලඹියක්තුගේ භාර්‍ය්‍යාවද ධිතෘවද යෙහෙලියද ඝන තුන්දෙන පහන්සිත් ඇත්තාහු ධාතුපූජාකරමුයයි කියා ගඳමල් ආදිගෙණ ධාතුපූජා ස්ථානයට ගත්ත පටන් ගත්කල්හි ඒ කෙළෙඹි පුත්‍රතෙම කියන්නේ ඇටවලට පූජාසත්කාර කෙරීමෙන් කවරප්‍රයෝජනදැයි කියා පරිභවකොට ධාතුපූජාවෙහි තුතුණකිහ.

ඒ තුන්දෙන කෙළෙඹි පුත්‍රයාගේ එබඳු වචනයක් අසා ඒ නොගෙණ ධාතුපූජාස්ථානයට ගොස් ගඳමල් ආදියෙන් පූජාකොට ගෙට ආවාහු, එක්තරා රෝගයකින් ආතුරව හිඳ නොබෝ

කලකින් මැරිගොස් දෙවුලොව උපන්නාහුය...ඒ කෙළෙඹි පුත්‍ර තෙම වනාහි ක්‍රොධයෙන් මැඩෙනලදුව නොබෝකලකින් මැරී ගොස් ධාතුපූජාවෙහි තුගුණකී අකුශලකර්මය හේතුකොටගෙණ ප්‍රේතඅපායෙහි උපන්හ...ඉක්බිත්තෙත් එක් දවසක් ආයුෂ්මත් මහා කාශ්‍යපස්ථවිරතෙම සත්ව කරුණාවෙන් ඉර්ධියෙන් ඒ ප්‍රේතයා මනුෂ්‍යයින්ට පෙනෙනසේ කෙළේය. එසේකොට චෛත්‍යඥනයෙහි වැඩසිට ධාතුපූජාවෙහි තුගුණ කී ප්‍රේතයාගෙන් මෙසේ විචාරණ සේක්...

(208) අන්නාලිකෙඛ නිට්ඨනෙත්‍රා දුග්ගතෙඛා පුනිව්‍යසී,
මුඛචඛාදන්ති භිමයොපුති ගඞ්ඛංච වායති...පෙ...

(209) කිස්ස කම්මවිපාකෙන.
ඉදං දුක්ඛන්ති ගවජ්ජන්ති.

(210) අහංරාජ ගහෙරමෙම රමණීයෙ ගිරිබ්බජෙ.
ඉස්සරොධන ඛත්තුස්ස පඤ්ඤස්ස මාරිස...පේ...

(211) ථූපපූජංකරිස්සාමි.
අප්පමත්තෙත්‍රා පුනප්පුනන්ති...

(208) ඒඛා ප්‍රේතය දුගීඛ භවන්නාවූ මුඛය ඇතිව හොපි අහසෙහි සිටින්නේව, එසේවූ තාගේ මුඛය කිසාරා පතුවෝ වැදි වැදී කන්නාහුය...

(209) ඒපමණකුත් නොව තොපගේ මුඛය ශස්ත්‍රවලින් ආයෙත් ආයෙත් කප කපා කැපූ කැපූ තැන්වල කරදිය ඉස ඉස නැවත නැවතත් කපති. මෙබඳු දුකක් අනුභවකරන්ට පුළුවෙහි තොපි කයින් වචසින් මනසින් කුමණ අකුශල කර්මයක් කෙළේද නා විසින් කරණලද කුමණ අකුශලකර්මයක් හේතුකොටගෙණ මෙවැනි දුකක් අනුභවකෙරේදැයි අසා වදාළේය...

(210) ඒකල්හි ප්‍රේතතෙම කියනුයේ ස්වාමීනි මම පෙර මිනිස් ලොව උපන්කල්හි රජගහ නුවර බොහෝ ධනයෙන් ආඪ්‍යවූ එක් කෙළෙඹි පුත්‍රයෙක් වූයෙමි. එකල්හි මාගේ භාර්‍යාව හා සිතාදි යෙහෙළිද ගත තුන්දෙන උපුල් හා සෙසුමල්ජාතිද මහාඤ්ඤ සුවඳ විලවුන්ද හැරගෙණ සවීඤධාතු පූජාපිණිස යනකල්හි ඇවවලට පූජාකෙරෙමින් කවර ප්‍රයෝජනයෙක්දැයි සනාදි වශයෙන් ධාතු පූජාවෙහි තුගුණ කියා මාවිසින් ඔවුන් වලකන්ට උත්සාහ කළෙමි.

මේ අකුශලකම්මය මා විසින් කරණලද්දේය, මිම මෙපමණක් නොවෙයි, අසූදහසක් මනුෂ්‍යයෝ ධාතු පූජාවෙහි තුතුණ කියා ප්‍රේතව උපපත්තිකොට ඔහු වෙතම දුක් අනුභවකරන්නාහුය. මේ ප්‍රකාරයෙන් අපි සියල්ලෝම ධාතු පූජාවෙහි තුතුණ කියා නරක යෙහි ඉපද බලවත්සේ පැසෙන්නෙමුව වෙනත්යමෙක් සවිඥධා තුපුජාපින්කමෙහි තුතුණ කියන්නාහුවෙද්ද ඔවුනුත් පිනෙන් පිරී හි මාසේ බැගෑපත්බවට පැමිණෙති, කාශ්‍යපයන්වහන්ස දිව්‍යමය වූ මාලාධාරිව දිව්‍යාභරණ පැලඳගෙණ දිව්‍ය සම්පත්තින් සමෘද්ධව පිරිවර සම්පතක් ඇතිව ධාතුපූජාවෙහි කරණලද මල්පූජාවේ උදෑ රවූ විපාක අනුභවකරමින් ආකාශයෙන් එන්නාවූ මාගේ මේ භා ග්‍යාවභා ධිතාවද යෙහෙලිද විඳින සුව විපාක බැළුවමැනව. ආ ශ්චර්‍යවිමත්වූ දුටුදුටුවන්ගේ රෝමොත්ගමනයවන තරම් උදෑරවූ මේ මහත් ආනුභාවය පුටුවාවූ සප්‍රාඥචරයෝ පුන්‍යක්ෂෙත්‍රවූ සවිඥ යන්වහන්සේට පූජාකරන්නාහුය. නමස්කාර කරන්නාහුය.

(211) මෙබඳ මෙතිත් ගොස් මනුෂ්‍යත්වය ලබා ප්‍රමාදනොව නැවත නැවත චෛත්‍යයට පූජාසත්කාර කරන්නෙමියි මෙසේ ප්‍රේතතෙම කිහ.

මෙසේ ඒ ප්‍රේතයා විසින් කී කල්හි මහාකාශ්‍යපස්ථවිර තෙම එම අත්‍යෝත්පත්තිකොට ගෙණ සම්ප්‍රාප්ත පිරිසට ධර්මදෙ ශනාකොට වදාළේය. ඒ ධර්මදේශනාතොමෝ බොහෝදෙනා හට සාක්ෂිකවිය. මේ ප්‍රේතවස්තු ප්‍රකරණයෙහි තුන්වන වූලවගී යේ දසවෙනි ධාතුවිවරණය ප්‍රේතවස්තුව නියා නිමවනලදි.

35 ධාතුවිවරණාප්‍රේතවස්තුව නිමි.

—:x:—

මෙතෙකින් පරමාර්ථජෝතිකා නම්වූ බුද්ධකනිකායාර්ථ කථාවට අනන්තගීත මේ ප්‍රේතවස්තු වර්ණනාවෙහි දසකථාවස්තුවකින් පූර්ති මණ්ඩිතවූ තුන්වෙනි වූලවගීය නිමවනලදි.

තවද මේ ප්‍රේතවස්තුප්‍රකරණයෙහි සතරවන මහාවගී යේ පළමුවෙනි "අඹසක්බර ප්‍රේතවස්තුව" කවරඟයත්? භෝමෙ සේ දනයුතු. එක් සමයෙක්හි සවිධම්මයෙහි අප්‍රතිහතඥාණචාර ඇති චක්‍රලක්ෂණතුරංජිත ශ්‍රීපාදස්පර්ශයකින් යුක්තවූ බුදුරජානන් වහන්සේ සැවැත්නුවර හොදුරු ගම්කොට පේතවනාරාමයෙහි වැඩවාසයකර වදාරණසේක්. එකල්හි අඹසක්බරනම් ලිච්ඡවිරජ

නෙම මිථ්‍යාදෘෂ්ටි ඇත්තේය, කරණලද කුශලාකුශල කර්මයෙහි ඵලවිපාක නැතැයි නියමින් නාස්තිකදෘෂ්ටිවාදිවූයේය; හේතෙම විසාලා මහනුවර රාජ්‍යයකරන්නේය.

ඒසමයෙහි වනාහි විසාලාමහනුවර වැසි එක්තරා වෙලන්දෙකුගේ කඩපිල සමීපයෙහි කඳිමයෙන් ගැවසීගත් භූමිප්‍රදේශයෙක් වෙයි, යන එන බොහෝ මනුෂ්‍යයෝ එතැන්දී පැන පැන යාමෙන් බොහෝකොට වෙහෙසෙන්නාහ; ඔවුනුවරි සමහරෙකුගේ ශරීර හා වස්ත්‍රත් කෙලසෙයි, ඒ දැක වෙලඳතෙම යන එන මනුෂ්‍යයෝ මඩ නොමැඩ සුවසේ යෙහෙයි සිතා දුගීක්‍රිය නැත්තාවූ කල්පසුගිය ගොන් හිස් ගෙන්වා මඩමතුයෙහි දැමෙමවූයේය. ඒ වෙළඳ ප්‍රකෘතියෙන්ම සිල්වත්වූහ. ක්‍රොධ නැත්තාහ, මොලොක්වචන ඇත්තේය, අනුන්ගේ ගුණ නොසඟවා තත්වූ පරිද්දෙන් කියන්නේය, හෙතෙම එක් දවසක් තමන්ගේ බැනන්ගේ ගහළුවෙක් නහනකල්හි ඔහු හැඳි වස්ත්‍රය ක්‍රීඩා පිණිස වස්ත්‍ර, හිමියාට නොපෙනී සඟවා තිබා වෙහෙසකොට නැවත වස්ත්‍රය දුන්නේය. ඔහුගේ බැනනුවෝ සොරකමින් අනුන්ගේ ගෙයකින් සොරා බඩු හැරගෙණවිත් මයිලනුවන්ගේ කඩපිලේ තිබූයේය, බඩු සවාමියෝසොයමින් ගොස් කඩපිලෙහි බඩු තිබෙන්නා දැක බැනනුවන්ද ඔහුද බඩු සමඟ අල්වාගෙණ ගොස් රජහට දැක්වූවාය. එකල රජතෙම කියනුයේය මොහුගේ හිස කපවා බැනනුවන් දිවස්ඝුල තිබවූයසි කියා ආඥාකරවයි යියේය.

රාජ පුත්‍රයෝ ඒ කෙලෙඹිපුත්‍රයා ගෙණ ගොස් හිස කැපූවාහුය, ඔහුගේ බැනනුවන් ගොස් දිවස්ඝුල නැබූවාහුය, ඒ කෙලෙඹි පුත්‍රතෙම මැරීගොස් භූමාටු දෙව්යන් අතරෙහි උපන්නේය, එතෙම පෙර මනුෂ්‍යව උපන්කල ගොන් ඔළුවලින් ඒ දණඩ දුමූ කුශලය හේතුකොට ගෙන සුන්‍දරණීවූ දිව්‍යමය ජවයෙන් සමන්විතවූ ආජානීය අශ්වයානාවක් ඔහුට පහළවූයේය. ගුණවතුන්ගේ ගුණ වර්ණනාකර කුශලයහේතුකොට ගෙණ ශරීරයෙන් දිව්‍ය සුවද හමන්නේය, වස්ත්‍රය සෑගවූ අකුශලය හේතුකොට ගෙණ නගනව උපන්නේය.

එතෙම තමන් පූර්වයෙහි කරණලද කර්මය බලන කල්හි එම අනුසාරයෙන් තමන්ගේ බැනනුවන් දිවස්ඝුල හිඳින්නවුන් දැක කරුණාවෙන් චෝදනාකරණලද සිත් ඇතිව දිව්‍යමය ජවඇති ආජානීය අශ්වයාට නැගි අඩරාත්‍රිවේලෙහි ඔහු ඝුල උන්තැනට ගොස් නුදුරු තැන්හි සිට භික්ෂූන්ගේ පින්වත් ජීවත්වෙව

ජීවත්වීමම උතුමැයි කියා දවසක් දවසක් පාසා කියන්නේය, එය මයෙහි වනාහි අඹසකඛර රජතෙම උතුම් හස්තිරාජයා පිට නැගි නුවර ප්‍රදක්ෂිණාකරමින් ඇවිදින්නේ ඒක්තරා ගෙක ජනෙල් කවුළු හැරගෙන සිට රාජ විභූති බලමින් සිටින්නාවූ සත්‍රියාවක් දැක ඇ තේරෙහි පිළිබඳවූ සිත් ඇතිව ඇතාගේ පසු ආසනයෙහි හුන් පුරුෂයාහට කියන්නේ මේ ග්‍රහය සහ මේ සත්‍රියාවත් මනකනි බාගනිවයි කියා ක්‍රමයෙන් ගොස් රජගෙට ප්‍රවේශව ඒ පුරුෂයා ඒ සත්‍රියාව සිටි තැනට යවමින් මෙසේ කීහ. සගයෙනි ඔව, අස චල් සත්‍රියාව සවාමියෙක් ඇතිව සිටින්නියෙක්ද නොහොත් සවාමි යෙක් නැතිව සිටින්නියෙක් දැයි කියා දැනගෙන එවයි කියේය.

(ලිහිල්)තෙම ඒ සත්‍රිය සිටි තැනට ගොස් විචාරා සවාමියෙක් සහිතව සිටි බව දැනගෙණ අවුත් රජහට කීහ, රජතෙම දැ ත මන්ට හැරගන්න උපායක් සොයමින් ඇගේ සවාමිඝා ගෙන්නවා මෙසේ කියන්නේ, සගය මට උපස්ථානකරවයි කියේය, හෙතෙම රාජසේවයකරන්ට නොකමැත්තේවිනමුත් රජහුගේ කිම නොක රණකල්හි මා කෙරෙහි රාජ දඬුසම් කෙරෙයි යන භයින් රාජ උපස්ථානය ඉවසා දවස්පතා රජ්ජුපස්ථානයට යන්නේ රජතෙවේ දැ ඔහුට බත් වැටුප් දෙවා කීප දවසක්ම ගියකල්හි තමන්ට උ පස්ථානය පිණිස ආ පුරුෂයාහට කියතුයේ,සගයෙනි යෙව අසවල් තැන එක් වලෙක් ඇත්තේය, එහි ගොස් අරුණුවත් මැටි හා රත්තොත්පලයන්ද ඇරගෙණ අදම එව එසේ නාවහොත් තාගේ දිවි නැතැයි කීහ. ඒ පුරුෂයා ගිය කල්හි රජතෙම දෙරටුපාල යාහට කියතුයේ අද හිරබස්නට ප්‍රථමකොට සියලු දොරවල් වස වයි කීහ, ඒ පුරුෂද පොකුණුතෙරට ගියේය, ඒ පොකුනද අම නුෂ්‍යාධිග්‍රහිත වන්නේයයි කියා පළමුකොටම අසනලිද්දේය, එ හෙයින් ඔහු විලට බසින්ට භයින් මෙහි නිසි උපද්‍රවයෙක් ඇද්ද නැද්දැයි කියා විලවටේ ඇවිදිනේය, ඒ දැක පොකුණ පාලනය කොට සිටින දිව්‍යරාජතෙම ඔහුට කරුණ උපදවා මනුෂ්‍යවේශ යෙන් අවුත් සිට පින්වත් පුරුෂය තොපි කුමක් පිණිස මෙහි ආ යෙහි දැයි විචාළේය. එකල්හි ඒ පුරුෂතෙම අමනුෂ්‍යයාහට ඒ ප්‍රවෘත්තිය කීහ, එකල්හි අමනුෂ්‍යතෙම කියතුයේ පින්වත්නි ඉදින් එසේවීනම් යපෙන පමණ මැටි හා මල්ද ගනිවයි කියා තමන්ගේ දිව්‍යශ්‍රීය දක්වා අන්තර්ධානවූයේය. ඒ පුරුෂතෙම ඒ විලෙන් අරුණුවණ් මැටි හා රක්තොත්පලයන්ද හැරගෙණ හිරබස්නට පළමුවෙන්ම නුවරට පැමිණියේය, ඒදැක චාරපාලතෙ ම ඔහු මොරගහමින් සිටියදීම නුවර දොර වැසුයේය. දොර වැසූ

හෙයින් නුවර තුළට වදින්ට නොහැකිව ඒ පුරුෂතෙම නුවර දොරටුව සමීපයෙහි දිවස්ගුල උන් පුරුෂයාට කියන්නේ මම අරුණුවන් මැටි හා රක්තොත්පලයනුත් හැර ගෙණ හිර බස්නට ප්‍රතමකොටම අවුත් සිට මොරගසමින් සිටියදීම මොහු නුවර දොර වැසුවාහ. මම කලින්ම ආයෙමි, මා අතදෙස් නැත, ඒ බව තෙපි දැනගනිවයි කියා ගුල උන් පුරුෂයාහට කීහ.

එකල්හි ඒ අසා ගුලවුන් තැනැත්තේ මෙසේ කියන්නේය. මම නම් වධයට පැමිණ ගුලවුන් තැනැත්තේය. දැනට මම මරණානුමූඛව සිටිමි, එසේවූ මම තොපට කෙසේ සාක්ෂි කියම්ද, මහත් ඉර්ධි ඇතිව එක් ප්‍රේතයෙක් මෙහි මම ලඟට එයි, ඔහු සාක්ෂිකරවයි කීහ. එකල ඒ පුරුෂතෙමේ කියනුයේ ඔහු මට කෙසේ සම්භවෙන්නේ දැයි විචාළේය. තොපි මෙහිම සිටිව එක ල නමන්වම පෙනෙවයි කිව, හෙතෙම එහි සිටින කල්හි මධ්‍යම යාමෙහි එනනට ආවාවූ ප්‍රේතයා දැක කියනුයේ තොපිත් මේ කාරණය දැනගණිවයි කියා ප්‍රේතයාට සාක්ෂිකෙළේය. ඉක්බිති අළුයම්වූ කල්හි රජහු විසින් කියනුයේ කොල තෑ මාගේ නියම ය ඉක්මුයේය, එහෙයින් තව රාජ දඬුයම් කරවම් කී කල්හි ඒ පුරුෂතෙම කියන්නේ දේවසන්වහන්ස මාවිසින් නුඹවහන්සේගේ ආඥාව කඩනොකළෙමි, හිරබැසීමට ප්‍රථමයෙන් මම මෙහි ආයෙමි කීය. එකල්හි රජතෙම විචාරණුයේ ඒ හැණ තව සාක්ෂි කවුදැයි විචාළේය.

එතෙම කියන්නේ දේවසන්වහන්ස මේ දිවස්ගුල උන් පුරුෂයා ලඟට එන්නාවූ නග්නප්‍රේතයෙක් ඇත මේ කාරණාව තොපිත් දැනගනිවයි කියා ඕහට මම සාක්ෂිකෙළේයයි කීයේය. එබව අපි විසින් කෙසේ දැනගතහැකි දැයි කියා රජහු විසින් විචාළකල්හි එසේවිනම් නුඹවහන්සේ විශ්වාසකරන්නාවූ පුරුෂයකු අද රෑ මාහා සමඟ එවුවමැනවයි කීයේය. ඒඅසා රජතෙම තමන් ඔහු හා සමඟ එනනට ගොස් සිටින කල්හි ඉහතනී ප්‍රේතතෙම එනනට අවුත් දිවස් ගුල උන් පුරුෂයාහට කියන්නේ පින්වත තෙපි ජීවත්වෙව, ජීවත්වීමම උතුමැයි කියා ප්‍රේනතෙමේ දිවස් ගුලඋන් තැනැත්තාහට කී කල්හි විසාලාමහනුවර රාජ්‍යකරම්න් සිටි ඒ අඹසක්බරනම් රජතෙම පින්වත තෙපි ජීවත්වෙව, ජීවත් වී මම උතුමැයි යනාදී ප්‍රේතයා විසින් කී වචනයාගේ අර්ථය දැනගත්නා පිණ්ඩ ප්‍රේතයාගෙන් මේ ප්‍රකාර විචාරන්නේ

(212) සෙයඤ්ඤනිසජ්ජා න සීමසස අත්ථි
අභික්ඛමෝ නත්ථි පටික්කමොවා
අසිතපීත ඛායිත වත්ථ හොගා
පරිචාරිකා සාපි නසි මසස අත්ථි

(213) එතාදිසං උත්තම කිච්ඡජතතං
උත්තාසිතං පුච්මඤ්ඤ සුලෙ
අථ කෙන වණ්ණෙන වදෙසි යඤ්ඤ
ජීව හො ජීවතමෙව සෙයෙතී

(212) යහතු හෙයින් එඛා යඤ්ඤය මේ කොසඛ ඝුලෙහි හිදිනා තැනැත්තාහට යම් කිසි ආසනයක පිට දිගහැර නිදගන්ට ඛැරි හෙයින් නිදගැනීමකුත් මොඝුට නැත, එසේම යම් කිසි තැනක හිදීමකුත් නැත, ඔඛ්මොඛ යාම් ර්මි සඞ්ඛ්‍යත සඞ්ල්ප ගමණ කුත් මෝහට නැත,, කැමිපීම් ආදිය පරිභොගයකුත් මෝහට නැත්තේය, එසේහෙයින් ඇස් කන්නාසා ආදි ඉන්ද්‍රියයන්ගේ පරිහරණයකුත් මෝහට නැත්තේය, පුච්යෙහි මොඝුගේ ඤුතිමිත්‍ර අනුකම්පකාදි කෙනෙක් ඇද්ද දැන් ඔඝු මුඝුන පමණවත් නොලබන්නාවූ වෙති, එකතුව වාසයකරන්ට කොයින් ලැබේද, ඒ ඤුති ආදීන් විසින් දැන් මොඝු හැරදම්න ලද්දේය, මොඝු දැන් මැරුණ වැන්න මැරුණහට ඤුතිමිත්‍රාදීන් ගෙන් කෘත්‍යයක් නැත්තේය, ජීවත්ව ඝුන්නේවීනමුත් මොඝුගෙන් අපව ඝතයුතු දෙයක් නැතැයිකියා වසතු විකල තැනැත්තා ඤුතිමිත්‍රාදිඝු හැරදමන්නාඝුය. යමෙකුට වසතු ඇතිනම් ඔඝුගේ වසතුව බ්‍රාහ්මනුෂ්‍යයෝ ප්‍රියවචන නියන්නාඝුය, මුඝුන බලන්නාඝු ඔඝු පිරිවරාගන්නාහ, වසතුවෙන් උසස්වූවාහට බොහෝ මිත්‍රයෝ ඇතිවන්නාහ, ලෝකයෙහි සවභාව මේ ප්‍රකාරවෙයි මොඝු දැනට සිටුලු වසතුවෙන් පිරිහුනේය, ලෝභයෙන් හැවසිගත් ශරීර ඇත්තේය, ඝුල හැනීමෙන් කැඩුනු බිඳුනු අභ්‍යන්තර ශරීර ඇත්තේය. දැනට මොඝුගේ ප්‍රාණයනම් තාන අඟ තිබෙන පිනිබිඳුව මෙන් මොඝුගේ ප්‍රාණය අදින්හෙටින් නිරුඬවෙයි, එයින් ඇතට ප්‍රානය නොතිබෙයි

(213) එකාසඔ ඝුල අමුනා තිබෙන මොඝු පින්වත නොපි ජීවත්වව, මේ ලොකයෙහි ජීවත්ව හිඳීමම මැරීමට වඩා සියක් කොටසින් දහසක් කොටසින් උතුම්යි කියා නොපි විසින් මොඝුට ඤුමන කාරණයකින් එසේ කියන්නෙහි දැයි කියා රජතෙම

ප්‍රේතයාගෙන් විචාළේය. එකල්හි ප්‍රේතතෙම රජහට තමාගේ අභිප්‍රාව ප්‍රකාශකොට කියනුයේ මෙසේ කීව.

(214) සාලොහිතො එසො අහොසි මයහං
අහං සරාමි පුරිමාය ජාතියා,
දිස්වා මෙ කාරුඤ්ඤං අහොසි රාජ
මා පාපධම්මා නිරයං පතායං.

(215) ඉතො චුතො ලිච්ඡවි එස පොසො
සතුස්සදං නිරයං ඝොර රූපං,
උපපජ්ජති දුක්කට කම්මකාරි
මහාභි තාපං කට්ඨකං භයානකං.පෙ.
මා චෙතතො ජීවිතසඝුපරොධි.

(114) යහු හෙයින් මහරජ මේ දිවස්හුලඟිදිනා පුරුෂතෙම සමාණලෙයින් උපන් මාගේ නැගෙක් වෙයි, පවිටු සවභාව ඇත් තැවූ මේ තෙම මැරී ගොස් පචවිධ බන්ධනයෙන් දුක් විඳිම ඇත් තාවූ ගිනිමෙන් රත්වූ ලොහොදිය මුඛයෙහි වත්කෙරීම ඇත්තා වූ අහුරු පවතයෙන් අහුරුපවීතයට නැත්වීම ඇත්තාවූ ලෝහ කවාරමේ බහලිම ඇත්තාවූ අසිපත්‍ර වනයට ප්‍රවේශකිරීම ඇත්තා වූ වේතරනී නරකයට පැමිණවීම ඇත්තාවූ අවිචිමහා නරකයෙහි දැම්ම ඇත්තාවූ අතිසයින් කෘරදුක් ඇති මහත් සන්තාප ඇති අතිශයින් භයානකවූ අනිෂ්ට විපාක ඇති නරකයෙහි මොහුමැරී ගොස් උපදිනබව මම දැක එසේ උපදිනබව කීයෙම් වීනම් මොහුඛ වේදනා ඉපදී වහාම මැරෙයි යනකරුණවෙන්.

(215) නරකයෙහි උපදිනබව මොහුට නොකියා පින්වත්නි තොපි ජීවත්වෙව. මේ ලෝකයෙහි ජීවත්වීම මැරීමට වැඩියෙන් සියක් කොටසින් දහසක් කොටසින් උතුමැයි කියා මෙපණක් නියම් මහරජයයි කීයේය. මෙසේ ප්‍රේතතෙම තමාගේ අභිප්‍රාව ප්‍රකාශකොට කී කල්හි නැවත රජතෙම ප්‍රේතයාගේ ප්‍රවෘත්තිය විචාරමින් මෙසේ කියනුයේ.

(216) අක්ඛතො එසො පුරිසස්ස අත්තා
අක්ඛුපි ඉච්ඡාමයෙ පුච්ඡිතුං භං
ඔකාසකම්මං නො සචෙ කරොසි
පුච්ඡාමහං නවතො කුජ්ඣිතබ්බං.

(117) අඩාපනිඤ්ඤ මෙතදඅග්ග
ආචික්ඛණ අපසන්නානඤ්ච හොති
අකාමසඞ්ඛ්‍ය වචොනිකඤ්ඤා
පුච්ඡිස්සුමං කාමං යථාවිසයහන්ති

(216) යක්ඛයෙසින් එඛා යක්ඛය දිවස්ඝුල ඉන්නාවූ පුරුෂයා ගේ මේ ප්‍රවෘත්තිය මම දනිම්, එතකුදුලවත් මනුෂ්‍යයෝ මාගෙන් යම්කිසිදේ විචාරන්නේයයි සිතා මට නොකිපි ඇසිමට තොපට අවකාශ දෙන්නෙඛි විනම් මම තවත් කාරණයක් තොපගෙන් විචාරන්නෙමි, තොපිනොකිපෙයි, රජතෙම කීහ

(217) එකල්ඛි ප්‍රේතතෙම කියන්නේ මහරජ දැනගැනිම්ට විචාරීම පිණිස මාගේ ප්‍රතිඤ්ඤ දීම ප්‍රථම දැනීමේදීම ඒකාන්නවූයේය. රිට කාරණකවරේද? තොපි විචාල කාරණය මම කියෙමි. කාරණයක් විචාළකල්ඛි අප්‍රසන්නයාගේ නොකීම ඇත්තේවෙයි, පළමුවෙන් තොපි මා කෙරෙඛි ප්‍රසන්න නැත්තේය, එකාරණයෙන් ප්‍රථමයෙන් මගෙන් තොපි ප්‍රත්ඤ නොගත්තේය, දැන් මම තොපට නොකමැත්තේම තොපට ඇදඛිය සුතු වචන ඇත්තක්වූයෙමි, එහෙයින් විචාරන්ට කැමැත්තක් විචාරව, මාවිසින් කියාදෙන්ට සුදුවන්වූ දෙයෙක්නම් මට කුවන ඇති තරම්න් තේරුම්කර දෙමයි කියේය

යම්තිසිවක් විචාරීමට මෙසේ ප්‍රේතයා විසින් අවකාස දුන්කල්ඛි අඛසඞ්ඛර රජතෙම කියතුයේ යක්ඛයානෙනි මම නම් ඇසින් දුටු යමක් ඇද්ද ඒ සියල්ල අදහන්නාවූ ඇසින් කුදුටු දෙය විසවාස නොකරන්නාවූ කෙනෙක් වූයෙමි, ඇසට නොපෙනෙනදෙය මම විසවාසනොකරෙමි, මේ කිමහැණ මට තොප නිග්‍රහකරන්නෙව, දැනට තොපි කීදෙය දුටුදෙයද සියල්ල විසවාසකරම්, තොපි කෙරෙඛි ඉතා ප්‍රසන්නවූ යෙමියිකීහ. එය අසා ප්‍රේතතෙම කියන්නේ මහරජ තාගේ ඒ කිම සත්‍යවේවා, මා විසින් නියන්නාවූ ධම්මය තොපි කෝප නැතිව දැනගන්නා කැමැත්ත ඇතිව අසා එහි සිත ප්‍රසන්නකරව. මා විසින් කියන්නාවූ යමක් ඇද්ද ඒ සියලල තෝ ඇසට පෙනුනාක්මෙන් අදහගණුවයි කියේය. එකල්ඛි රජතෙම මෙසේ විචාරන්නේ එඛා යක්ඛය තොපි සවිලඞ්කාරයෙන් සැරසුනාවූ සුභ්‍රවණ් අසවයානාවකින් මේ දිවස්ඝුල උන් පුරුෂයා ලඟට ආයේ වන මේ දක්ඛිණඛිවූ අත්භූතවූ අසවයානාව නොපට කවරනම් කුසලකම්මයක් හේතුකොට ගෙණ පහළවූයේදැයි විවාළේය එකල්ඛි ප්‍රේතතෙම කියතුයේ මු

ඛරජ විසාලාමහනුවර මධ්‍යයෙහි මනුෂ්‍යයෝ යන එන මාර්ගයෙහි එක් ප්‍රදේශයක මඩෙන් ගැවසීගත් එක් වලෙක් ඇත එහිදී මනුෂ්‍යයෝ ඔබ්මොබ පැන පැන යාමෙන් අපද වෙනත් මනුෂ්‍යයෝද වෙහෙසට පැමිනෙති, මම මනුෂ්‍යව සිටිකල සැපසේ මනුෂ්‍යයින් ට යාම්ඊම් පිණිස කල්හිය ගොත් හිස් ගෙණැවිත් ඒ මඩෙහි දමා ඒ දණ්ඩින් කෙළෙමි, ඒ කුශලකම්මය හේතුකොට ගෙණ මෙබඳු දක්ෂිණාහී අත්භූතවූ අශ්වයා නාවක් මට පහළවූයේයයි කීහ. ඉක්බිත් තෙත් රජතු කියන්නේ එඩා යක්ෂය තොපගේ ශරීර වර්ණය සියලු දිසාවන් බබුළුවන්නේය තවද තොපගේ ශරීරයෙන් සුගන්ධයහ මන්නේය. මහත් යක්ෂඍර්ධියා මහත් ආත්මභාව ඇත්තේව එතකුදු උවත් විලිවැසිලලක් නැතිව නගනව සිටින්නේය, මේ කී කාරණ විෂයට හේතුකවරේද? ඒ මට කියවයි කීයේය—මහරජ මම මිනිස්ලොව උපන් කල්හි ක්‍රෝධ නැතිව නිතර ප්‍රසන්න සිත් ඇතිවූයෙමි, *මනුෂ්‍යයින්ට මොලොක් වචන කියා කථාකෙළෙමි, මේ කුශලකම්මය හේතුකොට ගෙණ මට මෙබඳු ශරීර වර්ණයක් ඇතිව සිට සියලු දිසාවන් බබුළුවම්—තවද මහරජ මම මනුෂ්‍ය ව සිටින කල්හි ගුණ ඇතතවුන්ගේ ගුණය නොසඟවා ඇති පරිද්දෙන් වර්ණනාකෙළෙමි, ඒ කුශල හේතුකොට ගෙණ මාගේ ශරීරයෙන් දිව්‍ය සුගන්ධය පැනිරෙයි—

තවද මහරජ මම මනුෂ්‍යව සිටිකල්හි එක්දවසක් වස්ත්‍රය ගොඩතබා වතුර නහන්නාවූ මාගේ යහළුවෙකුගේ වස්ත්‍රය ක්‍රීඩා පිණිස සහවා වෙහෙසකොට නැවත වස්ත්‍රය ඔහුට දුන්නෙමි, ඒ අකුශල කම්මය හේතුකොට ගෙණ විලිවැසිල්ලක් නැතිව නගනව ඇවිදිමි, යම් පුද්ගලයෙක් තෙම ක්‍රීඩා පිණිස අකුසල් කෙරේනම් ඔහට මේ තරමෙන් අකුශල කම්මය විපාකය වන්නේය, ප්‍රයෝජනයක් සලකා අකුසල් කෙරෙත්නම් ඔවුන්ට ලැබෙනදුක් විපාකය කියනුම කවරේද? යම් මනුෂ්‍යයෙක් තෙම දුශ්‍යවූ සිත් ඇතිව කයින් වචසින් මනසින් අකුශල්කොට කෙලෙසුනාහුවෙද්ද ඔවුන් සැක නැතිව පරලොවදි නරකොත්පත්ති කරන්නාහුය. සම්භරෙක් සුගතියෙහි උත්පත්තිය ප්‍රාර්ථනාකොට දානාදි කුශලක්‍රියායෙහි ඇලුනාවූ ශරීරයෙහි ආදීනව සැලකි මෙහිද ඉඳුනාහු පරලොවදි සැක නැතිවම ඔවුන් දිව්‍යලෝකෝත්පත්ති කෙරෙති කීයේය—මෙසේ ප්‍රේතයා විසින් සංක්ෂේපයෙක් කථම එලවිභාගකොට නිකල්හි ඒ අදහානොහෙණ රජතෙම මෙසේ කියන්නේය—

යක්ෂය කාමවිතක්කාදියෙන් දූශ්‍යවූ සිත් ඇතිව යමෙක් අකුසල් කරන්නාහුද ඕහට මෙබදු දුක් විපාක ලැබෙයි, යහපත් අධ්‍යාසය ඇතිව යමෙක් පින් කෙරේද ඕහට මෙබඳු සැප විපාක ලැබේයයි කියා නොපවසින් ගම් කියමනක් කීයෙහිද, ඒ කාරණය මම කෙසේ අදහගනිම්ද කවරෙක් මට මේ කාරණය විශ්වාස කර වන්නේවේද එසේ විශ්වාසකරවන්නටසමර්ථවූ පණ්ඩිතයා කවරෙක්ද ඒ කියවයි කියා ප්‍රේතයාට කීහ, එකල ප්‍රේතතෙම කාරණයකින් ඒ ප්‍රවෘත්තිය ප්‍රකාශකරම්න් මෙසේ කිහ,

මහරජ අකුසල් කළාහට දුක්විපාක ලැබෙනබව හා කුසල්කළාහට සැපවිපාක ලැබෙනබවත් ප්‍රත්‍යක්ෂවශයෙන් දන්නා ධර්මය අසා ඒ අනුසාරයෙන්වත් කුසලාකුසල කර්මය මෙබඳු විපාකයක් ඇත්තේයි කියා අදහාගනුව. කුශලාකුසලයයි කියා කර්ම දෙකක් නැත්නම් සුගතියෙහි උපදවා සැපවිඳින්නාවූ සත්වයෝ කොයින්ද අපායේ උපදවා දුක්විඳිනනාවූ සත්වයෝ කොයින්ද ඒ දෙක තෙසේවේද, මේ මනුෂ්‍ය ලෝකයෙහිදී මනුෂ්‍යයෝ කුසල්කුසල කර්මයන් නොකලාහුනම් සුගතියෙහි ඉපිද සැපවිඳින්නාවූ සත්වයෝත් නැත දුගතියෙහි ඉපිද දුක්විඳින සත්වයෝත් නැත්ත මනුෂ්‍යලෝකයෙහි හෝ හීනප්‍රණීතවශයෙන් උපන්නාවූ සත්වයෝත් නැත්තාහ ධර්මතාවයකින් මනුෂ්‍යයෝ කුසල් අකුසල් කරන්නාහු වෙද්ද එහෙයින් සුගති දුගති දෙකෙහි ඉපිද සැප දුක් විඳින්නාහුය, මනුෂ්‍යලෝකයෙහින් කුලයෙන්හා රූප ආරෝග්‍යපරිවාරාදි උදුර සම්පතින් සුක්තාවද ඒ දෙය නැතිවද හීන ප්‍රණීතවශයෙන් උපදින්නාහුය සුඛ වේදනීය කර්මය යමෙක් කෙරේද ඔවුහු දිව්‍යලෝකයෙහි දේවතාවෝව උත්පත්තිකොට දිව්‍ය සුඛයෙන් සම්පූර්ණව ඉන්ද්‍රියයන් සතුටු කෙරෙති යම් බාලයෙක් දුකඛවේදනීය සුඛවේදනීය කර්මය මේයයි කියා අදහානොගෙණ අකුසල් කිරීමෙහි ව්‍යාවෘතවූවාහුද ඔවුන් දුකඛවේදනීය විපාක අනුභවකිරීම්න් නරකාදියෙහි උපදවා නොයෙක් ලෙසින් කාරතර දුකට පැමිනෙන්නාහුයයි කීයේය, එකල්හි රජතෙම කියන්නේ යක්ෂය නොපි මෙසේ කර්මඵල අදහන්නෙහි වීනම් කුමක්හෙයින් මෙවැනි දුකක් අනුභවකරන්නෙහිදැයි විවාළේය.

එවිට ප්‍රේතතෙම් කියන්නේ මහරජ මම විසින් පූර්වයෙහි විලිවැසිලි ලැබීමට හේතුවූ කරණලද කුසලකර්මයකුත් මට නැත්තේය මානමට දන්දී මට දක්ෂිණාව උදෙසනකෙනෙකුත් නැත. මාවිසින් පූර්වයෙහි කරණලද කුසලකර්මයකුත් නැතිහෙයින්ද

වසනුපූජාකොට මට දක්ෂිණාව දුන් කෙනෙකුත් නැතිහෙයින්ද දුන් විලිවැසිලලක් නැතිව නගනව දුක්වූ පැවතුම් ඇතිවූයෙමි කීය ඒ අසා රජතෙම ඒ ප්‍රේතයාහට වසනුලබාදෙන්ට කැමතිව ප්‍රේතයාගෙන් විචාරණුයේ එඛා යක්‍ෂය යම් ආකාරයකින් නොපව වසනු ලැබේද එබඳු කාරණයන් ඇත්තේවිනම් මට අදහාගතයුතු අන්දමින් ඒ කාරණය කියවයි කීයේය, ඉක්බිත්තෙන් ප්‍රේතතෙම රජහට ඒ කාරණය ප්‍රකාශකරණ්ණේ—

මහරජ අග්‍රවූ මාගීඵලධ්‍යානයෙන් යුක්තවූ සෞඛ්‍යවූ අහිත් ඵලප්‍රාපතවූ පඤ්ච විමුක්ති ඇතතාවූ ඉන්ද්‍රිය සංවර ඇතතාවූ ප්‍රාතිමොක්‍ෂ සංවරය ඇතතාවූ සියලු කෙලෙස් දුරලල නිවුවාවූ උතුම් අග්‍රඵල සම්‍යක්ප්‍රාප්තිප්‍රාපතවූ මිහිරිවචන ඇතතාවූ ධර්මය දනනාවූ සුවචවූ සුඛමවූ ආගමසම්පනනවූ පමණදුන කරණ්ණවූ යහපත් කථාව ඇතතාවූ මෛත්‍රී විහරණයෙන් යුක්තාවූ දිව්‍යමනුෂ්‍යයන්ට පුණ්‍යක්ෂෙත්‍රවූ දක්ෂිණාහිවූ සන්සිඳුවනලද කෙලෙස් ඇතතාවූ පහවූ මිථ්‍යාවිතකය ඇතතාවූ නිදුක්වූ තෘෂ්ණා ඇතතාවූ සියලු භවයෙන් මිදුනාවූ පහවූරාගාදී කෙලසයන් a ඇතතාවූ නිසි දෙයෙක්හි මමත්වය නැතතාවූ කාශවංකාදිය නැතතාවූ කෙලස අභිසංස්කාරාදි උපධිරහිතවූ ක්‍ෂයකරණලද තෘෂ්ණා ප්‍රපඤ්චාදිය ඇතතාවූ නිරුත්තරක්‍ෂණලොකයෙන් යුක්තවූ උතුම්අල්පෙච්ඡතාවෙන්යුක්තවූ ප්‍රතිඵ්‍ඡනන ගුණඇතතාවූ දැකත් මෙබඳු ගුණ ඇතෙතක, මෙබඳු සවභාව ඇතෙතක, මේබඳු සිල් ඇතෙතකැයි කියා දැනගන්ට නොහැකි ගම්භීර ගුණඇතතාවූ 'කපිනක' නම් භික්‍ෂූන්වහන්සේ නමක් මේ විසාලාමහනුවර ඇත ඒ භික්‍ෂූන්වහන්සේ තෘෂ්ණානැතිකෙනෙක යහපත්සවභාව ඇතෙතක අහිත් කෙනෙකැයි කියා යක්‍ෂාදීන් අතුරෙහිත් ප්‍රසිඩය මහරජ නොපි ඒ භික්‍ෂූන්වහන්සේට වසනුයුගලයක්හෝ දෙකක් හෝ පූජාකොට මට දක්ෂිණාවදෙවුනම් උන්වහන්සේ පිළිගත්විනම් නොපි විසින් මට දක්ෂිණාව දුන්කල්හි දිව්‍යවසනුඝැඳ පොරවාගෙණ එන්නාවූ මා බැලුවමැනවැයි කීහ—

කපිනක භික්‍ෂුවනම් ජටිලයෝ දහස අතුරෙහි ආයුෂ්මත් උපාලි තෙරුන්වහන්සේගේ උපාධ්‍යාය නම්වෙයි—එකල්හි රජතෙම ඒ භික්‍ෂූන්වහන්සේ වාසයකරණතැන විචාරණුයේ, එඛා යක්‍ෂය එබඳු ගුණයෙන් යුක්තවූ ඒ භික්‍ෂූන්වහන්සේ දැන් කොයි ප්‍රදේශයෙහි වාසයකරන්නේවේද කෙසේ අපි එහි ගොස් ඒ භික්‍ෂූන්වහන්සේ දැකගන්නෙමුදැයි විචාළේය—මහරජ අප්‍රමාදවිහරණය ඇතතාවූ ආශ්චර්‍යවූ සත්‍යවූ ගුණනාමාදියෙන් යුක්තවූ

a රාගාදි සල්ලයන් ඇතුම් පිටපත්හි.

මේ "කපිතකා" නම් භික්ෂුතෙම වඳුරන්ගේ නැටීම පවත්නා හෙයින් කපිතච්චනාවයයි කියනලද ප්‍රදේශයෙහි දැන් බොහෝ දේවතාවන් විසින් පිරිවරණලදුව වැඩහිඳ ධම්මදේශනාකරන්නේ යයි කියා, ප්‍රේතයා විසින් මෙසේ කී කල්හි රජතෙම එකනෙහිම තෙරුන්වහන්සේ ලඟට යනුකැමතිව කියනුයේ, යක්‍ෂය මම එසේකෙරෙමි දැන් ඒ භික්ෂූන්වහන්සේ ලඟට ගොස් ශ්‍රමණයින්වහන්සේට වඤ්චනාගලයකින් පූජාකෙරෙමි නැවත තොපට දක්ෂිණාව උදෙසනෙනාමුව උන්වහන්සේ විසින් පිළිගන්නාලද්දේ චිතම් දිව්‍යවඤ්චහැඳ පොරවාගෙණ ආවාවූ තා බලා දැනගන්නෙමුයයි කීහ.

ඉක්බිති ප්‍රේතතෙම සිතනුයේ ස්ථවිරයන්වහන්සේ දැන් දේවතාවන්ට ධම්මදේශනාකරණසේක මේ වේලාව එලඹෙන්ට සැහෙනවේලාව නොවේඃයි කියා දක්වන්නේ මහරජ අවේලාවෙහි ප්‍රවෘර්ජිතයන්වහන්සේ කරා නොඑලඹිනමැනව ලිවිජ්ව් රජුනි අවේලාවල්වල යම්තැනකට යාම තොපට යහපත්නොවෙයි එහෙයින් සුකතප්‍රාප්තවේලාවෙහි එලඹ එතැන්හිදීම රහසිගතව ඉන්නවුන් බලවයි කීයේය. මෙසේ ප්‍රේතයා විසින් කීකල්හි රජතෙම යහපතැයි පිළිගෙණ තමාගේ රජගෙවම ගොස් නැවත සුකතප්‍රාප්ත වේලාවෙක්හි වඤ්චගල අවක් ගෙන්වාගෙණ තෙරුන්වහන්සේකරා එලඹ එකන්පයෙක හිඳ පිළිසඳරකථාකොට සවාමිනි මේ වඤ්චගල අට පිළිගතමැනවැයි කීහ.

එකල්හි අසා තෙරුන්වහන්සේ කථා ඉපදවීම පිණිස මහරජ තොපි පෙර දන්නොදෙත්ණෙක ශ්‍රමණබ්‍රාහ්මණවරුන්ට වෙහෙස කරණෙණක දැන් කෙසේ මේ ප්‍රනීතවඤ්ච පූජාකරණු කැමතිවිදැයි අසාවදාලසේක ඒ අසා රජතෙම ඒ තෙරුන්වහන්සේට කාරණ කියන්නේ ප්‍රේතයා ලඟාවූබව හා ප්‍රේතයා හා සමග කළාවූ කථා ප්‍රවෘත්තිශුද්ධ සියල්ල තෙරුන්වහන්සේට කියා වඤ්ච පූජාකොට නැවත ප්‍රේතයාහට දක්ෂිණාව දුන්නේය. ඒ දක්ෂිණාව ලැබීමෙන් ප්‍රේතතෙම දිව්‍යවඤ්චහැඳ පොරවාගෙණ සුභ්‍රවර්ණී අශ්වයාපිටට නැගිඅවුත් තෙරුන්වහන්සේගේ හා රජහුගේ ඉදිරියෙහි ප්‍රාතුර්භූතව සිටියේය, ඒ දැක රජතෙම සතුටුසිත් ඇතිව සොම්නස් ඉපදී ප්‍රත්‍යක්‍ෂවශයෙන්ම දැන් මා විසින් කම්මවිපාකය දක්නාලද්දේය එහෙයින් මම මෙතැන්පටන් පවුනොකරම් පින්මතරන්නෙමි කියා ඒ ප්‍රේතයාලවා සාක්ෂිකෙළේය.

එකල්හි ප්‍රේතතෙමේද මෙසේ කියන්නේය, ලිවිජ්විර්ජුනි ඉදින් තොප මෙතැන්පටන් අධම්මය හැරදමා ධම්මයෙහි හැසිරෙන්

නෙහි විනම් මෙසේ ඇති කල්හි තොපට සාක්ෂිකරන්නෙම් තොප ලහටද මම නැවත නැවත එම්, දිවස්හුලඳුන් පුරුෂයා වහා මුදව එසේකළකල්හි හෙතෙම ජීවිතය ලැබ සකලධර්මයෙහි හැසිරෙමින් නරකදුකින් මිදෙන්නේවෙයි තෙරුන්වහන්සේකරාද කලින් කලට එලඹ බනඅසමින් පින් කරවයි කියා ඒ ප්‍රේතතෙම සවිකීය ස්ථානයට ගියේය—ඉක්බිත්තෙන් රජතෙම තෙරුන්වැඳ හුවරට හොස් වහවහා ලිච්ඡවි පිරිය රැස්කරවා ඔවුන්ගේ කෑමැත්තාගෙණ ඒ පුරුෂයා දිවස්හුලිත් මුදවා මොහු සුවකරව්වයයි වෙදුන්ට ආඥා කෙළේය, නැවත රජතෙම තෙරුන්වහන්සේ කරා එළඹ විචාරණුයේ ස්වාමීනි නරකයෙහි උපදින අකුසල්කොට සිටිනාහට යම් කිසි ආකාරයකින් එයින් මිදීමෙක් වේදැයි විවාළේය— එකල තෙරුන්වහන්සේ වදුරණසේක් මහරජ නරකයෙන් මිදෙන උපායෙක් ඇත්තේය ඉදින් උදුරවූ පින්කරන්නේවිනම් නරකයෙන් මිදෙන්නේයයි කියා සවිරතෙම රජහු තුන්සරණයෙහිද පවශීලයෙහිද පිහිටවූසේක. ඒ රජතෙම තුන්සරණයෙහිද පවශීලයෙහිද පිහිටා නැවත තෙරුන්වහන්සේගේ අවවාදයඩු පරිද්දෙන් පිලිපැද දහසක් නයින් ප්‍රතිමණ්ඩිත ශ්‍රොතාපත්ති ඵලප්‍රාප්තවූයේය— හුලඅමුනා උන් පුරුෂතෙමද නිරොගිව සසරෙහි භවගත් භංගේඝ ඇතිව භික්ෂූන්ලඟ මහදාව නොබෝ කලකින්ම රහත්වූයේය— ඒ අර්ථ ප්‍රකාශකරන්නාවූ ධම්මසංගාහක සවිරයන්වහන්සේලා මෙසේ කීවාහුය.

(218) තථාහි වඤ්ඤ අගමාසි තත්ථ
පරිවාරිතෝ දුසගණේන ලිච්ඡවි,
සෝ තං නගරං උපසං කම්හා
වාසූපගංජිත්ථසකෙ නිවෙසනෙ—පෙ—

(219) ඉමං ච අට්ඨඟවරං උපෙතං
සමාදියාම් කුසලා සුබ්‍රුථං,

(220) චීවරං පිණ්ඩපාතඤ්ච පඨයං සය නාසනං
අනනාංඤානං ඛාදනීයං වත්ථසෙනාසනානි ච—

(221) භික්ඛුව සීල සම්පනෙන චිතරාගෙ බහුස්සුතෙ,
දදාම් නවිකමපාමි බුඩානං සාසනෙ රතො—

(222) එනාදිසො ලිච්ඡවී අඹසක්ඛරො
වෙසාලියං අඤ්ඤතරො උපාසකො
සඩො මුදුකාරකරො භික්ඛු
සංඝං ච සඤ්ඤඩං තදු උපට්ඨහි—

(223) සුලාවුතෝ ච අරොගොහුඩා
සෙරී සුඛී පඛබජ්ජං උපාගමි
භික්ඛුං ච ආගම්ම කප්පිනකුත්තමං
උභොපි සාමඤ්ඤෑ ඵලානි අජ්ඣගූ

(224) එතාදිසා සප්පුරිසාන සෙවනා
මහප්ඵලා හොති සතං විජානතං
සුලාවුතෝ අගාරඵලං ච පුඤ්ඤයි
ඵලං කනිට්ඨං පන අඞ්ග සඞ්ඛරොති

(218) යම්තුදෙයින් අඹසඛඩරනම් ලිච්ඡවි රජතෙම දැසහනයා විසින් පිරිවරණලදුව තුවරව ගොස් වසිතුරුවූ තමාගේ නිවේසන ගෙහි වාසයට එලඹියේ කවසුතු කෘත්‍යයන්නිමවා වතුර නහා ආහර අනුභවයෙන්හා පැන්බී අවකාශවේලාවක් ලැබ ඒ වේලෙහි වසන්තුබූ පේලාවෙන් සිතුවාරක පුෂ්පාවණී වසන්තසොයා වසන්තුබූ ගල අවක් හැරගෙණ ඒ වසන්තයන් දැසහණයාලවා ගෙන්වාගෙණ ඒ ලිච්ඡවි රජතෙම 'කප්පිනක' නම් භික්ෂූන්වහන්සේ වැඩවාසය කරවදුරණ කපිනවනාව නම් ප්‍රදේශයට ගොස් පිණ්ඩපාතයෙන් පෙරලා වැඩමවා රුක්මුල හුදකලාව වැඩහුන් සිඟිල්ගුණය ආති ශානාවූ සිත්ඇති ඒ ශ්‍රමණයින්වහන්සේ දැන ලඟට ගොස් සැප පහසු කථාකොට නැවත නියන්නේ, සවාමීනි මම්සාලාමහතුවර ලිච්ඡවියෙක්මි මට අඹසඛඩරනම් ලිච්ඡවි රජයයි කියනි සවාමීනි මාගේ පොහනවූ මේ වසන්තුසුගල අව පිළිගත මැනව තුඛවහන්සේව මම ඉඳි වසන්ත පූජාකෙරෙමි මාගේ චිත්තප්‍රසනන මේ වසන්ත පූජා කරණුපිණිසම මම මෙහි ආයෙමි කීහ)

එවිට ඝවිරතෙම නියන්නේ, මහරජ ශ්‍රමණ බ්‍රාහ්මණවරු දුරදීම නොපගේ නිවේසනය දැක හැරදමා දුරින්ම යන්නාහුය, ඒ අසලින් යාකල ශ්‍රමණ බ්‍රාහ්මණවරුන්ගේ පාත්‍රා බිඳින්නාහුය, ඇඟලසිවුරු ඉරන්නාහුය, ශ්‍රමණ බ්‍රාහ්මණවරු යනඑන කල පාදයන්වැනි පාදකුදුරිකාවලින් ඇද හිස් ඝට්කුරුව පෙර ලන්නාහුය තාවසින් ප්‍රවෘර්ජිතයින්ව මේ ප්‍රකාර වෙහෙස කරවන ලද්දේය ඒ තොපි ශ්‍රමණයන්කරා කෙසේ එලඹෙන්නේද, නොපි ඒ ශ්‍රමණ බ්‍රාහ්මණවරුන්ව නියඟව ගන්නාතරම් දෙයක් වත් තුදුන්නේය, මන්මුලාවී ඇවිදින්නාවූ, කෙනෙකුට මාගීය පමණවත් නොකීයේය, අනියින්ගේ සැරයටි දඬු කොල්ලෙන් තමන් ගන්නේය, නොපි මෙවැනි තද මසුරුකෙනෙක, කිසි සංවරයක් නැත්තාවූකෙනෙක, නැවත නොපි කුමන ගුණයක් හේතුකොට ගෙණ කුමක් පිණිස දැන් ශ්‍රමණවූ අපි හා සමඟ තමන් අඳින වසන්තවලින් දැනස්විහාර කරන්නෙහිදැයි විචාළසේක

එවිට රජතෙම කියන්නේ ශ්‍රමණබ්‍රාහ්මණවරුන්ගේ පාත්‍රා බිඳින්නාහුය, සිවුරු ඉරන්නාහුයයි යනාදී වශයෙන් නුඹවහන්සේ යමක් කියේවේද සවාමීනි ඒ සැබවි ඒ දෙය මාවිසින් කරණලද්දේය, කරවණලද්දේය, ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට බොහෝ වෙහෙස කෙළෙම්, සවාමීනි ඒ දෙය කෙළේ කෙරෙවූයේ ක්‍රීඩා පිණිසය දූෂ්‍යසිත කින් නොවන්නේය, ක්‍රීඩා පිණිසවූයේ නමුත් මට අකුසල්මවෙයි, සවාමීනි ක්‍රීඩා පිණිස අකුසල් රැස්කොවත් වසතුව උත්පත්තිකොට දුක්විඳිනට වන්නේය, සවාමිනි ක්‍රීඩාපිණිස පවුකොට ප්‍රේතඅපායේ උපදවා ලදරුවෙකුමෙන් වසන්න නැතිව නගනව දුක්විඳින්නාවූ ප්‍රේතයෙක් දුටුයෙමි දුඃඛාතුරයාඟට නමුත් නගනව ගිදිමට වඩා වැඩිතරම් දුකෙක් කොයිකද ඔහුගේ ඒ නගනවගිද දුක්විඳීම දැක මාගේ සිතට සංවේග උපන්නේය, ඒ නිසා මේ වසන්දැනය දෙමි, සවාමීනි මේ වසතුයුගල අට පිළිගෙණ වදාළමැනව, මාවිසින් දෙනලද මේ වසතු දක්ෂිණාවෝ ප්‍රේතයාඟටම ලැබෙඩා, අනුන්ට දීම බොහෝ ප්‍රකාරවලින් බුඩාදින්විසින් ප්‍රසංසාකරණලද දෙයක්වෙයි දෙන්නාඟටද ක්ෂය නොවනසේ වස්තුලැබෙයි කිහ——එකල්හි ස්ථවිරයන්වහන්සේ කියනසේක්, මහරජ තොපගේ වස්තුයුගලඅට මම පිළිගන්නෙමි මේ වසතු දක්ෂිණාවෝ ඒ ප්‍රේතයාඟට ලැබෙඩයි වදාළේය——

ඒ කල අඹසකඩරනම් ලිච්ඡවි රජතෙම හස්තපාදයන් ධොවනයකොට මුහුන නාවා තෙරුන්වහන්සේට ඒ වසතුයුගල අට පූජාකොට පිළිගත්කල්හි ප්‍රේතයාඟට දක්ෂිණාව දුන්නේය, එකල්හි ප්‍රේතයාඟට දිව්‍යවස්ත්‍රාදිය පඟලව දිව්‍ය වස්තුයන් හැඳ පොරවාගෙණ දිව්‍යඟරණ පැලඳගෙණ දිව්‍යමයවූ සඳුන්කලල් ගල්වනලද ශරීරඇතිව පරිවාරිකයන් විසින් පිරිවරණලදුව උදාරවූ ශරීරවර්ණයක් ඟා මහත් ඉර්ධියක්ඇතිව අවුත් තෙරුන්වහන්සේඟා රජහු ඉදිරියේ සිටින්නාවූ ඒ දිව්‍යරාජයා දූක රජතෙම තුටුපඟටුවූ ඔදවැඩියාවූ සිත්ඇත්තේ ඉඟාත්මයෙහි සියැසින්ම කුසලාකුසල කර්මවිපාකයන් දැක විශෙෂයෙන්ම සතුටු සිත්ඇතිව මෙසේ කියතුයේ මෙතැන්පටන් මම ශ්‍රමණ බ්‍රාහ්මණවරුන්ට දන් දෙන්නෙමි ශ්‍රමණබ්‍රාහ්මණවරුන්ට නොදෙන්ඩාවූ කිසි දුනවඤ්ඤුවක් මට නැත්තේය, යඤ්ඤයානෙනි තොපිත් මට බොහෝ උපකාරවූයේයයි කිහ——දේවතාවා කියන්නේ, ලිච්ඡවි රජුනි තොපිත් මට වස්තුදැනයදීමෙන් උපකාරකෙළේය, මේ තොපගේ වස්තුදැනය නිඤ්ඵලනුවූයේය, මනුෂ්‍යවූ තොපිඟා සමඟ අමනුෂ්‍යවූ මම නාවිසින් සාඤ්ඡිකරණලද්දෙමි කිහ——

ඒ විට රජතෙම කියන්නේ, එබා යක්‍ෂය තොප මට පිළි සරණකාරයෙක්ද වූයේය, නැවත දේවතාවෙක්ද වූයේය, මම ඇදිලිගෙණ කියම් යක්‍ෂයානෙනි නැවතත් තොප දකින්ට මම කැමතියයි කිය මහරජ ඉදින් තොපි අශ්‍රද්ධාවන්න වන්නෙහිවිනම් නද මසුරු සිත්ඇත්තේවිනම් තොපට මම දකින්ට නොලැබෙයි දකින්ට ලැබුනත් මම තොපිහා සමග කථානොකරෙම් ඉදින් තොපි කුසලධම්මයෙහි ගෞරවඇතොහි විනම් දන්දීමෙහි ඇලුනේවිනම් සඟයන්ට හිතානුකම්පාඇත්තේ විනම් ශ්‍රමණ බ්‍රාහ්මණවරුන්ට දන්දීමෙන් පැන්සැලක් මෙන්වූයේවිනම් තොපට මා දකින්වලැබෙයි දැක මා හා සමග කථාකරන්වත් ලැබෙයි. දිවස් හුල උන් පුරුෂයා ලඟට ඒම නිමිත්තාකොටගෙණ යම්හෙයකින් තවත් පුරුෂයෙකුට මම සාක්ෂිකාරයෙක් වූයෙම්ද, එහෙයින් උල උන් පුරුෂයාත් උලින් මුදව වහාම උලුලන් තැනැත්තේ මිදෙවූයේ වීනම් හෙතෙම කුසල ධම්මයෙහි හැසිරීමෙන් නරකෝත්පත්තියෙන් මිදෙන්නේය, තොපි නැවත නැවතත් මේ කජ්පිත කනම් භික්ෂූන්වහන්සේගේ සම්මුඛයට එලඹ දුශ්‍යසිත්නැතිව දැනගන්නාපිණිස කාරණ විචාරව ඒ භික්ෂූන්වහන්සේ තොපට යමක් කියාදෙන්නේවේද පෙර තොපි අසනලද දෙයද නාසනලද දෙයද ඇසින් දුටුදෙයද නුදුටු දෙයද තෙරුන්වහන්සේ විසින් කියල්ල ඇසින් දුටුවකුමෙන් අදහා ගනුවයි කියේය.

එ අඹසකඛරනම් ලිච්ඡවි රජතෙම එහිදී දේවතාවාහා සමග මෙසේ රහසට කථාකොට ඒ අමනුෂ්‍යයා සාක්ෂිකොට ගෙණ රජගෙට ගොස් ලිච්ඡවීන් රැස්කොට මෙසේ කියන්නේය, මේ රැස්වඉන්නාවූ සමූහතෙම මාගේ එක වචනයක් අසව්ය, මා විසින් ඊර්ෂ්‍යාඡනයක් ලබන්නෙම් නොහොත් මාගේ කැමැත්ත ඉඟකරවූ රාජඝාතකරණලදුව දඬුගම්කොට මේ පුරුෂයා ඊවස්හුල් තිබා මොහුට විසිරියක් ඉක්මුනාහ, මොහු රෞද්‍ර කම්ය ඇත්තේය, තවම නොමැරුනෙත් නොවෙයි මැරුනෙත් නොවෙයි ජීවත් නොව ජීවත්වන්නේය, ඔහු මම මාගේකැමැත්තෙන් මරණයෙන් මුදවම් රැස්වහුන් මේ හැමදෙන ඊට අනුදනිවා උලුලන් පුරුෂයා හා අනික් රාජඝාතයට පැමිණෙන්ව සිටි පුරුෂයාද යන දෙදෙනම වහාම මුදවූය වධප්‍රාප්තකොටසිටි පුරුෂයන්මිදෙවූයේයයිකියා මේ වජ්ජීරට කිසිවෙක් අපවාදනොකරති ඔවුන් දෙදෙන වහාම මුදවූය එසේවිනමුත් තොපගේ කැමැත්තක් කරන්වයි කී කල්හි ඔවුන් දෙදෙන මුදවන්ව අපිත් කැමති යයි කියා ඒ සමූහතෙමද

රජතුගේ කැමැත්තට එකඟවූයේය, ඒ රජතෙම දිවස්ථල ලඟට ගොස් හුලඳුන් පුරුෂයා උලින් මුහුනකොට ගඟඑව නෝ භය නොවේවයිහියා වෙයුන්ට භාරදී වෙයුන්ට සංග්‍රහකෙළේය, නැව ත කප්පිතක නම් තෙරුන්වහන්සේ ලඟට ගොස් දන්දී සම්බුධ යෙහි ශ්‍රද්ධ ඒ ලිච්ඡවිරජතෙම දැනගත්නා පිණිස කථාකෙරෙමින් මෙසේ කියන්නේ සාමීනි දිවස්හුල උස් පුරුෂතෙම මාවිසින් මුදවනලද්දේය, ඔහු මැරී ගොස් නරකයෙහි උපදින්නේයයි කියා යක්‍ෂයෙම කියේය, යම්කාරණයක් හේතුකොටගෙණ හෙතෙම නරකයට නොගියන්නේ වේද,සාමීනි එබඳු කාරණයක් ඇත්තේ වීනම් අදහාගතයුතුලෙස ඒ මට කියාදෑනවයි කියා—

ඒකල්හි තෙරුන්වහන්සේ නියනසේක්, මහරජ සංසාර ප්‍රවෘත්තිය ඇතිකල්හි නොහොත් සසර ඉපදීම ඇතිකල්හි උප පද්‍යවේදනීය වශයෙන්ද අපරාපර්‍යවේදනීයවශයෙන්ද විපාකනොදී ඒ කම්සත් විනාසනොවෙයි ඉඳුන් ඔහු දිවාරාත්‍රියෙක්හි අප්‍රමාදව කුසලධර්මයෙහි හැසිරෙන්නේවිනම් ඔහු නරකෝත්පත්තියෙන් මිදෙන්නේය, ඔහු කළාවූ සුභීය අනික් ජාතියෙක විපාකදීයයුතුවෙයි වදාළේය, එකල රජතෙම නියහුයේ ඒ පුරුෂයා ගට වන්නාවූ අප්‍රිය මම දැනගනිමි සාමීනි දැන් මටත් අනුකම්පා කළමැනවා, යම් පරිද්දෙනින් මෙම නරකයට නොගඹිද ඒ ප්‍රකාර මට අවවාද කළමැණවැයි රජතෙම කීහ, එකල්හි තෙරුන්වහන්සේ වදාරණසේක්—මහරජ නොපි දැන්ම ප්‍රසන්නසිත්ඇතිව බුත් සරණයෙව එසේම දහම්සරණයෙව සඟසරණයෙව එසේම නොකඩව පවසිලයන් සමාදන්වෙව ප්‍රාණඝාතයෙන් වැලකෙව නුදුන් නාවූ දෙයක්නොගණුව මද්‍යපානය නොකරව බොරුනොකියව සවකියහායඝ්‍යාවගෙන් සතුටුවෙව, නැවත බොහෝසෑපවිපාකදෙන කුසලයක්වත්නාවූ මේ අෂ්ඨාඟසීලයද සමාදන්වෙව චීවර පිණ්ඩපාත සේනාසන ගිලානප්‍රත්‍යය යන සිවුපසය යෑප්‍රත්‍යපන්නයන්ගෙ රෙහි ප්‍රසන්න සිත්ඇතිව දෙව ආහාර පානාදියෙන් සිල්වත් බහු ශ්‍රැතවිතරාගී භික්ෂූන් වලඳව මේසේ ඇතිකල්හි සදුකල්හි නොපමා පින් වැඩෙයි, මේ ප්‍රකාරයෙන් දිවාරාත්‍රි දෙක්හි කුසල ධර්ම යෙහි හැසිරෙන්නේවිනම් තොපි නරකයෙහි නුපදින්නේය. තොපගේ අකුසලධර්මය උපපද්‍ය වේදනීය වන්නේයයි වදාළේය— එකල්හි රජතෙම නියන්නේ සවාමීනි මම දැන්ම බුදුන් දහම් සඟ ඝයා සරණයොව යෙමි, එසේම නොකඩව පවශික්ෂාපද සමාදන් වෙමි ප්‍රාණඝාත නොකරමි සොරකම් නොකරමි මද්‍යපානය නොකරමි බොරු නොකියමි නුවණින දුරුවගුන් සතුටුවෙමි,

(219) බොහෝ සුව විපාක දෙන්නාවූ මේ උතුම් අෂ්ටාංගයි ලැබද සමාදන්වන්නෙම්.

(220) චීවර පිඬපාතාදි සිව්පසයද ආහරපානයන්ද වැසුඹේ නාසනයන්ද.

(221) ප්‍රසන්න සිත්ඇතිව සිල්වත් බහුශ්‍රුත විතරාගි භික්ෂූන්ට දෙව්, සම්බුදුසසුනෙහි ඇල්මකෙරෙම් නියා රජතෙම එදවස් පටන් අපායොත්පත්තියට භයවූ සිත් ඇත්තේ රත්නත්‍රයගිදු කුසලධර්මයෙහිද නැවත නැවත වඩන්නාවූ ප්‍රසාද ඇතිව සරණසිල්සමාදන්වීමෙහිද වෙනත් කුසලධර්මයෙහිද හැසුරුණේය.

(222) පූ ඒයෙහි අශ්‍රද්ධාචාරාව තදමසුරුසිත් ඇතිව ශ්‍රමණබ්‍රාහ්මණවරුන්ට කිසිත් දෙයක් නොදී භික්ෂූන්ට පරිභව බෙහෙවින් සිටි කකීසවූ මෙවැනි අඹසකඛරනම් ලිච්ඡවිරජතෙම සරණසිල් සමාදන්වීමෙන් විසාලාමහනුවරසිටි නොයෙක් දහස්ගණන් උපාසකවරුන්ගෙන් එක්තරා උපාසකයෙක්ව ශ්‍රද්ධාඇතිව සඞ්ඝයාහට උපකාරකාරියෙක්ව සිවුපසයෙන් මේ ප්‍රකාරයෙන් උපස්ථානකෙළේය.

(223) දිව්‍යචක්ෂුලැබුන් පුරුෂතෙමේද සුවවූරෝගය ඇතිව කපිනකනම් නෙරුන්වහන්සේ ලහට අවුත් මහනව හෙතෙම අග්‍රඵලඅර්හත්ඵලයට පැමිණියේය,

(224) ඒ ඔඹසකඛරනම් ලිච්ඡවිරජතෙම ශ්‍රොතාපත්තිඵලයට පැමිණියේය, සත්පුරුෂයන් සේවනය කිරීමෙහි මෙබඳු ආනිසංස ඇත්තේයයි කියා මේ ප්‍රවෘත්ති සියල්ලම සඟිතිකාරයෝ කීවාහ. මෙසේ රජහුගේ ප්‍රවෘත්තියද රජහුගේ හා ප්‍රේතයාගේ කථාදුවෘත්තියද සියල්ල ආයුෂ්මත් කප්පිනකඨවිරයන්වහන්සේ සැවැත්නුවරට වැඩ බුදුරජුනන්වහන්සේට සැලකෙළේය, බුදුරජුනන්වහන්සේ එම අනෝත්තප්තාකොටගෙණ සම්ප්‍රාප්ත පරසට ධර්මදේශනාකළසේක. ඒ ධර්මදේශනාතොමෝ මහජනයාහට සතුටුවූයාය. මේ ප්‍රේතවස්තු ප්‍රකරණයෙහි සතරවෙන මහාවග්ගයේ පළමුවෙනි අඹසකඛර ප්‍රේතවස්තුව නියා නිමවනලදී.

36 අඹසකඛර ප්‍රේතවස්තුව නිමි.

—:x:—

ත් වද මේ ප්‍රේතවස්තු ප්‍රකරණයෙහි සතරවන මහාවීථියේ දෙවෙනි සේරිසසක ප්‍රේතවස්තුව කවරහයත්?

ඒ ප්‍රේතවස්තුව යම්හෙයකින් සේරිසසක විමානවස්තුව හා සමාන අමුතු විශෙෂයක්නැතිව ඒකාකාරවේද එහෙයින් එතැන්හි යම් අක්ඛාත්පත්තියක් ඇද්ද ගාථා වණ්ණාවක් ඇද්දඒ සියල්ල "පරමාථ විභාවිනී" නම් විමානවස්තු වණ්ණාවෙහිදී කියන ලද්දේය, එහි කියනලද ක්‍රමයෙන් මේ ප්‍රේතවස්තුවේ විස්තර දතයුතුමෙම වගීයේ දෙවෙනි සේරිසසක ප්‍රේතවස්තුව කියනලද්දේය.

37 සේරිසසක ප්‍රේතවස්තු නිමි.

——:X:——

ත් වද මේ ප්‍රේතවස්තු ප්‍රකරණයෙහි සතරවෙනි මහාවීථියේ තුන්වෙනි නඳුක ප්‍රේතවස්තුව කවරහයත්?

විවිධොපචිත පාරමිතා සම්භාරයෙන් විශුද්ධවූ සර්වඥතඥානය ඇති බුදුරජානන්වහන්සේගේ පරිනිර්වාණයෙන් දෙසියයක් හවුරුදු පසුවූකල්හි සුරටඨිරට පිහිළ නම් රජෙක් වූයේය, ඒ රජතුගේ නඳුකනම් භාණ්ඩාගාරිකයෙක් ඇත්තේය, හෙතෙම මිථ්‍යාවගෙන පෙරලියාවූ දෘෂ්ටි ඇතිව කුසලාකුසලයන්ගේ ඵලවිපාක නැතැයි කියමින් ඇවිද්දේය. ඒ නඳුකනම් භාණ්ඩාගාරිකයාගේ බිරිඳවූ උත්තරානම් උපාසිකාතොමෝ සුදුසු කුලයකට සරණපාවාදුන්නේවේ ඇගේ ප්‍රියතොවූ නඳුකතොම මැරිගොස් මහාවිනාශකර යෙහි මහතුනගයසෙක විමාන ප්‍රේතයෙක්ව උපන්නේය, ඔහු මැරුණුකල්හි උත්තරාතොමෝ පවිත්‍රවූ සිහිල්වූ සුගතිජලයෙන් පිරුණුවූ පැන්කලයක් කොමළුපිටිවලින් කරණලද වණ්ඩගතිරයඥෙන් සමන්විත පුපයෙන් පුරවනලද තැටියක්ද එක්තරා රහතන්වහන්සේ කෙනෙකුට පූජාකොට මේ දක්ෂිණාව මාගේ පියානන්ට ලැබේවයි කියා පින් දුන්නියය. එකෙනෙහි ඒ ප්‍රේතයාහට ඒ දානය හේතුකොටගෙණ දිව්‍යමයවූ සුවද පැන්හා අප්‍රමාණ දිව්‍යසුපයන්ද පහළවූවාහුය, ඒ දැක ඔහු මෙසේ සිතුයේය, මාවිසින් බොහෝ අනුසල්කරණලද්දේය, බොහෝ මනුෂ්‍යසිරිත් මාවිසින් මිථ්‍යාදෘෂ්ටිය ගුන්වනලද්දේය, දැන් වනාහී පිංහල රජතෙම ධම්මාසෝ

කරජහට අවවාදදෙන්ට ගියේය, පිංගල රජතෙම ධම්මාසෝකරජ
හටත් ඒ දෑහැවියදී එන්නේය, එබැවින් මම ඒ පිංගල රජහුගේද
හැටිය හැරදමා මේ සිතුවේය, නොබෝ දවසකින් පිංගල රජතෙම
ධම්මාසෝක රජහට අවවාදදී පෙරලා තුවරට යමින් මාගියට පැ
මිණියේය, එකල්හී ඒ ප්‍රේතතෙම ඒ මාගිය තමන් වසන තැනට
අභිමුඛකොට නිවටිතකෙළේය, රජතෙම ඉතා මඩතණහැවිලෙන්
මාගියෙන් තුවරට ගන්නට එන්නේය, ඒ රජතෙම යනකල්හී පෙ
රමන පෙනෙන්නේය, ප්‍රථිපස්සෙහි මාවත අතහැරියන්නේය,
එකල හැමට පස්සෙහි එන්නාවූ පුරුෂතෙම පසුමාගියය අතහැර
නවන්නා දැක භයපත්ව මුරගසමින් දුවගොස් රජහට කියේය——
ඒ අසා රජතෙම භයපත්ව කලනිරුණු සිත් ඇත්තේ ඇතා උඩ
සිට සතරදිසාවන් බලමින් ප්‍රේතයා වසන නුගගස දැක සිවුරාග
සෙනහ හා සමග රට අභිමුඛව ගියේය, ඉක්බිතෙන් කුසයෙන්
ගොස් නුගගස ලඟට පැමිණි කල්හී විමානප්‍රේතතෙම සවිහරණ
යෙන් සැරසී රජහු එළඹ පළිසඳර කථාකොට නැවත පූජාසත්කා
පැහැ දෙවවූයේය——රජතෙම ප්‍රවර සහිතව චතුරඟා සේනා
පැන්වී මාගිය්‍යාලානන්ත සංඥාවගෙණ අවකාශවී ප්‍රේතයාගේ ද්‍රව්‍ය
නිධිවලාළකළඟ ප්‍රේතතෙම මුලපටන් තමාගේ ද්‍රව්‍යනිධිකියා රජ
හු මේතදග්ගවියෙන් මුදවා සරණයෙහි සීලයෙහි පිහිටෙවූයේය——
එබව ප්‍රකාශකරණු පිණිස සහිනිකාරයෝ මෙසේ කීවාහුය——

(225) රාජපඩගලකොනාම සුරට්ඨානං ආධිපති,
ආහු මොරියානං උපට්ඨානා සුරට්ඨං පුන ආගමා——

(226) උණෙහ මජ්ඣන්හිකෙ කාලෙ රාජ මගහං උපාගමි,
අද්දස මගහං රමණීයං පෙතානං වණ්ණනාපථං——

(227) සාරථිං ආමන්තයි රාජ අයං මගහා රමණීයෝ,
ඛෙමොසොත්ථිකෝ සිවොඉමිනාව සාරථියාහි
සුරට්ඨාන සන්තිකෙ——පෙ——

(228) උපෙමි සරණං බුද්ධං ධම්මංචාපි අනුත්තරං,
සංඝංච නරදෙවස්ස ගච්ඡාමි සරණං අහං——

(229) පානාතිපාතා විරමාමි ඛිප්පං,
ලොකෙ අදින්නං පරිවජ්ජයාමි.
අමජ්ජපෝ නොච මුසාභණාමි,
සකෙන දාරෙණව හොමිතුට්ඨෝ——

(230) ඔපුනාමි මහාවාතෙ නදියාසීඝගාමිනී*
වමාම්පාපකංදිට්ඨිං බුඩානං සාසනෙරතෝ

(231) ඉදංවත්වාන සුරලෙඩා වීරම්භා පාපදඝනා,
නමෝ භගවතෝ කත්වා පාමොක්ඛාරථමාරුහිංසු

(225) යි නුගෙයින් සුරටඨ දේශයට අධිපතිවූ පිහුවන් ඇස් ඇති හෙයින් පිහලනම් රජෙක්වූයේය, හෙතෙම ධම්මාසෝකරජ හට උපස්ථානයටගොස් නැවත සියනුවරට පෙරලාඑමින්.

(226) මඩකණහ වේලන්ති මදවූ භූමිප්‍රදේශය ඇත්තාවූ ප්‍රේත නිර්මිත මාගීයට පැමිණියේය.

(227) චී කල්හි රජතෙම රථාචාර්‍යයාට ආමන්ත්‍රණයකොට කියන්නේ එබා රථාචාර්‍යය මේ මාගීය රමණීයයි, සුවඑලවන්නේ වෙයි, නිරුපද්‍රවයි, මේ මාගීයෙන් ගොස් සුරටඨානම් දේශය ලඟට බැසගියහැකියි කීය.

ඒවුරහසෙනහ හා සමහ සුරටඨානම් දේශයට යනු පිණිස ඒ මාර්ගයෙහි යන්නේ රථාචාර්‍යතෙම ඒ මාගීයයෙහි ඉදිරිය දෘශ්‍යමානවෙමින් පසුමාගීය අන්තර්ධානවන්නා දැක රජහට කියන්නේ සාමිනි මේ මාගීය ලෝමෝද්ගමනවන භයානක මාගීයක්වෙයි, පෙරමග පෙනෙයි, පසුමග නොපෙනෙයි, අපි ප්‍රේත යන් සිටි තැනට යන්නාවූ නොමාගීයකට පැමිණියෙමුයයි කීහ, එවිට රජතෙමද භයපත්ව යම්හි කියන්නේ එබා රථාචාර්‍යය ප්‍රේත ගඳ වහනයවන්නේය, සොරවූ දරුණුවූ හඬද ඇසෙයි පෙරමග පෙනෙයි, පසුමග නොපෙනෙයි, අපි ප්‍රේතයන් ලඟට යන ලෝමෝද්ගමනවන භයානකවූ නපුරු මාගීයකට පැමිණියෙමුයයි කියා ඇතා උඩට නැඟී සතරදිසාව බලමින් පාරෝහවලින් හා ජායාවෙන් සමන්විතවූ නිල්වලාකුලක්සේ නිලෝභාසවූ රමණවූ නුගගස දුටුයේය, දැක රථාචාර්‍යයාහට ආමන්ත්‍රණයකොට කියන්නේ එබා රථාචාර්‍යය මේ නිල්වලාකුලක්සේ නිලවණ්ණව විශාලව පෙනෙන්නේ කිමෙක්දැයි විමසේය. එවිට රථාචාර්‍යතෙම කියන්නේ, මහරජ්ජුරුවන්වහන්ස මේ පෙනෙන්නේ පාරෝහවෙන් හා ජායාවෙන් සමන්විතවූ නිල්වලාකුලක්සේ නිලවණ්ණවූ නුගගසයයි කියේය, ඒ නුගගස යම් දිසාවෙක්හි පෙනේද රජතෙම එතැන්හි යනුයේ ඇතා උඩින් බැස නුගගස මුලට පැමිණ පරිවාර ජනයන් හා සමග නුගගස මුල සෙවනෙහි උන්නේය, එවිට රජතෙම පැනින් පිරුණුවූ භාජනයන් හා පූපයන් පිරුණුවූ තැටිද එහි පස

* නදියාවාහි ඝංගාමිනි. පිටපත්හි පෙණේ.

ලෙව් නිබෙන්නා දිවිය, ඉක්බිති විමානප්‍රේතතෙම සවිහරණයෙන් සැරසී රජහු කරා එලඹ මෙසේ කියන්නේ, මහරජ තොපි ආශා මන ඉතා යහපත්වෙයි, අයහපත් ගමනක් නොවෙයි, මහද්ධනි පැන් බීපයව පුපයන්ද අනුභවකරවයි කීයේය. එකල්හි රජතෙම පිරිවර හා සමග පැන්බී පුපයන් අනුභවකොට පැන්ද පානය කොට ඉක්බිති මෙසේ කියන්නේය, කිමෙක්ද තොපි ගාඛිවී දෙවතාවෙක්වූයේද, එසේනොව පූරිඤදයයි කියනලද ශක්‍රයාහෝ වූයේද අපි නොදන්නා හයින් විමාරන්නෙමුව මේ අසවලායයි කියා තා කෙසේ දැනගන්නෙමුදැයි කීයේය. එකල්හි විමානප්‍රේත තෙම කියන්නේ මහරජ මම ගාඛිවී දිව්‍යරාජයෙකුත් නොවෙමි, නැවත පූර්ණදයයි කියනලද ශක්‍රයාත් නොවෙමි, මහරජ මම සුරටඨ නුවරින් මැරී අවුත් මෙහි උපන්නාවූ ප්‍රේතයෙක් වෙමි කීයේය.

ඒ කල රජතෙම නැවත විචාරණුයේ, තෙපි පෙර සුරටඨදෙශයෙහි සිටින කල්හි කවර ශීලයක් ඇතිවූයෙහිද, කවර සමාචාරයක් ඇතිවූයෙහිද, තොපගේ මෙබඳු අනුභාවය කවර බ්‍රහ්මචාරීත්වයක් හේතුකොටගෙණ වේදුයි විචාළේය. රට වර්ධනයකරන්නාවූ සතුරන් දමනයකරණහෙයින් අර්ථමත්වූ මහරජ්ජුරුවෙනි අනුබවහන්සේ හා මේ පිරිසද මේ පොරෝහිත බ්‍රාහ්මණතෙමේද මාගේ වචනය ඇසුවමැනව, මම සුරටඨනම් නුවර එක්තරා පුරුෂයෙක් වූයෙමි ඒ මම පව්වූ සිත් ඇත්තෙක් වූයෙමි, මිථ්‍යාදෘෂ්ටි ඇතිව දුස්සීලයෙක්වූයෙමි, තද මසුරු සිත් ඇත්තෙක් වූයෙමි, ශ්‍රමණ බ්‍රාහ්මණාදීන්ට නින්දාකරන්නෙක් වූයෙමි, දන් පින් කරන්නාවූ බොහෝ දෙනා මාවිසින් වැලැක්වූයෙමි, අනුන් දන්දෙනකල්හි මම ඔවුන් දැනමය පුණ්‍යයට අන්තරාකෙළෙමි, නැවත මම මෙසේද නීයෙමි, දන්දෙන්නාවුන්ට උපකාර කරන්නාවුන්ට පරලොව්වශයෙන් ලාබයසුතු කිසිත් ඵලවිපාකයක් නැත්තේය, ශීලපරිපාලනයාගේ සුප්‍රකාරයෙන්ම විපාකයක් නැත්තේය, ආචාරසමාචාරයෙහි හික්මවන්නාවූ කිසි ආචාර්‍ය්‍යකෙනෙක් නැත්තේය, තමතමන්ගේ සවභාවයෙන්ම සත්වයෝ නොහික්මෙන්නාහුද වෙති හික්මෙන්නාහුද වෙති කියා දෘෂ්ටිගත්තෙවූයෙමි,

එවද මේ සියලු සත්වයෝම හැමදෙන සමසමවෙති එහෙයින් ජෙෂ්ඨයෙක් නැත ජෙෂ්ඨයෙක් නැතිකල ජෙෂ්ඨ හින්ව කටයුතුවූ ආදර ගෞරවයක් හෝ එහි ඵලවිපාකයෙක් හෝ කාහින්ද, තමාගේ ශක්‍ති බලයෙන් පහිටා වියහිකොට මනුෂ්‍ය

ලෝකයෙහි සම්පතට පැමිණීම් ආදිකොට අහිත්ඵල සම්පත් සිඹ කරන්නේයයි කියන්නාවූ යම් වීර්‍යබලයක් වේද එබදු වීර්‍යබලය කුත් නැත්තෙය, මේ දෙය අපගේ පුරුෂ වික්‍රමයෙන් පුරුෂ වීර්‍යයෙන් පවත්නාහුයයි කියන්නාවූ යම් පුරුෂවික්‍රමයක් ඇද්ද, එබදු පුරුෂවික්‍රමයකුත් නැත්තෙය, දුනයාගේ කිසිත ඵලයෙක්නම් නැත, එසතු වියදම්නිරීමනම් අථගොඩට යටකරන්නාක්මෙන් නිෂ්ඵලය, ප්‍රාණඝාතාදියෙන් වැලකීමෙන් හෝ සිල් රැකීමෙන් හෝ පුද්ගලයෙක් ශුඛනොවෙයි, ඒ ආදියකින් පුද්ගලයෙක් ශුඛ නොකෙරෙයි—

එ හෙයින් දුනඵලයෙක්නම් නැත්තෙය, මේ සත්තෙම යම් සැපක්හෝ දුකක්හෝ ලබන්නේද ඒ දෙය පිරිනැමීම් වශයෙන් ලැබෙනවාමිස කර්‍මයක් කළහෙයින් නොවන්නේය, ඊශ්වරාදීන් වසින් කරන්නාවූ දෙයකුත් නොවන්නේය, මව්පියන් ආදීන් කෙරෙහි වරදවා පිළිපැදීමෙන් හෝ යහපත පිළිපැදීමෙන් හෝ දුක්සැප විපාකයක් නැත්තෙය, මේ ලෝකයෙහි සිට පරලෝක යට යාමෙක් නම් නැත, පරලොවසිට මේලොවට ඒමෙක්නම් නැත, සත්තයෝ ඒ ඒ නැත්වලදිම සිඳෙති, එපවට සිට ගෙණෙන සත්කාරයන්ගේ ඵලවිපාකයෙක් නැත්තේය, සුකෘත දුෂ්කෘත කර්‍මයන්ගේ ඵලවිපාක නැත්තේය, ශ්‍රමණයන්ට දන්දී අනුත්තරික නිබ්බානයක් නිබ්බත්කරණලද්දේයයි කියන්නාවූ යමක් ඇද්ද එසිතුත් නසින් ඵලවිපාකයක් නැත්තෙයයි කියෙමි, තවද මහරජ්ජනනි, මම මෙසේත් කියෙමි, යමෙක් යමෙකු මරන්නේද, යම්පුරුෂයෙක්විසින් යම් පුරුෂයෙකුගේ ඔස කපන්නේද, ඒ පුරුෂයාවිසින් කිසිවෙක් මැරුවේ නොවෙයි, කිසිවෙක් මැරුණෙත්නැත, පෘථිව්ධාතු ආදී සප්තධාතුව සිඳෙනහෙයින් මරන්නාක්මෙන්වෙයි, පෘථිව් ආදී සප්තවිධ ශරීර සිදුරු අතරෙහි ශස්ත්‍රය වදනේය, එහෙයින් සත්තයෝ කඩු ආදියෙන් ගසා මරණලද්දක්හු මෙන් පැණෙයි සත්තයන්ගේ ජීවසංඛ්‍යාතප්‍රාණය ශස්ත්‍රාදීන්ගෙන් සිදින්ට නුපුළුවන්වෙයි, එසේම යම්කිසිවකින් ගසා බිඳින්ටද නුපුළුවන්වෙයි, සිඳින්ට බිඳින්ට නොහැකිවන්නේනම්, ප්‍රාණය නත්‍යදෙයක් හෙයි නැයි කියා මම මෙබඳු ද්‍රෂ්ටි කියමන්ද කියෙමි,

ති වද මහරජ්ජනනි මම මෙසේත් කියෙමි, එබඳු මනුෂ්‍යයෙනි ඒ ප්‍රාණයනම් සමහරකලෙක අවැස්වෙයි, සමහරකලෙක ගුලියක්මෙන් වටකුරුවෙයි, ශුදකලාබවට පැමිණියේවිනම් පන්සියක් යොදුන් උසවෙයි, මෙසේ නිශ්චලවූ කිසි විකාරයක් නැත්

හාවූ ප්‍රාණයෝ ශැසත්‍රාදියකින් සිඳින්ට කවුරෙක් සමර්ථවේද, ඒ ප්‍රාණයනම් නිසිවෙතු වසින් කැඩීම් බිඳීම් ආදී වකෝපනයක් කරන්ට නොහැකිය, පව්තයක් උඩවත් ගස මුදුනේවත් සිට තුල් ගුලියක් වීසිකර කල්හි තුල් වෙලිමයම් පමනද එපමනදුර යන්නේය තුල් වෙලිම අවකාශඵලතු කල්හි නවතින්නේය, එමෙන් ඒ ප්‍රානයන් නිවේඨනය වෙමින් යන්නේය, ඊට උපමාකෙසේද, යම්සේ මනුෂ්‍යයෝ ගමින්ගම යන්නන්වේද එපරිද්දෙන්ම මේ ජීවසංඛ්‍යාත ප්‍රාණයන් වෙනින් කයකසිට වෙනින් කයකට යන්නේය, නවදමනුෂ්‍යවරුන් යමෙක් ගෙයින් පිටත වෙනින් ගෙයකට යන්නේවේද එපරිද්දෙන්ම මේ ප්‍රානය මේ ශරීරයෙන් වෙනත් ශරීරයකට යන්නේය, බාලයෝද පණ්ඩිතයෝද යන සියල්ලෝම මහා කල්ප අසූඅාර දහසක් මුළුල්ලෙහි සසර ගෙවා දුක් කෙලවර කරන්නාහුමේහි මහාකල්පයක් නම් කොපමණකාලයක්ද යනහොත? අනොතත්තාවිල ආදිකොටඇති මහවිල් අතුරෙන් එක් මහවිලකින් හවුරුදු සියයක් ගිලකල එකවරක් ජලයෙන් කුසතන අගතෙමාගෙණ ගොඩටගසාදමා නැවත තව සියක්හවුරුද්දක් පසුඋතුකල එක්වරක් කුසතන අගතෙමා ගසාදැමීමෙන් මෙසේ සියක්හවුරුද්දකට වරක් බැගින් කුසතන අගතෙමා තෙමා ගොඩට ගසාදැමීමෙන් ඒ විල්ලේ ජලය බින්දුවක්වත් ශූන්‍ය නොවී වියළිගොස් මෙම ක්‍රමයෙන් විල සත්වරක් වියලුතු කල්හි එක්මහකල්පයෙක්වෙයි ඒ මහා කල්පවලින් අසූඅාරදහසක් කල්ප මුළුල්ලෙහි සත්වයෝ අපරාපරියෙඋත්පත්තිවශයෙන් සසරගෙවා දුක් කෙලවර කරන්නාහුයයි කියා තේරුන්දී මාවිසින් මනුෂ්‍යයින්ට දෘෂ්ටිගතෙන්වූයෙමි.

ඵ වද මහරජ මම මෙසේ කියෙමි එබා මනුෂ්‍යවරුනි මේ සත්වයින්ගේ සැප දුක් දෙක ද්‍රොණයෙන් හා පැසකින් මැන්නාක්මෙන් එකතරම්නම්ම පවත්නේය, අඩුත් නැත්තේය සමහරෙකුට වැඩිත් නැත්තේය, පණ්ඩිතයෙක්වූයේ නමුත මහාකල්ප අසූඅාරදහස අතරෙන් කඩා අඩුකරන්ටත් තුපුලුවන බාලයෙක්වූයේවිනමුත් ඔහුට සසර උත්පත්තිය වැඩිවෙන්නේත් නැත ඒත් මහාකල්ප අසූඅාරදහසම වෙයි, එහෙයින් සත්වයාගේ සැප දුක් දෙක ද්‍රොණයෙන් මැන්නාක්මෙන් පවතනේය, මේ ඔව ජනහිමියෙනි සිවිඅාකෙනෙක් දනිති මේ අනික් සත්වයෝ මෝහයෙන් මුලාවුවාහයි කියෙමි, මහරජ පෙර මම මෙකී ප්‍රකාර දෘෂ්ටියක් අතිව සිටිමින් මනුෂ්‍යයින් ලවා දෘෂ්ටහන්නෙවූයෙමි, මහරජානනි කර්මඵල නැතැයි කියන්නාවූ මාගේ ඒ දෘෂ්ටිය මෝහයෙන් මුලා

වූහෙයින් පැවතුනේය, මෝහයෙන් මුලාවූහෙයින් මේ වැඩ අවැඩනොපෙනී දුස්සීලවූයෙමි තවද මසුරු සිත් ඇතිවූයෙමි ශ්‍රමණබ්‍රාහ්මණවරුන්ට පරිභව බිහුයෙමි, මම විසින් දෘෂ්ටිගතික නොයෙක් අකුසල් කලහෙයින් එහි විපාක විඳීමට මෙසිත් සමාසඝකින් මෙපිට මැරීගොස් ඒකාන්තයෙන් කටුකවූ ඝොරවූ දුක් ඇත්තාවූ සතර කොන් ඇත්තාවූ දෙරටු සතරක් ඇත්තාවූ කොටස් වශයෙන් බෙදුම්ඇති නවයොදුන් ඝනවූ යකඩබිත්ති හා නවයොදුන් ඝනවූ යකඩ පියන්පත ඇති නරකයෙහි මම උපදින්නෙම්, මහරජ ඒ නරකයෙහ යකඩමය භූමිය වන්නේය, නිතර ගිනිගෙන දිලිහෙයි, නිතර වහ්නිජ්වාල වලින්මුක්තයෙයි, හාත් පස්හි සියක්යොදුනකින් ඇතට වහ්නිජ්වාල පැතිරී සිටින්නේවෙයි,මහරජ එහි ඉපද දුක් විඳිමින් හවුරුදු ලක්ෂයක් ඉක්මුනුකල්හි නිදුකාව ඊණිමෙහි ඉපිද දුක් විඳින්නාවූ අතාපට හවුරුදුලක්ෂයක් ඉක්මුනේඃයි කියා ශබ්දයෙක් ඇසෙන්නේය, මහරජ නරකයෙහි උපන්නාවුන්ට නරකයෙහි ගණනාවෙන් හවුරුදු සියක්කෝටිය කට ආයුසවෙයි, මහරජ එහි උපදින්නාවූ සත්වයෝනම් කවරෙක්ද? මිථ්‍යාදෘෂ්ටිකයෝද දුස්සීලයෝද ආර්යෝපවාදකළාහුද යන මෙකී අය උපදින්නාහුය, මාගෙන් කෙරුණාවූ අකුසල විපාක විඳීමට එහි ඉපිද මම බොහෝ දීර්ඝකාලයක් මුළුල්ලෙහි කාරිරවූ කටුකදුක් අනුභවකරන්නෙම් කියා නැවත මෙසේ කියන්නේය.

මහරජ පළමුකොට නොපි මගෙන් මෙසේ විවාළේය, කවර සීලයක් කවර බ්‍රහ්මචර්‍යාවක් හේතුකොටගෙණ නොපි එබඳු ආනුභාවක් ඇතිවූයේදැයි විවාළේය, එසේවිනම් ඒ කාරණය ඇසුවමැනව, මහරජ උත්තරාවයයි කියා මාගේ දීඝනි කෙනෙක් ඇත්තීය, ඕතොමෝ සරණසීලය හා උපොසථසීලයද රක්ෂාකරන්නීය, දන්දෙන්නීය, පහවූ මසුරුමල ඇත්තීය, ධර්මය දන්නිය, අනුන්ගේ කුලයෙහි සිටිමිනුත් නොකඩව පඤ්සීලයහා අෂ්ටාඟසීලයත් ඇතිව සම්මාසම්බුදුන්වහන්සේගේ උපාසිකාවක් වූයේය, ඉක්බිති එක් දවසක් සිල්වත් භික්ෂූන්වහන්සේ කෙනෙක් පිඬුපිණිස ගමෙහි වඩනාසේක් ඒ භික්ෂූන්වහන්සේ යටබහාලනලද ඇස්ඇතිව සමාධිසම්පන්නව ගුප්තචාරව සංසුංවෘතව ගෙපිළිවෙලින් වැඩම වමින් ඒ උත්තරාදේවි උපාසිකාවගේ ගෙදරට වැඩියේක, මහරජ උත්තරාදේවී ඒ භික්ෂුව දැක භාජනයක පැන්පූරවාගෙණ විසිතුරුකොට සපයනලද පූජයන් පිරූ භාජනයක්ද ගෙණැවිත් ඒ භික්ෂූන්වහන්සේට පූජාකොට මෙසේ කියන්නීය,

සවා මේනි මාගේ පියානෝ මැරුණේය, මාගේ ඒ පියා නන්වහන්සේට මේ දක්ෂිණාව ලැබේවයි කියා මට දක්ෂිණාව දුන් නීය, ඒ ක්ෂණයෙහි මට දානවිපාකය පහළවූයේය, වෙසමුණි රජ තුමෙන් මම දැන් කාමයෙන් සමුඛව සැපවිඳිමි, රටවඩිනයට පමුණුවන්නාවූ අරින්දමනම් මහරජුනි, ඇසුවමැනව දෙවියන් සහිතවූ සියළු ලෝකයෙහි බුදුන් අග්‍රයයි කියනුලැබේ, අරින්දම රජුනි පුත්‍රදාරාවන් හා සමග තොපි ඒ බුදුන් සරණකොට යව, ආර්‍ය්‍ය අෂ්ටාංගිකමාර්ගයෙන් සඞ්ඝයෝ නිවනට පැමිණෙති, එහෙයින් ඒ ධර්මය සරණකොටයව, මාර්ගපුද්ගලයෝ සතරදෙනෙක ඵලස්ථ පුද්ගලයෝ සතරදෙනෙක මේ සඞ්ඝතෙම ඍජුප්‍රතිපන්නාය සීලාදි ගුණධර්මයෙන් යුක්තය, එහෙයින් තොපි පුත්‍රදාරාවන් හා සමග ඒ සඞ්ඝයා සරණකොට යව, ප්‍රාණඝාතයෙන් වැලකෙව කුදුන්දෙය නොගනුව, මද්‍යපාන නොකරව බොරුනොකියව, සත්‍යය දරාවන්ගෙන් සතුටුව වාසයකරවයි කීහ—එකල්හි රජතෙම කියන්නේ යක්ෂය තොප මට අනීකාම කෙණෙක, හිතකාමී කෙනෙක දේවතාවෙනි තොපගේ අවවාදය කරන්නෙමි තොපි මාගේ ආචාර්‍ය්‍යයොය—

(228) බුදුන් සරණකොටයෙමි ධර්මය සරණකොටයෙමි සඞ්ඝයා සරණකොටයෙමි—

(229) ඥානඝානයෙන් වලනිමි අදත්තාදානයෙන් වලනිමි මද්‍යපානයෙන් වලකිමි බොරු නොකියමි සත්‍යයහාර්‍ය්‍යාවගෙන් සතුටුව වෙසෙමි—

(230) මේ සේ සර්ව්වඥශාසනයෙහි ඇදුනාවූ මම මාගේ පව්වූ දෘෂ්ටිය බොල් සුලඟෙහරින්නාක්මෙන් තොපගේ ධර්මදේශනා නැමැති සුලඟට මාගේ දෘෂ්ටි නැමැති බොල් හරිමි, ගඟේ බැසගන වතුරෙහිපරඬලපන් හරින්නාක්මෙන් තොපගේ ධර්මදේශනා නැමැති ගඟේ මාගේ දෘෂ්ටිය නැමැති පරඬල දම්මිසි.

(231) ඉසුරටඩිවපති රජතෙම බුදුන්ට නමස්කාරකොට රජතෙම රථයටනැගි තුවරට යනුයේ දේවතාවාගේ ආනුභාවයෙන් ඒ දවසම තමන්ගේ තුවරට ගොස් රජගෙට ප්‍රවේශවූයසි, ඒ රජතෙම මැතකාලයෙහි මේ ප්‍රවෘත්තිය භික්ෂූන්වහන්සේලාට කීයේය.

භික්ෂූන්වහන්සේලා ස්ථවිරයන්වහන්සේලාට සැලකළානුය ස්ථවිරයන්වහන්සේලා මේ ප්‍රවෘත්තිය සංගායනාවට නැඟූ

වාහුයි—මේ ප්‍රේතවස්තුප්‍රකරණයෙහි සතරවෙනි මහාවර්ගයෙහි තුන්වෙනි නන්දික ප්‍රේතවස්තුව නියා නිමවනලදී.—

38 නන්දික ප්‍රේතවස්තුව නිමි.

—:o:—

කිවද මේ ප්‍රේතවස්තුප්‍රකරණයෙහි සතරවන මහාවර්ගයෙහි සතරවෙනි රේවති ප්‍රේතවස්තුව කවරහයත්?—

ඉමි රේවති ප්‍රේතවස්තුව සම්බන්ධයෙන් රේවති විමානවස්තුව හා සමග විශේෂයක් නැත්තේවේද, එසේහෙයින් මෙහි යම් උත්පත්තියක් විය යුතුද ගාථා වර්ණනාවක් විය යුතුද ඒ සියල්ල පරමාර්ථදීපනී නම්වූ විමානවස්තුවර්ණනාවෙහි කීහයින් දත යුතුය—මේ ප්‍රේතවස්තුව නන්දික දිව්‍යපුත්‍රයාගේ කථාව හා සම ග එකතුවෙයින් විමානවස්තු පාළියෙහි සංග්‍රහයට නැගුයේන මුත් රේවති ප්‍රතිබද්ධ කථාවගේ විශයෙන් රේවති ප්‍රේතවස්තුව යයි නියා පාළියෙහි සංග්‍රහවට නන්වනලදැයි දතයුතු—මේ ප්‍රේ තවස්තුප්‍රකරණයෙහි සතරවන මහාවර්ගයෙහි සතරවෙනි රේවති ප්‍රේතවස්තුව නියා නිමවනලදී.—

39 රේවති ප්‍රේතවස්තුව නිමි.

—※—

කාවද මේ ප්‍රේතවස්තුප්‍රකරණයෙහි සතරවන මහාවර්ගයෙහි පස්වෙනි උච්ඡුප්‍රේතවස්තුව කවරහයත්?—

කරුණානිධානවූ ඥතිකාන්තාරාදියෙන් සඳහයන් එතරකරණ හෙයින් ශාස්තෘනම්වූ බුදුරජනන්වහන්සේ රජගහනුවර වේළුව නාරාමයෙහි වැඩවාසයකර වදුරණකල්හි එක්තරා පුරුෂයෙක් උක්මිටියක් කරනිබාගණ එක් උක් දණ්ඩක් අනින්හෙණ කකා යන්නේය. එකල එක්තරා සිල්වත් ගුනවත් උපාසකයෙක්තෙම බාලදරුවෙක් හා සමග ඒ පුරුෂයාගේ පස්සෙන් යන්නේය, එ කල්හි ඒ බාලදරුතෙම උක්දඬු දැක මවත් උක් දෙවයි නියා හැ ඬිය, උපාසකතෙම දරුවා උක් ඉල්වමින් හඬන්නවුන් දැක ඒ පුරුෂයාලඟට එකතුවෙලා කථාබස්කරමින් යන්නේය, ඒ පුරුෂ තෙම ඔහුහා සමග කිසිවක් කථානොකරන්නේය, දරුවාට උක් දඬු කැබැල්ලකුත් නුදුන්නේය, එකල උපාසකතෙම දරුවා පෙන් වා කියන්නේ මේ දරුවා බලවත්සේ හඬන්නේය, මොහුට උක්දඬු

කැබැල්ලක් දෙවයි කීයේය, ඒ අසා ඒ පුරුෂතෙම මසුරු සිත් ඇති හෙයින් ඒ කියමන ඉවසන්ට නොහැකිව අනාදර වශයෙන් එක් උක්දණ්ඩක් පිටිපස්සට විසිකළේය.

ඉතිතෙම මැතකාලයෙහි මැරිගොස් බොහෝකල් පුරුදුවූ ලෝභයාගේ වශයෙන් ප්‍රේත අපායෙහි උපන්නේය, ඒ අකුශලකර්මයාගේ විපාකය කර්මයට සුදුසු අන්දමින් ලැබුනේය, අවකිරියක් පමණතැන් පැතිරිතිබෙන්නාවූ අඳුන්වණ් ඇති මොහොල් හස් ප්‍රමාණවූ උක්හස්වලින් ගැවසීහත් මහත් උක්වනයක් ඒ ප්‍රේතයාහට පහලවූයේය' ප්‍රේතතෙම උක්දඬු කනුකැමතිව උක් දණ්ඩක් ගනිමිසි සිතා උක්වනයට ගියකෙනෙහිම උක්දඬුවලින් ඔහුට පහරවදනේය, මෙසේ ඔහු එලවඑලවා උක්දඬුවලින් පහරවදිනකල්හි ඔහු මූර්ච්ඡාවි වැටෙන්නේය. ඉක්බිත්තෙන් එක් දවසක් ආයුෂ්මත් මහාමෞද්ගල්‍යායන ස්ථවිරයන්වහන්සේ ජඹු ප්‍රණීස රජගහනුවරට වඩිනසේක් අතරමගදී ඒ ප්‍රේතයා දුටුසේක, ප්‍රේතතෙමේද තෙරුන්වහන්සේ දැක තමන් විසින් පූර්වයෙහිදී කරණලද කර්මය විචාරන්නේ.

(232) ඉදං මම උච්චූවනං මහන්තං
නිබ්බත්තති පුඤ්ඤඵලං අනප්පකං,
තංදූනි මෙ පරිභොගං නළපෙති
ආචික්ඛ භන්තෙ කිස්ස අයං විපාකෝ ... පෙ ...

(233) තස්සතං කම්මස්ස අයං විපාකෝ
ඉංඝඹං පිට්ඨිතොගණ්හ උච්චූං,
ගහෙත්වා ඛාදස්සුඅවදළං
තෙනෙවඹං අත්තමනොභවිස්සසී.

(234) භටෙඨා උදග්ගෝ ච පමොදිතෝ ච
ගන්ත්වානසෝ පට්ඨිතොඅග්ගහෙසි
ගහෙත්වාන තං ඛාදි ඔවදළං
තෙනෙව සෝ අත්තමනෝ අහොසි ති.

(232) යම්තුසෙයින් ස්වාමිනි මට බොහෝවූ කුසලවිපාකයක්ව මහත් උක්වනයක් පහළවනිබෙන්නේය, එසේදවුව මට පරිභෝගයට නොපැමිනෙයි, පරිභෝගකරන්ට නොහැකිවෙයි ස්වාමිනි මේ කුමන කර්මයක්හුගේ විපාකයෙක්ද ඒ මට වදාළමැනව ස්වාමීනි මම උක්දඬු කන්නට ගියකල වෙහෙසට පැමිනෙම් මිරිකෙම් විශෙෂයෙන්ම පීඩාලබන්නෙමි, අසිපත්‍ර වනයට ගියාසේ ඉතා තීක්ෂ්ණ මුවහත් ඇති පත්‍රවලින් මාගේ ශරීරය කේදිලැබෙයි උක් අනුභවකරන්ට මම බොහෝසේ වැයම්කරන්නෙමි, ප්‍රයෝගක

රන්නොමි උත්සාහකරන්නෙමි කිසිවක් අනුභවකරන්ට නොලැබී සිදුනාවූ බිඳුනාවූ ශරීර ඇතිව ක්ෂයවූ ශරීරශක්ති ඇත්තේ බැගැපළු දුකින් පෙලෙනලදුව ඉතාම විලාප කියා හඬමින් දුක් ඉවසා ගත නොහී මූර්ඡාවී සිටින්ට නොහැකිව බිමවැටෙමි බිම පෙරලෙන්නෙමි අවුවෙන් රත්තනිබෙන වැල්ලෙනි මේ මත්ස්‍යයෙකුමෙන් වියළුනාවූ උගුරහා කටතොල ඇතිව පිපාසයෙන් මිරිකෙන්නෙමි කලානත්තාවන්නෙමි කිසි සුවයක් නොලැබෙයි ස්වාමිනි මේ කාරණය මම නුඹවහන්සේගෙන් විචාරන්නෙමි කුමන කාරණයෙක් හේතුකොටගෙණ මට උක් පරිභෝගකරන්ට නොලැබෙන්නේ දැයි විචාළේය.

(233) එකල තෙරුන්වහන්සේ වදුරණසේක් එඹා ප්‍රේතය පූර්ජාතියෙහි තොප මනුෂ්‍යව සිටිනකල්හි කළ අකුශලකර්මයක් වන්නේව. මම ඒ අකුශලකර්මය තොපට කියාදෙම්, තොපි අසා දුනගණුව, එක්දවසක් තොපි උක්දඬු මිටියක් කරතිබාගෙණ එකක් අතින්ගෙණ කකා මහවන යන්නේය, එකල එක් පුරුෂයෙක් තොපගේ පිටිපස්සෙහි යියේය, ඒ තෙම තොපට ලඟාවී තොප්හාසමග කථාකෙළේය, තොපි ඔහුගේ කථාවට ප්‍රත්‍යුත්තර වශයෙන් කිසින් කථාවක් නොකළේය, නැවත ඒ උපාසකතෙම නිතර තාගෙන් උක්දණ්ඩක් ඉල්වූකල්හි තොපි අප්‍රසන්නව උක්දණ්ඩක් පිටිපසට විසිකළේය, මේ උක් වනයෙන් තොපට උක් අනුභවකරන්ට නොහැකිවන්නේ ඒ අකුසලකර්මය හේතුකොට ගෙණවෙයි එබැවින් තොපි උක් දඬු පිටිපස්සෙන් ඇරගෙණ යැපෙනපමණ කාපියව, එසින්ම තොපි සතුටුසිත් ඇතිවෙදි වදාළේය.

(234) එකල්හි ඒ ප්‍රේතතෙම තුටුපහටු සිත් ඇතිව ගොස් පිටිපස්සෙන් උක්දඬුඇරගෙණ යැපෙනපමණ කා එසින්ම සතුටුවූයේය.

මසේ තෙරුන්වහන්සේ විසින් කී නියමයෙන් උක්දඬුගෙණ කැමතිපරිද්දෙන් කා මහත් උක්දඬු මිටියක් ගෙනැවිත් තෙරුන්වහන්සේට ඵලවාසිටියේය, තෙරුන්වහන්සේද ඔහුට අනුග්‍රහකරමින් ඔහුලවාම ඒ උක්දඬු මිටිය ගෙන්වාගෙණ වේළුවනයට වැඩමවා බුදුරජාණන්වහන්සේට පූජාකළේය. එකල්හි භාග්‍යවතුන්වහන්සේ භික්ෂුසංඝයා හා සමග උක්දඬු වළඳා අනුමෝදනාකළසේක. ප්‍රේතතෙම ප්‍රසන්න සිත් ඇතිව නමස්කාරකොට ගොස් එතැන්පටන් සැපවූපරිද්දෙන් උක් අනුභවකළේය.

හෙතෙම මැතකාලයෙහි මැරිගොස් තව්තිසා දිව්‍යලෝකයෙහි උපන්නේයි—ප්‍රේතයාගේ මේ ප්‍රවෘත්තිය මනුෂ්‍යලෝකයෙහි ප්‍රකට වූයේය. එකල්හි මනුෂ්‍යයෝ ශාස්තෘන්වහන්සේ කරා එළඹ බුදුන් ගෙන් මේ ප්‍රවෘත්තිය විචාළාහුය—බුදුරජානන්වහන්සේ ඔවුන්ට ඒ ප්‍රවෘත්තිය විස්තාරකොට වදාරා ධර්මදේශනාකළසේක—ඒ ධර්ම දේශනාව අසා මනුෂ්‍යයෝ මසුරුමලින් දුරුව දානාදි සුචරිතයෙහි හැසුරුණාහුය—මේ ප්‍රේතවස්තුප්‍රකරණයෙහි සතරවන මහාවග්ගයෙහි පස්වෙනි උච්චූප්‍රේතවස්තුව නියා නමවනලදි—

40 උච්චූප්‍රේත වස්තුව නිමි.

—00—

කිවද මේ ප්‍රේතවස්තුප්‍රකරණයෙහි සතරවන මහාවග්ගයෙහි හවෙනි කුමාර ප්‍රේතවස්තුව කවරහයත්?—

තවද එක්සමයෙක්හි ශාක්‍යකුල ප්‍රධානවූ ත්‍රිලෝගුරු බුදුරජානන්වහන්සේ සැවැත්නුවර ජේතවනාරාමයෙහි වැඩවාසයකර වදාරණසේක්—සැවැත්නුවර වනාහි කොසොල් රජහුගේ පුත්‍රයෝ දෙදෙනෙක් වූවාහ, ඒ දෙදෙනා ප්‍රසාද එලවන ශරීර ඇත් තාහූ ප්‍රථමවයස් පැමිණිකල්හි යොවන මදයෙන් මත්ත පරලොව නොසලකා පරදාරසේවනයෙහි හැසිරෙමින් සිට මැරිගොස් අගල් ඉවුරක්පිට ප්‍රේතයෝව උපන්නාහුය—ඉක්බිත්තෙන් එක්දවසක් ඒ ප්‍රේතයෝ දෙදෙනා රාත්‍රිදවස භයානක ආකාරයෙන් මුරගසා හැඬුවාහුය, මනුෂ්‍යයෝ ඒ ශබ්දය අසා භයින් තැතිවූවාහු මේසේ කළකල්හි මේ අවමඟලය සන්සිඳෙයි නියා බුදුන් ප්‍රමුඛ සංඝයාට මහදන්දී අවසානයෙහිදී ඒ ප්‍රවෘත්තිය උපාසකවරු බුදුරජානන්වහන්සේට සැලකළාහුය—එකල්හි භාග්‍යවතුන්වහන්සේ වදාරණසේක් උපාසකවරුනි ඒ ශබ්දය ඇසීම කරණකොටගෙණ නොපට නිසි අන්තරායෙක් නැතැයි වදාරා අන්තරා නැතිබවට කාරණ වදාරමින් ඔවුන්ට ධර්මදේශනා කරනුපිණිස මෙසේ වදාරණසේක්.—

(235) සාවත්ථී නාම නගරං හිමවන්තස්ස පස්සතො,
තත්ථ පුබ්බකුමාරාච රාජපුත්තා ච මෙසුතං—
(236) පමත්තා රජනීයෙසු කාමසඤ්ඤාහි නන්දිතා,
පවූපපන්නෙනයුබ්බේ ගිද්ධා න තෙ පස්සිංසු නාගතං—
(237) තෙචුතා ච මනුස්සත්තා පරලොකං ඉතො ගතා,
තෙඤ්ඤෙ සෙන්ති නදිස්සන්නා පුබ්බදුක්කටකම්මතනො-පෙ-
(238) එවමාදිනවං ඤත්වා ඉස්සරමානසමත්තනං,
පහාය ඉස්සරමදං භවෙ සඝගතොනරො
කායස්සභෙදා සප්පඤ්ඤෙ සඝගංසො උපපජ්ජතීති.

(235) යම්තුහෙයින් උපාසකවරුනි ඕමාලවතයාගේ එක් පා
ශ්වයෙක්හිවූ මේ සැවැත්නුවරෙහි පෙර රාජපුත්‍රයෝ දෙදෙනෙක්
සිටියාහුයයි කියා පාපකම්මවශයෙන් ලොව ප්‍රකටව තිබෙන බැවි
නුත් මාවිසින් අසනලද්දේය. දිවසිනුත් දක්නාලද්දේය.

(236) ඒ රාජපුත්‍රයෝ දෙදෙනා කාමාසවාදයෙහි සතුටුවීමෙන්
වර්තමාන සැපයෙහි ගිජුව සුවරිතය හැරදමා දුශ්චරිතයෙහි හැ
සිර අනාගතයෙහි ලැබිය යුතු දිව්‍ය මනුෂ්‍ය සැපතොසලකා.

(237) එහිත් අලවන්නාවූ පංචකාමයන් කෙරෙහි ඇලි පරදර
සේවනයෙහි හැසිරෙමින් කුසලයෙහි ප්‍රමාදව සිටියාවූ ඔවුන් මනු
ෂ්‍යත්මෙන් චුතව පරලොව හොස් ප්‍රේත අපායේ උපන්නාහුය.

(238) එසේ ප්‍රේත අපායෙහි ඉපිද දුක් විඳින්නාවූ ඒ ප්‍රේතයෝ
මෙසේ කියන්නාහුය, පෙර බොහෝ දක්ෂිණාහීයන්වහන්සේලා
සිටියදී බොහෝ දානවස්තුවත් අපට ලැබිනිබෙද්දී අනාගතයෙහි
සැප ලැබෙන්නාවූ සබලා පිනක්වත් කරගණ තමතමන්ට සුව
යක් නිරුපද්‍ර දෙයක් කරගත්නට නොහැකිවූයෙමුව, යම් අකු
ශලකර්මයක් හේතුකොටගෙණ අපි රාජකුලයෙන් චුතව මේ ප්‍රේත
අපායේ ඉපිද ක්ෂුා පිපාස දෙකින් පෙරලෙනලදුව දුක් විඳින්නෙ
මුද මිටවඩා ලාමක දෙයක් වෙනත් ඇද්ද, මනුෂ්‍යලෝකයෙහි
යම් යම් කුලයෙක ස්වාම්යෝව ඇවිද්දෙමුද දැන් ඒ කුලවල්වල
මහාහිරණ්‍යසුවණ්ණාදී වස්තුවට අහිමියෝව ක්ෂුා පිපාස දෙකින් පෙ
ළෙමින් දුක්විඳ ඇවිදින්නෙමුව, සමහරෙක් මනුෂ්‍යයෝව උපන්
කල ඒ ඒ දෙයට ස්වාම්ව සිට මැරිඅවුත් කර්මවශයෙන් ක්ෂුාපිපාස
දෙකින් පෙලිපෙලී අස්වාම්යෝව ඇවිදින්නාහුය. මේ සංසාරයෙහි
ප්‍රකෘතියවන්නේය, ඉසුරුමදය නිසා අපායෝත්පත්ති සංඛ්‍යාත
ආදීනවය මේ ප්‍රකාරයෙන් දැන ඉසුරුමදය හැරදමා කුසලක්‍රියා
වෙහි චිත්තව සිට සප්තෘතෙම මැරිගොස් දෙවුලෝව උපන්
නෙය, අපි ක්ෂුාපිපාසය දුක් විඳින්නෙමුයයි කියමින් සැවැත්නුවර
සමීපයෙහි අදෘශ්‍යමානව සිට හඬහඬා මුරගසන්නාහයි වදාළේය.

මෙසේ සර්ඥයන්වහන්සේ ඒ ප්‍රේතයින්ගේ ප්‍රවෘත්තිය
වදාරා ඒ මනුෂ්‍යයන් විසින් පළිගෙළකරණලද දානය ඒ ප්‍රේතයින්
නමට දෙවවා ඒ මනුෂ්‍යයින්ගේ ආධ්‍යාත්මාත්‍මරූපලෙසට ධර්මදේශ
නාකොට වදාළසේක—ඒ ධර්මදේශනාතොමෝ මහජනයාහට
සාර්ථකවූවාය—මේ ප්‍රේතවස්තුප්‍රකරණයෙහි සතරවන මහාවර්ගී
යේ හවෙනි කුමාර ප්‍රේතවස්තුව නියා නිමවනලදී.—

41 කුමාර ප්‍රෙතවසතුව නිමි.

—×—

තුවද මේ ප්‍රේතවත්‍ථුප්‍රකරණයෙහි සතරවනමහාවග්ගී යේ සත්වෙනි රාජපුත්‍ර ප්‍රේතවත්‍ථුව කවරඟයන්?

තවද එක් සමයෙක්හි ශාක්‍යසිංහවූ අසමසමවූ ත්‍රෛලෝකතිලකවූ බුදුරජානන්වහන්සේ සැවැත්නුවර ජෙතවනාරාමයෙහි වැඩවාසඟකරවදාරණසේක් රාජපුත්‍ර ප්‍රේතඟක්‍ෂු අරහයා මේ ප්‍රේතවත්‍ථුවවදාළසේක— කෙසේදයත්, අතීතයෙහි යම් කිතාව රජ්ජුගේ පුත්‍රයෙක්තෙම පසේබුදුරජකෙණෙකුට අපරාධකොට බොහෝ හවුරුදු දහස්ගණනක් මූළුල්ලෙහි නරකයෙහි පැසි ඒ අකුසලකම්මයාගේ විපාකාව ඝේසයෙන් ප්‍රේත අපායේ උපන්නේවේද ඒ කිතව රාජපුත්‍රතෙම මේ කථාවෙහි රාජපුත්‍රයයි අධිප්‍රාවෙහි ඔහුගේ විස්තර කථාවයට කියනලද සාත්‍වාසි ප්‍රේතවත්‍ථුවෙහි ආයේය, එහෙයින් විස්තාරය එයින් දතයුතුයි— ඒ කථාවත්‍ථුව පිළිබඳ සාත්‍වාසි තෙරුන්වහන්සේ විසින් තමාගේ ඤාතිප්‍රේතයින්ගේ ප්‍රවර්තිය බුදුරජානන්වහන්සේට කීකල්හි බුදුරජානන්වහන්සේ මේ ප්‍රකාරයෙන් වදාළේය, එඛා සාත්‍වාසිය තොපගේ නැයෝ පමණක් ප්‍රේත අපායේ උපන්නාහු නොවෙති එතකුදුවත් තොපිද මෙයින් අතීත ආත්මභාවයෙහි ප්‍රේතාව ඉපද මහ දුක් අත්‍භවකලේයයි වදාළකල්හි ඒ තෙරුන්වහන්සේ විසින් අතීත කථාව ගෙණහැරදක්වන්ට ආරාධනා කරණලදුව බුදුරජානන්වහන්සේ අතීත කථාව ගෙණහැරදක්වා වදාරණසේක් මෙසේ වදාළේය—

(239) පුබ්බෙ කතානං කම්මානං විපාකො මථයෙමනං,
රූපෙ සද්දෙ රසෙ ගන්ධෙ පොථ්ඨබ්බෙ ච මනොරමෙ—

(240) නච්චං ගීතං රතිඛ්ඩං අනුභුත්වා අනප්පකං,
උය්‍යානෙ ? චරිත්වාන පච්සන්තො ගිරිබ්බජං—

(241) ඉසිං සුනෙත්ත මද්දක්ඛි අත්තදන්තං සමාහිතං
අපිවිජං හිරිසම්පන්නං උංඡාපත්තාගතෙ රතං—පෙ—

(242) දිට්ඨෙවධම්මෙ පාසංසො යො බුද්ධෙසු සගාරවො,
කායස්ස භෙදා සප්පඤ්ඤු සග්ගං සො උපපජ්ජතීති—

(239) යිතුහෙයින් එඛා සාත්‍වාසිකය පූර්වකාලයෙහි කරණලද අකුසලකම්මයන්ට උදාරවූ දුක් විපාක දෙනකල්හි ඒ අකුසලකළ අඟුනයින්ගේ සිතට විපාකදීම් වසයෙන් වෙහෙස ලැබෙයි, අතුන්ට අනර්ථකිරීම ප්‍රධානකොටහෙණ තමන්ට අනර්ථ උපදවා

ගෙණ දුක් විඳින්නේය—සිත්වලට වෙහෙසදීමට හේතුවන කාරණයෝනම පෙර ඒ නිතව රාජපුත්‍රතෙම ප්‍රියමනාපවූ රූපාරම්මණයලැබීම නිමිත්තකොටගෙණද එසේම ප්‍රියමනාපවූ ශබ්ද ගන්ධ රසාදින් ලැබීම නිමිත්තකොටගෙණද

(240) උසනව ගොස් බොහෝ නෘත්‍ය ගීතාදීන් අනුභවකෙරෙමින් උයනේ ඇවිද නැවත රජගහනුවරට යනකල්හි

(241) ඒතරමගදී සිලඝණ්ඨාදීන් ඒසනය කරන්නාවූ සවභාව ඇති උත්තම දමනයෙන් දමනයකරණලද සිත් ඇති අභිඤ්ඤාල සමාධියෙන් සමාහිතවූ භික්ෂාචාර්‍යාවෙන් ලත් පාත්‍රාහාරයෙහි ඇලිවසන්න වූ අල්පේච්ඡවූ සුනෙත්තනම් පසේබුදුරජානන් දැක ආතාඋඩින් බැස කිමෙක්ද සවාමීනි ආහාර ලැබුනේදැයි කියා විශ්වාසභාවය උපදිනසේ කථාකොට පසේබුදුන් අතින් පාත්‍රය හැර ගෙණ අත උස්කොට සිට නොබුරුල්වූ කෘරවූ හයිවූ භූමිප්‍රදේශයෙක පාත්‍රය හෙලා බිඳ මදක් ඇත්ව ගොස් සිටිනකල්හි පසේබුදුරජතෙම සිතනුයේ මේ අඥානයා නිස්කාරණයේ තමන්ට මහත් අනර්ථයක් කරගන්නේවනැයි සිතා කාරුණ්‍යවශයෙන් ඔහුදිහාව බලාසිටිනකල්හි ඒ නිතව රාජපුත්‍රතෙම පසේබුදුන්ට භීතියනුයේ මහණ මම නිතාවරජහුගේ පුත්‍රයෙමි තොපි මාදහාව බලා කුමක් කරන්දැයි කීයේය—

එවිට අකුශලකර්මයාගේ විපාක ඉතා කටුකවන්නේය. එහෙයින් ඔහු මැරිගොස් නරකයෙහි ඉපිද නරකදුනින් යුක්තව දුක් විඳින්නේ උඩුකුරුව සවාසූදහසක් හවුරුදු මුළුල්ලෙහිද, යටිකුරුව සවාසූදහසක් හවුරුදු මුළුල්ලෙහිද, වම් පාර්‍ශ්වයට හැරී සවාසූදහසක් හවුරුදු මුළුල්ලෙහිද, දකුණු පාර්‍ශ්වයට හැරී සවාසූදහසක් හවුරුදු මුළුල්ලෙහිද, උඩුකුරුව පාදයන් ඇතිව එල්වී සිටගෙණ සවාසූදහසක් හවුරුදු මුළුල්ලෙහිද, ඌර්ධ්වසීර්ෂව සිටගෙණ සවාසූදහසක් හවුරුදු මුළුල්ලෙහිද, මෙසේ සවාසූදහස සවාසූදහස සකොවසක් මුළුල්ලෙහි ඒ පසේබුදුන්ට අපරාධනිර්මි සංඛ්‍යාත දරුණු කර්මයකළ ඒ රාජපුත්‍රතෙම නරකයෙහි මෙවැනි ඝොරවූ කටුකවූ දුක් අනුභව කෙරෙමින් පැසුනේය—හෙතෙම නරකයෙහි බොහෝ හවුරුදු දහස්ගණන් බොහෝ නහුතගණන් මුළුල්ලෙහි දුක්විඳ එහින් චුතව අවුත් ප්‍රේත අපායේ උපදවා ක්ෂුත්පිපාසදෙකින් මැඩෙනලදුව දුක් අනුභවකෙළේය—එසේහෙයින් ඉසුරුමදය නිසා වන්නාවූ මේ ආදීනවය දැක ඉසුරුසම්පත් නිසා සිත් උඩහුකොටගෙණ දුශ්චරිතයෙහි නොහැසිරී ඉසුරුමදය දුරුකොට යටත්විය යුක්තාන්ට යවනු පැවතිය යුතුය.

(242) එසේ නිස්සන්ව යටහ පවත්නාවූ බුඩාදීන් කෙරෙහි ගෞරව සහිතවූ යම් පුද්ගලයෙක් ඇද්ද ඒතෙම මේ ලෝකයෙහි දීද ප්‍රසංසනීය වන්නේය. මරණින්මත්තෙහිද ඒ සප්‍රාඥතෙම සුගතිලෝකෝත්පත්ති කරන්නේයයි.

එසේ වදාරමින් රාජපුත්‍ර ප්‍රේත කථාවෙන් එහි රැස්වූ මහජනයාහට සංවේග උපදවා නැවත මත්තෙහි චතුස්සත්‍යදේශනාකොට වදාළසේක. චතුස්සත්‍යදේශනා කෙළවර බොහෝදෙනා සෝවාන් ඵලාදියට පැමිණියේයි. මේ ප්‍රේතවස්තුප්‍රකරණයෙහි සතරවන මහාවග්ගයේ සත්වෙනි රාජපුත්‍ර ප්‍රේත කථාව නියා නිමවනලදී.

42 රාජපුත්‍ර ප්‍රේතවස්තුව නිමි.

—×—

නුවද මේ ප්‍රේතවස්තුප්‍රකරණයෙහි සතරවන මහාවග්ගයේ අටවෙනි ගුථඛාදක ප්‍රේතවස්තුව කවරහයත්? හේමෙසේ දතයුතු.

එක්සමයෙක්හි ත්‍රිභුවනචූඩාමණිකාවූ කරුණා නිධානවූ බුදුරජානන්වහන්සේ සැවැත්නුවර ජේතවනාරාමයෙහි වැඩවාසයකර වදාරණසේක් සැවැත්නුවරට නුදුරුවූ එක්තරා ගමෙක වනාහි එක් කෙළෙඹිපුත්‍රයෙක්තෙම තමන්ට කුළුපග භික්ෂූන්වහන්සේ නමක් උදෙසා විහාරයක් කරවා පූජාකෙළේය, ඒ විහාරයට නොයෙක් ජනපදවලින් භික්ෂූහු අවුත් වාසයකෙරෙති, මනුෂ්‍යයෝ ඒ භික්ෂූන් දැක පහන්සිත් ඇතිව ප්‍රනීතවූ සිවුපසයෙන් උපස්ථානකරන්නාහුය. කුළුපග භික්ෂුතෙමේද මනුෂ්‍යයන්විසින් ආගන්තුක භික්ෂූවරුන්ට කරන්නාවූ ඒ උපස්ථාන ඉවසාගත නොහැකිව ඊර්ෂ්‍යාවෙන් පෙළෙනලද සිත් ඇත්තේ ඒ ආගන්තුක භික්ෂූන්ගේ වරද කියමින් කෙළෙඹියා ලවාත් නිතැකෙරෙවුයේය. කුළුපග භික්ෂුව විසින් අනික් භික්ෂූන්ට පරිභවකරණකල්හි කෙළෙඹිපුත්‍ර තෙමේද ඒ භික්ෂූන්වහන්සේලාට පරිභවකෙළේය.

ඉක්බිත්තෙන් කුළුපග මහණ මැරිගොස් එම පන්සලේ වැසිකිලිහෙයි ප්‍රේතයෙක්ව උපන්නේය. කෙළෙඹිපුත්‍ර තෙම මැරිගොස් ඔහුගේ ඔළුවළඩ ප්‍රේතයෙක්ව උපන්නේය. ඉක්බිති එක් දවසක් ආයුෂ්මත් මෞද්ගල්‍යායන ස්ථවිරතෙම වළඳිස්කුපයතුලසිටි ප්‍රේතයාගේ හිස්මුදුන මත්තෙහි සිටි ප්‍රේතයා දැක මෙසේ විචාරාවදාරණසේක්.

(243) ඛුද්දකුපතෝ උග්ගතත්තා කොතූහලීතෝසි නීවත්ථසි.
සංසයං පාපකම්මන්තා නිත්තුසදණ්ඩයසෙ තුවන්නි.

(244) අහං භදන්තෙ පෙතොම්හි දුග්ගතෝ යමලොකිකෝ,
පාපකම්මං කරිත්වාන පෙතලොකම්හිතොගතොති.

(243) යිතුහෙයින් අසූචිවලෙන් මතුව් බැඟැපව සිටින්නාවූ තොප කවරෙක්ද? තොපගේ අකුශලකර්මයගැණ සැකයෙක් වෙයි තොපි කුමක් පිණිස මුරගහදැයි විචාරාවදුළසේක.

(244) එකල ප්‍රේතතෙම කියතුයේ ස්වාමීනි මම අකුශල්කොට මිනිස්ලොවින් චුතව යමලෝකයයි කියනලද මේ ප්‍රේත අපායේ ඉපිද දුක් විඳින්නාවූ ප්‍රේතයෙකැයි කීයේය. එකල්හි තෙරුන් වහන්සේ ඔහුගෙන් මෙසේ විචාරණසේක්.

එඛා ප්‍රේතය තොපි පෙර මිනිස්ලොවදී කයින් වචසින් මනසින් කුමන කර්මයක් කෙළේදැ, කුමන කර්මයක්හුගේ විපාකයක් හේතුකොටගෙණ මෙබදු දුකකට පැමිණියේදැයි අසාවදුළේය. ස්වාමිනි පෙර මාවිසින් තනවා පූජාකරණලද ආවාසයෙහි නිතර වාසයකරන්නාවූ ඊෂ්‍යා හා කුල මාත්සර්‍ය්‍ය ඇත්තාවූ තුදවූ මසුරු සිත් ඇති සංඝයාහට අක්‍රෝස පරිභව කරන්නාවූ භික්ෂුවක් තෙම ඇත්තේය, හෙතෙම කුඵපගභාවයෙන් මාගේ කුලයට තෘෂ්ණාවෙන් බැඳිසිටියේය, ඒ මහණගේ කියමන අසා මමත් භික්ෂූන්වහන්සේලාට අක්‍රෝස පරිභව කෙළෙමි, ඒ අකුසලකර්මය හේතුකොටගෙණ මනුෂ්‍යලෝකයෙන් චුතව අවුත් මේ ප්‍රේත අපායේ උපන්නෙමි කියා මෙසේ ප්‍රේතයා විසින් තමන්ගේ ප්‍රවෘත්තිය තෙරුන්වහන්සේට කීයේය. ඒ අසා ඔහා මොද්ගලාන යන ස්ථවිරයන්වහන්සේ නැවත කුඵපගව සිටි මහණගේ ප්‍රවෘත්ති විචාරාවදුරණසේක්.

එඛා ප්‍රේතය මිනිස්ලොවදී තොපට මිත්‍රස්වභාව් අඟවා ක්‍රියාවෙන්අම්නුව සිටි කුඵපගවූ ඒ අඤ්ඤතමහනා මැරී පරලොව ගොස් කුමනගතියකට පැමිණියේදැයි අසාවදුළේය, එවිට ප්‍රේත තෙම කියතුයේ ස්වාමීනි මම දැන් මේ සිටින්නේ පව්ටු අකුසල කර්මයඅැති ඒ පාපයාගේ ඛිස්මුදුනඋඩවෙයි ඛිස්මුදුනකොලින් අව්කායෙහි සිටින්නෙම් නොවෙම් ඔහුගේ ඛිස්මුදුණෙම සිටින්නෙම්, ඔහුත් සංඝයාහට අක්‍රොසපරිභවකල අකුසල කර්මය හේතුකොටගෙණ ප්‍රේතඅපායේ ඉපිද මාගේ වැඩකාරයෙක්වූයේය, ස්වාමිනි අන්‍යයාද මේ අසූචි වලෙහි යම්යම් අසූචියක් හෙලුවද ඒ අසූචිය

දවසක් දවසක් පාසා මට ආහරවන්නේය, ඒ අසූචි අනුභවකොට මම යම්කිසිකමක් කෙරෙම්ද මාගේවැඩකාරවූ කුළුපග ප්‍රේතතෙම දවසක් දවසක් පාසා මාගේ අසූචි අනුභවකරවිත් ඒ නිසා කුළුපගප්‍රේතතෙම ජීවත්වන්නේය. කිහෙළු ඒ ප්‍රේතදෙදෙනාගෙන් කුළුපගප්‍රේතතෙම පෙර මිනිස්ලොවදී ප්‍රියසිලිහිසූන්ට මෙසේ කීයේය, මනුෂ්‍යයන් විසින් දෙනලද ආහර අනුභවකෙරීමට වඩා අසූචි අනුභවකෙරීම තොපට උතුම්යයි කියා සුප්පල භික්ෂූන්ට බැන්නේය, කුළුපග මහනා විසින් එසේ බැනිමෙහි කෙළෙඹුපුත්‍රයන් සමාදන්කොට ඒ කෙළෙඹුපුත්‍රයා විසිදූත් එසේම සුප්පල භික්ෂූන්ට බැන්නේය, එහෙයින් ඒ කුළුපගප්‍රේතයාහට එයිට වඩා ප්‍රතික්කූලවූ නිහීන ජීවිකාවක් වූයේය. ආයුෂ්මත් මහාමෞද්ගල්‍යායන ස්ථවිරතෙමේද ප්‍රේතයාවිසින් කියනලද ඒ ප්‍රවෘත්තිය අසා ජේතවනාරාමයට වැඩ එපවත් භාග්‍යවත් බුදුරජානන්වහන්සේට සැලකළේය. මේ ප්‍රේතවස්තු ප්‍රකරණයෙහි සතරවන මහාවග්ගයෙහි අටවෙනි "ගූථඛාදක ප්‍රේතවස්තුව" නියා නිමවන ලදී.

43 ගූථඛාදක ප්‍රේත වස්තුව නිමි.

—:x:—

කවද මේ ප්‍රේතවස්තුප්‍රකරණයෙහි සතරවන මහාවග්ගයෙහි නවවෙනි ගූථඛාදක ප්‍රේතියගේ කථාවස්තුව කවරහයත්?

කවද එක්සමයෙක්හි මෛත්‍රීයට නිවාසවූ ප්‍රභූවට වල්ල භූවූ මහාසාගරයසේ අචින්‍යාඝගුණඇති සර්ව්වඥරාජෝත්තමයානන් වහන්සේ සැවැත්නුවර ජේතවනාරාමයෙහි වැඩවාසයකර වදුරණසේක් සැවැත්නුවරට නුදුරුවූ එක්තරාගමෙක වාහිහි එක්තරාඋපාසිකාවක් තොමෝ තමන්ට කුළුපග භික්ෂූන්වහන්සේ නමක් උදෙසා විහාරයක් තනවා පූජාකෙළේය, එකල්හි නොයෙක් ජනපදවලින් අවුත් බොහෝ භික්ෂුවරු එහිවසන්නාහුය, මනුෂ්‍යයෝ ඒ ආගන්තුක භික්ෂූන්වහන්සේලා දැක ප්‍රසන්න සිත්ඇතිව ප්‍රණීතප්‍රණීත සිව්පසයෙන් උපස්ථාන කරන්නාහුය. මනුෂ්‍යයන් විසින් ආගන්තුක භික්ෂූන්වහන්සේලාට කරන්නාවූ උපස්ථාන දැක නේවාසික භික්ෂූනොම ඉවසාගතනොහී ආගන්තුක භික්ෂූන්ගේ නුගුනකියා උපාසිකාවලඟදීත් බණිනසෙයින් උපාසිකාවගේසිතත් කලකිරී උපාසිකාවඳ ඒ ආගන්තුක භික්ෂූන්වහන්සේලාට අක්‍රෝසපරිභව බෙණෙයි, මෙසේ ඒ මහණුන් පේසල භික්ෂූන්ව බනිවිත්

උපාසිකාලවාත් බන්නවමින් සිට මැරිගොස් එම්පන්සලේ වැසිකිලි යෙහි ප්‍රේතයෙක්ව උපන්නේය උපාසිකාවද මැරිගොස් ඒ ප්‍රේත යාගේ හිස්මුදුනළඬම ප්‍රේතියක්ව උපන්නීය, ඒ ප්‍රේති තොමෝ භික්ෂූන් විසින් වැසිකිලියෙහි හෙලනලද අසුචි අනුභවකරන්නීය, ඒ අසුචි අනුභවකොට ඇ විසින් කරණලද වචස් ඒ කුළුපග ප්‍රේත තෙම අනුභව කරන්නේය—ඉක්බිත්තෙන් එක්දවසක් ආයුෂ්මත් මහාමොග්ගල්ලානයන වහන්සේ වැසිකිලියෙහි වැස්සකු පයමතුයෙහි සිටින ඒ ප්‍රේතිය දැක මෙසේ අසාවදාළසේක—

(245) ගූථකූපතෝ උග්ගන්ත්වා කාතු දීනාහිතිට්ඨසි,
සංසයං පාපකම්මන්තා කින්තු සඳ්ධායසෙතුවන්නි—

(245) යනුහෙයින් අසුචි කූපයෙන් මතුවී බැඟැපහ සිටින්නාවූ නී කවරෙක්ද නිගේ අකුසල කර්මය කවරේද නීකුමක් පරිණාම මුර ගහනේ දුසි අසාවදාළේය,

ඒ අසා ප්‍රේතිතොමෝ කියන්නී සවාමිනි මම යමලෝක යෙහි කියනලද ප්‍රේතඅපායේ දුකට පැමිනියාවූ ප්‍රේතියක්වූයෙමි, මිනිස්ලොවදී අකුසල්කොට එයින් අවුත් මේ ප්‍රේතඅපායේ උපන් නෙමි කීය, නැවත තෙරුන්වහන්සේ අසාවදාරණසේක්, එබාප්‍රේ තිය තොපි මිනිස්ලොවදී කයින් වචසින් මනසින් කුමන අකුසල කර්මයක් කෙලේද කුමන අකුසල කර්මයක්හුගේ විපාකයක් හේතු කොටගෙණ මෙබඳුදුකකට පැමිනියේදැයි අසාවදාළේය—එකල ප්‍රේතිතොමෝ කියනුයේ සවාමිනි පෙර මිනිස්ලොව මාගේ ආවාස යෙහි ඊර්ෂ්‍යාසිත් ඇතතාවූ කුලමාත්සර්‍යයෙන් යුක්තවූ තදමසුරු සිත් ඇතතාවූ භික්ෂූන්වහන්සේලාට අක්‍රොසපරිභව බෙනෙන් නාවූ තෘෂ්ණාවසයෙන් කුලයෙහි බැඳුනාහු සිත්ඇති කුළුපග භික්ෂූ වක් ඇත්තේය, සුපේසල භික්ෂූන්වහන්සේලාට අක්‍රෝසපරිභව බෙ නෙන්නාවූ ඒ භික්ෂුවගේ වචනය අසා මමත් භික්ෂූන්වහන්සේලාට අක්‍රොසපරිභව කෙලෙමි ඒ අකුසලකර්ම විපාකය හේතුකොට ගෙණ මිනිස්ලොවින් චුතව මේ ප්‍රේතලෝකයෙහි උපන්නෙමි කීය—ඒ අසා තෙරුන්වහන්සේ වදාරණසේක—

(246) අම්තෙතා මිත්තවණ්ණෙන යො තෙඅසි කුළුපකෙ,
කායස්සභෙදා දුප්පඤ්ඤ්ඤ කින්තු පෙච්ච ගතිං ගතොසි

(246) යනුහෙයින් එබා ප්‍රේතදුව, පෙර මිනිස්ලොවදී ක්‍රියා වෙන් අම්තුවූ මිත්‍රස්වභාවදන්වාගෙණ සිටිය ඒ කුළුපගවූ අඥාන

මහනා මැරී පරලොවගොස් කවර ගතියකට පැමිණියේදැයි අසා වදාළේය.

ඒවිට ප්‍රේතතොමෝ කියනුයේ ස්වාමිනි මම දැන් කරණ ලද අකුසලකර්ම ඇති, ඒ පාප මහණගේ ඔිස්මුදුනේ සිටිමි, ඒ කුළු පග මහණද මැරීගොස් ප්‍රේතඅපායේ ඉපිද මටම වැඩකාරයෙක් වූයේය ස්වාමීනි මේ වැසිකිලියෙහි අන්‍යයෝ යම් වස්සක් තෙරෙද්ද, ඒ වස්ස් දවසක් දවසක් පාසා මට ආහරවන්නේය, යම් අසූචියක් අනුභවකොට මාවිසින් යම් වස්සක් කරන්නෙම්ද ඒ වස්ස් හැරගෙණ ඒ කුළුපග ප්‍රේතතෙම දස්පතා අනුභවකරන්නේය, ඒ නිසා ඔහුජීවත් වන්නේයයි නිය. ඒ දෙදෙනාගෙන් කුළුපග ප්‍රේතතෙම මිනිස්ලොවදී සුපේසල භික්ෂූන්වහන්සේලාට අක්‍රොස පරිභව කෙරෙමින් මෙසේ කියන්නේ, මනුෂ්‍යයන් විසින් දෙනලද ආහාර අනුභවකෙරීමටවඩා අසූචි අනුභව කොට්ම තොපට උතු මැසිකියා බිනුයේය, උපාසිකාතොමෝද ඒ භික්ෂුවගේ වචනය අසා එසේමකියා පේසලභික්ෂූන්ට බැන්නේය, මෙසේ ඒ භික්ෂුවසින් උපාසිකාවන් සමාදන්කරවා උපාසිකාව ලවා බැන්නෙවූ අකුසල හේතුකොටගෙණ ඔහුට ඒ ප්‍රේතියටවඩා පිළිකුල්වූ ජීවිකාඇතිවූයේය. ආයුෂ්මත් මහාමොග්ගල්ලානස්ථවිරතෙම දෙවුරමටවැඩ ඒ ප්‍රවෘත්තිය බුදුරජානන්වහන්සේට සැලකළේය, භාග්‍යවත් බුදුරජානන්වහන්සේ එම අර්ථොත්පත්ති කොටගෙණ උපවාදයෙහි ආදීනව දක්වා සම්ප්‍රාප්තාපිර්සට ධර්මදේශනාකොට වදාළේය. ඒධර්මදේසනාතොමෝ බොහොදෙනාහට සාර්ථකවූවාය. එබා ශ්‍රද්ධාවන්ත උපාසක උපාසිකාවරුනි, සිල්වත් ගුණවත ඇත්තන්ට නිත්‍ය ගහීතකිරීම හේතුකොටගෙණ මහණදම් පිරීමෙහි ආනිසංසහා ආවාසදානයාගේ ආනිසංසද උපාසකභාවයෙහි ආනිසංසද මැඩ පවත්වා ආයොපවාද අකුසල කර්මයෙහිම විපාක දුන් බව මෙයින් තෙරුම්ගොණ සිල්වත්ගුණවත් ඇත්තන්ව නිත්‍යගහීතකොට දානසීලාදී සුචරිතධර්මයෙහි හැසිර සර්ගසම්පත් සාධාගන්නට උත්සාහ කටයුතු. මේ ප්‍රේතවස්තුප්‍රකරණයෙහි සතරවන මහාවර්ගයෙහි දසවෙනි ගණප්‍රේත වස්තුව කවරහයත්.

44 ගූථඛාදකප්‍රේතියගේකථාවතිමි.

—:o:—

තුවද මේ ප්‍රේතවස්තුප්‍රකරණයෙහි සතරවන මහාවර්ගයෙහි දසවෙනි ගණප්‍රේත වස්තුව කවරහයත්.

ඒ ක්ෂමයෙක්හි ත්‍රිභුවන වඳුනෙයාවූ තිලෝගුරු බුදුර
ජානන්වහන්සේ සැවැත්නුවර ජේතවනාරාමයෙහි වැඩවාසයකර
වදාරණකල්හි ප්‍රේතයෝ බොහෝගනනක් අරභයා මේ ප්‍රේතව
ස්තුව වදාරණලද්දේය—ඒ කෙසේදයත්?—සැවැත්නුවරවනාහි
බොහොමනුෂ්‍යයො සමූහයක් බුඩාදිරනතත්‍රයෙහි ශ්‍රඩානැතිව
ප්‍රසනනනැතිව මසුරුමල්ලන් මැඩෙනලදසින් ඇතිව දානාදි සුචරිත
කර්මයට පටිපා බොහොකල් ජීවත්වසිට මැරීගොස් නුවරසමීපයෙහි
ප්‍රේතයොනියෙහි උපන්නාහුය—ඉක්බිත්තෙන් එක්දවසක් ආයු
ෂ්මත් මහාමොදගලනඅන ස්ථවිරයන්වහන්සේ සැවැත්නුවරට පිඬු
පිණිස වඩනාසේක් අතරමගදී ඒ ප්‍රේතයන්දැක මෙසේ අසාවදා
ළේය—

(247) නගහා දුබ්බණ්ණරූපාසි කිසාධමණි සණ්ඨිතා,
උප්පාසුලිතෙ කිසිකෙ කාතු තුමෙනථ මාරිසාති—

(247) යහුගෙයින් විලිවැසිලලක් නැතිගෙයින් නගනව දුර්
ණ්වූ ඇවසැකිලිපමණක් හෙයින් කෘශවූ ඉලිපුනාවූ නහරවලින්
යුක්ත ශරීර ඇතිව ව්වරවූ ඉලන්ත්ඇතිව මෙහිසිටින්නාවූ ගොපි
කවරෙක් වන්නාහුදැයි අසාවදාළේය, එකල්හි ප්‍රේතයෝ මේසේ
කියන්නාහුය—

(248) අසංහදනෙන පෙතමහා දුග්ගතාසාමලොකිකා,
පාපකම්මං කරිත්වාන පෙතලොක මිතොගතාති—

(248) යහුගෙයින් සවාමිනි අපි ප්‍රේතවෙන්නෙමුව පෙර මිනිස්
ලොවදී අපි අකුසල්කොට එසින් මැරී අවුත් මේ ප්‍රේතයොනියෙහි
උපන්නෙමුයයි කීහ—

ඒ්ව තෙරුන්වහන්සේ නැවත විචාරණුයේ, එඩා ප්‍රේත
වරුණි තොපි මිනිස්ලොවදී කයින් වචයින් මණයින් කුම්න අකු
සලකම්මයක් කලාහුද කුම්න අකුසලකම්මයක් හේතුකොටගෙණ මි
නිස්ලොවින් චුතව අවුත් ප්‍රේතඅපායේ උපදවා ක්ෂුත්පිපාස දෙකින්
පෙලෙමින් පැන්සොයා ඇවිදින්නාවූ අපි පැන් බොන්නට ගඟාව
කට ගියෙමුනම් පිරීතිබුනාවූ ගඟාවෙජලය මදක්වත් නැතිව වියළෙයි, ග්‍රීෂ්මයෙන් තැවෙමින් සිට සෙවනටගියෙමුනම් එතැන්හි
තදඅවුවවෙයි ඉතා සිහිල්ව හමන්නාවූ සුලඟ අපට ගිනිමෙන්
වෙයි, සවාමිනි අපි පින් නොකලහෙයින් අපේ මේ දුකට පමනක්
සුදුසුසානොවෙමුව මිටත්වඩා දුක්විඳිමට සුදුසුසාවෙමුව ක්ෂුධාව

ඉවසන්නට නොහැනිව ආහරසොයා යොදුන්ගනන් දුරත් දුව ගොස් ආහරනොලැබ වෙහෙසටපැමිණ නවතින්නෙමුව අනේ අපේ පින්මඳිකමට ඉතාදුදුමය සවාමිනි අපි බොහොකල් ක්‍ෂුධාවෙන් පෙලෙමින් ඔබ ආහරයෙහි ගිජුව ආහරලෝභය ඇතිව මෙසේ බොහොදුරගොසිනුත් ආහරනොලැබ දුකටපැමිණීමෙන් සමහරවේලාවලදී උඩබැලෙලන් එනිම වැටෙන්නෙමුව අතපය ඇදිය කැඩිබිඳි ඉරියන්නාක්මෙන් වේදනාඇතිව සමහරවේලාවලදි මුහුනින්වැටෙන්නෙමුව, මුහුනිනවැටුනාවූ අපි බලවත්වේදනාවට පැමිණ නැගිට්න්නට නොහැනිව ඉස උරෙගසාගන්නෙමුව, අනේ සවාමිනි අපේ පින්මඳිකම ඉතාපුදුමයකි නිවාහුය—

එවිට අසා ආයුෂ්මත්මහා මොඳ්ගලායන ස්ථවිරයන්වහන්සේ ජේතවනාරාමයට වැඩ එපවත් බුදුරජානන්වහන්සේට සැලකෙළේහ්, බුදුරජානන්වහන්සේ එම අර්ථොත්පත්තිකොටගෙණ සම්ප්‍රාප්තාපිරිසට ධම්මදේශනාකොට වදාළේය—ඒ ධම්මදේශනාව අසා මහජනතෙම මසුරුමල දුරුකොට දානාදිපින්කම්හි ඇලුනේයි—මේ ප්‍රේතවස්තු ප්‍රකරණයෙහි සතරවන මහාවග්ගයෙහි දසවෙනි ගනප්‍රේතවස්තුව කියා නිමවනලදී—

45 ගන ප්‍රේත වස්තුව නිමි.

—※—

නවද මේ ප්‍රේතවස්තුප්‍රකරණයෙහි සතරවන මහාවග්ගයෙහි එකොළොස්වෙනි පාටලිප්‍රේතවස්තුව කවරහයන්? නවද එක්සමයෙක්හි ශාක්‍යකුලප්‍රධානවූ තිලොගුරුසම්‍යක්සම්බුදු රජානන්වහන්සේ සැවැත්නුවර ජේතවනාරාමයෙහි වැඩවාසයකරවදාරණකල්හි එක්තරාවිමානප්‍රේතයක්හු අරහයා මේ ප්‍රේතවස්තුව වදාරණලද්දේය—කෙසේදයත්? සැවැත්නුවරවාසිවූද පැලඳ්ත්නුවරවාසිවූද බොහොවෙලෙඳුන් ගනනක් නැවෙන් සුවණ්භූමියට ගියාහුය, ඔවුන්අතුරෙන් එක්උපාසකයෙක් ආබාධයකින් පෙලෙනලදුව මැරිගොස් එක්තරා සත්‍රියක්කෙරෙහි ප්‍රතිබද්ධසිත්ඇතිඔහුගින් දෙවුලොවනොයිපද මුහුදමැදවිමානප්‍රේතයෙක්ව උපන්නේය, ඔහුවසින් ආලයකරණලද සත්‍රිතොමෝද සුවර්ණභූමියට යන වෙන්න්නැවකින් යන්නිය, එකල්හි ඒ විමානප්‍රේතතෙම ඒ සත්‍රියාවහැරගන්නා කල්පනා ඇත්තේ දුවන්නනෙදී ඒ නැව වැලකුයේය—එකල්හි ඒ නැවෙහි යන වෙලෙන්දුකියන් නාහු කුමන කාරණයකින් මේ නැව නොයන්නේදැයි කියා පරීක්‍ෂා කරණ පිණිස කාලකන්නිපහු ඇද්දුහුය, එකල්හි ඒ විමාන

ප්‍රේතයාගේ ඉඩ්ධානුභාවයෙන් කාලකන්ණිපත්‍රය තුන්වරක්ම ඒ
ස්ත්‍රියට පෑම්ණියේය, ඒ දක වෙළෙන්දෙ ඝුනදඬුම්ටියක් මුහුදවබා
ඒ ඝුනදඬුම්ටිය මත්තට ඒ ස්ත්‍රිය බැවාඝුය, ස්ත්‍රිය ඝුනදඬුම්ටියමත්
තට බැවාවූකෙණෙහිම නැව ඔවර්ණභූමියට අභිමුඛව වේගයෙන්
දුවගියේය, විමානප්‍රේතතෙමද ඒ ස්ත්‍රිය තමාගේ විමානයට නන්
වාගෙණ ඇ හා සමග අභිරමනයකෙළේය, ඕතොමෝ එබිවිසි
මෙන් එක්හවුරුදුක් පසුඋතුකල්හි ඒස්ත්‍රීතොමෝ කලකිරුණුසිත්
ඇතිව ඒ විමානප්‍රේතයාට යාඤ්ඤකරම්න් මෙසේ කීය——මම මෙහි
වසනකල්හි මෙහිදී මට පරලොව වැඩක්කරගන්නට නොලැ
බෙයි එහෙයින් ඔබට යාඤ්ඤකරම් නිදුකානන්වහන්ස මා පැළලූප්
තුවරට ගෙණයෙවයි කීයේය, මෙසේ ඒ ස්ත්‍රිය විසින් යාඤ්ඤකරණ
ලදුව විමානප්‍රේතතෙම කියතුයේ එඛා ස්ත්‍රිය නී විසින් මෙහිදී සම
ඟං නරකවලුත් දුටුයේවන, මහත්ආනුභාවඇති නාගුරුඑඅදී නිරි
සන්ඝුද දුටුයෙව, සාප්පාසාදී ප්‍රභෙදදුක් අනුභවකරණ ප්‍රේත
ඝොද නී වසින් දක්නාලද්දේවන, කාලකඤ්ඡාදිඅසුරයොද නී
විසින් දක්නාලද්දෙවන චාතුම්හාරාජික දෙවලොව සමහරදිව්‍ය
රාජවරුද නී විසින් දක්නාලද්දෙවනැයි කීහ, ඒ විමානප්‍රේතතෙම
අතරතුරෙහි තමාගේ ආනුභාවයෙන් ඒ ස්ත්‍රිය හැරගෙණගොස්
නරකවල්ආදිය පෙන්වම්න් ඇවිදින්වෙයි එසේහෙයින් මේ ප්‍රකා
රය නිගම්න් නැවතනියන්නේ නරකවල්ආදී ඒ ඒ ස්ථානවලටගොස්
බලන්නාවූ නී උතුනුන්වසින් කරණලද කම්මානුරූපව විඳින්නාවූ
සැපදුක් දෙනප්‍රත්‍යක්ෂවශයෙන් නී විසින් දක්නාලද්දේය——එ
හෙයින් තීත් අප්‍රමාදව කුශලක්‍රියාවෙහි ඇලිවසවයිකීයේය——
එකල්හි ඒ ස්ත්‍රීතොමෝ ඒ විමානප්‍රේතයාගේ වචනයඅසා මෙසේ
කියන්නී——

(249) අත්ථිකාමොසි මෙයක්ඛ හිතකාමොසි දෙවතෙ,
කරොම් තුයහං වචනං ඛිප්පං ආචරියො මම——

(250) දිට්ඨා මයානිරයා නිරවිඡානයොනි,
පෙතා සුරා අථවාපි මනුස්සා දෙවා,
සඨං මඳුසි කම්මවිපාකමත්තනො,
කාඝාමි දුක්ඛූනි මනපාකානිති——

(249) යතුහෙයින් දිව්‍යරාජ්‍යය තොපි මට අර්ථ කාම්කෙණෙක්
වෙයි, දේවතාවෙනි තොපි මට හිතකාම් කෙණෙක්වෙයි, එසේ
හෙයින් ඉම තොපගේ වචනය කරන්නෙම් තොපි මාගේ ආචාර්‍ය්‍ය
කෙණෙක්වන්නේය——

(250) නරකාදියද මාවිසින් දක්නාලද්දේය, තිරිසන්යෝනිය

හා ප්‍රේත අසුරනිකායද, දෙව්ලොද මනුෂ්‍යලොද මාවිසින් දක්නා ලද්දහ, ඔවුනොවුන්කලාවූ කුසලාකුසල කර්මානුරූපව විඳින දුක් සැපදෙකද මාවිසින් ප්‍රත්‍යක්ෂවශයෙන්ම දුටුයෙමි එහෙයින් මම බොහොකු සල්කරන්නෙමියි කියා—

ඉක්බිත්තෙන් ඒ ප්‍රේතතෙම ඒ සත්‍රිය හැරගෙණ ආකාශයෙන් හොස් පැළලූ ප්තුවරමැද සිටුවා තමන්ගේ වාසස්ථානයට ගියේය—එකල්හි ඇගේ ඤාතිමිත්‍රාදිහු ඇය දැක මෙසේ කියන්නාවූ මෝතොමෝ මුහුදේදමන්ලදුව මැරුනේයයි කියා පෙර අඳිඅසු යෙමුව ඕතොමෝසුවසේ ආවවුන්එකාන්තයෙන්ම අපවිසින් දක්නාලද්දියයි කියමින් සතුටුසිත ඇතිව රැයවිසිට ඇගේ ප්‍රවෘත්තිවි චාලේය—ඕතොමෝඔවුන්ට මුලපටන් තමන්විසින් දක්නාලද දෙයද තමන්වසු සුවදුක්ද සියල්ලකියේය, සැවැත්තුවරවැසි ඒ වෙළෙන්දෝද ක්‍රමයෙන් අවුත් සැවත්තුවරට පැමිණි කල්හි, ශාස්තෘන්වහන්සේ ලඟට එළඹ වැඳ එකත්පසව ඳුන්නාසු ඒ ප්‍රවෘත්තිය භාග්‍යවත් බුදුරජානන්වහන්සේට සැලකළාහුය—ශාස්තෘන් වහන්සේ එම අර්ථොත්පත්තිඋකොටගෙණ සිවුවනක් පිරිසට ධර්ම දේශනා කළසේක—ඒ ධර්මදේශනාව අසා මහජනතෙම හට ගත් සංවේගඇතිව දුනාදිසුවර්තයෙහි ඇලිසිට කර්මවූ පරිද්දෙන් මියපරලොව ගියේයි—මේ ප්‍රේතවස්තුප්‍රකරණයෙහි සතරවන මහාවග්ගයේ එකොළොස්වෙනි පාටලිපුත්‍රත ප්‍රේතවස්තුව නියා නිම්වනලදි—

46 පාටලිපුත්‍රත ප්‍රේතවස්තුව නිම්.

—※—

නුවද මේ ප්‍රේතවස්තුප්‍රකරණයෙහි සතරවන මහාවග්ගයෙහි දෙලොස්වන අඹප්‍රේතවස්තුව කවරහයත්? එක්සමයෙක්හි සතරම්දිග ලෝකදීවාකරවූ සම්බුදුරජාණන්වහන්සේ සැවැත්නුවර ජේතවනාරාමයෙහි වැඩවසන්කල්හි එක්තරා ගෘහපතියෙක් අරභයා මේ ප්‍රේතවස්තුව වදාරණලද්දේය—කෙසේදයත්? සැවැත්නුවරවාසී ඍද්ධියවූ භෝගයන් ඇති එක්තරා ගෘහපතියෙක්වූ සේය, ඔහුගේ භාර්‍යාව මැරුනේය, ඔහට එකමදුකිනෙක් ඇත්තීය, ඒ ගෘහපතිතෙම තමාගේ මිත්‍රයෙකුගෙන් නයට කහවණු සියයක් හැරගෙණ සාත්තුවාහකයන් හා සමන වෙළඳුම්පිණිස ගොස් වෙළඳුම් කරමින් මුදල හා සමග ලාබකඟවණු පන්සිය යක්සඳහව සාත්තුවාහකයන්සමග දෙරලා සඛ්‍රීයගමට එන්නේ

අතරමගදී පල්සොරු බඩුගන්නාපිණිස සාත්තුවාහකයන් ලඟට ආවාහුය, සාත්තුවාහකයෝ ඒ ඒ අත දුවගියාහු—ඒ ගෘහපතිතොම එක්තරා ගසෙක කහවණු සඟවා තබා තමන් එයටයම් පතැනෙක්හි සැඟවිසිටියේය, සොරහු ඔහුදැක හැරගෙණ මැරුවාහුය, එතෙම වසහුලෝභයෙන් බැහැර නොගොස් එතැන්හිම ප්‍රේතයෙක්ව උපන්නේය, වෙලෙන්දෝ ක්‍රමයෙන් සැවැත්නුවරට ගොස් ඔහුගේ දුවට එපවත් කිවාහුය—

ඕතොමෝ පියානන් මැරුණුශෝකයෙන්හා ජීවත්විය නොහැනි. හසිත්‍රුත් හටගත් දෙම්නස් ඇතිව ඉතා අධිකතරව හැඬිය, එකල්හි ඇගේ පියානන්ට යහලුවූ කෙළෙඹියෙක් ඇත්තේ හෙතෙම අවුත් ඇට නියන්නේ දියනියනි යම්සේ සියලු මැවිහා ජන සදුකල්ම බිඳෙන සුභාවම ඇත්තාහුවෙද්ද, එපරිද්දෙන්ම සියලු සත්ත්වයෝ මැරෙණ සුභාව ඇත්තාහ, මරණයනම් සර්වසාධාරණය එහෙයින් දියනියනි නෙපි බොහෝසේ ශෝක නොකරව විලාපනොනියව, මම නිව පියානොවෙමි නිමාගේ දුහිතාවෙයි නිව පියානන්විසින් කරණසියල්ල මම සිඛකරදෙන්නෙමි මේ ගෙදර අමූතක්කොටනොසිතා තොපගේ ගෙදරමෙන් සිතාමෙහි සිත් අලවා සිටින්නෙහ් වේදැයි නියා අවවාදකොට අස්වැසුය— ඉ

ඕතොමෝ ඔහුගේ වචනයෙන් සන්සිඳුනාවූ ශෝක හා පසුතැවිලි ඇතිව තමන්ගේ පියාකෙරෙහි මෙන් ඔහුකෙරෙහිත් ගෞරවභාඛහුමාන උපදවා තමන්කෘපණ බැවින්. ඔහුවවත් පිළිවෙත් කරමින් සිටින්නී එක්දවසක් මැරුණු පියානන් උදෙසා මතකදන්දෙනු කැමතිව කැඳපිස මනාකොට ඉදිමෙන් සිරියල්වණ්ඩ ඇතිඅඹගෙඩි කිපයක් රන්තලියෙක තබාගෙණ කැඳසමග අඹත් දුසියලවා ගෙන්වාගෙණ විහාරයට ගොස් බුදුන්වැඳ සිට මෙසේ කියන්නිය, භාග්‍යවතුන්වහන්ස මාගේ මේ දක්ෂිණාව පිළිගැනීමෙන්මට අනුග්‍රහකළමැනවැයි කීය, එකල්හි, ශාස්තෘතොම මහාකරුණාසමාපත්තියෙන් සම්මෝදිතවූ සිත්ඇතිව ඇගේකල්පනාව සම්පූර්ණකොට වදුරමින් වැඩහිඳින ආකාරයක් දක්වා වදාළේය, ඕතොමෝ තුටුපහටූසිත්ඇතිව අස්නක්පනවා එහි තමාගේ ඉතා පිරිසිදුවස්ත්‍රය අතුවදුන්නේය, භාග්‍යවත් බුදුරජානන්වහන්සේ පනවනලද ආසනයෙහි වැඩහුන්සේක—එකල්හි ඕතොමෝ බුදුන්ට කැඳඑළුවූවාය, බුදුරජානොකැඳ පිළිගෙණ වදාළෝය, ඉක්බිනිසංඝනකොට භික්ෂූන්ට කැඳ පිළිගැන්වීය, කැඳවළඳ අවසාන සදුකල්හි ඕතොමෝ අතනාවාගෙණ ගුඩපවිත්‍රව අඹඵලයන්ද

බුදුන්වපි ළිහැන්වීය, භාග්‍යවත් බුදුරජානෝද අඹ පිළිගෙණ වැල
දුසේක, ඉක්බිති ඔතොමෝ බුදුන් වැඳසිට මෙසේ කියන්නීය, සවා
මීන්වහන්ස මාගේ මේ පසතරණහා කැඳහා අඹඵල දැක්ෂිණාවෙක්
ඇද්ද ඒ දැක්ෂිණාව මාගේ පියානන්ට ලැබේවයි කිවාය, එසේවේවයි
කියා බුදුරජානෝ ඇට අනුමෙවෙනිබණ වදාළසේක—ඔතොමෝ
බණඅසා ඉක්බිති වැඳ ප්‍රදක්ෂිණකොට ගියාය, ඒ දැක්ෂිණාව උදෙසු
කෙණෙහි ඒ ප්‍රේතතෙමේ අඹ උයන්හා විමාන කප්රුක් පොකුණු
ආදී මහත් දිව්‍යසම්පත් ලැබුයේය—ඉක්බිති ඒ වෙළෙන්දෝ මෑත
කාලයෙහි වෙළඳුමින් පෙරලා එන්නාහු, එම මාගීයටපැමිණ
එමින් පෙර වෙළඳුමට යනකලවිසූ ස්ථානයෙහි එකරැයක් වාසය
කළෝය—ඒ වෙළඳුන් දැක විමානප්‍රේතතෙම උදානවිමානාදිය
සමඟ ඔවුන්ට නමන්දක්වා සිටියේය, වෙළඳහු ඒ සම්පත් දැක
කවරකාරණයෙහින් ලදසම්පත්දැයි විචාරන්නාහු මෙසේ කිහ—

(251) අයවතෙ පොක්ඛරණී සුරම්මා,
සමාසුපතිත්ථාව මහොදකාසුං,
සුපුප්ඵිතා හම්මරගණානුකිණ්ණා,
කථංතයා ලඛාඅයං මනුඤ්ඤා—

(252) ඉදංවතෙ අඹවනං සුරම්මං,
සඛෙබාතුකංඛාර යති ඵලානි,
සුපුප්ඵි තංහමරගණානුකිණ්ණං,
කථංතයා ලඛම්මං විමානන්ති—

(251) ඵුතුහෙයින් එඛාදිව්‍යරාජය තොපගේ මේ පුඤකරණීහු
ම්නාව රම්‍යවන්නාහුය සමතලාවූ භූම්ප්‍රදේශඇත්තාහුය රතනාමය
ගිනිපෙති ඇතිහෙයින් යහපත් තොටුපල ඇත්තාහුය පිරිතිබෙන්
නාවූ ජලය ඇත්තාහුය සුපුෂ්පිතවන්නාහුය භෘංගසමූහයාගෙන්
ගැවසුනාහ, එහෙයින් ඉතාම්නෝඥවන්නාහ—

(252) නවද තොපගේ මේ අඹඋයන ඉතාරම්‍යවන්නේය, සියලු
යෑනුවල මල්හා ඵලදරන්නේය භෘංගසමූහයාගෙන් ආකීර්ණවූයේය,
මේ පුඤකරණීහා මේ අඹඵලයන්හා විමානාදිය තෙපි කෙසේද
දෙදැයි විචාළාහුය—

(253) අසා දිව්‍යරාජතෙම කියනුයේ මාගේ දුහිතෘතොමෝ
අඹඵලහා කැඳද ශුඛවෘතයක්ද බුදුන්වහා භික්ෂූන්වහන්සේලා
වන් පළිගන්වා මට ඒ දැක්ෂිණාව දුන්නේය, මාගේ දුහිතාව විසින්
දෙනලද ඒ දැක්ෂිණාව හේතුකොටගෙණ මටමෙහි දිව්‍යම්‍ය අඹ
උයනේ සියලු යෑනුවලට අඹඵලද මේ දිව්‍යම්‍ය පොකුණුවල දිව්‍ය

මයවූ පැන්ද කැඳහා ඇතිරිල්ලදුන් ආනිසංසය හේතුකොටගෙන උදානවිමානකල්ප වෘක්ෂාදියෙහි මනොරම්‍යවූ සිහිල්සෙවනහා මේ සම්පතුන් මෙහිමට ලැබුනේයයිකියා නැවත ඒ ප්‍රේතතෙම වෙළඳුන්කැඳවා ගොස් පෙරසඟවාතිබුනාවූ කහවණු පන්සියය පෙන්වා තෙපි මේ කහවණුඟැර ගෙනගොස් කොටසක් තෙපි ගනුව අනික්කොටස මාගේ දුහිතෘවටදී මා විසින් හැරගෙණ තිබුනු නයගෙවා සැපසේ ජීවත්වෙවයි කියවයි කීය, වෙළඳහුද ඒ කහවනුත් ඟැරගෙණ කුම්මයෙන් සැවැත්නුවරට ගොස් ඔහුගේ දුහිතෘවට ඒ ප්‍රවෘත්තියකියා ප්‍රේතයාවිසින් වෙළඳුන්ට දුන්කොට සඳ ඇටම දුන්නාහුය, ඕතොමෝ ඒ කහවණුගෙණ කහවණු සියයක් නයකාරයන්ට දී අනික්වා තමන්ගේ පියාගේ යහළුවූ තාමන්සිටිනකුලයෙහි කෙළෙඹිපුත්‍රයාඟට දී තමන් වතාවත්කර මින් සිටිනිය, ඒ කෙළෙඹි පුත්‍රතෙමේද මේ සියල්ල නිටවේවයි නියා ඇටම දෙවනු දී ඇ තමන් වැඩිමහළු පුතාඟට භාර්‍යාකොට සරණපාවාදුන්නේය.

ඕතොමෝ කල්‍යාණකදී එක්පුත්‍රයෙක් ලැබ ඒ පුත්‍රයාගේ සිත සතුටුකරමින් මෙසේ නියන්නිය, දුනයාගේ හා සීලසමාදුනයාගේ විපාකත් ඉහාතම්යෙහිදිම බලව මම පෙර මෙහි තොපගේ මුත්තාතුවන්ගේගෙදර දුසිවසිට දුන් ඔහුටම යෙහෙළිව ගෘහස්ථ ප්‍රධානවූයෙමි කීව. ඉක්බිති එක්දවසක් ශාස්තෘන්වහන්සේ ඇගේ නුවන මේ රුබවදුන ආලෝකයක් පතුරුවා සම්මුඛයෙහි සිටින්නාක්මෙන් තමන්වහන්සේ පෙනීසිට මෙසේ වදාරණසේක්.

(253) අසාතං සාතරූපෙන පියරූපෙන අප්පියං,
දුක්ඛං සුඛස්සරූපෙන පමත්තා අනිවත්තන්තිනි.

(253) සැපනොවූදෙය සැපවසඟෙන්ද අප්‍රියවූදෙය ප්‍රියවසඟෙන්ද දුක්ඛිතදෙය සුඛවසඟෙන්ද ගෙණ ප්‍රමාදවූවාහු ඉක්ම පවත්නාහුයයි.

යනමේ ගාථාව වදාළේය.

—×—

ගාථාවෙන් ධර්මදේසනාකොට වදාළකෙලවරදී ඒ සත්තොමෝ සෝවාන්පෙළෙහි පිහිටියාය. ඕතොමෝ දෙවෙනිදවස බුදුන් ප්‍රමුඛ භික්ෂුසංඝයාට දන්දී ප්‍රවෘත්තිය භාග්‍යවතුන්වහන්සේට සැලකළාය. භාග්‍යවත් බුදුරජානන්වහන්සේ එම අත්තොත්පත්තිකොටගෙණ සම්ප්‍රාප්තපිර්සව ධර්මදේශනාකොට වදාළසේක. ඒ ධර්මදේශනා තොමෝ මහජනයාඟට සාර්ථකවූ වාය. මේ ප්‍රේතවස්තු ප්‍රකරණයෙහි දෙලොස්වෙනි අඹප්‍රේතවස්තුව නියා නම්වනලදී.

47 අඹ ප්‍රේතවස්තුව නිමි.

—×—

තවද මේ ප්‍රේතවස්තුප්‍රකරණයෙහි සතරවන මහාවග්ගයේ තෙ
ලෙස්වෙනි අනඛරූඛඹ ප්‍රේතවස්තුව 'කවරහයත්? තවද එක්සම
යෙක්හි මහපොළවසේ පතලගුණඇති මහමෙරසේ උස්වූගුණ
ඇති බුදුරජානන්වහන්සේ සැවැත්නුවර ජේතවනාරාමයෙහි වැඩ
වාසයකර වදාරණකල්හි සැවැත්නුවරවැසි එක්තරා උපාසක
යෙක් තමගැල්වල බඩුපුරවාගෙණ වෙළඳුම්පිණිස පිටරටකට
ගොස් එහිදී තමන්ගේ බඩුවිකුණගෙන ගත් බඩුගැල්වලට නහා
ගෙන සැවැත්නුවරට යනමාගීයට පැමිනියේය, ඔහු මාගීගයට
බැස යනකල්හි එක්ගැලක අකුරක් බිඳුනේය, එකල්හි ගම්වැසි
එක්තරා පුරුෂයෙක් තෙම් ගස් කපාගන්නා පිණිස වැසිඑරසු
වක් ගෙන්වාගෙන තමාගේ ගම්න්පිටත අවුත් වනාන්තරයෙහි
ඇවිදිමින් ඒ ස්ථානයට පැමින ගැලෙහි අකුර බිඳුනුහෙයින් දෙම්
නසට පැමිනසිටින්නාවූ උපාසකයා දැක, සිතන්නේ මේ වෙළඳ
තෙම ගැල්අකුර බිඳුනුහෙයින් මහාවනාන්තරය මැද වෙහෙසෙන්
නේයයි සිතා කරුණු උපදවා රූකක් සිද එයින් ගැල්අකුරතනා
ගැලෙහි යොදුවන්නේය—ඒ පුරුෂතෙම මෑතකාලයෙහි මැරී
ගොස් එම මහාවනාන්තරයෙහි භූමාට්ඨ දෙවියෙකව උපන්නේය,
තමන්ගේ කුශලකම්මයෙන් පහළවූසඳහන් ප්‍රත්‍යවේක්ෂාකොට
දැන රාත්‍රියෙහි ඒ උපාසකයාගේ ගෙදරටගොස් ග්‍රහචාරයෙහිසිට
කියනුයේ—

(254) යං දදාති නතං හොති දෙථෙව දනං දතාතරනි,
උභයංතෙන දනෙන ගච්ඡතිජගරථ මාපමජ්ජථාති—

(254) යම්නුහෙයින් උපාසකය යම්දෙයක්දන්පිණිස දෙන්නේද

පරලොව්දී විපාකදෙනකල්හි ඒ දෙයම ලැබෙන්නේ නොවෙයි
එනුවුදුටුව ඒ දානානිසංසයෙන් වෙනත් බොහෝ සම්පත් පහළ
වීමවශයෙන් සුවවිපාකදෙන්නේය, එහෙයින් දන්ම දියයුතුවේයි
දන්දුන්කල්හි මෙලොව දුක්ද පරලොව දුක්ද මෙලොව අනඳුද
පරලොව අනඳුද සියල්ලම දුරුවෙයි, ඒ දානය හේතුකොටගෙන
තමන්ටද අනුන්ටද හිතසැපඵල්වීමවශයෙන් මෙලොවසැපද පර
ලොවසැපදයන මේ උභයලෝකාර්ථයම ලැබෙන්නේය, මෙසේ දෙ
ලොව අනඳු දුරලන්නටහා දෙලොව සුවසම්පාදනයකරගන්න
වත් දානොපකරණ සම්පාදනාදියෙහි අප්‍රමාදවීමෙන් නිදුවර්ජිත
කරවියයි මෙසේ දිව්‍යරාජතෙම වෙළෙන්දාට කියේය—

වේළඳනෙමේද තමාගේ කෘත්‍යයනිරණයකොට එතු
මයේ, ක්‍රමයෙන් සැවැත්නුවරට පැමිණ දෙවෙනිදවස ශාසනුන්ව
හන්සේ කරුණලඹ නමස්කාරකොට එකත්පසකහිඳ එපවත්
භාග්‍යවතුන්වහන්සේට සැලකළේය—භාග්‍යවත් බුදුරජානන්ව
හන්සේ එම අසේචිත්පත්තිකොටගෙණ සම්ප්‍රාප්තපිරිසට ධම්මදේ
ශනාකළසේක—ඒ ධම්මදේශනා තොමෝ මහජනයාහට සාතී
කවූයේයි—මේ ප්‍රේතවස්තුප්‍රකරණයෙහි සතරවන මහාවගී
යෙහි ලැබෙන්නේ අක්ඛරුක්ඛ ප්‍රේතවස්තුව කියා නමවනලදී—

48 අක්ඛරුක්ඛ ප්‍රේතවස්තුව නිමි.

—:0:—

නුවද මේ ප්‍රේතවස්තුප්‍රකරණයෙහි සතරවන මහාවගී
යෙහි තුදුස්වෙනි භෝගසංහර ප්‍රේතවස්තුවනම් කවරයන් එක්
සමයෙක්හි දැරගම්මක්සේ නිර්මලගුණඇති කරුණාවට නිධානවූ
බුදුරජානන්වහන්සේ රජගහනුවර වේළුවනාරාමයෙහි වැඩවාස
යකර වදුරණකල්හි රජගහනුවරවැසි ස්ත්‍රීපුරුෂතරදෙනෙක් සොර
මනාදියෙන් ගිතෙල් මීතෙල් ධාන්‍යාදි වෙළඳුම්කොට නුතුවණින්
වස්තුව එකතුකොටගෙන ජීවත්වන්නාහුය, ඒ ස්ත්‍රීපුරුෂ සතරදෙනා
පසුකාලයෙක්හි මැරිගොස් පිටතුවරෙහි ප්‍රේතියෝව උපන්නා
හුය, ඒ ප්‍රේතියෝ සතරදෙන මේ ප්‍රකාරවසන්නාහුය, අප ධම්යෙ
නුත් අධම්යෙනුත් වස්තුඑකතුකෙළෙමුය ඒ වස්තුදුන් වෙන අය
පරිභෝගකෙරෙති අපි දුකට භාග්‍යවූයෙමුයයි කියා විලාප කිය
මින් ඒ සතරදෙනා රාත්‍රිභාගයෙහි මුරගැසුවාහුය මහුෂ්‍ය
යෝ ඒ අසෘ භයින්තුස්තව අලුයම්වූකල්හි බුදුන්ප්‍රමුඛ භික්ෂුසංඝ
යාහට මහදන්සරසා ශාස්තෘන්සහිත භික්ෂුසංඝයාහට නිමන්ත්‍ර
ණයකොට ප්‍රණීතඛාද්‍ය භෝජ්‍යාදියෙන් වලඳවා භාග්‍යවතුන්ව
හන්සේ දන්වලඳ අවකාශවූකල්හි භාග්‍යවතුන් සමීපයෙහිහිඳ
එපවත් දන්නුවාහුය—භාග්‍යවතුන්වහන්සේ වදුරණසේක් උපා
සකවරුනි ඒ ශබ්දය ඇසීමෙන් තොපට කිසිත් අනතුරායෙක්
නැත්තේය, ප්‍රේතියෝ සතරදෙනෙක් ප්‍රේතදුකින් පෙලෙනලදුව
තමතමන් විසින් කරණලද අකුශලකර්මඵලයන්හා ඊට ලැබිනිබෙන
විපාකත් කියමින් හැඬිවැටෙයෙන් භයානකශබ්දයෙන් විලාප
කියන්නාහු.

මෙසේ කීවාහුය.

—00—

(255) මියං හොගෙ සංහරිමහා සමෙන විසමේනව,
තෙ අඤ්ඤෙ පරිභුංජන්ති මයං දුතඨස්ස භාගිනිනි.

(255) උපාසකවරුනි ඒ ප්‍රේති මෙසේකියා විලාපනියන්නා ඟුය, අපි මනුෂ්‍යලෝකයෙහිදී ධර්මයෙන්ද අධර්මයෙන්ද දැයි මෙන්ද නොදැනිමෙන්ද සුදුසුදෙයකිරීමෙන්ද නුසුදුසුදෙයකිර් මෙන්ද වස්ත්‍රාභරණාදිය එකතුකෙළෙමුය අප විසින් රැස්කරණ ලද ඒ වස්තුව දන් වෙනඅය වැඩවිඳින්නාඟුය වස්තුරැස්කොට වස්තුහිමිවසිටියාවූ අපි කුසල්නොකොට අකුසල්කෙරෙමින්සිට පෙත ආනමයෙහි උපදවා ප්‍රේතදුකව සවාමිව දුක්විඳිමින් සිටින් නෙමුයයි කියා ඒ සතරදෙන විලාපකියන්නාඟුයයි වදළේය.

මෙසේ බුදුරජානන්වහන්සේ ප්‍රේතයන් විසින් කියන ලද ගාථාව වදාරා එම කාරණකොටගෙන සම්ප්‍රාප්තපිරිසට ධර්ම දේශනාකොට වදාරා මතෙතෂි චතුස්සත්‍ය දේසනාකොට වදළ සේක. චතුස්සත්‍ය දේශනාකෙළවර බොහෝදෙන සෝවාන් ඵලාදියට පැමුනුනෝය. මේ ප්‍රේතවස්තුප්‍රකරණයෙහි සතර වන මහාවගීයෙහි තුදුස්වෙනි භෝගසංහර ප්‍රේතවස්තුව කියා නිමුවිනිලදි.

49 භොගසංහර ප්‍රේතවස්තුව නිමි.

—00—

මේවද මේ ප්‍රේතවස්තුප්‍රකරණයෙහි සතරවන මහාවගී යෙහි පසළොස්වෙනි සෙට්ඨිපුත්‍ර ප්‍රේතවස්තුව කවරයත් තවද එක්සමයෙක්හි ජගදේකනාථවූ දහමට ලඟැනිවූ ගම්භිරවූ, අමෘතාකාර මධුරධර්මදේශනා ඇති ලොවුතුරා බුදුරජානන්වහන්සේ සැවැත්නුවර ජේතවනාරාමයෙහි වැඩවාසයකරවදාරණසේක. එසමයෙහි බනාහි පසේනදිකොසොල් රජතෙම එක්දවසක් සවිභරණයෙන් සැරසී උතුම් හසතිරාජයාපිටට පැනනැඟි මහත් රාජ ඉර්ධියෙන් මහත් රාජානුභාවයෙන් යුක්තව නුවර ප්‍රදක්ෂිණකරන්නේය එකල එක්තරා ප්‍රාසාදයක මතුමහලේජනෙල් කවුළුව හැරගෙන ඒ රාජවිභූතිය බලමින්සිටි රූපසම්පත්තියෙන් සම්පූර්තවූ දිව්‍යප්සරාවක්වැනිවූ එක්ස්ත්‍රියක් දැක මේව පෙරතුදුටුනරමේ ස්ත්‍රියක්හෙයින් ඒක්ෂණයෙහි උපන්නාවූ කෙලෙසමුද්දාරයෙන් වැළඳගත් සිත්ඇතිව රූපලක්ෂණාදී නොයෙක් ගුණයෙන් යුක්තවූ අන්තඃපුර ස්ත්‍රීන්කෙරෙන් සිත වියොව වහාපෙරලෙන සුළුවූ දම

නය කරන්ට නොහැකිවූ චිත්තයාගේ වශයෙන් ඒ සත්‍රියගේ ළඟ පිළිබඳ සිත් ඇදව් ඇතාගේ පසු ආසනයෙහි හුන්පුරුෂයාහට නියන්නේ මේ ප්‍රාසාදය හා මේ සත්‍රියත් තොපි දැනගනුවයි කියා සංඥකොට රජවාසලට ගියේය—අනික් සියලල අඹසකඛර ප්‍රේත විසූවෙහි කියනලද ක්‍රමයෙන් දතයුත්තෙය—

ඒයිවවඩා වෙනස්වූයේනම් මේ මතුකියන ප්‍රවෘත්තිය වන්නේය—

විත්‍ර ලඟට ගිය ඒ පුරුෂතෙම හිරබස්නට පළමුවෙන් තුවරට එනඅකර කලින් තුවර දොරවසා (කියනලද ක්‍රමයෙන්) තිබුනේය, ඒ හෙයින් තමා වසින් ගෙණෙනලද අරුණවණි මැටි හා උසුල්ද තුවරවාරක වාටයෙහි අලවා රාත්‍රියෙහි නිදාගැනීමට දෙව්රම්වේහෙරට ගියේය, කොසොල්රජතෙම වනාහි ශ්‍රියහනාවෙහි නිදන්නේ මඩෑමයාම්වේලෙහි ස, යන අක්ෂරයද, න, යන අක්ෂරයද, ට, යන අක්ෂරයද, සො, යන අක්ෂරයද, යන මේ අකුරු සතර මහත් උගුරු වලින් යුක්තයන් විසින් කියනලද හෙයින් මහන්මුර ශබ්දයක් වසයෙන් රජහට ඇසුනේය, ඒ අකුරු සතරද අතීතකාලයෙහි සැවැත්නුවර වැසි සිට්ටපුත්‍රයෝ සතර දෙනෙක් විසින් නිගණ ලදහ, ඒ සිට්ට පුත්‍රයෝ සතර දෙනා වසතුම්දයෙන් මත්වී යවුවන කාලයෙහි ප්‍රදූර ක්‍රියාවසයෙන් අකුසල් රැස්කොට සිට මෑතකාලයෙහි මැරී ගොස් එම සැවැත්නුවර එකඵල්ලෙහිවූ ලොහොකුඹුනරකයෙහි ඉපිද පෑසෙමින් මතුවී ලොහොකුඹුයෙහි මුවව්වට පැමිණ සතරදෙන එක එක ගාථාකියතුකැමතිව ගාථා වන්ගේ මූලකුරුසතර පමණක් නියන අතර දුකඛවේදනාවට පැමිණ ලොහොකුඹුතුලවම බැසසාහුය—

කොසොල්රජතෙම ඒ ශබ්දය අසා හවගත් ලෝමොන්ගමනය හා කලනිරුණු සිත් ඇතිව භයවද පැමිණ, ඒ ඉතිරි රාත්‍රිය දුකසේ කල්යවා අළුයම්වූ කල්හි ප්‍රෝහිතබ්‍රාහ්මණයා කැඳවා ඒ ප්‍රවෘත්තිය කීයේය—එකල රජතු භයපත් හිඳිනේදැයි දන ප්‍රෝහිත බ්‍රාහ්මණතෙම ලාභයෙහි ගිජුව මට හා බ්‍රාහ්මණමඬලයාහටද ලාභ උපදින උපායක් වුයේයයි සිතා නියතුයේ මහරජ ඒකාන්තයෙන් එයින් මහත් උවදුරෙක් වන්නේය, මේ ගැණ සච්චතුස්කයාගය කරව් මැනවැයි කීහ, රජතෙම ඔහුගේ වචනය අසා අමාත්‍යයින්ට ආඥාකරණුයේ සච්චතුස්කයාගයට උපකරණ සම්පාදනය කරවූයයි කීහු, එයසාමලලිකාදේවිතොමෝ නියන්ති මහරජුරුවෙනි ප්‍රෝහිතබ්‍රාහ්මණයාගේ වචනය අසා කුමක්හෙයින් නොයෙක් ප්‍රාණීන්ට වධනිංසාලැබෙණ ක්‍රියාවක්කුරවන්ට කැමති

වීද, සියළුදෙය හසථාමලකසක්කේ දූනවදලාවූ සවිඤඤත්වඤත් සේගෙන් මේ කාරණය විචාරියයුතුනොවේද බුදුරජනන්වහන් සේගෙන් විචාලකල්හි බුදුරජනෝ යම්සේ වදරණවා ඇද්ද එලෙස පිළිපැදියයුතුයයි කියා—රජතෙම ඒ දේව්යගේ වචනය අසා ශාසනාෘන්වහන්සේ ලඟට ගොස් එපවත් බුදුරජනන්වහන් සේට සැලකෙළේය සවිඤඤත්වහන්සේ වදරණසේක් මහරජ ඒ ශබදය ඇසීම හේතුකොට ගෙණ නොපව කිසි අනතරායෙක්නැ තැයි වදරා ලොහොකුඹුනරකයෙහි උපන් ඒ සතරදෙනාගේ මුල පවන් ප්‍රවෘත්ති වදරමින් ඔවුන්විසින් කියන්ට ආරම්භකළ ගාථාස තර වදරනාවූ බුදුරජනෝ ප්‍රථමකොට සයන්න මුල්කොටද දෙ වනුව නයන්න මුල්කොටද තුන්වෙනුව දුයන්න මුල්කොටද ස තරවෙනුව සොයන්න මුල්කොටද ගාථාසතර දේශනාකරණ සේක්—

(256) සටසීං වසස සහසසානි පරිපුණණානි සබබසො
නිරයෙ පචචමානානං කදා අනතො භවිසසති—

(257) නහී අනතො කුතො අනතා නානතා පතිදිසසති
තදහි පකතං පාපං මම තුයහංච මාරිස—

(258) දුජජීවිතං අජීවිමහ යෙ සතතා නදදමහසෙ
සනතෙසු දෙයයධමමෙසු දීපං නාකමම අතතනො—

(259) සො හං නූන ඉතෝ ගනත්වා යොනිං ලබාන මානුසිං
වදඤඤූසිල සමපනනා කාහාමි කුසලං බහුන්—

(256) යනු හෙයින් මහරජ සයන්න මුල්කොට ගාථාවකියන්ට කැමතිවූ නිරිසත්තෙම මෙසේ කියන්නේය මෙහි ඉපිද දුක්විඳින් නාවූ අපට සවිප්‍රකාරයෙන්ම සැටදහසක් අවුරුදු ඉක්මුනාහ, නරකයෙහි පැසෙන්නාවූ අපට කවරකලෙක්හි දුක් කෙළවර වන්නේදැයි වදලේය—මේ නරකයෙහි උපන්නාවූ නිරිසත්තු තිස්දහසක් හවුරුදු මුළුල්ලෙහි පැසේමින් ලොහොකුඹුනරක යටම ගැලෙන්නෝය, තිස්දහසක් හවුරුදු මුළුල්ලෙහි පැසී යටසිට මතුවන්නෝය එසේහෙයින් නිරිසත්තෙම ඒ ප්‍රකාරයේය—

(257) නැයන්න මුල්කොට කියනුකැමතිවූ නිරිසත්තෙම මෙසේ කියන්නේ මේ නරකයෙහි දුක්විඳිමෙහි කෙළවරක් නැත් තේය, දුක්විඳිමෙහි කෙළවරක් කොයිහැ නිදුකානනි මාවිසිහැ තොපිවිසිහැ යම්සේ අකුසල් කරණලද්දේද, එසේම දුක්විඳිමෙහි කෙළවරක් නොපෙනෙයි කිහ—

(258) දුයන්න මුල්කොට නියතුකැමති නිරිසත්තෙම මේ ප්‍රකාර නියන්නේ යම්බඳුවූ අපි දැනවසතුව ඇතුව තිබේද්දී අනුන්ට ඉන් නුදුන්නෙමුද, එහෙයින් නුවනැත්තන්විසින් ගහපතිකටයුතුඅනුමින් අපි ජීවත්වූයෙමුව දැනවසතුව ඇතිව තිබෙනකල්හි අපි අපට පිහිටකරනොගතෙත්තමුයයි කිහ.

(259) සෝයන්න මුල්කොට නියතුකැමති නිරිසත්තෙම නියතුයේ, හේ මම මේ ලොහොකුඹනරකයෙන් මිදී හොස් මනුසත්භය ලැබ පරිත්‍යාගසිලිව සීලාචාරසම්පන්නව පලමුපරිද්දෙන් ප්‍රමාද භාවයට නොපැමිණ බොහෝ කුසල් කරනෙනම් කීහ. ශාස්තෘන්වහන්සේ මේ ගාථා විස්තරකොට ධර්මදේසනාකළසේක, දේශනාකෙළවරදී මැවි හා රත්තෝත්ඵලයන් ගෙනා පුරුෂතෙම සෝවාන් ඵලයෙහි පිහිටුසේක. කොසොල්රජතෙමද භවගත් සංවේග ඇතිව අනුන් අසිති සත්‍රියකෙරෙහි භවගත් ලෝභය හැර සවිනීය භාග්‍යවතගෙන් සතුටුව විසුයේයි. මේ ප්‍රේතවස්තුප්‍රකරණයෙහි සතරවන මහාවගීයේ පසළොස්වෙනි සෙටඨිපුත්‍රප්‍රේතවස්තුව, කියා නිමවනලදී.

50 සෙටඨිපුත්‍ර ප්‍රේතවස්තුව නිමි.

—※—

තුවද මේ ප්‍රේතවස්තුප්‍රකරණයෙහි සතරවෙනි මහාවගීයෙහි සොළොස්වෙනි සටහිකුව ප්‍රේතවස්තුව කවරයත්?

එක්සමයෙක්හි බැළුබැළුවන්හේ ඇස් ප්‍රසන්න වනරූපය ඇත්තාවූ, ඇසු ඇසුවන්ගේ කන් ප්‍රසන්නවන මධුර ධර්මදේසනා ඇත්තාවූ, දෙවි බඹුන්මුදුනෙහි කෙලනා පාපියුම්ඇත්තාවූ, ලෝකවිවූ, අවයවාදිවූ, අතුල්‍යවාදිවූ, ධර්මරජන්වූ, ධර්මාධිපතිවූ, ධර්මලෝවනවූ, ධර්මාභරණවූ, ධර්මාගතාවූ, ධර්මාමෘතවූ, ශාක්‍යසිංහවූ, ශාක්‍යකුලතිලකවූ, ශාක්‍යාධිපතිවූ, ශාක්‍යාකුලක්‍රීවූ, කරුණානිධානකරවූ, සමන්තභද්‍රවූ, පරදුක්ඛදුක්ඛිතවූ, නයනානන්දකරවූ, අපභාග්‍යවිත් අහිත් සම්‍යක්සම්බුද සර්ව්වඥඥේත්තමයානන්වහන්සේ රජගහනුවර සමීපයෙහිවූ වේළුවනාරාමයෙහි මෛත්‍රීකරුණා මුදිතා උපේක්ෂා ඝන සතරබ්‍රහ්මවිහරණයෙන් යුක්තව වැඩවාසයකර වදාරණ කල්හි එක්තරා ප්‍රේතයෙක් අරභයා මේ ප්‍රේතකථාව වදාරණ ලද්දේය. කෙසේදයත්?

යවගිය දවස බරනැස්නුවර වනාහි එක්තරා පිළෙක්

ඇත්තෙය, හෙතෙම සාලිත්තක ප්‍රයොගයෙහි දක්ෂවන්නේය, එසේම අකුරු විදීම් සිල්පයෙහිද පරතෙරට පැමිණියේය, හෙතෙම නුවරදොරටුවෙහි නුගගසමූල හිදගෙණ අකුරුවිදීමෙන් ඇත්රූප හා අශ්වරූප රථසටහන් මනුෂ්‍යරූප කුටාගාරසටහන් ධජසටහන් ආදිනොයෙක් රූපසටහන් නුගපත්‍ර වලින් පෙනෙන්නට අකුරු විද ආ ආවුන්ට පෙන්වන්නේය, නුවර දරුවෝ තම තමන්ට ක්‍රීඩා පිණිස නුගපත්‍රවලින් හත්ථාස්සාදි රූපතිබෙන්නට අකුරු විදුවා ගන්නට ඒ පිළාට මසුසක් අඩමසුසක්දී ඔහුලවා නුගපත්‍රවල රූපා දිය තනවන්නාහුය.

ඉක්බිති එක්දවසක් බරනැස්රජතෙම නුවරින් පටන්ව ඒ නුගගසමූලට පැමිණියේ නුගපත්‍රවල හත්ථාස්සාදිරූපාදිත්ගේ චයයෙන් නොයෙක් රූපවිකෘතීන් බොහෝකොට නිබෙන්නා දැක රජතෙම මනුෂ්‍යයින්ගෙන් විචාරන්නේ මේ නුගපත්‍රවල මෙබඳු නානාවිධ රූපවිකෘතීන් කවරෙක්හු විසින් කරණලද්දහුදැයි විචාලේය, එකල මනුෂ්‍යයෝ කියන්නාහු, මේ පිළා විසින් කරණලද්දේය, දේවයෙනි කියා රජහට පිළා පෙන්වාපුහ, රජතෙම ඔහු කැඳවා කියන්නේ සහය මා විසින් පෙන්වා දෙනලද කථාකරම්න් හුන් පුරුෂයෙකුට නොදන්වා කටව එළුබෙට් විද ඔහුගේ ඛඩ්ඩර වින්ට නොපට හැනිදැසි විචාලේය, හැක්කෙමි දේවයෙනි කියා රජ තෙමේ ඒ පිළා තමන්ගේ රාජභවනයට ගෙණගොස් බොහෝ කොට කථාකරණ ප්‍රොහිතයාකෙරෙහි කලකිරුණුසිත් ඇතිව හිඳ, රජතෙම ඒ ප්‍රොහිතයා ගෙන්වා විවේකවූ ප්‍රදේශයක ඔහු සමග හිඳ රජහටත් ප්‍රොහිතයාහටත් මැදෙන් වරේ තිරයක් බඳුවා තිරේට පිටින් ප්‍රොහිතයා ඉඳුවා රජතෙම තිරයතුලේ හිඳ ඒ ප්‍රොහිතයා හා කථාකෙරෙමින් හිඳිනා ගමන් පිළා කැඳවූයේය, පිළාද නැලියක් පමණ එළුබෙට්ත් හැරගෙණ අවුත් රජහුගේ මෝස්තුය බලා දුනගෙණ ප්‍රොහිතයාගේ ඉදිරියෙහි හිදගෙණ කථාකරන්ට ඔහුකටඇරිය ඇරියවිට එක එක එළුබෙට් වක් බැගින් ඔහුගේ උගුරපල්ලව විදින්නේය, ප්‍රොහිතතෙමේද එළුබෙට් වමාරන්ට ලජ්ජාවෙන්සියලල ගිලින්නේය, එකල්හි රජතෙම එළුබෙට්වලින් ඔහුගේ බඩපිරුනුබව දැන බ්‍රාහ්මණයාහට කියන්නේ එඹා බ්‍රාහ්මණය බොහෝකොට කථාකිරීමෙහි විපාකය තොපි දැම්ම ලද්දේය, ඔව තොපි ගොසින් කුකුරුමාන්ගෙහි පුවහු පත්සුසින්බි එළුබෙට් වමනයකරව එසේකලකල්හි තොපට සුව වෙයි කියා බ්‍රාහ්මණයා පිටත් කෙළේය.

පිළාගේ ඒ ක්‍රියාව කරණකොටගෙණ රජතෙම ප්‍රසන්න‍ව පිළාට ගත්වර තුදුසක් දුන්නේය, හෙතෙම ගම්ලැබ් එයින් තමතුන් පිරිවර ජනයාතුත් සුඛිතකරමින් ශ්‍රමණබ්‍රාහ්මණාදීන්ටත් සුදුසු පරිද්දෙන් නිසිවක්දෙමින් ද්‍රෂ්ටධාර්මික සම්පරායිකාර්ථයන් නොපිරිහෙලෙමින් සැපසේ ජීවත්වන්නේය,තමන්සමීපයටඅවුත් සිල්පදගෙණගන්නවුන්ටද බත්වැටුප්දෙන්නේය, ඉක්බිත්තෙන් එක්පුරුෂයෙක්තෙම ඔහුලඟට අවුත් කියන්නේ, ආචාර්‍යයන්ව හන්ස මටත් මේ සිල්පය ඉගැන්නුව මැනව මට බත්වැටුප් කම් නැතැයි කීහ.

එකල්හි ඕහට සිල්පදගැන්වූයේය, ඒ පුරුෂතෙමද සිල්ප ඉගෙන පරීක්ෂාකැමතිවගොස් ගහඉවුරෙක වැඩහුන් සුනෙත්‍රතෙම පසේබුදුරජහට අතකුරුවිද හිසබින්දේය, පසේබුදුරජානන්වහන්සේද, ඒ වේදනාවෙන් එහිදීම පිරිනිවන්පැවැදුලේය, ඔහුගේ අතකුරුවිදීමෙන් හිසබිඳි පසේබුදුරජානන්වහන්සේ පරිනිවන්පැයේයයි කියා මනුෂ්‍යයින්ට සැලව අවුත් ඔහු එතැන්හිදීම කැටකැබලිදඩුමුගුරු ආදියෙන් ගසා මැරුවාහුය, ඒ පුරුෂතෙම මැරීගොස් අවීචිමහානරකයෙහි බොහෝ දහස්ගනන් හවුරුදු ඇසි අවුත් එම අකුසලකර්මයාගේ විපාකාවශේසයෙන් මේ බුඩොත්පාද කාලයෙහි රජගහනුවරට නුදුරුව ප්‍රේතයෙක්ව උපන්නේය— ඔහුගේ අකුසලකර්මයට සදිසවූ විපාකය ලැබුනේය, ඒ කෙසේද පෙරවරු වේලෙහිද මධ්‍යාහ්නවේලෙහිද සවස්වේලෙහිද ඔහුගේ අකුසලකර්මයන් එසවී අවුත් යකුඑගෙඩි සැටදහසක් හිස්මුදුනෙහි වැටෙන්නේය, එකල්හි ඔහු සිදුනාවූ බිඳුනාවූ හිස ඇතිව බලවත් වේදනාවට පැමිණ බිමවැටෙයි, යකුඑ වැටීම් අවකාසවූ කෙනෙහිම හිස තිබුනුඅතුමින් සැදී සිටිනේය)—

ඉක්බිත්තෙන් එක්දවසක් ආයුෂ්මත් මෞද්ගල්‍යායන ස්ථවිරතෙම ගිජ්ඣකූට පර්වතයෙන් බස්නේ ඒ ප්‍රේතයා දැක මෙසේ වදාරණසේක්—

(260) කින්නු උම්මත්තාරූපොව මිගොඝනෙනාව ධාවසි
සංඝාටිං පාපකම්මන්තා කින්නු උග්ඝාස නෙතුවන්නි—

260 යම්හෙයින් නොපි උමතුවකුමෙන්ද භ්‍රාන්තවූ මෘගයකු සේ ඔබ්මොබ දුවන්නේය, හෙතෙම වනාහි යකුඑ හිස්මුදුනෙහි වැටෙනකල්හි මේ ප්‍රකාරයෙන්වත් නවනිදැනියා සිනා ඒ ඒ අනදුව ඇවිදින්නේය, කොතනට ගියේවිනමුත් යකුඑ හිස වැටෙන්නාහා,

මේනිසා තෙරුන්වහන්සේ තොපි කුමක් පිනිස උමතුවෙකුමෙන් දුවඇවිදිනේදැයි අසාවදාලේය, නැවත විචාරණුයේ තොපි කුමක් පිනිස මුරගසමින් ඇවිදිනේදැයි අසාවදාලේය—

එ අසා ඒ ප්‍රේතතෙම කියනුයේ සවාමිනි මම ප්‍රේත යෙක්වෙමි මිනිස්ලොවදී මම අකුසල්කොට එයින් අවුත් මෙහි ප්‍රේතයෙක්ව උපන්නෙමි එසේවූ මාගේ හිස්මුදුනට අඩුවැඩිනැතිව යකුඵ සැටදහසක් වැටෙයි එයින් මාගේ හිස බිදිපොඩිවන්නේයයි කිහ, (කුළුසැටදහසක් වැටීමට සැහෙනතාරමෙන් මහත්ව) ඔහු ගේ හිසපර්වතකූටයක් ප්‍රමාණ වෙයි, එහි අස්ලොම්හස් අගක් රුව නතරම් ප්‍රදේශයක් නැර් යකුඵ වැටි පොඩිවන්නේය, ඒ හෙයින් හෙතෙම බැගැපඬ මුරගසන්නේයයි කිහ—

එකල්හි තෙරුන්වහන්සේ ඔහු විසින් පූර්වජාතියෙහිදී කර ණුලද කර්ම විචාරණසේක්, එඛා ප්‍රේතය මිනිස්ලොවදී තොපි කයින් වචසින් මනසින් කුමන අකුසලකර්මයක් කරණුලද්දේද, කුමන අකුසලකර්මයක්හුගේ විපාකයක් හේතුකොටගෙණ මේබදු දුකකට පැමිණියෙහු අඩුවැඩිනැතිව සම්පූර්ණව යෝදහසක් කුඵ තොපගේ හිසෙහි වැටෙන්නාහුද, කුමන අකු සලයක් හේතුකොටගෙණ එයින්, තොපගේ හිස බිදියේදැයි අසා වදාලේය, එවිට ප්‍රේතතෙම කියනුයේ—

සවාමිනි මම මිනිස්ලොවදිවඩනාලද ඉන්ද්‍රියයන් ඇතිව කොසිකුත් හයක්නැතිව රුක්මූලෙක්හි භාවනා කෙරෙමින් වැඩ ඉඳිනාවූ සුනෙත්තනම් පසේබුදුන් දුටුයෙම්, එකල සාළිඛ්‍යතක ප්‍රහාරයයි කියනලද අතකුරුගැසීමෙන් මම ඒ පසේබුදුන්ගේ හිස බින්දෙම්, ඒ අකුසලකර්මයාගේ විපාකය හේතුකොටගෙණ මෙ බඳු මේ දුකට පැමිණියෙමි, සවාමිනි අඩුවැඩි නැතිව සම්පූර්ණ යෙන්ම සම්පූර්ණව යකුඵ සැටදහසක් මාගේ හිසමුදුනේ වැටෙ නාහුය, එයින් මාගේ හිස බිදී පොඩිවන්නේයයි කිහ—ඒ අසා තෙරුන්වහන්සේ වදාරන්නේ, එඛා ප්‍රේතය පසේබුදුන්කෙරෙහි තොපි අපරාධකෙරීමෙන් තාවිසින් කරණුලද අකුසලකර්මානුරූප කර්මඵලයක්ව අඩුවැඩිනැතිව සම්පූර්ණවූ සැටදහ සක් යකුඵ තාගේ හිස්මුදුනෙහි වැටෙන්නාහුවෙති එයින් තොප ගේ හිස බිදී පොඩිවන්නේය, ඒ දුර්විපාකය කිසිදෙවියෙකුවිසින් හෝ මාරයෙකුවිසින්හෝ බ්‍රහ්මයකුවිසින්හෝ බුදුන්විසින්හෝ වැලැක්විය හැනිනොවේයයි වදාලේය—මෙසේ වදාරා තෙරුන් වහන්සේ පිඬු පිනිස රජගහනුවරට වැඩ දන්වලද අවකාශව

සවස්වරුයෙහි ශාස්තෘන්වහන්සේ ලහට එලඹ ඒ ප්‍රවෘත්තිය භාග්‍යවත්බුදුරජනන්වහන්සේට සැලකලසේක භාග්‍යවත්බුදුරජතෙම එම අස්ථොත්පත්තිකොටගෙණ සම්ප්‍රාප්තවූ සිවුවනක් පිරිසට ධම්මදේශනාකරවදාරමින් පසේබුදුවරුන්ගේ ගුණානුභාව ය‍ද, අනුසලතම්ය වැලැක්වීය නොහැනි බවද වදාලසේක එකල්හි මහජනතෙම්ද හටගත් කලකිරිල්ලඇතිව ශ්‍රද්ධා ඉපද අනුසල්දුරුකොට කුසලයෙහි හැසිර කම්ය‍වූපරිදෙන් මිය පරලොව ග්‍යෙසිසි

ශ්‍රද්ධාබුද්ධි සම්පන්නඋපාසකඋපාසිකාදි සත්පුරුෂජනයෙනි සුවල්පවූද අකුසලවිපාකද්මෙහිදී මහත් උදාරතරවිපාකදෙනබව මෙයින් දැනගෙණ අකුසල් හැර කුසලයෙහි යෙදී අනාගතයෙහි ලොව පහල වන්නාවූ මෛත්‍රීසඞ්ඝයන්වහන්සේගේ සැසනයෙහිදී සිවු පිළිසිඹියාපත් රහත බව අමෘතමහානිර්වාණසම්පත් සිඩකරගන්ට උත්සාහකටයුතු මේ ප්‍රේතවස්තුප්‍රකරණයෙහි සතරවන මහාවග්ගයෙහි යොළොස්වෙනි සටහිකුටප්‍රේතවස්තුව කියානිමවනලදී

51 සටහිකුට ප්‍රේතවස්තුව නිමි.

—×—

මෙතෙකින් පරමාර්ථ ජෝතිකානම්වූ ඛුද්දක නිකායාර්ථකථාවට අත්‍යාගීත ප්‍රේතවස්තුවර්ණනාවෙහි කථාවස්තුසොළසකින් ප්‍රතිමණ්ඩිත මහාවග්ග කියා නිමවනලද්දේය

ඒඛා ශ්‍රීජේනේන්ද්‍රශාසනාභිවර්ධිකාමීවූ ශ්‍රද්ධාබුද්ධිසම්පන්න උපාසකඋපාසිකාදි සත්පුරුෂවරුණි මේ ප්‍රේතවස්තුප්‍රකරණයෙහි ප්‍රකාශිතකුසලාකුසල විපාකවිසෙසය කන් නමා සිත්හෙලා අවික්ඛිප්තව අසා දැන සුවලපවූද අකුසලින් දුරුව දානශීලාදිකුසල ධම්මයෙහි යෙදී වාසයකොට මිනිස්ලොවින් චුතව ගොස් දෙව්ලොව ඉපිද එහි ආයුප්‍රමාණයෙන් දිව්‍යසම්පත් අනුභවකොට නැවත කුසලෝපචිතයෙන්හෝ අපරාපර්‍යකුසලකම්යෙන්හෝ මනුෂ්‍යදිව්‍යලෝකවල ඉපිද එහිද දිව්‍යසම්පත් අනුභවකෙරෙමින් සිට අනාගතයෙහි ලොවපහළවිවරණනාවූ මෛත්‍රීසඞ්ඝරාජෝත්තමයානන්වහන්සේගෙන් ශ්‍රීසද්ධම්මදේසනාව අසා සෝවාන්සකදාගාමි අනාගාමි ඵල තුනට පැමිනකෙළවරදී සකලකෙලෙස යන් නසා සිව්පිළිසිඹියාපත්රහත්වීමෙන් අමෘතමහානිවන් දකින්ට උත්සාහකටයුතුයි

ප්‍රේතවස්තුවර්ණනාව නිමි.

ශුද්ධිපත්‍රය.

පිටේ	පෙළේ.	අසුද්ධ.	සුද්ධ
2	13	ඕෂවාජාක්‍ෂර	ඕෂධජාක්‍ෂර
,,	14	දන්තාජාක්‍ෂර	දන්‍යාජාක්‍ෂර
,,	24	දසදඟසත්	දසදඟසක්
4	7	අඟප්‍රත්‍යයන්	අඟප්‍රත්‍යඞ්ගයන්
6	1	දන්දිමෙන්	දන්දීමෙන්
,,	23	සන්සුත්	සංසුන්
8	26	වාරයෙන්	වාරත්‍රයෙන්
16	17	මීවෙක්	මිමෙක්
,,	15	ඛජාසුදන	ඡාසුදක
21	3	උදෙසවත්	උද්දසාවත්
23	3	සඵපාදන	සම්පාදනය
,,	30	දන්සඵපත්	දුන්සම්පත්
,,	31	සවිඤ්ඤකනෙක්	සවිඤ්ඤතනෙක්
,,	35	වදුලසෙ	වඳුළුසෙක
27	10	මේප්‍රකරණයෙන්	මේප්‍රකාරයෙන්
29	7	අනිත්	අනික්
31	10	විසින්	විසින්
32	10	වදුරණ	වදුරණ
40	32	සාසනාවාසයක්	සාසනාවාහකයන්
46	4	එලංනි	එලංනී
,,	16	ගෞවරව	ගෞරව
47	10	පිඛුපිණිස	පිඬුපිණිස
50	20	සමගුරු	සම්මුගුරු
,,	28	ඉක්මුයෙමි	ඉක්මවූයෙමි
51	13	සෙතෙත	සෙතෙන
60	6	ඇනිවකුම	ඇතිවකුම
62	23	පනක්	පිනක්
64	1	පෙරව	පොරවා
65	10	නොකටිනවයි	නොකටිහයි
,,	27	නිදුකාහ	නිදුකාන
71	4	ඔෞසධි	ඔෂධි
72	6	වදවුදයේය	වදදවූයේය
,,	13	ඇර්ණිත	ඇවර්ණිත
,,	24	පලිකන්නේ	පිලිකන්නේ
74	21	අනකුදු	අනිකුදු
79	29	වණිණාවෙ	වණිණනාවෙ
81	20	බලියතති	බලියනති
83	4	නැවක	නැවත
,,	10	කලගණත්	කෙලගණන්
84	11	ප්‍රාඥවරයෝ	ප්‍රාඥවරයො
98	31	නොකට	නොකොට
100	8	මහදත්	මහදන්
,,	17	සිඞ්ඛ	සිඞ්ඛකය

ශුද්ධිපත්‍රය.

පිටේ.	පෙළේ.	අසුඛ.	සුඛ.
101	15	විඤ්ඤාණක	අවිඤ්ඤාණක
,,	17	වසතුම	වසතුව
103	20	සඤ්ඤාවහ	සඤ්ඤාංවඤ්ඤ
,,	29	දඛ්බිඤාහා	දඛ්බිඤාහා
105	25	සඹපන්	සම්පත්
106	2	ලැබීමෙන්	නොලැබීමෙන්
,,	3	මෙයින්	සෙයින්
,,	6	ඤත	ඤාය
,,	16	වචනංබැව්	වචනම්බැව්
,,	18	අපපකම්පකතං	අපපකම්පිකතං
108	28	ආයුසම්ත්	ආයුස්මත්
112	29	අමතුඤතඤා	අමතුඤ්ඤයාඤා
115	17	ඤ්ඤාධම්මික	ඤ්ඤාධම්මික
119	19	දුවඤාඤය	දුව ආවාඤය
120	8	පිලිදල	පිලිලද
121	1	කොස්වගලිහිනී	කොස්වහලිහිනී
,,	7	බෙබදු	මේබදු
,,	33	කඤඤාඟං	තාඤඤාඟං
122	27	කාමා	කාමං
126	4	වඤකඤුං	වඤකාඤුං
127	5	පණ්ඨ	පිණ්ඨ
128	3	නිමයෙක්	නියමයෙක්
131	15	භාගඤවත්නි	භාගඤවත්නි
132	24	ආවාඤයය	ආවාඤය
139	32	ආඤකෙරීමෙන්	ආඤයකිරීමේන්
141	25	වචයඅසා	වචනය අසා
,,	31	ඤෙඤතුතෙහි	ඤෙත්‍රයෙහි
147	11	සිරිසපාවා	සිරිංසපාවා
149	3	පැම්ණිදූයි	පැම්ණියේදූයි
151	20	පයඤ්කඤට	පයඤ්කඤයට
155	9	කූටාගාරෙච	කූටාගාරෙච
157	31	සාමඳිටඨං	සාමංදිටඨං
160	11	දුකඛනන්නිගවජ්ජති	දුකඛංන්ගවජ්ජති
161	22	ධාතුවිචරණණ	ධාතුවිචණණ
,,	30	සුක්ම	සුග්ම
164	9	මරණතුම්බව	මරණභිමුඛව
168	34	සංඤෙපයෙක්	සංඤෙපයෙන්
169	3	අධඤසය	ආඛඤසය
170	27	පිලිගත්විනම්	පිලිගත්තේවිනම්
173	31	නියගට	නිය අගට
178	5	වණ්ණවක්	වණ්ණනාවක්
179	29	ගවවාම්	ගවජාම්

දැන්වීම ය.

—:*:—

ප්‍රේතවස්තුප්‍රකරණය යන මේ නමින් දැසිඬවූ මේ දේශනා ධර්ම්ම ය සර්ව්වඥයන්වහන්සේ විසින් ලෝකානුකම්පාවසයෙන් දෙශනාක රවදළාවූ ත්‍රිපිටක ධර්ම්මයෙන් සූත්‍රපිටකයට ඇතුලත්වූ කුදුගොත් සහියේ• පොත් පසලොසෙන් එකකි—මේ වනාහි ප්‍රේතාත්ම උත් පත්තිය ගෙණදෙන්නාවූ ඒ ඒ පාපකර්ම්මයන්ගේ තත්‍වව්ශෙෂ විභා ගප්‍රකාශකළාවූ දෙශනාධර්ම්මයෙකි—ඒ ප්‍රකරණ දෙශනාපාලියට අත්‍ත කථාචාය්‍ය ත්‍රිපිටකධාරී මහාඝව්ර සර්ම්මපාදයන්වහන්සේ විසින් ඒ ඒ කාලයන්හි ලෝකවාසීන් විසින් කරණුලැබුවාවූ ඒ ඒ පාපකර්ම්මානුරූප වසයෙන් ප්‍රේතයෝනියෙහි උපන්නාවුන්ගේ ව්‍ය ශෙෂාකාර ප්‍රකාශවන්නාවූ කථාවස්තු එනිනෙක යොදා බුඩදෙශ නාධර්ම්මය ප්‍රකාශකරණලද්දේයි—ඒ දෙශනාඥීකථාව පාලිභාෂාව නොදත් ශ්‍රද්ධාවතුන්ට මහත් උපකාරනොවන බැවින් සිංහලභාෂා වට පෙරලා ලිවීම ලඞ්කාවාසී පොදුජනයාට මහත් උපකාරවන් නේයයි කරුණාපෙරදැරි සැලකීමෙන් කොස්ගොඩ ගණ්ගොඩ ඩිල්ලේව්හාරාධිපතිව වැඩවිසූ ශාස්ත්‍රාගමධාර් පඤ්ඤාසාරාභිධාන මහාඝව්රයන්වහන්සේ විසින් යථොක්ත අත්‍ථකථාපාලිය මිට අව් රුදු පන්සළිසකට පමණ මත්තෙන් සිංහළ භාෂාවෙන් ලියනලද් දේය—ඒ සිංහළපොත කාලාන්තර ලිපිදෙසාද්‍ය පහකිරීමෙන් ශුඩකරන්ටයයි කොස්ගොඩ භිද්දරුවේ විභාරාධිවාසී සිලව්මලඝ් ව්රයන්වහන්සේ විසින් ආරාධනාකරනුලැබුවාවූ පින්වත්තෙ සඞ් නඤසාමීන්වහන්සේ එහි ලිපිකරුදෙසාදිය පහකිරීමෙන් සකස් කරන්ටයෙදුනේයි—මේ ප්‍රකරණයෙහි ප්‍රකාශවන ප්‍රේත. භයාදි උත්පත්තිකයන්ගේ භයානකසභාවය ඇඟවීම ආදිය සඳහා මෙ හි යමක්නොලිව්වාව මේ පොතකියවා බලනකාටත් ඒ උත්පත්ති පාපකර්ම්මාදිය අම්රුනැතිව වැටහේමය-ඒහෙයින් මෙයින් පොත් රුගෙණ පරලොව වැඩකැමති ශ්‍රද්ධාවතුන් විසින් භාවිතා කට යුතුයි—ප්‍රමාද භ්‍රමාදියෙන් වියහැකිවූ යම්යම් දෙසාදියක්මෙහි ඇතිවිනම් ලෝකසාසනානුකම්පා වසයෙන් වියත්තෝ තතු අඟවත්වා

මේසේ මේ නිවේදනයකරසිටින්නේ මේපොත මුද්‍රනයකර වන්ට යෙදුන අගම පොඩිපිටර්ද සොයිසා අපපුඟාමිය.

මේපොත නැවතනැවත මුද්‍රණයකරවීමේ අයිතිය අපටමයයි සැලකියයුතුයි.

1902 පෙබරවාරිමස 23 දිනදිය

පිටර්ද සොයිසා.

සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු